බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 3.

විනයපිටකයෙහි

03 වන ග්‍රන්ථය

# මහාවග්ගපාළි

ප්‍රථම භාගය

---

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

අම්බලම්ගොඩ ශාස්ත්‍රෝදය පරිවෙණාධිපති

පණ්ඩිත

අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ

විසින් කරණලද

සිංහල පරිවර්තනයෙන් යුක්තයි.

---

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 3

The Third Book in the

**Vinaya-Pitaka**

**3**

# MAHĀVAGGAPĀLI (I)

With the Sinhala translation by


**The Venerable Pandita**
**Ambalamgoda Dhammakusala Thera**
Principal of Sāstrodaya Pirivena, Ambalamgoda

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මසාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

<u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
<u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
<u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

## විනයපිටකෙ

# මහාවග්ගපාළි

## විනයපිටකයෙහි

# මහවග

"තථාගතප්පවෙදිතො ධම්මවිනයො භික්ඛවෙ විවටො විරොචති නො පටිච්ඡන්නො" –

"මහණෙනි, තථාගතයන්වහන්සේ විසින් දෙශනා කරණලද ධර්මය හා විනයය විවෘත වූයේ – ප්‍රකට වූයේ ම බබලයි. වැසුනේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවග්ග, 9 සූත්‍රය )

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 7 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:7 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

# CONTENTS


| | පිටුව |
|---|---|
| සංක්ෂෙපනය. | I |
| ප්‍රස්තාවනාව. | VII |
| බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලා. | LXIII |
| ත්‍රිපිටකපරිවර්තනය පිළිබඳ කාරකසභාව | LXVII |
| ත්‍රිපිටකපරිවර්තනය (ග්‍රන්ථ හා පරිවර්තකස්ථවිරවරු) | LXVIII |
| ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකමණ්ඩලය | LXX |
| ලංකාබෞද්ධමණ්ඩලයේ මධ්‍යවිධායකසභාව | LXXI |
| Corrigenda to the English Notes | LXXII |
| සංකේතනිරූපණය. | LXXIII |
| පාළි හෝඩිය | LXXIV |


## මහාවග්ගපාළියා පඨමො භාගො


**1. මහාඛන්ධකං . . . . . 2 - 246**

බොධිකථා 1. අජපාලකථා 6. මුචලින්දකථා 6. රාජායතනකථා 8. බ්‍රහ්මායාචනකථා 10. පඤ්චවග්ගියකථා 14. පබ්බජ්ජාකථා 30. මාරකථා 42. තීහි සරණගමනෙහි පබ්බජ්ජා-උපසම්පදාකථා 44. දුතියමාරකථා 46. භද්දවග්ගියවත්ථු 48. උරුවෙලපාටිහාරියකථා 50. බිම්බිසාරසමාගමකථා 74. සාරිපුත්තමොග්ගල්ලානපබ්බජ්ජා 84. උපජ්ඣායවත්තං 92. සද්ධිවිහාරිකවත්තං 106. පනාමිතකථා 114. ආචරියවත්තං 126. අන්තෙවාසිකවත්තං 142. පනාමනා-ඛමාපනා 52. බාලඅබ්‍යත්තවත්ථු 154. නිස්සයපටිප්පස්සද්ධි 156. උපසම්පා-දෙතබ්බපඤ්චකං 162. උපසම්පාදෙතබ්බඡක්කං 164. අඤ්ඤතිත්ථිය-පුබ්බකථා 172. පඤ්චආබාධවත්ථු 178. රාජභටවත්ථු 182. අඞ්ගුලිමාල-චොරවත්ථු 184. කාරභෙදකචොරවත්ථු 184. ලිඛිතකචොරවත්ථු 186. කසාහතවත්ථු 186. ලක්ඛණාහතවත්ථු 186. ඉණායිකවත්ථු 186. දාසවත්ථු 188. කම්මාරභණ්ඩුවත්ථු 188. උපාලිදාරකවත්ථු 190. අහිවාතකරොගවත්ථු 192. කණ්ටකවත්ථු 194. ආහුන්දරිකවත්ථු 194. නිස්සයකථා 196. රාහුලවත්ථු 204. සික්ඛාපදකථා 208. දණ්ඩකම්ම-වත්ථු 208. අනාපුච්ඡාවරණවත්ථු 212. අපලාළනවත්ථු 212. කණ්ටක-සාමණෙරවත්ථු 212. පණ්ඩකවත්ථු 212. ථෙය්‍යසංවාසකවත්ථු 214. තිරච්ඡානගතවත්ථු 214. මාතුඝාතකවත්ථු 218. පිතුඝාතකවත්ථු 218. අරහන්තඝාතකවත්ථු 218. භික්ඛුණීදූසකවත්ථු 220. උභතො-බ්‍යඤ්ජනකවත්ථු 220. අනුපජ්ඣායකාදිවත්ථු 222. අපත්තකාදි-වත්ථූනි 222. නඋපසම්පාදෙතබ්බවීසති 222. හත්ථච්ඡින්නකාදි-නපබ්බාජෙතබ්බද්වත්තිංසා 226. අලජ්ජිනිස්සයවත්ථූනි 228. ගමිකාදි චත්තාරි අනිස්සිතවත්ථූනි 228. ගොත්තෙන අනුසාවණානුජානනා 230. ද්වෙ උපසම්පදාපෙක්ඛා 230. ගබ්භවීසූපසම්පදා 230. උපසම්පදාය අනන්තරායිකධම්මපුච්ඡා 232. චත්තාරො නිස්සයා 238. චත්තාරි අකරණීයානි 240. ආපත්තියා අදස්සනාදිසු උක්ඛිත්තකා 242. උදානගාථා 244 -- 246.

2. උපොසථක්ඛන්ධකං . . . . . . . . . . . . . . 248 – 344

උපොසථසන්නිපාතකථා 248. පාතිමොක්ඛුද්දෙසො 250. මහාකප්පිනවිසුද්ධිකථා 256. සීමාසම්මුති 258. උපොසථාගාරසම්මුති 260. උපොසථාගාරසමූහනං 260. උපොසථප්පමුඛසම්මුති. 262. අවිප්පවාසසීමාසම්මුති 264. සීමාසමූහනං 266. ගාමාදිසීමාකථා 268. ද්වෙ උපොසථා 268. චත්තාරි උපොසථකම්මානි 270. පඤ්චපාතිමොක්ඛුද්දෙසා 270. සඞ්ඛිත්තෙන පාතිමොක්ඛුද්දෙසො 272. පාතිමොක්ඛුද්දෙසස්සන්තරායා 272. විනයපුච්ඡා 272. විනයවිස්සජ්ජනා 274. චොදනා 274. අධම්මකම්මපටික්කොසනා 276. සගහට්ඨපරිසාය පාතිමොක්ඛුද්දෙසපටික්ඛෙපො 278. පාතිමොක්ඛුද්දෙසකඅජ්ඣෙසනා 280. පක්ඛගණනාදිඋග්ගහණං 282. උපොසථාරොචනා 282. පුබ්බකරණානි 284. දිසඞ්ගමිකාදිවත්ථු 286. පාරිසුද්ධිදානං 288. ඡන්දදානං 290. ඤාතකාදිග්ගහණං 294. උම්මත්තකසම්මුති 294. සඞ්ඝුපොසථාදි උපොසථප්පභෙදා 298. ආපත්තිපටිකම්මං 304. සභාගාපත්තිපටිකම්මං 306. අනාපත්තිපණ්ණරසකං 306. වග්ගාවග්ගසඤ්ඤීපණ්ණරසකං 316. වෙමතිකපණ්ණරසකං 318. කුක්කුච්චපකතපණ්ණරසකං 320. භෙදපුරෙක්ඛාරපණ්ණරසකං 322. සීමොක්කන්තිකපෙය්‍යාලං 330. ආවාසිකාකාරලිඞ්ගාදිදස්සනං 332. නානාසංවාසකාදීහි උපොසථකරණං 334. නගන්තබ්බවාරා 336. ගන්තබ්බවාරා 338. වජ්ජනීයපුග්ගලදස්සනාදි 340. උද්දානගාථා 342 – 344.

3. වස්සූපනායිකක්ඛන්ධකං . . . . . . . . . . . 346 – 392

ද්වෙ වස්සූපනායිකා 346. වස්සානෙ චාරිකාපටික්ඛෙපො 348. වස්සුක්කඩ්ඪනං 348. සත්තාහකරණීයකථා 350. අන්තරායෙ අනාපත්තිවස්සච්ඡෙදස්ස 372. සඞ්ඝභෙදෙ අනාපත්ති වස්සච්ඡෙදස්ස 376. වජාදීසු වස්සූපගමනං 380. වස්සං අනුපගන්තබ්බට්ඨානානි 380. අකත්තබ්බකතිකා 382. පටිස්සවෙ දුක්කටාපත්ති 382. උද්දානගාථා 392.

4. පවාරණක්ඛන්ධකං . . . . . . . . . . . . . . 394 – 472

ඵාසුක-අඵාසුකවිහාරාදිකථා 394. පවාරණවිධිඅනුජානනා 398. ද්වෙපවාරණා 402. චත්තාරි පවාරණකම්මානි 402. පවාරණදානං 402. ඡන්දදානං 406. ඤාතකාදිග්ගහණං 406. සඞ්ඝපවාරණාදිපවාරණභෙදා 408. ආපත්තිපටිකම්මං 412. ආපත්තිආවීකරණං 414. සභාගාපත්තිපටිකම්මං 414. අනාපත්තිපණ්ණරසකං 418. වග්ගාවග්ගසඤ්ඤීපණ්ණරසකං 424. වෙමතිකපණ්ණරසකං 426. කුක්කුච්චපකතපණ්ණරසකං 428. භෙදපුරෙක්ඛාරපණ්ණරසකං 430. සීමොක්කන්තිකපෙය්‍යාලං 436. චාතුද්දසිකාදිදිවසනානත්තං 436. ආවාසිකාකාරලිඞ්ගාදිදස්සනං 438. නානාසංවාසකාදීහි පවාරණා 440. නගන්තබ්බවාරා 440. ගන්තබ්බවාරා 444. වජ්ජනීයපුග්ගලදස්සනං 444. ද්වෙවාචිකාදිපවාරණා 448. පවාරණස්ස අන්තරායා 450. පවාරණට්ඨපනං 450. ථුල්ලච්චයවත්ථු 454. වත්ථුඨපනං 462. භණ්ඩනකාරකවත්ථු 464. ඵාසුවිහාරාධිගමො 468 පවාරණසඞ්ගහා 470. උද්දානගාථා 472.

Free Distribution www.aathaapi.org

5. චම්මක්ඛන්ධකං . . . . . . . . . . . . . . . . . . 474 – 516

සොණකොළිවිසවත්ථු 474. දිගුණාදිඋපාහනපටික්ඛෙපො 486. සබ්බනීලිකාදිඋපාහනපටික්ඛෙපො 486. ගණඞ්ගණූපාහනානුජානනා 490. අජ්ඣාරාමෙ උපාහනපටික්ඛෙපො 492. පාදුකාදිපටික්ඛෙපො 492. යානපටික්ඛෙපො 500. උච්චාසයන-මහාසයන-පටික්ඛෙපො 500. සබ්බචම්මපටික්ඛෙපො 502. ගිහිවිකටානුජානනා 504. සොණකුටිකණ්ණවත්ථු 506. පච්චන්තිමජනපදෙසු විනයධරපඤ්චමෙන උපසම්පදඅනුජානනා 512. උද්දානගාථා 516.

---

Free Distribution www.aathaapi.org

# සංඥාපනය

## සම්බුද්ධජයන්තිය

ශ්‍රීශාක්‍යමුනීන්ද්‍ර වූ තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සකන්ධ-පරිනිර්වාණයෙන් දැන් අවුරුදු දෙදහස් පන්සියයක් සම්පූර්ණ ය. මේ තරම් දීර්ඝකාලයක් උන්වහන්සේගේ නෛර්‍යාණිකශාසනය සදෙවකලෝකයා හට හිතවැඩ සලසමින් අඛණ්ඩ ව පැවැත්මේ ආශ්චර්යසිද්ධිය නිමිත්ත කොට ගෙණ සම්බුද්ධමඞ්ගලමහොත්සව පැවැත්වීමට හා සම්බුද්ධශාසනයාගේ චිරස්ථිතියට හිත වූ කාර්‍යසංවිධානය සඳහා බෞද්ධමහාජනයා විසින් දෙදහස්පන්සියවන සම්බුද්ධපරිනිර්වාණවර්ෂය බුද්ධජයන්තිවර්ෂය වශයෙන් සම්මත කර ගන්නාලදි.

## සිංහලජාතිය

සම්බුද්ධපරිනිර්වාණදිනයෙහි ලක්දිව පැමිණි විජයකුමාරයාගෙන් ආරම්භ වූ සිංහලජාතියට ද අවුරුදු දෙදහස්පන්සියයක් පිරුණේ ය. එහෙයින් සිංහලජනතාවට මේ ජයන්තිවර්ෂය ජාතික වශයෙන් ද අතිශයින් වැදගත් වන්නේ ය. බුදුරජාණන් වහන්සේ විසින් ම තමන් වහන්සේගේ නෛර්‍යාණිකශාසනය පන්දහසක් හවුරුදු ආරක්ෂා කිරීමට සුදුසු ජාතිය වශයෙන් තෝරා ගණු ලැබූ සිංහලජාතිය ඒ ශ්‍රේෂ්ඨධර්මය ස්වකීයශිෂ්ටාචාරය හා ආගම ද වශයෙන් වැලඳ ගෙණ මෙතුවක් කල් ආරක්ෂා කිරීමෙන් දෙවියන් සහිත ලෝකයාගේ සම්භාවනයට පාත්‍ර වී ය.

## ලඞ්කාබෞද්ධමණ්ඩලය

මේ බව සැලකීමෙන් මහත් ප්‍රබොධයට පැමිණි වර්තමාන සිංහල බෞද්ධයන් විසින් බුද්ධශාසනයේ චිරස්ථිතිය සඳහා මින් පෙර නුවූ විරූ අවශ්‍යක්‍රියා සංවිධාන කළ යුතු බව සලකා මෙහි දැක්වෙන ප්‍රස්තාවනාවෙහි විස්තර වන පරිදි ලඞ්කාබෞද්ධමණ්ඩලය පිහිටුවන ලදී.

## ලඞ්කාරජයේ අනුග්‍රහය

බුද්ධජයන්තිය පිළිබඳ කටයුතු නො පිරිහෙලා සිදු කරණු පිණිස එකල අග්‍රාමාත්‍ය ව සිටි **ලඞ්කාබෞද්ධමණ්ඩලයේ** සභාපති වූ **ශ්‍රීමත් ජෝන් කොතලාවල** මැතිතුමන්ගේ හා ස්වදෙශකාර්‍ය භාර ව සිටි **ඒ. රත්නායක** ඇමැතිතුමන්ගේ ද ඉල්ලීම පරිදි ගතරජයේ අමාත්‍යමණ්ඩලය විසින් ප්‍රථමවරට **රුපියල් පණස්ලක්ෂයක** ආධාරමුදලක් ලඞ්කාබෞද්ධ-මණ්ඩලයට පවරා දෙන ලද්දේ ය.

## ත්‍රිපිටකය සිංහලභාෂාවට නැඟීම

ලඞ්කාබෞද්ධමණ්ඩලය මගින් සම්බුද්ධජයන්තිඅනුස්මරණය සඳහා කළ යුතු ය යි සම්මත කරගත් කටයුතු අතර ත්‍රිපිටකපාලිය සිංහලයට නැඟීම ප්‍රධාන වේ. එසේ කියන්නේ ස්ථවිරවාද බුද්ධධර්මයෙහි ආරක්ෂාව හා ව්‍යාප්තිය ද සලසාලීමට වරම් ලබා සිටුනා අප රටෙහි සියබසින් ලියැවුනු ත්‍රිපිටකයක් මෙතෙක් ඇති නො වීම මහත් පාඩුවක් ව තුබූ බැවිනි. දැන් ඒ කාර්‍යය සිද්ධ කිරීමෙන් ඒ පාඩුව පිරිමැසෙන්නේ ය. අනාගතසාමාන්‍ය මහාජනයාට ද ධර්මඥානය ලැබෙන්නේ ය. රත්නත්‍රය විෂයයෙහි ඔවුන්ගේ ශ්‍රද්ධාව වැඩෙන්නේ ය. දෙවියන් සහිතලෝකයාගේ යහපත සිද්ධ වන්නේ ය. ඉතිරි අවුරුදු දෙදහස්පන්සියය තුළ බුද්ධශාසනයාගේ ආරක්ෂාව ද සැලසෙන්නේ ය.

**ත්‍රිපිටකපරිවර්තනකාරකසභාව**

සම්බුද්ධජයන්තිඋත්සවය පිළිබඳ කටයුතු සඳහා තෝරා පත් කරණ ලද කාරකසභා අතුරෙහි ත්‍රිපිටකපරිවර්තනකාරකසභාව ද එකෙකි. මේ කාරකවර්ගීය සම්භාවනීය වූ ධර්මශාස්ත්‍රධර ස්ථවිරයන් වහන්සේලා සතළිස් සතරනමකගෙන් හා ගිහි මහතුන් සදෙනෙකුගෙන් ද යුක්ත වේ. එහි සභාපති ධුරය **කොළඹ විද්‍යෝදයමහාවිද්‍යාලයෙයෙහි උපප්‍රධානාචාර්ය වූත්, එහි අධ්‍යාපනාධිකාරී වූත්, අතිගරු පණ්ඩිතාචාර්ය වැලිවිටියේ ශ්‍රී සොරතාභිධාන** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ උසුලති. සම්පාදකධුරය උසුලන්නෝ **කොළඹ දෙමටගොඩ ධර්මදූතාශ්‍රමවිද්‍යාලයාධිපති වූ අතිගරු දර්ශනවිශාරද (පී එච්. ඩී.) පරවාහැර ශ්‍රී වජිරඤාණාභිධාන** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. මේ සභාපතිධුරය හා සම්පාදකධුරය ත්‍රිපිටකපරිවර්තනකාරකසභාව කෙරෙහි බෞද්ධමහාජනයාගේ ගෞරවය හා විශ්වාසය තහවුරු වීමට කරුණු වේ. එසේ ම එය ත්‍රිපිටකපරිවර්තනකාර්ය්‍යය ශීඝ්‍ර ව පරිසමාප්ත වීමට අසහාය හේතුව වශයෙන් ද සැලකිය යුත්තේ ය. මුන්වහන්සේලාගේ පාලනයෙන් හා සංවිධානයෙන් ත්‍රිපිටකපරිවර්තන කාරකසභාව ද ඒ කාර්ය්‍යයෙහි උනන්දුවෙන් ක්‍රියා කරන්නී ය. එහෙයින් කල් නො යවා මෙතෙක් නො ලැබූ සිංහලත්‍රිපිටකයක් සිංහලබෞද්ධ-මහාජනයා අතට පත් වන්නේ ය.

**සිංහලත්‍රිපිටකය**

ත්‍රිපිටකපාලියෙහි සමහර කොටස් හා අර්ථකථා පෙර සිංහලභාෂාවෙන් පැවති බව ඉතිහාසයෙන් පෙණේ. දැනුදු සිංහලයෙන් ලියූ සිංහලසාහිත්‍යයට නැඟුනු සම්භාවනීය වූ සිංහලගද්‍යපද්‍ය දහම් පොත් රාශියක් තිබේ. එහෙත් මෙයට කලින් සම්පූර්ණත්‍රිපිටකපාලිය සිංහලයට නැඟීමෙක් කවදා වත් නො වූයේ ය යි සිතමු. එසේ සලකනවිට දෙදහස් පන්සියයේ බුද්ධජයන්ති නිමිත්තෙන් ඉතිහාසයේ ප්‍රථම වරට සිංහලයාට සිංහලත්‍රිපිටකයක් ලැබීමේ භාග්‍යය උදා වූයේ ය.

**සංස්කාරකමණ්ඩලය**

ත්‍රිපිටකපරිවර්තකපණ්ඩිතස්ථවිරයන් වහන්සේලා විසින් කරණු ලබන සිංහලපරිවර්තන ඒ ඒ ආචාර්ය්‍යපරම්පරා අනු ව යැමෙන් එකකට එකක් වෙනස් විය හැක්කේ ය. එහෙයින් ඒ හැම පරිවර්තන ම සංශොධනය කොට පදයොජනා, වාක්‍යයොජනා, අර්ථවාචනාදිය හැකි පමණින් සමාන කොට ප්‍රවචනයාගේ යථාර්ථාවබොධයට සරි ලන සේ සකස් කිරීම සඳහා මේ මණ්ඩලය පිහිටුවන ලද්දේ ය.

**පරිවර්තනය සඳහා පොත් පිළිගැන්වීම**

ලඞ්කාබෞද්ධමණ්ඩලයේ මෙහෙයීම පරිදි **එක්දහස් නවසියපණස් පස්වන ක්‍රිස්තුවර්ෂයෙහි මාර්තු මස දහනවවන දින** කොළඹ රාජකීය විද්‍යාලයයෙහි මුළු දෙවුනු ගිහිපැවිදි මහාසභාවේ දී එකල අග්‍රාමාත්‍ය වූ **ජෝන් කොතලාවල** මහතා විසින් බෞද්ධමණ්ඩලය වෙනුවෙන් ත්‍රිපිටක-පරිවර්තනකාරකසභාවේ මහාස්ථවිරයන් වහන්සේලා සූසාළිස් නමකට ත්‍රිපිටකය සිංහලභාෂාවට නගන්නට ආරාධනා කොට ඒ ඒ පොත් ඒ ඒ ස්ථවිරයන් වහන්සේලාට පිළිගන්වන ලදී. මේ වනාහි **වළගම්බාරජු** දවස **මාතලේ අලුලෙන** දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසු ඇති වූ ශ්‍රෙෂ්ඨසිද්ධිය සේ පිළිගත යුතු ය.

## මා වෙත පිරිණැමූ මහවග

විනයපිටකයට අයත් **මහාවග්ගපාළිය** සිංහලභාෂාවට නැඟීම සඳහා මා වෙත පිරිණැමුනේ ය. එය ඉතා සතුටින් පිළිගත් මම පෙළපොත හා එහි පරිවර්තනයත් ලියා අටමසකින් අවසන් කෙළෙමි.

**මහාවග්ගපාළිය** විනයපිටකයෙහි තෙවන පොත ය. බුදුරජානන් වහන්සේ විසින් ප්‍රඥප්ති වශයෙන් ඒ ඒ තැන ඒ ඒ කරුණෙහි වදාළ විනය ශික්ෂාපද සඞ්ගායනා කළ ප්‍රථම සඞ්ගීතිකාරකමහාක්ෂීණාශ්‍රවයෝ එය **මාතිකා සුත්තවිභඞ්ග ඛන්ධක පරිවාර** යි කොටස් සතරකට බෙදූහ. එහි මාතිකා නම් වූ භික්ෂුභික්ෂුණී වශයෙන් බෙදුනු **ප්‍රාතිමොක්ෂ** දෙකෙහි සඞ්ගෘහීත වූ ශික්ෂාපද නිදාන පුද්ගල වස්තු ආදි විස්තර වශයෙන් විභාග කොට දැක්වීම **විභඞ්ග** නම් වී ය. ඛන්ධක වශයෙන් වදාළ දෙවිසි කඳුවත් **ඛන්ධක** නම් වේ. ඒ ශික්ෂාපද හා ඛන්ධක පිළිබඳ සොළොස් පරිවාරය **පරිවාර** නමි. මාතිකා විභඞ්ග ඛන්ධක පරිවාර යන මේ කොටස් සතර ඇතුළත් **විනයපිටකය** ද නවාඞ්ග ශාස්තෘශාසනයෙහි **සුත්ත** නාමයෙන් ගන්නා ලදී.

ඒ විනයපිටකය **පාරාජිකපාළි පාචිත්තියපාළි මහාවග්ගපාළි චුල්ලවග්ගපාළි පරිවාරපාළි** යි ග්‍රන්ථ පසෙකින් යුක්ත වේ. යට කියූ උභයවිභඞ්ගය පරාජිකපාළි පාචිත්තියපාළි ය යි ග්‍රන්ථ දෙකෙක් වී ය. මහාවග්ගපාළිය හා චුල්ලවග්ගපාළිය මෙවන වෙන ම කඳුවත් දසයකින් හා දොළසකින් බැඳුනේ ය. පරිවාරපාළියෙහි බැඳී සිටියෝ පඤ්ඤත්තිවාරාදී වූ සොළොස් පරිවාරයෝ ය.

එහි මහාවග්ගපාළිය **මහාඛන්ධක, උපොසථක්ඛන්ධක, වස්සූපනායිකක්ඛන්ධක, පවාරණක්ඛන්ධක, චම්මක්ඛන්ධක, භෙසජ්ජක්ඛන්ධක, කඨිනක්ඛන්ධක, චීවරක්ඛන්ධක, චම්පෙය්‍යක්ඛන්ධක, කොසම්බක්ඛන්ධක,** යන ඛන්ධක දසයෙන් යුක්ත ය. මෙහි ඇතුළත් කරුණු විසයසූචියෙහි දක්වා ඇත. චුල්ලවග්ගපාළියෙහි එන ඛන්ධකයන්ට වඩා මෙහි එන ඛන්ධක විෂයමහත්ත්වයෙන් මහත්බවට ගිය හෙයින් **මහාවග්ග** නම් වී ය.

**විනය** නම් ප්‍රධාන වශයෙන් කය වචන දෙක හික්මවීම ය. මේ සඳහා බුදුරජානන් වහන්සේ විසින් විශෙෂ වශයෙන් ශික්ෂාපද පණවන ලද්දේ බුද්ධත්වයට පැමිණීමෙන් අවුරුදු විස්සක් ගිය තැනේ දී ය. බුද්ධත්වයේ සිට අවුරුදු විස්සක් ගත වන තුරු භික්ෂූන් වහන්සේලා අතර අශ්‍රාමණික වූ වරදෙක් නො වී ය. එහෙයින් ඒ කාලයෙහි කායවාක්සංවරය සඳහා අමුතු පැණවීමෙක් වුව මනා නො වී ය. කල් යත් යත් ශාසනානුලොමික නො වූ පැවතුම් භික්ෂූන් අතර පහළ වන්නට වූ බැවින් භික්ෂුසඞ්ඝයාගේ සංවරය හා වත් පිළිවෙත් සම්බන්ධයෙන් ශික්ෂාපද පැණවූහ. ඒ ශික්ෂාපදසමූහය ප්‍රථමසඞ්ගායනාවේ දී නිදාන වස්තු පුද්ගලාදිය දක්වමින් විනයපිටකය නමින් සංග්‍රහ කරණ ලදී.

## මහවග සිංහලයට නැඟීම

මහාවග්ගපාළිය සිංහලයට නගන්නට පෙරාතුව **බෙන්තර සද්ධාතිස්ස** ස්ථවිරයන් වහන්සේ විසින් මුද්‍රණය කරවා පළ කරණ ලද මහාවග්ගපාළිය පිටපත් කරවීමි. ඒ පිටපත **මහනුවර පත්තිරිප්පුවෙන්, තොටගමුවේ රාජමහාවිහාරයෙන්, අම්බලම්ගොඩ සුනන්දාරාමමහාවිහාරයෙන්, හික්කඩුවේ ජනානන්දාරාමමහාවිහාරයෙන්, පොල්වත්තේ අග්ගාරාමමහා**

**විහාරයෙන්, වේරගොඩ ක්ෂේත්‍රාරාමමහාවිහාරයෙන්** ද ලබාගත් පැරණි පුස්කොළපොත් බුරුම - **සියම්** - ඉංග්‍රීසිඅකුරින් මුද්‍රණය කරණලද පොත් සමග සසඳා බැලිමි. මාගේ පිටපත ඒ පොත් හා සම කොට බැලීමේ දී එකිනෙක වෙනස් වූ පාඨාන්තරරාශියක් දක්නා ලදී. එහි දී අටුවා හා ටීකා අනු ව සුදුසු ය සි පෙණුනු පද - පාඨ පෙළට ඇතුළත් කොට විසම පද - පාඨ අධොලිපි වශයෙන් යෙදූවෙමි. සමහර පොතක ඇතැම් වාක්‍ය වාක්‍යාංශ හා පද මුළුමනින් ගිලිනී ඇතිබව දක්නට ලැබින. එසේ ගිලිනී ගිය අවශ්‍යයෙන් ඇතුළත් විය යුතුය සි පෙණුනු වාක්‍ය හා වාක්‍යාංශ ද පද ද අපගේ **සභාපති** - **සම්පාදකනායකසවාමීන්‍ද්‍රයන්** වහන්සේලාගේ උපදෙස් අනු ව අර්ථකථා, ටීකා, විනයප්‍රකරණ හා මහාවස්තු - විනයවස්තු ආදී බෞද්ධසංස්කෘතග්‍රන්ථ ද සමග සසඳා බලා ත්‍රිපිටකපරිවර්තනසංසකාරක- මණ්ඩලයේ අතික් ප්‍රවීණමහාස්ථවිරයන් වහන්සේලාත් සමග සාකච්ඡා කොට පෙළට ඇතුළත් කරණ ලදී. ඒ වාක්‍ය, වාක්‍යාංශ, පද '[ ]' මේ ලකුණෙන් ද, අධොලිපි වශයෙන් ද දක්වා ඇත.

පෙළපොත හැකිපමණින් ශුද්ධ කොට එහි පරිවර්තනය ද විනයාර්ථ කථාටීකාග්‍රන්ථ සිංහලයෙන් ලියැවී ඇති **සිඛවලඳවිනිස, සිඛවලඳ- විනිස ගැටපදය, කුදුසික, මුලුසික, සද්ධම්මරත්නාවලිය, කඩ්ඛාවිතරණි පිට පොත, අමාවතුර, පූජාවලිය, දම්පියාවුවා ගැටපදය** යන පොත් ද **අර්ථකථා** ග්‍රන්ථ ද ඇසුරු **කිරීමෙන්** ශුද්ධ කරණ ලදී. පාළිය සිංහලයට නැගීමේ දී ඒ වෙනුවට යොදන සිංහලය පොතේ වම්පස පිටුවේ සිටුනා පද වාක්‍ය හා ගැළපෙන සේ ලියන්නට උත්සාහ දැරිමි. වාග්රීතින් විසිත් පාළිරීතිය හා සිංහලරීතිය සම නො වේ. සිංහල පරිවර්තන සිංහලරීතියට අනුගත විය යුතු බැවින් සමහර පාළිවාක්‍යයන්ගේ අර්ථය සිංහලභාෂා- රීතියට අනුකූල ව ලියන ලදී.

**සංසකාරණය**

ත්‍රිපිටකපරිවර්තනකාරකසභාවේ හා එම සංසකාරකමණ්ඩලයේ සභාපති වූ වැලිවිටියේ නායකසවාමීන්‍ද්‍රයන් වහන්සේ හා ඒ සභා දෙක්හි සම්පාදක වූ පරවාහැර නායකසවාමීන්ද්‍රයන් වහන්සේත් මේ සංසකරණයෙහි ලා දක්වූ උනන්දුව ඉමහත් ය. උන්වහන්සේලා මෙහි මා ශුද්ධ කළ සමහර තැන් ද මා ලියූ සමහර අරුත් ද එ ලෙසින් ම නො ගෙණ සංසකාරක මණ්ඩලයේ ද අදහස් විමසමින් ඒ තැන්හි ඒ අරුත්හි වඩාත් පරීක්ෂ්‍යකාරී වූහ.

**උපග්‍රන්ථය**

මෙ ම පරිවර්තනයෙහි ද අර්ථව්‍යක්තිය සඳහා බොහෝ පද හා වාක්‍යයන් විස්තර කටයුතු බව පෙණී ගියේ ය. එහෙයින් මෙයට ද ඉතාකෙටියෙන් මුත් උපග්‍රන්ථයක් ලිය යුතු ය යි සංසකාරකමණ්ඩලයේ සම්මතය වී ය. එහෙයින් මෙහි ද්විතීය භාගය අගට යොදා ඇති උපග්‍රන්ථය ත්‍රිපිටකපරිවර්තන කාරක සභාවේ හා සංසකාරකමණ්ඩලයේ ද සම්පාදක වූ අතිගරු **පරවාහැර ශ්‍රී වජ්‍රඥාන**නායකසවාමීන්ද්‍රයන් වහන්සේ අතින් ලියවුනේ ය.

**මුද්‍රණය**

මෙසේ සිංහලයට නගා සංසකාරණයට පමුණුවා පළමු ව අවසන් කළ මේ ග්‍රන්ථය පළමු කොට මුද්‍රණය කළ යුතු ය යි සංසකාරකමණ්ඩලයෙන් සම්මත වූ බැවින් ලඞකාබෞද්ධමණ්ඩලය විසින් මෙය මුද්‍රණය කිරීමට

මහාබොධි යන්ත්‍රාලයයට පවරණ ලදි. මෙහි අවසාන ශොධ්‍යපත්‍ර බැලීම, ඡේද - වාක්‍ය - පද වෙන් කිරීම, මුද්‍රණය පිළියෙල කිරීම ආදිය ත්‍රිපිටක-පරිවර්තනකාරකසභාවේ සභාපති සම්පාදක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දෙනම විසින් කරණ ලදී. එහි දී දක්නට ලැබුනු සැක සහිත ය යි සිතූ පදවාක්‍යයන් ගැණ ද සංස්කාරකමණ්ඩලයේ මහා ස්ථවිරයන් වහන්සේලා හා සාකච්ඡා කොට අවසානතීරණය වශයෙන් ගන්නා ලද්දේ ගරු සභාපති නායකස්වාමීන්ද්‍රයන් වහන්සේගේ තීරණය යි.

## මහජනරජය

ගත රාජ්‍ය පාලක මණ්ඩලය විසින් සංවිධානය කරණ ලද සම්බුද්ධජයන්ති උත්සවය පිළිබඳ කටයුතු වර්තමානමහාජනරාජ්‍යයේ අග්‍රාමාත්‍ය වූ ගරු **ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක** මැතිතුමන් විසින් අමාත්‍යමණ්ඩලයේ සහයොගයෙන් සිදු කරලීම මහත් ප්‍රීතියකි. මේ සම්බන්ධයෙන් පළාත් පාලන හා සාංස්කෘතිකඅමාත්‍යාංශයේ ගරු අමාත්‍ය වූ **ජයවීර කුරුප්පු** මැතිතුමන් හා එහි අධ්‍යක්‍ෂක වූ සිවිල්නිලධර **ඇන්. ක්‍යූ. ඩයස්** මැතිතුමන් ද එහි සෙසු නිලධරයන් ද ත්‍රිපිටකපරිවර්තනය පිළිබඳ කටයුතු නිතර සොයා බැලීමෙන් කරණු ලබන උපකාර හා දෙනු ලබන ධෛර්‍ය්‍යයත් ඒ ශ්‍රේෂ්ඨ කර්තව්‍යය ඉක්මනින් නිම කිරීමට විශෙෂ හෙතුවක් විය හැකි බව ප්‍රශංසාපූර්වක ව පවසමු.

## උපකාරානුස්මෘතිය.

ත්‍රිපිටකපරිවර්තනකාරකසභාවේ සභාපති සම්පාදක නායකස්වාමීන්ද්‍රයන් වහන්සේලා මෙහි ලා උපදෙස් දීමෙන් හා අවසානශොධ්‍යපත්‍ර බැලීමෙන් ද උපග්‍රන්ථ ලිවීමෙන් ද කළ උපකාර ඉමහත් ය. සංස්කාරක මහාස්ථවිරයන් වහන්සේලා සංස්කරණයට සහභාගී වීමෙන් ද, පරිවර්තනයේ දී අපගේ ධර්මාන්තෙවාසී වූ **කුඩාගල ගුණසිරි, වැලිපටන්විල විජිතවංස** භික්ෂූහු ලෙඛන සකස් කිරීමෙන් ද, අප පිරිවෙණෙහි ආචාර්‍ය්‍ය වූ පණ්ඩිත **බ්‍රූස්සේ රෙවත, අම්බලම්ගොඩ සුමඞ්ගල** ස්ථවිර දෙනම හා ප්‍රාචීනභාෂාවිෂයයෙහි අපගේ ශිෂ්‍ය වූ **ශාස්ත්‍රාචාර්‍ය්‍ය ඇස්. කේ. නෙත්තානන්ද, ශාස්ත්‍රාචාර්‍ය්‍ය ඒ. ජේ. ද සිල්වා** යන මහත්වරු එම පෙළපොත අන් පෙළපොත් හා සසඳා බැලීමෙන් ද, **අම්බලම්ගොඩ සොරතසිරි, අම්බලම්ගොඩ කවිධජ, වරදිවෙල චන්දරතන, ඉලුක්මුල්ලේ විමලවංස,** යන අසමද් ධර්මාන්තෙවාසිකයෝ ශොධ්‍යපත්‍ර කියවීමෙන් ද, යට කියූ විහාරයන්හි අධිපති නායකස්ථවිරයන් වහන්සේලා පාඨශොධනය සඳහා පුස්කොළපොත් හා බුරුම - සියම් - ඉංග්‍රීසිපොත් දීමෙන් ද, **ලඞ්කාබෞද්ධමණ්ඩලයේ** ප්‍රධාන සම්පාදක ව සිටි සිවිල් නිලධාරී **ආචාර්‍ය්‍ය ආනන්ද ඩබ්ලිව්. පී. ගුරුගේ** මහතා හා වර්තමාන ප්‍රධාන සම්පාදක ලේඛක සිවිල් නිලධාරී **වින්සන්ට් පණ්ඩිත** මහතා ද සහකාර සම්පාදක **ඇම්. ඇන්. පීරිස්** මුදලිතුමන් හා ලෙඛක **ඩී. ඒ. කේ. ඩබ්ලිව්. ගුණවර්ධන** මහතා ද, මෙහි කෙළවර වහා දකිනු කැමැත්තෙන් මට උපකාර කළහ. මෙසේ මේ හැම දෙනකුන් කළ ඒ නො මඳ උපකාර මේ පොත ත්‍රිපිටකපරිවර්තනකාරකසභාවෙන් නිකුත් වන සිංහල ත්‍රිපිටක-ග්‍රන්ථමාලාවේ ප්‍රථමපුස්තකය වශයෙන් බෞද්ධමහාජනයා අතට පමුණුවා-ලීමට උපෂ්ටම්භක වූ බව කෘතවෙදී ව මෙහි සඳහන් කරමු.

**ආශීර්වාදය**

**මහවග** පිළිබඳ පරිවර්තනකාර්‍ය්‍යයෙන් නිස්තාරණයට මෙසේ අපට උපකාර කළ නායකස්වාමීන්ද්‍රයන් වහන්සේලා ප්‍රධාන කොට ඇති හැමදෙනකුන් කෙරෙහි අපගේ හෘදයඞ්ගමශුභාශීර්වාදය පිරිණමත අතර ලඞ්කාබෞද්ධ-මණ්ඩලයේ බුද්ධජයන්තිඋත්සව කටයුතු සඳහා නොයෙක් ලෙසින් උපකාර කළ සියලු පින්වතුනට ද මේ මහාධර්මදානයෙහි පින් ලැබේවා.

තවද ලඞ්කාබෞද්ධමණ්ඩලයේ **මධ්‍යවිධායකසභාවේ** මහතුන් හා අකුරල ශ්‍රී විජයාරාමවිහාරවාසී **අකුරල විමලදස්සි** සථවිරතැනගේ මෙහෙයීමෙන් මේ පරිවර්තන කාර්‍ය්‍යයෙහි ලා අප කෙරෙහි ගෞරවාදර හා සැලකුම් දැක්වූ **අකුරල ගම්කාර්‍ය්‍ය සභාවේ** මහතුන් ද **අම්බලම්ගොඩ සුනන්දාරාමමහාවිහාරකාර්‍ය්‍යසාධකසභාවේ** මහතුන් ද කුළුණු සිතින් සිහිපත් කරමු.

**අයැදුම**

මෙහි අපගේ අනවධානයෙන් යෙදුනු සාවද්‍යස්ථාන ඇති විය හැක්කේ ය. ඒ අරුමයෙක් නො වේ. සාවද්‍යස්ථාන නො වෙත් නම් එය අරුම ය. එ හෙයින් එබඳු තැන් දක්නා ධර්මවිනයාර්ථවේදීහු සමාධානයෙන් යථාර්ථ ග්‍රහණය කෙරෙත්වා යනු අපගේ ආයාචනය යි.

**ස්තුතිය**

මෙසේ අපට උපකාර කළ හැම කෙනකුන්ට හා මෙහි මුද්‍රණකාර්‍ය්‍යය සිත් ගන්නා පරිදි මැනවින් අවසන් කළ **කොළඹ මහාබෝධි** මුද්‍රණාලයයේ පරීක්ෂක මහතුන්ට ද අක්ෂර යොජක මණ්ඩලයට හා මහාබොධි සමාගමේ **පාලකමණ්ඩලයට** ද අපගේ හෘද්‍ගතපවිත්‍රස්තුතිය ප්‍රකාශ කරණ අතර **ලඞ්කා** මහාබොධිසමාගම පිහිටු වූ **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා** ද මෙහි දී ගෞරවයෙන් හා ආදරයෙන් සිහිපත් කරමු.

මීට:

**අම්බලම්ගොඩ ධම්මකුසල.**

ශ්‍රී බුද්ධවර්ෂ: 2501 } අම්බලම්ගොඩ ශාසනෝදය පිරිවෙන්හි දී ය.
(ක්‍රි: වර්ෂ: 1957).

# ප්‍රස්තාවනා

## බුද්ධශාසනය

**ද**ඹදිව මධ්‍යදෙශයෙහි (උත්තරභාරතයට අයත්) හිමාලයපර්වත ප්‍රාන්තයෙහි සාධුජනනිකේතනයක් වූ ශාක්‍යජනපදයෙහි **කපිලාදි** මහර්ෂීන්ගේ වාසභූමි වූ **කපිලවාස්තු**නගරයෙහි උභයකුලපරිශුද්ධ **ශුද්ධොදන** ශාක්‍යරාජයාගේ අගමෙහෙසි වූ **මහාමායා** දේවිය කුස පිළිසඳ ගත් අප මහබෝසතාණෝ **වික්‍රමපූර්ව 566** වන වර්ෂයෙහි[1] වෙසක්පුන්පොහෝදින **ලුම්බිනී** නම් සාලවනොද්‍යානයෙහි දී මවුකුසින් බිහි වූහ.

උපන් කෙණෙහි "මම ලොවට අග්‍රයෙමි. ජ්‍යෙෂ්ඨයෙමි. ශ්‍රෙෂ්ඨයෙමි. මේ අන්තිම ජාතිය යි. මතු පුනර්භවයෙක් නැතැ"යි බුදු ව නිවන් පසක් කරණ බව හඟවා පැවැත්වූ අභීතනාදයෙන් දෙව්මිනිසුන් විස්මයට පැමිණවූ පාරමීගුණවිභූතියෙන් හා මහාපුරුෂලක්ෂණයන්ගෙන් ද ශොභාසම්පන්න වූ ළදරු බුදුකුරු මහතාණෝ **අසිතර්ෂි** ආදි මහතීයසත්ත්වයන්ගෙන් අභිවාදන ලබමින් සර්වාර්ථසිද්ධිකර හෙයින් **සිද්ධාර්ථ** නම් ව රාජකුලොපග **විශ්වාමිත්‍රා** දි බ්‍රාහ්මණගුරුන්ගේ ආශ්‍රයයෙන් කුලවංශානුරූප වූ ශිල්පශාස්ත්‍රයන් ප්‍රගුණ කරමින් සොළොස් හැවිරිදි වයසට පැමිණියෝ ය.

අභිනීහාරසම්පන්න වූ මහතාණෝ කුලසන්තානය සඳහා දාරපරිග්‍රහණය මනුධර්මයක් බැවින් **දෙව්දහනුවර** **සුප්‍රබුද්ධ**ශාක්‍යරාජදුහිතෘ වූ **බිම්බා** යන අපරනාමයක් ද ඇති **යශොධරා**දේවිය අගබිසොවුන් කොට ගෙණ තුන් ඍතුවට යොග්‍ය වූ රම්‍ය, සුරම්‍ය, ශුභ නම් වූ ප්‍රාසාදයන්හි සුඛොපභොගසම්පත්තියෙන් ආඪ්‍ය ව වුසූ නමුදු කාමාදීනව දැක එහි කලකිරී වි: පූ: 537 වන වර්ෂයෙහි ඇසළපුන්පොහෝදා **රාහුල**පුත්‍රයා උපන් බව අසා පුත්‍රප්‍රෙමයෙහි කිඳී නො ගොස් "මෙ ද මහත් බන්ධනයෙක. වැඩී ගියොත් බාධාවෙක. පුතනුවන්ගේ හා දේවියගේ සුඛජීවනයට නො මඳ රාජසම්පත් ඇත. නැති මොක්ෂසම්පත් ලබා ගෙණ වුත් දෙමැ" යි සිතමින් එදින ම රාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණය කළහ.

නිරුත්තරශාන්තපදය සොයමින් ගිහිගෙන් නික්ම තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ ආදිත්‍යබන්ධු වූ මහාසත්ත්වයෝ ධර්මාරණ්‍යාදි තපොවනයන්හි විසූ **භාර්ගවාදි** තවුසන් වෙත එළඹ ඔවුන්ගේ ආගමසමය හා ශරීරතාපනාදි පිළිවෙත් ද දැන එය තමන් සොයන මග[2] නොවන බැවින් අත්හැර ලා ක්‍රමයෙන් **රජගහනුවරට** පැමිණ **පාණ්ඩව** පර්වතයෙහි නැවතී **බිම්බිසාර** රජු විසින් පැවරූ රාජ්‍යසම්පත් ප්‍රතික්ෂෙප කොට මොක්ෂමාර්ගය ම සොයමින් **මගධ**යෙහි හැසුරුණෝ ය.

---

1. වික්‍රමවර්ෂය ආරම්භ වූයේ ක්‍රිස්තු පූර්ව 58 වැන්නෙහි ය. වි. පූ. 566 වන වර්ෂය ක්‍රි. පූ. 624 වන වර්ෂය වේ. මෙය වර්තමාන ක්‍රිස්තුවර්ෂයට එකතු වීමෙන් 2581 ක් වෙයි. මෙය ලක්දිව ව්‍යවහාර වන බුද්ධවර්ෂයට සරිලයි. ඒ අනු ව මිට වර්ෂ 2580 කට පෙර බුදුරජාණන් වහන්සේ උපන් සේක. බුද්ධජන්මවර්ෂය ක්‍රි. පූ. 563 වන වර්ෂය යි යුරෝපීය පඬුවෝ කියති.

2. "යත්‍ර සර්වං න භවතෙ, යත්‍ර සර්වං නිරුද්ධ්‍යතෙ, යත්‍රොපශාම්‍යතෙ සර්වං, තත්පදං ප්‍රාර්ථයාම්‍යහං" = යම් තැනෙක කිසිවක් නො වේ ද, යම් තැනෙක සියල්ල නිරුද්ධ වේ ද, යම් තැනක සියල්ල සන්හිඳේ ද, මම ඒ ශාන්තපදය සොයමි" යි කියමින් මහසතාණෝ ඒ තවුසන් හැර ගියහ. මහාවස්තු ii. 197.

එකල මගධයෙහි නානාලබ්ධි, නානාදර්ශන උගන්වන ශාස්තෘසම්මත ගණාචාර්ය වූ බ්‍රාහ්මණ - තාපස - පරිව්‍රාජකයෝ බොහෝ වූහ. **අට්ටක** (**අෂ්ටක**), **වාමක**, **වාමදේව**, **භගු** ආදී[1] පුරාණ වේදකර්තෘ වූ දශමහාඍෂීන්ගේ පරම්පරාවෙන් පැවත ආ ඇතැම් බ්‍රාහ්මණයෝ ඒ පෞරාණික ත්‍රිවේදය පෙරළා ඍෂිවචනයට විරුද්ධ වූ, සත්ත්වඝාතනාදියෙන් දූෂිත වූ, යාගහෝමාදිය ස්වර්ගමාර්ගය යි උගැන්වූහ.

පෙර රජුන් අතර - සස්සමේධය (ශස්‍යසම්පාදනයෙහි නුවණැති බව), පුරිසමේධය (රාජපුරුෂයන්ට සමසක වැටුප් එක් වර දෙමින් සංග්‍රහ කිරීම), සම්මාපාසය (දිළිඳු මිනිසුන්ට පොළී නැතිව දහස දෙදහස බැගින් ධනය නයට දීම), වාචපෙය්‍යය (ප්‍රියවචනයෙන් ජනයා සතුටු කිරීම), නිරග්ගළය (මෙකී සිවු සඟරාවතින් රටවැසියා සතුටු කොට එයින් ම සුරක්ෂිත වූ අගුල් - ආරක්ෂාවිධාන නැති රට පාලනය කිරීම) යන ධර්ම පසෙක් පැවැත්තේ ය.[2] ඇතැම් අධාර්මික බ්‍රාහ්මණයෝ මේ ධර්ම "අස්සමේධ, පුරිසමේධ, සම්මාපාස, වාචපෙය්‍ය (වාජපෙය්‍ය), නිරග්ගළ" යන නමින් යාගකර්ම ලෙස දක්වමින් අශ්වපුරුෂ ආදි දහස් ගණන් සතුන් යාගකණුවල බැඳ මරමින් එය මෙලොව පරලොව සැප ලැබීමට කළ යුතු මහාපුණ්‍යකර්මය යි මිනිසුන්ට උගැන්වූහ.

සත්පුරුෂ බ්‍රාහ්මණයෝ-

"වෘක්ෂාන් ඡිත්වා පශූන් හත්වා කෘත්වා රුධිරකර්දමම්,
යද්‍යේවං ගම්‍යතේ ස්වර්ගෝ නරකඃ කේන ගම්‍යතේ".[3]

ගස් කපා තිරිසනුන් මරා බිම ලේයින් මඩ කොට කරණ යාගයන්ගෙන් ස්වර්ගයට යන්නේ නම්, නරකයට යන්නේ කුමකින් ද?" යන අදීන් දක්වනලද පරිදි යාගනිග්‍රහ කෙරෙමින් දුඃඛනිවෘත්තිය සඳහා භාවනා තපස්ආදි සාධුයෝගයෙහි යෙදුනාහ.

මහාකාරුණික වූ බෝධිසත්ත්වයෝ මගධයෙහි පැවති අශුද්ධධර්මයන් කෙරෙහි කලකිරෙමින් පෞරාණික සිද්ධමුනි වූ **කපිලර්ෂීන්** විසින් ප්‍රණීත ප්‍රකෘතිපුරුෂාදි පඤ්චවිංශත්තත්ත්වපදාර්ථයෙන් බැඳුනු **සාංඛ්‍ය**ප්‍රවචනයෙහි ප්‍රවීණයෙකැ යි කියනු ලබන පඤ්චාභිඥ සප්තසමාපත්තිලාභී **ආළාර** (ආරාඩ) **කාලාම**[4] නම් වූ තවුසානන් වෙත ගොස් ඔහුගේ සමය විචාරා ඔහු විසින් අධිගත **ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය** තමනුත් උපදවා තදනුගතධර්ම විමසීමෙන් එහි බාහිරලෝකය පිළිබඳ විඥානවිෂය වූ අරමුණු ගැටුමක්

1. සුමඞ්ගලවිලාසිනී, අම්බට්ඨසුත්තවණ්ණනා. 2. අඞ්ගුත්තරට්ඨකථා, 8. 1. 1.
3. සාංඛ්‍යකාරිකා, මාඨරවෘත්තිටීකා.
4. බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට වැඩි දවසක භරණ්ඩුකාලාමගේ අසපුවෙහි රැය ගත කළ සේක. භරණ්ඩුකාලාම බුදුරජාණන් වහන්සේගේ සබ්‍රහ්මචාරී වශයෙන් අඳුන්වන ලද්දේ ය. ආළාරකාලාමගේ අසපුවෙහි බෝසතාණන් විසූ කල භරණ්ඩු එහි විසී ය. එහෙයින් සබ්‍රහ්මචාරී යයි කියන ලදී. අඞ්ගුත්තර නි. තික - භරණ්ඩුවග්ග.
ආළාර කාලාමගේ ශ්‍රාවකයෙක් වූ පුක්කුසමල්ල තෙමේ ආළාරකාලාමයන් කුසිනාරා - පාවා නගර අතර වූ මහමග අසල සමාපත්තියෙන් සිටි කල ලඟින් ගිය ගැල් පන්සියය නො දුටු බවත් ශබ්දය හෝ නො ඇසූ බවත් කියමින් ඔහුගේ සමාපත්තිලාභය බුදුරජාණන් වහන්සේට වර්ණනා කොට කියයි. දීඝනි, මහාපරිනිබ්බාණ සුත්ත.
ආළාරකාලාම වෛශාලී නගරයෙහි වුසූ බව මහාවස්තුව කියයි. ලලිතවිස්තරය ද එසේ කියයි. පිටුව 238.

Free Distribution www.aathaapi.org

නැතත් විඥනා අසම්භා(මම වෙමි යි යන ආත්ම) දෘෂ්ටිගත භවතිෂ්ණාවාති-යෙන් බැඳුනු හෙයින් ද, ආස්‍රව සහිත වීමෙන් ගුණාත්මක වූ තද්විඥනය කාර්‍යකාරණසම්බන්ධයෙන් නැවත පෙරළෙන බව දැන එය මොක්ෂයට මාර්ගය නො වේ ය යි අත්හැර බැහැර ගියහ.

ඉක්බිති කිංකුසලගවෙසී වූ මහසතානෝ සාංඛ්‍යදර්ශනයෙහි හා වෛශෙෂිකදර්ශනයෙහි ද පාරප්‍රාප්ත වූවෙකැ යි කියනු ලබන **උද්දක (රුද්‍රක) රාමපුත්‍ර**[1] නම් වූ තවුසා වෙත පැමිණ ඔහු විසින් අධිගතඅෂ්ටම සමාපත්තිය වූ **නෛවසංඥානාසංඥායතනය** තුමූත් උපදවා ගත්හ. එහි කාර්‍යක්ෂම වූ පටුසංඥාවක් නැතත් අනුභූතවශයෙන් පවත්නා මන්දසංඥා ඇති හෙයින් තදාශ්‍රිතචිත්තචෛතසික ආස්‍රව සහිත බවත්, ඒ සමාපත්තිය (යොගනිෂ්ඨාව වූ මොක්ෂය යි බාහිරයොගීන් විසින් සලකනු ලබන) භවාග්‍රයෙහි ඉපැදීමට හෙතු වන භවපර්‍යාපන්නධර්මයක් බැවින් කාලාන්තර-යෙහි නැවත භවයට ම ඇතුළත් වන බවත් සලකා එය මොක්ෂමාර්ගය නො වේ ය යි එ ද අත්හැර **ගයා** පෙදෙසේ **සෙනානි** නම් නියම්ගම **නෙරඤ්ජනා** (නෛරඤ්ජනා) ගඟබඩ පිහිටි පෞරාණික තපොවනයක් වූ **උරුවෙලාවට** (උරුබිල්වා වනයට) ගොස් තපස් කරණුවන්ට මේ සුදුසු තැනැ යි සිතා එහි නැවතුනහ.

එහි දී – “අමු නො වූ තෙත සිඳුනු දිඹුල්දරකඩ ගිනි ගානා දඬුවෙන් මැදීමෙන් හෝ අත් වියළි ලීකඩක ගැටීමෙන් හෝ ගිනි ඉපදවිය හෙන්නාක් මෙන් වස්තුකාමක්ලෙශකාමයෙන් තොර වූවෝ ම ආත්මතාපනාදි උපක්‍රම-යෙන් දුක් විඳීමෙන් හෝ නො විඳීමෙන් සම්බොධියට පැමිණිය හෙන්නෝ ය. මම **කාමයෙන්** ද කාමාශාවෙන් ද තොර වූයෙමි. ආත්මතාපනය බොධියට මාර්ගය වේ නම් ඊට මම සුදුසු වෙමි. වැලි, ‘**දුක්ඛෙන ඛො සුඛං අධිගන්තබ්බං** – දුකෙන් සැප ලැබිය යුතු ය’ යි සිතන ලොකයාට පිළිතුරු දෙමි. සෙසු කවරකුටත් කරණු තබා සිතන්නට ද නො හැකි ප්‍රදහන වීර්‍ය කිරීමෙන් දෙව්මිනිසුන් සතුටු කරමි. ප්‍රදහනවීර්‍යය කරණුවන්ගෙන් අග්‍ර වෙමි” යි මෙසේ සිතූ ශාක්‍යසිංහ වූ මහබෝසතානෝ ආත්මක්ලමථයෙහි යෙදුනාහ.

අසල්ගම්හි සිඟීමෙන් හා ගම්වැසියන්ගෙන් ලද දෙයකින් යැපෙමින් තමන් සමග වුසූ පස්වගතවුසන්[2] සිය කැමත්තෙන් කරණ උවටැන් ඉවසමින් පිරිවෙන්හි ද, රුක්මුල් වනලැහැබ් සොහොන් එළිමහන්හි ද, අව් වැසි සීතසුළං නො සලකා වෙසෙමින් කුසල් සිතින් අකුශලවිතර්ක මඩිනු සඳහා වැයම් කළ මහතානන්ට දරුණු වූ කායික වෙදනා උපන. එහෙත් වීර්‍යය නො සැඟැවුනේ ය. බෝසත්හු වඩවඩා ධෛර්‍යවත් වූහු ම ය. සිහිය මුළා නො වූයේ ඉදිරියෙහි ම එළෙඹ සිටියේ ය. කාය මුත් සිත නො පෙළුනේ ය.

---

1. උද්දක තෙමේ ස්වකීය පියා වූ රාමගේ ශිෂ්‍යයා වේ. හෙතෙමේ “පස්සං න පස්සති” යි කියමින් මහාජනයාට තමන් සියල්ල දන්නා බව අඟවයි. පාසාදිකසුත්ත, දීඝ නි. එළෙය්‍ය රජු හා රජුගේ යහළු යමක, මොග්ගල්ල ආදීහුත් ශ්‍රමණ රාමපුත්‍ර (උද්දක) කෙරෙහි අතිශයින් පැහැදී සිටි බවත් ඔහු පණ්ඩිතයෙකු බවත් කියමින් වස්සකාර බ්‍රාහ්මණ තෙමේ රාමපුත්‍රයාහට ප්‍රශංසා කෙරෙයි. අ. නි. චතුක්ක-යොධාජීවවග්ග, සූත්‍රය 7. උද්‍රක තෙමේ ධ්‍යානලාභී තාපසයෙකි. මහීගඟබඩ වනාශ්‍රමයක විසී ය. චීනවාතී.

2. බෝසතානන් රුද්‍රකාශ්‍රමයෙන් පිටත් වෙද්දී එහි විසූ පස්වග තවුසන් උන්වහන්සේ සමග ගයාශීර්ෂයට ගොස් එයින් උරුවෙලාවට ගොස් බෝසතානන් සමග තපස් කළ බව ලලිතවිස්තරය කියයි. පිටුව 245. එහි “භද්‍රවර්ගීය” යි සඳහන් වේ.

මෙසේ කල් යැවූ මුනිඳු වූ මහතාණෝ කිසිවකු විසින් නො කළ විරූ ආශ්වාසප්‍රශ්වාසනිරෝධය වූ **අප්පාණක** (අප්‍රාණක) ධ්‍යානයෙහි[1] යෙදුණෝ ය. නැහැයෙන් හෝ මුවින් හුස්ම ගැණීම හෙළීම වැළකීමෙන් ඇතුළෙහි වූ වාතය කන්සිදුරින් නික්මෙනුයේ කම්බුරුකම්හලයකින් නික්මෙන්නාක් මෙන් ශබ්දසහිත වී ය. කන්සිදුරු ද වැසූ කල අධිකවාතයෝ උලෙකින් විදින්නාක් මෙන් හිස පෙළූහ. වරපට බැඳුමකින් වෙළන කල්හි මෙන් හිස්වේදනාව දරුණු වී ය. තියුණුසැතකින් කපන කලෙක මෙන් කුසවේදනා කටුක වී ය. දිලියෙන ගිනිඅඟුරුවලක හෙළූ කලෙක මෙන් අධිකදැහය සිරුර දැවී ය. එසින් නොයෙක් වර මුසපත් වූ ද මහතාණෝ ඒ අප්‍රාණකධ්‍යානයෙහි නැවත නැවතත් යෙදුණෝ ය.

ඉක්බිති මහාපුරුෂතෙමේ ශරීරතාපනය සඳහා අල්පාහාරතායෙහි යෙදුනේ රුක්පල, ඇට, උඳුමුංයුස, තණසහල් ආදියෙන් අල්පමාත්‍රයක් ම අහර කොට ගණිමින් එද දිනගණන් නො ගණිමින් උග්‍රතපස් කරන්නේ අතිශයින් වැරුණු සිරුරු ඇත්තේ වී ය.

මෙසේ උරුවෙල්දනව්වෙහි සාවුරුද්දක් නොයෙක් ක්‍රමයෙන් දුෂ්කර ක්‍රියා කළ බෝසතානන්ගේ සිත එක් ක්‍රමයෙකිනුදු කෙලෙසුන්ගෙන් නො මිදුනේ ය. ඉක්බිති මහතාණෝ සත්‍යානුසාරී ව ගත වූ කාලය බලමින් තමන් ළදරුකල පිතෘශාක්‍යයන්ගේ වප්මඟුල්දා දඹරුක්සෙවණෙහි පලඟ බැඳ හිඳ ආනාපානසමෘතිභාවනාවෙන් උපදවා ගත් ප්‍රථමධ්‍යානය සිහිපත් කොට එය ම සම්බොධිමාර්ගීය යි සිතා එහි යෙදීමට ශාරීරික දුර්වලත්වය බාධා හෙයින් පිණ්ඩචරියාවෙන් ලත් ප්‍රණීතභොජනයෙන් සිරුර සතපමින් මධ්‍යමප්‍රතිපදාවෙහි යෙදුනෝ ය. ඒ බව දුටු පස්වගතවුසෝ 'ශ්‍රමණගෞතමයෝ ප්‍රධන්වීර්යය හැර සුඛජීවනයට හැරුණෝ ය' යි වරදවා ගෙණ කළකිරී **බරණැසට** ගොස් **ඉසිපතන**තපොවනයෙහි විසූහ.

ධර්මතාවෙන් ම යෙදුනු මේ විවෙකයෙන් හුදකළා වූ බොධිසත්ත්වයෝ අභිමතාර්ථසිද්ධිය ළං වීමෙන් ලද නිරාමිෂප්‍රීතියෙන් ද සිරුර පිණවමින් කීපදවසක් විවේක ගෙණ වෙසක්පුණුපොහෝදා පෙරවරු **සුජාතා** දේවිය දුන් ක්ෂීරපායාසය වළඳා නෙරඤ්ජරා ගංතෙර **භද්‍රසාලවන**යෙහි දිවාවිහරණය කොට පස්වරු **සොත්ථිය** නම් බමුණා - **සොවත්ථික** නම් තණවෙළෙඳා[2] දුන් **කුසතණ** පිළිගෙණ බොධිමණ්ඩයට පැමිණ බෝරුක්මුල කුසතණ සලා ඒ කුශතෘණවජ්‍රාසනයෙහි පර්‍යඞ්කයෙන් වැඩහිඳ සියලු බුදුවරුන්ගේ මූලකර්මස්ථානය වූ ආනාපානසමෘතිභාවනාවෙන් උපදවා ගත් චතුර්ථධ්‍යානය පාදක කොට අතීතාංශඥනය වූ පූර්වේනිවාසානුස්මෘතිඥනය හා වර්තමාන-අනාගතාංශඥනය වූ දිව්‍යචක්ෂුර්ඥනය ද ලැබූහ.

ඒ ධ්‍යානාභිඥගත චිත්තචෛතසිකසංස්කාරයන් උදයව්‍යය විසින් **සම්මර්ශනය** කරමින් අනිත්‍යදර්ශනාදි සියලු විදර්ශනාඥන මුහුකුරුවා මහාබොධිසංඛ්‍යාත ආශ්‍රවක්ෂයකරඥනය සමග පහළ වූ සියලු බුදුගුණයෙන්

---

1. මජ්ඣිම නි. අරියපරියෙසන - මහාසච්චක සූත්‍ර. "ආස්ඵානකම - ආස්ඵානකධ්‍යානය." ලලිතවිස්තර (පිටුව 250.)
2. "යාවසික" = තණකපන්නා. මහාවස්තු, පිටුව 264.
කුශතෘණ ශක්‍රයා විසින් දුන් බව - අවදනකල්පලතා, I. පිටුව 725.

Free Distribution www.aathaapi.org

**ධම්මවිනය** නාමයෙහි – ධම්ම නම් සවභාවයි. විනය නම් හික්මිය යුතු මග යි. මේ අර්ථ දෙකින් "ධම්මවිනය" යි දත යුතු. මෙහි "ධම්ම" ශබ්දයෙන් සතිපට්ඨානාදි බොධිපාක්ෂික ධර්ම ද, සච්චපටිච්චසමුප්පාදාදි සවභාව ධර්ම ද ගැණෙයි. බොධිපාක්ෂිකධර්ම වැඩීමෙන් සවභාවධර්ම ඇති සැටි දැනීමෙන් පිළිපන් පුද්ගලයා අපායාදියෙන් වළකා දරණ හෙයින් ධම්ම වූයේත් ඔහුගේ රාගාදි කෙලශයන් නැසීමෙන් විනය වූයේත් ඒ මැයි යන අර්ථයෙන් "ධම්මවිනය" නම් වේ. තවද, කුශලධර්මයෙන් අකුශලධර්ම නැසීම, දණ්ඩාදියෙන් නො ව ධර්මයෙන් හික්මවීම, ලාභාදිය සඳහා නො ව ධර්මය (නිවරදබව) සඳහා හික්මවීම, සංකෙලශ ධර්මයෙන් විශුද්ධියට පැමිණ වීම, "ධම්මභූත" වූ භාග්‍යවතුන් වහන්සේගේ විනය, සත්ත්වපුද්ගලාදියෙන් තොර වූ සකන්ධධාතුආයතනාදිධර්මයන්හි තත්ත්වාවබොධයට පැමිණවීම, ජාත්‍යාදිසංසාරදුඃඛධර්මයෙන් නිර්වාණසුඛයට පැමිණවීම – යන මේ ආදි අර්ථයෙන් තථාගතසාසනය "ධම්මවිනය" යි කියනු ලැබේ. මෙහි ධම්ම-විනය දෙකක් නො ව කාය්‍යීකාරණ සම්බන්ධයෙන් එකක් බව සැලකිය යුතු.

**බ්‍රහ්මචරිය** ශබ්දයෙන් බ්‍රහ්ම (ශ්‍රෙෂ්ඨ – උතුම්) වූ ප්‍රතිපද්මාර්ගය, බ්‍රහ්ම වූ බුදුරජානන් වහන්සේගේ මාර්ගය, බ්‍රහ්ම වූ නිර්වාණයට පමුණුවන මාර්ගය යන අර්ථ ප්‍රකාශ වෙයි. එය මුල – මැද – අග යහපත් වූ සීලසමාධි ප්‍රඥා යන ත්‍රිවිධශික්ෂාවෙන් යුක්ත වූ පූර්වභාගප්‍රතිපදා ය යි ද, සීලවිසුද්ධි, චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි ආදි සප්තවිශුද්ධියෙන් සැදුම් ලත් අනුපූර්වප්‍රතිපදා-සඞ්ඛ්‍යාත ශාසනමාර්ගබ්‍රහ්මචය්‍යී ය යි ද දත යුතු.

**සාසන** නම් ශීලාදිත්‍රිවිධශික්ෂාවන් පය්‍යීාප්ති වශයෙන් ඉගැන්වීම හා ප්‍රතිපත්ති වශයෙන් පුහුණු කරවීම යි. "මේ කුසල් ය. මේ අකුසල් ය. මේ අර්ථ ය. මේ අනර්ථ ය. මේ කට යුතු. මේ නො කට යුතු" යන ආදියෙන් යථාධර්මයෙහි යථා කාලයෙහි අනුශාසනා කිරීම, අවවාද දීම ආදි අර්ථයෙන් සාසන නම් වේ. දෙශනා වශයෙන් දියුණු වූ සුත්තගෙය්‍යාදි නවාඞ්ගය විෂය කොට ඇති සාසනය දෙව්මිනිසුන්ට ශාස්තෘ වූ තථාගතයන් වහන්සේගේ අනුසාසනය යන අර්ථයෙන් සත්ථුසාසන ය යි ද කියනු ලැබේ. සාසන නාමය ව්‍යවහාරයෙහි බහුලවසයෙන් පවත්නා සර්වසංග්‍රාහකනාමය වේ.

**පාවචන** යනු ප්‍රධාන වූ උතුම් වූ වචනය යි. බුදුරජානන් වහන්සේ විසින් අර්ථයට යොග්‍ය පදයෙන් පදයට යොග්‍ය ව්‍යඤ්ජනයෙන් ශ්‍රොතෘ-ජනයාට යථාර්ථාවබොධය වන පරිදි සිතින් සිතා දෙශනා කරණ ලද පය්‍යීාප්ති නම් වූ පාලිධර්මය එයින් ප්‍රකාශ වේ. එය දෙශනා විෂය වූ ධර්මනිරුක්තිය යි. එයින් ත්‍රිවිධ ශාසනය ම ප්‍රකාශ වේ. එය ශාස්තෘන් වහන්සේගේ ධර්මවචනය* යන අර්ථයෙන් සත්ථුපාවචනය යි දත යුතු.

මෙසේ එකිනෙකට සම්බන්ධ වූ විවිධනාමයෙන් අදුන්වන ලද ශාස-නය ප්‍රථමබොධියෙන් (බුද්ධත්වයෙන්) විසි වසකට පසු භික්ෂුභික්ෂුණීන්ගේ කායවාක්සංවරය හා ආචාරසම්පත්තිය සඳහා විනයශික්ෂාපද පැණවූ තැන් පටන් "ධර්මය", "විනය" ය යි විභාගවශයෙන් දෙකෙක් වි ය.

---

* 'පාවචන' යන තන්හි ආදියෙහි යෙදුනු 'පා' ශබ්දය "පාලනාච්ච ත්‍රයීධර්මඃ පාශබ්දෙන නිගද්‍යතෙ" යනු හෙයින් මුල දී වෙදත්‍රයධර්මවාචී වී ය. දැන් 'පාවචන' යන්නෙහි අර්ථය නම් „ධර්මවචනය' යනු යි.

එහෙයින් වදාළහ: “යො බො ආනන්ද, මයා **ධම්මො ච විනයො** ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා” – “ආනන්දය, මවිසින් යම් ධර්මයක් දෙසන ලද ද, පණවන ලද ද, යම් විනයක් දෙසන ලද ද, පණවන ලද ද, ඒ ධර්මවිනය මා ඇවෑමෙන් තොපට ශාස්තෘ වන්නේ ය”.

පරිනිර්වාණසමයෙහි ශාස්තෘවියොගයෙන් වැලපෙන ශ්‍රාවකයන් සනහමින් වදාළ මේ වචනයෙන් “මා එක ශාස්තෘවරයෙකු පිරිනිවියත් මා විසින් පන්සාළිස්වසක් තුළ දෙශනා කොට තැබූ ධර්මවිනය දෙකට අයත් අසූසාරදහසක් වූ ධර්මස්කන්ධය මා ඇවෑමෙන් ජීවමාන වූ බුදුවරුන් අසූසාරදහසක් මෙන් පන්දහසක් අවුරුදු දෙවියන් සහිත ලොකයාට අනුශාසනා කරන්නේ ය” යි අඟවා වදාළ සේක. එබැවින් ධර්මවිනය දෙක නිරුපද්‍රැත ව පවත්නා තෙක් ශාස්තෘශාසනය ද නිරුපද්‍රැත ව පවත්නේ ය.

## ධර්මවිනය බෙදීම

ශාක්‍යසිංහ ගෞතම තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ අභිසම්බොධියෙහි පටන් නොයෙක් තැන්හි නොයෙක් ජනයන්ගේ චරිතාධිමුක්ති බලා ඒ ඒ චරිතයන්ට අනුලොම් වන සේ නිර්වාණමාර්ගය සම්පාදනය කරමින් අනුශාසනා – ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් දෙශනා කරණ ලද ධර්මවිනය සඞ්ඛ්‍යාත ශාසනය බුද්ධකාලයෙහි ම මතාන්තර සංකලනයෙන් තොර ව චිරස්ථායී වන පරිදි කොටස් වශයෙන් බෙදා සංග්‍රහ කොට මේ නෛර්‍යාණික බුද්ධවචනය යි තථාගතශ්‍රාවකයන් විසින් සම්මත කරණලදී.

බුදුරජාණන්වහන්සේ ධරමාන කාලයෙහි ම උන්වහන්සේ වෙත පැවිදි ව සිටි **දෙවදත්ත, සුනක්ඛත්ත, අරිට්ඨ, සාති**[1] ආදි භික්ෂූන් විසින් ධර්මවිනය පිළිබඳ මතභෙද ඇති කොට විවාදාපන්න වූ අවස්ථාවන්හි උන්වහන්සේ විසින් ද ශාරිපුත්‍රාදි මහාශ්‍රාවකයන් විසින් ද භික්ෂු සඞ්ඝයා ඉදිරියෙහි ඒ විවිධමත නිරාකරණය කරමින් යථාධර්ම යථාවිනය වශයෙන් ශාසනය පිරිසිදු කොට එහි පාළිය ද ධර්මය ද සුදුසු පරිදි සංග්‍රහ කරණ ලද බව ඒ ඒ සූත්‍රයන්හි දක්නා ලැබේ.

බුදුරජාණන්වහන්සේ විසින් ම ධර්මවිනය පාලිධර්ම වශයෙන් “ඉධ පන භික්ඛවෙ එකච්චෙ කුලපුත්තා, ධම්මං පරියාපුණන්ති: සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථං, උදානං, ඉතිවුත්තකං, ජාතකං, අබ්භුතධම්මං, වෙදල්ලං”[2] යි දෙශනාස්වරූපවශයෙන් හා විෂයවශයෙන් ද අඞ්ග (කොටස්) නවයකට බෙදා තිබේ. එහි සූත්‍රයට පාවචන වශයෙන් අභිධර්ම සහිත සියලු බුද්ධවචනත්, වෙය්‍යාකරණයට දෙශනාස්වරූප වශයෙන් අභිධර්මයත් ඇතුළත් වන බව අර්ථකථාවන්හි දක්වේ. ධර්මයෙහි අභිධර්මයත් විනයයෙහි අභිවිනයයත් ධර්මාතිරෙක-විනයාතිරෙකාදි වශයෙන් ඇතුළත් වන බව පහත දැක්වෙන නිදර්ශනයන්ගෙන් පැහැදිලි වේ.

---

1 දෙවදත්ත ගැණ – පංචවස්තුයාචනාකථා, චුල්ලවග්ගපාළි, සඞ්ඝභෙදක්ඛන්ධක; සුනක්ඛත්ත ගැණ – දීඝ නි. පාථිකසුත්ත; මජ්ඣිම නි. මහාසීහනාදසුත්ත; අරිට්ඨ ගැණ – අලගද්දූපමසුත්ත; සාති ගැණ – මහාතණ්හාසඞ්ඛයසුත්ත – යන සූත්‍රයන් බැලිය යුතු.

2. ම. නි. අලගද්දූපමසුත්ත; අඞ්ගු. නි. චතුක්ක – භණ්ඩගාමවග්ග, සූත්‍රය 6.
මහායානිකයෝ “සූත්‍රං, ගෙයං, ව්‍යාකරණං, ගාථා, උදානං, නිදානං, අවදානං, ඉතිවෘත්තකං, ජාතකං, වෛපුල්‍යං, අද්භූතධර්මඃ, උපදෙශඃ” යි අඞ්ග දොළසක් ගණිති. මහාව්‍යුත්පත්ති පිටුව 21, ඡෙදය 62. විස්තර සඳහා History of Buddhist Thought by Dr. E. J. Thomas (p p. 276-280) බලනු.

"යෙ වො මයා ධම්මා දෙසිතා, සෙය්‍යථීදං ? චත්තාරො සතිපට්ඨානා... අරියො අට්ඨඞ්ගිකො මග්ගො" යන ආදීන් ධර්මය නම් බොධිපාක්ෂික ධර්ම ය යි ද, "**තත්‍ර සියුං ද්වෙ භික්ඛූ අභිධම්මෙ** නානාවාදා"[1] යන ආදීන් ඒ බොධිපාක්ෂික ධර්මයෙහි අභිධර්මය ඇතුළත් බව ද, "පටිබලො හොති... **අභිධම්මෙ** විනෙතුං. **අභිවිනයෙ** විනෙතුං...."[2] යන ආදීන් (අට්ඨකථා අනු ව) නාමරූපපරිච්ඡේදය අභිධර්ම ය යි ද, සියලු විනය අභිවිනය ය යි ද, "පුන ච පරං භික්ඛවෙ, භික්ඛු ධම්මකාමො හොති..... **අභිධම්මෙ අභිවිනයෙ** උළාර පාමොජ්ජො හොති"[3] ආදීන් සූත්‍රය ධර්මය යි ද, (අට්ඨකථා අනු ව) සප්තප්‍රකරණය අභිධර්ම ය යි ද, උභතොවිභඞ්ගය අභිවිනය ය යි ද දෙශනා කරණ ලදී.

තවද, බුදුරජාණන්වහන්සේ විසින් "ඉධ භික්ඛවෙ භික්ඛූ නිස්සය-සම්පන්නා හොන්ති... ආගතාගමා, ධම්මධරා, විනයධරා, මාතිකාධරා"[4] යන ආදීන් ධම්මවිනය ආගම - ධම්ම - විනය - මාතිකා වසයෙන් බෙදන ලදී. අට්ඨකථාවෙහි 'ආගම' නමින් පංචනිකායය ද, 'ධම්ම" නමින් සුත්තන්ත-පිටකය ද, 'විනය' නමින් විනයපිටකය ද, 'මාතිකා' නමින් අට්ඨකථාවෙහි එක් තැනක (ද්වෙ මාතිකා) උභයමාතෘකා ද, තවත් තැනක (ද්වෙ පාතිමොක්ඛා) උභය පාතිමොක්ඛය ද දැක්වේ. 'විනයධරා' යන තැන විනය ශබ්දයෙන් විනයපිටකය ගැණෙන බැවින් 'මාතිකාධරා' යන මෙහි 'මාතිකා' යනුවෙන් අභිධර්මමාතෘකා[5] ද ගත යුතු සේ හැඟේ. එහෙත් පාතිමොක්ඛය සංගීති තුණට ආරූඪ වූ විනයපිටකයට වෙන් වශයෙන් අයත් ග්‍රන්ථයක් සේ සඳහන් නැති බැවින් මාතිකා නමින් (එනම් වූ) පාතිමොක්ඛය ගතයුතු බව අටුවාවේ අදහස ය යි සිතිය යුතු.

අග්‍රශ්‍රාවක **ශාරිපුත්‍ර** මහරහතුන් වහන්සේ විසින් "ආරඤ්ඤකෙනාවුසො භික්ඛුනා **අභිධම්මෙ අභිවිනයෙ** යොගො කරණීයො"[6] යන ආදීන් අභිධර්මය හා විනයය පාලි - අට්ඨකථා සහිත ව උගත යුතු බව කියන ලදී. "පුන ච පරං ආවුසො භික්ඛූ පියසමුදාහාරො **අභිධම්මෙ අභිවිනයෙ** උළාරපාමොජ්ජො"[7] යන මෙයින් අභිධර්මයෙහි අභිවිනයයෙහි ප්‍රියභාවය බුදුනු වදාළ නාථකරණ ධර්මයෙකැයි දක්වන ලදී.

ද්විතීය අග්‍රශ්‍රාවක **මහාමෞද්ගල්‍යායන** මහරහතුන් වහන්සේ විසින් **මහාගොසිඞ්ග** සූත්‍රයෙහි "ඉධාවුසො සාරිපුත්ත, ද්වෙ භික්ඛූ **අභිධම්මකථං** කථෙන්ති - තෙ අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති"[8] යන ආදීන් අභිධර්මකථා කරණ භික්ෂූනු ගොසිඞ්ගසාලවනය හොබවන බව ප්‍රකාශ කරණ ලදී.

ශාරිපුත්‍ර මහරහතුන් වහන්සේ විසින් පයඞ්ඤපත්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ වශයෙන් ත්‍රිවිධ වූ තථාගතධර්මය පිළිබඳ මාතෘකා පද සංග්‍රහ කොට එක ද්විකත්‍රිකාදි වශයෙන් දසකය තෙක් එක් එක් රාශිය "එකො ආවුසො ධම්මො බහුකාරො, එකො ධම්මො භාවෙතබ්බො, එකො ධම්මො

---

1. ම. නි. උපරිපණ්ණාස, කින්තිසුත්ත  2. මහාවග්ගපාළි - **මහාඛන්ධක**
3. අඞ්ගුත්තර නි. දසක-නාථකරණ වග්ග, සූත්‍ර 7.
4. අඞ්ගු. නි තික - රථකාරවග්ග, සූත්‍ර 10; ඡක්ක - 5 වග්ග, සූත්‍ර 9.
5. "මාතෘකා" නම් අභිධර්මය යි චීන - ටිබැට් බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වේ. Rockhill's Life of the Buddha, (Translation from Dulva - Tibetan Vinaya). p p. 148, 160. ආචාර්ය ඊ. ජේ. තෝමස් මහතා ද මාතිකා අභිධර්මපයහීය බව කියයි. History of Buddhist Thought, P. 266. විසුද්ධිමග්ගටීකා, 117 පිටුව ද බලනු.
6. ම. නි. ගුලිස්සානි සුත්ත  7. දීඝ නි. සංගීති සුත්ත.  8. ම. නි

Free Distribution www.aathaapi.org

පරිඤ්ඤෙය්‍යො'' යන ආදීන් දසආකාරයකින් බෙදූ මාතෘකාපද පන්සිය-පණසක් ඇතුළත් වන **දසුත්තර** සූත්‍රය[1] භික්ෂූන් පන්සියයක් ඉදිරියෙහි වදාරණ ලදී. **භික්ෂූහු** එය ඒකමතික ව පිළිගන්නාහු සූත්‍රාගතධර්මමනසිකාර-යෙන් රහත්වූහ.

එක් සමයක බුදුරජාණන්වහන්සේ ශාරිපුත්‍ර තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් පන්සියයක් සමග **පාවා** නුවර **මල්ලරජුන්**ගේ සන්ථාගාරයෙහි වැඩවසන සේක. ඒ ජෛනශාස්තෘ වූ **නිර්ග්‍රන්ථඥාත** පුත්‍රයන් පාවා නුවර දී කාලගත වූ ළඟ දී ය. ඔහුගේ මරණින් පසු ශ්‍රාවකයෝ ස්වකීය ශාස්තෘවරයාගේ ධර්මය අනෛර්යාණික වූ බැවින් ඔවුන් අතර හටගත් මතභෙද නිසා කලහ කරමින් අසරණ ව බිඳී ගියහ. මේ කරුණ නිදාන කොට ගෙණ **ශාරිපුත්‍ර** මහරහතුන් වහන්සේ භික්ෂූන් අමතා ''අයං ඛො ආවුසො, අම්හාකං භගවතා ධම්මො ස්වාක්ඛාතො **සුප්පවෙදිතො** නිය්‍යානිකො උපසම-සංවත්තනිකො සම්මාසම්බුද්ධප්පවෙදිතො. තත්‍ථ සබ්බෙහෙව සඞ්ගායිතබ්බං, න විවදිතබ්බං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං. තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.'' – ''ඇවැත්නි, මේ අපගේ සම්‍යක්සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වාඛ්‍යාත වූ සුප්‍රවේදිත වූ ධර්මය නෛර්යාණිකය. නිර්වාණ ශාන්තිය පිණිස පවත්නේ ය. එහි හැම දෙනා විසින් ම ඒකමතික ව එකතු ව ගැයිය යුතු ය. විවාද නො කට යුතු ය. එයින් බ්‍රහ්මචර්‍ය්‍යශාසනය කල් පවත්නේ ය. චිරස්ථායී වන්නේ ය'' යි මෙසේ වදාරමින් ත්‍රිපිටකය අල්ලා ගෙණ සියලු ධර්මයන් ඒකද්විකත්‍රිකාදි රාසි වසයෙන් දසකය තෙක් සංග්‍රහ කොට ඉහත කී වාක්‍යය හා සම්බන්ධ කරමින් සංගීති සූත්‍රය දෙශනා කළහ. ප්‍රශ්න එක්දහස්තුදුසකින් සංගෘහිත වූ මේ **සංගීති** පර්‍ය්‍යාය (සාමග්‍රී රස) දෙශනාව ''සාධු, සාධු, සාරිපුත්ත, සාධු ඛො ත්වං සාරිපුත්ත, භික්ඛූනං සංගීතිපරියායං අභාසි''යි වදාරා බුදුරජාණන් වහන්සේ විසින් සාධු-වාදයෙන් අනුමත කරණ ලදී. එයින් සූත්‍රය බුද්ධභාෂිත වී ය. ප්‍රමුදිත වූ ඒ භික්ෂූහු ද සූත්‍රාගතධර්මමනසිකාරයෙන් රහත් වූහ.

මල්අස්නෙක විසිරී පැවැති නානාවර්ණයට අයත් මල් රැසක් ගොතා සංග්‍රහ කරන්නාක් මෙන් ඒ ඒ ශ්‍රාවකයන්ගේ චිත්තසන්තානයෙහි පැවැති සූත්‍රාභිධර්මවිනයට අයත් බ්‍රහ්මචර්‍ය්‍යය චිරස්ථායී වන සේ සංග්‍රහ කරණලද මේ ධ්‍රියමාණසංගීති වූ සංගීති - දසුත්තර සූත්‍ර දෙක ද, යට කී පාලිප්‍රදෙශ ද සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු පවත්වන ලද ධර්මවිනය සඞ්ගායනාවන්ට භූමි වූ බව සැලකිය යුතු.

මේ කරුණු සිත තබා ගෙණ සංගීතිකථා කියවන්නකුට සංගීති හා ත්‍රිපිටකධර්මය -- විශෙෂයෙන් අභිධර්මය ගැණ විවේචන කරන්නාවූ ඇතැම් යුරෝපීයපණ්ඩිතයන් හා ඔවුන් අනුගමනය කරමින් බුද්ධධර්මය විෂය කොට ගෙණ ස්වකීය විමශීන බුද්ධිප්‍රභා ප්‍රකට කරගණු කැමැති ඇතැම් නවීන පණ්ඩිතයන් විසින් ද නගන ප්‍රශ්නයන්ට ඔවුන්ගේ අවධානය යොමු වීමට තරම් වූ ද පිළිතුරක් ලැබේ ය යි සිතමු..

1. දීඝ නි, සූත්‍ර 34.

Free Distribution www.aathaapi.org

# සම්බුද්ධපරිනිර්වාණය

අංගීරස ගෞතම සම්මාසම්බුදුරජාණන් වහන්සේ ස්වකීය ජීවිතයෙහි අසූවැන්න වූ පරිනිර්වාණවර්ෂයෙහි **බේලුව**ගමෙහි වස් එළැඹි සේක. එහි දී ලොහිතපක්ඛන්දිකාරෝගය වැළඳීමෙන් හටගත් මහත් වූ වේදනාව දසමසකට නො නගින ලෙස සමාපත්තිබලයෙන් මැඩගෙණ දසමසෙකින් පිරිනිවීමට ඉටාගත් සේක. වස්අවසන්හි **සැවැත්**නුවරට වැඩ එහි වෙසෙමින්, **සැරියුත්**මහරහතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ගුණ වදාරා ධාතු නිදන් කොට චෛත්‍යයක් කරවා, **රජගහ**නුවරට වැඩ **මුගලන්** මහරහතුන් වහන්සේ පිරිනිවි පසු උන්වහන්සේගේ ද ධාතු නිදන් කොට චෛත්‍යයක් කරවා චාරිකා කරණ සේක් **උක්කචෙලා**-නියම්ගමට වැඩ සැරියුත් මුගලන් දෙනමගේ පිරිනිවීම නිමිති කොට භික්ෂූන්හට දහම් දෙසා **විසාලා**පුරයට වැඩ පිඩු පිණිස හැසිර පස්වරු **චාපාල**චෙතියට පැමිණි සේක.

එහි රුක්මුලෙක වැඩහිඳ අනඳතෙරුන් අමතා “සෘද්ධිපාද වැඩූවහුට කැමැති නම් කල්පයක් (නියතපරමායුෂය) හෝ වැඩියක් ද ජීවත් විය හැකි ය” යි තෙවරක් ම වදාළ සේක. වසවත්මරු බිහිසුණු අරමුණක් දක්වා අනඳතෙරුන්ගේ සිත් මැඩගත් හෙයින් බුදුරජුන්ට “දීර්ඝකාලයක් ජීවත් වන සේක්වා”යි ආයාචනා කිරීමට උන්වහන්සේට සිහි නැති වි ය. අනඳ තෙරුන් බුදුරජුන් වැද විවේකය සඳහා නික්ම ගිය කල්හි පවිටු මාරයා පැමිණ භාග්‍යවතුන් වහන්සේට “දැන් කට යුතු සියල්ල සම්පූර්ණ බැවින් පිරිනිවීමට කාලය” යි දැන්වී ය. බුදුරජාණන් වහන්සේ තුන්මසකින් පිරිනිවන් පානා බව මරුට වදාරා සංස්කාරධර්මස්වභාවය ප්‍රකට කෙරෙමින් ආයුස්සංස්කාරය හළ සේක. පිරිනිවීමට ඉටාගත් සේක. ඉන් පසු අනඳ තෙරණුවෝ පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ “බොහෝ ජනයාට හිතසැප පිණිස (ආයු) කපක් ජීවත් වන සේක්වා” යි තෙවරක් ම ආයාචනා කළහ. “පිරිනිවන් පානා බැව් අඟවද්දීත් ඒ ගැණ සිහි නො කොට මා පිරිනිවීමට ඉටාගත් පසු කරණ ආයාචනාව දැන් පිළිගත නො හැකි ය” යි වදාරා තුන්මසකින් පිරිනිවන් පානාබැව් අනඳතෙරුන්ට ද දැන්වූ සේක. ශොකාවතීර්ණ වූ තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. බුදුරජාණන් වහන්සේ අනඳ-තෙරුන් සනහමින් “මින් පෙරත් රජගහනුවර **ගිජ්ඣකූඵ**පව්වෙහි ද, **ගෞතමනිග්‍රොධ**යෙහි ද, **චොරපපාත**යෙහි ද, **සප්තපර්ණී** ගුහාවෙහි ද, **ඉසිගිලි**පව්වෙහි ද, **සීතවන**යෙහි ද, **තපොදාරාම**යෙහි ද, **වෙළුවන**යෙහි ද, **ජීවකාම්බවන**යෙහි ද, **මද්දකුච්ඡිම්ගදා**යෙහි ද මේ විසල්පුරයෙහි **උදෙන**, **ගොතමක**, **සත්තම්බ**, **බහුපුත්ත**, **සාරන්දද** යන චෛත්‍යයන්හි ද වෙසෙමින් තොප අමතා “සෘද්ධිපාද වැඩූ තථාගතයන්ට කැමැති නම් කපක් හෝ වැඩියක් ජීවත් විය හැකි ය යි අඟවද්දීත් එය දත නො හැකි වීම තොපගේ ම දොස ය (දුක්කටය)”යි වදාරා “සියලු ප්‍රියමනාප දෙයින් වෙන් වන බවත්, එහි වෙන් නො වීමක් නො වන බවත්,උපන් සියල්ල වැනසෙන බවත්, එහි නො වැනසීමක් නො වන බවත් මා විසින් පළමුවෙන් ම ප්‍රකාශ කරණ ලද්දේ නො වේ දැ” යි ධර්මදෙශනා කළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනඳතෙරුන් සමග කූටාගාරසාලාවට වැඩ බණ වදාරා **භණ්ඩගාම**, **හත්ථිගාම**, **අම්බගාම**, **ජම්බුගාම** යන තැන්හි ද බොහෝ සෙයින් සීල-සමාධි-ප්‍රඥා යන ධර්මයන් වදාරා **භොග** නගරයෙහි **ආනන්ද**චෙතියට වැඩි සේක.

එහි දී භාග්‍යවතුන් වහන්සේ ‘මේ ධර්මය, මේ විනය ය, මේ ශාස්තෘශාසනය’ යි යථාර්ථයෙන් අවබොධ කරගැණීම සඳහා බුද්ධාපදෙස, සඞ්ඝාපදෙස, සම්බහුලථෙරාපදෙස, එකථෙරාපදෙස යන සතර මහාපදෙස (ප්‍රමාණයන්) වදාළහ. “මේ කරුණ මම බුදුන්ගෙන් ම දැන ගතිමි” යි යමෙක් කියා නම්, එය සූත්‍ර විනය හා සැසඳූ කල ගැළපේ නම්, බුද්ධවචන වශයෙන් ඒ කරුණෙහි බුදුරජුන් ප්‍රමාණ කොට ගැණීම ‘බුද්ධාපදෙස’ නමි. එසේ ම “සඞ්ඝයාගෙන් දැන ගතිමි. බොහෝ තෙරුන්ගෙන් දැන ගතිමි. එක් තෙරනමකගෙන් දැන ගතිමි” යි යන ආදීන් කියන කරුණ සූත්‍ර විනය හා ගැළපේ නම්, ගැණීම ඒ ඒ අපදෙස නමින් දත යුතු.*

**භොග**නගරයෙන් **පාවා**නුවරට වැඩි භාග්‍යවතුන් වහන්සේ **චුන්ද** නම් කර්මාරපුත්‍රයාගේ අඹඋයනෙහි[1] නැවතුනු සේක. චුන්දකර්මාරපුත්‍රයා ඒ බව දැන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ දහම් අසා පැහැදී කරණ ලද ආරාධනාව පිළිගත් භාග්‍යවතුන් වහන්සේ ඔහු විසින් පිළියෙළ කළ ‘සූකරමද්දව’[2] නම් මෘදු වූ රසායනබෙහෙත්ආහාරය වැළැඳූ ඉක්බිති කලින් වැළඳී තුබුනු රොගාබාධය නැවත උත්සන්න වීමෙන් උපන් බලවත් වෙදනාව සතිසම්පජඤ්ඤයෙන් ඉවසා ගෙණ චුන්දකර්මාරපුත්‍රයා දුන් ඒ ප්‍රණීතභොජනයෙන් ලබන ලද පහසු ඇති ව **කුසිනාරා**නුවර බලා වැඩි සේක.

මග දී කලාන්ත වූ බුදුරජානන් වහන්සේ එක් රුක්මුලෙක වැඩ හිඳ පිපාසා ඇති බව දන්වා ආනන්දතෙරුන්ට පැන් සොයා ගෙණෙන්නට වදාළහ. එහි කුඩා ඔයක තුබූ ජලය කැළඹී මඩ සහිත වූ බැවින් “නුදුරෙහි වූ **කකුධා**[3] නදියෙහි ජලය පිරිසිදු ය. එහි වැඩියොත් පැන් පිය හැකි ය” යි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. එහෙත් බුදුහු “ආනන්දය, පැන් ගෙණෙව” යි තුන්වර තෙක් වදාළහ. තෙරණුවෝ මැනවැයි පාත්‍රය ගෙණ ඒ කුඩා ඔයට නැවත ගොස් බැලූ විට ජලය පිරිසිදු ව තිබෙන බව දැක බුද්ධානුභාවය ගැණ පුදුම වී එයින් පාත්‍රය පුරා පැන් ගෙණවුත් භාග්‍යවතුන් වහන්සේට එපවත් කියා පිළිනැන්වූහ.

---

* මෙහි විනය පිළිබඳ කරුණක් නිශ්චය කිරීමේ දී විනයානුලොම වශයෙන් සූත්‍ර ය යි ගත යුත්තේ විනයදෙශනාවයි. විනය යි ගත යුත්තේ එය රාගාදි විනයට ගැළපේ ද නැද්ද යන කාරණය යි. ධර්මය පිළිබඳ කරුණෙහි ධර්මානුලොම වන පරිදි සූත්‍රය ත්‍රිපිටකය වශයෙනුත් විනය රාගාදි විනයට හේතු වශයෙනුත් ගත යුතු. විස්තර සඳහා දීඝනි. මහාපරිනිබ්බාණසුත්ත, නෙත්තිඅට්ඨකථා-යුත්තිහාරවණ්ණනා ද බැලිය යුතු

සුත්ත, සුත්තානුලොම, ආචරියවාද, අත්තනොමති යන නමින් මෙහි විස්තර සමන්තපාසාදිකා-චතුබ්බිධවිනයකථාවෙහි දැක්වේ. පිටු, 161-168.

1. “ජලූකාමහාවන” ටිබැට් විනය.

2. “සූකරමද්දව” යනු විකිණීමට තුබූ (පවත්තමංස) තරුණ ඌරුමසකින් නැනූ ආහාරයක් බව සමහරු කියති. පස්ගෝරසයුසින් පිසූ ආහාරයකැයි ද කියති. “සූකරමද්දව” නම් රසායනයකි. එය පිළියෙල කොට චුන්ද විසින් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීම නො වේවා යි බෙහෙත් වශයෙන් දුන් බව කියති. (සුමඞ්ගලවිලාසිනී, පිටුව. 395.) සූකරමද්දව නම් ඌරුමස් නො වේ. එය ඌරන් මැඩූ උණකිළිල් හෝ ඌරන් මැඩූ බිම හටගත් හතු හෝ ගෙණ නැනූ රසායනයකැයි ද කියති. (උදානට්ඨකථා, පිටුව. 279.) මෙය ප්‍රණීතආහාරයකැයි ටිබැට්විනයයෙහි සඳහන් බව රොක්හිල් මහතා කියයි.

3. “කුකුත්ථා”, ආනන්ද මෛත්‍රෙය බුද්ධචරිත, පිටුව 323; Spence Hardy, p. 356.

මේ නදිය ටිබැට් පොත්වල “කකුස්ථ” නම් වේ. එය ගණ්ඩකී (ගුන්දක්) නදියේ ශාඛාවක් වූ “කකුත්ථ” නදිය ය යි ද, ගඟ දැනට අභාවයට ගිය නමුත් ගඟ ගිය පාර දැන ගැණීමට ලකුණු පිහිටි ය යි ද කියති. Rockhill's Life of the Buddha, p. 134; note. 1.

ඉක්බිති එහි පැමිණි **පුක්කුස** මල්ලපුත්‍රයාට දහම් දෙසා ඔහු විසින් පිදූ රන්වන් සිනිඳු සළු දෙක පිළිගෙණ කකුධා නදිය වෙත පැමිණ ඇඟ සෝදා ඒ සමීපයෙහි වූ අඹවනයෙහි මඳක් සැතපුනු සේක. එහි දී අනඳතෙරුන් අමතා චුන්දකර්මාරපුත්‍රයා දුන් අන්තිමදානය බුදුවන දා **සුජාතාව** දුන් දානයට සමාන අනුසස් ඇතැයි වදාරා චුන්දයා දුන් දානයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ආබාධය වැඩි වූවා ඒ යන සැකය හා විපිළිසර දුරු කිරීම සඳහා දානානිසංසධර්මදෙශනා කොට මල්ලරාජයන්ගේ (ගණතන්ත්‍ර රාජධානිය වූ) **කුසිනාරා**නුවර **හිරණ්‍යවතී**නදියෙහි පාරිමතීරයෙහි වූ **උපවත්තන** නම් සල්වනයට වැඩි සේක. එහි උතුරුදෙසට හිස ලා යුග්මශාලාන්තරයෙහි පණවනලද පරිනිර්වාණමඤ්චකයෙහි හොත් බුදුරජානන් වහන්සේ "අපගේ ශාස්තෲන් වහන්සේ අද පිරිනිවන් පානාසේකැ"යි එහි රැස් ව වැලපෙන දෙව්මිනිසුන් සහිත ශ්‍රාවකයන්ට ධර්මානුශාසනා කරමින් තමන් වහන්සේ වෙත පැමිණි **සුභද්‍ර** නම් පරිව්‍රාජකයාට දහම් දෙසා පැවිද්ද දෙවා ඔහු රහත්බවට පැමිණවූ සේක. හෙතෙම තථාගතයන් වහන්සේගේ අන්තිමශ්‍රාවකයා වී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ පැසුළුසමයෙහි "යො වො ආනන්ද, මයා **ධම්මො** ච **විනයො** ච දෙසිතො පඤ්ඤත්තො, **සො වො මමච්චයෙන සත්ථා**" – "ආනන්දය, මා විසින් දෙසූ පැණවූ ධර්මය හා විනයය මා ඇවෑමෙන් තොපගේ ශාස්තෲ වන්නේය" යි ද, "ආකඞ්ඛමානො ආනන්ද, සඞ්ඝො මමච්චයෙන **ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනතු**" – "ආනන්දය, ඉදින් සඞ්ඝයා කැමැත්තේ නම්, මා ඇවෑමෙන් ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍රශික්‍ෂාපද බැහැර කෙරේවා" යි ද, "ඡන්නස්ස ආනන්ද, භික්ඛුනො මමච්චයෙන **බ්‍රහ්මදණ්ඩො** දාතබ්බො" – "ආනන්දය, මාගේ ඇවෑමෙන් **ඡන්න** භික්‍ෂුනමට බ්‍රහ්මදණ්ඩය දිය යුතු යැ" යි ද වදාළහ.

ඉක්බිති භුවනප්‍රදීප වූ සම්මාසම්බුදුරජානන් වහන්සේ "හන්ද දානි භික්ඛවෙ, ආමන්තයාමි වො. වයධම්මා සඞ්ඛාරා. **අප්පමාදෙන සම්පාදෙථ**" – "මහණෙනි, සංස්කාරයෝ නැසෙන ස්වභාව ඇත්තෝ ය. අප්‍රමාදයෙන් (සිහියෙන්) යෙදී තොපගේ කටයුතු සම්පාදනය කරගණිවු" යි – "අනෙක ජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං" යන ආදි ප්‍රථමබුද්ධවචනයෙහි පටන් පන්සාළිස් වසක් දෙසූ සියලු ධර්මය "**අප්පමාද**" පදයෙහි ඇතුළත් කොට අන්තිම බුද්ධවචනය වදාරා වි. පූ. 486 වන වර්ෂයෙහි වෙසක්පුන්පොහෝදා අලුයම නිරුපධිශෙෂනිර්වාණයෙන් පිරිනිවි සේක.

## ධර්මවිනයසඞ්ගීති

සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු ධර්මවිනය පිටක-නිකාය-ග්‍රන්ථාදිවශයෙන් සකස් වූයේ මහාකාශ්‍යපාදි මහරහතුන් වහන්සේ විසින් පවත්වන ලද සංගීතිමාර්ගයෙනි. එහි **මහාකස්සපත්ථෙර**සංගීති, **යසත්ථෙර**සංගීති **මොග්ගලිපුත්තතිස්ස**ත්ථෙරසංගීති ය යි දඹදිව පැවැති තුණෙක, පොත්ථක සංගීති, **කුමාරධාතුසෙන**සංගීති ය යි[1] ලක්දිව පැවැති දෙකෙකැයි ථෙරවාදබුද්ධසාසනඉතිහාසයෙහි දක්වෙන සංගීති පසෙක් වේ.

එයින් ප්‍රථමද්විතීයසංගීති චූලවග්ගපාළියෙහි සංක්‍ෂෙපයෙන් ද එහි විස්තර සමග සෙසු සංගීති සිංහලඅට්ඨකථාවෙන් හා ආචාර්‍ය්‍යවාදයෙන් ගෙණ සඞ්ග්‍රහ කරණ ලද පරිච්ඡෙදන් දීපවංස, මහාවංස, බොධිවංස ආදි

1. මහාවංස, පරිච්ඡෙද 40 – පෙල [illegible], 3.

වංසකථාවන්හි ද සුමංගලවිලාසිනී, සමන්තපාසාදිකා, අත්ථසාලිනී ආදි සූත්‍ර විනයාභිධර්මාර්ථකථාවන්හි ද, නිකායසංග්‍රහ, සද්ධර්මරත්නාකර, පූජාවලී ආදි සිංහලග්‍රන්ථයන්හි ද දක්නා ලැබේ.

## 1. ප්‍රථමසඞ්ගීතිනිදානය

මහාකාශ්‍යප මහරහතුන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පන්සියක් රහතුන් විසින් පවත්වන ලද ප්‍රථමසඞ්ගීතිය විනයග්‍රන්ථයක් වූ චුල්ලවග්ග-පාළියෙහි පඤ්චසතිකක්ඛන්ධකයෙහි "**පඤ්චසතිකා විනයසඞ්ගීති**" නමින් දක්නා ලැබේ. මේ සංගීතියෙහි නිදානය හා විෂයය මහාපරිනිර්වාණ සූත්‍රය හා සම්පූර්ණයෙන් සම්බන්ධ වේ. සංගීතිය පිළිබඳ ඓතිහාසික සත්‍ය-තාව පිළිගැනීමටත් ඒ සම්බන්ධයෙන් ඇතැම් විතණ්ඩවාදී[1] රන්ධ්‍රගවෙෂ-කයන් විසින් නගන ප්‍රශ්නයන්ට පිළිතුරු දීමටත් මේ සම්බන්ධය නිරා-කුල සේ දැන ගැනීම ප්‍රයෝජන වෙති යි සිතමු. එබැවින් මහාපරිනිර්වාණ සූත්‍රය හා සම්බන්ධ වන කරුණු චුල්ලවග්ගපාළියෙහි එන පිළිවෙළින් යොදා සංගීතිකථාව අර්ථකථා ද අනුගමනය කෙරෙමින් මතභෙද ද සඳහන් කෙරෙමින් මෙහි සංක්ෂෙපයෙන් දක්වමු.

චුල්ලවග්ගපාළියෙහි "අථ ඛො ආයස්මා මහාකස්සපො භික්ඛූ ආමන්තෙසි-එකල්හි ආයුෂ්මත් මහකසුප්තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ." යන ආදීන් සංගීතිනිදානය ආරම්භ වේ. විනයකථා ආරම්භ වන "තෙන ඛො පන සමයෙන" යන සාමාන්‍යවිධියෙන් නො ව "අථ ඛො" යනුවෙන් දැක්වෙන මේ ආරම්භයෙන් ඉන් පෙර වූ සිද්ධියක් පරාමර්ශනය කරණු ලැබේ. පරිනිර්වාණ-කථාවෙහි දැක්වෙන මේ සිද්ධිය වූයේ **කුසිනාරා** නුවර දී බුද්ධපරිනිර්වාණයෙන් සත්වනදා ය.

සංගීතිනිදානපාළියෙහි දැක්වෙන පරිදි, මහකසුප් මහරහතුන් වහන්සේ පාවානුවර සිට කුසිනාරානුවරට වඩිද්දී උන්වහන්සේ සමග පැමිණි පිරිසෙහි සිටි **සුභද්ද**[2] නම් මහලු පැවිද්දා සම්බුද්ධපරිනිර්වාණය අසා ශාස්තෘවියොගයෙන් වැලපෙන භික්ෂූන් අමතා "අලං ආවුසො, මා සොචිත්ථ. මා පරිදෙවිත්ථ. සුමුත්තා මයං තෙන මහාසමණෙන. උපද්දුතා ච හොම: 'ඉදං වො කප්පති. ඉදං වො න කප්පතී'ති. ඉදානි මයං යං ඉච්ඡිස්සාම, තං කරිස්සාම. යං න ඉච්ඡිස්සාම, න තං කරිස්සාම" යන ආදීන් "ඇවැත්නි, සොක නො කරවු. නො වැලපෙවු. ඒ මහාශ්‍රමණයාගෙන් අපි හොඳින් මිදුනෙමු. 'මේ තොපට කැප ය. මේ නො කැප ය' යි ඔහුගේ නීති පැණවීමෙන් අපි පීඩා වින්දෙමු. දැන් අපි යමක් කැමැත්තෙමු නම්, එය කරන්නෙමු .යමක් නො කැමැත්තෙමු නම්, එය නො කරන්නෙමු"යි කී ය.

අර්ථකථාවෙහි දැක්වෙන පරිදි, මේ වචන ඇසීමෙන් සංවෙගයට පත්, එකල සත්ලක්ෂයක් භික්ෂූන් අතුරෙහි සඞ්ඝස්ථවිර වූ මහකාසුප්මහ-තෙරණුවෝ "මෙබඳු නිර්ලජ්ජශ්‍රමණයන්ගේ පක්ෂබලය වැඩීමෙන් ශාසනය

---

1. විතණ්ඩවාදීහු නම් පිළිගැන්වීමට තරම් වූ ප්‍රමාණයක් හෝ සාධකයක් තමහට නැති ව අනුන් වෙහෙසීමට බොරුවාද කරන්නෝ ය.

2. පරිනිර්වාණකථාවෙහි එන මේ දෙවැනි සුභද්‍ර එහි පළමුවෙන් සඳහන් අන්තිම-තථාගතශ්‍රාවක වූ පරිව්‍රාජක සුභද්‍ර නො වේ. කරනැවැමියෙක් ව සිට මහලුකල පැවිදි වූ හෙයින් වුඩ්ඪපබ්බජිත වූ මේ මහලු සුභද්‍ර ආතුමාගමෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩවිසූ දවසක අකැප සේ පිළියෙල කළ භොජ්ජයාගුවක් (කමින් පිය යුතු තලප කැඳක්) පිළිගැන්වූ කල එය අකැපය යි ප්‍රතික්ෂෙප කොට "මහණෙනි, මහණුන් නො කැප දෙයෙහි සමාදන් නො කරවිය යුතු ය. පෙර කරනැවැමි ව සිට පැවිදි වූවහු විසින් කරබඩු පරිහරණය නො කළ යුතු ය" යි ශික්ෂාපද පැණවීමෙන් තමන්ට වූයේ අලාභයෙක, නින්දාවෙකැයි සිතා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බැඳගත් වෛර ඇත්තේ මේ දුෂ්ටවචන කීය.

ඉක්මනින් ම අතුරුදන් විය හැකි ය. මතාන්තරසංකලනයෙන් දූෂිත වන්නට පෙර ධර්මවිනය සඞ්ගායනා කොට තැබීම මා විසින් කට යුතු ය"යි සිතා සර්වඥපරිනිර්වාණයෙන් එක්විසිවනදා - සර්වඥධාතු බෙදා අවසන් වූ දින - එහි සිටි භික්ෂූන්ට මෙපවත් දන්වා ධර්මවිනයසඞ්ගායනාවෙහි භික්ෂූන් උත්සාහවත් කළහ. එහෙයින් කීහ සංගීතිපාළියෙහි: "හන්‍ද මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායාම, පුරෙ අධම්මො දිප්පති, ධම්මො පටිබාහීයති. පුරෙ අවිනයො දිප්පති, විනයො පටිබාහීයති" යි.

එකල්හි "තෙන හි භන්‍තෙ, ථෙරො භික්ඛූ උච්චිනාතු - එසේ නම් ස්වාමීනි, තෙරුන් වහන්සේ භික්ෂූන් තෝරණ සේක්වා" යි සංඝසම්මතය ලැබූ මහකසුප්තෙරණුවෝ එහි පැමිණ සිටි භික්ෂූන් රැස් කරවා[1] සංගීතිය සඳහා එක් නමක් අඩු පන්සියක් රහතුන් තෝරා ගත්හ. අනඳතෙරුන් එකල රහත් නො වූ බැවින් තමන් විසින් ම උන්වහන්සේ තෝරා ගැණීම පක්ෂපාතයකැ යි නැගිය හැකි චෝදනාවෙන් මිදී සංඝයාගේ සම්මතයෙන් අනඳතෙරුන් ද ඇතුළත් කර ගැණීමට ඉඩ තබා එක් නමක් අඩු පන්සියය තෝරාගත් බව සැලකිය යුතු. ධර්මභාණ්ඩාගාරික වූ අනඳතෙරුන් නැති ව ධර්මසංගායනා නො කට යුතු බැවින් උන්වහන්සේ ගැණීම අවශ්‍ය ය යි සඞ්ඝයා විසින් සම්මත වී ය. ඉක්බිති මහකසුප්තෙරහු අනඳතෙරුන්ට[2] රහත් වීමට යුහුසුලු විය යුතු ය යි අවවාද දී කල් නො යවා වස්කාලයෙහි ම සංගීතිය පැවැත්විය යුතු ය යි ද, ඊට මගධයෙහි **රජගහනුවර**[3] සුදුසු ය යි ද නියම කරගත්හ. එහි දී ම සංගීතියට තෝරාගත් පන්සියය හැර සෙසු භික්ෂූන් රජගහනුවර වස් නො විසිය යුතු ය යි කර්මවාක්‍යයකින් සම්මත කොට ගත් ස්ථවිරභික්ෂූහු සංගීතිය සඳහා රජගහනුවරට පැමිණියහ. "අථ ඛො ථෙරා භික්ඛූ රාජගහං අගමංසු ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිතුං"යි එහෙයින් කීහ.

## 2. ධර්මවිනයසඞ්ගායනා

රජගහනුවරට පැමිණි ඒ පන්සියක් දෙනා වහන්සේ ඇසළ මස අව පැළවියදා වස් එළඹ ප්‍රථමමාසයෙහි විහාරාරාම පිළිසකර කරවා[4] නිකිණි මස අවදියවක්දා (තථාගතපරිනිර්වාණයෙන් සිවුවන මස දෙවනදා)[5] රජගහ-නුවර වෛභාරපර්වතප්‍රාන්තයෙහි සප්තපර්ණි[6]ගුහාද්වාරයෙහි අජාසත් මහරජු විසින් කරවන ලද මණ්ඩපයට රැස් ව අනඳතෙරුන්ට අසුනක්

---

1. මහකසුප්තෙරුන්ගේ නියමයෙන් පූර්ණ නම් තෙරහු ගෙඩිය ගසා භික්ෂූන් රැස් කරවූහ. මහකසුප්තෙරුන් 'මෙහි නො පැමිණියෙක් ඇද්ද'යි ඇසූකල ගවම්පතිතෙරුන් නැතැයි ද ඒ තෙරහු සිරීෂවෘක්ෂාරාමයෙහි වෙසෙති යි ද පූර්ණතෙරහු කීහ. ගවම්පතිතෙරුන් කැඳවා ගෙණ ඒමට පූර්ණතෙරහු ගියහ. එකල ගවම්පතිතෙරහු මරණාසන්න ව සිටියහ. සංගීතියට යා නො හැකි බැවින් සඞ්ඝයාට දෙවයි පාත්‍රය හා තුන්සිවුරු දී තෙරහු පිරිනිවියහ. පූර්ණතෙරහු කසුප්තෙරුන්ට එපවත් දැන්වූහ. ටිබැට් විනය – Rockhill's Life of the Buddha, pp. 149-150.

2. පළමුවර තෝරා නො ගත් හෙයින් "ශාසතෘන්වහන්සේ වැඩසිටිය දී ධර්මවිනිශ්චය පිළිබඳ සියලු රැස්වීම්වලට පැමිණියෙමි. ශාසතෘඅභාවයෙන් පසු පවත්වනු ලබන ධර්මසභාවෙන් මා බැහැර කළහ" යි ශෝකී වූ අනඳතෙරහු කසුප්මහතෙරුන් විසින් රහත් වීමට උත්සාහවත් වනු මැනවැ යි අවවාද දීමෙන් සනසන ලදහ. Beal's Record of Western World, Vol. 11. p. 163. Cf. Rockhill's Life... pp. 154-155.

3. සම්භර තෙරහු බුදුන් බුද්ධත්වයට පැමිණි බොධිමූලයෙහි සංගීතිය පැවැත්විය යුතු ය'යි කීහ. ආජාසත් රජුගේ ආරක්ෂාව ලැබෙන නිසා රජගහ නුවර සුදුසු ය යි කසුප්තෙරහු කීහ. Rockhill's Life of the Buddha, p. 150.

4. මේ ලැගුම් ගෙවල් පිළියෙල කිරීම ය යි ධර්මගුප්තිකයෝ කියති. Buddhist Council at Rajagaha - by Otto Franke, J P T S. 1908, p. 35, Note 1.

5. පඨමමාසං ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කරිංසු... පක්ෂයෙහි පස්වනදා, සුමඞ්ගලවිලාසිනී, පිටුව 8; සාරත්ථදීපනී, පිටුව 50.

6. "න්‍යග්‍රොධගුහාව" යයි කියති. ටිබැට් විනය. Rockhill's Life... p. 156..

තබා සුදුසු පරිදි වැඩ හුන්හ. "අථ බො ආයස්මා ආනන්දො අරහා සමානො සන්නිපාතං අගමාසි" යි දක්වූ සේ අනඳතෙරණුවෝ ද එදින අලුයම රනත් වී රැස් වීමට පැමිණ[1*] තෙරුන් වැද සිය අස්නෙහි හුන්හ.

ඉක්බිති **මහකසුප්** මහතෙරහු "සුණාතු මෙ ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං" යන ආදීන් සඞ්ඝයාට දන්වා පළමු ව විනයසඞ්ගායනාව ආරම්භ කරමින් **උපාලි** තෙරුන්ගෙන් විනය විචාළහ. "ඇවැත්නි, උපාලි, ප්‍රථම පාරාජිකය කොතැන්හි දී පණවන ලද ද?" (උපාලි) "ස්වාමීනි, වෙසාලියෙහි දී ය. "කවරකු අරභයා ද?" "**සුදින්න** නම් කලන්දපුත්‍රයා අරභයා ය". "කවර වස්තුවෙක්හි ද?" "මෛථුන සෙවනවස්තුවෙහි ය" – මෙසේ කසුප්තෙරණුවෝ ප්‍රථමපාරාජිකසික්ඛාපදය පිළිබඳ නිදාන, පුද්ගල, වස්තු, ප්‍රඥප්ති, අනුප්‍රඥප්ති, ආපත්ති, අනාපත්ති විචාළහ. උපාලිතෙරණුවෝ විචාළ සියල්ල ම විසඳූහ. මේ ක්‍රමයෙන් **උභතො-විභඞ්ගය** (භික්ෂුභික්ෂුණීප්‍රාතිමොක්ෂශික්ෂාපද සියල්ල) පුච්ඡාවිස්සජ්ජනයෙන් විනයය සංගීත වී ය.

අනතුරු ව ධර්මසඞ්ගායනාව ආරම්භ කළ මහකසුප්තෙරණුවෝ සඞ්ඝ-සම්මතය පරිදි **අනඳ**තෙරණුවන්ගෙන් "ඇවැත්නි, ආනන්දය, බ්‍රහ්මජාල සූත්‍රය කොතැන්හි දී දේශනා කරණ ලද ද" යි විචාළහ. "ස්වාමීනි, **රජගහ** නුවරටත් **නාලන්දා**වටත් අතර අම්බලට්ඨිකාඋයන්හි රාජාගාරයෙහි දී ය". "කවරකුහට, දේශනා කරණ ලද ද?" "**සුප්පිය** නම් පිරිවැජියාටත් **බ්‍රහ්මදත්ත** නම් මාණවකයාටත් ය". මෙසේ කසුප්තෙරණුවෝ සියලු සූත්‍රයන් පිළිබඳ නිදානපුද්ගලාදිය විචාළහ. අනඳතෙරණුවෝ විචාළ සියල්ල විසඳූහ. මේ ක්‍රමයෙන් **පඤ්චනිකාය** පුච්ඡාවිස්සජ්ජනයෙන් ධර්මය සංගීත වී ය. මේ සංගීතිපාළියෙහි ධර්මවිනයසඞ්ගායනා සංක්ෂෙපයෙන් සඳහන් වන සැටි ය[2].

## 3. ඛුද්දානුඛුද්දකසික්ඛාපදකථා

ධර්මවිනයසංගීතියෙන් පසු අනඳතෙරණුවෝ ස්ථවිරභික්ෂූන් අමතා "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණකාලයෙහි "ආකඞ්ඛමානො ආනන්ද, සඞ්ඝො මමච්චයෙන ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහනතු-

1. අනඳතෙරුන්ගේ ශිෂ්‍යයකු වූ වුජ්ජසොභිත තෙරුන් සඞ්ඝාඥාවෙන් සංගීතිය සඳහා අනඳතෙරුන් කැඳවීමට ගිය බව ථෙරගාථාඅට්ඨකථාවෙහි සඳහන් වේ. 351 පිටුව. අනඳ-තෙරුන් රහත්බව හඟවමින් පොළෝ කිමිද පැමිණිබව සමහරු කියති. සමහරු තෙරුන් අහසින් ආ බව කියති. සමන්තපාසාදිකා, 7. පිටුව.

* ආපොකසිණසමාපත්ති බලයෙන් පොළොව කිමිද යා හැකි වේ. වායොකසිණසමා-පත්තියෙන් අහසින් යා හැකි වේ.

"අනඳතෙරහු සංගීතිසාලාව වෙත පැමිණ දොරට තට්ටු කොට ආ බව ඇඟවූහ. මහ-කසුප්තෙරහු දොර වෙත පැමිණ රහත් වූයේ නම් දොර නො ඇර ඇතුල් වනු මැනවැයි අනඳතෙරුන්ට කීහ. අනඳතෙරහු ඍද්ධිබලයෙන් යතුරු සිදුරෙන් ඇතුල් වූහ." චීනවාර්තා. Beal's Buddhist Records of the Western World, Vol 11. p. 163.

2. ටිබැට්විනයයෙහි සඳහන් පරිදි මහකසුප්තෙරහු "අනාගතකාලයෙහි භික්ෂූන්ගේ ධාරණශක්තිය දුර්වල වන හෙයින් මාතෘකාගාථා නැති ව සුත්තන්ත, විනය, අභිධම්ම ඉගෙණීම අපහසු වෙනවා ඇත. ඔවුන්ට පහසු වන පරිදි පෙරවරුවේ පළමු කොට ගාථා (උදාන) සඞ්ගායනා කොට පස්වරු ධර්මය සඞ්ගායනා කරමු යි තෙරුන්ට දන්වූහ. එසේ ගිවිස ගෙණ පස්වරු සඞ්ගායනාව ආරම්භ කරමින් පළමු කොට අනඳතෙරුන් ධුර කොට ගෙණ ධර්මචක්‍රසූත්‍රය පටන් දෙශනා පිළිවෙළින් පුච්ඡාවිස්සජ්ජනයෙන් සූත්‍රපිටකය ද, උපාලිතෙරුන් ධුර කොට ගෙණ පබ්බජ්ජාඅනුජානනය පටන් විනයය ද සඞ්ගායනා කොට අවසන් වූ පසු මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ තමන් විසින් ම ස්මෘත්‍යුපස්ථාන (සතිපට්ඨාන) ආදි මාතෘකා (අභිධර්මය) සඞ්ගායනා කළහ. R. Life of the Buddha, p p, 156-159. Cf. Indian Philosophy by S. Radhakrishnan, Vol. 1. p. 343.

ආනන්දය, ඉදින් සඞ්ඝ තෙමේ කැමැති නම් ඛුද්දානුඛුද්දක (කුඩා - අනුකුඩා) සික්ඛාපද බැහැර කෙරේවා"[1] යි වදාළබව දුන්වූහ. (අනඳ තෙරහු මේ සික්ඛාපදයෝ කවරහු දැයි භාග්‍යවතුන් වහන්සේගෙන් නො විචාළහ.)

තෙරවරු සමහරෙක් පාරාජික හැර සෙසු සික්ඛාපද ඛුද්දානුඛුද්දක ය යි කීහු. මෙසේ පාරාජික - සඞ්ඝාදිසෙස - අනියත - නිස්සග්ගිය-පාචිත්තිය - පාටිදෙසනීය යන පාතිමොක්ඛයට අයත් සික්ඛාපද අතුරෙන් මුල මුල සික්ඛාපද හැර අග අග සික්ඛාපද ක්‍රමයෙන් ඛුද්දානුඛුද්දක ය යි ඒ ඒ තෙරවරු කීහ. (ඒ සික්ඛාපදයන් ඉක්මවීමෙන් වන වරදේ පමණ වසයෙන් මුත් හළ යුතු වසයෙන් නො වේ.) කිසිවෙකුටත් අසුවල් ශික්ෂා-පදය කුඩා ය, අසුවල් ශික්ෂාපදය ඉතා කුඩා ය යි (හළයුතු වසයෙන්) නිශ්චය කළ හැකි නො වී ය.

මහකසුප්මහතෙරුන් විසින් "සඞ්ඝො අපඤ්ඤත්තං න පඤ්ඤපෙති. පඤ්ඤත්තං න සමුච්ඡින්දති. යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තති - සඞ්ඝතෙමේ නො පැණවූවක් නො පණවයි. පැණවූවක් නො සිඳියි. පැණවූ තාක් ශික්ෂාපදයෙහි සමාදන් ව පවති" යි කම්මවාක්‍යයෙන් ශික්ෂාපද සමූහනනයක් නො කට යුතු බව සම්මත කරණ ලදි[2].

## 4. අනඳතෙරුන්ට දොස් පැවරීම

ඉක්බිති සථවිර භික්ෂූහු අනඳතෙරුන්ට කරුණු පසකින් දොස් (දුක්කට) පැවරූහ:

1. "ආනන්දය, ඔබ ඛුද්දානුඛුද්දකසික්ඛාපදයෝ කවරහු දැයි භාග්‍යවතුන් වහන්සේගෙන් නො විචාළහු ය. (එහෙයින් සියලු ශික්ෂාපද මුල සිට විමසන්නට වි ය.) මෙය තොපගේ දෝසයකි. එය දෙසවු (ප්‍රතිඥා කරවු)" යි කීහු. අනඳතෙරහු "මම බුද්ධපරිනිර්වාණයෙහි දුඃඛිත වූයෙම් නො සිහියෙන් එය නො විචාළෙමි. එහි දොසක් නො දකිමි. එහෙත් ආයුෂ්මතුන්ගේ කීම අනු ව (කීමට ගරු කරමින්) එය දෙසමි" යි කීහ.

2. "ආනන්දය, තෙපි භාග්‍යවතුන් වහන්සේගේ වැසිසළුව පාගාගෙණ මසන ලදී. මේ තොපගේ දෝසයෙකි. එය දෙසවු" යි කීහ. අනඳතෙරහු මම අගෞරවයකින් එය නො පෑගුවෙමි. (ඒ සිවුර මසද්දී සහාය වීමට කිසිවකු නුවූ බැවින් එසේ කෙළෙමි.) එහි දොසක් නො දකිමි. එහෙත් ආයුෂමතුන්ගේ කීම අනු ව එය දෙසමි" යි කීහ.

3. "ආනන්දය, තෙපි මාගමුන් ලවා පළමු කොට බුද්ධශරීරය වැඳ-වූහු ය. ඔවුන් ඇඬූ කඳුළෙන් බුදුබඳ කිලිටු වි ය. මේ තොපගේ දෝසයකි. එය දෙසවූ" යි තෙරහු කීහ. අනඳ තෙරහු "මා එසේ කෙළේ ඔවුන්ට කල් ගත වී අවේලා වන හෙයිනි. (පරිනිර්වාණයෙහි රැස් වූ මල්ලජනකාය විසාල වූ බැවින් ඔවුන් සමූහවශයෙන් යොදා සත්‍රීන්ට පළමු කොට බුද්ධශරීරය දක්වන ලදී.) එහි දොසක් නො දකිමි. එහෙත්... එය ද දෙසමි" යි කීහ.

---

1. මෙය පාතිමොක්ඛය උදෙසීමේ දී ඛුද්දානුඛුද්දක සික්ඛාපද දෙසීමෙන් වැඩෙක් නැතැයි සවගමහණුන් කියූ කාරුණෙහි පණවන ලද පහත දැක්වෙන ශික්ෂාපදය හා සම්බන්ධ ය යි සිතිය හැකි ය. "යො පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය 'කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි? යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තී'ති සික්ඛාපදවිලෙඛනෙ පාචිත්තියන්ති". පාචිත්තියපාළි - විලෙඛනසික්ඛාපද.

2 මෙය "යාව කීවඤ්ච භික්ඛවෙ භික්ඛූ අපඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය සික්ඛිස්සන්ති, වුද්ධියෙව භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි" යි පරිනිබ්බාණ සූත්‍රයෙහි වදාළ අනුශාසනය හා සම්බන්ධ වේ.

4. "ආනන්දය, තෙපි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීමේ ලකුණු (චාපාලචෛත්‍යාදියෙහි දී පිරිනිවන් පානා බව) අඟවද්දී "ස්වාමීනි, බොහෝ ජනයාට හිත පිණිස කල්පයක් ජීවත් වන සේක්වා" යි නො ඉල්ලූහු ය. මේ තොපගේ දෙසකි. එය දෙසවූ" යි තෙරහු කීහ. අනඳතෙරණුවෝ "එවේලෙහි මාගේ සිත මරුට වසඟ වී තුබුනු බැවින් එසේ නො ඉල්වීමි. එබැවින් එහි දෙසක් නො දකිමි. එහෙත් ... එය දෙසමි" යි කීහ.

5. "ආනන්දය, තෙපි තථාගතශාසනයෙහි පැවිද්දට ස්ත්‍රීන් උත්සාහවත් කළහු ය. එය දෙසකි. එය දෙසවූ" යි තෙරහු කීහ. අනඳතෙරහු තථාගතයන් වහන්සේගේ කිරිමව වූ මහාපජාපතීගොතමිය කෙරෙහි සැලකීමෙන් එසේ කෙළෙමි. එහි දෙසක් මම නො දකිමි. එහෙත් ... එය දෙසමි"යි කීහ[1].

## 5. ඡන්නතෙරුන්ට බ්‍රහ්මදණ්ඩය පැණවීම

ඉක්බිති අනඳතෙරහු "ආනන්දය මාගේ ඇවෑමෙන් ඡන්න භික්ෂුහුහට බ්‍රහ්මදණ්ඩය පැණවිය යුතු ය යි භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණකාලයෙහි දී වදාළසේක" යි තෙරුන්ට දන්වූහ. බ්‍රහ්මදණ්ඩය නම් ඡන්නතෙරුන් සමග කිසිවෙකු කථා නො කිරීමයි. අවවාද අනුශාසනා නො කිරීමයි කීහ. තෙරහු ඡන්නතෙරුන්හට බ්‍රහ්මදණ්ඩය පැණවීමට අනඳතෙරුන්ට ම පැවරූහ. එකල කොසඹෑනුවර ඝොසිතාරාමයෙහි විසූ ඡන්නතෙරුන් වෙත ගිය අනඳතෙරහු ඡන්නතෙරුන්ට "ඇවැත්නි, තොපට සඞ්ඝයා විසින් බ්‍රහ්මදණ්ඩය පණවන ලදැ" යි කීහ. බ්‍රහ්මදණ්ඩ නම් කුමක් දැයි විචාළ ඡන්නතෙරුන්ට "ඔබ සමග කිසිවෙක් කථා නො කෙරෙයි. ඔබට අවවාද නො දෙයි. මේ බ්‍රහ්මදණ්ඩය" යි අනඳතෙරහු කීහ. ඡන්නතෙරහු ඒ උසස් ම (බ්‍රහ්ම) වූ දඬුවම අසා මුසපත් වී නැවත සිහි ලැබ එසිත් කලකිරී කමටහන් වඩා රහත් වූහ. (මෙහි ධර්මවිනයසඞ්ගායනාව හැර සෙසු කරුණු මහාපරිනිර්වාණසූත්‍රය හා සම්බන්ධ වෙයි.)

## 6. පුරාණතෙරුන්ගේ කථාව

ප්‍රථමසංගීතිපාලියට අයත් විශෙෂ කරුණක් නම් පුරාණ තෙරුන්ගේ කථාවයි. ඒ කාලයෙහි පුරාණතෙරණුවෝ දක්ෂිණාගිරියෙහි පිරිවර පන්සියක් භික්ෂූන් සමග චාරිකා කළහ. ස්ථවිරභික්ෂූන් විසින් ධර්මවිනය සඞ්ගායනා කළ පසු රජගහනුවර වෙළුවනාරාමයට වැඩියහ. ස්ථවිරභික්ෂුහු

---

[1] "අනඳතෙරුන්ට දෙස් පැවරුවෝ මහකසුප් තෙරහු ය. දෙස් පැවරුණේ අනඳතෙරුන් රහත් වීමට පෙර ය. (1) ස්ත්‍රීන් සාසනයට ඇතුල් කිරීම, (2) කල්පයක් ජීවත්වීමට භාග්‍යවතුන්වහන්සේගෙන් නො ඉල්වීම, (3) භාග්‍යවතුන්වහන්සේගේ රත්වන්සිවුර දවසක් ම පාගාගෙණ සිටීම, (4) භාග්‍යවතුන් වහන්සේ පැන් ඉල්ලූවිට ම නො දීම-පිරිසිදු පැන් නැත්නම් අහසට පාත්‍රය අල්ලා දෙවියන්ගෙන් පැන් ලබා නො ගැණීම, (5) භාග්‍යවතුන් වහන්සේ පක්ෂයකට වරක් පාමොක් දෙසීමට නියම කොට ඛුද්දානුඛුද්දක සික්ඛාපද කැමැති නම් සඞ්ඝතෙමේ නො දෙසන්නේ ය යි වදාළ විට ඒ සික්ඛාපදයෝ කවරහු දැයි නො විචාරීම, (6) හීනගති ඇති ස්ත්‍රීපුරුෂයන්ට තථාගතශරීරයෙහි පිළිසන් කොටස් දක්වීම, (7) දූෂිත වූ මාගමුන්ට රන්වන් බුදුබඳ පෙන්වා ඔවුන්ගේ කඳුලෙන් කිළිටි කරවීම යන දෙස් සතක් පවරණ ලදී. අනඳතෙරණුවෝ එකක් පාසා කරුණු කියා නිදෙස් වූහ. මෙහි 4, 6 දෙෂයෝ චුල්ලවග්ගයෙහි සඳහන් නො වෙති. 6, 7 වන දෙෂයන්ගෙන් නිදෙස්වීමට පිළිවෙළින් - ප්‍රකෘතියෙන් රාගී වූ ස්ත්‍රීන් බුදුන් දැක එසේ රාගීන් නො වෙති යි ද, දූෂිතස්ත්‍රීන් බුදුන් දැක උන්වහන්සේ මෙන් පිරිසිදු වෙතියි ද අදහස් කළ බව කීහ. මෙහි දී ශාස්තෘවියොගය සිහිකොට වැඩියක් ම දුක්පත් වූ අනඳතෙරහු කසුප්තෙරුන් හා අනුරුද්ධතෙරුන් දුන් අවවාදයෙන් සැනහී රහත්වීමට උත්සුක වූහ." ටිබැට් විනය. Rockhill's Life of the Buddha, pp. 152-154.

උන්වහන්සේට "ඇවත, පුරාණයෙනි, අප විසින් ධර්මවිනය සංගීත ය. එය අනුගමනය කරවු" යි කීහ. "සුසංගීතාවුසො ථෙරෙහි ධම්මො ච විනයො ච" යන ආදීන් "ඇවැත්නි, තෙරුන් විසින් ධර්මවිනය මනා කොට සඞ්ගායනා කරණ ලද්ද" යි සංගීතිය පසසා, "තව ද (අපිච), මා විසින් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි යම් සේ අසන ලද ද, පිළිගන්නා ලද ද, එසේ ම මම එය ධරන්නෙමි" යි පුරාණතෙරහු කීහ[1]. මෙතෙකින් ප්‍රථමසංගීතිකථාවට ඇතුළත් කරුණු අවසන් වේ.

## සංගීති පිළිබඳ මතභෙද

ප්‍රථමසංගීතිය පන්සියක් රහතුන් විසින් කප්පියාකප්පියවිනය-සික්ඛාපද පැණවීම සම්බන්ධයෙන් මහලු සුභද්‍ද කී වචන හා බුද්ධානුබුද්ධක-සික්ඛාපද විනිච්ඡය ද නිදාන කොට ගෙණ පවත්වන ලද හෙයින් "**පඤ්චසතිකා විනයසංගීති**" නම් වේ. ත්‍රිපිටකපාලිය ග්‍රන්ථාරූඪ කිරීමේ දී විනයධර ආචාර්යවරයන් විසින් එය විනයග්‍රන්ථයක් වූ චුල්ලවග්ගපාලියෙහි ඛන්ධකයක් වශයෙන් ඇතුළත් කරණ ලදී. එය (ද්විතීයසංගීතිකථාවත් සමග) 'සංගීතිපාලි' නමින් ද දන්නා ලදී.

සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු ධර්මවිනය චිරස්ථායී වනු සඳහා සම්මුඛ ශ්‍රාවක වූ ධර්මවිනයධර අනුබුද්ධ **මහාකාශ්‍යප**, ධම්මභාණ්ඩාගාරික **ආනන්ද**, අග්‍රවිනයධර **උපාලි** ආදී සිවුපිළිසිඹියා පත් මහරහතුන් විසින් පවත්වන ලද මේ ප්‍රථමධර්මසඞ්ගායනාව සෙසු සියලු සඞ්ගායනාවන්ට භූමි වූ බවත්, සියලු බෞද්ධනිකායිකයන් විසින් පිළිගන්නා ලද බවත්, ත්‍රිපිටකධර්ම විනිශ්චය පිළිබඳ සතර මහාඅපදෙශ(ප්‍රමාණ)යන් අතුරෙහි "ආචාර්යවාදය" වශයෙන් ගන්නා ලද බවත් අර්ථකථාගතවිස්තරයන්ගෙන් පැහැදිලි වේ.

පුරාණයෙහි පටන් ත්‍රිපිටකසංගීති හා එහි ග්‍රන්ථවිභාග දෙශ කාල නිදාන පුද්ගලාදිය පිළිබඳ මතභෙද ඒ ඒ ආචාර්ය පරම්පරාවන්හි පැවැති බවත්, ඒ ධර්මවිනයවිරොධි නො වූ ආචීර්ණවශයෙන් හා ශ්‍රැති වශයෙන් පැවැති විකල්පයන් බව දක්වමින් අර්ථකථාචාර්යයන් විසින් සුදුසු පරිදි විනිශ්චය කරණ ලද බවත් අර්ථකථාවන්හි දක්වෙයි. අභූතපූර්ව වූ සර්වඥතාඥානවිෂය වූ ධර්මයක් ලොව පහළ වූ කල ලෞකිකජනයා අතර ඒ පිළිබඳ මතභෙද ඇති වීම පුදුමයෙක් නො වේ. බුද්ධකාලයෙහි ද ධර්මවිනය සම්බන්ධයෙන් නොයෙක් මතයෝ ඇති වූහ. ඒ මත නිරාකරණය කරණ ලද්දේ ධර්මය පිළිබඳ න්‍යායක්‍රම දත් ධර්මාන්වයඥානය ඇති ශාරීපුත්‍රාදි මහරහතුන් විසින් ය. පාලිඅර්ථකථාවන්හි දක්වෙන්නේ ආචාර්යපරම්පරාවෙන් පැවැති ඒ බුද්ධශ්‍රාවකයන්ගේ ම බුද්ධවචනානුගත වාචනාමාර්ගය යි. ශතවර්ෂ ගණනකින් පසු ග්‍රන්ථාරූඪ වූ ධර්මවිනය පිළිබඳ කවර විවෙචනයක දී වුවත් පූර්වාචාර්යයන් විසින් අනුගමනය කරණ ලද ආප්තවචනය හා තදර්ථකථා ද ප්‍රමාණ වශයෙන් ගත යුතු ය. ඒ ප්‍රමාණයන් නො දත හෝ නො ගෙණ තර්කයෙන් හෝ 'මෙය මෙසේ වන්නට ඇත' යන '**ඉති – කිරා**'වෙන් හෝ ධර්මවිනය විනිශ්චය කිරීමෙන් නැගෙන වාදයෝ අහෙතුකවිවාද වනු මිස සහෙතුක වාදයෝ නො වෙති.

---

1. ධර්මවිනයසංගීති අවසානයෙහි එන මේ කථාව මෙතැන අතනීමට දක්වූයේ සංගීති කථාවෙහි සඳහන් මහාපරිනිර්වාණසූත්‍රය හා සම්බන්ධ වන කරුණු මෙයින් වෙන් කොට පිළිවෙළින් දක්වීම සඳහා ය.

ප්‍රථම සංගීතිය හා එයින් සංගීත වූ ත්‍රිපිටකය ගැණ මෑත කාලයෙහි පෙර - අපර දෙදිග නොයෙක් පඬුවන් විසින් නගා තිබෙන විවාදයෝ බොහෝ වෙති. ඒ සියල්ල එක් කොට ගත් කල-

(1) "ප්‍රථමසංගීතිකථාව මිථ්‍යාප්‍රබන්ධයකි.

(2) "එහි ධර්මවිනයයෙහි කොටසක් මිස සම්පූර්ණත්‍රිපිටකය සංගීත නො වී ය.

(3) "අභිධර්මය ගැණ කිසිවක් එහි සඳහන් නැත. එහෙයින් අභිධර්මය බුද්ධභාෂිතයක් නො වේ. එය පසු කාලයක සංග්‍රහකරණ ලද්දකි" යි -

මෙසේ ප්‍රධාන වශයෙන් කොටස් තුණකට බෙදිය හැකි වේ. මෙතැන් පටන් මේ සියල්ලට හා එයට සම්බන්ධ අන්‍ය මතයන්ට ද යථාවිධියෙන් පිළිතුරු ලැබෙනු ඇත.

ප්‍රථමසංගීතිකථාවෙහි ඉහත (xx - xxv පිටුවල) දක්වූ කරුණු අතුරෙන් ධර්මසඞ්ගායනාව හා පුරාණ තෙරුන්ගේ කථාව ද හැර සෙසු කරුණු සියල්ල මහාපරිනිර්වාණසූත්‍රයෙහි ඇතුළත් වේ. එහි "හන්‍ද මයං ආවුසො, ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායාම" යි මහකසුප්තෙරුන් විසින් කරණ ලද සංගීතියොජනාව හා ධර්මසඞ්ගායනාව මහාපරිනිර්වාණ සූත්‍රයෙහි නො දක්වීම කරුණු කොට ගෙණ චුල්ලවග්ගපාළියෙහි දක්වෙන ප්‍රථමසංගීතිකථාව ඓතිහාසික වූ සත්‍යසිද්ධියක් නො ව කලකට පසු අමුතුවෙන් ගොතා එකතු කරණ ලද මිථ්‍යාප්‍රබන්ධයකැයි[1] ප්‍රකාශ කරමින් ආචාර්ය ඕල්ඩන්බර්ග් (Dr. Oldenberg) මහතා තමා විසින් සකස් කොට ඉංග්ලිෂ් අකුරෙන් මුද්‍රිත **මහාවග්ග** සංඥපනයෙහි මෙසේ කියයි:

"මේ සංගීතිය පිළිබඳ ලේසමාත්‍ර වූ ද සටහනක් එහි (මහාපරිනිර්වාණසූත්‍රයෙහි) නැත. මේ නිශ්ශබ්දතාව මහාපරිනිර්වාණසූත්‍රකර්තෘ ප්‍රථමසංගීතිය ගැණ කිසිවක් නොදත් බව පෙන්වීමට වැදගත් වූ ප්‍රබල සාධකයක් වේ."[2]

මහාපරිනිර්වාණසූත්‍රකර්තෘ සංගීතිය ගැණ කිසිවක් නො දත් බැවින් එය එහි ඇතුළත් නො කෙළේ ය යි ද එහෙයින් චුල්ලවග්ගපාළියෙහි දක්වෙන සංගීතිකථාව අසත්‍ය වූ ප්‍රබන්ධයකැයි ද මෙයින් අඟවයි.

පරිනිර්වාණසූත්‍රයෙහි කර්තෘය යි කිය යුත්තෙක් නැත. එහි ධර්මය බුදුරජානන් වහන්සේ වදාළහ. සූත්‍රය ආනන්‍දස්ථවිරයන් වහන්සේ විසින් සංගීත ය.

"විනයසංගීති" නම් වූ මේ සංගීතිය පිළිබඳ කථාව සූත්‍රපිටකයට අයත් මහාපරිනිර්වාණසූත්‍රයට නො ව විනයපිටකයට ඇතුළත් කිරීම යුක්තිය වේ. එහෙයින් එය චුල්ලවග්ගපාළියෙහි අඟ අතිරේකඛන්ධක යක් වශයෙන් යොදන ලදී. පශ්චාත්සිද්ධියක් වූ ධර්මවිනයසඞ්ගායනාව

---

1. Vi nayapitaka, vol 1. p. xxvii.

2. There is not a slightest trace of any such allusion to this council. This silence is as valuable as the most direct testimony: it shows that the author of the Mahaparinibbana Sutta did not know anything of the first Council" Vinayapitaka, Vol. 1. p. xxviii.

ඕල්ඩන්බර්ග් මහතා අනුගමනය කරමින් ඔටෝ ප්‍රාන්ක (Prof. Otto Franke) මහතා මෙසේ කියයි. "It is to Oldenberg's credit that... he declared the first Council to be fictitious" එහි ගෞරවය ඕල්ඩන්බර්ග් මහතාටයි. හෙතෙමේ ප්‍රථමසංගීතිය මිථ්‍යාකල්පිතයකැයි ප්‍රකාශ කෙළේ ය. J P T S. 1908, p. 69.

පූර්වසිද්ධියක් වූ මහාපරිනිර්වාණසූත්‍රයට ඇතුළත් වීම ද නො යෙදෙන්නේ ය. සංගීතිකාරක වූ මහරහතුන් වහන්සේ ඉදිරි පිට සිදු වූ මහාපරිනිර්වාණ සූත්‍රාගත සිද්ධීන් එලෙසින් ම සංගීතිකථාවෙහි සංගීතිහෙතු වසයෙන් ඇතුළත් වීම ද, සංගීතිය නො පිළිගත්තේ ය යි සමහරුන් කියන පුරාණ තෙරුන්ගේ කථාව ඇතුළත් වීම ද සංගීතිකථාව සත්‍ය වූ ඓතිහාසික සිද්ධියක් බවට සාධක වේ.

සංගීතිනිදානයෙහි පෙණෙන දුෂ්ටවචන කී මහලු සුභද්‍ද මහණ තථාගත පරිනිර්වාණයට පැය කීපයකට පෙර රහත්බවට පැමිණ තථාගතයන් වහන්සේගේ අන්තිමශ්‍රාවකයා වූ **පරිබ්‍රාජක** සුභද්‍ද ය යි ඕල්ඩන්බර්ග් මහතා කියයි.[1] මේ සුභද්‍ද දෙනම වෙන් කොට අඳුනා ගැණීමට තරම් වූ විවෙකයක් නැති ව ඒ මහතා විසින් නගන සංගීතිවාදය මතදෙඩුමක් පමණෙකි. (ඕල්ඩන්බර්ග්මහතාගේ සංගීතිවිවෙචන ගැණ පිළිතුරක් **ශ්‍රී සුමඞ්ගල**-සිංහලමහාවංශසංශෝධනයෙහි ද සදහන් වේ. පිටු xxv – xxvi.)

ඕල්ඩන්බර්ග්මතය සාධක කොට ගත් වෙනත් යුරෝපීය පඬුවෝ සංගීති පිළිබඳ නොයෙක් අභූතමත පළකළහ:

“චුල්ලවග්ගයෙහි එන ප්‍රථමසංගීතිනිදානය මහාපරිනිර්වාණසූත්‍රයෙහි පමණක් නො ව දීපවංසයෙහි ද සඳහන් වී නැත. එයින් සූත්‍රයෙහි පෞරාණිකත්වය පිළිබඳ වාදය බිඳ වැටෙයි. දීපවංසය චුල්ලවග්ගයට වඩා පැරැණි වූවක් නො විය හැකි බැවිනි. මේ කීම චුල්ලවග්ගයෙහි සිද්ධාන්තයක් සේ දක්වෙන සංගීතිකථාව අනුෂඞ්ග වශයෙන් අළුත් ය යන නිගමනය කිසිසේත් දුර්වල නො කෙරෙයි.”[2] මේ ආචාර්ය් **එච්. කාන්** (Dr. H. Kern) මහතා කියන සැටියි.

---

1 “After the death of the Master so it is related in the Chullavagga - Subhadda, the last disciple converted by the Buddha shortly before his death, proclaimed views which threatened the dissolution of the community. “Do not grieve, do not lament,...” Vinayapitaka Vol. 1. p. xxvi.

මෙය ස්ථිර කිරීමට මෙන් ආචාර්ය් ඔටෝ ප්‍රාන්ක මහතා මෙසේ කියයි: “It is conceivable that in some more original form of traditional narrative, the two Subhaddas were one and the same...” - පැරැණි වූ ඇතැම් මූලිකවෘත්තාන්ත අනු ව මේ සුභද්‍ද දෙදෙනා එක ම කෙනෙකු වන්නට ඇතැයි සිතිය හැකි වේ.” J P T S. 1908, P. 26. * foot-note.

පරිව්‍රාජක සුභද්‍ර 120 වයස් ඇත්තේ බුද්ධපරිනිර්වාණයට පෙර ඒ රාත්‍රියෙහි ම බුදුන්ගෙන් අවසර ගෙණ පිරිනිවියේ ය. ටිබැට් විනය. Rockhill's Life... p 138.

ඒ අභීත් සුභද්‍ර පිරිනිවි තැන චෛත්‍යයක් ද ගොඩ නගා තුබුනු බව (Beal's Records of the Western World, Vol. 11. p p. 35-36.) සඳහන් වේ.

“අජ්ජේවදානි පබ්බජ්ජා අජ්ජේව උපසම්පදා,
අජ්ජේව පරිනිබ්බාණං සම්මුඛා දිපදුත්තමෙ.”

ද්විපදෙත්තමයන් වහන්සේ හමුවෙහි අද ම පැවිද්ද ද අද ම උපසම්පදාව ද අද ම පිරිනිවීම ද විය යි සුභද්‍රස්ථවිරයන් වහන්සේ පැවසූහ. අපදානපාළි, 1238 වන ගාථා.

2. “Now the motive alleged in the C V. is not only absent from the Sutta, but likewise from the Dipavansa. Hence the argument for the great antiquity of the Sutta falls to the ground, for the DipaV. cannot be made older than the C V. But this remark in no wise invalidates the conclusion that the dogmatical story of the first Council, as told in CV. is comparatively yong.” Manual of Indian Buddhism, p. 102 ff.

මෙසින් **කාන්** මහතා ඕල්ඩන්බර්ග්මතය රකිමින් ප්‍රථමසංගීතිය ඓතිහාසික කථාවක් නම් එහි නිදානය දීපවංසයෙහි සඳහන් විය යුතු බව ප්‍රකාශ කෙරෙයි. සංගීතිනිදානය වූ සුභද්‍රකථාව දීපවංසයෙහි නො දක්වෙතත් එහි සතරවන පරිච්ඡේදයෙහි ප්‍රථමසඞ්ගායනාව පැවැති සැටි දක්වෙන බැවින් දීපවංසකතෘ එය චූලලවග්ගපාළියෙන් ගෙණ සඳහන් කිරීමේදී එහි නිදානය නො දත්තේ යයි නො සිතිය යුතු.

“මහාපරිනිබ්බාණසුත්ත-චූලලවග්ග” යන මාතෘකාවෙන් සංගීති පිළිබඳ සාඩම්බරවිවෙචනයක් කරණ ආචාර්ය **ලුවිස් ෆිනොට්** (Prof. Louis Finot) මහතා මෙසේ කියයි:

“චූලලවග්ගයෙහි 1–10 වන ඛන්ධකයන් පටන් ගන්නා (“තෙන ඛො පන සමයෙන යන”) පිළිවෙළ හැර 11වන ඛන්ධකය ‘අථ ඛො ආයස්මා මහා කස්සපො භික්ඛූ ආමන්තෙසි’ යන ආකස්මික වචනයෙන් ආරම්භ කොට තිබේ. කවරතැනක, කවරකලෙක, කිනම් කරුණක් නිසා මේ කථාව පැවතුනා ද, ආමන්ත්‍රණය කරණ ලද භික්ෂූහු කවරහු දැ යි කිසිවෙක් නො දනී.” “අථ ඛො” යි ආරම්භ කළ මේ කථාව සෙසු ඛන්ධකයන්ට මෙන් නිදානයක් නැති, සෙසු ඛන්ධක හා සම්බන්ධයක් නැති අන්‍යකථාවකි.”[1]

“මෙහි 11වන, 12වන ඛන්ධකයන්හි රැකී තිබෙන සංගීතිකථා කියවන්නෙකුට එය හිස කපාලූ කඳක් වැනි බව ද, හිස වෙන තැනක සෙවිය යුතු බව ද යන විධිවිරොධී වූ කරුණු දෙක වැටහෙනවා ඇත.”[2]

“දීර්ඝකාලයක පටන් සංගීති විවෙචනය කළ පඬුවෝ කීප දෙනෙක් වෙති. ඒ කවරකු විසිනුත් මහාපරිනිර්වාණසූත්‍රයත් චූලලවග්ගයෙහි සංගීතිඛන්ධක දෙකත් මුළුමනින් ම එක කථාවක් සේ පැවැති බව නිගමනය කරණ ලද්දේ නො වේ. මේ කථා තුණ ම එකට සම්බන්ධ වූ එක කථාවක් සේ මූලසර්වාස්තිවාදීන්ගේ විනයයෙහි සංයුක්තවස්තු නමින් සංග්‍රහ වී තිබේ.”[3]

“පරිනිර්වාණසූත්‍රය තථාගතපරිනිර්වාණයෙන් දීර්ඝකාලයකට පසු සකස් කරණ ලද බැවින් එහි ඇතුළත් කථා බුද්ධවචන ය යි නො කියහැකි බව පෙණේ. එය නියත වශයෙන් ම අතිරේකපාළියකි.”[4]

“ථෙරවාදීන්ගේ ත්‍රිපිටක සඞ්ග්‍රහයෙහි දී විශාල ඓතිහාසිකකෘතියක අගකොටසක් වශයෙන් පැවැති රාජගහ – වෙසාලි සංගීතිකථා වෙන් කොට එහි මුල් කොටස මහාපරිනිර්වාණසූත්‍රයට පෙරළා අග කොටස (සංගීති කථා වශයෙන්) චූලලවග්ගයෙහි දසවන ඛන්ධකයට යා කරණ ලද බව සිතීමට ඉහත දක්වූ සාධක කීපයෙන් අපට පුළුවන් කම ලැබේ”.[5]

---

1. Mahaparinibbana-Sutta and Chullavagga, Indian Historical Quarterly, Vol. viii. 1932, p. 241 ff.

2. "Here are two anomalies bound to strike the reader, and we must acknowledge that as they now stand preserved in chaps. XI-XII, these 'Acta Conciliorum' appear as a beheaded trunk, the head of which has to be sought elsewhere." Ibid p. 241.

3. Ibid. p. 242.

4. "Since it extended over a long time after the Death of the Thathagatha, the subject matter of the "Chronicle" could not be styled as the Word of the Buddha." It was necessarily extra-canonical." Ibid. p p. 242.

5. "In short several data gathered above entitle us to suppose that the account of the councils of Rājagaha and Vesali once formed the latter part of a larger historical work, which, at the time of the compilation of the Tripitaka, was severed into two sections, the former being converted into the Mahaparinibbana-Sutta and the latter annexed as 'Capitula extravagantia' to the tenth Khandhaka of the Chullavagga." Ibid. p. 246.

Free Distribution www.aathaapi.org

**ආචාර්ය ඔබර්මිලර්** (Dr. Obermiller) මහතා ද **පිශොච්** මහතාගේ මතය අනුමත කරමින් මෙසේ කියයි:

"බුද්ධපරිනිර්වාණකථාවත් ප්‍රථම - ද්විතීයසංගීතිකථා දෙකත් **විනය** ක්‍ෂුද්‍රක (ව්‍යැම්විනය) ප්‍රථමකාණ්ඩයෙහි එකට දක්නා ලැබේ. එය පාළි පිටකයෙහි දෙකට කඩා දක්වා තිබෙතත් ඒ කොටස් දෙක ම **උතුරු** විනයයෙහි සම්පූර්ණයෙන් එක ම කථාවක් සේ පෙණේ"[1].

ථෙරවාදිතිපිටකපාළිය හා ඉතිහාසය ද වෙනස් කොට අමුතු ධර්මසඞ්ග්‍රහ කරමින් කලකට පසු සකස් කරණ ලද, එසේ ම තෘතීය සඞ්ගායනාව ගැණ කිසි දු සටහනක් නැති මහාසාංඝිකවිනයවස්තු අනු ව මේ මහතුන් දෙඩන මේ භ්‍රාන්තිමතයන්ට පිළිතුරු මෙහි xx, xxvi පිටුවලින් දත හැකි වේ. මීට තවත් පිළිතුරක් වශයෙන් ආචාර්ය **විල්හෙල්ම් ගයිගර්** (Dr. Wilhelm Geiger) මහතාගේ අදහස මෙහි දක්වමු:

"මගේ අදහස නම් (දකුණු බෞද්ධයන් විසින්) සංගීතිකථා දෙක වෙන් වසයෙන් බෙදා දැක්වීම නිවැරැදිබවයි. උතුරු බෞද්ධයන් විසින් **කාලාසොක-ධම්මාසොක** රජවරු දෙදෙන එක් රජෙකැයි ගත්තා සේ සංගීතිකථා දෙක ද වැරදි ලෙස මිශ්‍ර කොට තිබේ".[2] (මේ කියන්නේ දෙවන තුන්වන සඞ්ගායනා මිශ්‍ර කිරීම ගැණයි).

කෙසේ හෝ **පිශොච් - ඔබර්මිලර්** මහතුන්ගේ මතයෙන් **ඔල්ඩන්බර්ග්** මතය බොහෝ සෙයින් අනාථ වෙයි.

**මහාවග්ග** සංක්‍ෂෙපනයෙහි දැක්වෙන පරිදි ඔල්ඩන්බර්ග් මහතා ප්‍රථමසංගීතිකථාව සම්පූර්ණයෙන් ද, ද්විතීයසංගීතිකථාවෙන් භාගයක් (ධර්මසඞ්ගායනාව) ද මිථ්‍යාප්‍රබන්ධය යි ප්‍රතික්‍ෂෙප කරමින් ද්විතීයසංගීතිකථාවෙන් භාගයක් වූ විනයවිරොධිදශවස්තුකථාව ද තෘතීය සංගීතිය ද පැරැණි බෞද්ධසමය පිළිබඳ ස්ථිර වූ ඓතිහාසික සිද්ධිවශයෙන් පිළිගණියි[3]. සංගීතිකථා තුණෙන් එකහමාරක් බොරුකථා මෙන් ද එකහමාරක් සත්‍යකථා මෙන් ද පිළිගන්නා **ඔල්ඩන්බර්ග්** මහතාගේ මතයෙන් අර්ධයක් පිළිගණිමින් අර්ධයක් ප්‍රතික්‍ෂෙප කරමින් සංගීති තුණ ම ඓතිහාසික සිද්ධිවශයෙන් නො සැලකිය හැකි බව නිගමනය කරණ **වින්සන්ට් ස්මිත්** (Vincent Smith) මහතා මෙසේ කියයි:

"ප්‍රථමසංගීතිකථාව සම්පූර්ණයෙන් මිථ්‍යාවෘත්තාන්තයකැ යි කියන ආචාර්ය **ඔල්ඩන්බර්ග්** මහතා සමග එකඟ වීමෙහි පැකිලීමෙක් මට නැත[4].

"රාජගෘහසංගීතිකථාව කූටප්‍රබන්ධයක් නම් ඊට සමාන වෛශාලීයසංගීතිකථාව පලමු බෞද්ධසමයයට ඇතුළත් ස්ථිරඓතිහාසික කරුණක් ය යි පිළිගත යුත්තේ කුමක් නිසා ද ?"[5]

---

1. Cf. Indian Historical Quarterly, pp. 780-784  2. P T S. Mahavnsa Introd, p. lix.
3. Cf. Vinayapitaka Vol. 1. p p. xxiv-xxxiv.
4. "...I have no hesitation in agreeing with Professor. Oldenberg that the tale of the First Council is simply fiction" J R A S. Vol 33, 1901, p. 843.
5. "...If the story of the council of Rajagriha...is "pure invention," why should the similar Story of the Council of Vaisali ... be regarded as a "fixed point" in the history of the earliar form of Buddhism?" Ibid. p. 847.

("අපගේ නිගමනයෙහි) ප්‍රතිඵල අනුව යථොක්ත වෛශාලී - පාටලිපුත්‍ර සංගීතිකථා (දෙක ද) පළමු බෞද්ධාගමයෙහි ස්ථිරඓතිහාසික කරුණු වශයෙන් සැලකිය හැකි නො වේ[1]".

ඉහත දැක්වූ යුරෝපීය පඬුවන්ගේ සංගීතිවිරොධිමතයන්ට පිළිතුරු වශයෙන් සංගීතිකථා පිළිගත් පඬුවන්ගේ අදහස් මෙහි දක්වනු ලැබේ.

පාලිත්‍රිපිටකග්‍රන්ථයන් ප්‍රකාශයට පැමිණවීම සම්බන්ධයෙන් මහාඅධි-කාරයක් කළ ආචාර්ය්‍ය **රිස් ඩේවිඩ්ස්** (Prof. Rhys Davids) මහතා තමන් හා එක් ව ක්‍රියා කළ කීර්තිමත් පණ්ඩිතයකු වූ **ඕල්ඩන්බර්ග්** මහතාගේ මතය එක්තරා මෘදුලීලාවකින් ප්‍රතික්ෂෙප කරන්නේ මෙසේ ය:

"මහාපරිනිර්වාණසූත්‍රකර්තෘ රජගහනුවර පැවැති ප්‍රථමසංගීතිය එහි සඳහන් නො කොට අත් හැර තිබෙන්නේ ඒ ගැණ තමන් නො දත් නිසා නො ව ඔවුන්ගේ කෘතියට අදාළ නොවන සිද්ධියක් එහි සඳහන් කිරීම නො වුව මනා ය යි සිතීමෙන් විය යුතු. ඔහු විසින් විස්තර කෙළේ බුද්ධපරිනිර්වාණය මිස ත්‍රිපිටකඉතිහාසය හෝ ශාසනඉතිහාසය නො වේ."[2]

සංගීති පිළිබඳ වැදගත් ලිපියක් ලියූ ආචාර්ය්‍ය **ඇල්. ද ල වලේ පුසං** (Prof. L. De. La Vallee Poussin) මහතාගේ වාක්‍ය කීපයක අදහස මෙසේ ය:

"ප්‍රථමසංගීතිය ඇතැම් ගර්විතජනයන් සිතන සේ (අභූතයක්) නො වී ය. එහි තෙරුන් විසින් පරම්පරානුසාරයෙන් කියා තිබෙන පරිදි ධර්මග්‍රන්ථසඞ්ග්‍රහයක් ඒ තත්ත්වයෙන් ම නො පැවැත්තේ ය. **මිනයෑප්** (Mineyeff) මහතා සඳහන් කරණ සේ අපගේ විස්තරයෙහි ඒ අදහස (ධර්මග්‍රන්ථසංග්‍රහය) පිළිගැණීමට තරම් නො වූ කියුම් අප විසින් මිශ්‍ර නො කළ යුතු ය. ...එකල ඉදිරිපත් වූ කාර්ය්‍යසිද්ධියට අවශ්‍ය වූ පරිදි සංගීති නියත වශයෙන් පවත්වන ලදී."[3]

"පෞරාණික (ශාසන)සම්ප්‍රදායානුගත ප්‍රමාණසාධකයක් වූ විනය-ශික්ෂාපදසාකච්ඡාව ඇතුළත් වීම ද, රාජගෘහයෙහි පැවැත්වූ ඒ රැස්වීමෙන් ඇති කළ ආරම්භය මුල් ශතවර්ෂයන්හි සඞ්ගායනා සංවිධානයන්ට භූමි වූ

---

1. "Consequently the alledged Councils of Vaisali and Pātaliputra cannot be regarded as 'fixed points' in the history of the earlier form of Buddhism." Ibid. p. 858.

2. "...It is just possib'e that the Author of the Book of the Great Decease omitted all mention of the first Council at Rajagaha, not because he did not know of it, but because he considsred it unnecessary to mention an event which had no bearing on the subject of his work. He was describing the death of the Buddha, and not the history of the Canon or of the Order". Sacred Books of the East, Vol. xi. p. xiv ff.

3 "The First Council was not what a vain people thinks. The codification of the Scripture did not hold the position in it that has been stated by ecclesiastical tradition. But, as Minayeff remarks in our accounts we msst not "confound the statements which do not deserve the same belief .. the assemblies were instituted quite naturally and were a necessary consequence of a given state of things". Indian Antiquary, Vol. xxxvii. 1908, p. 15.

“**එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ**” – “මහණෙනි, මේ ශික්ෂාපදය මෙසේ උදෙසවු” යි භික්ෂූන් සඳහා පණවනලද පාරාජිකාදි සික්ඛාපද දෙසියවිස්සෙක (220), “**එවඤ්ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු**” – “මහණෙනි, භික්ෂුණීහු මේ ශික්ෂාපදය මෙසේ උදෙසත්වා” යි භික්ෂුණීන් සඳහා පණවන ලද පාරාජිකාදි සික්ඛාපද තුන්සියසතරෙකැ යි (304) යන මෙතෙක් සික්ඛාපදයෝ පාතිමොක්ඛයට ඇතුළත් වෙති. ඒ **පඤ්ඤත්තසික්ඛාපද** සමූහවසයෙන් බෙදූ පාරාජික, සඞ්ඝාදිසෙස, අනියත, නිස්සග්ගිය, පාචිත්තිය, පාටිදෙසනීය, සෙඛියා යන කොටස් සයට අධිකරණශමථධර්මයන් ද එක් කොට පාමොක් දෙසන ක්‍රමය අනුව ප්‍රථම පාරාජිකය පටන් ඒ ඒ ශික්ෂාපද නිදාන, පුග්ගල, වත්‍ථු, පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, ආපත්ති, අනාපත්ති වසයෙන් සත් අයුරකින් මහසුප් මහතෙරණුවන් විසින් විචාරණ ලදී. ඒ සියල්ල උපාලි තෙරණුවන් විසින් විසඳන ලදී.

ඒ ශික්ෂාපදසමූහය භික්ෂුභික්ෂුණීවශයෙන් දෙවැදෑරුම් හෙයින් ද, නිදානාදිවසයෙන් විභාග වූ හෙයින් ද “**උභතොවිභඞ්ග**” නමින් සංගීත වී ය. එක් එක් ශික්ෂාපදය “ආප්ත(ආගමික)වචනය, සිද්ධාන්තය” ආදී අර්‍ථයෙන් **සුත්ත** (සූක්ත) නම් වේ. ඒ නමින් උභතොවිභඞ්ගය **සුත්තවිභඞ්ගය** යි ද කියනු ලැබේ.

මෙසේ මෙහි (ඉහත xv වන පිටුවේ) සඳහන් නිදශීනදෙශනා ආදියෙහි දැක්වෙන විනය-අභිවිනය දෙකින් **විනය** නම් වූ උභතොවිභඞ්ගය පළමුවෙන් සඞ්ගායනා කරණ ලද බව සිතිය යුතු. (ඒ පිටුවේ 9 වන පෙළ වචන කීපයක් අඩු වීමෙන් “උභතොවිභඞ්ගය අභිවිනය ය” යි යෙදී තිබේ. එහි “උභතොවිභඞ්ගය **විනය**” ය යි ද, “ඛන්ධක හා පරිවාරය **අභිවිනය**” ය යි ද ගත යුතු.)

සංගීතිකථාවෙහි “**එතෙනෙව උපායෙන උභතොවිභඞ්ගෙ පුච්ඡි**” යි විනයසංගීතිපාළිය සංක්ෂෙප කිරීම නිසා උභතොවිභඞ්ගය හැර විනයෙහි සෙසු කොටස් සංගීත නො වූයේ ය යි රත්‍රිගවෙෂිවිමර්ශකයෝ විවාද කෙරෙති.

“**වුත්තම්හි එකධම්මෙ යෙ ධම්මා එකලක්ඛණා කෙචි-වුත්තා භවන්ති සබ්බෙ**”[1] – “එකට සම්බන්ධ වූ සමානලක්ෂණ ඇති යම් ධර්මයෝ වෙත් ද, ඔවුනතුරෙන් එක් ධර්මයක් කී කල්හි සියල්ලෝ ම කියන ලද්දෝ වෙත්” යනු ඔවුන්ට දිය යුතු පිළිතුර ය යි සිතමු.

විනය සංගීත වූ කල විනයලක්ෂණයෙන් ඊට සම්බන්ධ වූ **අභිවිනය** නම් වූ ඛන්ධකපරිවාරයන් ද සංගීත වීම න්‍යායානුගතසිද්ධියෙක් ම ය. නො එසේ නම් විනය සඞ්ගායනාව සම්පූර්ණ නො වේ. වුව මනා පමණ කාලය ගෙණ සංගීතියෙහි යෙදුනු සම්මුඛශ්‍රාවක වූ මහරහත්හු බුද්ධභාෂිත වූ විනයධර්මයෙන් අඩක් නො හැර ලත් ම ය.

“**ඉධ භික්ඛවෙ, භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො**” – “මහණෙනි, මෙහි භික්ෂු තෙමේ ප්‍රාතිමොක්ෂ-සංවරයෙන් යුක්ත ව වෙසෙ”යි වදාළ තැන ප්‍රාතිමොක්ෂසංවරය නම් **පන්සියක් රහතුන් විසින් පළමුවෙන් සඞ්ගායනා කළ උභතොවිභඞ්ග විනය** යි. එය **ආදිබ්‍රහ්මචරියකසීලයට** අයත් වේ.

---

1. නෙත්ති - ලක්ඛණහාර.

“**ආචාර ගොචරසම්පන්නො විහරති**” – “ආචාරයෙන් හා ගොචරයෙන් (මනා සේ හැසිරීමෙන්) සම්පූර්ණ ව වෙසෙසි.” යනු වදාළ තැන ආචාර ගොචරය නම් “**අනුජානාමි භික්ඛවෙ**...” යන ආදීන් අනුඥාත (මේ කට යුතු, මේ නො කටයුතු ය යි අනුදැන වදාළ) සික්ඛාපදයන්ට අයත් ආභිසමාචාරිකසීලය යි. එහි ආකල්පසමාචාරය පිළිබඳ ව වදාළ – පැවිදි, මහලුපැවිදි, ආචරිය – උපජ්ඣාය – අන්තෙවාසික – සද්ධිවිහාරික – ආගන්තුකාදි වූ වත්පිළිවෙත් හා භික්ෂුජීවිතයට අයත් පොහෝපවුරුණු කිරීම ද, සිවුපසය පිළිබඳ කප්පියාකප්පියවිධි හා සඞ්ඝකර්මාදිය ද ඇතුළත් සමූහ හෝ පරිච්ඡේද වසයෙන් බෙදුනු **ඛන්ධකවිනය ආභිසමාචාරිකසීලය** නම් වේ.

මෙසේ ශාස්තෘශාසනයෙහි ප්‍රාණය වූ ශීලය ආදිබ්‍රහ්මචරියක ආභිසමාචාරිකවසයෙන් හා සිරිත්විරිත් විසින් ද දෙවැදෑරුම් වේ. මේ දෙවැදෑරුම් වූ සීලය අනු ව ප්‍රථමසංගීතිකාරක වූ මහරහතුන් විසින් ප්‍රාතිමොක්ෂශික්ෂාපදයන් ඇතුළත් විනය **උභතොවිභඞ්ග** නමින් ද, අනුඥාතශික්ෂාපදයන් ඇතුළත් අභිවිනය **ඛන්ධක** නමින් ද, උභතොවිභඞ්ගයෙහි හා ඛන්ධකයන්ගේ අපොද්ධාරය වූ අභිවිනය **පරිවාර** නමින් ද සඞ්ගායනා කරණ ලදී. ඊට ‘පර්‍යාප්තිපාළිය’, ‘භාජනය’ යන අර්ථ ඇති පිටකශබ්දය[1] යොදා **විනයපිටක** ය යි නම් කොට “ඇවැත්නි, මෙය තොප ඇසුරෙහි වූවන් හදාරවා ලව” යි උපාලි තෙරණුවන්ට ම භාර කරණ ලදී.[2]

මෙසේ උභතොවිභඞ්ග, ඛන්ධක, පරිවාර වසයෙන් සංගීත වූ විනයපිටකය ග්‍රන්ථවශයෙන් භික්ඛුවිභඞ්ගයෙහි පාරාජික, සඞ්ඝාදිසෙස, අනියත, නිස්සග්ගිය යන කොටස් ඇතුළත් **පාරාජිකපාළිය**, භික්ඛුවිභඞ්ගයෙහි පාචිත්තියාදිය හා භික්ඛුණීවිභඞ්ගයෙහි සියලු සික්ඛාපද ඇතුළත් **පාචිත්තියපාළිය**, මහාඛන්ධකය ආදි ඛන්ධක දසයක් ඇතුළත් **මහාවග්ගපාළිය**, (විනය)ඛන්ධක දසයක් හා සංගීතිඛන්ධක දෙක ද ඇතුළත් **චුල්ලවග්ගපාළිය**, සොළොස් පරිවාරයෙන් යුත් **පරිවාරපාළිය** යි නම් කොට පොත්ථක සංගීතියෙහි දී ග්‍රන්ථ පසකට බෙදන ලදී.

“ඛන්ධකයන්ට අනතුරු ව පරිවාරපාඨය සංගීත වී ය යි අර්ථකථාවත් කියතත් එය පිළිගත නො හැකි ය. පරිවාරය බුද්ධකාලීන නො වේ. එහි සෙසු විනයග්‍රන්ථයන්හි නැති අමුතු විනයයක් නැත. එය ලක්දිව **දීප** නම් තෙර නමක් විසින් පසු කලෙක රචනා කරණ ලද්දකි” යි ඇතැම් ත්‍රිපිටකවිචාරකයෝ කියති. මෙයට පිළිතුරු පහත දැක්වේ:

“**යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං**?” යන ආදි පුච්ඡාවිස්සජ්ජනයෙන් පරිවාරය ආරම්භ වෙයි. මේ පාළිය උභතොවිභඞ්ගය සංගීත වූ ආකාරයට සරි ලයි. උභතොවිභඞ්ගයට අයත් සියලු ශික්ෂාපද ප්‍රශ්නොත්තරවශයෙන් විසඳමින් “පඤ්ඤත්තිවාරය, කතාපත්ති(කති ආපත්ති)වාරය, විපත්තිවාරය, සඞ්ගහවාරය, සමුට්ඨානවාරය, අධිකරණවාරය, සමථවාරය, සමුච්චයවාරය” යි වාර අටකින් ද, “**මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං**?” යන ආදියෙහි ‘පච්චය’ පදය සමග යොදා ඉහත කී

1 “මා පිටකසම්පදානෙන,” කාලාමසූත්‍රය, අංගුත්තර – නිකාය. මහාවග්ග, සූත්‍රය 5. මෙහි පිටක ශබ්දයෙන් ‘ග්‍රන්ථය, තන්තිපාළිය, පර්‍යාප්තිය’ කියවේ. “පිටකසම්පදාය” මජ්ඣිම, චංකීසූත්‍රය. ‘මෙහි පිටක ශබ්දයෙන් ‘පදවලිය, වචන ගැළපීම’ යන අර්ථය කියවේ.

2. සුමඞ්ගලවිලාසිනී.

Free Distribution www.aathaapi.org

වාර අට නැවත කීමෙන් ද සි මෙසේ සොළොස් වාරයකින් පාරාජිකාදි සියලු ශික්‍ෂාපදයෙන් පිරිවැරුණු හෙයින් තද්විෂය වූ සංග්‍රහය එහි දක්වූ ඛන්‍ධකපුච්ඡාදියත් සමග පරිවාර නම් වී ය.

මෙහි බුද්ධභාෂිත හා (ආචරියවංස-උද්දානාදිගාථාබන්‍ධවසයෙන්) ශ්‍රාවකභාෂිතයෝ ද ඇතුලත් වෙති. මෙහි විස්තර වන විනයක්‍රම අනෙක් විනයපාළියක දක්නට නො ලැබේ. සොළසපරිවාර, ඛන්‍ධකපුච්ඡා, එකොත්තරාදිවිභාගය, විනයසාමුක්කංස (සතර මහාපදෙස පිළිබඳ "සුත්තං සුත්තානුලොමං විනයං විනයානුලොමං" යි කී මූලපද), උපාලිපඤ්චක, සෙදමොචනගාථා, බ්‍රහ්මදණ්ඩ[1] යන ආදිය පරිවාරයෙහි ම දක්නා ලැබේ. මෙහි උපාලිපඤ්චකයෙහි "ථෙරො කිර ... භගවන්තං උපසඞ්කමිත්වා 'කති හි නු ඛො භන්තෙ' ති ආදිනා නයෙන පඤ්ඤෙහ පුච්ඡි[2] –" "ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, 'කෙතෙකින් ස්වාමීනි,' ආදීන් ප්‍රශ්න විචාළේ ය" යනු අර්ථකථායි. ගාථාසඞ්ගණිකාවෙහි "චොදනාකිමත්ථායාති ආදිකා පුච්ඡා උපාලිත්ථෙරෙන කතා. චොදනා සාරණත්ථායාති ආදි විස්සජ්ජනං භගවතා වුත්තං"[3] යනු ටීකායි. මෙයින් පරිවාරයෙහි එන සියලු විනය ප්‍රශ්නයන් උපාලි තෙරුන් විසින් අසනලද බවත් බුදුරජුන් විසින් විසඳූ බවත් සංගීතිකාලයෙහි ඒ වූ පරිදි පුච්ඡාවිස්සජ්ජනයෙන් සංගීත වූ බවත් පැහැදිලි වේ.

පර්‍ය්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ යන ත්‍රිවිධසද්ධර්මයාගේ චිරස්ථිතියට හෙතු වන්නේ උභතොවිභඞ්ග, ඛන්‍ධක, මාතිකා යන ත්‍රිවිධවිනයධර්මය යි. මේ ත්‍රිවිධවිනයසඞ්ඛ්‍යාත පුෂ්පරාශිය ගෙතී පවත්නා සූත්‍රය(හුය) නම් පරිවාරය යි. එබැවින් පරිවාරය සද්ධර්මස්ථිතියට උපකාරය වේ. එහෙයින් කීහ පරිවාරයෙහි:

"එවං තීයති සද්ධම්මො විනයො යදි තිට්ඨති,
උභතො ච විභඞ්ගානි ඛන්‍ධකා යා ච මාතිකා,
මාලා සුත්තගුණෙනෙව පරිවාරෙන ගන්‍ථිතා"[4] යි.

විනයටීකාචාර්‍ය්‍යයන් මෙයට ලියූ ටීකාවෙහි මෙසේ දක්වේ: "**විනය පරියත්ති පන කථං තිට්ඨති ... පරිවාරෙ ගන්‍ථිතා තිට්ඨති**"– "විනය පර්‍ය්‍යාප්තිය කෙසේ පවත්නේ ද? පරිවාරයෙහි ගෙතී පවත්නේ ය".

"**තස්මා සික්ඛෙ පරිවාරං ධම්මකාමො සුපෙසලො**" – "එහෙයින් ධර්මය කැමැති ප්‍රියශීල තෙමේ පරිවාරය උගන්නේ ය."

"**පරිවාරං අජානන්තො කුතො ධම්මවිනිච්ඡයං**" – "පරිවාරය නො දන්නේ කෙසේ ධර්මවිනිශ්චය දන්නේ ද?". "**සද්ධම්මවිනයො පරිවාරෙන සොභති**" – "විනයසද්ධර්මය පරිවාරයෙන් බබලයි".

---

1. "බ්‍රහ්මදණ්ඩ" මහාපරිනිර්වාණ සූත්‍රයෙහි ද (එහි ආ පරිදි) චුල්ලවග්ග - පංචසතික ඛන්‍ධකයෙහි ද දක්වේ. එය ද අපලොකනකර්මයට අයත් විනයකර්මයක් වශයෙන් පරිවාරපාළියෙහි මිස අනෙක් විනයපාළියක දක්නා නො ලැබේ

2. විනයට්ඨකථා, පරිවාරවණ්ණනා 1017 පිටුව. 3. විමතිවිනොදනී, 499 පිටුව.
4. පරිවාර, (සද්ධාතිස්ස-මුද්‍රණ) 130 පිටුව.

Free Distribution www.aathaapi.org

මේ ආදියෙන් වර්ණිත වූ පරිවාරපාළිය ධර්මසංග්‍රාහකයන් විසින් සඞ්ගෘහීත ය යි අර්ථකථා ද ටීකාවෝ ද කියති. ත්‍රිපිටකයෙහි සංගීත වූ ද නො වූ ද කොටස් මේ මේ ය යි අර්ථකථාවන්හි දැක්වේ. එක ද අර්ථකථාවක හෝ ටීකාවක, එක ද ථේරවාදිසාසනඉතිහාසයක පරිවාරය සංගීත නො වූයේ යි කියන ලද්දේ නො වේ. එහෙත් වර්තමාන ත්‍රිපිටක-පරීක්ෂකයෝ "පරිවාරය නම් සංගීත්‍යාරූඪ නො වී ය. එය **දීප** නම් වූ තෙරනමක් විසින් කරණ ලද බව පරිවාරයෙන් ම ස්ඵුට වේ ය" යි කියමින් ග්‍රන්ථාවසානයෙහි දැක්වෙන මේ නිගමනගාථා ඉදිරිපත් කෙරෙති:

"පුබ්බාචරියමග්ගං ච පුච්ඡිත්වා ච තහිං තහිං,
**දීප**නාමො මහාපඤ්ඤො සුතධාරී විචක්ඛණො,

ඉමං විත්ථාරං සඞ්ඛෙපං සජ්ඣාමග්ගෙන මජ්ඣිමෙ,
චින්තයිත්වා ලිඛාපෙසි සිස්සකානං සුඛාවහං".

මෙහි අර්ථ විමසීමේ දී පරිවාරය සඞ්ගායනාරූඪ නො වූබවක් හෝ දීපතෙරුන් විසින් එය පසු ව කරණ ලදබවක් හෝ නො පෙණේ.

"මහාප්‍රාඥ වූ ශ්‍රැතධාරී වූ සියුම් වූ දර්ශන ඇති **දීප** නම් ස්ථවිරතෙමේ ඒ ඒ කරුණෙහි පූර්වාචාර්යයන්ගේ කථාමාර්ගය ද විචාරා දැන **මධ්‍යදේශයෙහි** (ආචාර්යවරයන්ගේ) වාචනාමාර්ගයෙන්[1] (මුඛපාඨවශයෙන්) සිතා සමෘතියෙන් දුරූ පරිදි (සොළසපරිවාරාදියෙන්) විස්තර සහිත වූ (සමුට්ඨානසීසසංඛෙපාදියෙන් හා පෙය්‍යාලමුඛයෙන්) සංක්ෂෙප වූ විනයෙහි හික්මෙනුවන්ට සුව එළවන්නා වූ මේ විනයසංග්‍රහය ලියවී ය" යනු මෙහි අභිප්‍රෙත වූ අර්ථය වේ.

මෙහි ධ්වනිතාර්ථය නම් ලක්දිව හා දඹදිව පැවති ආචාර්යපරම්පරාවෙන් මුඛපාඨවශයෙන් දුරූ පරිවාරපාඨය සංගීත වූ පරිද්දෙන් පොත්ථකාරෝහ සංගීතිසමයෙහි දීප තෙරණුවන් විසින් ග්‍රන්ථාරූඪ කරවූ බව වේ. විනය ප්‍රඥප්තිය හා විනයකර්මවිභාග බුදුරජුන්ට ම විෂය වේ. එය ශ්‍රාවකයන්ට විෂය නො වේ. ශ්‍රාවකයෝ බුදුරජුන් වදාළ ක්‍රමය අනු ව එය විස්තර කෙරෙති. එහෙයින් පරිවාරවිනයය දීප තෙරුන් විසින් නිපදවූවක් විය හැකි නො වේ.

ඒ හැර "**පොරාණකෙහි මහාථෙරෙහි ගාථායො ඨපිතා**"[2] යන අර්ථකථාවෙන් පරිවාරයෙහි ආචාර්යවංශසන්දර්ශනගාථා පුරාණාචාර්යවරයන් විසින් තබන ලදබව කියවේ. "**පොරාණකෙහි මහාථෙරෙහීති සංගීතිතොයතො පච්ඡා පොත්ථකසංගීතිකාරකෙහි ඡළභිඤ්ඤාපටිසම්භිදාදිගුණ සමුජ්ජලෙහි මහාථෙරෙහි**"[3] යන ටීකාපාඨයෙන් පුස්තකසංගීතිකාරක වූ ෂඩභිඥාදිගුණයෙන් බැබලුනු මහතෙරුන් විසින් ගාථා තැබූ බව ප්‍රකාශ වේ. මේ අර්ථකථා – ටීකා ලියූ ආචාර්යයෝ "**දීපනාමො... ඉමං ලිඛාපෙසි**" යනු නො දුටුවෝ ය යි නො සිතිය යුතු. දීපතෙරුන් විසින් පරිවාරය

---

1. ස්ථවිරවාදි ආචාර්ය පරම්පරාගත වාචනාමාර්ගය අශෝකාධිරාජයන් විසින් විදේශීය ධර්මප්‍රචාරය ආරම්භ කරණ තුරු මධ්‍යදේශයෙහි ම පැවැත්තේ ය. මිහිඳුමහරහතන්වහන්සේ විසින් ලක්දිවට ගෙණෙන ලද්දේ මධ්‍යදේශයෙහි පැවැති ඒ වාචනාමාර්ගය යි.

Cf. "Prior to the despatch of missionaries by Asoka, Buddhism as a religious movement was confined, more or less, within the territorial limits of what is known in Buddhist literature as the Middle Country (Majjhimadesa) and the Buddhist tradition in Pali is very definite on this point". A History of Pali Literature, Vol. 1. p. 9.

2. සමන්තපාසාදිකා, (හේවාවිතාරණ මුද්‍රණ) 960 පිටුව. 3. විමතිවිනොදනී, 484 පිටුව.

Free Distribution www.aathaapi.org

අමුතුවෙන් ලියවන ලද නම් මේ පාඨයන් මෙසේ නො කියූහ. කෙසේ හෝ මේ පාඨයන්ගෙන් පෙණෙන්නේ අට්ඨකථා-ටීකාචාර්‍ය්‍යවරයන්ගේ පිළිගැණීම පරිවාරය සංගීති තුණෙන් ම සංගීත වූ බවත් පොත්කසංගීතියෙහි දී ග්‍රන්ථාරූඪ වූ බවත් ය. **දීප**තෙරණුවන් ද ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙහි සහභාගි වූ සිංහල රහතුන් පන්සියය අතුරෙන් කෙනෙකුන් බව සිතිය යුතු.

තව ද,

> "පරිවාරං අත්‍ථුද්ධාරං අභිධම්මං ඡප්පකරණං,...
> එතතකං විසජ්ජෙත්වාන අඤ්ඤනි අකරිංසු තෙ"[1]

යන දීපවංසගාථාවෙන් ද්විතීයසංගීතියෙන් පසු ඇති වූ මහාසඞ්ඝික නිකායිකයන් විසින් විනයෙහි අර්ථොද්ධාරය වූ පරිවාරයත් අභිධර්මප්‍රකරණ සයත් අත්හළ බව කියවේ. මේ ඓතිහාසිකවාර්තාව සත්‍යය යි පිළිගණිතොත් ප්‍රථමසඞ්ගායනාවේ පටන් පරිවාරය මුඛපාඨ වශයෙන් දඹදිව පැවැති බව නිශ්චිත වෙයි.

ද්විතීයසංගීතියෙහි සංගීතිකාරක රහතුන් විසින් විනයවිරොධිදශවස්තුව විසඳන ලද්දේ "සුත්තං සුත්තානුලොමං, විනයං විනයානුලොමං"යි පරිවාරයෙහි දැක්වෙන මහාපදෙසයන් ප්‍රමාණ කොට ගෙණ බව "**කත්‍ථ පටික්ඛිත්තං ? සාවත්‍ථියං සුත්තවිභඞ්ගෙ**" යන ආදියෙන් පෙණේ. ඒ සඞ්ගායනාවේ දී ථෙරවාදිසඞ්ඝයාගෙන් බැහැර කරණු ලැබූ අධම්මවාදි වජ්ජි භික්‍ෂූන්ට පරිවාරය රුචි නො වූ බව හැඟේ. ඒ කෙසේ වෙතත් සම්බුද්ධපරිනිර්වාණයෙන් පළමුවන ශතවර්ෂයෙහි පරිවාරවිනය දඹදිව ථෙරවාදයෙහි පැවැති බව සත්‍යයක් විය යුතු.

මේ හැර **අශොකාධිරාජයන්** විසින් අභිෂෙකයෙන් දොළොස් වන හෝ තෙළෙස් වන වර්ෂයෙහි (තෘතීයසඞ්ගායනාවට වර්ෂ පහකට පෙර) ලියවා තබන ලද **භාබ්‍රා** (**භාබ්‍රා** -**බෛරාට්**) නමින් දන්නා ලද ශිලාලෙඛනයෙහි සඳහන් "**විනයසමුකසෙ**" යනුවෙන් පරිවාරය අදහස් කරන්නට ඇති බව සිතිය හැකි වෙයි. මේ කරුණ ගැණ විමසීම සඳහා ඒ ශිලාලිපිය මෙහි දක්වනු ලැබේ:

### භාබ්‍රා – ශිලාලිපිය

1. "ප්‍රියදසිලාජා මාගධෙ සංඝං අභිවාදෙතුනං
   ආහා අපාබාධතං ච ඵාසුවිහාලතං චා [.]

2. විදිතෙ වෙ භංතෙ ආවතකෙ හමා
   බුධසි ධංමසි සංඝසි ති ගාලවෙ ච
   ප්‍රසාදෙ ච [.] එ කෙචි භංතෙ

3. භගවතා බුධෙන භාසිතෙ සවෙ සෙ
   සුභාසිතෙ වා [.] එ චු ඛො භංතෙ හමියා යෙ
   දිසෙයා හෙවං සධමෙම

4. චිලඨිතිකෙ හොසතී ති අලහාමි
   හකං තං වතවෙ [.] ඉමානි භංතෙ
   ධංමපලියායානි විනයසමුකසෙ

---

1. දීපවංස (මුද්‍රිත) 25 පිටුව.

5. අලියවසානි අනාගතභයානි මුනිගාථා
මොනෙයසුතෙ උපතිසපසිනෙ එ චා
ලාඝුලො –

6. වාදෙ මුසාවාදං අධිගිච්‍ය භගවතා
බුධෙන භාසිතෙ[.] එතානි භංතෙ
ධංම පලියායානි ඉච්ඡාමි

7. කිං ති බහුකෙ භිඛුපායෙ චා
භිඛුනියෙ චා අභිඛිනං සුනෙයු චා
උපධාලයෙයු චා

8. හෙවංමෙවා උපාසකා චා උපාසිකා චා [.]
එතෙනි භංතෙ ඉමං ලිඛාපයාමි
අභිප්‍රෙතං මෙ ජානංතූ ති".

## සිංහල අනුවාදය

මගධදෙශයෙහි ප්‍රියදර්ශි රජ තෙම සඞ්ඝයා සකසා වැඳ නීරොග බව ද ඵාසුවිහරණය ද විචාරයි.

වහන්ස, බුද්ධධර්මසඞ්ඝ යන තුන් තන්හි මාගේ ගෞරවය ද ප්‍රසාදය ද කොතරම් දැයි (ඔබවහන්සේ විසින්) දන්නා ලද ම ය.

වහන්ස, බුදුරජුන් විසින් යමක් වදාරණ ලද නම්, ඒ සියල්ල මනා කොට වදාරණ ලද්දේ ම ය.

වහන්ස, "සද්ධර්මය මෙසේ චිරස්ථායී වන්නේ ය" යි සිතා මෙය මම කියමි. එය කීමට මම සුදුසු ද වෙමි.

වහන්ස,

1. විනයසාමුක්කංස, 2. අරියවංස, 3. අනාගතභය,
4. මුනිගාථා, 5. මොනෙය්‍යසූත්‍ර, 6. උපතිස්සපඤ්හ,
7. මුසාවාදය කරුණු කොට ගෙණ භාග්‍යවත් බුදුරජුන් විසින් වදාළ රාහුලොවාදය ද යන ධර්මපර්‍ය්‍යායයෝ වෙති.

වහන්ස, බොහෝ පූජ්‍යභික්ෂූහු ද භික්ෂුණීහු ද එසේ ම උපාසකයෝ ද උපාසිකාවෝ ද මේ ධර්මපර්‍ය්‍යායයන් නිතර අසත් නම් දරත් නම් මැනවැ යි මම අපේක්ෂා කරමි.

වහන්ස, මාගේ ඒ අභිප්‍රාය දනිත්වා යි මේ ධර්මයන් මෙහි ලියවමි.

**අශෝකාධිරාජයන්** විසින් මෙයට අවුරුදු දෙදහස්දෙසියහැත්තෑවකට පමණ පෙර පිහිටුවන ලද මේ ශිලාලිපිය ස්ථවිරවාදීන්ගේ ධර්ම විනය පිළිබඳ ඉතිහාසය සනාථ කිරීමෙහි ප්‍රබල වූ සාධකයක් වේ.

"බුදුරජානන් වහන්සේ විසින් වදාළ සියලු ධර්මය සුභාෂිත (ස්වාක්ඛාත)ය. එයින් මේ ධර්මපර්‍ය්‍යායයෝ සද්ධර්මශාසනස්ථිතිය සඳහා අතිශයින් උපකාරී වෙති. එහෙයින් මේ ධර්මපර්‍ය්‍යායයෝ (දෙශනාවෝ) භික්ෂුභික්ෂුණීන් විසින් ද, එසේ ම උපාසකඋපාසිකාවන් විසින් ද සුදුසු පරිදි පුගුණ කළ යුත්තාහ.

විනයසමුක්කසයෙහි 'උත්කර්ෂය, ශ්‍රෙෂ්ඨය, සාරය' යන අර්ථ හා ගැළපෙන 'ප්‍ර - අති මොක්ෂ, ප්‍ර-මුඛ' යන අර්ථ ඇති ප්‍රාතිමොක්ෂය 'විනයසමුක්කස' විය හැකි බවත්, වරක් **රිස්ඩේවිඩ්ස්** මහතා සිතූ පරිදි එය පරිවාරය නොවන බවත් **ඕල්ඩන්බර්ග්** මහතා කියයි.[1]

**රිස්ඩේවිඩ්ස්** මහතා විනයසමුක්කසය කුමක් ද යනු සැක සහිත බවත්, එය අඳුනා ගැණීම දුෂ්කර බවත්, එය ප්‍රාතිමොක්ෂය නො විය හැකි බවත් පසු ව කිය යි[2].

ධර්මප්‍රතිපදාවක් වශයෙන් ගත යුතු තුවටකසූත්‍රයෙහි සත්වන ගාථාවේ "පාතිමොක්ඛං, සමාධිං" යි යෙදී තිබෙන බැවින් අශොක රජුගේ විනයසමුක්කසය (ප්‍රාතිමොක්ෂය) ඒ සූත්‍රයෙහි දැක්වේ ය යි **ඩී. ආර්. භණ්ඩර්කාර්** මහතා කියයි[3].

ප්‍රාතිමොක්ෂය විනයපිටකයට අයත් වෙන් වසයෙන් පැවැති ග්‍රන්ථයක් නො වේ. එය උපොසථයෙහි දෙසීම සඳහා ප්‍රගුණ කිරීමේ පහසුව සලකා සකස් කරණ ලද ග්‍රන්ථයකි. එය මුලින් පැවැත්තේ මුඛපාඨ වසයෙනි. එහි සඳහන් ශික්ෂාපද සියල්ල නිදානාදි විභාග සහිත ව උභතොවිභඞ්ගයෙහි ඇතුළත් වේ. එහි සාරය දැක්වෙන්නේ පරිවාරයෙහි ය. "ධම්මධරා, විනයධරා, මාතිකාධරා" යි පෙළෙහි දැක්වෙන බැවින් විනයපිටකය වූ

---

1. "The Vinayasamākasa (-Vinayasamākarsha) is, I think, certainly not the Parivāra as Mr. Davids once supposed... The expression "Substance of the Vinaya" seems to me to apply very well to the Pātimokkha." Vinayapitaka, Vol. 1. XL.

"It is just possible that Vinayasamukase may refer to the Old Commentary as well as to the Pātimokkha... And Vinayasamukase cannot for the reasons above stated mean, as has been supposed, the Parivāra-pātha." S.B.E. Vol. XIII, Introd. by Rhys Davids, and Oldenberg, pp. xxvi-xxvii.

2. "The Pātimokkha can scarcely be rightly called a Dharmaparyaya and it does not correspond to the meaning of the title used by Asoka. The noun Samukasa has not been found in the Pitaka.... The Exaltation of Vinaya (Vinayasamukasa)... is much more probably meant as the title of some short Sutta or passage in praise cf Vinaya in one or other of its two senses, ethical or legal. And I quite agree, therefore, with Mr. M. Senart (p. 204) in regarding this identification as unsatisfactory." Rhys Davids, JRAS. Vol. 30. (1898) p. 639.

මෙයින් ප්‍රාතිමොක්ෂය ධර්මපර්‍යායයකැයි නිවැරදි ව කිය හැකි නො වන බවත්, එය අශොක රජතුමා යෙදූ නාමයේ අර්ථයට නො ගැළපෙන බවත්, සමුකස නාමය පිටකයෙහි දක්නට නො ලැබුන බවත්, විනය සමුකසය වෙන යම් සූත්‍රයක් හෝ දෙශනාවක් විය හැකි බවත්, විනයසමුකසය ප්‍රාතිමොක්ෂය යි හැඳින්වීම සෑහීමකට පත් නො වන්නක් යයි සෙනාට් මහතාගේ කීම පිළිගන්නා බවත් රිස් ඩේවිඩ්ස් මහතා කියයි.

3. Cf. Asoka, by Dr. Bhandarkar, pp. 86-88.

මෙහි භණ්ඩර්කාර් මහතා විශුද්ධිමාර්ගයෙහි (හේවාවිතාරණ මුද්‍රණ 69 වන පිටුවේ) දැක්වෙන "රථවිනීතපටිපදා, නාලකපටිපදා, තුවටකපටිපදා, මහාඅරියවංසපටිපදා" ගැණ ද සඳහන් කරයි.

"විනයසමුක්කසෙ යනුවෙන් ප්‍රථම සූත්‍රදෙශනාවේ දැක්වෙන චතුසත්‍යය ප්‍රකාශ වන 'සාමුක්කංසිකා ධම්මදෙශනා' යන පාඨය අශොක රජතුමා විසින් මෙහි දී සිතන්නට ඇතැයි ඒ. ජේ. ඇඩ්මන්ඩ්ස් මහතා කියයි. [JRAS, 1913, p. 387]. බී. ඇම්. බරුවා මහතා එය ගිහිවිනය නම් වූ සිගාලොවාද සූත්‍රය යි කියයි." Cf. Asoka by R. Mookerji, p. 118, Note 3.

උභතොවිභඞ්ගඛන්ධකපාරිවාර .විනයවසයෙන් ද පාතිමොක්ඛය මාතිකා වසයෙන් ද බුද්ධකාලයෙහි පටන් වෙන්වෙන් ව දරූ බව පෙණේ. එබැවින් ධර්මපර්‍යායයක් වශයෙන් දක්වූ විනයසමුක්කසය ප්‍රාතිමොක්‍ෂය නො ව සතර මහාපදෙශ ඇතුළත් වූ පරිවාරය යි සැලකීම යුක්ති යුක්ත වේ.

අපගේ මේ විමසීමෙන් **අශොකාධිරාජයන්ගේ භාබ්‍රශිලාලිපියෙහි** සඳහන් **සද්ධර්මස්ථිතිය** සඳහා උගත යුතු **බුද්ධභාෂිතධර්මපර්‍යායයක්** වූ විනයසමුක්කසය විනයසාමුක්කංස නම් වූ සතරමහාපදෙසයන් ඇතුළත් පරිවාරපාඨය ම සඳහා යොදන ලදැයි ඔප්පු වේ. එය අශොකකාලයටත් පෙර සිට මද්ධ්‍යදෙශයෙහි ථෙරවාදීන් විසින් “තස්මා සික්ඛෙ පරිවාරං ධම්මකාමො සුපෙසලො” යි අනුශාසිත වූ පරිදි පුහුණු කළ බවත්, නිකායාන්තර මතභෙදයෙන් භින්න ව කැප නො කැප නො සලකා ප්‍රත්‍යයගෙධයෙන් කවිකථාදියෙහි ඇලී ප්‍රතිපත්තියෙහි නො ඇලී විසූ භික්‍ෂුභික්‍ෂුණීන්ට – විශෙෂයෙන් **මාත්ස්‍ය**, **සූරසෙන**, **චෙදි** (වර්තමාන **රාජ්පුටානා**) ප්‍රදෙශවාසී සඞ්ඝයාට එය අසා දැන පුහුණු කට යුතු ය යි රජතුමා දුන් අවවාදය බවත් මේ ලිපියෙන් නිගමනය වන්නේය.

මේ තාක් දක්වූ කරුණුවලින් පරිවාරය බුද්ධභාෂිත වූ විනයොපදෙශයෙන් හා උපාලි ආදී මහරහතුන්ගේ වාචනාමාර්ගයෙන් යුක්ත බවත්, එය සංගීති තුනෙන් ම සංගීත වූ බවත්, **දීප**තෙරණුවන් විසින් ග්‍රන්ථාරූඪ කරවූ බවත් පැහැදිලි වේ ය යි සිතමු.

## 2. සූත්තන්තපිටකය.

විනයසඞ්ගායනාවට අනතුරු ව ධර්මසඞ්ගායනාව ආරම්භ කළ **මහාකාශ්‍යප**ස්ථවිරයන් වහන්සේ විසින් බ්‍රහ්මජාලසූත්‍රයෙහි පටන් ඒ ඒ සූත්‍රයන්ගේ නිදාන – පුද්ගල ආදිය විචාරණු ලැබූ ධර්මභාණ්ඩාගාරික **ආනන්ද**ස්ථවිරයන් වහන්සේ විසින් “එවං මෙ සුතං එකං සමයං භගවා අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නො හොති......” යන ආදීන් බ්‍රහ්මජාලසූත්‍රයෙහි පටන් එක් එක් සූත්‍රය පිළිබඳ නිදානාදිය දක්වමින් එක් එක් සූත්‍රය විසඳූ පසු මහරහතුන් වහන්සේ විසින් ගණසජ්ඣායනා කොට ඒ සියලු ධර්ම ශාසනව්‍යවහාරයෙහි ‘සමූහය’, ලොකව්‍යවහාරයෙහි ‘නිවාසය’ යන අර්ථ ඇති **නිකාය** ශබ්දය යොදා දීඝනිකායාදි නිකාය පසකට බෙදන ලදී. එහෙයින් ඛීහ සංගීතිපාළියෙහි: “එතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි” යි.

ඒ ඒ ධර්මපර්‍යායයන්ගේ ස්වරූප බලා නිකාය පස මෙසේ නම් කරණ ලදී:

(i) දීඝප්‍රමාණ ඇති **බ්‍රහ්මජාල** ආදි සූත්‍ර සූතිසක් (34) ගෙණ වර්ග තුණකට බෙදා සඞ්ග්‍රහ කොට ඊට **දීඝනිකාය** යි නම් තබා එහි බණවර[1] සූසැටක් (64) පමණ වූ පාළිය සජ්ඣායනා කොට (සුමඞ්ගලවිලාසිනියෙහි කී පරිදි) “ඇවැත්නි, මෙය තොප ඇසුරූ කරණුවන් හදරව” යි **ආනන්ද**ස්ථවිරයන්වහන්සේට භාර කරණ ලදී.

(ii) මධ්‍යමප්‍රමාණ වූ **මූලපරියාය** ආදි සූත්‍ර එක්සියදෙපණසක් (152) පණ්ණාස තුණකට හා වර්ග පසළොසකට බෙදා සඞ්ග්‍රහ කොට **මජ්ඣිම නිකාය** යි නම් තබා එහි බණවර අසූවක් (80) පමණ වූ පාළිය සජ්ඣායනා කොට “ඇවැත්නි, මෙය පරිහරණය කරවූ” යි දම්සෙනෙවි සැරියුත් තෙරණුවන්ගේ අන්තෙවාසිකයන්ට පවරණ ලදී.

1. අකුරු 8000 ක් එක් බණවරෙකි

Free Distribution www.aathaapi.org

(iii) **ඔඝතරණ** ආදි සත්දහස්සත්සියදෙසැටක් (7762) සූත්‍ර සංයුත්තවසයෙන් බෙදා ඊට **සංයුත්තනිකාය** ය යි නම් තබා එහි බණවර සියක් (100) පමණ වූ පාළිය සජ්ඣායනා කොට "ස්වාමීනි, මෙය සිය අතැවැසියන් ලවා හදරවන සේක්වා" යි **මහාකාශ්‍යප** ස්ථවිරයන්වහන්සේට භාර කරණ ලදී.

(iv) එක් එක් අඞ්ගයෙන් වැඩී සිටි **චිත්තපරියාදාන** ආදි නවදහස් පන්සියසත්පණසක් (9557) සූත්‍ර සඞ්ග්‍රහ කොට ඊට **අංගුත්තරනිකාය** යි නම් තබා එහි බණවර එක්සියවිස්සක් (120) පමණ වූ පාළිය සජ්ඣායනා කොට "ඇවැත්නි, මෙය තොප ඇසුරෙහි වූවන් ලවා හදරව" යි **අනුරුද්ධ** ස්ථවිරයන් වහන්සේට පවරණ ලදී.

(v) ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදා, අපදාන, බුද්ධවංස, චරියාපිටක යන දෙසනාපාළිය සඞ්ගායනා කොට **ඛුද්දකනිකාය** යන නමින් තබන ලදි. ධර්මවිනය නිකාය පසට පමණක් බෙදීමේ දී මුලින් කී නිකාය සතර හැර සෙසු සියලු බුද්ධවචන ඛුද්දකනිකායට ඇතුළත් බව සැලකිය යුතු.

මෙතෙකින් ප්‍රථමසංගීතිපාලියෙහි අර්ථකථාව අවසන් කරණ අර්ථකථාචාර්‍ය්‍යපාදයෝ මෙසේ කියති: "තත්ථ ඛුද්දකනිකායො නාම: චත්තාරො නිකායෙ ඨපෙත්වා අවසෙසං බුද්ධවචනං. තත්ථ විනයො ආයස්මතා උපාලිත්ථෙරෙන විසජ්ජිතො. සෙසඛුද්දකනිකායො චත්තාරො ච නිකායා ආනන්දත්ථෙරෙන" – "එහි (සංගීතිපාළියෙහි දක්වූ පඤ්චනිකාය අතුරෙන්) ඛුද්දකනිකාය නම්: දීඝාදිනිකාය සතර හැර සෙසු බුද්ධවචනයි. එහි විනයය ආයුෂ්මත් **උපාලි** තෙරුන් විසින් විසඳන ලදී. සෙසු බුද්ධවචන සහිත වූ ඛුද්දකනිකාය හා මුලින් කී නිකාය සතර ද ආයුෂ්මත් **ආනන්ද**තෙරුන් විසින් විසඳන ලදී."

මේ පාඨයෙන් සංගීතිය පැවැත්වූ ක්‍රමය ආමර්ශනය කෙරෙයි. බුද්ධවචන වූ සියලු පර්‍ය්‍යාප්තිපාලිධර්මය බුද්ධකාලයෙහි "සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං" යන ආදි නවාඞ්ගයකට බෙදන ලද බව යට (xiv පිටුවේ) සඳහන් කරණ ලදී. මේ බෙදීම සිත තබා ගෙණ සංගීතිය පැවැත්වූ මහරහතුන් වහන්සේ ඒ නවාඞ්ගය මහාපරිනිර්වාණසූත්‍රයෙහි ධර්මවිනය වශයෙන් බෙදා වදාළ පරිදි සඞ්ගායනාව පැවැත්වූහ. එහි අඞ්ගවශයෙන් සූත්‍රයට අයත් විනයපර්‍ය්‍යාප්තිය උභතොවිභඞ්ගඛන්ධකපරිවාර වශයෙන් සංගීත ය. සූත්‍රයෙන් විනය වෙන් කොට ගත් කල්හි සූත්‍රනාමයෙන් ගතයුතු ඉතිරි සියලු ධර්මය දීඝාදිනිකාය සතරෙහි සඞ්ගෘහීත වී ය. ශෙෂ වූ බුද්ධවචන සංගීත වූ සැටියෙන් විනයයෙහි ඇතුළත් විය නොහැකි වේ. එසේ ම දීඝාදිනිකායසතරෙහි ද ඇතුළත් නො වේ. එබැවින් ඒ බුද්ධවචන සියල්ල ඛුද්දකනිකාය නම් වී ය. එහි විනයධරයන්ගෙන් අගතැන් පැමිණි උපාලි තෙරණුවෝ විනය විසඳූහ. ධර්මධරයන්ගෙන් අගතැන් පැමිණි ආනන්දතෙරණුවෝ දීඝාදිනිකාය සතර හා අභිධර්මය සහිත වූ ඛුද්දකනිකාය යන පඤ්චනිකායය විසඳූහ.

පිටක වසයෙන් බෙදීමේ දී අනන්තගීත වූ සියලු ධර්ම සූක්ත (ස්වාක්ඛාත) හෙයින් නිකාය පස **සූත්තන්තපිටක** යන නමින් දත්නා ලදී. දෙශනාපාලියෙහි සංගීතිපරියාය ආදියෙහි පෙණෙන 'එක් ව ගැයීම' යන අර්ථ

ඇති '**සංගීති**' ශබ්දය යොදා නිකාය පස '**දීඝසංගීති**' ආදි විසින් ද ව්‍යවහාර කරණු ලැබේ. සිංහලයෙන් දික්සඟි මැදුම්සඟි සංයුත්සඟි අඞ්ගුත්තරසඟි කුදුගත්(කුදුගොත්)සඟි යයි කියනු ලැබේ. "ආගතාගමා" ආදි තන්හි පෙණෙන '**ආගම**' ශබ්දය සමග යොදා '**දීඝාගම**'[1] ආදි වසයෙන් ද දත්නා ලදි.

අට්ඨකථාවන්හි 'චතුරාගමා' යි දීඝාදිනිකාය සතර සූත්‍ර විෂයයෙහි ප්‍රධානත්වයෙන් වෙසෙසා දක්වේ. එයින් ඛුද්දකනිකාය **ආගමක්** නො වේ ය යි විචාරකයෝ කියත්. එහෙත් ආගම ශබ්දයෙන් සඟිපස ම ගැණෙන බව– "**ආගතාගමාති** – එකො නිකායො එකො ආගමො නාම, ද්වෙ නිකායා ද්වෙ ආගමා නාම, පඤ්ච නිකායා පඤ්ච ආගමා නාම[2] ...." යන අට්ඨකථාවෙන් ඔප්පු වෙයි.

"සංගීතියෙහි දී දීඝනිකායාදිය ඒ ඒ ආචාය්‍ය්‍යීවරයන්ට භාර දුන් නමුත් ඛුද්දකනිකාය භාර දෙන ලද කෙනෙක් නැත" යි කියමින් ඇතැම් විචාරකයෝ කුදුගත්සඟිය අනාථ කෙරෙති. ඛුද්දකනිකායය ග්‍රන්ථරාශියකින් යුක්තය. එහෙයින් එක් ආචාය්‍ය්‍යීවරයෙකුට එය භාර දී නැති බව ඇත්තකි. බුද්ධකාලයෙහි ම ඊට අයත් ධර්‍මයන් සාමාන්‍යයෙන් භික්ෂූන් විසින් පය්‍ය්‍යීාප්තිවශයෙන් ප්‍රගුණ කරණ ලද බව "ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං" යන දෙසනාපාළියෙන් ද ප්‍රකාශ වේ. තව ද, එය කොටස් වසයෙන් හදාල ජාතකභාණක, ධම්මපදභාණකාදි ආචාය්‍ය්‍යීවරයන් ගැණ අට්ඨකථාදියෙහි සඳහන් වේ. "පඤ්චනෙකායිකා[3] – පඤ්චනිකාය හදාරන්නෝ" ආදීන් අශෝකකාලීනශිලාලෙඛනයන්හි ද "ඛුද්දකභාණකා – කුදුගත්සඟිය හදාරන්නෝ" යි මිලින්දප්‍රශ්නාදියෙහි ද සඳහන් වීමෙන් සංගීතිකාලයෙහි පටන් කුදුගත්සඟිය මුඛපාඨවසයෙන් හදාල ආචාය්‍ය්‍යීපරම්පරා පැවැති බව පැහැදිලි වේ.

ප්‍රථමසංගීතිපාලියෙහි අට්ඨකථාව අවසන් කොට, අභිධර්‍මය සඞ්ගායනා කළ සැටි හා සියලු බුද්ධවචන පිළිබඳ එකවිධාදි විස්තර ද දක්වමින් සංගීතිකාරක මහරහතුන්ගේ ප්‍රකීර්‍ණකකථාව දක්වන අට්ඨකථාචාය්‍ය්‍යීයෝ ත්‍රිපිටකය මැනැවින් විස්තර කෙරෙති. එහෙයින් දීර්‍ඝ වූ ප්‍රපඤ්චකථා මෙහි අනවශ්‍ය ය.

---

1. සර්‍වාස්තිවාදීහු – "දීර්‍ඝාගමඃ මධ්‍යමාගමඃ සංයුක්තාගමඃ එකොත්තරාගමඃ ක්‍ෂුද්‍රකාගමඃ" යි ව්‍යවහාර කෙරෙති. අභිධර්‍මකොෂ-භූමිකා (රාහුලසාංකෘත්‍යායන), 10 පිටුව.

2. අංගුත්තරට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණ. 352 පිටුව.

3. "විනයකා = වෙනයිකා, සුතාතිකා, = සුත්තන්තිකා, සුතාතිකිනි = සුත්තන්තිකිනී, පචනෙකයිකා = පඤ්චනෙකායිකා" සාංචිශිලාලිපි, The Monuments of Sanchi, Vol. 1, p. 297. බාහුට් ශිලාලිපි. Cf. Indian Historical Quarterly, Vol. vii, 1931, p. 640.

අට්ඨකථාදියෙහි දක්වෙන "දීඝභාණකා, මජ්ඣිමභාණකා, සංයුත්තභාණකා, අඞ්ගුත්තරභාණකා, ඛුද්දකභාණකා" යන මේ වචනවලින් පෙර පටන් පංචනිකාය වෙන් වශයෙන් හැදෑරූ ආචාය්‍ය්‍යීපරම්පරා පැවැති බව ස්ඵුට වේ.

## 3. අභිධර්මපිටකය.

අභිධර්මය නම් බුද්ධඥානයට ම විෂය වූ ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, සත්‍ය, ප්‍රතීත්‍යසමුත්පාද, මාර්ග, ඵල, නිර්වාණ ආදි ස්වභාවධර්මයන් මාතෘකා වශයෙන් විභාග කොට වදාළ පරමාර්ථදෙශනාවයි. එය සංවෘතිදෙශනා සඞ්ඛ්‍යාත සූත්‍රවිනය දෙකින් 'අතිරෙක වූ, විශිෂ්ට වූ' යන අර්ථයෙන් අභිධර්ම නම් වේ. සියලු බුද්ධවචන ධර්මවිනයවශයෙන් බෙදූ විදාළ හෙයින් අභිධර්මය ද ධර්මයෙහි ම ඇතුළත් වේ. "ධම්මෙන හෙත්ථ ද්වෙ පිටකානි වුත්තානි" යි ධම්මවිනයපදයට ලියූ අර්ථකථාවෙන් ද 'ධම්ම' පදයෙන් සූත්‍ර–අභිධර්ම පිටක දෙක කී බව ප්‍රකාශ වේ.[1]

එහි "යෙ වො මයා ධම්මා දෙසිතා, සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො"යි වදාළ සතර සතිපට්ඨානාදි සත්තිස් බොධිපාක්ෂිකධර්මයෝ ධර්ම නම් වෙත්. "තත්ථ සියුං ද්වෙ භික්ඛූ අභිධම්මෙ නානාවාදා" යි[2] වදාළ වචනයෙන් ඒ බොධිපාක්ෂිකධර්මයන්හි ම විශිෂ්ටධර්මය අභිධර්මය යි දක්වේ. මේ දෙශනාපාළියෙන් ද "ධම්මොති සුත්තාභිධම්මෙ සඞ්ගණ්හාති"[3] යන ටීකාපාඨයෙන් ද සූත්‍ර අභිධර්ම දෙක ම ධර්මශබ්දයෙහි ඇතුළත් බව ප්‍රකාශ වේ. එහෙයින් ප්‍රථමසංගීතිකාරකමහරහතුන් ධර්මසංගායනා නමින් ම අභිධර්මය ද සංගායනා කළ බව ඔප්පු වේ.

ධර්මසංගායනා කිරීමේ දී "කතරං ආවුසො පිටකං පඨමං සඞ්ගායාමාති ? සුත්තන්තපිටකං භන්තෙති" – "ඇවැත්නි, (සූත්‍රාභිධර්ම දෙකින්) කවර පිටකයක් පළමු කොට සඞ්ගායනා කරමු ද" යි මහකස්සපමහතෙරුන් විචාළ කල්හි "ස්වාමීනි, සුත්තන්තපිටකය" යි තෙරහු කීහ.[4] එහෙයින් සත්තිස්–බොධිපාක්ෂිකධර්මයන් විභාග කොට සුත්තගෙය්‍යාදි අඞ්ගවසයෙන් බුදුරජානන් වහන්සේ විසින් ඒ ඒ තැන්හි දෙශනා කරණ ලද පර්යායදෙශනාවන් සංග්‍රහ කොට නිකායවසයෙන් බෙදූ සූත්‍රාන්තපිටකය පළමුවෙන් සංගායනා කරණ ලදී.

ඉක්බිති ධර්මසඞ්ගායනාවෙහි ඉතිරි කොටස වූ අභිධර්මපිටකසංගීතිය ආරම්භ කළ මහරහත්හු "ඉතෙනෙව මයා ඉමෙ පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරස ධාතුයො, චත්තාරි සච්චානි ..... ඉමෙ ධම්මෙ විභජිත්වා..... අනන්තනයමහාපට්ඨානපතිමණ්ඩිතං අභිධම්මපිටකං දෙසිතං" ආදීන් අර්ථකථාවෙහි[5] කී පරිදි පඤ්චස්කන්ධාදිධර්ම විභාග කොට නිෂ්පර්යායවශයෙන් දෙශනා කරණ ලද අභිධර්මය සඞ්ගායනා කළහ. එය බෝමැඩ දී බුදුරජානන් වහන්සේ විසින් මෙනෙහි කළ පිළිවෙළින් ද, තව්තිසාදෙව්ලොව දී දෙශනා කළ පිළිවෙළින් ද **ධම්මසඞ්ගණී, විභඞ්ග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන** යන කොටස් සතට බෙදීමෙන් සංගීත විය. එක් එක් කොටස 'විභාගය' යන අර්ථ ඇති '**පකරණ**'[6] නාමයෙන් **ධම්මසඞ්ගණිප්පකරණ** ආදි වසයෙන් සම්මත වි ය.

මෙහි කථාවත්ථුප්පකරණය මතු ඇති වන පරවාදීන්ගේ ධර්මවිරොධිකථා නිරාකරණය කරමින් **මොග්ගලිපුත්තතිස්ස** තෙරුන් විසින් සම්පූර්ණ කරණ බව දත් බුදුරජානන් වහන්සේ එය විස්තර නො කොට එහි සියලු කථා–

---

1. සංයුත්තනිකායට්ඨකථා, 35 පිටුව. 2. මජ්ඣිමනිකාය, කින්තිසුත්ත.
3. සාරත්ථදීපනී' 18 පිටුව. 4. සුමඞ්ගලවිලාසිනී, 10 පිටුව.
5. සුමඞ්ගලවිලාසිනී, 414 පිටුව.
6. 'පකරණ' ශබ්දය විභාගාර්ථයෙහි යෙදී තිබෙන බව පරිවාරපාළියෙන් පෙණේ. පරිවාරපාළි (සද්ධාතිස්ස මුද්‍රණ)210 පිටුව.

Free Distribution www.aathaapi.org

මාර්ගයත් පිළිබඳ මාතෘකා පමණක් වදාළහ. එහෙයින් ප්‍රථම සංගීතියෙන් සංගීත වූයේ එහි මාතෘකා පමණෙකි. මොග්ගලිපුත්තතිස්ස මහරහතුන් වහන්සේ විසින් ඒ මාතෘකා අනු ව සකවාදපරවාදවසයෙන් විභාග කොට සම්පූර්ණ කරණ ලද කථාවත්ථුව මධුපිණ්ඩිකාදි සූත්‍ර මෙන් බුද්ධභාසිත වී ය. එය තෘතීයසඞ්ගීතියෙන් සංගීත වූයේ පොත්ථකසංගීතියෙහි දී ග්‍රන්ථාරූඪ වී ය. සප්තප්‍රකරණ වශයෙන් බෙදුනු ඒ අභිධර්මපාලිය අඞ්ගවසයෙන් වෙය්‍යාකරණයට ද නිකාය වසයෙන් ඛුද්දකනිකායට ද පිටක වසයෙන් අභිධර්මපිටකයට ද ඇතුළත් වේ.

## අභිධර්මය පිළිබඳ මතභේද

පූර්වකාලීනවිතණ්ඩවාදීන්ගේ පටන් වර්තමානය තෙක් ත්‍රිපිටකපරීක්ෂක-යන් විසින් අභිධර්මය සම්බන්ධයෙන් නගා තිබෙන විවාදයෝ එක සේ ම දරුණු වෙති.

එයින්-

"අභිධර්මය බුද්ධභාසිතයක් නො වේ. බුද්ධකාලයෙහි එය නො පැවැත්-තේ ය. එය ප්‍රථමසංගීතියෙන් හා ද්විතීයසංගීතියෙන් ද සංගීත නො වී ය. ද්විතීයසංගීතියටත් තෘතීයසංගීතියටත් අතර කාලයෙහි එය සම්පාදනය කරණ ලදැයි සිතිය හැකි ය" යන මේ වාදයෝ ප්‍රධාන වෙති.

1. අභිධර්මය සර්වඥතාඥනයට ම විෂය වූවකි. තථාගතයන් වහන්සේ පෙර බුදුවරුන් මෙන් ආනාපානචතුර්ථධ්‍යානයෙන් නැගී පටිච්චසමුප්පාදය සම්මර්ශනය[1] කිරීමෙන් ලත් සර්වඥතාඥනයෙන් සියලු ධර්මයන් අවබොධ කිරීමෙන් බුදුවූ සේක.

අනන්තකාලයක් පෙරුම් පුරා බෝමැඩ දී අවබොධ කළ ඒ ශ්‍රෙෂ්ඨධර්මය මෙනෙහි කිරීමෙන් උපන් සොම්නස ප්‍රකාශ කරමින් එහි දී මේ ගාථාවන් ද වදාළහ:

i. "යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතුධම්මං.

ii. ...............
යතො ඛයං පච්චයානං අවෙදි.

iii. ...............
විධූපයං තිට්ඨති මාරසෙනං
සුරියොව ඔභාසයමන්තලික්ඛං."

(i) කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යෙදී ධ්‍යාන කරණ ක්ෂීණාශ්‍රවයාට බොධිපාක්ෂිකධර්මයෝ භාවිත වසයෙන් යම් මොහොතක ප්‍රකට වෙත් ද, ඒ මොහොතෙහි අවිද්‍යාදිහෙතුසහිත දුඃඛධර්මය අවබොධ වීමෙන් සංසාර-ප්‍රවෘත්තිය පිළිබඳ සියලු සැක පහ ව යේ. (ii.) එසේ ම ප්‍රත්‍යයයන්ගේ නිරොධය දැනීමෙන් සංසාර නිවෘත්තිය පිළිබඳ සියලු සැක පහ ව යේ. (iii). හෙතෙම අඳුරු නසා අහස බබලුවන හිරු මෙන් කෙලෙස්මරසෙනඟ නසා සිටියේ ය." මේ ප්‍රත්‍යයාකාරයත් ප්‍රත්‍යයනිරොධය වූ නිර්වාණයත් ප්‍රත්‍යයනිරොධයට පමුණුවන මාර්ගයත් පිළිවෙළින් ප්‍රත්‍යවෙක්ෂා කළ සැටි ය.

---

1. සංයුත්තනිකාය – නිදානවග්ගයෙහි බුද්ධවග්ගය බැලිය යුතු.

Free Distribution www.aathaapi.org

බුදු වූ සිවුවනසතියේ බෝමැඩ රතනඝරයෙහි වැඩහිඳ බොධිපාක්ෂික ධර්මයන් හා ප්‍රත්‍යයාකාරධර්මයන් පිළිබඳ විභාගවසයෙන් ධම්මසඞ්ගණී ආදිය ද ප්‍රත්‍යයාකාරය හෙතුප්‍රත්‍යයාදියෙන් විභාග කරමින් අනන්තනයසමන්ත-පට්ඨානය ද මෙනෙහි කළසේක.

"යාවතකං ඤෙය්‍යං, තාවතකං ඤාණං. යාවතකං ඤාණං, තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං. ඤාණපරියන්තිකං ඤෙය්‍යං." — "දත යුතු දෑ යම් තාක් ද ඒ තාක් ඥානය ඇත. ඥානය යම් තාක් ද ඒ තාක් දත යුතු දෑ ඇත. දත යුතු දය කෙළවර කොට ඥානය ඇත. ඥානය කෙළවර කොට දත යුතු දෑ ඇතැ"යි මෙ කී ආකාරයෙන් සර්වඥතාඥානයත් ඊට විෂය වූ පට්ඨානයත් එකිනෙකට ගැළපී සිටියේ ය. මෙහි පට්ඨානය සර්වඥතාඥානයට විෂය වූ බවත් සර්වඥතාඥානය ම පට්ඨානයට ප්‍රමාණ වූ බවත් සැලකිය යුතු.

බුදුරජානන් වහන්සේ මෙසේ අවබොධ කළ සූක්ෂ්මඥානවිෂය වූ අභිධර්මය බුදු වීමෙන් සත්වනවස තව්තිසාදෙව්ලොව දී මාතෘදිව්‍යපුත්‍රයා කායසාක්ෂි කොට දසදහස්සක්වල දෙවසමූහයාට තෙමසක් තුළ, "**කුසලා ධම්මා අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා**" ආදි මාතෘකා වශයෙන් දෙශනා කරමින්[1] එහි මාතෘකාවත් දම්සෙනෙවිසැරියුත්මහරහතුන් වහන්සේට කියා දුන්සේක. ධර්මන්‍යාය දත් සැරියුත්මහතෙරණුවෝ බුදුරජානන් වහන්සේ විසින් වදාළ අභිධර්මමාතෘකා සියල්ල විස්තර කොට එහි වාචනාමාර්ගය තමන්වහන්සේගේ අතැවැසි පන්සියක් භික්ෂූන්ට ඉගැන්වූහ.

එතැන් පටන් භික්ෂූහු අභිධර්ම මාතෘකා වශයෙන් ප්‍රගුණ කළහ. "ධම්මධරා, විනයධරා, මාතිකාධරා" යන වචනවලින් ඒ බව පැහැදිලි වේ. "මාතිකාධරාති ධම්මවිනයානං මාතිකාසු සතපරිචයෙන මාතිකාධාරා" — ධර්මවිනයමාතෘකා ප්‍රගුණ කිරීමෙන් මාතිකාධර වූවෝ" යනු විසුද්ධිමග්ග-දීපිකාවෙහි දක්වේ. "තෙසං යෙව ධම්මවිනයානං මාතිකාය ධාරණෙන මාතිකාධරා" යනු විසුද්ධිමග්ගටීකායි. මෙහි ධර්මමාතෘකා නම් අභිධර්ම-මාතෘකායි. මෙයින් 'මාතෘකා' යනු අභිධර්මපර්‍යාය නාමයක්[2] බව පෙණේ. "තිකදුකමාතිකා, අභිධම්මමාතිකා, සුත්තන්තිකමාතිකා" ආදියෙන් ද ඒ බව පැහැදිලි වේ.

මේ හැර අභිධර්මය වෙන්වසයෙන් බුද්ධකාලයෙහි පැවැති බවට දෙශනාපාලියෙහි ඇති නිදර්ශන බොහෝ ය. එයින් සමහරක් මෙහි XV වන පිටුවේ සංක්ෂෙපයෙන් දක්වන ලදී. පහත දැක්වෙන නිදර්ශනවලින් ද එය පැහැදිලි වේ:

---

1. බුදුරජානන් වහන්සේ අභිධර්ම දෙසා ආවිර්භාවප්‍රාතිහාර්යයෙන් ලොකවිවරණය කොට දෙවොරොහණයෙන් සංකාස්සනුවරට වැඩිසේක. විසුද්ධිමග්ග, 291-292 පිටු බැලියයුතු. විස්තර ධම්මපදට්ඨකථා - යමකපාටිහාරියවත්ථුවෙන් දතයුතු. එහි බුදුරජුන් මිණිහිණිමගින් බැස බිම දකුණු පිය තැබූ තැන අචලචෛත්‍ය වූ බව දක්වේ.

   දෙව්ලොවින් බට හිණිමග පිහිටි තැන අශොකරජතුමා විසින් විහාරයක් කරවා එය පිටිපස ගල්ටැඹක් පිහිටුවා තුබූනු බව පාහියන් චීනයාත්‍රිකයා කියයි. Cf. Fa-Hien Record of Buddhistic Kingdoms, by J. Legge - pp 48-50.

2. ඉහත XV වන පිටුවේ 5 අඩොලිපිය බලනු.

   නාගර්ජුනීකොණ්ඩශිලාලිපිවල සඳහන් ධම්ම විනය මාතිකා ආදිවචන ගැණ විස්තරයක් කරණ ආචාර්‍ය නලිනාක්ෂ දත් මහතා "මාතිකා" යනු පාලියෙහි ප්‍රාතිමොක්ෂයට මෙන් අභිධර්මයට ද පර්‍යායවචනයක් බව කරුණු සහිත ව ප්‍රකාශ කරයි. එහි දක්වෙන 'පංචමාතුකා' වචනයෙන් මහාසඞ්ඝිකයන්ගේ විනය හෝ අභිධර්මය ගැණේ ය යි සිතිය හැකි බව ද කියයි.

Cf Indian Historical Quarterly. Vol. VII. 1931. PP. 640-645.

Free Distribution www.aathaapi.org

"ආරඤ්ඤකෙන භාවු'සො භික්ඛුනා **අභිධම්මෙ** අභිවිනයෙ යොගො කරණීයො. සන්තාවුසො . . . අභිධම්මෙ අභිවිනයෙ පඤ්හං **පුච්ඡිතාරො . . .**"- "ඇවැත්නි, ආරණ්‍යයෙහි වසන මහණහු විසින් අභිධර්මයෙහි අභිවිනය-යෙහි (උද්ග්‍රහණධාරණවශයෙන්) යොග කට යුතු ය. ඇවැත්නි, අභිධර්ම-යෙහි අභිවිනයයෙහි ප්‍රශ්න විචාරන්නෝ වෙති" යි මැදුම්සඟියේ ගුලිස්සානි සූත්‍රයෙහි දක්වෙන මේ පාඨයෙන් සැරියුත් මහරහතුන්වහන්සේ විසින් ආරණ්‍යකභික්ෂූන් විසින් අභිධර්මය උගත යුතු ය යි අවවාද දුන් බවත් බුද්ධකාලයෙහි අභිධර්මය පිළිබඳ පැන පිළිවිසීම් බහුල ව පැවැති බවත් පෙණේ. මෙහි අභිධර්මපිටකය සම්පූර්ණයෙන් නො වේ නම් යටත් පිරිසෙයින් දුක-තිකමාතිකා සමග ධම්මහදයවිභඞ්ගය වත් උගත යුතු බව අට්ඨකථාව කියයි.[1]

"**අභිධම්මෙ** ඛො පන අභිවිනයෙ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති"යි අඞ්ගුත්තර - නවකනිපාත - සත්තාවාසවග්ග - දෙවන සූත්‍රයෙහි වදාළ මේ පාඨයෙන් අභිධර්මප්‍රශ්න විසඳීම පුරිසබලුංක (පුහුණුවන) මහණහුගේ වර්ණසම්පත්තිය බව ප්‍රකාශ වේ.

"පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙ-තබ්බං . . . පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා **අභිධම්මෙ** විනෙතුං, අභිවිනයෙ විනෙතුං . . ." මහාවග්ග - මහාඛන්ධකයෙහි වදාළ මේ පාළියෙන් උපසම්පදාකර්මය කරණ මහණහු අඞ්ග පසකින් යුක්ත විය යුතු බවත් අතැවැසියා හෝ සමගවසන්නා අභිධර්මයෙහි හික්මවීමට සමර්ථ වීම ඉන් එක් අඞ්ගයක් බවත් ප්‍රකාශ වේ. මෙහි අභිධම්මපදයෙන් නාමරූපපරිච්ඡේදය (චිත්ත - චෛතසික - නිර්වාණ යන නාමධර්ම හා - රූප ධර්ම ද) ගැණේ ය යි අට්ඨකථාව කියයි.[2]

පාචිත්තියපාළියෙහි භික්ඛුවිභඞ්ගයෙහි විලෙඛන සික්ඛාපද[3] විභඞ්ගයෙහි "ඉඞ්ඝ තාව සුත්තන්තෙ වා ගාථායො වා **අභිධම්මං** වා පරියාපුණස්සු, පච්ඡාපි විනයං... මේ වාක්‍යයෙන් එකල අභිධර්මය භික්ෂූන් විසින් සාමාන්‍යයෙන් වෙන ම පුහුණු කළ කරුණක් බව දක්වේ. එහි ම භික්ඛුණීවිභඞ්ග - ඡත්තවග්ගයෙහි 12 වන සික්ඛාපදවිභඞ්ගයෙහි පෙණෙන "**අභිධම්මෙ** ඔකාසං කාරාපෙත්වා සුත්තන්තං වා විනයං වා පුච්ඡති, ආපත්ති පාචිත්තියස්ස" යන මේ වාක්‍යයෙන් භික්ෂුණීන් ද අභිධර්මය හදාළ බව ප්‍රකාශ වේ. මෙහි අභිධම්මපදයෙන් අභිධර්මපිටකය ගැණෙයි.

"තෙන ඛො පන සමයෙන සම්බහුලා ථෙරා භික්ඛූ මණ්ඩලමාළෙ සන්නි-සින්නා සන්නිපතිතා **අභිධම්මකථං** කථෙන්ති"යි අඞ්ගුත්තරනිකාය - ඡක්ක නිපාත - 6 වන වග්ග - 6 වන සූත්‍රයෙහි දක්වෙන මේ පාඨයෙන් බුද්ධ කාලයෙහි (**මහාකොට්ඨිතාදි**) බොහෝ ස්ථවිර භික්ෂූන් රැස් ව අභිධර්ම කථා කිරීමෙහි යෙදුනු බව ප්‍රකාශ වේ.

---

1. මජ්ඣිමනිකායට්ඨකථා, (හේ. වි.) 3 කාණ්ඩ, 126 පිටුව.

2. සමන්තපාසාදිකා (හේ. වි.) 739 පිටුව.

3. මෙසේ ඉහත මේ සික්ඛාපදය දක්වෙන xxiii පිටුවේ 1. අඩොලිපියෙහි "සික්ඛාපදවිලෙඛනෙ පාචිත්තියන්ති"යි වැරදීමෙන් යෙදී තිබේ. එය "සික්ඛාපදවිවණ්ණනකෙ පාචිත්තියන්ති" යි සුදඩ විය යුතු.

තවද, බුද්ධකාලයෙහි අභිධර්මයෙහි ප්‍රවීණ වූ ධර්මකථික භික්ෂූන් නානා ප්‍රදේශයන්හි වෙන ම සිටිබව පාරාජිකපාළියෙහි හා චුල්ලවග්ගපාළි - සමථක්ඛන්ධකයෙහිත් එන **දබ්බමල්ලපුත්ත** තෙරුන්ගේ කථාවෙන් ද පෙණේ. සෙනසුන් පැණවීමට සඞ්ඝයා විසින් සම්මත කරණු ලැබූ දබ්බමල්ලපුත්ත තෙරුන් විසින් නොයෙක් දෙසින් පැමිණෙන භික්ෂූන්ට සෙනසුන් පැණවූ සැටි දක්වන "යෙ තෙ භික්ඛූ සුත්තන්තිකා ... විනයධරා ... ධම්මකථිකා, තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤපෙති" යන වාක්‍යයෙන් සෞත්‍රාන්තිකයන්ට එකතැනක, විනයධරයන්ට එකතැනක, ධර්මකථිකයන්ට එකතැනක ද යි මෙසේ සභාගවසයෙන් ඒ ඒ භික්ෂූන්ට සෙනසුන් පැණවූබව ප්‍රකාශ වේ. මෙහි ධම්මකථිකයෝ නම් ආභිධම්මිකයෝ ය.

සියුම් වූ චිත්තාන්තර ඛන්ධන්තරාදි නාමරූපධර්මයන්ගේ යථාර්ථය නො වරදවා නිර්වාණාධිගමය සම්පාදනය කරමින් ධර්මදෙශනා කිරීමෙහි සමර්ථ හෙයින් මුගලන්මහරහතුන් වහන්සේට බුදුරජාණන් වහන්සේ විසින් සාධුවාදයෙන් 'ධම්මකථිකයා' යි කී බව "සාධු! සාධු! සාරිපුත්ත, ... මොග්ගල්ලානො හි සාරිපුත්ත, **ධම්මකථිකො**"යි මහාගොසිඞ්ග සූත්‍රයෙහි වදාළ මේ වාක්‍යයෙන් පෙණේ.

දබ්බමල්ලපුත්තකථාවෙහි "යෙ තෙ භික්ඛූ ධම්මකථිකා"යි කියූයේ අභිධර්මය හදාරණ භික්ෂූන් සඳහා ය.* "ධම්මකථිකොති ආභිධම්මිකො" යනු මහානිද්දෙස අට්ඨකථාසි.[1]

මෙසේ අභිධර්මය බුද්ධභාෂිතයක් ම වනබවත් සිවුපිළිසිඹියාපත්, මහරහතුන් පටන් බුද්ධකාලිනශ්‍රාවක පිරිස විසින් එය. උද්ග්‍රහණ, ධාරණ, ප්‍රශ්න, ප්‍රතිප්‍රශ්න, දෙශනා වශයෙන් භාවිත වූ බවත් පිටකපාළියෙහි ම ඉරහඳ සේ ප්‍රකට ව පෙණේ. අභිධර්මය බුද්ධභාෂිතයක් නො වේ ය යි කියන විතණ්ඩවාදීන්ගේ මත අර්ථකථාචාර්යවරයන් විසින් දෙශනාපාළියෙන් නිදර්ශන දක්වමින් ඉතා පහසුවෙන් නිරාකරණය කොට මැඩ ලා තිබෙන සැටි ධම්මසඞ්ගණිප්පකරණට්ඨකථාවෙහි නිදානකථාව සාවධාන ව කියවීමෙන් දත හැකි වේ.

**2.** අභිධර්මය ප්‍රථමද්විතීයසංගීතිවලදී සංගීත නො වූයේ ය යි කියන්නෝ "සංගීතිපාළියෙහි අභිධර්මය ගැණ කිසිවක් සඳහන් වී නැති බවත්, අභිධර්මයට නිදානයක් නැති බවත්, අභිධර්මය කිසියම් ඇදුරු පරපුරකට භාර වී නැති බවත් සාධකවසයෙන් දක්වති.

අභිධර්මය සංගීතිපාළියෙහි සඳහන් ධර්මසඞ්ගායනාවශයෙන් සංගීත වූ සැටි යට දැක්වූ කරුණුවලින් ඔප්පු කරණ ලදී. සුමඞ්ගලවිලාසිනිඅර්ථකථාවේ දැක්වෙන පරිදි සූත්‍රපිටකසඞ්ගායනාවට අනතුරු ව අභිධර්මපාළිය සඞ්ගායනා කොට අභිධර්මපිටකය යි නම් කොට පන්සියක් රහතුන් විසින් සජ්ඣායනා කරණ ලදී.

* ධර්මකථිකයා ගැණ විස්තර මහාගොසිඞ්ගසූත්‍රවර්ණනාවෙන් ද අත්ථසාලිනියෙන් ද, සංයුත්තනිකාය - ධම්මකථිකවග්ගයෙන් ද දත හැකි වේ

1. මහානිද්දෙසට්ඨකථා, 140 පිටුව.

Free Distribution www.aathaapi.org

ඉන් පසු ජාතක, නිද්දෙස, පටිසම්භිදාමග්ග, සුත්තනිපාත, ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරථෙරීගාථා යන මේ පාළිය සඞ්ගායනා කොට "මේ ඛුද්දකගන්ථය" යි නම් කොට පිටක වසයෙන් අභිධර්මපිටකයෙහි ම සංග්‍රහ කළහ යි දීඝභාණකයෝ කියති. චරියාපිටකඅපදානබුද්ධවංස සමග අභිධර්මයත් ඇතුළු ක්‍ෂුද්‍රකග්‍රන්ථ සියල්ල සූත්‍රාන්තපිටකයට අයත්බව මජ්ඣිමභාණකයෝ කියති.

මෙහි ජාතකපාළිය පුබ්බෙනිවාසඤ්ඤාණවිසය වූ භවසන්තතිය ප්‍රකාශ කෙරෙයි. නිද්දෙස, පටිසම්භිදාමග්ග, සුත්තනිපාත, ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක යන මේ ග්‍රන්ථයෝ ප්‍රතිවෙධඥානවිෂය වූ ධර්මයන් ප්‍රකාශ කෙරෙති. විමානවත්ථු පෙතවත්ථු ථෙරථෙරීගාථා යන මේ ග්‍රන්ථයෝ කර්මඵල ප්‍රකාශ කෙරෙති. මේ ස්වරූප සලකා දීඝභාණකයෝ තත්ස්වරූප ඇති යථාධර්මදෙශනා වූ අභිධර්මපිටකයට ඒ ග්‍රන්ථ ඇතුළත් විය යුතුබවත් යථානු-ලොම්දෙසනා වූ සූත්‍රාන්තපිටකයෙහි ද පඤ්ඤත්තිදෙසනා වූ විනය පිටක-යෙහි ද ඇතුළත් නො විය යුතුබවත් කියති යනු සිතිය යුතු ය. මෙහි දීඝභාණකයෝ චරියාපිටක, අපදාන, බුද්ධවංස යන පොත් ජාතකස්වරූප ඇති හෙයින් වෙන ම නො ගත්හ. චරියාපිටක, අපදාන, බුද්ධවංස යන පොත් සමග ජාතකාදි සියල්ල අත්ථොපපත්තිවශයෙන් දෙශනා කරණ ලද යථානුලොමදෙශනා බැවින් තද්විෂය වූ සූත්‍රාන්තපිටකයට ඇතුළත් විය යුතු ය යනු මජ්ඣිමභාණකයන්ගේ මතය යි. මේ ආචාර්‍ය්‍යමත අනු ව ඛුද්දකනිකායය පිටකවසයෙන් බෙදීමේ දී අභිධර්මපිටකයට හෝ සූත්‍ර-පිටකයට අයත් වේ. මෙහි යුක්තිය ධර්මන්‍යාය අනු ව විමසිය යුතු වේ. මේ ආචාර්‍ය්‍යමතනිදර්ශනයෙන් ද අභිධර්මය සඞ්ගායනාරූඪ වූ බව ඔප්පු වෙයි.

මේ හැර **දුල්වා** නම් ටිබැට් විනයග්‍රන්ථයෙහි මූලසර්වාස්තිවාදීන්ගේ විනයක්‍ෂුද්‍රකයෙහි එන ප්‍රථමසංගීතිකථාවෙහි සූත්‍ර-විනය-අභිධර්මවශයෙන් ත්‍රිපිටකය සඞ්ගායනා කළ සැටි විස්තර වේ. [1]

1. Kācyapa said to the Bhikshus, "Sirs, Whereas hereafter bhikshus may be oblivious and ignorant, and not able to understand the Sutrānta, the Vinaya, and the Abhidharma, because there are no gāthās of the Sutras, therefore in the forenoon gāthās of the Sutras will be recited, and in the afternoon the Sutrānta, the Vinaya, and the Abhidharma will be taken into consideration (discussed or recited)" Rockhill's The Life of The Buddha, p. 156. xxii වන පිටුවේ 2 වන අධොලිපිය බලනු.

මෙහි කාශ්‍යප තෙරණුවන් විසින් ප්‍රථමසංගීතියේ දී සූත්‍රාන්ත, විනය, අභිධර්ම සඞ්ගා-යනා යොජනා කළ සැටි දක්වේ.

"Then Mahākācyapa thought .....'I myself will expound the Mātrikas to preserve the sense of the Sutranta and Vinaya as it was spoken. So he mounted the pulpit and said to the bhikshus, "Venerable sirs, in what does the Matrika consist ?" Ibid. p. 160.

මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ සූත්‍රවිනය දෙක්හි යථාර්ථය ආරක්‍ෂා වීම සඳහා මාතෘකා 'මම ම ප්‍රකාශ කරන්නෙමි' යි සිතා "කවර ධර්මයන්හි මාතෘකා ඇතුළත්ද" යි භික්‍ෂූන් විචාළ බව මෙහි දක්වේ. මෙහි (the Matrika, i.e., the Abhidharma, or metaphysics) 'මාතෘකා' නම් අභිධර්මය යි නොහොත් අද්ධ්‍යාත්මවිද්‍යාවය යි කියන ලදී.

"...the Venerable Mahākācyapa and the five hundred other arhats have compiled the Three Baskets (Tripitaka) of the Tathagatha;..." මේ ආදි වාක්‍යයෙහි "මහාකාශ්‍යප ඇතුළු පන්සියයක් රහතුන් වහන්සේ විසින් තථාගතත්‍රිපිටකය සංගීතය" යි කියා දිව්‍යාසුර-යක්‍ෂයෝ සාධුනාද පැවැත්වූහ යි ප්‍රකාශ වේ Ibid p. 161.

Free Distribution www.aathaapi.org

චීනවාර්තා අනුව අභිධර්මය ද **ආනන්දස්ථවිරයන්වහන්සේ** විසින් ම සඞ්ගායනා කළ බව **සැමුඑල් බීල්** (Samuel Beal) මහතා කියයි[1]. මේ වාර්තාවලින් මහායානිකයෝ ද ප්‍රථමසංගීතියෙන් අභිධර්මය සංගීත වූ බව පිළිගණිත්.

මෙහි ඉහත XXXVII වන පිටුවේ දැක්වූ දීපවංසගාථාවෙහි මහාසංඝිකයන් විසින් අභිධර්මප්‍රකරණ සය අත්හළ බව කීමෙන් ද්විතීය සංගීතියෙන් ද අභිධර්මය සංගීත වූ බව ඔප්පු වේ.

**3.** අභිධර්මයට සූත්‍රයන්ට මෙන් සංගීතියෙහි දී නිදානයක් දක්වා නැතැයි වැලපෙනුවන්ට පිළිතුරු අර්ථකථානයින් මෙහි දක්වනු ලැබේ:

නොයෙක් කාලයන්හි නොයෙක් තන්හි ඒ ඒ කරුණෙහි ඒ ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් පවත්වන ලද බොහෝ දෙනා කෙරෙහි අප්‍රකට වූ සූත්‍රදේශනා බුද්ධභාසිත, සාවකභාසිත, දේවභාසිත, ඉසිභාසිත වසයෙන් ද කාලදේශපුද්ගලවශයෙන් ද නියම කොට ඓතිහාසික සිද්ධාන්ත ලෙසින් ප්‍රකට කොට තැබීම සඳහා නිදාන පාඨයක් දැක්වීම අවශ්‍ය වේ. එහෙත් නිදානයක් නො දක්වන ලද ජාතකධම්මපදසුත්තනිපාතාදිගාථා ද ඉතිවුත්තකාදි දෙසනා දැයි යන බුද්ධභාසිතයෝ බොහෝ වෙති.

අභිධර්මසම්භවය පිළිබඳ එක් නිදානයක් නො ව නිදාන දෙකක් ම ඇතිබව දෙවියන් සහිත ලෝකයා අතර ප්‍රකට වූවකි. බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය, දම්සක්පැවැත්වීම, යමාමහපෙළහර, තව්තිසාදෙව්ලොවට වැඩ අභිධර්මය දේශනා කිරීම, දෙව්ලොවින් සංකස්සනගරයට පැමිණීම ද යන මේ කරුණු ඉතා ප්‍රසිද්ධ යි.

බුද්ධත්වයට පැමිණ අධිගතධර්මයන් මෙනෙහි කිරීම අභිධර්මය පිළිබඳ අධිගමනිදානය වේ. සියලු බුදුවරයන්ගේ ආවේණිකධර්මයක් වූ යමාමහ පෙළහර දක්වමින් තීර්ථකයන් දමනය කොට දෙව්ලොවට වැඩ අභිධර්මය දේශනා කිරීම එහි දේශනානිදානය වේ.

විජම්බණ දෙසා සංකස්සනගරයට වැඩි දා බුදුමහිමය දැක බුදුබැව් පැතූ පිරිසට දෙසූ "යෙ ඣානපසුතා ධීරා" යන ආදි ධම්මපදගාථාවෙන් ද, සැරියුත්මහරහතුන්ගේ ප්‍රඥාමහිමය ප්‍රකට කරණු සඳහා ඇසූ "යෙ ච සඞ්ඛාත ධම්මාසෙ" ආදි අජිතසූත්‍රගාථාවෙන් ද, සුත්තනිපාතයෙහි සාරිපුත්තසූත්‍රයෙන් ද දෙව්ලොව දී අබිදම් දෙසූ පුවත සත්‍ය බව ඔප්පු වේ. බුද්ධපරිනිර්වාණයෙන් අවුරුදු දෙසියගණනකට පසු අශෝකරජතුමා විසින් සංකස්සනුවර බුදුහු දෙව්ලොවින් වැඩි හිණිමග පිහිටි තැන කරවූ විහාරයෙන් හා පිහිට වූ ගල්ටැඹෙන් ද මේ පුවත ඓතිහාසික සත්‍යයක් බවට පත් විය.[2]

මෙසේ බුදුරජාණන්වහන්සේට ම විෂය වූ අන්‍යයන්ට සාධාරණ නො වූ අභිධර්මදේශනාව උන්වහන්සේ විසින් දෙව්ලොව දී (මායා)මාතෘදිව්‍ය පුත්‍රයා ප්‍රධාන දෙව්පිරිසට දේශනා කරණ ලදබව ප්‍රසිද්ධ හෙයින් සංගීතියෙහි දී මහකසුප්මහතෙරණුවෝ එහි නිදානය නො විචාළහ. අනඳතෙරණුවෝ ද එය අමුතුවෙන් කිය යුතු නො වන බැවින් නො කීහ. අභිධර්මපාළිය බුද්ධදේශිත වූ පරිදි පන්සියයක් රහතුන් විසින් සංගීත වී ය. ඇඳින්වීමේ නිදානයක් සමග නො යෙදීමෙන් එය නිසැකයෙන් ම බුද්ධභාසිතයක් බව ප්‍රකාශ වේ.

1. Cf. Rockhill's Life of The Buddha, p. 160, note 2.
2. මෙහි XLVII වන පිටුවේ 1 වන අඩංලිපිය බලනු.

Free Distribution www.aathaapi.org

අභිධර්මය බුද්ධභාෂිත නම් එහි නිදානය කොහි දැ යි අසන විරුද්ධවාදියාට මණ්ඩලාරාමවාසී තිස්සභූතිතෙරණුවෝ මහාබොධිනිදානය (සර්වඥතාඥාන ප්‍රතිලාභය) අභිධර්මනිදානය යි කියමින් පදෙසවිහාරසුත්‍රාන්තය ගෙණහැර දැක්වූහ.

එහෙත් යමක් ඉල්ලා අඬන බාලයා ඒ දැය ම දී සනසන්නාක් මෙන් අනුරාධපුර(ගම්) වැසි සුමනදෙවස්ථවිර තෙමේ ලොහොපායෙහි දම් දෙසන්නේ "මේ පරවාදියා අභිධර්මයට නිදානයක් ඇතිබවක් නො දත එය නැතැ යි හඬමින් අප ඉදිරියේ වැලපේ. මෙන්න! ඔහුට අභිධම්ම නිදානය" යනු කියමින් දෙව්ලොව දී බුදුරජුන් අබිදම් දෙසූ බව සූත්‍ර-නිදානයක් මෙන් පාළියෙන් මෙසේ කී ය: "එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං. තත්‍ර ඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මකථං කථෙසි: කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා"ති.

අත්ථසාලිනී අටුවාවෙහි එන මේ කථාවෙහි තත්ත්වය නොදත් ඇතැම් විචාරකයෝ "මේ කියන නිදානය කිසි ම අභිධර්මපොතක හෝ ත්‍රිපිටකයේ අන්පොතක හෝ නැත්තේ ය. එය එතුමන් විසින් ගොතා කියන ලද්දකි. එබැවින් එබඳු දුර්වල සාධකයක් පවා ගෙණහැර පෑමෙන් පෙණීයන්නේ මෙය සර්වඥභාෂිතය යි ඔප්පු කරගැණීමට බලවත් අපහසුවක් තිබුණබවයි" යනු කියති.

සුමනදෙවතෙරණුවන් කී මේ පාළියෙන් අභිධර්මයට අමුතු නිදානයක් ගෙනු බවක් කථාප්‍රවෘත්තියෙන් නො හැඟෙයි. අභිධර්මනිදානය දැන ගැණීමට වුව මනා නම් "එක් සමයක භාග්‍යවතුන්වහන්සේ තව්තිසාදෙව්ලොව පරසතුරුක්මුල පඬුපුල්සලස්නෙහි වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ තව්තිසාවැසි දෙවියන්ට 'කුසලා ධම්මා' යන ආදීන් අභිධර්මකථාව වදාළ සේකැ" යි කියමින් අභිධර්මනිදානය මෙසේ දත යුතු යි කී බව මෙයින් ප්‍රකාශ වේ. අර්ථකථාචාර්ය්‍යයෝ ද අභිධර්මනිදානයක් අමුතුවෙන් වුව මනා නම් මේ ඒ නිදානය යි ඇඟවීමට ලක්දිව තෙරුන් අතර පැවැති මේ කථාව නිදර්ශන කළහ.

4. තවද, සඞ්ගායනාවසානයෙහි දී දීඝනිකායාදිය ඒ ඒ තෙරුන්ට භාර කරණලද නමුත් අභිධර්මය කිසිවෙකුට භාර දුන්බවක් අර්ථකථාවන්හි දක්නට නැතැ යි කියමින් සමහර විචාරකයෝ අභිධර්මය අනාථ කෙරෙති.

කෙනෙකුන්ට භාර කරණ ලද්දක් තවත් කෙනෙකුන්ට භාර දීම ධර්මය හෝ නීතිය නො වේ. බුදුරජානන්වහන්සේ විසින් ම අභිධර්මය ධර්මසේනාපති වූ සැරියුත්මහරහතුන්වහන්සේට භාර දෙන ලදී. ධර්මපුරොහිත වූ මුගලන් මහරහතුන්වහන්සේ එහි ප්‍රවීණකථිකයා වූහ. ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද මහරහතුන්වහන්සේ එය සිත්හි දැරීමෙන් එහි ආරක්ෂකයා වූහ. විශේෂයෙන් සැරියුත්මහරහතුන්වහන්සේගේ අතැවැසි පන්සියයක් රහත්භික්ෂූන්වහන්සේ පෙරැම් පුරා පැතූ ලෙස ආභිධම්මිකයෝ වූහ. එහෙයින් උන්වහන්සේලා ධරමාණකල්හි ම සංගීතිකාරකමහරහත්හු අභිධර්මය අන්පිරිසකට කෙසේ භාර කරත් ද?

මෙසේ බුද්ධකාලයෙහි පටන් අභිධර්මය රැකීමට පිරිසක් වෙන ම සිටි බැවින් සංගීතියෙහි දී එය කිසිවෙකුට භාර දුන්බවක් සඳහන් වී නැත. මේ කරුණ සාධක කොටගෙණ අභිධර්මපිටකය සඞ්ගායනාරූඪ නො වී ය යි කීම වාදයක් නො ව වාද සිඟීමකි.

**5**. ප්‍රථමසංගීතියෙන් ධර්මය, විනය ය යි ද්විපිටකයක් මුත් ත්‍රිපිටකයක් සංගීත නො වී ය යි කියමින් අභිධර්මපිටකය ප්‍රතික්ෂෙප කරණ **ඕල්ඩන්බර්ග්** මහතා ඊට හොඳ ම සාධකය මහාපරිනිර්වාණසූත්‍රයෙහි දක්වේ ය යි කියමින් මේ වචන නිදර්ශන කරයි: "තානි පදව්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි. විනයෙ සන්දස්සෙතබ්බානි."[1]

සතර මහාපදෙසයන් දෙශනා කළ පාළියෙහි එන මේ වචනවලින් දක්වෙන්නේ යමෙකු "මේ බුද්ධභාසිතයෙකැ" යන ආදීන් ඉදිරිපත් කරණ කරුණක් විනිශ්චය කිරීමේ දී එහි පද හා ව්‍යඤ්ජන මැනැවින් ඉගෙණ සූත්‍රයෙහි බැහිය යුතු ය. විනයයෙහි සසැඳිය යුතු ය. එය සූත්‍රයට හා විනයට ගැළපේ නම් ගත යුතු ය යන අදහස යි. මෙහි සූත්‍රය නම් බුද්ධ-භාසිත වූ ත්‍රිපිටකධර්මය යි. විනය නම් රාගාදිය විනය (ප්‍රහාණය) කිරීමට හෙතු වන කාරණය යි. අර්ථකථාවෙහි දක්වෙන මේ අර්ථය නොදත් **ඕල්ඩන්බර්ග්** මහතා සූත්‍රය සූත්‍රපිටකය යි ද විනය විනයපිටකය යි ද ගෙණ මුලින් ද්විපිටකය පමණක් පැවැතිබවට මෙය අගනා නිදර්ශනයෙකැ, මෙබඳු සත්‍ය වූ සාධක තිබිය දී අභිධර්මපිටකයක් පැවැතිබවට සාධකපාඨ ඉදිරිපත් කිරීම ඒ තරම් වැදගත් නො වේ ය යි පවසයි.

තවද, ඒ මහතා මෙසේත් කියයි: "අභිධර්මය පිළිබඳ කිසි ම දැනීමක් එකල නො පැවැත්තේ ය. නැත හොත් එය ආගමධර්මයක් වශයෙන් සලකා නැත. එසේත් නො වේ නම් එය අනෙක් පිටකදෙක මෙන් වැදගත් ය යි සලකා නැත. බුද්ධපරිනිර්වාණයෙන් පසු පැවැත්වූ සංගීතියේ දී තෙරුන් විසින් එය ධර්මවිනයට හෝ ජිනවචනයට ඇතුළත් නො කරණ ලද බව සාමාන්‍ය මතයයි."[2]

**ඕල්ඩන්බර්ග්** මහතා ධර්මවිනය හා අභිධර්මය ගැණ හසරක් නො දැනී-මෙන් මෙසේ කියති යි සිතිය යුතු. එහෙත් ඒ මහතාගේ මේ භ්‍රාන්තිමත ආශ්‍රය කොට ගෙණ සෙසු විචාරකයන් විසින් ද ත්‍රිපිටකය සම්බන්ධයෙන් නගා තිබෙන වාදත් එක සේ ම එල්ගුමතයන් බව තේරුම් ගැණීමට මේ කරුණු මෙහි දක්වීමු.

අභිධර්මපිටකය "ප්‍රථම සංගීතිකාරක මහරහතුන් විසින් සංගීත නො වී ය. එය පසු කාලයක සංග්‍රහ කරණ ලද්දකැ" යි කියන්නන්ට දිය යුතු පිළිතුර චුල්ලවග්ගසංගීතිපාළි-උද්ධෘතයෙහි දක්වෙන්නේ මෙසේ ය:

---

1. Cf. "A valuable testimony of the earlier existence of a Dvipitaka is also contained in the Mahāparinibbāna Sutta: 'tāni padavyanjanāni sādhukam uggahetva Sutte otāretabbāni, Vinaye sandassetabbāni.' - In opposition to such sure proofs, it is of little importance to bring forward passages... in favour of the existence of the Abhidhammapitaka" The Vinayapitaka, Vol. 1. p. xii, Note 2.

2. ...the collection of the Abhidhammapitaka was either altogether unknown, or was not regarded as canonical or of the same value as the two other Pitakas; and it was generally supposed that, in the council held after Budd a's death, it had not been admitted by the Theras into the collection of the Dhammavinaya or of the Jinavacana." Ibid. p. xi.

"උපාලිං විනයං පුච්ඡි සුත්තන්තානන්දපණ්ඩිතං,
පිටකා තීණි සංගීතිං අකංසු ජිනසාවකා."

"උපාලිතෙරුන්ගෙන් විනයපිටකය විචාළේ ය. පණ්ඩිත ආනන්ද තෙරුන්ගෙන් සූත්‍රාන්තපිටකය විචාළේ ය. මෙසේ ඒ බුද්ධශ්‍රාවකයෝ පිටක තුන සඞ්ගායනා කළාහු ය." මෙහි සුත්තන්තපිටකයෙහි ඛුද්දකනිකායට අභිධර්මය නිකාය වසයෙන් ඇතුළත් බව සැලකිය යුතු.

ඇතැම් විචාරකයෝ මේ උදානගාථාව පසු ව එකතු කරණ ලද්දකැ යි ප්‍රතික්ෂෙප කරති. එහෙත් එය කවදා කවුරුන් විසින් එකතු කරණ ලද දෑ යි නො කියති. සංගීතිපාළිය ද සඞ්ගායනාවෙන් පසු ව එකතු කරණ ලද්දකි. එය පිළිගණිමින් එහි උදානය ප්‍රතික්ෂෙප කිරීම යුක්තිවශයෙන් නො යෙදෙන අසද්වාදයකි.

ත්‍රිපිටකපාලියෙහි එන උදාන, පෙය්‍යාල, වග්ග, නිපාත, සංයුත්ත, පණ්ණාසක, පිටක, නිකාය, පකරණ ආදි සඞ්ග්‍රහප්‍රභෙදයන් සංගීති කාරක මහරහතුන් විසින් ම ව්‍යවස්ථා කරණ ලදබව අට්ඨකථාවන්හි දක්නා ලැබේ. සංගීතිපාළිය හා එහි උදානය ද්විතීය සංගීතියෙන් පසු පිටකපාළියට එකතු කරණ ලද බව ඇත්තකි. ඒ නිසා උද්දානගාථාවෙහි දැක්වෙන ත්‍රිපිටකසංගීතිය එලෙසින් පැවැත්වූබව පිළිගත නො හැකි ය යි කීම අධර්මවාදයකි. තමන්ගේ වාදය ඔප්පු කර ගැණීම සඳහා ප්‍රමාණසාධකයක් නැති කල්හි ප්‍රකට ව පෙණෙන සත්‍යය පවා ප්‍රතික්ෂෙප කිරීම විතණ්ඩ-වාදීන්ගේ ලක්ෂණයකි.

**පුරාණ තෙරුන් සංගීතිය පිළිගැණීම.**

සංගීතිපාළි-උද්දානයන්හි ද අට්ඨකථාවන්හි ද දැක්වෙන පරිදි මහාකාශ්‍යපාදි සම්බුද්ධශ්‍රාවකයන් විසින් පවත්වන ලද ත්‍රිපිටකමහාසංගීතිය සත් මසකින් අවසන් වී ය. සර්වපර්‍යාප්තිධරෂඩභිඥලාභී සිව්පිළිසිඹියාපත් මහතෙරුන් විසින් පැවැත්වූ හෙයින් එය '**ථෙරිකා**' නම් විය. මෙයින් ධර්මවිනය බුද්ධභාසිත වූ සැටියෙන් ම චිරස්ථායී වන සේ ව්‍යවස්ථාපිත වීමෙන් ප්‍රත්‍යයලොභී, සෙරිචාරී, බුඩ්ඪපබ්බජිතසුභද්දගණයට ඇතුළත් නිර්ලජ්ජභික්ෂූන්ට හානියක් විනැයි ඔහු සිතූහ. එහෙයින් ඔහු එය නිෂ්ප්‍රභ කිරීම සඳහා නොයෙක් ප්‍රයත්න දැරූහ.[1] විරුද්ධකථා ඉපදවූහ. ඔවුන්ගේ ඒ කථා ශතවර්ෂගණනක් ඔවුන්ගේ ගණයෙහි වූවත් අතර දියුණු වෙමින් සංස්ථා වෙමින් පැවැත්තාහු ද වෙති.

පුරාණ තෙරුන් වැනි සම්භාවනීය රහත්හු ද කාශ්‍යපසංගීතිය නො පිළිගත්හ යනු එකල පැතිරී තුබුනු එක් කථාවෙකි. මෙහි xxiv වන

---

1. "කාශ්‍යපසංගීතියට ඇතුළත් වීමට අවසර නොලත් රහතුන් හා පුහුදුන් සහිත ලක්ෂයක් පමණ වූ සාමාන්‍ය භික්ෂූහු රැස්වී සඞ්ගායනාවක් පවත්වා සූත්‍රවිනයඅභිධර්මපිටක හා සන්නිපාතපිටක (ඛුද්දකනිකාය), ධාරණීපිටක (මන්ත්‍ර ?) ය යි පිටක පහක් සංග්‍රහ කළහ. ඒ සඞ්ගායනාව 'මහාසඞ්ඝ' ය යි කියනු ලැබේ." හියුං සාං-චීනචාරී. Cf. Beal's Buddhist Records of The Western World, Vol. 11. pp. 164-165,

මෙහි රහතුන් ද ඇතුළත් බව ඔවුන් කියතත් රහත්හු මෙබඳු විරුද්ධවාදයන්ට සම්බන්ධ නො වෙති මේ මුඛපරම්පරාගත වැරදි පුවතක් හියුං සාංට අසන්නට ලැබුනු සැටියක් විය යුතු

පිටුවේ දැක්වූ පුරාණතෙරුන්ගේ කථාව විශෙෂ කරුණක් වශයෙන් සංගීති-පාළියට ඇතුළත් වී තිබෙන්නේ මේ කථාව නිසා ය යි සිතිය හැකි ය. එහි සිද්ධිය මෙසේ ය:

දක්ඛිණාගිරියෙහි චාරිකාවෙහි යෙදී සිටි පුරාණ තෙරණුවෝ සංගීතිය අවසන් වූ පසු රජගහනුවර වේළුවනාරාමයෙහි සංගීතිකාරකතෙරුන් වෙත පැමිණියහ. එහි දී තෙරහු සාමීචිකථා කෙරෙමින් "ථෙරෙහි ආවුසො, පුරාණ, ධම්මො ච විනයො ච සංගීතො. උපෙහි තං සංගීතින්ති- ඇවැත, පුරාණයෙනි, තෙරුන් විසින් ධර්මය ද විනය ද සඞ්ගායනා කරණ ලදී. ඒ සංගීතිය අනුගමනය කරවූ" යි පුරාණතෙරුන්ට කීහ. (සංගීත වූ විධියෙන් ධර්මවිනය දරණු මැනැවැයි කියූ සේ ය.) පුරාණතෙරණුවෝ "සුසංගීතාවුසො ථෙරෙහි ධම්මො ච විනයො ච. අපිච, යථෙව මයා භගවතො සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහිතං, තථෙවාහං ධාරෙස්සාමීති – ඇවැත්නි, තෙරුන් විසින් ධර්මවිනය මනා කොට සංගායනා කරණ ලදී. තවද, මා විසින් භාග්‍යවතුන්වහන්සේගේ හමුවෙන් යම් සේ අසන ලද ද, පිළිගන්නා ලද ද, එසේ ම එය දරන්නෙමි" යි කීහ.

මෙහි පුරාණතෙරුන් කී පළමු වාක්‍යයෙන් සංගීතිය සුසංගීත ය යි පසසමින් උන්වහන්සේ එය පිළිගත් බව ප්‍රකාශ වේ. යමෙකු උන්වහන්සේ සංගීතිය නො පිළිගත්හ යි කියතොත් එසේ කියන්නේ දෙවන වාක්‍යයෙහි යෙදී තිබෙන 'තවද' යන අර්ථ ඇති 'අපිච' යන්නෙන් 'එහෙත්, නමුත්' ය යි අර්ථ ගැණීමෙන් විය යුතු. කෙසේ අර්ථ ගත්තත් එයින් සංගීතිය ප්‍රතික්ෂිප්ත බවක් නො කියවේ. එයින් හැඟෙන්නේ සංගීතිකාරකතෙරුන් විසින් "ධර්මවිනය මෙසේ සංගීත ය. ඔබවහන්සේ ද (උපෙහි තං සංගීතිං) ඒ සංගීතිය අනුගමනය කරණු මැනැව – ඒ වූ පරිදි ධර්මවිනය දරණු මැනැවැ" යි කී වචනයට "මා විසින් බුදුරජුන්ගෙන් ධර්මවිනය අසාගත් සැටියෙන් ම සිත තබාගෙණ ඒ වූ පරිද්දෙන් එය දරන්නෙමි" යි පුරාණතෙරුන් පිළිතුරු දුන් සැටි ය.

පුරාණතෙරණුවෝ සම්භාවනීය වූ රහත් කෙනෙකි. රහත්හු දෙසිත් දෙවචන නැත්තෝ ය. එහෙයින් උන්වහන්සේ පළමු වාක්‍යයෙන් සංගීතිය පසසා දෙවන වාක්‍යයෙන් එය ප්‍රතික්ෂෙප නො කෙරෙත් ම ය. රහත්හු චාටුකම්‍යතා ඇත්තෝ ද නො වෙත්. එහෙයින් උන්වහන්සේ සංගීතිකාරක තෙරුන්ගේ සිත් ගැණීම සඳහා සංගීතිය පසසා පසු ව එය ප්‍රතික්ෂෙප කළහ යි සිතිය හැකි නො වේ. සංගීතිකාරක තෙරහු පරසිත් දන්නා ෂඩභිඥලාභී රහත්හු ය. උන්වහන්සේලා පුරාණතෙරහු සංගීතිය නො පිළි-ගන්නා අදහසින් සිටියාහු නම් එය පිළිගන්නට ය යි නො කියත්. තව ද, පුරාණතෙරහු සංගීතිය නො පිළිගත්තු නම් මේ කථාව සංගීතිපාළියට ඇතුළත් නො වන්නේ ම ය. මෙහි දී පුරාණ තෙරුන්ගේ කථාව සංගීති-පාළියට ඇතුළත් වීමේ හෙතුව ගැණ ද සැලකිය යුතු. චීනභාෂාවට පරිවර්තනය කරණලද මහායානවිනයග්‍රන්ථයන්හි මෙබඳු කථාවෙක් දක්වේ:

i. "ගවාම්පතිතෙරුන් හා පුරාණතෙරුන් ද සම්භාවනීය රහතුන් බැවින් උන්වහන්සේලා ලවා සංගීතිය අනුමත කරවා ගැණීම සඳහා මහසුප්තෙරණුවෝ උත්සාහයක් කළහ. එහි දී ගවාම්පතිතෙරහු කිසිත් නො කියා නිශ්ශබ්ද වූහ. රජගහනුවරට සමීප දක්ඛිණාගිරියෙහි විසූ පුරාණතෙරහු සංගීතියට සම්බන්ධ වීමට කැමැත්තක් නො දක්වමින්

"සන්නිධි කොට තැබූ ආහාර වැළඳීම, වෙහෙරතුළ පිසූ, තමන් ම පිසූ, තමන් ම පිළිගත් ආහාර වැළඳීම" ආදිය පිළිබඳ ශික්ෂාපද සත විනයට ඇතුළත් කිරීමට මහසුප්තෙරුන්ගෙන් ඉල්ලූහ.[1]"

ධර්මගුප්ත - මහීශාසකවිනයෙහි හා විනයමාතෘකා සූත්‍රයෙහි ද විස්තර වශයෙන් එන පුරාණතෙරුන්ගේ කථාව **ඇල්. ද ල වලේ පුසං** (L. De La Vallee Poussin) මහතා මෙසේ දක්වයි:

ii. "පුරාණතෙරහු සංගීතිය අවසන් වූ පසු රජගහනුවරට පැමිණියහ. පුරාණතෙරුන්ගේ ආයාචනයෙන් කසුප්තෙරහු නැවත සඞ්ඝයා රැස් කළහ. උපාලිතෙරහු නැවත විනය දෙසූහ. පුරාණතෙරහු ඒ සියල්ල අනුමත කෙරෙමින් කරුණු අටක්-බුදුරජුන් විසින් අනුදත් හෙයින් විනයානුකූල වූ (ආහාර පිළිබඳ)ශික්ෂාපද අට ඇතුළත් කිරීමට ඉල්ලූහ. එනම්: (1) ආහාර ඇතුළත තබා ගැනීම, (2) ඇතුළත පිසීම, (3) තමන් ම පිසීම, (4) තමා ම පිළිගෙණ වැළඳීම, (5) උදෑසන ම නැගිට ආහාර පිළිගැනීම, (6) දායකයාගේ කැමැත්තෙන් ආහාර ගෙණ ඒම, (7) නානා ඵල වැළඳීම, (8) පොකුණෙහි වැවුනු දෙය වැළඳීම ද යන මේයි.

දුර්භික්ෂයෙහි පිඩු දුලබ හෙයින් මේ කරුණු බුදුරජුන් විසින් අනුදත් බව කසුප්තෙරහු පිළිගත්හ. එහෙත් එය පසු ව තහනම් කළ බව කියා 'පුරාණයෙනි, අපි බුදුරජුන් විසින් නො පැණවූ දෙය නො පැණවීමටත් පැණවූ දෙය නො ඉක්මවීමටත්, පැණවූ පරිදි ක්‍රියා කිරීමටත් එකඟ වෙමු' යි කසුප්තෙරහු කීහ."[2]

දැනට චීනභාෂාවෙන් පවත්නා මහායානවිනයසංගීතිවාර්තා කීපයක එකිනෙකට වෙනස් ව දක්වෙන මේ කථාවෙහි එන කරුණු කාශ්‍යපසංගීතියට විරුද්ධ වූවන් විසින් තමන් ගත් මතයට සරි ලන සේ ගෙතූ සත්‍යයට නො ගැළපෙන ප්‍රබන්ධයක් බව හැගේ.

මෙහි පළමු කථාවෙහි සදහන් ගවම්පතිතෙරුන් සංගීතියට පෙර පිරිනිවිබව මූලසර්වාස්තිවාදීන්ගේ විනයක්ෂුද්‍රකයෙහි දක්වේ.[3] සංගීතියෙන් බැහැර කරණ ලදැයි සමහරුන් කියන පුරාණතෙරුන් සංගීතියට සහභාගී වූ තෙරුන්ගෙන් කෙනෙකු බව මහීශාසකයෝ කියති.[4]

---

1. Cf. Early Monastic Buddhism by N. Dutt, Vol. 1. pp. 331-33 ; Le Concile De Rajagrha, by Prof. Przyluski p. 160.

2. Cf. Indian Antiquary 1908. pp. 5-6; Le Concile De Rajagrha, pp. 195-200; 319-323.

මේ ශික්ෂාපද ඇම්. සුශුකි මහතා විසින් පරිවර්තනය කරණ ලද බවත් ඒ මහතා ඒවා මහාවග්ගභෙසජ්ජක්ඛන්ධකයෙහි ඇතැයි දක්නා නැති බවත් ල වලේ පුසං මහතා කියයි. මෙහි (5) ශික්ෂාපදය පෙරවරු පිළිගත් (පුරෙභත්තං පටිග්ගහිතං)දෙය (වළඳා පවාරණය කළහු විසින්) වැළඳීමට අවසර දීම විය යුතු. (6) ශික්ෂාපදය වැළඳූ තැනින් ගෙණෙන ලද්ද (තතො නීහටං) වැළඳීමට අවසර දීම විය යුතු. (7) ඇට නැති, ඇට ඉවත් කළ, කැප නො කළ ඵල විය යුතු. (8) වනයෙහි, පොකුණෙහි වැවුනා දෙය විය යුතු. මහාවග්ග (ඤාණවිමල මුද්‍රිත) 207, 208, 209, පිටු වලින් මේ ශික්ෂාපද දත හැකි වේ. 229 වන පිටුවේ මේ ශික්ෂාපද පසු ව තහනම් කළ සැටි දක්වේ.

3. මෙහි XXI වන පිටුවේ 1 වන අධොලිපිය බලනු.

4. Le Concile De Rajagrha, p. 168; Cf. Early Monatic Buddhism, p. 331. Note 1,

Free Distribution www.aathaapi.org

දෙවන කථාවෙහි කසුප්තෙරුන් විසින් පුරාණතෙරුන්ගේ ඉල්ලීමට නැවත සඞ්ඝයා රැස් කරණ ලදැ යි ද, උපාලි තෙරුන් විසින් නැවත විනයශික්ෂාපද දෙසන ලදැ යි ද කීම නො යෙදෙන්නකි. පන්සියක් රහතුන් විසින් සම්මත කොට සජ්ඣායනා කරණ ලද විනය පුරාණ තෙරුන් ඉදිරියෙහි නැවත සඞ්ගායනා කරණ ලදැ යි කීමෙන් ඔවුන් හඟවන්නේ පළමුවෙන් විනයසඞ්ගායනා කළ සැටි වැරදි ය යන බවෙකි.

පුරාණ තෙරුන් විසින් විනයට ඇතුළත් කළ යුතු ය යි කසුප් තෙරුන්ට කියූ කරුණු අට වනාහි බුදුරජුන් විසින් දුර්භික්ෂයෙහි අනුදන්නා ලද නමුත් පසු ව උන්වහන්සේ විසින් ම තහනම් කරණ ලද ශික්ෂාපදයෝ වෙති. ඒ තහනම් කළ ශික්ෂාපද එසේ පිළිගත යුතු ය යි කියූ කසුප් තෙරුන්ගේ වචනය පුරාණතෙරහු නො පිළිගත්හ යි චීනවිනයෙහි එන සංගීතිවාතීාවෙන් පෙණේ.[1] සර්වඥ වූ බුදුරජුන් විසින් ප්‍රතික්ෂිප්ත වූ පැණවීම් විනයශික්ෂාපදවශයෙන් ගත යුතු ය යි පුරාණ තෙරුන් වැනි ශික්ෂාගුරුක රහත්කෙනෙක් කෙසේ කියත් ද ?.

මේ කථාවෙන් පශ්චාත්කාලීන නිකායාන්තරප්‍රභවයට තරම් වූ මත-භෙදයක් එකල රහතුන් අතර ද පැවැත්තේ ය යි හැඟවීමට උත්සාහයක් කර තිබෙනබව පෙණේ. වර්ගභෙදයට තුඩු දෙන මතභෙදයක් රහතුන් අතර නම් කිසිසේත් ඇති වන්නේ නො වේ. ඒ බව ඔප්පු කිරීමටත් සංගීතිකාරක මහතෙරුන්ට එකඟ ව පුරාණ තෙරුන් විසින් ම සංගීතිය පසසා පිළිගත්බවටත් සාධකවසයෙන් පුරාණතෙරුන්ගේ කථාව සංගීති පාළියෙහි සඳහන් කරණ ලද බව සිතිය යුතු.

දෙශනාපාලි, අර්ථකථා, සංගීතිපාළි, උදානගාථා සහ පුරාණතෙර කථා ද ප්‍රමාණසාධක කොට ගෙණ අප විසින් මේ තාක් මෙහි දැක්වූ කරුණුවලින් ප්‍රථමසංගීතියෙන් ම විනය, සූත්‍ර, අභිධර්ම යන පිළිවෙළින් ත්‍රිපිටකය සංගීත වූබවත් එය ආයර්‍යශ්‍රාවක සියලු තෙරුන් විසින් ඒකමතික ව පිළිගන්නා ලදබවත් මෙය කියවන්නාට පැහැදිලි වේ ය යි සිතමු.

## ද්විතීයසඞ්ගීතිය

ප්‍රථමසඞ්ගායනාවෙන් අවුරුදු සියයක් ඉක්ම ගිය පසු කාලාශොක රජු දවස විශාලානුවර මහාවනවිහාරයෙහි විසූ වජ්ජිභික්ෂූන් විසින් විනයවිරොධි දශවස්තුවක් උපදවන ලදී. චුල්ලවග්ගපාළියෙහි එන ඒ දශවස්තු මෙසේ ය:

(1) “කප්පති සිඞ්ගිලොණකප්පො - අඟක (අංකුලාවක) බහා ලුණු තබාගෙණ ලුණු නැති යාවකාලික ආහාරයක් හා මිශ්‍ර කොට වළඳත් වටී.” (ලුණු යාවජ්ජීවික වන හෙයින් ආහාරසන්නිධිපච්චිති ඇවැත් නො වේ).

(2) “කප්පති ගාමන්තරකප්පො - දැන් අන්ගමකට යෙමි යි සිතා භොජනපවාරණය කළ පසු අසිරිත් කැප නො කළා වූ ද ආහාරය වළඳත් වටී”. (එයින් නො අසිරිත් බොජුනෙහි පචිති ඇවැත් නො වේ).

(3) “කප්පති ද්වඞ්ගුලකප්පො - ඉර අවර වී ඡායාව දෑඟුලක් වූ විකාලයෙහි ද යාවකාලිකආහාරයක් වළඳත් වටී.” (එයින් විකල් බොජුනෙහි පචිති ඇවැත් නො වේ.)

(4) “කප්පති ආවාසකප්පො - එක්සීමාවෙහි නොයෙක් ආවාසයන්හි පොහෝපවුරුණු ආදි සඞ්ඝකර්ම කරත් වටී.” (එයින් විනය ඉක්මවීමෙහි දුකුලාඇවැත් නො වේ )

1. Cf. Indian Antiquary, Vol. xxxvii, 1908, p. 5, note 27.

Free Distribution www.aathaapi.org

(5) "කප්පති අනුමතිකප්පො – ඇතුළුසීමාවෙහි සඞ්ඝයාගේ කැමැත්ත නො ගෙණ එය පසු ව ගන්නා අදහසින් ව්‍යග්‍ර ව සඞ්ඝකර්‍ම කරත් වටී". (එසින් විනය ඉක්මවීමෙහි දුකුලාඇවැත් නො වේ.)

(6) "කප්පති ආචිණ්ණකප්පො – ආචාර්‍ය්‍ය උපාද්ධ්‍යායයන් විසින් පුරුදු කරණලද කැප හෝ නොකැප දෙය ඔවුන් කළබැවින් තමා කරත් වටී."

(7) "කප්පති අමථිතකප්පො – භොජනපවාරණය කළ පසු මිදීගෙණ එනබැවින් කිරිත් නො වූ සම්පූර්ණයෙන් නොමිදුනුබැවින් දීත් නො වූ අයිරිත්කැප නොකළ කිරි වළඳත් වටී". (එසින් නො අයිරිත් බොජුනෙහි පචිති ඇවැත් නො වේ.)

(8) "කප්පති ජලොගි පාතුං – මද්‍යාවට නො ගිය තරුණ සුරා බොත් වටී." (එසින් රහමෙර බීමේ පචිති ඇවැත් නො වේ.)

(9) "කප්පති අදසකං නිසීදනං – අනුදත් පරිදි සුගත්වියත් පමණ දහ(දාවලු) නො ලා කළ නිසීදනය (හිඳිනා ඇතිරිය) පරිහරණය කරත් වටී" (එසින් ඡේදනක පචිති ඇවැත් නො වේ.)

(10) "කප්පති ජාතරූපරජතං – රන්රිදීම්සුකහවණු (මිල මුදල්) පරිහරණය වටී".[1]

---

1. සර්‍වාස්තිවාදීන්ගේ විනයක්‍ෂුද්‍රකයෙහි එන දශවස්තු (ල වලේ පුසං මහතාගේ පරිවර්‍තනය අනු ව) මෙසේ ය:

(1) එකාල වජ්ජී භික්‍ෂූහු "අධර්‍මයෙන් ව්‍යග්‍රකර්‍ම, අධර්‍මයෙන් සමග්‍රකර්‍ම, ධර්‍මයෙන් ව්‍යග්‍රකර්‍ම" යන සඞ්ඝකර්‍ම කරත්.

(2) නොපැමිණි සඞ්ඝයාගේ ඡන්දය ගන්නා අදහසින් ව්‍යග්‍ර ව කර්‍ම කරත්.

(3) පොළොව කැණීම හා කැණවීම කරත්.

(4) යාවජ්ජීවික ලුණු යාවකාලික ආහාරය සමග මිශ්‍ර කොට කාලයෙහි වළඳත්

(5) යොදුනක් හෝ අඩයොදුනක් ගමන් කොට ගණභොජන වළඳත්.

(6) භොජනපවාරණය කළ පසු අයිරිත් නොකළ තද හෝ මෘදු ආහාරය ඇඟිලි දෙකින් අනුභව කරත්.

(7) දියකුඩැල්ලන් (ජලූකාවන්) මෙන් උරමින් පැසුනු රා බොත්. (...drinking fermented liquor with a sucking action like leeches.)

(8) දීකිරට සමපමණ හුන්කිරි බහා මිශ්‍ර කොට විකාලයෙහි වළඳත්.

(9) සුගත් වියත් පමණ දවලු නැති, පුරාණනිසීදනයෙන් සුගත්වියත් පමණ කොටසක් කපා නො යොදා කළ නිසීදන දරත්.

(10) වටකුරු පාත්‍රයක් සුවඳ කවා මලින් සරසා හිස තබාගෙණ මංසන්ධි වීථි ආදියෙහි යමින් "මේ භද්‍රපාත්‍රය රන්කහවණු ආදියෙන් යමෙක් පුරවන්නේ නම් ඔහුට මහත් පිණක් අයත් වේ" යි කියමින් සම්මාදන් කරත්.

Cf. The Indian Antiquary, Vol. xxxvii, 1908, pp 104 - 105

Cf. Rockhill's The Life of The Buddha, p p. 171 - 173.

මෙහි 7 වන වස්තුවෙහි "දියකුඩැල්ලන් (ජලූකා) මෙන් උරමින් බොත්" යන මෙහි 'ජලූකා' ශබ්දය හා 'ජලොගි' ශබ්දයේ අ්‍යසම්බන්ධයක් හැයේ දැයි විමසත්වා. 'ජලොගි' යනු දෙශිය ව්‍යවහාරයෙකි ? "ජලූගා, ජලායා" (=ජලෞකස් = කුඩැල්ලෝ) යි අභිධානශබ්දකොෂයෙහි දක්වේ.

කුඩැල්ලෝ ලේ බී වැටෙන තෙක් ලේ බොත්. එ මෙන් මත් වන තෙක් සුරා බොත් ය යි මෙයින් හැඟෙන්නේ ද ?

"The Bhikshus of Vaisāli held it lawful to suck fermented drinks as would a leech, though one was made ill by drinking thus..." Rockhill's The Life of The Buddha, p. 172.

"වෛශාලී භික්‍ෂූහු කුඩැල්ලා උරා බොන්නාක් මෙන් එයින් තමා ආතුර (මත් වන තුරු) වුවත් උරඋරා රා බීම කැප ය යි ගණිති" යනු මෙහි අදහසයි.

ජලය මෙන් පෙණෙන සුරා බීම කැපය යනු ද මතයෙකි.

(8. That fermented drinks, if they looked like water, were allowed to be drunk. Buddhism by Rhys Davids, p. 216.)

Free Distribution www.aathaapi.org

මෙසේ විනයප්‍රඥප්ති පෙරළාගත් දසදහසක් පමණ වූ වජ්ජි භික්ෂූහු මිලමුදල් ආදි අකැප්පදෙය පරිහරණය කරමින් ශාසනභෙදයක් ඇති කළහ. ඒ බව ඇසූ **කාකණ්ඩපුත්‍ර යස** නම් මහරහතුන් වහන්සේ ඒ දශවස්තුව විනිශ්චය කොට එය අවිනය යි බැහැර කොට ශාසනය සෙමෙහි තබා ආරක්ෂා කිරීම සඳහා එකල මහාසංඝස්ථවිර වූ **එක්සිය** විසිවයස් වන **සබ්බකාමි** රහතුන් වහන්සේ ඇතුළු **රේවත, සාළ්හ, ඛුජ්ජසොභිත, වාසභගාමි සුමන, සාණවාසි සම්භූත** යන රහතුන් හා සාකච්ඡා කොට ගෙණ උන්වහන්සේලා සමග **වාලුකාරාමයට** වැඩියහ. මෙහි **යස, සබ්බකාමි** ආදි සනම **අනන්ද** මහරහතුන් වහන්සේගේ **සද්ධිවිහාරිකයෝ** ය. **සුමන, සම්භූත** දෙනම **අනුරුද්ධ** රහතුන් වහන්සේගේ ශිෂ්‍යයෝ ය. මේ අටනම ම බුදුරජුන් දුටුවිරූහ. මේ චිරරාත්‍රඥ මහරහතුන් වහන්සේ ඒ දශවස්තුව විනයශික්ෂාපද හා ශික්ෂාපද-විභඞ්ගය අනුව විසඳා එය විනයවිරොධි බව ප්‍රකාශ කොට නිර්ලජ්ජ වජ්ජිභික්ෂූන් මර්දනය කළහ. ඉක්බිති එහි රැස් වූ දොළොස් දහසක් රහතුන් අතුරෙන් තෝරා ගන්නාලද සත්සියක් රහතුන් විසින් ප්‍රථම-සඞ්ගායනාවෙන් සංගීත වූ පරිද්දෙන් ම ධර්මවිනය පිටකනිකායාදි වශයෙන් සඞ්ගායනා කරණලදී.

සත්සියක් රහතුන් විසින් විනය නිදාන කොට ගෙණ පැවැත්වූ හෙයින් **"සත්තසතිකාවිනයසංගීති"** නම් වූ මේ ද්විතීයසංගීතියෙහි දී චුල්ලවග්ගයෙහි සංගීතික්ඛන්ධක දෙක ද, අඞ්ගුත්තරනිකායෙහි **මුණ්ඩරාජ** සූත්‍රය ද, විමානවත්ථුවෙහි **සෙරීස්සක**විමානකථාව ද, පෙතවත්ථුවෙහි **උත්තරමාතු** පෙතවත්ථුව ද පිටකපාළියට එකතු කරණලදී. **පායාසිසූත්‍රය** ද මේ සංගීතියෙන් සංගීත වී ය යි සමහරු කියති. එය අට්ඨකථාදියක දක්නට නැත. බුද්ධපරිනිර්වාණයටත් ප්‍රථමසංගීතියටත් අතර කාලයක **කුමාරකස්සප** තෙරණුවන් විසින් වදාළ **පායාසිසූත්‍රය** උන්වහන්සේගෙන් ඇසූ පරිදි **අනඳ** තෙරුන් විසින් "එවං මෙ සුතං එකං සමයං ආයස්මා කුමාරකස්සපො"[1] ආදීන් නිදානය තබා ප්‍රථමසංගීතියෙහි දී ම සංගීත වී ය යි සිතිය යුතු. **කුමාරකස්සප** තෙරණුවෝ ඒ සංගීතියට සහභාගී වූ කෙනෙකි.[2]

ද්විතීයසංගීතියෙන් පසු ථෙරවාදිසඞ්ඝයාගෙන් භින්න වූ වජ්ජිභික්ෂූන් විසින් මහාසංගීති නම් වූ සඞ්ගායනාවක් පවත්වන ලදි. එතැන් පටන් මහාසඞ්ඝිකාදි නිකායාන්තරයන් ප්‍රභූත වූ සැටිත්, ධර්මවිනය වෙනස් කොට අමුතුවෙන් පිටක, ආගම, සූත්‍ර, පාරමිතා, අවතංසක, අවදාන, රත්නකූට, තන්ත්‍ර, කල්ප ආදි නමින් ඒ ඒ නිකායිකයන් විසින් ආත්මවාදාදි නානා මිථ්‍යාමත ඇතුළත් කොට ප්‍රාකෘත-සංස්කෘතග්‍රන්ථරාශියක් නිපදවූ බවත් ප්‍රකට ය.

සම්බුද්ධපරිනිර්වාණයෙන් දෙවන ශතවර්ෂයෙහි ස්ථවිරවාදී සඞ්ඝයාගෙන් භින්න වූ සර්වාස්තිවාදීන්ගේ ද සංස්කෘතත්‍රිපිටකයෙක් වෙයි. එහි සූත්‍රපිටකය පාළිසුත්තපිටකයට ධර්මපර්‍යාය වශයෙන් බෙහෙවින් අසමාන දීර්ඝාගමාදි පඤ්චාගමයෙන් ද, විනයපිටකය විනයවිභඞ්ග, විනයවස්තු, විනයක්ෂුද්‍රක යන ග්‍රන්ථතුණෙන් ද යුක්ත වේ. අභිධර්ම පිටකය පාළිඅභිධම්ම-පිටකයට ගණනින් හා නමින් පමණක් සමාන බව හැඟෙන ග්‍රන්ථ සතකින් යුක්ත වේ. එහි ඓතිහාසික තත්ත්වය දැනගැනීමට දැනට චීනභාෂාවෙන් පවත්නා ඒ ග්‍රන්ථ හා එහි කර්තෘවරයන් ද මෙහි දක්වමු:

---

1. දීඝනිකාය, 23 සූත්‍රය
2 දීපවංස, 20 පිටුව.

Free Distribution www.aathaapi.org

| | ග්‍රන්ථ | | කර්තෘ |
|---|---|---|---|
| 1 | ඥානප්‍රස්ථාන (ශාස්ත්‍ර) | (පාලි - පට්ඨාන) | ආර්‍ය්‍යකාත්‍යායන |
| 2. | ප්‍රකරණපාද | (කථාවත්ථු) | ස්ථවිර වසුමිත්‍ර |
| 3. | විඥානකාය | (විභඞ්ග) | ස්ථවිර දේවශර්මන් |
| 4. | ධර්මස්කන්ධ | (ධම්මසඞ්ගණී) | ආර්‍ය්‍යශාරිපුත්‍ර |
| 5. | ප්‍රඥප්තිපාද | (පුග්ගලපඤ්ඤත්ති) | ආර්‍ය්‍යමෞද්ගල්‍යායන |
| 6. | ධාතුකාය | (ධාතුකථා) | පූර්ණ |
| 7. | සංගීතිපර්‍ය්‍යාය | (යමක) | මහාකෞෂ්ඨිල.* |

මෙහි 1, 4, 5, 6, 7 වන ග්‍රන්ථයන් කළ කර්තෘවරයෝ බුද්ධකාලීන **මහාකච්චායන, සාරිපුත්ත, මහාමොග්ගල්ලාන, පුණ්ණ, මහාකොට්ඨිත** යන මහරහත් ශ්‍රාවකයෝ වෙති. උන්වහන්සේ මේ ග්‍රන්ථ රචනා කළහ යි කීම කල්පිතයකි. මේ පස්නම ආභිධර්මිකයන් බව නම් සැබෑ ය. මහා-කච්චායන පුණ්ණ මහාකොට්ඨිත යන තුන්නම ප්‍රථමසංගීතියට ද සහභාගී වූ රහත්හු ය. සැරියුත් මුගලන් දෙනම බුද්ධකාලයෙහි ම පිරිනිවියහ.

## තෘතීයසඞ්ගීතිය

සම්බුද්ධපරිනිර්වාණයෙන් දෙසියඅටළොස්වන වසෙහි **පැළලුප්නුවර** රාජාභිෂෙකයට පැමිණි **අශෝකාධිරාජයන්ගේ** කාලයෙහි තීර්ථකමත ගත් ශ්‍රමණයන් ශාසනයට ඇතුළත් වී නොයෙක් විප්ලව ඇති කිරීමෙන් හටගත් ශාසනාර්බුද සන්හිඳුවා **මොග්ගලිපුත්තතිස්ස** මහරහතුන් වහන්සේ ප්‍රමුඛ දහසක් රහතුන් වහන්සේ විසින් අශෝකාභිෂෙකයෙන් සතළොස් වන වසෙහි බුද්ධවර්ෂයෙන් දෙසියපන්තිස්වැන්නෙහි **අශෝකාරාමයෙහි** තුන්වන සඞ්ගායනාව පවත්වන ලදී.

මේ සංගීතියෙහි දී මොග්ගලිපුත්තතිස්ස මහරහතුන් වහන්සේ විසින් බුදුරජාණන් වහන්සේ වදාළ මාතෘකා විස්තර කෙරෙමින් පරවාද මර්දනය සඳහා කරණලද **කථාවත්ථුප්පකරණය** ද සංගීත වී ය. එසින් අභිධර්ම පිටකයේ ප්‍රකරණ සත සම්පූර්ණ විය. නවමසකින් නිමවූ **සාහස්සිකා** නම් මේ සංගීතිය බුද්ධධර්මය සංකර කිරීමට නිකායාන්තරිකයන් උපදවා තුබුනු මිථ්‍යාමත නිරාකරණය කිරීම හා **කථාවත්ථුප්පකරණය** සඞ්ගායනාරූඪ කිරීම ප්‍රධාන කොටගෙණ පවත්වන ලදී. ඒ සංගීතියෙන් ථෙරගාථාපාළියට **තෙකිච්ඡකානි**ථෙරගාථා ද, පෙතවත්ථුපාළියට **නන්දක** පෙතවත්ථුවෙහි **පිඞ්ගලකරාජ**කථාව ද ඇතුළත් වූහ. **ධර්මාශෝක** මහරජතුමාගේ ආරක්ෂාසංවිධානයෙන් හා උපකාරයෙන් පැවැත්වුනු මේ සඞ්ගායනාවෙන් ඇති වූ ශ්‍රේෂ්ඨසිද්ධිය නම් උතුම් රජතුමන් විසින් ඒ ඒ ප්‍රදේශවලට ධර්මදූතයන් යවා බුද්ධශාසනය පිහිටුවාලීම යි. මේ සංගීතිය මහායානිකග්‍රන්ථයන්හි සඳහන් නො වේ. ඔහු මේ සංගීතිය ද්විතීය සංගීතිය වශයෙන් ගෙණ **කාලාශෝක** රජ ධර්මාශෝක ය යි ගණිති.

## පොත්ථකසඞ්ගීතිය

ත්‍රිපිටකය දැරීම සඳහා ඒ ඒ ආචාර්‍ය්‍යවරයන්ට භාර වූ සැටි යට දක්වන ලදී. එසින් ප්‍රථමසංගීතියෙහි පටන් **උපාලි** මහරහතුන් වහන්සේ හා උන්වහන්සේගේ ශිෂ්‍යපරම්පරාවෙහි වූ **දාසක, සොණක, සිග්ගව, මොග්ගලිපුත්තතිස්ස** යන රහතුන් වහන්සේ විසින් **විනයපිටකය** පවත්වා ගෙණ එනලදී.

---

* මේ විස්තරය රාහුල සාංකෘත්‍යායන - අභිධර්මකෝෂව්‍යාඛ්‍යාසංඥප්තයෙන් ගන්නාලදී.

**ආනන්ද** පරපුරෙහි වූ දීඝභාණක, **ශාරිපුත්‍ර** ශිෂ්‍ය පරපුරෙහි වූ මජ්ඣිමභාණක, **මහාකාශ්‍යප** පරපුරෙහි වූ සංයුත්තභාණක, **අනුරුද්ධ** පරපුරෙහි වූ අංගුත්තරභාණක යන ආචාර්‍ය්‍යවරයන් සහ **ජාතකභාණක** ධම්මපදභාණකාදි ආචාර්‍ය්‍යවරයන් ද විසින් **සූත්‍රාන්තපිටකය** ගෙණ එනලදී.

**ශාරිපුත්‍රශිෂ්‍යපරම්පරාවෙහි** වූ **භද්දජි, සොභිත, පියජාලි, පියපාල, පියදස්සී, කොසියපුත්ත, සිග්ගව, සන්දෙහ, මොග්ගලිපුත්ත, සුදත්ත, ධම්මිය, දාසක, සොණක, රෙවත** යන ආචාර්‍ය්‍යවරයන් විසින් **අභිධර්ම පිටකය** දරාගෙණ එනලදී.

මේ හැර ශිලාලිපි – අටුවා ආදියෙහි පෙණෙන පේටක, නෙකායික, තෙපිටක, පංචනෙකායික, වෙනයික, සුත්තන්තික, විනයධර, මාතිකාධර, ධම්මකථික ආදි වචනවලින් හැඟෙන්නේ ඒ ඒ ආචාර්‍ය්‍යවරයන් විසින් ත්‍රිපිටකධර්මය කොටස් වශයෙන් ද සමහරුන් විසින් සම්පූර්ණවශයෙන් ද දරණලදබව යි.

තෘතීයසඞ්ගායනාවසානය තෙක් දඹදිව පැවැති ථෙරවාදාචරිය පරම්පරාවෙහි අන්තිම පුරුෂ වූ **මොග්ගලිපුත්ත** රහතුන් වහන්සේගේ ශිෂ්‍ය **මහාමහින්ද** මහරහතුන් වහන්සේගෙන් ලක්දිව ආරම්භ වූ **අරිට්ඨාදි** සිංහල මහරහතුන් වහන්සේගේ පරම්පරාවෙහි ත්‍රිපිටකපාලිධර්මය සංගීතිකාරක මහරහතුන්ගේ වාචනාමාර්ගය අනු ව මුඛපාඨවශයෙන් ම පැවැත්තේ ය.

මෙසේ සම්බුද්ධපරිනිර්වාණයෙන් පස්වැනි ශතවර්ෂය තෙක් අවිච්ඡින්න වූ ස්ථවිරපරම්පරාවෙහි ස්මෘතිමාර්ගයෙන් පැවති පුරාණාර්ථකථා සහිත සම්පූර්ණ ත්‍රිපිටකපාලිය බුද්ධවර්ෂ 440 ටත් 454 ටත් අතර කාලයෙහි **වළගම්බා** රජු දවස පර්‍ය්‍යාප්තිධර ෂඩභිඥලාභී පන්සියක් සිංහල මහරහතුන් විසින් මාතලේ **අළුලෙන්** විහාරයෙහි වැඩහිඳ සිංහල අකුරෙන් ලියවා පුස්තකාරූඪ කොට සඞ්ගායනා කරණලදී. වර්තමාන ත්‍රිපිටකය සකස් වූයේ මෙලෙසිනි.[1]

ලොකයේ ප්‍රථමවරට සිංහල රහතුන් විසින් කරණලද මේ මහාධිකාරයෙන් පාලිත්‍රිපිටකය බුරුම, සියම්, කාම්බෝජ, ලාඕස් ආදි ථෙරවාදි බෞද්ධරටවල පැතිර ගියේ පාලිවශයෙන් ද ඒ ඒ ජාතීන්ගේ භාෂාවිෂය වූ වාචනාමාර්ගයෙන් ද ඔවුන්ගේ ජාතිකජීවිතය හා සම්බන්ධ වූ ඓතිහාසික ආගමසාහිත්‍යය වශයෙන් පවත්නේ ය.

ලක්දිව අටලොස් මහගණයට අයත් දීඝභාණක, මජ්ඣිමභාණක, සංයුත්තභාණක, අංගුත්තරභාණක, ඛුද්දකභාණක, පාරාජිකභාණක, පාචිත්තියභාණක, චුල්ලවග්ගභාණක, මහාවග්ගභාණක, පරිවාරභාණක, ධම්මසඞ්ගණීභාණක, විභඞ්ගභාණක, කථාවත්ථුභාණක, පුග්ගලභාණක, ධාතුකථාභාණක, යමකභාණක, පට්ඨානභාණක, ජාතකභාණක යන භාණකාචාර්‍ය්‍යයන් විසින් ද අර්ථකථාචාර්‍ය්‍ය – ටීකාචාර්‍ය්‍යවරයන් හා ප්‍රකරණ, විවරණ, සන්න, ගැටපද කළ ගිහිපැවිදි සද්ධාබුද්ධිසම්පන්න පඬිවරයන් ද විසින් පරිපොෂිත වීමෙන් සිංහලයන්ගේ ජීවරුධිරය වූ ත්‍රිපිටකපාලිධර්මය අද බටහිර රටවල ද පැතිර ගියේ ලොකසාහිත්‍යයෙහි ශ්‍රෙෂ්ඨත්වයෙන් ස්වීකෘත ව පවත්නේ ය.

1. පාලිපිටකපොත් පළමුවෙන් උතුරු ඉන්දියාවෙන් ලක්දිවට ගෙණෙන ලදබවත් සිංහල තෙරුන් විසින් ඒ පොත් සංස්කාරණය කරණ ලදබවත් සමහරු සිතත්.
Cf. Buddhist India by Rhys Davids, pp. 111-113.

Free Distribution www.aathaapi.org

සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පර්‍ය්‍යාප්ති ශාසනසඞ්ඛ්‍යාත ත්‍රිපිටක-ධර්මයෙහි සම්භවය හා ව්‍යාප්තිය පිළිබඳ ඉතිහාසය විෂය කොට ගෙණ අප විසින් ලියූ ප්‍රස්තාවනාව මෙතෙකින් සමාප්ත වේ.

මේ ප්‍රස්තාවනාව ලිවීමේ දී විද්‍යෝදය පිරිවෙණේ සහකාර පරිවෙණාධිපති පූජ්‍ය පණ්ඩිත **වැලිවිටියේ සෝරතාභිධාන නායක** ස්ථවිරයන් වහන්-සේගෙන් ශෝධ්‍යපත්‍ර බැලීමාදියෙන් ලැබුනු උපකාරය ද, අග්ගමහාපණ්ඩිත **බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය**, පණ්ඩිත **කෝදාගොඩ ඤාණාලෝක**, **පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද** යන ස්ථවිරයන් වහන්සේලාගෙන් ලත් අනුග්‍රහය ද කෘතඥතා පූර්වක ව සිහිපත් කරම්හ.

**"චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මාසම්බුද්ධසාසනං."**

පරවාහැර වජිරඤාණ.

# බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා

## ත්‍රිපිටකපාලිය සිංහලභාෂාවට පරිවර්තනය කිරීම

ශ්‍රී සුගත තථාගත සම්මාසම්බුද්ධරජාණන් වහන්සේගේ සකන්ධපරිනිර්වාණයෙන් ද උන්වහන්සේ විසින් වදාළ ත්‍රිපිටකසද්ධර්මය මෙතාක් ආරක්ෂා කරගත් සිංහලජාතියේ ආරම්භයෙන් ද අවුරුදු දෙදහස් පන්සියයක් සම්පූර්ණ කරමින් පැමිණි 2500 වන **බුද්ධජයන්ති වර්ෂය** නිමිත්ත කොට ගෙණ ආගමිකඅභිවෘද්ධිය හා ජාතික ප්‍රබෝධය ද සඳහා ලංකාබෞද්ධයන් විසින් ලංකාආණ්ඩුවේ ආධාරයෙන් කළ යුතු ය යි සම්මත වූ කටයුතු අතුරෙන් ත්‍රිපිටකපාලිය සිංහලභාෂාවට පරිවර්තනය කොට පෙළත් සමග මුද්‍රණය **කිරීම** ප්‍රධානකාර්ය්‍යය වශයෙන් සැලකිය යුතු බව එකල ලක්රජයේ ස්වදෙශකාර්ය්‍යභාර අමාත්‍යවරයා වූ **අබේරත්න රත්නායක** මහතා විසින් ආණ්ඩුවට දන්වන ලදී.

මේ යෝජනාව හා බුද්ධජයන්ති උත්සවය පිළිබඳ වෙනත් කටයුතු සම්බන්ධ ව සාකච්ඡා කොට වාර්තා කිරීම සඳහා තත්කාලීන ලංකාආණ්ඩුවේ අග්‍රාමාත්‍ය වූ ශ්‍රීමත් **ජෝන් කොතලාවල** මහතා විසින් ස්වදෙශඅමාත්‍ය **ඒ. රත්නායක,** කෘෂිකර්ම හා ආහාර පිළිබඳ අමාත්‍ය **ජේ. ආර්. ජයවර්ධන,** අධ්‍යාපනඅමාත්‍ය **ඇම්. ඩී. බණ්ඩා,** පළාත් පාලන අමාත්‍ය **සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,** ස්වදෙශඅමාත්‍යාංශයෙහි ස්ථිරලේකම් වූ **බී. ඇෆ්. පෙරේරා,** ලංකාආණ්ඩුවේ මහාභාරකාර **වී. ඇෆ්. ගුණරත්න,** ආචාර්ය්‍ය **ආනන්ද ඩබ්ලිව්. පී. ගුරුගේ** යන මහතුන්-ගෙන් යුත් අනුකාරකසභාවක් පත් කරණලදී.

මේ සභාව විසින් ප්‍රධානස්ථවිරවරයන් හා ප්‍රභූගිහිමහතුන් කීපදෙ-නෙකුන් ද සමග සාකච්ඡා කොට ඉදිරිපත් කරණලද වාර්තාව අනු ව බුද්ධජයන්ති කාර්ය්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 1954 ක් වූ ඔක්තෝබර් මස 12 වන දින කොළඹ ටොරිංටංචතුරශ්‍රයේ නිදහස් මන්දිරයෙහි දී අගමැතිතුමා විසින් ලංකාආණ්ඩුව වෙනුවෙන් **ලංකාබෞද්ධමණ්ඩලය** පිහිටුවන ලදී.

ලංකාබෞද්ධමණ්ඩලයේ ව්‍යවස්ථා අනු ව එහි සභාපති අග්‍රාමාත්‍යතුමාගේ අනුමතියෙන් ඒ ඒ කටයුතු ඉටු කිරීම සඳහා කාරකසභා පත් කිරීමේ දී මෙහි LXVII වන පිටුවේ සඳහන් වන ගිහිපැවිදිසාමාජිකයන්ගෙන් යුත් **ත්‍රිපිටකපරිවර්තනය පිළිබඳ කාරකසභාව** පත් කරණු ලැබී ය.

ඒ කාරකසභාවෙන් සම්මත වූ පරිදි ත්‍රිපිටකපාලිය කොටස් වසයෙන් බෙදා සිංහල භාෂාවට නැඟීම සඳහා මෙහි LXVIII වන පිටුවේ දැක්වෙන ස්ථවිරවරුන්ට ශ්‍රීමත් ජෝන් කොතලාවල අග්‍රාමාත්‍යතුමා විසින් ඒ ඒ ග්‍රන්ථ ආණ්ඩුව වෙනුවෙන් පිළිගන්වන ලදි.

පරිවර්තනය කරණු ලබන ග්‍රන්ථයන් සංශෝධනය කොට මුද්‍රණයට පැමිණවීම සඳහා මෙහි LXX වන පිටුවේ දැක්වෙන **සංස්කාරකමණ්ඩලය** ත්‍රිපිටකපරිවර්තනකාරකසභාව විසින් සම්මත වී ය. සංස්කාරක මණ්ඩලය වර්ෂ 1955 ජූලායි මස 10 වන දින ස්වකාර්ය්‍යය ආරම්භ කරමින් එකලට පරිවර්තිත ව තුබූ ග්‍රන්ථ සංශෝධනයෙහි නියුක්ත වී ය

Free Distribution www.aathaapi.org

පාලිධර්මය කථාව්‍යවහාරයෙහි පවත්නා භාෂාවකට පරිවර්තනය කිරීමෙන් පාලිවචනයෙහි යථාර්ථය ගිලිහී යා හැකි බවත් එහි මහාර්ඝත්වය පිරිහී යා හැකි බවත් ධර්මගෞරවයෙන් සිතන්නෝ ද වෙති. ජාතික භාෂාවක් කලින් කල වෙනස් වන බැවින් මුල්කාලයෙහි පැවැති වචන පසුකාලයෙහි දුරවබෝධ වීමෙන් ලීනාර්ථ වෙති සි ද අන්‍යාර්ථ දෙති සි ද සිතූ පූර්වාචාර්යයන් විසින් මිහිඳුකාලයෙහි පටන් ශතවර්ෂ සතක් පමණ සිංහලදෙශීයභාෂාවෙන් පැවති අර්ථකථා නම් වූ ශාරීපුත්‍රාදී මහරහතුන්ගේ වාචනාමාර්ගීය (පෙළමග) කථාව්‍යවහාරයෙහි නො පවත්නා වූ ලෞකිකශාස්ත්‍රාන්තර හා දර්ශනාන්තර ඇසුරු නො කරන්නා වූ හුදෙක් බුද්ධවචන ම විෂය කොට ඇති පාලිභාෂාවට නගා තැබූ බැවින් අන්‍ය ලොකයාට ද හිත සිද්ධ කෙරෙමින් මතාන්තර සංකලනයෙන් තොර ව මූලික පරිශුද්ධත්වයෙන් යුක්ත ව අද තෙක් ආරක්ෂිත ය යි ඔහු නිදර්ශන කෙරෙති. ඒ එසේ ම ය.

එහෙත් පාලිධර්මය ආශ්‍රය කිරීමෙන් ම පූජ්‍යත්වයට හා ප්‍රභූත්වයට පැමිණි අර්ථව්‍යක්තියෙහි විශද වූ ශ්‍රැතියෙහි මධුර වූ වචනසම්පත් ඇති සිංහලභාෂාවට යම් යම් ත්‍රිපිටකග්‍රන්ථ පෙළ සහිත වත් රහිත වත් ධර්මවිරොධ නොවන සේ පරිවර්තිත ව තුබූ බව ඉතිහාසයෙන් පෙණේ. බු: වර්ෂ 1474 වැන්නෙහි රජ වූ **සවන කාසුප්** රජු විසින් අභිධර්මපිටකයෙහි දම්සඟුණු පොත රන්පත ලියවා පෙරහැරින් පිදූබවත්, 1609 වැන්නෙහි රජ වූ **මහවිජයබා** රජු විසින් දම්සඟුණුපෙළ සිංහලභාෂාවට පරිවර්තනය කරණ ලදබවත් මහාවංසයෙන් පෙණේ.[1]

තවද, ඒ ඒ කාලයෙහි ගිහිපැවිදිපඬිවරුන් විසින් දෙශනාපාලියෙන් හා අර්ථකථාපාලියෙන් ගෙණ සිංහලයෙන් ලියූ නොයෙක් ධර්මපර්යායයන් විෂය කොට ඇති ගද්‍යපද්‍ය පොත් රාශියකි. ඒ සිංහලබණපොත් ද පාළිබණපොත් මෙන් ම සිංහලයන්ගේ ආගමිකධනය හා ජාතිකසාහිත්‍යය වශයෙන් ආදෘත වූයේ සම්භාවිත ව පවත්නේ ය. “ජාතකපොත්වහන්සේ’ ආදිය නිදර්ශන සි.

**බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලාව** පාළිය හා එහි සිංහලපරිවර්තනය වෙන් වෙන් ව යෙදෙන සේ සකස් වන බැවින් පාළිය සමග එහි අර්ථය ද එකවිට උගත හැකි වේ. එයින් පාළිය ද රැකෙයි. අර්ථය ද පැහැදිලි වෙයි.

බුද්ධශාසනයේ මධ්‍යයුගය වූ මේ කාලයෙහි ශාසනය පිළිබඳ පුනරුද්දීප්තිය ඇති වන්නේ ය යනු බෞද්ධලෝකයාගේ ඒකාන්ත විශ්වාසය සි. ඊට හෙතු වන්නේ පර්යාප්තිශාසනධර්මය (පෙළදහම) මැනැවින් ඉගෙණ එහි දැක්වෙන ප්‍රතිපත්තිය පිළිපැදීමයි. එයින් ප්‍රතිවෙධධර්මය අවබොධ වන්නේ ය. ඒ අවබොධයට මූලිකහෙතු වන්නේ පෙළදහම ඒ ඒ මිනිසුන්ගේ භාෂාවෙන් ම ඇසීම හා කියවීම සි.

1. මහාවංසය, 52 පරිච්ඡේදය, 67 පිටුව, 50 - 57 පෙළ. එම 60 පරිච්ඡේදය, 85 පිටුව, 16 - 18 පෙළ.

පාළි නො දත් සාමාන්‍යසිංහලජනතාවට ද ධර්මවිනය සියබසින් දැන ගැනීමට – ඉගෙනීමට බුද්ධජයන්තීග්‍රන්ථමාලාව අසහාය උපකාරය වන්නේ ය. "තථාගතප්පවෙදිතො ධම්මවිනයො ... විවටො විරොචති නො පටිච්ඡන්නො" යනු වදාළ හෙයින් තථාගතදෙශිත ධර්මවිනයය ජනයා අතර ප්‍රකට වූයේ ම බබලයි. වැසී පවත්නේ නො ම බබලයි. එහෙයින් බුද්ධජයන්තිය නිමිත්තෙන් ධර්මවිනය ප්‍රකට කරලීම සඳහා ලංකාආණ්ඩුව විසින් ගත්මග අතිශයින් ප්‍රශංසනීය වේ.

ලංකාබෞද්ධමණ්ඩලයේ කටයුතු සංවිධානය කිරීම සඳහා පත් වූ මෙහි LXXI වන පිටුවේ සඳහන් වන මධ්‍යවිධායකසභාව විසින් ආරම්භ කරණ ලද ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්තනය කරවා මුද්‍රණය කරවීමේ කාර්‍ය්‍යය දැනට වර්තමාන මහජනරජයේ සාංස්කෘතිකකාර්‍ය්‍යාංශයට පැවරී තිබේ. එහි අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කරණ **ඇන්. ක්‍යූ. ඩයස්** මහතා පළාත්පාලන හා සාංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු **ජයවීර කුරුප්පු** මැතිතුමාගේ සහයොගයෙන් මේ කාර්‍ය්‍යය ඉක්මනින් ඉටු කිරීම සඳහා එහි ප්‍රධාන සම්පාදක **වී. පණ්ඩිත** මහතා ද සහකාර සම්පාදක මුදලි නැත්පන් **ඇම්. ඇන්. පීරිස්** මහතා ද සමග උද්‍යොගයෙන් ක්‍රියා කරයි.

වර්තමාන ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු **ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක** මහාශයන්ගේ හා ඇමැතිමඩලේ ද අනුමතියෙන් ඒ මහතුන් විසින් දැනට සංවිධාන කරණු ලැබ තිබෙන ක්‍රියාමාර්ගයෙන් මේ කාර්‍ය්‍යය නොබෝ කලකින් අවසන් වෙනවා ඇත.

## බුද්ධජයන්තිමහාවග්ගපාළිය

බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලාවේ ග්‍රන්ථ අතුරෙන් ප්‍රථමයෙන් මුද්‍රණයට පැමිණි **මහාවග්ගපාළිය** විනයපිටකයෙහි තුන්වන ග්‍රන්ථය වේ. එය සිංහලභාෂාවට පරිවර්තනය කිරීම පිණිස භාරගත් **අම්බලම්ගොඩ ශාසනෝදය** පරිවෙණාධිපති පණ්ඩිත **අම්බලම්ගොඩ ධම්මකුසල** ස්ථවිරයන් වහන්සේ ඒ කාර්‍ය්‍යය මැනැවින් ඉටුකළහ. එහි සංශොධනය හා පරිවර්තනය පිළිබඳ විස්තරය උන්වහන්සේ විසින් ලියනලද සංඥාපනයෙහි දැක්වේ. ධර්මවිනයයෙහි ප්‍රවීණත්වයක් දරණ විශදබුද්ධිප්‍රභා ඇති ඒ පණ්ඩිත ස්ථවිරයන් වහන්සේ ස්වකාර්‍ය්‍යවිෂයයෙහි දක්වන ලද උත්සාහය පැසසිය යුතු වේ.

මෙහි සිංහල පරිවර්තනය පාළිපදයන්ගේ අර්ථව්‍යක්තිය සැලසෙන සේ දුර්බොධපදයන්ට ශිථිලාර්ථ කථනයෙන්, සුගමාර්ථ නැති පදයන්ට පරිකථා ලියමින් සාමාන්‍යජනයාට ද අර්ථාවබොධය වන පරිදි ලියා තිබෙන අයුරු සිත්ගන්නාසුළු ය. ධර්මව්‍යාඛ්‍යා කිරීමේ දී පෞරාණික ආචාර්‍ය්‍යවරයන් අර්ථකථා – ටීකාකථා අනු ව සමස්තපද ව්‍යස්ත කොට සන්ධිපද විසන්ධි කොට නිරුක්තිනිර්දේශ සහිත ව ධර්මාර්ථ විස්තර කර තිබෙන සැටි අනුගමනය කළ යුතු නමුත් මෙහි පාළිය දැක්වෙන පිටුවට ඉදිරි පිටුවෙහි එහි සිංහල පරිවර්තනය පාළියේ ප්‍රමාණයට ම යෙදිය යුතු වීම නිසා ඇතැම් පදයන්ගේ අර්ථවර්ණනා දුෂ්කර වී තිබේ.

සංශෝධනය සඳහා සංස්කාරකමණ්ඩලය වෙත පළමුවෙන් ම ඉදිරිපත් කරණ ලද මේ පොත සංශෝධනය කිරීමෙන් සෙසු ග්‍රන්ථයන්ට වඩා ඉක්මනින් අවසන් වීමත්, පළමුවෙන් විනයපිටකයට අයත් ග්‍රන්ථයක් ම මුද්‍රණය කරවිය යුතු ය යි සම්මත වීම හා හැකි තරම් ඉක්මනින් ත්‍රිපිටක මුද්‍රණය පටන් ගත යුතු වීමත් නිසා ප්‍රථමයෙන් මේ පොත මුද්‍රණයට පැමිණියේ ය.

මෙහි ශෝධ්‍යපත්‍ර බැලීමේ දී අප විසින් සසඳා බැලූ පොත්හි ඇතැම් පදවාක්‍යයන් ගිලිහී ගිය තැන් ද, අස්ථානපතිත වූ තැන් ද දක්නා ලදී. ඒ තැන් සංස්කාරකමණ්ඩලයේ සභාපති පූජ්‍යපණ්ඩිත වැලිවිටියේ සෝරතාභිධාන නායක ස්ථවිරයන් වහන්සේගේ තීරණයෙන් හා සෙසු සංස්කාරකස්ථවිරයන් වහන්සේලාගේ අනුමතියෙන් සම්පූර්ණ කොට සුදුසු පරිද්දෙන් යොදා මෙහි ශුද්ධිය කරණ ලදී. එහෙත් මෙහි අශුද්ධතැන් නැත්තේ නො වේ. කාලාන්තරයෙහි අතින් අත ලියවී පැවැති ග්‍රන්ථයක් සම්පූර්ණයෙන් ශුද්ධියට පැමිණවීම දුෂ්කර වූ කාරියෙකි.

මේ පොතේ ප්‍රථම භාගයෙහි පොත බලනුවන්ගේ පහසුව සඳහා ඒ ඒ පිටුව මුදුනේ යෙදිය යුතු ඛණ්ඩක නාමයන් හා අඞ්කයන් ද යෙදී නැති බව පෙණේ. අනවධානතායෙන් වී තිබෙන ඒ අඩුවෙන් ග්‍රන්ථයට පාඩුවක් නො වෙතැ යි සිතමු. පොතේ ද්විතීයභාගයෙහි අවසානයේ යෙදෙන උපග්‍රන්ථය ද පදසූචිය ද මෙහි විශෙෂාඞ්ගයෝ වෙති. පොත කාණ්ඩ දෙකට බෙදා නිකුත් කිරීමට සම්මත වූයේ පරිහරණයට පහසු වීම සඳහා බව සැලකිය යුතු.

පරවාහැර වජිරඤාණ.

ත්‍රිපිටකපරිවර්තන කාරකසභාවේ
හා සංස්කාරකමණ්ඩලයේ
සම්පාදක.

ශ්‍රී බුද්ධවර්ෂ 2501.
ධර්මදූතආශ්‍රමවිද්‍යාලය,
විද්‍යෝදයභික්ෂුශිෂ්‍ය නිවාසය,
දෙමටගොඩ, කොළඹ.

# ත්‍රිපිටකපරිවර්තනය පිළිබඳ කාරකසභාව

පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ (සභාපති), ආචාර්ය පරවාහැර වජිරඤාණ ස්ථවිරයන් වහන්සේ (සම්පාදක), අඹන්වැල්ලේ සිරි ධම්මානන්ද අනුනායක ස්ථවිරයන් වහන්සේ, අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත නායක ස්ථවිරයන් වහන්සේ, අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ, හාල්දඹුවන ධම්මරක්ඛිත ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත වැලිවිටියේ පුඤ්ඤසාර නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත කඩවැද්දුව සිරිනිවාස නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත කොස්ගොඩ ධම්මවංස ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත පලන්නොරුවේ විමලධම්ම නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත වේරගොඩ අමරමොලි නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත පරවාහැර පඤ්ඤානන්ද ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත ගලගම සරණංකර ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත හැගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත කටුකුරුන්දේ දෙවානන්ද නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත තලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ, කෙසෙල්වතුගොඩ සිරි රතනජෝති නායක ස්ථවිරයන් වහන්සේ, මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත හපුවලානේ සිරි ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ, කළුකොඳයාවේ සිරි පඤ්ඤාසේඛර නායක ස්ථවිරයන් වහන්සේ, යටිගම්මන විමලඤාණ නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත කුඹිරිප්පුවේ පඤ්ඤාසේඛර ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත අහුන්ගල්ලේ විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත වටද්දර මේධානන්ද ස්ථවිරයන් වහන්සේ, ගම්මුල්ලේ චන්දජෝති ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත දඹවින්නේ සුමනසාර නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත කෝදූගොඩ ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත හාල්යාලේ සුමනතිස්ස ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත කොටගම වාචිස්සර ස්ථවිරයන් වහන්සේ, හල්ගස්තොට දෙවානන්ද ස්ථවිරයන් වහන්සේ, බෙම්තර මංගල ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත හාන්දුපැල්පොල පුඤ්ඤරතන නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත මැදඋයන්ගොඩ විමලකිත්ති ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත අහුගොඩ සිරි සීලානන්ද ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේ, අමුණුගම රාජගුරු විපස්සි අනුනායක ස්ථවිරයන් වහන්සේ, දෙවිනුවර ඤාණාවාස ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත බලපිටියේ විසුද්ධාලෝක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත වලගෙදර සෝමාලෝක තිස්ස නායක ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත නුවරඑළියේ සෙනානන්ද ස්ථවිරයන් වහන්සේ, පණ්ඩිත ගබ්බෙල උපතිස්ස ස්ථවිරයන් වහන්සේ, ජී. පී. මලලසේකර මහාචාර්යතුමා, ආචාර්ය සෙනරත් පරණවිතාන පුරාවිද්‍යාධිකාරිතුමා, ඩී. පී. ජයසේකර මහතා, බී. ආර්. ඩයස් මහතා, පී. ඩ. රත්නතුංග මුදලිතුමා, දොස්තර අමරදාස රත්නපාල මහතා යන ගිහිපැවිදිභවතුන්ගෙන් ත්‍රිපිටකපරිවර්තනකාරකසභාව සමන්විත වෙයි.

# ත්‍රිපිටකග්‍රන්ථ පරිවර්තනය

## ග්‍රන්ථ හා පරිවර්තක ස්ථවිරවරු:

### 1. සුත්තන්තපිටක

දීඝනිකාය:- බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර.
මජ්ඣිමනිකාය:- i. කොස්ගොඩ ධම්මවංස ස්ථවිර.
ii. කුඹිරිප්පුවේ පඤ්ඤාසෙඛර ස්ථවිර.

සංයුත්තනිකාය:

සගාථකවග්ග:- පලන්නොරුවේ විමලධම්ම ස්ථවිර.
නිදානවග්ග:- දෙහිගස්පේ පඤ්ඤාසාර ස්ථවිර.
ඛන්ධකවග්ග:- වතුගෙදර අමරසීහ ස්ථවිර.
සළායතනවග්ග:- ගලගම සරණංකර ස්ථවිර.
මහාවග්ග:- i. හෑගොඩ ධම්මින්ද ස්ථවිර.
ii. ගබ්බෙල උපතිස්ස ස්ථවිර.

අඞ්ගුත්තරනිකාය:

එක, ද්වික, තික, චතුක්ක නිපාත:- හාත්දුපැල්පොල පුඤ්ඤරතන ස්ථවිර.
පංචක, ඡක්ක, සත්තක නිපාත:- හල්ගස්තොට දේවානන්ද ස්ථවිර.
අට්ඨක, නවක, දසක, එකාදසක නිපාත:- වටද්දර මේධානන්ද ස්ථවිර.

ඛුද්දකනිකාය:

ඛුද්දකපාඨ:- කළුකොඳයාවේ පඤ්ඤාසෙඛර ස්ථවිර.
ධම්මපද:- අහුන්ගල්ලේ විමලකිත්ති ස්ථවිර.
උදාන:- හපුවලානේ ඤාණාලෝක ස්ථවිර.
ඉතිවුත්තක:- ගම්මුල්ලේ චන්දජෝති ස්ථවිර.
සුත්තනිපාත:- පරවාහැර පඤ්ඤානන්ද ස්ථවිර.
විමානවත්ථු:- හාල්යාලේ සුමනතිස්ස ස්ථවිර.
පේතවත්ථු:- කොටගම වාචිස්සර ස්ථවිර.
ථෙරගාථා:- යටිගම්මන විමලඤාණ ස්ථවිර.
ථෙරීගාථා:- අමුණුගම විපස්සි ස්ථවිර.
ජාතක:- මඩිහේ පඤ්ඤාසීහ ස්ථවිර.
චුල්ලනිද්දෙස:- අහුගොඩ සීලානන්ද ස්ථවිර.
මහානිද්දෙස:- ලබුගම ලඞ්කානන්ද ස්ථවිර.
පටිසම්භිදා:- මහාවග්ග - වලගෙදර සෝමාලෝක තිස්ස ස්ථවිර.
පටිසම්භිදා:- යුගනද්ධවග්ග - වැලිවිටියේ පුඤ්ඤසාර ස්ථවිර.
පටිසම්භිදා:- පඤ්ඤාවග්ග - දඹවින්නේ සුමනසාර ස්ථවිර.
අපදාන:- තලල්ලේ ධම්මානන්ද ස්ථවිර.
බුද්ධවංස:- බලපිටියේ විසුද්ධාලෝක ස්ථවිර.
චරියාපිටක:- බෙමිතර මංගල ස්ථවිර.
නෙත්ති:- පරවාහැර වජිරඤාණ ස්ථවිර.

Free Distribution www.aathaapi.org

## 2. විනයපිටක

පාරාජිකපාළි:- වේරගොඩ අමරමොලි ස්ථවිර.
පාචිත්තියපාළි:- ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිර.
මහාවග්ගපාළි:- අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිර.
චුල්ලවග්ගපාළි:- හාල්දඹුවන ධම්මරක්ඛිත ස්ථවිර.
පරිවාරපාළි:- කෙසෙල්වතුගොඩ රතනජෝති ස්ථවිර.

## 3. අභිධම්මපිටක

ධම්මසංගණී:- දෙවුන්දර ඤාණාවාස ස්ථවිර.
විභඞ්ග 1-9:- කටුකුරුන්දේ දෙවානන්ද ස්ථවිර.
විභඞ්ග 10- 18:- කඩවැද්දුව සිරිනිවාස ස්ථවිර.
ධාතුකථා:- නුවරඑළියේ සෙනානන්ද ස්ථවිර.
පුග්ගලපඤ්ඤත්ති:- අඹත්වැල්ලේ ධම්මානන්ද ස්ථවිර.
කථාවත්ථු:- කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිර.
යමක 1 - 5:- මැදඋයන්ගොඩ විමලකිත්ති ස්ථවිර.
යමක 9 - 10:- මිරිස්සේ ගුණසිරි ස්ථවිර.
පට්ඨාන:- බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර.

# ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකමණ්ඩලය

1. වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ (සභාපති),
2. පරවාහැර වජිරඤාණ ස්ථවිරයන් වහන්සේ (සම්පාදක),
3. කොසෙල්වතුගොඩ රතනජෝති නායක ස්ථවිරයන් වහන්සේ,
4. පොල්වත්තේ බුද්ධදත්ත නායක ස්ථවිරයන් වහන්සේ,
5. බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ,
6. හාල්දඹුවන ධම්මරක්ඛිත ස්ථවිරයන් වහන්සේ,
7. වැලිවිටියේ පුඤ්ඤසාර නායක ස්ථවිරයන් වහන්සේ,
8. අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ,
9. කඩවැද්දුව සිරිනිවාස නායක ස්ථවිරයන් වහන්සේ,
10. පලන්නොරුවේ විමලධම්ම නායක ස්ථවිරයන් වහන්සේ,
11. දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ,
12. වේරගොඩ අමරමෝලි නායක ස්ථවිරයන් වහන්සේ,
13. පරවාහැර පඤ්ඤානන්ද ස්ථවිරයන් වහන්සේ,
14. ගලගම සරණංකර ස්ථවිරයන් වහන්සේ,
15. හැගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ,
16. කටුකුරුන්දේ දේවානන්ද නායක ස්ථවිරයන් වහන්සේ,
17. ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
18. වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේ,
19. ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ,
20. මඩිහේ පඤ්ඤාසීහ නායක ස්ථවිරයන් වහන්සේ,
21. කොස්ගොඩ ධම්මවංස ස්ථවිරයන් වහන්සේ,
22. තලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ,
23. පුරාවිද්‍යාධිකාරී සෙනරත් පරණවිතාන මහතා,
24. මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා.

(පසුව පත්කරගන්නා ලද)

25. කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ,
26. අකුරටියේ අමරවංස නායක ස්ථවිරයන් වහන්සේ,
27. මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේ,
28. කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

## උත්තරීතරසංස්කාරකමණ්ඩලය

පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ,
ආචාර්ය පරවාහැර වජිරඤාණ ස්ථවිරයන් වහන්සේ,
බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ,
පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ.

Free Distribution www.aathaapi.org

# ලංකා බෞද්ධ මණ්ඩලයේ මධ්‍යවිධායක සභාව

**කාරකසභාවන්හි සභාපතිවරු:**

ගරු පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ, ගරු අඹන්වැල්ලේ සිරි ධම්මානන්ද අනුනායක ස්ථවිරයන් වහන්සේ, ගරු බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ, ගරු පණ්ඩිත කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ, ගරු ඒ. පී. බුද්ධදත්ත නායක ස්ථවිරයන් වහන්සේ, ගරු කළුකොඳයාවේ පඤ්ඤාසේඛර නායක ස්ථවිරයන් වහන්සේ, මහාචාර්ය ජී. පී. මලලසේකර මහතා, මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, පී. ද ඇස්. කුලරත්න මහතා, එච්. ඩබ්ලිව් අමරසූරිය මහතා, රාජා හේවාවිතාරණ මහතා, සෙනෙට් මන්ත්‍රී දෙස්තර ඒ. ඇම්. සමරසිංහ මහතා, සී. බී. නුගවෙල දිසාව, සෙනෙට් මන්ත්‍රී සිරිල් ද සොයිසා මහතා, ජේ. ඩී. ඒ. පෙරේරා මහතා, දෙස්තර ඒ. රත්නපාල මහතා, සෙනෙට් මන්ත්‍රී ජස්ටින් කොතලාවල මහතා.

**කාරකසභාවන්හි ලේකම්වරු:**

ගරු ආචාර්ය පරවාහැර වජිරඤාණ ස්ථවිරයන් වහන්සේ, ගරු යක්කඩුවේ පඤ්ඤාරාම ස්ථවිරයන් වහන්සේ, ගරු පණ්ඩිත මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේ, ගරු පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ, ගරු පණ්ඩිත කොස්ගොඩ ධම්මවංස ස්ථවිරයන් වහන්සේ, ගරු පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ, ඩී. ටී. දෙවෙන්ද්‍ර මහතා, පී. බී. සන්නස්ගල මහතා, ඩී. ජේ. කුමාරගේ මහතා, පී. සී. පෙරේරා මහතා, එච්. ඇල්. කල්දේරා මහතා, ඩී. පී. ජයසේකර මහතා, ඩබ්ලිව්. ගොපල්ලාව මහතා, දයා හේවාවිතාරණ මහතා, ඩබ්ලිව්. පී. දළුවත්ත මහතා, ආර්. ප්‍රේමදාස මහතා, ඩී. එන්. ඩබ්ලිව්. ද සිල්වා මහතා.

**සඞ්ඝසභාවෙහි ලේඛක:**

ගරු යටිගම්මන විමලඤාණ නායක ස්ථවිරයන් වහන්සේ.

**ගිහි සභාවෙහි ලේකම්:**

ඩී. බී. ඇල්ලේපොල මහතා.

**අග්‍රාමාත්‍යතුමන් විසින් පත්කළ සාමාජිකයෝ:**

ගරු ඒ. රත්නායක ඇමතිතුමා, ගරු ජේ. ආර්. ජයවර්ධන ඇමතිතුමා, ගරු ඇම්. ඩී. බණ්ඩා ඇමතිතුමා, ගරු ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ඇමතිතුමා, ඩඩ්ලි සේනානායක මහතා, ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා, එච්. එච්. බස්නායක මහතා, බී. ඇප්. පෙරේරා මහතා.

**ප්‍රධාන ලේකම්:**

ඒ. ඩබ්ලිව්. පී. ගුරුගේ මහතා.

# CORRIGENDA

TO THE ENGLISH NOTES

**Page**

xi -- (N. 1) *For* Archeolcgica *read* Archaeological.

xi -- (N. 1) *For* Beal's Records of the Western World *read* Beal's Buddhist Records of the Western World.

xxi — (N. 2) *For* Beal's Record of Western World *read* Beal's Buddhist Records of the Western World.

xxvii — (N. 2) *For* yong *read* young.

xxviii — (N. 4) *For* Thathagatha *read* Tathāgata.

xxix — (N. 5) *For* the earliar *read* the earlier.

xxx — (N. 1) *For* alledged *read* alleged.

xxx — (N. 3) *For* msst *read* must.

Liii — (N. 2) *For* Budda's death *read* Buddha's death.

Lvi — (N. 4) *For* Monatic *read* Monastic.

# සඞ්කේතනිරූපණං

# ABBREVIATIONS

| | | |
|---|---|---|
| අවි. | —— | 'අම්බලම්ගොඩ'-මහාවිහාර-තාලපණ්ණපොත්ථකං |
| ජවි. | —— | 'හික්කඩු'-ජනනන්දාරාම විහාර-තාලපණ්ණපොත්ථකං |
| තොවි. | —— | 'තොටගමු'-මහාවිහාර-තාලපණ්ණපොත්ථකං |
| මනුප. | —— | 'මහනුවර-පත්තිරිප්පු'පොත්ථකාලය-තාලපණ්ණ පොත්ථකං |
| මජසං. | —— | මරම්මඡට්ඨසංගීතිපිටක-පොත්ථකං |
| සි. | —— | ස්‍යාමක්ඛර-පොත්ථකං |
| සීමු. | —— | සීහලක්ඛර-මුද්දිත පොත්ථකං |
| PTS. | —— | Pali Text Society-Mahāvagga |

---

## ශුද්ධියක්

ප්‍රස්තාවනාවෙහි XXXI පිටුවෙහි 18 වන පෙළෙහි "සඳහන් වී තිබෙන බව" යනු "සඳහන් වී නැති බව" යයි ද, LXIV පිටුවෙහි 34 වන පෙළෙහි "පිළිපැදීමෙනි" යනු "පිළිපැදීමයි" කියා ද විය යුතුයි.

පොතේ සම්පූර්ණ ශුද්ධිපත්‍රය දෙවෙනි භාගයෙහි අග පළ වේ.

Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ ē  ඔ ō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya  ර ra  ල la  ව va  ස sa  හ ha  ළ ḷa  අං aṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කක kka | ඤ්ඤ ñña | ත්ව tva, ත්‍ර tra | ම්ඵ mpha |
| කඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ම්‍බ mba |
| ක්‍ය kya | ඤ්ච, ඤ්‍ච ñca | ද්ධ, ද්‍ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ඤ්‍ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඤ්‍ජ ñja | ද්ව, ද්‍ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ගග gga | ට්ඨ, ට්‍ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ගඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ග්‍ර gra, ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ඞ්ඛ ṅkha | ණ්ණ ṇṇa | න්න nna, න්හ nha | ව්හ wha |
| ඞ්ග ṅga | ණ්ට ṇṭa | ප්ප ppa | ස්ස ssa |
| ඞ්ඝ ṅgha | ණ්ඨ ṇṭha | ප්ඵ ppha | ස්ම sma |
| චච cca | ණ්ඩ, ණ්‍ඩ ṇḍa | බ්බ bba | ස්ව swa |
| චඡ ccha | ණ්හ ṇha | බ්භ bbha | හ්ම hma |
| ජජ jja | ත්ත tta | බ්‍ර bra | හ්ව hva |
| ජඣ jjha | ත්ථ ttha | ම්ප mpa | ළ්හ ḷha |

ා ā  ි i  ී ī  ු ු u  ූ ූ ū  ෙ ē  ො ō

Free Distribution www.aathaapi.org

විනයපිටකෙ

# මහාවග්ගපාලියා

පඨමො භාගො

# විනයපිටකෙ

# මහාවග්ගපාළියා

## පඨමො භාගො

---

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

---

## මහාක්ඛන්ධකං

---

1. තෙන[1] සමයෙන බුද්ධො භගවා **උරුවෙලායං** විහරති නජ්ජා **නෙරඤ්ජරාය** තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො.

2. අථ ඛො භගවා බොධිරුක්ඛමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී.[2]

3. අථ ඛො භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොමපටිලොමං මනසාකාසි:

4. අවිජ්ජාපච්චයා සඞ්ඛාරා; සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං; විඤ්ඤාණපච්චයා නාමරූපං; නාමරූපපච්චයා සළායතනං; සළායතනපච්චයා ඵස්සො; ඵස්සපච්චයා වෙදනා; වෙදනාපච්චයා තණ්හා; තණ්හාපච්චයා උපාදානං; උපාදානපච්චයා භවො; භවපච්චයා ජාති; ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

5. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො; සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො; විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො; නාමරූපනිරොධා සළායතනනිරොධො; සළායතනනිරොධා ඵස්සනිරොධො; ඵස්සනිරොධා වෙදනානිරොධො; වෙදනානිරොධා තණ්හානිරොධො; තණ්හානිරොධා උපාදානනිරොධො; උපාදානනිරොධා භවනිරොධො; භවනිරොධා ජාතිනිරොධො; ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

---

1. "තෙන ඛො පන සමයෙන"
2. "විමුත්තිසුඛං පටිසංවෙදී" ඉතිපි පාඨො

# විනයපිටකයෙහි

# මහාවග්ග

## ප්‍රථම භාගය

—:—

## ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

---

# මහාඛන්ධකය

---

1. එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **උරුවෙල්** දනව්වෙහි **නෙරඤ්ජරා** ගංඉවුර සමීපයෙහි වූ බෝරුක්මුල්හි අභිසම්බෝධියට පැමිණ ප්‍රථමයෙන් (=බුදු ව පළමු වර) වැඩ වාසය කරණ සේක.

2. එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බෝරුක්මුල්හි සත්දවසක් මුළුල්ලෙහි විමුක්තිසුඛය (=පලසමවත් සුව) විඳින සේක් එක ම පයඹීඩකයෙන් වැඩහුන් සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ පෙරයම මුළුල්ලෙහි ප්‍රතීත්‍ය-සමුත්පාදය අනුලෝමප්‍රතිලෝමවශයෙන් (=මුල සිට අගටත් අග සිට මුලටත්) මෙනෙහි කළ සේක.

4 අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥනය වේ. විඥනප්‍රත්‍යයයෙන් නාමය ද රූපය ද නාමරූපය ද* වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ. ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ. ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනාව වේ. වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදනය වේ. උපාදනප්‍රත්‍යයයෙන් භවය වේ. භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෝ හටගණිත්. මෙසේ මේ හුදු දුක් රැසේ හටගැණීම වේ.

5. අවිද්‍යාවගේ ම අනවශෙෂ විරාග නම් වූ නිරොධයෙන් සංස්කාරනිරොධය වේ. සංස්කාරනිරොධයෙන් විඥනනිරොධය වේ. විඥනනිරොධයෙන් නාමරූපනිරොධය වේ. නාමරූපනිරොධයෙන් ෂඩායතනනිරොධය වේ. ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ. ස්පර්ශනිරොධයෙන් වෙදනා නිරොධය වේ. වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ. තෘෂ්ණා නිරොධයෙන් උපාදනනිරොධය වේ. උපාදනනිරොධයෙන් භවනිරොධය වේ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ. ජාතිනිරොධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරොධය වේ.

---

* උපග්‍රන්ථය බලනු.

Free Distribution www.aathaapi.org

6. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:–

"යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතුධම්ම"න්ති

7. අථ ඛො භගවා රත්තියා මජ්ඣිමං යාමං පටිච්චසමුප්පාදං අනුලොමපටිලොමං මනසාකාසි: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා; සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං; විඤ්ඤාණපච්චයා නාමරූපං; නාමරූපපච්චයා සළායතනං –පෙ– එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති –පෙ– නිරොධො හොතීති.

8. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:–

"යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො ඛයං පච්චයානං අවෙදී"ති

9. අථ ඛො භගවා රත්තියා පච්ඡිමං යාමං පටිච්චසමුප්පාදං අනුලොමපටිලොමං මනසාකාසි: අවිජ්ජාපච්චයා සඞ්ඛාරා; සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං; විඤ්ඤාණපච්චයා නාමරූපං; නාමරූපපච්චයා සළායතනං –පෙ– එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති –පෙ– නිරොධො හොතීති.

10. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:–

"යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
විධූපයං තිට්ඨති මාරසෙනං
සුරියො'ව ඔභාසයමන්තලික්ඛ"න්ති

**බොධිකථා නිට්ඨිතා.**

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන එවේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක:-

"යම් කලෙක කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුත් ධ්‍යාන කරන්නා වූ බැහැර කළ පව් ඇති රහතුන් වහන්සේට හෙතුප්‍රත්‍යයධර්මයෝ ප්‍රකට ව වැටහෙත් ද, එකල්හි උන්වහන්සේ අවිද්‍යාදිහෙතුවෙන් සහෙතුක වූ ධර්මය දනිති. එයෙයින් ඒ රහතුන් වහන්සේගේ සියලු සැක දුරු වේ."

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාත්‍රියෙහි මධ්‍යමයාමය මුළුල්ලෙහි ප්‍රතීත්‍යසමුත්පාදය අනුලෝමප්‍රතිලෝමවශයෙන් මෙනෙහි කළ සේක: අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූපය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ. -පෙ- [1]මෙසේ මේ හුදු දුක් රැසේ හටගැණීම වේ -පෙ-[1] නිරෝධය වේ.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන එවේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක:-

"යම් කලෙක්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තා වූ ධ්‍යාන කරන්නා වූ බැහැර කළ පව් ඇති රහතුන් වහන්සේට හෙතුප්‍රත්‍යයධර්මයෝ ප්‍රකට ව වැටහෙත් ද, එකල්හි අවිද්‍යාදිප්‍රත්‍යයයන්ගේ ක්ෂය වීම දැනගත් හෙයින් ඒ රහතුන් වහන්සේගේ සියලු සැකයෝ දුරු වෙත්."

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පැසුළුයම මුළුල්ලෙහි ප්‍රතීත්‍ය-සමුත්පාදය අනුලෝමප්‍රතිලෝමවශයෙන් මෙනෙහි කළ සේක: අවිද්‍යා-ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥානප්‍රත්‍යයයෙන් නාමරූපය වේ. නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතනය වේ. -පෙ-[1] මෙසේ මේ හුදු දුක් රැසේ හටගැණීම වේ -පෙ-[1] නිරෝධය වේ.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන එවේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක:-

"යම් කලෙක්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තා වූ ධ්‍යාන කරන්නා වූ බැහැර කළ පව් ඇති රහතුන් වහන්සේට හෙතුප්‍රත්‍යයධර්මයෝ ප්‍රකට ව වැටහෙත් ද, එකල්හි ඒ රහතුන් වහන්සේ මරසෙනඟ පිඹ හරිමින් අහස බබුළුවන්නා වූ හිරු මෙන්, සිටින සේක."

**බොධිකථාව නිමි.**

---

1. 4-5 ඡේද බැලිය යුතුයි.

Free Distribution www.aathaapi.org

1. අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා බොධිරුක්ඛමූලා යෙන **අජපාලනිග්‍රොධො,** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා අජපාලනිග්‍රොධමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී.

2. අථ ඛො අඤ්ඤතරො **හුහුඞ්කජාතිකො**[1] බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරානීයං[2] වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "කිත්තාවතා නු ඛො භො ගොතම, බ්‍රාහ්මණො හොති? කතමෙ ච පන බ්‍රාහ්මණකරණා[3] ධම්මා?"ති

3. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:–

"යො බ්‍රාහ්මණො බාහිතපාපධම්මො
නිහුහුඞ්කො නික්කසාවො යතත්තො,
වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො
ධම්මෙන සො බ්‍රහ්මවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ"ති.

**අජපාලකථා නිට්ඨිතා.**

---

1. අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා අජපාලනිග්‍රොධමූලා යෙන **මුචලින්දො,** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මුචලින්දමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී.

2. තෙන ඛො පන සමයෙන මහා අකාලමෙඝො උදපාදි; සත්තාහවද්දලිකා සීතවාතදුද්දිනී.

3. අථ ඛො මුචලින්දො නාගරාජා සකභවනා නික්ඛමිත්වා භගවතො කායං සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා උපරි මුද්ධනි මහන්තං ඵණං කරිත්වා අට්ඨාසි: "මා භගවන්තං සීතං, මා භගවන්තං උණ්හං, මා භගවන්තං ඩංසමකසවාතාතපසිරිංසප[4]සම්ඵස්සො"ති.

4. අථ ඛො මුචලින්දො නාගරාජා සත්තාහස්ස අච්චයෙන විද්ධං විගතවලාහකං දෙවං විදිත්වා භගවතො කායා භොගෙ විනිවෙඨෙත්වා සකවණ්ණං පටිසංහරිත්වා මාණවකවණ්ණං අභිනිම්මිනිත්වා භගවතො පුරතො අට්ඨාසි පඤ්ජලිකො භගවන්තං නමස්සමානො.

5. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:–

---

1. හුහුඞ්කජාතිකො - තො. වි; ම. නු. ප; හුංහුඞ්කජාතිකො - ම ඡ. සං.
2. සාරණීයං - ම. ඡ. සං; සාරඤ්ජනීයාම් - සංඝකෘත.
3. බ්‍රාහ්මණකාරකා - ම. ඡ. සං; 4. සරීසප - ම ඡ. සං

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සත් දවසක් ඇවෑමෙන් ඒ පලසමවතින් නැගිට බෝරුක්මුලින් නික්ම **අජපල්නුගරුක** වෙතට වැඩි සේක. වැඩ අජපල්නුගරුක්මුල්හි සත් දවසක් මුළුල්ලෙහි පලසමවත් සුව විඳින සේක් එක ම පයඹකයෙන් වැඩ හුන් සේක.

2. ඉක්බිති (මාන වශයෙන්) ''හුම්! හුම්!' ය යි ශබ්ද කරණ ස්වභාවය* ඇති එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට පැමිණියේ ය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූයේ ය. සතුටු විය යුතු වූ සිත් ඇලවිය යුතු වූ කතා කොට නිමවා එකත්පසෙක සිටියා වූ ඒ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කෙළේ ය: ''පින්වත් ගෞතමයන් වහන්ස, කොපමණකින් බමුණෙක් වේ ද ? බමුණකු කරන්නාවූ ධර්මයෝ කවරහු ද ?''

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය දැන එ වේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළ සේක:–

''පව් බැහැර කළ, හුහුංකාරයන්ගේ පහ කිරීමෙන් හුහුංකාර (මාන) රහිත වූ රාගාදිකසට නැත්තා වූ සංසුන් සිත් ඇත්තා වූ චතුර්විධමාර්ගඥාන නම් වෙදයෙහි කෙළවරට පැමිණියා වූ වැස නිමවූ මාර්ගබ්‍රහමචර්‍ය්‍යය ඇති යම් ක්ෂීණාශ්‍රවබ්‍රාහමණයෙක් වේ ද, යමකුට ලොකයෙහි කිසි තැනක රාගාදි උත්සදයෝ* නැත්තාහු ද, ඒ පුද්ගලතෙමේ 'මම බ්‍රාහමණ වෙමි' යි ධර්මයෙන් (=නිවැරදි ලෙස) කියන්නේ ය.''

**අජපාලකථාව නිමි.**

---

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සත් දවසක් ඇවෑමෙන් ඒ පලසමවතින් නැගිට අජපල් නුගරුක්මුලින් **මිදෙල්ල**රුක වෙතට වැඩි සේක. වැඩ, මිදෙල්ලරුක්මුල්හි සත් දවසක් මුළුල්ලෙහි පලසමවත්සුව විඳින සේක් එක ම පයඹකයෙන් වැඩ හුන්සේක.

2. එකල්හි මහත් වූ නොකල්වැස්සෙක් පහළ වී ය. සීතසුළං වලාවෙන් වැලලි වූ හද්දුවැස්සෙකි.

3. ඉක්බිති **මුචලින්‍දනාරජ** තෙමේ සවකීයභවනයෙන් නික්ම භාග්‍යවතුන් වහන්සේගේ සිරුර සත්වරක් දරණවැලින් හාත්පසින් වට කොට ''ශීතය භාග්‍යවතුන් වහන්සේ නො පෙළාවා. උෂ්ණය භාග්‍යවතුන් වහන්සේ නො පෙළාවා. ඩැහැ ලේ බොන මැසි මදුරු සුළං අවු සර්ප යන මොවුන්ගේ ස්පර්ශය භාග්‍යවතුන් වහන්සේ නො පෙළාවා'' යි හිස මුදුනෙහි මහත් පෙණයක් කොට සිටියේ ය.

4. ඉක්බිති මුචලින්‍දනාරජතෙමේ සත්දවසක් ඇවෑමෙන් පහ වූ වලාපටල ඇති පැහැදිලි අහස (ඇති බව) දැන භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙන් දරණවෙළුම් හැර සියවේෂය අතුරුදහන් කොට තරුණ මිනිස් වෙසක් මවා ගෙණ බුදුරජුන් ගේ ඉදිරියෙහි ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේ වඳිමින් සිටියේ ය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන එ වේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කළසේක:

---

* උපග්‍රන්ථය බලනු.

"සුඛො විවෙකො තුට්ඨස්ස සුතධම්මස්ස පස්සතො,
අබ්‍යාපජ්ජං[1] සුඛං ලොකෙ පාණභූතෙසු සංයමො.

සුඛා විරාගතා ලොකෙ කාමානං සමතික්කමො,
අස්මිමානස්ස යො විනයො එතං වෙ පරමං සුඛ''න්ති

**මුචලින්දකථා නිට්ඨිතා.**

---

1. අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා මුචලින්දමූලා යෙන **රාජායතනං**, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජායතනමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී.

2. තෙන ඛො පන සමයෙන **තපස්සුභල්ලිකා**[2] වාණිජා **උක්කලා** තං දෙසං අද්ධානමග්ගපටිපන්නා හොන්ති. අථ ඛො තපස්සුභල්ලිකානං වාණිජානං ඤාතිසාලොහිතා දෙවතා තපස්සුභල්ලිකෙ වාණිජෙ එතදවොච:

"අයං මාරිසා, භගවා රාජයතනමූලෙ විහරති පඨමාභිසම්බුද්ධො. ගච්ඡථ තං භගවන්තං මන්ථෙන ච මධුපිණ්ඩිකාය ච පතිමානෙථ. තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛායා''ති.

3. අථ ඛො තපස්සුභල්ලිකා වාණිජා මන්ථඤ්ච මධුපිණ්ඩිකඤ්ච ආදාය යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තපස්සුභල්ලිකා වාණිජා භගවන්තං එතදවොචුං: "පතිගණ්හාතු නො භන්තෙ, භගවා මන්ථඤ්ච මධුපිණ්ඩිකඤ්ච යං අම්හාකං අස්ස දීඝරත්තං හිතාය සුඛායා''ති.

4. අථ ඛො භගවතො එතදහොසි: "න ඛො තථාගතා හත්ථෙසු පතිගණ්හන්ති. කිම්හි නු ඛො අහං පතිගණ්හෙය්‍යං මන්ථඤ්ච මධුපිණ්ඩිකඤ්චාති. අථ ඛො **චත්තාරො මහාරාජා** භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය චතුද්දිසා චත්තාරො සෙලමයෙ පත්තෙ භගවතො උපනාමෙසුං– "ඉධ භන්තෙ, භගවා පතිගණ්හාතු මන්ථඤ්ච මධුපිණ්ඩිකඤ්චා''ති. පටිග්ගහෙසි භගවා පච්චග්ඝෙ සෙලමයෙ පත්තෙ මන්ථඤ්ච මධුපිණ්ඩිකඤ්ච. පටිග්ගහෙත්වා ච[3] පරිභුඤ්ජි.

5. අථ ඛො තපස්සුභල්ලිකා වාණිජා භගවන්තං[4] එතදවොචුං: "එතෙ මයං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච. උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙ''ති[5]. තෙ ච ලොකෙ පඨමං උපාසකා අහෙසුං ද්වෙවාචිකා.

**රාජායතනකථා නිට්ඨිතා.**

---

1. "අබ්‍යාපජ්ඣන්ති'' සබ්බත්ථ. 2. තපස්සුභල්ලඞ්කා – ම. නු. ප; තපුස්සභල්ලූකා – තො. වි. තපුස්සභල්ලිකා – ම. ජ. සං 3. පටිග්ගහෙත්වා – ම. ජ. සං.
4. ඔනීත පත්තපාණිං විදිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං – ජ. ම. සං
5. සරණඞ්ගතෙති – ම. නු. ප.

Free Distribution www.aathaapi.org

"නිවණ නම් වූ උපධිවිවෙකය සැප වේ. චතුර්මාර්ගඥානසන්තොෂයෙන් යුත්, ප්‍රකට වූ දහම් ඇති, ඒ උපධිවිවේකය නුවණ නැමැති ඇසින් දක්නහුට නො කිපීම සැප වේ. ලෙව්හි සතුන් කෙරෙහි හිංසා නො කිරීම සැප වේ.

"ලොකයෙහි නො ඇලීම - වස්තුකාමකෙලශකාමයන්ගේ ඉක්මවීම සැප වේ. අස්මිමානයාගේ යම් වැනසීමෙක් වේ ද මෙය ඒකාන්තයෙන් උතුම් වූ සැපය වේ."

## මුචලින්ද කථාව නිමි.

---

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සත්දවසක් ඇවෑමෙන් ඒ පලසමවතින් නැගිට මුචලින්දරුක්මුලින් **කිරිපලුරුක** වෙතට වැඩි සේක. වැඩ කිරිපලුරුක්මුල්හි සත්දවසක් මුළුල්ලෙහි පලසමවත්සුව විඳින සේක් එක ම පර්‍ය්‍යඞ්කයෙන් වැඩ හුන් සේක.

2. එකල්හි **ත්‍රපුෂ්‍ය - භල්ලික*** වෙළඳදෙබෑයෝ **උක්කලා** ජනපදයෙන් ඒ දෙශයට යනු පිණිස දීර්ඝමාර්ගයට පිළිපන්නාහු වෙත්. එකල්හි ත්‍රපුෂ-භල්ලික [1] වෙළෙඳුන්ගේ සහලේනෑ වූ දේවතාවෙක් ත්‍රපුෂ්‍ය-භල්ලික වෙළෙඳුන්ට මෙය කී ය:-

"නිදුකානෙනි, මේ භාග්‍යවතුන් වහන්සේ අභිසම්බොධියට පැමිණි අළුත ම කිරිපලුරුක්මුල්හි වැඩ වසන සේක. යවු; ඒ භාග්‍යවතුන් වහන්සේ අත්සුණුයෙන් ද මීපිඬුයෙන් ද පුදවූ. ඒ පිදීම තොපට බොහෝ කලක් මුළුල්ලෙහි හිත පිණිස ද සැප පිණිස ද වන්නේ ය".

3. ඉක්බිති ත්‍රපුෂ්‍ය-භල්ලික වෙළෙන්දෝ අත්සුණු ද මීපිඬු ද ගෙණ භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් තැනට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක සිටියාහු ය. එකත්පසෙක සිටියා වූ ත්‍රපුෂ්‍ය-භල්ලික [1] වෙළෙන්දෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අපගේ අත්සුණු හා මීපිඬුත් පිළිගන්නා සේක්වා; ඒ පිළිගැණීම අපට බොහෝ කලක් හිත සැප පිණිස වන්නේ ය" යි සැළ කළහ.

4. එකල්හි භාග්‍යවතුන් වහන්සේට "තථාගතයෝ අතින් නො පිළිගණිති. මම වනාහි කුමකින් අත්සුණුත් මීපිඬුත් පිළිගන්නෙම් දැ"යි සිතෙක් වූයේ ය. එකල්හි **සතරවරම්මහරජහු** තම සිතින් භාග්‍යවතුන් වහන්සේගේ සිත දැන සිවුදිගින් අවුත් "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙයින් අත්සුණුත් මීපිඬුත් පිළිගන්නා සේක්වා"යි ශෛලමය පාත්‍ර සතරක් භාග්‍යවතුන් වහන්සේ අතට එළවූහ. භාග්‍යවතුන් වහන්සේ එකෙණෙහි උපන් අළුත් මාහැඟි ශෛලමය වූ පාත්‍රයෙන් අත්සුණු ද මීපිඬු ද පිළිගත් සේක. පිළිගෙණ වැළඳූ සේක.

5. ඉක්බිති ත්‍රපුෂ්‍ය-භල්ලික වෙළෙන්දෝ "ස්වාමීනි, මේ අපි භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද සරණ යමු, භාග්‍යවතුන් වහන්සේ අප අද පටන් දිවි හිම් කොට සරණ ගියා වූ උපාසකයනැයි දරණ සේක්වා" යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළෝ ය. ඔහු දෙදෙන ද පළමු කොට ලොකයෙහි ද්වෙවාචික (='බුද්ධ, ධම්ම' යන වචන දෙකින් සරණ ගියා වූ) උපාසකයෝ වූහ.

## රාජායතනකථාව නිමි.

---

i. ත්‍රපුෂ්‍යකොර් වචල්ලිකොර් - E. Z. iv. 317. * උපග්‍රන්ථය බලනු.

1. අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා රාජායතනමූලා යෙන **අජපාල**නිග්‍රොධො, තෙනුපසඞ්කමි. තත්‍ර සුදං භගවා අජපාලනිග්‍රොධමූලෙ විහරති.

2. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: “අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයරාමා ඛො පනා'යං පජා ආලයසම්මුදිතා. ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං – යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො. ඉදම්පි ඛො ඨානං සුදුද්දසං – යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අහඤ්චෙව[1] ඛො පන ධම්මං දෙසෙය්‍යං, පරෙ ච මෙ න ආජානෙය්‍යුං, සො මම'ස්ස **කිලමථො** සා මම'ස්ස විහෙසා”ති.

3. අපිස්සු භගවන්තං ඉමා අනච්ඡරියා ගාථායො පටිභංසු පුබ්බෙ අස්සුතපුබ්බා:

“කිච්ඡෙන මෙ අධිගතං හලං දානි පකාසිතුං,
රාගදොසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො.

පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං,
රාගරත්තා න දක්ඛින්ති[2] තමොක්ඛන්ධෙන ආවටා”ති[3]

4. ඉතිහ භගවතො පටිසඤ්චික්ඛතො අප්පොස්සුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනාය. අථ ඛො බ්‍රහ්මුනො **සහම්පතිස්ස** භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය එතදහොසි: “නස්සති වත භො, ලොකො; විනස්සති වත භො, ලොකො; යත්‍ර හි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනායා”ති.

5. අථ ඛො බ්‍රහ්මා **සහම්පති** සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි. අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජාණුමණ්ඩලං[4] පුථුවියං[5] නිහන්ත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: “දෙසෙතු භන්තෙ, භගවා ධම්මං. දෙසෙතු සුගතො ධම්මං. සන්ති[6] සත්තා අප්පරජක්ඛජාතිකා. අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො”ති. ඉදමවොච බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වාන[7] අථාපරං එතදවොච:–

1. “අහමෙව” තො, වි; ම, නු, ප.
2. “දක්ඛන්ති” ම, ජ, සං.
3. “ආවුටා” ම, ජ, සං.
4. “දක්ඛිණජාණුමණ්ඩලං” ම, ජ, සං
5. “පථවියං” ම, ජ, සං.
6. සන්තීධ සත්තා” අ, වි, ජ, පු.
7. “වත්වා” තො, වි, අ, වි.

Free Distribution www.aathaapi.org

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සත්දවසක් ඇවෑමෙන් ඒ පලසමවතින් නැඟිට කිරිපලුරුක්මුලින් නික්ම අජපල්නුගරුක්මුලට වැඩි සේක. එහි භාග්‍යවතුන් වහන්සේ අජපල්නුගරුක්මුල්හි වැඩවසන සේක.

2. එකල්හි හුදකලා වූ, පලසමවතින් යුක්ත වූ, භාග්‍යවතුන් වහන්සේට මෙබඳු කල්පනාවෙක් පහළ වි ය:– "මා විසින් අවබොධ කළ මේ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය ගැඹුරු ය. දැකීමට දුෂ්කර ය. අවබොධයට දුෂ්කර ය. ශාන්ත ය. ප්‍රණීත ය. තර්කයෙන් නො දත හැකි ය. සියුම් ය. පණ්ඩිතයන් විසින් ම දත යුතු ය. මේ ප්‍රජා තොමෝ පඤ්චකාමගුණයෙහි සතුටු වූවා ය. පඤ්චකාමගුණයෙහි ඇලුනී ය. පඤ්චකාමගුණයෙහි දැඩි සේ මුදිත ය. පස්කම්ගුණයෙහි සතුටු වූ පස්කම්ගුණයෙහි ඇලුනා වූ පස්කම් ගුණයෙහි දැඩි සේ සතුටු වූ ප්‍රජාව විසින් යම් මේ (එකිනෙක ප්‍රත්‍යය හා ප්‍රත්‍යයසමුත්පන්න වන ආකාර ඇති) අවිද්‍යාදි ප්‍රත්‍යය සමූහය වූ ප්‍රතීත්‍යසමුත්පාදයෙක් වේ ද, මෙය දැකීම දුෂ්කර ය. යම් මේ සකලසංස්කාරයන්ගේ සංසිඳීමෙක් වේ ද, සකලඋපධීන්ගේ බැහැර ලීමෙක් වේ ද, තෘෂ්ණාවගේ ක්ෂය වීමෙක් වේ ද, නො ඇල්මෙක් වේ ද, සකල දුඃඛනිරොධයෙක් වේ ද, නිර්වාණයෙක් වේ ද, (යත) මෙය ද දැකීම ඉතා දුෂ්කර ය. ඉදින් මම දහම් දෙසන්නෙම් නම්, අන්‍යයෝ මාගේ දහම් දත නො ගන්නාහු නම්, එය මට ක්ලාන්තියෙක් වන්නේ ය; ඒ මට වෙහෙසෙක් ම වන්නේ" යි.

3. වැලිදු භාග්‍යවතුන් වහන්සේට පෙර නො ඇසූවිරූ නැවත නැවත විස්මයකර වූ මේ ගාථාවෝ ද වැටහුනහ:–

"මා විසින් දුක සේ අවබොධ කළ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය දැන් ප්‍රකාශ කිරීමෙන් වැඩෙක් නැත්තේ ය. රාගද්වෙෂයන්ගෙන් පෙළුනවුන් විසින් මේ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය තෙමේ අවබොධ කට හැක්කේ නො වේ.

"උඩුහෝ (නිවන්) කරා යන්නා වූ නිපුණ වූ ගැඹුරු වූ දුක සේ දැක්ක යුතු වූ සියුම් වූ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය රාගයෙන් රත් වූ අවිද්‍යාස්කන්ධයෙන් වැසුනා වූ සත්ත්වයෝ නො දක්නාහු ය".

4. මෙසේ සලකන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ සිත මන්‍දෞත්සුක්‍යභාවයට නැමේ. දහම් දෙසීම පිණිස නො නැමේ.* එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ අදහස දත් සහම්පතිබ්‍රහ්මයාහට මෙ බඳු සිතෙක් වී ය. යම් ලොකයක රහත් වූ සම්මාසම්බුදු වූ තථාගතයන් වහන්සේගේ සිත මන්‍දෞත්සුක්‍යභාවයට නැමේ ද, දහම් දෙසනු පිණිස නො නැමේ ද, භවත්නි, ඒ ලොකය නැසේ. භවත්නි, ඒ ලොකය වැනසේ"යි කියායි.

5. ඉක්බිති සහම්පතිබ්‍රහ්මතෙමේ බලවත් පුරුෂයෙක් හැකිළූ අත යම් සේ දිගු කරන්නේ ද, දිගු කළ අත යම් සේ හකුළන්නේ ද, එපරිද්දෙන් (වහා) බ්‍රහ්මලොකයෙහි අතුරුදහන් වූයේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූයේ ය. ඉක්බිති සහම්පතිබ්‍රහ්මතෙමේ උතුරුසළුව එකස් කොට දකුණු දණමඬල පොළොවෙහි ඇන භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳ මෙය සැළ කෙළේ ය:– "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. ස්වල්ප වූ රාගාදි රජස් ඇති සත්ත්වයෝ වෙති. (ඔහු) දහම් නො ඇසීමෙන් පිරිහෙත්. දහම් දැනගන්නෝ (ලොකයෙහි) ඇත්තාහ" කියා යි. නැවත මේ ගාථා ද කීයේ ය:

* උපග්‍රන්ථය බලනු

"පාතුරහොසි මගධෙසු පුබ්බෙ
ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො,
අවාපුරෙතං අමතස්ස ද්වාරං
සුණන්තු ධම්මං විමලෙනානුබුද්ධං.

සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු,
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං.

උට්ඨෙහි වීර විජිතසඞ්ගාම සත්ථවාහ අනණ[1] විචර ලොකෙ,
දෙසස්සු භගවා ධම්මං අඤ්ඤාතාරො භවිස්සන්තී" ති[2]

6. අථ ඛො භගවා බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤතං පටිච්ච බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙසි. අද්දසා ඛො භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො[3] විහරන්තෙ.

7. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති[4] අනුපලිත්තානි උදකෙන; එවමෙව භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො[5] විහරන්තෙ. දිස්වාන බ්‍රහ්මානං සහම්පතිං ගාථාය පච්චභාසි:-

"අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං,
විහිංසසඤ්ඤී පගුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ"ති.

අථ ඛො බ්‍රහ්මා සහම්පති 'කතාවකාසො ඛො'ම්හි භගවතා ධම්මදෙසනායා'ති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

**බ්‍රහ්මායාචනකථා නිට්ඨිතා.**

---

1. "අණණ" ම, ජ, සං 2. ම, ජ, සං පොත්ථකෙ බ්‍රහ්මායාචනගාථා තික්ඛත්තුං ආගච්ඡන්ති. 3. "ඨිතානි" ම. ජ. සං; 4. "භයදස්සාවිනො" ම, ජ, සං ම. නු. ප; තො වි

"පෙර **මගධ**දනව්වෙහි රාගාදිකෙලෙස්මලින් යුක්ත වූවන්* විසින් සිතන ලද අපිරිසිදු වූ මිථ්‍යාදෘෂ්ටිධර්මයෙක් පහළ වූයේ ය. නිවන් දොරටුව වූ මේ ආර්‍ය්‍යමාර්ගය විවෘත කළ මැනවි. දුරු වූ රාගාදි කෙලෙස් මල ඇති බුදුන් විසින් අවබොධ කළ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය සත්ත්වයෝ අසත්වා.

"සමතැස් ඇති සුන්‍දර ප්‍රඥා ඇති භාග්‍යවතුන් වහන්ස, ශෛලමය පර්වතයක් මුදුනෙහි සිටි පුරුෂයෙක් හාත්පස ජනසමූහයා යම් සේ දකී ද, පහ වූ ශොක ඇති ඔබවහන්සේ ඒ ශෛලමයපර්වතය වැනි වූ ප්‍රඥාමය වූ පහයට නැඟී ශොකයට බැසගත් ජාතිජරායෙන් මැඩුනා වූ ජනසමූහයා බලා වදාරණසේක්වා.

"දිනූ මාරසඞ්ග්‍රාම ඇති සාර්ථවාහක වූ කාමච්ඡන්‍දාදි නය නැත්තා වූ වීරයන් වහන්ස, නැඟී සිටිනු මැනවි. ලොකයෙහි හැසිරෙණු මැනවි. භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනසේක්වා. දහම් අවබොධ කරන්නෝ වන්නාහ"යි.

6, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බ්‍රහමයාගේ ආරාධනාව දැන සත්ත්වයන් කෙරෙහි කරුණාව නිසා බුදුඇසින් ලොකය බලා වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් සත්ත්වලොකය බලාවදාරණ සේක්, අල්ප වූ රාගාදි රජස් ඇත්තා වූ ද මහත් වූ රජස් ඇත්තා වූ ද තියුණු වූ ශ්‍රද්ධාදිඉන්‍ද්‍රියයන් ඇත්තා වූ ද ශ්‍රද්ධාදීන්ගේ අඩු වැඩි ආකාර ඇත්තා වූ ද සුව සේත් දුක සේත් ධර්මාවබොධය කට හැක්කා වූ ද පරලොව වරද හා බිය දක්නාසුලු ව වසන්නා වූ ද ඇතැම් සත්ත්වයන් දුටු සේක.

7. යම් සේ උපුල්විලක හෝ පියුම්විලක හෝ හෙලපියුම්විලක හෝ දියෙහි හටගත්, දියෙහි මොනවට වැඩුනා වූ, දියෙන් මතු නො වූ, ඇතැම් උපුල්හු හෝ පියුම්හු හෝ හෙලපියුම්හු හෝ දිය තුළ ගැලී වැඩෙන්නාහු ද, දියෙහි හටගත් දියෙහි වැඩුනු ඇතැම් උපුල්හු හෝ පියුම්හු හෝ හෙලපියුම්හු හෝ දිය හා සම ව සිටිත් ද, දියෙහි හටගත් දියෙහි වැඩුනු ඇතැම් උපුල්හු හෝ පියුම්හු හෝ හෙලපියුම්හු හෝ දියෙන් උඩට නැඟී දිය හා නො තැවරී සිටිත් ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් සත්ත්වලොකය බලා වදාරණ සේක් අල්පරජසක වූ ද මහාරජසක වූ ද තියුණු වූ ත් මෘදු වූ ත් ශ්‍රද්ධාදිඉන්‍ද්‍රියයන් ඇත්තා වූ ද ශ්‍රද්ධාදීන්ගේ අඩු වැඩි ආකාර ඇත්තා වූ ද සුව සේත් දුක සේත් ධර්මාවබොධය කට හැක්කා වූ ද පරලොව වරද හා බිය දක්නා සුලු ව වසන්නා වූ ද ඇතැම් සත්ත්වයන් දුටු සේක. **දැක** සහම්පතිබ්‍රහමයාහට ගාථාවකින් මෙසේ වදාළසේක:-

"බ්‍රහමය, (නොදන්නවුන්ට දෙසීම කයට) වෙහෙස ය යන කල්පනා ඇත්තෙම් ප්‍රගුණ වූ උතුම් වූ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය මිනිසුන් අතර නො කීයෙමි. යම් කෙනෙක් කන් ඇත්තෝ වෙත් ද, ඔහු ශ්‍රද්ධාව මුදත්වා (හෙවත් ඉදිරිපත් කෙරෙත්වා): ඔවුන්ට (දැන්) නිර්වාණද්වාරයෝ (= ආර්‍ය්‍යමාර්ගයෝ) විවෘත කරණ ලදහ".

ඉක්බිති **සහම්පති**බ්‍රහම**තෙමේ "භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසනු පිණිස කළ අවකාශ ඇත්තෙම් වෙමි"යි භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් වූයේ ය.

**බ්‍රහමායාචනකථා නිමි.**

---

* උපග්‍රන්ථය බලනු.

1. අථ ඛො භගවතො එතදහොසි: "කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී?"ති. අථ ඛො භගවතො එතදහොසි: "අයං ඛො **ආළාරො කාලාමො** පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී දීඝරත්තං අප්පරජක්ඛජාතිකො. යන්නූනාහං ආළාරස්ස කාලාමස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං; සො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති. අථ ඛො අන්තරහිතා දෙවතා භගවතො ආරොචෙසි[1]: "සත්තාහකාලකතො[2] භන්තෙ, ආළාරෙ කාලාමො"ති. භගවතො'පි ඛො ඤාණං උදපාදි: "සත්තාහකාලකතො ආළාරො කාලාමො"ති. අථ ඛො භගවතො එතදහොසි: "මහාජානියො ඛො ආළාරො කාලාමො. සචෙ හි සො ඉමං ධම්මං සුණෙය්‍ය, ඛිප්පමෙව ආජානෙය්‍යා"ති.

2. අථ ඛො භගවතො එතදහොසි: "කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී?"ති. අථ ඛො භගවතො එතදහොසි: "අයං ඛො **උද්දකො[3] රාමපුත්තො** පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී දීඝරත්තං අප්පරජක්ඛජාතිකො. යන්නූනාහං උද්දකස්ස රාමපුත්තස්ස පඨමං ධම්මං දෙසෙය්‍යං; සො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී"ති. අථ ඛො අන්තරහිතා දෙවතා භගවතො ආරොචෙසි: "අභිදොසකාලකතො භන්තෙ, උද්දකො රාමපුත්තො"ති. භගවතො'පි ඛො ඤාණං උදපාදි: "අභිදොසකාලකතො උද්දකො රාමපුත්තො"ති. අථ ඛො භගවතො එතදහොසි: "මහාජානියො ඛො උද්දකො රාමපුත්තො. සචෙ හි සො ඉමං ධම්මං සුණෙය්‍ය, ඛිප්පමෙව ආජානෙය්‍යා"ති.

3. අථ ඛො භගවතො එතදහොසි: "කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතී?"ති. අථ ඛො භගවතො එතදහොසි: බහුකාරා[4] ඛො මෙ **පඤ්චවග්ගියා** භික්ඛූ, යෙ මං පධානපහිතත්තං[5] උපට්ඨහිංසු. යන්නූනාහං **පඤ්චවග්ගියානං** භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍යන්ති. අථ ඛො භගවතො එතදහොසි: කහන්නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තී?ති. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ **බාරාණසියං** විහරන්තෙ **ඉසිපතනෙ මිගදායෙ.** අථ ඛො භගවා **උරුවෙලායං** යථාභිරන්තං[6] විහරිත්වා යෙන **බාරාණසී,** තෙන චාරිකං පක්කාමි.

---

1 "දෙවතා ආරොචෙසි" ම. නු. ප; තො. වි; ජ. පු. 2. "සත්තාහං කාලකතො" ම. ඡ. සං; 3. "උදකො" ම. ඡ. සං; 4. "බහුපකාරා" ම. නු. ප; තො. වි; ජ. පු; අ. ම වි. 5. "පධානපහිතත්තා" ම. නු. ප.; තො. වි; ජ. පු. අ ම. වි. 6 "යථාභිරන්තං" ම. ඡ. සං.

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මම **කවරකුට** පළමු කොට දහම් දෙසන්නෙම් ද ? කවරෙක් මේ චතුරාර්‍ය්‍යසත්‍යධර්‍මය වහා ම අවබොධ කරන්නේ ද ?" යි මෙබඳු සිතෙක් වූයේ ය. **එකල්හි** භාග්‍යවතුන් වහන්සේට "**කාලාම**ගොත්‍රයෙහි වූ මේ **ආළාර**තවුස් තෙමේ පණ්ඩිත ය. ව්‍යක්ත ය. නුවණැත්තේ ය. බොහෝ කලක් මුළුල්ලෙහි අල්පරජස්ක වූයේ ය. මම කාලාමගොත්‍රයෙහි වූ ආළාරතවුසාහට පළමු කොට දහම් දෙසන්නෙම් නම් යෙහෙක. හෙතෙමේ වහා ම මේ ධර්‍මය දැනගන්නේ ය" යි මෙබඳු සිතෙක් වූයේ ය. එකල්හි අතුරුදහන් වූ (නො පෙණී සිටි) දෙවතාවෙක් භාග්‍යවතුන් වහන්සේහට "ස්වාමීනි, කාලාමගොත්‍රයෙහි වූ ආළාරතවුස් තෙමේ මින් සත් දවසකට පෙර කලුරිය කෙළේ ය" යි සැළකෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද **ආළාරකාලාම** තවුස් තෙමේ සත්දවසකට පෙර කලුරිය කෙළේ ය" යි සර්‍වඥතාඥානයෙන් දත් සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේහට ආළාරකාලාම තවුස්තෙමේ මහත් පිරිහීම් ඇත්තෙක. ඉදින් හෙතෙමේ මේ ධර්‍මය ඇසුයේ නම්, වහා ම දැන ගන්නේ ය" යි මෙබඳු සිතෙක් වූයේ ය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මම කවරකුහට පළමු කොට දහම් දෙසන්නෙම් ද ? කවරෙක් මේ ධර්‍මය වහා ම දැනගන්නේ ද ?" යි සිතෙක් වූයේ ය. **එකල්හි** භාග්‍යවතුන් වහන්සේහට "**රාමපුත්‍ර** වූ මේ **උද්දක** තවුස් තෙමේ පණ්ඩිත ය. ව්‍යක්ත ය. නුවණැත්තේ ය. බොහෝ කලක් මුළුල්ලෙහි අල්පරජස්ක වූයේ ය. මම උද්දකරාමපුත්‍රයාහට පළමු කොට දහම් දෙසන්නෙම් නම් යෙහෙක, හෙතෙමේ මේ ධර්‍මය වහා ම දැනගන්නේ ය" යි සිතෙක් උපන. ඉක්බිති මුවා ව සිටි දෙවතාවෙක් භාග්‍යවතුන් වහන්සේහට "ස්වාමීනි, රාමපුත්‍රවූ උද්දක තාවුස් තෙමේ රෑ මැදියම කලුරිය කෙළේ ය" යි සැළකළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද "**උද්දකරාමපුත්‍ර** තෙමේ රෑ මැදියම කලුරිය කෙළේ ය" යි සර්‍වඥතාඥානයෙන් දත් සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේහට උද්දකරාමපුත්‍ර තෙමේ මහත් පිරිහීම් ඇත්තෙක. ඉදින් හෙතෙමේ මේ ධර්‍මය ඇසුයේ නම්, වහා ම දැනගන්නේ ය" යි සිතෙක් උපන්නේ ය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේහට "මම කවරකුට පළමු කොට දහම් දෙසන්නෙම් ද ? කවරෙක් මේ ධර්‍මය වහා ම දැනගන්නේ ද ?" යි සිතෙක් විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේට "යම් කෙනෙක් (කෙලෙශ) ප්‍රදහනවීර්‍ය්‍යකරණයෙහි යෙදුණු සිත් ඇති මට උපස්ථාන කළාහු ද, ඒ **පස්වගමහණුහු** මට බොහෝ උපකාර ඇත්තෝ ම ය. මම් ඒ පස්වග මහණුන්හට පළමු කොට දහම් දෙසන්නෙම් නම් යෙහෙකැ" යි ද "මෙකල්හි පස්වග මහණුහු කොහැන්හි වෙසෙත් ද ?" යි ද සිත් විය. භාග්‍යවතුන් වහන්සේ පිරිසිදු වූ මිනිසැස ඉක්ම පවත්නා වූ දිවැසින් **බරණැස්**නුවර **මෘගදාය** නම් වූ **ඉසිපතනයෙහි** වසන්නා වූ පස්වගමහණුන් දුටු සේක. ඉක්බිති උන්වහන්සේ **උරුවෙල්**දනව්වෙහි කැමැති තාක් වාසය කොට **බරණැස්**නුවරට වඩිනු පිණිස චාරිකාවෙහි වැඩි සේක.

4. අද්දසා ඛො **උපකො** ආජීවකො[1] භගවන්තං අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගපටිපන්නං. දිස්වාන භගවන්තං එතදවොච: "විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්ද්‍රියානි. පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කං සි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසී?"ති. එවං වුත්තෙ භගවා උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසි:–

"සබ්බාභිභූ සබ්බවිදූ'හමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො,
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.

න මෙ ආචරියො අත්ථි සදිසො මෙ න විජ්ජති,
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො.

අහං හි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො,
එකො'ම්හි සම්මාසම්බුද්ධො සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං,
අන්ධභූතස්මිං ලොකස්මිං ආහඤ්ඡං[2] අමතදුන්දුභි"න්ති.

යථා ඛො ත්වං ආවුසො පටිජානාසි, අරහසි අනන්තජිනොති.

"මාදිසා වෙ ජිනා හොන්ති යෙ පත්තා ආසවක්ඛයං,
ජිතා මෙ පාපකා ධම්මා තස්මා'හං උපකා ජිනො"ති.

5. එවං වුත්තෙ උපකො ආජීවකො "හුවෙය්‍යපාවුසො"ති[3] වත්වා සීසං ඔකම්පෙත්වා උම්මග්ගං ගහෙත්වා පක්කාමි.

6. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන **බාරාණසී ඉසිපතනං මිගදායො,** යෙන **පඤ්චවග්ගියා** භික්ඛූ, තෙනුපසඞ්කමි. අද්දසංසු ඛො පඤ්චවග්ගියා භික්ඛූ භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන අඤ්ඤමඤ්ඤං සණ්ඨපෙසුං: "අයං ආවුසො සමණො **ගොතමො** ආගච්ඡති බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය. සො නෙව අභිවාදෙතබ්බො. න පච්චුට්ඨාතබ්බො. නාස්ස පත්තචීවරං පටිග්ගහෙතබ්බං. අපි ච ඛො ආසනං ඨපෙතබ්බං, සචෙ ආකඞ්ඛිස්සති, නිසීදිස්සතී"ති.

---

1. "ආජීවිකො" ම. ඡ. ස; ජ. පු; අ. ම. වි; 2. "ආහඤ්ඡිං", ආහඤ්ඤං ඉත්‍යපි
3. "හුවෙය්‍යාවුසො" - කත්ථචි.

4. **උපක**ආජීවක තෙමේ **ගයාවට** හා බොධිවෘක්‍ෂයට ද අතරෙහි වූ දීඝීමාගීයට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේහට මෙසේ කී ය: "ඇවැත්නි, නුඹවහන්සේගේ චක්‍ෂුරාදිඉන්‍ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ. සිරුරුපැහැය පිරිසිදු ය. අතිශයින් නිර්මල ය. ඇවැත්නි, තමුන්නාන්සේ කවරකු උදෙසා පැවිදි වූ සේක් ද? තමුන්නාන්සේගේ ශාස්තෘතෙමෙ කවරෙක් හෝ වේ ද? තමුන්නාන්සේ කවරකුගේ ධම්ය රුචි කරණ සේක් ද?"යි විචාළේ ය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ උපකආජීවකයාහට මේ ගාථාවන් වදාළ සේක:

"මම සියල්ල මැඩ සිටියෙමි. සියල්ල දන්නෙම් වෙමි. සියලු ධම්යන්හි නො ඇලුනෙමි. සියලු කෙලෙස් හැර සිටියෙමි. තෘෂ්ණාක්‍ෂයයෙහි නිමාවට ගියෙමි. (මෙසේ) තෙමේ ම සියල්ල දැන සිටි මම අන් කවරකු ආචායයී වශයෙන් උදෙසන්නෙම් ද?

"මට ලොකොත්තරධම්යෙහි ඇදුරෙක් නැත. මට සමානයෙක් විද්‍යමාන නො වේ. දෙවියන් සහිත ලොකයෙහි මාහට සම පුද්ගලයෙක් නැත.

"ලොකයෙහි මම ම රහත් වෙමි. මම ම නිරුත්තර වූ ශාස්තෘ වෙමි. මම ම සම්‍යක්සම්බුද්ධ වෙමි. (සියලු කෙලෙස්ගිනි නිවීමෙන්) සිහිල් වූයෙමි. එහෙයින් ම නිවුනෙමි.

"මම දම්සක් පැවැත්වීමට **කාසිරට බරණැස්** නුවර බලා යමි. අවිද්‍යාවෙන් අන්ධ වූ ලොකයෙහි අමාදහම්බෙරය ගසන්නෙමි."

ඇවැත්නි, තමුන්නාන්සේ යම් සේ පිළිණ කරණ සේක් ද, එසේ 'අනන්තජින' වීමට සුදුසු සේක.

"යම් කෙනෙක් කාමාදිආශ්‍රවයන් ක්‍ෂය කිරීමට පැමිණියෝ ද, මා වැනි ඔහු එකාන්තයෙන් 'ජින' නම් වෙති. **උපකය,** මා විසින් පාප ධම්යෝ දිනන ලදහ. එහෙයින් මම **'ජින'** නම් වෙමි."

5. මෙසේ වදාළ කල්හි **උපක** ආජීවක තෙමේ "ඇවැත්නි, එහෙමත් විය හැකි ය"යි හිස සලා කුඩාමගකට බැස **වඞ්ගහාර**ජනපදය බලා ගියේ ය.

6 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් සැරිසරා වඩිනා සේක් බරණැස්නුවර **ඉසිපතන** නම් වූ **මෘගදායයෙහි** පස්වගමහණුන් වෙත වැඩිසේක. **පස්වගමහණහු** වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටුවාහු ය. දැක, උන් උන් කතිකාවක් කළාහු ය: "ඇවැත්නි, මේ **ශ්‍රමණගෞතම** තෙමේ එයි. ප්‍රත්‍යය බහුල කොට ඇත්තේ, ප්‍රධන් වීයයී කිරීමෙන් පිරිහුනේ, ප්‍රත්‍යයයන්ගේ බහුලභාවයට පෙරළුනේ ය. ඒ ශ්‍රමණගෞතම තෙමේ නො ම වැඳිය යුත්තේ ය. උපස්ථාන නො කට යුතු ය. පාසිවුරු නො පිළිගත යුතු ය. එසේ නමුත් කැමැති නම් හිඳිනු පිණිස අසුනක් එළවිය යුතු ය."



Free Distribution www.aathaapi.org

7. යථා යථා ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ උපසඞ්කමති, තථා තථා තෙ පඤ්චවග්ගියා භික්ඛූ නාසක්ඛිංසු සකාය කතිකාය සණ්ඨාතුං. අසණ්ඨහන්තා භගවන්තං පච්චුග්ගන්ත්වා එකො භගවතො පත්තචීවරං පටිග්ගහෙසි. එකො ආසනං පඤ්ඤපෙසි. එකො පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා පාදෙ[1] පක්ඛාලෙසි. අපිස්සු භගවන්තං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්ති. එවං වුත්තෙ භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොච: "මා භික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරිත්ථ[2]. අරහං භික්ඛවෙ, තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ, සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

8. එවං වුත්තෙ පඤ්චවග්ගියා භික්ඛූ භගවන්තං එතදවොචුං: "තාය'පි ඛො ත්වං ආවුසො ගොතම, ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නෙවජ්ඣගා උත්තරිමනුස්සධම්මා[3] අලමරියඤාණදස්සනවිසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙස"න්ති. එවං වුත්තෙ භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොච: "න භික්ඛවෙ තථාගතො බාහුලිකො. න පධානවිබ්භන්තො. න ආවත්තො බාහුල්ලාය. අරහං භික්ඛවෙ, තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ, සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙ'ව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති. දුතියම්පි ඛො පඤ්චවග්ගියා භික්ඛූ භගවන්තං එතදවොචුං -පෙ- දුතියම්පි ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොච -පෙ- තතියම්පි ඛො පඤ්චවග්ගියා භික්ඛූ භගවන්තං එතදවොචුං: "තාය'පි ඛො ත්වං ආවුසො ගොතම තාය ඉරියාය තාය පටිපදාය තාය දුක්කරකාරිකාය නෙවජ්ඣගා උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං. කිම්පන ත්වං එතරහි බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය අධිගමිස්සසි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙස"න්ති.

1. "නිසජ්ජ පාදෙ" - ම. ඡු. ප; තො. වි. 2. "සමුදාචරථ" - ම. ඡ. සං.
3. "උත්තරිමනුස්සධම්මං" - ම. ඡ. සං; තො. වි.

Free Distribution www.aathaapi.org

7. භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන් වෙත එළඹෙත් එළඹෙත් ම පස්වගමහණහු සිය කතිකාවෙහි සිටින්නට නො හැකි වූහ. නො සිටින්නෝ භාග්‍යවතුන් වහන්සේ කරා ගියහ. ගොස්, එක් නමක් භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු පිළිගත්තේ ය. එක් නමක් අසුනක් පැණවී ය. එක් නමක් පා දෝනා දිය ද පාපුටුව ද නො සේදූ පා තබනා පුවරුව ද එළවා තැබී ය. භාග්‍යවතුන් වහන්සේ පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ හිඳ පා සේදූ සේක. එසේ නමුත් ඔහු භාග්‍යවතුන් වහන්සේට ගෞතම නාමයෙන් ද "ඇවැත්නි" යන කීමෙන් ද කතා කෙරෙත්. මෙසේ කතා කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන්ට "මහණෙනි, තථාගතයන්ට නාමයෙන් ද 'ඇවැත්නි' කීමෙන් ද කතා නො කරවු. මහණෙනි, තථාගත තෙමේ රහත් ය. සම්‍යක්සම්බුද්ධ ය. මහණෙනි, කන් යොමු කරවු. මවිසින් නිවණ ලබන ලදී. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. ඒ අනුශාසනය පරිද්දෙන් පිළිපදින්නා වූ තෙපි නොබෝ කලකින් ම, යම් අර්හත්ඵලයක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට ම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත් ද, බඹසර කෙළවර කොට ඇති නිරුත්තර වූ ඒ අර්හත්ඵලය ඉහාත්මයෙහි ම තුමූ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නහු ය" යි යන මෙය වදාළ සේක.

8. මෙසේ වදාළ කල්හි පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේට "ඇවැත්නි ගෞතමයෙනි, තමුන්නාන්සේ ඒ දුෂ්කර ඉරියව් පැවැත්වීමෙන් ඒ දුෂ්කර පිළිවෙත් පිරීමෙන්, ඒ දුෂ්කරක්‍රියාවෙන් මනුෂ්‍යධර්මයෙන් අධික වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශනවිශෙෂයක් නො ලැබූ සේක. මෙකල්හි චීවරාදිප්‍රත්‍යය බහුල කොට ඇති, වීර්‍ය්‍ය කිරීමෙන් පිරිහුනු, චීවරාදිප්‍රත්‍යයබහුලභාවයට පෙරළුනු තමුන්නාන්සේ මනුෂ්‍යධර්මයෙන් අධික වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශනවිශෙෂයක් කෙසේ නම් අවබොධ කළසේක් ද" යි කීහ. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන්හට "මහණෙනි, තථාගත වූ මම චීවරාදිප්‍රත්‍යය බහුල කොට ඇත්තේ නො වෙමි. වීර්‍ය්‍ය කිරීමෙන් පිරිහුනේ නො වෙමි. චීවරාදිප්‍රත්‍යය බහුලභාවය පිණිස පෙරළුනේ නො වෙමි. මහණෙනි, තථාගත තෙමේ රහත් ය. සම්‍යක්සම්බුඬ ය. මහණෙනි, කන් යොමු කරවු. නිවණ ලබනලදී. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. ඒ අනුශාසනය පරිද්දෙන් පිළිපදින්නා වූ තෙපි නොබෝ කලකින් ම යම් නිවණක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට ම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙත් ද, බඹසර කෙළවර කොට ඇති නිරුත්තර වූ ඒ නිවණ ඉහාත්මයෙහි ම තුමූ ම විශිෂ්ට-ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නහුය" යි වදාළ සේක. දෙවන වර ද පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ. දෙවනවර ද භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන්ට මෙය වදාළ සේක -පෙ- තෙවන වර ද පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේට "ඇවැත්නි ගෞතමයෙනි, තමුන්නාන්සේ ඒ දුෂ්කර ඉරියව් පැවැත්වීමෙන්, දුෂ්කර පිළිවෙත් පිරීමෙන්, ඒ දුෂ්කරක්‍රියාවෙන් මනුෂ්‍යධර්මයෙන් අධික වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශනවිශෙෂයක් නො ලැබූසේක. මෙකල්හි චීවරාදිප්‍රත්‍යය බහුල කොට ඇති, වීර්‍ය්‍ය කිරීමෙන් පිරිහුනු, චීවරාදිප්‍රත්‍යයබහුලභාවයට පෙරළුනු තමුන්නාන්සේ මනුෂ්‍යධර්මයෙන් අධික වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශනවිශෙෂයක් කෙසේ නම් අවබොධ කළසේක් ද" යි කීහ.

9. එවං වුත්තෙ භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ එතදවොච: "අභිජානාථ මෙ නො තුම්හෙ භික්ඛවෙ ඉතො පුබ්බෙ එවරූපං භාසිතමෙත"න්ති. "නොහෙතං භන්තෙ. "අරහං භික්ඛවෙ තථාගතො සම්මාසම්බුද්ධො. ඔදහථ භික්ඛවෙ, සොතං. අමතමධිගතං. අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි. යථානුසිට්ඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙ'ව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙ'ව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති. අසක්ඛි ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ සඤ්ඤාපෙතුං. අථ ඛො පඤ්චවග්ගියා භික්ඛූ භගවන්තං සුස්සූසිංසු. සොතං ඔදහිංසු. අඤ්ඤාය චිත්තං උපට්ඨාපෙසුං. අථ ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි:

10. "ද්වෙ'මෙ භික්ඛවෙ, අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා: යො චා'යං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො; යො චා'යං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො. එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති."

11. "කතමා ච සා භික්ඛවෙ, මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි. අයං ඛො සා භික්ඛවෙ, මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති."

12. "ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: ජාති'පි දුක්ඛා. ජරා'පි දුක්ඛා. ව්‍යාධි'පි දුක්ඛො. මරණම්පි දුක්ඛං. අප්පියෙහි සම්පයොගො දුක්ඛො. පියෙහි විප්පයොගො දුක්ඛො. යම්පිච්ඡං න ලභති, තම්පි දුක්ඛං. සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා."

13. "ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛසමුදයං අරියසච්චං: යා'යං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා."

9. මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන්ට "මහණෙනි, මින් පෙර 'මහණෙනි, මම රහත්මි. සම්මා සම්බුදු වෙමි' යි මවිසින් මේබඳු වචනයක් කියනලද්ද යි තෙපි දන්නහු ද?"යි අසා වදාළසේක. "ස්වාමීනි, මෙබඳු වචනයක් නො වදාළහු ම ය". "මහණෙනි, තථාගත තෙමේ රහත් ය. සම්‍යක්සම්බුඩ ය. මහණෙනි, කන් යොමු කරවු, නිවණ ලබන ලදී. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. ඒ අනුශාසනය පරිද්දෙන් පිළිපදින්නා වූ තෙපි නොබෝ කලකින් ම, යම් නිවණක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට ම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත් ද, බඹසර කෙළවර කොට ඇති නිරුත්තර වූ ඒ නිවණ ඉහාත්මයෙහි ම තුමූ ම විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වසන්නහු ය" යි (වදාළසේක). භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන්ට (තමන් වහන්සේ ගේ බුදුබව) හඟවාලන්නට හැකි වූසේක් ම ය. එකල්හි පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය මනා කොට ඇසූහ. කන් යොමු කළහ. රහත්බව පිණිස සිත පිහිටවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් ඇමතූසේක.

10. "මහණෙනි, ලාමක වූ ග්‍රාම්‍ය වූ පොදුජනයා විසින් සෙවුනා වූ අනාර්‍ය්‍ය වූ අනර්ථයෙන් යුක්ත වූ වස්තුකාමයන්හි යම් මේ කෙලශකාම-සුඛවශයෙන් ඇලීමෙක් වේ ද, (එ ද), දුක් වූ අනාර්‍ය්‍ය වූ අනර්ථයෙන් යුක්ත වූ යම් මේ ශරීරයට වෙහෙස දීමක් වේ ද (එ ද යන) මේ දෙ කොටස පැවිද්දා විසින් සෙවනය නො කට යුතු ය. මහණෙනි, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරණලද දර්‍ශනමාර්‍ගඥනය කරන්නී වූ භාවනාමාර්‍ගඥනය කරන්නී වූ මධ්‍යමප්‍රතිපදා තොමෝ කෙලෙසුන් සංසිඳීම පිණිස, සිවුසස්දහම් මොනවට දැනීම පිණිස, සිවුසස්දහම් මනා කොට අවබොධ කිරීම පිණිස, නිවන් පිණිස පවතී."

11 "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරණ ලද දර්‍ශනමාර්‍ගඥනය කරන්නී වූ, භාවනාමාර්‍ගඥනය කරන්නී වූ ඒ කිනම් මධ්‍යමප්‍රතිපදාවක් තොමෝ කෙලෙසුන් සංසිඳීම පිණිස, සිවුසස් දහම් මොනවට දැනීම පිණිස, සිවුසස්දහම් මොනවට අවබොධ කිරීම පිණිස, නිවන් පිණිස පවතී ද? ඒ මධ්‍යමප්‍රතිපදාව මේ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්‍ගය මැ යි. ඒ කවරී ද? යත්:— සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සඞ්කල්පනා, සම්‍යග්වචන, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්ස්මෘති, සම්‍යක්සමාධි (යන මේ යි). මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරණලද දර්‍ශනමාර්‍ගඥනය කරන්නී වූ, භාවනාමාර්‍ගඥනය කරන්නී වූ ඒ මේ මධ්‍යමප්‍රතිපදාතොමෝ කෙලෙසුන් සංසිඳීම පිණිස, සිවුසස්දහම් මනා කොට දැනීම පිණිස, සිවුසස්දහම් මනා කොට අවබොධ කිරීම පිණිස, නිවන් පිණිස, පවතී."

12. "මහණෙනි, මේ (මතු කියන්නේ) දුඃඛාර්‍ය්‍යසත්‍යය යි: ජාතිය ද දුක් (දුකට හෙතු) ය. ජරාව ද දුක් ය. ව්‍යාධිය ද දුක් ය. මරණය ද දුක් ය. අප්‍රියයන් හා එක් වීම ද දුක් ය. ප්‍රියයන්ගෙන් වෙන් වීම ද දුක් ය. කැමැති දේ නො ලැබීම ද දුක් ය. කොටින් පඤ්චඋපාදානස්කන්ධයෝ දුක් වෙත්.

13. "මහණෙනි, මේ (මතු කියන්නේ) දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය යි: යම් මේ තෘෂ්ණාවක් තොමෝ පුනර්භවය ඇති කරන්නී ද, නන්දිරාගය හා එක් වූවා ද, ඒ ඒ භවයෙහි ඇලෙන්නී ද, ඒ තෘෂ්ණාව යි. ඒ තෘෂ්ණා තොමෝ කවරී ද? කාමසහගත තෘෂ්ණා ය, ශාශ්වතදෘෂ්ටිසහගත තෘෂ්ණා ය, උච්ඡේදදෘෂ්ටිසහගත තෘෂ්ණා ය (යන මේයි).

14. "ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධං අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො."

15. "ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො – පෙ – සම්මාසමාධි."

16. "ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ – පෙ – පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි."

17. "ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මෙ භික්ඛවෙ – පෙ – පහීණන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි."

18. "ඉදං දුක්ඛනිරොධං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මෙ භික්ඛවෙ – පෙ – සච්ඡිකතන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි – පෙ – ආලොකො උදපාදි.

19. "ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදාඅරියසච්චං භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ -පෙ- භාවිතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි. ආලොකො උදපාදි."

20. "යාවකීවඤ්ච මෙ භික්ඛවෙ, ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි, නෙව තාවා'හං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො[1] පච්චඤ්ඤාසිං."

1. "අභිසම්බුද්ධොති" ජ ම. සං; අ. වි.

14. "මහණෙනි, මේ දුඃඛනිරොධාය෍ීසත්‍යය නම් ඒ තෘෂ්ණාව මුළුමනින් නැසීමක් වේ ද, අත්හැරීමක් වේ ද, දුරු ලීමක් වේ ද, මිදීමක් වේ ද, නොඇලීමක් වේ ද (යන මේ ය)."

15. "මහණෙනි, මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාය෍ීසත්‍යය නම් මේ ආය෍ීාෂ්ටාඞ්ගිකමාගීය මැ යි. ඒ කවරේ ද ? සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සංකල්පනා, –පෙ– සම්‍යක්සමාධි (යන මෙයි)."

16 "මහණෙනි, මට 'මේ දුඃඛාය෍ීසත්‍යය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස පහළ වූයේ ය. ඥනය පහළ වූයේ ය. ප්‍රඥව පහළ වී ය. විද්‍යාව පහළ වී ය. ආලොකය පහළ වූයේ ය. මහණෙනි, 'ඒ මේ දුඃඛාය෍ීසත්‍යය පිරිසිඳ දත යුතු ය' යි (පෙර මෙනි). මහණෙනි, මට –පෙ– මහණෙනි, මට 'පිරිසිඳ දන්නා ලද්දේ ය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස පහළ වූයේ ය. ඥනය පහළ වූයේ ය. ප්‍රඥව පහළ වී ය. විද්‍යාව පහළ වී ය. ආලොකය පහළ වූයේ ය."

17. "මහණෙනි, මට මේ දුඃඛසමුදයාය෍ීසත්‍යය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස පහළ වූයේ ය. ඥනය පහළ වූයේ ය. ප්‍රඥව උපන. විද්‍යාව උපන. ආලොකය උපන. මහණෙනි, මට 'ඒ මේ දුඃඛසමුදයාය෍ී–සත්‍යය දුරු කට යුතු' යි –පෙ– මහණෙනි, මට 'ප්‍රහීණ වූයේ ය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස උපන. ඥනය උපන. ප්‍රඥව උපන. විද්‍යාව උපන. ආලොකය උපන.

18. "මහණෙනි, මට 'මේ දුඃඛනිරොධාය෍ීසත්‍යය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස උපන. ඥනය උපන. ප්‍රඥව උපන. විද්‍යාව උපන. ආලොකය උපන. මහණෙනි, මට 'ඒ මේ දුඃඛනිරොධාය෍ීසත්‍යය ප්‍රත්‍යක්‍ෂ කට යුතු ය' යි –පෙ– මහණෙනි, මට 'ප්‍රත්‍යක්‍ෂ කාරණ ලද්දේ ය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස උපන. –පෙ– ආලොකය උපන."

19. "මහණෙනි, මට 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාය෍ීසත්‍යය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස උපන. –පෙ– ආලොකය උපන. මහණෙනි, මට 'ඒ මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාය෍ීසත්‍යය වැඩිය යුතු ය' යි –පෙ– මහණෙනි, මට 'වඩනාලද්දේ ය' යි පෙර නො ඇසූ දහම්හි නුවණැස උපන. ඥනය උපන ප්‍රඥව උපන. විද්‍යාව උපන. ආලොකය උපන.

20. "මහණෙනි, යම් තාක් මෙසේ (සත්‍යඥන – කෘත්‍යඥන – කෘතඥන යි) ත්‍රිපරිවෘත්තයක් ඇති (එකී එකී සත්‍යයයෙක්හි තුන් තුන් ආකාර වශයෙන්) දොළොස් ආකාරයක් ඇති මේ චතුරාය෍ීසත්‍යධම෍ීයන් කෙරෙහි ඇති සැටි දැකීම මට පැහැදිලි නො වී ද, මහණෙනි, ඒ තාක් දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ලොකයෙහි ද, මහණ බමුණන් සහිත වූ, දෙවිමිනිසුන් සහිත වූ ප්‍රජාවෙහි ද 'මම නිරුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළෙමි' යි ප්‍රතිඥ නො කෙළෙමි."

21. "යතො ච ඛො මෙ භික්ඛවෙ, ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'අකුප්පා මෙ චෙතොවිමුත්ති[1] අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො'ති."

22. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො **කොණ්ඩඤ්ඤස්ස** විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: 'යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම'න්ති.

23. පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ **භුම්මා** දෙවා සද්දමනුස්සාවෙසුං: "එතං භගවතා **බාරාණසියං ඉසිපතනෙ** මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මි"න්ති.

24. **භුම්මානං** දෙවානං සද්දං සුත්වා **චාතුම්මහාරාජිකා** දෙවා සද්දමනුස්සාවෙසුං – පෙ – චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා **තාවතිංසා** දෙවා – **යාමා** දෙවා – **තුසිතා** දෙවා – **නිම්මානරතී** දෙවා – **පරනිම්මිතවසවත්තිනො** දෙවා – **බ්‍රහ්මකායිකා** දෙවා සද්දමනුස්සාවෙසුං: "එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මි"න්ති.

25. ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි. අයං ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පි. සම්පකම්පි. සම්පවෙධි. අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුරහොසි අතික්කම්ම දෙවානං දෙවානුභාවං. අථ ඛො භගවා උදානං[2] උදානෙසි: "අඤ්ඤාසි වත භො **කොණ්ඩඤ්ඤො**. අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො"**ති**. ඉති හි'දං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස **'අඤ්ඤාකොණ්ඩඤ්ඤො'**[3] ත්වෙව නාමං අහොසි.

1. "මෙ විමුත්ති" - ජ, ම, සං.
2. "ඉමං උදානං" ජ, ම, සං.
3. "අඤ්ඤාසි කොණ්ඩඤ්ඤො" ජ, ම, සං.

21. "මහණෙනි, යම් දිනක පටන් මෙසේ ත්‍රිපරිවෘත්තයක් ඇති දොළොස් ආකාරයක් ඇති මේ චතුරාර්‍ය්‍යසත්‍යධර්‍මයන් කෙරෙහි ඇති සැටි දැකීම මට පැහැදිලි වී ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලෝකයෙහි, මහණ බමුණන් සහිත වූ දෙවි මිනිසුන් සහිත වූ ප්‍රජාවෙහි නිරුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙමි යි ප්‍රතිඥා කෙළෙමි. 'මාගේ අර්හත්ඵලය ස්ථිර ය. මේ අන්තිම ජාතිය ය. දැන් මතු භවයක් නැත්තේ ය' යි මට ප්‍රත්‍යවෙක්ෂාඥානය පහළ වි ය."

22. මේ වෙය්‍යාකරණධර්‍මය දෙසන කල්හි ආයුෂ්මත් **කොණ්ඩඤ්ඤ** ස්ථවිරයන් වහන්සේට "යම් කිසි ධර්‍මයක් ප්‍රත්‍යයයෙන් උපන්නේ වේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි රාගාදිරජස් රහිත වූ පහ වූ (දිට්ඨිවිචිකිච්ඡා) මල ඇති සෝතාපත්තිමග්ගඥානය පහළ වූයේ ය.

23. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්‍මචක්‍රය පවත්වනු ලැබූ කල්හි **භූමාටුදෙවියෝ** 'භාග්‍යවතුන් වහන්සේ විසින් **බරණැස මෘගදාය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** ලොකයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ අන්කිසිවකු විසින් හෝ නො පැවැත්විය හැකි වූ නිරුත්තර වූ මේ ධර්‍මචක්‍රය පවත්වනලද්දේ ය" යි සාධුනාද පැවැත්වූහ.

24. භූමාටු දෙවියන්ගේ ශබ්දය අසා **චාතුර්‍මහාරාජිකා**දෙවියෝ ශබ්ද ඇස්වූහ. –පෙ– **චාතුර්‍මහාරාජිකා**දෙවියන්ගේ ශබ්දය අසා **තව්තිසා**වැසි දෙවියෝ – තව්තිසාවැසි දෙවියන්ගේ ශබ්දය අසා – **යාම**වැසි දෙවියෝ, යාමදෙවියන්ගේ ශබ්දය අසා – **තුසිත**වැසි දෙවියෝ – තුසිතදෙවියන්ගේ ශබ්දය අසා – **නිම්මානරති**දෙවියෝ – නිම්මානරතිදෙවියන්ගේ ශබ්දය අසා **පරනිම්මිතවසවත්ති**දෙවියෝ – පරනිම්මිතවසවත්තිදෙවියන්ගේ ශබ්දය අසා **බ්‍රහ්මකායික**දෙවියෝ "භාග්‍යවතුන් වහන්සේ විසින් **බරණැස** මෘගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි ලොකයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ අන් කිසිවකු විසින් හෝ නො පැවැත්විය හැකි වූ නිරුත්තර වූ මේ ධර්‍මචක්‍රය පවත්වනලද්දේ ය" යි සාධුනාද පැවැත්වූහ.

25. මෙසේ ඒ **ක්ෂණයෙහි** ඒ මොහොතෙහි බඹලොව තෙක් ශබ්දය ඉතා උස් ව නැංගේ ය. මේ දසදහසක් ලොකධාතු නොමෝ කම්පිත වූවා ය. තදින් සැලුනී ය. තදින් වෙවුලූ ය. දෙවියන්ගේ දිව්‍යානුභාවය ඉක්මවා ප්‍රමාණරහිත වූ මහත් වූ ආලෝකයක් පහළ වූයේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "භවත් **කොණ්ඩඤ්ඤ** තෙමේ ඒකාන්තයෙන් (චතුරාර්‍ය්‍යසත්‍යධර්‍මය) දත්තේය භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් (චතුරාර්‍ය්‍යසත්‍යධර්‍මය) දත්තේ ය" යි ප්‍රීතිවාක්‍යය පැවැත්වූ සේක. මෙසේ ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට "අඤ්ඤාකොණ්ඩඤ්ඤ" කියා ම මේ නමක් වූයේ ය.

26. "අථ ඛො ආයස්මා **අඤ්ඤාකොණ්ඩඤ්ඤො** දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගත-කථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: "ලභෙය්‍යා'හං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යං උපසම්පද"න්ති. "එහි භික්ඛූ" ති භගවා අවොච. "ස්වාක්ඛාතො ධම්මො. චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති. සා'ව තස්ස ආයස්මතො උපසම්පදා අහොසි.

27. අථ ඛො භගවා තදවසෙසෙ භික්ඛූ ධම්මියා කථාය ඔවදි. අනුසාසි. අථ ඛො ආයස්මතො ච **වප්පස්ස** ආයස්මතො ච **භද්දියස්ස** භගවතා ධම්මියා කථාය ඔවදියමානානං අනුසාසියමානානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම"න්ති. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද"න්ති. "එථ භික්ඛවො"ති භගවා අවොච. "ස්වාක්ඛාතො ධම්මො. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා"ති. සා'ව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

28. අථ ඛො භගවා තදවසෙසෙ භික්ඛූ නීහාරභත්තො ධම්මියා කථාය ඔවදි. අනුසාසි. යං තයො භික්ඛූ පිණ්ඩාය චරිත්වා ආහරන්ති, තෙන ඡබ්බග්ගො යාපෙති

29. අථ ඛො ආයස්මතො ච **මහානාමස්ස** ආයස්මතො ච **අස්සජිස්ස** භගවතා ධම්මියා කථාය ඔවදියමානානං අනුසාසියමානානං. විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම"න්ති තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද"න්ති. "එථ භික්ඛවො"ති භගවා අවොච. "ස්වාක්ඛාතො ධම්මො. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා"ති. සා'ව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

26. ඉක්බිති ආයුෂ්මත් **කොණ්ඩඤ්ඤ** ස්ථවිර තෙමේ දක්නාලද (සිව්සස්)දහම් ඇත්තේ, පැමිණි (සිව්සස්)දහම් ඇත්තේ, වෙසෙසින් බැසගත් (සිව්සස්) දහම් ඇත්තේ, දුරු කළ සැක ඇත්තේ, පහ වූ (කෙසේ කෙසේ දැයි පැවති) සැක ඇත්තේ, විසාරදභාවයට පැමිණියේ, ශාස්තෲශාසනයෙහි අන් කෙනකුන්ගේ පිටිවහලක් නැත්තේ "භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි" යි භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේය. භාග්‍යවතුන් වහන්සේ "මහණ, එව. ධර්මය තෙමේ මනා ව දෙසනලද්දේ ය. මනා කොට දුක් කෙළවර කිරීම පිණිස මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙව" යි වදාළ සේක. ඒ වචනය ම ඒ ආයුෂ්මතුන් වහන්සේහට උපසම්පදාව වි ය.

27. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගෙන් අවශේෂ වූ භික්ෂූන්ට දැහැමිකතාවෙන් අවවාද කළ සේක. අනුශාසනා කළ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමිකතාවෙන් අවවාද කරණු ලැබූ අනුශාසනා කරණු ලැබූ සිවු දෙනා වහන්සේ අතුරෙන් ආයුෂ්මත් **වප්ප** ස්ථවිරයන් වහන්සේට ද, ආයුෂ්මත් **භද්දිය** ස්ථවිරයන් වහන්සේට ද "යම් කිසි ධර්මයක් ප්‍රත්‍යයයෙන් උපන්නේ වේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදිරජස් ඇති, පහ වූ දිට්ඨිවිචිකිච්ඡාමල ඇති සෝතාපත්තිමග්ගඤාණය පහළ වි ය. ඔහු දක්නාලද දහම් ඇත්තාහු පැමිණි දහම් ඇත්තාහු, අවබෝධ කළ දහම් ඇත්තාහු, වෙසෙසින් බැසගත් දහම් ඇත්තාහු, දුරු කළ සැක ඇත්තාහු, පහ වූ සැක ඇත්තාහු, නිර්භයභාවයට පැමිණියාහු, ශාස්තෲශාසනයෙහි පරප්‍රත්‍යයයක් නැත්තාහු "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු"යි භාග්‍යවතුන් වහන්සේට සැළකළහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එවූ. ධර්මය තෙමේ මොනවට දෙසන ලද්දේ ය. දුක් කෙළවර කිරීම පිණිස මනා කොට මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙවූ" යි වදාළසේක. ඒ වචනය ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වී ය.

28. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (සෙසු භික්ෂූන් විසින්) ගෙණවුත් පිළිගැන්වූ බත් ඇති සේක් දැහැමිකතාවෙන් සෙසු භික්ෂූන්ට අවවාද කළ සේක. අනුශාසනා කළ සේක. භික්ෂූහු තිදෙනෙක් පිඬු පිණිස හැසිර යම් අහරක් ගෙණ එත් ද, එ අහරින් ස නම යැපෙත්.

29. එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් අවවාද කරණු ලබන්නා වූ අනුශාසනා කරණු ලබන්නා වූ ආයුෂ්මත් වූ **මහානාම** ස්ථවිරයන් වහන්සේට ද, ආයුෂ්මත් වූ **අස්සජි** ස්ථවිරයන් වහන්සේට ද "යම් කිසි ධර්මයක් ප්‍රත්‍යයයෙන් උපන්නේ ද, ඒ සියල්ල නිරුද්ධවීම ස්වභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදිරජස් ඇති පහ වූ මල ඇති සෝතාපත්ති-මග්ගඤාණය පහළ වූයේ ය. ඔහු දක්නාලද දහම් ඇත්තාහු, පැමිණි දහම් ඇත්තාහු, අවබෝධ කළ දහම් ඇත්තාහු, වෙසෙසින් බැසගත් දහම් ඇත්තාහු, දුරු කළ සැක ඇත්තාහු, පහ වූ සැක ඇත්තාහු, නිර්භය භාවයට පැමිණියාහු, බුදුසසුනෙන් පිටත් ඇදහීමක් නැත්තාහු "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි භාග්‍යවතුන් වහන්සේට සැළකළහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එවූ. ධර්මය තෙමේ මොනවට දෙසනලද්දේ ය. දුක් කෙළවර කිරීම පිණිස මනා කොට බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙවූ" යි වදාළ සේක. ඒ වචනය ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වී ය.

30. අථ ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි: "රූපං භික්ඛවෙ, අනත්තා. රූපං ච හිදං භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය. ලබ්භෙථ ච රූපෙ 'එවං මෙ රූපං හොතු. එවං මෙ රූපං මා අහොසී'ති. යස්මා ච ඛො භික්ඛවෙ, රූපං අනත්තා, තස්මා රූපං ආබාධාය සංවත්තති. න ච ලබ්භති රූපෙ 'එවං මෙ රූපං හොතු. එවං මෙ රූපං මා අහොසී"ති.

31. "වෙදනා භික්ඛවෙ, අනත්තා.[1] වෙදනා ච හිදං භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං වෙදනා ආබාධාය සංවත්තෙය්‍ය. ලබ්භෙථ ච වෙදනාය 'එවං මෙ වෙදනා හොතු. එවං මෙ වෙදනා මා අහොසී'ති. යස්මා ච ඛො භික්ඛවෙ, වෙදනා අනත්තා, තස්මා වෙදනා ආබාධාය සංවත්තති. න ච ලබ්භති වෙදනාය 'එවං මෙ වෙදනා හොතු. එවං මෙ වෙදනා මා අහොසී'ති.

32. "සඤ්ඤා භික්ඛවෙ, අනත්තා. -පෙ- සඞ්ඛාරා භික්ඛවෙ, අනත්තා. සඞ්ඛාරා ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්සිංසු,[2] නයිමෙ සඞ්ඛාරා ආබාධාය සංවත්තෙය්‍යුං. ලබ්භෙථ ච සඞ්ඛාරෙසු 'එවං මෙ සඞ්ඛාරා හොන්තු. එවං මෙ සඞ්ඛාරා මා අහෙසු'න්ති. යස්මා ච ඛො භික්ඛවෙ, සඞ්ඛාරා අනත්තා, තස්මා සඞ්ඛාරා ආබාධාය සංවත්තන්ති. න ච ලබ්භති සඞ්ඛාරෙසු "එවං මෙ සඞ්ඛාරා හොන්තු. එවං මෙ සඞ්ඛාරා මා අහෙසු'න්ති.

33. "විඤ්ඤාණං භික්ඛවෙ, අනත්තා. විඤ්ඤාණඤ්ච හිදං භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං විඤ්ඤාණං ආබාධාය සංවත්තෙය්‍ය. ලබ්භෙථ ච විඤ්ඤාණෙ 'එවං මෙ විඤ්ඤාණං හොතු. එවං මෙ විඤ්ඤාණං මා අහොසී' ති. යස්මා ච ඛො භික්ඛවෙ විඤ්ඤාණං අනත්තා, තස්මා විඤ්ඤාණං ආබාධාය සංවත්තති. න ච ලබ්භති විඤ්ඤාණෙ 'එවං මෙ විඤ්ඤාණං හොතු. එවං මෙ විඤ්ඤාණං මා අහොසී'ති.

34. "තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා ? ති. අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ?'ති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නනු තං සමනුපස්සිතුං 'එතං මම. එසො'හමස්මි. එසො මෙ අත්තා ?'ති. නො හෙතං භන්තෙ. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා ?'ති. අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා? 'ති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නනු තං සමනුපස්සිතුං 'එතං මම. එසො හමස්මි. එසො මෙ අත්තා ?'ති. නො හෙතං භන්තෙ.

1. "වෙදනා අනත්තා" ම. ජ. සං; නො. වි
2 "අභවිස්සංසු" ම. ජ. සං; ම. නු. ප; නො. වි. "අභවිංසු"

30. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් ඇමතූ සේක: "මහණෙනි, රූපය අනාත්මයි. මහණෙනි, යම් හෙයකින් මේ රූපය ආත්ම වී නම්, මේ රූපය පීඩාව පිණිස නො පවත්නේ ය. 'මාගේ රූපය මෙසේ වේවා. මෙසේ නො වේවා' යනු ලැබිය හැකි වන්නේ ය. මහණෙනි, යම් හෙතුවකින් රූපය ආත්ම නො වේ ද, ඒ හෙතුවෙන් රූපය පීඩාව පිණිස පවතී. 'මාගේ රූපය මෙසේ වේවා. මෙසේ නො වේවා' යනු රූපයෙහි නො ලැබේ.

31. "මහණෙනි, වෙදනාව අනාත්මයි. මහණෙනි, යම්හෙයකින් මේ වෙදනාව ආත්මය වී නම්, මේ වෙදනාව පීඩාව පිණිස නො පවත්නී ය. 'මාගේ වෙදනාව මෙසේ වේවා. මෙසේ නො වේවා' යනු වෙදනාවෙහි ලැබිය හැකි වන්නේ ය. මහණෙනි, යම්හෙයකින් වෙදනාව ආත්ම නො වේ ද, එහෙයින් වෙදනාව පීඩාව පිණිස පවතී. 'මාගේ වෙදනාව මෙසේ වේවා. මෙසේ නො වේවා' යනු වෙදනාවෙහි නො ලැබේ.

32 "මහණෙනි, සංඥව අනාත්මයි -පෙ- මහණෙනි, සංස්කාරයෝ අනාත්ම වෙත්. මහණෙනි, යම්හෙයකින් මේ සංස්කාරයෝ ආත්ම වූවාහු නම්, මේ සංස්කාරයෝ පීඩාව පිණිස නො පවත්නාහු ය 'මාගේ සංස්කාරයෝ මෙසේ වෙත්වා මෙසේ නොවෙත්වා' යනු සංස්කාරයන් කෙරෙහි ලැබිය හැකි වන්නේ ය. මහණෙනි, යම් හෙයකින් සංස්කාරයෝ ආත්ම නො වෙත් ද, එහෙයින් සංස්කාරයෝ පීඩාව පිණිස පවතිත්. 'මාගේ සංස්කාරයෝ මෙසේ වෙත්වා. මෙසේ නො වෙත්වා' යනු සංස්කාරයන් කෙරෙහි නො ලැබේ.

33. "මහණෙනි, විඥනය අනාත්මයි. මහණෙනි, යම්හෙයකින් මේ විඥනය ආත්ම වී නම්, මේ විඥනය පීඩාව පිණිස නො පවත්නේ ය. 'මා ගේ විඥනය මෙසේ වේවා මෙසේ නො වේ වා' යනු විඥනයෙහි ලැබිය හැකි වන්නේ ය. මහණෙනි, යම්හෙයකින් විඥනය ආත්ම නො වේ ද, එහෙයින් විඥනය පීඩාව පිණිස පවතී. 'මාගේ විඥනය මෙසේ වේවා. මෙසේ නො වේවා' යනු විඥනයෙහි නො ලැබේ.

34. "මහණෙනි, ඒ කිමැ යි සිතවු ද? රූපස්කන්ධය නිත්‍ය ද ? අනිත්‍ය ද ? ස්වාමීනි, අනිත්‍ය යි. යමක් අනිත්‍ය වේ නම්, එය දුක් ද ? සැප ද ? ස්වාමීනි, දුක් ය, යමක් අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සුලු ද, එබඳු දෙය 'මෙය, මාගේ ය. මේ තෙමේ මම වෙමි. මේ තෙමේ මාගේ ආත්මය' යි දක්නට සුදුසු ද? ස්වාමීනි, ඒ නුසුදුසු ම ය. වෙදනා තොමෝ -පෙ- සංඥ තොමෝ -පෙ- සංස්කාරයෝ -පෙ- විඥනය නිත්‍ය ද ? අනිත්‍ය ද ? ස්වාමීනි, අනිත්‍ය යි. යමක් අනිත්‍ය නම් එය දුක් ද ? සැප ද? ස්වාමීනි, දුක් ය. යමක් වනාහි අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සුලු ද, එය 'මෙය මාගේ ය. මේ තෙමේ මම වෙමි. මේ තෙමේ මාගේ ආත්මය' යි දක්නට සුදුසු ද ? ස්වාමීනි, ඒ නුසුදුසු ම ය.

35. තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ වා සන්තිකෙ වා; සබ්බං තං රූපං නෙතං මම. නෙසො'හමස්මි. න මෙ සො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා – යා කාචි සඤ්ඤා – යෙ කෙචි සඞ්ඛාරා – යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං තං විඤ්ඤාණං නෙතං මම, නෙසො'හමස්මි. න මෙ සො අත්තා'ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

36. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති. වෙදනාය'පි නිබ්බින්දති. සඤ්ඤාය'පි නිබ්බින්දති. සඞ්ඛාරෙසු'පි නිබ්බින්දති. විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති; ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං; කතං කරණීයං; නාපරං ඉත්ථත්තායා'ති. පජානාතී''ති.

37. ඉදමවොච භගවා. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුං. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ පඤ්චවග්ගියානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

38. තෙන ඛො පන සමයෙන ඡ ලොකෙ අරහන්තො හොන්ති.

## පඨමකභාණවාරං

---

1. තෙන ඛො පන සමයෙන බාරාණසියං යසො නාම කුලපුත්තො සෙට්ඨිපුත්තො සුඛුමාලො හොති. තස්ස තයො පාසාදා හොන්ති. එකො හෙමන්තිකො, එකො ගිම්හිකො, එකො වස්සිකො. සො වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො මාසෙ[1] නිප්පුරිසෙහි තූරියෙහි පරිචාරයමානො න හෙට්ඨාපාසාදං ඔරොහති.

2. අථ ඛො යසස්ස කුලපුත්තස්ස පඤ්චහි කාමගුණෙහි සමප්පිතස්ස සමඞ්ගීභූතස්ස පරිචාරයමානස්ස පටිගච්චෙව[2] නිද්දා ඔක්කමි. පරිජනස්ස'පි නිද්දා ඔක්කමි. සබ්බරත්තියො ච තෙලපදීපො ඣායති.

1. චත්තාරොමාසෙ - ම. ජ. සං 2. "පටිකච්චෙව" - ම. ජ. සං.

35. මහණෙනි, එහෙයින් මේ ලොකයෙහි තමා ගේ වූ හෝ බැහැර වූ හෝ මහත් වූ හෝ සියුම් වූ හෝ ලාමක වූ හෝ ප්‍රණීත වූ හෝ අතීතානාගතවර්තමාන වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, යම් රූපයෙක් දුරෙහි හෝ සමීපයෙහි හෝ වේ ද ඒ සියලු රූපය "මේ මාගේ නො වේ. මේ තෙමේ මම නො වෙමි. මේ තෙමේ මාගේ ආත්මය නො වේ ය" යි මෙසේ මෙය යහපත් නුවණින් තත් වූ පරිදි දත යුතු ය. යම් කිසි වෙදනාවක් වේ ද,- යම්කිසි සංඥාවක් වේ ද,- යම් කිසි සංස්කාරයෝ වෙත් ද- අධ්‍යාත්මයෙහි වූ හෝ බැහැර වූ හෝ මහත් වූ හෝ සියුම් වූ හෝ ලාමක වූ හෝ ප්‍රණීත වූ හෝ අතීතානාගතවර්තමාන වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, යම් විඥානයෙක් දුරෙහි හෝ සමීපයෙහි හෝ වේ ද, ඒ සියලු විඥානය "මේ මාගේ නොවේ. මේ තෙමේ මම නො වෙමි. මේ තෙමේ මාගේ ආත්මය නොවේ ය' යි මෙසේ මෙය යහපත් නුවණින් තත් වූ පරිදි දත යුතු ය.

36. මහණෙනි, මෙසේ දක්නා වූ බහුශ්‍රැත වූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපස්කන්ධයෙහි ද කළකිරෙයි. වෙදනාස්කන්ධයෙහි ද කළකිරෙයි. සංඥාස්කන්ධයෙහි ද කළකිරෙයි. සංස්කාරස්කන්ධයෙහි ද කළකිරෙයි. විඥානස්කන්ධයෙහි ද කළකිරෙයි. කළකිරුණේ නො ඇලෙයි. නො ඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි. මිදුනු කල්හි මිදුනේ යැ යි (පස්විකුම්) නුවණ වේ. 'ජාතිය ක්‍ෂය වී ය. බඹසර වැස නිමවන ලදී. (සිව් මගින් කළ යුතු) කටයුතු කරණ ලදී. අර්හත්වය පිණිස (කටයුතු) අනිකක් නැතැ' යි දනියි.

37. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය (පසසමින්) සතුටු සිතින් පිළිගත්හ. මේ නිර්ගාථක සූත්‍රය දෙසනු ලබන කල්හි පස්වගමහණුන් ගේ සිත් තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් අල්ලා නොගැණීමෙන් ආශ්‍රවයන්ගෙන් මිදුනාහ.

38. එකල්හි ලොකයෙහි රහත්හු සදෙනෙක් වෙත්.

**පළමු බණවර නිමි.**

---

1. එකල්හි බරණැස යස නම් කුලපුත්‍රයෙක් වෙයි. සිටුපුත් වූ ඔහු සියුමැලි ය. ඔහුට ප්‍රාසාදයෝ තුණක් වෙත්. එක් ප්‍රාසාදයෙක් හෙමන්ත ඍතුවට සුදුසු ය. එක් ප්‍රාසාදයෙක් ග්‍රීෂ්ම ඍතුවට සුදුසු ය. එක් ප්‍රාසාදයෙක් වර්‍ෂාඍතුවට සුදුසු ය. ඒ යස කුලපුත්‍රතෙමේ වැසිකලට සුදුසු පහයෙහි වැසි සාරමස්හි ස්ත්‍රීන් විසින්ම වාදනය කළ තූර්‍ය්‍යයන් ගෙන් හැම ලෙසින් ඉදුරන් පිණවන්නේ යටපහයට නො බසියි.

2. ඉක්බිති පස්කම්ගුණයෙන් මොනවට සැහීමට පැමිණි හැම ලෙසින් ඉදුරන් පිණවන යස කුලපුත්‍රයාහට හැමට පළමුව නින්ද පැමිණියේය. පිරිවර ජනයාහට ද නින්ද පැමිණියේය. මුළු රෑ තෙල් පහන ද දැල්වේ.

3. අථ ඛො යසො කුලපුත්තො පටිගච්චෙව පබුජ්ඣිත්වා අද්දස සකං පරිජනං සුපන්තං. අඤ්ඤිස්සා කච්ඡෙ වීණං. අඤ්ඤිස්සා කණ්ඨෙ මුදිඞ්ගං. අඤ්ඤිස්සා කච්ඡෙ ආලම්බරං. අඤ්ඤං විකෙසිකං අඤ්ඤං වික්ඛෙලිකං. අඤ්ඤා විප්පලපන්තියො. හත්ථප්පත්තං සුසානං මඤ්ඤෙ. දිස්වානස්ස ආදීනවො පාතුරහොසි. නිබ්බිදාය චිත්තං සණ්ඨාසි.

4. අථ ඛො **යසො** කුලපුත්තො උදානං උදානෙසි: “උපද්දුතං වත භො; උපස්සට්ඨං වත භො”ති.

5. අථ ඛො යයො කුලපුත්තො සුවණ්ණපාදුකායො ආරොහිත්වා යෙන නිවෙසනද්වාරං තෙනුපසඞ්කමි. අමනුස්සා ද්වාරං විවරිංසු: “මා යසස්ස කුලපුත්තස්ස කොචි අන්තරායමකාසි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා” ති.

6. අථ ඛො යසො කුලපුත්තො යෙන නගරද්වාරං තෙනුපසඞ්කමි. අමනුස්සා ද්වාරං විවරිංසු. “මා යසස්ස කුලපුත්තස්ස කොචි අන්තරායමකාසි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා”ති.

7. අථ ඛො යසො කුලපුත්තො යෙන ඉසිපතනං මිගදායො, තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය අජ්ඣොකාසෙ චඞ්කමති. අද්දසා ඛො භගවා යසං කුලපුත්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන චඞ්කමා ඔරොහිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො යසො කුලපුත්තො භගවතො අවිදූරෙ උදානං උදානෙසි: උපද්දුතං වත භො; උපස්සට්ඨං වත භො”ති.

8. අථ ඛො භගවා යසං කුලපුත්තං එතදවොච: “ඉදං ඛො යස, අනුපද්දුතං. ඉදං අනුපස්සට්ඨං. එහි යස, නිසීද. ධම්මං තෙ දෙසිස්සාමී”ති[1] අථ ඛො යසො කුලපුත්තො “ඉදං කිර අනුපද්දුතං. ඉදං අනුපස්සට්ඨ”න්ති හට්ඨො උදග්ගො සුවණ්ණපාදුකාහි ඔරොහිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො යසස්ස කුලපුත්තස්ස භගවා ආනුපුබ්බීකථං[2] කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි යසං කුලපුත්තං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා[3] ධම්මදෙසනා තං පකාසෙසි – දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය. එවමෙව යසස්ස කුලපුත්තස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි “යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම”න්ති.

1. “දෙසෙස්සාමි” ම. නු. ප; තො. වි; ම. ඡ. සං.
2. අනුපුබ්බිකථං” ම. ඡ. ස. ආනුපුබ්බිකථං” ම. නු. ප. 3 “සමුක්කංසිකා” ඡ. පු.

Free Distribution www.aathaapi.org

3. **එකල්හි යස**කුලපුත්‍රතෙමේ හැමට පළමු පිබිද නිදන සිය පිරිවර දුටුවේ ය. එකකගේ කිසිල්ලෙහි වීණාව වී ය. එකකගේ බෙල්ලේ මිහිඟුබෙරය වී ය. එකකගේ කිසිල්ලෙහි පණාබෙරය වී ය. අවුල් වූ කෙස් ඇති එකක ද කෙළ වැහෙන එකක ද නන් දෙඩන අන් අඟනන් ද දුටුවේ ය. එතැන හමුවට පත් අමුසොහොනක් වැනි වී ය. දැක, ඒ කුලපුත්‍රයාහට දෙස් පෙණී ගියේ ය. සසර කළකිරීමෙහි සිත පිහිටියේ ය.

4. ඉක්බිති යසකුලපුත්‍රතෙමේ “භවත්නි, ඒකාන්තයෙන් තෘෂ්ණාදි කෙලශයන් විසින් පීඩා කරණ ලද්දේ ය. භවත්නි, තෘෂ්ණාදිකෙලශයන් විසින්. දූඛ කොට ගන්නා ලද්දේ ය” යි උදන් ඇනී ය.

5. ඉක්බිති යසකුලපුත්‍රතෙමේ රන්මිරිවැඩිසඟල පය ලා නිවෙස්දොරට පැමිණියේ ය. දෙවියෝ “යසකුලපුත්‍රයාහට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිද්දට කිසිවෙක් අන්තරාය නො කෙරේවා” යි දොර හළහ.

6. ඉක්බිති යසකුලපුත්‍ර තෙමේ නුවර දොරට පැමිණියේ ය. යසකුලපුත්‍රයාහට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිද්දට කිසිවෙක් අන්තරාය නො කෙරේවා” යි දෙවියෝ දොර අළහ.

7. ඉක්බිති යසකුලපුත්‍රතෙමේ **ඉසිපතනය** වූ **මෘගදායයට** ගියේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ අලුයම්වේලෙහි නැඟී සිට එළිමහනෙහි සක්මන් කරණසේක. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ යසකුලපුත්‍රයා දුර දී ම දුටුසේක. දැක, සක්මනින් ඉවත් වී පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. එකල්හි යසකුලපුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේට නුදුරු තැනක සිට “භවත්නි, ඒකාන්තයෙන් තෘෂ්ණාදිකෙලශයන් විසින් පීඩා කරණ ලද්දේ ය. තෘෂ්ණාදිකෙලශයන් විසින් දූඛ කොට ගන්නා ලද්දේ ය” යි උදන් ඇනී ය.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යසකුලපුත්‍රයාහට “යසය, මේ වනාහි තෘෂ්ණාදිකෙලශයන් විසින් පීඩා නො කරණ ලද්දේ ය. තෘෂ්ණාදි කෙලශයන් විසින් දූඛ කොට නො ගන්නා ලද්දේ ය. යසය, එව. හිඳුව. තට දහම් දෙසන්නෙමි” යි වදාළ සේක. ඉක්බිති යසකුලපුත්‍රතෙමේ “මේ පීඩා නො කරණ ලද්දේ ල. මේ දූඛ කොට නො ගන්නා ලද්දේ ල” යි සතුටු වූයේ ඔද, වැඩි වූයේ මිරිවැඩිසඟල ගලවා භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ යසකුලපුත්‍රයාහට භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළකතාව වදාළසේක. එනම්:- දානකථාව සීලකථාව ස්වර්ගකථාව කාමයන්ගේ දොෂය ලාමකභාවය කෙලෙසීමට හෙතු වන බව ගිහිගෙන් නික්මීමෙහි අනුසස් (යන මෙය) ප්‍රකාශ කළසේක. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ යසකුලපුත්‍රයා (කාමච්ඡන්දය පහ වීමෙන්) යොග්‍ය වූ සිත් ඇත්තෙකැ යි ද, (ව්‍යාපාදය දුරු වීමෙන්) මොළොක් වූ සිත් ඇත්තෙකැ යි ද, (උද්ධච්චකුක්කුච්චය දුරු වීමෙන්) නො විසිරුණු සිත් ඇත්තෙකැ යි ද (ථිනමිද්ධය පහ වීමෙන්) නො හැකුළුනු සිත් ඇත්තෙකැ යි ද (විචිකිච්ඡාව දුරු වීමෙන්) නිසැක සිත් ඇත්තෙකැ යි ද දත් සේක් ද, එකල්හි බුද්ධවරයන්ගේ තමා ම උසස්බවට පැමිණි යම් ධර්මදේශනාවක් වේ ද, දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන ඒ චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළසේක. පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයක් මනා සේ සායම් ගන්නේ යම් සේ ද, එපරිද්දෙන් යසකුලපුත්‍රයාහට ඒ අසුනෙහි දී ම “හටගැණීම ස්වභාවය කොට ඇති යම්කිසිවක් වේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ” යි යන රාගාදිරජස් රහිත වූ පහ වූ කෙලෙස්මල ඇති දහම්ඇස (සොතාපත්තිඥාණය) පහළ වූයේ ය.


Free Distribution www.aathaapi.org

9. අථ ඛො යසස්ස කුලපුත්තස්ස මාතා පාසාදං ආරුහිත්වා යසං කුලපුත්තං අපස්සන්තී යෙන සෙට්ඨි ගහපති, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සෙට්ඨිං ගහපතිං එතදවොච: "පුත්තො තෙ ගහපති, යසො න දිස්සතී"ති. අථ ඛො සෙට්ඨි ගහපති චතුද්දිසා අස්සදූතෙ උය්‍යොජෙත්වා සාමඤ්ඤෙව යෙන ඉසිපතනං මිගදායො, තෙනුපසඞ්කමි. අද්දසා ඛො සෙට්ඨි ගහපති සුවණ්ණපාදුකානං නික්ඛෙපං. දිස්වාන තඤ්ඤෙව අනුගමා[1]. අද්දසා ඛො භගවා සෙට්ඨිං ගහපතිං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන භගවතො එතදහොසි: "යන්නූනාහං තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛරෙය්‍යං, යථා සෙට්ඨි ගහපති ඉධ නිසින්නො ඉධ නිසින්නං යසං කුලපුත්තං න පස්සෙය්‍යා"ති. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි.[2]

10. අථ ඛො සෙට්ඨි ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "අපි භන්තෙ, භගවා යසං කුලපුත්තං පස්සෙය්‍යා?"ති. "තෙන හි ගහපති, නිසීද. අප්පෙව නාම ඉධ නිසින්නො ඉධ නිසින්නං යසං කුලපුත්තං පස්සෙය්‍යාසී"ති.

11. අථ ඛො සෙට්ඨි ගහපති "ඉධෙව කිරාහං නිසින්නො ඉධ නිසින්නං යසං කුලපුත්තං පස්සිස්සාමී"ති හට්ඨො උදග්ගො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො සෙට්ඨිස්ස ගහපතිස්ස භගවා ආනුපුබ්බිකථං කථෙසි -පෙ- අපරප්පච්චයො සත්ථු-සාසනෙ භගවන්තං එතදවොච: "අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ,. නික්කුජ්ජිතං[3] වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති' එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත"න්ති. සො'ව[4] ලොකෙ පඨමං උපාසකො අහොසි තෙවාචිකො.

12. අථ ඛො යසස්ස කුලපුත්තස්ස පිතුනො ධම්මෙ දෙසියමානෙ යථාදිට්ඨං යථාවිදිතං භූමිං පච්චවෙක්ඛන්තස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි. අථ ඛො භගවතො එතදහොසි: "යසස්ස ඛො කුලපුත්තස්ස පිතුනො ධම්මෙ දෙසියමානෙ යථාදිට්ඨං යථාවිදිතං භූමිං පච්චවෙක්ඛ-න්තස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං. අභබ්බො ඛො යසො කුලපුත්තො හීනායාවත්තිත්වා කාමෙ පරිභුඤ්ජිතුං සෙය්‍යථාපි පුබ්බෙ අගාරිකභූතො. යන්නූනාහං තං ඉද්ධාභිසඞ්ඛාරං පටිප්පස්සම්භෙය්‍ය"න්ති.

---

1 අනුගමාසි - ම, ජ, සං.
2. අභිසඞ්ඛාරෙසි - ම, ජ, සං.
3. "නික්කුජ්ජිතං" - ඉත්‍යපි
4 සො. ච - ම නු. ප; අ. වි.

9. ඉක්බිති **යසකුලපුත්‍ර**යාගේ මවුතොමෝ පහයට නැඟී යසකුලපුත්‍රයා නො දක්නී සිටුගැහැවියා වෙත ගියා ය. ගොස්, සිටුගැහැවියාහට "ගැහැවිය, ඔබගේ පුත් වූ යසතෙමේ නො දක්නා ලැබේ" යයි කීවා ය. එකල්හි සිටුගැහැවි තෙමේ අසුන් නැඟි දූතයන් සිවුදිගට යවා තෙමේ ම **ඉසිපතන** නම් වූ **මෘගදායයට** ගියේ ය. එහි සිටුගැහැවි තෙමේ සුවර්ණපාදුකාවන්ගේ අඩි සටහන දුටුයේ ය. දැක, එය අනු ව ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ සිටුගැහැවියා දුර දී ම දුටු සේක. දැක්මෙන් භාග්‍යවතුන් වහන්සේට "මෙහි හුන්නා වූ සිටුගැහැවි තෙමේ මෙහි හුන් යසකුලපුත්‍රයා යම් සේ නො දක්නේ ද, මම එබඳු වූ සෘද්ධියක් කරන්නෙම් නම් යෙහෙකැ" යි මේ සිත වි ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එබඳු වූ සෘද්ධියක් කළ සේක.

10. ඉක්බිති සිටුගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කිම? භාග්‍යවතුන් වහන්සේ යසකුලපුත්‍ර දුටු සේක් ද?"යි ඇසී ය. "ගැහැවිය, එසේ නම්' හිඳුව. මෙහි හුන් තෝ මෙහි හුන් යසකුලපුත්‍ර ඒකාන්තයෙන් දක්නෙහි ය"යි (උන් වහන්සේ වදාළ සේක.)

11. ඉක්බිති සිටුගැහැවි තෙමේ "මම මෙහි ම හුන්නෙම් මෙහි ම හුන් යසකුලපුත්‍ර දකින්නෙමි"යි සතුටු වූයේ ඔද වැඩි සිතැත්තේ, භාග්‍යවතුන් සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් සිටුගැහැවියාහට භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළකතාව වදාළ සේක. –පෙ– ශාස්තෘශාසනයෙහි පරප්‍රත්‍යයයක් නැත්තේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, යටිකුරු කරණලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ විවෘත කරන්නේ ද, මං මුළා වූවකුට යම් සේ මග කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නාහු යැ' යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේ ය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද නවලෝකෝත්තරධර්මය ද අෂ්ටාර්‍ය්‍යපුද්ගලභික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියා වූ මා උපාසකයකු කොට දරණ සේක්වා"යි කීයේ ය. හෙතෙමේ ම ලෝකයෙහි පළමු **තෙවාචික**[1] උපාසක වූයේ ය.

12. ඉක්බිති පියාහට දහම් දෙසනු ලබන කල්හි දුටු පරිදි දත් පරිදි ආර්‍ය්‍යභූමිය මැනැවින් සලකන්නා වූ යසකුලපුත්‍රයාගේ සිත තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් අල්ලා නො ගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "පියාහට දහම් දෙසනු ලබන කල්හි දුටු පරිදි දත් පරිදි ආර්‍ය්‍යභූමිය ප්‍රත්‍යවෙක්ෂා කරන්නා වූ යසකුලපුත්‍රයාගේ සිත තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් නො ගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ ය. යසකුලපුත්‍ර තෙමේ පෙර ගිහි කල්හි මෙන් – ගිහි වී – කාම්සැප විඳීමට නුසුදුසු ම ය. මම ඒ සෘද්ධිය දුන් හැර ලන්නෙම් නම් යෙනෙකැ" යි සිතෙක් උපන්නේ ය.

---

1. "බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සඞ්ඝං සරණං ගච්ඡාමි" යි මෙසේ සරණ ගිය උපාසක තෙමේ තෙවාචික උපාසක ය.

13. අථ ඛො භගවා තං ඉද්ධාභිසඞ්ඛාරං පටිප්පස්සම්භෙසි. අද්දසා ඛො සෙට්ඨි ගහපති **යසං** කුලපුත්තං නිසින්නං. දිස්වාන යසං කුලපුත්තං එතදවොච: "මාතා තෙ තාත, යස, පරිදෙවසොකසමාපන්නා. දෙහි මාතුයා ජීවිත"න්ති.

14. අථ ඛො **යසො** කුලපුත්තො භගවන්තං උල්ලොකෙසි. අථ ඛො භගවා සෙට්ඨිං ගහපතිං එතදවොච: තං **කිම්මඤ්ඤසි** ගහපති, යසස්ස[1] සෙඛෙන ඤාණෙන සෙඛෙන දස්සනෙන ධම්මො දිට්ඨො විදිතො සෙය්‍යථාපි තයා. තස්ස යථාදිට්ඨං යථාවිදිතං භූමිං පච්චවෙක්ඛන්තස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං. භබ්බො නු ඛො සො ගහපති, හීනායාවත්තිත්වා කාමෙ පරිභුඤ්ජිතුං සෙය්‍යථාපි පුබ්බෙ අගාරිකභූතො?"ති. "නො හෙතං භන්තෙ". යසස්ස ඛො ගහපති, කුලපුත්තස්ස සෙඛෙන ඤාණෙන සෙඛෙන දස්සනෙන ධම්මො දිට්ඨො විදිතො සෙය්‍යථාපි තයා. තස්ස යථාදිට්ඨං යථාවිදිතං භූමිං පච්චවෙක්ඛන්තස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං. අභබ්බො ඛො ගහපති, යසො කුලපුත්තො හීනායාවත්තිත්වා කාමෙ පරිභුඤ්ජිතුං සෙය්‍යථාපි පුබ්බෙ අගාරිකභූතො"ති.

15. "ලාභා භන්තෙ, යසස්ස කුලපුත්තස්ස. සුලද්ධං භන්තෙ, යසස්ස කුලපුත්තස්ස, යථා යසස්ස කුලපුත්තස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං. අධිවාසෙතු මෙ භන්තෙ, භගවා අජ්ජතනාය භත්තං යසෙන කුලපුත්තෙන පච්ඡාසමණෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

16. අථ ඛො සෙට්ඨි ගහපති භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො යසො කුලපුත්තො අචිරපක්කන්තෙ සෙට්ඨිම්හි භගවන්තං එතදවොච: "ලභෙය්‍යා'හං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යං උපසම්පද" න්ති. "එහි භික්ඛූ" ති භගවා අවොච: "ස්වාක්ඛාතො ධම්මො. චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති. සා'ව තස්ස ආයස්මතො උපසම්පදා අහොසි.

තෙන ඛො පන සමයෙන සත්ත ලොකෙ අරහන්තො හොන්ති.

**යසස්ස පබ්බජ්ජා නිට්ඨිතා.**

---

[1] "යසස්ස" ම ජ. සං

Free Distribution www.aathaapi.org

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ ඍද්ධිය හළ සේක. සිටු-ගැහැවිතෙමේ එහි හුන් යසකුලපුත්‍රයා දුටුයේ ය. දැක, "පුත්‍රය, යස, නුඹගේ මවු තොමෝ වැලපීමට හා ශොකයට පැමිණියා ය. මවට ජීවිතය දෙව" යි යසකුලපුත්‍රයාහට කීයේ ය.

14. ඉක්බිති යසකුලපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේ දෙස බැලුයේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සිටුගැහැවියාහට "ගැහැවිය, ඒ කුමකැ යි සිතහි ද? යසකුලපුත්‍රයා විසින්, ඔබ විසින් මෙන්, (පළමු කොට) සෙඛඤාණ-යෙන් ද සෙඛදස්සනයෙන් ද ආර්‍යසත්‍යධර්‍මය දක්නා ලද්දේ ය. දක්නා ලද පරිදි දන්නාලද පරිදි ඒ ආර්‍යභූමිය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නා වූ ඒ යසකුලපුත්‍රයාගේ සිත තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් නො ගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ ය. ගැහැවිය, යසකුලපුත්‍ර තෙමේ පෙර ගිහිකල මෙන් ගිහිබවට හැරී කාමසැප විඳින්නට සුදුස්සෙක් වේ ද?" යි අසා වදාළ සේක. "ස්වාමීනි, සුදුසු නො වේ ම ය." "ගැහැවිය, යසකුලපුත්‍රයා විසින් යට තුන්මග නුවණින් ද යට තුන්මග දැක්මෙන් ද චතුස්සත්‍ය ධර්‍මය, ඔබ විසින් මෙන්, (පළමු කොට) දක්නා ලද්දේ ය. දුටු පරිදි දත් පරිදි ඒ ආර්‍යභූමිය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නා වූ ඔහුගේ සිත තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නො ගෙණ ආශ්‍රවයන්ගෙන් මිදුනේ ය. ගැහැවිය, යස කුලපුත්‍ර තෙමේ පෙර ගිහිකල මෙන් ගිහි වී කාමසැප විඳින්ට නුසුදුසු ම ය."

15. "යම් සේ යසකුලපුත්‍රයාගේ සිත උපාදාන රහිත ව ආශ්‍රවයන්ගෙන් මිදුනේ ද, ස්වාමීනි, යසකුලපුත්‍රයාහට එය ලාභයකි. ස්වාමීනි, යස කුලපුත්‍රයා විසින් ඒ මනා සේ ලද්දකි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පසුමහණ වූ යසකුලපුත්‍ර සමග අද මාගේ බත ඉවසන සේක්වා." භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසූ සේක.

16. ඉක්බිති සිටුගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේ ය. එකල්හි යසකුලපුත්‍ර තෙමේ සිටුගැහැවියා ගිය නො බෝ වේලාවක දී "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි" යි භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය. උන් වහන්සේ "මහණ, එව. ධර්‍මය මොනවට දෙසන ලද්දේ ය. මොනවට දුක් කෙළවර කිරීම පිණිස බ්‍රහ්මචර්‍යයෙහි හැසිරෙව" යි වදාළ සේක. බුදුන්ගේ ඒ වචනය ම ඒ ආයුෂ්මත්හුහට උපසම්පදාව වී ය.

එකල්හි ලොකයෙහි රහත්හු සත් දෙනෙක් වෙති.

**යසකුලපුත්‍රයාගේ පැවිද්ද කියා නිමවනලදී.**

---

1. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ආයස්මතා යසෙන පච්ඡාසමණෙන යෙන සෙට්ඨිස්ස ගහපතිස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ආයස්මතො යසස්ස මාතා ච පුරාණදුතියිකා ච යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තාසං භගවා ආනුපුබ්බිං කථං කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා තා භගවා අඤ්ඤාසි කල්ලචිත්තා මුදුචිත්තා විනීවරණචිත්තා උදග්ගචිත්තා පසන්නචිත්තා, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තාසං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්මං" න්ති. තා දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ' -පෙ- එතා මයං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසිකායො නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතා" ති. තා ච ලොකෙ පඨමං උපාසිකා අහෙසුං තෙවාචිකා.

2. අථ ඛො ආයස්මතො යසස්ස මාතා ච පිතා ච පුරාණදුතියිකා ච භගවන්තඤ්ච ආයස්මන්තඤ්ච යසං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදිංසු. අථ ඛො භගවා ආයස්මතො යසස්ස මාතරඤ්ච පිතරඤ්ච පුරාණදුතියිකඤ්ච ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

3. අස්සොසුං ඛො ආයස්මතො යසස්ස චත්තාරො ගිහීසහායකා බාරාණසියං සෙට්ඨානුසෙට්ඨීනං කුලානං පුත්තා **විමලො සුබාහු පුණ්ණජි ගවම්පති** "යසො කිර කුලපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො" ති. සුත්වාන නෙසං එතදහොසි: "නහ නූන සො ඔරකො ධම්මවිනයො, න සා ඔරකා පබ්බජ්ජා, යත්ථ යසො කුලපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො" ති. තෙ යෙනායස්මා යසො, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං යසං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. අථ ඛො ආයස්මා යසො තෙ චත්තාරො ගිහීසහායකෙ ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා යසො භගවන්තං එතදවොච: "ඉමෙ මෙ භන්තෙ චත්තාරො ගිහීසහායකා බාරාණසියං සෙට්ඨානුසෙට්ඨීනං කුලානං පුත්තා විමලො සුබාහු පුණ්ණජි ගවම්පති. ඉමෙ භගවා ඔවදතු අනුසාසතු" ති.

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවෙහි හැඳ පාසිවුරු ගෙණ පසු ව යන මහණ වූ ආයුෂ්මත් යස මහණහු සමග සිටුගැහැවියාගේ ගෙට වැඩිසේක. වැඩ පැණවූ අසුනෙහි හුන්සේක. ඉක්බිති ආයුෂ්මත් යසමහණහුගේ මවු ද පුරාණ භාර්‍ය්‍යාව ද භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් තැනට ගියහ. ගොස්, භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළ කථාව වදාළසේක. එනම්:- දානකථාව, ශීලකථාව, ස්වර්‍ගකථාව, කාමයන්ගේ දොෂය, ලාමකබව, කෙලෙසීමට හෙතු වනබව හා නෙක්ඛම්මයෙහි අනුසස් ද ප්‍රකාශ කළසේක. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සුදුසු සිත් ඇතියවුනැ යි ද මොලොක් සිත් ඇතියවුනැ යි ද නීවරණයන්ගෙන් තොර වූ සිත් ඇතිය-වුනැ යි ද ඔද වැඩි සිත් ඇතියවුනැ යි ද පහන්සිත් ඇතියවුනැ යි ද දත් කල්හි බුදුවරයන්ගේ තමා ම උසස් වූ ධර්‍මදෙශනාව වූ දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්‍ගසත්‍යය යන ඒ චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළසේක. යම් සේ පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයක් හොඳින් සායම් අල්ලා ගන්නේ ද, එසේම ඔවුන්ට ඒ අසුනෙහි දීම "යම් කිසිවක් හට ගැන්ම ස්වභාවය කොට ඇත්තේද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති සොතාපත්තිමග්ගඥානය උපන්නේ ය. ඔහු දක්නාලද දහම් ඇත්තෝ පැමිණි දහම් ඇත්තෝ අවබොධ කළ දහම් ඇත්තෝ වෙසෙසින් බැස ගත් දහම් ඇත්තෝ දුරු කළ සැක ඇත්තෝ පහ වූ කෙසේ කෙසේ දැ යි පැවති සැක ඇත්තෝ ආර්‍ය්‍යභාවයට පැමිණියෝ බුදුසසුනෙන් පිටත් ඇදගීමක් නැත්තෝ "ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත - පෙ - ස්වාමීනි, මේ අපි භාග්‍යවතුන් වහන්සේ ද නවලොකොත්තර ධර්‍මය ද ආර්‍ය්‍යසඞ්ඝයා වහන්සේ ද සරණ කොට යමු. භාග්‍යවතුන් වහන්සේ අද පටන් අප දිවිහිමියෙන් සරණ ගියා වූ උවැසියන් කොට දරණසේක්වා" යි දැන්වූහ. ඒ දෙදෙන ලොකයෙහි ප්‍රථම වූ තෙවාචිකඋපාසිකාවෝ වූහ.

2. ඉක්බිති ආයුෂ්මත් යසමහණහුගේ මවු හා පියා ද පුරාණ භාර්‍ය්‍යාව ද භාග්‍යවතුන් වහන්සේ හා ආයුෂ්මත් යසතෙරුන් ප්‍රණීත වූ කෑ යුතු දෙයින් හා බිදිය යුතු දෙයින් ද සියන්තින් මනා කොට සතප්පා පැරැත්ත කොට වළඳවා, වළඳා නිමවූ, පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති, භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ පසෙක හුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් යසමහණහුගේ මවු ද පියා ද පුරාණභාර්‍ය්‍යාව ද දැහැමි කතාවෙන් මනාකොට කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැඟිට වැඩිසේක.

3. ආයුෂ්මත් යසතෙරුන් වහන්සේගේ ගිහි කල්හි යහළු වූ බරණැස් නුවර සිටුඅනුසිටුකුලයන්ගේ පුත්‍ර වූ **විමල සුබාහු පුණ්ණජි** ගවම්පති යන සතර දෙන "යසකුලපුත්‍ර තෙමේ ඉසකේ රවුල් බැහැර කරවා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ යැ" යි ඇසූහ. ඇසීමෙන් ඔවුනට "යම් සස්නෙක යස තෙමේ පැවිදි වූයේ නම්, ඒ ධර්‍මවිනය (ශාසනය) ලාමක නො වේ. ඒ පැවිද්ද ලාමක නො වේ ය" යි සිතක් පහළ වූයේ ය. ඔහු ආයුෂ්මත් යසතෙරුන් හුන් තැනට ගියහ. ගොස්, ආයුෂ්මත් යසතෙරුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියාහ. ඉක්බිති ආයුෂ්මත් යසමහණතෙමේ ඒ ගිහි යහළුවන් සිව් දෙනා කැඳවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙනට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ. පසෙක හුන් ආයුෂ්මත් යසමහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, බරණැස් නුවර සිටුඅනුසිටුකුලයන්ගේ පුත්‍ර වූ විමල සුබාහු පුණ්ණජි ගවම්පති යන මේ සිව් දෙන මාගේ ගිහිකල්හි යහළුවෝ ය. භාග්‍යවතුන් වහන්සේ මොවුන්ට අවවාද කරණ සේක්වා" යි සැළ කෙළේ ය.

4. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: “යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මම්”න්ති. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: “ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද”න්ති.

“එථ භික්ඛවො”ති භගවා අවොච: “ස්වාක්ඛාතො ධම්මො. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා”ති.

සා’ව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි. අථ ඛො භගවා තෙ භික්ඛූ ධම්මියා කථාය ඔවදි. අනුසාසි. තෙසං භගවතා ධම්මියා කථාය ඔවදියමානානං අනුසාසියමානානං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

තෙන ඛො පන සමයෙන එකාදස ලොකෙ අරහන්තො හොන්ති.

## චතුගිහිසහායපබ්බජ්ජා නිට්ඨිතා.

---

1. අස්සොසුං ඛො ආයස්මතො යසස්ස පඤ්ඤාසමත්තා ගිහිසහායකා ජානපදා පුබ්බානුපුබ්බකානං කුලානං පුත්තා “යසො කිර කුලපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො”ති. සුත්වාන තෙසං එතදහොසි: “න හ නූන සො ඔරකො ධම්මවිනයො, න සා ඔරකා පබ්බජ්ජා, යත්ථ යසො කුලපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො”ති. තෙ යෙනායස්මා යසො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං යසං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. අථ ඛො ආයස්මා යසො තෙ පඤ්ඤාසමත්තෙ ගිහිසහායකෙ ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා යසො භගවන්තං එතදවොච: “ඉමෙ මෙ භන්තෙ, පඤ්ඤාසමත්තා ගිහිසහායකා ජානපදා පුබ්බානුපුබ්බකානං කුලානං පුත්තා. ඉමෙ භගවා ඔවදතු අනුසාසතූ”ති.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළකථාව වදාළ සේක. ඒ මෙසේ ය:- දානකථාව ශීලකථාව ස්වර්ගකථාව කාමයන් දුක්සහිත බව ලාමක බව කෙලෙසීමට හෙතු වනබව හා නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සත්‍යාවබෝධයට සුදුසු සිත් ඇතියවුන් කොට මොළොක් සිත් ඇතියවුන් කොට නීවරණයන්ගෙන් තොරවූ සිත් ඇතියවුන් කොට ඔද වැඩි සිත් ඇතියවුන් කොට පහන් සිත් ඇතියවුන් කොට දත් කල්හි බුදුවරයන්ගේ තමා ම උසස් වූ ධර්‍මදෙශනාව වූ දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරෝධසත්‍යය මාර්‍ගසත්‍යය යන චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළ සේක. පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයක් හොඳින් සායම් අල්ලාගන්නේ යම් සේ ද, එසේ ම ඔවුන්ට ඒ ආසනයෙහි දීම "යම් කිසිවක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාව කොට ඇතැ" යි යන පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති සෝතාපත්තිමාර්‍ගඥානය පහළ වූයේ ය. ඔහු දක්නා ලද දහම් ඇත්තෝ, පැමිණි දහම් ඇත්තෝ, අවබොධ කළ දහම් ඇත්තෝ, වෙසෙසින් බැසගත් දහම් ඇත්තෝ, දුරු කළ සැක ඇත්තෝ, පහ වූ කෙසේ කෙසේ ද යි පැවැති සැක ඇත්තෝ, නිර්භය භාවයට පැමිණියෝ, සත්‍යාවබොධයෙහි අනුන්ගේ උපකාරයක් නුවූව මනා වූවෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි කීහ.

භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එව්. ධර්‍මය මොනවට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කිරීම පිණිස බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙව්" යි වදාළ සේක. ඒ වචනය ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට දැහැමි කතාවෙන් අවවාද කළ සේක. අනුශාසනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් අවවාද කරණු ලැබූ අනුශාසනා කරණු ලැබූ ඒ භික්ෂූන්ගේ චිත්තයෝ තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නො ගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනාහ.

එකල්හි ලොකයෙහි රහත්හු එකොළොස් දෙනෙක් වෙති.

**සිවුගිහියහළුවන්ගේ පැවිද්ද කියා නිමවන ලදී.**

---

1. ආයුෂ්මත් යසභික්ෂුහුගේ පූර්‍වානුපූර්‍වකුලයන්ගේ (පරම්පර වශයෙන් පිළිවෙළින් පැරණි වූ කුලයන්ගේ) පුත්‍ර වූ දනවු වැසි පණසක් පමණ ගිහියහළුවෝ "යසකුලපුත්‍ර තෙමේ හිසකේ රවුලු බැහැර කරවා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ ය" යි ඇසුවාහු ය. අසා, ඔවුන්ට "යසකුලපුත්‍ර තෙමේ හිසකේ රවුලු බැහැර කරවා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම යම් ශාසනයෙක්හි පැවිදි වූයේ ද, ඒ ධර්‍මවිනය ඒකාන්තයෙන් ලාමක නො වේ. ඒ පැවිද්ද ලාමක නො වේ ය" යි සිතක් උපන. ඒ යහළුවෝ ආයුෂ්මත් යස භික්ෂුහු හුන් තැනට ගියහ. ගොස්, ආයුෂ්මත් යස භික්ෂුහු වැඳ පසෙක සිටියාහ. ඉක්බිති ආයුෂ්මත් යසභික්ෂුහුගේ පණසක් පමණ වූ ඒ ගිහියහළුවන් කැඳවා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙනට ගියහ. ගොස්, භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්හ. පසෙක හුන්නා වූ යසභික්ෂු තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, දනවුවැසි පරම්පරාවශයෙන් පිළිවෙළින් පැරණි වූ කුලයන්ගේ පුත්‍ර වූ පණසක් පමණ වූ මොහු මාගේ ගිහිකල්හි යහළුවෝ ය. භාග්‍යවතුන් වහන්සේ මොවුන්ට අවවාද කරණ සේක්වා. අනුශාසනා කරණ සේක්වා" යි සැලකෙළේ ය.

2. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි - පෙ - දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්ම දෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්මන්" ති. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පදන්" ති. "එථ භික්ඛවො" ති භගවා අවොච: "ස්වාක්ඛාතො ධම්මො. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති. සා'ව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි. අථ ඛො භගවා තෙ භික්ඛූ ධම්මියා කථාය ඔවදි, අනුසාසි. තෙසං භගවතා ධම්මියා කථාය ඔවදියමානානං අනුසාසියමානානං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

තෙන ඛො පන සමයෙන එකසට්ඨි ලොකෙ අරහන්තො හොන්ති.

3. අථ ඛො භගවා භික්ඛූ[1] ආමන්තෙසි: "මුත්තා'හං භික්ඛවෙ, සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා. තුම්හෙ'පි භික්ඛවෙ, මුත්තා සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා. චරථ භික්ඛවෙ, චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. මා එකෙන ද්වෙ අගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ, ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා; අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො. අහම්පි භික්ඛවෙ, යෙන **උරුවෙලා සෙනානිගමො,** තෙනුපසඞ්කමිස්සාමි ධම්මදෙසනායා" ති.

4. අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:—

"බද්ධො'සි සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා,
මහාබන්ධනබද්ධො'සි න මෙ සමණ මොක්ඛසී" ති.

1. "තෙ භික්ඛූ" - ම, ජ, සං.

Free Distribution www.aathaapi.org

2. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළකථාව දෙසූ සේක. එනම්: දානකථාව, ශීලකථාව, ස්වර්ගකථාව, කාමයන්ගේ දෝෂය ලාමකබව කෙලෙසීම, නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද යන මෙය වදාළ සේක. -(පෙ)-[1] යම් සේ පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයක් මනා කොට ම සායම් ගන්නේ ද, එපරිද්දෙන් ම ඔවුනට ඒ ආසනයෙහි දී ම "යමක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති (ශ්‍රොතාපත්ති) මාර්‍ගඥානය පහළ විය. ඔහු දක්නා ලද සිවුසස්දහම් ඇත්තාහු, පැමිණි සිවුසස්දහම් ඇත්තාහු, අවබොධ කළ සිවුසස්දහම් ඇත්තාහු, බැස ගත් සිවුසස්දහම් ඇත්තාහු, දුරු කළ සැක ඇත්තාහු, පහ වූ කෙසේ කෙසේ ද යි පැවැති සැක ඇත්තාහු, බුදුසස්නෙහි විශාරදභාවයට පැමිණියාහු, බුදුසස්නෙහි පරප්‍රත්‍යය රහිත වූවාහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි සැළ කළහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එවු. ධර්‍මය මනා කොට දෙසන ලද්දේ ය. මනා ව දුක් කෙළවර කරණු පිණිස බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙවු" යි වදාළසේක. ඒ ම ඒ ආයුෂ්මත්වරුන්ගේ උපසම්පදාව වී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට දැහැමි කථාවෙන් අවවාද කළ සේක. අනුශාසනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් අවවාද කරණු ලබන අනුශාසනා කරණු ලබන ඔවුන්ගේ චිත්තයෝ තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් නො ගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනාහු ය.

ඒ කාලයෙහි ලොකයෙහි රහත්හු එක් සැටදෙනෙක් වෙත්.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, මම දෙවියන් පිළිබඳ වූ යම් කෙලශපාශයෝ වෙත් ද, මිනිසුන් පිළිබඳ වූ යම් කෙලශපාශයෝත් වෙත් ද, ඒ සියලු කෙලශපාශයන්ගෙන් මිදුනෙමි. මහණෙනි, තෙපි ද දෙවියන් පිළිබඳ වූ යම් කෙලශපාශයෝ වෙත් ද, මිනිසුන් පිළිබඳ වූ යම් කෙලශපාශයෝත් වෙත් ද, ඒ සියලු කෙලශපාශයන්ගෙන් මිදුනහු ය. මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස ද බොහෝ දෙනාට සැප පිණිස ද ලොවට අනුකම්පා පිණිස ද දෙව් මිනිසුන්ට වැඩ පිණිස ද හිත පිණිස ද සැප පිණිස ද චාරිකාවෙහි හැසිරෙවු. දෙනමක් එක් මගින් නො යවු. මහණෙනි, ආදියෙහි යහපත් වූ මධ්‍යයෙහි යහපත් වූ අවසනැ යහපත් වූ අර්‍ථ සහිත වූ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ සියල්ලෙන් සම්පූර්‍ණ වූ ධර්‍මය දෙසවු. පිරිසිදු වූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරවු. අල්පරජස්ක වූ (ස්වල්ප වූ රාගාදී රජස් ඇති) සත්ත්වයෝ වෙති. ඔහු දහම් නො ඇසීමෙන් පිරිහෙත්. දහම් අවබොධ කරන්නෝ වන්නාහ. මහණෙනි, මමත් උරුවෙල් දනව්වෙහි සෙනානිනියම්ගමට දහම් දෙසනු පිණිස යන්නෙමි" යි වදාළ සේක.

4. එකල්හි පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ හුන් තැනට ගියේ ය. ගොස්, භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයේ ය:—

"දෙවියන් පිළිබඳ වූ ද මිනිසුන් පිළිබඳ වූ ද යම් කෙලෙස් මලපුඩු ඇද් ද, ඒ සියලු කෙලෙස් මලපුඩුවලින් බඳනාලද්දේ වෙහි ය. ඒ මහත් කෙලෙස්බැඳුමෙන් බැඳුනේ වෙහි ය. ශ්‍රමණය, මාගේ විෂයයෙන් නො මිදෙන්නෙහි ය."

1. සිවු ශිෂ්‍යයහළුවන් පිළිබඳ පැවිදිකතාවෙහි 4 වන ඡෙදය බැලිය යුතුය.

"මුත්තොහං සබ්බපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා,
මහාබන්ධනමුත්තොම්හි නිහතො ත්වමසි අන්තකා" ති.

"අන්තලික්ඛචරො පාසො ය්වායං චරති මානසො,
තෙන තං බාධයිස්සාමි න මෙ සමණ මොක්ඛසී" ති.

"රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා,
එත්ථ මෙ විගතො ඡන්දො නිහතො ත්වමසි අන්තකා" ති.

අථ ඛො මාරො පාපිමා "ජානාති මං භගවා. ජානාති මං සුගතො"ති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායී ති.

**මාරකථා එකාදසමී නිට්ඨිතා.**

---

1 තෙන ඛො පන සමයෙන භික්ඛූ නානාදිසා නානාජනපදා පබ්බජ්ජාපෙඛෙ උපසම්පදාපෙඛෙ[1] ආනෙන්ති: "භගවා නෙ පබ්බාජෙස්සති. උපසම්පාදෙස්සතී" ති. තත්ථ භික්ඛූ චෙව කිලමන්ති පබ්බජ්ජාපෙඛා ච උපසම්පදාපෙඛා ච. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "එතරහි ඛො භික්ඛූ නානාදිසා නානා-ජනපදා පබ්බජ්ජාපෙඛෙ උපසම්පදාපෙඛෙ ආනෙන්ති, භගවා නෙ පබ්බාජෙස්සති, උපසම්පාදෙස්සතී" ති. තත්ථ භික්ඛූ චෙව කිලමන්ති, පබ්බජ්ජාපෙඛා ච උපසම්පදාපෙඛා ච. යන්නූනාහං භික්ඛූනං අනුජානෙය්‍යං: "තුම්හෙව'දානි භික්ඛවෙ, තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පාදෙථා"ති.

2. අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "ඉධ මය්හං භික්ඛවෙ රහොගතස්ස පටිසල්ලී-නස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'එතරහි ඛො භික්ඛූ නානාදිසා නානාජනපදා පබ්බජ්ජාපෙඛෙ උපසම්පදාපෙඛෙ ආනෙන්ති - භගවා නෙ පබ්බාජෙස්සති, උපසම්පාදෙස්සතී ති. තත්ථ භික්ඛූ චෙව කිලමන්ති පබ්බජ්ජාපෙඛා ච උපසම්පදාපෙඛා ච. යන්නූනාහං භික්ඛූනං අනුජානෙය්‍යං- තුම්හෙව'දානි භික්ඛවෙ තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ. උපසම්පාදෙථා"ති.

---

1. "පබ්බජ්ජාපෙක්ඛෙ ච උපසම්පදාපෙක්ඛෙ ච" - ම, ඡ, සං

"මම දෙවියන් පිළිබඳ වූ ද මිනිසුන් පිළිබඳ වූ ද යම් කෙලෙස් මලපුඬු කෙනෙක් වෙද් ද, ඒ සියලු පාසයන්ගෙන් මිදුනෙම් වෙමි. ඒ මහත් කෙලෙස් බැඳුමෙන් මිදුනෙම් වෙමි. මාරය, තෝ නැසුනේ වෙහි ය."

"අහස හැසිරෙණ අන්තලික්ඛචර * නම් වූ සිතෙහි හටගත්තා වූ යම් මේ රාගපාසයක් වේ ද එයින් තා බඳින්නෙමි. ශ්‍රමණය, මාගේ විෂයයෙන් නො මිදෙන්නෙහි ය."

"සිත්කලු වූ රූපයෝ ද ශබ්දයෝ ද රසයෝ ද ගන්ධයෝ ද ස්පර්ශයෝ ද යන මේ පස්කම් කෙරෙහි පැවැති මාගේ ආලය වෙසෙසින් පහ ව ගියේ ය. මාරය තෝ නැසුනේ වෙහි ය."

එකල්හි පවිටු මාර තෙමේ "භාග්‍යවතුන් වහන්සේ මා දන්නා සේක. සුගතයන් වහන්සේ මා දන්නා සේකැ" යි දුක් ඇත්තේ නොසතුටු සිත් ඇත්තේ එහි ම නො පෙණී ගියේ ය.

**එකොළොස්වන මාරකතාව නිමි.**

---

1. එකල්හි භික්ෂූහු නොයෙක් දිශාවන්ගෙන් නොයෙක් ජනපදයන්ගෙන් ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයන් ද උපසම්පදාපෙක්ෂකයන් ද "බුදුරජානන් වහන්සේ ඔවුන් පැවිදි කරණසේක. උපසපන් කරණසේකැ" යි සිතා කැඳවා ගෙණ එත්. එයින් භික්ෂූහු ද ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයෝ ද උපසම්පදාපෙක්ෂකයෝ ද වෙහෙසට පැමිණෙත්. එකල්හි රහොගත වූ විවේකයට පැමිණියාවූ භාග්‍යවතුන් වහන්සේට "මෙකල්හි වනාහි භික්ෂූහු 'භාග්‍යවතුන් වහන්සේ පැවිදි කරන්නාහ. උපසපන් කරන්නාහ' යි නොයෙක් දිශාවන්ගෙන් නොයෙක් ජනපදයන්ගෙන් ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයන් ද උපසම්පදාපෙක්ෂකයන් ද ගෙණ එත්. එයින් භික්ෂූහු ද ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයෝ ද උපසම්පදාපෙක්ෂකයෝ ද වෙහෙසට පත් වෙති. 'මහණෙනි, මෙකල තෙපි ම ඒ ඒ දිශාවන්හි ම ඒ ඒ ජනපදයන්හි ම පැවිදි කරවු. උපසම්පදා කරවු' යි මම භික්ෂූන්ට අනුදන්නෙම් නම් යෙහෙකැ" යි කල්පනාවක් පහළ වූයේ ය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස්කාලයෙහි විවේකයෙන් නැගී සිටිසේක් මෙ නිදානයෙහි මේ ප්‍රථම කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, මෙහි රහොගත වූ විවේකයට පැමිණ හුන්නා වූ මාගේ සිතට මෙබඳු පරිවිතර්කයක් පහළ වී ය: "මෙකල්හි භික්ෂූහු 'භාග්‍යවතුන් වහන්සේ පැවිදි කරන්නාහ. උපසපන් කරන්නාහ' යි නොයෙක් දිශාවන්ගෙන් නොයෙක් ජනපදයන්ගෙන් ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයන් ද උපසම්පදාපෙක්ෂකයන් ද ගෙණ එත්. එයින් භික්ෂූහු ද ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයෝ ද උපසම්පදාපෙක්ෂකයෝ ද වෙහෙසට පැමිණෙත්. මහණෙනි, මෙකල තෙපි ම ඒ ඒ දිශාවන්හි ම ඒ ඒ ජනපදයන්හි ම පැවිදි කරවු. උපසම්පදා කරවු' ය යි මම භික්ෂූන්ට අනුදන්නෙම් නම් යෙහෙකැ" යි කියායි.

---

* උපග්‍රන්ථය බලනු.

3. අනුජානාමි භික්ඛවෙ, තුම්හෙව'දානි තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ. උපසම්පාදෙථාති. එවඤ්ච පන භික්ඛවෙ, පබ්බාජෙතබ්බො. උපසම්පාදෙතබ්බො. පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා[1] එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා එවං වදෙහීති වත්තබ්බො:

"බුද්ධං සරණං ගච්ඡාමි,
ධම්මං සරණං ගච්ඡාමි,
සඞ්ඝං සරණං ගච්ඡාමි,

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි,
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි,
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි,

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි,
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි,
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි."

අනුජානාමි භික්ඛවෙ, ඉමෙහි තීහි සරණගමනෙහි පබ්බජ්ජං උපසම්පදන්ති.

**තීහි සරණගමනෙහි පබ්බජ්ජාඋපසම්පදාකථා ද්වාදසමී නිට්ඨිතා.**

---

1. අථ ඛො භගවා වස්සං වුත්ථො[2] භික්ඛූ ආමන්තෙසි: "මය්හං ඛො භික්ඛවෙ, යොනිසො මනසිකාරා යොනිසො සම්මප්පධානා අනුත්තරා විමුත්ති අනුප්පත්තා. අනුත්තරා විමුත්ති සච්ඡිකතා. තුම්හෙ'පි භික්ඛවෙ, යොනිසො මනසිකාරා යොනිසො සම්මප්පධානා අනුත්තරං විමුත්තිං අනුපාපුණාථ. අනුත්තරං විමුත්තිං සච්ඡිකරොථා" ති.

2. අථ ඛො මාරො පාපිමා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:--

"බද්ධො'සි මාරපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා,
මාරබන්ධනබද්ධො'සි න මෙ සමණ මොක්ඛසී" ති.

"මුත්තො'හං මාරපාසෙහි යෙ දිබ්බා යෙ ච මානුසා,
මාරබන්ධනමුත්තො'ම්හි නිහතො ත්වමසි අන්තකා" ති.

අථ ඛො මාරො පාපිමා "ජානාති මං භගවා, ජානාති මං සුගතො" ති දුක්ඛී දුම්මනො තත්ථෙවන්තරධායී.

1. "අච්ඡාපෙත්වා" ම, ජ, සං, 2. "වුට්ඨො" - ම, ජ, සං,

3. මහණෙනි, මෙකල තෙපි ම ඒ ඒ දිශාවන්හි ම ඒ ඒ ජනපදයන්හි ම පැවිදි කරවු. උපසම්පදා කරවු යි අනුදනිමි. මහණෙනි, මෙසේ පැවිදි කළ යුතු ය. උපසපන් කළ යුතු ය: පළමු කොට හිසකේ රවුල් බා කසාවත් අඳවා උතුරුසඟසිවුර එකස් කරවා භික්ෂූන්ගේ පා වඳවා උක්කුටුකයෙන් හිඳුවා ඇඳිලි බඳවා මෙසේ කියව යි කිය යුතු ය:

"බුදුන් සරණ යෙමි
දහම් සරණ යෙමි
සඟ සරණ යෙමි

දෙවනු ද බුදුන් සරණ යෙමි
දෙවනු ද දහම් සරණ යෙමි
දෙවනු ද සඟ සරණ යෙමි

තෙවනු ද බුදුන් සරණ යෙමි
තෙවනු ද දහම් සරණ යෙමි
තෙවනු ද සඟ සරණ යෙමි" යි.

මහණෙනි, මේ ත්‍රිවිධ වූ සරණගමනින් පැවිදි බව හා උපසම්පදාව ද අනුදනිමි යි වදාළ සේක.

**දෙලොස් වින සරණගමනින් (වන) පැවිද්ද හා උපසම්පදාව පිළිබඳ කථාව නිමි.**

---

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වස් වුසූ සේක් භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, මවිසින් උපාය වශයෙන් මෙනෙහි කිරීමෙන් ද උපායයෙන් මනා සේ ප්‍රදහන වීර්‍ය්‍ය කිරීමෙන් ද නිරුත්තර වූ අර්හත්ඵලවිමුක්ති තොමෝ ලබනලද්දී ය. නිරුත්තර වූ අර්හත්ඵලවිමුක්ති තොමෝ ප්‍රත්‍යක්ෂ කරණ ලද්දී ය. මහණෙනි, තෙපි ද උපායවශයෙන් මෙනෙහි කිරීමෙන් ද උපායයෙන් මනා සේ ප්‍රදහන වීර්‍ය්‍ය කිරීමෙන් ද නිරුත්තර වූ අර්හත්ඵල-විමුක්තියට පැමිණෙවු. නිරුත්තර වූ අර්හත්ඵලවිමුක්තිය ප්‍රත්‍යක්ෂ කරවු."

2. ඉක්බිති පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් (මෙසේ) කීයේ ය:

"දෙවියන් පිළිබඳ වූ ද මිනිසුන් පිළිබඳ වූ ද යම් මාරපාශ කෙනෙක් වෙත් නම්, ඒ සියලු මාරපාශවලින් බැඳුනේ වෙහි ය. මාරබන්ධනවලින් බඳනා ලද්දෙහි ය. ශ්‍රමණය, මාගේ විෂයයෙන් නො මිදෙන්නෙහි ය."

"මම දෙවියන් පිළිබඳ වූ ද මිනිසුන් පිළිබඳ වූ ද යම් මාරපාශ කෙනෙක් වෙත් නම්, ඒ සියලු මාරපාශවලින් මිදුනෙම් වෙමි. මරබැඳුම්වලින් මිදුනෙම් වෙමි. මාරය, තෝ නැසුනේ වෙහි ය."

ඉක්බිති පවිටු මාර තෙමේ "භාග්‍යවතුන් වහන්සේ මා දන්නා සේක. සුගතයන් වහන්සේ මා දන්නාසේකැ" යි දුක් ඇත්තේ නො සතුටු සිත් ඇත්තේ එහි ම අතුරුදහන් වූයේ ය.

3. අථ ඛො භගවා **බාරාණසියං** යථාභිරන්තං විහරිත්වා යෙන **උරුවෙලා** තෙන චාරිකං පක්කාමි. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන අඤ්ඤතරො වනසණ්ඩො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං වනසණ්ඩං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

4. තෙන ඛො පන සමයෙන තිංසමත්තා **භද්දවග්ගියා** සහායකා සපජාපතිකා තස්මිං වනසණ්ඩෙ පරිචාරෙන්ති. එකස්ස පජාපති නාහොසි. තස්ස අත්ථාය වෙසී ආනීතා අහොසි. අථ ඛො සා වෙසී තෙසු පමත්තෙසු පරිචාරෙන්තෙසු භණ්ඩං ආදාය පලායිත්ථ.

5. අථ ඛො තෙ සහායකා සහායකස්ස වෙය්‍යාවච්චං කරොන්තා තං ඉත්ථිං ගවෙසන්තා තං වනසණ්ඩං ආහිණ්ඩන්තා අද්දසංසු භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං. දිස්වාන යෙන භගවා තෙනුප-සඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං: එතදවොචුං: "අපි භන්තෙ, භගවා ඉත්ථිං [1] පස්සෙය්‍යා" ති. "කිම්පන වො කුමාරා, ඉත්ථියා!" ති. ඉධ මයං භන්තෙ, තිංසමත්තා භද්දවග්ගියා සහායකා සපජාපතිකා ඉමස්මිං වනසණ්ඩෙ පරිචාරිම්හා. එකස්ස පජාපති නාහොසි. තස්ස අත්ථාය වෙසී ආනීතා අහොසි. අථ ඛො සා භන්තෙ, වෙසී අම්හෙසු පමත්තෙසු පරිචාරෙන්තෙසු භණ්ඩං ආදාය පලායිත්ථ. තෙ මයං භන්තෙ, සහායකා සහායකස්ස වෙය්‍යාවච්චං කරොන්තා තං ඉත්ථිං ගවෙසන්තා ඉමං වනසණ්ඩං ආහිණ්ඩාමා" ති.

6. "තං කිං මඤ්ඤථ වො කුමාරා, - කතමං නු ඛො තුම්හාකං වරං, යං වා තුම්හෙ ඉත්ථිං ගවෙසෙය්‍යාථ, යං වා අත්තානං ගවෙසෙය්‍යාථා?" ති "එතදෙව භන්තෙ, අම්හාකං වරං, - යං මයං අත්තානං ගවෙසෙය්‍යාමා" ති. "තෙන හි වො කුමාරා, නිසීදථ. ධම්මං වො දෙසිස්සාමී" ති. "එවං භන්තෙ" ති ඛො තෙ භද්දවග්ගියා සහායකා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

1. "එකං ඉත්ථිං" - ම, ඡ, සං

Free Distribution www.aathaapi.org

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **බරණැස්** නුවර කැමැති තාක් කල් වාසය කොට **උරුවෙල්** දනව්වට වැඩි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් බැහැර ව එක්තරා වනලැහැබකට වැඩිසේක. වැඩ ඒ වනලැහැබට ඇතුල් ව එක්තරා ගසක් මුල වැඩ හුන්සේක.

4. එකල්හි තිසක් පමණ යහළු වූ **භද්‍රවර්ගිකයෝ** බිරියන් සහිත වූවාහු ඒ වනලැහැබෙහි ඔබිනොබ හැසිරෙත්. එකකුට බිරියක් නො වූ ය. ඔහු සඳහා වෙසඟනක් ගෙණෙන ලද්දී ය. එකල්හි ඒ වෙසඟන ඔවුන් පමා ව ඉඳුරන් පිණවන කල්හි (ඔවුන්ගේ) බඩු ගෙණ පලා ගියා ය.

5. එකල්හි ඒ යහළුවෝ යහළුවාට උපකාර කරමින් ඒ ස්ත්‍රිය සොයමින් ඒ වනලැහැබෙහි ඇවිදින්නාහු එක්තරා ගසක් මුල වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුවාහු ය. දැක භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේට ''කිමෙක් ද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ස්ත්‍රියක දුටු සේක් ද?'' යි ඇසූහ. ''කුමාරයෙනි, තොපට ස්ත්‍රියගෙන් කම් කිම?'' ''ස්වාමීනි, මෙහි තිසක් පමණ වූ භාර්‍ය්‍යාවන් සහිත වූ භද්‍රවර්ගික යහළුවෝ වූ අපි මේ වනලැහැබෙහි හැසුරුණෙමු. එකකුට භාර්‍ය්‍යාවක් නො වූ ය. ඔහු පිණිස ගණිකාවක් ගෙණෙන ලද්දී ය. ඒ වෙසඟන තොමෝ අප පමා ව ඉඳුරන් පිණවන කල්හි (අප සතු) බඩු පැහැර ගෙණ පලා ගියා ය. ස්වාමීනි, යහළු වූ අපි (අපගේ) යහළුවාගේ මෙහෙ කරමින් ඒ ස්ත්‍රිය සොයමින් මේ වන ලැහැබෙහි ඇවිදිමු'' යි කීහ.

6. ''කුමාරයෙනි, තෙපි ඒ කුමැ යි සිතවූ ද? තෙපි ස්ත්‍රියක හෝ සොයවූ ද, තමන් හෝ සොයවූ ද, යන යමක් ඇත් ද, මෙදෙකින් තොපට කවරක් උතුම් ද?'' ''ස්වාමීනි, යම් හෙයකින් අපි තමන් සොයන්නෙමු නම් මෙය ම අපට උතුම් වේ''. ''කුමාරයිනි, එසේ වී නම්, තෙපි මෙහි හිඳිවූ. තොපට මම දහම් දෙසන්නෙමි''. ''ස්වාමීනි, එසේ ය'' යි යහළු වූ ඒ භද්‍රවර්ගිකයෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්හ.



Free Distribution www.aathaapi.org

6. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය, එවමෙව තෙසං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම"න්ති. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද"න්ති. "එථ භික්ඛවො" ති භගවා අවොච "ස්වාක්ඛාතො ධම්මො. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා"ති. සා'ව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

**භද්දවග්ගියසහායකානං වත්ථු නිට්ඨිතං.**

**දුතියභාණවාරං.**

---

1. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන **උරුවෙලා** තදවසරි. තෙන ඛො පන සමයෙන උරුවෙලායං තයො ජටිලා පටිවසන්ති: **උරුවෙලකස්සපො නදීකස්සපො ගයාකස්සපො** ති. තෙසු උරුවෙලකස්සපො ජටිලො පඤ්චන්නං ජටිලසතානං නායකො හොති විනායකො අග්ගො පමුඛො පාමොක්ඛො. නදීකස්සපො ජටිලො තිණ්ණං ජටිලසතානං නායකො හොති විනායකො අග්ගො පමුඛො පාමොක්ඛො. ගයාකස්සපො ජටිලො ද්වින්නං ජටිලසතානං නායකො හොති විනායකො අග්ගො පමුඛො පාමොක්ඛො.

Free Distribution www.aathaapi.org

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළකථාව වදාළ සේක. ඒ කවරේ ද යත්: දානකථාව සීලකථාව ස්වර්ගකථාව කාමයන්ගේ දෝෂය ලාමකභාවය කෙලෙසීම පැවිද්දෙහි අනුසස් ද (යන මේය) පැවසූහ. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සුදුසු සිත් ඇත්තන් මොළොක් සිත් ඇත්තන් නීවරණ රහිත වූ සිත් ඇත්තන් ඔදවැඩි සිත් ඇත්තන් පහන් සිත් ඇත්තන් යි දත්සේක් ද, එකල්හි බුදුවරුන්ගේ තමා ම උසස් වූ ධර්ම දෙශනාවක් වී ද, දුඃඛසත්‍යය සමුදය සත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන ඒ චතුස්සත්‍යය දෙසූහ. පහ වූ කිලිටි ඇති පිරිසිදු වස්ත්‍රයක් යම් සේ මනා කොට ම සායම් ගන්නේ ද, එ පරිද්දෙන් ම ඔවුන්ට ඒ ආසනයෙහි දී ම "යම් කිසිවක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදි රජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති සොතාපත්තිමගඥණය උපන්නේ ය. දක්නාලද සිවුසස් දහම් ඇති පැමිණි සිවුසස්දහම් ඇති අවබොධ කළ සිවුසස්දහම් ඇති හාත්පසින් බැස ගත් සිවුසස්දහම් ඇති දුරු කළ විචිකිච්ඡා ඇති පහ වූ කෙසේ කෙසේ දැ යි පැවති සැක ඇති විශාරද භාවයට පැමිණි ශාස්තෘශාසනාවබොධයෙහි අන් පිහිටක් වුව මනා නැති ඔහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, එවු. ධර්මය මනා කොට දෙශනා කරණ ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරණ පිණිස බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙවු ය" යි වදාළ සේක. ඒ ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වි ය.

භද්‍රවර්ගික වූ යහළුවන්ගේ කථාවස්තුව නිමි.

**දෙවන බණවර නිමි.**

---

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙමින් **උරුවෙල්** දනව්වට වැඩිසේක. ඒ කාලයෙහි උරුවෙලාවෙහි **උරුවෙලකාශ්‍යප නදීකාශ්‍යප ගයාකාශ්‍යප** ය යි ජටිලයෝ තිදෙනෙක් වාසය කරත්. ඔවුන් අතුරෙන් උරුවෙලකාශ්‍යපජටිල තෙමේ පන්සියයක් ජටිලයන්ට නායක වේ. (තම ලබ්ධිය ගන්වන බැවින්) විනායක වේ. අග්‍ර වේ. ප්‍රමුඛ වේ. ආචාර්‍ය්‍ය වේ. නදීකාශ්‍යප ජටිල තෙමේ තුන්සියයක් ජටිලයන්ට නායක වේ. විනායක වේ. අග්‍ර වේ. ප්‍රමුඛ වේ. ආචාර්‍ය්‍ය වේ. ගයාකාශ්‍යප ජටිල තෙමේ දෙසියයක් ජටිලයන්ට නායක වේ. විනායක වේ. අග්‍ර වේ. ප්‍රමුඛ වේ. ආචාර්‍ය්‍ය වේ.

2. අථ ඛො භගවා යෙන උරුවෙලකස්සපස්ස ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උරුවෙලකස්සපං ජටිලං එතදවොච: "සචෙ තෙ කස්සප, අගරු, වසෙය්‍යාම එකරත්තිං[1] අග්‍යාගාරෙ" ති. "න ඛො මෙ මහාසමණ, ගරු. චණ්ඩෙත්ථ නාගරාජා ඉද්ධිමා ආසීවිසො ඝොරවිසො. සො තං මා විහෙඨෙසී" ති. දුතියම්පි ඛො භගවා උරුවෙලකස්සපං ජටිලං එතදවොච: "සචෙ තෙ කස්සප, අගරු, වසෙය්‍යාම එකරත්තිං අග්‍යාගාරෙ" ති. "න ඛො මෙ මහාසමණ, ගරු. චණ්ඩෙත්ථ නාගරාජා ඉද්ධිමා ආසීවිසො ඝොරවිසො. සො තං මා විහෙඨෙසී" ති. තතියම්පි ඛො භගවා උරුවෙලකස්සපං ජටිලං එතදවොච: "සචෙ තෙ කස්සප, අගරු, වසෙය්‍යාම එකරත්තිං අග්‍යාගාරෙ" ති. "න ඛො මෙ මහාසමණ, ගරු චණ්ඩෙත්ථ නාගරාජා ඉද්ධිමා ආසීවිසො. සො තං මා විහෙඨෙසී" ති. "අප්පෙව නාම[2] මං න විහෙඨෙය්‍ය, ඉඞ්ඝ ත්වං කස්සප, අනුජානාහි අග්‍යාගාර" න්ති. "විහර මහාසමණ, යථාසුඛ" න්ති. අථ ඛො භගවා අග්‍යාගාරං පවිසිත්වා තිණසන්ථරකං පඤ්ඤාපෙත්වා නිසීදි පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

3. අථ ඛො සො නාගො අද්දස භගවන්තං පවිට්ඨං.[3] 'දිස්වාන දුම්මනො[4] පධූපායි. අථ ඛො භගවතො එතදහොසි: "යන්නූනාහං ඉමස්ස නාගස්ස අනුපහච්ච ඡවිඤ්ච චම්මඤ්ච මංසඤ්ච නහාරුඤ්ච අට්ඨිඤ්ච අට්ඨිමිඤ්ජඤ්ච තෙජසා තෙජං පරියාදියෙය්‍ය" න්ති. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා පධූපායි. අථ ඛො සො නාගො දුක්ඛං අසහමානො පජ්ජලි. භගවාපි තෙජොධාතුං සමාපජ්ජිත්වා පජ්ජලි. උභින්නං සජොතිභූතානං අග්‍යාගාරං ආදිත්තං විය හොති සම්පජ්ජලිතං සජොතිභූතං. අථ ඛො තෙ ජටිලා අග්‍යාගාරං පරිවාරෙත්වා එවමාහංසු: "අභිරූපො වත භො මහාසමණො නාගෙන විහෙඨීයතී" ති. අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන තස්ස නාගස්ස අනුපහච්ච ඡවිඤ්ච චම්මඤ්ච මංසඤ්ච නහාරුඤ්ච අට්ඨිඤ්ච අට්ඨිමිඤ්ජඤ්ච තෙජසා තෙජං පරියාදියිත්වා පත්තෙ පක්ඛිපිත්වා උරුවෙලකස්සපස්ස ජටිලස්ස දස්සෙසි: "අයං තෙ කස්සප, නාගො. පරියාදින්නො අස්ස තෙජසා තෙජො" ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො. යත්‍ර හි නාම චණ්ඩස්ස නාගරාජස්ස ඉද්ධිමතො ආසීවිසස්ස ඝොරවිසස්ස තෙජසා තෙජං පරියාදියිස්සති. නත්වෙව ච ඛො අරහා යථා අහ" න්ති.

1. "රත්තං" ම. ජ. සං; තො. වි; ම. නු; P. T. S. 2. "අප්පෙව" ම ජ. සං. P T. S.
3. "අද්දසා ඛො සො නාගො භගවන්තං පවිට්ඨං" ම. ජ. සං.
"අථ ඛො සො නාගො භගවන්තං පවිට්ඨං අද්දස" P. T. S.
"අථ ඛො සො නාගො භගවන්තං පවිට්ඨං දිස්වාන" ම. නු. ප; ජ. පු; අ. වි.
4 "දුක්ඛී දුම්මනො" P. T. S.

Free Distribution www.aathaapi.org

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ අසපුවට වැඩිසේක. වැඩ “කාශ්‍යපය, ඉදින් ඔබට බරක් නැති නම් එක් රැයක් ගිනිහල්ගෙයි වසන්නෙමු” යි උරුවෙලකාශ්‍යපජටිලයාට වදාළසේක. “මහාශ්‍රමණය, මට කිසි බරක් නැත. මෙහි චණ්ඩ වූ සෘද්ධි ඇති වහා පැතිරෙණ විස ඇති දරුණු විස ඇති නාරජෙක් වෙයි. ඒ නාරජ තෙමේ නුඹවහන්සේ නො වෙහෙසාවා” යි (උරුවෙලකාශ්‍යප තෙමේ කී ය). දෙවනු ද භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යප ජටිලයාහට “කාශ්‍යපය, ඉදින් ඔබට බරක් නො වේ නම්, එක් රැයක් ගිනිහල්ගෙයි වසන්නෙමු” යි වදාළ සේක. “මහා ශ්‍රමණය, මට කිසි බරක් නැත. මෙහි චණ්ඩ වූ සෘද්ධි ඇති වහා පැතිරෙණ විස ඇති දරුණු විස ඇති නාරජෙක් වෙයි. හේ නුඹවහන්සේ නො වෙහෙසාවා” යි (කී ය). තෙවනු ද භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාහට “කාශ්‍යපය, ඔබට කිසි බරක් නො වේ නම්, එක් රැයක් ගිනිහල්ගෙයි වසන්නෙමු” යි වදාළසේක. “මහා ශ්‍රමණය, මට කිසි බරක් නැත. මෙහි චණ්ඩ වූ සෘද්ධි ඇති වහා පැතිරෙණ විස ඇති දරුණු විස ඇති නාරජෙක් වෙයි. හේ නුඹවහන්සේ නො වෙහෙසාවා” යි (කී ය). “මා නො පෙළන්නේ නම් මැනවි. කාශ්‍යපය, ඔබ ගිනිහල්ගෙය අනුදනමැනැවැ” යි වදාළසේක. (එවිට කාශ්‍යප තෙමේ) “මහාශ්‍රමණය, සැප සේ වාසය කරව” යි කීයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගිනිහල්ගෙට ඇතුල් ව තණඇතිරිය පණවා පලඟ බැඳ කය කෙළින් තබා සිහිය එළවා වැඩ හුන්සේක.

3. එකල්හි ඒ නාගතෙමේ (ගිනිහල්ගෙට) ඇතුල් වූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක නො සතුටු සිත් ඇත්තේ තදින් දුමා ගියේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේට “මම මේ නාගයාගේ සිවිය ද සම ද මස් ද නහර ද ඇට ද ඇටමිදුලු ද නො ගටා සියතෙදින් ඔහුගේ තෙද නසන්නේ නම් යෙහෙකැ” යි මෙබඳු සිතක් උපන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එබඳු වූ සෘද්ධියක් කොට තදින් දුමා ගියහ. එකල්හි ඒ නාග තෙමේ කොපය නො ඉවසන්නේ වැඩියක් ඇවිළ ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ද තෙජොධාතුවට සම්වැද වැඩියක් ඇවිළ ගත්හ. දෙදෙනා ගිනිදැල් සහිත වූ කල්හි (ඇවිළ ගත්කල්හි) ගිනිහල්ගෙය ගින්නෙන් ඇවිළ ගත්තා සේ වෙයි. හාත්පසින් දිලිසුනේ වෙයි. ගිනිදැල් සහිත වෙයි. එකල්හි ඒ ජටිලයෝ ගිනිහල්ගෙය පිරිවරා “භවත්නි, මනා රූ ඇති මහාශ්‍රමණ තෙමේ ඒකාන්තයෙන් නාගයා විසින් වෙහෙසනුලැබේ ය” යි කීහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැ ඇවෑමෙන් ඒ නාගයාගේ සිවිය ද සම ද මස් ද නහර ද ඇට ද ඇටමිදුලු ද නො ගටා සිය තෙදින් ඔහුගේ තෙද අබිබවා පාත්‍රයෙහි බහා “කාශ්‍යපය, මේ තාගේ නාගතෙමේ ය. මොහුගේ තෙද මාගේ තෙදින් අභිභවනය කරණලදැ” යි උරුවෙලකාශ්‍යපජටිලයාහට දැක්වූහ. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට “යමෙක් චණ්ඩ වූ සෘද්ධි ඇති වහා පැතිරෙණ විස ඇති දරුණු විස ඇති නාරජුගේ තෙද සියතෙදින් නසන්නේ ද, ඒ මහාශ්‍රමණ තෙමේ මහත් සෘද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ ම ය” යි මේ අදහස වී ය.

4 නෙරඤ්ජරායං භගවා උරුවෙලකස්සපං ජටිලමවොච,
සචෙ තෙ කස්සප අගරු විහරෙමු අජ්ජුණ්හො අග්ගිසරණම්හීති[1]

න ඛො මෙ මහාසමණ ගරු ඵාසුකාමොව තං නිවාරෙමි,
චණ්ඩෙත්ථ නාගරාජා ඉද්ධිමා ආසීවිසො ඝොරවිසො
සො තං මා විහෙඨෙසීති.

අප්පෙව මං න විහෙඨෙය්‍ය ඉඞ්ඝ ත්වං කස්සප
අනුජානාහි අග්‍යාගාරන්ති
දින්නන්ති නං විදිත්වා අසම්භීතො පාවිසි භයමතීතො.

දිස්වා ඉසිං පවිට්ඨං අහිනාගො දුම්මනො පධූපායි,
සුමනමනසො [2] අධිමනො මනුස්සනාගොපි තත්ථ පධූපායි.

මක්ඛඤ්ච අසහමානො අහිනාගො පාවකොව පජ්ජලි,
තෙජොධාතුසු කුසලො මනුස්සනාගො'පි තත්ථ පජ්ජලි.

උභින්නං සජොතිභූතානං අග්‍යාගාරං උදිච්චරෙ ජටිලා[3],
අභිරූපො වත භො මහාසමණො නාගෙන විහෙඨීයතීති භණන්ති.

අථ රත්තියා[4] අච්චයෙන අහිනාගස්ස[5] අච්චියො න හොන්ති,
ඉද්ධිමතො පනුට්ඨිතා[6] අනෙකවණ්ණා අච්චියො හොන්ති

නීලකා [7] අථ ලොහිතිකා මඤ්ජෙට්ඨා පීතිකා [8] ඵලිකවණ්ණායො,
අඞ්ගීරසස්ස කායෙ අනෙකවණ්ණා අච්චියො හොන්ති.

පත්තම්හි ඔදහිත්වා අහිනාගං බ්‍රාහ්මණස්ස දස්සෙසි,
අයං තෙ කස්සප නාගො පරියාදින්නො අස්ස තෙජසා තෙජොති.

5. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො භගවතො ඉමිනා ඉද්ධිපාටිහාරියෙන අභිප්පසන්නො භගවන්තං එතදවොච: "ඉධෙව මහාසමණ, විහර. අහං තෙ ධුවභත්තෙනා"ති.

**පඨමං පාටිහාරියං.**

---

1. "අජ්ජණ්හො අග්ගිසාලම්හී"ති - ම ජ. සං. P. T S. 2. "සුමනසො අවිමනො"
3. "උභින්නං සජොතිභූතානං අග්‍යාගාරං ආදිත්තං හොති සම්පජ්ජලිතං සජොතිභූතං උදිච්චරෙ ජටිලා"-ම. ජ. සං.
4. "අථ තස්සා රත්තියා" - ම. ජ. සං "අථ ඛො තස්සා රත්තියා" P. T. S.
5. "යථා නාගස්ස" ම, ජ, සං, 6. "පනඨිතා"-ම. ජ. සං; තො. වි; P. T. S.
7. "නීලා" ම. ජ. සං 8. "පීතකා" - ම ජ. සං. P. T. S.

4. භාග්‍යවතුන් වහන්සේ නෙරඤ්ජරා ගඟ සමීපයෙහි විසූ උරුවෙල-කාශ්‍යපජටිලයාහට "කාශ්‍යපය, ඉදින් ඔබට බරක් නො වේ නම්, අද එක් දිනක් ගිනිහල්ගෙයි වසමු" යි වදාළසේක.

මහාශ්‍රමණය, මට කිසි බරක් නැත්තේ ම ය. මේ ගිනිහල්ගෙයි චණ්ඩ වූ සෘද්ධි ඇති ආශීවිස වූ දරුණු විස ඇති නාරජෙක් වෙසෙයි. 'හේ නුඹවහන්සේ නො වෙහෙසාවා' යි නුඹවහන්සේට පහසු කැමැත්තේ ම නුඹවහන්සේ වළකා ලමි.

ඒ නාරජතෙමේ මා නො වෙහෙසන්නේ නම් මැනවි. කාශ්‍යපය, තෝ ගිනිහල්ගෙය අනුදනුව. 'ඒ ගිනිහල්ගෙය දෙන ලද්දේ ය' යි දැන බිය ඉක්මවූයේ නැති ගැණීම් රහිත වූයේ ගිනිහල්ගෙට පිවිසියේ ය.

නාරජතෙමේ (ගිනිහල්ගෙය තුළට) පිවිසි බුදුරජුන් දැක නො සතුටු සිත් ඇත්තේ තදින් දුමා ගියේ ය. (පූර්ණ වූ) බුදුවරුන් හා සමසිත් ඇති උසස් සිත් ඇති මනුෂ්‍යශ්‍රෙෂ්ඨ තෙමේ ද තදින් දුමා ගියේ ය.

නාරජතෙමේ කොපය ද නො ඉවසන්නේ ගින්නක් සේ තදින් ඇවිළුනේ ය. එහි දී තෙජොධාතුසමාපත්තිවිෂයයෙහි දක්ෂ වූ මනුෂ්‍යශ්‍රෙෂ්ඨ තෙමේ ද තදින් ඇවිළුනේ ය.

දෙදෙන ගිනිදැල් සහිත වූ කල්හි (ගින්නෙන් ඇවිළ ගත් කල්හි) ජටිලයෝ ගිනිහල්ගෙය දෙස බැලූහ. නොහොත් පිරිවැරූහ. 'භවත්නි, මනා රූ ඇති මහාශ්‍රමණතෙමේ නාරජු විසින් වෙහෙසනුලැබේ ය යි කියත්.

ඉක්බිති රෑ ඉක්ම යාමෙන් නාරජුගේ ගිනිදැල් නො වෙයි. සෘද්ධිමත් බුදුරජානන් වහන්සේගේ (සිරුරෙන්) නැඟී සිටි නොයෙක් පැහැ ඇති රශ්මීහු වෙත්.

එකල්හි බුදුරජානන් වහන්සේගේ සිරුරෙහි හටගත් නිල්වන් වූ ද ලේවන් වූ ද මදටවන් වූ ද රත්වන් වූ ද පළිඟුවන් වූ ද රශ්මීහු නන් පැහැ ඇත්තෝ වෙත්.

නාරජු පාත්‍රයෙහි බහා "කාශ්‍යපය, මේ තොපගේ නාරජතෙමේ ය. මොහුගේ තෙද මාගේ තෙදින් හාත්පසින් මැඩගන්නා ලද්දේ ය" යි බ්‍රාහ්මණයාහට දැක්වූසේක.

5. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ මේ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන් වෙසෙසින් පහන් වූයේ "මහාශ්‍රමණය, මෙහි ම වාසය කරවු. මම නුඹවහන්සේට නිති බතින් උපස්ථාන කරමි" යි භාග්‍යවතුන් වහන්සේට කීයේ ය.

**ප්‍රථමප්‍රාතිහාර්‍ය්‍යය නිමි.**

6. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස අස්සමස්ස අවිදූරෙ අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ විහාසි. අථ ඛො චත්තාරො මහාරාජා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං වනසණ්ඩං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා චතුද්දිසා අට්ඨංසු සෙය්‍යථාපි මහන්තා අග්ගික්ඛන්ධා.

අථ ඛො උරුවෙලකස්සපො ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: ''කාලො මහාසමණ, නිට්ඨිතං භත්තං. කෙ නු ඛො තෙ මහාසමණ, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං වනසණ්ඩං ඔභාසෙත්වා යෙන ත්වං තෙනුපසඞ්කමිංසු? උපසඞ්කමිත්වා තං අභිවාදෙත්වා චතුද්දිසා අට්ඨංසු සෙය්‍යථාපි මහන්තා අග්ගික්ඛන්ධා?''ති.

''එතෙ ඛො කස්සප, චත්තාරො මහාරාජා යෙනාහං තෙනුපසඞ්කමිංසු ධම්මසවණාය''ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: ''මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම චත්තාරොපි මහාරාජා උපසඞ්කමිස්සන්ති ධම්මසවණාය. නත්වෙව ච ඛො අරහා යථා අහ''න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස භත්තං භුඤ්ජිත්වා තස්මිංයෙව වනසණ්ඩෙ විහාසි.

**දුතියං පාටිහාරියං.**

---

7. අථ ඛො සක්කො දෙවානමින්දො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං වනසණ්ඩං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. සෙය්‍යථාපි මහා අග්ගික්ඛන්ධො පුරිමාහි වණ්ණනිභාහි අභික්කන්තතරො ච පණීතතරො ච.

අථ ඛො උරුවෙලකස්සපො ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: ''කාලො මහාසමණ, නිට්ඨිතං භත්තං. කො නු ඛො සො මහාසමණ, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං වනසණ්ඩං ඔභාසෙත්වා යෙන ත්වං තෙනුපසඞ්කමි? උපසඞ්කමිත්වා තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි සෙය්‍යථාපි මහා අග්ගික්ඛන්ධො පුරිමාහි වණ්ණනිභාහි අභික්කන්තතරො ච පණීතතරො ච?''

6. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ අසපුවට නුදුරෙහි එක්තරා වනලැහැබෙක්හි විසූසේක. එකල්හි සතර වරම්මහරජහු රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ටශරීරවර්ණ ඇත්තාහු සියලු වනලැහැබ බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියාහු ය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ මහත් ගිනිකඳන් සේ සිව්දිග සිටියාහු ය.

ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලතෙමේ ඒ රැය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේගෙන් ''මහාශ්‍රමණය, මේ සුදුසුකාලය වේ. බත නිමවී ය. මහාශ්‍රමණය, රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ටශරීරවර්ණ ඇති ඒ කවර කෙනෙක් මුළු වනලැහැබ බබුළුවා නුඹවහන්සේ වෙතට පැමිණියාහු ද? පැමිණ නුඹවහන්සේ වැඳ මහත් වූ ගිනිකඳන් සේ සිව්දිග සිටියාහුද?' යි ඇසී ය.

''කාශ්‍යපය, ඒ සතරවරම්මහරජහු දහම් අසනු පිණිස මා වෙතට පැමිණියාහු ය''යි(වදාළසේක). එකල්හි උරුවෙලකාශ්‍යපජටිලයාහට ''සමකු කරා සතරවරම්මහරජහු දහම් අසනු පිණිස පැමිණෙන්නාහු ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් සෘඞි ඇත්තේ ම වේ. මහත් අනුභාව ඇත්තේ ම වේ. එනෙත් මා මෙන් රහත් නො වේ ම ය'' යි සිතක් උපන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ බත වළඳා ඒ වනලැහැබෙහි ම විසූසේක.

**ද්විතියප්‍රාතිහාය‍ර්‍යය යි.**

---

7. ඉක්බිති සක්දෙව්රජතෙමේ රෑ පෙරයම් ඉක්ම ගිය කල්හි විශිෂ්ට ශරීරවර්ණ ඇත්තේ සියලු වනලැහැබ බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක සිටියේ ය. මහගිනිකඳක් සේ පළමු **පැහැයටත්** වඩා අතිශයින් විශිෂ්ට වූයේ ද අතිශයින් ප්‍රණීත වූයේ ද වි ය.

ඉක්බිති උරුවෙලකාශ්‍යපතෙමේ ඒ රෑ ඉක්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ''මහාශ්‍රමණය, මේ සුදුසු කාලය යි. බත නිමියේ ය. මහාශ්‍රමණය, රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ටශරීරවර්ණ ඇති කාවරෙක් වනලැහැබ බබුළුවා ඔබවහන්සේ වෙතට පැමිණියේ ද? පැමිණ නුඹ වහන්සේ වැඳ පසෙක සිටියේ ද? හේ මහ ගිනිකඳක් සේ පළමු වූ පැහැසටහන්වලට වඩා අතිශයින් විශිෂ්ට වූයේ ද අතිශයින් ප්‍රණීත වූයේ ද වී ය'' යි කීයේ ය.

"එසො ඛො කස්සප, සක්කො දෙවානමින්දො යෙනාහං තෙනුපසඞ්කමි ධම්මසවණායා"ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම සක්කොපි දෙවානමින්දො උපසඞ්කමිස්සති ධම්මසවණාය. නත්වෙව ච ඛො අරහා යථා අහ"න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස භත්තං භුඤ්ජිත්වා තස්මිංයෙව වනසණ්ඩෙ විහාසි.

**තතියං පාටිහාරියං.**

---

8. අථ ඛො **බ්‍රහ්මා සහම්පති** අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං වනසණ්ඩං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි සෙය්‍යථාපි මහා අග්ගික්ඛන්ධො පුරිමාහි වණ්ණනිභාහි අභික්කන්තතරො ච පණීතතරො ච.

9. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "කාලො මහාසමණ, නිට්ඨිතං භත්තං. කො නු ඛො සො මහාසමණ, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං වනසණ්ඩං ඔභාසෙත්වා යෙන ත්වං තෙනුපසඞ්කමි? උපසඞ්කමිත්වා තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි සෙය්‍යථාපි මහා අග්ගික්ඛන්ධො පුරිමාහි වණ්ණනිභාහි අභික්කන්තතරො ච පණීතතරො චා?"ති.

"එසො ඛො කස්සප, බ්‍රහ්මා සහම්පති යෙනාහං තෙනුපසඞ්කමි ධම්මසවණායා"ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම බ්‍රහ්මාපි සහම්පති උපසඞ්කමිස්සති ධම්මසවණාය. නත්වෙව ච ඛො අරහා යථා අහ"න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස භත්තං භුඤ්ජිත්වා තස්මිංයෙව වනසණ්ඩෙ විහාසි.

**චතුත්ථං පාටිහාරියං.**

---

10. තෙන ඛො පන සමයෙන උරුවෙලකස්සපස්ස ජටිලස්ස මහායඤ්ඤො පච්චුපට්ඨිතො හොති. කෙවලකප්පා ච අඞ්ගමගධා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය අභික්කමිතුකාමා හොන්ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "එතරහි ඛො මෙ මහායඤ්ඤො පච්චුපට්ඨිතො. කෙවලකප්පා ච අඞ්ගමගධා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය අභික්කමිස්සන්ති. සචෙ මහාසමණො මහාජනකායෙ ඉද්ධිපාටිහාරියං කරිස්සති, මහාසමණස්ස ලාභසක්කාරො අභිවඩ්ඪිස්සති. මම ලාභසක්කාරො පරිහායිස්සති. අහො නූන මහාසමණො ස්වාතනාය නාගච්ඡෙය්‍යා"ති.

"කාශ්‍යපය, දෙවියන්ට අධිපති වූ ශක්‍රතෙමේ දහම් අසනු පිණිස මා වෙතට පැමිණියේ ය" යි (වදාළසේක). එකල්හි උරුවෙලකාශ්‍යප ජටිලයාහට "යමකු තරා දෙවියන්ට අධිපති වූ ශක්‍රතෙමේත් දහම් අසනු පිණිස පැමිණෙන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් සෘද්ධි ඇත්තේ ම ය, මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මැ" යි සිතක් උපන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යප ජටිලයාගේ බත වළඳා ඒ වනලැහැබෙහි ම විසූසේක.

**තෘතියප්‍රාතිහාර්‍ය්‍යය යි.**

---

8. ඉක්බිති **සහම්පති** බ්‍රහ්මතෙමේ රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ටශරීරවර්ණ ඇත්තේ වනලැහැබ බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක සිටියේ ය. මහාගිනිකඳක් සේ පළමු පැහැසටහන්වලට වඩා අතිශයින් විශිෂ්ට වූයේ ද, අතිශයින් ප්‍රණීත වූයේ ද වි ය.

9. ඉක්බිති උරුවෙලකාශ්‍යප ජටිලතෙමේ ඒ රෑ ඉක්ම ගිය පසු භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේට "මහාශ්‍රමණය, මේ සුදුසු කාලය යි. බත නිමවූයේ ය. මහාශ්‍රමණය, රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ටශරීරවර්ණ ඇති ඒ තවරෙක් වනලැහැබ බබුළුවා ඔබවහන්සේ වෙතට පැමිණියේ ද, පැමිණ ඔබ වහන්සේ වැඳ පසෙක සිටියේ ද? හේ මහාගිනිකඳක් සේ පළමු පැහැසටහන් වලට වඩා අතිශයින් විශිෂ්ට වූයේ ද අතිශයින් ප්‍රණීත වූයේ ද වී ය" යි කීයේ ය.

"කාශ්‍යපය, සහම්පති බ්‍රහ්මතෙමේ දහම් ඇසීම පිණිස මා වෙත පැමිණියේ" යි වදාළසේක. එකල්හි උරුවෙලකාශ්‍යපජටිලයාහට "යමකු තරා සහම්පති බ්‍රහ්මයාත් දහම් ඇසීම පිණිස පැමිණෙන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් සෘද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ ම ය" යි සිතක් උපන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ බත වළඳා ඒ වනලැහැබෙහි ම විසූසේක.

**චතුර්ථප්‍රාතිහාර්‍ය්‍යය යි.**

---

10. එකල්හි උරුවෙලකාශ්‍යපජටිලයාගේ මහායාගයක් එළඹ සිටියේ වෙයි. මුළු අඟුමගධදනවුවැස්සෝ බොහෝ වූ කෑයුතු දේත් බිදියයුතු දේත් ගෙණ එළඹෙනු කැමැත්තෝ වෙති. එකල්හි උරුවෙලකාශ්‍යපජටිලයාහට "දැන් මාගේ මහායාගය එළඹ සිටියේ ය. අඟුමගධදනවුවැස්සෝ බොහෝ වූ කෑයුතු දේත් බිදියයුතු දේත් ගෙණ එළඹෙන්නාහු ය. ඉදින් මහාශ්‍රමණ තෙමේ මහාජනසමූහයා මැද සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යයක් කෙළේ නම්, මහාශ්‍රමණයාගේ ලාභසත්කාර ය වැඩෙන්නේ ය. මගේ ලාභසත්කාරය පිරිහෙන්නේ ය. එහෙයින් මහාශ්‍රමණතෙමේ හෙට නො එන්නේ නම් යෙහෙකැ" යි මෙබඳු සිතක් උපන්නේ ය.

11. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය උත්තරකුරුං ගන්ත්වා තතො පිණ්ඩපාතං ආහරිත්වා අනොතත්තදහෙ පරිභුඤ්ජිත්වා තත්ථෙව දිවාවිහාරං අකාසි.

12. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "කාලො මහාසමණ. නිට්ඨිතං භත්තං. කින්නු ඛො මහාසමණ, හීයො නාගමාසි? අපි ච මයං තං සරාම: 'කින්නු ඛො මහාසමණො නාගච්ඡතී?' ති. ඛාදනීයස්ස ච භොජනීයස්ස ච තෙ පටිවිංසො[1] ඨපිතො"ති.

13. "නනු තෙ කස්සප, එතදහොසි: එතරහි ඛො මෙ මහායඤ්ඤො පච්චුපට්ඨිතො. කෙවලකප්පා ච අඞ්ගමගධා පහූතං ඛාදනීයං භොජනීයං ආදාය අභික්කමිස්සන්ති. සචෙ මහාසමණො මහාජනකායෙ ඉද්ධිපාටිහාරියං කරිස්සති, මහාසමණස්ස ලාභසක්කාරො අභිවඩ්ඪිස්සති. මම ලාභසක්කාරො පරිහායිස්සති. අහො නූන මහාසමණො ස්වාතනාය නාගච්ඡෙය්‍යා?"ති.

14. "සො ඛො අහං කස්සප, තව චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය **උත්තරකුරුං** ගන්ත්වා තතො පිණ්ඩපාතං ආහරිත්වා **අනොතත්තදහෙ** පරිභුඤ්ජිත්වා තත්ථෙව දිවාවිහාරං අකාසි"න්ති.

15. අථ ඛො උරුවෙලකස්සපස්සජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම චෙතසා'පි චිත්තං පජානිස්සති. නත්වෙව ච ඛො අරහා යථා අහ"න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස භත්තං භුඤ්ජිත්වා[2] තස්මිංයෙව වනසණ්ඩෙ විහාසි.

**පඤ්චමං පාටිහාරියං.**

---

1 "පටිවීංසො" - ම. ඡ. සං. P. T. S. 2. "පරිභුඤ්ජි" P. T. S.

Free Distribution www.aathaapi.org

11. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ කල්පනාව සියසිතින් දැන **උතුරුකුරු**දිවයිනට වැඩ එයින් පිණ්ඩපාතය ගෙණවුත් **අනවතප්ත**විල සමීපයෙහි දී වළඳා එහි ම දිවාවිහරණය කළසේක.

12. එකල්හි උරුවෙලකාශ්‍යප ජටිලතෙමේ ඒ රැය ඉක්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ''මහාශ්‍රමණය, මේ සුදුසු කාලය යි. බත නිමවූයේ ය. මහාශ්‍රමණය, කුමක් නිසා ඊයේ නො ආවහු ද? එහෙත් 'අපි මහාශ්‍රමණතෙමේ කුමක් නිසා නො ඒ ද?' යි ඔබවහන්සේ සිහිපත් කෙළෙමු. කෑ යුතු දෙය ද බිදියයුතු දෙය ද පිළිබඳ ඔබ වහන්සේගේ කොටස තබා ලද්දේ ය'' යි කීයේ ය.

13. 'කාශ්‍යපය, නුඹට 'දැන් මාගේ මහායාගය එළඹ සිටියේ ය. **අඟුමගධ**දනවුවැසි ඉතා වැඩි දෙනෙක් බොහෝ වූ කෑ යුතු දේත් බිදිය යුතු දේත් ගෙණ එළඹෙන්නාහු ය. ඉදින් මහාශ්‍රමණ තෙමේ මහාජනසමූහයා මැද සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යයක් කරන්නේ නම්, මහාශ්‍රමණයාගේ ලාභසත්කාරය වැඩෙන්නේ ය. මගේ ලාභසත්කාර පිරිහෙන්නේ ය. එහෙයින් මහාශ්‍රමණ තෙමේ හෙට නො එන්නේ නම් යෙහෙකැ' යි මෙබඳු සිතක් නො වූයේ ද?

14. ''කාශ්‍යපය, ඒ මම නුඹගේ සිත මා සිතින් දැන උතුරුකුරු දිවයිනට ගොස් එයින් පිණ්ඩපාතය ගෙණවුත් අනවතප්තවිල සමීපයෙහි දී වළඳා එහි ම දිවාවිහරණය කෙළෙමි'' යි වදාළසේක.

15. එකල්හි උරුවෙලකාශ්‍යපජටිලයාහට ''සමෙක් සිය සිතින් අනුන්ගේ සිත දැන ගන්නේ ද, ඒ මහාශ්‍රමණ තෙමේ මහත් සෘද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මැ'' යි සිතක් වූයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ බත වළඳා ඒ වනලැහැබෙහි ම විසූසේක.

**පස්වම ප්‍රාතිහාර්‍ය්‍යය යි.**

---

1. තෙන ඛො පන සමයෙන භගවතො පංසුකූලං උප්පන්නං හොති. අථ ඛො භගවතො එතදහොසි: "කත්ථ නු ඛො අහං පංසුකූලං ධොවෙය්‍ය?" න්ති. අථ ඛො **සක්කො දෙවානමින්දො** භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය පාණිනා පොක්ඛරණිං ඛණිත්වා භගවන්තං එතදවොච: "ඉධ භන්තෙ, භගවා පංසුකූලං ධොවතූ" ති. අථ ඛො භගවතො එතදහොසි: "කිම්හි නු ඛො අහං පංසුකූලං පරිමද්දෙය්‍ය?" න්ති අථ ඛො සක්කො දෙවානමින්දො භගවතො චෙතසා චෙතොපරිවිතක්ක-මඤ්ඤාය මහතිං සිලං උපනික්ඛිපි: "ඉධ භන්තෙ, භගවා පංසුකූලං පරිමද්දතූ" ති. අථ ඛො භගවතො එතදහොසි: "කිම්හි නු ඛො අහං ආලම්බිත්වා උත්තරෙය්‍ය?" න්ති. අථ ඛො කකුධෙ අධිවත්ථා දෙවතා භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සාඛං ඔනාමෙසි [1] "ඉධ භන්තෙ, භගවා ආලම්බිත්වා උත්තරතූ" ති. අථ ඛො භගවතො එතදහොසි: "කිම්හි නු ඛො අහං පංසුකූලං විස්සජ්ජෙය්‍ය?" න්ති. අථ ඛො සක්කො දෙවානමින්දො භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය මහතිං සිලං උපනික්ඛිපි: "ඉධං භන්තෙ, භගවා පංසුකූලං විස්සජ්ජෙතූ" ති.

2. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "කාලො මහාසමණ, නිට්ඨිතං භත්තං. කින්නු ඛො මහාසමණ, නායං පුබ්බෙ ඉධ පොක්ඛරණී, සායං ඉධ පොක්ඛරණී? නයිමා සිලා පුබ්බෙ උපනික්ඛිත්තා. කෙනිමා සිලා උපනික්ඛිත්තා? නයිමස්ස කකුධස්ස පුබ්බෙ සාඛා ඔනතා, සායං සාඛා ඔනතා?" ති.

3. "ඉධ මෙ කස්සප, පංසුකූලං උප්පන්නං අහොසි. තස්ස මය්හං කස්සප, එතදහොසි: 'කත්ථ නු ඛො අහං පංසුකූලං ධොවෙය්‍ය?' න්ති. අථ ඛො කස්සප, සක්කො දෙවානමින්දො මම චෙතසා චෙතොපරිවිතක්ක-මඤ්ඤාය පාණිනා පොක්ඛරණිං ඛණිත්වා මං එතදවොච: 'ඉධ භන්තෙ, භගවා පංසුකූලං ධොවතූ' ති. සායං අමනුස්සෙන පාණිනා ඛතා [2] පොක්ඛරණී. තස්ස මය්හං කස්සප, එතදහොසි. 'කිම්හි නු ඛො අහං පංසුකූලං පරිමද්දෙය්‍ය?' න්ති. අථ ඛො කස්සප, සක්කො දෙවානමින්දො මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය මහතිං සිලං උපනික්ඛිපි: 'ඉධ භන්තෙ, භගවා පංසුකූලං පරිමද්දතූ' ති. සායං අමනුස්සෙන උපනික්ඛිත්තා සිලා. තස්ස මය්හං කස්සප, එතදහොසි: 'කිම්හි නු ඛො අහං ආලම්බිත්වා උත්තරෙය්‍ය?' න්ති. අථ ඛො කස්සප, කකුධෙ අධිවත්ථා දෙවතා මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සාඛං ඔනාමෙසි: 'ඉධ භන්තෙ, භගවා ආලම්බිත්වා උත්තරතූ' ති. ස්වායං ආහරහත්ථො කකුධො. තස්ස මය්හං කස්සප, එතදහොසි: 'කිම්හි නු ඛො අහං පංසුකූලං විස්සජ්ජෙය්‍ය?' න්ති. අථ ඛො කස්සප, සක්කො දෙවානමින්දො මම චෙතසා චෙතොපරිවිතක්ක-මඤ්ඤාය මහතිං සිලං උපනික්ඛිපි: 'ඉධ භන්තෙ භගවා පංසුකූලං විස්සජ්ජෙතූ' ති. සායං අමනුස්සෙන උපනික්ඛිත්තා සිලා" ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම සක්කොපි දෙවානමින්දො වෙය්‍යාවච්චං කරිස්සති. නත්වෙව ච ඛො අරහා යථා අහ" න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස භත්තං භුඤ්ජිත්වා තස්මිංයෙව වනසණ්ඩෙ විහාසි.

1. "ඔනාමෙසි" P. T. S    2. "ඛණිතා" ම, ඡ, සං; P. T. S

Free Distribution www.aathaapi.org

1. එකල්හි භාග්‍යවතුන් වහන්සේට පංසුකූලයක් උපන්නේ ය. එවිට උන්වහන්සේට "මම කොතැන්හි දී පංසුකූලය සෝදන්නෙම් දැ?" යි සිතක් පහළ වූයේ ය. අනතුරු ව දෙවියන්ට අධිපති වූ ශක්‍රතෙමේ භාග්‍ය වතුන් වහන්සේගේ සිත තම සිතින් දැන අතින් පොකුණක් හාරා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි පංසුකූලය සෝදන සේක්වා" යි සැළ කෙළේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මම කුමක ලා පංසුකූලය පිරිමදින්නෙම් දැ?" යි සිතක් වි ය. ඉක්බිති සක්දෙව්රජතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ චිත්තපරිතර්කය තම සිතින් දැන "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි පංසුකූලය පිරිමදිනසේක්වා" යි මහත් ගලක් එළවා තැබුයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මම කොතැනක එල්බී ගොඩ නගින්නෙම්දැ?" යි සිතක් වූයේය. ඉක්බිති කුඹුක්ගසෙහි අරක් ගත් දේවතාතොමෝ භාග්‍යවතුන් වහන්සේගේ සිත තම සිතින් දැන "භාග්‍යවතුන් වහන්සේ මෙහි එල්බී ගොඩ නගිනසේක් වා" යි අත්තක් නැමූ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මම පංසුකූලය කොතැනක දිග හරින්නෙම් (-වනම් දැ යි) සිතක් වූයේ ය. ඉක්බිති සක්දෙව්රජතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සිත තම සිතින් දැන "භාග්‍යවතුන් වහන්සේ පංසුකූලය මෙහි දිග හරිණ(වනන)සේක්වා" යි මහත් ගලක් එළවා තැබුයේ ය.

2. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලතෙමේ ඒ රැය ඉක්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියේ ය. පැමිණ "මහාශ්‍රමණය, මේ සුදුසු කාලය යි. බත නිමවූයේ ය. මහාශ්‍රමණය, කිමෙක් ද? මේ පොකුණ පෙර මෙහි නො වී ය. මෙහි ඒ මේ පොකුණ දැන් තිබේ. පෙර මේ ගල නො තිබුනි. කවරකු විසින් මේ ගල තබන ලද්දේ ද? පෙර මේ කුඹුක් ගසේ අත්ත නො නැමින. දැන් ඒ මේ අත්ත නැමිනැ" යි කීයේ ය.

3. "කාශ්‍යපය, මෙහි දී මට පංසුකූලයක් උපන්නේ ය. 'කොතැනක මම පංසුකූලය සෝදන්නෙම් දැ?' යි ඒ මට සිතක් උපන. කාශ්‍යපය, ඉක්බිති සක්දෙව්රජ තෙමේ තමසිතින් මාගේ සිත දැන අතින් පොකුණක් හාරා මට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පංසුකූලය මෙහි සෝදනසේක්වා' යි කීයේ ය. ඒ මේ පොකුණ නො මිනිසකු අතින් සාරණලද්දේ ය. කාශ්‍යපය, ඒ මට 'මම කො තැනක පංසුකූලය පිරිමදින්නෙම් දැ?' යි සිතක් වූයේ ය. කාශ්‍යපය, ඉක්බිති සක්දෙව්රජ තෙමේ තම සිතින් මාගේ සිත දැන 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පංසුකූලය මෙහි පිරිමදිනසේක්වා' යි මහත් ගලක් එළවා තැබුවේ ය. ඒ මේ ගල නො මිනිසකු විසින් එළවා තබන ලද්දේ ය. 'කාශ්‍යපය, ඒ මට මම කො තැනක එල්බී ගොඩ නගින්නෙම් දැ' යි සිතක් උපන්නේ ය. ඉක්බිති කාශ්‍යපය, කුඹුක්ගසෙහි අරක්ගත් දෙවතාතොමෝ තම සිතින් මාගේ සිත දැන 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි එල්බී ගොඩ නගිනසේක්වා" යි අත්තක් නැමූ ය. ඒ මේ කුඹුක්ගස "ස්වාමීනි, අත දෙව" යි කියන්නා සේ ය. කාශ්‍යපය, ඒ මට 'මම පංසුකූලය කො තැනක දිග හරින්නෙම් දැ?' යි සිතක් වි ය. ඉක්බිති කාශ්‍යපය, සක්දෙව්රජ තෙමේ තම සිතින් මාගේ සිත දැන 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි පංසුකූලය දිග හරිණසේක්වා' යි මහත් ගලක් එළවා තැබුයේ ය. ඒ මේ ගල නො මිනිසකු විසින් එළවා තබන ලද්දේ ය" යි (වදාළසේක.) ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට "සක්දෙව්රජතෙමේත් යම් මහාශ්‍රමණයකුට වතාවත් කරන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් සෘද්ධිඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මය" යි සිතක් වූයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ බත වළඳා ඒ වනලැහැබෙහි ම විසූ සේක.

4. අථ ඛො **උරුවෙලකස්සපො** ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො කාලං ආරොචෙසි: "කාලො මහාසමණ, නිට්ඨිතං භත්ත" න්ති. "ගච්ඡ, කස්සප, [1] ආයාමහ"න්ති. උරුවෙලකස්සපං ජටිලං උය්‍යොජෙත්වා යාය ජම්බුයා **ජම්බුදීපො** පඤ්ඤායති තතො ඵලං ගහෙත්වා පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසීදි. අද්දසා ඛො උරුවෙලකස්සපො ජටිලො භගවන්තං අග්‍යාගාරෙ නිසින්නං. දිස්වාන භගවන්තං එතදවොච: "කතමෙන ත්වං මහාසමණ, මග්ගෙන ආගතො? අහං තයා පඨමතරං පක්කන්තො. සො ත්වං පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසින්නො" ති. "ඉධාහං කස්සප, තං උය්‍යොජෙත්වා යාය ජම්බුයා ජම්බුදීපො පඤ්ඤායති, තතො ඵලං ගහෙත්වා පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසින්නො. ඉදං ඛො කස්සප, ජම්බුඵලං වණ්ණසම්පන්නං ගන්ධසම්පන්නං රසසම්පන්නං. සචෙ ආකඞ්ඛසි පරිභුඤ්ජා" ති. "අලං, මහාසමණ, ත්වං යෙවෙතං [2] ආහරසි, [3] ත්වං යෙවෙතං පරිභුඤ්ජා" ති. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො. යත්‍ර හි නාම මං පඨමතරං උය්‍යොජෙත්වා යාය ජම්බුයා ජම්බුදීපො පඤ්ඤායති, තතො ඵලං ගහෙත්වා පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසීදිස්සති. නත්වෙව ච ඛො අරහා යථා අහ"න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපස්ස ජටිලස්ස භත්තං භුඤ්ජිත්වා තස්මිංයෙව වනසණ්ඩෙ විහාසි.

5. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො කාලං ආරොචෙසි: "කාලො මහාසමණ, නිට්ඨිතං භත්ත"න්ති. "ගච්ඡ, කස්සප, ආයාමහ"න්ති උරුවෙලකස්සපං ජටිලං උය්‍යොජෙත්වා යාය ජම්බුයා ජම්බුදීපො පඤ්ඤායති, තස්සා අවිදූරෙ අම්බො -පෙ- තස්ස අවිදූරෙ ආමලකී -පෙ- තස්සා අවිදූරෙ හරීතකී -පෙ- තස්සා අවිදූරෙ -පෙ- තාවතිංසං ගන්ත්වා පාරිච්ඡත්තකපුප්ඵං ගහෙත්වා පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසීදි. අද්දසා ඛො උරුවෙලකස්සපො ජටිලො භගවන්තං අග්‍යාගාරෙ නිසින්නං. දිස්වාන භගවන්තං එතදවොච: "කතමෙන ත්වං මහාසමණ, මග්ගෙන ආගතො. අහං තයා පඨමතරං පක්කන්තො. සො ත්වං පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසින්නො"ති. "ඉධාහං කස්සප, තං උය්‍යොජෙත්වා තාවතිංසං ගන්ත්වා පාරිච්ඡත්තකපුප්ඵං ගහෙත්වා පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසින්නො. ඉදං ඛො කස්සප, පාරිච්ඡත්තකපුප්ඵං වණ්ණසම්පන්නං ගන්ධසම්පන්න"න්ති. [4] අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම මං පඨමතරං උය්‍යොජෙත්වා තාවතිංසං ගන්ත්වා පාරිච්ඡත්තකපුප්ඵං ගහෙත්වා පඨමතරං ආගන්ත්වා අග්‍යාගාරෙ නිසීදිස්සති. නත්වෙව ච ඛො අරහා යථා අහ" න්ති.

1. "ගච්ඡ ත්වං කස්සප" ම, ජ, සං; P. T. S 2. "ත්වංයෙව තං; ම, ජ, සං P. T. S
3. "අරහසි" ම, ජ, සං;
4 "සචෙ ආකඞ්ඛසි ගණ්හාහි. අලං මහාසමණ, ත්වං යෙව තං අරහසි ත්වං යෙව තං ගණ්හාහි" ම, ජ, සං; P. T. S

4. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලතෙමේ ඒ රැය ඉක්ම ගිය පසු භාග්‍යවතුන් වහන්සේ වෙනට පැමිණියේ ය. පැමිණ ''මහාශ්‍රමණය, සුදුසු කාලය වේ. බත නිමියේ ය'' යි කල් දැන්වී ය. ''කාශ්‍යපය, යව. මම පසු ව එමි'' යි උරුවෙලකාශ්‍යපජටිලයා යවා දඹදිව යම් දඹගසකින් ප්‍රසිද්ධ වේ ද, ඒ දඹගසින් ගෙඩියක් ගෙණ පළමු කොට අවුත් ගිනිහල්ගෙයි වැඩ හුන්සේක. උරුවෙලකාශ්‍යපජටිල තෙමේ ගිනිහල්ගෙයි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක ''මහාශ්‍රමණය, ඔබ කවර මගකින් ආසේක් ද? මම ඔබට පළමු ව පිටත් වූයෙමි. ඒ ඔබ පළමු කොට අවුත් ගිනිහල්ගෙයි හුන්සේකැ'' යි කීයේ ය. ''කාශ්‍යපය, මෙහි මම ඔබ පිටත් කොට, දඹදිව යම් දඹගසකින් ප්‍රසිද්ධ වේ ද ඒ ගසින් ගෙඩියක් ගෙණ පළමු කොට අවුත් ගිනිහල්ගෙයි හුන්නෙමි. කාශ්‍යපය, මේ දඹගෙඩිය පැහැයෙන් පිරිපුන් ය. සුවඳින් පිරිපුන් ය. රසයෙන් පිරිපුන් ය. ඉදින් කැමැත්තෙහි නම් අනුභව කරව'' යි වදාළ සේක. ''මහාශ්‍රමණය, කම් නැත. ඔබ ම මේ දඹගෙඩිය ගෙණ ආසේක. ඔබ ම මෙය අනුභව කරණු මැනැව.'' ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට ''යමෙක් මා පළමු කොට පිටත් කර යවා, දඹදිව යම් දඹගසකින් ප්‍රසිද්ධ වේ ද, ඒ දඹගසින් ගෙඩියක් ගෙණ පළමුකොට අවුත් ගිනිහල්ගෙයි හුන්නේ ද, ඒ මහාශ්‍රමණ තෙමේ මහත් ඍද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ ම ය'' යි සිතක් වූයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාගේ බත වළඳා ඒ වනලැහැබෙහි ම විසූසේක.

5 ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලතෙමේ ඒ රැය ඉක්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ''මහාශ්‍රමණය, මේ සුදුසු කාලය වේ. බත නිමියේ ය'' යි කල් දැන්වී ය. ''කාශ්‍යපය, යව, මම එමි'' යි උරුවෙලකාශ්‍යපජටිලයා පිටත් කර යවා දඹදිව යම් දඹගසකින් ප්‍රසිද්ධ වේ ද, ඒ දඹගසට නුදුරෙහි අඹගසක් වේ. -පෙ- ඒ අඹගසට නුදුරෙහි නෙල්ලිගසක් වේ. -පෙ- ඒ නෙල්ලිගසට නුදුරෙහි අරළුගසක් වේ. -පෙ- තව්තිසා දෙව්ලොවට වැඩ පරසතුමලක් ගෙණ පළමු කොට අවුත් ගිනිහල්ගෙයි වැඩහුන් සේක. උරුවෙලකාශ්‍යප ජටිලතෙමේ ගිනිහල්ගෙයි වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේට ''මහාශ්‍රමණය, නුඹවහන්සේ කිනම් මගකින් ආසේක් ද? මම නුඹවහන්සේට වඩා පළමු කොට පිටත් වූයෙම් වෙමි. ඒ නුඹවහන්සේ පළමු කොට අවුත් ගිනිහල්ගෙයි හුන්සේකැ'' යි කීයේ ය. ''කාශ්‍යපය, මම මෙහි ඔබ පිටත් කර යවා තාවතිංසයට ගොස් පරසතුමලක් ගෙණ පළමුකොට අවුත් ගිනිහල්ගෙයි හුන්නෙම් වෙමි. කාශ්‍යපය, මේ පරසතුමල පැහැයෙන් යුක්ත ය. සුවඳින් යුක්ත ය'' යි වදාළසේක. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට ''යමෙක් මා පළමු කොට පිටත් කර යවා තාවතිංසයට ගොස් පරසතුමලක් ගෙණ පළමු කොට අවුත් ගිනිහල්ගෙයි හුන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් ඍද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මැ'' යි සිතක් වූයේ ය.


Free Distribution www.aathaapi.org

6. තෙන ඛො පන සමයෙන තෙ ජටිලා අග්ගිං පරිචරිතුකාමා න සක්කොන්ති කට්ඨානි ඵාලෙතුං. අථ ඛො තෙසං ජටිලානං එතදහොසි: “නිස්සංසයං ඛො මහාසමණස්ස ඉද්ධානුභාවො, යථා මයං න සක්කොම කට්ඨානි ඵාලෙතු”න්ති. අථ ඛො භගවා **උරුවෙලකස්සපං** ජටිලං එතදවොච: “ඵාලීයන්තු කස්සප, කට්ඨානී?”ති. “ඵාලීයන්තු මහාසමණා”ති. සකිදෙව පඤ්ච කට්ඨසතානි ඵාලීයිංසු. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: “මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම කට්ඨානිපි න ඵාලීයිස්සන්ති.[1] නත්වෙව ච ඛො අරහා යථා අහ”න්ති.

7. තෙන ඛො පන සමයෙන තෙ ජටිලා අග්ගිං පරිචරිතුකාමා න සක්කොන්ති අග්ගිං ජාලෙතුං. අථ ඛො තෙසං ජටිලානං එතදහොසි: “නිස්සංසයං ඛො මහාසමණස්ස ඉද්ධානුභාවො, යථා මයං න සක්කොම අග්ගිං ජාලෙතු”න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපං ජටිලං එතදවොච: “උජ්ජාලීයන්තු කස්සප, අග්ගී?”ති. “උජ්ජාලීයන්තු මහාසමණා”ති. සකිදෙව පඤ්ච අග්ගිසතානි උජ්ජලිංසු. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: “මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම අග්ගීපි න උජ්ජලිස්සන්ති.[2] නත්වෙව ච ඛො අරහා යථා අහ”න්ති.

8. තෙන ඛො පන සමයෙන තෙ ජටිලා අග්ගිං පරිචරිත්වා න සක්කොන්ති අග්ගිං **විජ්ඣාපෙතුං**. අථ ඛො තෙසං ජටිලානං එතදහොසි: “නිස්සංසයං ඛො මහාසමණස්ස ඉද්ධානුභාවො, යථා මයං න සක්කොම අග්ගිං විජ්ඣාපෙතු”න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපං ජටිලං එතදවොච: “විජ්ඣායන්තු කස්සප, අග්ගී?”ති. “විජ්ඣායන්තු මහාසමණා”ති. සකිදෙව පඤ්ච අග්ගිසතානි විජ්ඣායිංසු. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: “මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම අග්ගීපි න **විජ්ඣායිස්සන්ති**.[3] නත්වෙව ච ඛො අරහා යථා අහ”න්ති.

9. තෙන ඛො පන සමයෙන තෙ ජටිලා සීතාසු හෙමන්තිකාසු රත්තීසු අන්තරට්ඨකාසු හිමපාතසමයෙ නජ්ජා **නෙරඤ්ජරාය** උම්මුජ්ජන්තිපි නිමුජ්ජන්තිපි. උම්මුජ්ජනිමුජ්ජම්පි කරොන්ති. අථ ඛො භගවා පඤ්චමත්තානි මන්දාමුඛිසතානි අභිනිම්මිනි යත්ථ තෙ ජටිලා උත්තරිත්වා විසීවෙසුං.[4] අථ ඛො තෙසං ජටිලානං එතදහොසි: “නිස්සංසයං ඛො මහාසමණස්ස ඉද්ධානුභාවො, යථායිමා මන්දාමුඛියො නිම්මිතා”ති. අථ ඛො උරුවෙල-කස්සපස්ස ජටිලස්ස එතදහොසි: “මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම තාව බහූ මන්දාමුඛියො අභිනිම්මිනිස්සන්ති. නත්වෙව ච ඛො අරහා යථා අහ”න්ති.

1. “ඵාලියිස්සන්ති” ම, ජ, සං P. T. S 2. ‘උජ්ජලියිස්සන්ති” ම, ජ, සං P. T. S
3. “විජ්ඣායියිස්සන්ති” ම, ජ, සං P. T. S 4. “විසිබ්බෙසුං” ම, ජ, සං P. T. S

6. එකල්හි ඒ ජටිලයෝ ගිනි පුදනු කැමැත්තාහු දර පළන්ට අපොහොසත් වෙත්. එහෙයින් ඒ ජටිලයන්ට "යම් සේ අපි දර පළන්ට අපොහොසත් වෙමු ද, එය ඒකාන්තයෙන් මහාශ්‍රමණයාගේ ඍද්ධ්‍යනුභාවයක් වේ" යි සිතක් වූයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **උරුවෙලකාශ්‍යපජටිලයාහට "කාශ්‍යපය, දර පැළේවා දැ?"** යි වදාළසේක. ජටිලතෙමේ ද "මහාශ්‍රමණය, දර පැළේවා" යි කී ය. එකවර ම දරකඩ පන්සියයක් පැළී ගියේ ය. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට "යමකුගේ අනුභාවයෙන් දර නො පැළෙන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් ඍද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මැ" යි සිතක් වූයේ ය.

7. එකල්හි ඒ ජටිලයෝ ගිනි පුදනු කැමැත්තාහු ගිනි දල්වන්නට නො හැකි වෙති. එහෙයින් ඒ ජටිලයන්ට "යම් සේ අපි ගිනි දල්වන්ට නො හැකි වෙමු ද, එය ඒකාන්තයෙන් මහාශ්‍රමණයාගේ ඍද්ධ්‍යනුභාවයක් වේ ය" යි සිතෙක් වූයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යප ජටිලයාහට "කාශ්‍යපය, ගිනි දැල්වේවා දැ?" යි වදාළ සේක. "මහාශ්‍රමණය, ගිනි දැල්වේවා" යි ජටිලතෙමේ කී ය. එකවර ම ගිනි පන්සියයක් ඇවිළ ගත්තේ ය. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට "යමකුගේ අනුභාවයෙන් ගිනි නො දැල්වෙන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් ඍද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මැ" යි සිතක් වූයේ ය.

8. එකල්හි ඒ ජටිලයෝ ගිනි පුදා ගිනි නිවන්නට නො හැකි වෙති. එහෙයින් ඒ ජටිලයන්ට "යම්හෙයකින් අපි ගිනි නිවන්නට නො හැකි වෙමු ද, එය නිසැකයෙන් ම මහාශ්‍රමණයාගේ ඍද්ධ්‍යනුභාවයක් වේ" යි සිතක් වූයේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙලකාශ්‍යපජටිලයාහට "කාශ්‍යපය, ගිනි නිවේවා දැ?" යි වදාළසේක. "මහාශ්‍රමණය, ගිනි නිවේවා" යි ජටිලතෙමේ කී ය. එකවර ම ගිනි පන්සියය නිවී ගියේ ය. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට "යමකුගේ අනුභාවයෙන් ගිනි නො නිවෙන්නේ ද, ඒ මහාශ්‍රමණතෙමේ මහත් ඍද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම වේ. එහෙත් මා මෙන් රහත් නොවේ ම ය" යි සිතක් වූයේ ය.

9. එකල්හි ඒ ජටිලයෝ සීත වූ හෙමන්තඍතුව පිළිබඳ වූ නවම් මැදින් දෙ මස අතර අටදිනය වූ රාත්‍රීන්හි හිම වැටෙන කාලයෙහි **නෙරඤ්ජරා** නදියෙහි ගැලෙන්නාහු ද වෙති. කිඳෙන්නාහු ද වෙති. ගැලීම හා කිඳීම ද කෙරෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ ජටිලයෝ ගොඩ නැගී යම් තැනක ගිනි තැප්පාහු ද, එහි පන්සියයක් පමණ ගිනිකබල් මැවූ සේක. එකල්හි ඒ ජටිලයන්ට යම්හෙයකින් මේ ගිනි කබල් මැවුනෝ නම් එය නිසැක ව ම මහාශ්‍රමණයාගේ ඍද්ධ්‍යනුභාවයක් වේ" යි සිතක් වූයේ ය. ඉක්බිති උරුවෙලකාශ්‍යපජටිලයාහට "යමෙකුගේ අනුභාවයෙන් එපමණ බොහෝ ගිනි කබල් මැවුනෝ ද, ඒ මහාශ්‍රමණ තෙමේ මහත් ඍද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. එහෙත් මා මෙන් රහත් නො වේ මැ" යි සිතක් වූයේ ය.

10. තෙන ඛො පන සමයෙන මහා අකාලමෙඝො පාවස්සි.[1] මහා උදකවාහකො සඤ්ජායි. යස්මිං පදෙසෙ භගවා විහරති, සො පදෙසො උදකෙන ඔත්ථටො හොති.[2] අථ ඛො භගවතො එතදහොසි: "යන්නූනාහං සමන්තා උදකං උස්සාදෙත්වා[3] මජ්ඣෙ රෙණුගතාය[4] භූමියා චඞ්කමෙය්‍ය"න්ති. අථ ඛො භගවා සමන්තා උදකං උස්සාදෙත්වා මජ්ඣෙ රෙණුගතාය භූමියා චඞ්කමි. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො "මානෙව ඛො මහාසමණො උදකෙන වූළ්හො අහොසී"ති. නාවාය සම්බහුලෙහි ජටිලෙහි සද්ධිං, යස්මිං පදෙසෙ භගවා විහරති, තං පදෙසං අගමාසි. අද්දසා ඛො උරුවෙලකස්සපො ජටිලො භගවන්තං සමන්තා උදකං උස්සාදෙත්වා මජ්ඣෙ රෙණුගතාය භූමියා චඞ්කමන්තං. දිස්වාන භගවන්තං එතදවොච: "ඉදන්නු ත්වං මහාසමණා" ති, "අයමහමස්මි[5] කස්සපා"ති. භගවා වෙහාසං අබ්භුග්ගන්ත්වා නාවාය පච්චුට්ඨාසි. අථ ඛො උරුවෙලකස්සපස්ස ජටිලස්ස එතදහොසි: "මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, යත්‍ර හි නාම උදකම්පි නප්පසහිස්සති.[6] නත්වෙව ච ඛො අරහා යථා අහ"න්ති.

11. අථ ඛො භගවතො එතදහොසි: "චිරම්පි ඛො ඉමස්ස මොඝපුරිසස්ස එවං භවිස්සති: 'මහිද්ධිකො ඛො මහාසමණො මහානුභාවො, නත්වෙව ච ඛො අරහා යථා අහ'න්ති. යන්නූනාහං ඉමං ජටිලං සංවෙජෙය්‍ය"න්ති. අථ ඛො භගවා උරුවෙලකස්සපං ජටිලං එතදවොච: "නෙව ඛො ත්වං[7] කස්සප, අරහා. නපි අරහත්තමග්ගං සමාපන්නො.[8] සාපි තෙ පටිපදා නත්ථි, යාය ත්වං අරහා වා අස්සසි[9] අරහත්තමග්ගං වා සමාපන්නො"ති.

12. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: "ලභෙය්‍යාහං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පද"න්ති. "ත්වං ඛො'සි කස්සප, පඤ්චන්නං ජටිලසතානං නායකො විනායකො අග්ගො පමුඛො පාමොක්ඛො. තෙපි තාව අපලොකෙහි, යථා තෙ මඤ්ඤිස්සන්ති, තථා කරිස්සන්තී"ති.

13. අථ ඛො උරුවෙලකස්සපො ජටිලො යෙන තෙ ජටිලා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා තෙ ජටිලෙ එතදවොච: "ඉච්ඡාමහං භො මහාසමණෙ බ්‍රහ්මචරියං චරිතුං. යථා භවන්තො මඤ්ඤන්ති, තථා කරොන්තූ" ති. "චිරපටිකා මයං භො, මහාසමණෙ අභිප්පසන්නා, සචෙ භවං මහාසමණෙ බ්‍රහ්මචරියං චරිස්සති, සබ්බෙව මයං මහාසමණෙ බ්‍රහ්මචරියං චරිස්සාමා"ති.

1. "වස්සි" P. T. S 2. "අනුත්ථටො" ම, ජ, සං, P. T. S. "පත්ථටො" තො, වි,
3 "උස්සාරෙත්වා" ම, ජ, සං, P. T. S. 4. "රෙණුහතාය" තො, වි, P. T. S.
5. "අහමස්මි' ම. නු. ප. 6 "න පවාහිස්සති" ම, ජ, සං, P. T. S.
7 "නෙව ච ඛො ත්වං" ම, ජ, සං,
8 "අරහමග්ග සමාපන්නො" තො, වි. "අරහත්තමග්ග සමාපන්නො"ති බහුසු
9 අස්ස ම, නු, ප, P. T. S.

10. එකල්හි මහත් නොකල්වැස්සක් වැස්සේ ය. එයින් මහත් ජලගැල්මක් හට ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ විසූ පෙදෙස දියෙන් යට වී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මම හාත්පස දිය ඉවත් කොට මැද රජසින් ගැවසී ගත් බිම සක්මන් කරන්නෙම් නම් යෙහෙකැ" යි සිතක් හටගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ හාත්පස දිය ඉවත් කොට මැද රජසින් ගැවසී ගත් බිම සක්මන් කළසේක. එකල්හි **උරුවෙලකාශ්‍යපජ**ටිලතෙමේ "මහාශ්‍රමණතෙමේ දියෙන් ගසා ගෙණ යන ලද්දේ නො වේවා" යි නැවකින් බොහෝ ජටිලයන් සමග භාග්‍යවතුන් වහන්සේ හුන් පෙදෙසට ගියේ ය. උරුවෙලකාශ්‍යපජටිලතෙමේ හාත්පස දිය ඉවත් කොට මැද රජසින් ගැවසී ගත් බිම සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක "මහාශ්‍රමණය, මෙහි නුඹවහන්සේ සිටින සේක් ද?" යි ඇසී ය. "කාශ්‍යපය, මේ මම මෙහි වෙමි" යි උන්වහන්සේ අහසට නැගී නැවෙහි වැඩ සිටිසේක. එකල්හි උරුවෙලකාශ්‍යපජටිලයාහට "යමකු සිටි තැනක් ජලය පවා නො මැඩලන්නේ ද, ඒ මහාශ්‍රමණ තෙමේ මහත් සෘද්ධි ඇත්තේ ම වේ. මහත් අනුභාව ඇත්තේ ම වේ. එහෙත් මා මෙන් රහත් නො වේ මැ" යි සිතක් වූයේ ය.

11. එකල්හි භාග්‍යවතුන් වහන්සේට "බොහෝ කලක් ම මේ හිස් පුරුෂයාහට 'මහාශ්‍රමණතෙමේ මහත් සෘද්ධි ඇත්තේ ම ය. මහත් අනුභාව ඇත්තේ ම ය. (එසේ නමුත්) මා මෙන් රහත් නො වේ මැ' යි මෙසේ අදහස් වන්නේ ය. මම මේ ජටිලයා සංවේගයට පමුණුවන්නෙම් නම් යෙහෙකැ" යි සිතක් වූයේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙල-කාශ්‍යපජටිලයාහට "කාශ්‍යපය, තෝ රහත් නො වෙහි ම ය. රහත්මගට නො පැමිණියෙහි ම ය. තෝ, යම් ප්‍රතිපදාවකින් රහත් හෝ වන්නෙහි ද, රහත්මගට හෝ පැමිණෙහි ද, ඔබට ඒ ප්‍රතිපදාවත් නැතැ" යි වදාළසේක.

12. එකල්හි උරුවෙලකාශ්‍යපජටිල තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදිබව ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි" යි කීයේ ය. "කාශ්‍යපය, තෝ පන්සියයක් ජටිලයන්ට නායක වෙහි. තම ලබ්ධිය ගන්වන්නෙහි. අග්‍ර වෙහි. ප්‍රමුඛ වෙහි. ආචාර්‍ය්‍ය වෙහි. එහෙයින් පළමු කොට ඒ අතැවැසිජටිලයන් ද බලව. (එවිට) ඔහු යම් සේ සිතන්නාහු ද එසේ කරන්නාහු ය" යි වදාළසේක.

13. ඉක්බිති උරුවෙලකාශ්‍යප ජටිලතෙමේ ඒ ජටිලයන් හුන් තැනට ගියේ ය. ගොස් ඒ ජටිලයන්ට "භවත්නි, මම මහාශ්‍රමණයා වෙත බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙන්ට කැමැත්තෙමි. භවත්හු යම් සේ සිතත් ද, එසේ කෙරෙත්වා" යි කී ය. "පින්වත් ගුරුතුමනි, අපි බොහෝ කල් පටන් මහාශ්‍රමණයා කෙරෙහි වෙසෙසින් පැහැදුනෝ වෙමු. ඉදින් පින්වතුන් වහන්සේ මහාශ්‍රමණයා වෙත බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙණසේක් නම්, අපි සියල්ලෝ ම මහාශ්‍රමණයා වෙත බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙන්නෙමු" යි කීහ.

14. අථ ඛො තෙ ජටිලා කෙසමිස්සං ජටාමිස්සං ඛාරිකාජමිස්සං අග්ගිහුත්තමිස්සං උදකෙ පවාහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද"න්ති. "එථ භික්ඛවො" ති භගවා අවොච "ස්වාක්ඛාතො ධම්මො, චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා"ති. සාව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

15. අද්දසා ඛො **නදීකස්සපො** ජටිලො කෙසමිස්සං ජටාමිස්සං ඛාරිකාජමිස්සං අග්ගිහුත්තමිස්සං උදකෙ වුය්හමානෙ. දිස්වාන'ස්ස එතදහොසි: "මා හෙව මෙ භාතුනො උපස්සග්ගො[1] අහොසී" ති. ජටිලෙ පාහෙසි "ගච්ඡථ මෙ භාතරං ජානාථා" ති. සාමඤ්ච තීහි ජටිලසතෙහි[2] යෙනායස්මා උරුවෙලකස්සපො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උරුවෙලකස්සපං එතදවොච: "ඉදන්නු ඛො කස්සප, සෙය්‍ය"?න්ති. "ආමාවුසො, ඉදං සෙය්‍ය"න්ති අථ ඛො තෙ ජටිලා කෙසමිස්සං ජටාමිස්සං ඛාරිකාජමිස්සං අග්ගිහුත්තමිස්සං උදකෙ පවාහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යාම උපසම්පද" න්ති. "එථ භික්ඛවො"ති භගවා අවොච. "ස්වාක්ඛාතො ධම්මො චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති. සාව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

16. අද්දසා ඛො **ගයාකස්සපො** ජටිලො කෙසමිස්සං ජටාමිස්සං ඛාරිකාජමිස්සං අග්ගිහුත්තමිස්සං උදකෙ වුය්හමානෙ. දිස්වාන'ස්ස එතදහොසි: "මාහෙව මෙ භාතූනං උපස්සග්ගො අහොසී"ති. ජටිලෙ පාහෙසි "ගච්ඡථ මෙ භාතරෙ ජානාථා"ති. සාමඤ්ච ද්වීහි ජටිලසතෙහි යෙනායස්මා උරුවෙලකස්සපො, තෙනුපසංකමි උපසඞ්කමිත්වා, ආයස්මන්තං උරුවෙලකස්සපං එතදවොච: "ඉදන්නු ඛො කස්සප, සෙය්‍ය?"න්ති. "ආමාවුසො, ඉදං සෙය්‍ය"න්ති.

17. අථ ඛො තෙ ජටිලා කෙසමිස්සං ජටාමිස්සං ඛාරිකාජමිස්සං අග්ගිහුත්තමිස්සං උදකෙ පවාහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද" න්ති. "එථ භික්ඛවො" ති භගවා අවොච "ස්වාක්ඛාතො ධම්මො, චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා"ති. සාව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

භගවතො අධිට්ඨානෙන පඤ්ච කට්ඨසතානි න ඵාලියිංසු,
ඵාලියිංසු අග්ගී න උජ්ජලිංසු උජ්ජලිංසු න විජ්ඣායිංසු.

විජ්ඣායිංසු පඤ්චමන්දාමුඛිසතානි අභිනිම්මිනි,
එතෙන නයෙන අඩ්ඪුඩ්ඪපාටිහාරියසහස්සානි හොන්ති.

1. "උපසග්ගො" ම, ජ, ස්‍යා, P. T. S. 2. "ජටිලසතෙහි සද්ධිං" ම, ජ, ස්‍යා P. T. S.

14. ඉක්බිති ඒ ජටිලයෝ හිසකේ ද ජටාමඬුලු ද තවුස්පිරිකර හා පිරිකරකද ද ගිනි පුදන උපකරණ ද ජලයෙහි පා කොට යවා භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි කීහ. "මහණෙනි, එවු. ධර්මය මනා කොට දෙශනා කරණ ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරණු පිණිස බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙවු" යි වදාළ සේක. ඒ ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වී ය.

15. **නදීකාශ්‍යප** ජටිලතෙමේ ජලයෙහි පා වී යන හිසකේ ද ජටාමඬුලු ද තවුස්පිරිකරකත් ද ගිනි පුදන උපකරණ ද දුටුයේ ය. දැක ඔහුට "මාගේ සොහොයුරාහට උවදුරක් නො වේවා" යි සිතක් වූයේ ය. "යවු. මාගේ සොහොයුරා ගැණ දැන ගණිවු" යි ජටිලයන් පිටත් කොට හැරියේ ය. තෙමේ ද තුන්සියයක් ජටිලයන් සමග ආයුෂ්මත් උරුවෙලකාශ්‍යපයන් වෙතට ගියේ ය. ගොස් ආයුෂ්මත් උරුවෙලකාශ්‍යපයාහට "කාශ්‍යපය, මේ පැවිද්ද (පළමු තවුස්බවට වඩා) උතුම් දැ?" යි ඇසී ය. "ඇවැත්නි, එසේ ය. මේ පැවිද්ද උතුම් ය" යි හේ කී ය. ඉක්බිති ඒ ජටිලයෝ හිසකේ ද ජටාමඬුලු ද තවුස්පිරිකර කත් ද ගිනි පුදන උපකරණ ද දියෙහි පා කොට යවා භාග්‍යවතුන් වහන්සේ හුන් තැනට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි කීහ. "මහණෙනි, එවු. ධර්මය මනා කොට දෙසන ලද්දේ ය. මුළුමනින් දුක් කෙළවර කරණු පිණිස බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙවු" යි වදාළ සේක. ඒ ම ඒ ආයුෂ්මත් වරුන්ට උපසම්පදාව වී ය.

16. **ගයාකාශ්‍යප**ජටිලතෙමේ දියෙහි පා වී යන හිසකේ ද ජටාමඬුලු ද තවුස්පිරිකරකත් ද ගිනි පුදන උපකරණ ද දුටුයේ ය. දැක "මාගේ සොහොයුරන්ට උවදුරක් නො වේවා" යි සිතක් වූයේ ය. "යවු. මාගේ සොහොයුරන් ගැණ දැන ගණිවු" යි ජටිලයන් පිටත් කොට හැරියේ ය. තෙමේ ද දෙසියයක් ජටිලයන් සමග ආයුෂ්මත් උරුවෙලකාශ්‍යපයන් හුන් තැනට ගියේ ය. ගොස් ආයුෂ්මත් උරුවෙලකාශ්‍යපයාහට "කාශ්‍යපය, මේ පැවිද්ද උතුම් දැ?" යි ඇසී ය. "ඇවැත්නි, එසේ ය. මේ පැවිද්ද උතුම් ය" යි හෙතෙමේ කී ය.

17. ඉක්බිති ඒ ජටිලයෝ හිසකේ ද ජටාමඬුලු ද තවුස්පිරිකර කත් ද ගිනි පුදන උපකරණ ද දියෙහි පා කොට යවා භාග්‍යවතුන් වහන්සේ හුන් තැනට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිද්ද ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු" යි කීහ. "මහණෙනි, එවු. ධර්මය මනා කොට දෙශනා කරණ ලද්දේ ය. මුළුමනින් දුක් කෙළවර කරණු පිණිස බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙවු" යි වදාළ සේක. ඒ ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වී ය.

භාග්‍යවතුන් වහන්සේගේ ඉටීමෙන් පන්සියයක් දරකඩ නො පැළිත. (එසේ ම ඉටීමෙන්) පැළිත. ගිනි නො දැල්වුනේ ය. ගිනි දැල්වුනේ ය. නො නිවුනේ ය. නිවුනේ ය. ගිනි කබල් පන්සියයක් මැවූසේක. මේ පිළිවෙළින් පෙළහර තුන්දහස් පන්සියයක් වෙයි.

18. අථ ඛො භගවා උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන **ගයාසීසං** තෙන පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං භික්ඛුසහස්සෙන සබ්බෙහෙව පුරාණජටිලෙහි. තත්‍ර සුදං භගවා **ගයායං** විහරති ගයාසීසෙ සද්ධිං භික්ඛුසහස්සෙන. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි:

“සබ්බං භික්ඛවෙ ආදිත්තං. කිඤ්ච භික්ඛවෙ, සබ්බං ආදිත්තං? චක්ඛුං [1] භික්ඛවෙ ආදිත්තං. රූපා ආදිත්තා. චක්ඛුවිඤ්ඤාණං ආදිත්තං. චක්ඛුසම්ඵස්සො ආදිත්තො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි ආදිත්තං. කෙන ආදිත්තං? රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා ආදිත්තං. ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්ත” න්ති වදාමි.

“සොතං ආදිත්තං. සද්දා ආදිත්තා. -පෙ- ඝාණං ආදිත්තං. ගන්ධා ආදිත්තා - ජිව්හා ආදිත්තා. රසා ආදිත්තා.- කායො ආදිත්තො. ඵොට්ඨබ්බා ආදිත්තා.- මනො ආදිත්තො. ධම්මා ආදිත්තා. මනොවිඤ්ඤාණං ආදිත්තං. මනොසම්ඵස්සො ආදිත්තො. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි ආදිත්තං. කෙන ආදිත්තං? රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා ආදිත්තං. ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්ත”න්ති වදාමි. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති. රූපෙසුපි නිබ්බින්දති. චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති. චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තස්මිම්පි නිබ්බින්දති.

“සොතස්මිම්පි නිබ්බින්දති. සද්දෙසුපි නිබ්බින්දති - ඝාණස්මිම්පි නිබ්බින්දති. ගන්ධෙසුපි නිබ්බින්දති. - ජිව්හායපි නිබ්බින්දති. රසෙසුපි නිබ්බින්දති. - කායස්මිම්පි නිබ්බින්දති. ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති.- මනස්මිම්පි නිබ්බින්දති. ධම්මෙසුපි නිබ්බින්දති. - මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති. මනොසම්ඵස්සෙපි නිබ්බින්දති. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ‘ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායා’ති පජානාතී”ති.

19. අස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ තස්ස භික්ඛුසහස්සස්ස අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු.

**ආදිත්තපරියායං නිට්ඨිතං.**

---

**උරුවෙලපාටිහාරියං.**

---

**තතියභාණවාරං නිට්ඨිතං**

1. “චක්ඛු ආදිත්තං” ම, නු, ප. ස්‍යා,

18. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවෙල්දනව්වෙහි කැමැති තාක් වාසය කොට සියල්ලන් පුරාණජටිලයන් වූ දහසක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයා සමග ගයාශීර්ෂයට වැඩිසේක. එහි භාග්‍යවතුන් වහන්සේ **ගයාව** සමීපයෙහි වූ ගයාශීසයෙහි භික්ෂූන් දහස සමග වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක:

"මහණෙනි, සියල්ල ඇවිළ ගත්තේ ය. මහණෙනි, ඇවිළ ගත් සියල්ල කිම? මහණෙනි, ඇස ඇවිළ ගත්තේ ය. රූපයෝ ඇවිළ ගත්හ. චක්ඛුවිඤ්ඤාණය ඇවිළ ගත්තේ ය. චක්ඛුසම්ඵස්සය ඇවිළ ගත්තේ ය. චක්ඛුසම්ඵස්සය හෙතුවෙන් යම් සුව දුක් උපෙක්ෂා වෙදනාවක් උපදී ද, එ ද ඇවිළ ගත්තේ ය. කුමකින් ඇවිළ ගත්තේ ද? රාගගින්නෙන් දෙස ගින්නෙන් මොහගින්නෙන් ඇවිළ ගත්තේ ය. ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයන්ගෙන් විලාපයන්ගෙන් දුක්වලින් දොම්නස්වලින් සිත් තැවුල්වලින් ඇවිළ ගත්තේ ය" යි කියමි.

"කණ ඇවිළ ගත්තේ ය. ශබ්දයෝ ඇවිළ ගත්තෝ ය. — නැහැය ඇවිළ ගත්තේ ය. ගන්ධයෝ ඇවිළ ගත්තෝ ය. — දිව ඇවිළ ගත්තේ ය. රසයෝ ඇවිළ ගත්තෝ ය. — කය ඇවිළ ගත්තේ ය. ඵොට්ඨබ්බයෝ ඇවිළ ගත්තෝ ය. — මනස ඇවිළ ගත්තේ ය. ධම්මාරම්මණයෝ ඇවිළ ගත්තෝ ය. මනොවිඤ්ඤාණය ඇවිළ ගත්තේ ය. මනොසම්ඵස්සය ඇවිළ ගත්තේ ය. මනොසම්ඵස්සහෙතුවෙන් යම් දුක්වූ ද සැපවූ ද උපෙක්ෂා වූ ද වෙදනාවක් උපදී ද, එ ද ඇවිළ ගත්තේ ය. කුමකින් ඇවිළ ගත්තේ ද? රාගගින්නෙන් දෙසගින්නෙන් මොහගින්නෙන් ඇවිළ ගත්තේ ය. ජාතියෙන් ජරායෙන් මරණයෙන් සොකයන්ගෙන් විලාපයන් ගෙන් දුක්වලින් දොම්නස්වලින් සිත්තැවුල්වලින් ඇවිළ ගත්තේ ය' යි කියමි. මහණෙනි, මෙසේ නුවණින් දක්නා බහුශ්‍රැත වූ ආර්‍යශ්‍රාවකතෙමේ ඇසෙහි ද කලකිරේ. රූපයන්හි ද කලකිරේ. චක්ඛුවිඤ්ඤාණයෙහි ද කලකිරේ. චක්ඛුසම්ඵස්සයෙහි ද කලකිරේ. චක්ඛුසම්ඵස්සහෙතුවෙන් යම් දුක් සැප උපෙක්ෂා වෙදනාවක් වේ ද, එහි ද කලකිරේ.

"කණෙහි ද කලකිරේ. ශබ්දයන්හි ද කලකිරේ. — නැහැයෙහි ද කලකිරේ. ගන්ධයන්හි ද කලකිරේ. — දිවෙහි ද කලකිරේ. රසයන්හි ද කලකිරේ. — කයෙහි ද කලකිරේ. ඵොට්ඨබ්බයන්හි ද කලකිරේ. — මනසෙහි ද කලකිරේ. ධම්මාරම්මණයන්හි ද කලකිරේ. මනොවිඤ්ඤාණයෙහි ද කලකිරේ. මනොසම්ඵස්සයෙහි ද කලකිරේ. මනොසම්ඵස්සහෙතුවෙන් යම් දුක් සැප උපෙක්ෂා වෙදනාවක් උපදී ද, එහි ද කලකිරේ. කලකිරෙන්නේ නො ඇලේ. නො ඇලීමෙන් මිදේ. මිදුනු කල්හි මිදුනේ ය යි දක්නා නුවණ වේ. 'ජාතිය ක්‍ෂය වි ය. මාර්ගබ්‍රහ්මචර්‍යය වැස නිමවන ලද්දේ ය. සිවුමගින් කළ යුතු දෙය කරණ ලද්දේ ය. මේ රහත්බව පිණිස වෙන කළ යුත්තෙක් නැත්තේ ය යි දනියි."

19. මේ නිර්‍ගාථකසූත්‍රය දෙසනු ලැබූ කල්හි ඒ භික්ෂූන් දහසගේ සිත් තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් ගැණීම් රහිත ව ආශ්‍රවයන්ගෙන් මිදී ගියහ.

**ආදිත්තපරියාය නිමි.**

---

**උරුවෙල්පෙළහරසී.**

---

**තෙවන බණවර නිමි.**

---

1 අථ ඛො භගවා **ගයා**සීසෙ යථාභිරන්තං විහරිත්වා යෙන **රාජගහං,** තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං භික්ඛුසහස්සෙන සබ්බෙහෙව පුරාණජටිලෙහි. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං, තදවසරි. තත්‍ර සුදං භගවා රාජගහෙ විහරති ලට්ඨිවනෙ[1] **සුප්පතිට්ඨෙ** චෙතියෙ. අස්සොසි ඛො රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො රාජගහං අනුප්පත්තො රාජගහෙ විහරති ලට්ඨිවනෙ සුප්පතිට්ඨෙ චෙතියෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[2] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං, පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී" ති.

2. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ද්වාදසනහුතෙහි මාගධිකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි පරිවුතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. තෙපි ඛො ද්වාදසනහුතා මාගධිකා බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතො සන්තිකෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

3. අථ ඛො තෙසං ද්වාදසනහුතානං මාගධිකානං බ්‍රාහ්මණගහපතිකානං එතදහොසි: "කිංනු ඛො මහාසමණො උරුවෙලකස්සපෙ බ්‍රහ්මචරියං චරති? උදාහු උරුවෙල කස්සපො මහාසමණෙ බ්‍රහ්මචරියං චරතී?" ති. අථ ඛො භගවා තෙසං ද්වාදසනහුතානං මාගධිකානං බ්‍රාහ්මණගහපතිකානං චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය ආයස්මන්තං උරුවෙලකස්සපං ගාථාය අජ්ඣභාසි:

1. "ලට්ඨිවනුය්‍යානෙ" සයා; P. T. S. 2. "භගවාති" ම. ඡ. සං.

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **ගයාසීසයෙහි** කැමැති තාක් වැඩ වාසය කොට සියල්ලන් ම පුරාණජටිලයන් වූ භික්ෂූන් දහසක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයා සමග **රජගහනුවර** බලා වැඩි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණසේක් රජගහනුවරට වැඩ එහි රජගහනුවර සමීපයෙහි වැල්මීලිය වැලඳගත් තල්උයනෙහි **සුප්පතිට්ඨ චෛත්‍ය** නම් නුගරුක්මුල්හි වැඩ වසනසේක. මගධෙශ්වර වූ සෙනා ඇති **බිම්බිසාර** රජ තෙමේ “ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ භවත් ශ්‍රමණගෞතමයන් වහන්සේ රජගහනුවරට පැමිණ තල්උයනෙහි සුප්පතිට්ඨචෛත්‍ය නම් වූ නුගරුක්මුල්හි වාසය කරණසේක. ගෞතමගොත්‍රයෙහි උපන් ඒ භාග්‍යවතුන් වහන්සේගේ කල්‍යාණ වූ කීර්තිඝොෂාව උස් ව නැංගේ ය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් අර්හත් වනසේක. මේ කාරණයෙන් සම්‍යක්සම්බුද්ධ වන සේක. මේ කාරණයෙන් අෂ්ටවිද්‍යායෙන් හා පසළොස්චරණධර්මයෙන් යුක්ත වන සේක. මේ කාරණයෙන් යහපත් ගමන් ඇති සේක. මේ කාරණයෙන් තුන්ලොව දත් සේක. මේ කාරණයෙන් නිරුත්තර වූ පුරුෂයන් දමනය කිරීමෙහි සාරථි වන සේක. මේ කාරණයෙන් දෙවිමිනිසුන්ට ශාස්තෘ වන සේක. මේ කාරණයෙන් බුද්ධ වන සේක. මේ කාරණයෙන් භාග්‍යවත් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලෝකය ද මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව ද තම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ සේක. මුල මැද අග යහපත් වූ අරුත් සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ හාත්පසින් සම්පූර්ණ වූ ධර්මය දෙශනා කරණ සේක. පිරිසිදු වූ ශාසනබ්‍රහ්මචර්‍ය්‍යය වදාරණ සේක. එබඳු වූ රහතුන්ගේ දැකීම යහපත් වේ ය” යි ඇසුයේ ය.

2. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාරරජ තෙමේ මගධදෙසවාසී වූ දොළොස් නහුතයක් බ්‍රාහ්මණගෘහපතියන් විසින් පිරිවරණ ලද්දේ භාග්‍යවතුන් වහන්සේ හුන් තැනට පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්නේ ය. ඒ මගධදෙසවාසී වූ දොළොස් නහුතයක් බ්‍රාහ්මණගෘහපතියෝ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිත් ඇලවිය යුතු කතා කොට නිමවා පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හුන් දිසාවට ඇඳිලි බැඳ පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි නම්ගොත් අස්වා පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් නිශ්ශබ්ද ව පසෙක හුන් හ.

3. ඉක්බිති ඒ මගධදෙසවාසී වූ දොළොස් **නහුතයක්** බ්‍රාහ්මණගෘහපතියන්ට “කිම, මහාශ්‍රමණතෙමේ උරුවෙලකාශ්‍යපයා වෙත බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරේ ද, නොහොත් උරුවෙලකාශ්‍යපතෙමේ මහාශ්‍රමණයා වෙත බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරේ ද?” යි සිතක් වූයේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මගධදෙසවාසී වූ දොළොස් නහුතයක් බ්‍රාහ්මණගෘහපතියන්ගේ චිත්තවිතර්කය තමන්ගේ සිතින් දැන ආයුෂ්මත් උරුවෙලකාශ්‍යපසථවිරයන්හට ගාථාවෙන් (මෙසේ) වදාළ සේක:-

4\. "කිමෙව දිස්වා උරුවෙලවාසී
පහාසි අග්ගිං කිසකොවදානො,
පුච්ඡාමි තං කස්සප එතමත්ථං
කථං පහීණං තව අග්ගිහුත්ත"න්ති.

"රූපෙ ච සද්දෙ ච අථො රසෙ ච
කාමිත්ථියො චාභිවදන්ති යඤ්ඤා,
එතං මලන්ති උපධීසු ඤත්වා
තස්මා න යිට්ඨෙ න හුතෙ අරඤ්ජි"න්ති.

"එත්ථ ච[1] තෙ මනො න රමිත්ථ (කස්සපාති භගවා)
රූපෙසු සද්දෙසු අථො රසෙසු,
අථ කො චරහි දෙවමනුස්සලොකෙ
රතො මනො කස්සප බ්‍රෑහි මෙතන්ති.

"දිස්වා පදං සන්තමනූපධීකං
අකිඤ්චනං කාමභවෙ අසත්තං,
අනඤ්ඤථාභාවිමනඤ්ඤනෙය්‍යං
තස්මා න යිට්ඨෙ න හුතෙ අරඤ්ජි"න්ති.

5\. අථ ඛො ආයස්මා උරුවෙලකස්සපො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: "සත්ථා මෙ භන්තෙ, භගවා, සාවකො'හමස්මි. සත්ථා මෙ භන්තෙ, භගවා, සාවකො'හමස්මී" ති. අථ ඛො තෙසං ද්වාදසනහුතානං මාගධිකානං බ්‍රාහ්මණගහපතිකානං එතදහොසි: "උරුවෙලකස්සපො මහාසමණෙ බ්‍රහ්මචරියං චරතී"ති. අථ ඛො භගවා තෙසං ද්වාදසනහුතානං මාගධිකානං බ්‍රාහ්මණගහපතිකානං චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං - දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය, එවමෙව එකාදසනහුතානං මාගධිකානං බ්‍රාහ්මණගහපතිකානං බිම්බිසාරපමුඛානං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම"න්ති. එකං නහුතං[2] උපාසකත්තං පටිවෙදෙසි.

1\. "එත්ථෙව" ම, ජ, සං, 2. "එකනහුතං" ම, ජ, සං, P. T.S.

Free Distribution www.aathaapi.org

4. "නවුසන්ට අවවාද දෙන නොහොත් තමා නවුස් ව සෙස්සන්ට අවවාද දෙන උරුවෙල්වැසි ඔබ කුමක් නම් දැක ගිනි පිදීම දුරු කළා හු ද ? කාශ්‍යපය, මේ කරුණ ඔබ අතින් විචාරමි ඔබගේ ගිනි පිදීම කෙසේ ප්‍රහීණ වී ද?"

"රූප ද ශබ්ද ද රස ද කාන්තාවන් ද ස්පර්ශ ද ගන්ධ ද යන මේ කාමයෝ යාග කිරීමේ හේතුවෙන් සිද්ධ වෙති යි කියත්. මේ රූපාදිකාමප්‍රභේදය කාමූපධිආදියෙහි කිලුටැයි දැන ගත් හෙයින් මහායාගයෙහි නො ඇලුනෙමි. දවසක් පාසා කටයුතු ගිනි පිදීමෙහි නො ඇලුනෙමි" යි (පිළිවදන් දුන්නේ ය.)

භාග්‍යවතුන් වහන්සේ "කාශ්‍යපය, මේ ලොකයෙහි රූප කෙරෙහි ද ශබ්ද කෙරෙහි ද රස කෙරෙහි ද නොපගේ සිත නො ඇලුනේ නම්, එකල්හි දිව්‍යමනුෂ්‍යලොකයෙහි කොතැනක දැන් සිත ඇලුනේ ද? යන මේය කියව" යි (වදාළ සේක.)

"කාමභවයෙහි නොඇලුනා වූ ශාන්ත වූ කාමාදිඋපධිරහිත වූ කාමාදිපලිබොධරහිත වූ ජාතිජරාමරණයන්ගේ අභාවයෙන් වෙනස් වන බවක් නැත්තා වූ තමන් විසින් වැඩූ මගින් ම පැමිණිය යුතු වූ අනිකකු විසින් නො පැමිණවිය හැකි බැවින් අනඤ්ඤනෙය්‍ය වූ හෙවත් තමන් දියුණු කළ පිළිවෙතින් ම අවබොධ කළ යුතු වූ නිර්වාණපදය දැන ගත් හෙයින් මහායාගයෙහි නො ඇලුනෙමි. දවසක් පාසා කට යුතු ගිනි පිදීමෙහි නො ඇලුනෙමි" යි කී ය.

5. එකල්හි ආයුෂ්මත් උරුවෙලකාශ්‍යපතෙමේ හුනස්නෙන් නැගිට උතුරුසඟසිවුර එකස් කොට පොරොවා භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වන සේක. මම ශ්‍රාවකයෙක් වෙමි. භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වන සේක. මම ශ්‍රාවකයෙක් වෙමි" යි කීයේ ය. එකල්හි මගධදනව්වැසි දොළොස් නහුතයක් වූ (එක්ලක්ෂවිසිදහසක්) බ්‍රාහ්මණගෘහපතියන්හට "උරුවෙල-කාශ්‍යපතෙමේ මහාශ්‍රමණයන් වෙත බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරේ ය" යි සිත් වි ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධදනව්වැසි දොළොස්නුහුවක් වූ ඒ බ්‍රාහ්මණගෘහපතියන්ගේ සිත තම සිතින් දැන පිළිවෙළකතාව වදාළසේක. ඒ මෙසේ ය -- දානකථාව සීලකථාව ස්වර්ගකථාව කාමයන් දුක් සහිතබව් ලාමකබව කෙලෙස්බව නෛෂ්කම්‍යයෙහි අනුසස් ද ප්‍රකාශ කළසේක. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ සුදුසු වූ සිත් ඇති මොළොක් සිත් ඇති නීවරණ රහිත සිත් ඇති ඔද වැඩි සිත් ඇති පහන් සිත් ඇති ඔවුන් දත්සේක් ද, එකල්හි බුදුවරයන්ගේ ආවෙණික වූ යම් ධර්මදෙශනාවක් වේ ද, දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන ඒ චතුරාර්‍ය්‍යසත්‍යය දෙසූසේක. පහ වූ කිලුටුඇති පිරිසිදු වූ වස්ත්‍රයක් සායම් අල්ලා ගන්නා සේ බිම්බිසාර රජු ප්‍රමුඛ කොට ඇති මගධදනව්වැසි දොළොස්නුහුවන් බ්‍රාහ්මණගෘහපතියන්ට ඒ ආසනයෙහි දී ම පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති "යම් - කිසිවක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ"යි යන සොතාපත්තිමාර්ගඥානය උපන්නේ ය. එහි දී එක් නුහුවක් උපාසකභාවය ප්‍රකාශ කෙළේ ය.

6. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථඞ්කථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: “පුබ්බෙ මෙ භන්තෙ, කුමාරස්ස සතො පඤ්ච අස්සාසකා අහෙසුං. තෙ මෙ එතරහි සමිද්ධා. පුබ්බෙ මෙ භන්තෙ, කුමාරස්ස සතො එතදහොසි: ‘අහො වත මං රජ්ජෙ අභිසිඤ්චෙය්‍යු’න්ති. අයං ඛො මෙ භන්තෙ, පඨමො අස්සාසකො අහොසි. සො මෙ එතරහි සමිද්ධො. ‘තස්ස ච මෙ විජිතං අරහං සම්මා සම්බුද්ධො ඔක්කමෙය්‍යා’ති අයං ඛො මෙ භන්තෙ, දුතියො අස්සාසකො අහොසි. සො මෙ එතරහි සමිද්ධො. ‘තඤ්චාහං භගවන්තං පයිරුපාසෙය්‍ය’න්ති අයං ඛො මෙ භන්තෙ, තතියො අස්සාසකො අහොසි. සො මෙ එතරහි සමිද්ධො. ‘සො ච මෙ භගවා ධම්මං දෙසෙය්‍යා’ති අයං ඛො මෙ භන්තෙ, චතුත්ථො අස්සාසකො අහොසි. සො මෙ එතරහි සමිද්ධො. ‘තස්ස චාහං භගවතො ධම්මං ආජානෙය්‍ය’න්ති අයං ඛො මෙ භන්තෙ, පඤ්චමො අස්සාසකො අහොසි. සො මෙ එතරහි සමිද්ධො. පුබ්බෙ මෙ භන්තෙ, කුමාරස්ස සතො ඉමෙ පඤ්ච අස්සාසකා අහෙසුං. තෙ මෙ එතරහි සමිද්ධා.”

7. “අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී’ති, එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භන්තෙ, [1] භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතු ච මෙ භන්තෙ, භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා”ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

8. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: “කාලො භන්තෙ. නිට්ඨිතං භත්ත”න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පාවිසි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං භික්ඛුසහස්සෙන සබ්බෙහෙව පුරාණජටිලෙහි. තෙන ඛො පන සමයෙන සක්කො දෙවානමින්දො මාණවකවණ්ණං අභිනිම්මිනිත්වා බුද්ධප්පමුඛස්ස සඞ්ඝස්ස [2] පුරතො පුරතො ගච්ඡති ඉමා ගාථායො ගායමානො.

1. “උපාසකං මං’ ම, ජ, සං, 2. “භික්ඛු සඞ්ඝස්ස” ම, ජ, සං, P. T. S

6. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාරරජතෙමේ දක්නාලද සිවුසස් දහම් ඇත්තේ පැමිණි සිවුසස්දහම් ඇත්තේ අවබොධ කළ සිවුසස් දහම් ඇත්තේ බැස ගත් සිවුසස් දහම් ඇත්තේ පහ වූ සැක ඇත්තේ පහ වූ කෙසේ කෙසේ දැ යි පැවැති සැක ඇත්තේ නිර්භයභාවයට පැමිණියේ බුදුසසුනෙහි පිටත් අන් පිහිටක් නැත්තේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, පෙර කුමාර වූ මාගේ පැතීම් පසක් වි ය. මාගේ ඒ පැතීම් දැන් සමෘද්ධ වී ය. ස්වාමීනි, පෙර කුමාර වූ මට 'මා මගධරාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහු නම් යෙහෙකැ' යි මෙබඳු සිතක් උපන. ස්වාමීනි, මේ මට උපන් මුල් පැතීම ය. මාගේ ඒ පැතීම දැන් සමෘද්ධ වූයේ ය. 'මාගේ විජිතයට රහත් වූ සම්මාසම්බුදුරජානන්වහන්සේ පැමිණෙන්නාහු නම් යෙහෙකැ' යි සිත් වි ය. ස්වාමීනි, මේ මට උපන් දෙවන පැතීම ය. මාගේ ඒ පැතීම දැන් සමෘද්ධ විය. 'මම ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙන්නෙම් නම් යෙහෙකැ' යි සිතක් උපන. ස්වාමීනි, මේ මාගේ තෙවන පැතීම ය. මාගේ ඒ පැතීම දැන් සමෘද්ධ වී ය. 'භාග්‍යවතුන් වහන්සේ මට දහම් දෙසනසේක් නම් යෙහෙකැ' යි සිතක් උපන. ස්වාමීනි, මේ මාගේ සිවුවන පැතීම ය. මාගේ ඒ පැතීම දැන් සමෘද්ධ ය. 'මම ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අවබොධ කරන්නෙම් නම් යෙහෙකැ' යි සිත් වී ය. ස්වාමීනි, මේ මාගේ පස්වන පැතීම ය. මාගේ ඒ පැතීම දැන් සමෘද්ධ ය. ස්වාමීනි, පෙර කුමාර වූ මට මේ පැතීම් පස වූයේ ය. මාගේ ඒ පැතීම් දැන් සමෘද්ධ වී ය."

7. "ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ වේ ද, වැසුනක් යම් සේ විවෘත කරන්නේ වේ ද, මං මුළා වූවහුට යම් සේ මග කියන්නේ වේ ද, ඇස් ඇත්තෝ රූප දක්නාහ යි ගනඳුරෙහි තෙල් පහනක් යම් සේ දරන්නේ වේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේ ය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද නවලෝකෝත්තර ධර්මය ද සඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියා වූ මා උපාසකයකු කොට දරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග හෙට මාගේ බත ඉවසන සේක්වා" යි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දභාවයෙන් එය ඉවසා වදාළ සේක.

8. ඉක්බිති මගධෙශ්වර වූ සේනා ඇති බිම්බිසාර රජතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඒ ඉවසීම දැන හුනස්නෙන් නැඟිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේ ය. ඉක්බිති මගධාධිපති වූ සේනා ඇති බිම්බිසාර රජතෙමේ ඒ රැය ඉක්ම යැමෙන් පසු ප්‍රණීත වූ කෑ යුතු දේ බිදිය යුතු දේ පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මේ සුදුසු කාලය යි. බත නිමැවීය" යි කල් දැන්වී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පොරොවා පා සිවුරු ගෙණ සියල්ලන් ම පුරාණ ජටිලයන් වූ දහසක් පමණ මහත් භික්ෂුසඞ්ඝයා සමග රජගහ නුවරට වැඩි සේක. එකල්හි දෙවාධිපති වූ ශක්‍රතෙමේ තරුණ මිනිස් වෙසක් මවාගෙණ බුද්ධප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාගේ ඉදිරියෙහි මේ ගාථාවන් කියමින් යයි.

9. "දන්තො දන්තෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි,
සිඞ්ගීනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා.

සන්තො සන්තෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි,
සිඞ්ගීනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා.

මුත්තො මුත්තෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි,
සිඞ්ගීනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා.

තිණ්ණො තිණ්ණෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි,
සිඞ්ගීනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා.

දසවාසො දසබලො දසධම්මවිදූ දසභි චුපෙතො
සො දසසතපරිවාරො රාජගහං පාවිසි භගවා"ති.

මනුස්සා **සක්කං** දෙවානමින්දං පස්සිත්වා එවමාහංසු: "අභිරූපො වතායං මාණවකො. දස්සනීයො වතායං මාණවකො. පාසාදිකො , වතායං මාණවකො. කස්ස නු ඛො අයං මාණවකො?" ති. එවං වුත්තෙ සක්කො දෙවානමින්දො තෙ මනුස්සෙ ගාථාය අජ්ඣභාසි:--

"යො ධීරො සබ්බධි දන්තො සුද්ධො අප්පටිපුග්ගලො,
අරහං සුගතො ලොකෙ තස්සාහං පරිචාරකො"ති

10. අථ ඛො භගවා යෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස **බිම්බිසාරස්ස** නිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතදහොසි: "කත්ථ නු ඛො භගවා විහරෙය්‍ය, යං අස්ස ගාමතො නෙව අතිදූරෙ න අච්චාසන්න[1] ගමනාගමනසම්පන්නං අත්ථිකානං අත්ථිකානං මනුස්සානං අභික්කමනීයං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං විජනවාතං මනුස්සරාහසෙය්‍යකං පටිසල්ලානසාරුප්ප"න්ති. අථ ඛො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතද-හොසි: "ඉදං ඛො අම්හාකං **වෙළුවනං** උය්‍යානං ගාමතො නෙව අතිදූරෙ න අච්චාසන්නෙ ගමනාගමනසම්පන්නං අත්ථිකානං අත්ථිකානං මනුස්සානං අභික්කමනීයං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං විජනවාතං මනුස්සරාහසෙය්‍යකං පටිසල්ලානසාරුප්පං. යන්නූනාහං වෙළුවනං උය්‍යානං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දදෙය්‍ය"න්ති.

1. "නච අච්චාසන්නෙ" ම, ඡ, සං. "නාච්චාසන්නෙ" තො. වි.

9. "දැමුනු වෙසෙසින් මිදුනු භාග්‍යවතුන් වහන්සේ දඹරන්පැහැ ඇති සේක්, දැමුනු වෙසෙසින් මිදුනු පුරාණජටිලයන් හා රජගහනුවරට වැඩි සේක.

සංසිඳුනු වෙසෙසින් මිදුනු භාග්‍යවතුන් වහන්සේ දඹරන්පැහැ ඇතිසේක්, සන්හුන් වෙසෙසින් මිදුනු පුරාණජටිලයන් හා රජගහ නුවරට වැඩි සේක.

මිදුනු වෙසෙසින් මිදුනු භාග්‍යවතුන් වහන්සේ දඹරන්පැහැ ඇතිසේක්, මිදුනු වෙසෙසින් මිදුනු පුරාණජටිලයන් හා රජගහ නුවරට වැඩිසේක.

සසරින් එතෙර වූ වෙසෙසින් මිදුනු භාග්‍යවතුන් වහන්සේ දඹරන්පැහැ ඇතිසේක්, එතෙර වූ වෙසෙසින් මිදුනු පුරාණජටිලයන් හා රජගහ නුවරට වැඩිසේක.

දසවැදෑරුම් වූ ආර්‍ය්‍යවාසය ඇති දසවැදෑරුම් වූ කායබල ඤාණබල ඇත්තා වූ දස වැදෑරුම් වූ කම්පථ දන්නා වූ දශවිධ අශෛක්‍ෂ්‍යාඞ්ගයන් ගෙන් යුක්ත වූ දහසක් මහරහතුන් පිරිවර කොට ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරට වැඩිසේක."

මිනිස්සු **සක්දෙව්රජු** දැක මේ තරුණ තෙමේ මනා රූ ඇත්තේ ම ය. මේ තරුණ තෙමේ දැකුම්කලු ම ය. මේ තරුණතෙමේ ප්‍රසාද ජනක ම ය. මේ තරුණතෙමේ කාවරකුගේ දැ" යි කීහ. මෙසේ කී කල්හි සක්දෙව්රජතෙමේ මේ ගාථාව කීයේ ය:

"යම් නුවණැත්තෙක් තෙමේ සියලු ෂඩායතනයන්හි දැමුනේ ද, පිරිසිදු වූයේ ද, අප්‍රතිපුද්ගල වූයේ ද, ලෝකයෙහි රහත් වූයේ ද, යහපත් ගමන් ඇත්තේ ද, මම උන්වහන්සේගේ මෙහෙකරු වෙමි."

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධේශ්වර වූ සේනා ඇති බිම්බිසාර රජහුගේ රජමැඳුරට වැඩිසේක. වැඩ පැණ වූ අසුනෙහි භික්‍ෂුසඞ්ඝයා සමග වැඩ හුන්සේක. මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජතෙමේ බුද්ධප්‍රමුඛ භික්‍ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑයුතු දෙයින් හා බිදිය යුතු දෙයින් සියතින් සතප්වා වළඳා නිම වූ පාත්‍රයෙන් ඉවත් කල අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පසෙක හුන්නේ ය. පසෙක හුන් මගධේශ්වර වූ සේනා ඇති බිම්බිසාරරජුහට ගමට නොදුර වූ ගමට නො ලං වූ යෑම් ඊමට පහසු වූ බුදුන් වැදීම හා දහම් ඇසීම ප්‍රයෝජන කොට ඇති මිනිසුන්ට යෑමට පහසු වූ දහවල ජනසමූහයාගේ ගැවසීම් නැත්තා වූ රාත්‍රියෙහි නිහඬ වූ ඝොෂා රහිත වූ ජනවාතයෙන් තොර වූ මිනිසුන්ගේ රහස්වැඩට සුදුසු වූ කායාදීන්ගේ විවේකයට යොග්‍ය වූ යම් සෙනසුනක් වන්නේ ද, එබඳු කවර තැනක භාග්‍යවතුන් වහන්සේ වැඩවසන සේක් ද?" යන සිතක් වූයේ ය. මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාරරජහට අපගේ මේ **වෙළුවන** උයන ගමට නො දුරෙහි ය. නො ලං නැත්හි ය. යෑම් ඊමට පහසු වේ. වුව මනා මිනිසුන්ට පහසුවෙන් යා හැකි වේ. දහවල් ගැවසීමෙක් නැත. රාත්‍රියෙහි නිහඬ ය. ඝොෂා රහිත ය. ජනවාත නැත. මිනිසුන්ගේ රහස්වැඩට සුදුසු වේ. කායවිවෙකයට යොග්‍ය වේ. මම ඒ වේළුවනඋයන බුද්ධප්‍රමුඛභික්‍ෂු සඞ්ඝයා වහන්සේට පුදන්නෙම් නම් යෙහෙකැ" යි සිතක් වූයේ ය.


Free Distribution www.aathaapi.org

11 අථ ඛො රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** සොවණ්ණමයං **භිඞ්කාරං** ගහෙත්වා භගවතො ඔණොජෙසි: "එතාහං භන්තෙ, වෙළුවනං උය්‍යානං බුද්ධපමුඛස්ස සඞ්ඝස්ස දම්මී" ති. පටිග්ගහෙසි භගවා ආරාමං. අථ ඛො භගවා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ආරාම" න්ති.

12. තෙන ඛො පන සමයෙන **සඤ්ජයො** පරිබ්බාජකො රාජගහෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං අඩ්ඪතෙය්‍යෙහි පරිබ්බාජකසතෙහි. තෙන ඛො පන සමයෙන **සාරිපුත්තමොග්ගල්ලානා** සඤ්ජයෙ පරිබ්බාජකෙ බ්‍රහ්මචරියං චරන්ති. තෙහි කතිකා කතා හොති: "යො පඨමං අමතං අධිගච්ඡති, සො ඉතරස්ස ආරොචෙතූ" ති. අථ ඛො ආයස්මා **අස්සජි** පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛු ඉරියාපථසම්පන්නො.

13. අද්දසා ඛො සාරිපුත්තො පරිබ්බාජකො ආයස්මන්තං **අස්සජිං** රාජගහෙ පිණ්ඩාය චරන්තං පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛුං ඉරියාපථසම්පන්නං. දිස්වානස්ස එතදහොසි: "යෙ වත ලොකෙ අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා, අයං තෙසං භික්ඛු අඤ්ඤතරො. යන්නූනාහං ඉමං භික්ඛුං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යං, කං'සි ත්වං ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසී?" ති.

14. අථ ඛො සාරිපුත්තස්ස පරිබ්බාජකස්ස එතදහොසි: "අකාලො ඛො ඉමං භික්ඛුං පුච්ඡිතුං, අන්තරඝරං පවිට්ඨො පිණ්ඩාය චරති. යන්නූනාහං ඉමං භික්ඛුං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධෙය්‍යං. අත්ථිකෙහි උපඤ්ඤාතං මග්ග" න්ති. අථ ඛො ආයස්මා අස්සජි රාජගහෙ පිණ්ඩාය චරිත්වා පිණ්ඩපාතං ආදාය පටික්කමි. අථ ඛො සාරිපුත්තො [1] පරිබ්බාජකො යෙනායස්මා අස්සජි, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා අස්සජිනා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සාරිපුත්තො පරිබ්බාජකො ආයස්මන්තං අස්සජිං එතදවොච: "විප්පසන්නානි ඛො තෙ ආවුසො, ඉන්ද්‍රියානි. පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කං'සි ත්වං ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසී?" ති.

1. "සාරිපුත්තොපි" ම. ඡ. සං.

Free Distribution www.aathaapi.org

11. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාරරජතෙමේ රන් කෙණ්ඩිය ගෙණ "ස්වාමීනි, මම මේ වෙළුවනඋයන බුද්ධප්‍රමුඛ මහා සඞ්ඝයා වහන්සේට දෙමි" යි භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පැන් වක්කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ ආරාමය පිළිගත්සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු දැහැමි කතාවෙන් මනා කොට කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය නිමිති කොට දැහැමි කථාවක් කොට භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, ආරාම පිළිගැණීම අනුදනිමි."

12. ඒ කාලයෙහි සඤ්ජයපරිව්‍රාජක තෙමේ දෙසිය පණසක් පරිව්‍රාජකයන්ගෙන් යුත් මහත් පරිව්‍රාජක පිරිසක් සමග රජගහනුවර වාසය කරයි. එකල්හි ශාරීපුත්‍රමෞද්ගල්‍යායන දෙදෙන සඤ්ජයපරිව්‍රාජකයා වෙත බ්‍රහ්මචය්‍ර්‍යයෙහි හැසිරෙත්. ඔවුන් විසින් යමෙක් පළමු කොට නිර්‍වාණයට පැමිණේ ද, හෙතෙමේ අනිකාහට දන්වා" යි කතිකාවක් කරණ ලදී. ඉක්බිති ආයුෂ්මත් අස්සජි ස්ථවිරතෙමේ පෙරවරුයෙහි හැඳ පොරොවා පා සිවුරු ගෙණ ප්‍රසාදජනක වූ ඉදිරි ගමනින් ආපසු ගමනින් ඉදිරිය බැලීමෙන් හාත්පස බැලීමෙන් අත්පා හැකිළීමෙන් අත්පා දිගු කිරීමෙන් යුක්ත ව යට හෙළූ ඇස් ඇත්තේ යහපත් ඉරියව් වෙන් යුක්ත ව පිඬු පිණිස රජගහනුවරට වැඩියේ ය.

13. ශාරීපුත්‍රපරිව්‍රාජක තෙමේ, ප්‍රසාදජනක වූ ඉදිරි ගමනින් ආපසු ගමනින් ඉදිරිය බැලීමෙන් හාත්පස බැලීමෙන් අත්පා හැකිළීමෙන් අත්පා දිගු කිරීමෙන් යුක්ත ව යට හෙළූ ඇස් ඇති ව මනා ඉරියව්වෙන් යුක්ත ව රජගහනුවර පිඬු සිඟා හැසිරෙණ ආයුෂ්මත් අස්සජි තෙරුන් දුටුවේ ය. දැක, ඔහුට "ඒකාන්තයෙන් ලොකයෙහි යම් කෙනෙක් රහත් වූවාහු හෝ රහත්මගට පිළිපන්නාහු හෝ වෙත් ද, මේ මහණතෙමේ ත් ඔවුන් අතුරෙහි එක්තරා එකෙක. මම මේ මහණහු කරා ගොස් "ඇවැත්නි, නුඹවහන්සේ කවරකු උදෙසා පැවිදිවූවහු ද ? නුඹවහන්සේගේ ශාස්තෘතෙමේ කවරෙක් හෝ වේ ද? නුඹවහන්සේ කවරකුගේ ධර්‍මය රුචි කරනසේක් ද? යි විචාරන්නෙම් නම් යෙහෙකැ" යි සිතක් පහළ වූයේ ය.

14. ඉක්බිති ශාරීපුත්‍රපරිව්‍රාජකයාහට "මේ මහණහු විචාරන්නට මේ කාලය නො වේ ම ය. ඇතුළුගමට පිවිසියේ පිඬු සිඟා හැසිරේ. මම මේ මහණහු පසුපස්සේ ලුහුබැඳ යන්නෙම් නම් යෙහෙක. එය අර්ථීන් විසින් සොයාගන්නා ලද මාර්‍ගය යි. නොහොත් නිවන් සොයන්නන් විසින් මග දැන ගන්නා ලද්දේ ය" යි සිතක් වූයේ ය. ඉක්බිති ආයුෂ්මත් අස්සජි ස්ථවිරතෙමේ රජගහනුවර පිඬු සිඟා හැසිර පිණ්ඩපාතය ගෙණ පෙරළා ගියේ ය. ඉක්බිති ශාරීපුත්‍රපරිව්‍රාජකතෙමේ අස්සජි ස්ථවිරයන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් ආයුෂ්මත් අස්සජි තෙරුන් සමග සතුටු වි ය. සතුටු විය යුතු සිත් ඇලවිය යුතු කතා කොට නිමවා පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ ශාරීපුත්‍රපරිව්‍රාජකතෙමේ ආයුෂ්මත් අස්සජි තෙරුන්ට "ඇවැත්නි, නුඹවහන්සේගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන් වූවෝ ය. පිරිසිදු වූ සිරුරු පැහැය නිර්මල වේ. ඇවැත්නි, නුඹවහන්සේ කවරකු උදෙසා පැවිදි වූසේක් ද? නුඹවහන්සේගේ ශාස්තෘතෙමේ කවරෙක් හෝ වේ ද? කවරක්හුගේ ධර්‍මය රුචි කරනසේක්ද ?" යි විචාළේ ය.

15. "අත්ථාවුසො මහාසමණො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො. තාහං භගවන්තං උද්දිස්ස පබ්බජිතො. සො ච මෙ භගවා සත්ථා. තස්ස චාහං භගවතො ධම්මං රොචෙමී"ති. "කිංවාදී පනායස්මතො සත්ථා කිමක්ඛායී?" "අහං ඛො ආවුසො, නවො අචිරපබ්බජිතො. අධුනාගතො ඉමං ධම්මවිනයං. න තාහං සක්කොමි විත්ථාරෙන ධම්මං දෙසෙතුං. අපි ච තෙ සඞ්ඛිත්තෙන අත්ථං වක්ඛාමී"ති. අථ ඛො සාරිපුත්තො පරිබ්බාජකො "ආයස්මන්තං අස්සජිං එතදවොච: "හොතු ආවුසො –

"අප්පං වා බහුං වා භාසස්සු අත්ථඤ්ඤෙව මෙ බ්‍රූහි,
අත්ථෙනෙව මෙ අත්ථො කිං කාහසි ව්‍යඤ්ජනං බහු" න්ති.

අථ ඛො ආයස්මා අස්සජි සාරිපුත්තස්ස පරිබ්බාජකස්ස ඉමං ධම්මපරියායං අභාසි:

"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො එවංවාදී මහාසමණො" ති.

අථ ඛො සාරිපුත්තස්ස පරිබ්බාජකස්ස ඉමං ධම්මපරියායං සුත්වා විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම"න්ති.

"එසෙව ධම්මො යදි තාවදෙව පච්චබ්‍යථ[1] පදමසොකං,
අදිට්ඨං අබ්භතීතං බහුකෙහි කප්පනහුතෙහී" ති.

16. අථ ඛො සාරිපුත්තො පරිබ්බාජකො යෙන මොග්ගල්ලානො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අද්දසා ඛො මොග්ගල්ලානො පරිබ්බාජකො සාරිපුත්තං පරිබ්බාජකං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන සාරිපුත්තං පරිබ්බාජකං එතදවොච: "විප්පසන්නානි ඛො තෙ ආවුසො, ඉන්ද්‍රියානි. පරිසුද්ධො ඡවිවණ්ණො. පරියොදාතො. කච්චි නො ත්වං[2] ආවුසො, අමතමධිගතො?" ති. "ආමාවුසො, අමතං අධිගතො" ති. "යථා කථම්පන ත්වං ආවුසො, අමතං අධිගතො?" ති. "ඉධාහං ආවුසො, අද්දසං අස්සජිං භික්ඛුං රාජගහෙ පිණ්ඩාය චරන්තං පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛුං ඉරියාපථසම්පන්නං. දිස්වාන මෙ එතදහොසි: "යෙ වත ලොකෙ අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. අයං තෙසං භික්ඛු අඤ්ඤතරො. යන්නූනාහං ඉමං භික්ඛුං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යං: කං'සි ත්වං ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසී?"'ති. තස්ස මය්හං ආවුසො, එතදහොසි: "අකාලො ඛො ඉමං භික්ඛුං පුච්ඡිතුං, අන්තරඝරං පවිට්ඨො පිණ්ඩාය චරති. යන්නූනාහං ඉමං භික්ඛුං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධෙය්‍යං. අත්ථිකෙහි උපඤ්ඤාතං මග්ග"න්ති.

1 "පච්චබ්‍යත්ථ" ම. ජ. සං. 2. "කච්චිනු ත්වං" P. T. S

15. (එකල්හි අස්සජිස්ථවිරතෙමේ) "ඇවැත්නි, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුල යෙන් නික්ම පැවිදි වූ මහාශ්‍රමණයෙක් ඇත. මම ඒ භාග්‍යවතුන් උදෙසා පැවිදි වූයෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ද මට රුස්නේ" යි කීයේ ය. එවිට ආයුෂ්මතුන් වහන්සේගේ ශාස්තෘන් වහන්සේ කිනම් ලබ්ධි ඇතිසේක් ද? කුමක් කියනසේක්ද" යි පරිව්‍රාජකතෙමේ (ඇසී ය.) "ඇවැත්නි, මම නවකයෙක් වෙමි. පැවිදි වූ නොබෝකල් ඇත්තේ වෙමි. මේ ශාසනයට අළුත පැමිණියේ වෙමි. එහෙයින් මම ඔබට ධර්මය විස්තර වශයෙන් දෙශනා කරන්නට අපොහොසත් වෙමි. එතෙකුදු වුවත් ඔබට සැකෙවින් අර්ථය කියමි"යි අස්සජිස්ථවිරතෙමේ කී ය. ඉක්බිති ශාරීපුත්‍රපරිව්‍රාජකතෙමේ ආයුෂ්මත් අස්සජි තෙරුන්ට "ඇවැත්නි, වේවා –

"ස්වල්ප කොට හෝ බොහෝ කොට හෝ වදුරණු මැනවි. මට අර්ථය ම කියව. මට අර්ථයෙන් ම ය වැඩ, බොහෝ වචනවලින් ප්‍රයෝජන කිමැ!" යි කීයේ ය.

ඉක්බිති ආයුෂ්මත් අස්සජිස්ථවිරතෙමේ ශාරීපුත්‍රපරිව්‍රාජකයාහට මේ ධර්මක්‍රමය කී ය:

"හෙතුවෙන් උපදින යම් ධර්මකෙනෙක් වෙත් ද, ඔවුන්ගේ හෙතුව තථාගතතෙමේ වදාළේ ය. ඔවුන්ගේ යම් නිරොධයෙක් වේ ද, එය ද වදාළේ ය. මහාශ්‍රමණතෙමේ මෙබඳුවාද ඇත්තේ ය"යි.

ඉක්බිති ශාරීපුත්‍රපරිව්‍රාජකයාහට මේ ධර්මක්‍රමය අසා පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති "යම් කිසිවක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම් ස්වභාවය කොට ඇතැ" යි සොතාපත්තිමග්ගඥාණය උපන්නේ ය.

ඉදින් මෙ පමණක් වුවත් එය ම ධර්මය වේ. (ඔබවහන්සේ) බොහෝදෙනා විසින් කල්පනහුතයන්හි ද නො දුටු ඉක්මවා ගිය ශොකරහිත වූ ඒ නිර්වාණපදය ප්‍රතිවෙධ කළසේක."

16. ඉක්බිති ශාරීපුත්‍රපරිව්‍රාජකතෙමේ මෞද්ගල්‍යායනපරිව්‍රාජකයා හුන් තැනට ගියේ ය. මෞද්ගල්‍යායනපරිව්‍රාජකතෙමේ එන්නා වූ ශාරීපුත්‍ර-පරිව්‍රාජකයා දුර දී ම දුටුයේ ය. දැක ශාරීපුත්‍රපරිව්‍රාජකයාහට "ඇවැත්නි, ඔබගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන් වෙති. පිරිසිදු වූ සිරුරුපැහැය අතිශයින් නිර්මල වේ. ඇවැත්නි, කිම? නිවණ අවබෝධ කළහු දැ?" යි කීයේ ය. "එසේ ය, ඇවැත්නි, නිවණ අවබෝධ කෙළේ වෙමි" යි (ශාරීපුත්‍රතෙමේ කී ය.) "ඇවැත්නි, යුෂ්මත්හු කෙසේ නිවණ අවබොධ කළහු දැ ?" යි (මෞද්ගල්‍යායනතෙමේ ඇසී ය.) "ඇවැත්නි, මම මෙහි ප්‍රසාදජනක වූ ඉදිරි ගමනින් ආපසු ගමනින් ඉදිරිය බැලීමෙන් හාත්පස බැලීමෙන් අත්පා හැකිලීමෙන් අත්පා දිගුකිරීමෙන් යුක්ත ව යට හෙළු ඇස් ඇති ව යහපත් ඉරියව්වෙන් යුක්ත ව රජගහනුවර පිඬු සිඟා හැසිරෙණ අස්සජි මහණහු දුටුයෙමි. දැක මට "ඒකාන්තයෙන් ලෝකයෙහි යම් කෙනෙක් රහත් වූවාහු හෝ රහත් මගට පිළිපන්නාහු හෝ වෙත් ද, මේ මහණතෙමේ ත් ඔවුන් අතුරෙහි එක්තරා එකෙක. මම මේ මහණහු කරා ගොස් "ඇවැත්නි, ඔබවහන්සේ කවරකු උදෙසා පැවිදි වූවහු ද? ඔබවහන්සේගේ ශාස්තෘ තෙමේ කවරෙක් හෝ වේ ද? ඔබවහන්සේ කවරකුගේ ධර්මය රුචි කරහු ද? යි විචාරන්නෙම් නම් යෙහෙකැ" යි සිතක් උපන්නේ ය. ඇවැත්නි මට "මේ මහණහු විචාරන්ට මේ කාලය නො වේ ම ය. ඇතුළුගමට පිවිසියේ පිඬු සිඟා හැසිරේ. මම මේ මහණහු පසුපස්සේ ලුහුබැඳ යන්නෙම් නම් යෙහෙක. නිවන් සොයන්නන් විසින් මඟ දැන ගන්නා ලද්දේ ය" යි සිතක් වි ය.

17. අථ බො ආවුසො, අස්සජි භික්ඛු රාජගහෙ පිණ්ඩාය චරිත්වා පිණ්ඩපාතං ආදාය පටික්කමි. අථඛ්වාහං ආවුසො, යෙන අස්සජි භික්ඛු තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා අස්සජිනා භික්ඛුනා සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසිං. එකමන්තං ඨිතො බො අහං ආවුසො අස්සජිං භික්ඛුං එතදවොචං: "විප්පසන්නානි බො තෙ ආවුසො, ඉන්ද්‍රියානි. පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කං'සි ත්වං ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසී?" ති.

"අත්ථාවුසො මහාසමණො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො. තාහං භගවන්තං උද්දිස්ස පබ්බජිතො. සො ච මෙ භගවා සත්ථා. තස්ස චාහං භගවතො ධම්මං රොචෙමී" ති. "කිංවාදී පනායස්මතො සත්ථා? කිමක්ඛායී?" ති. "අහං බො ආවුසො, නවො අචිරපබ්බජිතො. අධුනාගතො ඉමං ධම්මවිනයං, න තාහං සක්කොමි විත්ථාරෙන ධම්මං දෙසෙතුං. අපි ච තෙ සඞ්ඛිත්තෙන අත්ථං වක්ඛාමී" ති.[1]

"අප්පං වා බහුං වා භාසස්සු අත්ථංයෙව මෙ බ්‍රෑහි,
අත්ථෙනෙව මෙ අත්ථො කිං කාහසි ව්‍යඤ්ජනං බහු" න්ති.

අථ බො ආවුසො, අස්සජි භික්ඛු [2] ඉමං ධම්මපරියායං අභාසි:

"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො එවංවාදී මහාසමණො" ති

අථ බො මොග්ගල්ලානස්ස පරිබ්බාජකස්ස ඉමං ධම්මපරියායං සුත්වා විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම" න්ති.

"එසෙව ධම්මො යදි තාවදෙව පච්චබ්‍යථා පදමසොකං,
අදිට්ඨං අබ්භතීතං බහුකෙහි කප්පනහුතෙහී" ති.

18. අථ බො මොග්ගල්ලානො පරිබ්බාජකො සාරිපුත්තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡාම මයං ආවුසො, භගවතො සන්තිකෙ. සො නො භගවා සත්ථා" ති. "ඉමානි බො ආවුසො අඩ්ඪතෙය්‍යානි පරිබ්බාජකසතානි අම්හෙ නිස්සාය අම්හෙ සම්පස්සන්තා ඉධ විහරන්ති. තෙ'පි තාව අපලොකෙම [3] යථා තෙ මඤ්ඤිස්සන්ති, තථා කරිස්සන්තී" ති.

1. "අථඛ්වාහං ආවුසො, අස්සජිං භික්ඛුං එතදවොච හොතු ආවුසො 'ති – ම. ඡ සං අසෙසඤ්ඤසු පොත්ථකෙසු න දිස්සතෙ වාක්‍යමිදං.
2 "ආයස්මා අස්සජිභික්ඛු" ම, නු, ප; තො, වි, 3 "අපලොකාම" ම. නු. ප

Free Distribution www.aathaapi.org

17. ඉක්බිති අස්සජි භික්ෂුතෙමේ රජගහනුවර පිඬු සිඟා හැසිර පිණ්ඩපාතය ගෙණ පෙරළා ගියේ ය. ඇවැත්නි, එකල්හි මම අස්සජිභික්ෂු වෙතට ගියෙමි. ගොස්, අස්සජිභික්ෂුහු සමග සතුටු වීමි. සතුටු විය යුතු වූ සිත් ඇලවිය යුතු වූ කතා කොට නිමවා පසෙක සිටියෙමි. ඇවැත්නි, පසෙක සිටියා වූ මම අස්සජිභික්ෂුහුට "ඇවැත්නි, තමුන්නාන්සේගේ ඉන්ද්‍රියයෝ වෙසෙසින් පහන් වෙත් ම ය. පිරිසිදු වූ සිරුරුපැහැය අතිශයින් නිර්මල ය. ඇවැත්නි, තමුන්නාන්සේ කවරෙකු උදෙසා පැවිදි වූ සේක් ද? නුඹවහන්සේගේ ශාස්තෘතෙමේ කවරෙක් හෝ වේ ද? කවරකු ගේ ධර්මය රුචි කරණසේ ද?" යි මෙය ඇසීමි.

(එවිට අස්සජිභික්ෂුතෙමේ) "ඇවැත්නි, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ මහාශ්‍රමණයෙක් ඇත්තේ ය. මම ඒ භාග්‍යවතුන් උදෙසා පැවිදි වූයෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වනසේක. මම ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය රුචි කරමි" යි කීයේ ය. "ආයුෂ්මත්හුගේ ශාස්තෘන්වහන්සේ කිනම් ලබ්ධි ඇතිසේක් ද? කුමක් කියන සේක් ද?" යි (මම ඇසීමි.) "ඇවැත්නි, මම නවකයෙක්මි; පැවිදි වූ නොබෝකල් ඇත්තේ වෙමි. මේ ශාසනයට අළුත බැස ගත්තේ වෙමි. (එහෙයින්) මම ඔබට ධර්මය විස්තර වශයෙන් දෙශනා කරන්නට අපොහොසත් වෙමි. එතෙකුදු වුවත් මම නුඹට සැකෙවින් අර්ථය කියමි" යි (අස්සජිභික්ෂුතෙමේ කී ය.)

"ස්වල්ප කොට හෝ බොහෝ කොට හෝ වදුරණු මැනවි. මට අර්ථය ම කියව. මට අර්ථයෙන් ම ය වැඩ. බොහෝ වචන වලින් කුමක් කරන්නේ ද?" (මම කීමි).

ඉක්බිති ඇවැත්නි, අස්සජිභික්ෂුතෙමේ, 'හෙතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඔවුන්ගේ හෙතුව තථාගතතෙමේ වදාළේ ය. ඔවුන්ගේ යම් නිරොධයෙක් වේ ද, එය ද වදාළේ ය. මහාශ්‍රමණතෙමේ මෙබඳු වාද ඇත්තේ ය" යි මේ ධර්මක්‍රමය කීයේ ය.

ඉක්බිති මුගලන්පිරිවැජියාහට මේ ධර්මක්‍රමය අසා පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති "යමක් හටගැණීම සවභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම සවභාවය කොට ඇතැ" යි යන සොතාපත්තිමගඥණය උපන්නේ ය.

"ඉදින් මෙපමණක් ම වුවත් එය ම ධර්මය වේ. බොහෝ දෙනා විසින් බොහෝ කල්පනහුතයන්හි ද නො දුටු ඉක්මවා ගිය අසොක වූ ඒ නිර්වාණ පදය (ඔබවහන්සේ) ප්‍රතිවෙධ කළසේක."

18. එකල්හි මුගලන්පිරිවැජිතෙමේ ශාරීපුත්‍රපරිව්‍රාජකයාහට "ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයට යමු. ඒ භාග්‍යවතුන් වහන්සේ අපගේ ශාස්තෘන් වහන්සේ යයි කීයේ ය. ඇවැත්නි, "මේ දෙසියපණසක් පරිව්‍රාජකයෝ අප නිසා අප බලමින් මෙහි වෙසෙති. (එහෙයින්) පළමු කොට ඔවුන් ගැණ ද සොයා බලමු. ඔහු යම් පරිද්දෙකින් සිතන්නෝ ද එසේ කරන්නාහ"යි (සැරියුත් පිරිවැජිතෙම කීයේ ය.)

19. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා යෙන තෙ පරිබ්බාජකා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තෙ පරිබ්බාජකෙ එතදවොචුං: "ගච්ඡාම මයං ආවුසො, භගවතො සන්තිකෙ. සො නො භගවා සත්ථා"ති. "මයං ආයස්මන්තෙ නිස්සාය ආයස්මන්තෙ සම්පස්සන්තා ඉධ විහරාම. සචෙ ආයස්මන්තා මහාසමණෙ බ්‍රහ්මචරියං චරිස්සන්ති, සබ්බෙව මයං මහාසමණෙ බ්‍රහ්මචරියං චරිස්සාමා" ති.

අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා යෙන **සඤ්ජයො** පරිබ්බාජකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සඤ්ජයං පරිබ්බාජකං එතදවොචුං: "ගච්ඡාම මයං ආවුසො, භගවතො සන්තිකෙ. සො නො භගවා සත්ථා" ති. "අලං ආවුසො, මා ගමිත්ථ, සබ්බෙව තයො ඉමං ගණං පරිහරිස්සාමා" ති.

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො සාරිපුත්තමොග්ගල්ලානා සඤ්ජයං පරිබ්බාජකං එතදවොචුං: "ගච්ඡාම මයං ආවුසො, භගවතො සන්තිකෙ. සො නො භගවා සත්ථා"ති. "අලං ආවුසො, මා ගමිත්ථ, සබ්බෙව තයො ඉමං ගණං පරිහරිස්සාමා"ති.

20. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා තානි අඩ්ඪතෙය්‍යානි පරිබ්බාජකසතානි ආදාය යෙන වෙළුවනං තෙනුපසඞ්කමිංසු. සඤ්ජයස්ස පන පරිබ්බාජකස්ස තත්ථෙව උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි.

අද්දසා ඛො භගවා සාරිපුත්තමොග්ගල්ලානෙ දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: "එතෙ භික්ඛවෙ ද්වෙ සහායා ආගච්ඡන්ති **කොලිතො උපතිස්සො** ච. එතං මෙ සාවකයුගං භවිස්සති අග්ගං භද්දයුග"න්ති.

"ගම්භීරෙ ඤාණවිසයෙ අනුත්තරෙ උපධිසඞ්ඛයෙ,
විමුත්තෙ අප්පත්තෙ වෙළුවනං අථ නෙ සත්ථා බ්‍යාකාසි.
එතෙ ද්වෙ සහායා ආගච්ඡන්ති [1] කොලිතො උපතිස්සො ච,
එතං මෙ සාවකයුගං භවිස්සති අග්ගං භද්දයුග"න්ති.

21. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං: "ලභෙය්‍යාම මයං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං. ලභෙය්‍යාම උපසම්පද"න්ති. "එථ භික්ඛවො"ති භගවා අවොච. "ස්වාක්ඛාතො ධම්මො. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති. සාව තෙසං ආයස්මන්තානං උපසම්පදා අහොසි.

1. "ආයන්ති" ම, නු, ප, තො, චි, P. T. S.

Free Distribution www.aathaapi.org

19. ඉක්බිති සැරියුත් මුගලන් දෙදෙන ඒ පරිව්‍රාජකයන් හුන් තැනට ගියහ. ගොස්, ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයට යමු. ඒ භාග්‍යවතුන් වහන්සේ අපගේ ශාස්තෘන් වහන්සේ ය යි කීහ. අපි ආයුෂ්මතුන් නිසා ආයුෂ්මතුන් බලමින් මෙහි වසමු. ඉදින් ආයුෂ්මත්හු මහාශ්‍රමණයන් කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙන්නාහු ද, අපි සියලු දෙන ම මහාශ්‍රමණයන් කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙන්නෙමු'' යි ඒ පරිව්‍රාජකයෝ කීහ.

ඉක්බිති සැරියුත් මුගලන් දෙදෙන **සඤ්ජය** පරිව්‍රාජකයා වෙතට ගියහ. ගොස් ''ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයට යමු. ඒ භාග්‍යවතුන් වහන්සේ අපගේ ශාස්තෘන් වහන්සේ ය'' යි සඤ්ජය පරිව්‍රාජකයාහට කීහ. (එවිට සඤ්ජයතෙමේ) ''ඇවැත්නි, කම් නැත. නො යවු. අපි තවුරුත් මේ ගණය පරිහරණය කරන්නෙමු'' යි කී ය.

දෙවනු ද -පෙ- තෙවනු ද සැරියුත් මුගලන් දෙදෙන ''ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයට යමු. ඒ භාග්‍යවතුන් වහන්සේ අපගේ ශාස්තෘන් වහන්සේ ය'' යි සඤ්ජය පරිව්‍රාජකයාහට කීහ. ''ඇවැත්නි කම් නැත. නො යවු. අපි තිදෙන ම මේ ගණය පරිහරණය කරන්නෙමු'' යි සඤ්ජය තෙමේ කියේ ය.

20. ඉක්බිති සැරියුත් මුගලන් දෙදෙන ඒ දෙසිය පණසක් පරිව්‍රාජකයන් ගෙණ වේළුවනයට ගියහ. ඒ වේලෙහි සඤ්ජය පරිව්‍රාජකයාගේ මුවින් උණුලේ නැංගේ ය

භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ ශාරිපුත්‍ර - මෞද්ගල්‍යායනයන් දුර දී ම දුටු සේක. දැක ''මහණෙනි, **කොලිත - උපතිස්ස** යන මේ යහළුවෝ දෙදෙන මෙහි එත්. මේ දෙදෙන මාගේ ශ්‍රෙෂ්ඨ වූ භද්‍රයුග්මය වූ ශ්‍රාවකයුග්මය වන්නේ ය'' යි වදාළ සේක.

''ඉක්බිති, ගැඹුරු නුවණට විෂය වූ නිරුත්තර වූ නිර්වාණයෙහි මිදුනාවූ ඒ ශාරිපුත්‍ර - මෞද්ගල්‍යායනයන් වේළුවනයට නො පැමිණි කල්හි ම ශාස්තෘන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක'':

''කොලිත ද උපතිස්ස ද යන මේ යහළුවෝ දෙදෙන මෙහි එත්. මේ යුග්මය මාගේ ශ්‍රෙෂ්ඨ භද්‍රයුග්මය වූ ශ්‍රාවකයුග්මය වන්නේ ය.''

21. ඉක්බිති සැරියුත් මුගලන් දෙදෙන භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී ''ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදිබව ලබන්නෙමු. උපසම්පදාව ලබන්නෙමු'' යි දැන්වූහ. ''එවු; මහණෙනි, ධර්මය මොනවට දේශනා කරණ ලද්දේ ය. මොනවට දුක් කෙළවර කරණු පිණිස බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙවු'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඒ ම ඒ ආයුෂ්මත්වරුන්ට උපසම්පදාව වී ය.

22. තෙන ඛො පන සමයෙන අභිඤ්ඤාතා අභිඤ්ඤාතා මාගධිකා කුලපුත්තා භගවති බ්‍රහ්මචරියං චරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “අපුත්තකතාය පටිපන්නො සමණො ගොතමො. වෙධබ්‍යාය පටිපන්නො සමණො ගොතමො. කුලුපච්ඡෙදාය පටිපන්නො සමණො ගොතමො. ඉදානි තෙන [1] ජටිලසහස්සං පබ්බාජිතං. ඉමානි ච අඩ්ඪතෙය්‍යානි පරිබ්බාජකසතානි සඤ්ජයානි [2] පබ්බාජිතානි. ඉමෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා මාගධිකා කුලපුත්තා සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං චරන්ති” ති. අපිස්සු භික්ඛූ දිස්වා ඉමාය ගාථාය චොදෙන්ති:—

“ආගතො ඛො මහාසමණො මාගධානං ගිරිබ්බජං,
සබ්බෙ සඤ්ජයකෙ නෙත්වා [3] කං සු’දානි නයිස්සතී” ති.

23. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ සො සද්දො චිරං භවිස්සති. සත්තාහමෙව භවිස්සති. සත්තාහස්ස අච්චයෙන අන්තරධායිස්සති. තෙන හි භික්ඛවෙ, යෙ තුම්හෙ ඉමාය ගාථාය චොදෙන්ති:—

‘ආගතො ඛො මහාසමණො මාගධානං ගිරිබ්බජං,
සබ්බෙ සඤ්ජයකෙ නෙත්වා කං සු’දානි නයිස්සතී,” ති

තෙ තුම්හෙ ඉමාය ගාථාය පටිචොදෙථ:—

‘නයන්ති වෙ මහාවීරා සද්ධම්මෙන තථාගතා,
ධම්මෙන නයමානානං කා උසූයා විජානත” න්ති.

තෙන ඛො පන සමයෙන මනුස්සා භික්ඛූ දිස්වා ඉමාය ගාථාය චොදෙන්ති:—

“ආගතො ඛො මහාසමණො මාගධානං ගිරිබ්බජං,
සබ්බෙ සඤ්ජයකෙ නෙත්වා කං සු’දානි නයිස්සතී” ති,

භික්ඛූ තෙ මනුස්සෙ ඉමාය ගාථාය පටිචොදෙන්ති:—

“නයන්ති වෙ මහාවීරා සද්ධම්මෙන තථාගතා,
ධම්මෙන නයමානානං කා උසූයා විජානත” න්ති;

24. මනුස්සා “ධම්මෙන කිර සමණා සක්‍යපුත්තියා නෙන්ති නො අධම්මෙනා” ති. සත්තාහමෙව සො සද්දො අහොසි. සත්තාහස්ස අච්චයෙන අන්තරධායි.

**සාරිපුත්තමොග්ගල්ලානපබ්බජ්ජා නිට්ඨිතා.**

**චතුත්ථභාණවාරං නිට්ඨිතං.**

1. “අනෙන” ම, ජ, සං 2. “සඤ්ජයානි” ම, ජ, සං. තො, වි.
3. “සඤ්ජයෙ නෙත්වාන” ම, ජ, සං.

22. එ කල්හි මගදදනවුවැසි ඉතා ප්‍රසිද්ධ වූ කුලපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචය්‍ර්‍යයෙහි හැසිරෙත්. එකල්හි මිනිස්සු "ශ්‍රමණගෞතම තෙමේ දරුවන් නැතිකිරීම පිණිස පිළිපන්නේ ය. ශ්‍රමණ ගෞතමතෙමේ වැන්දඹුබව පිණිස පිළිපන්නේ ය. ශ්‍රමණ ගෞතමතෙමේ කුල නැසීම පිණිස පිළිපන්නේ ය. දන් ඔහු විසින් දහසක් ජටිලයෝ පැවිදි කරණ ලදහ. මේ සඤ්ජය පරිව්‍රාජකයාගේ අනැවැසි වූ දෙසියපණසක් පරිව්‍රාජකයෝ පැවිදි කරණ ලදහ. ඉතා ප්‍රසිද්ධ වූ මේ මගදදනවුවැසි කුලපුත්‍රයෝ ද ශ්‍රමණ ගෞතමයා වෙත බ්‍රහ්මචය්‍ර්‍යයෙහි හැසිරෙත්" යි හෙළා දකිත්. ගරහත්. අගුණ පතුරුවත්. භික්ෂූන් දක මේ ගාථාවෙන් චොදනා ද කරත්:

"මහාශ්‍රමණ තෙමේ සඤ්ජයඅනැවැසි සියල්ලන් තමන් වෙත පමුණුවා ගෙණ මගදදනවුවැස්සන්ගේ **ගිරිබ්බජ** නම් රජගහ නුවරට ආයේ ය. දන් කවරකු ගෙණයන්නේ ද?

23. භික්ෂූහු – මෙසේ හෙළා දකින ගරහන අගුණ කියනම්නිසුන්ගේ ඒ කතාව ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දන්වූහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ඒ කතාහඬ වැඩි කල් නො පවතින්නේ ය. සතියක් ම ඒ පවතින්නේ ය. සතිය ගෙවී යැමෙන් පසු අතුරුදහන් වන්නේ ය. එසේ නම් මහණෙනි, යම් කෙනෙක් තොපට -

"මහාශ්‍රමණ තෙමේ සඤ්ජයඅනැවැසි සියල්ලන් තමන් වෙත පමුණුවා ගෙණ මගදදනවුවැස්සන්ගේ ගිරිබ්බජ නම් රජගහ නුවරට ආයේ ය. දන් කවරකු ගෙණයන්නේ ද" යි

මේ ගාථාවෙන් චොදනා කෙරෙත් නම්, "තෙපි ද ඒ මිනිසුන්ට–

"මහත් වීය්‍ර්‍යය ඇති තථාගතවරයෝ ඒකාන්තයෙන් හික්මවිය හැකි ජනයා සගමොක් සැපයට පමුණුවත්. එසේ ධර්මයෙන් පමුණුවන කල්හි තතු දන්නන්ගේ කවර දෙස් පහළ කිරීමෙක් වේ ද" යි

මේ ගාථාවෙන් පෙරළා චොදනා කරවු" යි වදාළසේක.

එකල්හි මිනිස්සු භික්ෂූන් දක–

"මහාශ්‍රමණ තෙමේ සඤ්ජයඅනැවැසි සියල්ලන් තමන් වෙත පමුණුවා ගෙණ මගදදනවුවැස්සන්ගේ ගිරිබ්බජ නම් රජගහ නුවරට ආයේ ය. දන් කවරකු ගෙණයන්නේ ද?" යි

මේ ගාථාවෙන් චොදනා කෙරෙත්

භික්ෂූහු ඒ මිනිසුන්ට–

"මහත් වීය්‍ර්‍යය ඇති තථාගතවරයෝ ඒකාන්තයෙන් හික්මවිය හැකි ජනයා සගමොක් සැපයට පමුණුවත්. එසේ ධර්මයෙන් පමුණුවන කල්හි තතු දන්නන්ගේ කවර දෙස් පහළ කිරීමෙක් වේ ද" යි

මේ ගාථාවෙන් පෙරළා චොදනා කරත්.

24. මිනිස්සු "ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ ධර්මයෙන් පමුණුවත් ල. අධර්මයෙන් නො පමුණුවත් ල" යි මෙසේ කීහ. ඒ කතාහඬ සතියක් තුළ ම පැවැත්තේ ය. සතිය ගෙවී යැමෙන් අතුරුදහන් වි ය.

**ශාරීපුත්‍ර – මෞද්ගල්‍යායන ප්‍රව්‍රජ්‍යාතොමෝ නිමි.**

---

**සිවුවන බණවර නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන භික්ඛූ අනුපජ්ඣායකා[1] අනොවදියමානා අනනුසාසියමානා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරන්ති. මනුස්සානං[2] භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති. උපරි ඛාදනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති උපරි සායනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති. උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති. සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති. භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරන්ති.

2. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරිස්සන්ති? මනුස්සානං භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි ඛාදනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි සායනීයෙපි උත්තිට්ඨපත්තං? උපනාමෙස්සන්ති? උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති? භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරිස්සන්ති සෙය්‍යථාපි බ්‍රාහ්මණා බ්‍රාහ්මණභොජනෙ?" ති.

3. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරිස්සන්ති? මනුස්සානං භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි ඛාදනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි සායනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති? භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරිස්සන්තී"? ති අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර භික්ඛවෙ, භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරන්ති? මනුස්සානං භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති? උපරි ඛාදනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති? උපරි සායනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති? උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති? සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති? භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරන්තී?" ති.

1. "අනුපජ්ඣායකා අනාචරියකා" ම. ඡ. සං. 2. "තෙ මනුස්සානං" P. T. S; තො. වි.

1. එකල්හි භික්ෂූහු උපාධ්‍යායයන් නැත්තෝ අවවාද නොකරණු ලබන්නෝ අනුශාසනා නො කරණු ලබන්නෝ නො මනා සේ හැන්දෝ නො මනා සේ පෙරෙව්වෝ මනණුන්ට සුදුසු ආචාරයෙන් තොර වූවෝ පිඬු සිඟා යත්. මිනිසුන් අනර ගණිමින් සිටිය දී බොජුන් මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත්. කෑම මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත්. රස විඳිය යුතු අහර මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත්. පිය යුතු දෙය මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත්. තුමූ සුප ද බත් ද ඉල්ලා ගෙණ වළඳත්. බත් හලෙහි උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වෙසෙත්.

2. මිනිස්සු "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ නො මනා සේ ඇන්දෝ නො මනා සේ පෙරෙව්වෝ මනණුන්ට සුදුසු ආචාරයෙන් තොර වූවෝ පිඬු සිඟා හැසිරෙත් ද ? මිනිසුන් අනුභව කරණවිට බොජුන් මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? කෑම මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? රස විඳිය යුතු ආහාර මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? පිය යුතු දෙය මතුයෙහි ඉඳුල් පාත්‍රය තබන්නෝ ද ? තුමූ සුප ද බත් ද ඉල්ලා ගෙණ අනුභව කරත් ද ? බත්හලෙහි උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වසත් ද ? බමුණු බොජුනෙහි බමුණන් මෙනැ" යි ලාමක කොට සිතත්. ගරහා කෙරෙත්. හැම තැන දෙස් කියත්

3. භික්ෂූහු නෙලා දකින්නා වූ දෙස් පහල කරන්නා වූ ඒ මිනිසුන්ගේ කථාව ඇසුවාහු ය. ආසා රහිත වූ පවට බිය ඇති වරදෙහි කුකුස් ඇති හික්මීම කැමැති යම් ඒ භික්ෂූහු වෙත් ද, උන්වහන්සේලා කෙසේ නම් භික්ෂූහු නො මනා සේ හැඳ පෙරෙව මනණුන්ට සුදුසු ආචාරයෙන් තොර වූවෝ පිඬු සිඟා යත් ද ? මිනිසුන් අනුභව කරණ විට බොජුන් මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? කෑම මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? රස විඳිය යුතු ආහාර මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? පියයුතු දෙය මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? තුමූ සුප ද බත් ද ඉල්ලා ගෙණ අනුභව කරත් ද ? බොජුන්හලෙහි ද උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වසත් දැ" ? යි නෙලා දකිත්. ගරහත්. දෙස් කියත්. ඉක්බිති ඒ භික්ෂූහු මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට දන්වා සිටියහ.

4 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි ලා මේ කාරණයෙහි ලා භික්ෂුසඞ්ඝයා රැස්කරවා "මහණෙනි, සැබෑද ? භික්ෂූහු නො මනා ව හැඳ පෙරෙව මනණුන්ට සුදුසු ආචාරයෙන් තොරවූවාහු පිඬු සිඟා යත්ද ? මිනිසුන් අනුභව කරණ විට බොජුන් මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? කෑම මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද? රස විඳිය යුතු ආහාර මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? පිය යුතු දෙය මතුයෙහි ඉඳුල් පාත්‍රය එළවත් ද ? තුමූ සුප ද බත් ද ඉල්ලා ගෙණ අනුභව කරත් ද ? බත්හලෙහි ද උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වසත් ද ?' යි භික්ෂූන් විචාළ සේක.

5. "සච්චං භගවා ති."[1] විගරහි බුද්ධො භගවා අනනුච්ඡවියං[2] භික්ඛවෙ තෙසං මොඝපුරිසානං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තෙ භික්ඛවෙ, මොඝපුරිසා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරිස්සන්ති? මනුස්සානං භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි ඛාදනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති. උපරි සායනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති? භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරිස්සන්ති? නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භීයොභාවාය. අථ ඛ්වෙතං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා" ති.

6. අථ ඛො භගවා තෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨියා[3] සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

අනුජානාමි, භික්ඛවෙ, උපජ්ඣායං. උපජ්ඣායො භික්ඛවෙ, සද්ධිවිහාරිකම්හි පුත්තචිත්තං උපට්ඨපෙස්සති.[4] සද්ධිවිහාරිකො උපජ්ඣායම්හි පිතුචිත්තං උපට්ඨපෙස්සති. එවං තෙ අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභාගවුත්තිනො[5] විහරන්තා ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්ති.

එවඤ්ච පන භික්ඛවෙ, උපජ්ඣායො ගහෙතබ්බො: එකංසං උත්තරාසඞ්ගං කරිත්වා පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "උපජ්ඣායො මෙ භන්තෙ, හොහි. උපජ්ඣායො මෙ භන්තෙ, හොහි. උපජ්ඣායො මෙ භන්තෙ, හොහී" ති. 'සාහු' ති වා, 'ලහු' ති වා, 'ඔපායික' න්ති වා, 'පතිරූප'න්ති වා, 'පාසාදිකෙන සම්පාදෙහී' ති වා කායෙන විඤ්ඤාපෙති. වාචාය විඤ්ඤාපෙති. කායෙන වාචාය විඤ්ඤාපෙති. ගහිතො හොති උපජ්ඣායො. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති න ගහිතො හොති උපජ්ඣායො.

1. "සච්චං භගවා" කත්ථචි
2. "අනනුච්ඡවිකං" ම. ජ. සං.
3. "අසන්තුට්ඨිතාය" ම, ජ, සං. "අසන්තුට්ඨතාය" සී,
4. "උපට්ඨාපෙස්සති" තො, වි, ම, නු, ප, P T. S.
5. "සභාගවුත්තිකා" තො වි; ම. නු. ප.

Free Distribution www.aathaapi.org

5. "භාග්‍යවතුන් වහන්ස, සැබෑය" යි (ඒ භික්ෂූහු සැලකළහ.) භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ඒ හිස් මිනිසුන් ගේ ක්‍රියාව නුසුදුසු ය. නො ගැළපේ නො සම ය. මහණකමට නුසුදුසු ය. අනැප වූවෙක. නො කට යුත්තෙක. මහණෙනි, නො මනා සේ ඇන්ද වූ නො මනා සේ පෙරෙව්වා වූ සුදුසු ආචාරයෙන් තොර වූ ඒ හිස් මිනිස්සු කෙසේ නම් පිඬු සිඟා හැසිරෙත් ද ? මිනිසුන් අහර ගන්නා විට බොජුන් මතුයෙහි ඉදුල් පාත්‍ර අල්ලත් ද ? කෑම මතුයෙහි ඉදුල් පාත්‍ර අල්ලත් ද ? රස විඳිය යුතු දෙය මතුයෙහි ඉදුල් පාත්‍ර අල්ලත් ද ? පිය යුතු දෙය මතුයෙහි ඉදුල් පාත්‍ර අල්ලත් ද ? තුමූ ව්‍යඤ්ජන ද බත් ද ඉල්ලා ගෙණ අනුභව කරත් ද ? බත්හලෙහි උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වසත් ද? මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස හෝ නො වන්නේ ය. මේ වනාහි නො පැහැදුනවුන්ගේ නො පැහැදීම පිණිස ද පැහැදුනු ඇතැමුන්ගේ වෙනස් බව පිණිස ද පවත්නේ ය" යි එයට ගර්හා කළ සේක.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට නොයෙක් අයුරින් ගරනා පරිහරණයට අපහසුබැව්හි පොෂණයට අපහසුබැව්හි මහත් ආශා ඇති බැව්හි ලද දෙයින් සතුටු නො වීමෙහි සමූහයා කෙරෙහි ඇලීමෙහි කුසීත බැව්හි අගුණ වදරා පරිහරණයට පහසු බැව්හි පොෂණයට පහසුබැව්හි අපිස්බැව්හි සතොස්බැව්හි කෙලෙස් ලියානැරීමෙහි කෙලශකම්පනයෙහි ප්‍රසාදජනකකායකර්මාදියෙහි කෙලෙස් දුරු කිරීමෙහි පටන් ගත් වීර්‍යයෙහි නොයෙක් අයුරින් ගුණ වදරා භික්ෂූන්ට ඊට සුදුසු වූ ඊට අනුලොම් වූ දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක:

7. "මහණෙනි, උපාධ්‍යායයකු අනුදනිමි. මහණෙනි උපාධ්‍යාය තෙමේ සද්ධිවිහාරිකයා කෙරෙහි 'මේ තෙමේ මාගේ පුතු ය' යි සිත උපද වන්නේ ය. සද්ධිවිහාරික තෙමේ උපාධ්‍යායයා කෙරෙහි "මේ තෙමේ මාගේ පියා" යි සිත උපදවන්නේ ය. මෙසේ ඔහු ගුරුන් සහිත ව පිහිට සහිත ව ගැළපෙන පැවතුම් ඇති ව වසන්නෝ මේ සසුනෙහි වැඩීමට මුල් බැස ගැන්මට මහත්බවට පැමිණෙන්නාහ."

8. මහණෙනි, උපාධ්‍යාය තෙමේ මෙසේ පත් කර ගත යුත්තේ ය: උතුරුසඟසිවුර එකස් කොට ගෙණ පා වැඳ උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මට උපාධ්‍යාය වනු මැනවි. ස්වාමීනි, මට උපාධ්‍යාය වනු මැනවි. ස්වාමීනි, මට උපාධ්‍යාය වනු මැනවැ' යි මෙසේ කිය යුතු ය. උපාධ්‍යාය තෙමේ 'යහපතැ' යි හෝ 'පහසු' යි හෝ 'පිළිගත හැකි ය' යි හෝ 'සුදුසු' යි හෝ 'පහදවනසුලු කායප්‍රයොග පිළිවෙතින් සරුවෙව' යි හෝ කයින් විණවා ද, (හඟවා ද) වචනයෙන්, විණවා ද, කයින් හා වචනයෙන් විණවා ද, උපාධ්‍යාය තෙමේ ගන්නා ලද්දේ වේ. කයින් නො විණවා ද, වචනයෙන් නො විණවා ද, කයින් හා වචනයෙන් නො විණවා ද, උපාධ්‍යාය තෙමේ නො ගන්නා ලද්දේ වේ.

9. සද්ධිවිහාරිකෙන භික්ඛවෙ, උපජ්ඣායම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා:- කාලස්සෙව වුට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගු පීතස්ස [1] උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන [2] ධොවිත්වා පටිසාමෙතබ්බං.

10. "උපජ්ඣායම්හි වුට්ඨිතෙ, ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො, සො දෙසො සම්මජ්ජිතබ්බො." සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති, නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. සචෙ උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං. නාච්චාසන්නෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං."

11. "න උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා. උපජ්ඣායො ආපත්තිසාමන්තා භණමානො නිවාරෙතබ්බො. නිවත්තන්තෙන පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං. නිවාසනං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති, මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිඩ්ඩහිතබ්බං.[3] චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාදෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං. 'මා මජ්ඣෙ භඞ්ගො අහොසී' ති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං."

12. "සචෙ පිණ්ඩපාතො හොති, උපජ්ඣායො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. උපජ්ඣායො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිඩ්ඩහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨා මඤ්චං වා හෙට්ඨා පීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං."

---

1. "යාගුං පීතස්ස" ම. ඡ. සං. P. T .S. 2. අප්පටිඝංසන්තෙන" ම. ඡ. සං.
3. "නිදහිත්වා" ම. ඡ. සං.

9. මහණෙනි, සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායයා කෙරෙහි මනා කොට පැවැතිය යුතු ය. එහි මේ මනා කොට පැවැත්ම ය: උදය කලින් ම නැගිට වහන් මුදා, උතුරුසඟසිවුර එකස් කොට දැහැටි දිය යුතු ය. මුව දෝනා දිය දිය යුතු ය. අසුන් පැණවිය යුතු ය. ඉදින් කැඳ තිබේ නම්, බඳුන සෝදා කැඳ එළවිය යුතු ය. කැඳ වළඳා අවසන් කොට සිටියහුට දිය පිළිගන්වා බඳුන ගෙණ පාත් කොට නො ගටමින් මැනැවින් සෝදා, තැන්පත් කොට තැබිය යුතු ය.

10. උපාධ්‍යායයා නැගී සිටි කල්හි අසුන ඔසොවා තැබිය යුතු ය. ඒ දෙස කසල සහිත වේ නම් හැමදිය යුතු ය. උපාධ්‍යායතෙමේ ගමට යනු කැමැත්තේ නම් අඳනය දිය යුතු ය. ඇඳ තුබූ අඳනය තමන් පිළිගත යුතු ය. කාබාන (පටිය) දිය යුතු ය. දෙගුණ කොට සඟළ සිවුර දිය යුතුය. සෝදා දිය සහිත පාත්‍රය දිය යුතු ය. උපාධ්‍යායතෙමේ පසු මහණෙකු කැමැත්තේ නම්, තෙමඬුලු වසා පිරිමඬුලු කොට හැඳ පටිය බැඳ දෙගුණ කොට සඟළ සිවුර පොරොවා ගණ්ඨිය අවුණා පාත්‍රය සෝදා ගෙණ උපාධ්‍යායයාහට පසුව යන මහණහු විය යුතු ය. වැඩිදුරින් නො යා යුතු ය. වැඩි ලඟින් නො යා යුතු ය. පාත්‍රයෙහි වූ දෙයක් පිළිගත යුතු ය.

11. උපාධ්‍යායයා කතා කරමින් සිටිය දී අතරතුර කතා නො දැමිය යුතු ය. උපාධ්‍යාය තෙමේ ඇවැත් විය හැකි තරම් වූ වදන් කියන්නේ නම් වැලැක්විය යුතු ය. පිඬු සිඟා පෙරළා එන්නහු විසින් පළමු කොට අවුත් අසුන් පැණවිය යුතු ය. පා දෝනා දිය පාපුටුව නො සේදූ පා තබාන පුවරුව එළවිය යුතු ය. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගත යුතු ය. ඇඳ තුබූ අඳනය දිය යුතු ය. (පිඬු සිඟා යනකල ඇඳි) අඳනය පිළිගත යුතු ය. ඉදින් සිවුර තෙත් නම් මොහොතක් උෂ්ණයෙහි ලා වියළිය යුතු ය. සිවුර උෂ්ණයෙහි (වැඩියක්) නො දැවිය යුතු ය. සිවුර නැමිය යුතු ය. සිවුර නමන්නහු විසින් සතරඟුලක් පමණ සිවුරුකොණ උස් කොට 'මැද නො බිදේවා' යි (සලකා) නැමිය යුතු ය. නැමූ සිවුරේ කාබහන තැබිය යුතු ය.

12. ඉදින් පිණ්ඩපාතය වේ ද, උපාධ්‍යායතෙමේත් වළඳනු කැමැති වේ නම්, දිය පිළිගන්වා පිණ්ඩපාතය එළවිය යුතු ය. උපාධ්‍යායතෙමේ පැනින් පිළිවිසිය යුතු ය. වළඳා අවසන් කළහුට දිය පිළිගන්වා පාත්‍රය පිළිගෙණ පාත් කොට නො ගටමින් මනා කොට සෝදා දිය පිස ලා මොහොතක් උෂ්ණයෙහි තැබිය යුතු ය. පාත්‍රය උෂ්ණයෙහි ලා වැඩියක් නො දැවිය යුතු ය. පාසිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා බැලිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය බහා නො තැබිය යුතු ය. සිවුර බහා තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුරු ලන උණදඬුව හෝ සිවුරු ලන රැහැණ හෝ පිරිමැද පිරිසිදු කොට නුවාව එහාට හා දරණිය මෑතට නමා සිවුර බහා තැබිය යුතු ය.



Free Distribution www.aathaapi.org

13. උපජ්ඣායම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ උපජ්ඣායො නහායිතුකාමො හොති, නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති, සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති, උණ්හං පටියාදෙතබ්බං.

14. සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති, චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය උපජ්ඣායස්ස පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා. ජන්තාඝරෙ උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං.

15. උදකෙපි උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා උපජ්ඣායස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. උපජ්ඣායො පානීයෙන පුච්ඡිතබ්බො. සචෙ උද්දිසාපෙතුකාමො හොති, උද්දිසාපෙතබ්බො. සචෙ පරිපුච්ඡිතුකාමො හොති, පරිපුච්ඡිතබ්බො.

16. යස්මිං විහාරෙ උපජ්ඣායො විහරති, සචෙ සො විහාරො උක්ලාපො හොති, සචෙ උස්සහති, සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භිසිබිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චො නීචං කත්වා සාධුකං අප්පරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං[1] නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අප්පරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා.

1. "කවාටපීඨං" ඉතිපි පාඨො.

13. උපාධ්‍යායයා නැඟී සිටි කල්හි ආසනය ඔසොවා තැබිය යුතු ය. පා ධෝනා දිය ද පා පුටුව හා නො සේදූ පා තබන පුවරුව ද නැන්පත් කොට තැබිය යුතු ය. ඉදින් එදෙස කසල සහිත වේ නම්, හැමැන්ද යුතු ය. ඉදින් උපාධ්‍යායතෙමේ නහනු කැමැත්තේ නම්, නහනු පිළියෙල කළ යුතු ය. සිහිල්දියෙන් ප්‍රයෝජන වේ නම්, සිහිල්දිය පිළියෙල කළ යුතු ය. උණුදියෙන් ප්‍රයෝජන වේ නම් උණුදිය පිළියෙල කළ යුතු ය.

14. ඉදින් උපාධ්‍යායතෙමේ (ධූමාලයෙන් නාන) ගිනිහල් ගෙට පිවිසෙනු කැමැත්තේ වේ ද, නහනසුණු දියෙන් තෙමා පිඩු කළ යුතු ය. නහනමැටි තෙමිය යුතු ය. ගිනිහල්ගෙයි පුටුව ගෙණ උපාධ්‍යායයන් වහන්සේගේ පිටිපසින් ගොස් ගිනිහල්ගෙයි පුටුව දී සිවුර පිළිගෙණ පසෙක බහා තැබිය යුතු ය. නහනසුණු දිය යුතු ය. නහනමැටි තෙම්ය යුතු ය. හැක්කේ නම් ගිනිහල්ගෙට යා යුතු ය. ගිනිහල් ගෙට යන්නහු විසින් නහනමැටියෙන් මුහුණ තවරා ඉදිරිපසින් හා පසු පසින් ද සිරුර වසා ගෙණ ගිනිහල් ගෙට පිවිසිය යුතු ය. ස්ථවිරභික්ෂූන් ගටා නො හිඳිය යුතු ය. නවක භික්ෂූන් අසුනෙන් බැහැර නො කළ යුතු ය. ගිනිහල් ගෙයි උපාධ්‍යායයාගේ (ඇඟ ඉලීම් ආදී) වත් කළ යුතු ය. ගිනිහල්ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල්ගෙයි පුටුව ගෙණ ඉදිරි පසින් හා පසුපසින් ද සිරුර වසා ගෙණ ගිනිහල්ගෙයින් නික්මිය යුතු ය.

15. දියෙහි දී ද උපාධ්‍යායයාගේ (ඇඟ ඉලීම් ආදී) වත් කළ යුතු ය. නා අවසන් කළනු විසින් පළමු කොට ගොඩ නැගී තමාගේ සිරුරෙහි දිය පිස දමා නැද පොරොවා ගෙණ උපාධ්‍යායයාගේ සිරුරෙහි දිය පිස දැමිය යුතු ය. අඳනය දිය යුතු ය. සඞ්ඝාටිය දිය යුතු ය. ගිනිහල්ගෙයි හිඳිනා පුටුව ගෙණ පළමු කොට අවුත් අසුනක් පැණවිය යුතු ය. පා ධෝනා දිය ද පාපුටුව ද නො සේදූ පා තබන පුවරුව ද එළවා තැබිය යුතු ය. උපාධ්‍යායතෙමේ පැනින් පිළිවිසිය යුතු ය. ඉදින් උදෙසවා ගණු කැමැත්තේ නම් උදෙසවා ගත යුතු ය. ඉදින් අරුත් කියවා ගණු කැමැත්තේ නම් අරුත් කියවා ගත යුතු ය.

16. උපාධ්‍යායතෙමේ යම් වෙහෙරක වෙසේ නම්, ඒ වෙහෙර කසල සහිත නම්, පිරිසිදු කිරීමෙහි පොහොසත් නම්, පිරිසිදු කළ යුතු ය. වෙහෙර පිරිසිදු කරන්නහු විසින් පළමු කොට පාසිවුරු බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. හිඳිනාකඩ හා පසතුරුණ බැහැරට ගෙණ තැබිය යුතු ය. ගුදිරිය හා කොට්ටය බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. ඇඳ පාත් කොට බිම නො උලා දොරබාව නො ගටා බැහැරට ගෙණ පසෙක මනාව තැබිය යුතු ය. පුටුව පාත් කොට බිම නො උලා දොරබාව නො ගටා බැහැර කොට පසෙක මනාව තැබිය යුතු ය. ඇඳපාඅළු බැහැර කොට පසෙක තැබිය යුතු ය

17. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භූමත්ථරණං යථාපඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. සචෙ විහාරෙ සන්තානකං හොති, උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ අකතා හොති, භූමි උදකෙන පරිප්ඵොසෙත්වා[1] සම්මජ්ජිතබ්බා: "මා විහාරො රජෙන උහඤ්ඤී" ති.

18. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං. භූමත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. භිසිබිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බං.

19. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨා මඤ්චං වා හෙට්ඨා පීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

20. සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති, පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති, පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති, උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති, දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති, දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති, දිවා වාතපානා ථකෙතබ්බා. රත්තිං විවරිතබ්බා.

1. "පරිප්ඵොසිත්වා" ම. ඡ. සං.

17. කෙලමලාව බැහැර කොට පසෙක තැබිය යුතු ය. වැතිර හිඳිනා පුවරුව බැහැර කොට පසෙක තැබිය යුතු ය. බුමුතුරුණ පණුවාතුබූ සැටි සලකා බලා බැහැර කොට පසෙක තැබිය යුතු ය. වෙහෙරෙහි මකුළු දැල් වේ නම් පළමු කොට උඩ පටන් ඉවත් කළ යුතු ය. ඇතුළත පිටත ජනෙල්කවුළු හා කාමරයෙහි මුළු සතර පිස දැමිය යුතු ය. ගුරුයෙන් පිරියම් කළ බිත්තිය හටගත් පුස් ඇත් නම් රෙදිකඩක් තෙමා මදක් මිරිකා පිස දැමිය යුතු ය. කළුපැහැ කළ බිම හටගත් පුස් ඇත් නම් රෙදි කඩක් තෙමා මදක් මිරිකා පිස දැමිය යුතු ය. බිම පිරියම් නො කරණ ලද නම්, "වෙහෙර දූවිල්ලෙන් කිලිටි නො වේවා"යි දිය ඉස පිස දැමිය යුතු ය.

18. කසල එකතු කොට එකත්පසෙක හළ යුතු ය. බුමුතුරුණ වියලා පිරිසිඳු කොට ගසා දමා ගෙණවුත් පණවා තුබූ ලෙසට පැණවිය යුතු ය. ඇඳපාඅළු වියලා පිරිමැද ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. ඇඳ වියලා පිරිසිඳු කොට ගසා දමා පාත් කොට බිම නො උලන්නහු විසින් දොරබා නො හප්පා ගෙණවුත් පණවා තුබූ ලෙසට මනා කොට පැණවිය යුතු ය. පුටුව වියලා පිරිසිඳු කොට ගසා දමා පාත් කොට බිම නො ගටා දොරබා නො හපා ගෙණවුත් පණවා තුබූ පරිදි පැණවිය යුතු ය. ගුදිරිය හා කොට්ටය වියලා පිරිසිඳු කොට ගසා දමා ගෙණවුත් පණවා තුබූ පරිදි පැණවිය යුතු ය. හිඳිනාකඩ හා පසතුරුණ වියලා පිරිසිඳු කොට ගසා දමා ගෙණවුත් පණවා තුබූ පරිදි පැණවිය යුතු ය. පඩික්කම සෝදා වියලා පිරිමැද ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. වැතිර හිඳිනා පුවරුව වියලා පිරිමැද ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය.

19. පාසිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා පාත්‍රය තැබිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය නො තැබිය යුතු ය. සිවුර බහා තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුර ලන උණදඬුව හෝ රැහැණ හෝ පිරිමැද නුවාව එනාට හා දරණය මෙනාට තබා සිවුර දැමිය යුතු ය.

20. ඉදින් පෙරදිගින් නැඟ එන දූලි සහිත වූ වාතයෝ හමත් නම්, පෙරදිග කවුළුදොර වැසිය යුතු ය. බස්නාහිරින් නැඟ එන වාතයෝ දූලි සහිත ව හමත් නම්, බස්නාහිර කවුළුදොර වැසිය යුතු ය. උතුරුදිග හටගත් වාතයෝ දූලි සහිත ව හමත් නම්, උතුරුදිග කවුළු දොර වැසිය යුතු ය. දකුණුදිග හටගත් දූලි සහිත වූ වාතයෝ හමත් නම්, දකුණුදිග කවුළුදොර වැසිය යුතු ය. සීතකාලය වේ නම්, දහවල කවුළුදොර ඇර තැබිය යුතු ය. රාත්‍රියෙහි වැසිය යුතු ය. උෂ්ණකාලය වේ නම්, දහවල කවුළුදොර වැසිය යුතු ය. රාත්‍රියෙහි ඇර තැබිය යුතු ය.

21. සචෙ පරිවෙණං උක්ලාපං හොති, පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති, කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති, උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති, අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති, වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පානීයං න හොති, පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති, පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති, ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

22. සචෙ උපජ්ඣායස්ස අනභිරති උප්පන්නා හොති, සද්ධිවිහාරිකෙන වූපකාසෙතබ්බො. වූපකාසාපෙතබ්බො. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායස්ස කුක්කුච්චං උප්පන්නං හොති, සද්ධිවිහාරිකෙන විනොදෙතබ්බං. විනොදාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායස්ස දිට්ඨිගතං උප්පන්නං හොති, සද්ධිවිහාරිකෙන විවෙචෙතබ්බං. විවෙචාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා.

23. සචෙ උපජ්ඣායො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං. "කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස පරිවාසං දදෙය්‍යා ?" ති.

24. සචෙ උපජ්ඣායො මූලාය පටිකස්සනාරහො හොති, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායං මූලාය පටිකස්සෙය්‍යා ?" ති.

25. සචෙ උපජ්ඣායො මානත්තාරහො හොති, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස මානත්තං දදෙය්‍යා ?" ති.

26. සචෙ උපජ්ඣායො අබ්භානාරහො හොති, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායං අබ්භෙය්‍යා ?" ති.

27. සචෙ සඞ්ඝො උපජ්ඣායස්ස කම්මං කත්තුකාමො හොති, තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස කම්මං න කරෙය්‍ය, ලහුතාය [1] වා පරිණාමෙය්‍යා ?" ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො උපජ්ඣායො සම්මා වත්තෙය්‍ය ? ලොමං පාතෙය්‍ය ? නෙත්ථාරං වත්තෙය්‍ය ? සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා ?" ති.

1. "ලහුකාය" ම. ජ. සං; P. T. S.

21. පිරිවෙණ කසළ සහිත වේ නම්, පිරිවෙණ හැමැදිය යුතු ය. ඇතුළුගෙය කසළ සහිත වේ නම්, ඇතුළුගෙය හැමැදිය යුතු ය. උපස්ථානශාලාව කසළ සහිත වේ නම්, උපස්ථානශාලාව හැමැදිය යුතු ය. ගිනිහල් ගෙය කසළ සහිත වේ නම් ගිනිහල් ගෙය හැමැදිය යුතු ය. වැසිකිළිය කසළ සහිත වේ නම්, වැසිකිළිය හැමදිය යුතු ය. පැන් නො වේ නම්, පැන් එළවා තැබිය යුතු ය. පරිභොගයට සුදුසු දිය නැති නම්, පරිභොගයට සුදුසු දිය එළවා තැබිය යුතු ය. වැසිකිළිදිය සැලෙහි දිය නැති නම්, වැසිකිළිදියසැලෙහි දිය වක්කළ යුතු ය.

22. උපාධ්‍යායයාට සාසනයෙහි නො ඇල්මෙක් උපන්නේ නම්, සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායයා අන් තැනකට ගෙණ යා යුතු ය. "තෙරුන් අන් තැනකට ගෙණ යව" යි අන් භික්‍ෂුවකට කිය යුතු ය. උන්වහන්සේට ධම්කථා හෝ කිය යුතු ය. උපාධ්‍යායයාහට කුකුසෙක් උපන්නේ නම්, සද්ධිවිහාරිකයා විසින් එය දුරු කළ යුතු ය. "තෙරුන්ගේ කුකුස හරළව" යි අන් භික්‍ෂුවකට කිය යුතු ය. උන් වහන්සේට ධම්කථා හෝ කිය යුතු ය. උපාධ්‍යායයාහට මිසදිටුවක් උපන්නේ නම් සද්ධිවිහාරිකයා විසින් එය දුරු කට යුතු ය. අනිකකු ලවා හෝ දුරු කරවිය යුතු ය. උන්වහන්සේට ධම්කථා හෝ කිය යුතු ය.

23. උපාධ්‍යායතෙමේ ගරු ඇවැතට පැමිණියේ පිරිවෙසට සුදුසු වූයේ වේ ද, සද්ධිවිහාරිකයා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ උපාධ්‍යායයා හට පිරිවෙස් දෙන්නේ දැ ' යි උත්සාහ කට යුතු ය.

24. උපාධ්‍යායතෙමේ මූලායපටිකස්සනයට (මුල සිට පිරිවෙස් පිරීමට) සුදුසු වූයේ වේ නම්, "කෙසේ නම් සඞ්ඝතෙමේ උපාධ්‍යායයා මුල සිට පිරිවෙස් පිරීමට අදින්නේදැ ?" යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කට යුතු ය.

25. උපාධ්‍යායතෙමේ මානතට සුදුසු වූයේ නම්, කෙසේ නම් සඞ්ඝ තෙමේ උපාධ්‍යායයාහට මානත දෙන්නේදැ" යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කට යුතු ය.

26. උපාධ්‍යායතෙමේ අබ්භානයට සුදුසු වූයේ නම්, කෙසේ නම් සඞ්ඝ තෙමේ උපාධ්‍යායයා සඞ්ඝයාට ඇතුළත් කරන්නේදැ ?" යි උත්සාහ කට යුතු ය.

27. සඞ්ඝතෙමේ උපාධ්‍යායයාහට තජ්ජනීයකම්මය හෝ නියස්සකම්මය හෝ පබ්බාජනීයකම්මය හෝ පටිසාරණීයකම්මය හෝ උක්ඛෙපනීය කම්මය හෝ කරණු කැමැත්තේ නම්, "කෙසේ නම් සඞ්ඝ තෙමේ උපාධ්‍යායයාහට කම් නො කරන්නේ ද? ලඝුබවට හෝ පෙරළන්නේ දැ ?" යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කට යුතු ය. "උන්වහන්සේට සඞ්ඝයා විසින් තජ්ජනීය-කම්මය හෝ නියස්ස කම්මයහෝ පබ්බාජනීයකම්මය හෝ පටිසාරණීයකම්මය හෝ උක්ඛෙපනීයකම්මය හෝ කරණ ලද්දේ හෝ වේ ද, කෙසේ නම් උපාධ්‍යාය තෙමේ මනා කොට පවතින්නේ ද ? අනුලොම් වන්නේ ද ? නිදොස්බව පිණිස පවතින්නේ ද ? සඞ්ඝතෙමේ ඒ කම්ය සන්සිඳුවන්නේ දැ ?" යි සද්ධිවිහාරිකයා විසින් උත්සාහ කට යුතු ය.

28. සචෙ උපජ්ඣායස්ස චීවරං ධොවිතබ්බං හොති, සද්ධිවිහාරිකෙන ධොවිතබ්බං. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං ධොවියෙථා?" ති. සචෙ උපජ්ඣායස්ස චීවරං කාතබ්බං හොති, සද්ධිවිහාරිකෙන කාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං කරියෙථා?" ති. සචෙ උපජ්ඣායස්ස රජනං පචිතබ්බං හොති, සද්ධිවිහාරිකෙන පචිතබ්බං. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො උපජ්ඣායස්ස රජනං පචියෙථා?" ති. සචෙ උපජ්ඣායස්ස චීවරං රජෙතබ්බං[1] හොති, සද්ධිවිහාරිකෙන රජෙතබ්බං. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං රජියෙථා?" ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජෙතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං.

29. න උපජ්ඣායං අනාපුච්ඡා එකච්චස්ස පත්තො දාතබ්බො. න එකච්චස්ස පත්තො පටිග්ගහෙතබ්බො. න එකච්චස්ස චීවරං දාතබ්බං. න එකච්චස්ස චීවරං පටිග්ගහෙතබ්බං. න එකච්චස්ස පරික්ඛාරො දාතබ්බො. න එකච්චස්ස පරික්ඛාරො පටිග්ගහෙතබ්බො. න එකච්චස්ස කෙසා ඡෙත්තබ්බා[2]. න එකච්චෙන කෙසා ඡෙදාපෙතබ්බා. න එකච්චස්ස පරිකම්මං කාතබ්බං. න එකච්චෙන පරිකම්මං කාරාපෙතබ්බං. න එකච්චස්ස වෙය්‍යාවච්චො[3] කාතබ්බො. න එකච්චෙන වෙය්‍යාවච්චො කාරාපෙතබ්බො. න එකච්චස්ස පච්ඡාසමණෙන හොතබ්බං. න එකච්චො පච්ඡාසමණො ආදාතබ්බො. න එකච්චස්ස පිණ්ඩපාතො නීහරිතබ්බො. න එකච්චෙන පිණ්ඩපාතො නීහරාපෙතබ්බො.

30. න උපජ්ඣායං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො. න සුසානං ගන්තබ්බං. න දිසා පක්කමිතබ්බා. සචෙ උපජ්ඣායො ගිලානො හොති, යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බන්ති.

**උපජ්ඣායවත්තං නිට්ඨිතං**

---

1. "රජිතබ්බං" ම. ඡ. සං. 2. "ඡෙදෙතබ්බා" ම. ඡ. සං; තො වි. "ඡෙදතබ්බා" P T. S.
3 "වෙය්‍යාවච්චං" කත්ථචි

28. උපාධ්‍යායයාගේ සිවුර සේදිය යුතු නම්, සද්ධිවිහාරිකයා විසින් සේදිය යුතුය. "කෙසේ නම් උපාධ්‍යායයාගේ සිවුර සෝදනු ලබන්නේ ද?" යි උත්සාහය හෝ කට යුතු ය. උපාධ්‍යායයාට සිවුරක් කට යුතු නම්, සද්ධිවිහාරිකයා විසින් ඒ කට යුතු ය. "කෙසේ නම් උපාධ්‍යායයාගේ සිවුර කරණු ලබන්නේ ද ?" යි උත්සාහය හෝ කට යුතු ය. උපාධ්‍යායයාට පඬු පිසිය යුතු නම්, සද්ධිවිහාරිකයා විසින් පඬු පිසිය යුතු ය. "කෙසේ නම් උපාධ්‍යායයාහට පඬු පිසනු ලබන්නේද?" යි උත්සාහය හෝ කට යුතු ය. උපාධ්‍යායයාගේ සිවුර පඬු පෙවිය යුතු නම්, සද්ධිවිහාරිකයා විසින් පඬු පෙවිය යුතු ය. "කෙසේ නම් උපාධ්‍යායයාගේ සිවුර පඬු පොවනු ලබන්නේද" යි උත්සාහය හෝ කටයුතු ය සිවුර පඬු පොවන්නහු විසින් මනා කොට පෙරළ පෙරළා පඬු පෙවිය යුතු ය. පොද නො සුන් කල්හි (පඬු දිය නො සුන් කල්හි) බැහැර නො යා යුතු යි.

29. උපාධ්‍යායයා නො විචාරා කිසිවෙකුට පාත්‍රය නො දිය යුතු ය. කිසිවෙකුගේ පාත්‍රය නො පිළිගත යුතු ය. කිසිවෙකුට සිවුර නො දිය යුතු ය. කිසිවෙකුගේ සිවුර නො පිළිගත යුතුය. කිසිවෙකුට පිරිකර නො දිය යුතු ය. කිසිවෙකුගේ පිරිකර නො පිළිගත යුතු ය. කිසිවෙකුගේ කෙස් නො කැපිය යුතු ය. කිසිවෙකු ලවා කෙස් නො කැප්පිය යුතු ය. කිසිවෙකුගේ පා මිරිකීම් ආදි වත් නො කට යුතු ය. කිසිවෙකු ලවා වත් නො කරවා ගත යුතුය. කිසිවෙකුට වතාවත් නො කට යුතුය. කිසිවෙකු ලවා වතාවත් නො කරවා ගත යුතු ය. කිසිවෙකුගේ පස්සේ යන මහණකු නො විය යුතු ය කිසිවෙකු කැටුව යන මහණකු සේ නො ගත යුතු ය. කිසිවෙකුගේ පිණ්ඩපාතය බැහැර නො කට යුතු ය. කිසිවෙකු ලවා පිණ්ඩපාතය බැහැර නො කරවිය යුතු ය.

30. උපාධ්‍යායයා නො විචාරා ගම් නො වැදිය යුතු ය. සොහොනට නො යා යුතු ය. ඒ ඒ දිශාවන්හි නො යා යුතු ය. උපාධ්‍යාය තෙමේ ගිලන් වේ නම්, ජීවත් වනතුරු උපස්ථාන කළ යුතු ය. උන්වහන්සේගේ ලෙඩින් නැගී සිටීම බලාපොරොත්තු විය යුතු ය.

**උපාධ්‍යාය වත නිමි.**

---

1. උපජ්ඣායෙන භික්ඛවෙ, සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මාවත්තනා: උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකො සඞ්ගහෙතබ්බො අනුග්ගහෙතබ්බො උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා.

2. සචෙ උපජ්ඣායස්ස පත්තො හොති, සද්ධිවිහාරිකස්ස පත්තො න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පත්තො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස පත්තො උප්පජ්ජියෙථා?" ති.

3. සචෙ උපජ්ඣායස්ස චීවරං හොති, සද්ධිවිහාරිකස්ස චීවරං න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස චීවරං දාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං උප්පජ්ජියෙථා?" ති.

4. සචෙ උපජ්ඣායස්ස පරික්ඛාරො හොති, සද්ධිවිහාරිකස්ස පරික්ඛාරො න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පරික්ඛාරො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස පරික්ඛාරො උප්පජ්ජියෙථා?" ති.

5. සචෙ සද්ධිවිහාරිකො ගිලානො හොති, කාලස්සෙව වුට්ඨාය දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගු පීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බා. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො.

6. සචෙ සද්ධිවිහාරිකො ගාමං පවිසිතුකාමො හොති, නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. එත්තාවතා නිවත්තිස්සතීති ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං. නිවාසනං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති, මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාරෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං: "මා මජ්ඣෙ භඞ්ගො අහොසී" ති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

1. මහණෙනි, උපාධ්‍යායයා සද්ධිවිහාරිකයා කෙරෙහි මනා කොට පැවතිය යුතු ය. එහි මේ මනා කොට පැවැත්ම ය: මහණෙනි, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකා තෙමේ උදෙසීමෙන් කරුණු විමසීමෙන් අවවාදයෙන් අනුශාසනයෙන් සංග්‍රහ කට යුතු ය. අනුග්‍රහ කට යුතු ය.

2. උපාධ්‍යායයාහට වැඩිපුර පාත්‍රයක් වේ ද, සද්ධිවිහාරිකයාහට පාත්‍රයක් නො වේ ද, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයාහට පාත්‍රයක් දිය යුතු ය. "සද්ධිවිහාරිකයාහට පාත්‍රයක් කෙසේ නම් උපදනේ දැ?" යි උත්සාහය හෝ කට යුතු ය.

3. උපාධ්‍යායාහට වැඩිපුර සිවුරක් වේ ද, සද්ධිවිහාරිකයාහට සිවුරක් නො වේ ද, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයාහට සිවුරක් දිය යුතු ය. "සද්ධිවිහාරිකයාහට සිවුරක් කෙසේ නම් උපදනේදැ?" යි උත්සාහය හෝ කට යුතු ය.

4. උපාධ්‍යායයාහට වැඩිපුර පරිෂ්කාරයක් වේ ද, සද්ධිවිහාරිකයාහට පරිෂ්කාරයක් නො වේ ද, උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයාහට පරිෂ්කාර දිය යුතු ය. "සද්ධිවිහාරිකයාහට පරිෂ්කාරයක් කෙසේ නම් උපදනේ දැ?" යි උත්සාහය හෝ කට යුතු ය.

5. සද්ධිවිහාරිකතෙමේ ගිලන් වේ නම්, කලින් ම නැගිට දැහැටි දිය යුතු ය. මුව දෝනා දිය දිය යුතු ය. අසුන් පැණවිය යුතු ය. කැඳ තිබේ නම්, බඳුන සෝදා කැඳ එළවිය යුතු ය. කැඳ වළඳා සිටියහුට දිය දී බඳුන පිළිගෙණ පාත් කොට මනා කොට නො ගටා සෝදා තැන්පත් කළ යුතු ය. එදෙස කසළ සහිත වේ නම්, එතැන හැමදිය යුතු ය. සද්ධිවිහාරිකයා නැඟී සිටි කල්හි ආසනය ඔසවා තැබිය යුතු ය.

6. සද්ධිවිහාරිකතෙමේ ගම් වදිනු කැමැත්තේ නම්, අඳනය දිය යුතු ය. ඇඳ තුබූ අඳනය පිළිගත යුතු ය. පටිය දිය යුතු ය. සිවුරු දෙක එක් කොට දිය යුතු ය. සෝදා දිය සහිත වූ පාත්‍රය දිය යුතු ය. මෙපමණකින් (පිඩුසිගා) නවතින්නේ (පෙරළා එන්නේ) ය යි දැන අසුන් පැණවිය යුතු ය. පා දෝනා දිය පාපුටුව නො සේදූ පා තබන පුවරුව එළවිය යුතු ය. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගත යුතු ය. ඇඳි අඳනය පිළිගත යුතු ය. සිවුර තෙත් වූයේ නම්, මොහොතක් උෂ්ණයෙහි ලා වියළිය යුතු ය. සිවුරු උෂ්ණයෙහි ලා වැඩියක් නො දැවිය යුතු ය. සිවුර නැමිය යුතු ය. සිවුර නමන්නහු විසින් "මැද නො දිරාවා" යි සතරඟුලක් පමණ සිවුරු කොණ උස් කොට සිවුර නැමිය යුතු ය. නැමූ සිවුරෙහි පටිය තැබිය යුතු ය.

7. සචෙ පිණ්ඩපාතො හොති, සද්ධිවිහාරිකො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. සද්ධිවිහාරිකො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන පත්තං ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො.

8. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨා මඤ්චං වා හෙට්ඨා පීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

9. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ සද්ධිවිහාරිකො නහායිතුකාමො හොති, නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති, සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති, උණ්හං පටියාදෙතබ්බං.

10. සචෙ සද්ධිවිහාරිකො ජන්තාඝරං පවිසිතුකාමො හොති, චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති, ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා. ජන්තාඝරෙ සද්ධිවිහාරිකස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං.

11. උදකෙපි සද්ධිවිහාරිකස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා සද්ධිවිහාරිකස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. සද්ධිවිහාරිකො පානීයෙන පුච්ඡිතබ්බො. යස්මිං විහාරෙ සද්ධිවිහාරිකො විහරති, සචෙ සො විහාරො උක්ලාපො හොති, සචෙ උස්සහති සොධෙතබ්බො.

7. පිණ්ඩපාතය වේ නම්, සද්ධිවිහාරික තෙමේත් වළඳනු කැමැත්තේ වේ නම්, දිය දී පිණ්ඩපාතය එළවිය යුතු ය. සද්ධිවිහාරික තෙමේ පැනින් පිවාළ යුතු ය. වළඳා අවසන් කළහුට දිය දී පාත්‍රය පිළිගෙණ පාත් කොට කිසිවක නො ගටා මනා කොට සෝදා දිය පිසදමා මොහොතක් උෂ්ණයෙහි වියලිය යුතු ය. පාත්‍රය උෂ්ණයෙහි ලා වැඩියක් නො දැමිය යුතු ය.

8. පා සිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා පාත්‍රය බහා තැබිය යුතු ය. කිසිවක් නො අතුළ බිම් පාත්‍රය නො තැබිය යුතු ය. සිවුර බහන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුර ලන උණ්දඬුව හෝ සිවුරු ලන රැහැණ හෝ පිරිමැද නුවාව එහාට දරණය මෙහාට තබා සිවුර බැතිය යුතු ය.

9. සද්ධිවිහාරිකයා නැගී සිටි කල්හි අසුන ඔසවා තැබිය යුතු ය. පා දෝනා දිය පාපුටුව නො සේදූ පා තබන පුවරුව තැන්පත් කටයුතු ය. එදෙස කසළ සහිත වේ නම්, එතැන හැමදිය යුතු ය. සද්ධිවිහාරිකයා නහනු කැමති වේ නම්, නහනු පිළියෙල කළ යුතු ය. සීත දියෙන් ප්‍රයෝජන වේ නම්, සීත දිය පිළියෙල කළ යුතු ය. උණු දියෙන් ප්‍රයෝජන වේ නම්, උණු දිය පිළියෙල කළ යුතු ය.

10. සද්ධිවිහාරිකතෙමේ ගිනිහල්ගෙට පිවිසෙනු කැමැත්තේ නම්, නහනසුණු තෙමා පිඩු කළ යුතු ය. නහනමැටි තෙමිය යුතු ය. ගිනිහල් ගෙයි පුටුව ගෙණ ගොස් ගිනිහල්ගෙයි පුටුව දී සිවුර පිළිගෙණ පසෙක තැබිය යුතු ය. සුණු දිය යුතු ය. නහනමැටි දිය යුතු ය. හැක්කේ නම් ගිනිහල්ගෙට පිවිසිය යුතු ය. ගිනිහල්ගෙට පිවිසෙන්නහු විසින් නහනමැටියෙන් මුහුණ තවරා ඉදිරිපසින් හා පසුපසින් සිරුර වසා ගිනිහල්ගෙට පිවිසිය යුතු ය. ස්ථවිරනිසුන් ගටා නො හිඳිය යුතු ය. නවකනිසුන් ආසනයෙන් බැහැර නො කට යුතු ය. ගිනිහල්ගෙයි දී සද්ධිවිහාරිකයාගේ ඇඟ ඉලීම් ඈ වත් කළ යුතු ය. ගිනිහල්ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල්ගෙයි පුටුව ගෙණ ඉදිරි පසින් සිරුර වසා ගිනිහල්ගෙයින් නික්මිය යුතු ය.

11. ජලයෙහි දී ද සද්ධිවිහාරිකයාගේ ඇඟ ඉලීම් ඈ වත් කට යුතුය. නා අවසන් කළහු විසින් පළමු කොට ගොඩ නැගී තමන්ගේ සිරුරෙහි දිය පිස දමා හැඳ ගෙණ සද්ධිවිහාරිකයාගේ සිරුර පිස දැමිය යුතු ය. අඳනය දිය යුතු ය. සිවුරු දිය යුතු ය. ගිනිහල්ගෙයි පුටුව ගෙණ පළමු කොට අවුත් අසුන පණවා පා දෝනා දිය, පා පුටුව, නො සේදූ පා තබන පුවරුව එළවිය යුතු ය. සද්ධිවිහාරික තෙමේ පැනින් පිවාළ යුතු ය. යම් වෙහෙරක සද්ධිවිහාරික තෙමේ වාසය කෙරේ නම්, ඒ වෙහෙර කසළ සහිත නම්, හැක්කේ නම්, පිරිසිදු කළ යුතු ය.

12. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භිසිබිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චො නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා.

13. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භුම්මත්ථරණං යථාපඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. සචෙ විහාරෙ සන්තානකං හොති, උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා සම්මජ්ජිතබ්බා. සචෙ අකතා හොති, භූමි, උදකෙන පරිප්ඵොසෙත්වා සම්මජ්ජිතබ්බා: "මා විහාරො රජෙන උහඤ්ඤී" ති.

14. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං. භුම්මත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. භිසිබිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බං.

15. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

12. වෙහෙර පිරිසිදු කරන්නහු විසින් පළමු කොට පාසිවුරු බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. හිඳිනාකඩ හා ඇතිරිල්ල ගෙණ පසෙක තැබිය යුතුය. ගුදිරිය හා කොට්ටය ගෙණ පසෙක තැබිය යුතු ය. ඇඳ පාත් කොට අල්ලා ගෙණ නො ගටමින් දෙරබාවෙහි නො හප්පා ඉවත් කොට පසෙක තැබිය යුතු ය. පුටුව පාත් කොට අල්ලා ගෙණ නො ගටමින් දෙරබාවෙහි නො හප්පා පසෙක තැබිය යුතු ය. ඇඳපාඅළු ඉවතට ගෙණ පසෙක තැබිය යුතු ය.

13. කෙළම්ලාව බැහැරකොට පසෙක තැබිය යුතුය. වැතිර හිඳිනා පුවරුව ඉවතට ගෙණ පසෙක තැබිය යුතු ය. බුමුතුරුණ පණවා තුබූ සැටි සලකා ඉවතට ගෙණ පසෙක තැබිය යුතු ය. විහාරයෙහි (වසන තැන) මකුණු දැල් වේ නම්, පළමු කොට උඩ සිට ඉවත් කළ යුතු ය. ඇතුළත පිටත ජනෙල්කවුළු හා කාමරයෙහි මුළු සතර පිස දැමිය යුතු ය. ගුරුයෙන් පිරියම් කළ බිත්තිය හටගත් පුස් ඇත්නම්, රෙදි කඩක් තෙමා මඳක් මිරිකා පිස දැමිය යුතු ය. ඉදින් කළු පැහැ කළ බිම හටගත් පුස් ඇත්නම්, රෙදි කඩක් තෙමා මඳක් මිරිකා පිස දැමිය යුතු ය. ඉදින් බිම පිරියම් නො කරණලද නම්, දිය ඉස "වෙහෙර දූවිල්ලෙන් කිලිටි නො වේවා" යි නැමැදිය යුතු ය.

14. කසළ රැස් කොට පසෙක දැමිය යුතු ය. බුමුතුරුණ වියලා ශුඩ කොට ගසා දමා ඇතුළට ගෙණවුත් තුබූ පරිදි තැබිය යුතු ය. ඇඳ පාඅළු වියලා පිස දමා ඇතුළට ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. ඇඳ වියලා ශුඩ කොට ගසා දමා පාත් කොට නො ගටා දෙරබාව නො හප්පා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් මනා කොට පැණවිය යුතු ය. පුටුව වියලා ශුඩ කොට ගසා දමා පාත් කොට නො ගටා දෙරබාව නො හප්පා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් මනා කොට පැණවිය යුතු ය. ගුදිරිය හා කොට්ටය වියලා ශුඩ කොට ගසා දමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් පැණවිය යුතු ය. හිඳිනාකඩ හා පසතුරුණ වියලා ශුඩ කොට ගසා දමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් පැණවිය යුතු ය. කෙළම්ලාව වියලා පිස දමා ඇතුළට ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. හාන්සිපුවරුව වියලා පිස දමා ඇතුළට ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය.

15. පාසිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබාන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා පාත්‍රය බහා තැබිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය බහා නො තැබිය යුතු ය සිවුර බහා තබාන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුරු ලන උණදඬුව හෝ සිවුරු ලන රැහැණ හෝ පිස දමා නුවාව එතාට ද දරණය මෙතාට ද තබා සිවුර බැහිය යුතු ය.

16. සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති, පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති, පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති, උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති, දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති, දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති, දිවා වාතපානා ථකෙතබ්බා. රත්තිං විවරිතබ්බා.

17. සචෙ පරිවෙණං උක්ලාපං හොති, පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති, කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති, උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති, අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පානීයං න හොති පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති, පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති, ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

18. සචෙ සද්ධිවිහාරිකස්ස අනභිරති උප්පන්නා හොති, උපජ්ඣායෙන වූපකාසෙතබ්බො. වූපකාසාපෙතබ්බො. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ සද්ධිවිහාරිකස්ස කුක්කුච්චං උප්පන්නං හොති, උපජ්ඣායෙන විනොදෙතබ්බං. විනොදාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ සද්ධිවිහාරිකස්ස දිට්ඨිගතං උප්පන්නං හොති, උපජ්ඣායෙන විවෙචෙතබ්බං, විවෙචාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා.

19. සචෙ සද්ධිවිහාරිකො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො, උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං: ‘‘කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකස්ස පරිවාසං දදෙය්‍යා ?’’ ති.

20. සචෙ සද්ධිවිහාරිකො මූලායපටිකස්සනාරහො හොති, උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං: ‘‘කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකං මූලාය පටිකස්සෙය්‍යා ?’’ ති.

21. සචෙ සද්ධිවිහාරිකො මානත්තාරහො හොති, උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං: ‘‘කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකස්ස මානත්තං දදෙය්‍යා ?’’ ති.

22. සචෙ සද්ධිවිහාරිකො අබ්භානාරහො හොති, උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං: ‘‘කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකං අබ්භෙය්‍යා ?’’ ති.

Free Distribution www.aathaapi.org

16. පෙරදිගින් නගිනා දූලි සහිත වූ වාතයෝ හමත් නම්, පෙරදිග වාකවුළු වැසිය යුතු ය. බස්නාහිරින් නගිනා වාතයෝ දූලි සහිත ව හමත් නම්, බස්නාහිර වාකවුළු වැසිය යුතු ය. උතුරුදිගින් නගිනා වාතයෝ දූලි සහිත ව හමත් නම්, උතුරු දිග වාකවුළු වැසිය යුතු ය. දකුණුදිගින් නගිනා වාතයෝ දූලි සහිත ව හමත් නම්, දකුණුදිග වාකවුළු වැසිය යුතු ය. ශීතකාලය වේ නම්, දහවල වාකවුළු හැර දැමිය යුතු ය. රාත්‍රියෙහි වැසිය යුතු ය. උෂ්ණකාලය වේ නම්, දහවල වාකවුළු වැසිය යුතු ය. රාත්‍රියෙහි හැර දැමිය යුතු ය.

17. පිරිවෙණ කසළ සහිත නම්, පිරිවෙණ හැමැදිය යුතු ය. ඇතුළු ගෙය කසළ සහිත නම්, ඇතුළුගෙය හැමැදිය යුතු ය. උපස්ථානශාලාව කසළ සහිත නම්, උපස්ථානශාලාව හැමැදිය යුතු ය. ගිනිහල් ගෙය කසළ සහිත නම්, ගිනිහල්ගෙය හැමැදිය යුතු ය. වැසිකිළිය කසළ සහිත නම්, වැසිකිළිය හැමැදිය යුතු ය. පැන් නො වේ නම්, පැන් එළවා තැබිය යුතු ය. පරිභොග කටයුතු දිය නො වේ නම්, පරිභොග කටයුතු දිය එළවා තැබිය යුතු ය. වැසිකිළිදියසැළෙහි දිය නො වේ නම්, වැසිකිළිදියසැළෙහි දිය වක් කළ යුතු ය.

18. සද්ධිවිහාරිකයාහට ශාසනයෙහි නො ඇල්මෙක් උපන්නේ නම් උපාධ්‍යායයා විසින් අන් තැනකට ගෙණ යා යුතු ය. අනෙකකු ලවා අන් තැනකට පමුණුවාලිය යුතු ය. ඔහුට ධර්මකථා හෝ කියයුතු ය. සද්ධිවිහාරිකයාහට කුකුසෙක් උපන්නේ නම් උපාධ්‍යායයා විසින් එය දුරු කට යුතු ය. අනෙකෙකු ලවා හෝ දුරු කරවිය යුතු ය. ඔහුට ධර්මකථා හෝ කිය යුතු ය. සද්ධිවිහාරිකයාහට මිසදිටුවක් උපන්නේ නම්, උපාධ්‍යායයා විසින් එය දුරු කට යුතු ය. අනෙකකු ලවා දුරු කරවිය යුතු ය. ඔහුට ධර්මකථාවක් හෝ කිය යුතු ය.

19. සද්ධිවිහාරිකතෙමේ ගරු ඇවැතට පැමිණියේ පිරිවෙසට සුදුසු වූයේ වේ ද, උපාධ්‍යායයා විසින් "කෙසේ නම් සඞ්ඝතෙමේ සද්ධිවිහාරිකයාහට පිරිවෙස දෙන්නේ දැ ?" යි උත්සාහ කට යුතු ය.

20. සද්ධිවිහාරිකතෙමේ මුල සිට පිරිවෙස් පිරීමට සුදුසු වූයේ නම්, උපාධ්‍යායයා විසින් "කෙසේ නම් සඞ්ඝතෙමේ සද්ධිවිහාරිකයා මුලට අදින්නේ දැ?" යි උත්සාහ කටයුතු ය.

21. සද්ධිවිහාරිකතෙමේ මානතට සුදුසු වූයේ නම්, උපාධ්‍යායයා විසින් "කෙසේ නම් සඞ්ඝතෙමේ සද්ධිවිහාරිකයාහට මානත දෙන්නේ දැ?" යි උත්සාහ කට යුතු ය.

22. සද්ධිවිහාරිකතෙමේ අබ්භානයට සුදුසු වූයේ නම්, උපාධ්‍යායයා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයාගේ අබ්භානකර්මය කරන්නේ දැ ?" යි උත්සාහ කට යුතු ය.

24. සචෙ සඞ්ඝො සද්ධිවිහාරිකස්ස කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො සද්ධිවිහාරිකස්ස කම්මං න කරෙය්‍ය. ලහුකාය වා පරිණාමෙය්‍යා" ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, උපජ්ඣායෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සද්ධිවිහාරිකො සම්මා වත්තෙය්‍ය? ලොමං පාතෙය්‍ය? නෙත්ථාරං වත්තෙය්‍ය? සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා?" ති.

25. සචෙ සද්ධිවිහාරිකස්ස චීවරං ධොවිතබ්බං හොති, උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං "එවං ධොවෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං ධොවියෙථා" ති. සචෙ සද්ධිවිහාරිකස්ස චීවරං කාතබ්බං හොති, උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං "එවං කරෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං කරියෙථා" ති. සචෙ සද්ධිවිහාරිකස්ස රජනං පචිතබ්බං හොති, උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං "එවං පචෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස රජනං පචියෙථා" ති. සචෙ සද්ධිවිහාරිකස්ස චීවරං රජෙතබ්බං හොති, උපජ්ඣායෙන ආචික්ඛිතබ්බං "එවං රජෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස චීවරං රජීයෙථා" ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජෙතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං. සචෙ සද්ධිවිහාරිකො ගිලානො හොති යාවජීවං උපට්ඨාතබ්බො, වුට්ඨානමස්ස ආගමෙතබ්බන්ති.

**සද්ධිවිහාරිකවත්තං නිට්ඨිතං.**

---

1. තෙන ඛො පන සමයෙන සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තිස්සන්තී" ති.

2. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තන්තී" ති. සච්චං භගවා -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ සද්ධිවිහාරිකෙන උපජ්ඣායම්හි න සම්මා වත්තිතබ්බං: යො න සම්මා වත්තෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

24. සඞ්ඝතෙමේ සද්ධිවිහාරිකයාහට තජ්ජනීයකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනීයකර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපණීය කර්මය හෝ කරණු කැමැත්තේ නම් "කෙසේ නම් සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයාහට කර්ම නො කරන්නේ ද ? ලඝු බවට හෝ පෙරළන්නේ ද? " යි උපාධ්‍යායයා විසින් උත්සාහ කටයුතු ය. සද්ධිවිහාරිකයාහට සඞ්ඝයා තජ්ජනීයකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනීයකර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපණීයකර්මය හෝ කරණ ලද්දේ වේ ද, "කෙසේ සද්ධිවිහාරික තෙමේ මනා කොට පවතින්නේ ද, අනුලෝම වන්නේ ද, නිදොස්බව පිණිස මනා කොට පවතින්නේ ද, සඞ්ඝ තෙමේ ඒ කර්මය සන්සිඳුවන්නේ ද ?" යි උපාධ්‍යායයා විසින් උත්සාහ කටයුතු ය.

25. සද්ධිවිහාරිකයාගේ සිවුර සේදිය යුතු නම් උපාධ්‍යායයා විසින් "මෙසේ සෝදන්නෙහි" යි කිය යුතු ය. "සද්ධිවිහාරිකයාගේ සිවුර කෙසේ නම් සෝදනු ලබන්නේ ද" යි උත්සාහය හෝ කට යුතු ය. සද්ධිවිහාරිකයා හට සිවුරක් කට යුතු නම් උපාධ්‍යායයා විසින් "මෙසේ කරන්නෙහි" යි කිය යුතු ය. "සද්ධිවිහාරිකයාගේ සිවුර කෙසේ නම් කරණු ලබන්නේ ද" යි උත්සාහය හෝ කට යුතු ය. සද්ධිවිහාරිකයාහට පඬු පිසිය යුතු නම්, උපාධ්‍යායයා විසින් "මෙසේ පිසන්නෙහි" යි කිය යුතු ය. "සද්ධිවිහාරිකයාහට කෙසේ නම් පඬු පිසනු ලබන්නේ ද" යි උත්සාහය හෝ කට යුතු ය. සද්ධිවිහාරිකයාගේ සිවුර පඬු පෙවිය යුතු නම්, උපාධ්‍යායයා විසින් "මෙසේ පඬු පොවන්නෙහි"යි කිය යුතු ය. "සද්ධිවිහාරිකයාගේ සිවුර කෙසේ නම් පඬු පොවනු ලබන්නේද ?" යි උත්සාහය හෝ කට යුතු ය. සිවුර පඬු පොවන්නහු විසින් පෙරළ පෙරළා මනා කොට පඬු පෙවිය යුතු ය. පොද නො සුන් කල්හි බැහැර නො යා යුතු ය. සද්ධිවිහාරික තෙමේ ගිලන් නම්, ජීවත් වන තුරු උවටැන් කළ යුතු ය. සද්ධිවිහාරිකයාගේ රෝගයෙන් නැගී සිටීම බලාපොරොත්තු විය යුතු ය.

**සද්ධිවිහාරිකවත නිමි.**

---

1. එකල්හි සද්ධිවිහාරිකයෝ උපාධ්‍යායයන් කෙරෙහි මැනැවින් නො පවත්නෝ ය. අල්පෙච්ඡ වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඔහු "සද්ධිවිහාරිකයෝ කෙසේ නම් උපාධ්‍යායයන් කෙරෙහි මැනැවින් **නොපවතිත් දැයි** පහත් කොට සිතත්. නින්දා කෙරෙත්. දොස් **කියත්.**

2. ඉක්බිති ඒ භික්ෂූහු මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. උන්වහන්සේ "මහණෙනි සද්ධිවිහාරිකයෝ උපාධ්‍යායයන් කෙරෙහි මැනැවින් නො පවතිත් යනු සැබෑ ද ?" යි ඇසූහ. භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය. – පෙ – ගර්හා කොට දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, සද්ධිවිහාරිකයා උපාධ්‍යායයා කෙරෙහි මැනැවින් නො පැවතිය යුතු නො වේ. යමෙක් මැනවින් නො පවත්නේ නම් (පැණ වූ වත් නො පුරන්නේ නම්), දුකුලා ඇවැත් වේ" (යයි වදාළ සේක.)

නෙව සම්මා වත්තන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අසම්මාවත්තන්තං පනාමෙතුං. එවඤ්ච පන භික්ඛවෙ, පනාමෙතබ්බො: "පනාමෙමි ත"න්ති වා "මායිධ පටික්කමී" ති වා "නීහර තෙ පත්තචීවර" න්ති වා "නාහං තයා උපට්ඨාතබ්බො" ති වා කායෙන විඤ්ඤාපෙති. වාචාය විඤ්ඤාපෙති. කායෙන වාචාය විඤ්ඤාපෙති. පනාමිතො හොති සද්ධිවිහාරිකො. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති, න පනාමිතො හොති සද්ධිවිහාරිකො.

3. තෙන ඛො පන සමයෙන සද්ධිවිහාරිකා පනාමිතා න ඛමාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ඛමාපෙතු"න්ති. නෙව ඛමාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, පනාමිතෙන න ඛමාපෙතබ්බො. යො න ඛමාපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

4. තෙන ඛො පන සමයෙන උපජ්ඣායා ඛමාපියමානා න ඛමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ඛමිතු" න්ති. නෙව ඛමන්ති. සද්ධිවිහාරිකා පක්කමන්තිපි විබ්භමන්තිපි තිත්ථියෙසුපි සඞ්කමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, ඛමාපියමානෙන න ඛමිතබ්බං. යො න ඛමෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

5. තෙන ඛො පන සමයෙන උපජ්ඣායා සම්මා වත්තන්තං පනාමෙන්ති. අසම්මා වත්තන්තං න පනාමෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ සම්මා වත්තන්තො පනාමෙතබ්බො. යො පනාමෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච [1] අසම්මාවත්තන්තො න පනාමෙතබ්බො. යො න පනාමෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

6. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො පනාමෙතබ්බො: උපජ්ඣායම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරී හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො පනාමෙතබ්බො.

1. "නච භික්ඛවෙ" ම. ඡ. සං. P. T. S.

(එහෙත් ඔහු) උපාධ්‍යායවත් මැනැවින් නො පුරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "මහණෙනි, නො මනා ව පවතින සද්ධිවිහාරිකයා බැහැර කරන්නට අනුදනිමි. "මහණෙනි, සද්ධිවිහාරිකයා බැහැර කළ යුත්තේ මෙසේ ය: "තා බැහැර කරමි" යි හෝ "මෙහි නො පිවිසෙව" යි හෝ "තාගේ පා සිවුරු බැහැරට ගණුව" යි හෝ "තා විසින් මම උපස්ථාන නො කට යුත්තෙමි" යි හෝ කයින් හඟවා ද, වචනයෙන් හඟවා ද, කයින් හා වචනයෙන් හඟවා ද, සද්ධිවිහාරික තෙමේ බැහැර කරණ ලද්දේ වේ. කයින් නො හඟවා ද, වචනයෙන් නො හඟවා ද, කයින් හා වචනයෙන් නොහඟවා ද, එකල්හි සද්ධිවිහාරික තෙමේ බැහැර නො කරණ ලද්දේ වේ.

3. එකල්හි බැහැර කළ සද්ධිවිහාරිකයෝ උපාධ්‍යායයන් කමා නො කරවත්. භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. (උන්වහන්සේ) "මහණෙනි, කමා කරවා ගන්නට අනුදනිමි" යි වදාළ සේක. එහෙත් උපාධ්‍යායයන් කමා නො කරවත්. භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "මහණෙනි, බැහැර කරණ ලද්දහු විසින් කමා නො කරවිය යුතු නො වේ. යමෙක් උපාධ්‍යායයන් කමා නො කරවන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළසේක.

4. එකල්හි සද්ධිවිහාරිකයන් විසින් කමා කරවනු ලබන උපාධ්‍යායයෝ කමා නො කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, කමා කරන්නට අනුදනිමි" යි වදාළ සේක. එහෙත් උපාධ්‍යායයෝ කමා නො කරත්. සද්ධිවිහාරිකයෝ බැහැර ද යෙති. සිවුරු ද හැර ලත්. අන්‍යතීර්ථකයන් වෙත ද යෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "කමා කරවනු ලබන්නහු විසින් කමා නො කළ යුතු නො වේ. යමෙක් කමා නො කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළසේක.

5. එකල්හි උපාධ්‍යායයෝ මනා කොට පිළිවෙත් පුරණ සද්ධිවිහාරිකයා බැහැර කෙරෙත්. මනා කොට පිළිවෙත් නො පුරණ සද්ධිවිහාරිකයා බැහැර නො කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, මනා කොට පිළිවෙත් පුරණ සද්ධිවිහාරික තෙමේ බැහැර නො කළ යුතු ය. යමෙක් බැහැර කරන්නේ නම්, දුකුලා ඇවැත් වේ. මනා කොට පිළිවෙත් නො පුරණ සද්ධිවිහාරික තෙමේ බැහැර නො කට යුතු නො වේ. යමෙක් බැහැර නො කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක.

6. මහණෙනි, කරුණු පසෙකින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර කට යුතු ය. උපාධ්‍යායයා කෙරෙහි අධික වූ ප්‍රේමයක් නො වේ ද, අධික වූ පැහැදීමෙක් නො වේ ද, අධික වූ ලජ්ජාවක් නො වේ ද, අධික වූ ගෞරවයක් නො වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් (සම්භාවනාවක්) නො වේද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර කට යුතු ය.

7. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො න පනාමෙතබ්බො. උපජ්ඣායම්හි අධිමත්තං පෙමං හොති, අධිමත්තො පසාදො හොති, අධිමත්තා හිරි හොති, අධිමත්තො ගාරවො හොති, අධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො න පනාමෙතබ්බො.

8. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො අලං පනාමෙතුං. උපජ්ඣායම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො අලං පනාමෙතුං.

9. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො නාලං පනාමෙතුං. උපජ්ඣායම්හි අධිමත්තං පෙමං හොති, අධිමත්තො පසාදො හොති, අධිමත්තා හිරි හොති, අධිමත්තො ගාරවො හොති, අධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො නාලං පනාමෙතුං.

10. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතං සද්ධිවිහාරිකං අපනාමෙන්තො උපජ්ඣායො සාතිසාරො හොති. පනාමෙන්තො අනතිසාරො හොති. උපජ්ඣායම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං සද්ධිවිහාරිකං අපනාමෙන්තො උපජ්ඣායො සාතිසාරො හොති. පනාමෙන්තො අනතිසාරො හොති.

11. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතං සද්ධිවිහාරිකං පනාමෙන්තො උපජ්ඣායො සාතිසාරො හොති. අපනාමෙන්තො අනතිසාරො හොති. උපජ්ඣායම්හි අධිමත්තං පෙමං හොති. අධිමත්තො පසාදො හොති, අධිමත්තා හිරි හොති, අධිමත්තො ගාරවො හොති, අධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං සද්ධිවිහාරිකං පනාමෙන්තො උපජ්ඣායො සාතිසාරො හොති. අපනාමෙන්තො අනතිසාරො හොතීති.

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බ්‍රාහ්මණො (රාධො නාම) භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. තං භික්ඛූ න ඉච්ඡිංසු පබ්බාජෙතුං. සො භික්ඛූසු පබ්බජ්ජං අලභමානො කිසො අහොසි ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො.

7. මහණෙනි, කරුණු පසෙකින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර නො කට යුතු ය. උපාධ්‍යායයා කෙරෙහි අධික වූ ප්‍රේමයක් වේ ද, අධික වූ පැහැදීමෙක් වේ ද, අධික වූ ලජ්ජාවක් වේද, අධික වූ ගෞරවයෙක් වේ ද, අධික වූ මෛත්‍රීභාවනාවක් වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර නො කට යුතු ය.

8. මහණෙනි, කරුණු පසකින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර කරන්නට සුදුසු වේ. උපාධ්‍යායයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් නො වේ ද, අධික වූ පැහැදීමෙක් නො වේ ද; අධික වූ ලජ්ජාවක් නො වේ ද, අධික වූ ගෞරවයෙක් නො වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් නො වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර කරන්නට සුදුසු වේ.

9. මහණෙනි, කරුණු පසකින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර කරන්නට සුදුසු නො වේ. උපාධ්‍යායයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් වේ ද අධික වූ පැහැදීමෙක් වේ ද, අධික වූ ලජ්ජාවක් වේ ද, අධික වූ ගෞරවයෙක් වේ ද, අධික වූ මෛත්‍රීභාවනාවක් වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සද්ධිවිහාරික තෙමේ බැහැර කරන්නට සුදුසු නො වේ.

10. මහණෙනි, කරුණු පසකින් යුත් සද්ධිවිහාරිකයා බැහැර නො කරන්නා වූ උපාධ්‍යාය තෙමේ දොස් සහිත වේ. බැහැර කරන්නේ දොස් රහිත වේ. උපාධ්‍යායයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් නො වේ ද, අධික වූ පැහැදීමෙක් නො වේ ද, අධික වූ ලජ්ජාවක් නො වේ ද, අධික වූ ගෞරවයෙක් නො වේ ද, අධික වූ මෛත්‍රීභාවනාවක් නො වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සද්ධිවිහාරිකයා බැහැර නො කරන්නා වූ උපාධ්‍යාය තෙමේ දොස් සහිත වේ. බැහැර කරන්නේ දොස් රහිත වේ.

11. මහණෙනි, කරුණු පසකින් යුත් සද්ධිවිහාරිකයා බැහැර කරන්නා වූ උපාධ්‍යාය තෙමේ දොස් සහිත වේ. බැහැර නො කරන්නේ දොස් රහිත වේ. උපාධ්‍යායයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් වේ ද, අධික වූ පැහැදීමෙක් වේ ද, අධික වූ ලජ්ජාවක් වේ ද, අධික වූ ගෞරවයෙක් වේ ද, අධික වූ මෛත්‍රීභාවනාවක් වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සද්ධිවිහාරිකයා බැහැර කරන්නා වූ උපාධ්‍යාය තෙමේ දොස් සහිත වේ. බැහැර නො කරන්නේ දොස් රහිත වේ.

12. එකල්හි **රාධ** නම් එක්තරා බමුණෙක් භික්ෂූන් වෙත පැමිණ පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ඔහු පැවිදි කරන්නට නො කැමැති වූහ. හෙතෙමේ භික්ෂූන් සමීපයෙහි පැවිද්ද නො ලබන්නේ වැරුණු සිරුරු ඇත්තේ රළු වූයේ දුර්වර්ණ වූයේ ඉතා පඬුවන් සිරුර ඇත්තේ නහර ඉල්පුනු සිරුරු ඇත්තේ වි ය.

13. අද්දසා ඛො භගවා තං බ්‍රාහ්මණං කිසං ලූඛං දුබ්බණ්ණං උප්පණ්ඩුප්පණ්ඩුකජාතං ධමනිසන්ථතගත්තං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: "කිං නු ඛො සො භික්ඛවෙ, බ්‍රාහ්මණො කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො?" ති. "එසො භන්තෙ, බ්‍රාහ්මණො භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. තං භික්ඛූ න ඉච්ඡිංසු පබ්බාජෙතුං. සො භික්ඛූසු පබ්බජ්ජං අලභමානො කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො" ති.

14. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කො නු ඛො භික්ඛවෙ, තස්ස බ්‍රාහ්මණස්ස අධිකාරං සරතී?" ති. එවං වුත්තෙ ආයස්මා **සාරිපුත්තො** භගවන්තං එතදවොච: "අහං ඛො භන්තෙ තස්ස බ්‍රාහ්මණස්ස අධිකාරං සරාමී" ති. "කිං පන ත්වං සාරිපුත්ත, තස්ස බ්‍රාහ්මණස්ස අධිකාරං සරසී?" ති. "ඉධ මෙ භන්තෙ, සො බ්‍රාහ්මණො **රාජගහෙ** පිණ්ඩාය චරන්තස්ස කටච්ඡුභික්ඛං දාපෙසි. ඉමං ඛො අහං භන්තෙ, තස්ස බ්‍රාහ්මණස්ස අධිකාරං සරාමී" ති. "සාධු! සාධු! සාරිපුත්ත, කතඤ්ඤුනො හි සාරිපුත්ත, සප්පුරිසා කතවෙදිනො. තෙන හි ත්වං සාරිපුත්ත, තං බ්‍රාහ්මණං පබ්බාජෙහි උපසම්පාදෙහී" ති. "කථාහං භන්තෙ, තං බ්‍රාහ්මණං පබ්බාජෙමි? උපසම්පාදෙමී?" ති.

15. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "යා සා භික්ඛවෙ, මයා තීහි සරණගමනෙහි උපසම්පදා අනුඤ්ඤාතා, තාහං[1] අජ්ජතග්ගෙ පටික්ඛිපාමි. අනුජානාමි භික්ඛවෙ ඤත්තිචතුත්ථෙන කම්මෙන උපසම්පදං.[2] එවඤ්ච පන භික්ඛවෙ, උපසම්පාදෙතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

16. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙඛො[3], යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය. ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන එසා ඤත්ති.

17. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙඛො. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස න ක්ඛමති, සො භාසෙය්‍ය.

1. "තං" ම. ඡ. සං. 2. "උපසම්පාදෙතුං" ම ඡ. සං. P. T. S
3. "උපසම්පදාපෙක්ඛො" ම. ඡ. සං. P T. S

13. භාග්‍යවතුන් වහන්සේ වැරැණු සිරුරු ඇති රළු වූ දුර්වණි වූ ඉතා පඬුවන් වූ සිරුරු ඇති නහර ඉල්පුනු සිරුරු ඇති ඒ බමුණා දැක භික්ෂූන් අමතා "මහණෙනි, මේ බමුණා වැරැණේ රළු වූයේ නපුරු පැහැ ඇත්තේ ඉතා පඬුපැහැ ඇත්තේ නහර ඉල්පුනු සිරුරු ඇත්තේ කුමක් නිසා දැ" යි විචාළ සේක. "ස්වාමීනි, මේ බමුණා භික්ෂූන් වෙත පැමිණ පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ඕහු පැවිදි කරන්නට නො හැමැති වූහ. භික්ෂූන් වෙතින් පැවිද්ද නො ලබන්නා වූ මෙ තෙමේ වැරැණේ ය. රළු වූයේ ය. දුර්වණි වූයේ ය. ඉතා පඬුවන් සිරුරු ඇත්තේ වි ය. නහර ඉල්පුනු සිරුරු ඇත්තේ වී ය" යි භික්ෂූහු සැළකළහ.

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මෙහි ඉන්නා කවර භික්ෂු නමක් මේ බමුණා කළ සත්කාරයක් ගැණ දනී දැ ?" යි (විචාළ සේක.) මෙසේ අසා වදාළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ "ස්වාමීනි, මම මේ බමුණා කළ සත්කාරයක් ගැණ දනිමි" යි භාග්‍යවතුන් වහන්සේට දන්වා සිටියේ ය. "ශාරිපුත්‍රය, ඔබ මේ බමුණා කළ කිනම් සත්කාරයක් දන්නහු දැයි උන්වහන්සේ ඇසූහ. "ස්වාමීනි, මේ රජගහනුවර පිඬු සිඟා ගිය මට (එක් දිනෙක) මේ බමුණු තෙමේ සැන්දක් පමණ බත් දෙව්වේ ය. ස්වාමීනි, බමුණා කළ මේ සත්කාරය මම සිහිපත් කරමි" යි කී ය. භාග්‍යවතුන් වහන්සේ "ශාරිපුත්‍රය, ඔබගේ ඒ සිහිපත් කිරීම ඉතා මැනවි. සත්පුරුෂයෝ කළ දේ දන්නෝ ය. කළ දේ ඉතා ප්‍රකට ව දන්නෝ ම ය. ඒ නිසා ඔබ මේ බමුණා පැවිදි කරන්න. උපසම්පදා කරන්නැ" යි වදාළ සේක. ඉක්බිති ස්ථවිර තෙමේ "මම කෙසේ මේ බමුණා පැවිදි කරම් ද ? කෙසේ උපසම්පදා කරම් දැ ?" යි ඇසී ය.

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රථම කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, මා විසින් තුන්සරණ ගමනින් යම් ඒ උපසම්පදාවක් අනුදන්නා ලදද, ඒ උපසම්පදාව අද පටන් මම ප්‍රතික්ෂෙප කරමි. ඥප්තිචතුර්ථකර්මයෙන් උපසම්පදා කිරීම අනුදනිමි" යි වදාළ සේක. "මහණෙනි, උපසම්පදා කළ යුත්තේ මෙසේ යː- ප්‍රතිබල වූ ව්‍යක්ත වූ භික්ෂු නමක් විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්විය යුත්තේ ය.

16. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙනම් ඇති මේ තෙමේ මෙ නම් ඇති ආයුෂ්මතුන්ගේ උපසම්පදා-පෙක්ෂකයෙකි. ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් වේ නම් සඞ්ඝ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙනම් ඇත්තහු උපසම්පදා කරන්නේ ය. මේ දැන්වීම ය.

17. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇති මේ තෙමේ මෙ නම් ඇති ආයුෂ්මතුන්ගේ උපමපදාපෙක්ෂකයෙකි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇත්තහු මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්තව උපසම්පදා කරයි. යම් ආයුෂ්මත් කෙනෙකුන් හට මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තහුගේ උපසම්පදා තොමෝ රුචි වේ නම්, ඒ ආයුෂ්මත් තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙතෙමේ කියාවා.

18. ''දුතියම්පි එතමත්ථං වදාමි: සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති, ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

19 ''තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

20. ''උපසම්පන්නො සඞ්ඝෙන ඉත්ථන්නාමො ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී'' ති.

21. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු උපසම්පන්නසමනන්තරා අනාචාරං ආචරති. භික්ඛූ එවමාහංසු: ''මා ආවුසො එවරූපං අකාසි. නෙතං කප්පතී'' ති. සො එවමාහ: ''නෙවාහං ආයස්මන්තෙ යාචිං: 'උපසම්පාදෙථ ම'න්ති. කිස්ස මං තුම්හෙ අයාචිතං උපසම්පාදිත්ථා ?'' ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''න භික්ඛවෙ අයාචිතෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, යාචිතෙන උපසම්පාදෙතුං. එවං ච පන භික්ඛවෙ යාචිතබ්බො: තෙන උපසම්පදාපෙක්ඛෙන සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'සඞ්ඝං භන්තෙ, උපසම්පදං යාචාමි, උල්ලුම්පතු මං භන්තෙ සඞ්ඝො අනුකම්පං උපාදාය' ති. දුතියම්පි යාචිතබ්බො -පෙ- තතියම්පි යාචිතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

18. "දෙවනවර ද මේ කරුණ කියමි. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇති මේ තෙමේ මෙ නම් ඇති ආයුෂ්මතුන්ගේ උපසම්පදාපෙක්ෂකයෙකි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇත්තහු මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසම්පදා කරයි. යම් ආයුෂ්මත් කෙනෙකුන් හට මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තහුගේ උපසම්පදා තොමෝ රුචි වේ නම්, හෙතෙමේ තුෂ්ණීම්භූත වේවා. යමකුට රුචි නො වේ නම්, හෙතෙමේ කියාවා.

19. "තෙවනවර ද මේ කරුණ කියමි. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇති තෙරණ තෙමේ ආයුෂ්මත් වූ මෙ නම් ඇති තෙරුන්ගේ උපසම්පදාපෙක්ෂකයෙකි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති තෙරණහු මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසම්පදා කරයි. ආයුෂ්මත් වූ යම් ස්ථවිර නමක්හට මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇති තෙරණහුගේ උපසම්පදා තොමෝ රුචි වේ නම්, හෙතෙමේ තුෂ්ණීම්භූත වේවා. යමකුට රුචි නො වේ නම්, හෙතෙමේ කියාවා.

20. "සඞ්ඝයා විසින් මෙ නම් ඇති මෙ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසපන් කරණ ලද්දේ ය. එය සඞ්ඝයාට රුචි වේ. එබැවින් තුෂ්ණීම්භූත වේ. මේ කරුණ මෙසේ සලකමි.

21. එකල්හි එක්තරා මහණෙක් උපසම්පදාවට අනතුරු ව අනාචාරයෙහි හැසිරෙයි. සෙසු භික්ෂූහු "ඇවැත්නි, මෙබන්දක් නො කරව. මේ නො කැප ය" යි කීහ. ඒ මහණ තෙමේ "මම මා උපසපන් කරවූ" යි ආයුෂ්මතුන්ගෙන් නො ඉල්ලීමි. මා විසින් නො ඉල්වූ තමුන්නාන්සේලා කුමකට මා උපසපන් කලහු දැ?" යි ඇසී ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකලහ. "මහණෙනි, සඞ්ඝයා නො ඉල්ලනලදහු විසින් උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, ඉල්ලනලදහු උපසපන් කිරීම අනුදනිමි. මහණෙනි, මෙසේ ඉල්ලිය යුතු ය. උපසම්පදාපෙක්ෂක වූ මහණහු විසින් සඞ්ඝයා වෙත පැමිණ උතුරුසඟසිවුර එකස් කොට පොරවා ගෙණ භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලමි. ස්වාමීනි, මා කෙරෙහි අනුකම්පා කොට මා සාමණේරභාවයෙන් උදුරා භික්ෂුභාවයෙහි පිහිටුවනු මැනවි' යි මෙසේ කිය යුතු ය. දෙවනවර ද ඉල්ලිය යුතු ය. තෙවනවර ද ඉල්ලිය යුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණෙකු විසින් සඞ්ඝයාට මෙසේ දැන්විය යුතු ය:

'සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, එසා ඤත්ති.

'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

'දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ-

'උපසම්පන්නො සඞ්ඝෙන ඉත්ථන්නාමො ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී'' ති.

22. තෙන ඛො පන සමයෙන රාජගහෙ පණීතානං භත්තානං භත්තපටිපාටි අට්ඨිතා [1] හොති. අථ ඛො අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: ''ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සුඛසීලා සුඛසමාචාරා සුභොජනානි භුඤ්ජිත්වා නිවාතෙසු සයනෙසු සයන්ති. යන්නූනාහං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍ය'' න්ති.

23. අථ ඛො සො බ්‍රාහ්මණො භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. තං භික්ඛූ පබ්බාජෙසුං. උපසම්පාදෙසුං. තස්මිං පබ්බජිතෙ භත්තපටිපාටි ඛීයිත්ථ. භික්ඛූ එවමාහංසු: ''එහි'දානි ආවුසො, පිණ්ඩාය චරිස්සාමා''ති. සො එවමාහ: ''නාහං ආවුසො එතංකාරණා පබ්බජිතො පිණ්ඩාය චරිස්සාමී'' ති. සචෙ මෙ දස්සථ, භුඤ්ජිස්සාමි. නො චෙ මෙ දස්සථ, විබ්භමිස්සාමී'' ති. ''කිම්පන ත්වං ආවුසො, උදරස්ස කාරණා පබ්බජිතො?'' ති. ''එවමාවුසො'' ති.

24. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛු, එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ උදරස්ස කාරණා පබ්බජිස්සතී'' ති භගවතො [2] එතමත්ථං ආරොචෙසුං.

1. ''අධිට්ඨිතා'' P. T. S. 2. ''තෙ භික්ඛූ භගවතො'' ම. ඡ. සං. P. T. S

'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: මෙ නම් ඇති මේ තෙමේ මෙ නම් ඇති ආයුෂ්මතුන්ගේ උපසම්පදාපෙක්ෂක යෙකි. මෙ නම් ඇති මෙ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලයි. ඉදින් සඞ්ඝයාහට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් ඇත්තහු මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසපන් කරන්නේ ය. මේ දැන්වීම යි.

'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: මෙ නම් ඇති මේ තෙමේ මෙ නම් ඇති ආයුෂ්මතුන්ගේ උපසම්පදාපෙක්ෂකයෙකි. මෙ නම් ඇති හෙරණ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලයි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇත්තහු මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසපන් කරයි. යම් ආයුෂ්මත් කෙනකුන්ට මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තහුගේ උපසම්පදාව රුචි වේ නම්, ඒ ආයුෂ්මත් තෙමේ තුෂ්ණීම්භූත වේවා. යම් ආයුෂ්මත් කෙනකුන්ට රුචි නො වේ නම්, ඒ ආයුෂ්මත් තෙමේ කියාවා.

'දෙවනවර ද මේ කාරණය කියමි. -පෙ- තෙවනවර ද මේ කාරණය කියමි. -පෙ-

'සඞ්ඝයා විසින් මෙ නම් ඇති මෙ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසපන් කරණ ලද්දේ ය. සඞ්ඝයාහට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ සලකමි.

22. එකල්හි **රජගහ** නුවර ප්‍රණීත වූ බත් පිළිබඳ බත් පිළිවෙළක් නිති පැවැත්තේ වේ. එකල්හි එක්තරා බමුණකුට "මේ ශ්‍රමණශාක්‍ය-පුත්‍රයෝ සුඛස්වභාව ඇත්තෝ ය. සුව සේ හැසිරීම් ඇත්තෝ ය. මනා බොජුන් වළඳා හුළං නැති තැන්හි වූ යහන්හි නොවිත්. මම ශ්‍රමණ-ශාක්‍යපුත්‍රයන් කෙරෙහි පැවිදි වන්නෙම් නම් යෙහෙකැ" යි සිතෙක් විය.

23. ඉක්බිති ඒ බමුණු තෙමේ භික්ෂූන් කරා ගොස් පැවිද්ද ඉල්ලී ය. භික්ෂුහු ඔහු පැවිදි කොට උපසපන් කළහ. ඒ බමුණා පැවිදි වූ කල්හි බත්පිළිවෙළ නැවතුනේ ය. භික්ෂූන් "ඇවැත්නි, එව. දැන් පිඬු සිඟා යන්නෙමු" යි කී කල්හි හෙතෙමේ "ඇවැත්නි, මම 'පිඬු සිඟා යන්නෙමි' යි යන මේ හෙතුවෙන් පැවිදි නො වූයෙමි. ඉදින් මට දෙන්නහු නම්, වළඳන්නෙමි. නො දෙන්නහු නම්, සිවුරු හැර යන්නෙමි" යි කීයේ ය. "කිම, ඇවැත්නි, ඔබ බඩ නිසා පැවිදි වූවෝ ද ?" "ඇවැත්නි, එසේ ය."

24. යම් ඒ මහණහු ආශා නැත්තෝ ද, ඔහු "කෙසේ නම් මහණ, බඩ රැකීමේ බලාපොරොත්තුවෙන් මෙසේ මොනවට දෙසූ සාසනයෙහි පැවිදි වූයේ දැයි අවමන් කෙරෙත්. ගරහා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මේ සැලකළහ.

25. "සච්චං කිර ත්වං භික්ඛු, උදරස්ස කාරණා පබ්බජිතො?" ති. "සච්චං භගවා" ති. විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස, එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ උදරස්ස කාරණා පබ්බජිස්සසි? නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භීය්‍යොභාවාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

26. "අනුජානාමි භික්ඛවෙ උපසම්පාදෙන්තෙන චත්තාරො නිස්සයෙ ආචික්ඛිතුං: 'පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො: සඞ්ඝභත්තං උද්දෙසභත්තං නිමන්තනං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං.

"පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගං.

"රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො: විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා.

"පූතිමුත්තභෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතන්ති."

**උපජ්ඣායවත්තභාණවාරං නිට්ඨිතං පඨමං.**

---

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො මාණවකො භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. තස්ස භික්ඛූ පටිගච්චෙව නිස්සයෙ ආචික්ඛිංසු. සො එවමාහ: "සචෙ මෙ භන්තෙ, පබ්බජිතෙ නිස්සයෙ ආචික්ඛෙය්‍යාථ, අභිරමෙය්‍යඤ්චාහං [1]. න දානාහං භන්තෙ, පබ්බජිස්සාමි. ජෙගුච්ඡා මෙ නිස්සයා පටිකූලා" ති.

2. භික්ඛූ භගවතො එතමත්‍ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, පටිගච්චෙව නිස්සයා ආචික්ඛිතබ්බා. යො ආචික්ඛෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, උපසම්පන්නසමනන්තරා නිස්සයෙ ආචික්ඛිතු" න්ති.

---

1. "අභිරමෙය්‍යාමහං" ම. ඡ සං "අභිරමෙය්‍යං ස්වාහං" P. T. S.

25. "සැබෑ ද මහණ, ඔබ බඩ රැකීමේ හෙතුවෙන් පැවිදි වූවෝ ද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය." භාග්‍යවත්බුද්ධරජාණන්වහන්සේ "හිස් පුරුෂය, කෙසේ නම් ඔබ මෙසේ මොනවට දෙසූ සාසනයෙහි බඩ රැකීමේ හෙතුවෙන් පැවිදි වූවෝ ද? හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිස හෝ නො පවත්නේ ය" යි ගැරහූ සේක. ගරහා දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක:

26. "මහණෙනි, උපසපන් කරන්නහු විසින් නිඃසය සතර මේ ය යි කියාදීම මම නියම කරමි. 'පැවිද්ද සිඟා ලත් පිඬු බොජුන නිසා ය. තා විසින් දිවි තෙක් ඒ පිණ්ඩියාලොපභොජනයෙහි උත්සාහ කට යුතු ය. සඞ්ඝයාට දෙන බත, උදෙසා දෙන බත, ආරාධනා කොට දෙන බත, කුසපත් ලා දෙන බත, පසළොස් දිනකට වරක් දෙන බත, පොහෝ දිනයෙහි දෙන බත, පැලවීදිනයෙහි දෙන බත, වැඩි ලැබීම් වේ.

"පැවිද්ද පසුල් සිවුර නිසා ය. තා විසින් දිවි තෙක් එහි උත්සාහ කට යුතු ය. කොමු, කපු, තිතිරි (පටනූලෙන් කළ පිළි), කම්බිලි, හණ, මිශ්‍ර පිළි වැඩි ලැබීම් වේ.

"පැවිද්ද, රුක්මුල සෙනසුන නිසා ය. තා විසින් දිවි තෙක් එහි උත්සාහ කට යුතු ය. වෙහෙර, ගුරුළු පියාපත් ලෙසින් කළ වහල ඇති ගෙය, සිවුරැස්ගෙය, සඳලු සහිත ගෙය, ලෙන, වැඩි ලැබීම් වේ.

"පැවිද්ද පූතිමුත්තභෙසජ්ජය* නිසා ය. තා විසින් දිවි තෙක් එහි උත්සාහ කට යුතු ය. ගිතෙල්, වෙඬරු, තෙල්, මී, උක්හකුරු යන මේ වැඩි ලැබීම් වේ."

**පඤ්චම උපාද්ධ්‍යායවත්තභාණවර නිමි.**

---

1. එකල්හි එක්තරා මාණවකයෙක් භික්ෂූන් වෙත ගොස් පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ඔහුට පළමු කොට ම සිවු නිඃසය කීහ. ඒ මහණ තෙමේ "ස්වාමීනි, පැවිදි වූ කල්හි මට සිවු නිඃසය කිහු නම්, මම (පැවිද්දෙහි) කැමති වන්නේ හෝ වෙමි. මම දැන් පැවිදි නො වන්නෙමි. සිවු නිඃසය මා විසින් ගරහන ලද ය. මට පිළිකුල් ය" යි මෙසේ කීයේ ය.

2. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළකළහ. "මහණෙනි, පළමු කොට ම සිවු නිඃසය නො කිය යුතු ය. යම් මහණෙක් කියන්නේ නම්, දුකුළා ඇවැත් වේ. මහණෙනි, උපසම්පදාවට අනතුරු ව සිවු නිඃසය කියන්නට අනුදනිමි.

* උපග්‍රන්ථය බලනු.

3. තෙන ඛො පන සමයෙන භික්ඛූ ද්වෙවග්ගෙනපි තිවග්ගෙනපි ගණෙන [1] උපසම්පාදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, ඌනදසවග්ගෙන ගණෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, දසවග්ගෙන වා අතිරෙකදසවග්ගෙන වා ගණෙන උපසම්පාදෙතු"න්ති.

4 තෙන ඛො පන සමයෙන භික්ඛූ එකවස්සාපි ද්විවස්සාපි සද්ධිවිහාරිකං උපසම්පාදෙන්ති. ආයස්මාපි **උපසෙනො වඞ්ගන්තපුත්තො** එකවස්සො සද්ධිවිහාරිකං උපසම්පාදෙසි. සො වස්සං වුත්ථො ද්විවස්සො එකවස්සං සද්ධිවිහාරිකං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං.

5. අථ ඛො භගවා ආයස්මන්තං උපසෙනං වඞ්ගන්තපුත්තං එතදවොච: "කච්චි භික්ඛු ඛමනීයං? කච්චි යාපනීයං? කච්චිත්ථ [2] අප්පකිලමථෙන අද්ධානං ආගතා?" ති [3]. "ඛමනීයං භගවා. යාපනීයං භගවා. අප්පකිලමථෙන ච මයං භන්තෙ අද්ධානං ආගතා" ති.

6. ජානන්තාපි තථාගතා පුච්ඡන්ති. ජානන්තාපි න පුච්ඡන්ති. කාලං විදිත්වා පුච්ඡන්ති. කාලං විදිත්වා න පුච්ඡන්ති. අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති. නො අනත්ථසංහිතං. අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං. ද්වීහි ආකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛූ පටිපුච්ඡන්ති. ධම්මං වා දෙසෙස්සාම; සාවකානං වා සික්ඛාපදං පඤ්ඤාපෙස්සාමී ති.

7. අථ ඛො භගවා ආයස්මන්තං උපසෙනං වඞ්ගන්තපුත්තං එතදවොච: "කතිවස්සො'සි ත්වං භික්ඛු?" ති. "ද්විවස්සො අහං භගවා"ති. අයං පන භික්ඛු කතිවස්සො?" ති. "එකවස්සො භගවා" ති. "කිංනායං භික්ඛු හොතී?"ති "සද්ධිවිහාරිකො මෙ භගවා"ති.

8. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, අඤ්ඤෙහි ඔවදියො අනුසාසියො අඤ්ඤං ඔවදිතුං අනුසාසිතුං මඤ්ඤිස්සසි? අතිලහුං ඛො ත්වං මොඝපුරිස, බාහුල්ලාය ආවත්තො යදිදං ගණබන්ධිකං. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය" -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, ඌනදසවස්සෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, දසවස්සෙන වා අතිරෙකදසවස්සෙන වා උපසම්පාදෙතු"න්ති.

---

1. "චතුවග්ගෙනපි ගණෙන" ම. නු ප; නො වි.
2. "කච්චි ත්වං" ම. ජ. සං. 3 "ආගතොති" ම ජ. සං.

3. එකල්හි භික්ෂූහු දෙදෙනෙකුන් වූ ගණයාගෙන් යුක්ත ව ද තිදෙනකුන් වූ ගණයාගෙන් යුක්ත ව ද උපසම්පදා කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. "මහණෙනි, දසදෙනකුන්ට අඩු වූ ගණයා විසින් උපසපන් නො කට යුතු ය. යම් මහණෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, දසනමක් වූ හෝ දසනමකට වැඩි වූ හෝ ගණයාගෙන් යුක්ත ව උපසපන් කළ යුතු ය" යි අනුදනිමි.

4. එකල්හි උපසපන් වීමෙන් එක්වස් ඇත්තා වූ ද දෙවස් ඇත්තා වූ ද භික්ෂූහු සද්ධිවිහාරිකයා උපසපන් කරති. **වඞ්ගන්ත**බැමිණියගේ පුත් වූ ආයුෂමත් **උපසෙන** භික්ෂු තෙමේ ද උපසපන් වීමෙන් එක් වස් ඇත්තේ සද්ධිවිහාරිකයකු උපසපන් කෙළේ ය. ඒ වඞ්ගන්තපුත්‍ර වූ උපසෙන භික්ෂු තෙමේ වස් පවාරණය කළේ දෙවස් ඇත්තේ එක්වස් ඇති සද්ධිවිහාරිකයා ගෙණ භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්නේ ය. භාග්‍යවත් බුදුරජුන්හට ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කතා කිරීම පුරුදු ම ය.

5. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කිම ඉරියවු ඉවසිය හැකි ද? කිම දිවි යැපිය හැකි ද? කිම නිදුකින් දික්මග ආවහු ද" යි වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂමත් උපසෙන භික්ෂූහුගෙන් විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. ස්වාමීනි, අපි නිදුකින් දික්මග ආවෙමු" යි හේ කී ය.

6. තථාගතවරු දැන ද විචාරත්. දැන ද නො විචාරත්. කල් දැන විචාරත්. කල් දැන නො විචාරත්. තථාගතවරු අර්ථයෙන් යුක්ත වූවක් විචාරත්. අනර්ථයෙන් යුක්ත වූවක් නො විචාරත්. අනර්ථසහිතවචනයෙහි තථාගතවරු මාර්ගයෙන් සෙතු නැසූ සේක. 'ධර්මය හෝ දෙසන්නෙමි. ශ්‍රාවකයන්ට ශික්ෂාපද හෝ පණවන්නෙමි යි' යන දෙ කරුණෙන් භාග්‍යවත් බුදුවරයෝ භික්ෂූන් විචාරත්.

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණ, කොතෙක් වස් ඇත්තෙහි ද" යි වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂමත් උපසෙන භික්ෂූහට මෙය වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, මම දෙවස් ඇත්තෙමි". "මේ මහණ කොතෙක් වස් ඇත්තේ ද ?" "භාග්‍යවතුන් වහන්ස, එක්වස් ඇත්තේ ය". "මේ මහණ තට කවරෙක් ද" යි ඇසූ කල්හි "භාග්‍යවතුන් වහන්ස, මාගේ සද්ධිවිහාරිකයා" යි කී ය.

8. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "හිස් පුරුෂය, (තාගේ ක්‍රියාව) නුසුදුසු ය. නො ගැළපෙන්නකි. නො සම වූවෙකි. මහණකමට නො සුදුසු ය. අකැප වූවෙකි. නො කට යුත්තෙකි යි" නින්දා කළ සේක. හිස් පුරුෂය, තෝ අනුන් විසින් අවවාද කට යුත්තෙහි ය. අනුසාසනා කටයුත්තෙහි ය. කෙසේ නම් අනිකකුට අවවාද කරන්නට අනුසාසනා කරන්නට **සිතුයෙහි ද ?** හිස් පුරුෂය, යම් මේ පිරිස් බැඳ ගැණීම වූ බහුලභාවයෙක් වේ ද, එයට තෝ ඉතා ඉක්මනට ම වැටුනෙහි ය. හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ -පෙ- නො පවතී" යි ගරහා දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, අඩු දසවස් ඇති මහණහු විසින් උපසපන් නො කට යුතු ය. අඩු දස වස් ඇති යම් මහණෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, දසවස් පිරුණු මහණහු විසින් හෝ වැඩි දසවස් ඇති මහණහු විසින් හෝ උපසම්පදා කරන්නට අනුදනිමි".

9. තෙන ඛො පන සමයෙන භික්ඛූ "දසවස්සම්හ, දසවස්සම්හා"ති[1] බාලා අබ්‍යත්තා උපසම්පාදෙන්ති. දිස්සන්ති උපජ්ඣායා බාලා, සද්ධිවිහාරිකා පණ්ඩිතා. දිස්සන්ති උපජ්ඣායා අබ්‍යත්තා, සද්ධිවිහාරිකා බ්‍යත්තා. දිස්සන්ති උපජ්ඣායා අප්පස්සුතා, සද්ධිවිහාරිකා බහුස්සුතා. දිස්සන්ති උපජ්ඣායා දුප්පඤ්ඤා, සද්ධිවිහාරිකා පඤ්ඤවන්තො.

10 අඤ්ඤතරොපි අඤ්ඤතිත්ථියපුබ්බො උපජ්ඣායෙන සහධම්මිකං වුච්චමානො උපජ්ඣායස්ස වාදං ආරොපෙත්වා තංයෙව තිත්ථායතනං සඞ්කමි.

11. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ 'දසවස්සම්හ, දසවස්සම්හා' ති බාලා අබ්‍යත්තා උපසම්පාදෙස්සන්ති? දිස්සන්ති උපජ්ඣායා බාලා, සද්ධිවිහාරිකා පණ්ඩිතා. දිස්සන්ති උපජ්ඣායා අබ්‍යත්තා, සද්ධිවිහාරිකා බ්‍යත්තා. දිස්සන්ති උපජ්ඣායා අප්පස්සුතා, සද්ධිවිහාරිකා බහුස්සුතා. දිස්සන්ති උපජ්ඣායා දුප්පඤ්ඤා, සද්ධිවිහාරිකා පඤ්ඤවන්තො" ති.

12. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, භික්ඛූ 'දසවස්සම්හ දසවස්සම්හා' ති බාලා අබ්‍යත්තා උපසම්පාදෙන්ති? දිස්සන්ති උපජ්ඣායා බාලා, සද්ධිවිහාරිකා පණ්ඩිතා? දිස්සන්ති උපජ්ඣායා අබ්‍යත්තා සද්ධිවිහාරිකා බ්‍යත්තා? දිස්සන්ති උපජ්ඣායා අප්පස්සුතා, සද්ධිවිහාරිකා බහුස්සුතා? දිස්සන්ති උපජ්ඣායා දුප්පඤ්ඤා, සද්ධිවිහාරිකා පඤ්ඤවන්තො?" ති.

13. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා "කථං හි නාම තෙ භික්ඛවෙ, මොඝපුරිසා 'දසවස්සම්හ, දසවස්සම්හා' ති බාලා අබ්‍යත්තා උපසම්පාදෙස්සන්ති? දිස්සන්ති උපජ්ඣායා බාලා -පෙ- සද්ධිවිහාරිකා පඤ්ඤවන්තො. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, බාලෙන අබ්‍යත්තෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙකදසවස්සෙන වා උපසම්පාදෙතු" න්ති.

14. තෙන ඛො පන සමයෙන භික්ඛූ උපජ්ඣායෙසු පක්කන්තෙසුපි විබ්භන්තෙසුපි කාලඞ්කතෙසුපි පක්ඛසඞ්කන්තෙසුපි අනාචරියකා අනොවදියමානා අනනුසාසියමානා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරන්ති.

1. "දසවස්සම්හා දසවස්සම්හා ති" ම. ඡ. සං.

9. එකල්හි "දසවස් ඇත්තම්හ, දසවස් ඇත්තම්හ" යි අඥාන වූ අව්‍යක්ත වූ භික්ෂූහු උපසපන් කෙරෙති. උපාධ්‍යායයෝ අඥ වූවාහු සද්ධිවිහාරිකයෝ පණ්ඩිත වූවාහු දක්නා ලැබෙත්. උපාධ්‍යායයෝ අව්‍යක්ත වූවාහු සද්ධිවිහාරිකයෝ ව්‍යක්ත වූවාහු දක්නා ලැබෙත්. උපාධ්‍යායයෝ අල්පශ්‍රැත වූවාහු සද්ධිවිහාරිකයෝ බහුශ්‍රැත වූවාහු දක්නා ලැබෙත්. උපාධ්‍යායයෝ නුවණ නැත්තාහු සද්ධිවිහාරිකයෝ නුවණ ඇත්තාහු දක්නා ලැබෙත්.

10. පෙර අන්‍යතීර්ථකයන් කෙරෙහි පැවිදි ව වුසූ එක්තරා මහණෙක් ද උපාධ්‍යායයන් විසින් සහධර්මයෙන් කියනු ලබන්නේ උපාධ්‍යායයාහට වාදාරොපණය කොට ඒ තීර්ථායතනයට ම ගියේ ය.

11. ආශාරක්ෂිත වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඔහු අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්: "කෙසේ නම් 'භික්ෂූහු දස වස් ඇත්තම්හ' දස වස් ඇත්තම්හ' යි අඥ වූවාහු අව්‍යක්ත වූවාහු උපසපන් කරන්නාහු ද? උපාධ්‍යායයෝ අඥ වූවාහු සද්ධිවිහාරිකයෝ පණ්ඩිත වූවාහු දක්නා ලැබෙත්. උපාධ්‍යායයෝ අව්‍යක්ත වූවාහු සද්ධිවිහාරිකයෝ ව්‍යක්ත වූවාහු දක්නා ලැබෙත්. උපාධ්‍යායයෝ අල්පශ්‍රැත වූවාහු සද්ධිවිහාරිකයෝ බහුශ්‍රැත වූවාහු දක්නා ලැබෙත්. උපාධ්‍යායයෝ නුවණ නැත්තාහු සද්ධිවිහාරිකයෝ නුවණ ඇත්තාහු දක්නා ලැබෙත්".

12. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය දැන්වූහ. "මහණෙනි, සැබෑ ද? භික්ෂූහු 'දසවස් ඇත්තම්හ' දසවස් ඇත්තම්හ යි අඥ වූවෝ අව්‍යක්ත වූවෝ උපසපන් කරන්නහු ද? උපාධ්‍යායයෝ අඥ වූවාහු සද්ධිවිහාරිකයෝ පණ්ඩිත වූවාහු දක්නා ලැබෙත් ද? උපාධ්‍යාය යෝ අව්‍යක්ත වූවාහු සද්ධිවිහාරිකයෝ ව්‍යක්ත වූවාහු දක්නා ලැබෙත් ද? උපාධ්‍යායයෝ අල්පශ්‍රැත වූවාහු සද්ධිවිහාරිකයෝ බහුශ්‍රැත වූවාහු දක්නා ලැබෙත් ද? උපාධ්‍යායයෝ නුවණ නැත්තාහු සද්ධිවිහාරිකයෝ නුවණ ඇත්තාහු දක්නා ලැබෙත් ද?"

13. "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ 'දස වස් ඇත්තම්හ, දසවස් ඇත්තම්හ' යි අඥ වූවාහු අව්‍යක්ත වූවාහු උපසපන් කරත් ද? උපාධ්‍යායයෝ අඥ වූවාහු -පෙ- සද්ධිවිහාරිකයෝ නුවණ ඇත්තාහු දක්නා ලැබෙත් ද? මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො පවතී යි -පෙ- ගැරහූ සේක. ගරහා දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, අඥ වූ අව්‍යක්ත වූ මහණහු විසින් උපසපන් නො කට යුතු ය. යම් මහණෙක් උපසපන් කරන්නේ නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ දස වස් ඇත්තා වූ හෝ වැඩි දස වස් ඇත්තා වූ හෝ මහණහු විසින් උපසපන් කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

14. එකල්හි භික්ෂූහු උපාධ්‍යායයන් බැහැර ගිය කල්හි ද සිවුරු හැර ගිය කල්හි ද කලුරිය කළ කල්හි ද අන්‍යතීර්ථකපක්ෂයකට මාරු වූ කල්හි ද ආචාර්යයන්ගෙන් තොර වූවෝ අවවාද නො කරණු ලබන්නෝ අනුශාසනා නො කරණු ලබන්නෝ නොමනා සේ හැන්දේ නොමනා සේ පෙරවූවෝ මහණහුට සුදුසු හැසිරීමෙන් තොර වූවෝ පිඬු සිඟා යෙත්.

15. මනුස්සානං භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති. උපරි ඛාදනීයෙපි උපරි සායනීයෙපි උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති. සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති. භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරන්ති.

16. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරිස්සන්ති? මනුස්සානං භුඤ්ජමානානං උපරි භොජනෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? උපරි ඛාදනීයෙපි උපරි සායනීයෙපි උපරි පානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙස්සන්ති? සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති? භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරිස්සන්ති සෙය්‍යථාපි බ්‍රාහ්මණභොජනෙ?" ති.

17. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ-

18. "සච්චං කිර භික්ඛවෙ," -පෙ- "සච්චං භගවා" -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ආචරියං. ආචරියො භික්ඛවෙ, අන්තෙවාසිකම්හි පුත්තචිත්තං උපට්ඨාපෙස්සති. අන්තෙවාසිකො ආචරියම්හි පිතුචිත්තං උපට්ඨාපෙස්සති. එවං තෙ අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභාගවුත්තිනො විහරන්තා ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්ති.

19. "අනුජානාමි භික්ඛවෙ, දසවස්සං නිස්සාය වත්ථුං, දසවස්සෙන නිස්සයං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ ආචරියො ගහෙතබ්බො: එකංසං උත්තරාසඞ්ගං කරිත්වා පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'ආචරියො මෙ භන්තෙ, හොහි. ආයස්මතො නිස්සාය වච්ඡාමි. ආචරියො මෙ භන්තෙ, හොහි. ආයස්මතො නිස්සාය වච්ඡාමි. ආචරියො මෙ භන්තෙ, හොහි. ආයස්මතො නිස්සාය වච්ඡාමී' ති. 'සාහු' වා 'ලහු' වා 'ඔපායික' න්ති වා 'පතිරූප' න්ති වා 'පාසාදිකෙන සම්පාදෙහී' ති වා කායෙන විඤ්ඤාපෙති, වාචාය විඤ්ඤාපෙති, කායෙන වාචාය විඤ්ඤාපෙති, ගහිතො හොති ආචරියො. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති, න ගහිතො හොති ආචරියො.

20. අන්තෙවාසිකෙන භික්ඛවෙ ආචරියම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා:- කාලස්සෙව වුට්ඨාය උපාහනා[1] ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤාපෙතබ්බං. සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුපීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං.

1. "උපාහනං" - ම. ඡ. සං.

Free Distribution www.aathaapi.org

15. අනුභව කරණ මිනිසුන්ගේ බොජුන් මතුයෙහි ද ඉඳුල් පාත්‍රය අල්ලති. කෑම මතුයෙහි ද රස විඳිය යුතු දෙය මතුයෙහි ද පිය යුතු දෙය මතුයෙහි ද ඉඳුල් පාත්‍රය අල්ලති. තුමූ ව්‍යඤ්ජන ද බත් ද විනවා ගෙණ අනුභව කරත්. බොජුන්හලෙහි ද උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වෙසෙත්.

16. මිනිස්සු "කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයෝ නො මනා සේ හැන්දෙ නො මනා සේ පෙරෙව්වෝ ශ්‍රමණසාරූප්‍යාචාරයෙන් තොර වූවෝ පිඬු සිඟා හැසිරෙත් ද? මිනිසුන් අනුභව කරණ කල්හි බොජුන් මතුයෙහි ඉඳුල් පාත්‍රය අල්ලත් ද? කෑම මතුයෙහි ද රස විඳිය යතු දෙය මතුයෙහි ද පිය යුතු දෙය මතුයෙහි ද ඉඳුල් පාත්‍රය අල්ලත් ද? බ්‍රාහමණභොජනයෙහි බමුණන් මෙන් බොජුන්හලෙහි උස් හඬ ඇති ව මහත් හඬ ඇති ව වසත් ද? අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්.

17. භික්ෂූහු පහත් කොට සිතන නින්ද, කරණ දෙස් කියන ඒ මිනිසුන්ගේ කතාව ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු ඒ වග භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ.

18. "මහණෙනි, සැබෑ ද?" -පෙ- "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය" -පෙ- ගරහා දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, ආචාර්‍ය්‍යයකු අනුදනිමි" යි වදාළ සේක. "මහණෙනි, ආචාර්‍ය්‍යතෙමේ අතැවැසියා කෙරෙහි පුත්‍රයා ය යන සිත උපදවන්නේ ය. අතැවැසිතෙමේ ආචාර්‍ය්‍යයා කෙරෙහි පියා ය යන සිත උපදවන්නේ ය. මෙසේ ඔහු ගුරුත් සහිත ව පිහිට සහිත ව සමාන පැවතුම් ඇති ව වසන්නෝ මේ සාසනයෙහි වැඩීමට මුල් බැසගැණීමට මහත්බවට පැමිණෙන්නෝ ය.

19. "මහණෙනි, දස වස් ඇති ඇදුරෙකු ඇසුරු කොට විසීම ද දසවස් ඇති ඇදුරෙකු විසින් නිස දීම ද අනුදනිමි. මහණෙනි, ආචාර්‍ය්‍ය තෙමේ මෙසේ පත් කර ගත යුත්තේ ය: උතුරුසඟසිවුර එකස් කොට ගෙණ පා වැඳ උකකුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මට ආචාර්‍ය්‍ය වනු මැනවි. මම ආයුෂ්මතුන් වහන්සේ නිසා වසන්නෙමි. ස්වාමීනි, මට ආචාර්‍ය්‍ය වනු මැනවි. මම ආයුෂ්මතුන් වහන්සේ නිසා වසන්නෙමි. ස්වාමීනි, මට ආචාර්‍ය්‍ය වනු මැනවි. මම ආයුෂ්මතුන් වහන්සේ නිසා වසන්නෙමි' යි (කිය යුතුය). ආචාර්‍ය්‍ය තෙමේ 'යහපතැ' යි හෝ 'පහසු' යි හෝ 'පිළිගත හැකි ය' යි හෝ 'සුදුසු' යි හෝ 'පහද වන සුලු පිළිවෙතින් සරු වෙව' යි හෝ කයින් හඟවා ද, වචනයෙන් හඟවා ද, කයින් හා වචනයෙන් හඟවා ද ආචාර්‍ය්‍ය තෙමේ ගන්නා ලද්දේ වේ. කයින් නො හඟවා ද, වචනයෙන් නො හඟවා ද, කයින් හා වචනයෙන් නො හඟවා ද, ආචාර්‍ය්‍ය තෙමේ නො ගන්නා ලද්දේ ය.

20. "මහණෙනි, අතැවැසියා විසින් ආචාර්‍ය්‍යයා කෙරෙහි මනා කොට පැවතිය යුතු ය. එහි මේ මනා කොට පැවැත්ම ය: උදය කලින් ම නැගිට වහන් මුදා උතුරුසඟසිවුර එකස් කොට දැහැටි දිය යුතු ය. මුව දෝනා දිය දිය යුතු ය. අසුන් පැණවිය යුතු ය. ඉදින් කැඳ තිබේ නම් බඳුන සෝදා කැඳ එළවිය යුතු ය. කැඳ වළඳා අවසන් කොට සිටියහුට දිය පිළිගන්වා බඳුන ගෙණ පාත් කොට නො ගටා මැනැවින් සෝදා තැන්පත් කොට තැබිය යුතු ය.

21. ආචරියම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ ආචරියො ගාමං පවිසිතුකාමො හොති, නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. සචෙ ආචරියො පච්ඡාසමණං ආකඞ්ඛති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා ආචරියස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං. නාච්චාසන්නෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං.

22. න ආචරියස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා. ආචරියො ආපත්තිසාමන්තා භණමානො නිවාරෙතබ්බො. නිවත්තන්තෙන පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පටිනිවාසනං දාතබ්බං. නිවාසනං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති, මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාදෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං: 'මා මජ්ඣෙ භඞ්ගො අහොසී' ති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

23. සචෙ පිණ්ඩපාතො හොති, ආචරියො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. ආචරියො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

24. ආචරියම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ ආචරියො න්හායිතුකාමො හොති, න්හානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති, සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො, උණ්හං පටියාදෙතබ්බං.

21. ආචාර්යයා නැගී සිටි කල්හි අසුන ඔසවා තැබිය යුතු ය. එදෙස කසළ සහිත නම් හැමදිය යුතු ය. ආචාර්යයීතෙමේ ගම් වදිනු කැමැත්තේ නම්, අඳනය දිය යුතු ය. ඇඳ තුබූ අඳනය පිළිගත යුතු ය. පටිය දිය යුතු ය. උතුරුසඟසිවුර හා සඟළ සිවුර එක් කොට සිවුරු දිය යුතු ය. සෝද දිය සහිත පාත්‍රය දිය යුතු ය. ඉදින් ආචාර්යයී තෙමේ පස්සේ යන මහණකු කැමැත්තේ නම් තෙමඬුලු වසන්නහු විසින් පිරිමඬුලු කොට හැඳ පටිය බැඳ උතුරුසඟ හා සඟළ සිවුර එක් කොට පොරොවා ගෙණ ගණ්ඨිය අවුණා පාත්‍රය සෝද ගෙණ ආචාර්යයාහට පස්සේ යන මහණකු විය යුතු ය. ඉතා දුරින් නො යා යුතු ය. ඉතා ළඟින් නො යා යුතු ය. පාත්‍රයෙහි ඉතිරි වූ දෙය පිළිගත යුතු ය.

22. ආචාර්යයා කතා කරණ කල්හි අතරතුර කතා නො බැණිය යුතු ය. ආචාර්යයී තෙමේ ඇවැත් වියහැකි තරම් වූ වදන් කියන්නේ නම් වැළැක්විය යුතු ය. පිඬු සිඟා නවතින්නහු විසින් පළමු කොට අවුත් අසුන් පැණවිය යුතු ය. පා දෝනා දිය ද පාපුටුව ද නො සේදූ පා තබන පුවරුව ද එළවිය යුතු ය. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගත යුතු ය. කලින් ඇඳ තුබූ අඳනය දිය යුතු ය. ඇඳි අඳනය පිළිගත යුතු ය. සිවුර තෙත් නම්, මොහොතක් උෂ්ණයෙහි ලා වියලිය යුතු ය. සිවුර උෂ්ණයෙහි වැඩියක් නො දැවිය යුතු ය. සිවුර නැමිය යුතු ය. සිවුර නමන්නහු විසින් සතරඟුලක් පමණ සිවුරු කොණ උස් කොට 'මැද නො බිඳේවා' යි නැමිය යුතු ය. සිවුරුදරණයෙහි පටිය බහා තැබිය යුතු ය.

23. ඉදින් පිණ්ඩපාතය වේ ද ආචාර්යයී තෙමේත් වළඳනු කැමති වේ නම්, දිය පිළිගන්වා පිණ්ඩපාතය එළවිය යුතු ය. ආචාර්යයාහට පැන් වුවමනා දැයි පිළිවිසිය යුතු ය. වළඳා අවසන් කළහුට දිය පිළිගන්වා පාත්‍රය පිළිගෙණ පාත් කොට නො ගටා මනා කොට සෝද, දිය පිස දමා මොහොතක් උෂ්ණයෙහි තැබිය යුතු ය. පාත්‍රය උෂ්ණයෙහි ලා වැඩියක් නො දැවිය යුතු ය. පාසිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා බැලිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය බහා නො තැබිය යුතු ය. සිවුර බහා තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුරු ලන උණදඬුව හෝ සිවුරු ලන රැහැණ හෝ පිරිමැද පිරිසිදු කොට නුවාව එහාට ද දරණය මෙහාට ද තබා සිවුර බැහිය යුතු ය.

24. ආචාර්යයා නැගී සිටි කල්හි ආසනය ඔසවා තැබිය යුතු ය. පා දෝනා දිය ද පාපුටුව ද නො සේදූ පා තබන පුවරුව ද තැන්පත් කොට තැබිය යුතු ය. ඉදින් එ දෙස කසළ සහිත නම්, හැමැන්ද යුතු ය. ආචාර්යයී තෙමේ නහනු කැමැත්තේ නම් නහනු පිළියෙළ කළ යුතු ය. සිහිල් දියෙන් ප්‍රයෝජන නම්, සිහිල් දිය පිළියෙල කළ යුතු ය. උණු දියෙන් ප්‍රයෝජන නම්, උණු දිය පිළියෙල කළ යුතු ය.

25. සචෙ ආචරියො ජන්තාඝරං පවිසිතුකාමො හොති, චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය ආචරියස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා. එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති, ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා. ජන්තාඝරෙ ආචරියස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං.

26. උදකෙපි ආචරියස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා ආචරියස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. ආචරියො පානීයෙන පුච්ඡිතබ්බො. සචෙ උද්දිසාපෙතුකාමො හොති, උද්දිසාපෙතබ්බො. සචෙ පරිපුච්ඡිතුකාමො හොති, පරිපුච්ඡිතබ්බො.

27. යස්මිං විහාරෙ ආචරියො විහරති, සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ, උස්සහති, සොධෙතබ්බො, විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භිසිබිබ්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චො නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා.

28. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භුම්මත්ථරණං යථාපඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. සචෙ විහාරෙ සන්තානකං හොති, උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ අකතා හොති භූමි, උදකෙන පරිප්ඵොසෙත්වා සම්මජ්ජිතබ්බා: "මා විහාරො රජෙන උහඤ්ඤී" ති.

25. ආචාර්‍යයීතෙමේ ගිනිහල්ගෙට පිවිසෙනු කැමැත්තේ නම්, නහනසුණු දියෙන් තෙමා පිඩු කළ යුතු ය. නහනමැටි තෙමිය යුතු ය. ගිනිහල්ගෙයි පුටුව ගෙණ ආචාර්‍යයීයන් වහන්සේට පිටු පසින් ගොස් ගිනිහල්ගෙයි පුටුව දී සිවුර පිළිගෙණ පසෙක බහා තැබිය යුතු ය. නහන සුණු දිය යුතු ය. නහනමැටි තෙමිය යුතු ය. හැක්කේ නම් ගිනිහල් ගෙට යා යුතු ය. ගිනිහල්ගෙට යන්නහු විසින් මැටියෙන් මූණ තවරා ඉදිරිපසින් හා පසුපසින් සිරුර වසා ගෙණ ගිනිහල්ගෙට පිවිසිය යුතු ය. ස්ථවිරභික්ෂූන් ගටා නො හිඳිය යුතු ය. නවකභික්ෂූන් ආසන යෙන් බැහැර නො කළ යුතු ය. ගිනිහල්ගෙයි දී ආචාර්‍යයීයාගේ ඇඟ ඉලීම් ඈ වත් කළ යුතු ය. ගිනිහල්ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල්ගෙයි පුටුව ගෙණ ඉදිරියෙන් හා පස්සෙන් සිරුර වසා ගෙණ ගිනිහල්ගෙයින් නික්මිය යුතු ය.

26. දියෙහි දී ද ආචාර්‍යයීයාගේ ඇඟ ඉලීම් ඈ වත් කළ යුතු ය. නා අවසන් කළහු විසින් පළමු කොට ගොඩ නැගී තමාගේ සිරුරෙහි දිය පිසදමා හැඳ පොරොවා ගෙණ ආචාර්‍යයීයාගේ සිරුරෙහි දිය පිස දැමිය යුතු ය. අඳනය දිය යුතු ය. සඟළසිවුරු දිය යුතු ය. ගිනිහල්ගෙයි හිඳිනා පුටුව ගෙණ පළමු කොට අවුත් අසුනක් පැණවිය යුතු ය. පා දෝනා දිය ද පා පුටුව ද නො සේදූ පා තබන පුවරුව ද එළවා තැබිය යුතු ය. ආචාර්‍යයී තෙමේ පැනින් පිළිවිසිය යුතු ය. උදෙසවා ගණු කැමැත්තේ නම්, උදෙසවා ගත යුතු ය. අරුත් කියවා ගණු කැමැත්තේ නම්, අරුත් කියවා ගත යුතු ය.

27. ආචාර්‍යයී තෙමේ යම් වෙහෙරක වෙසේ නම්, ඒ වෙහෙර කසළ සහිත නම්, හැක්කේ නම්, පිරිසිදු කළ යුතු ය. වෙහෙර පිරිසිදු කරන්නහු විසින් පළමු කොට පාසිවුරු බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. හිඳිනාකඩ හා පසතුරුණ බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. ගුදිරිය හා කොට්ටය බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. ඇඳ පාත් කොට බිම නො ගටා දොරබාව නො හප්පා බැහැරට ගෙණ පසෙක මනා ව තැබිය යුතු ය. පුටුව පාත් කොට බිම නො ගටා දොරබාව නො හප්පා බැහැර කොට පසෙක මනා ව තැබිය යුතු ය. ඇඳපාඅළු බැහැර කොට පසෙක තැබිය යුතු ය.

28. කෙළමල්ලාව බැහැර කොට පසෙක තැබිය යුතු ය. වැතිර හිඳිනා පුවරුව බැහැර කොට පසෙක තැබිය යුතු ය. බුමුතුරුණ පණවා තුබූ සැටි සලකා බලා බැහැර කොට පසෙක තැබිය යුතු ය. වෙහෙරෙහි මකුළුදැල් වේ ද, උඩ සිට ඉවත් කළ යුතු ය. ඇතුළත පිටත ජනෙල් කවුළු හා කාමරයෙහි මුළු සතර පිස දැමිය යුතු ය. ගුරුයෙන් පිරියම් කළ බිත්තිය හටගත් පුස් ඇත් නම්, රෙදිකඩක් තෙමා මදක් මිරිකා පිස දැමිය යුතු ය. කළු පැහැ කළ බිම හටගත් පුස් ඇත් නම්, රෙදි කඩක් තෙමා මදක් මිරිකා පිස දැමිය යුතු ය. බිම පිරියම් නො කරණ ලද නම්, "වෙහෙර දූවිල්ලෙන් කිලිටි නො වේවා" යි දිය ඉස පිස දැමිය යුතු ය.

29. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං. භූමත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. භිසිබිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බං.

30. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

31. සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති, පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති, පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති, උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති, දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති, දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති දිවා වාතපානා ථකෙතබ්බා රත්තිං විවරිතබ්බා.

32. සචෙ පරිවෙණං උක්ලාපං හොති, පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති, කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා, හොති, උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති, අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති, වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පානීයං න හොති, පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති, පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති, ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

33. සචෙ ආචරියස්ස අනභිරති උප්පන්නා හොති, අන්තෙවාසිකෙන වූපකාසෙතබ්බො. වූපකාසාපෙතබ්බො. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ ආචරියස්ස කුක්කුච්චං උප්පන්නං හොති, අන්තෙවාසිකෙන, විනොදෙතබ්බං. විනොදාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ ආචරියස්ස දිට්ඨිගතං උප්පන්නං හොති, අන්තෙවාසිකෙන විවෙචෙතබ්බං. විවෙචාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා.

29. කසළ එකතු කොට පසෙක හළ යුතු ය. බුමුතුරුණු වියලා පිරිසිදු කොට ගසා දමා ගෙණවුත් පණවා තුබූ ලෙසට පැණවිය යුතු ය. ඇඳපාඅළු වියලා පිරිමැද ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. ඇඳ වියලා පිරිසිදු කොට ගසා දමා පාත් කොට බිම නො ගටා දොරබාව නො හප්පා ගෙණවුත් පණවා තුබූ ලෙසට මනා කොට පැණවිය යුතු ය. පුටුව වියලා පිරිසිදු කොට ගසා දමා පාත් කොට බිම නො ගටා දොරබාව නො හප්පා ගෙණවුත් පණවා තුබූ පරිදි පැණවිය යුතු ය. ගුදිරිය හා කොට්ටය වියලා පිරිසිදු කොට ගසා දමා ගෙණවුත් පණවා තුබූ පරිදි පැණවිය යුතු ය. හිඳිනාකඩ හා පසතුරණ වියලා පිරිසිදු කොට ගසා දමා ගෙණවුත් පණවා තුබූ පරිදි පැණවිය යුතු ය. කෙලම්ලාව සෝදා වියලා පිරිමැද ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. වැතිර හිඳිනා පුවරුව වියලා පිරිමැද ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය.

30. පා සිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා පාත්‍රය තැබිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය නො තැබිය යුතු ය. සිවුර බහා තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුරු ලන උණදඬුව හෝ රැහැණ හෝ පිරිමැද නුවාව එහාට ද දරණය මෙහාට ද තබා සිවුර දැමිය යුතු ය.

31. පෙර දිගින් නැගී එන දූලි සහිත වූ වාතයෝ හමත් නම්, පෙරදිග කවුළුදොර වැසිය යුතු ය. බස්නාහිර දිගින් නැග එන වාතයෝ දූලි සහිත ව හමත් නම්, බස්නාහිර කවුළුදොර වැසිය යුතු ය. උතුරු දිගින් එන වාතයෝ දූලි සහිත ව හමත් නම්, උතුරු දිග කවුළුදොර වැසිය යුතු ය. දකුණු දිගින් එන වාතයෝ දූලි සහිත ව හමත් නම්, දකුණුදිග කවුළුදොර වැසිය යුතු ය. ශීතකාලය වේ නම්, දහවල කවුළුදොර ඇර තැබිය යුතු ය. රාත්‍රියෙහි වැසිය යුතු ය. උෂ්ණ කාලය වේ නම්, දහවල කවුළුදොර වැසිය යුතු ය. රාත්‍රියෙහි ඇර තැබිය යුතු ය.

32. පිරිවෙණ කසළ සහිත නම්, පිරිවෙණ හැමැදිය යුතු ය. ඇතුළුගෙය කසළ සහිත නම්, ඇතුළුගෙය හැමැදිය යුතු ය. උපස්ථානශාලාව කසළ සහිත නම්, උපස්ථාන ශාලාව හැමැදිය යුතු ය. ගිනිහල්ගෙය කසළ සහිත නම්, ගිනිහල්ගෙය හැමැදිය යුතු ය. වැසිකිළිය කසළ සහිත නම්, වැසිකිළිය හැමැදිය යුතු ය. පැන් නො වේ නම්, පැන් එළවා තැබිය යුතු ය. පරිභොගයට සුදුසු දිය නො වේ නම්, පරිභොගයට සුදුසු දිය එළවා තැබිය යුතු ය. වැසිකිළිදියසැළෙහි දිය නො වේ නම්, වැසිකිළිදියසැළෙහි දිය වක්කළ යුතු ය.

33. ආචාර්‍ය්‍යයාහට ශාසනයෙහි නො ඇල්මෙක් උපන්නේ නම්, අතැවැසියා විසින් ආචාර්‍ය්‍යයා අන් තැනකට ගෙණ යා යුතු ය. අනෙකකු ලවා අන් තැනකට පමුණුවාලිය යුතු ය. උන්වහන්සේට ධර්‍මකථා හෝ කිය යුතු ය. ආචාර්‍ය්‍යයාහට කුකුසෙක් උපන්නේ නම්, අතැවැසියා විසින් එය දුරු කළ යුතු ය. "තෙරුන්ගේ කුකුස හැරලව" යි අන් මහණෙකුට කිය යුතු ය. උන්වහන්සේට ධර්‍මකථා හෝ කිය යුතු ය. ආචාර්‍ය්‍යයාහට මිසදිටුවක් උපන්නේ නම්, අතැවැසියා විසින් එය දුරු කට යුතු ය. අනිකකු ලවා හෝ දුරු කරවිය යුතු ය. උන්වහන්සේට ධර්‍මකථා හෝ කිය යුතු ය

34. සචෙ ආචරියො ගරුධම්මං අජ්ඣාපන්නො හොති, පරිවාසාරහො. අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො ආචරියස්ස පරිවාසං දදෙය්‍යා?" ති.

35. සචෙ ආචරියො මූලාය පටිකස්සනාරහො හොති, අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො ආචරියං මූලාය පටිකස්සෙය්‍යා?" ති.

36. සචෙ ආචරියො මානත්තාරහො හොති, අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො ආචරියස්ස මානත්තං දදෙය්‍යා?" ති.

37. සචෙ ආචරියො අබ්භානාරහො හොති, අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො ආචරියං අබ්භෙය්‍යා?" ති.

38. සචෙ සඞ්ඝො ආචරියස්ස කම්මං කත්තුකාමො හොති, තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො සඞ්ඝො ආචරියස්ස කම්මං න කරෙය්‍ය? ලහුකාය වා පරිණාමෙය්‍යා?" ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, අන්තෙවාසිකෙන උස්සුක්කං කාතබ්බං: "කින්ති නු ඛො ආචරියො සම්මා වත්තෙය්‍ය? ලොමං පාතෙය්‍ය? නෙත්ථාරං වත්තෙය්‍ය? සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා?" ති.

39. සචෙ ආචරියස්ස චීවරං ධොවිතබ්බං හොති, අන්තෙවාසිකෙන ධොවිතබ්බං උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො ආචරියස්ස චීවරං ධොවියෙථා?" ති. සචෙ ආචරියස්ස චීවරං කාතබ්බං හොති, අන්තෙවාසිකෙන කාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො ආචරියස්ස චීවරං කරියෙථා" ති. සචෙ ආචරියස්ස රජනං පචිතබ්බං හොති, අන්තෙවාසිකෙන පචිතබ්බං. උස්සුක්කං වා කාතබ්බං. "කින්ති නු ඛො ආචරියස්ස රජනං පචියෙථා" ති. සචෙ ආචරියස්ස චීවරං රජෙතබ්බං හොති, අන්තෙවාසිකෙන රජෙතබ්බං. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො ආචරියස්ස චීවරං රජියෙථා" ති. චීවරං රජෙන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජෙතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං.

34. ආචාර්‍ය්‍යතෙමේ ගරු ඇවතට පැමිණියේ පිරිවෙසට සුදුසු වූයේ වේ ද, අතැවැසියා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ ආචාර්‍ය්‍යයාහට පිරිවෙස් දෙන්නේ දැ" යි උත්සාහ කට යුතු ය.

35. ආචාර්‍ය්‍යතෙමේ මුල සිට පිරිවෙස් පිරීමට සුදුසු වූයේ නම් අතැවැසියා විසින් කෙසේ නම් සඞ්ඝ තෙමේ ආචාර්‍ය්‍යයා මුලට (මුල සිට පිරිවෙස් පිරීමට) අදින්නේ දැ" යි උත්සාහ කට යුතු ය.

36. ආචාර්‍ය්‍යතෙමේ මානතට සුදුසු වූයේ නම්, අතැවැසියා විසින් "කෙසේ නම් සඞ්ඝතෙමේ ආචාර්‍ය්‍යයාහට මානත දෙන්නේ දැ" යි උත්සාහ කට යුතු ය.

37. ආචාර්‍ය්‍යතෙමේ අබ්භානයට සුදුසු වූයේ නම්, අතැවැසියා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ ආචාර්‍ය්‍යයා සඞ්ඝයාට ඇතුළත් කරවන්නේ දැ" යි උත්සාහ කට යුතු ය.

38. සඞ්ඝ තෙමේ ආචාර්‍ය්‍යයාහට තජ්ජනීයකම්මය හෝ නියස්සකම්මය හෝ පබ්බාජනීයකම්මය හෝ පටිසාරණීයකම්මය හෝ උක්ඛෙපනීයකම්මය හෝ කරණු කැමැත්තේ නම්, "සඞ්ඝතෙමේ කෙසේ නම්, ආචාර්‍ය්‍යයාහට කම් නො කරන්නේ ද? ලඝු බවට හෝ පෙරළන්නේ දැ" යි අතැවැසියා විසින් උත්සාහ කට යුතු ය. උන්වහන්සේට සඞ්ඝයා විසින් තජ්ජනීයකම්මය හෝ නියස්සකම්මය හෝ පබ්බාජනීයකම්මය හෝ පටිසාරණීයකම්මය හෝ උක්ඛෙපනීයකම්මය හෝ කරණ ලද්දේ හෝ වේ ද, "කෙසේ නම් ආචාර්‍ය්‍ය තෙමේ මනා කොට පවතින්නේ ද? භික්ෂූන්ට අනුලොම් වන්නේ ද? නිදොස්බව පිණිස මනා කොට පවතින්නේ ද? සඞ්ඝ තෙමේ ඒ කාමිය සංසිඳුවන්නේ දැ" යි අතැවැසියා විසින් උත්සාහ කට යුතු ය.

39. ආචාර්‍ය්‍යයාගේ සිවුර සේදිය යුතු නම්, අතැවැසියා විසින් සේදිය යුතු ය. "කෙසේ නම් ආචාර්‍ය්‍යයාගේ සිවුර සෝදනු ලබන්නේ දැ" යි උත්සාහය හෝ කටයුතු ය. ආචාර්‍ය්‍යයාහට සිවුරක් කට යුතු නම්, අතැවැසියා විසින් ඒ කටයුතු ය. "කෙසේ නම් ආචාර්‍ය්‍යයාගේ සිවුර කරණු ලබන්නේ දැ" යි උත්සාහය හෝ කට යුතු ය. ආචාර්‍ය්‍යයාහට පඬු පිසිය යුතු නම්, අතැවැසියා විසින් පිසිය යුතු ය. "කෙසේ නම් ආචාර්‍ය්‍යයාහට පඬු පිසනු ලබන්නේ දැ"- යි උත්සාහය හෝ කට යුතු ය. ආචාර්‍ය්‍යයාගේ සිවුර පඬු පෙවිය යුතු නම්, අතැවැසියා විසින් පඬු පෙවිය යුතු ය. "කෙසේ නම්, ආචාර්‍ය්‍යයාගේ සිවුර පඬු පොවනු ලබන්නේ දැ"යි උත්සාහය හෝ කට යුතු ය. සිවුර පඬු පොවන්නහු විසින් මනා කොට පෙරළ පෙරළා පඬු පෙවිය යුතු ය. පොද නොසුන්කල්හි බැහැර නො යා යුතු ය.

40. න ආචරියං අනාපුච්ඡා එකච්චස්ස පත්තො දාතබ්බො. න එකච්චස්ස පත්තො පටිග්ගහෙතබ්බො. න එකච්චස්ස චීවරං දාතබ්බං. න එකච්චස්ස චීවරං පටිග්ගහෙතබ්බං. න එකච්චස්ස පරික්ඛාරො දාතබ්බො. න එකච්චස්ස පරික්ඛාරො පටිග්ගහෙතබ්බො. න එකච්චස්ස කෙසා ඡෙත්තබ්බා. න එකච්චෙන කෙසා ඡෙදාපෙතබ්බා. න එකච්චස්ස පරිකම්මං කාතබ්බං. න එකච්චෙන පරිකම්මං කාරාපෙතබ්බං. න එකච්චස්ස වෙය්‍යාවච්චො කාතබ්බො. න එකච්චෙන වෙය්‍යාවච්චො කාරාපෙතබ්බො. න එකච්චස්ස පච්ඡාසමණෙන හොතබ්බං. න එකච්චො පච්ඡාසමණො ආදාතබ්බො. න එකච්චස්ස පිණ්ඩපාතො නීහරිතබ්බො. න එකච්චෙන පිණ්ඩපාතො නීහරාපෙතබ්බො.

41. න ආචරියං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො. න සුසානං ගන්තබ්බං. න දිසා පක්කමිතබ්බා. සචෙ ආචරියො ගිලානො හොති, යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බ'න්ති.

ආචරියවත්තං නිට්ඨිතං.

---

1. ආචරියෙන භික්ඛවෙ, අන්තෙවාසිකම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා: ආචරියෙන භික්ඛවෙ, අන්තෙවාසිකො සඞ්ගහෙතබ්බො අනුග්ගහෙතබ්බො උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා.

2. සචෙ ආචරියස්ස පත්තො හොති, අන්තෙවාසිකස්ස පත්තො න හොති, ආචරියෙන අන්තෙවාසිකස්ස පත්තො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස පත්තො උප්පජ්ජියෙථා" ති.

3. සචෙ ආචරියස්ස චීවරං හොති, අන්තෙවාසිකස්ස චීවරං න හොති, ආචරියෙන අන්තෙවාසිකස්ස චීවරං දාතබ්බං. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං උප්පජ්ජියෙථා" ති.

4. සචෙ ආචරියස්ස පරික්ඛාරො, හොති, අන්තෙවාසිකස්ස පරික්ඛාරො න හොති, අන්තෙවාසිකස්ස පරික්ඛාරො දාතබ්බො. උස්සුක්කං වා කාතබ්බං: "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස පරික්ඛාරො උප්පජ්ජියෙථා" ති.

5. සචෙ අන්තෙවාසිකො ගිලානො හොති, කාලස්සෙව වුට්ඨාය දන්තකට්ඨං දාතබ්බං. මුඛොදකං දාතබ්බං. ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුපීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං.

40. ආචාර්‍ය්‍යයා නො විචාරා කිසිවෙකුට පාත්‍රය නො දිය යුතු ය. කිසිවෙකුගේ පාත්‍රය නො පිළිගත යුතු ය. කිසිවෙකුට සිවුර නො දිය යුතු ය. කිසිවෙකුගේ සිවුර නො පිළිගත යුතු ය. කිසිවෙකුට පිරිකර නො දිය යුතු ය. කිසිවෙකුගේ පිරිකර නො පිළිගත යුතු ය. කිසිවෙකුගේ කෙස් නො කැපිය යුතු ය. කිසිවෙකු ලවා කෙස් නො කැප්විය යුතු ය. කිසිවෙකුට පා මිරිකීම් ඈ වත් නො කට යුතු ය. කිසිවෙකු ලවා නො කරවා ගත යුතු ය. කිසිවෙකුට වතාවත් නො කට යුතු ය. කිසිවෙකු ලවා වතාවත් නො කරවා ගත යුතු ය. කිසිවෙකුගේ පස්සේ යන මහණකු නො විය යුතු ය. පස්සේ යන කිසි මහණෙක් නො ගත යුතු ය. කිසිවෙකුගේ පිණ්ඩපාතය බැහැර නො කට යුතු ය. කිසිවෙකු ලවා පිණ්ඩපාතය බැහැර නො කරවිය යුතු ය.

41. ආචාර්‍ය්‍යයා නො විචාරා ගම් නො වැදිය යුතු ය. සොහොනට නො යා යුතු ය. ඒ ඒ දසාවන්හි නො යා යුතු ය. ආචාර්‍ය්‍ය තෙමේ ගිලන් වේ නම්, ජීවත් වන තුරු උපස්ථාන කළ යුතු ය. උන්වහන්සේගේ ලෙඩින් නැඟීසිටීම බලාපොරොත්තු විය යුතු ය.

**ඈදුරුවත නිමි.**

---

1. මහණෙනි, ආචාර්‍ය්‍යයා අතැවැසියා කෙරෙහි මනා කොට පැවතිය යුතු ය. එහි මේ මනා කොට පැවැත්ම ය: මහණෙනි, ආචාර්‍ය්‍යයා විසින් අතැවැසි තෙමේ උදෙසීමෙන් අනුග්‍රහ කට යුතු ය. කරුණු විමසීමෙන් අවවාදයෙන් අනුශාසනායෙන් සංග්‍රහ කට යුතු ය.

2. ආචාර්‍ය්‍යයාහට වැඩි පාත්‍රයෙක් වේ ද, අතැවැසියාහට පාත්‍රයෙක් නො වේ ද, ආචාර්‍ය්‍යයා විසින් අතැවැසියාහට පාත්‍රය දිය යුතු ය. "අතැවැසියාහට පාත්‍රයක් කෙසේ නම් උපදින්නේ දැ" යි උත්සාහය හෝ කට යුතු ය

3. ආචාර්‍ය්‍යයාහට සිවුරක් වේ ද, අතැවැසියාහට සිවුරක් නො වේ ද, ආචාර්‍ය්‍යයා විසින් අතැවැසියාහට සිවුර දිය යුතු ය. "අතැවැසියාහට සිවුරෙක් කෙසේ නම් උපදනේ දැ" යි උත්සාහය හෝ කට යුතු ය.

4. ආචාර්‍ය්‍යයාහට පරිෂ්කාරයෙක් වේ ද, අතැවැසියාහට පරිෂ්කාරයෙක් නො වේ ද, ආචාර්‍ය්‍යයා විසින් අතැවැසියාහට පරිෂ්කාර දිය යුතු ය. "අතැවැසියාට පරිෂ්කාරයෙක් කෙසේ නම් උපදනේ දැ" යි උත්සාහය හෝ කටයුතු ය.

5. අතැවැසි තෙමේ ගිලන් වේ නම්, කලින් ම නැගිට දැහැටි දිය යුතු ය. මුව දෝනා දිය දිය යුතු ය. අසුන් පැණවිය යුතු ය. ඉදින් කැඳ තිබේ නම්, බඳුන සෝදා, කැඳ එළවිය යුතු ය. කැඳ වළඳා, සිටිය හුට දිය දී බඳුන පිළිගෙණ පාත් කොට මැනැවින් නො ගටා සෝදා තැන්පත් කළ යුතු ය

6. අන්තෙවාසිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ අන්තෙවාසිකො ගාමං පවිසිතුකාමො හොති, නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. "එත්තාවතා නිවත්තිස්සතී"ති ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. සචෙ චීවරං සින්නං හොති, මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං. න ච උණ්හෙ චීවරං නිදහිතබ්බං. චීවරං සඞ්ඝරිතබ්බං. චීවරං සඞ්ඝරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාදෙත්වා චීවරං සඞ්ඝරිතබ්බං "මා මජ්ඣෙ භඞ්ගො අහොසී"ති. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

7. සචෙ පිණ්ඩපාතො හොති අන්තෙවාසිකො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. අන්තෙවාසිකො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො.

8. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨා මඤ්චං වා හෙට්ඨා පීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

9. අන්තෙවාසිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ අන්තෙවාසිකො නහායිතුකාමො හොති, නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති, සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති, උණ්හං පටියාදෙතබ්බං.

10. සචෙ අන්තෙවාසිකො ජන්තාඝරං පවිසිතුකාමො හොති, චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහෙතබ්බා. ජන්තාඝරෙ අන්තෙවාසිකස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං.

6. අතැවැසියා නැඟී සිටි කල්හි ආසනය ඔසවා තැබිය යුතු ය. ඒ දෙස කසල සහිත නම්, ඒ තැන හැමැදිය යුතු ය. අතැවැසි තෙමේ ගම් වදිනු කැමැත්තේ නම්, අඳනය දිය යුතු ය. ඇඳ තුබූ අඳනය පිළිගත යුතු ය. පටිය දිය යුතු ය. සගුණ කොට සිවුරු දිය යුතු ය. සෝද, දිය සහිත වූ පාත්‍රය දිය යුතු ය. "මෙපමණකින් පිඬු සිඟීමෙන් නවතින්නේ ය" යි දැන ආසනය පැණවිය යුතු ය. පා දෝනා දිය ද පාපුටුව ද නො සේදූ පා තබන පුවරුව ද එළවිය යුතු ය. ඉදිරියට ගොස් පා සිවුරු පිළිගත යුතු ය. සිවුර තෙත් නම්, මොහොතක් උෂ්ණයෙහි ලා වියලිය යුතු ය. සිවුර උෂ්ණයෙහි ලා වැඩියක් නො දැවිය යුතු ය. සිවුර නැමිය යුතු ය. සිවුර නමන්නහු විසින් "මැද නො දිරාවා" යි සතරඟුලක් පමණ සිවුරු කොණ උස් කොට සිවුර නැමිය යුතු ය. සිවුරු දරණයෙහි පටිය තැබිය යුතු ය.

7. ඉදින් පිණ්ඩපාතය වේ ද, අතැවැසිතෙමේත් වළඳනු කැමැත්තේ වේ ද, දිය දී පිණ්ඩපාතය එළවිය යුතු ය. අතැවැසි තෙමේ පැනින් විචාළ යුතු ය. වළඳා අවසන් කළහුට දිය දී පාත්‍රය පිළිගෙණ පාත් කොට නො ගටා මනා කොට සෝදා දිය පිස දමා මොහොතක් උෂ්ණයෙහි ලා වියලිය යුතු ය. පාත්‍රය උෂ්ණයෙහි ලා වැඩියක් නො දැවිය යුතු ය.

8. පාසිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා පාත්‍රය බහා තැබිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය නො තැබිය යුතු ය. සිවුර බහා තබන්නහු විසින් එක අතකින් සිවුර ගෙණ එක අතකින් සිවුරු ලන උණදඬුව හෝ රැහැණ හෝ පිසදමා නුවාව එහාට ද දරණය මෙහාට ද ලා සිවුර බහා තැබිය යුතු ය.

9. අතැවැසියා නැඟී සිටි කල්හි ආසනය ඔසවා තැබිය යුතු ය. පාදෝනා දිය ද පාපුටුව ද නො සේදූ පා තබන පුවරුව ද තැන්පත් කළ යුතු ය. ඒ දෙස කසල සහිත නම්, ඒ තැන හැමැදිය යුතු ය. අතැවැසියා නානු කැමති නම්, නහනු පිළියෙල කළ යුතු ය. සිහිල් දියෙන් ප්‍රයෝජන නම් සිහිල් දිය පිළියෙල කළ යුතු ය. උණු දියෙන් ප්‍රයෝජන නම් උණු දිය පිළියෙල කළ යුතු ය.

10. අතැවැසි තෙමේ ගිනිහල්ගෙට යනු කැමැත්තේ නම්, නහන සුණු තෙමා පිඬු කළ යුතු ය. නහනමැටි තෙමිය යුතු ය. ගිනිහල්ගෙයි පුටුව ගෙණ ගොස් ගිනිහල්ගෙයි පුටුව දී සිවුර පිළිගෙණ පසෙක තැබිය යුතු ය. නහනසුණු දිය යුතු ය. නහනමැටි දිය යුතු ය. හැක්කේ නම් ගිනිහල්ගෙට පිවිසිය යුතු ය. ගිනිහල්ගෙට පිවිසෙන්නහු විසින් මැටියෙන් මුණ තවරා ඉදිරිපසින් හා පසුපසින් සිරුර වසා ගිනිහල්ගෙට පිවිසිය යුතු ය. ස්ථවිරභික්ෂූන් ගටා නො හිඳිය යුතු ය. නවක භික්ෂූන් ආසනයෙන් බැහැර නො කට යුතු ය. ගිනිහල්ගෙයි දී අතැවැසියාගේ ඇඟ ඉළිම් ඈ වත් කළ යුතු ය. ගිනිහල්ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල්ගෙයි පුටුව ගෙණ ඉදිරි පසින් හා පසු පසින් ද සිරුර වසා ගිනිහල්ගෙයින් නික්මිය යුතු ය.

11. උදකෙ'පි අන්තෙවාසිකස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා අන්තෙවාසිකස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං. නිවාසනං දාතබ්බං. සඞ්ඝාටි දාතබ්බා. ජන්තාඝරපීඨං ආදාය පඨමතරං ආගන්ත්වා ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. අන්තෙවාසිකො පානීයෙන පුච්ඡිතබ්බො.

12. යස්මිං විහාරෙ අන්තෙවාසිකො විහරති, සචෙ සො විහාරො උක්ලාපො හොති, සචෙ උස්සහති, සොධෙතබ්බො. විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. නිසීදනපච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භිසිබිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චො නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. පීඨං නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. අපස්සෙනඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. භුම්මත්ථරණං යථාපඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං.

13. සචෙ විහාරෙ සන්තානකං හොති, උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. ආලොකසන්ධිකණ්ණභාගා පමජ්ජිතබ්බා. සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති, චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. සචෙ අකතා හොති භූමි, උදකෙන **පරිප්ඵොසෙත්වා** සම්මජ්ජිතබ්බා, "මා විහාරො රජෙන උහඤ්ඤී" ති. සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං.

14. භුම්මත්ථරණං ඔතාපෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බා. මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බො. පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. භිසිබිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාපඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං.

11. ජලයෙහි දී ද අතැවැසියාගේ ඇඟ ඉලීම් ආදී වත් කළ යුතු ය. නා අවසන් කළහු විසින් පළමුකොට ගොඩ නැඟී තමන්ගේ සිරුරෙහි දිය පිසදමා හැඳ ගෙණ අතැවැසියාගේ සිරුර පිස දැමිය යුතු ය. අඳනය දිය යුතු ය. සිවුර දිය යුතු ය. ගිනිහල්ගෙයි පුටුව ගෙණ පළමු කොට අවුත් ආසනය පැණවිය යුතු ය. පා දෝනා දිය පාපුටුව හො සේදූ පා තබන පුවරුව එළවා තැබිය යුතු ය. අතැවැසි තෙමේ පැනින් විචාළ යුතු ය.

12. යම් වෙහෙරක අතැවැසි තෙමේ වෙසේ ද, ඒ වෙහෙර කසළ සහිත වේ නම් හැක්කේ නම් පිරිසිදු කළ යුතු ය. වෙහෙර පිරිසිදු කරන්නහු විසින් පළමු කොට පා සිවුරු බැහැරට ගෙණ පසෙක තැබිය යුතු ය. හිඳිනා කඩ හා පසතුරුණ බැහැර කොට පසෙක තැබිය යුතු ය. ගුදිරිය හා කොට්ටය බැහැර කොට පසෙක තැබිය යුතු ය. ඇඳ පාත් කොට නො ගටා දොරබාව නො හප්පා බැහැර කොට පසෙක මනා කොට තැබිය යුතු ය පුටුව පාත් කොට නො ගටා දොරබාව නො හප්පා පසෙක මනාකොට තැබිය යුතු ය. ඇඳපාඅළු බැහැර කොට පසෙක තැබියයුතුය. කෙළමලාව පසෙක තැබිය යුතු ය. වැතිර හෝනා පුවරුව බැහැර කොට පසෙක තැබිය යුතු ය. බුමුතුරුණ පණවා තුබූ සැටි සලකා බැහැර කොට පසෙක තැබිය යුතු ය.

13. වෙහෙරෙහි මකුළු දැල් වේ නම් උඩ සිට පළමු කොට ඉවත් කළ යුතු ය. ඇතුළතපිටත ජනෙල්කවුළු හා කාමරයෙහි මුළුසතර පිසදැමිය යුතු ය. ගුරුයෙන් පිරියම් කළ බිත්තිය හටගත් පුස් ඇත්තී නම් රෙදි කඩක් තෙමා මඳක් මිරිකා පිස දැමිය යුතු ය. කළු පැහැ කළ බිම හටගත් පුස් ඇත්තී නම් රෙදි කඩක් තෙමා මඳක් මිරිකා පිස දැමිය යුතු ය. බිම පිරියම් නො කරණ ලද නම් දිය ඉස "වෙහෙර නො කිලිටි වේවා" යි හැමදිය යුතු ය. කසළ රැස් කොට පසෙක දැමිය යුතු ය.

14. බුමුතුරුණ වියලා ශුද්ධ කොට ගසා දමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ පරිදි තැබිය යුතු ය. ඇඳපාඅළු වියලා පිස දමා ඇතුළට ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. ඇඳ වියලා ශුද්ධ කොට ගසා දමා පාත් කොට නො ගටා දොරබාව නො හප්පා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් මනාකොට පැණවිය යුතු ය. පුටුව වියලා ශුද්ධ කොට ගසා දමා පාත්කොට නො ගටා දොරබාව නො හප්පා ඇතුළට ගෙණවුත් පණවා තුබු ලෙසින් මනා කොට පැණවිය යුතු ය. ගුදිරිය හා කොට්ටය වියලා ශුද්ධ කොට ගසා දමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් පැණවිය යුතු ය. හිඳිනා කඩ හා පසතුරුණ වියලා ශුද්ධ කොට ගසා දමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ ලෙසින් පැණවිය යුතු ය.

15. ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බො. අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාට්ඨානෙ ඨපෙතබ්බං. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං.

16. සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති, පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති, පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. සචෙ උත්තරා සරජා වාතා වායන්ති, උත්තරා වාතපානා ථකෙතබ්බා. සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති, දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. සචෙ සීතකාලො හොති, දිවා වාතපානා විවරිතබ්බා. රත්තිං ථකෙතබ්බා. සචෙ උණ්හකාලො හොති, දිවා වාතපානා ථකෙතබ්බා. රත්තිං විවරිතබ්බා.

17. සචෙ පරිවෙණං උක්ලාපං හොති, පරිවෙණං සම්මජ්ජිතබ්බං. සචෙ කොට්ඨකො උක්ලාපො හොති, කොට්ඨකො සම්මජ්ජිතබ්බො. සචෙ උපට්ඨානසාලා උක්ලාපා හොති, උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. සචෙ අග්ගිසාලා උක්ලාපා හොති, අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. සචෙ වච්චකුටි උක්ලාපා හොති, වච්චකුටි සම්මජ්ජිතබ්බා. සචෙ පානීයං න හොති, පානීයං උපට්ඨාපෙතබ්බං. සචෙ පරිභොජනීයං න හොති, පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. සචෙ ආචමනකුම්භියා උදකං න හොති, ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං.

18. සචෙ අන්තෙවාසිකස්ස අනභිරති උප්පන්නා හොති, ආචරියෙන වූපකාසෙතබ්බො. වූපකාසාපෙතබ්බො. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ අන්තෙවාසිකස්ස කුක්කුච්චං උප්පන්නං හොති, ආචරියෙන විනොදෙතබ්බං. විනොදාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ අන්තෙවාසිකස්ස දිට්ඨිගතං උප්පන්නං හොති, ආචරියෙන විවෙචෙතබ්බං. විවෙචාපෙතබ්බං. ධම්මකථා වාස්ස කාතබ්බා.

19. සචෙ අන්තෙවාසිකො ගරුධම්මං අජ්ඣාපන්නො හොති, පරිවාසාරහො, ආචරියෙන උස්සුක්කං කාතබ්බං "කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකස්ස පරිවාසං දදෙය්‍යා" ති.

20. සචෙ අන්තෙවාසිකො මූලාය පටිකස්සනාරහො හොති, ආචරියෙන උස්සුක්කං කාතබ්බං "කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකං මූලාය පටිකස්සෙය්‍යා" ති.

21. සචෙ අන්තෙවාසිකො මානත්තාරහො හොති, ආචරියෙන උස්සුක්කං කාතබ්බං "කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකස්ස මානත්තං දදෙය්‍යා"ති.

15. කෙළමලාව වියලා පිස දමා ඇතුළට ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. වැතිරහෝනා පුවරුව වියලා පිස දමා ඇතුළට ගෙණවුත් තුබූ තැන තැබිය යුතු ය. පාසිවුරු බහා තැබිය යුතු ය. පාත්‍රය බහා තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අත ගා පාත්‍රය බහා තැබිය යුතු ය. කිසිවක් නො අතුළ බිම පාත්‍රය බහා නො තැබිය යුතු ය. සිවුර බහා තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුරු ලන උණදඬුව හෝ රැහැණ හෝ පිස දමා නුවාව එහාට හා දරණය මෙහාට තබා සිවුර බැහිය යුතු ය.

16. පෙර දිගින් නගිනා වාතයෝ දූලි සහිත ව හමත් නම්, පෙර දිග වාකවුළු වැසිය යුතු ය. බස්නා හිරින් නැග එන වාතයෝ දූලි සහිත ව හමත් නම්, බස්නා හිර වාකවුළු වැසිය යුතු ය. උතුරු දිගින් නගිනා වාතයෝ දූලි සහිත ව හමත් නම්, උතුරු දිග වාකවුළු වැසිය යුතු ය. දකුණු දිගින් නගිනා වාතයෝ දූලි සහිතව හමත් නම් දකුණු දිග වාකවුළු වැසිය යුතු ය. ශීත කාලය වේ නම්, දහවල වාකවුළු ඇර දැමිය යුතු ය. රාත්‍රියෙහි වැසිය යුතු ය. උෂ්ණකාලය වේ නම්, දහවල වාකවුළු වැසිය යුතු ය. රාත්‍රියෙහි ඇර දැමිය යුතු ය.

17. පිරිවෙණ කසල සහිත වේ නම්, පිරිවෙණ හැමැදිය යුතු ය. ඇතුළු ගෙය කසළ සහිත වේ නම්, ඇතුළු ගෙය හැමැදිය යුතු ය. උපස්ථානශාලාව කසල සහිත වේ නම්, උපස්ථානශාලාව හැමැදිය යුතු ය. ගිනිහල් ගෙය කසල සහිත වේ නම්, ගිනිහල් ගෙය හැමැදිය යුතු ය. වැසිකිළිය කසල සහිතවේ නම්, වැසිකිළිය හැමැදිය යුතු ය. පැන් නොවේ නම්, පැන් එළවා තැබිය යුතු ය. පරිභොගයට සුදුසු දිය නො වේ නම්, පරිභොගයට සුදුසු දිය එළවා තැබිය යුතු ය. වැසිකිළිදියසැළෙහි දිය නො වේ නම්, වැසිකිළිදියසැළෙහි දිය වත් කළ යුතු ය.

18. අතැවැසියානට ශාසනයෙහි නො ඇල්මෙක් උපන්නේ නම්, ආචාර්‍ය්‍යයා විසින් අන් තැනකට ගෙණ යා යුතු ය. "අනෙකකු ලවා අන් තැනකට පමුණුවා ලිය යුතු ය. ඔහුට ධර්‍මකථා හෝ කිය යුතු ය. අතැවැසියාහට කුකුසෙක් උපන්නේ නම්, ආචාර්‍ය්‍යයා විසින් දුරු කට යුතු ය. "අතැවැසියාගේ කුකුස හැරලව"යි අන් මහණෙකුට කිය යුතු ය. ඔහුට ධර්‍මකථා හෝ කිය යුතු ය. අතැවැසියාහට මිසදිටුවෙක් උපන්නේ නම්, ආචාර්‍ය්‍යයා විසින් දුරු කට යුතු ය. අනිකකු ලවා හෝ එය දුරු කරවිය යුතු ය.

19. අතැවැසි තෙමේ ගරු ඇවැතට පැමිණියේ පිරිවෙසට සුදුසු වූයේ වේ ද, ආචාර්‍ය්‍යයා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ අතැවැසියාහට පිරිවෙස් දෙන්නේ දැ?" යි උත්සාහ කට යුතු ය.

20. අතැවැසි තෙමේ මුල සිට පිරිවෙස් පිරීමට සුදුසු වූයේ වේ ද, ආචාර්‍ය්‍යයා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ අතැවැසියා මුලසිට (පිරිවෙස් පිරීමට) අදින්නේ දැ?" යි උත්සාහ කට යුතු ය.

21. අතැවැසි තෙමේ මානතට සුදුසු වූයේ වේ ද, ආචාර්‍ය්‍යයා විසින් "කෙසේ නම් සඞ්ඝ තෙමේ අතැවැසියාහට මානත දෙන්නේ දැ?" යි උත්සාහ කට යුතු ය.

22. සචෙ අන්තෙවාසිකො අබ්භානාරහො හොති, ආචරියෙන උස්සුක්කං කාතබ්බං "කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකං අබ්භෙය්‍යා"?ති.

23. සචෙ සඞ්ඝො අන්තෙවාසිකස්ස කම්මං කත්තුකාමො හොති. තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, ආචරියෙන උස්සුක්කං කාතබ්බං "කින්ති නු ඛො සඞ්ඝො අන්තෙවාසිකස්ස කම්මං න කරෙය්‍ය? ලහුකාය වා පරිණාමෙය්‍යා"? ති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, ආචරියෙන උස්සුක්කං කාතබ්බං "කින්ති නු ඛො අන්තෙවාසිකො සම්මා වත්තෙය්‍ය? ලොමං පාතෙය්‍ය? නෙත්ථාරං වත්තෙය්‍ය? සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා" ? ති.

24. සචෙ අන්තෙවාසිකස්ස චීවරං ධොවිතබ්බං හොති, ආචරියෙන ආචික්ඛිතබ්බං "එවං ධොවෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං ධොවීයෙථා" ති. සචෙ අන්තෙවාසිකස්ස චීවරං කාතබ්බං හොති, ආචරියෙන ආචික්ඛිතබ්බං "එවං කරෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං කරීයෙථා"ති. සචෙ අන්තෙවාසිකස්ස රජනං පචිතබ්බං හොති, ආචරියෙන ආචික්ඛිතබ්බං "එවං පචෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස රජනං පචීයෙථා" ති. සචෙ අන්තෙවාසිකස්ස චීවරං රජෙතබ්බං හොති, ආචරියෙන ආචික්ඛිතබ්බං "එවං රජෙය්‍යාසී" ති. උස්සුක්කං වා කාතබ්බං "කින්ති නු ඛො අන්තෙවාසිකස්ස චීවරං රජීයෙථා" ති. චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිවත්තකං රජෙතබ්බං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං. සචෙ අන්තෙවාසිකො ගිලානො හොති, යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බන්ති.

**අන්තෙවාසිකවත්තං නිට්ඨිතං.**

22. අතැවැසි තෙමේ අබ්භානයට සුදුසු වූයේ වේ ද, ආචාය්‍ය්‍යීයා විසින් ''කෙසේ නම් සඞ්ඝතෙමේ අතැවැසියා සඞ්ඝයාට ඇතුළත් කරන්නේ දැ'' ? යි උත්සාහ කට යුතු ය.

23. සඞ්ඝතෙමේ අතැවැසියාහට තජ්ජනීය කම්මය හෝ නියස්සකම්මය හෝ පබ්බාජනීයකම්මය හෝ පටිසාරණීයකම්මය හෝ උක්ඛෙපනීයකම්මය හෝ කරණු කැමැත්තේ වේ ද, ආචාය්‍ය්‍යීයා විසින් ''කෙසේ නම් සඞ්ඝ තෙමේ අතැවැස්සාහට කර්මය නො කරන්නේ ද, ලුහුබවට පෙරළන්නේ දැ''? යි උත්සාහ කටයුතු ය. අතැවැසියාහට සඞ්ඝයා විසින් තජ්ජනීයකම්මය හෝ නියස්සකම්මය හෝ පබ්බාජනීයකම්මය හෝ පටිසාරණීයකම්මය හෝ උක්ඛෙපනීය කම්මය හෝ කරණ ලද්දේ හෝ වේ ද, ''කෙසේ නම් අතැවැසි තෙමේ මනා කොට පවතින්නේ ද? අනුලොම් වත්නේ ද? නිදොස් බව පිණිස මනා කොට පවතින්නේ ද ? සඞ්ඝ තෙමේ ඒ කර්මය සන්සිඳුවන්නේ දැ''? යි ආචාය්‍ය්‍යීයා විසින් උත්සාහ කටයුතු ය.

24. අතැවැසියාගේ සිවුර සේදිය යුතු නම් ආචාය්‍ය්‍යීයා විසින් ''මෙසේ සෝදන්නෙහි'' යි කිය යුතු ය. ''අතැවැසියාගේ සිවුර කෙසේ නම් සෝදනු ලබන්නේ දැ'' යි උත්සාහය හෝ කට යුතු ය. අතැවැසියා හට සිවුරක් කටයුතු නම් ආචාය්‍ය්‍යීයා විසින් ''මෙසේ කරන්නෙහි'' යි කිය යුතු ය. ''අතැවැසියාගේ සිවුර කෙසේ නම් කරණු ලබන්නේ දැ'' යි උත්සාහය හෝ කටයුතු ය. අතැවැසියාහට පඬු පිසිය යුතු නම් ආචාය්‍ය්‍යීයා විසින් ''මෙසේ පිසන්නෙහි'' යි කිය යුතු ය. ''අතැවැසියා හට කෙසේ නම් පඬු පිසනු ලබන්නේ දැ'' යි උත්සාහය හෝ කට යුතු ය. අතැවැසියාගේ සිවුර පඬු පෙවිය යුතු නම් ආචාය්‍ය්‍යීයා විසින් මෙසේ පඬු පොවන්නෙහි' යි කිය යුතු ය. ''අතැවැසියාගේ සිවුර කෙසේ නම් පඬු පොවනු ලබන්නේ දැ'' යි උත්සාහය හෝ කටයුතු ය. සිවුර පඬු පොවන්නහු විසින් පෙරළ පෙරළා මනා කොට පඬු පෙවිය යුතු ය. පොද නො සුන් කල්හි බැහැර නො යා යුතු ය. අතැවැසි තෙමේ ගිලන් වේ නම් ජීවත් වනතුරු උවැටැන් කළ යුතු ය. අතැවැසියාගේ රෝගයෙන් නැගී සිටීම බලාපොරොත්තු විය යුතු ය.

**අතැවැසිවත නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන අන්තෙවාසිකා ආචරියෙසු න සම්මා වත්තන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, අන්තෙවාසිකෙන ආචරියම්හි න සම්මා වත්තිතබ්බං. යො න සම්මා වත්තෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති. නෙව සම්මා වත්තන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, අසම්මාවත්තන්තං පනාමෙතුං”. එවඤ්ච පන භික්ඛවෙ, පනාමෙතබ්බො. “පනාමෙමි ත” න්ති වා “මා ඉධ පටික්කමී” ති වා “නීහර තෙ පත්තචීවර” න්ති වා, “නාහං තයා උපට්ඨාතබ්බො” ති වා, කායෙන විඤ්ඤාපෙති, වාචාය විඤ්ඤාපෙති, කායෙන වාචාය විඤ්ඤාපෙති, පනාමිතො හොති අන්තෙවාසිකො. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති, න පනාමිතො හොති අන්තෙවාසිකොති.

2. තෙන ඛො පන සමයෙන අන්තෙවාසිකා පනාමිතා න ඛමාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, ඛමාපෙතු” න්ති. නෙව ඛමාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, පනාමිතෙන න ඛමාපෙතබ්බො. යො න ඛමාපෙය්‍ය ආපත්ති දුක්කටස්සා” ති.

3. තෙන ඛො පන සමයෙන ආචරියා ඛමාපියමානා න ඛමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, ඛමිතු” න්ති. නෙව ඛමන්ති. අන්තෙවාසිකා පක්කමන්තිපි විබ්භමන්තිපි තිත්ථියෙසුපි සඞ්කමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, ඛමාපියමානෙන න ඛමිතබ්බං. යො න ඛමෙය්‍ය ආපත්ති දුක්කටස්සා” ති.

4. තෙන ඛො පන සමයෙන ආචරියා සම්මා වත්තන්තං පනාමෙන්ති. අසම්මා වත්තන්තං න පනාමෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, සම්මා වත්තන්තො පනාමෙතබ්බො. යො පනාමෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, අසම්මා වත්තන්තො න පනාමෙතබ්බො. යො න පනාමෙය්‍ය ආපත්ති දුක්කටස්සා” ති.

5. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො පනාමෙතබ්බො. ආචරියම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති. ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො පනාමෙතබ්බො.

6. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො න පනාමෙතබ්බො. ආචරියම්හි අධිමත්තං පෙමං හොති, අධිමත්තො පසාදො හොති, අධිමත්තා හිරි හොති, අධිමත්තො ගාරවො හොති, අධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො න පනාමෙතබ්බො.

7. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො අලං පනාමෙතුං. ආචරියම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති. ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සම්මන්නාගතො අන්තෙවාසිකො අලං පනාමෙතුං.

Free Distribution www.aathaapi.org

1. එකල්හි අතැවැසියෝ ආචාර්‍ය්‍යයන් වෙත මැනවින් නො පවත්නෝ ය. භාග්‍යවතුන් වහන්සේට මේ බව සැලකළහ. "මහණෙනි, අතැවැසියා ආචාර්‍ය්‍යයා වෙත මැනවින් නො පැවැතිය යුතු නො වේ. යමෙක් මැනවින් නො පවත්නේ නම් දුකුලාඇවැත් වේ ය" යි. මැනවින් නොම පවතිත්. භාග්‍යවතුන් වහන්සේට මේ බව සැලකළහ. මහණෙනි, මැනවින් නො පවතින්නහු බැහැර කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ බැහැර කළ යුතු ය. "නා බැහැර කරමි" යි හෝ "මෙහි නො පිවිසෙව" යි හෝ "නාගේ පාසිවුරු බැහැරට ගණුව" යි හෝ "නා විසින් මම උපස්ථාන නො කටයුත්තෙමි" යි හෝ කයින් හඟවා ද වචනයෙන් හඟවා ද කයින් හා වචයෙන් හඟවා ද අතැවැසි තෙමේ බැහැර කරණ ලද්දේ වේ. කයින් නො හඟවා ද වචනයෙන් නො හඟවා ද කයින් හා වචනයෙන් නො හඟවා ද අතැවැසි තෙමේ බැහැර නො කරණ ලද්දේ වේ ය" යි.

2. එකල්හි බැහැර කරණලද අතැවැසියෝ (ආචාර්‍ය්‍යයන්) කමා නො කරවත්. භාග්‍යවතුන් වහන්සේට මේ බව සැලකළහ. "මහණෙනි, කමා කරවා ගන්ට අනුදනිමි" යි. එහෙත් ඔහු ආචාර්‍ය්‍යයන් කමා නො කරවත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි බැහැර කරණ ලදහු විසින් කමා නො කර විය යුතු නො වේ. යමෙක් ආචාර්‍ය්‍යයන් කමා නො කරවන්නේ නම් දුකුලාඇවැත් වේ" යි.

3. එකල්හි අතැවැසියන් විසින් කමා කරවනු ලබන ආචාර්‍ය්‍යයෝ කමා නො කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, කමාකරන්ට අනුදනිමි" යි. ආචාර්‍ය්‍යයෝ කමා නො කරත්. අතැවැසියෝ බැහැර ද යෙති. සිවුරු ද හැර ලත්. අන්‍යතීර්ථකයන් වෙත ද යෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "කමා කරවනු ලබන්නහු විසින් කමා නො කරවිය යුතු නො වේ. යමෙක් කමා නො කරන්නේ නම් දුකුලාඇවැත් වේ" යි.

4. එකල්හි ආචාර්‍ය්‍යයෝ මනා කොට පිළිවෙත් පුරණ අතැවැසියා බැහැර කෙරෙත්. මනා කොට පිළිවෙත් නො පුරණ අතැවැසියා බැහැර නො කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මනා කොට පිළිවෙත් පුරණ අතැවැසි තෙමේ බැහැර නො කළයුතු ය. යමෙක් බැහැර කරන්නේ නම් දුකුලාඇවැත් වේ. මනා කොට පිළිවෙත් නො පුරණ අතැවැසි තෙමේ බැහැර නො කට යුතු නො වේ. යමෙක් බැහැර නො කරන්නේ නම් දුකුලාඇවැත් වේ" යි.

5. මහණෙනි, කරුණු පසකින් යුත් අතැවැසිතෙමේ බැහැර කට යුතු ය. ආචාර්‍ය්‍යයා කෙරෙහි අධික වූ ගෙහසිතප්‍රෙම්යෙක් නො වේ ද, අධික වූ පැහැදීමෙක් නො වේ ද, අධික වූ ලජ්ජාවක් නො වන්නී ද, අධික වූ ගෞරවයෙක් නො වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් නො වන්නී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් අතැවැසි තෙමේ බැහැර කටයුතු ය.

6. මහණෙනි, කරුණු පසකින් යුත් අතැවැසිතෙමේ බැහැර නො කටයුතු ය. ආචාර්‍ය්‍යයා කෙරෙහි අධික වූ ගෙහසිතප්‍රෙම්යෙක් වේ ද, අධික වූ පැහැදීමෙක් වේ ද, අධික වූ ලජ්ජාවක් වන්නී ද, අධික වූ ගෞරවයෙක් වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් වන්නී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් අතැවැසි තෙමේ බැහැර නො කට යුතු ය.

7. මහණෙනි, කරුණු පසකින් යුත් අතැවැසිතෙමේ බැහැර කරන්නට සුදුසු වේ. ආචාර්‍ය්‍යයා කෙරෙහි අධික වූ ප්‍රෙමයෙක් නො වේ ද, අධික වූ පැහැදීමෙක් නො වේ ද, අධික වූ ලජ්ජාවක් නොවන්නී ද, අධික වූ ගෞරවයෙක් නො වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් නො වන්නී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් අතැවැසි තෙමේ බැහැර කරන්නට සුදුසු වේ.

8. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො නාලං පනාමෙතුං. ආචරියම්හි අධිමත්තං පෙමං හොති, අධිමත්තො පසාදො හොති, අධිමත්තා හිරි හොති, අධිමත්තො ගාරවො හොති, ආධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො නාලං පනාමෙතුං.

9. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතං අන්තෙවාසිකං අපනාමෙන්තො ආචරියො සාතිසාරො හොති. පනාමෙන්තො අනතිසාරො හොති. ආචරියම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං අන්තෙවාසිකං අපනාමෙන්තො ආචරියො සාතිසාරො හොති. පනාමෙන්තො අනතිසාරො හොති.

10. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං අන්තෙවාසිකං පනාමෙන්තො ආචරියො සාතිසාරො හොති. අපනාමෙන්තො අනතිසාරො හොති. ආචරියම්හි අධිමත්තං පෙමං හොති, අධිමත්තො පසාදො හොති, ආධිමත්තා හිරි හොති, අධිමත්තො ගාරවො හොති, අධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං අන්තෙවාසිකං පනාමෙන්තො ආචරියො සාතිසාරො හොති, අපනාමෙන්තො අනතිසාරො හොතී'' ති.

11. තෙන ඛො පන සමයෙන භික්ඛූ ''දසවස්සම්හ, දසවස්සම්හා''ති බාලා අබ්‍යත්තා නිස්සයං දෙන්ති. දිස්සන්ති ආචරියා බාලා, අන්තෙවාසිකා පණ්ඩිතා. දිස්සන්ති ආචරියා අබ්‍යත්තා, අන්තෙවාසිකා බ්‍යත්තා. දිස්සන්ති ආචරියා අප්පස්සුතා, අන්තෙවාසිකා බහුස්සුතා. දිස්සන්ති ආචරියා දුප්පඤ්ඤා, අන්තෙවාසිකා පඤ්ඤවන්තො.

12. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති. ''කථං හි නාම භික්ඛූ දසවස්සම්හ, දසවස්සම්හා ති බාලා අබ්‍යත්තා නිස්සයං දස්සන්ති? දිස්සන්ති ආචරියා බාලා, අන්තෙවාසිකා පණ්ඩිතා. දිස්සන්ති ආචරියා අබ්‍යත්තා, අන්තෙවාසිකා බ්‍යත්තා. දිස්සන්ති ආචරියා අප්පස්සුතා, අන්තෙවාසිකා බහුස්සුතා. දිස්සන්ති ආචරියා දුප්පඤ්ඤා, අන්තෙවාසිකා පඤ්ඤවන්තො?'' ති.

13. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. ''සච්චං කිර භික්ඛවෙ'' -පෙ- සච්චං භගවා -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. ''න භික්ඛවෙ බාලෙන අබ්‍යත්තෙන නිස්සයො දාතබ්බො. යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙකදසවස්සෙන වා නිස්සයං දාතු'' න්ති.

**ආචරියවත්තභාණවාරං නිට්ඨිතං ඡට්ඨං.**

8. "මහණෙනි, කරුණු පසකින් යුත් අතැවැසි තෙමේ බැහැර කරන්නට සුදුසු නො වේ. ආචාර්‍ය්‍යයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් වේ ද, අධික වූ පැහැදීමෙක් වේ ද, අධික වූ ලජ්ජාවක් වන්නී ද, අධික වූ ගෞරවයක් වේ ද, අධික වූ මෛත්‍රීභාවනාවක් වන්නී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් අතැවැසිතෙමේ බැහැර කරන්නට සුදුසු නො වේ.

9. මහණෙනි, කරුණු පසකින් යුත් අතැවැසියා බැහැර නො කරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ දෙස් සහිත වේ. බැහැර කරන්නේ දෙස් රහිත වේ. ආචාර්‍ය්‍යයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් නො වේ ද, අධික වූ පැහැදීමෙක් නො වේ ද, අධික වූ ලජ්ජාවක් නො වන්නී ද, අධික වූ ගෞරවයක් නො වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් නො වන්නී ද, මේ කරුණු පසින් යුත් අතැවැසියා බැහැර නො කරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ දෙස් සහිත වේ. බැහැර කරන්නේ දෙස් රහිත වේ.

10. මහණෙනි, කරුණු පසකින් යුත් අතැවැසියා බැහැර කරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ දෙස් සහිත වේ. බැහැර නො කරන්නේ දෙස් රහිත වේ. ආචාර්‍ය්‍යයා කෙරෙහි අධික වූ ප්‍රේමයෙක් වේ ද, අධික වූ පැහැදීමෙක් වේ ද, අධික වූ ලජ්ජාවක් වන්නී ද, අධික වූ ගෞරවයෙක් වේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් වන්නී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් අතැවැසියා බැහැර කරන්නා වූ ආචාර්‍ය්‍ය තෙමේ දෙස් සහිත වේ. බැහැර නො කරන්නේ දෙස් රහිත වේ.

11. එකල්හි "දසවස් ඇත්තම්හ දසවස් ඇත්තම්හ" යි අඥ වූ අව්‍යක්ත වූ භික්ෂූහු නිඃස්‍රය දෙත්. ආචාර්‍ය්‍යයෝ අඥ වූවාහු අතැවැසියෝ පණ්ඩිත වූවාහු දක්නා ලැබෙත්. ආචාර්‍ය්‍යයෝ අව්‍යක්ත වූවාහු අතැවැසියෝ ව්‍යක්ත වූවාහු දක්නා ලැබෙත්. ආචාර්‍ය්‍යයෝ අල්පශ්‍රැත වූවාහු අතැවැසියෝ බහුශ්‍රැත වූවාහු දක්නා ලැබෙත්. ආචාර්‍ය්‍යයෝ නුවණ නැත්තාහු අතැවැසියෝ නුවණ ඇත්තාහු දක්නා ලැබෙත්.

12. යම් ඒ භික්ෂූහු ආශා රහිත වූවාහු ද ඔහු අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. "කෙසේ නම් භික්ෂූහු 'දස වස් ඇත්තම්හ, දස වස් ඇත්තම්හ' යි අඥ වූවාහු අව්‍යක්ත වූවාහු නිඃස්‍රය දෙත් ද ? ආචාර්‍ය්‍යයෝ අඥ වූවාහු අතැවැසියෝ පණ්ඩිත වූවාහු දක්නා ලැබෙත්. ආචාර්‍ය්‍යයෝ අව්‍යක්ත වූවාහු අතැවැසියෝ ව්‍යක්ත වූවාහු දක්නා ලැබෙත්. ආචාර්‍ය්‍යයෝ අල්පශ්‍රැත වූවාහු අතැවැසියෝ බහුශ්‍රැත වූවාහු දක්නා ලැබෙත්. ආචාර්‍ය්‍යයෝ නුවණ නැත්තාහු අතැවැසියෝ නුවණ ඇත්තාහු දක්නා ලැබෙත්."

13. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සැබෑ ද ?" –පෙ– භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය. –පෙ– ගරහා දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, අඥ වූ අව්‍යක්ත මහණහු විසින් නිඃස්‍රය නො දිය යුතු ය. යම් මහණෙක් නිඃස්‍රය දෙන්නේ නම් දුකුළාඇවැත් වේ. "මහණෙනි, දසවස් ඇත්තා වූ හෝ වැඩි දස වස් ඇත්තාවූ හෝ ව්‍යක්තවූ ප්‍රතිබලවූ මහණහු විසින් නිඃස්‍රය දෙන්නට අනුදනිමි"යි.

**සවන ඇදුරුවත්බණවර නිමි.**

1. තෙන ඛො පන සමයෙන භික්ඛූ ආචරියුපජ්ඣායෙසු පක්කන්තෙසුපි විබ්භන්තෙසුපි කාලඞ්කතෙසුපි, පක්ඛසඞ්කන්තෙසුපි නිස්සයපටිප්පස්සද්ධියො න ජානන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං "පඤ්චිමා භික්ඛවෙ, නිස්සයපටිප්පස්සද්ධියො උපජ්ඣායම්හා: උපජ්ඣායො පක්කන්තො වා හොති, විබ්භන්තො වා, කාලඞ්කතො වා, පක්ඛසඞ්කන්තො වා, ආණත්තියෙව පඤ්චමී. ඉමා ඛො භික්ඛවෙ, පඤ්ච නිස්සයපටිප්පස්සද්ධියො උපජ්ඣායම්හා.

2. ඡයිමා භික්ඛවෙ, නිස්සයපටිප්පස්සද්ධියො ආචරියම්හා: ආචරියො පක්කන්තො වා හොති, විබ්භන්තො වා, කාලඞ්කතො වා, **පක්ඛසඞ්කන්තො** වා, ආණත්තියෙව පඤ්චමී, උපජ්ඣායෙන වා සමොධානගතො හොති. ඉමා ඛො භික්ඛවෙ, ඡ නිස්සයපටිප්පස්සද්ධියො ආචරියම්හා.

3. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

4. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

5. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අත්තනා න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ සීලක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ සමාධික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ පඤ්ඤාක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ විමුත්තික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ සමාදපෙතා. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

1. එකල්හි භික්ෂූහු ආචාර්‍යෝපාධ්‍යායයන් බැහැර ගිය කල්හි ද සිවුරු හැර ගිය කල්හි ද කළුරිය කළ කල්හි ද අන්‍යතීර්ථකපක්ෂයකට මාරු වූ කල්හි ද නිස සන්හිදීම්* (නිස සන්හිඳෙන සැටි) නො දනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උපාධ්‍යායයා කෙරෙන් නිස සන්හිදීම් මේ පසෙක් වේ: උපාධ්‍යාය තෙමේ බැහැර ගියේ හෝ වේ ද, සිවුරු හැර ගියේ හෝ වේ ද, කළුරිය කෙළේ හෝ වේ ද, තීර්ථකපක්ෂයකට මාරු වූයේ හෝ වේ ද, යන මේ සතර හා (බැහැරයව් යි) අණ කිරීම ම පස්වැන්න වේ. මේ පස උපාධ්‍යායයා කෙරෙන් වන නිස සන්හිදීම් වේ.

2. මහණෙනි, ආචාර්‍යයා කෙරෙන් වන නිස සන්හිදීම් මේ සයෙකි: ආචාර්‍ය තෙමේ බැහැර ගියේ හෝ වේ ද, සිවුරු හැර ගියේ හෝ වේ ද, කළුරිය කෙළේ හෝ වේ ද, තීර්ථකපක්ෂයකට මාරු වූයේ හෝ වේ ද, මේ සතර හා අණ කිරීම ම පස්වැන්න වේ. උපාධ්‍යායයා හා එක්වීමට* ගියේ හෝ වේ. මේ සය ආචාර්‍යයා කෙරෙන් වන නිස සන්හිදීම් වේ.

3 මහණෙනි, කරුණු පසකින් යුක්ත වූ මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුක්ත වූ මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

4. මහණෙනි, කරුණු පසකින් යුක්ත වූ මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිඃශ්‍රය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුක්ත වූ මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිඃශ්‍රය දිය යුතුය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

5. මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුක්ත වූ මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. තෙමේ අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත නො වූයේද, අන්හු අසෙඛ වූ සීලක්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත නො වූයේ ද, අන්හු අසෙඛ වූ සමාධික්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් යුක්ත නො වූයේ ද, අන්හු අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත නො වූයේ ද, අන්හු අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත නො වූයේද, අන්හු අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද; මහණෙනි, මේ කරුණු පසින් යුක්ත වූ මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

---

* උපග්‍රන්ථය බලනු

6. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අත්තනා අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ සීලක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ සමාධික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ පඤ්ඤාක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ විමුත්තික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ සමාදපෙතා. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

7. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

8. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. සද්ධො හොති, හිරිමා හොති, ඔත්තාපී [1] හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතස්සති හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

9. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො **උපට්ඨාපෙතබ්බො.** අධිසීලෙ සීලවිපන්නො හොති, අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, අප්පස්සුතො හොති, දුප්පඤ්ඤො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

10. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න අධිසීලෙ සීලවිපන්නො හොති, න අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, න අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, බහුස්සුතො හොති, පඤ්ඤවා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

1. "ඔත්තප්පී" ම. ඡ. සං; P. T. S. "ඔත්තාපී" ති සීහළක්ඛරපොත්ථකෙසු දිස්සති.

Free Distribution www.aathaapi.org

6. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. තෙමේ අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත වූයේ ද, අන්හු අසෙඛ වූ සීලක්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත වූයේ ද, අන්හු අසෙඛ වූ සමාධික්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ පඤ්ඤක්ඛන්ධයෙන් යුක්ත වූයේ ද, අන්හු අසෙඛ වූ පඤ්ඤක්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ වේ ද; තෙමේ අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත වූයේ ද, අන්හු අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ වේ ද; තෙමේ අසෙඛවූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත වූයේ ද, අන්හු අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ වේ ද; මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දියයුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

7. මහණෙනි, අතිකුදු කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. ශ්‍රද්ධා නැත්තේ ද, ලජ්ජා නැත්තේ ද, පවට බිය නැත්තේ ද, කුසීතයෙක් ද, මුළා වූ සිහි ඇත්තේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් නො කළයුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

8. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ශ්‍රද්ධා ඇත්තේ ද, ලජ්ජා ඇත්තේ ද, පවට බිය ඇත්තේ ද, පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ ද, එළඹ සිටි සිහි ඇත්තේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

9. මහණෙනි, අතිකුදු කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට පැමිණියේ ද, අජ්ඣාචාරයෙහි ආචාරවිපත්තියට පැමිණියේ ද, අත්‍යන්තගාහිකදිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට පැමිණියේ ද, අල්පශ්‍රැත ද, නුවණ නැත්තේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

10. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් කළයුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට නො පැමිණියේ වේ ද, අජ්ඣාචාරයෙහි ආචාරවිපත්තියට නො පැමිණියේ වේ ද, අත්‍යන්තගාහිකදිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට නො පැමිණියේ වේ ද, බහුශ්‍රැත වේ ද, නුවණ ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

11. අපරෙහිපි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං වා විනොදාපෙතුං වා, ආපත්තිං න ජානාති, ආපත්තියා වුට්ඨානං න ජානාති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

12. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, අනභිරතිං[1] වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං වා විනොදාපෙතුං වා, ආපත්තිං ජානාති, ආපත්තියා වුට්ඨානං ජානාති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

13. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය[2] සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

14. පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

1. "අනභිරතිං" ම ජ. සං. 2. "ආදිබ්‍රහ්මචරියකාය" ම. ජ. සං.

11. මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් නො කළයුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. ගිලන් වූ අතැවැසියාට හෝ සද්ධිවිහාරිකයාහට උපස්ථාන කරන්නට හෝ උපස්ථාන කරවන්නට, ශාසනයෙහි නො ඇල්ම දුරු කරන්නට හෝ දුරු කරවන්නට, උපන්නා වූ කුකුස ධර්මානුකූලව දුරු කරන්නට හෝ දුරු කරවන්නට පොහොසත් වූයේ නො වේ ද, ඇවැත් නො දනී ද, ඇවතින් නැගීසිටීම නො දනී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

12. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ගිලන් වූ අතැවැසියාහට හෝ සද්ධිවිහාරිකයාහට හෝ උපස්ථාන කරන්නට හෝ උපස්ථාන කරවන්නට, ශාසනයෙහි නො ඇල්ම දුරු කරන්නට හෝ දුරු කරවන්නට, උපන්නා වූ කුකුස ධර්මානුකූල ව බැහැර කරන්නට හෝ බැහැර කරවන්නට පොහොසත් වූයේ වේ ද, ඇවැත් දනී ද, ඇවතින් නැගීසිටීම දනී ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතුය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

13. මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. අතැවැසියා හෝ සද්ධිවිහාරිකයා හෝ සසුන් පිළිවෙතට සුදුසු ආචාරශික්ෂාවෙහි (ඛන්දවත්හි) හික්මවන්නට, මාගීබ්‍රහ්මචය්‍ය්‍යීයට ආදි වූ (උභතොවිභඞ්ගයට ඇතුළත්) සික්ඛාපදයෙහි හික්මවන්නට, අභිධර්මයෙහි (නාමරූප පරිච්ඡේදයෙහි) හික්මවන්නට, සියළු විනයපිටකයෙහි හික්මවන්නට, උපන් මිසදිටු ධර්මානුකූලව නොර කරන්නට, පොහොසත් වූයේ නො වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

14. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. අතැවැසියා හෝ සද්ධිවිහාරිකයා හෝ සසුන් පිළිවෙතට සුදුසු ආචාරශික්ෂාවෙහි හික්මවන්නට, මාගීබ්‍රහ්මචය්‍ය්‍යීයට ආදි වූ සික්ඛාපදයෙහි හික්මවන්නට, අභිධර්මයෙහි හික්මවන්නට, සියලු විනය පිටකයෙහි හික්මවන්නට, උපන් මිසදිටු ධර්මානුකූලව නොර කරන්නට, පොහොසත් වූයේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

15. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. ආපත්තිං න ජානාති. අනාපත්තිං න ජානාති. ලහුකං ආපත්තිං න ජානාති. ගරුකං ආපත්තිං න ජානාති. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන න ස්වාගතානි හොන්ති න සුවිභත්තානි න සුප්පවත්තීනි න සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

16. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති. සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

17. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. ආපත්තිං න ජානාති. අනාපත්තිං න ජානාති. ලහුකං ආපත්තිං න ජානාති, ගරුකං ආපත්තිං න ජානාති. ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

18. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති. ගරුකං ආපත්තිං ජානාති. දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි, සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බොති.

**උපසම්පාදෙතබ්බපඤ්චකසොළසවාරං නිට්ඨිතං.** [1]

---

1 "සොළසවාරො නිට්ඨිතො" ම. ඡ. සං

Free Distribution www.aathaapi.org

15. මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපත් නො කළයුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. ආපත්තිය නො දනී ද, ආනාපත්තිය නො දනී ද, ලහුකාපත්තිය නො දනී ද, ගරුකාපත්තිය නො දනී ද, ඕහට උභයප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ නුවූවාහු වෙත් ද, මාතිකාවිභඞ්ග වශයෙන් මනා සේ බෙදුනාහු නො වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ නො පවත්නෝ වෙත් ද, මාතිකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා කොට විනිශ්චය නො කරණ ලද්දාහු වෙත් ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

16. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ආපත්තිය දනී ද, අනාපත්තිය දනී ද, ලහුකාපත්තිය දනී ද, ගරුකාපත්තිය දනී ද, ඕහට උභයප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වූවාහු වෙත් ද, මාතිකාවිභඞ්ග වශයෙන් මනා සේ බෙදුනාහු වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ පවත්නෝ වෙත් ද, මාතිකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා කොට විනිශ්චය කරණ ලද්දාහු වෙත් ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපත් කළයුතු ය. නිස්සය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

17. මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කර විය යුතු ය. ආපත්තිය නො දනී ද, අනාපත්තිය නො දනී ද, ලහුකාපත්තිය නො දනී ද, ගරුකාපත්තිය නො දනී ද, අඩු දස වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපත් නො කළයුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

18. මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ආපත්තිය දනී ද, අනාපත්තිය දනී ද, ලහුකාපත්තිය දනී ද, ගරුකාපත්තිය දනී ද, දස වස් ඇත්තේ හෝ වැඩි දසවස් ඇත්තේ හෝ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

**උපසපන්කිරීමේ සුදුසුකම් පස පිළිබඳ සොළොස් වාරය නිමි.**

1. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

2. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. දසවස්සො වා හොති අතිරෙක දසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

3. අපරෙහිපි භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අත්තනා න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ සීලක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ සමාධික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ පඤ්ඤාක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ විමුත්තික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා න අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, න පරං අසෙඛෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ සමාදපෙතා; ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

4. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අත්තනා අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ සීලක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ සමාධික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ පඤ්ඤාක්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ විමුත්තික්ඛන්ධෙ සමාදපෙතා; අත්තනා අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, පරං අසෙඛෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ සමාදපෙතා, දසවස්සො වා හොති අතිරෙක දසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

1. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ ප්‍රඥාක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුක්තික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුක්තිඥානදර්ශනක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

2. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිඃශ්‍රය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ ප්‍රඥාක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ විමුක්තික්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ විමුක්තිඥානදර්ශනක්ඛන්ධයෙන් යුක්ත වේ ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ හෝ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිඃශ්‍රය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

3. මහණෙනි, අනිකුදු කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. තෙමේ අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත නො වූයේ අන්හු අසෙඛ වූ සීලක්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද, තෙමේ අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත නො වූයේ අන්හු අසෙඛ වූ සමාධික්ඛන්ධයෙහි සමාදන් නොකරවන්නේ වේ ද, තෙමේ අසෙඛ වූ ප්‍රඥාක්ඛන්ධයෙන් යුක්ත නො වූයේ අන්හු අසෙඛ වූ ප්‍රඥාක්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද, තෙමේ අසෙඛ වූ විමුක්තික්ඛන්ධයෙන් යුක්ත නො වූයේ අන්හු අසෙඛ වූ විමුක්තික්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද, තෙමේ අසෙඛ වූ විමුක්තිඥානදර්ශන-ක්ඛන්ධයෙන් යුක්ත නො වූයේ අන්හු අසෙඛ වූ විමුක්තිඥානදර්ශන-ක්ඛන්ධයෙහි සමාදන් නො කරවන්නේ වේ ද, අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිඃශ්‍රය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

4. කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිඃශ්‍රය දිය යුතු ය. සාමණේරතෙමේ උපස්ථාන කරවිය යුතු ය. තෙමේ අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත වූයේ අන්හු අසෙඛ වූ සීලක්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ ද, තෙමේ අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත වූයේ අන්හු අසෙඛ වූ සමාධික්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ ද, තෙමේ අසෙඛ වූ ප්‍රඥාක්ඛන්ධයෙන් යුක්ත වූයේ අන්හු අසෙඛ වූ ප්‍රඥාක්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ ද, තෙමේ අසෙඛ වූ විමුක්තික්ඛන්ධයෙන් යුක්ත වූයේ අන්හු අසෙඛ වූ විමුක්තික්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ ද, තෙමේ අසෙඛ වූ විමුක්තිඥානදර්ශනක්ඛන්ධයෙන් යුක්ත වූයේ අන්හු අසෙඛ වූ විමුක්තිඥානදර්ශනක්ඛන්ධයෙහි සමාදන් කරවන්නේ ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ හෝ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිඃශ්‍රය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

5. අපරෙහිපි භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අස්සද්ධො හොති. අහිරිකො හොති. අනොත්තප්පී හොති. කුසීතො හොති. මුට්ඨස්සති හොති. ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො

6. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. සද්ධො හොති. හිරිමා හොති. ඔත්තප්පී හොති. ආරද්ධවිරියො හොති. උපට්ඨිතසති හොති. දසවස්සො වා හොති අතිරෙක දසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

7. අපරෙහිපි භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. අධිසීලෙ සීලවිපන්නො හොති. අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති. අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති. අප්පස්සුතො හොති. දුප්පඤ්ඤො හොති. ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

8. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න අධිසීලෙ සීලවිපන්නො හොති. න අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති. න අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති. බහුස්සුතො හොති. පඤ්ඤවා හොති. දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

9. අපරෙහිපි භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං වා විනොදාපෙතුං වා. ආපත්තිං න ජානාති, ආපත්තියා වුට්ඨානං න ජානාති. ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

5. මහණෙනි, අංගකුදු කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිසසය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. ශ්‍රද්ධා නැත්තේ ද, ලජ්ජා නැත්තේ ද, පවට බිය නැත්තේ ද, කුසීත වේ ද, මුළා වූ සිහි ඇත්තේ ද, අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිසසය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතුය.

6. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිසසය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ශ්‍රද්ධා ඇත්තේ ද, ලජ්ජා ඇත්තේ ද, පවට බිය ඇත්තේ ද, පටන්ගත් වීර්‍ය්‍යය ඇත්තේ ද, එළඹ සිටි සිහි ඇත්තේ ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ හෝ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිසසය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

7. මහණෙනි, අංගකුදු කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිසසය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට පැමිණියේ වේ ද, අධ්‍යාචාරයෙහි ආචාරවිපත්තියට පැමිණියේ වේ ද, අන්තගග්‍රාහික-දිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට පැමිණියේ වේ ද, අල්පශ්‍රැත වේ ද, නුවණ නැත්තේ වේ ද; අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිසසය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

8. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිසසය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට නො පැමිණියේ වේ ද, අධ්‍යාචාර යෙහි ආචාරවිපත්තියට නො පැමිණියේ වේ ද, අන්තගග්‍රාහිකදිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට නො පැමිණියේ වේ ද, බහුශ්‍රැත වේ ද, නුවණැත්තේ වේ ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ හෝ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපත් කළ යුතු ය. නිසසය දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

9. මහණෙනි, අංගකුදු කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිසසය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. ගිලන් වූ අතැවැසියාහට හෝ සද්ධි-විහාරිකයාහට හෝ උපස්ථාන කරන්නට හෝ උපස්ථාන කරවන්නට හෝ ශාසනයෙහි නො ඇල්ම බැහැර කරන්නට හෝ බැහැර කරවන්නට හෝ උපන් කුකුස ධර්මානුකූලව දුරු කරන්නට හෝ දුරු කරවන්නට හෝ පොහොසත් නො වේ ද, ආපත්තිය නො දනී ද, ආපත්තියෙන් නැගීසිටීම නො දනී ද, අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපත් නො කළ යුතු ය. නිසසය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

10. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං වා විනොදාපෙතුං වා, ආපත්තිං ජානාති, ආපත්තියා වුට්ඨානං ජානාති, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

11. අපරෙහිපි භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

12. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො. පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

13. අපරෙහිපි භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. ආපත්තිං න ජානාති. අනාපත්තිං න ජානාති. ලහුකං ආපත්තිං න ජානාති. ගරුකං ආපත්තිං න ජානාති. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන න ස්වාගතානි හොන්ති න සුවිභත්තානි න සුප්පවත්තීනි න සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. ඌනදසවස්සො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

10. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ගිලන් වූ අතැවැසියාහට හෝ සද්ධිවිහාරිකයාහට හෝ උපස්ථාන කරන්නට හෝ උපස්ථාන කරවන්නට, ශාසනයෙහි නො ඇල්ම බැහැර කරන්නට හෝ බැහැර කරවන්නට, උපන් කුකුස ධර්මානුකූල ව දුරු කරන්නට හෝ දුරු කරවන්නට, පොහොසත් වේ ද, ආපත්තිය දනී ද, ආපත්තියෙන් නැගී සිටීම දනී ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

11. මහණෙනි, අනිකුදු කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. අතැවැසියා හෝ සද්ධිවිහාරිකයා හෝ සසුන් පිළිවෙතට සුදුසු චාරිත්‍රශික්ෂාවෙහි හික්මවන්නට, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදි වූ උභතොවිභඞ්ගයට ඇතුළත් සිකපදයෙහි හික්මවන්නට, නාමරූප පරිච්ඡේදයෙහි හික්මවන්නට, සියලු විනය පිටකයෙහි හික්මවන්නට, උපන් මිසදිටුව ධර්මයෙන් තොර කරන්නට, පොහොසත් වූයේ නො වේ ද, අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

12. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතුය. අතැවැසියා හෝ සද්ධිවිහාරිකයා හෝ සසුන් පිළිවෙතට සුදුසු වූ චාරිත්‍රශික්ෂා-වෙහි හික්මවන්නට, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයට ආදි වූ උභතොවිභඞ්ගයට ඇතුළත් සිකපදයෙහි හික්මවන්නට, නාමරූපපරිච්ඡේදයෙහි හික්මවන්නට සියලු විනය පිටකයෙහි හික්මවන්නට, උපන් මිසදිටුව ධර්මානුකූලව තොරකරන්නට, පොහොසත් වූයේ වේ ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

13. මහණෙනි, අනිකුදු කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය. ආපත්තිය නො දනී ද, අනාපත්තිය නො දනී ද, ලඝුකාපත්තිය නො දනී ද, ගරුකාපත්තිය නො දනී ද, ඔහට උභය ප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වූවාහු නො වෙත් ද, මාතිකා විභඞ්ග වශයෙන් මනා සේ බෙදුනාහු නො වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ නො පවත්නාහු වෙත් ද, මාතිකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා සේ විනිශ්චය නො කරණ ලද්දාහු වෙත් ද, අඩු දස වස් ඇත්තේ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන නො කරවිය යුතු ය.

14. ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො. ආපත්තිං ජානාති. අනාපත්තිං ජානාති. ලහුකං ආපත්තිං ජානාති ගරුකං ආපත්තිං ජානාති. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා. ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො ති.

**උපසම්පාදෙතබ්බඡක්කචුද්දසවාරං නිට්ඨිතං.**

---

Free Distribution www.aathaapi.org

14. මහණෙනි, කරුණු සයකින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය. ආපත්තිය දනී ද අනාපත්තිය දනීද ලහුකාපත්තිය දනී ද ගරුකාපත්තිය දනී ද ඔහට උභයප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වෙත් ද, මාතිකාවිභඞ්ග වශයෙන් බෙදූනාහු වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ පවත්නාහු වෙත් ද, මාතිකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා සේ විනිශ්චය කරණ ලද්දාහු වෙත් ද, දස වස් ඇත්තේ හෝ වැඩි දස වස් ඇත්තේ හෝ වේ ද; මහණෙනි, මේ කරුණු සයින් යුත් මහණහු විසින් උපසපන් කළ යුතු ය. නිස්සය දිය යුතු ය. සාමණේර තෙමේ උපස්ථාන කරවිය යුතු ය.

**උපසපන් කිරීමෙහි සුදුසුකම් සය පිළිබඳ තුදුස්වාරය නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන යො සො අඤ්ඤතිත්ථියපුබ්බො උපජ්ඣායෙන සහධම්මිකං වුච්චමානො උපජ්ඣායස්ස වාදං ආරොපෙත්වා තංයෙව තිත්ථායතනං සඞ්කමි. සො පුන පච්චාගන්ත්වා භික්ඛූ උපසම්පදං යාචි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "යො සො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො උපජ්ඣායෙන සහධම්මිකං වුච්චමානො උපජ්ඣායස්ස වාදං ආරොපෙත්වා තංයෙව තිත්ථායතනං සඞ්කන්තො, සො ආගතො න උපසම්පාදෙතබ්බො."

2. යො[1] භික්ඛවෙ අඤ්ඤොපි අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං. තස්ස චත්තාරො මාසෙ පරිවාසො දාතබ්බො. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බො: පඨමං කෙසමස්සුං ඔහාරාපෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදාපෙත්වා එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිම්පග්ගණ්හාපෙත්වා එවං වදෙහී ති වත්තබ්බො: "බුද්ධං සරණං ගච්ඡාමි. ධම්මං සරණං ගච්ඡාමි. සඞ්ඝං සරණං ගච්ඡාමි. දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි. තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමී"ති.

3. තෙන භික්ඛවෙ අඤ්ඤතිත්ථියපුබ්බෙන සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො. "අහං භන්තෙ, ඉත්ථන්නාමො අඤ්ඤතිත්ථියපුබ්බො, ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛාමි උපසම්පදං. සොහං භන්තෙ, සඞ්ඝං චත්තාරො මාසෙ පරිවාසං යාචාමී"ති දුතියම්පි යාචිතබ්බො. තතියම්පි යාචිතබ්බො.

4. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති උපසම්පදං. සො සඞ්ඝං චත්තාරො මාසෙ පරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස අඤ්ඤතිත්ථිය-පුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසං දදෙය්‍ය. එසා ඤත්ති.

5. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො අඤ්ඤතිත්ථිය-පුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති උපසම්පදං. සො සඞ්ඝං චත්තාරො මාසෙ පරිවාසං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස අඤ්ඤතිත්ථියපුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස අඤ්ඤතිත්ථියපුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසස්ස දානං. සො තුණ්හස්ස. යස්ස න ඛමති, සො භාසෙය්‍ය.

6. "දින්නො සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස අඤ්ඤතිත්ථියපුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

---

1. "යො සො භික්ඛවෙ" ම. ඡ. සං.

Free Distribution www.aathaapi.org

1. එකල්හි පෙර අන්‍යතීර්ථික වූ යම් ඒ මහණෙක් උපාධ්‍යායයා විසින් සිකපදයෙන් කියනු ලබන්නේ උපාධ්‍යායයාහට වාද නගා ඒ තීර්ථායතනයට ම ගියේ ය. හෙතෙමේ නැවත පෙරළා අවුත් භික්ෂූන්ගෙන් උපසම්පදාව ඉල්ලී ය. භික්ෂූහු ඒ බව භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. මහණෙනි, පෙර අන්‍යතීර්ථික වූ යම් ඒ මහණෙක් උපාධ්‍යායයා විසින් සිකපදයෙන් කියනු ලබන්නේ උපාධ්‍යායයාහට වාද නගා ඒ තීර්ථායතනයට ම ගොස් නැවත ආයේ ද, හෙතෙම උපසපත් නො කටයුතු ය.

2. මහණෙනි, පෙර අන්‍යතීර්ථික වූ අන් යමෙක් ද මේ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදාව කැමැති වේ නම් ඔහුට සිව්මසක් පිරිවෙස් දිය යුතු ය. මහණෙනි, ඒ දිය යුත්තේ මෙසේ ය: පළමු කොට හිසකේ රැවුල් බැහැර කරවා කසාවත් අන්දවා උතුරු සඟ සිවුර එකස් කරවා භික්ෂූන්ගේ පා වන්දවා උක්කුටිකයෙන් හින්දවා ඇඳිලි ගන්වා "බුදුන් සරණ කොට යමි. ධර්මය සරණ කොට යමි. සඞ්ඝයා සරණ කොට යමි. දෙවනු ද බුදුන් සරණ කොට යමි. දෙවනු ද ධර්මය සරණ කොට යමි. දෙවනු ද සඞ්ඝයා සරණ කොට යමි. තෙවනු ද බුදුන් සරණ කොට යමි. තෙවනු ද ධර්මය සරණ කොට යමි. තෙවනු ද සඞ්ඝයා සරණ කොට යමි" යි මෙසේ කියව යි කිය යුත්තේ ය.

3. මහණෙනි, පෙර අන්‍යතීර්ථික වූ ඔහු විසින් සඞ්ඝයා වෙත පැමිණ උතුරු සඟසිවුර එකස් කොට භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ "ස්වාමීනි, මම පෙර මෙ නම් ඇති අන්‍යතීර්ථිකයෙක් වීමි. දැන් මේ ශාසනයෙහි උපසම්පදාව කැමැත්තේ වෙමි. ස්වාමීනි, ඒ මම සිවු මසක් සඞ්ඝයා වෙතින් පිරිවෙස් ඉල්ලමි' යි මෙසේ කිය යුතු වන්නේය. දෙවනු ද ඉල්ලිය යුතු ය. තෙවනු ද ඉල්ලිය යුතු ය.

4. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණෙකු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. "මෙ නම් ඇති පෙර අන්‍යතීර්ථික වූ මේ තෙමේ මේ ශාසනයෙහි උපසම්පදාව බලාපොරොත්තු වේ. සඞ්ඝයාගෙන් සිව්මසක් පිරිවෙස් ඉල්ලයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ පෙර අන්‍යතීර්ථික වූ මෙ නම් ඇත්තහුට සිවු මසක් පිරිවෙස් දෙන්නේ ය. මේ දැන්වීම ය."

5. ස්වාමීනි, සඞ්ඝතෙමේ මා කියන්නක් අසාවා. "මෙ නම් ඇති අන්‍යතීර්ථික වූ මේ තෙමේ මේ ශාසනයෙහි උපසම්පදාව බලාපොරොත්තු වේ. හෙතෙමේ සඞ්ඝයාගෙන් සිවු මසක් පිරිවෙස් ඉල්ලයි. සඞ්ඝතෙමේ පෙර අන්‍යතීර්ථික වූ මෙ නම් ඇත්තහුට සිවු මසක් පිරිවෙස් දෙයි. යම් ආයුෂ්මතෙකුට පෙර අන්‍යතීර්ථික වූ මෙනම් ඇත්තහුට සිවු මසක් පිරිවෙස් දීම රුචි වේ නම් හෙතෙමේ - තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම් හෙතෙමේ කියාවා."

6. "සඞ්ඝයා විසින් පෙර අන්‍යතීර්ථික වූ මෙ නම් ඇත්තහුට සිවු මසක් පිරිවෙස් දෙන ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ සලකමි" යි.

7. එවං ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති එවං අනාරාධකො. කථඤ්ච භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අනාරාධකො හොති? ඉධ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අතිකාලෙන ගාමං පවිසති. අතිදිවා පටික්කමති. එවම්පි භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අනාරාධකො හොති.

8. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො වෙසියගොචරො [1] වා හොති. විධවගොචරො [2] වා හොති. ථුල්ලකුමාරිකගොචරො [3] වා හොති. පණ්ඩකගොචරො වා හොති. භික්ඛුනීගොචරො වා හොති. එවම්පි භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අනාරාධකො හොති.

9. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි තත්ථ න දක්ඛො හොති න අනලසො. න තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො. න අලං කාතුං, න අලං සංවිධාතුං එවම්පි භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අනාරාධකො හොති.

10. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො න තිබ්බච්ඡන්දො හොති **උද්දෙසෙ** පරිපුච්ඡාය, අධිසීලෙ, අධිචිත්තෙ, අධිපඤ්ඤාය. එවම්පි භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අනාරාධකො හොති.

11. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො යස්ස තිත්ථායතනා සඞ්කන්තො හොති, තස්ස සත්ථුනො තස්ස දිට්ඨියා තස්ස ඛන්තියා තස්ස රුචියා තස්ස ආදායස්ස අවණ්ණෙ භඤ්ඤමානෙ කුපිතො හොති අනත්තමනො අනභිරද්ධො. බුද්ධස්ස වා ධම්මස්ස වා සඞ්ඝස්ස වා අවණ්ණෙ භඤ්ඤමානෙ අත්තමනො හොති උදග්ගො අභිරද්ධො. යස්ස වා පන තිත්ථායතනා සඞ්කන්තො හොති, තස්ස සත්ථුනො තස්ස දිට්ඨියා තස්ස ඛන්තියා තස්ස රුචියා තස්ස ආදායස්ස වණ්ණෙ භඤ්ඤමානෙ අත්තමනො හොති උදග්ගො අභිරද්ධො. බුද්ධස්ස වා ධම්මස්ස වා සඞ්ඝස්ස වා වණ්ණෙ භඤ්ඤමානෙ කුපිතො හොති අනත්තමනො අනභිරද්ධො. ඉදං භික්ඛවෙ සඞ්ඝාතනිකං අඤ්ඤතිත්ථියපුබ්බස්ස අනාරාධනීයස්මිං. එවං ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො අනාරාධකො හොති. එවං අනාරාධකො ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආගතො න උපසම්පාදෙතබ්බො.

12. කථඤ්ච භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති? ඉධ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො නාතිකාලෙන ගාමං පවිසති. නාතිදිවා පටික්කමති. එවම්පි භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති.

1 "වෙසියාගොචරො" ම. ඡ. සං. 2 "විධවාගොචරො" ම. ඡ. සං.
3 "ථුල්ලකුමාරිකාගොචරො" ඡ. පු; ම. නු. ප; ම. ඡ. සං.

Free Distribution www.aathaapi.org

7. මහණෙනි, පෙර අන්‍යතීර්ථක වූයේ මෙසේ වත් සපයන්නේ (පිරිවෙස්වන පුරන්නේ) වේ. මෙසේ වත් නො සපයන්නේ වේ. මහණෙනි, පෙර අන්‍යතීර්ථක වූයේ කෙසේ වත් නො සපයන්නේ වේ ද? මහණෙනි, මෙහි පෙර අන්‍යතීර්ථක වූයේ ඉතා කලින් ගමට පිවිසෙයි. ඉතා දහවල් පෙරළා එයි. මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථක වූයේ වත් නො සපයන්නේ වේ.

8. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථක වූයේ වෙසඟනන් ඇසුරු කරන්නේ හෝ වේ ද, වැන්දඹු ගැහැණුන් ඇසුරු කරන්නේ හෝ වේ ද, විවාහ නොවී මහලු වූ ගැහැණුන් ඇසුරු කරන්නේ හෝ වේ ද, ලිඞ්ග විකල වූවන් (නපුංසකයන්) ඇසුරු කරන්නේ හෝ වේ ද, මෙහෙණින් ඇසුරු කරන්නේ හෝ වේ ද, මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථක වූයේ වත් නො සපයන්නේ වේ.

9. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථක වූයේ සබ්‍රහ්මචාරීන් පිළිබඳ කුමක් කෙරෙම්ද යි පිළිවිස කළයුතු යම් ඒ කුදු මහත් කටයුතු වෙත් ද, ඒ කටයුතුවල දක්‍ෂ නො වේ. උත්‍ථානවීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ නො වේ. ඒ ඒ කටයුතුවල "මෙය මෙසේ කට යුතු ය" යි කෙණෙහි උපන් නුවණින් යුක්ත වූයේ නො වේ. සියතින් කරන්නට සමර්‍ථ නො වේ. ස්ථවිර - මධ්‍යම - නවකයන් තුළ උත්සාහය උපදවා සංවිධානය කරන්නට සමර්‍ථ නො වේ. මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථක වූයේ වත් නො සපයන්නේ වේ.

10. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථක වූයේ පෙළ පුහුණු කිරීමෙහි අරුත් ඇසීමෙහි ප්‍රාතිමොක්‍ෂශීලයෙහි ලෞකිකසමාධිභාවනාවෙහි ලොකොත්තරමාර්ගභාවනාවෙහි බලවත් කැමැත්ත ඇත්තේ නො වේ. මහණෙනි, පෙර අන්‍යතීර්ථක වූයේ මෙසේ ද වත් නො සපයන්නේ වේ.

11. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථක වූයේ යමෙකුගේ තීර්ථායතනයකින් මෙහි ආයේ වේ ද, ඒ තීර්ථායතනස්වාමී වූ ශාස්තෘහුගේ ද ඔහු අයත් ලබ්ධියෙහි ද ඔහුගේ කැමැත්තෙහි ද ඔහුගේ රුචියෙහි ද ඔහුගේ දැඩිව ගත් දෘෂ්ටියෙහි ද දෙස් කියනු ලබන කල්හි කිපියේ නො සතුටු සිත් ඇත්තේ නො පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, බුදුන්ගේ හෝ ධර්මයෙහි හෝ සඞ්ඝයාගේ හෝ දෙස් කියනු ලබන කල්හි සතුටු සිත් ඇත්තේ ඔද වැඩි වූයේ පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, යමෙකුගේ තීර්ථායතනයකින් මෙහි ආයේ වේ ද, ඒ තීර්ථායතන ස්වාමී වූ ශාස්තෘහුගේ ද ඔහු අයත් ලබ්ධියෙහි ද ඔහු පිළිබඳ කැමැත්තෙහි ද ඔහුගේ රුචියෙහි ද ඔහුගේ දැඩිව ගත් දෘෂ්ටියෙහි ද ගුණ කියන කල්හි සතුටු සිත් ඇත්තේ ඔද වැඩි වූයේ පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, බුදුන්ගේ හෝ ධර්මයෙහි හෝ සඞ්ඝයාගේ හෝ ගුණ කියනු ලබන කල්හි කිපියේ නො සතුටු සිත් ඇත්තේ නො පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, මහණෙනි, මෙය පෙර අන්‍යතීර්ථකවූවහුගේ වත් නො පිරීමෙහි ප්‍රධාන ලක්‍ෂණය වේ. මහණෙනි, මෙසේ පෙර අන්‍යතීර්ථක වූයේ වත් නො පුරන්නේ වේ. මහණෙනි, මෙසේ •වත් නො පුරණ පෙර අන්‍යතීර්ථක වූයේ මෙහි ආයේ උපසපත් නො කළ යුතු ය.

12. මහණෙනි, පෙර අන්‍යතීර්ථක වූයේ කෙසේ වත් පුරන්නෙක් වේ ද? මහණෙනි, මෙහි පෙර අන්‍යතීර්ථක වූයේ ඉතා කලින් ගමට නො පිවිසේ. ඉතා දහවල් පෙරළා නො එයි. මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථක වූයේ වත් පුරන්නෙක් වේ.

13. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො න වෙසියගොචරො හොති. න විධවගොචරො හොති. න ථුල්ලකුමාරිකගොචරො හොති. න පණ්ඩකගොචරො හොති. න භික්ඛුනීගොචරො හොති. එවම්පි භික්ඛවෙ අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති.

14. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො. තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. එවම්පි භික්ඛවෙ අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති.

15. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො තිබ්බච්ඡන්දො හොති උද්දෙසෙ, පරිපුච්ඡාය, අධිසීලෙ, අධිචිත්තෙ, අධිපඤ්ඤාය, එවම්පි භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති.

16. පුන ච පරං භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො යස්ස තිත්ථායතනා සඞ්කන්තො හොති, තස්ස සත්ථුනො තස්ස දිට්ඨියා තස්ස ඛන්තියා තස්ස රුචියා තස්ස ආදායස්ස අවණ්ණෙ භඤ්ඤමානෙ අනත්තමනො හොති උදග්ගො අභිරද්ධො. බුද්ධස්ස වා ධම්මස්ස වා සඞ්ඝස්ස වා අවණ්ණෙ භඤ්ඤමානෙ කුපිතො හොති අනත්තමනො අනභිරද්ධො. යස්ස වා පන තිත්ථායතනා සඞ්කන්තො හොති, තස්ස සත්ථුනො තස්ස දිට්ඨියා තස්ස ඛන්තියා තස්ස රුචියා තස්ස ආදායස්ස වණ්ණෙ භඤ්ඤමානෙ කුපිතො හොති අනත්තමනො අනභිරද්ධො. බුද්ධස්ස වා ධම්මස්ස වා සඞ්ඝස්ස වා වණ්ණෙ භඤ්ඤමානෙ අත්තමනො හොති උදග්ගො අභිරද්ධො. ඉදං භික්ඛවෙ, සඞ්ඝාතනිකං අඤ්ඤතිත්ථියපුබ්බස්ස ආරාධනියස්මිං. එවං ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආරාධකො හොති. එවං ආරාධකො ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො ආගතො උපසම්පාදෙතබ්බො.

17. සචෙ භික්ඛවෙ, අඤ්ඤතිත්ථියපුබ්බො නග්ගො ආගච්ඡති උපජ්ඣායමූලකං චීවරං පරියෙසිතබ්බං. සචෙ අච්ඡින්නකෙසො ආගච්ඡති සඞ්ඝො අපලොකෙතබ්බො භණ්ඩුකම්මාය. යෙ තෙ භික්ඛවෙ, අග්ගිකා ජටිලකා තෙ ආගතා උපසම්පාදෙතබ්බා. න තෙසං පරිවාසො දාතබ්බො. තං කිස්ස හෙතු. කම්මවාදිනො එතෙ භික්ඛවෙ, කිරියවාදිනො. සචෙ භික්ඛවෙ ජාතියා සාකියො, අඤ්ඤතිත්ථියපුබ්බො ආගච්ඡති, සො ආගතො උපසම්පාදෙතබ්බො. න තස්ස පරිවාසො දාතබ්බො. ඉමාහං භික්ඛවෙ ඤාතීනං ආවෙණිකං පරිහාරං දම්මී 'ති.

**අඤ්ඤතිත්ථියපුබ්බකථා නිට්ඨිතා.**

**සත්තමභාණවාරං.**

---

13. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථික වූයේ වෙසඟනන් ඇසුරු නො කරන්නේ වේ ද, වැන්දඹු ගැහැණුන් ඇසුරු නො කරන්නේ වේ ද, විවාහ නොවී මහලුවූ ගැහැණුන් ඇසුරු නො කරන්නේ වේ ද, ලිඞ්ගවිකලවූවන් ඇසුරු නො කරන්නේ වේ ද, මෙහෙණන් ඇසුරු නො කරන්නේ වේ ද, මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථික වූයේ වත් පුරන්නෙක් වේ.

14. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථිකවූයේ සබ්‍රහ්මචාරීන් පිළිබඳ "කුමක් කෙරෙම් දැ" යි පිළිවිස කළ යුතු යම් ඒ කුදු මහත් කටයුතු වේ ද ඒ කටයුතුවල දක්ෂ වේ ද, උත්ථානවීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ වේ ද, ඒ ඒ කටයුතුවල "මෙය මෙසේ කටයුතු ය, මෙය මෙසේ කටයුතු ය" යි කෙණෙහි උපන් නුවණින් යුක්ත වූයේ වේ ද, සියතින් කරන්නට සමර්ථ වේ ද; ස්ථවිර – මධ්‍යම – නවකයන් තුළ උත්සාහය උපදවා සංවිධානය කරන්නට සමර්ථ වේ ද, මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථික වූයේ වත් පුරන්නෙක් වේ.

15 මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථික වූයේ පෙළ පුහුණු කිරීමෙහි, අරුත් ඇසීමෙහි, ප්‍රාතිමොක්ෂශීලයෙහි, ලෞකිකසමාධිභාවනා–වෙහි, ලොකොත්තරමාර්ගභාවනාවෙහි, බලවත් කැමැත්ත ඇත්තේ වේ ද, මහණෙනි, මෙසේ ද පෙර අන්‍යතීර්ථික වූයේ වත් පුරන්නෙක් වේ.

16. මහණෙනි, නැවත ද පෙර අන්‍යතීර්ථික වූයේ යමකුගේ තීර්ථායතනයකින් මෙහි ආයේ වේ ද, ඒ තීර්ථායතනස්වාමි වූ ශාස්තෘහුගේ ද ඔහු සතු ලබ්ධියෙහි ද ඔහුගේ කැමැත්තෙහි ද ඔහුගේ රුචියෙහි ද ඔහුගේ දෘෂ්ටියෙහි ද දොස් කියනු ලබන කල්හි සතුටු සිත් ඇත්තේ ඔද වැඩි වූයේ පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, බුදුන්ගේ හෝ ධර්මයෙහි හෝ සඞ්ඝයාගේ හෝ දොස් කියනු ලබන කල්හි කිපියේ නො සතුටුසිත් ඇත්තේ නො පිරිපුන් අදහස් ඇත්තේ වේ ද– යමෙකුගේ තීර්ථායතනයකින් මෙහි ආයේ වේ ද, ඒ තීර්ථායතනස්වාමි වූ ශාස්තෘහුගේ ද ඔහු සතු ලබ්ධියෙහි ද ඔහුගේ කැමැත්තෙහි ද ඔහුගේ රුචියෙහි ද ඔහුගේ දැඩිව ගත් දෘෂ්ටියෙහි ද ගුණ කියනු ලබන කල්හි කිපියේ නො සතුටු සිත් ඇත්තේ නො පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, බුදුන්ගේ හෝ ධර්මයෙහි හෝ සඞ්ඝයාගේ හෝ ගුණ කියනු ලබන කල්හි සතුටු සිත් ඇත්තේ ඔද වැඩි වූයේ පිරිපුන් අදහස් ඇත්තේ වේ ද, මහණෙනි, මෙය පෙර අන්‍යතීර්ථිකවූවහුගේ වත් පිරීමෙහි ප්‍රධාන ලක්ෂණය වේ. මහණෙනි, මෙසේ පෙර අන්‍යතීර්ථික වූයේ වත් පුරන්නේ වේ. මහණෙනි, මෙසේ වත් පුරණ පෙර අන්‍යතීර්ථික වූයේ ආයේ උපසපන් කළ යුතු ය.

17 මහණෙනි, පෙර අන්‍යතීර්ථික වූයේ නග්නව ආයේ නම් උපාධ්‍යායයා මුල් කොට සිවුරු සෙවිය යුතු ය. නො කැපූ හිසකේ ඇතිව පැමිණේ නම් භණ්ඩුකර්ම්ය පිණිස සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය. මහණෙනි, යම් ඒ ගිනි පුදන්නෝත් ජටාධරයෝත් වෙත් නම් ආවා වූ ඔහු උපසපන් කළ යුතු ය. ඔවුන්ට පිරිවෙස් නො දිය යුතු ය. ඊට හේතු කිම? මහණෙනි, මොහු කර්මවාදීහු ක්‍රියාවාදීහු වෙත්. මහණෙනි, ජාතියෙන් (උත්පත්තියෙන්) ශාක්‍ය වූ පෙර අන්‍යතීර්ථිකවූවෙක් පැමිණේ ද, ආවා වූ හෙතෙමේ උපසපන් කළ යුතු ය. ඔහුට පිරිවෙස් නො දිය යුතු ය. මහණෙනි, මම නෑයන්ට (ඔවුනට පමණක්) උරුම වූ මේ පරිහාරය (අනුග්‍රහයක් වශයෙන්) දෙමි.

**අන්‍යතීර්ථිකකථාව නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන **මගධෙසු** පඤ්ච ආබාධා උස්සන්නා හොන්ති: කුට්ඨං, ගණ්ඩො, කිලාසො, සොසො, අපමාරො. මනුස්සා පඤ්චහි ආබාධෙහි ඵුට්ඨා **ජීවකං කොමාරභච්චං** උපසඞ්කමිත්වා එවං වදන්ති: "සාධු නො ආචරිය තිකිච්ඡාහී"ති. "අහමය්‍යා[2] බහුකිච්චො බහුකරණීයො. රාජා ච මෙ මාගධො සෙනියො **බිම්බිසාරො** උපට්ඨාතබ්බො, ඉත්ථාගාරං ච, බුද්ධපමුඛො ච සඞ්ඝො.[3] නාහං සක්කොමි තිකිච්ඡිතු"න්ති. "සබ්බං සාපතෙය්‍යං ච තෙ ආචරිය හොතු. මයං ච තෙ දාසා. සාධු නො ආචරිය තිකිච්ඡාහී" ති "අහමය්‍යා බහුකිච්චො බහුකරණීයො. රාජා ච. මෙ මාගධො සෙනියො බිම්බිසාරො උපට්ඨාතබ්බො, ඉත්ථාගාරඤ්ච, බුද්ධපමුඛො ච සඞ්ඝො. නාහං සක්කොමි තිකිච්ඡිතු"න්ති.

2. අථ ඛො තෙසං මනුස්සානං එතදහොසි: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සුඛසීලා සුඛසමාචාරා, සුභොජනානි භුඤ්ජිත්වා නිවාතෙසු සයනෙසු සයන්ති. යන්නූන මයං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍යාම. තත්ථ භික්ඛූ චෙව උපට්ඨහිස්සන්ති. ජීවකො ච කොමාරභච්චො තිකිච්ඡිස්සතී" ති.

3. අථ ඛො තෙ මනුස්සා භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචිංසු. තෙ භික්ඛූ පබ්බාජෙසුං. උපසම්පාදෙසුං. තෙ භික්ඛූ චෙව උපට්ඨහිංසු. ජීවකො ච කොමාරභච්චො තිකිච්ඡි.

4. තෙන ඛො පන සමයෙන භික්ඛූ බහූ ගිලානෙ භික්ඛූ උපට්ඨහන්තා යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්ති. "ගිලානභත්තං දෙථ. ගිලානුපට්ඨාකභත්තං දෙථ. ගිලානභෙසජ්ජං දෙථා" ති. ජීවකොපි කොමාරභච්චො බහූ ගිලානෙ භික්ඛූ තිකිච්ඡන්තො අඤ්ඤතරං රාජකිච්චං පරිහාපෙසි.

5. අඤ්ඤතරොපි පුරිසො පඤ්චහි ආබාධෙහි ඵුට්ඨො ජීවකං කොමාරභච්චං උපසඞ්කමිත්වා එතදවොච: "සාධු මං ආචරිය තිකිච්ඡාහී" ති. "අහඤ්හාවුසො බහුකිච්චො බහුකරණීයො. රාජා ච මෙ මාගධො සෙනියො බිම්බිසාරො උපට්ඨාතබ්බො, ඉත්ථාගාරං ච, බුද්ධපමුඛො ච සඞ්ඝො. නාහං සක්කොමි තිකිච්ඡිතු"න්ති. "සබ්බං සාපතෙය්‍යං ච තෙ ආචරිය හොතු. අහං ච තෙ දාසො. සාධු මං ආචරිය තිකිච්ඡාහී" ති. "අහඤ්හාවුසො බහුකිච්චො බහුකරණීයො. රාජා ච මෙ මාගධො සෙනියො බිම්බිසාරො උපට්ඨාතබ්බො. ඉත්ථාගාරං ච, බුද්ධපමුඛො ච සඞ්ඝො. නාහං සක්කොමි තිකිච්ඡිතු"න්ති.

1. "වදන්ති" අ වි. නො වි.
2. "අහංහය්‍යා" අ වි. නො වි. ජ පු. "අහම්හය්‍යා" ම ඡ සං.
3. "භික්ඛුසඞ්ඝො" අ වි. නො වි. ම ඡ සං. P T S.

1. එකල්හි **මගදදනවුවෙහි** කුෂ්ඨ - ගණ්ඩ - කිලාස - ක්ෂය අපස්මාර යන පඤ්චාබාධයෝ උත්සන්න වූවාහු වෙත්. මේ ආබාධ පසින් මඩනා ලද මිනිස්සු **කොමාරභච්ච** නම් **ජීවක** වෙදුන් වෙත ගොස් "ආචාර්යය, අපට පිළියම් කළ මැනවැ" යි මෙසේ කියති. එකල්හි "ආර්යයෙනි, මම බොහෝ කටයුතු ඇත්තෙක් වෙමි. බොහෝ කළ යුතු දෑ ඇත්තෙක් වෙමි. මා විසින් මගධේශ්වර වූ සේනා ඇති බිම්බිසාර රජතෙමේ ද ඒ රජහුගේ අන්තඃපුරය ද බුද්ධප්‍රමුඛසඞ්ඝ තෙමේ ද උපස්ථාන කළ යුතු ය. එහෙයින් මම පිළියම් කිරීමට නො හැක්කේ වෙමි" යි හේ කීයේ ය: "ආචාර්යය, අපසතු සියලු ධනය ද ඔබට වේවා. අපි ද ඔබට දාසයෝ වෙමු. ඇදුර, අපට පිළියම් කරණු මැනවැ" යි නැවත ද කීහ. "ආර්යයෙනි, මම බොහෝ කටයුතු ඇත්තෙක් වෙමි. බොහෝ කළ යුතු දෑ ඇත්තෙක් වෙමි. මා විසින් මගධේශ්වරවූ සේනා ඇති බිම්බිසාර රජතෙමේ ද ඒ රජුගේ අන්තඃපුරය ද බුද්ධප්‍රමුඛසඞ්ඝ තෙමේ ද උපස්ථාන කළ යුතු ය. එහෙයින් මම පිළියම් කරන්නට නො හැක්කේ වෙමි" යි ජීවක තෙමේ කීයේ ය.

2. එකල්හි ඒ මිනිසුන්ට "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ සැපවූ පැවැතුම් ඇත්තෝ ය. පහසු හැසිරීම් ඇත්තෝ ය. මනා බොජුන් වළඳා හුළං නො හමන යහන්හි සයනය කරති. අපි ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණයන් කෙරෙහි පැවිදි වන්නෙමු නම් යෙහෙක. එකල්හි භික්ෂූහු ද උපස්ථාන කරන්නෝ ය. කොමාරභච්ච ජීවක තෙමේ ද පිළියම් කරන්නේ ය" යි සිතෙක් උපන.

3. ඉක්බිති ඒ මිනිස්සු භික්ෂූන් කරා ගොස් පැවිද්ද ඉල්ලූහ. භික්ෂූහු ඔවුන් පැවිදි කළහ. උපසපන් ද කළහ. භික්ෂූහු ද ඔවුන්ට උපස්ථාන කළහ. කොමාරභච්ච ජීවක තෙමේ ද පිළියම් කෙළේ ය.

4. එකල්හි භික්ෂූහු බොහෝ ගිලන් මහණුන්ට උපස්ථාන කරන්නෝ "ගිලනුන්ට හිත බත් දෙවු. ගිලානොපස්ථායකයන්ට බත් දෙවු. ගිලනුන්ට හිත බෙහෙත් දෙවු" යි බොහෝ සේ ඉල්ලමින් බොහෝ සේ විණවමින් වෙසෙති. කොමාරභච්චජීවක තෙමේ ද බොහෝ ගිලන් මහණුන්ට පිළියම් කරන්නේ එක්තරා රාජකාර්යයක් පිරිහෙළූයේ ය.

5. එකල්හි පඤ්චාබාධයෙන් පෙළුනු එක්තරා පුරුෂයෙක් කොමාරභච්චජීවකයා වෙතට ගොස් "ඇදුර, මට පිළියම් කරනු මැනවැ" යි කීයේ ය. "ආර්යය මම බොහෝ කටයුතු ඇත්තෙක් වෙමි. බොහෝ කළයුතු දෑ ඇත්තෙක් වෙමි. මගධේශ්වර වූ සෙනාඇති බිම්බිසාර රජ තෙමේ ද ඔහුගේ අන්තඃපුරය ද බුද්ධප්‍රමුඛසඞ්ඝ තෙමේ ද මා විසින් උපස්ථාන කළ යුතු ය. එහෙයින් මම පිළියම් කරන්නට නො හැක්කේ වෙමි" යි කී ය. "ඇදුර, මා සතු සියලු ධනය ද ඔබට වේවා. මම ඔබගේ දාසයෙක් ද වෙමි. ඇදුර, මට පිළියම් කරණු මැනවැ" යි (හෙතෙමේ නැවතත් කී ය.) එවිට ද ජීවක තෙමේ "සගය, මම බොහෝ කටයුතු ඇත්තෙක් වෙමි. බොහෝ කළ යුතු දෑ ඇත්තෙක් වෙමි. මා විසින් මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ ද ඔහුගේ අන්තඃපුරය ද බුධප්‍රමුඛ සඞ්ඝතෙමේ ද උපස්ථාන කළ යුතු ය. මම පිළියම් කිරීමට නො හැක්කේ වෙමි" යි කී ය.

6. අථ ඛො තස්ස පුරිසස්ස එතදහොසි: “ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සුඛසීලා සුඛසමාචාරා, සුභොජනානි භුඤ්ජිත්වා නිවාතෙසු සයනෙසු සයන්ති. යන්නූනාහං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍යං, තත්‍ථ භික්ඛූචෙව උපට්ඨහිස්සන්ති. ජීවකො ච කොමාරභච්චො තිකිච්ඡිස්සති· සොහං[1] අරොගො විබ්භමිස්සාමී” ති.

7. අථ ඛො සො පුරිසො භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. තං භික්ඛූ පබ්බාජෙසුං. උපසම්පාදෙසුං. තං භික්ඛූචෙව උපට්ඨහිංසු. ජීවකො ච කොමාරභච්චො තිකිච්ඡි. සො අරොගො විබ්භමි.

8. අද්දසා ඛො ජීවකො කොමාරභච්චො තං පුරිසං විබ්භන්තං. දිස්වාන තං පුරිසං එතදවොච: “නනු ත්වං අය්‍ය භික්ඛූසු පබ්බජිතො අහොසී ?” ති. “එවං ආචරියා” ති. “කිස්ස පන ත්වං අය්‍යො එවරූපං අකාසී ?” ති.

9. අථ ඛො සො පුරිසො ජීවකස්ස කොමාරභච්චස්ස එතමත්ථං ආරොචෙසි. ජීවකො කොමාරභච්චො උජ්ඣායති ඛීයති විපාචෙති: “කථං හි නාම භදන්තා පඤ්චහි ආබාධෙහි ඵුට්ඨං පබ්බාජෙස්සන්තී” ති.

10. අථ ඛො ජීවකො කොමාරභච්චො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: “සාධු භන්තෙ, අය්‍යා පඤ්චහි ආබාධෙහි ඵුට්ඨං න පබ්බාජෙය්‍යු” න්ති.

11. අථ ඛො භගවා ජීවකං කොමාරභච්චං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

12. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “න භික්ඛවෙ පඤ්චහි ආබාධෙහි ඵුට්ඨො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා” ති.

1. “සොමහී” ම ජ සං.

Free Distribution www.aathaapi.org

6. එකල්හි ඒ පුරුෂයාහට "මේ ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයෝ සැප වූ පැවැතුම් ඇත්තෝ ය. පහසු හැසිරීම් ඇත්තෝ ය. මනා බොජුන් වළඳා හුලං නොවදින යහන්හි සයනය කෙරෙති. මම ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වන්නෙම් නම් යහපති. එකල්හි භික්ෂූහු ද මට උපස්ථාන කරන්නාහ. කොමාරභච්චජීවක තෙමේ ත් මට පිළියම් කරන්නේ ය. ඒ මම ලෙඩ නැත්තෙක් ව සිවුරු හරින්නෙමි' යි සිතෙක් උපන.

7. ඉක්බිති ඒ පුරුෂ තෙමේ භික්ෂූන් කරා ගොස් පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ඔහු පැවිදි කළහ. උපසපන් ද කළහ. භික්ෂූහු ඔහුට උපස්ථාන ද කළහ. කොමාරභච්චජීවක තෙමේ ත් ඔහුට පිළියම් කෙළේ ය. හෙතෙමේ නීරොගවූයේ සිවුරු හැර ගියේ ය.

8. එකල්හි ජීවකතෙමේ සිවුරු හැර ගියාවූ ඒ පුරුෂයා දුටුයේ ය. දැක "සගය, ඔබ භික්ෂූන් වෙත පැවිදිව සිටියෝ නොවහු ද?" යි ඔහු ගෙන් ඇසී ය. "ඇදුර, එසේ ය" යි හෙතෙමේ පිළිතුරු දුන්නේ ය. "සගය, මෙබන්දක් කෙළේ කුමක් නිසාද?" යි ඇසී ය.

9. එකල්හි ඒ පුරුෂ තෙමේ කොමාරභච්චජීවකයාහට මේ කරුණ දැන්වී ය. කොමාරභච්චජීවක තෙමේ "කෙසේ නම් ස්වාමීන් වහන්සේලා පඤ්චාබාධයන්ගෙන් පෙළෙන්නකු පැවිදි **කරත් දැයි** යි අවමන් කරයි. නින්දා කරයි. දොස් කියයි.

10. ඉක්බිති කොමාරභච්චජීවක තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, ස්වාමීන් වහන්සේලා පඤ්චාබාධයන්ගෙන් පෙළෙනකු පැවිදි නො කරන්නෝ නම් යහපතැ" යි සැළකළේ ය.

11. එවිට භාග්‍යවතුන් වහන්සේ කොමාරභච්චජීවකයාහට දැහැමි කතාවෙන් කරුණු දැක්වූ සේක. කුසල් දහම්හි සමාදන් කරවූ සේක. කුසල් දහම්හි තියුණු කරවූ සේක. ඇති ගුණයන්ගෙන් සතුටු කරවූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දැක්වූ කුසල් දහම්හි සමාදන් කරවූ කුසල් දහම්හි තියුණු කරවූ පැහැදවූ කොමාරභච්චජීවක තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, පඤ්චාබාධයන්ගෙන් පෙළෙනෙක් පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුලාඇවැත් වේ" යි භික්ෂූන් ඇමතූ සේක.

13. තෙන ඛො පන සමයෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පච්චන්තො කුපිතො හොති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො සෙනානායකෙ මහාමත්තෙ ආණාපෙසි: "ගච්ඡථ භණෙ,[1] පච්චන්තං උච්චිනථා" ති. "එවං දෙවා" ති ඛො සෙනානායකා මහාමත්තා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පච්චස්සොසුං.

14. අථ ඛො අභිඤ්ඤාතානං අභිඤ්ඤාතානං යොධානං එතදහොසි: "මයං ඛො යුද්ධාභිනන්දිනො ගච්ඡන්තා පාපඤ්ච කරොම.[2] බහුඤ්ච අපුඤ්ඤං පසවාම. කෙන නු ඛො මයං උපායෙන පාපා ච විරමෙය්‍යාම කල්‍යාණඤ්ච කරෙය්‍යාමා" ති.

15. අථ ඛො තෙසං යොධානං එතදහොසි: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා. සචෙ ඛො මයං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍යාම එවං මයං පාපා ච විරමෙය්‍යාම කල්‍යාණඤ්ච කරෙය්‍යාමා"ති.

16. අථ ඛො තෙ යොධා භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචිංසු. තෙ භික්ඛූ පබ්බාජෙසුං, උපසම්පාදෙසුං. සෙනානායකා මහාමත්තා රාජභටෙ පුච්ඡිංසු. "කින්නු ඛො භණෙ ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච යොධා න දිස්සන්තී" ති. "ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමොච සාමි, යොධා භික්ඛූසු පබ්බජිතා"ති. සෙනානායකා මහාමත්තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා රාජභටං පබ්බාජෙස්සන්තී" ති. සෙනානායකා මහාමත්තා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතමත්ථං ආරොචෙසුං.

17. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො වොහාරිකෙ[3] මහාමත්තෙ පුච්ඡි. "යො භණෙ, රාජභටං පබ්බාජෙති, කිං සො පසවතී?"ති. උපජ්ඣායස්ස දෙව, සීසං ඡෙත්තබ්බං.[4] අනුසාසකස්ස[5] ජිව්හා උද්ධරිතබ්බා. ගණස්ස උපඩ්ඪඵාසුකා භඤ්ජිතබ්බා" ති.

18. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවන්තං එතදවොච: "සන්ති භන්තෙ, රාජානො අස්සද්ධා අප්පසන්නා, තෙ අප්පමත්තකෙනපි[6] භික්ඛූ විහෙඨෙය්‍යුං. සාධු භන්තෙ අය්‍යා රාජභටං න පබ්බාජෙය්‍යු"න්ති.

---

1. "භද්දන්තා" P T S. 2. "පාපකං කම්මං" අ වි. තො වි. ම නු ප. ජ පු.
3. "වොහාරකෙ" අ වි. තො වි. ජ පු. ම නු ප.
4. "ඡෙදෙතබ්බං" ජ පු. P T S. තො වි. ම නු ප. "ඡෙතබ්බං" ම ජ සං.
5. "අනුස්සාවකස්ස" ම ජ සං P T S. 6. "අප්පමත්තකොපි" තො වි. ම නු ප.

Free Distribution www.aathaapi.org

13. එකල්හි මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුට පසල් දනව්ව කිපියේ වේ. ඉක්බිති මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ සේනාවන්ට නායක වූ මහඇමතියන්ට "සගයෙනි, යවු, පසල් දනව්ව දියුණු කරවු" (සොරුන් පලවා හැර සොර බියෙන් නැගී බැහැර ගිය ගම්වැස්සන් ගෙන්වා ඔවුන්ට වාසස්ථාන සපයා දී ගොවිකම් ආදිය දියුණු කරවු) යි අණ කෙළේ ය. "දෙවයන් වහන්ස, යහපතැ" යි සෙනාධිපති මහාමාත්‍යයෝ මගධෙශ්වරවූ සෙනා ඇති බිම්බිසාර රජුහට පිළිවදන් දුන්හ.

14. එකල්හි ප්‍රසිද්ධ යොධයන්ට "අපි යුද්ධ කිරීමෙහි සතුටු වන්නමෝ පව් ද කරන්නෙමු. බොහෝ අකුසල් ද රැස් කරන්නෙමු. අපි කිනම් උපායකින් පවින් වළකින්නෙමු ද ? කුසල් කරන්නෙමු දැ ?" යි සිතෙක් උපන්නේ ය.

15. නැවත ද ඒ යෝධයන්ට "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ දහම්හි හැසිරෙන්නෝ ය. සමව හැසිරෙන්නෝ ය. බ්‍රහ්මචාරී ය. සත්‍යවාදී ය. සිල්වත් ය. යහපත් පැවැතුම් ඇත්තාහ. අපි ත් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් කෙරෙහි පැවිදි වන්නෙමු නම්, පවිනු ත් වළකින්නෙමු. කුසලු ත් කරන්නෙමු" යි සිත් විය.

16. ඉක්බිති ඒ යොධයෝ භික්ෂූන් කරා ගොස් පැවිද්ද ඉල්ලූහ. භික්ෂූහු ඔවුන් පැවිදි කළහ. උපසපන් කළහ. එකල්හි සෙනාධිපති මහාමාත්‍යයෝ "සගයෙනි, මෙ නම් වූ ත් මෙ නම් වූත් යොධයෝ නො දක්නා ලැබෙත්. එහි හේතු කිමැ ?" යි රාජභටයන්ගෙන් විචාළෝ ය. "ස්වාමීනි, මෙ නම් වූ ත් මෙ නම් වූ ත් යොධයෝ භික්ෂූන් වෙත පැවිදි වූහ" යි ඔහු කීහ. කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයෝ රාජභටයන් පැවිදි කරන්නාහු දැ ?" යි සෙනාධිපති මහාමාත්‍යයෝ අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. ඔහු ඒ බව මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුට දැන්වූහ.

17. ඉක්බිති මගධෙශ්වරවූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ "සගයෙනි, යමෙක් රාජ භටයෙකු පැවිදි කෙරේ නම් හෙ තෙමේ කිනම් දඬුවමක් අත්පත් කරගණී දැ?" යි විනිශ්චයකාරක මහාමාත්‍යයන්ගෙන් විචාළේ ය. "දේවයන් වහන්ස, උපාධ්‍යායයාගේ හිස සිඳිය යුතු ය. අනුශාසකයාගේ දිව උදුරා දැමිය යුතු ය. ගණයාගේ අඩක් ඉළ ඇට බිඳිය යුතු ය" යි ඔහු කීහ.

18. එකල්හි මගධෙශ්වරවූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හිඳ ස්වාමීනි, ශ්‍රද්ධා නැත්තා වූ සසුන්හි නො පහන් රජහු වෙති. ඒ රජහු ඉතා ටිකකිනිදු භික්ෂූන් පෙළන්නාහු ය. ස්වාමීනි, ආර්‍ය්‍යයන් වහන්සේලා රාජ භටයෙකු පැවිදි නො කරන්නෝ නම් යහපතැ යි" සැළකෙළේ ය.

Free Distribution www.aathaapi.org

19. අථ ඛො භගවා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

20. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ රාජභටො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති

21. තෙන ඛො පන සමයෙන චොරො අඞ්ගුලිමාලො භික්ඛූසු පබ්බජිතො හොති. මනුස්සා පස්සිත්වා උබ්බිජ්ජන්තිපි. උත්තසන්තිපි. පලායන්තිපි. අඤ්ඤෙනපි ගච්ඡන්ති. අඤ්ඤෙනපි මුඛං කරොන්ති. ද්වාරම්පි ථකෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා ධජබද්ධං චොරං පබ්බාජෙස්සන්තී" ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ධජබද්ධො චොරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

22. තෙන ඛො පන සමයෙන රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන අනුඤ්ඤාතං හොති: "යෙ සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජන්ති. න තෙ ලබ්භා කිඤ්චි කාතුං. ස්වාක්ඛාතො ධම්මො චරන්තු බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති.

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො චොරිකං කත්වා කාරාය බද්ධො හොති. සො කාරං භින්දිත්වා පලායිත්වා භික්ඛූසු පබ්බජිතො හොති. මනුස්සා පස්සිත්වා එවමාහංසු. "අයං සො කාරභෙදකො චොරො. හන්ද නං නෙමා" ති. එකච්චෙ එවමාහංසු. "මායේ‍යා එවං අවචුත්ථ. අනුඤ්ඤාතං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන යෙ සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජන්ති න තෙ ලබ්භා කිඤ්චි කාතුං. ස්වාක්ඛාතො ධම්මො. චරන්තු බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති.

24. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අභයූවරා ඉමෙ සමණා සක්‍යපුත්තියා. නයිමෙ ලබ්භා කිඤ්චි කාතුං. කථං හි නාම [1] කාරභෙදකං චොරං පබ්බාජෙස්සන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. න භික්ඛවෙ, කාරභෙදකො චොරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

1. "කථංහි නාම සමණා සක්‍යපුත්තියා" ම ජ සං.

19. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු දහැමි කතාවෙන් කරුණු දක්වූහ. කුසල් දහම්හි සමාදන් කරවූහ. කුසල් දහම්හි තියුණු කරවූහ. ඇති ගුණයෙන් සතුටු කරවූහ. ඉක්බිති මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කතාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තියුණු කරවන ලද්දේ සතුටු කරවන ලද්දේ හුනස්නෙන් නැගිට වැඳ පැදකුණු කොට ගියේ ය.

20. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දහැමි කතා කොට "මහණෙනි, රාජභටයෙක් පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුළාඇවැත් වේ" යි භික්ෂූන් ඇමතූ සේක.

21. එකල්හි **අඞ්ගුලිමාල** සොර තෙමේ භික්ෂූන් වෙත පැවිදි වූයේ වේ. මිනිස්සු දැක බියපත් වෙති. තැති ගණිති. පලා යෙති. අන් මගිනුදු යෙත්. අන් දෙසකට මුහුණ ද හරවත්. දොර වසා ගණිත්. මිනිස්සු "කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයෝ කොඩි බැඳි (ප්‍රකටවූ) සොරහු පැවිදි කරන්නාහු ද" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. භික්ෂූහු ඒ ණිත දෙඩන දොස් කියන ඒ මිනිසුන්ගේ බස් අසා භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. උන්වහන්සේ "මහණෙනි, කොඩි බැඳි සොර තෙමේ පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුළාඇවැත් වේ" යි වදාළ සේක.

22. එකල්හි මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු විසින් "යම් කෙනෙක් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වෙත් ද ඔහු කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. ධර්මය මනාකොට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරන්නට බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙත්වා" යි අනුදන්නා ලද්දේ ය.

23. එකල්හි එක්තරා පුරුෂයෙක් සොරකම් කොට සිරගෙයි ලා බඳින ලද්දේ වේ. හෙතෙමේ සිරගෙය බිඳ ගෙණ පලා ගොස් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. මිනිස්සු දැක "මේ තෙමේ ඒ සිර ගෙය බිඳ ගියා වූ සොරා ය. එහෙයින් මුහු අල්ලා ගෙණ යමු" යි කීහ. ඇතැම් කෙනෙක් "මිත්‍රයෙනි, මෙසේ නො කියවූ, මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු විසින් 'යම් කෙනෙක් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වෙත් ද, ඔහු කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. ධර්මය තෙමේ මනා කොට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරන්නට බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙත්වා' යි අනුදන්නා ලද්දේ ය" යි මෙසේ කීහ.

24. මිනිස්සු "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ (රජුගෙන්) ලත් අභය ඇත්තෝ ය. මුන් වහන්සේලා කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. කෙසේ නම් සිරගේ බිඳ ගිය සොරු පැවිදි කරන්නාහු ද ?" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සිරගෙය බිඳ ගිය සොර තෙමේ පැවිදි නො කළයුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුළා ඇවැත් වේ" යි උන්වහන්සේ වදාළ සේක.

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො[1] පුරිසො චොරිකං කත්වා පලායිත්වා භික්ඛූසු පබ්බජිතො හොති. සො ච රඤ්ඤො අන්තෙපුරෙ[2] ලිඛිතො හොති. "යත්ථ පස්සිතබ්බො[3] තත්ථ හන්තබ්බො" ති. මනුස්සා එවමාහංසු: "අයං සො ලිඛිතකො චොරො. හන්ද නං හනාමා"ති. එකච්චෙ එවමාහංසු: "මායස්මා එවං අවචුත්ථ. අනුඤ්ඤාතං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන යෙ සමණෙසු සක්‍යපුත්තෙසු පබ්බජන්ති න තෙ ලබ්භා කිඤ්චි කාතුං. ස්වාක්ඛාතො ධම්මො. චරන්තු බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති.

26 මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අභයූවරා ඉමෙ සමණා සක්‍යපුත්තියා. නයිමෙ ලබ්භා කිඤ්චි කාතුං. කථං හි නාම ලිඛිතකං චොරං පබ්බාජෙස්සන්ති" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ලිඛිතකො චොරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො කසාහතො කතදණ්ඩකම්මො භික්ඛූසු පබ්බජිතො හොති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම සමණා සක්‍යපුත්තියා කසාහතං කතදණ්ඩකම්මං පබ්බාජෙස්සන්ති" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, කසාහතො කතදණ්ඩකම්මො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො ලක්ඛණාහතො කතදණ්ඩකම්මො භික්ඛූසු පබ්බජිතො හොති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා ලක්ඛණාහතං කතදණ්ඩකම්මං පබ්බාජෙස්සන්ති" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ලක්ඛණාහතො කතදණ්ඩකම්මො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො ඉණායිකො[4] පලායිත්වා භික්ඛූසු පබ්බජිතො හොති. ධනියා පස්සිත්වා එවමාහංසු: "අයං සො අම්හාකං ඉණායිකො. හන්ද නං නෙමා ති. එකච්චෙ එවමාහංසු "මායස්මා එවං අවචුත්ථ. අනුඤ්ඤාතං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන යෙ සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජන්ති න තෙ ලබ්භා කිඤ්චි කාතුං. ස්වක්ඛාතො ධම්මො. චරන්තු බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති.

---

1. "අඤ්ඤතරොපි" අ වි. ජ. පු
2. "සො ච. අන්තෙපුරෙ" සී මු. 3. "යත්ථ පස්සති" ම ඡ සං.
4 "අඤ්ඤතරො ඉණායිකො" අ වි. තො වි. ජ පු. ම නු ප. P T S.

25. එකල්හි එක්තරා පුරුෂයෙක් සොරකම් කොට පලා ගොස් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. හෙතෙමේ ද රජුගේ අන්තඃපුරයෙහි ලියා තබන ලද්දේ වේ: "යම් තැනකදී දක්ක හැක්කේ ද එතැන්හිදී නැසිය යුත්තේ ය" කියා යි. මිනිස්සු දැක "මේ ඒ ලියා තුබූ සොරා ය. එබැවින් මූ නසමු" යි කීහ. "සගයෙනි, එසේ නො කියවූ. මගධේශ්වර වූ සේනා ඇති බිම්බිසාර රජු විසින් 'යම් කෙනෙක් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වෙත් ද ඔහු කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. ධර්මය තෙමේ මනා කොට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරන්නට බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙත්වා' යි අනුදන්නා ලද්දේය" යි කීහ.

26. මිනිස්සු ශාක්‍යපුත්‍ර වූ "මේ ශ්‍රමණයෝ (රජුගෙන්) ලත් අභය ඇත්තෝ ය. මුන්වහන්සේලා කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. කෙසේ නම් ලියා තැබූ සොරු පැවිදි කරන්නාහු දැ?" යි අවමන් කෙරෙත්. නිඤ කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ලියැවුනු සොර තෙමේ පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුළාඇවැත් වේ" යි උන්වහන්සේ වදාළ සේක.

27. එකල්හි එක්තරා පුරුෂයෙක් කසයෙන් තළන ලද්දේ (එයින්ම) කරණු ලැබූ දඬුවම් ඇත්තේ භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. මිනිස්සු කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයෝ කසයෙන් තළනු ලැබූ කරණලද දඬුවම් ඇත්තහු පැවිදි කරන්නාහු දැ?" යි අවමන් කෙරෙත්. නිඤ කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, කසයෙන් තළනු ලැබූ කරණලද දඬුවම් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුළාඇවැත් වේ" යි උන්වහන්සේ වදාළ සේක.

28. එකල්හි සලකුණු තබනු ලැබූ (හංවඩු ගැසීමෙන්) කරණ ලද දඬුවම් ඇති එක්තරා පුරුෂයෙක් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. එකල්හි මිනිස්සු "කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයෝ සලකුණු තබනු ලැබූ කරණ ලද දඬුවම් ඇත්තවුන් පැවිදි කරන්නාහු දැ" යි අවමන් කෙරෙත්. නිඤ කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සලකුණු තැබූ කරණ ලද දඬුවම් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුළාඇවැත් වේ" යි උන්වහන්සේ වදාළ සේක.

29. එකල්හි එක්තරා පුරුෂයෙක් ණය ගැති වූයේ පලා ගොස් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. ධන හිමියෝ ඔහු දැක "මේ ඒ අපගේ ණය ගැතියා ය. එබැවින් මූ ගෙණ යමු" යි කීහ. ඇතැම් කෙනෙක් මිත්‍රයිනි, මෙසේ නො කියවූ. මගධේශ්වර වූ සේනා ඇති බිම්බිසාර රජු විසින් 'යම් කෙනෙක් ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණයන් වෙත පැවිදි වෙත් ද ඔහු කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. ධර්මය තෙමේ මනා කොට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරන්නට බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙත්වා' යි අනුදන්නා ලද්දේ ය" යි මෙසේ කීහ.

30. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අභයූවරා ඉමෙ සමණා සක්‍යපුත්තියා. නයිමෙ ලබ්භා කිඤ්චි කාතුං. කථං හි නාම ඉණායිකං පබ්බාජෙස්සන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ ඉණායිකො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

31. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො දාසො පලායිත්වා භික්ඛූසු පබ්බජිතො හොති. අයිරකා[1] පස්සිත්වා එවමාහංසු "අයං සො අම්හාකං දාසො. හන්ද නං නෙමා" ති. එකච්චෙ එවමාහංසු: මාය්‍යා එවං අවචුත්ථ. අනුඤ්ඤාතං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන යෙ සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජන්ති න තෙ ලබ්භා කිඤ්චි කාතුං. ස්වාක්ඛාතො ධම්මො. චරන්තු බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා" ති.

32. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අභයූවරා ඉමෙ සමණා සක්‍යපුත්තියා. නයිමෙ ලබ්භා කිඤ්චිකාතුං. "කථං හි නාම දාසං පබ්බාජෙස්සන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ දාසො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

33. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො කම්මාරභණ්ඩු මාතා-පිතූහි සද්ධිං භණ්ඩිත්වා ආරාමං ගන්ත්වා භික්ඛූසු පබ්බජිතො හොති. අථ ඛො තස්ස කම්මාරභණ්ඩුස්ස මාතාපිතරො තං කම්මාරභණ්ඩුං විචිනන්තා ආරාමං ගන්ත්වා භික්ඛූ පුච්ඡිංසු: "අපි භන්තෙ, එවරූපං දාරකං පස්සෙය්‍යාථා" ති. භික්ඛූ අජානංයෙව ආහංසු: "න ජානාමා" ති අපස්සංයෙව ආහංසු "න පස්සාමා" ති.

34. අථ ඛො තස්ස කම්මාරභණ්ඩුස්ස මාතාපිතරො තං කම්මාර-භණ්ඩුං විචිනන්තා භික්ඛූසු පබ්බජිතං දිස්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා මුසාවාදිනො. ජානංයෙව ආහංසු න ජානාමාති. පස්සංයෙව ආහංසු න පස්සාමාති. අයං දාරකො භික්ඛූසු පබ්බජිතො" ති.

35. අස්සොසුං ඛො භික්ඛූ තස්ස කම්මාරභණ්ඩුස්ස මාතාපිතූනං[2] උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ සඞ්ඝං අපලොකෙතුං භණ්ඩුකම්මායා" ති.

1. "අය්‍යකා" ම ඡ සං. "අය්‍යිකා" P T S. "අයිරා" තො වි. ම නු ප.
2. "මාතාපිතූනං" ම ඡ සං.

30. මිනිස්සු "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ (රජුගෙන්) ලත් අභය ඇත්තෝ ය. මුන්වහන්සේලා කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. කෙසේ නම් නයගැතියකු පැවිදි කරන්නහු ද" යි අවමන් කෙරෙත්. නිඳු කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි නයගැත්තේ පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුලාඇවැත් වේ" යි උන්වහන්සේ වදාළ සේක.

31. එකල්හි එක්තරා දාසයෙක් පලා ගොස් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. ස්වාමීහු දැක මේ ඒ අපගේ දාසයා ය, මූ ගෙණ යමු" යි කීහ. ඇතැම් කෙනෙක් "මිත්‍රයෙනි, මෙසේ නො කියවූ. මගධෙශ්වර වූ සේනා ඇති බිම්බිසාර රජු විසින් යම් කෙනෙක් ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වෙත් ද ඔහු කිසි දඬුවමක් කරන්නට නො ලැබිය යුත්තෝ ය. ධර්මය නමේ මනා කොට දෙසන ලද්දේ ය. මනා කොට දුක් කෙළවර කරන්නට බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරෙත්වා යි අනුදන්නා ලද්දේ ය" යි මෙසේ කීහ.

32. මිනිස්සු "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ රජුගෙන් ලත් අභය ඇත්තෝ ය. මුන්වහන්සේලා කිසිදඬුවමක් කරන්ට නො ලැබිය යුත්තෝ ය. කෙසේ නම් දාසයා පැවිදි කරන්නාහු ද" යි අවමන් කෙරෙත්. නිඳු කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "මහණෙනි, දාස තෙමේ පැවිදි නොකළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුලාඇවැත් වේ' යි උන්වහන්සේ වදාළ සේක.

33. එකල්හි එක්තරා මුඩු කළ හිස ඇති (කෙස් සිළුපසක් ඇති) තරුණ රන්කරුපුතෙක් මවු පියන් සමග ඩබර කොට ආරාමයට ගොස් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. ඉක්බිති ඒ හිසමුඩු රන්කරු පුතුගේ මවුපියෝ ඒ හිසමුඩු රන්කරු පුතු සොයමින් ආරාමයට ගොස් "ස්වාමීනි, මෙබඳු දරුවකු දුටුවහු ද ?" යි භික්ෂූන්ගෙන් විචාළහ. භික්ෂූහු නො දන්නෝ ම "නො දනිමු" යි කීහ. නො දක්නෝ ම "නො දකිමු" යි කීහ.

34. ඉක්බිති ඒ කම්මාරභණ්ඩුගේ මවුපියෝ ඒ කම්මාරභණ්ඩු සොයන්නෝ භික්ෂූන් වෙත පැවිදිවූවහු දැක "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ ලජ්ජා නැත්තෝ ය. දුශ්ශීලයෝ ය. බොරු කියන්නෝ ය. දන්නක් නො දනිමු යි කීහ. දක්නක් නො දකිමු යි කීහ. මේ දරුතෙමේ භික්ෂූන් වෙත පැවිදි වූයේ ය" යි අවමන් කෙරෙත්. නිඳු කෙරෙත්. දෙස් කියත්.

35. එකල්හි භික්ෂූහු එසේ බණින දොඩන දෙස් පවරණ ඒ කම්මාර-භණ්ඩුගේ මවුපියන්ගේ ඇණුම් බැණුම් ඇසූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, භණ්ඩුකර්මය (හිස කෙස් බෑම) පිණිස සඞ්ඝයා විචාරන්නට අනුදනිමි" යි වදාළ සේක.

36. තෙන ඛො පන සමයෙන රාජගහෙ සත්තරසවග්ගියා දාරකා සහායකා හොන්ති. **උපාලි** දාරකො තෙසං පාමොක්ඛො හොති. අථ ඛො උපාලිස්ස මාතාපිතූන්නං එතදහොසි: "කෙන නු ඛො උපායෙන උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා" ති.

37. අථ ඛො උපාලිස්ස මාතාපිතූන්නං එතදහොසි: "සචෙ ඛො උපාලි ලෙඛං සික්ඛෙය්‍ය, එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා" ති.

38. අථ ඛො උපාලිස්ස මාතාපිතූන්නං එතදහොසි: "සචෙ ඛො උපාලි ලෙඛං සික්ඛිස්සති, අංගුලියො දුක්ඛා භවිස්සන්ති. සචෙ ඛො උපාලි ගණනං සික්ඛෙය්‍ය, එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා" ති.

39. අථ ඛො උපාලිස්ස මාතාපිතූන්නං එතදහොසි: "සචෙ ඛො උපාලි ගණනං සික්ඛිස්සති, උරස්ස දුක්ඛො භවිස්සති. සචෙ ඛො උපාලි රූපං සික්ඛෙය්‍ය, එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා" ති.

40. අථ ඛො උපාලිස්ස මාතාපිතූන්නං එතදහොසි: "සචෙ ඛො උපාලි රූපං සික්ඛිස්සති, අක්ඛීනි දුක්ඛා භවිස්සන්ති. "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සුඛසීලා සුඛසමාචාරා, සුභොජනානි භුඤ්ජිත්වා නිවාතෙසු සයනෙසු සයන්ති. සචෙ ඛො උපාලි සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍ය එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා" ති.

41. අස්සොසි ඛො උපාලි දාරකො මාතාපිතූන්නං ඉමං කථාසල්ලාපං. අථ ඛො උපාලි දාරකො යෙන තෙ දාරකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ දාරකෙ එතදවොච: "එථ මයං අය්‍යා සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජිස්සාමා" ති.

42. අථ ඛො තෙ දාරකා එකමෙකස්ස මාතාපිතරෙ උපසඞ්කමිත්වා එතදවොචුං "අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා" ති. අථ ඛො තෙසං දාරකානං මාතාපිතරො "සබ්බෙපි මෙ දාරකා සමානච්ඡන්දා කල්‍යාණාධිප්පායා" ති අනුජානිංසු. තෙ භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචිංසු. තෙ භික්ඛූ පබ්බාජෙසුං. උපසම්පාදෙසුං. තෙ රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය රොදන්ති, "යාගුං දෙථ. භත්තං දෙථ. ඛාදනීයං දෙථා" ති.

43. භික්ඛූ එවමාහංසු "ආගමෙථ ආවුසො යාව[1] විභායති. සචෙ යාගු භවිස්සති. පිවිස්සථ. සචෙ භත්තං භවිස්සති භුඤ්ජිස්සථ. සචෙ ඛාදනීයං භවිස්සති. ඛාදිස්සථ. නො චෙ භවිස්සති යාගු වා[2] භත්තං වා ඛාදනීයං වා පිණ්ඩාය චරිත්වා භුඤ්ජිස්සථා" ති.

1. "යාවරත්ති" ම ඡ සං. 2. "යාගුං වා" ම ඡ සං. අ වි. තො වි.

36. එකල්හි රජගහනුවර සතළොස් වගීයේ දරුවෝ යහළුවෝ වෙති. **උපාලි** දරුතෙමේ ඔවුන්ට ප්‍රධාන වේ. එකල්හි උපාලි දරුගේ මවුපියන්ට "කිනම් උපායයකින් උපාලිතෙමේ අපගේ ඇවෑමෙන් සුවසේ ජීවත් වන්නේ ද කලානත නො වන්නේ දැ" යි සිත් විය.

37. ඉක්බිති උපාලිගේ මවුපියන්ට "උපාලි තෙමේ ලිවීම ඉගෙණ ගන්නේ නම් මෙසේ උපාලි තෙමේ අපගේ ඇවෑමෙන් සුවසේ ජීවත් වන්නේ ය. කලානත ද නො වන්නේ ය" යි සිත් වි ය.

38. නැවත ද උපාලිගේ මවුපියන්ට "උපාලි තෙමේ ලිවීම ඉගෙණ ගන්නේ නම් ඔහුගේ ඇඟිලි පෙළෙන්නේ ය. යම් ලෙසකින් උපාලි තෙමේ ගණිතය ඉගෙණ ගන්නේ නම් මෙසේ අපගේ ඇවෑමෙන් සුවසේ ජීවත් වන්නේ ය. කලානත නො වන්නේ ය" යි කල්පනා වි ය.

39. ඉක්බිති උපාලිගේ මවුපියන්ට "උපාලි තෙමේ ගණිතය උගන්නේ නම් ඔහුගේ ළය පෙළෙන්නේ ය. යම් ලෙසකින් උපාලි තෙමේ රූප ඇඳීම උගන්නේ නම් මෙසේ උපාලි අපගේ ඇවෑමෙන් සුවසේ ජීවත් වන්නේ ය. කලානත නො වන්නේය" යි අදහස් වි ය.

40. ඉක්බිති උපාලිගේ මවුපියන්ට "යම් ලෙසකින් උපාලි තෙමේ රූප ඇඳීම උගන්නේ නම් ඔහුගේ ඇස් පෙළෙන්නේ ය. ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ සැප වූ පැවැතුම් ඇත්තෝ ය. පහසු වූ හැසිරීම් ඇත්තෝ ය. මනා බොජුන් වළඳා හුළං හැමීම් නැති යහන්හි සයනය කරත්. උපාලි තෙමේ ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වන්නේ නම් උපාලි අපගේ ඇවෑමෙන් සුවසේ ජීවත් වන්නේ ය. කලානත නො වන්නේ ය" යි සිතෙක් උපන.

41. උපාලි දරු තෙමේ මවුපියන්ගේ මේ කතාව අසා ඒ යහළු දරුවන් වෙතට ගොස් ඔවුන්ට "මිත්‍රයෙනි, එවූ, අපි ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණයන් වෙත පැවිදි වන්නෙමු" යි කී ය. "මිත්‍රය, ඔබ පැවිදි වන්නහු නම් අපිත් පැවිදි වන්නෙමු" යි ඔහු කීහ.

42. ඉක්බිති ඒ යහළු දරුවෝ එකිනෙකාගේ මවුපියන් වෙත ගොස් "ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවන්නට මට අවසර දෙවූ" යි ඉල්ලා සිටියහ. එකල්හි ඒ යහළු දරුවන්ගේ මවුපියෝ මේ සියලු දරුවෝ ම සම අදහස් ඇත්තාහ. යහපත් අදහස් ඇත්තාහ" යි අවසර දුන්හ. ඔහු භික්ෂූන් වෙත ගොස් පැවිද්ද ඉල්ලූහ. භික්ෂූහු ඔවුන් පැවිදි කළහ. උපසපන් කළහ. ඔහු රෑ ඉනා අලුයම නැගිට "කැඳ දෙවූ, බත් දෙවූ. කෑ යුතු දෙයක් දෙවූ" යි හඬත්.

43. භික්ෂූහු "ඇවැත්නි එළි වන තුරු ඉවසවූ. කැඳ තිබේ නම් බොවූ. බත් තිබේ නම් බුදිවූ. කෑ යුතු දෙයක් තිබේ නම් කවූ. කැඳ බත් හෝ (වෙන) කෑ යුතු දෙයක් නොවන්නේ නම් පිඬු පිණිස හැසිර බුදිවූ" යි කීහ.

44. එවම්පි ඛො තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා රොදන්තෙව "යාගුං දෙථ, භත්තං දෙථ, ඛාදනීයං දෙථා" ති. සෙනාසනං උහදන්තිපි උම්මිහන්තිපි.

45. අස්සොසි ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය දාරකසද්දං. සුත්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "කින්නු ඛො සො ආනන්ද දාරකසද්දො?" ති.

46. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙන්තී?" ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙස්සන්ති, ඌනවීසතිවස්සො භික්ඛවෙ, පුග්ගලො අක්ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සනං, දුරුත්තානං දුරාගතානං වචනපථානං. උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසකජාතිකො හොති.

47. "වීසතිවස්සො ච ඛො භික්ඛවෙ,[1] පුග්ගලො ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචනපථානං. උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො හොති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, ජානං ඌනවීසතිවස්සො පුග්ගලො උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො" ති.

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරං කුලං අහිවාතකරොගෙන කාලකතං හොති. තස්ස පිතාපුත්තකා සෙසා හොන්ති. තෙ භික්ඛූසු පබ්බජිත්වා එකතො පිණ්ඩාය චරන්ති. අථ ඛො සො දාරකො පිතුනො භික්ඛාය දින්නාය උපධාවිත්වා එතදවොච. "මය්හම්පි තාත, දෙහි මය්හම්පි තාත, දෙහී" ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අබ්‍රහ්මචාරිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා. අයං[2] දාරකො භික්ඛුනියා ජාතො" ති.

49. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "න භික්ඛවෙ ඌනපණ්ණරසවස්සො දාරකො පබ්බාජෙතබ්බො යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති

1 "වීසතිවස්සො ච භික්ඛවෙ" අ වි ජ පු. ම නු ප. නො වි. ස.
2 "වීසතිවස්සො ඛො භික්ඛවෙ" "අයම්පි" ම ජ සං PTS

44. මෙසේ ද භික්ෂූන් විසින් කියනු ලබන්නා වූ ඒ භික්ෂූහු "කෑද දෙවූ. බත් දෙවු. කෑ යුතු දෙයක් දෙවූ" යි කියමින් හඬත්. සෙනසුන අසුචි තැවරුණක් ද කෙරෙත්. මූත්‍ර තැවරුණක් ද කෙරෙත්. (සෙන සුන මත මල මූ පහ කෙරෙත්.)

45. රෑ අලුයම නැඟී සිටි භාග්‍යවතුන් වහන්සේ ළදරුහඬ අසා ආයුෂ්මත් අනඳතෙරුන් අමතා "ආනන්දය, මේ ළදරු හඬ කිමැ ?" යි විචාරා වදාළ සේක.

46. ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, භික්ෂූහු දත දත විසිවසින් අඩු පුද්ගලයා උපසපන් කරත් යනු සැබෑ ද ?" යි ඇසූහ. "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය". එකල්හි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ දත දත විසිවසින් අඩු පුද්ගලයකු උපසපන් කරත් ද ? මහණෙනි, විසිවසින් අඩු පුද්ගල තෙමේ සීත උෂ්ණ බඩ ගිනි පිපාසා මැසි මදුරු අවු සුළං සපී යන මොවුන්ගේ පහස නො ඉවසන්නේ ය. (ඉවසීමට නො හැක්කේ වේ.) නො මනා සේ කියූ නපුරු වචන නො ඉවසන්නේ ය. සිරුරෙහි හටගත් දුක් වූ තියුණු වූ රළු වූ කටුක වූ අමිහිරි වූ මන නො වඩන්නා වූ පණ නසන්නා වූ වේදනාවන් නො ඉවසන සවභාව ඇත්තේ වේ.

47. "මහණෙනි, විසිවස් ඇත්තා වූ පුද්ගල තෙමේ ම සීත උෂ්ණ බඩගිනි පිපාසා මැසි මදුරු අවු සුළං සපී යන මොවුන්ගේ පහස ඉවසන්නේ ය. (ඉවසීමට හැක්කේ ය.) නො මනා සේ කියූ නපුරු වචන ඉවසන්නේ ය. සිරුරෙහි හටගත් දුක් වූ තියුණු වූ රළු වූ කටුක වූ අමිහිරි වූ මන නො වඩන්නා වූ පණ නසන්නා වූ වේදනාවන් ඉවසන සවභාව ඇත්තේ වේ. මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස නො වේ." -පෙ- ගරහා දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි දත දත විසිවසින් අඩු පුද්ගල තෙමේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, ඇවැත් පරිදි කරවිය යුතු ය".

48. එකල්හි එක්තරා කුලයක් අහිවාතකරෝගයෙන් කළුරිය කෙළේ වෙයි. ඒ කුලයේ පියපුත් දෙදෙන ඉතිරි වූවාහු වෙති. ඔහු භික්ෂූන් වෙත පැවිදි ව එකතු ව ම පිඬු සිඟා යති. එකල්හි (පැවිදි වූ) ඒ දරු තෙමේ පියාට ආහාර දුන් කල්හි ළඟට දුව ගොස් "පියාණෙනි, මට ද දෙව. පියාණෙනි, මට ද දෙව" යි කීයේ ය. මිනිස්සු "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයෝ බඹසර නැත්තෝ ය. මේ දරුතෙමේ මෙහෙණකගෙන් උපන්නේ ය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්.

49. භික්ෂූහු බණින දොඩන දෙස් කියන ඒ මිනිසුන්ගේ බස් අසා භාග්‍යවතුන් වහන්සේට ඒ බව සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, පසළොස්වසින් අඩු දරුවා පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි වදාළ සේක.



Free Distribution www.aathaapi.org

50. තෙන ඛො පන සමයෙන ආයස්මතො **ආනන්දස්ස** උපට්ඨාකකුලං සද්ධං පසන්නං අහිවාතකරොගෙන කාලකතං හොති. ද්වෙ ච දාරකා සෙසා හොන්ති. තෙ පොරාණකෙන ආචිණ්ණකප්පෙන භික්ඛූ පස්සිත්වා උපධාවන්ති. භික්ඛූ අපසාදෙන්ති. තෙ භික්ඛූහි අපසාදියමානා රොදන්ති.

51. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න ඌනපණ්ණරසවස්සො දාරකො පබ්බාජෙතබ්බො' ති. ඉමෙ ච දාරකා ඌනපණ්ණරසවස්සා. කෙන නු ඛො උපායෙන ඉමෙ දාරකා න විනස්සෙය්‍යු"න්ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "උස්සහන්ති පන තෙ ආනන්ද, දාරකා කාකෙ උඩ්ඩාපෙතු ?" න්ති.[1] "උස්සහන්ති භගවා" ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, ඌනපණ්ණරසවස්සං දාරකං කාකුඩ්ඩෙපකං පබ්බාජෙතු"න්ති.

52. තෙන ඛො පන සමයෙන ආයස්මතො **උපනන්දස්ස** සක්‍යපුත්තස්ස ද්වෙ සාමණෙරා හොන්ති **කණ්ටකො** ච **මහකො** ච. තෙ අඤ්ඤමඤ්ඤං දූසෙසුං. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සාමණෙරා එවරූපං අනාචාරං ආචරිස්සන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ එකෙන ද්වෙ සාමණෙරා උපට්ඨාපෙතබ්බා. යො උපට්ඨාපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

53. තෙන ඛො පන සමයෙන භගවා තත්ථෙව **රාජගහෙ** වස්සං වසි. තත්ථ හෙමන්තං. තත්ථ ගිම්හං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "ආහුන්දරිකා සමණානං සක්‍යපුත්තියානං දිසා අන්ධකාරා. න ඉමෙසං දිසා පක්ඛායන්තී" ති.

54. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා ආයස්මන්තං **ආනන්දං** ආමන්තෙසි: "ගච්ඡානන්ද, අවාපුරණං[2] ආදාය අනුපරිවෙණියං භික්ඛූනං ආරොචෙහි: "ඉච්ඡතාවුසො භගවා **දක්ඛිණාගිරිං** චාරිකං පක්කමිතුං. යස්සායස්මතො අත්ථො, සො ආගච්ඡතූ" ති. "එවම්භන්තෙ" ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා[3] අවාපුරණං ආදාය අනුපරිවෙණියං භික්ඛූනං ආරොචෙසි. "ඉච්ඡතාවුසො භගවා දක්ඛිණාගිරිං චාරිකං පක්කමිතුං. යස්සායස්මතො අත්ථො, සො ආගච්ඡතූ" ති. භික්ඛූ එවමාහංසු: "භගවතා ආවුසො ආනන්ද, පඤ්ඤත්තං 'දසවස්සානි නිස්සාය වත්ථුං. දසවස්සෙන නිස්සයං දාතුං.' තත්ථ ච නො ගන්තබ්බං භවිස්සති. නිස්සයො ච ගහෙතබ්බො භවිස්සති. ඉත්තරො ච වාසො භවිස්සති. පුන ච පච්චාගන්තබ්බං භවිස්සති. පුන ච නිස්සයො ගහෙතබ්බො භවිස්සති. සචෙ අම්හාකං ආචරියුපජ්ඣායා ගමිස්සන්ති, මයම්පි ගමිස්සාම. නො චෙ අම්හාකං ආචරියුපජ්ඣායා ගමිස්සන්ති, මයම්පි න ගමිස්සාම. ලහුචිත්තකතා නො ආවුසො ආනන්ද, පඤ්ඤායිස්සතී" ති.

1. "උඩ්ඩෙහතුං" තො වි. ම නු ප. 2. "අපාදුරණං" P T S.
3. "පටිස්සුණිත්වා" ම ඡ සං.

50. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේගේ සැදැහැති පහන් වූ උපස්ථායක කුලයක් අහිවාතකරොගයෙන් කලුරිය කළේ ය. එහි දරුවෝ දෙදෙනෙක් ඉතිරි වූහ. ඔහු පැරණි වූ තමන්ට පුරුදු සිරිතින් භික්ෂූන් **දැක** ලඟට දුව යෙත්. භික්ෂූහු ඔවුන් බැහැර කරත්. භික්ෂූන් විසින් බැහැර කරණු ලබන ඒ දරුවෝ හඬා වැටෙති.

51. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'පසළොස්වසින් අඩු දරු තෙමේ පැවිදි නො කළ යුතු ය' යි පණවන ලද්දේ ය. මේ දරුවෝත් පසළොස්වසට අඩු වයස් ඇත්තෝ ය. කිනම් උපායකින් මේ දරුවෝ නො නැසෙන්නාහු දැ?" යි සිතෙක් උපන. එකල්හි ආයුෂ්මත් වූ ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළහ. එවිට උන්වහන්සේ "ආනන්දය, ඒ දරුවෝ කවුඩන් පලවාලීමට හැකි වෙත් දැ ?" යි ඇසූහ. "භාග්‍යවතුන්වහන්ස, හැකි වෙත්" යි ආනන්දස්ථවිරයන් වහන්සේ පිළිතුරු දුන්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි පසළොස්වසින් අඩු වූ කවුඩන් පලවාලීමෙහි පොහොසත් වූ දරුවා පැවිදි කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

52. එකල්හි ආයුෂ්මත් **උපනන්ද** ස්ථවිරයන් වහන්සේට **කණ්ටක** ය, **මහක** ය යි සාමණේරයෝ දෙදෙනෙක් වෙති. ඔහු එකිනෙකා දූෂණය කළාහු ය. භික්ෂූහු "කෙසේ නම් සාමණේරයෝ මෙබඳු නො සිරිත් **කරත් දැයි**" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙබව සැලකළහ. "මහණෙනි, එකකු විසින් සාමණේරයෝ දෙදෙනෙක් වෙන නබා ගතයුතු නො වෙත්. යමෙක් තබාගන්නේ නම් දුකුලාඇවැත් වේ" යි වදාළ සේක.

53. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එහි ම **රජගහ** නුවර වස් විසූ සේක. හෙමන්ත කාලයෙහි ද ග්‍රීෂ්ම කාලයෙහි ද එහි ම විසූ සේක. මිනිස්සු "ශාක්‍යපුත්‍ර වූ මේ ශ්‍රමණයන්ට දිසාවෝ ගැහැටින් සම්බාධයහ. අඳුරු ය. මොවුන්ට දිසාවෝ නො වැටහෙත් (ප්‍රකට නො වෙත්)" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

54. භික්ෂූහු බණින දොඩන දොස් පවරණ ඒ මිනිසුන්ගේ බස් අසා මේ බව භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ අමතා "ආනන්දය, යතුරු ගෙණ පිරිවෙණක් පාසා ගොස් භික්ෂූන්ට 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ **දක්ෂිණාගිරියෙහි** චාරිකාවට වඩින්නට කැමැති සේක. යම් ආයුෂ්මතෙකුහට (ඒ ගමනින්) වැඩෙක් වේ නම්, හෙතෙමේ ද ඒවා' යි දන්වාලව" යි වදාළ සේක. "එසේ ය; ස්වාමීනි" යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේහට පිළිවදන් දී යතුරුමුදුව ගෙණ පිරිවෙණක් පාසා ගොස් භික්ෂූන්ට "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ දක්ෂිණාගිරියෙහි චාරිකාවට වඩින්නට කැමැති සේක. යම් ආයුෂ්මතෙකුට වැඩෙක් වේ නම්, හෙතෙමේ ඒවා" යි දැන්වූහ. භික්ෂූහු "ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ විසින් දසවසක් නිස ගෙණ විසීමට ද දසවස් ඇති මහණහු විසින් නිස දීමට ද නියම කාරණ ලද්දේ ය. අප විසින් එහි යා යුතු ද වන්නේ ය. නිස්සය ද ගත යුතු වන්නේ ය. සුලු කලක් විසීමෙක් ද වන්නේ ය. නැවත පෙරළා ආ යුතු ද වන්නේ ය. නැවත නිස්සය ගත යුතු ද වන්නේ ය. (එහෙයින්) අපගේ ආචාර්‍යෝපාධ්‍යායයෝත් යන්නෝ නම්, අපි ද යන්නෙමු. අපගේ ආචාර්‍යෝපාධ්‍යායයෝ නො යන්නෝ නම්, අපි ද නො යන්නෙමු. ඇවැත්නි, ආනන්ද ස්ථවිරතුමනි, අපගේ ලඝු සිත් ඇති බවක් පෙණෙන්නේ ය" යි කීහ.

55. අථ ඛො භගවා ඔගණෙන භික්ඛුසඞ්ඝෙන **දක්ඛිණාගිරිං** චාරිකං පක්කාමි. අථ ඛො භගවා දක්ඛිණාගිරිස්මිං යථාභිරන්තං විහරිත්වා පුනදෙව **රාජගහං** පච්චාගඤ්ඡි. අථ ඛො භගවා ආයස්මන්තං **ආනන්දං** ආමන්තෙසි: "කින්නු ඛො ආනන්ද තථාගතො ඔගණෙන භික්ඛුසඞ්ඝෙන දක්ඛිණාගිරිං චාරිකං පක්කන්තො?" ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, ව්‍යත්තෙන භික්ඛුනා පඤ්ච වස්සානි නිස්සාය වත්ථුං. අව්‍යත්තෙන යාවජීවං".

56. "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං. න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන සමාධික්ඛන්ධෙන -පෙ- න අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන- න අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන- න අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං "

57. "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං. අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන- අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන- අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන- අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං."

58. අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං. අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තාපී හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං."

59. "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං. සද්ධො හොති, හිරිමා හොති, ඔත්තාපී හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතසති හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං."

60. "අපරෙහිපි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං. අධිසීලෙ සීලවිපන්නො හොති, අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, අප්පස්සුතො හොති, දුප්පඤ්ඤො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං."

55. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අඩු ගණයා ඇති භික්‍ෂුසඞ්ඝයා සමග **දක්ෂිණාගිරියෙහි** චාරිකාවට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ දක්ෂිණාගිරියෙහි කැමැති තාක් කල් වාසය කොට නැවතත් **රජගහ** නුවරට පෙරළා වැඩි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ අමතා "ආනන්දය, කුමක් හෙයින් තථාගත තෙමේ අඩු ගණයා ඇති භික්‍ෂුසඞ්ඝයා සමග දක්ෂිණාගිරියෙහි චාරිකාවට වැඩියේ දැ?" යි **ඇසූහ** එවිට ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළහ. ඉක්බිති උන්වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමිකතා කොට "මහණෙනි, ප්‍රතිබල සම්පන්න වූ ව්‍යක්ත භික්‍ෂූහු විසින් පස්වසක් (උපාධ්‍යායයන් හෝ ආචාර්‍ය්‍යයන්) ඇසුරු කොට වසන්නට ද අව්‍යක්ත භික්‍ෂූහු විසින් දිවි තිබෙන තුරු (උපාධ්‍යායයන් හෝ ආචාර්‍ය්‍යයන්) ඇසුරු කොට වසන්නට ද අනුදනිමි" යි වදාළ සේක.

56. "මහණෙනි, කරුණු පසකින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

57. "මහණෙනි, කරුණු පසකින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් - අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් - අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් - අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

58. "මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. ශ්‍රද්ධා නැත්තේ ද, ලජ්ජා නැත්තේ ද, පවට බිය නැත්තේ ද, කුසීත ද, මුළා වූ සිහි ඇත්තේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

59. "මහණෙනි, කරුණු පසකින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. ශ්‍රද්ධා ඇත්තේ ද, ලජ්ජා ඇත්තේ ද, පවට බිය ඇත්තේ ද, පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ ද, එළඹ සිටි සිහි ඇත්තේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

60. "මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට පැමිණියේ ද, අජ්ඣාචාරයෙහි ආචාරවිපත්තියට පැමිණියේ ද, අන්තගාහික දිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට පැමිණියේ වේ ද, අල්පශ්‍රැත වේ ද, ප්‍රඥ නැත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්‍ෂූහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

61. “පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: න අධිසීලෙ සීලවිපන්නො හොති, න අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, න අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, බහුස්සුතො හොති, පඤ්ඤවා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං.”

62. “අපරෙහිපි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තිං න ජානාති, අනාපත්තිං න ජානාති, ලහුකං ආපත්තිං න ජානාති, ගරුකං ආපත්තිං න ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන න ස්වාගතානි හොන්ති, න සුවිභත්තානි න සුප්පවත්තීනි න සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං.”

63. “පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති, සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං.”

64. “අපරෙහිපි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තිං න ජානාති, අනාපත්තිං න ජානාති, ලහුකං ආපත්තිං න ජානාති, ගරුකං ආපත්තිං න ජානාති, ඌනපඤ්චවස්සො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං.”

65. “පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා, ඉමෙහි ඛො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං.”

61. "මහණෙනි, කරුණු පසකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට නො පැමිණියේ ද, අජ්ඣාචාරයෙහි ආචාරවිපත්තියට නො පැමිණියේ ද, අත්‍යන්තගාමිකදිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට නො පැමිණියේ ද, බහුශ්‍රැත වේ ද, ප්‍රඥ ඇත්තේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු කොට විසිය යුතු ය."

62. "මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. ආපත්තිය නො දනී ද, අනාපත්තිය නො දනී ද, ලහුකාපත්තිය නො දනී ද, ගරුකාපත්තිය නො දනී ද, ඔහුට උභයප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වූවාහු නො වෙත් ද, මාතෘකා-විභඞ්ග වශයෙන් මනා සේ බෙදුනාහු නො වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ පවත්නාහු නො වෙත් ද, මාතෘකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා සේ විනිශ්චය කරණ ලද්දාහු නො වෙත් ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

63. "මහණෙනි, කරුණු පසකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. ආපත්තිය දනී ද, අනාපත්තිය දනී ද, ලහුකාපත්තිය දනී ද, ගරුකාපත්තිය දනී ද, ඔහුට උභය ප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වූවාහු වෙත් ද, මාතෘකා-විභඞ්ග වශයෙන් මනා සේ බෙදුනාහු වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ පවත්නාහු වෙත් ද, මාතෘකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා සේ විනිශ්චය කරණ ලද්දාහු වෙත් ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

64. "මහණෙනි, අනිකුදු කරුණු පසකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. ආපත්තිය නො දනී ද, අනා-පත්තිය නො දනී ද, ලහුකාපත්තිය නො දනී ද, ගරුකාපත්තිය නො දනී ද, අඩු පස්වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

65. "මහණෙනි, කරුණු පසකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. ආපත්තිය දනී ද, අනාපත්තිය දනී ද, ලහුකාපත්තිය දනී ද, ගරුකාපත්තිය දනී ද, පස්වස් ඇත්තේ හෝ පස්වසින් වැඩි වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

66. “ඡහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං: න අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙඛෙන සමාධික්ඛන්ධෙන -පෙ- න අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන - න අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන- න අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, ඌනපඤ්චවස්සො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං.”

67. “ඡහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන -පෙ- අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන- අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන- අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා, ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං.”

68. “අපරෙහිපි භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං: අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, ඌනපඤ්චවස්සො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං.”

69. “ඡහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතස්සති හොති, පඤ්චවස්සො වා හොති, අතිරෙක පඤ්චවස්සො වා, ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං.”

70. “අපරෙහිපි භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං: අධිසීලෙ සීලවිපන්නො හොති, අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, අප්පස්සුතො හොති, දුප්පඤ්ඤො හොති, ඌනපඤ්චවස්සො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං.”

71. “ඡහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: න අධිසීලෙ සීලවිපන්නො හොති, න අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, න අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, බහුස්සුතො හොති, පඤ්ඤවා හොති, පඤ්චවස්සො වා හොති, අතිරෙකපඤ්චවස්සො වා, ඉමෙහි ඛො භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං.”

66. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත නො වේ ද, අඩු පස්වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

67. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. අසෙඛ වූ සීලක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ සමාධික්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ පඤ්ඤාක්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ විමුත්තික්ඛන්ධයෙන් යුක්ත වේ ද, අසෙඛ වූ විමුත්තිඤාණදස්සනක්ඛන්ධයෙන් යුක්ත වේ ද, පස් වස් ඇත්තේ හෝ පස්වසින් වැඩි වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

68. "මහණෙනි, අනිකුදු කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. ශ්‍රද්ධා නැත්තේ ද, ලජ්ජා නැත්තේ ද, පවට බිය නැත්තේ ද, කුසීත ද, මුළා වූ සිහි ඇත්තේ වේ ද, අඩු පස්වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

69. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. ශ්‍රද්ධා ඇත්තේ ද, ලජ්ජා ඇත්තේ ද, පවට බිය ඇත්තේ ද, පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ ද, එළඹ සිටි සිහි ඇත්තේ ද, පස්වස් ඇත්තේ හෝ පස්වසින් වැඩි වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

70. "මහණෙනි, අනිකුදු කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට පැමිණියේ වේ ද, අධ්‍යාචාරයෙහි ආචාරවිපත්තියට පැමිණියේ වේ ද, අත්‍යන්තගාමිකදිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට පැමිණියේ වේ ද, අල්ප ශ්‍රැත වේ ද, ප්‍රඥ නැත්තේ වේ ද, අඩු පස්වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

71. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. අධිසීලයෙහි සීලවිපත්තියට නො පැමිණියේ වේ ද, අධ්‍යාචාරයෙහි ආචාරවිපත්තියට නො පැමිණියේ වේ ද, අත්‍යන්තගාමික දිට්ඨි ගැණීමෙන් දිට්ඨිවිපත්තියට නො පැමිණියේ වේ ද, බහුශ්‍රැත වේ ද, ප්‍රඥ ඇත්තේ වේ ද, පස්වස් ඇත්තේ හෝ පස්වසින් වැඩි වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

72. “අපරෙහිපි භික්ඛවෙ, ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තිං න ජානාති, අනාපත්තිං න ජානාති, ලහුකං ආපත්තිං න ජානාති, ගරුකං ආපත්තිං න ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන න ස්වාගතානි හොන්ති, න සුවිභත්තානි න සුප්පවත්තීනි න සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, ඌනපඤ්චවස්සො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න අනිස්සිතෙන වත්ථබ්බං.”

73. “ඡහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති, සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා, ඉමෙහි ඛො භික්ඛවෙ ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බන්ති.”

**අභයූවරභාණවාරං නිට්ඨිතං – අට්ඨමං**

72. "මහණෙනි, අතිකුදු කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය. ආපත්තිය නො දනී ද, අනාපත්තිය නො දනී ද, ලහුකාපත්තිය නො දනී ද, ගරුකාපත්තිය නො දනී ද, ඔහුට උභය ප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වූවාහු නො වෙත් ද, මාතෘකා-විභඞ්ග වශයෙන් බෙදුනාහු නො වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ පවත්නාහු නො වෙත් ද, මාතෘකා වශයෙන් හා විභඞ්ග වශයෙන් මනා සේ විනිශ්චය කරණ ලද්දාහු නො වෙත් ද, අඩු පස්වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට නො විසිය යුතු ය."

73. "මහණෙනි, කරුණු සයකින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය. ආපත්තිය දනී ද, අනාපත්තිය දනී ද, ලහුකාපත්තිය දනී ද, ගරුකාපත්තිය දනී ද, ඔහුට උභය ප්‍රාතිමොක්ෂයෝ විස්තර (උභතොවිභඞ්ග) වශයෙන් මනා සේ අවබොධ වූවාහු වෙත් ද, මාතෘකා-විභඞ්ග වශයෙන් මනා සේ බෙදුනාහු වෙත් ද, වාචොද්ගත කිරීම් වශයෙන් මනා සේ පවත්නාහු වෙත් ද, මාතෘකාවශයෙන් හා විභඞ්ගවශයෙන් මනා සේ විනිශ්චය කරණ ලද්දාහු වෙත් ද, පස්වස් ඇත්තේ හෝ පස්වසින් වැඩි වස් ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු සයින් යුත් භික්ෂුහු විසින් ඇදුරෙකු ඇසුරු නො කොට විසිය යුතු ය."

**අටවන අභයූවරබණවර නිමි.**

---

1 අථ බො භගවා **රාජගහෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **කපිලවත්ථු** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කපිලවත්ථු තදවසරි.

2. තත්‍රසුදං භගවා **සක්කෙසු** විහරති කපිලවත්ථුස්මිං **නිග්‍රොධාරාමෙ**. අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන **සුද්ධොදනස්ස** සක්කස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

3. අථ බො **රාහුලමාතා** දෙවී **රාහුල**කුමාරං [1] එතදවොච: "එසො තෙ රාහුල, පිතා. ගච්ඡස්සු [2]. දායජ්ජං යාචාහී" ති. අථ බො රාහුලො කුමාරො යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පුරතො අට්ඨාසි: "සුඛා තෙ සමණ ඡායා" ති.

4. අථ බො භගවා උට්ඨායාසනා පක්කාමි. අථ බො රාහුලො කුමාරො භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි: "දායජ්ජං මෙ සමණ දෙහි. දායජ්ජං මෙ සමණ දෙහී" ති. අථ බො භගවා ආයස්මන්තං **සාරිපුත්තං** ආමන්තෙසි: "තෙන හි ත්වං සාරිපුත්ත, රාහුලකුමාරං පබ්බාජෙහී" ති. "කථාහම්භන්තෙ, රාහුලකුමාරං පබ්බාජෙමී ?" ති.

5. අථ බො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, තීහි සරණගමනෙහි සාමණෙරපබ්බජ්ජං. එවඤ්ච පන භික්ඛවෙ, පබ්බාජෙතබ්බො: පඨමං කෙසමස්සුං ඔහාරාපෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදාපෙත්වා එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිම්පග්ගණ්හාපෙත්වා 'එවං වදෙහී' ති වත්තබ්බො: 'බුද්ධං සරණං ගච්ඡාමි. ධම්මං සරණං ගච්ඡාමි. සඞ්ඝං සරණං ගච්ඡාමි. දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි. තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමී' ති අනුජානාමි භික්ඛවෙ, ඉමෙහි තීහි සරණගමනෙහි සාමණෙරපබ්බජ්ජ" න්ති.

6. අථ බො ආයස්මා සාරිපුත්තො රාහුලං කුමාරං පබ්බාජෙසි. අථ බො **සුද්ධොදනො සක්කො** යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො සුද්ධොදනො සක්කො භගවන්තං එතදවොච: "එකාහං භන්තෙ, භගවන්තං වරං යාචාමී" ති. "අතික්කන්තවරා බො **ගොතම,** තථාගතා" ති. "යඤ්ච භන්තෙ, කප්පති යඤ්ච අනවජ්ජ" න්ති. "වදෙහි ගොතමා" ති. "භගවති මෙ භන්තෙ, පබ්බජිතෙ අනප්පකං දුක්ඛං අහොසි. තථා **නන්දෙ**. අධිමත්තං රාහුලෙ. පුත්තපෙමං භන්තෙ, ඡවිං ඡින්දති. ඡවිං ඡෙත්වා චම්මං ඡින්දති. චම්මං ඡෙත්වා මංසං ඡින්දති. මංසං ඡෙත්වා නහාරුං ඡින්දති. නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති. අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨති. සාධු භන්තෙ, අය්‍යා අනනුඤ්ඤාතං මාතාපිතූහි පුත්තං න පබ්බාජෙය්‍යු" න්ති.

---

1. "රාහුලං කුමාරං" ම ඡ සං.   2. "ගච්ඡස්ස" ම නු ප. සී මු.

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **රජගහ නුවර** කැමැතිතාක් කල් වැඩ වාසය කොට **කිඹුල්වත්** නුවරට වැඩිසේක. පිළිවෙළින් සැරිසරා වඩනා සේක් කිඹුල්වත්නගරයට පැමිණියහ.

2. භාග්‍යවතුන් වහන්සේ එහි **ශාක්‍යජනපදයෙහි** කිඹුල්වත් නුවර **නිග්‍රොධාරාමයෙහි** වැඩ වෙසෙති. එකල්හි උන්වහන්සේ පෙරවරුයෙහි හැඳ පොරොවා ගෙණ පාසිවුරු ගෙණ **ශුද්ධොදන** ශාක්‍යරජුගේ ප්‍රාසාදයට වැඩිසේක. වැඩ පැණවූ අසුනෙහි වැඩ හුන් සේක.

3. ඉක්බිති **රාහුලමාතා** වූ දේවී තොමෝ රාහුල කුමරුට "රාහුලය, මේ තෙමේ ඔබගේ පියා ය. යව. දායාද්‍ය (උරුමය) ඉල්ලව" යි කිවූ ය. එවිට රාහුල කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් උන්වහන්සේගේ ඉදිරියෙහි සිටියේ "ශ්‍රමණය, ඔබගේ සෙවණ මට සැප ය" යි කී ය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගිට වැඩිසේක. එවිට රාහුලකුමාර තෙමේ "ශ්‍රමණය, මට දායාද්‍ය දෙව. ශ්‍රමණය, මට දායාද්‍ය දෙව" යි උන්වහන්සේ පිටිපස ලුහුබැඳ ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් **ශාරීපුත්‍ර** ස්ථවිරයන් වහන්සේ අමතා "ශාරීපුත්‍රය, එසේ නම් රාහුල කුමරු පැවිදි කරව" යි නියම කළ සේක. "ස්වාමීනි, මම කෙසේ රාහුල කුමරු පැවිදි කරම් ද?" යි උන්වහන්සේ ඇසූහ.

5. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමිකතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, මම සරණ ගමනයෙන් හෙරණ පැවිද්ද අනුදනිමි. මහණෙනි, මෙසේ පැවිදි කළ යුතු ය. පළමු කොට කෙස් රැවුල් බහැර කරවා කසාවත් හඳවා උතුරුසඟසිවුර එකස් කරවා භික්ෂූන්ගේ පා වඳවා උක්කුටිකයෙන් හිඳුවා ඇඳිලි ගන්වා 'මෙසේ කියව' යි කිය යුතු ය. 'බුදුන් සරණ කොට යෙමි. දහම් සරණ කොට යෙමි. සඟුන් සරණ කොට යෙමි. දෙවනු ද බුදුන් සරණ කොට යෙමි. දෙවනු ද දහම් සරණ කොට යෙමි. දෙවනු ද සඟුන් සරණ කොට යෙමි. තෙවනු ද බුදුන් සරණ කොට යෙමි. තෙවනු ද දහම් සරණ කොට යෙමි. තෙවනු ද සඟුන් සරණ කොට යෙමි' යි. මහණෙනි, මේ තුන් සරණගමනයෙන් හෙරණ පැවිද්ද අනුදනිමි" යි වදාළ සේක.

6. එකල්හි ආයුෂමත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ රාහුල කුමරු පැවිදි කළහ. ඉක්බිති **ශුද්ධොදන ශාක්‍ය** තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් වැඳ පසෙක හිඳ "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ අතින් එක් වරයක් ඉල්ලමි" යි සැලකෙළේ ය. එවිට උන්වහන්සේ "**ගෞතමය,** තථාගතයෝ ඉක්මවූ වර ඇත්තෝ ය" යි වදාළ සේක. "ස්වාමීනි, යම් වරයෙක් කැප වේ ද, යම් වරයෙක් නිදොස් වේ ද, එබඳු වරයක් ඉල්ලමි" යි හේ කීය. එකල්හි "ගෞතමය, කියව" යි වදාළ සේක. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පැවිදි වූ කල්හි මට මහත් දුකෙක් උපන. **නන්ද** කුමරු පැවිදි වූ - කල්හි ද එසේ ම වි ය. රාහුල කුමරු පැවිදි වූ කල්හි එයට වැඩි දුකෙක් වි ය. ස්වාමීනි, පුත්‍රප්‍රෙමය සිරුරෙහි සිවිය සිඳී යි. සිවිය සිඳ සම සිඳී යි. සම සිඳ මස් සිඳී යි. මස් සිඳ නහර සිඳී යි. නහර සිඳ ඇට සිඳී යි. ඇට සිඳ ඇටමිදුලු හැපී පැතිර සිටි යි. ස්වාමීනි, ආර්‍යයන් වහන්සේලා මවුපියන් විසින් නො අනුදන්නා ලද පුත්‍රයකු පැවිදි නො කරන්නෝ නම් මැනැවැ" යි සැලකෙළේ ය.

7. අථ ඛො භගවා සුද්ධොදනං සක්කං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො සුද්ධොදනො සක්කො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

8. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ අනනුඤ්ඤාතො මාතාපිතූහි පුත්තො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

**රාහුලවත්ථුකථා නිට්ඨිතා.**

---

7. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ශුද්ධොදන ශාක්‍යයාට දැහැමි කතාවෙන් මොනවට කරුණු දක්වූහ. කුසල් දහම්හි සමාදන් කරවූහ. මොනවට තියුණු කරවූහ. මොනවට සතුටු කරවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කරුණු දක්වනලද කුසල්දහම්හි සමාදන් කරවන ලද මොනවට තියුණු කරවන ලද මොනවට සතුටු කරවනලද ශුද්ධොදන ශාක්‍ය තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමිකතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, මවුපියන් විසින් නො අනුදත් පුත්‍ර තෙමේ පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම් දුකුලාඇවැත් වේ" යි වදාළ සේක.

**රාහුල වස්තු කථාව නිමි.**

1. අථ ඛො භගවා **කපිලවත්ථුස්මිං** යථාභිරන්තං විහරිත්වා යෙන **සාවත්ථි**, තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි, තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො සාරිපුත්තස්ස උපට්ඨාකකුලං ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ දාරකං පාහෙසි: "ඉමං දාරකං ථෙරො පබ්බාජෙතූ" ති.

2. අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න එකෙන ද්වෙ සාමණෙරා උපට්ඨාපෙතබ්බා' ති. අයඤ්ච මෙ රාහුලො සාමණෙරො. කථං නු ඛො මයා පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසි. "අනුජානාමි භික්ඛවෙ, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන එකෙන ද්වෙ සාමණෙරෙ උපට්ඨාපෙතුං. යාවතකෙ වා පන උස්සහති ඔවදිතුං අනුසාසිතුං, තාවතකෙ උපට්ඨාපෙතු" න්ති.

3. අථ ඛො සාමණෙරානං එතදහොසි: "කති නු ඛො අම්හාකං සික්ඛාපදානි? කත්ථ ච අම්හෙහි සික්ඛිතබ්බ?" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සාමණෙරානං දස සික්ඛාපදානි. තෙසු ච සාමණෙරෙහි සික්ඛිතුං. පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, අබ්‍රහ්මචරියා වෙරමණී, මුසාවාදා වෙරමණී, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණී, විකාලභොජනා වෙරමණී, නච්චගීතවාදිතවිසූකදස්සනා වෙරමණී, මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා වෙරමණී, උච්චාසයනමහාසයනා වෙරමණී, ජාතරූපරජතපටිග්ගහණා වෙරමණී. අනුජානාමි භික්ඛවෙ, සාමණෙරානං ඉමානි දස සික්ඛාපදානි. ඉමෙසු ච සාමණෙරෙහි සික්ඛිතු" න්ති.

4. තෙන ඛො පන සමයෙන සාමණෙරා භික්ඛූසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරන්ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති - "කථං හි නාම සාමණෙරා භික්ඛූසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරිස්සන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස සාමණෙරස්ස දණ්ඩකම්මං කාතුං: භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති, භික්ඛූනං අවාසාය පරිසක්කති, භික්ඛූනං අක්කොසති පරිභාසති, භික්ඛූ භික්ඛූහි භෙදෙති, අනුජානාමි භික්ඛවෙ, ඉමෙහි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස සාමණෙරස්ස දණ්ඩකම්මං කාතු" න්ති.

5. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කින්නු ඛො දණ්ඩකම්මං කාතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ආවරණං කාතු" න්ති.

1. භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුරයෙහි කැමැති තාක් කල් වැස **සැවැත්** නුවර බලා වැඩි සේක. පිළිවෙළින් සැරිසරා වඩනා සේක් සැවැත් නුවරට පැමිණ එහි **ජේතවන** නම් වූ **අනාථපිණ්ඩික**සිටුහුගේ ආරාම යෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් **ශාරිපුත්‍ර** ස්ථවිරයන් වහන්සේ ගේ උපස්ථායක කුලයක් "මේ දරුවා ස්ථවිරයන් වහන්සේ පැවිදි කරණ සේක්වා" යි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේ වෙතට දරුවකු යැවී ය.

2. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'සාමණේරයෝ දෙදෙනෙක් එකෙකු විසින් ලඟ තබා නො ගත යුත්තාහ' යි පණවන ලද්දේ ය. මේ රාහුල තෙමේ ද මාගේ සාමණේරයෙක් වේ. එහෙයින් මෙහි දී මා විසින් කෙසේ පිළිපැදිය යුතු ද?" යි කල්පනා වි ය. මෙය භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. "මහණෙනි, ප්‍රතිබලසම්පන්න වූ ව්‍යක්ත වූ එක් භික්ෂුනමක් විසින් සාම-ණේරයන් දෙදෙනකුන් තබාගන්නට ද, යම් පමණ සාමණේරයන්ට අවවාද කරන්නට අනුශාසනා කරන්නට පොහොසත් නම් එපමණ සාමණේරයන් තබාගන්නට ද අනුදනිමි" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

3. එකල්හි සාමණේරයන්ට "අපට කෙතෙක් ශික්ෂාපදයෝ වෙත් ද? අප විසින් කිනම් ශික්ෂාපදයන්හි හික්මිය යුතු ද?" යි සිත් වි ය. භාග්‍ය වතුන් වහන්සේට මෙය සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, සාමණේර යන්ට ශික්ෂාපද දසයක් ද සාමණේරයන් විසින් එහි හික්මෙන්නට ද අනුදනිමි. සතුන් මැරීමෙන් වැළකීම, නුදුන් දෙය ගැණීමෙන් වැළකීම, මෛථුන්දම් සෙවීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, මත් වීමට හා පමා වට කරුණු වූ රහමෙර බීමෙන් වැළකීම, විකල්බොජුනෙන් වැළකීම, නැටුම් ගැයුම් වැයුම් විසුළු දැක්මෙන් වැළකීම, මල් හා සුවඳ විලෙවුන් දැරීම අඩු තැන් පිරවීමෙන් සැරසීම අබරණ ලා සැදීම යන මෙයින් වැළකීම, උසසුන්මහසුනෙන් වැළකීම, රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළකීම, මහණෙනි, සාමණේරයන්ට මේ දශශික්ෂා පදයන් ද මේ දශශික්ෂාපදයන්හි හික්මෙන්නට ද අනුදනිමි" යි වදාළ සේක.

4. එකල්හි සාමණේරයෝ භික්ෂූන් කෙරෙහි ගෞරව නැත්තෝ යටත් පැවැතුම් නැත්තෝ සභාග පැවැතුම් නැත්තෝ ව වෙසෙති. භික්ෂූහු "කෙසේ නම් සාමණේරයෝ භික්ෂූන් කෙරෙහි ගෞරව නැත්තෝ යටත් පැවැතුම් නැත්තෝ සභාග පැවැතුම් නැත්තෝ ව වාසය **කරත් දැයි** " යි අවමන් කෙරෙත්. නිඳු කෙරෙත්. දෙස් කියත්. මේ බව භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, කරුණු පසකින් යුත් සාමණේරයාහට දඬුවම් කිරීමට අනුදනිමි. භික්ෂූන්ට ලාභ නො ලැබෙන්නට උත්සාහ කෙරේ ද, භික්ෂූන්ට උපද්‍රව පිණිස උත්සාහ කෙරේ ද, භික්ෂූන්ගේ නො විසීම පිණිස උත්සාහ කෙරේ ද, භික්ෂූන්ට ආක්‍රොශ කෙරේ ද පරිභව කෙරේ ද, කේලාම් කියා භික්ෂූන් භික්ෂූන් හා බිඳවයි ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් සාමණේරයාහට දඬුවම් කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

5. එකල්හි භික්ෂූන්ට "කිනම් දඬුවමෙක් කළ යුතු ද" යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, 'මෙහි නො පිවිසෙව්' යි වළකන්නට අනුදනිමි."

6. තෙන ඛො පන සමයෙන භික්ඛූ සාමණෙරානං සබ්බං සඞ්ඝාරාමං ආවරණං කරොන්ති. සාමණෙරා ආරාමං පවිසිතුං අලභමානා පක්කමන්තිපි. විබ්භමන්තිපි. තිත්ථියෙසුපි සඞ්කමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ සබ්බො සඞ්ඝාරාමො ආවරණං කාතබ්බො. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ යත්ථ වා වසති, යත්ථ වා පටික්කමති, තත්ථ ආවරණං කාතු"න්ති.

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ සාමණෙරානං මුඛද්වාරිකං ආහාරං ආවරණං කරොන්ති මනුස්සා යාගුපානම්පි සඞ්ඝභත්තම්පි කරොන්තා සාමණෙරෙ එවං වදෙන්ති: "එථ භන්තෙ, යාගුං පිවථ. එථ භන්තෙ, භත්තං භුඤ්ජථා"ති. සාමණෙරා එවං වදෙන්ති: "නාවුසො, ලබ්භා. භික්ඛූහි ආවරණං කත"න්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භදන්තා සාමණෙරානං මුඛද්වාරිකං ආහාරං ආවරණං කරිස්සන්තී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, මුඛද්වාරිකො ආහාරො ආවරණං කාතබ්බො. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

**දණ්ඩකම්මවත්ථු නිට්ඨිතං.**

---

6. එකල්හි භික්ෂූහු සාමණේරයන්ට සියලු සඞ්ඝාරාමය වළකත්. සාමණේරයෝ ආරාමයට පිවිසෙන්නට නො ලබන්නෝ බැහැර ද යෙත්. සිවුරු ද හරිත්. තීර්ථිකයන් වෙත ද යෙත්. භාග්‍යවතුන් වහන්සේට මේ ය සැලකළහ. "මහණෙනි, සියලු සඞ්ඝාරාමය නො වැළැක්විය යුතු ය. යමෙක් වළකන්නේ නම් දුකුලාඇවැත් වේ. මහණෙනි, යම් තැනක වෙසේ ද, යම් තැනෙක යේ ද, එහි පිවිසීම වළකන්නට අනුදනිමි."

7. එකල්හි භික්ෂූහු සාමණේරයන්ගේ කටට පත් ආහාරය වළකත්. මිනිස්සු කැඳ බීම ද සඟබත් ද කරන්නෝ සාමණේරයන්ට "ස්වාමීනි, එවු. කැඳ බොවු. ස්වාමීනි, එවු. බත් බුදිවු" යි මෙසේ කියත්. "ඇවැත්නි, (කැඳබත්) නො ලැබිය හැක්කෝ වෙමු. භික්ෂූන් විසින් වළක්වන ලද ය" යි සාමණේරයෝ මෙසේ කියත්. මිනිස්සු "කෙසේ නම් ස්වාමීන් වහන්සේලා සාමණේරයන්ගේ කටට පත් ආහාරය **වළකත් දැයි** ." යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මේ ය සැලකළහ. "මහණෙනි, කටට පත් ආහාරය නො වැළැක්විය යුතු ය. යමෙක් වළකන්නේ නම්, දුකුලාඇවැත් වේ.

**දඬුවම්වත් නිමි.**

---

1 තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උපජ්ඣායෙ අනාපුච්ඡා සාමණෙරානං ආවරණං කරොන්ති. උපජ්ඣායා ගවෙසන්ති: "කහං නු ඛො අම්හාකං සාමණෙරා න දිස්සන්තී?" ති. භික්ඛූ එවමාහංසු: "ඡබ්බග්ගියෙහි ආවුසො, භික්ඛූහි ආවරණං කත"න්ති. උපජ්ඣායා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අම්හෙ අනාපුච්ඡා අම්හාකං සාමණෙරානං ආවරණං කරිස්සන්තී?" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ උපජ්ඣායෙ අනාපුච්ඡා ආවරණං කාතබ්බං. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

2. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ථෙරානං භික්ඛූනං සාමණෙරෙ අපලාළෙ**න්ති**. ථෙරා සාමං දන්තකට්ඨම්පි මුඛොදකම්පි ගණ්හන්තා කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අඤ්ඤස්ස පරිසා අපලාළෙතබ්බා. යො අපලාළෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

3. තෙන ඛො පන සමයෙන ආයස්මතො **උපනන්දස්ස** සක්‍යපුත්තස්ස **කණ්ටකො** නාම සාමණෙරො **කණ්ටකිං** නාම භික්ඛුණිං දූසෙසි. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සාමණෙරා එවරූපං අනාචාරං ආචරිස්සන්ති" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, දසහඞ්ගෙහි සමන්නාගතං සාමණෙරං නාසෙතුං: පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, අබ්‍රහ්මචාරී හොති, මුසාවාදී හොති, මජ්ජපායී හොති, බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති, මිච්ඡාදිට්ඨිකො හොති, භික්ඛුණීදූසකො හොති, අනුජානාමි භික්ඛවෙ, ඉමෙහි දසහඞ්ගෙහි සමන්නාගතං සාමණෙරං නාසෙතු" න්ති.

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පණ්ඩකො භික්ඛූසු පබ්බජිතො හොති. සො දහරෙ භික්ඛූ උපසඞ්කමිත්වා එවං වදෙති: "එථ, මං ආයස්මන්තො දූසෙථා"ති. භික්ඛූ අපසාදෙන්ති: "නස්ස පණ්ඩක. විනස්ස පණ්ඩක. කො තයා අත්ථො?" ති. සො භික්ඛූහි අපසාදිතො මහන්තෙ මහන්තෙ මුනිගල්ලෙ[1] සාමණෙරෙ උපසඞ්කමිත්වා එවං වදෙති: "එථ මං ආයස්මන්තො[2] දූසෙථා" ති. සාමණෙරා අපසාදෙන්ති: "නස්ස පණ්ඩක. විනස්ස පණ්ඩක. කො තයා අත්ථො?" ති.

5. සො සාමණෙරෙහි අපසාදිතො හත්ථිභණ්ඩෙ අස්සභණ්ඩෙ උපසඞ්කමිත්වා එවං වදෙති: "එථ, මං ආවුසො, දූසෙථා" ති. හත්ථිභණ්ඩා අස්සභණ්ඩා දූසෙසුං. තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "පණ්ඩකා ඉමෙ සමණා සක්‍යපුත්තියා. යෙ'පි ඉමෙසං න පණ්ඩකා, තෙ'පි පණ්ඩකෙ දූසෙන්ති. එවං ඉමෙ සබ්බෙව අබ්‍රහ්මචාරිනො ති."

6. අස්සොසුං ඛො භික්ඛූ තෙසං හත්ථිභණ්ඩානං අස්සභණ්ඩානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "පණ්ඩකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (1.)

1. "මොළිගල්ලෙ" ම ඡ සං. P T S. අ වි. ඡ පු. 2. "එථ මං ආවුසො". ම ඡ සං. P T S.

Free Distribution www.aathaapi.org

1. එකල්හි **සවග භික්ෂූහු** උපාධ්‍යායයන් නො විචාරා සාමණේරයන් වළකත්. උපාධ්‍යායයෝ "කුමක් හෙයින් අපගේ සාමණේරයෝ නො දක්නා ලැබෙත් ද?" යි සොයත්. භික්ෂූහු "ඇවැත්නි, සවග භික්ෂූන් විසින් වැළකීම කරණ ලද" යි කීහ. උපාධ්‍යායයෝ "කෙසේ නම් සවග භික්ෂූහු අපගෙන් නො විචාරා අපගේ සාමණේරයන් **වළකත් දැයි** අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උපාධ්‍යායයන් නො විචාරා වැළකීම නො කළ යුතු ය. යමෙක් වළකන්නේ නම් දුකුලා ඇවැත් වේ."

2. එකල්හි සවග භික්ෂූහු ස්ථවිරභික්ෂූන්ගේ සාමණේරයන් සංග්‍රහයෙන් පොළඹවත්. ස්ථවිරභික්ෂූහු තුමූ ම දැහැටිත් මුව දෝනා දියත් ගන්නෝ කලානත වෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අනෙකකුගේ පිරිස සංග්‍රහයෙන් නො පෙළඹවිය යුතු ය. යමෙක් පොළඹවන්නේ නම් දුකුලා ඇවැත් වේ" යි වදාළ සේක.

3. එකල්හි ශාක්‍යපුත්‍ර වූ ආයුෂ්මත් **උපනන්ද** ස්ථවිරයන් වහන්සේගේ **කණ්ටක** නම සාමණේර තෙමේ **කණ්ටකී** නම් මෙහෙණ දූෂ්‍ය කෙළේ ය. භික්ෂූහු "කෙසේ නම් සාමණේරයෝ මෙබඳු නො සිරිත් **කරත්ද යි** අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. මහණෙනි, කරුණු දසයකින් යුත් හෙරණහු නසන්නට (මහණ බැවින් මුදා හරින්නට) අනුදනිමි. "සතුන් මරන්නේ වේ ද, නුදුන් දෙය ගන්නේ වේ ද, ලාමක හැසිරීම් ඇත්තේ වේ ද, බොරු කියන්නේ වේ ද, මත්පැන් බොන්නේ වේ ද, බුදුරදුන්ගේ අගුණ කියා ද, ධර්මයෙහි අගුණ කියා ද, සඞ්ඝයාගේ අගුණ කියා ද, මිසදිටු ගත්තේ වේ ද, භික්ෂුණීදූෂක වේ ද – මහණෙනි, මේ කරුණු දසයෙන් යුත් හෙරණහු මහණ බැවින් මුදා හරින්නට අනුදනිමි" යි වදාළ සේක.

4. එකල්හි එක්තරා පණ්ඩකයෙක් භික්ෂූන් වෙත පැවිදි වූයේ වේ. හෙතෙමේ තරුණභික්ෂූන් වෙත ගොස් "එවූ, ආයුෂ්මත්නි, මා දූෂ්‍ය කරවූ" යි කියයි. භික්ෂූහු "පණ්ඩකය, නැසෙව. පණ්ඩකය, වැනසෙව. තාගෙන් කිනම් වැඩෙක් ද?" යි ඔහු බැහැර කෙරෙත්. භික්ෂූන් විසින් බැහැර කළ හෙතෙමේ තරබාරු සිරුරු ඇති සාමණේරයන් කරා ගොස් "එවූ, ආයුෂ්මත්නි, මා දූෂ්‍ය කරවූ" යි කියයි. සාමණේරයෝ "පණ්ඩකය, නැසෙව. පණ්ඩකය, වැනසෙව. තාගෙන් කිනම් වැඩෙක් ද"? යි ඔහු ඉවත් කෙරෙත්.

5. සාමණේරයන් විසින් පන්නා දැමූ හෙතෙමේ ඇත්ගොව්වන් අස්ගොව්වන් වෙතට ගොස් "ඇවැත්නි, මා දූෂ්‍ය කරවූ" යි කියයි. ඇත්ගොව්වෝ ද අස්ගොව්වෝ ද ඔහු දූෂ්‍ය කළහ. ඔහු "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ පණ්ඩකයෝ ය. මොවුන් අතුරෙහි යම් ශ්‍රමණශාක්‍යපුත්‍රකෙනෙක් පණ්ඩක නො වෙත් ද ඔහු ද පණ්ඩකයන් දූෂ්‍ය කෙරෙත්. මෙසේ මොහු සියල්ලෝ ම ලාමක හැසිරීම් ඇත්තෝ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරත්. දොස් කියත්.

6. භික්ෂූහු බණින දෙඩන දොස් පවරණ ඒ ඇත්ගොව්වන්ගේ අස්-ගොව්වන්ගේ බස් ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු බුදුරජානන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පණ්ඩක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ මහණ බැවින් මුදා හළයුතු ය" යි වදාළ සේක. (1)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරාණකුලපුත්තො ඛීණකොලඤ්ඤො සුඛුමාලො හොති. අථ ඛො තස්ස පුරාණකුලපුත්තස්ස ඛීණකොලඤ්ඤස්ස එතදහොසි: "අහං ඛො සුඛුමාලො. න පටිබලො අනධිගතං වා භොගං අධිගන්තුං අධිගතං වා භොගං ඵාතීකාතුං.[1] කෙන නු ඛො අහං උපායෙන සුඛඤ්ච ජීවෙය්‍යං? න ච කිලමෙය්‍යං?" ති.

8. අථ ඛො තස්ස පුරාණකුලපුත්තස්ස ඛීණකොලඤ්ඤස්ස එතදහොසි: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සුඛසීලා සුඛසමාචාරා සුභොජනානි භුඤ්ජිත්වා නිවාතෙසු සයනෙසු සයන්ති. යන්නූනාහං සාමං පත්තචීවරං පටියාදෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා ආරාමං ගන්ත්වා භික්ඛූහි සද්ධිං සංවසෙය්‍ය" න්ති.

9. අථ ඛො සො පුරාණකුලපුත්තො ඛීණකොලඤ්ඤො සාමං පත්තචීවරං පටියාදෙත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා ආරාමං ගන්ත්වා භික්ඛූ අභිවාදෙති. භික්ඛූ එවමාහංසු "කතිවස්සොසි ත්වං ආවුසො?" ති. "කිං එතං - 'ආවුසො, 'කතිවස්සා' නාමා?" ති. "කො පන තෙ ආවුසො, උපජ්ඣායො?" ති. "කිං එතං ආවුසො, උපජ්ඣායො නාමා?" ති. භික්ඛූ ආයස්මන්තං **උපාලිං** එතදවොචුං: "ඉඞ්ඝාවුසො උපාලි, ඉමං පබ්බජිතං අනුයුඤ්ජාහී" ති.

10. අථ ඛො සො පුරාණකුලපුත්තො ඛීණකොලඤ්ඤො ආයස්මතා උපාලිනා අනුයුඤ්ජියමානො එතමත්ථං ආරොචෙසි. ආයස්මා උපාලි භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "ථෙය්‍යසංවාසකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො. තිත්ථියපක්කන්තකො භික්ඛවෙ, අනුප-සම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (2.3)

11. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො නාගො නාගයොනියා අට්ටීයති. හරායති. ජිගුච්ඡති. අථ ඛො තස්ස නාගස්ස එතදහොසි: "කෙන නු ඛො අහං උපායෙන නාගයොනියා ච පරිමුච්චෙය්‍යං? ඛිප්පඤ්ච මනුස්සත්තං පටිලභෙය්‍යං?" ති. අථ ඛො තස්ස නාගස්ස එතදහොසි: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා. සචෙ ඛො අහං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍යං, එවාහං නාගයොනියා ච පරිමුච්චෙය්‍යං. ඛිප්පඤ්ච මනුස්සත්තං පටිලභෙය්‍ය" න්ති.

12. අථ ඛො සො නාගො මාණවකවණ්ණෙන භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. තං භික්ඛූ පබ්බාජෙසුං. උපසම්පාදෙසුං. තෙන ඛො පන සමයෙන සො නාගො අඤ්ඤතරෙන භික්ඛුනා සද්ධිං පච්චන්තිමෙ විහාරෙ පටිවසති. අථ ඛො සො භික්ඛු රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය අජ්ඣොකාසෙ චඞ්කමති.

1 "ඵාතිං කාතුං" මජ සං. මනුප. තො වි.

7. එකල්හි මවුපිය දෙපසින් නැති වී ගිය කුලපුත්‍රභාවය ඇති සියුමැලි වූ පුරාණ කුලපුත්‍රයෙක් වෙයි. නැසීගිය කුලපුත්බැව් ඇති ඒ පුරාණ කුලපුත්‍රයාහට "මම සියුමැලි වෙමි. නො ලැබූ භොගයක් ලබන්නට හෝ ලැබූ භොගයක් දියුණු කරන්නට හෝ සමර්ථ නො වෙමි. මම කිනම් උපායයකින් සුව සේ ජීවත් වන්නෙම් ද ? නො පෙළෙන්නෙම් ද ?" යි මේ සිත් වි ය.

8. නැවත ඔහුට "මේ ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ සැප වූ පැවතුම් ඇත්තෝ ය. සැප වූ හැසිරීම් ඇත්තෝ ය. මනා බොජුන් වළඳා හුළං හැමීම් නැති යහන්හි සයනය කරති. ඉදින්, මම ම පාසිවුරු පිළියෙල කොට කෙස් රැවුල් බැහැර කොට කසාවත් හැඳ ආරාමයට ගොස් භික්ෂූන් සමග එක් ව වසන්නෙම් නම්, යෙහෙකැ" යි සිත් වි ය.

9 ඉක්බිති නැසීගිය කුලපුත්බැව් ඇති ඒ පුරාණකුලපුත්‍රයා තෙමේ ම පාසිවුරු පිළියෙල කොට කෙස්රැවුල් බැහැර කොට කසාවත් හැඳ ආරාමයට ගොස් භික්ෂූන්ට නමස්කාර කරයි. භික්ෂූහු "ඇවැත, තෝ කෙතෙක් වස් ඇත්තෙහි ද ?" යි ඇසූහ. "ඇවැත්නි, 'කතිවස්සො' යන මෙහි තේරුම කිමෙක් ද?" යි (තෙතෙමේ ඇසී ය.) "ඇවැත, ඔබගේ උපාධ්‍යාය තෙමේ කවරේ ද ?" යි භික්ෂූන් ඇසූ විට "ඇවැත්නි, උපාධ්‍යාය යන මෙහි තේරුම කිමෙක් ද ?" යි ඇසී ය. භික්ෂූහු ආයුෂ්මත් උපාලිස්ථවිරයන් වහන්සේට "ඇවැත්නි, උපාලි ස්ථවිරයෙනි, මේ පැවිද්දහු අතින් කරුණු විචාරණු මැනවැ' යි කීහ.

10. ඉක්බිති නැසී ගිය කුලපුත්බැව් ඇති ඒ පුරාණ කුලපුත්‍රතෙමේ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ විසින් කරුණු විචාරණු ලබන්නේ මේ කාරණය දන්වා සිටියේ ය. ආයුෂ්මත් උපාලි ස්ථවිර තෙමේ භික්ෂූන්ට එය දැන්වී ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ථෙය්‍යසංවාසක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ මහණ බැවින් මුදා හැරිය යුතු ය. මහණෙනි, තිත්ථියපක්කන්තක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ මහණ බැවින් මුදා හැරිය යුතු ය" යි වදාළ සේක. (2. 3.)

11. එකල්හි එක්තරා නාගයෙක් නාගයොනිය කාරණ කොට පෙළෙ යි. ලජ්ජිත වේ. අත්බව පිළිකුල් කෙරෙ යි. ඉක්බිති ඒ නාගයාහට "කිනම් උපායයකින් මම නාගයොනියෙන් මිදෙන්නෙම් ද ? මිනිසත්බවක් වහා ලබන්නෙම් ද ?" යි සිතෙක් වි ය. නැවත ඒ නාගයාහට "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ධර්මයෙහි හැසිරෙන්නෝ ය. සම වූ හැසිරීම් ඇත්තෝ ය. සත්‍යවාදීහු ය. සිල්වත් ය. යහපත් ගුණ ඇත්තෝ ය. එහෙයින් මම ශ්‍රමණශාක්‍යපුත්‍රයන් වෙත පැවිදි වන්නෙම් නම්, මෙසේ නාගයොනියෙන් ද මිදෙන්නෙමි. මිනිසත්බව ද වහා ලබන්නෙමි" යි කල්පනා වි ය.

12. ඉක්බිති ඒ නාග තෙමේ මාණවකවෙශයෙන් භික්ෂූන් වෙත පැමිණ පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ඔහු පැවිදි කළහ. උපසපන් කළහ. එකල්හි, නාග තෙමේ එක්තරා භික්ෂුනමක් සමග පිටිසරගමෙක වූ විහාරයෙක්හි වාසය කර යි. එකල ඒ භික්ෂු තෙමේ රෑ අලුයම නැගිට එළිමහන් තැනෙක සක්මන් කර යි.

13. අථ ඛො සො නාගො තස්ස භික්ඛුනො නික්ඛන්තෙ විස්සට්ඨො නිද්දං ඔක්කමි. සබ්බො විහාරො අහිනා පුණ්ණො. වාතපානෙහි භොගා නික්ඛන්තා හොන්ති. අථ ඛො සො භික්ඛු "විහාරං පවිසිස්සාමී" ති කවාටං පනාමෙන්තො අද්දස සබ්බං විහාරං අහිනා පුණ්ණං. වාතපානෙහි භොගෙ නික්ඛන්තෙ. දිස්වාන භීතො විස්සරමකාසි. භික්ඛූ උපධාවිත්වා තං භික්ඛුං එතදවොචුං: "කිස්ස ත්වං ආවුසො, විස්සරමකාසී?" ති. "අයං ආවුසො, සබ්බො විහාරො අහිනා පුණ්ණො. වාතපානෙහි භොගා නික්ඛන්තා" ති.

14. අථ ඛො සො නාගො තෙන සද්දෙන පටිබුජ්ඣිත්වා සකෙ ආසනෙ නිසීදි. භික්ඛූ එවමාහංසු: "කො'සි ත්වං ආවුසො?" ති. "අහං භන්තෙ, නාගො" ති. "කිස්ස පන ත්වං ආවුසො, එවරූපං අකාසී?" ති.

15. අථ ඛො සො නාගො භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා තං නාගං එතදවොච: "තුම්හෙ ච ඛොත්ථ නාගා. අවිරූළ්හිධම්මා ඉමස්මිං ධම්මවිනයෙ. ගච්ඡ ත්වං නාග. තත්ථෙව චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස උපොසථං උපවස. එවං ත්වං නාගයොනියා ච පරිමුච්චිස්සසි. ඛිප්පඤ්ච මනුස්සත්තං පටිලභිස්සසී" ති.

16. අථ ඛො සො නාගො "අවිරූළ්හිධම්මො කිරාහං ඉමස්මිං ධම්මවිනයෙ" ති දුක්ඛී දුම්මනො අස්සූනි පවත්තයමානො විස්සරං කරිත්වා පක්කාමි. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "ද්වෙ මෙ භික්ඛවෙ, පච්චයා නාගස්ස සභාවපාතුකම්මාය. යදා ච සජාතියා මෙථුනං ධම්මං පටිසෙවති, යදා ච විස්සට්ඨො නිද්දං ඔක්කමති, ඉමෙ ඛො භික්ඛවෙ, ද්වෙ පච්චයා නාගස්ස සභාවපාතුකම්මාය. තිරච්ඡානගතො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (4)

17. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො මාණවකො මාතරං ජීවිතා වොරොපෙසි. සො තෙන පාපකෙන කම්මෙන අට්ටීයති, හරායති, ජිගුච්ඡති. අථ ඛො තස්ස මාණවකස්ස එතදහොසි: "කෙන නු ඛො අහං උපායෙන ඉමස්ස පාපකස්ස කම්මස්ස[1] නික්ඛන්තිං කරෙය්‍ය" න්ති. අථ ඛො තස්ස මාණවකස්ස එතදහොසි: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා. සචෙ ඛො අහං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍යං, එවාහං ඉමස්ස පාපකස්ස කම්මස්ස නික්ඛන්තිං කරෙය්‍ය" න්ති.

18. අථ ඛො සො මාණවකො භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. භික්ඛූ ආයස්මන්තං **උපාලිං** එතදවොචුං: "පුබ්බෙපි ඛො ආවුසො, උපාලි, නාගො මාණවකවණ්ණෙන භික්ඛූසු පබ්බජිතො. ඉඞ්ඝාවුසො, උපාලි, ඉමං මාණවකං අනුයුඤ්ජාහී" ති.

1. "පාපකම්මස්ස" අ වි. ජ දු. ම නු ප.

Free Distribution www.aathaapi.org

13. නාග තෙමේ ඒ භික්ෂුහු නික්ම ගිය කල්හි සැක නැති ව නින්දට ගියේ ය. සියලු විහාරය නාගයාගෙන් පිරුණේ ය. ජනෙල්කවුළුවලින් දරණවැල් නික්මුනේ ය. එවේලෙහි ඒ භික්ෂු තෙමේ "වෙහෙරට පිවිසෙන්නෙමි" යි දොරකවුළුව හරින්නේ නාගයාගෙන් පිරී තුබූ විහාරය හා ජනෙල්කවුළුවලින් නික්මුනු දරණවැල් ද දුක්කේ ය. දැක බියට පැමිණියේ වියරු මහහඬක් කෙළේ ය. භික්ෂූහු ළඟට දුව ගොස් ඒ භික්ෂුහුගෙන් "ඇවැත, නෙපි කුමකට වියරු හඬක් කළහු ද?" යි ඇසූහ. "ඇවැත්නි, මුළු වෙහෙර නාගයාගෙන් පිරී තිබේ. ජනෙල් කවුළු වලින් දරණවැල් නික්ම තිබේ ය" යි කී ය.

14. ඉක්බිති නාග තෙමේ ඒ හඬින් පිබිද සිය අසුනෙහි හිඳ ගත්තේ ය. භික්ෂූහු "ඇවැත, තෝ කවරෙක් වෙහි ද?" යි ඇසූහ. "ස්වාමීනි, මම නාගයෙක් වෙමි" යි කී ය. "ඇවැත, තෝ කුමකට මෙබන්දක් කෙළෙහි ද?" යි ඇසූහ.

15. ඉක්බිති ඒ නාගතෙමේ භික්ෂූන්ට මේ කාරණය දැන්වී ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා (සඟමැද) ඒ නාගයාහට "නෙපි නාගයෝ වනු ය. මේ ශාසනයෙහි නොවැඩෙන ස්වභාව **ඇත්තහුය** නාගය, තෝ එහි ම යව. තුදුස්වක්හි ද පසළොස්-වක්හි ද පක්ෂයේ අටවක්හි ද පෙහෙවස් වසව. මෙසේ කල්හි තෝ නාගයොනියෙන් මිදෙන්නෙහි ය. වහා මිනිසත්බව ද ලබන්නෙහි ය" යි වදාළ සේක.

16. එවිට ඒ නාග තෙමේ "මම මේ ශාසනයෙහි නො වැඩෙන ස්වභාව ඇත්තෙමි" යි දුක් ඇත්තේ නො සතුටු සිත් ඇත්තේ කඳුළු හෙළමින් වියරුහඬක් කොට බැහැර ගියේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, නාගයාගේ ස්වභාවය පහළ කිරීමෙහි මෙ කරුණු දෙකක් වේ. යම් කලෙක සැපින්නක හා මෙවුන්දම් සෙවනය කෙරේ ද, යම් කලෙක නිසැක ව නින්දට බසී ද යන මෙ දෙක නාගයාගේ ස්වභාවය ප්‍රකට වීමෙහි කරුණු වෙයි. මහණෙනි, තිරිසන් තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ සිවුරු හැරවිය යුතු ය" යි වදාළ සේක. (4)

17. එකල්හි එක්තරා මාණවකයෙක් මව මැරී ය. හෙතෙමේ ඒ පව්කමින් පෙළෙසි. ලජ්ජිත වේ. පිළිකුල් කෙරේ. ඒ අතර ඔහුට "කිනම් උපායයකින් මම මේ පාපකර්මයෙන් මිදෙන්නෙම් ද?" යි සිත් වි ය. එකල ඔහුට "මේ ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ ධර්මයෙහි හැසිරෙන්නෝ ය. සම ව හැසිරෙත්තෝ ය. උතුම් හැසිරීම් ඇත්තෝ ය. සත්‍යවාදීහු ය. සිල්වත් ය. යහපත් ගුණ ඇත්තෝ ය. ඉදින් මම මේ ශ්‍රමණශාක්‍යපුත්‍රයන් වෙත පැවිදි වන්නෙම් නම්, මේ පාපකර්මයෙන් මිදෙන්නට හැක්කෙමි" යි අදහස් වි ය.

18. එකල්හි ඒ මාණවකතෙමේ භික්ෂූන් වෙත ගොස් පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ආයුෂ්මත් **උපාලි** ස්ථවිරයන් වහන්සේට "ඇවැත්නි, උපාලි ස්ථවිර තුමනි, පෙර ද නාගයෙක්තෙමේ මාණවකවෙශයෙන් අවුත් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. එබැවින් ඇවැත්නි, උපාලි ස්ථවිර තුමනි, මේ මාණවකයාගෙන් කරුණු විචාරණු මැනවැ" යි දැන්වූහ.

19. අථ ඛො සො මාණවකො ආයස්මතා **උපාලිනා** අනුයුඤ්ජියමානො එතමත්ථං ආරොචෙසි. ආයස්මා උපාලි භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "මාතුඝාතකො භික්ඛවෙ, අනුප-සම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (5.)

20. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො මාණවකො පිතරං ජීවිතා වොරොපෙසි. සො තෙන පාපකෙන කම්මෙන අට්ටීයති, හරායති, ජිගුච්ඡති. අථ ඛො තස්ස මාණවකස්ස එතදහොසි: "කෙන නු ඛො අහං උපායෙන ඉමස්ස පාපකස්ස කම්මස්ස නික්ඛන්තිං කරෙය්‍ය" න්ති. අථ ඛො තස්ස මාණවකස්ස එතදහොසි: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා. සචෙ ඛො අහං සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍යං, එවාහං ඉමස්ස පාපකස්ස කම්මස්ස නික්ඛන්තිං කරෙය්‍ය" න්ති.

21. අථ ඛො සො මාණවකො භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. භික්ඛූ ආයස්මන්තං උපාලිං එතදවොචුං: පුබ්බෙපි ඛො ආවුසො උපාලි නාගො මාණවකවණ්ණෙන භික්ඛූසු පබ්බජිතො. ඉඞ්ඝාවුසො උපාලි, ඉමං මාණවකං අනුයුඤ්ජාහී" ති.

22. අථ ඛො සො මාණවකො ආයස්මතා උපාලිනා අනුයුඤ්ජියමානො එතමත්ථං ආරොචෙසි. ආයස්මා උපාලි භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "පිතුඝාතකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (6.)

23. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ **සාකෙතා සාවත්ථිං** අද්ධානමග්ගප්පටිපන්නා හොන්ති. අන්තරාමග්ගෙ චොරා නික්ඛමිත්වා එකච්චෙ භික්ඛූ අච්ඡින්දිංසු. එකච්චෙ භික්ඛූ හනිංසු. සාවත්ථියා රාජභටා නික්ඛමිත්වා එකච්චෙ චොරෙ අග්ගහෙසුං. එකච්චෙ චොරා පලායිංසු. යෙ තෙ පලායිංසු. තෙ භික්ඛූසු පබ්බජිංසු. යෙ තෙ ගහිතා, තෙ වධාය ඔනීයන්ති.

24. අද්දසාසුං ඛො තෙ[1] පබ්බජිතා තෙ චොරෙ වධාය ඔනීයමානෙ. දිස්වාන එවමාහංසු: "සාධු ඛො මයං පලායිම්හ. සචජ්ජ[2] මයං ගණ්හියෙය්‍යාම.[3] මයම්පි එවමෙව හඤ්ඤෙය්‍යාමා" ති. භික්ඛූ එවමාහංසු: "කිම්පන තුම්හෙ ආවුසො, අකත්ථා" ති. අථ ඛො තෙ පබ්බජිතා භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අරහන්තො එතෙ භික්ඛවෙ, භික්ඛූ. අරහන්තඝාතකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො"ති. (7.)

1. "තෙ පලායිත්වා පබ්බජිතෙ" ම ඡ සං.
2. "සචා ච" ම ඡ සං. "ස චෙ ච"- අට්ඨකථා.
3. "ගණ්හෙය්‍යාමං" ම ඡ සං. ගණ්හෙය්‍යාම. - බ හු සු.

Free Distribution www.aathaapi.org

19. ඉක්බිති ඒ මාණවක තෙමේ ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ විසින් කරුණු විචාරණු ලබන්නේ මේ කාරණය කියා සිටියේ ය. ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට එය දැන්වූහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. "මහණෙනි, මාතෘඝාතක තෙමේ උපසපන් නොවූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ සිවුරු හැරවිය යුතු ය" යි වදාළ සේක. (5.)

20. එකල්හි එක්තරා මාණවකයෙක් පියා මැරී ය. හෙතෙමේ ඒ පව්කමින් පෙළේ. ලජ්ජිත වේ. පිළිකුල් කෙරේ. ඒ අතර ඔහුට "කිනම් උපායයෙකින් මම මේ පාපකර්මයෙන් මිදෙන්නෙම් දැ?" යි සිත් වි ය. එකල ඔහුට "මේ ශ්‍රමණශාක්‍යපුත්‍රියයෝ ධර්මයෙහි හැසිරෙන්නෝ ය. සම ව හැසිරෙන්නෝ ය. උතුම් හැසිරීම් ඇත්තෝ ය. සත්‍යවාදීහු ය. සිල්වත් ය. යහපත් ගුණ ඇත්තෝ ය. මම මේ ශ්‍රමණශාක්‍යපුත්‍රියයන් වෙත පැවිදි වන්නෙම් නම්, මේ පාපකර්මයෙන් මිදෙන්නට හැක්කෙමි" යි අදහස් වි ය.

21. එකල්හි ඒ මාණවක තෙමේ භික්ෂූන් වෙත ගොස් පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු ආයුෂ්මත් උපාලිස්ථවිරයන් වහන්සේට "ඇවැත්නි, උපාලි ස්ථවිර තුමනි, පෙර ද නාගයෙක් තෙමේ මාණවක වෙශයෙන් අවුත් භික්ෂූන් වෙත පැවිදි වූයේ ය. එබැවින් ඇවැත්නි උපාලි ස්ථවිරතුමනි, මේ මාණවකයාගෙන් කරුණු විචාරණු මැනවැ" යි කීහ.

22. එකල්හි ඒ මාණවක තෙමේ ආයුෂ්මත් උපාලිස්ථවිරයන් වහන්සේ විසින් කරුණු විචාරණු ලබන්නේ ඒ කාරණය දැන්වී ය. ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට ඒ කාරණය දැන්වූහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පිතෘඝාතක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ සිවුරු හැරවිය යුතු ය" යි වදාළ සේක. (6.)

23. එකල්හි බොහෝ භික්ෂූහු **සාකේත** නුවරින් **සැවැත්**නුවරට යනු පිණිස දීර්ඝමාර්ගයට පිළිපන්නෝ ය. අතරමග දී සොරු (වනයෙන්) නික්ම අවුත් ඇතැම් භික්ෂූන්ගෙන් (පාසිවුරු) පැහැර ගත්හ. ඇතැම් භික්ෂූන් නැසූහ. සැවැත්නුවරින් නික්ම ආ රාජභටයෝ ඇතැම් සොරුන් අල්ලා ගත්හ. ඇතැම් සොරු පලා ගියහ. පලා ගිය සොරු භික්ෂූන් වෙත පැවිදි වූහ. (රාජභටයන් විසින්) අල්ලා ගත් සොරු වධයට ගෙණ යනු ලැබෙත්.

24. ඒ පැවිද්දෝ වධයට ගෙණ යනු ලබන ඒ සොරුන් දුටුහු ය. දැක, "අපි පලා ගියෙමු. ඒ යහපත් ය. යම් ලෙසකින් අපිත් අල්ලා ගන්නා ලද්දෙමු නම්, අපිත් අද මෙසේ නසනු ලබන්නෙමු" යි මෙසේ කීහ. භික්ෂූහු (ඒ අසා) "ඇවැත්නි, නෙපි කුමක් කළහු දැ?" යි ඇසූහ. එවිට ඒ පැවිද්දෝ භික්ෂූන්ට ඒ කාරණය දැන්වූහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එය සැලකළහ. "මහණෙනි, මේ (මරණ ලද) භික්ෂූහු රහත්හු වෙති. මහණෙනි, අරහන්තඝාතක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ ශාසනයෙන් බැහැර කළ යුතු ය" යි වදාළ සේක. (7.)

25. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛුණියො **සාකෙතා සාවත්ථිං** අද්ධානමග්ගප්පටිපන්නා හොන්ති. අන්තරාමග්ගෙ චොරා නික්ඛමිත්වා එකච්චා භික්ඛුණියො අච්ඡින්දිංසු. එකච්චා භික්ඛුණියො දූසෙසුං. සාවත්ථියා රාජභටා නික්ඛමිත්වා එකච්චෙ චොරෙ අග්ගහෙසුං. එකච්චෙ චොරා පලායිංසු. යෙ තෙ පලායිංසු. තෙ භික්ඛූසු පබ්බජිංසු. යෙ තෙ ගහිතා තෙ වධාය ඔනීයන්ති.

26. අද්දසාසුං ඛො තෙ පබ්බජිතා තෙ චොරෙ වධාය ඔනීයමානෙ. දිස්වාන එවමාහංසු: "සාධු ඛො මයං පලායිම්හ. සචජ්ජ මයං ගණ්හීයෙය්‍යාම, මයම්පි එවමෙව හඤ්ඤෙය්‍යාමා" ති. භික්ඛූ එවමාහංසු: "කිම්පන තුම්හෙ ආවුසො, අකත්ථා" ති. අථ ඛො තෙ පබ්බජිතා භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "භික්ඛුණීදූසකො භික්ඛවෙ අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො. සඞ්ඝභෙදකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො. ලොහිතුප්පාදකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (8. 9. 10.)

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උභතොබ්‍යඤ්ජනකො භික්ඛූසු පබ්බජිතො හොති. සො කරොතිපි, කාරාපෙතිපි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "උභතොබ්‍යඤ්ජනකො භික්ඛවෙ, අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො. උපසම්පන්නො නාසෙතබ්බො" ති. (11.)

**අනුපසම්පන්නෙනකාදසවත්ථු නිට්ඨිතං.**

---

Free Distribution www.aathaapi.org

25. එ කල්හි බොහෝ මෙහෙණෝ **සාකෙත** නුවරින් **සැවැත්** නුවරට යනු පිණිස දීඝීමාගීයට පිළිපන්නාහ. අතරමග දී සොරු නික්ම අවුත් ඇතැම් මෙහෙණින්ගේ පාසිවුරු පැහැර ගත්හ. ඇතැම් මෙහෙණින් දූෂ්‍ය කළහ. සැවැත් නුවරින් ආ රාජභටයෝ ඇතැම් සොරුන් අල්වා ගත්හ. ඇතැම් සොරු පලා ගියහ. පලා ගිය සොරු භික්ෂූන් වෙත පැවිදි වූහ. අල්ලා ගණු ලැබූ සොරු වධයට ගෙණ යනු ලැබෙත්.

26. ඒ පැවිද්දෝ වධයට ගෙණ යනු ලබන ඒ සොරුන් දුටුවාහු ය. දැක, “අපි පලා ගියෙමු. ඒ යහපත් ය. යම් ලෙසකින් අපිත් අල්ලා ගන්නා ලද්දෙමු නම්, අපිත් අද මෙසේ නසනු ලබන්නෙමු” යි කීහ. භික්ෂූහු ඒ අසා “ඇවැත්නි, තෙපි කුමක් කළහුද?” යි ඇසූහ. එවිට ඒ පැවිද්දෝ භික්ෂූන්ට ඒ කාරණය දැන්වූහ. භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට එය සැළකළහ. “මහණෙනි, භික්ෂුණීදූසක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ ශාසනයෙන් නෙරපා හැරිය යුතු ය. මහණෙනි, සඞඝභෙදක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ ශාසනයෙන් නෙරපිය යුතු ය. මහණෙනි, ලොහිතුප්පාදක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළයුතු ය. උපසපන් වූයේ ශාසනයෙන් නෙරපිය යුතු ය.” (8.9.10)

27. එ කල්හි එක්තරා උභතොබ්‍යඤ්ජනකයෙක් භික්ෂූන් වෙත පැවිදි වූයේ වේ. හෙතෙමේ (මෙවුන්දම් සෙවනය ද) කරයි. (මෙවුන්දම සෙවනය) කරවාත් ගණියි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. උන් වහන්සේ “මහණෙනි, උභතොබ්‍යඤ්ජනක තෙමේ උපසපන් නො වූයේ උපසපන් නො කළ යුතු ය. උපසපන් වූයේ ශාසනයෙන් නෙරපිය යුතු ය” යි වදාළ සේක. (11)

**අනුපසපන් එකොළොස් වත නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන භික්ඛූ අනුපජ්ඣායකං උපසම්පාදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, අනුපජ්ඣායකො උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති. (1)

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ සඞ්ඝෙන උපජ්ඣායෙන උපසම්පාදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, සඞ්ඝෙන උපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති. (2)

3. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගණෙන උපජ්ඣායෙන උපසම්පාදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, ගණෙන උපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති. (3)

4. තෙන ඛො පන සමයෙන භික්ඛූ පණ්ඩකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. -පෙ- ථෙය්‍යසංවාසකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - තිත්ථියපක්කන්තකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - තිරච්ඡානගතුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - මාතුඝාතකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - පිතුඝාතකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - අරහන්තඝාතකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - භික්ඛුණිදූසකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - සඞ්ඝභෙදකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - ලොහිතුප්පාදකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. - උභතොබ්‍යඤ්ජනකුපජ්ඣායෙන උපසම්පාදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

5. “න භික්ඛවෙ, පණ්ඩකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. -පෙ- න[1] ථෙය්‍යසංවාසකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න තිත්ථියපක්කන්තකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න තිරච්ඡානගතුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න මාතුඝාතකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න පිතුඝාතකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න අරහන්තඝාතකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න භික්ඛුණිදූසකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න සඞ්ඝභෙදකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. - න ලොහිතුප්පාදකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. න උභතොබ්‍යඤ්ජනකුපජ්ඣායෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති. (4-14)

6. තෙන ඛො පන සමයෙන භික්ඛූ අපත්තකං උපසම්පාදෙන්ති. හත්ථෙසු පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: “සෙය්‍යථාපි තිත්ථියා” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, අපත්තකො උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති. (15.)

1. “න භික්ඛවෙ” මජ සං.

1. එකල්හි භික්ෂූහු උපාධ්‍යායයෙකු නො ගත් හෙරණහු උපසපන් කෙරෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උපාධ්‍යායයෙකු නොගත් හෙරණ තෙමේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි උන් වහන්සේ වදාළ සේක. (1.)

2. එකල්හි භික්ෂූහු සඞ්ඝයා උපාධ්‍යාය කොට උපසපන් කෙරෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සඞ්ඝයා උපාධ්‍යාය කොට උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (2.)

3. එකල්හි භික්ෂූහු ගණයා උපාධ්‍යාය කොට උපසම්පදා කෙරෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගණයා උපාධ්‍යාය කොට උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (3.)

4. එකල්හි භික්ෂූහු පණ්ඩකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. -පෙ- ථෙය්‍යසංවාසකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – තිත්ථියපක්කන්තකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – තිරච්ඡානගතයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති – මාතෘඝාතකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – පිතෘඝාතකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – අරහන්තඝාතකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – භික්ඛුණීදූසකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – සඞ්ඝභෙදකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – ලොහිතුප්පාදකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. – උභතොබ්‍යඤ්ජනකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් කෙරෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

5. "මහණෙනි, පණ්ඩකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් නො කළ යුතු ය. -පෙ- ථෙය්‍යසංවාසකයා උපාධ්‍යාය කොට ගෙණ, – තිත්ථියපක්කන්තකයා උපාධ්‍යාය කොට ගෙණ, – තිරච්ඡානගතයා උපාධ්‍යාය කොට ගෙණ, – මාතුඝාතකයා උපාධ්‍යාය කොට ගෙණ, – පිතුඝාතකයා උපාධ්‍යාය කොට ගෙණ, – අරහන්තඝාතකයා උපාධ්‍යාය කොට ගෙණ, – භික්ඛුණීදූසකයා උපාධ්‍යාය කොට ගෙණ, – සඞ්ඝභෙදකයා උපාධ්‍යාය කොට ගෙණ, – ලොහිතුප්පාදකයා උපාධ්‍යාය කොට ගෙණ, උභතොබ්‍යඤ්ජනකයා උපාධ්‍යාය කොට ගෙණ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (4-14.)

6. එකල්හි භික්ෂූහු පාත්‍රය නැත්තහු උපසපන් කෙරෙති. (පාත්‍රය නැත්තෝ) අත්වලින් පිඬු සිඟා හැසිරෙති. මිනිස්සු "(මොහු) තීර්ථකයන් වැනිය" යි අවමන් කෙරෙති. නින්දා කෙරෙති දෙස් කියති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පාත්‍රය නැත්තේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ"යි වදාළ සේක. (15.)

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ අචීවරකං උපසම්පාදෙන්ති. නග්ගා පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "සෙය්‍යථාපි තිත්ථියා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අචීවරකො උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. (16)

8. තෙන ඛො පන සමයෙන භික්ඛූ අපත්තචීවරකං උපසම්පාදෙන්ති. නග්ගා හත්ථෙසු පිණ්ඩාය චරන්ති, මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි තිත්ථියා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අපත්තචීවරකො උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. (17)

9. තෙන ඛො පන සමයෙන භික්ඛූ යාචිතකෙන පත්තෙන උපසම්පාදෙන්ති. උපසම්පන්නෙ පත්තං පටිහරන්ති. හත්ථෙසු පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි තිත්ථියා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, යාචිතකෙන පත්තෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. (18)

10. තෙන ඛො පන සමයෙන භික්ඛූ යාචිතකෙන චීවරෙන[1] උපසම්පාදෙන්ති. උපසම්පන්නෙ චීවරං පටිහරන්ති. නග්ගා පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි තිත්ථියා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ යාචිතකෙන චීවරෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. (19)

11. තෙන ඛො පන සමයෙන භික්ඛූ යාචිතකෙන පත්තචීවරෙන උපසම්පාදෙන්ති. උපසම්පන්නෙ පත්තචීවරං පටිහරන්ති. නග්ගා හත්ථෙසු පිණ්ඩාය චරන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "සෙය්‍යථාපි තිත්ථියා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, යාචිතකෙන පත්තචීවරෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. (20)

**න උපසම්පාදෙතබ්බවීසතිවාරං[2] නිට්ඨිතං.**

---

1 "චීවරකෙන" ම නු ප. නො වි.
2 "න උපසම්පාදෙතබ්බඑවීසතිවාරො" ම ඡ සං.

7. එකල්හි භික්ෂූහු සිවුරු නැත්තහු උපසපන් කෙරෙති. (ඔහු) නග්න ව පිඬු සිඟා යති. මිනිස්සු "(මොහු) තීර්ථකයන් වැනි ය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සිවුරු නැත්තේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (16.)

8. එකල්හි භික්ෂූහු පාසිවුරු නැත්තහු උපසපන් කෙරෙති. (ඔහු) නගන ව අතින් පිඬු සිඟා යති. "මිනිස්සු (මොහු) තීර්ථකයන් මෙනැ" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. උන්වහන්සේ "මහණෙනි, පාසිවුරු නැත්තෝ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලා ඇවැත් වේ" යි වදාළ සේක. (17.)

9. එකල්හි භික්ෂූහු පිරුළු ගත් පාත්‍රය ඇත්තහු උපසපන් කෙරෙති. උපසපන් වූ කල්හි පාත්‍රය නැවැත ගෙණ යත්. (ඔහු) අතින් පිඬු සිඟා යති. මිනිස්සු "(මොහු) තීර්ථකයන් මෙනැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ඉල්ලා ගත් පාත්‍රය ඇත්තේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (18.)

10. එකල්හි භික්ෂූහු පිරුළු ගත් සිවුර ඇත්තහු උපසපන් කෙරෙති. උපසපන් වූ කල්හි සිවුර නැවත ගෙණ යත්. නග්න ව පිඬු සිඟා යති. මිනිස්සු "(මොහු) තීර්ථකයන් මෙනැ" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පිරුළු ගත් සිවුරු ඇත්තේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (19.)

11. එකල්හි භික්ෂූහු පිරුළු ගත් පාසිවුරු ඇත්තහු උපසපන් කෙරෙත්. උපසපන් කල්හි පාසිවුරු නැවැත ගෙණ යත්. නග්න ව අතින් පිඬු සිඟා යති. මිනිස්සු "(මොහු) තීර්ථකයන් මෙනැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ඉල්ලා ගත් පාසිවුරු ඇත්තේ උපසපන් නො කළ යුතු ය. යමෙක් උපසපන් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (20.)

**උපසපන් නො කළ යුතු විසි වර නිමි.**

1. තෙන ඛො පන සමයෙන භික්ඛූ හත්ථච්ඡින්නං පබ්බාජෙන්ති. -පෙ- පාදච්ඡින්නං පබ්බාජෙන්ති. - හත්ථපාදච්ඡින්නං පබ්බාජෙන්ති. කණ්ණච්ඡින්නං පබ්බාජෙන්ති. නාසච්ඡින්නං පබ්බාජෙන්ති. - කණ්ණනාසච්ඡින්නං පබ්බාජෙන්ති. - අඞ්ගුලිච්ඡින්නං පබ්බාජෙන්ති. - අළච්ඡින්නං පබ්බාජෙන්ති. කණ්ඩරච්ඡින්නං පබ්බාජෙන්ති. - ඵණහත්ථකං පබ්බාජෙන්ති. - ඛුජ්ජං පබ්බාජෙන්ති. - වාමනං පබ්බාජෙන්ති. - ගලගණ්ඩිං පබ්බාජෙන්ති. - ලක්ඛණාහතං පබ්බාජෙන්ති. - කසාහතං පබ්බාජෙන්ති. - ලිඛිතකං [1] පබ්බාජෙන්ති - සීපදිං පබ්බාජෙන්ති. - පාපරොගිං පබ්බාජෙන්ති. - පරිසදූසකං පබ්බාජෙන්ති. - කාණං පබ්බාජෙන්ති. - කුණිං පබ්බාජෙන්ති. - ඛඤ්ජං පබ්බාජෙන්ති. - පක්ඛහතං පබ්බාජෙන්ති. - ඡින්නිරියාපථං පබ්බාජෙන්ති. - ජරාදුබ්බලං පබ්බාජෙන්ති. - අන්ධං පබ්බාජෙන්ති. - මූගං පබ්බාජෙන්ති. - බධිරං පබ්බාජෙන්ති. - අන්ධමූගං පබ්බාජෙන්ති. - අන්ධබධිරං පබ්බාජෙන්ති. - මූගබධිරං පබ්බාජෙන්ති. -පෙ- අන්ධමූගබධිරං පබ්බාජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. "න භික්ඛවෙ, හත්ථච්ඡින්නො පබ්බාජෙතබ්බො. -පෙ- න පාදච්ඡින්නො පබ්බාජෙතබ්බො. - න හත්ථපාදච්ඡින්නො පබ්බාජෙතබ්බො. - න කණ්ණච්ඡින්නො පබ්බාජෙතබ්බො. - න නාසච්ඡින්නො පබ්බාජෙතබ්බො. - න කණ්ණනාසච්ඡින්නො පබ්බාජෙතබ්බො - න අඞ්ගුලිච්ඡින්නො පබ්බාජෙතබ්බො - න අළච්ඡින්නො පබ්බාජෙතබ්බො - න කණ්ඩරච්ඡින්නො පබ්බාජෙතබ්බො. - න ඵණහත්ථකො පබ්බාජෙතබ්බො. - න ඛුජ්ජො පබ්බාජෙතබ්බො. - න වාමනො පබ්බාජෙතබ්බො. - න ගලගණ්ඩී පබ්බාජෙතබ්බො. - න ලක්ඛණාහතො පබ්බාජෙතබ්බො. - න කසාහතො පබ්බාජෙතබ්බො. - න ලිඛිතකො පබ්බාජෙතබ්බො - න සීපදී පබ්බාජෙතබ්බො - න පාපරොගී පබ්බාජෙතබ්බො. - න පරිසදූසකො පබ්බාජෙතබ්බො. - න කාණො පබ්බාජෙතබ්බො. - න කුණී පබ්බාජෙතබ්බො. - න ඛඤ්ජො පබ්බාජෙතබ්බො. - න පක්ඛහතො පබ්බාජෙතබ්බො. - න ඡින්නිරියාපථො පබ්බාජෙතබ්බො. - න ජරාදුබ්බලො පබ්බාජෙතබ්බො. - න අන්ධො පබ්බාජෙතබ්බො. - න මූගො පබ්බාජෙතබ්බො. - න බධිරො පබ්බාජෙතබ්බො. - න අන්ධමූගො පබ්බාජෙතබ්බො. - න අන්ධබධිරො පබ්බාජෙතබ්බො. - න මූගබධිරො පබ්බාජෙතබ්බො. -පෙ- න අන්ධමූගබධිරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

**නපබ්බාජෙතබ්බද්වත්තිංසවාරං නිට්ඨිතං.**

**දූයජ්ජභාණවාරං නිට්ඨිතං.**

**නවමං.**

---

[1] "ලිඛිතං" ජ පු. ම නු ප. තො වි.

1. එකල්හි භික්ෂූහු කැපූ අත් ඇත්තහු පැවිදි කරති. -පෙ- කැපූ පා ඇත්තහු පැවිදි කරති. - කැපූ අත්පා ඇත්තහු පැවිදි කරති. - කැපූ කන් ඇත්තහු පැවිදි කරති. - කැපූ නාසය ඇත්තහු පැවිදි කරති. - කැපූ කන් නාස් ඇත්තහු පැවිදි කරති. - කැපූ ඇඟිලි ඇත්තහු පැවිදි කරති. - කැපූ මාපට ඇඟිලි ඇත්තහු පැවිදි කරති. - කැපූ මහනහර ඇත්තහු පැවිදි කරති. - පෙණය වැනි අත් ඇත්තහු පැවිදි කරති. - කුදු වූවහු පැවිදි කරති.- මිටි වූවහු පැවිදි කරති. - ගලගණ්ඩරොගය ඇත්තහු පැවිදි කරති. - කොටූ ලකුණු ඇත්තහු පැවිදි කරති. - කසවලින් තළනලද්දහු පැවිදි කරති. - රජයෙහි ලියා තබනලද්දහු පැවිදි කරති. - බරවාරෝග ඇත්තහු පැවිදි කරති. - නිතර පවත්නා පාපරෝග ඇත්තනු පැවිදි කරති. - විරූප බැවින් පිරිස දූෂණය කරන්නහු පැවිදි කරති. - එක් ඇසක් (පමණක්) ඇත්තහු පැවිදි කරති. - වක් වූ අත්පා ඇඟිලි ඇත්තහු පැවිදි කරති. - කොර වූවහු පැවිදි කරති. - එක් අතක් හෝ පයක් හෝ සිරුරු අඩක් හෝ නැසුනහු පැවිදි කරති. - පිලා පැවිදි කරති. - ජරාවෙන් දුබල වූවනු පැවිදි කරති. - අන්ධයා පැවිදි කරති. - ගොළුවා පැවිදි කරති. - බිහිරා පැවිදි කරති. - අඳගොළුවා පැවිදි කරති. - අඳබිහිරා පැවිදි කරති. - ගොළුබිහිරා පැවිදි කරති. -පෙ- අඳගොළුබිහිරා පැවිදි කරති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

2. මහණෙනි, කැපූ අත් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. -පෙ- කැපූ පා ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ අත්පා ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ කන් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ නාස් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ කන්නාස් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ ඇඟිලි ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ මාපට ඇඟිලි ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කැපූ මහනහර ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - පෙණය වැනි අත් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කුදා පැවිදි නො කළ යුතු ය. - මිට්ටා පැවිදි නො කළ යුතු ය. - ගලගණ්ඩරොගය ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - ලකුණු කොටූයේ පැවිදි නො කළ යුතු ය. - කසයෙන් පැහැරුණේ පැවිදි නො කළ යුතු ය. - රජයෙහි ලියා තැබූයේ පැවිදි නො කළ යුතු ය. - බරවාරෝග ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - පාපරෝග ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - පිරිස් දූෂණය කරන්නේ පැවිදි නො කළ යුතු ය. - එකැස් ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - වක් වූ අත්පා ඇත්තේ පැවිදි නො කළ යුතු ය. - කොර වූයේ පැවිදි නො කළ යුතු ය - එක් අතක් හෝ එක් පයක් හෝ සිරුර අඩක් හෝ නැසුනේ පැවිදි නො කළ යුතු ය. - පිලා පැවිදි නො කළ යුතු ය. - ජරාවෙන් දුබල වූයේ පැවිදි නො කළ යුතු ය. - අන්ධයා පැවිදි නො කළ යුතු ය. - ගොළුවා පැවිදි නො කළ යුතු ය. - බිහිරා පැවිදි නො කළ යුතු ය. - අඳගොළුවා පැවිදි නො කළ යුතු ය. - අඳබිහිරා පැවිදි නො කළ යුතු ය. - ගොළුබිහිරා පැවිදි නො කළ යුතු ය. -පෙ- අඳගොළුබිහිරා පැවිදි නො කළ යුතු ය. යමෙක් පැවිදි කරන්නේ නම්, දුකුලාඇවැත් වේ'' යි වදාළ සේක.

**පැවිදි නො කළ යුතු දෙතිස් වාරය නිමි.**

**නවවන දූයාද බණවර නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අලජ්ජීනං නිස්සයං දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අලජ්ජීනං නිස්සයො දාතබ්බො. යො දදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. තෙන ඛො පන සමයෙන භික්ඛූ අලජ්ජීනං නිස්සාය වසන්ති. තෙපි න චිරස්සෙව අලජ්ජිනො හොන්ති පාපා භික්ඛූ[1]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අලජ්ජීනං නිස්සාය වත්ථබ්බං. යො වසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

2. අථ ඛො භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න අලජ්ජීනං නිස්සයො දාතබ්බො. න අලජ්ජීනං නිස්සාය වත්ථබ්බ' න්ති. කථන්නු ඛො මයං ජානෙය්‍යාම ලජ්ජී වා අලජ්ජී වා[2]" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ චතුහපඤ්චාහං ආගමෙතුං යාව භික්ඛුසභාගතං[3] ජානාමී" ති.

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු **කොසලෙසු** ජනපදෙසු[4] අද්ධානමග්ගපටිපන්නො හොති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න අනිස්සිතෙන වත්ථබ්බ' න්ති. අහඤ්චම්හි නිස්සයකරණීයො අද්ධානමග්ගපටිපන්නො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අද්ධානමග්ගපටිපන්නෙන භික්ඛුනා නිස්සයං අලභමානෙන අනිස්සිතෙන වත්ථු" න්ති.

4. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. තෙ අඤ්ඤතරං ආවාසං උපගච්ඡිංසු. තත්ථ එකො භික්ඛු ගිලානො හොති. අථ ඛො තස්ස ගිලානස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න අනිස්සිතෙන වත්ථබ්බ' න්ති. අහඤ්චම්හි නිස්සයකරණීයො ගිලානො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ ?" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා නිස්සයං අලභමානෙන අනිස්සිතෙන වත්ථු" න්ති.

5. අථ ඛො තස්ස ගිලානුපට්ඨාකස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න අනිස්සිතෙන වත්ථබ්බ' න්ති. අහඤ්චම්හි නිස්සයකරණීයො. අයඤ්ච භික්ඛු ගිලානො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ගිලානුපට්ඨාකෙන භික්ඛුනා නිස්සයං අලභමානෙන යාචියමානෙන අනිස්සිතෙන වත්ථු" න්ති.

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අරඤ්ඤෙ විහරති. තස්ස ච තස්මිං සෙනාසනෙ ඵාසු හොති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න අනිස්සිතෙන වත්ථබ්බ' න්ති. අහඤ්චම්හි නිස්සයකරණීයො අරඤ්ඤෙ විහරාමි. මය්හඤ්ච ඉමස්මිං සෙනාසනෙ ඵාසු හොති. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ආරඤ්ඤකෙන භික්ඛුනා ඵාසුවිහාරං සල්ලක්ඛෙන්තෙන නිස්සයං අලභමානෙන අනිස්සිතෙන වත්ථුං. යදා පතිරූපො නිස්සයදායකො ආගච්ඡිස්සති. තස්ස[5] නිස්සාය වසිස්සාමී" ති.

1. "පාපකා භික්ඛූ" ම ඡ සං. 2. "ලජ්ජිං වා අලජ්ජිං වා" ම ඡ සං.
3. "භික්ඛූනං සභාගතං" අ වි. ජ පු. 4. "ජනපදෙ" ම ඡ සං.
5. "තදා තස්ස" ම ඡ සං.

1. එකල්හි සවග භික්ෂූහු අලජ්ජීන්ට නිස දෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අලජ්ජීන්ට නිස නො දිය යුතු ය. යමෙක් දෙන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි වදාළ සේක. එකල්හි භික්ෂූහු අලජ්ජීන් නිසා වසති. ඔහු ද නොබෝ දිනකින් ම අලජ්ජී වූ ලාමක භික්ෂූහු වෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අලජ්ජීන් නිසා නො විසිය යුතු ය. යමෙක් වසන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි වදාළ සේක.

2. එකල්හි භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'අලජ්ජීන්ට නිස නො දිය යුතු ය. අලජ්ජීන් නිසා නො විසිය යුතු ය' යි නියම කරණ ලද්දේ ය. අපි '(මෙ තෙමේ) ලජ්ජී හෝ වේ ද ? අලජ්ජී හෝ වේ ද' ? යි කෙසේ නම් දන්නෙමු ද?" යි අදහස් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, යම් තාක් භික්ෂූන් හා ශීලාදි-සභාගත්වය දනිම් ද, ඒ තාක් (සිටිම්යි) සතර පස් දිනක් බලාපොරොත්තු වන්නට අනුදනිමි" යි වදාළ සේක.

3. එකල්හි එක්තරා භික්ෂුනමක් කොසොල්දනව්වෙහි අදන්මගට පිළිපන්නේ ය. එකල්හි ඒ භික්ෂුහට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'නිස නැති ව නො විසිය යුතු ය' යි නියම කරණ ලද්දේ ය. මමත් කට යුතු නිස ඇත්තේ අදන්මගට පිළිපන්නේ වෙමි. මා විසින් කෙසේ පිළිපැදිය යුතු ද ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ "මහණෙනි, අදන්මගට පිළිපන්, නිස නො ලබන්නාවූ මහණහු විසින් නිස නැතු ව වසන්නට අනුදනිමි" යි වදාළ සේක.

4. එකල්හි භික්ෂූහු දෙනමක් කොසොල්දනව්වෙහි අදන්මගට පිළිපන්නෝ වෙත්. ඔහු එක්තරා ආවාසයකට ගියහ. ඔවුනතුරෙන් එක් නමක් ගිලන් වෙයි. ඒ ගිලන් භික්ෂුහට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'නිස නැති ව නො විසිය යුතු ය' යි පණවන ලද්දේ ය. මමත් කට යුතු නිස ඇති ගිලනෙක් වෙමි. මා විසින් කෙසේ පිළිපැදිය යුතු ද ?"යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගිලන්, නිස නො ලබන, භික්ෂූහු විසින් නිස නැති ව වසන්නට අනුදනිමි" යි වදාළ සේක.

5. එකල්හි ඒ ගලානොපසථායකභික්ෂුහට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'නිස නැති ව නො විසිය යුතු ය' යි පණවන ලදී. මමත් නිස කට යුත්තෙක් වෙමි. මේ මහණ ද ගිලන් ය. මා විසින් කෙසේ පිළිපැදිය යුතු ද ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, (ඒ ගිලන් භික්ෂූහු විසින්) ඉල්ලනු ලබන, නිස නො ලබන්නාවූ, ගලානො-පසථායක භික්ෂූහු විසින් නිස නැති ව වසන්නට අනුදනිමි" යි වදාළ සේක.

6. එකල්හි එක්තරා මහණෙක් වනයෙහි වසයි. ඔහුට ඒ වනසෙන-සුනෙහි විසීම පහසු වේ. එකල්හි ඒ භික්ෂුහට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'නිස නැති ව නො විසිය යුතු ය' යි පණවන ලදී. මමත් නිස කට යුත්තේ වනයෙහි වසමි. මට මේ සෙනසුනෙහි විසීම පහසු ය. මා විසින් කෙසේ පිළිපැදිය යුතු ද ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වනයෙහි වසන නිස නො ලබන භික්ෂූහු විසින් ඵාසුවිහරණය සලකා 'යම් විටෙක සුදුසු වූ නිස දෙන්නෙක් එන්නේ නම්, ඔහු නිසා වසන්නෙමි' යි සිතා නිස නැති ව වසන්නට අනුදනිමි"යි වදාළ සේක.

7. තෙන ඛො පන සමයෙන ආයස්මතො **මහාකස්සපස්ස** උපසම්පදාපෙක්ඛො හොති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මතො **ආනන්දස්ස** සන්තිකෙ දූතං පාහෙසි: “ආගච්ඡතු ආනන්දො, ඉමං අනුසාවෙස්ස” තූති.[1] ආයස්මා ආනන්දො එවමාහ: “නාහං උස්සහාමි ථෙරස්ස නාමං ගහෙතුං. ගරු මෙ ථෙරො” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, ගොත්තෙනපි අනුසාවෙතු” න්ති.

8. තෙන ඛො පන සමයෙන ආයස්මතො මහාකස්සපස්ස ද්වෙ උපසම්පදාපෙක්ඛා හොන්ති. තෙ විවදන්ති: “අහං පඨමං උපසම්පජ්ජිස්සාමි. අහං පඨමං උපසම්පජ්ජිස්සාමී”ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ ද්වෙ එකානුසාවනෙ[2] කාතු” න්ති.

9. තෙන ඛො පන සමයෙන සම්බහුලානං ථෙරානං උපසම්පදාපෙක්ඛා හොන්ති. තෙ විවදන්ති: “අහං පඨමං උපසම්පජ්ජිස්සාමි. අහං පඨමං උපසම්පජ්ජිස්සාමී” ති. ථෙරා එවමාහංසු: “හන්ද මයං ආවුසො සබ්බෙව එකානුසාවනෙ කරොමා” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ ද්වෙ තයො එකානුසාවනෙ කාතුං. තඤ්ච ඛො එකෙන උපජ්ඣායෙන. න ත්වෙව නානුපජ්ඣායෙනා” ති.

10. තෙන ඛො පන සමයෙන ආයස්මා **කුමාරකස්සපො** ගබ්භවීසො උපසම්පන්නො හොති.[3] අථ ඛො ආයස්මතො කුමාරකස්සපස්ස එතදහොසි: “භගවතා පඤ්ඤත්තං න ඌනවීසතිවස්සො පුග්ගලො උපසම්පාදෙතබ්බො ති. අහඤ්චම්හි ගබ්භවීසො උපසම්පන්නො. උපසම්පන්නො නු ඛොම්හි? න නු ඛො උපසම්පන්නො?” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “යං භික්ඛවෙ මාතුකුච්ඡිස්මිං පඨමං චිත්තං උප්පන්නං, පඨමං විඤ්ඤාණං පාතුභූතං, තදුපාදාය සාවස්ස ජාති. අනුජානාමි භික්ඛවෙ ගබ්භවීසං උපසම්පාදෙතු” න්ති.

11. තෙන ඛො පන සමයෙන උපසම්පන්නා දිස්සන්ති කුට්ඨිකාපි ගණ්ඩිකාපි කිලාසිකාපි[4] සොසිකාපි අපමාරිකාපි. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ උපසම්පාදෙන්තෙන තෙරස අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුං. එවඤ්ච පන භික්ඛවෙ පුච්ඡිතබ්බො: “සන්ති තෙ එවරූපා ආබාධා – කුට්ඨං? ගණ්ඩො? කිලාසො? සොසො? අපමාරො? මනුස්සොසි? පුරිසොසි? භුජිස්සොසි? අනණොසි? නසි රාජභටො? අනුඤ්ඤාතොසි මාතාපිතූහි? පරිපුණ්ණවීසතිවස්සොසි? පරිපුණ්ණං තෙ පත්තචීවරං? කින්නාමොසි? කො නාමො තෙ උපජ්ඣායො?” ති.

1. “අනුසාවෙස්සතීති” සී මු. PTS  2. “එකානුසාවනෙන” තො වි. ජ පු. අ වි
3. “අහොසි” ම ජ සං.  4. “කිලාසාපි” තො වි. ම නු ප.

Free Distribution www.aathaapi.org

7. එකල්හි ආයුෂ්මත් **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේට උපසම්පදාපෙක්ෂකයෙක් වේ. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් **ආනන්ද ස්ථවිරයන්** වහන්සේගේ සමීපයට "ආනන්ද ස්ථවිරතෙමේ (මෙහි) ඒවා. (අවුත්) මේ හෙරණහුට කර්මවාක්‍යය අස්වාවා" යි දූතයකු යැවූහ. එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ "මම ස්ථවිරයන් වහන්සේගේ නම කියන්ට අපොහොසත් වෙමි. ස්ථවිරයන් වහන්සේ මාගේ ගුරුය" යි කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගොත්‍රයෙන් අස්වන්නට * අනුදනිමි" යි වදාළ සේක.

8. එකල්හි ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට උපසම්පදාපෙක්ෂකයෝ දෙදෙනෙක් වෙති. "මම පළමු කොට උපසපන් වන්නෙමි. මම පළමු කොට උපසපන් වන්නෙමි" යි ඔහු විවාද කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දෙදෙන එක් අනුසාවණයෙහි උපසපන් කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

9. එකල්හි බොහෝ ස්ථවිරයන් වහන්සේලාට උපසම්පදාපෙක්ෂකයෝ වෙති. ඔහු "මම පළමු කොට උපසපන් වන්නෙමි, මම පළමු කොට උපසපන් වන්නෙමි" යි විවාද කෙරෙත්. තෙරහු "ඇවැත්නි, එබැවින් අපි සියලු දෙනා එක් අනුසාවණයෙහි උපසපන් කරමු" යි මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දෙ තුන් දෙනා එක් අනුසාවණයෙහි උපසපන් කරන්නට අනුදනිමි. එද එක් උපාධ්‍යාය කෙනෙකුන්ගෙන් ය. නානාඋපාධ්‍යායයන්ගෙන් ඒ නො ම කට යුතු ය" යි වදාළ සේක.

10. එකල්හි ආයුෂ්මත් **කුමාරකාශ්‍යප** ස්ථවිර තෙමේ ගැබෙහි පටන් විසිවස් ඇත්තේ උපසපන් වූයේ වේ. ඉක්බිති ආයුෂ්මත් කුමාර කාශ්‍යපස්ථවිරයන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'විසිවසින් අඩු පුද්ගල තෙමේ උපසපන් නො කළ යුතු ය' යි පණවන ලද්දේ ය. මම ගැබෙහි පටන් විසිවස් ඇත්තේ උපසපන් වූයෙම් වෙමි. මම උපසපන් වූයෙම් දෝ ? උපසපන් නො වූයෙම් දෝ ?" යි සැකයෙක් පහළ වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මවුකුසෙහි යම් පළමු ප්‍රතිසන්ධි චිත්තයක් උපන්නේ ද, යම් පළමු ප්‍රතිසන්ධිවිඥානයක් වූයේ ද, එතැන් පටන් ඒ ප්‍රතිසන්ධිය ම ඔහුගේ උපපත්තිය යි. මහණෙනි, ගැබෙහි පටන් විසිවස් ඇත්තහු උපසපන් කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

11. එකල්හි කුෂ්ඨරොග ඇත්තෝ ද, ගණ්ඩරොග ඇත්තෝ ද, කිලාසරොග ඇත්තෝ ද, ක්ෂයරොග ඇත්තෝ ද, මීමැස්මොර ඇත්තෝ ද, උපසපන් වූවාහු දක්නා ලැබෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උපසපන් කරන්නහු විසින් තෙළෙස් අන්තරායකරධර්මයන් විචාරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ විචාළ යුතු ය: ඔබට කුෂ්ඨ - ගණ්ඩ - කිලාස - ක්ෂය - මීමැස්මොර යන මෙබඳු ආබාධයෝ වෙත් ද ? මිනිසෙක් වෙහි ද ? පුරුෂයෙක් වෙහි ද ? නිවහල් වෙහි ද ? නය නැත්තේ වෙහි ද ? රාජභටයෙක් නො වෙහි ද ? මවුපියන් විසින් අනුදන්නා ලද්දේ වෙහි ද ? පිරිපුන් විසිවස් ඇත්තේ වෙහි ද ? ඔබගේ පාසිවුරු සම්පූර්ණ වේ ද ? (13) කි නම් ඇත්තේ වෙහි ද ? ඔබගේ උපාධ්‍යාය තෙමේ කි නම් ඇත්තේ ද ?"

* උපග්‍රන්ථය බලනු.

12. තෙන ඛො පන සමයෙන භික්ඛූ අනනුසිට්ඨෙ උපසම්පදාපෙක්ඛෙ අන්තරායිකෙ ධම්මෙ පුච්ඡන්ති. උපසම්පදාපෙක්ඛා විත්ථායන්ති. මඞ්කූ හොන්ති. න සක්කොන්ති විස්සජ්ජෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පඨමං අනුසාසිත්වා පච්ඡා අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතු" න්ති. තත්ථෙව සඞ්ඝමජ්ඣෙ අනුසාසන්ති. උපසම්පදාපෙක්ඛා තථෙව විත්ථායන්ති. මඞ්කූ හොන්ති. න සක්කොන්ති විස්සජ්ජෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ එකමන්තං අනුසාසිත්වා සඞ්ඝමජ්ඣෙ අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුං. එවඤ්ච පන භික්ඛවෙ, අනුසාසිතබ්බො: පඨමං උපජ්ඣං ගාහාපෙතබ්බො. උපජ්ඣං ගාහාපෙත්වා පත්තචීවරං ආචික්ඛිතබ්බං: "අයං තෙ පත්තො, අයං සඞ්ඝාටි. අයං උත්තරාසඞ්ගො. අයං අන්තරවාසකො. ගච්ඡ. අමුම්හි ඔකාසෙ තිට්ඨාහී" ති.

13. බාලා අබ්‍යත්තා අනුසාසන්ති. දුරනුසිට්ඨා උපසම්පදාපෙක්ඛා විත්ථායන්ති මඞ්කූ හොන්ති. න සක්කොන්ති, විස්සජ්ජෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ බාලෙන අබ්‍යත්තෙන අනුසාසිතබ්බො. යො අනුසාසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන අනුසාසිතු" න්ති.

14. අසම්මතා අනුසාසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අසම්මතෙන අනුසාසිතබ්බො. යො අනුසාසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ සම්මතෙන අනුසාසිතුං. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: අත්තනා වා [1] අත්තානං සම්මන්නිතබ්බං. පරෙන වා පරො සම්මන්නිතබ්බො.

15. කථඤ්ච අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං? බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ඉත්ථන්නාමං අනුසාසෙය්‍ය" න්ති. එවං අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං.

16. කථඤ්ච [2] පරෙන වා පරො සම්මන්නිතබ්බො? බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, ඉත්ථන්නාමො ඉත්ථන්නාමං අනුසාසෙය්‍යා" ති. එවං පරෙන වා [3] පරො සම්මන්නිතබ්බො.

---

1. "අත්තනාව - සී මු. P T S. 2. "කථඤ්ච පන" ම ඡ සං.
3. "පරෙන" ම ඡ සං. P T S. නො වි. ජ පු. ම නු ප.

12. එකල්හි භික්ෂූහු අනුශාසනා නො කළ උපසම්පදාපෙක්ෂකයන් වෙතින් අන්තරායකරධර්මයන් විචාරති. උපසම්පදාපෙක්ෂකයෝ කලබල වෙති. ලජ්ජිත වෙති. විසඳන්ට (පිළිතුරු දෙන්ට) නො පොහොසත් වෙති. භාග්‍යවතුන් වහන්සේට මේ සැලකළහ. "මහණෙනි, පළමු ව අනුශාසනා කොට පසු ව අන්තරායකරධර්මයන් විචාරන්නට අනුදනිමි" යි වදාළ සේක. එහි ම සඟ මැද අනුශාසනා කෙරෙත්. උපසම්පදාපෙක්ෂකයෝ එසේ ම කලබල වෙති. මංකු වෙති. පිළිතුරු දෙන්ට අපොහොසත් වෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පසෙකට ගෙණ අනුශාසනා කොට සඟ මැද දී අන්තරායකරධර්මයන් විචාරන්නට අනුදනිමි. මහණෙනි, අනුශාසනා කළ යුත්තේ මෙසේ ය: පළමු කොට උපාධ්‍යායයා ගැන්විය යුතු ය. උපාධ්‍යායයෙකු ගන්වා පා සිවුරු කිය යුතු ය: "මේ ඔබගේ පාත්‍ර ය. මේ සඞ්ඝාටි ය. මේ උත්තරාසඞ්ග ය. මේ අන්තරවාසක ය. යව, අසුවල් අවකාසයෙහි සිටුව".

13. අඥ වූ අව්‍යක්තයෝ අනුශාසනා කෙරෙත්. වැරදි ලෙසට අනුශාසනා කළ උපසම්පදාපෙක්ෂකයෝ කලබල වෙති. නො වැටහෙන්නෝ වෙති. විසඳන්ට අපොහොසත් වෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, අඥ වූ අව්‍යක්තයා විසින් අනුශාසනා නො කට යුතු ය. (බාල වූ) යමෙක් අනුශාසනා කරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් අනුශාසනා කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

14. සම්මත නො කරණ ලද භික්ෂූහු අනුශාසනා කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සම්මත නො කළ භික්ෂුනමක් විසින් අනුශාසනා නො කට යුතු ය. යමෙක් අනුශාසනා කරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, සම්මතය ලැබූවහු විසින් අනුශාසනා කරන්නට අනුදනිමි. මහණෙනි, සම්මතය කළ යුත්තේ මෙසේ ය. තමන් විසින් හෝ තමා සම්මත කට යුතු ය. අනිකකු විසින් හෝ අනෙකෙක් සම්මත කට යුතු ය."

15. "තමන් විසින් හෝ තමා සම්මත කළ යුත්තේ කෙසේ ද? ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ මෙසේ දන්විය යුතු ය: 'සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති ආයුෂ්මත්හුගේ උපසම්පදාපෙක්ෂකයා වේ. ඉදින් සඞ්ඝයාහට සුදුසු කල් පැමිණියේ වේ නම්, මම මෙ නම් ඇත්තහුට අනුශාසනා කරන්නෙමි' යි මෙසේ තමන් විසින් හෝ තමා සම්මත කළ යුතු ය."

16. "අන්‍යයකු විසින් හෝ අනෙකෙක් සම්මත කළ යුත්තේ කෙසේ ද? ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ මෙසේ දන්විය යුතු ය: 'සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති ආයුෂ්මත්හුගේ උපසම්පදාපෙක්ෂකයා වේ. ඉදින් සඞ්ඝයාහට සුදුසු කල් පැමිණියේ නම්, මෙ නම් ඇත්තේ මෙ නම් ඇත්තහුට අනුශාසනා කරන්නේ ය' යි අන්‍යයකු විසින් හෝ අනෙකෙක් මෙසේ සම්මත කළ යුතු ය."

17. තෙන සම්මතෙන භික්ඛුනා උපසම්පදාපෙක්ඛො උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: "සුණසි ඉත්ථන්නාම. අයං තෙ සච්චකාලො, භූතකාලො. යං ජාතං තං සඞ්ඝමජ්ඣෙ පුච්ඡන්තෙ සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං. මා ඛො විත්ථාසි. මා ඛො මඞ්කු අහොසි. එවං තං පුච්ඡිස්සන්ති: සන්ති තෙ එවරූපා ආබාධා - කුට්ඨං? ගණ්ඩො? කිලාසො? සොසො? අපමාරො? මනුස්සො'සි? පුරිසො'සි? භුජිස්සො'සි? අනණො'සි? නසි රාජභටො? අනුඤ්ඤාතො'සි මාතාපිතූහි? පරිපුණ්ණවීසතිවස්සො'සි? පරිපුණ්ණං තෙ පත්තචීවරං? කින්නාමො'සි? කො නාමො තෙ උපජ්ඣායො?" ති.

18. එකතො ආගච්ඡන්ති. "න භික්ඛවෙ, එකතො ආගන්තබ්බං. අනුසාසකෙන පඨමතරං ආගන්ත්වා සඞ්ඝො ඤාපෙතබ්බො:

19. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. අනුසිට්ඨො සො මයා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, ඉත්ථන්නාමො ආගච්ඡෙය්‍යා ති. 'ආගච්ඡාහී' ති වත්තබ්බො."

20. එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා උපසම්පදං යාචාපෙතබ්බො:

21. "සඞ්ඝං භන්තෙ, උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං භන්තෙ, සඞ්ඝො අනුකම්පං උපාදාය. දුතියම්පි භන්තෙ, සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං භන්තෙ, සඞ්ඝො අනුකම්පං උපාදාය. තතියම්පි භන්තෙ, සඞ්ඝං උපසම්පදං යාචාමි. උල්ලුම්පතු මං භන්තෙ, සඞ්ඝො අනුකම්පං උපාදායා" ති.

22. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ඉත්ථන්නාමං අන්තරායිකෙ ධම්මෙ පුච්ඡෙය්‍යං" ති. 'සුණසි ඉත්ථන්නාම, අයං තෙ සච්චකාලො. භූතකාලො. යං ජාතං තං පුච්ඡාමි. සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං. සන්ති තෙ එවරූපා ආබාධා - කුට්ඨං? ගණ්ඩො? කිලාසො? සොසො? අපමාරො? මනුස්සො'සි? පුරිසො'සි? භුජිස්සො'සි? අනණො'සි? නසි රාජභටො? අනුඤ්ඤාතො'සි මාතාපිතූහි? පරිපුණ්ණවීසතිවස්සො'සි? පරිපුණ්ණං තෙ පත්තචීවරං? කින්නාමො'සි? කො නාමො තෙ උපජ්ඣායො'? ති.

Free Distribution www.aathaapi.org

17. සම්මතය ලද ඒ භික්ෂුහු විසින් (උපසම්පදාපෙක්ෂකයා වෙතට) ගොස් "මෙ නම් ඇත්ත, අසව. මේ ඔබගේ සත්‍යය කිය යුතු කාලය යි. වූවක් කිය යුතු කාලය යි. සඟ මැද විචාරණ කල්හි වූවක් නම් ඇතැ යි කිය යුතු ය. නො වූවක් නම් නැතැයි කිය යුතු ය. නුසන්හු වූවෙක් නො වන්න. හැකිලෙන්නෙක් නො වන්න. ඔබගෙන් මෙසේ විචාරන්නාහු ය: ඔබට කුෂ්ඨ, ගණ්ඩ, කිලාස, ක්ෂය, මීමැස්මොර යන මෙබඳු ආබාධයෝ වෙත් ද ? මිනිස් වෙහි ද ? පිරිමියෙක් වෙහි ද ? නිවහලෙක් වෙහි ද ? නය නැත්තෙහි ද ? රජභටයෙක් නො වෙහි ද ? මවුපියන් විසින් අනුදන්නා ලද්දේ වෙහි ද ? පිරිපුන් විසි වස් ඇත්තෙහි ද ? ඔබගේ පාසිවුරු සම්පූර්ණ ද ? කි නම් ඇත්තෙහි ද ? ඔබගේ උපාධ්‍යාය තෙමේ කි නම් ඇත්තේ වේ ද ?' යි මෙසේ ඇසිය යුතු වන්නේ ය."

18. (අනුශාසනා කළ භික්ෂුහු අනුශිෂ්ට උපසම්පදාපෙක්ෂකයන් හා) එක් ව එති. "මහණෙනි, එක් ව නො ආ යුතු ය අනුශාසකයා පළමු කොට අවුත් සඞ්ඝයාට මෙසේ දැන්විය යුතු ය:

19. "සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති ආයුෂ්මත්හට උපසම්පදාපෙක්ෂක වේ. මා විසින් හෙ තෙමේ අනුශාසනා කරණ ලද්දේ ය. ඉදින් සඞ්ඝයාට කල් පැමිණියේ නම්, මෙ නම් ඇත්තේ එන්නේ ය. එව යි කිය යුතු ය."

20. උතුරුසඟසිවුර එකස් කරවා භික්ෂූන්ගේ පා වඳවා උක්කුටික-යෙන් හිඳුවා ඇඳිලි ගන්වා උපසම්පදාව යාච්ඤා කරවිය යුතු ය.

21. "ස්වාමීනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලමි. අනුකම්පා කොට සඞ්ඝ තෙමේ මා සාමණේරභාවයෙන් උදුරාවා. දෙවනු ව ද ස්වාමීනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලමි. අනුකම්පා කොට සඞ්ඝ තෙමේ මා සාමණේරභාවයෙන් උදුරාවා. තෙවනු ව ද ස්වාමීනි, සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලමි. අනුකම්පා කොට සඞ්ඝ තෙමේ මා සාමණේරභාවයෙන් උදුරාවා."

22. "ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝයාට මෙසේ දැන්විය යුතු ය: 'සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇති මෙ තෙමේ මෙ නම් ඇති ආයුෂ්මත්හුගේ උපසම්පදාපෙක්ෂක වේ. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මම මෙ නම් ඇත්තාගෙන් අන්තරායකර-ධර්මයන් විචාරන්නෙමි. මෙ නම් ඇත්ත, අසව. මේ තාගේ ඇත්ත කිය යුතු කාලය යි. වූවක් කිය යුතු කාලය යි. යමක් වූයේ නම් එය අසමි. වූවක් නම් ඇතැ යි කිය යුතු ය. නො වූවක් නම් නැතැයි කිය යුතු ය. ඔබට කුෂ්ඨ, ගණ්ඩ, කිලාස, ක්ෂය, මීමැස්මොර යන මෙබඳු ආබාධයෝ වෙත් ද ? මිනිස් වෙහි ද ? පිරිමියෙක් වෙහි ද ? නිවහලෙක් වෙහි ද ? නය නැත්තෙහි ද? රජභටයෙක් නො වෙහි ද ? මවුපියන් විසින් අනුදන්නා ලද්දේ වෙහි ද ? පිරිපුන් විසි වස් ඇත්තෙහි ද ? ඔබගේ පාසිවුරු සම්පූර්ණ ද ? කිනම් ඇත්තෙහි ද ? ඔබගේ උපාධ්‍යාය තෙමේ කි නම් ඇත්තේ ද ?

23. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: 'සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්ස පත්තචීවරං. ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. එසා ඤත්ති.

24. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්ස පත්තචීවරං. ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස න ක්ඛමති, සො භාසෙය්‍ය."

25. "දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්ස පත්තචීවරං. ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

26. "තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. අයං ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස ආයස්මතො උපසම්පදාපෙක්ඛො. පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්ස පත්තචීවරං. ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. සඞ්ඝො ඉත්ථන්නාමං උපසම්පාදෙති ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපසම්පදා ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

27. 'උපසම්පන්නො සඞ්ඝෙන ඉත්ථන්නාමො ඉත්ථන්නාමෙන උපජ්ඣායෙන. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

**උපසම්පදාකම්මං නිට්ඨිතං.**

23. "ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝයාට මෙසේ දැන්විය යුතු ය: 'සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇති මෙ තෙමේ මෙ නම් ඇති ආයුෂමත්හට උපසම්පදාපෙක්ෂක වේ. අන්තරායකරධර්මයන්ගෙන් පිරිසිදු ය. මොහුගේ පාසිවුරු සම්පූර්ණ ය. මෙ නම් ඇත්තේ මෙ නම් ඇත්තහු උපාධ්‍යාය කොට ගෙණ සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලයි. සඞ්ඝයාට කල් පැමිණියේ නම් සඞ්ඝ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තහු උපසපන් කරන්නේ ය. මේ දැන්වීම ය.

24. ස්වාමීනි, 'සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති ආයුෂමත්හට උපසම්පදාපෙක්ෂක වේ. අන්තරායකරධර්මයන්ගෙන් පිරිසිදු ය. මොහුගේ පාසිවුරු සම්පූර්ණ ය. මෙ නම් ඇත්තේ මෙ නම් ඇත්තහු උපාධ්‍යාය කොට ගෙණ සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලයි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තහු උපසපන් කරයි. මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත වූ මෙ නම් ඇත්තහුගේ උපසම්පදාව යම් ආයුෂමතෙකුහට රුචි වේ නම්, හෙ තෙමේ නිශ්ශබ්ද වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා.

25. "දෙවනුව ද මේ කරුණ කියමි. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති ආයුෂමත්හට උපසම්පදාපෙක්ෂක වේ. අන්තරායකරධර්මයන්ගෙන් පිරිසිදු ය. මොහුගේ පාසිවුරු සම්පූර්ණ ය. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලයි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තහු උපසපන් කරයි. මෙ නම් ඇති උපාධ්‍යායයා ගෙන් යුක්ත වූ මෙ නම් ඇත්තහුගේ උපසම්පදාව යම් ආයුෂමතෙකුහට රුචි වේ නම්, හෙ තෙමේ නිශ්ශබ්ද වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙතෙමේ කියාවා."

26. "තෙවනුව ද මේ කරුණ කියමි. ස්වාමීනි, සඞ්ඝතෙමේ මාගේ වචනය අසාවා. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති ආයුෂමත්හුගේ උපසම්ප-දාපෙක්ෂකයෙකි. අන්තරායකරධර්මයන්ගෙන් පිරිසිදු ය. මොහුගේ පාසිවුරු සම්පූර්ණ ය. මෙ නම් ඇත්තේ මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව සඞ්ඝයාගෙන් උපසම්පදාව ඉල්ලයි. සඞ්ඝ තෙමේ මෙ නම් ඇත්තහු මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව උපසපන් කරයි. මෙනම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත වූ මෙ නම් ඇත්තහුගේ උපසම්පදාව යම් ආයුෂමතෙකුහට රුචි වේ නම්, හෙ තෙමේ නිශ්ශබ්ද වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙතෙමේ කියාවා."

27. "සඞ්ඝයා විසින් මෙ නම් ඇති උපාධ්‍යායයාගෙන් යුක්ත ව මෙ නම් ඇත්තේ උපසපන් කරණ ලද්දේ ය. සඞ්ඝයාට එය රුචි වේ. එහෙයින් තුෂ්ණිම්භූත වේ. මෙය මෙසේ දරමි."

**උපසම්පදාකර්මය නිමි.**

1. තාවදෙව ඡායා මෙතබ්බා. උතුපමාණං ආචික්ඛිතබ්බං. දිවසභාගො ආචික්ඛිතබ්බො. සඞ්ගීති ආචික්ඛිතබ්බා. චත්තාරො නිස්සයා ආචික්ඛිතබ්බා.

2. පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො - සඞ්ඝභත්තං, උද්දෙසභත්තං, නිමන්තනං, සලාකභත්තං, පක්ඛිකං, උපොසථිකං, පාටිපදිකං. (1)

3. පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො - ඛොමං, කප්පාසිකං, කොසෙය්‍යං, කම්බලං, සාණං, භඞ්ගං. (2)

4. රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො - විහාරො, අඩ්ඪයොගො, පාසාදො, හම්මියං, ගුහා. (3)

5. පූතිමුත්තභෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො - සප්පි, නවනීතං, තෙලං, මධු, ඵාණිතන්ති. (4)

**චත්තාරො නිස්සයා නිට්ඨිතා.**

---

1. උපසපන් කිරීමට අනතුරු ව (උපසපන් වේලාව දැනගැණීමට) පියවර මැනිය යුතු ය. සෘතුප්‍රමාණය කිය යුතු ය. දවස පිළිබඳ පෙරවරු පස්වරු කිය යුතු ය. සඞගීතිය කිය යුතු ය. නිස සතර කිය යුතු ය.

2. පැවිද්ද සිඟා ලත් බත්පිඬු නිසා ය. තා විසින් දිවි තෙක් ඒ පිණ්ඩියාලොපභොජනයෙහි උත්සාහ කට යුතු ය. සඞ්ඝයා පිණිස දෙන බත, උදෙසා දෙන බත, ආරාධනා කොට දෙන බත, කුසපත් හෙළා දෙන බත, පසළොස් දිනකට වරක් දෙන බත, පොහෝදිනයෙහි දෙන බත, පැළ-වියෙහි දෙන බත - යන මෙය අතිරෙක ලාභය යි. (1)

3. පැවිද්ද පංසුකුලසිවුර නිසා ය. තා විසින් දිවි තෙක් ඒ පංසුකුලචීවරයෙහි උත්සාහ කට යුතු ය. කොමු, කපු, කොසෙය්‍ය, කම්බිලි, හණ, මිශ්‍ර පිළී - යන මෙය අතිරෙක ලාභය යි. (2)

4. පැවිද්ද රුක්මුල්සෙනසුන නිසා ය. තා විසින් දිවි තෙක් ඒ රුක්ඛමූලසෙනාසනයෙහි උත්සාහ කට යුතු ය. වෙහෙර, ගුරුළු පියාපත් වැනි වහල ඇති ගෙය, සිවුරැස් ගෙය, සඳලු සහිත ගෙය, ගුහා - යන මෙය අතිරෙක ලාභයි. (3)

5. පැවිද්ද ගොමුත්‍ර බෙහෙත් නිසා ය. තා විසින් දිවි තෙක් ඒ පූතිමුත්තභෙසජ්ජයෙහි උත්සාහ කට යුතු ය. ගිතෙල්, වෙඬරු, තෙල්, මී, උක්සකුරු - යන මෙය අතිරෙක ලාභ යි. (4)

**සතර නිස නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන භික්ඛූ අඤ්ඤතරං භික්ඛුං උපසම්පාදෙත්වා එකකං ඔහාය පක්කමිංසු. සො පච්ඡා එකකොව[1] ආගච්ඡන්තො අන්තරාමග්ගෙ පුරාණදුතියිකාය සමාගඤ්ඡි. සා එවමාහ: "කිං දානි පබ්බජිතොසී?" ති.[2] "ආම, පබ්බජිතොම්හී" ති.[3] "දුල්ලභො ඛො පබ්බජිතානං මෙථුනො ධම්මො. එහි, මෙථුනං ධම්මං පටිසෙවා" ති. සො තස්සා මෙථුනං ධම්මං පටිසෙවිත්වා චිරෙන අගමාසි. භික්ඛූ එවමාහංසු: "කිස්ස ත්වං ආවුසො, එවං චිරං අකාසී?" ති අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, උපසම්පාදෙත්වා දුතියං දාතුං, චත්තාරි ච අකරණීයානි ආචික්ඛිතුං."

2. උපසම්පන්නෙන භික්ඛුනා මෙථුනො ධම්මො න පටිසෙවිතබ්බො අන්තමසො තිරච්ඡානගතායපි. යො භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවති, අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම පුරිසො සීසච්ඡින්නො අභබ්බො තෙන සරීරබන්ධනෙන ජීවිතුං, එවමෙව භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං. (1)

3. උපසම්පන්නෙන භික්ඛුනා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං න ආදාතබ්බං අන්තමසො තිණසලාකං උපාදාය. යො භික්ඛු පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො බන්ධනා පමුත්තො අභබ්බො හරිතත්තාය, එවමෙව භික්ඛු පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං. (2)

4. උපසම්පන්නෙන භික්ඛුනා සඤ්චිච්ච පාණො ජීවිතා න වොරොපෙතබ්බො අන්තමසො කුන්ථකිපිල්ලිකං උපාදාය. යො භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙති අන්තමසො ගබ්භපාතනං උපාදාය, අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම පුථුසිලා ද්වෙධා භින්නා අප්පටිසන්ධිකා හොති, එවමෙව භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං. (3)

5. උපසම්පන්නෙන භික්ඛුනා උත්තරිමනුස්සධම්මො න උල්ලපිතබ්බො අන්තමසො සුඤ්ඤාගාරෙ අභිරමාමීති. යො භික්ඛු පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ඣානං වා විමොක්ඛං වා සමාධිං වා සමාපත්තිං වා මග්ගං වා ඵලං වා, අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුන විරූළ්හියා, එවමෙව භික්ඛු පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයන්ති (4)

**චත්තාරි අකරණීයානි නිට්ඨිතානි.**

---

1. "එකකො" අ වි ජ පු. ම නු ප. 2. "පබ්බජිතොසි" අ වි.
3. "පබ්බජිතොම්හි" ම ජ සං.

1. එකල්හි භික්ෂූහු එක්තරා භික්ෂුනමක් උපසපන් කොට තනි ව හැර දමා ගියහ. හෙ තෙමේ පසු ව තනි ව එන්නේ අතරමග දී පෙර බිරිඳට හමු වි ය. ඕතොමෝ "කොහොම ද? දැන් පැවිදි වූයෙහි ද?" යි ඇසු ය. "ඔව්. දැන් පැවිදි වූයෙමි"(යි හේ කී ය). "පැවිද්දනට මෛථුන ධර්මය ලැබීම පහසු නො වේ. එන්න, මෙවුන්දම් සෙවනය කරන්නැ" යි කීවා ය. ඒ භික්ෂු තෙමේ ඇ හා මෙවුන්දම් සෙවනය කොට බොහෝ වේලාවක් ගෙවා භික්ෂූන් වෙත ගියේ ය. එකල්හි භික්ෂූහු "ඇවැත් නි, ඔබ කුමක් නිසා බොහෝ කල් ගෙවූවෙහි ද" යි ඇසූහ. එවිට ඒ භික්ෂු තෙමේ සියලු කරුණු භික්ෂූන්ට සැලකෙළේ ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, උපසපන් කොට දෙ වැන්නෙකු දෙන්නට ද, නො කට යුතු කරුණු සතර කියන්නට ද අනුදනිමි" යි වදාළ සේක.

2. උපසපන් මහණහු විසින් යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක හා ද මෙවුන්දම් නො සෙවිය යුතු ය. යම් මහණෙක් මෙවුන්දම් සෙවනය කෙරේ නම්, හෙ තෙමේ ශ්‍රමණයෙක් නො වේ. ශාක්‍යපුත්‍රයෙක් නො වේ. හිස් සිඳි පුරුෂයෙක් ඒ ශරීරබන්ධනයෙන් ජීවත් වන්නට යම් සේ හැකි නො වේ ද, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙවුන්දම් සෙවනය කිරීම හේතු කොට ශ්‍රමණශාක්‍යපුත්‍රයෙක් නො වේ. තා විසින් ඒ මෙවුන්දම් සෙවනය දිවි තෙක් නො කට යුතු ය. (1)

3. උපසපන් මහණහු විසින් යටත් පිරිසෙයින් තණකුරක් පටන් වූ නොදුන් දෙයක් සොරසිතින් නො ගත යුතු ය. යම් මහණෙක් කහවණු වෙන් සතරෙන් කොටස වූ පාදයක් හෝ පාදයක් අගනා වූ හෝ පාදය කට වැඩි තරම් වූ හෝ නො දුන් දෙයක් සොර සිතින් ගණී ද, හෙතෙමේ ශ්‍රමණයෙක් නො වේ. ශාක්‍යපුත්‍රයෙක් නො වේ. නැට්ටෙන් ගැලවුනු ඉදුනු කොළයක් තිල්වන් වීමට යම් සේ නො සුදුසු වේ ද, එපරිද්දෙන් ම මහණ තෙමේ පාදයක් වූ හෝ පාදයක් අගනා වූ හෝ පාදයකට වැඩි තරම් වූ හෝ නො දුන් දෙයක් සොර සිතින් ගැණීම හෙතු කොට ශ්‍රමණශාක්‍යපුත්‍රයෙක් නො වේ. තා විසින් ඒ සොරකම දිවි තෙක් නො කට යුතු ය. (2)

4. උපසපන් මහණහු විසින් දැන දැන යටත් පිරිසෙයින් කුරුකුහුඹුවෙකු පටන් පණැති සතෙකු ජීවිතයෙන් තොර නො කළ යුතු ය. යම් මහණෙක් දැන දැන යටත් පිරිසෙයින් ගැබ් හෙළීම පටන් මිනිස් සිරුරක් ජීවිතයෙන් තොර කෙරේ ද, හෙ තෙමේ ශ්‍රමණයෙක් නො වේ. ශාක්‍යපුත්‍රයෙක් නො වේ. යම් සේ දෙකට බිඳුනු මහත් ගලෙක් නො ගැලපිය හැකි වේ ද, එ පරිද්දෙන් ම මහණෙක් තෙමේ දැන දැන මිනිස් සිරුරක් ජීවිතයෙන් තොර කිරීම් හෙතුවෙන් ශ්‍රමණශාක්‍යපුත්‍රයෙක් නො වේ. තා විසින් එය දිවි තෙක් නො කට යුතු ය. (3)

5. උපසපන් මහණහු විසින් ධ්‍යානාදි උත්තරිමනුෂ්‍යධර්මය නො කිය යුතු ය. යටත් පිරිසෙයින් ශූන්‍යාගාරයෙහි ඇලෙමි යි ද නො කිය යුතු ය. යම මහණෙක් තෙමේ ලාමක ආසා ඇත්තේ ආසාවෙන් මඩනා ලද්දේ විද්‍යමාන නො වූ ධ්‍යානයක් හෝ විමොක්ෂයක් හෝ සමාධියක් හෝ සමාපත්තියක් හෝ මාර්ගයක් හෝ ඵලයක් හෝ යන උත්තරිමනුෂ්‍ය ධර්මය කියා ද, (හෙ තෙමේ) ශ්‍රමණයෙක් නො වේ. ශාක්‍යපුත්‍රයෙක් නො වේ. කරටිය කපා හළ තල්ගස නැවත හට ගැණීමට යම් සේ සුදුසු නො වේ ද, එ පරිද්දෙන් ම ලාමක ආසා ඇති ආසාවෙන් මැඩුනු ඒ මහණ තෙමේ අවිද්‍යමාන වූ උත්තරිමනුෂ්‍යධර්මය කියා පෑම හෙතු කොට ශ්‍රමණශාක්‍යපුත්‍රයෙක් නො වේ. තා විසින් එය දිවි තෙක් නො කට යුතු ය. (4)

**සතර අකරණීයයෝ නිමි.**

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො විබ්භමි. සො පුන පච්චාගන්ත්වා භික්ඛූ උපසම්පදං යාචි. භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො විබ්භමති, සො පුන පච්චාගන්ත්වා භික්ඛූ උපසම්පදං යාචති, සො එවමස්ස වචනීයො: 'පස්සිස්සසි තං ආපත්ති' න්ති. සචාහං පස්සිස්සාමී ති, පබ්බාජෙතබ්බො. සචාහං න පස්සිස්සාමී ති, න පබ්බාජෙතබ්බො. පබ්බා-ජෙත්වා වත්තබ්බො: 'පස්සිස්සසි තං ආපත්ති' න්ති. සචාහං පස්සිස්සාමී ති, උපසම්පාදෙතබ්බො. සචාහං න පස්සිස්සාමී ති, න උපසම්පාදෙතබ්බො. උපසම්පාදෙත්වා වත්තබ්බො: 'පස්සිස්සසි තං ආපත්ති' න්ති. සචාහං පස්සිස්සාමී ති, ඔසාරෙතබ්බො. සචාහං න පස්සිස්සාමී ති, න ඔසාරෙතබ්බො. ඔසාරෙත්වා වත්තබ්බො: 'පස්සාහි [1] තං ආපත්ති'න්ති. සචෙ පස්සති, ඉච්චෙතං කුසලං. නො චෙ පස්සති, ලබ්භමානාය සාමග්ගියා පුන උක්ඛිපිතබ්බො. අලබ්භමානාය සාමග්ගියා අනාපත්ති සම්භොගෙ සංවාසෙ."

3. "ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො විබ්භමති, සො පුන පච්චාගන්ත්වා භික්ඛූ උපසම්පදං යාචති, සො එවමස්ස වචනීයො: 'පටිකරිස්සසි තං ආපත්ති' න්ති. සචාහං පටිකරිස්සාමී ති, පබ්බාජෙතබ්බො. සචාහං න පටිකරිස්සාමී ති න පබ්බාජෙතබ්බො. පබ්බාජෙත්වා වත්තබ්බො: 'පටිකරිස්සසි තං ආපත්ති' න්ති. සචාහං පටිකරිස්සාමී ති, උපසම්පාදෙතබ්බො. සචාහං න පටිකරිස්සාමී ති, න උපසම්පාදෙතබ්බො. උපසම්පාදෙත්වා වත්තබ්බො: 'පටිකරිස්සසි තං ආපත්ති' න්ති. සචාහං පටිකරිස්සාමී ති, ඔසාරෙතබ්බො. සචාහං න පටිකරිස්සාමී ති, න ඔසාරෙතබ්බො. ඔසාරෙත්වා වත්තබ්බො: 'පටිකරොහි තං ආපත්ති' න්ති. සචෙ පටිකරොති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිකරොති, ලබ්භමානාය සාමග්ගියා පුන උක්ඛිපිතබ්බො. අලබ්භමානාය සාමග්ගියා අනාපත්ති සම්භොගෙ සංවාසෙ."

4. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො විබ්භමති, සො පුන පච්චාගන්ත්වා භික්ඛූ උපසම්පදං යාචති, සො එවමස්ස වචනීයො: 'පටිනිස්සජ්ජිස්සසි තං පාපිකං දිට්ඨි' න්ති. සචාහං පටිනිස්සජ්ජිස්සාමී ති, පබ්බාජෙතබ්බො. 'සචාහං' න පටිනිස්ස-ජ්ජිස්සාමීති, න පබ්බාජෙතබ්බො. පබ්බාජෙත්වා වත්තබ්බො: 'පටිනිස්සජ්ජිස්සසි තං පාපිකං දිට්ඨි' න්ති. 'සචාහං පටිනිස්සජ්ජිස්සාමී ති, උපසම්පා-දෙතබ්බො. සචාහං න පටිනිස්සජ්ජිස්සාමී ති, න උපසම්පාදෙතබ්බො. උපසම්පාදෙත්වා වත්තබ්බො: 'පටිනිස්සජ්ජිස්සසි තං පාපිකං දිට්ඨි' න්ති. සචාහං පටිනිස්සජ්ජිස්සාමී ති, ඔසාරෙතබ්බො. සචාහං න පටිනිස්සජ්ජිස්සාමී ති න ඔසාරෙතබ්බො. ඔසාරෙත්වා වත්තබ්බො: 'පටිනිස්සජ්ජාහි [2] තං පාපිකං දිට්ඨි'න්ති. සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජති, ලබ්භමානාය සාමග්ගියා පුන උක්ඛිපිතබ්බො. අලබ්භමානාය සාමග්ගියා අනාපත්ති සම්භොගෙ සංවාසෙ" ති.

**මහාඛන්ධකො පඨමො.**

---

1. "පස්සසි තං ආපත්තිං" මජ සං. PTS "පස්සසෙතං" තො වි. ම නු ප. ජ පු.
2. "පටිනිස්සජ්ජ." ඉතිපි පාඨො.

1. එකල්හි එක්තරා මහණෙක් තෙමේ ඇවැත් නො දැක්මෙහි උත්ක්‍ෂේපණීයකර්‍මය කරණ ලද්දේ සිවුරු හැර ගියේ ය. හෙතෙමේ නැවත පෙරළා අවුත් භික්‍ෂූන්ගෙන් උපසම්පදාව ඉල්ලී ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් තෙමේ ඇවැත් නො දැක්මෙහි උත්ක්‍ෂේපණීයකර්‍මය කරණ ලද්දේ සිවුරු හරියි. හෙ තෙමේ නැවත පෙරළා අවුත් භික්‍ෂූන්ගෙන් උපසම්පදාව ඉල්ලයි. එකල්හි ඔහුට 'ඒ ඇවැත දකින්නෙහි ද?' යි කිය යුතු ය. ඉදින් 'මම දකින්නෙමි' යි කියා නම්, පැවිදි කළ යුතු ය. ඉදින් 'මම නො දකින්නෙමි' යි කියා නම්, පැවිදි නො කළ යුතු ය. පැවිදි කොට 'ඒ ඇවැත දකින්නෙහි ද' යි කිය යුතු ය. ඉදින් 'මම දකින්නෙමි' යි කියා නම්, උපසපත් කළ යුතු ය. ඉදින් 'මම නො දකින්නෙමි' යි කියා නම්, උපසපත් නො කළ යුතු ය. උපසපත් කොට 'ඒ ඇවැත දකින්නෙහි ද' යි කිය යුතු ය. ඉදින් 'මම දකින්නෙමි' යි කියා නම්, (සඟ පිරිසට) ඇතුළත් කර ගත යුතු ය. 'මම නො දකින්නෙමි' යි කියා නම්, ඇතුළත් කර නො ගත යුතු ය. ඇතුළත් කොට 'ඒ ඇවැත දකුව' යි කිය යුතු ය. ඉදින් දකී නම්, මෙය යහපත් ය. ඉදින් නො දකී නම්, සමගිය ලැබෙන කල නැවත උත්ක්‍ෂේපණීයකර්‍මය කළ යුතු ය. සමගිය නො ලත් කල ප්‍රත්‍යයසම්භොගයෙහි ද සමාන සංවාසයෙහි ද ඇවැත් නො වේ."

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් තෙමේ ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්‍ෂේපණීය කර්‍මය කරණ ලද්දේ සිවුරු හරියි. හෙතෙමේ නැවත පෙරළා අවුත් භික්‍ෂූන්ගෙන් උපසම්පදාව ඉල්ලයි. ඔහුට 'ඒ ඇවැතට පිළියම් කරන්නෙහි ද?' යි මෙසේ කිය යුතු ය. ඉදින් 'මම පිළියම් කරන්නෙමි' යි කියා නම්, පැවිදි කළ යුතු ය. ඉදින් 'මම පිළි-යම් නො කරන්නෙමි' යි කියා නම්, පැවිදි නො කළ යුතු ය. පැවිදි කොට 'ඒ ඇවතට පිළියම් කරන්නෙහි ද?' යි කිය යුතු ය. ඉදින් 'මම පිළියම් කරන්නෙමි' යි කියා නම්, උපසපත් කළ යුතු ය. ඉදින් 'මම පිළියම් නො කරන්නෙමි' යි කියා නම්, උපසපත් නො කළ යුතු ය. උපසපත් කොට 'ඒ ඇවතට පිළියම් කරන්නෙහි ද' යි කිය යුතු ය. ඉදින් 'මම පිළියම් කරන්නෙමි' යි කියා නම්, (සඟ පිරිසට) ඇතුළත් කළ යුතු ය. 'ඉදින් මම පිළියම් නො කරන්නෙමි' යි කියා නම්, ඇතුළත් නො කළ යුතු ය. ඇතුළත් කොට 'ඒ ඇවතට පිළියම් කරව' යි කිය යුතු ය. ඉදින් පිළියම් කෙරේ නම්, මෙය යහපත් ය. පිළියම් නො කෙරේ නම්, සමගිය ලැබෙන කල නැවත උත්ක්‍ෂේපණීයකර්‍මය කළ යුතු ය. සමගිය නො ලැබෙන කල ප්‍රත්‍යයසම්භොගයෙහි ද සමාන සංවාසයෙහි ද ඇවැත් නො වේ."

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් තෙමේ ලාමකදෘෂ්ටිය නො හැරීමෙහි උත්ක්‍ෂේපණීයකර්‍මය කරණ ලද්දේ සිවුරු හරියි. හෙතෙමේ නැවත පෙරළා අවුත් භික්‍ෂූන්ගෙන් උපසම්පදාව ඉල්ලයි. ඔහුට 'ඒ ලාමකදෘෂ්ටිය හරින්නෙහි ද?' යි කිය යුතු ය. ඉදින් 'මම හරින්නෙමි' යි කියා නම්, පැවිදි කළ යුතු ය. 'ඉදින් මම නො හරින්නෙමි' යි කියා නම්, පැවිදි නො කළ යුතු ය. පැවිදි කොට 'ඒ ලාමකදෘෂ්ටිය හරින්නෙහි ද'? යි කිය යුතු ය. 'ඉදින් මම හරින්නෙමි' යි කියා නම්, උපසපත් කළ යුතු ය. ඉදින් 'මම නො හරින්නෙමි' යි කියා නම් උපසපත් නො කළ යුතු ය. උපසපත් කොට 'ඒ ලාමකදෘෂ්ටිය දුරු කරන්නෙහි ද?' යි කිය යුතු ය. ඉදින් 'මම දුරුකරන්නෙමි' යි කියා නම්, (සඟ පිරිසට) ඇතුළත් කළ යුතු ය. 'මම දුරු නො කරන්නෙමි' යි කියා නම්, ඇතුළත් නො කළ යුතු ය. ඇතුළත් කොට 'ඒ ලාමකදෘෂ්ටිය හරුව' යි කිය යුතු ය. ඉදින් හරින්නේ නම්, යහපත් ය. නො හරින්නේ නම්, සමගිය ලැබෙන කල නැවත උත්ක්‍ෂේපණීයකර්‍මය කළ යුතු ය. සමගිය නො ලැබෙන කල ප්‍රත්‍යයසම්භොගයෙහි ද සමානසංවාසයෙහි ද ඇවැත් නො වේ."

**ප්‍රථම වූ මහාඛන්ධකය නිමි.**

---

1. විනයම්හි මහත්ථෙසු[1] පෙසලානං සුඛාවහෙ,
නිග්ගහානඤ්ච පාපිච්ඡෙ ලජ්ජීනං පග්ගහෙසු ච.

සාසනාධාරණෙ චෙව[2] සබ්බඤ්ඤුජිනගොචරෙ,
අනඤ්ඤවිසයෙ ඛෙමෙ සුපඤ්ඤත්තෙ අසංසයෙ.

ඛන්ධකෙ විනයෙ චෙව පරිවාරෙ ච මාතිකෙ,
යථාත්ථකාරී කුසලො පටිපජ්ජති යොනිසො.

2. යො ගවං න විජානාති න සො රක්ඛති ගොගණං,
එවං සීලං අජානන්තො කිං සො රක්ඛෙය්‍ය සංවරං?

3. පමුට්ඨම්හි ච[3] සුත්තන්තෙ අභිධම්මෙ ච තාවදෙ,
විනයෙ අවිනට්ඨම්හි පුන තිට්ඨති සාසනං.

4. තස්මා සඞ්ගාහනාහෙතු[4] උද්දානං අනුපුබ්බසො,
පවක්ඛාමි යථාඤායං සුණොථ[5] මම භාසතො.

5. වත්ථු[6] නිදානං ආපත්ති නයා පෙය්‍යාලමෙව ච,
දුක්කරං තං අසෙසෙතුං නයතො තං විජානථා ති.

6. බොධී ච රාජායතනං[7] අජපාලො[8] සහම්පති,
බ්‍රහ්මා ආළාරො උද්දො ච[9] භික්ඛු ච උපකො ඉසි.

7. කොණ්ඩඤ්ඤො භද්දියො වප්පො[10] මහානාමො ච අස්සජි,
යසො චත්තාරො පඤ්ඤාස[11] සබ්බෙ පෙසෙසි සො දිසා.

8. වත්ථු මාරෙහි තිංසා ච උරුවෙලං තයො ජටී,
අග්‍යාගාරං මහාරාජා සක්කො බ්‍රහ්මා ච කෙවලා.[12]

9. පංසුකූලං පොක්ඛරණී සිලා ච කකුධො සිලා,
ජම්බු අම්බො ච ආමලො[13] පාරිපුප්ඵඤ්ච ආහරි.

10. ඵාලියන්තු උජ්ජලන්තු විජ්ඣායන්තු ච කස්සප,
නිමුජ්ජන්ති[14] මුඛී මෙඝො ගයා ලට්ඨි ච මාගධො.

11. උපතිස්සො කොලිතො ච අභිඤ්ඤාතා ච පබ්බජුං,[15]
දුන්නිවත්ථා පනාමනා කිසො ලූඛො ච බ්‍රාහ්මණො.

12. අනාචාරං ආචරති උද්දරං මාණවො ගණො,
වස්සං බාලෙහි පක්කන්තො දසවස්සානි නිස්සයො.

---

1. "මහත්ථෙසු" අ වි. ජ පු. 2. "සාසනෙ ධාරණෙ චෙව" තො වි. ම නු ප
3. "පම්මුට්ඨම්හි ච" ජ පු. අ වි. 4 "හෙතුං" ජ පු. අ වි. ම ඡ සං.
5. "සුණාථ" ම ඡ සං. P T S. 6. "වත්ථුං" තො වි. අ වි. ජ පු. ම නු ප.
7. "බොධිරාජායතනං ච" ම ඡ සං "බොධීරාජායතනං" තො වි. ම නු ප.
8. අජපාලෙ" අ වි. ජ පු. ම නු ප. තො වි. 9. "උදකො" ම ඡ සං. "උද්දකො" P T S.
10. "වප්පො භද්දියො" ම ඡ සං. P T S. අ වි. සි මු.
11. "යසො චත්තාරී පඤ්ඤාස" අ වි. ජ පු. සි මු 12. "කෙවලො" සි මු. P T S.
13. "ආමලකො" ම ඡ සං. P T S. 14. "නිමුජ්ජන්තු" තො වි. ම නු ප.
15. "පබ්බජං" P T S.

Free Distribution www.aathaapi.org

1. ප්‍රියශීලී භික්ෂූන්ට සැප එළවන්නා වූ, ලාමක ආශා ඇති භික්ෂූන්ට නිග්‍රහ කිරීමට කරුණු වූ, ලජ්ජී භික්ෂූන්ට රුකුලක් වූ, ත්‍රිවිධ ශාසනය දරන්නා වූ, සියල්ල දත් බුදුරජුන්ට විෂය වූ, අන්‍යයනට විෂය නොවූ, බිය රහිත වූ, මනා කොට පණවන ලද, සැක රහිත වූ, මහත් අර්ථ ඇති විනය පිටකය ඇති කල්හි ඛන්ධක විනයෙහි ද පරිවාර විනයෙහි ද මාතෘකා විනයෙහි ද අරුත් පරිදි කරන්නා වූ දක්‍ෂ පුද්ගල තෙමේ නුවණින් පිළිපදී.

2. යමෙක් (තමාගේ) ගව රැළ (මෙතෙකැ යි) නො දනී ද, හෙතෙමේ ගව සමූහයා නො රකී. එපරිද්දෙන් සීලය නො දන්නා වූ ඒ පුද්ගල තෙමේ කිනම් සංවරයක් රකින්නේ ද?

3. සූත්‍රපිටකය පිරිහී ගියත් එසේ ම අභිධර්මපිටකය පිරිහී ගියත් විනයපිටකය නො නැසී පවත්නා තාක් ශාසනය පවත්නේ ය.

4. එහෙයින් සඞ්ග්‍රහ කිරීමට හේතු වූ උද්දානය (වස්තුනාමාවලිය) පිළිවෙළින් න්‍යායානුකූලව කියන්නෙමි. කියන්නා වූ මාගේ වචනය අසවු.

5. වස්තු- නිදාන - ආපත්ති - නය - පෙය්‍යාල යන ඒ සියල්ල සම්පූර්ණ කොට දැක්වීම දුෂ්කර වේ. ක්‍රමය අනු ව එය දැන ගණිවු.

6. බොධිකථා ද මුචලින්දකථා ද රාජායතනකථා ද අජපාලකථා ද සහම්පතිබ්‍රහ්මයාචනකථා ද ආළාර-කාලාමකථා ද උද්දකරාමපුත්‍රකථා ද පඤ්චවග්ගීයකථා ද උපකාජීවකකථා ද වෙයි.

7. කොණ්ඩඤ්ඤ- භද්දිය- වප්ප- මහානාම- අස්සජි- යස යන ස්ථවිර-කථා ද චතුසහායකකථා ද පඤ්ඤාසසහායකකථා ද වෙයි. බුදුරජානන් වහන්සේ මේ සියලු භික්ෂූන් දහම් දෙසන්නට ඒ ඒ දිශාවන්හි යැවූහ.

8. රත්නත්‍රයශරණගමනකථා ද මාරකථා ද තිංසභද්දවග්ගිකකථා ද උරුවෙල- නදී- ගයාකස්සප ජටිලදමනකථා ද ගිනිහල් ගෙට පිවිසීම ද සතරවරම් මහරජුන්ගේ පැමිණීම ද සක්දෙවිඳුගේ පැමිණීම ද මහා-බ්‍රහ්මයාගේ පැමිණීම ද අඟුම්ගද වැස්සන්ගේ පැමිණීම ද වෙයි.

9. පංසුකූලය ලැබීම, පොකුණක් සෑරීම, ගලක් එළවීම, කකුධකථා, සිලාකථා, ජම්බු- අම්බ- ආමලකී- පාරිච්ඡත්තකකථා ද වෙයි.

10. දඬු පැළීම, ගිනි දැල්වීම, ගිනි නිවීම, දියෙහි ගිලීම, නොකල් වැස්ස, ගයාහි විසීම, ලට්ඨිවනයෙහි විසීම, බිම්සරරජු බුදුරජුන් සරණ යෑම ද වෙයි.

11. උපතිස්ස- කොලිතපරිව්‍රාජක, අභිඥාතපුරුෂ - යන කථා ද වෙයි. මොහු හැමදෙන පැවිදි වූහ. නො සකස් ව හැඳීම - පෙරවීම හා අපනාමනය ද රාධබ්‍රාහ්මණයාගේ පැවිද්ද ද වෙයි.

12. අනාචාරයෙහි හැසිරෙයි. උදරය නිසා පැවිදිවීම ද මාණවකයකු නිස්සය සතර පිළිකුල් කොට පැවිදි නො වීම ද ගණොපසම්පදාව ද ඌන-දසවස්සික වූ භික්ෂූන් විසින් සද්ධිවිහාරිකයන් උපසපත් නො කටයුතු බව ද ධර්මවිනය නො දත්තන් උපසපත් නො කටයුතු බව හා උපාධ්‍යායයන් බැහැර යෑම ද දසවස් නිස ගැණීම හා නිස දීම ද - වෙයි.

13. න වත්තන්ති පනාමෙතුං බාලා පස්සද්ධි පඤ්ච ඡ [1],
යො සො අඤ්ඤො ච නග්ගො ච අච්ඡින්නජටිසාකියො [2].

14. මගධෙසු පඤ්ච ආබාධා එකො රාජා ච අඞ්ගුලි [3],
මාගධො ච අනුඤ්ඤාසි කාරා ලිඛි කසාහතො.

15. ලක්ඛණා ඉණදාසා ච [4] භණ්ඩුකො උපාලි අහි,
සද්ධං කුලං කණ්ටකො ච [5] ආහුන්දරිකමෙව ච.

16. වත්ථුස්මිං දාරකො සික්ඛා විහරන්ති ච කින්නු ඛො,
සබ්බං මුඛං උපජ්ඣායෙ අපලාළනකණ්ටකො [6].

17. පණ්ඩකො ථෙය්‍යපක්කන්තො අහි ච මාතරං පිතා,
අරහන්තභික්ඛුනිභෙදා රුහිරෙන ච බ්‍යඤ්ජනං.

18. අනුපජ්ඣායසඞ්ඝෙන ගණපණ්ඩක'පත්තකා [7],
අචීවරං තදූභයං යාචිතෙනපි යෙ තයො.

19. හත්ථා පාදා හත්ථපාදා කණ්ණනාසා තදූභයං,
අඞ්ගුලී අළකණ්ඩරං ඵණං ඛුජ්ජඤ්ච වාමනං.

20. ගලගණ්ඩී ලක්ඛණා චෙව [8] කසාලිඛිත සීපදී [9],
පාප පරිසදූසී ච කාණකුණී [10] තථෙව ච.

21. ඛඤ්ජං පක්ඛහතඤ්චෙව සඤ්ඡින්නඉරියාපථං,
ජරාන්ධමූගබධිරං අන්ධමූගඤ්ච යං තහිං.

22. අන්ධබධිරං යං වුත්තං මූගබධිරමෙව ච,
අන්ධමූගබධිරඤ්ච අලජ්ජීනඤ්ච නිස්සයං.

23. වත්ථබ්බං ච තථාද්ධානං යාචමානෙන පෙක්ඛනා,
ආගච්ඡතු [11] විවාදෙන්ති එකූපජ්ඣෙන කස්සපො.

24. දිස්සන්ති උපසම්පන්නා ආබාධෙහි ච පීළිතා,
අනනුසිට්ඨා විත්ථෙන්ති [12] තත්ථෙව අනුසාසනා,

25. සඞ්ඝෙපි ච අථො බාලො [13] අසම්මතො ච [14] එකතො,
උල්ලුම්පතුපසම්පදා නිස්සයො එකකො තයොති.

**ඉමම්හි ඛන්ධකෙ වත්ථු එකසතං ද්වාසත්තති.**
**මහාඛන්ධකෙ උද්දානං නිට්ඨිතං.**

---

1. "බාලපස්සද්ධි පඤ්චකායො" අ වි. ජ පු.
,, "බාලපස්සද්ධි පච්චයො" ම නු ප. තො වි.
2. "අච්ඡින්නජටිලසාකියො" ම ඡ සං. අච්ඡින්නං ජටිසාකියො" P T S.
3. "එකො භටො චොරෙ" සි. "එකො චොරො ච අඞ්ගුලි" P T S.
4. "ඉණදාසො ච" ම ඡ සං P T S. අ වි. 5. "භණ්ඩකො ච" අ වි. ජ පු.
6. "අපලාළනකණ්ඩකො" P T S.
7. "ගණපණ්ඩකාපත්තකෙ" P T S. අ වි. ජ පු.
8. "ලක්ඛනාකසා" ම නු ප. තො වි. 9. "ලිඛිතඤ්චසීපදී" ම නු ප. තො වි.
10. "කාණංකුණිං" P T S.
11. "ආගච්ඡන්තු" ම නු ප. තො, වි. "ආගච්ඡන්ති" අ වි.
,, "ආගච්ඡන්තං" P T S. 12. "විත්ථෙන්ති" ම ඡ සං. "විත්ථායන්ති" P T S
13. "බාලා" ම ඡ සං. 14. "අසම්මතා" ම ඡ සං.

13. නො මනා පැවැත්ම, අපනාමනය, නො වියත්නිසැදුරු, නිස සත්සිඳුම් පස හා සය, තීර්ථකයන් වෙතින් ආවුන් උපසපන් නො කිරීම, අන්‍ය තීර්ථකපරිවාසය, නග්නයනට සිවුරු දීම, භණ්ඩුකර්මය, කර්මක්‍රියාවාදීන්ගේ පැවිදි උපසම්පදා, අන්‍යතීර්ථකශාක්‍යයන්ගේ පැවිදි උපසම්පදා යන මේ ද වෙයි.

14. මගදදනව්වෙහි පඤ්ච ආබාධයන්ගෙන් මැඩුනවුන් පැවිදි උපසපන් නො කිරීම, රාජභටයන් පැවිදි නො කිරීම, අඟුල්මල් සොරු පිළිබඳ පුවත, බිම්සරරජු කළ තහනම, සිරගෙය බිඳ පලා ගිය - රජයේ ලියාතැබූ - කස පහර කෑ සොරුන් පැවිදි නො කිරීම යන මේ ද වෙයි.

15. ලකුණු කෙටූ සොරුන් - නය ගැතියන් - දාසයන් පැවිදි නො කිරීම, භණ්ඩුකර්මය අනුදැනීම, (විසි වස් නො පිරුණු) සප්තදශවර්ගිකයන්ගේ උපසම්පදාප්‍රතික්ෂේපය, අහිවාතකරෝගීකුලයෙන් පැවිදි වීම, අහිවාතක රෝගයෙන් මිය ගියවුන් ඇති ශ්‍රද්ධාවත්කුලයෙන් පැවිදි වීම, කණ්ටකපැවිද්ද, ආහුන්දරිකවස්තුව යන මේ ද වෙයි.

16. නිස සමාදන් ව විසිය යුතු නො විසිය යුතු කාලය, දරු පැවිද්ද, සික පද අනුදැනීම, ගරු බුහුමන් නැති ව විසීම, දඬුවම් කිම් දැයි පිළිවිසීම, සියලු සඞ්ඝාරාමය ඇවිරීම, මුඛද්වාරිකවස්තුව, උපාධ්‍යායයන් නො විචාරා ඇවිරීම, තමන්ට නතු කර ගැණීම, කණ්ටකහෙරණහු කණ්ටකී හෙරණිය දූෂිත කිරීම යන මේ ද වේ.

17-18. පණ්ඩක - ථෙය්‍යසංවාසක - නාග-මාතෘඝාතක- පිතෘඝාතක - අරහන්තඝාතක - භික්ඛුණීදූසක - සඞ්ඝභෙදක - ලොහිතුප්පාදක - උභතො ව්‍යඤ්ජනකයන් පැවිදි උපසපන් නො කිරීම, සිවුරෙන් මුඳු ලීම, අනුපජ්ඣායක- සඞ්ඝ - ගණ - පණ්ඩකාදි උපජ්ඣාය උපසම්පදාප්‍රතික්ෂේපය, අපත්තක - අචීවරක - අපත්ත අචීවරක උපසම්පදා ප්‍රතික්ෂේපය, පිරුළෙන් ගත් පාත්‍රය - චීවරය - පාත්‍රචීවරය ගෙණ උපසපන් නො කිරීම යන මේ ද වේ.

19. අත් - පා - අත්පා - කන් - නාස් - කන් නාස් - ඇඟිලි - මාපටඇඟිලි - මහනහර කැපූවන් හා ඵණහත්ථක - ඛුජ්ජ - වාමනයන් පැවිදි නො කිරීම ද වේ.

20. ගලගණ්ඩික - ලක්ඛණාහත - කසාහත - ලිඛිතක - සීපදි - පාපරෝගී - පරිසදූසක - කාණ - කුණී යන මොවුන් පැවිදි නො කිරීම ද වේ.

21. ඛඤ්ජ - පක්ඛහත - ඡින්නිරියාපථ - ජරාදුබ්බල - අන්ධ-මූග - බධිර - අන්ධ මූගයන් පැවිදි නො කිරීම ද වේ.

22. අන්ධබධිර - මූගබධිර - අන්ධමූගබධිරයන් පැවිදි නො කිරීම, අලජ්ජීන්ට නිස නො දීම ද වේ.

23. අලජ්ජීන්ගෙන් නිස නො ගැණීම, අධ්වමග දී නිස නො ගැණීම, ගලානොපස්ථායකයන් නිස නො ගැණීම, ආරණ්‍යක භික්ෂූන්ගේ නිඃශ්‍රයාපෙක්ෂාව, ආනන්දස්ථවිරානුශ්‍රාවණය, එකොපාධ්‍යායානුශ්‍රාවණවිවාදය, කුමාරකාශ්‍යපොපසම්පදාව යන මේ කථා ද වෙයි.

24-25. පඤ්චාබාධයන්ගෙන් පෙළුනු උපසම්පන්නයෝ දක්නා ලැබෙත්. අනුශාසනා නො කරණ ලද්දෝ නැති ගණිත්. උන් පිළිබඳ අනුශාසනය, සඟ මැදින් බැහැරට ගෙණ අනුශාසනා කිරීම, බාල - අසම්මත අනුශාසනා ප්‍රතික්ෂේපය, අනුශාසකයන් උපසම්පදාපෙක්ෂකයන් හා එක් ව පැමිණීම, උපසම්පදායාචනය, සිවු නිස කීම, එකලා ව නො යෑම, උක්ඛිත්තකයන් තිදෙන යන මොහු ද වෙත්.

**මේ ඛන්ධකයෙහි වස්තු එක්සියදෙසැත්තෑවකි.** *

**මහාඛන්ධකයෙහි උද්දානය (වස්තුනාමාවලිය) නිමි.**

---

* උපග්‍රන්ථය බලනු.

# 2

# උපොසථක්ඛන්ධකං.

---

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා ධම්මං භාසන්ති. තෙ මනුස්සා උපසඞ්කමන්ති ධම්මසවණාය. තෙ ලභන්ති අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු පෙමං. ලභන්ති පසාදං. ලභන්ති අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පක්ඛං.

2. අථ ඛො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස **බිම්බිසාරස්ස** රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "එතරහි ඛො අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා ධම්මං භාසන්ති. තෙ මනුස්සා උපසඞ්කමන්ති ධම්මසවණාය. තෙ ලභන්ති අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු පෙමං. ලභන්ති පසාදං. ලභන්ති අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පක්ඛං. යන්නූන අය්‍යාපි චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතෙය්‍යු" න්ති.

3. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවන්තං එතදවොච:-

4. "ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'එතරහි ඛො අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා ධම්මං භාසන්ති. තෙ මනුස්සා උපසඞ්කමන්ති ධම්මසවණාය. තෙ ලභන්ති අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු පෙමං. ලභන්ති පසාදං. ලභන්ති අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා පක්ඛං. යන්නූන අය්‍යාපි චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතෙය්‍යු' න්ති. සාධු භන්තෙ, අය්‍යාපි චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතෙය්‍යු" න්ති.

5. අථ ඛො භගවා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

6. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, චාතුද්දසෙ **පඤ්චදසෙ** අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිතු" න්ති.

# 2
# උපොසථක්ඛන්ධකය.

---

1. එකල්හි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ **රජගහ**නුවර සමීපයෙහි වූ **ගිජ්ඣකූට**පව්වෙහි වසන සේක. එසමයෙහි අන්‍යතීර්ථික පරිව්‍රාජකයෝ තුදුස්වක්හි ද පසළොස්වක්හි ද පක්‍ෂයේ අටවක්හි ද එක් තැන් වී දහම් (කටයුතු නො කටයුතු) කියා දෙත්. මිනිස්සු ඒ දහම් ඇසීමට ඔවුන් වෙත යත්. ඔහු අන්‍යතීර්ථිකපරිව්‍රාජකයන් කෙරෙහි ප්‍රේමය ලබත්. පැහැදීම ලබත්. අන්‍යතීර්ථිකපරිව්‍රාජකයෝ පක්‍ෂබල ලබත්.

2. එකල්හි එකලා වූ සිත එකඟ කොට සිටි මගධේශ්වර වූ සෙනා ඇති **බිම්බිසාර** රජහට "දැන් අන්‍යතීර්ථික පරිව්‍රාජකයෝ තුදුස්වක්හි පසළොස්වක්හි පක්‍ෂයේ අටවක්හි රැස් වී ධර්‍මය කියා දෙත්. ඒ මිනිස්සු ඒ දහම් ඇසීමට ඔවුන් වෙත යත්. එයින් ඔහු අන්‍යතීර්ථිකපරිව්‍රාජකයන් කෙරෙහි ප්‍රේමය ලබත්. පැහැදීම ලබත්. අන්‍යතීර්ථිකපරිව්‍රාජකයෝ පක්‍ෂබල ලබත්. අපගේ ආයුෂ්මතුන් වහන්සේලා ත් තුදුස්වක්හි පසළොස්වක්හි පක්‍ෂයේ අටවක්හි රැස් වන්නාහු නම්, වැඩෙක් වන්නේ ය"යි සිත් වි ය.

3. ඉක්බිති මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාරරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ, භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාරරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළේ ය:

4. "ස්වාමීනි, මෙහි එකලා ව සිත එකඟ කොට සිටි මට, 'දැන් අන්‍යතීර්ථිකපරිව්‍රාජකයෝ තුදුස්වක්හි පසළොස්වක්හි පක්‍ෂයේ අටවක්හි රැස් වී (මිනිසුන්ට) යුතු අයුතුකම් කියා දෙති. මිනිස්සු ඒ ඇසීමට ඔවුන් කරා යන්නෝ ය. එයින් ඔහු අන්‍යතීර්ථික පරිව්‍රාජකයන් කෙරෙහි ප්‍රේමය ලබත්. පැහැදීම ලබත්. අන්‍යතීර්ථිකපරිව්‍රාජකයෝ පක්‍ෂබල ලබත්. අප ගේ ආයුෂ්මතුන් වහන්සේලා ත් තුදුස්වක්හි පසළොස්වක්හි පක්‍ෂයේ අටවක්හි රැස් වන්නෝ නම්, වැඩෙක් වන්නේ ය' යි සිත් වි ය. 'ස්වාමීනි, ආයුෂ්මතුන් වහන්සේලා ත් තුදුස්වක්හි පසළොස්වක්හි පක්‍ෂයේ අටවක්හි රැස් වන්නාහු නම් යහපතැ" යි රජ තෙමේ සැළකෙළේ ය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුට දැහැමි කතාවෙන් කරුණු දැක්වූහ. සමාදන් කරවූහ. තියුණු කරවූහ. සතුටු කරවූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමිකතාවෙන් කරුණු දක්වනලද සමාදන් කරවනලද තියුණු කරවනලද සතුටු කරවනලද මගධේශ්වර වූ සෙනියබිම්බිසාරරජ තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

6. අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්‍ෂූන් ඇමතූ සේක: "මහණෙනි, තුදුස්වක්හි පසළොස්වක්හි පක්‍ෂයේ අටවක්හි රැස් වන්නට අනුදනිමි"යි වදාළසේක.

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ "භගවතා අනුඤ්ඤාතං[1] චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිතු"න්ති චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා තුණ්හී නිසීදන්ති. තෙ මනුස්සා උපසඞ්කමන්ති ධම්මසවණාය. තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා තුණ්හී නිසීදිස්සන්ති සෙය්‍යථාපි මූගසූකරා?[2] නනු නාම සන්නිපතිතෙහි ධම්මො භාසිතබ්බො?" ති.

8. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

9. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස සන්නිපතිත්වා ධම්මං භාසිතු"න්ති.

10. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යන්නූනාහං යානි මයා භික්ඛූනං පඤ්ඤත්තානි සික්ඛාපදානි, තානි නෙසං පාතිමොක්ඛුද්දෙසං අනුජානෙය්‍යං, සො නෙසං භවිස්සති උපොසථකම්ම"න්ති.

11. අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "ඉධ මය්හං භික්ඛවෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'යන්නූනාහං යානි මයා භික්ඛූනං පඤ්ඤත්තානි සික්ඛාපදානි, තානි නෙසං පාතිමොක්ඛුද්දෙසං අනුජානෙය්‍යං, සො නෙසං භවිස්සති උපොසථකම්ම'න්ති. අනුජානාමි භික්ඛවෙ, පාතිමොක්ඛං උද්දිසිතුං. එවඤ්ච පන භික්ඛවෙ, උද්දිසිතබ්බං. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:-

12. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො,[3] යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො උපොසථං කරෙය්‍ය. පාතිමොක්ඛං උද්දිසෙය්‍ය. කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං. පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ. පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තං සබ්බෙව සන්තා සාධුකං සුණොම. මනසි කරොම. යස්ස සියා ආපත්ති, සො ආවිකරෙය්‍ය. අසන්තියා ආපත්තියා තුණ්හී භවිතබ්බං. තුණ්හීභාවෙන ඛො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි. යථා ඛො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති, එවමෙවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතං හොති. යො පන භික්ඛු යාව තතියං අනුසාවියමානෙ සරමානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය, සම්පජානමුසාවාදස්ස හොති. සම්පජානමුසාවාදො ඛො පනායස්මන්තො අන්තරායිකො ධම්මො වුත්තො භගවතා. තස්මා සරමානෙන භික්ඛුනා ආපන්නෙන විසුද්ධාපෙක්ඛෙන සන්තී ආපත්ති ආවිකාතබ්බා. ආවිකතා හිස්ස ඵාසු හොතී" ති.

1. "අනුඤ්ඤාතා" ම ජ සං. 2. "මිගසූකරා" අ වි. තො වි. ම නු ප.
3. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජ උපොසථො පණ්ණරසො" PTS.

Free Distribution www.aathaapi.org

7. එකල්හි භික්ෂූහු “භාග්‍යවතුන් වහන්සේ විසින් තුදුස්වක්හි පසළොස්වක්හි පක්ෂයේ අටවක්හි රැස් වන්නට අනුදන්නාලද” යි තුදුස්වක්හි පසළොස්වක්හි පක්ෂයේ අටවක්හි රැස් වී නිශ්ශබ්ද ව හිඳිත්. මිනිස්සු දහම් ඇසීමට ඒ භික්ෂූන් වෙත පැමිණෙත්. ඒ මිනිස්සු “කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ තුදුස්වක්හි පසළොස්වක්හි පක්ෂයේ අටවක්හි රැස්ව ගොළු උෟරන් මෙන් නො බැණ හිඳිත් ද? රැස් වූවන් විසින් දහම් දෙසිය යුතු නො වේ දැ?” යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්.

8. භික්ෂූහු බණින දෙඩන දෙස් කියන ඒ මිනිසුන්ගේ බැණුම් දෙඩුම් ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ බව සැළකළහ.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි, මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: “මහණෙනි, තුදුස්වක්හි පසළොස්වක්හි පක්ෂයේ අටවක්හි රැස් වී දහම් දෙසන්නට අනුදනිමි” යි.

10. ඉන් පසු එකලා ව විවේකයෙන් වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේට “මා විසින් භික්ෂූන්ට යම් සිකපද කෙනෙක් පණවනලද ද, ඒ සිකපද ඔවුන්ට පාමොක් උදෙසීම් කොට අනුදන්නෙම් නම්, යෙහෙක. ඒ පාමොක් උදෙසීම ඔවුන්ට පෙහෙවස්කම් වන්නේ ය” යි අදහස් වි ය.

11. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්කාලයෙහි පලසමවතින් නැඟී සිටි සේක් මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: “මහණෙනි, මෙහි එකලා වූ පලසමවතින් යුක්ත වූ මට ‘මා විසින් භික්ෂූන්ට යම් සිකපද කෙනෙක් පණවනලද ද, ඒ සිකපද මම ඔවුන්ට පාමොක් උදෙසීම් කොට අනුදන්නෙම් නම් යෙහෙක. එය ඔවුන්ට පෙහෙවස්කම් වන්නේ ය’ යි සිත් වි ය. මහණෙනි, පාමොක් උදෙසන්නට අනුදනිමි. එය මෙසේ උදෙසිය යුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය:

12. “සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයාට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ පොහොය කරන්නේ ය. පාමොක් උදෙසන්නේ ය. සඞ්ඝයාගේ පූර්වකෘත්‍යය කිම? ආයුෂ්මතුනි, පිරිසිදුබව සැළකරවූ. පාමොක් උදෙසන්නෙමි. ඒ පාමොක් මේ පිරිසෙහි වූ අපි සියලු දෙන ම මනා කොට අසමු. මෙනෙහි කරමූ. යමකුට ඇවැතෙක් වේ නම්, හෙ තෙමේ එය කියන්නේ ය. ඇවැත් නැති කල්හි නිශ්ශබ්ද විය යුතු ය. නිශ්ශබ්ද වීමෙන් ආයුෂ්මතුන් පිරිසිදුහ යි දැන ගන්නෙමි. යම් සේ වෙන් වෙන් කොට විචාරණලද්දහුගේ (මා විචාරන්නේ ය යි දැන) විචාළ දෑ කීමෙක් වේ ද, එපරිද්දෙන් ම මෙබඳු පිරිස්හි තෙවනවර තෙක් අස්වන ලද්දේ වේ. යම් මහණෙක් තෙමේ තෙවනවර තෙක් අස්වනු ලබන කල්හි තමා කෙරෙහි ඇති ඇවැත සිහිපත් කරමින් ප්‍රකාශ නො කෙරේ නම්, සම්පජානමුසාවාදය වේ. ආයුෂ්මතුනි, සම්පජානමුසාවාදය අන්තරායකරධර්මයෙකැ යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. එහෙයින් ඇවැතට පැමිණියා වූ, ඒ ඇවැත සිහිපත් කරන්නා වූ, පිරිසිදුබව බලාපොරොත්තු වන්නා වූ, භික්ෂුහු විසින් ඇති ඇවැත කිය යුතු ය. ඒ එසේ ම ය. ප්‍රකාශ කිරීම හෙතු කොට ඒ ඔහට පහසු වෙයි.

13. ''පාතිමොක්ඛ'' න්ති ආදිමෙතං මුඛමෙතං පමුඛමෙතං කුසලානං ධම්මානං. තෙන වුච්චති ''පාතිමොක්ඛ'' න්ති.

14. ''ආයස්මන්තො'' ති පියවචනමෙතං. ගරුවචනමෙතං. සගාරව සප්පතිස්සවාධිවචනමෙතං ''ආයස්මන්තො'' ති.

15. ''උද්දිසිස්සාමී'' ති ආචික්ඛිස්සාමි. දෙසිස්සාමි.[1] පඤ්ඤපෙස්සාමි. පට්ඨපෙස්සාමි. විවරිස්සාමි. විභජිස්සාමි. උත්තානී කරිස්සාමි.[2] පකාසිස්සාමි.

16. ''තං'' ති පාතිමොක්ඛං වුච්චති.

17. ''සබ්බෙව සන්තා'' ති යාවතිකා තස්සා පරිසාය ථෙරා ච නවා ච මජ්ඣිමා ච, එතෙ වුච්චන්ති සබ්බෙව සන්තා ති.

18. ''සාධුකං සුණොමා''ති අට්ඨිකත්වා[3] මනසි කත්වා සබ්බචෙතසා[4] සමන්නාහරාම.

19. ''මනසි කරොමා'' ති එකග්ගචිත්තා අවික්ඛිත්තචිත්තා අවිසාහටචිත්තා නිසාමෙම.

20. ''යස්ස සියා ආපත්ති'' ති ථෙරස්ස වා නවස්ස වා මජ්ඣිමස්ස වා පඤ්චන්නං වා ආපත්තික්ඛන්ධානං අඤ්ඤතරා ආපත්ති. සත්තන්නං වා ආපත්තික්ඛන්ධානං අඤ්ඤතරා ආපත්ති.

21. ''සො ආවීකරෙය්‍යා'' ති සො දෙසෙය්‍ය, සො විවරෙය්‍ය, සො උත්තානී කරෙය්‍ය, සො පකාසෙය්‍ය සඞ්ඝමජ්ඣෙ වා ගණමජ්ඣෙ වා එකපුග්ගලෙ වා.

22. ''අසන්තී නාම ආපත්ති'' අනජ්ඣාපන්නා වා හොති, ආපජ්ජිත්වා වා වුට්ඨිතා.

23. ''තුණ්හී භවිතබ්බං'' ති අධිවාසෙතබ්බං, න බ්‍යාහරිතබ්බං.

24. ''පරිසුද්ධා ති වෙදිස්සාමී'' ති ජානිස්සාමි. ධාරෙස්සාමි.

25. ''යථා ඛො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොතී'' ති යථා එකෙන එකො පුට්ඨො බ්‍යාකරෙය්‍ය, එවමෙවං[5] තස්සා පරිසාය ජානිතබ්බං මං පුච්ඡන්ති ති. එවරූපා නාම පරිසා භික්ඛුපරිසා වුච්චති.

26. ''යාවතතියං අනුසාවිතං හොතී'' ති සකිම්පි අනුසාවිතං හොති. දුතියම්පි අනුසාවිතං හොති. තතියම්පි අනුසාවිතං හොති.

27. ''සරමානො'' ති ජානමානො. සඤ්ජානමානො.

28. ''සන්තී නාම ආපත්ති'' අජ්ඣාපන්නා වා හොති. ආපජ්ජිත්වා වා අවුට්ඨිතා.

29. ''නාවීකරෙය්‍යා'' ති න දෙසෙය්‍ය. න විවරෙය්‍ය. න උත්තානී කරෙය්‍ය. න පකාසෙය්‍ය සඞ්ඝමජ්ඣෙ වා ගණමජ්ඣෙ වා එකපුග්ගලෙ වා.

1. දෙසෙස්සාමි'' ම ඡ සං. P T S. 2. උත්තානිං කරිස්සාමි'' ම ඡ සං. P T S.
3. ''අට්ඨිංකත්වා'' ම ඡ. සං 4. ''සබ්බං චෙතසා'' ම. ඡ. සං. P T S.
5. ''එවමෙව'' ම ඡ සං.

Free Distribution www.aathaapi.org

13. "පාතිමොක්ඛං" යනු මේ සංවරසීලය තෙමේ 'පාති' සඞ්ඛ්‍යාත කුශලධර්මයන්ට (මොක්ඛ=) ආදි වේ. මේ මුඛය වේ. මේ ප්‍රධාන වේ. එහෙයින් "පාතිමොක්ඛං" යි කියනු ලැබේ.

14. "ආයස්මන්තො" යනු ප්‍රියවචනයෙකි. ගරුවචනයෙකි. අවවාද පිළිගන්නවුන්ට ගෞරව කළ යුත්තන් ඇසුරු කළවුන්ට නමෙකි. එහෙයින් "ආයස්මන්තො" යි කියනු ලැබේ.

15. "උද්දිසිස්සාමි" යන්නෙහි - කියන්නෙමි, දෙසන්නෙමි, පණවන්නෙමි, තබන්නෙමි, විවෘත කරන්නෙමි, බෙදන්නෙමි, ප්‍රකට කරන්නෙමි, ප්‍රකාශ කරන්නෙමි යන අර්ථයි.

16. "තං" යි ප්‍රාතිමොක්ෂය කියනු ලැබේ.

17. "සබ්බෙව සන්තා" යනු ඒ සඟපිරිසෙහි ස්ථවිර නවක මධ්‍යම යම් පමණ භික්ෂූහු වෙත් ද, තෙල පැවිද්දෝ "සබ්බෙව සන්තා" යි කියනු ලැබෙත්.

18. "සාධුකං සුණොම" යන්නෙහි - අර්ථවත් කොට මෙනෙහි කොට මුළු හිතින් සලකමු යන අර්ථයි.

19. "මනසි කරොම" යන්නෙහි - ප්‍රයෝජන සලකා මෙනෙහි කොට මුළු හිතින් මනා කොට ගණිමු යන අර්ථයි.

20. "යස්ස සියා ආපත්ති" යන්නෙහි අර්ථ නම් - තෙරනමකට හෝ නවකයකුට හෝ මධ්‍යමයකුට හෝ පඤ්චාපත්තිස්කන්ධයන් අතුරෙන් එක්තරා ඇවැතක් හෝ සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් එක්තරා ඇවැතක් වී නම් යනුයි.

21. "සො ආවීකරෙය්‍ය" යන්නෙහි අර්ථ නම් - ඒ භික්ෂු තෙමේ සඞ්ඝයා මැද හෝ ගණයා මැද හෝ එක් පුද්ගලයකු ඉදිරියෙහි හෝ දෙසන්නේ ය. ඒ භික්ෂු තෙමේ විවෘත කරන්නේ ය. ඒ භික්ෂු තෙමේ ප්‍රකට කරන්නේ ය. ඒ භික්ෂු තෙමේ ප්‍රකාශ කරන්නේ ය යනුයි.

22. "අසන්තී නාම ආපත්ති" යනු, නො පැමිණියා වූ හෝ පැමිණ නැගී සිටියා වූ හෝ ඇවැතයි.

23. "තුණ්හී භවිතබ්බං" යනු ඉවසිය යුතු ය. කතා නො කළ යුතු ය යනුයි.

24. "පරිසුද්ධා ති වෙදිස්සාමි" යනු දන්නෙමි, දරන්නෙමි යනුයි

25. "යථා ඛො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති" යනු යම් සේ එකකු විසින් වෙන් වශයෙන් එකෙක් විචාරණ ලද්දේ වෙන් වශයෙන් ප්‍රකාශ කරන්නේ ද, එපරිද්දෙන් ඒ පිරිසෙහි හුන් සාපත්තික භික්ෂූහු විසින් "මා විචාරන්නේ ය" යි දත යුතු ය. මෙබඳු පිරිස නම් භික්ඛු පිරිස කියනු ලැබේ.

26. "යාවතතියං අනුසාවිතං හොති" යනු එකවරකුත් අස්වන ලද්දේ වේ. දෙවනු ද අස්වන ලද්දේ වේ. තෙවනු ද අස්වන ලද්දේ වේ යනුයි.

27. "සරමානො" යනු දන්නේ, මනා කොට දන්නේ යනුයි.

28. "සන්තී නාම ආපත්ති" යනු පැමිණියා වූ හෝ පැමිණ නො නැගී සිටියා වූ හෝ ඇවැතයි.

29. "නාවිකරෙය්‍ය" යනු සඞ්ඝයා මැද හෝ ගණයා මැද හෝ එක් පුද්ගලයකු වෙත හෝ නො දෙසන්නේ ය, විවෘත නො කරන්නේ ය, ප්‍රකට නො කරන්නේ ය, ප්‍රකාශ නො කරන්නේ ය යනුයි.

30. "සම්පජානමුසාවාදස්ස හොති" ති සම්පජානමුසාවාදෙ [1] කිං හොති ? දුක්කටං හොති.

31. "අන්තරායිකො ධම්මො වුත්තො භගවතා" ති කිස්ස අන්තරායිකො ? පඨමස්ස ඣානස්ස අධිගමාය අන්තරායිකො. දුතියස්ස ඣානස්ස අධිගමාය අන්තරායිකො. තතියස්ස ඣානස්ස අධිගමාය අන්තරායිකො. චතුත්ථස්ස ඣානස්ස අධිගමාය අන්තරායිකො. ඣානානං විමොක්ඛානං සමාධීනං සමාපත්තීනං නෙක්ඛම්මානං නිස්සරණානං පවිවෙකානං කුසලානං ධම්මානං අධිගමාය අන්තරායිකො.

32. "තස්මා" ති තංකාරණා.

33. "සරමානෙනා" ති ජානමානෙන සඤ්ජානමානෙන.

34. "විසුද්ධාපෙක්ඛෙනා" ති වුට්ඨාතුකාමෙන විසුජ්ඣිතුකාමෙන.

35. "සන්තී නාම ආපත්ති" අජ්ඣාපන්නා වා හොති, ආපජ්ජිත්වා වා අවුට්ඨිතා.

36. "ආවීකාතබ්බා" ති ආවිකාතබ්බා සඞ්ඝමජ්ඣෙ වා ගණමජ්ඣෙ වා එකපුග්ගලෙ වා.

37. "ආවීකතා හිස්ස ඵාසු හොතී" ති කිස්ස ඵාසු හොති? පඨමස්ස ඣානස්ස අධිගමාය ඵාසු හොති. දුතියස්ස ඣානස්ස අධිගමාය ඵාසු හොති. තතියස්ස ඣානස්ස අධිගමාය ඵාසු හොති. චතුත්ථස්ස ඣානස්ස අධිගමාය ඵාසු හොති. ඣානානං විමොක්ඛානං සමාධීනං සමාපත්තීනං නෙක්ඛම්මානං නිස්සරණානං පවිවෙකානං කුසලානං ධම්මානං අධිගමාය ඵාසු හොතී ති.

38. තෙන ඛො පන සමයෙන භික්ඛූ "භගවතා පාතිමොක්ඛුද්දෙසො අනුඤ්ඤාතො" ති දෙවසිකං පාතිමොක්ඛං උද්දිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, දෙවසිකං පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, උපොසථෙ පාතිමොක්ඛං උද්දිසිතු" න්ති.

39. තෙන ඛො පන සමයෙන භික්ඛූ "භගවතා උපොසථෙ පාතිමොක්ඛුද්දෙසො අනුඤ්ඤාතො" ති පක්ඛස්ස තික්ඛත්තුං පාතිමොක්ඛං උද්දිසන්ති චාතුද්දසෙ පණ්ණරසෙ අට්ඨමියා ච පක්ඛස්ස. භගවතො එතමත්ථං ආරොචෙසුං. න භික්ඛවෙ පක්ඛස්ස තික්ඛත්තුං පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, සකිං පක්ඛස්ස චාතුද්දසෙ වා පණ්ණරසෙ වා පාතිමොක්ඛං උද්දිසිතු" න්ති.

40. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ යථාපරිසාය පාතිමොක්ඛං උද්දිසන්ති සකාය සකාය පරිසාය. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, යථාපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං සකාය සකාය පරිසාය. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, සමග්ගානං උපොසථකම්ම" න්ති.

1. "මුසාවාදෙ" අ වි ජ පු. තො වි. ම නු ප. P T S.

30. "සම්පජානමුසාවාදස්ස හොති" මෙහි දැන දැන බොරු කීමෙහි කිනම් ඇවැතක් වේ ද? දුකුළා ඇවැත් වේ.

31. "අන්තරායිකො ධම්මො වුත්තො භගවතා." මෙහි කුමකට අන්තරායකර වේ ද? ප්‍රථමධ්‍යානය ලැබීමට අන්තරායකර වේ. විතීය-ධ්‍යානය ලැබීමට අන්තරායකර වේ. තෘතීයධ්‍යානය ලැබීමට අන්තරාය කර වේ. චතුර්ථධ්‍යානය ලැබීමට අන්තරායකර වේ. ධ්‍යාන- විමොක්ඛ- සමාධි- සමාපත්ති- නෙක්ඛම්ම- නිස්සරණ- පවිවෙක යන මේ කුශලධර්ම ලැබීමට අන්තරායකර වේ.

32. "තස්මා" - 'ඒ හෙතුවෙන්' යනුයි.

33. "සරමානෙන" - දන්නහු විසින්, මනා කොට දන්නහු විසින්- යනුයි.

34. "විසුද්ධාපෙක්ඛෙන" - නැඟී සිටිනු කැමැත්තහු විසින්- ඇවැතින් පිරිසිදු වනු කැමැත්තහු විසින් යනුයි.

35. "සන්තී නාම ආපත්ති" යනු පැමිණියා වූ හෝ පැමිණ නො නැඟී සිටියා වූ හෝ ඇවැතයි.

36. "ආවිකාතබ්බා" - සඞ්ඝයා මැද හෝ ගණයා මැද හෝ එක් පුද්ගලයකු වෙත හෝ ප්‍රකාශ කළ යුතු ය යනුයි.

37. "ආවිකතා හිස්ස ඵාසු හොති" මෙහි කුමකට පහසු වේ ද ? ප්‍රථම-ධ්‍යානය ලැබීමට පහසු වේ. විතීයධ්‍යානය ලැබීමට පහසු වේ. තෘතීය ධ්‍යානය ලැබීමට පහසු වේ. චතුර්ථධ්‍යානය ලැබීමට පහසු වේ. ධ්‍යාන-විමොක්ඛ- සමාධි- සමාපත්ති- නෙක්ඛම්ම- නිස්සරණ- පවිවෙක- යන මේ කුශලධර්ම ලැබීමට පහසු වේ.

38. එකල්හි භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ විසින් පාමොක් උදෙසීම අනුදන්නා ලදැ" යි දින පතා පාමොක් උදෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, දින පතා පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්; දුකුලාඇවැත් වේ. මහණෙනි, පොහෝ දිනයෙහි පාමොක් උදෙසන්නට අනුදනිමි."

39. එකල්හි භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ විසින් උපොසථදිනයෙහි පාමොක් උදෙසීම අනුදන්නාලදැ" යි තුදුස්වක්හි ද පසළොස්වක්හි ද පක්ෂයේ අටවක්හි ද යි පක්ෂයට තෙවරක් පාමොක් උදෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පක්ෂයට තෙවරක් පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, පක්ෂයකට වරක් - තුදුස්වක්හි හෝ පසළොස්වක්හි හෝ පාමොක් උදෙසන්නට අනුදනිමි".

40. එකල්හි සවග භික්ෂූහු පිරිස් අනුව සිය සිය පිරිස්හි පාමොක් උදෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පිරිස් අනුව සිය සිය පිරිස්හි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙ-සන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, සමගි වූවන්ගේ පෙහෙවස් කර්මය අනුදනිමි"

41. අථ ඛො භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං සමග්ගානං උපොසථකම්මන්ති. කිත්තාවතා නු ඛො සාමග්ගී හොති යාවතා එකාවාසො? උදාහු සබ්බා පුථුවී"ති? [1] භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, එත්තාවතා සාමග්ගී යාවතා එකාවාසො" ති.

42. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකප්පිනො රාජගහෙ** විහරති **මද්දකුච්ඡිස්මිං මිගදායෙ.** අථ ඛො ආයස්මතො මහාකප්පිනස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "ගච්ඡෙය්‍යං වාහං උපොසථං? න වා ගච්ඡෙය්‍යං? ගච්ඡෙය්‍යං වාහං සඞ්ඝකම්මං? න වා ගච්ඡෙය්‍යං? අථ ඛ්වාහං විසුද්ධො පරමාය විසුද්ධියා" ති.

43. අථ ඛො භගවා ආයස්මතො මහාකප්පිනස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං [2] වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව **ගිජ්ඣකූටෙ පබ්බතෙ** අන්තරහිතො මද්දකුච්ඡිස්මිං මිගදායෙ ආයස්මතො මහාකප්පිනස්ස පමුඛෙ [3] පාතුරහොසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. ආයස්මාපි ඛො මහාකප්පිනො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාකප්පිනං භගවා එතදවොච:

44. "නනු තෙ කප්පින, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි? ගච්ඡෙය්‍යං වාහං උපොසථං? න වා ගච්ඡෙය්‍යං? ගච්ඡෙය්‍යං වාහං සඞ්ඝකම්මං? න වා ගච්ඡෙය්‍යං? අථ ඛ්වාහං විසුද්ධො පරමාය විසුද්ධියා" ති. "එවම්භන්තෙ". "තුම්හෙ චෙ බ්‍රාහ්මණා උපොසථං න සක්කරිස්සථ, න ගරු කරිස්සථ, න මානෙස්සථ, න පූජෙස්සථ, අථ කො චරහි උපොසථං සක්කරිස්සති? ගරු කරිස්සති? මානෙස්සති? පූජෙස්සති? ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, උපොසථං. මා නො අගමාසි. ගච්ඡෙව සඞ්ඝකම්මං මා නො අගමාසී" ති. "එවම්භන්තෙ" ති ඛො ආයස්මා මහාකප්පිනො භගවතො පච්චස්සොසි.

45. අථ ඛො භගවා ආයස්මන්තං මහාකප්පිනං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව **මද්දකුච්ඡිස්මිං** මිගදායෙ ආයස්මතො මහාකප්පිනස්ස පමුඛෙ අන්තරහිතො ගිජ්ඣකූටෙ පබ්බතෙ පාතුරහොසි.

1 "පථවීති' ම ඡ සං. 2 "සම්මිඤ්ජිතං" ම ඡ ස. 3. "සම්මුඛෙ" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

41. එකල්හි භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් සමගි වූවන්ට පෙහෙවස්කම් අනුදන්නා ලද්දේ ය. සමගිය කෙතෙක් ද? එක් ආවාසයක් තෙක් ද? නොහොත් මුළුපොළොව දැ?" යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, (සීමාවට රැස් වූ) එකාවාසය යම් තාක් ද සමගිය එපමණ ය යි අනුදනිමි".

42. එකල්හි ආයුෂමත් **මහාකප්පින** ස්ථවිරයන් වහන්සේ රජගහනුවර මිගදාය නම් **මද්දකුච්ඡියෙහි** වැඩ වසති. එහි එකලා ව විවේකයෙන් හුන් ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේට "මම පොහොය කිරීමට යන්නෙම් ද? නො යන්නෙම් ද? සඞ්ඝකර්‍මයට යන්නෙම් ද? නො යන්නෙම් ද? ගියත් නොගියත් මම උතුම් වූ පිරිසිදු බැවින් පිරිසිදුබැව් ඇත්තේ වෙමි" යි සිත් වි ය.

43. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තම සිතින් ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේගේ සිත දැන බලවත් පුරුෂයෙක් තෙමේ හැකිළු අතක් යම් සේ දිගු කරන්නේ වේ ද, දිගු කළ අතක් යම් සේ හකුළන්නේ වේ ද, එපරිද්දෙන් (ඉතා වහා) **ගිජ්ඣකූළපව්වෙහි** අතුරුදහන් වූසේක් **මෘගදාය** නම් වූ **මද්දකුච්ඡියෙහි** ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේගේ ඉදිරියෙහි පහළ වූ සේක. පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්සේක. පසෙක හුන් ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:-

44. "කප්පිනය, එකලා ව විවේකයෙන් හුන් ඔබට 'මම පොහොය කිරීමට යන්නෙම් දෝ හෝ නො යන්නෙම් දෝ හෝ සඞ්ඝකර්‍මයට යන්නෙම් දෝ හෝ නොයන්නෙම් දෝ හෝ - ගියත් නො ගියත් මම උතුම් පිරිසිදු බැවින් පිරිසිදු වූයේ වෙමි' යි මෙබඳු සිතක් වූයේ නො වේ දැ?" යි. "ස්වාමීනි, එසේ ය" යි කී කල්හි "රහත් වූ තෙපි උපොසථයට සත්කාර නො කරන්නහු නම්, ගරු නො කරන්නහු නම්, නො පුදන්නහු නම්, එකල්හි කවරෙක් උපොසථයට සත්කාර කරන්නේ ද? ගරු කරන්නේ ද? බුහුමන් කරන්නේ ද? පුදන්නේ ද? බ්‍රාහ්මණය, උපොසථයට යව. නො යන්නෙහි නො ව. සඞ්ඝකර්‍මයට යව. නො යන්නෙහි නො ව" යි වදාළ සේක. ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි, එසේ ය" යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

45. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේට දැහැමිකතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා බලවත් පුරුෂයෙක් තෙමේ හැකිළු අතක් යම් සේ දිගු කරන්නේ වේ ද, දිගු කළ අතක් යම් සේ හකුළන්නේ වේ ද, එපරිද්දෙන් මෘගදාය නම් මද්දකුච්ඡියෙහි ආයුෂමත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේගේ ඉදිරියෙහි අතුරුදහන් වූ සේක් ගිජ්ඣකූළපව්වෙහි පහළ වූ සේක.

46. අථ ඛො භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං එත්තාවතා සාමග්ගී යාවතා එකාවාසො ති. කිත්තාවතා නු ඛො එකාවාසො හොතී?" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සීමං සම්මන්නිතුං. එවං ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බා. පඨමං නිමිත්තා කිත්තෙතබ්බා – පබ්බතනිමිත්තං පාසාණනිමිත්තං වනනිමිත්තං රුක්ඛනිමිත්තං මග්ගනිමිත්තං වම්මිකනිමිත්තං නදීනිමිත්තං උදකනිමිත්තං. නිමිත්තෙ කිත්තෙත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

47. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො එතෙහි නිමිත්තෙහි සීමං සම්මන්නෙය්‍ය සමානසංවාසං එකුපොසථං. එසා ඤත්ති."

"සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, සඞ්ඝො එතෙහි නිමිත්තෙහි සීමං සම්මන්නති සමානසංවාසං එකුපොසථං. යස්සායස්මතො ඛමති එතෙහි නිමිත්තෙහි සීමාය සම්මුති[1] සමානසංවාසාය එකුපොසථාය, සො තුණ්හස්ස යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. සම්මතා සීමා සඞ්ඝෙන එතෙහි නිමිත්තෙහි සමානසංවාසා එකුපොසථා. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

48. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා සීමාසම්මුති අනුඤ්ඤාතා" ති අතිමහතියො සීමායො සම්මන්නන්ති චතුයොජනිකාපි පඤ්චයොජනිකාපි ඡයොජනිකාපි. භික්ඛූ උපොසථං ආගච්ඡන්තා උද්දිස්සමානෙපි පාතිමොක්ඛෙ ආගච්ඡන්ති. උද්දිට්ඨමත්තෙපි ආගච්ඡන්ති. අන්තරාපි පරිවසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අතිමහතී සීමා සම්මන්නිතබ්බා චතුයොජනිකා වා පඤ්චයොජනිකා වා ඡයොජනිකා වා. යො සම්මන්නෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, තියොජනපරමං සීමං සම්මන්නිතු" න්ති.

49. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නදීපාරං සීමං[2] සම්මන්නන්ති. උපොසථං ආගච්ඡන්තා භික්ඛූපි වුය්හන්ති. පත්තාපි වුය්හන්ති. චීවරානිපි වුය්හන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, නදීපාරං සීමා සම්මන්නිතබ්බා. යො සම්මන්නෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, යත්ථස්ස ධුව නාවා වා ධුව සෙතු වා, එවරූපං නදීපාරං සීමං සම්මන්නිතු" න්ති.

1. "සම්මති" සී. 2. "නදීපාරසීමං" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

46. එකල්හි භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් එකාවාසය යම් තාක් ද, සමගිය ඒ තාක් ය යි පණවන ලදී. කොපමණකින් එකාවාසය වේ දැ" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. උන්වහන්සේ (මෙසේ වදාළසේක). "මහණෙනි, සීමාව සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය. පබ්බත නිමිත්ත- පාසාණ නිමිත්ත- වන නිමිත්ත - රුක්ඛ නිමිත්ත- මග්ග නිමිත්ත- වම්මික නිමිත්ත-නදී නිමිත්ත (යන මේ) නිමිති පළමු කොට කීර්තනය කළ යුතු ය. නිමිති කීර්තනය කොට ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දත් විය යුත්තේ ය.

47. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. හාත්පස යම් පමණ නිමිති කීර්තනය කරණ ලද ද, ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මේ නිමිතිවලින් සමානසංවාස වූ එකුපොසථ වූ සීමාවක් සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය."

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. හාත්පස යම් පමණ නිමිති කීර්තනය කරණ ලද ද, සඞ්ඝ තෙමේ මේ නිමිතිවලින් සමාන සංවාස වූ එකුපොසථ වූ සීමාවක් සම්මත කරයි. යම් ආයුෂ්මතෙකුහට මේ නිමිතිවලින් සමාන සංවාස වූ එකුපොසථ වූ සීමාව සම්මත කිරීම රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමකුහට රුචි නො වේ නම්, හෙතෙමේ කියාවා. සඞ්ඝයා විසින් මේ නිමිතිවලින් සමාන සංවාස වූ එකුපොසථ වූ සීමාව සම්මත කරණ ලද්දී ය. සඞ්ඝයාට එය රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

48. එකල්හි ෂබ්බග්ග භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ විසින් සීමා සම්මත කිරීම අනුදන්නා ලදැ" යි සිවු යොදුන් පමණ වූ ද පස් යොදුන් පමණ වූ ද සයොදුන් පමණ වූ ද ඉතා මහත් සීමා සම්මත කරත්. භික්ෂූහු උපොසථයට එන්නෝ පාමොක් උදෙසනු ලබන කල්හි ද එත්. පාමොක් උදෙසූ ඇසිල්ලෙහි ද එත්. අතර ද රැඳෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සිවු යොදුන් පමණ වූත් පස් යොදුන් පමණ වූත් සයොදුන් පමණ වූත් ඉතා මහත් සීමා සම්මත නො කට යුතු ය. යමෙක් සම්මත කරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, තුන් යොදුන පරම කොට ඇති සීමා සම්මත කිරීමට අනුදනිමි" යි.

49. එකල්හි ෂබ්බග්ග භික්ෂූහු නදිය මැදි කොට දෙගංඉවුරෙහි සීමා සම්මත කෙරෙත්. උපොසථයට එන්නා වූ භික්ෂූහු ද (ගඟදියෙන්) ගසා ගෙණ යනු ලැබෙත්. පාත්‍ර ද ගසා ගෙණ යනු ලැබේ. සිවුරු ද ගසා ගෙණ යනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නදිය යට කොට සිටි සීමා සම්මත නො කළ යුතු ය. යමෙක් සම්මත කරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, යම් තැනෙක නිතර හැසිරෙණ නැවක් හෝ නිතර තිබෙන හෙයක් හෝ වන්නේ ද, එබඳු වූ නදීපාර සීමාව සම්මත කරන්නට අනුදනිමි" යි.

50. තෙන ඛො පන සමයෙන භික්ඛූ අනුපරිවෙණියං පාතිමොක්ඛං උද්දිසන්ති. අසඞ්කෙතෙන ආගන්තුකා භික්ඛූ න ජානන්ති: "කත්ථ වා අජ්ජුපොසථො කරීයිස්සතී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, . අනුපරිවෙණියං පාතිමොක්ඛං උද්දිසිතබ්බං අසඞ්කෙතෙන. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, උපොසථාගාරං සම්මන්නිත්වා උපොසථං කාතුං, යං සඞ්ඝො ආකඞ්ඛති විහාරං වා අඩ්ඪයොගං වා පාසාදං වා හම්මියං වා ගුහං වා. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බං. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

51. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං උපොසථාගාරං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති."

"සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං උපොසථාගාරං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස විහාරස්ස උපොසථාගාරස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

"සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො විහාරො උපොසථාගාරං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

52. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ ද්වෙ උපොසථාගාරානි සම්මතානි හොන්ති. භික්ඛූ උභයත්ථ සන්නිපතන්ති "ඉධ උපොසථො කරීයිස්සති. ඉධ උපොසථො කරීයිස්සතී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, එකස්මිං ආවාසෙ ද්වෙ උපොසථාගාරානි සම්මන්නිතබ්බානි. යො සම්මන්නෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, එකං සමූහනිත්වා [1] එකත්ථ උපොසථං කාතුං. එවඤ්ච පන භික්ඛවෙ, සමූහන්තබ්බං. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

53. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං උපොසථාගාරං සමූහනෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං උපොසථාගාරං සමූහනති. [2] යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස උපොසථාගාරස්ස සමුග්ඝාතො, සො තුණ්හස්ස. යස්ස න ක්ඛමති, සො භාසෙය්‍ය.

සමූහතං සඞ්ඝෙන ඉත්ථන්නාමං උපොසථාගාරං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

1. "සමූහන්ත්වා" ම ඡ සං. P T S 2. "සමූහති" තො වි. ම නු ප.

50. එකල්හි භික්ෂූහු පිරිවෙණක් (=පන්සලක්) පාසා සීමා ලකුණු නො කොට පාමොක් උදෙසත්. ආගන්තුක භික්ෂූහු "අද උපෝසථය කො තැන්හි කරණු ලැබේ දැ" යි නො දනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ලකුණු නො තබා පිරිවෙණක් පාසා පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, සඞ්ඝ තෙමේ වෙහෙරක් හෝ ගුරුළුපියාපත් වැනි පියසි ඇති ගෙයක් හෝ පහයක් හෝ සඳලු සහිත ගෙයක් හෝ ගුහාවක් හෝ කැමැති නම්, විහාරාදි එබඳු ගෙයක් පොහෝගෙයක් කොට සම්මත කර පොහොය කරන්නට අනුදනිමි. මහණෙනි, එය මෙසේ සම්මත කළ යුතු ය. ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ (පළමු කොට) දැන්විය යුතු ය:

51. "සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් විහාරය පොහෝගෙයක් කොට සම්මත කරන්නේ ය. මේ දැන්වීම යි."

"සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් විහාරය පොහෝගෙයක් කොට සම්මත කරයි. යම් ආයුෂ්මතෙකුහට මෙ නම් විහාරයාගේ උපොසථාගාරසම්මුතිය රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමකුට රුචි නො වේ නම්, හෙ තෙමෙ කියාවා. '

"සඞ්ඝයා විසින් මෙ නම් විහාරය උපොසථාගාරයක් කොට සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් නිශ්ශබ්ද වේ. මෙය මෙසේ දරමි" යි.

52. එකල්හි එක්තරා ආවාසයෙක පොහෝ ගෙවල් දෙකක් සම්මත කරණ ලද්දේ ය. භික්ෂූහු "මෙහි පොහොය කරණු ලබන්නේ ය. මෙහි පොහොය කරණු ලබන්නේ ය" යි දෙ තැන්හි රැස් වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එක ආවාසයෙක පොහෝ ගෙවල් දෙකක් සම්මත නො කළ යුතු ය. යමෙක් සම්මත කරන්නේ නම්, දුකුළා ඇවැත් වේ. මහණෙනි, එක් පොහෝගෙයක් උදුරා එක් තැනෙක පොහොය කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ඉදිරිය යුතු ය. ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමෙ දැන් විය යුතු ය:

53. "සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් ඇති පොහෝගෙය උදුරන්නේ ය. මේ දැන්වීම යි."

"සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති පොහෝගෙය උදුරාලයි. යම් ආයුෂ්මතෙකුහට මෙ නම් ඇති පොහෝගෙය උදුරාලීම රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම් හෙ තෙමේ කියාවා."

"සඞ්ඝයා විසින් මෙ නම් ඇති පොහෝගෙය උදුරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

54. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ අතිඛුද්දකං උපොසථාගාරං සම්මතං හොති. තදහුපොසථෙ මහාභික්ඛුසඞ්ඝො සන්නිපතිතො හොති. භික්ඛූ අසම්මතාය භූමියා නිසින්නා පාතිමොක්ඛං අස්සොසුං. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: “භගවතා පඤ්ඤත්තං උපොසථාගාරං සම්මන්නිත්වා උපොසථො කාතබ්බො ති. මයඤ්චම්හ අසම්මතාය භූමියා නිසින්නා පාතිමොක්ඛං අස්සොසුම්හා [1]. කතො නු ඛො අම්හාකං උපොසථො? අකතො නු ඛො?” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

“සම්මතාය වා භික්ඛවෙ, භූමියා නිසින්නො [2] අසම්මතාය වා යතො පාතිමොක්ඛං සුණාති, කතොවස්ස උපොසථො. තෙන හි භික්ඛවෙ, සඞ්ඝො යාවමහන්තං උපොසථපමුඛං [3] ආකඞ්ඛති, තාවමහන්තං උපොසථපමුඛං සම්මන්නතු. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බං: පඨමං නිමිත්තා කිත්තෙතබ්බා [4]. නිමිත්තෙ කිත්තෙත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

55. “සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො එතෙහි නිමිත්තෙහි උපොසථපමුඛං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

“සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො, යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, සඞ්ඝො එතෙහි නිමිත්තෙහි උපොසථපමුඛං සම්මන්නති. යස්සායස්මතො ඛමති එතෙහි නිමිත්තෙහි උපොසථපමුඛස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

“සම්මතං සඞ්ඝෙන එතෙහි නිමිත්තෙහි උපොසථපමුඛං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී” ති.

56. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ නවකා භික්ඛූ පඨමතරං සන්නිපතිත්වා “න තාව ථෙරා ආගච්ඡන්තී” ති පක්කමිංසු. උපොසථො විකලො [5] අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, තදහුපොසථෙ ථෙරෙහි භික්ඛූහි පඨමතරං සන්නිපතිතු” න්ති.

57. තෙන ඛො පන සමයෙන **රාජගහෙ** සම්බහුලා ආවාසා සමානසීමා හොන්ති. තත්ථ භික්ඛූ විවදන්ති: “අම්හාකං ආවාසෙ උපොසථො කරීයතු. අම්හාකං ආවාසෙ උපොසථො කරීයතූ” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “ඉධ පන භික්ඛවෙ, සම්බහුලා ආවාසා සමානසීමා හොන්ති. තත්ථ භික්ඛූ විවදන්ති: ‘අම්හාකං ආවාසෙ උපොසථො කරීයතු. අම්හාකං ආවාසෙ උපොසථො කරීයතූ’ ති. තෙහි භික්ඛවෙ, භික්ඛූහි සබ්බෙහෙව එකජ්ඣං සන්නිපතිත්වා උපොසථො කාතබ්බො. යත්ථ වා පන ථෙරො භික්ඛු විහරති [6], තත්ථ සන්නිපතිත්වා උපොසථො කාතබ්බො. නත්වෙව වග්ගෙන සඞ්ඝෙන උපොසථො කාතබ්බො. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති.

1. “අස්සුම්හා” PTS. 2. “නිසින්නා” ම ඡ සං. PTS.
3. “උපොසථමුඛං” සී. 4. “නිමිත්තානි කිත්තෙතබ්බානි” ම නු ප. තො වි.
5. “විකාලො” ම ඡ සං. PTS. 6. “ථෙරා භික්ඛූ විහරන්ති” ම නු ප. තො වි.

Free Distribution www.aathaapi.org

54. එකල්හි එක්තරා ආවාසයෙක ඉතා කුඩා වූ පොහෝගෙයක් සම්මත කරණ ලද්දේ ය. එදවස පොහෝදිනයෙහි මහාභික්ෂුසඞ්ඝ තෙමේ රැස් වූයේ වේ. භික්ෂූහු සම්මත නො කළ බිම හුන්නාහු පාමොක් උදෙසුම් ඇසූහ. එකල්හි ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'පොහෝගෙයක් සම්මත කොට පොහොය කළ යුතු ය' යි පණවන ලද්දේ ය. අපි ද සම්මත නො කළ බිම හුන්නමෝ පාමොක් උදෙසීම් ඇසූමු. (එහෙයින්) අප විසින් පොහොය කරණ ලද්දේ ද ? නො කරණ ලද්දේ ද ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

"මහණෙනි, සම්මත කළ බිම හෝ සම්මත නො කළ බිම හෝ හුන්නේ පාමොක් උදෙසීම් අසා ද ඒ භික්ෂූහු විසින් පොහොය කරණ ලද්දේ ම වේ. මහණෙනි, එසේ නම් සඞ්ඝ තෙමේ යම් පමණ මහත් වූ උපොසථාගාරආලින්දයක් කැමැති වේ නම් ඒ පමණ මහත් වූ උපොසථාගාරආලින්දයක් සම්මත කෙරේවා. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: පළමු කොට නිමිති කීර්තනය කළ යුතු ය. නිමිති කීර්තනය කොට ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

55. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. යම් පමණ භාත්පස නිමිති කීර්තනය කරණ ලද ද, සඞ්ඝයාට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ මේ නිමිතිවලින් උපොසථාගාරආලින්දයක් සම්මත කරන්නේ ය මේ දැන්වීම ය."

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. යම් පමණ භාත්පස නිමිති කීර්තනය කරණ ලද ද, සඞ්ඝ තෙමේ මේ නිමිති වලින් උපොසථාගාරආලින්දයක් සම්මත කරයි. යම් ආයුෂ්මතෙකුහට මේ නිමිතිවලින් උපොසථාගාරආලින්දයාගේ සම්මුතිය රුචි වේ නම් හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා.

"සඞ්ඝයා විසින් මේ නිමිතිවලින් උපොසථාගාරආලින්දයෙක් සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

56. එකල්හි එක්තරා ආවාසයෙක ඒ දවස පොහොයෙහි නවක භික්ෂූහු පළමු කොට රැස් වී "ස්ථවිරයන් වහන්සේලා ඒ තාක් නො එත්" යි නික්ම ගියහ. උපොසථය අසම්පූර්ණ වූයේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. උන්වහන්සේ "මහණෙනි, ඒ දවස පොහොයෙහි පළමු කොට ස්ථවිරභික්ෂූන් රැස් වීමට අනුදනිමි" යි.

57. එකල්හි **රජගහනුවර** සමාන සීමා ඇති බොහෝ ආවාසයෝ වෙති. ඒ ආවාසයන්හි වැසි භික්ෂූහු "අපගේ ආවාසයෙහි පොහොය කරණු ලැබේවා. අපගේ ආවාසයෙහි පොහොය කරණු ලැබේවා" යි විවාද කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි සමාන සීමා ඇති බොහෝ ආවාසයෝ වෙති. එහි වැසි භික්ෂූහු 'අපගේ ආවාසයෙහි පොහොය කරණු ලැබේවා. අපගේ ආවාසයෙහි පොහොය කරණු ලැබේවා' යි විවාද කෙරෙත්. මහණෙනි, ඒ සියලු භික්ෂූන් විසින් ම එක් තැනෙක්හි රැස් වී පොහොය කළ යුතු ය. ස්ථවිර භික්ෂු තෙමේ යම් ආවාසයෙක වෙසේ නම්, ඒ තැනට රැස් වී පොහොය කළ යුතු ය. වර්ගී වූ සඞ්ඝයා විසින් පොහොය නො කළ යුත්තේ ම ය. යමෙක් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

58. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකස්සපො අන්ධකවින්දා, රාජගහං** උපොසථං ආගච්ඡන්තො අන්තරාමග්ගෙ නදිං තරන්තො මනං වූළ්හො අහොසි. චීවරානිස්ස අල්ලානි. භික්ඛූ ආයස්මන්තං මහාකස්සපං එතදවොචුං: “කිස්ස තෙ ආවුසො චීවරානි අල්ලානී?” ති. “ඉධාහං ආවුසො අන්ධකවින්දා රාජගහං උපොසථං ආගච්ඡන්තො අන්තරාමග්ගෙ නදිං තරන්තො මනම්හි වූළ්හො. තෙන මෙ චීවරානි අල්ලානී” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “යා සා භික්ඛවෙ, සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නතු. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

59. “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.”

“සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නති. යස්සායස්මතො ඛමති එතිස්සා සීමාය තිචීවරෙන අවිප්පවාසාය [1] සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසා [2]. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එව මෙතං ධාරයාමී” ති.

60. තෙන ඛො පන සමයෙන භික්ඛූ “භගවතා තිචීවරෙන අවිප්පවාසසම්මුති අනුඤ්ඤාතා” ති අන්තරඝරෙ චීවරානි නික්ඛිපන්ති. තානි චීවරානි නස්සන්තිපි ඩය්හන්තිපි උන්දූරෙහිපි ඛජ්ජන්ති. භික්ඛූ දුච්චොළා හොන්ති ලූඛචීවරා. භික්ඛූ එවමාහංසු: “කිස්ස තුම්හෙ ආවුසො, දුච්චොළා ලූඛචීවරා?” ති. “ඉධ මයං ආවුසො භගවතා තිචීවරෙන අවිප්පවාස සම්මුති අනුඤ්ඤාතාති අන්තරඝරෙ චීවරානි නික්ඛිපිම්හා. තානි චීවරානි නට්ඨානිපි. දඩ්ඪානිපි. උන්දූරෙහිපි ඛායිතානි. තෙන මයං දුච්චොළා ලූඛචීවරා” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “යා සා භික්ඛවෙ සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නතු ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

1. “අවිප්පවාසස්ස” සී 2 “අවිප්පවාසො” සී

Free Distribution www.aathaapi.org

58. එකල්හි ආයුෂ්මත් **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ **අන්ධකවින්ද** විහාරයෙන් **රජගහ** නුවරට උපොසථය පිණිස එන්නාහු අතරමග දී නදියකින් එතෙර වනසේක් මඳකින් ජලයෙන් ගසාගෙණ යන ලද්දේ වූහ. (එසින්) උන්වහන්සේගේ සිවුරු තෙමුනේ ය. එකල්හි භික්ෂූහු ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට ''ඇවැත්නි, නුඹ-වහන්සේගේ සිවුරු කුමක් හෙයින් තෙමුනේ දැ?'' යි ඇසූහ. ''ඇවැත්නි, මම මෙහි අන්ධකවින්දවිහාරයේ සිට රජගහනුවර වේළුවනයට උපොසථය පිණිස එන්නෙම් අතරමග ගඟෙන් එතෙර වන්නෙම් ජලයෙන් මඳකින් ගසා ගෙණ යන ලද්දෙමි. එසින් මගේ සිවුරු තෙමුනේ ය'' යි කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. ''මහණෙනි, සඞ්ඝයා විසින් සමානසංවාස වූ එකූපොසථ වූ යම් ඒ සීමාවක් සම්මත කරණ ලද ද සඞ්ඝතෙමෙ ඒ සීමාව තුන් සිවුරෙන් අවිප්පවාසය යි* සම්මත කෙරේවා. මහණෙනි, ඒ මෙසේ සම්මත කළ යුතු ය. ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන් විය යුත්තේ ය:''

59. ''සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් සමාන-සංවාස වූ එකූපොසථ වූ යම් ඒ සීමාවක් සම්මත කරණ ලද ද, ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ ඒ සීමාව තුන් සිවුරෙන් අවිප්පවාස ය යි සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය.

''සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: සඞ්ඝයා විසින් සමානසංවාස වූ එකූපොසථ වූ යම් ඒ සීමාවක් සම්මත කරණ ලද ද, සඞ්ඝ තෙමේ ඒ සීමාව තුන්සිවුරෙන් අවිප්පවාසය යි සම්මත කරයි. යම් ආයුෂ්මතෙකුහට තුන්සිවුරෙන් අවිප්පවාසසම්මුතිය රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා. සඞ්ඝයා විසින් තුන්සිවුරෙන් අවිප්පවාසය ඇති ඒ සීමාව සම්මත කරණ ලද්දී ය. සඞ්ඝයාට එය රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි'' යි.

60. එකල්හි භික්ෂූහු ''භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් සිවුරෙන් අවිප්පවාසය පිළිබඳ සම්මුතිය අනුදන්නා ලදැ'' යි ගම තුළ සිවුරු බහා තබත්. (එසින්) ඒ චීවරයෝ නැසෙත්. ගින්නෙන් දැවෙත්. මීයන් විසිනු දු කැවෙත්. භික්ෂූහු අපිරිසිදු සිවුරු ඇත්තෝ රළු සිවුරු ඇත්තෝ වෙති. භික්ෂූහු ''ඇවැත්නි, තෙපි කුමක් නිසා අපිරිසිදු සිවුරු ඇත්තෝ රළු සිවුරු ඇත්තෝ වහු දැ'' යි ඇසූහ. ''ඇවැත්නි, මෙහි අපි 'භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්සිවුරෙන් අවිප්පවාසසම්මුතිය අනුදන්නා ලදැ'යි ගම තුළ සිවුරු බහා තැබුවෙමු. (එසින්) ඒ චීවරයෝ නැසුනාහ. (ගින්නෙන්) දැවුනාහ. මීයන් විසිනුත් කැවුනාහ. අපි අපිරිසිදු සිවුරු ඇත්තෝ රළු සිවුරු ඇත්තෝ වූම්හ'' යි කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. ''මහණෙනි, සඞ්ඝයා විසින් සමානසංවාස වූ එකූපොසථ වූ යම් සීමාවක් සම්මත කරණ ලද ද, සඞ්ඝ තෙමේ ඒ සීමාව තුන් සිවුරෙන් අවිප්පවාසය ඇත්තක් කොට, ගම ද ගාමූපචාරය ද හැර, සම්මත කෙරේවා. මහණෙනි, ඒ මෙසේ සම්මත කළ යුතු ය. ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

* උපග්‍රන්ථය බැලිය යුතු.

61. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නෙය්‍ය ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. එසා ඤත්ති."

"සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමාන සංවාසා එකූපොසථා, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. යස්සායස්මතො ඛමති එතිස්සා සීමාය තිචීවරෙන අවිප්පවාසාය සම්මුති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

"සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසා ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

62. "සීමං භික්ඛවෙ, සම්මන්නන්තෙන පඨමං සමානසංවාසසීමා [1] සම්මන්නිතබ්බා. පච්ඡා තිචීවරෙන අවිප්පවාසො සම්මන්නිතබ්බො. සීමං භික්ඛවෙ, සමූහනන්තෙන පඨමං තිචීවරෙන අවිප්පවාසො සමූහන්තබ්බො. පච්ඡා සමානසංවාසසීමා සමූහන්තබ්බා. එවඤ්ච පන භික්ඛවෙ තිචීවරෙන අවිප්පවාසො සමූහන්තබ්බො: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:-

63. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො සම්මතො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං තිචීවරෙන අවිප්පවාසං සමූහනෙය්‍ය. එසා ඤත්ති."

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො සම්මතො, සඞ්ඝො තං තිචීවරෙන අවිප්පවාසං සමූහනති. යස්සායස්මතො ඛමති එතස්ස තිචීවරෙන අවිප්පවාසස්ස සමුග්ඝාතො, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

"සමූහතො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

64. "එවඤ්ච පන භික්ඛවෙ, සමානසංවාසසීමා [2] සමූහන්තබ්බා: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:-

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමාන-සංවාසා එකූපොසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං සීමං සමූහනෙය්‍ය සමානසංවාසං එකූපොසථං. එසා ඤත්ති."

1. "සමාන සංවාසා සීමා" සී.
2. "භික්ඛවෙ සීමා" ම ඡ සං. අ වි. ම නු ප නො වි. ජ ද්‍ර. PTS.

61. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: සඞ්ඝයා විසින් සමානසංවාස වූ එකූපොසථ වූ යම් ඒ සීමාවක් සම්මත කරණ ලද ද, ඉදින් සඞ්ඝයාහට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ ඒ සීමාව තුන් සිවුරෙන් අවිප්පවාස ඇත්තක් කොට ගමත් ගාමූපචාරයත් හැර සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය."

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් සමාන සංවාස වූ එකූපොසථ වූ යම් ඒ සීමාවක් සම්මත කරණ ලද ද, සඞ්ඝ තෙමේ ඒ සීමාව තුන් සිවුරෙන් අවිප්පවාස ඇත්තක් කොට ගමත් ගාමූප-චාරයත් හැර සම්මත කරයි. යම් ආයුෂ්මතෙකුහට ගමත් ගාමූපචාරයත් හැර තුන් සිවුරෙන් අවිප්පවාසය ඇති ඒ සීමාවගේ සම්මුතිය රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා."

"සඞ්ඝයා විසින් ගමත් ගාමූපචාරයත් හැර තුන් සිවුරෙන් අවිප්ප-වාසය ඇති ඒ සීමාව සම්මත කරණ ලද්දී ය. සඞ්ඝයාහට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

62. මහණෙනි, සීමාවක් සම්මත කරන්නහු විසින් පළමු කොට සමානසංවාසසීමාව සම්මත කළ යුතු ය. පසු ව තුන් සිවුරෙන් අවිප්පවාසය සම්මත කළ යුතු ය. මහණෙනි, සීමාවක් උදුරන්නහු විසින් පළමු කොට තුන් සිවුරෙන් අවිප්පවාසය ඉදිරිය යුතු ය. පසු ව සමානසංවාසසීමාව ඉදිරිය යුතු ය. මහණෙනි, තුන්සිවුරෙන් අවිප්පවාසය මෙසේ ඉදිරිය යුතු ය: ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්විය යුතු ය:

63. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: සඞ්ඝයා විසින් යම් ඒ තුන් සිවුරෙන් අවිප්පවාසයෙක් සම්මත කරණ ලද ද, සඞ්ඝයාහට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ ඒ තුන් සිවුරෙන් අවිප්පවාසය උදුරන්නේ ය. මේ දැන්වීම ය."

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: සඞ්ඝයා විසින් යම් ඒ තුන් සිවුරෙන් අවිප්පවාසයෙක් සම්මත කරණ ලද්දේ ද, සඞ්ඝ තෙමේ ඒ තුන් සිවුරෙන් අවිප්පවාසය උදුරාලයි. යම් ආයුෂ්මතෙකුහට මේ තුන් සිවුරෙන් අවිප්පවාසයාගේ උදුරාලීම රුචි වේ නම්, හෙ තෙමේ තුෂණීම්භූත වේවා. යමෙකුහට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා."

"සඞ්ඝයා විසින් ඒ තුන් සිවුරෙන් අවිප්පවාසය උදුරණ ලද්දේ ය. සඞ්ඝයාහට කැමැති වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

64. "මහණෙනි, මෙසේ සමානසංවාසසීමාව ඉදිරිය යුතු ය: ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්විය යුතු ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් යම් ඒ සමානසංවාසඑකූපොසථසීමාවක් සම්මත කරණ ලද ද, ඉදින් සඞ්ඝයාහට කල් පැමිණියේ නම්, සඞ්ඝ තෙමේ ඒ සමානසංවාසඑකූපොසථසීමාව උදුරන්නේ ය. මේ දැන්වීම ය."

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමාන සංවාසා එකූපොසථා, සඞ්ඝො තං සීමං සමූහනති සමානසංවාසං එකූපොසථං. යස්සායස්මතො ඛමති එතිස්සා සීමාය සමානසංවාසාය එකූපොසථාය සමුග්ඝාතො, සො තුණ්හස්ස යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

"සමූහතා සා සීමා සඞ්ඝෙන සමානසංවාසා එකූපොසථා. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති

65. "අසම්මතාය භික්ඛවෙ, සීමාය අට්ඨපිතාය යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති, යා තස්ස ගාමස්ස වා ගාමසීමා, නිගමස්ස වා නිගමසීමා, අයං තත්‍ථ සමානසංවාසා එකූපොසථා."

66. "අගාමකෙ චෙ භික්ඛවෙ, අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරා, අයං තත්‍ථ සමානසංවාසා එකූපොසථා."

67 "සබ්බා භික්ඛවෙ, නදී අසීමා. සබ්බො සමුද්දො අසීමො. සබ්බො ජාතස්සරො අසීමො. නදියා වා භික්ඛවෙ, සමුද්දෙ වා ජාතස්සරෙ වා යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපා, අයං තත්‍ථ සමානසංවාසා එකූපොසථා". ති.

68. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සීමාය සීමං සම්භින්දන්ති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං. "යෙසං භික්ඛවෙ සීමා පඨමං සම්මතා, තෙසං තං කම්මං ධම්මිකං අකුප්පං ඨානාරහං. යෙසං භික්ඛවෙ, සීමා පච්ඡා සම්මතා, තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහං. න භික්ඛවෙ, සීමාය සීමා සම්භින්දිතබ්බා. යො සම්භින්දෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති

69. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සීමාය සීමං අජ්ඣොත්‍ථරන්ති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං. "යෙසං භික්ඛවෙ, සීමා පඨමං සම්මතා, තෙසං තං කම්මං ධම්මිකං අකුප්පං ඨානාරහං. යෙසං භික්ඛවෙ, සීමා පච්ඡා සම්මතා, තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහං. න භික්ඛවෙ සීමාය සීමා අජ්ඣොත්‍ථරිතබ්බා. යො අජ්ඣො-ත්‍ථරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, සීමං සම්මන්නන්තෙන සීමන්තරිකං ඨපෙත්වා සීමං සම්මනිතු" න්ති.

70. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කති නු ඛො උපොසථා?" ති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං. "ද්වෙ මෙ භික්ඛවෙ, උපොසථා චාතුද්දසිකො ච පණ්ණරසිකො ච. ඉමෙ ඛො භික්ඛවෙ, ද්වෙ උපොසථා" ති

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝයා විසින් යම් ඒ සමානසංවාසඑකුපොසථසීමාවක් සම්මත කරණ ලද ද, සඞ්ඝ තෙමේ ඒ සමානසංවාසඑකුපොසථසීමාව උදුරාලයි. යම් ආයුෂ්මතෙකුට මේ සමාන සංවාසඑකුපොසථසීමාවගේ උදුරාලීම රුචි වේ ද, හෙතෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා.

"සඞ්ඝයා විසින් ඒ සමානසංවාසඑකුපොසථසීමාව උදුරණ ලද්දී ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණිම්භූත වේ. මෙය මෙසේ දරමි"යි.

65. "මහණෙනි, සීමාවක් සම්මත නො කළ කල්හි නො පිරිසිඳි කල්හි යම් ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට වාසය කෙරේ ද, ඒ ගම පිළිබඳ යම් ගාමසීමාවක් හෝ නියම්ගම පිළිබඳ යම් නිගමසීමාවක් හෝ වේ ද, මේ එහි සමානසංවාසඑකුපොසථසීමාව" යි.

66. "මහණෙනි, ගම් නො වූ වනයෙහි හාත්පස සතරවටින් අබ්භන්තර* සතක් වේ ද, මේ එහි සමානසංවාස එකුපොසථසීමාව ය."

67. "මහණෙනි, සියලු නදිය සීමාව නො වෙයි. සියලු මුහුද සීමාව නො වේ. සියලු ජාතස්සරය (ඉබේ ඇති වූ විල) සීමාව නො වේ. මහණෙනි, නදියෙක හෝ මුහුදෙහි හෝ ජාතස්සරයෙක හෝ යම් පෙදෙසක් මධ්‍යමපුරුෂයාගේ හාත්පස දිය ඉසීමෙන් පිරිසිදේ ද, මේ උදකුක්ඛෙපය එහි සමානසංවාසඑකුපොසථසීමා ය."

68. එකල්හි සවග භික්ෂූහු සීමාවෙන් සීමාව බිඳිත්. (මිශ්‍ර කරත්). භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යම් කෙනෙකුන් විසින් පළමු කොට සීමාවක් සම්මත කරණ ලද ද, ඔවුන්ගේ ඒ කර්මය ධාර්මික වේ. බැහැර කළයුතු බවට නො පැමිණේ. කරුණට සුදුසු වේ. මහණෙනි, යම් කෙනකුන් විසින් පසු ව සීමාවක් සම්මත කරණ ලද ද, ඔවුන්ගේ ඒ කර්මය ධාර්මික නො වේ. බැහැර කළ යුතු බවට පැමිණේ. කරුණට සුදුසු නො වේ. මහණෙනි, සීමාවෙන් සීමාව නො බිඳිය යුතු ය. යමෙක් බිඳින්නේ නම්, දුකුලාඇවැත් වේ.

69. එකල්හි සවග භික්ෂූහු සීමාවෙන් සීමාව යටපත් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යම් කෙනකුන් විසින් පළමු කොට සීමාවක් සම්මත කරණ ලද ද, ඔවුන්ගේ ඒ කර්මය ධාර්මික වේ. බැහැර කළ යුතු බවට නො පැමිණේ. කාරණයට සුදුසු වේ. මහණෙනි, යම් කෙනකුන් විසින් පසු ව සීමාවක් සම්මත කරණ ලද ද, ඔවුන්ගේ ඒ කර්මය ධාර්මික නො වේ. බැහැර කළ යුතු බවට පැමිණේ. කාරණයට සුදුසු නො වේ. මහණෙනි, සීමාවෙන් සීමාව යටපත් නො කළ යුතු ය. යමෙක් යටපත් කරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, සීමාවක් සම්මත කරන්නනු විසින් සීමාවට අතරක් තබා සීමා සම්මත කරන්නට අනුදනිමි."

70. එකල්හි භික්ෂූන්ට "උපොසථයෝ කෙතෙක් දැ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, චාතුද්දසිකය පඤ්ඤරසිකය යි උපොසථයෝ දෙදෙනෙකි. මහණෙනි, මේ උපොසථයෝ දෙදෙන වෙති."

* එක් අබ්භන්තරයෙක් විසිඅට රියනක දුරය.

71. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කති නු ඛො උපොසථකම්මානී ?" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "චත්තාරිමානි භික්ඛවෙ, උපොසථකම්මානි - අධම්මෙන වග්ගං උපොසථකම්මං, අධම්මෙන සමග්ගං උපොසථකම්මං. ධම්මෙන වග්ගං උපොසථකම්මං ධම්මෙන සමග්ගං උපොසථකම්ම" න්ති.

72. "තත්‍ර භික්ඛවෙ, යමිදං[1] අධම්මෙන වග්ගං උපොසථකම්මං, න භික්ඛවෙ, එවරූපං උපොසථකම්මං කාතබ්බං. න ච මයා එවරූපං උපොසථකම්මං අනුඤ්ඤාතං."

73. "තත්‍ර භික්ඛවෙ, යමිදං අධම්මෙන සමග්ගං උපොසථකම්මං, න භික්ඛවෙ, එවරූපං උපොසථකම්මං කාතබ්බං. න ච මයා එවරූපං උපොසථකම්මං අනුඤ්ඤාතං."

74. "තත්‍ර භික්ඛවෙ, යමිදං ධම්මෙන වග්ගං උපොසථකම්මං, න භික්ඛවෙ, එවරූපං උපොසථකම්මං කාතබ්බං. න ච මයා එවරූපං උපොසථකම්මං අනුඤ්ඤාතං."

75. "තත්‍ර භික්ඛවෙ, යමිදං ධම්මෙන සමග්ගං උපොසථකම්මං, එවරූපං භික්ඛවෙ, උපොසථකම්මං කාතබ්බං. එවරූපඤ්ච මයා උපොසථකම්මං අනුඤ්ඤාතං. තස්මාතිහ භික්ඛවෙ, 'එවරූපං උපොසථකම්මං කරිස්සාම යදිදං ධම්මෙන සමග්ග' න්ති, එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බ" න්ති.

76. අථ ඛො භික්ඛූනං එතදහොසි. "කති නු ඛො පාතිමොක්ඛුද්දෙසා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "පඤ්චිමෙ භික්ඛවෙ, පාතිමොක්ඛුද්දෙසා. - නිදානං උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං පඨමො පාතිමොක්ඛුද්දෙසො."

77. "නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං දුතියො පාතිමොක්ඛුද්දෙසො."

78. "නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං තතියො පාතිමොක්ඛුද්දෙසො."

79. "නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා ද්වෙ අනියතෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං. අයං චතුත්ථො පාතිමොක්ඛුද්දෙසො."

80. "විත්ථාරෙනෙව පඤ්චමො. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච පාතිමොක්ඛුද්දෙසා" ති.

1. "යදිදං" ම නු ප. ම ජ සං.

71. එකල්හි භික්ෂූන්ට "උපොසථකර්ම කෙතෙක් ද?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මේ උපොසථ කර්ම, අධර්මයෙන් වර්ග වූ උපොසථකර්මය, අධර්මයෙන් සමගි වූ උපොසථ කර්මය, ධර්මයෙන් වර්ග වූ උපොසථ කර්මය, ධර්මයෙන් සමගි වූ උපොසථ කර්මය යි සතරෙකි."

72. "මහණෙනි, ඒ උපොසථ කර්මයන් අතුරෙහි යම් මේ අධර්මයෙන් වර්ග වූ උපොසථකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ උපොසථ කර්මය නො කළ යුතු ය. මා විසින් එබඳු වූ උපොසථකර්මයෙක් නො අනුදන්නා ලද ය."

73. "මහණෙනි, ඒ උපොසථ කර්මයන් අතුරෙහි යම් මේ අධර්මයෙන් සමගි වූ උපොසථකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ උපොසථකර්මය නො කළ යුතු ය. මා විසින් එබඳු උපොසථකර්මයෙක් නො අනුදන්නා ලද ය."

74. "මහණෙනි, ඒ උපොසථකර්මයන් අතුරෙහි යම් මේ ධර්මයෙන් වර්ග වූ උපොසථකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ උපොසථකර්මය නො කළ යුතු ය. මා විසින් එබඳු උපොසථකර්මයෙක් නො අනුදන්නා ලද ය."

75. "මහණෙනි, ඒ උපොසථකර්මයන් අතුරෙහි යම් මේ ධර්මයෙන් සමගි වූ උපොසථකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ උපොසථකර්මය කළ යුතු ය. මා විසින් අනුදන්නා ලද්දේ එබඳු උපොසථකර්මයෙකි. මහණෙනි, එහෙයින් 'මේ ශාසනයෙහි යම් මේ ධර්මයෙන් සමගි වූ උපොසථ කර්මයෙක් වේ ද, එබඳු වූ උපොසථකර්මය කරන්නෙමු' යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ම ය."

76. එකල්හි භික්ෂූන්ට "ප්‍රාතිමොක්ඛොද්දෙසයෝ කෙතෙක් ද" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මේ ප්‍රාති-මොක්ඛොද්දෙසයෝ පසෙකි. නිදානය උදෙසා සෙස්ස ශ්‍රැතියෙන් ඇස්විය යුතු ය. මේ පළමුවන පාමොක්උදෙසීම වේ."

77. "නිදානය උදෙසා සතර පරිජි උදෙසා සෙස්ස ශ්‍රැතියෙන් ඇස්විය යුත්තේ ය. මේ දෙවන පාමොක්උදෙසීම වේ."

78. "නිදානය උදෙසා සතර පරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙස් උදෙසා සෙස්ස ශ්‍රැතියෙන් ඇස්විය යුතු ය. මේ තෙවන පාමොක් උදෙසීම වේ."

79. "නිදානය උදෙසා සතරපරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙස් උදෙසා අනියත දෙක උදෙසා සෙස්ස ශ්‍රැතියෙන් ඇස්විය යුතු ය. මේ සිවුවන පාමොක් උදෙසීම වේ."

80. "විස්තර වශයෙන් ම පාමොක් දෙසීම පස්වන උද්දෙසය යි. මහණෙනි, මේ පාමොක් උදෙසීම් පසය."

81. තෙන ඛො පන සමයෙන භික්ඛූ "භගවතා සඞ්ඛිත්තෙන පාතිමොක්ඛුද්දෙසො අනුඤ්ඤාතො" ති සබ්බකාලං සඞ්ඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සඞ්ඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

82. තෙන ඛො පන සමයෙන **කොසලෙසු ජනපදෙසු** අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සවරභයං [1] අහොසි. භික්ඛූ නාසක්ඛිංසු විත්ථාරෙන පාතිමොක්ඛං උද්දිසිතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සති අන්තරායෙ සඞ්ඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසිතු" න්ති."

83. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අසතිපි අන්තරායෙ සඞ්ඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ අසති අන්තරායෙ සඞ්ඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ සති අන්තරායෙ සඞ්ඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසිතුං. තත්‍රිමෙ අන්තරායා:- රාජන්තරායො චොරන්තරායො අග්‍යන්තරායො උදකන්තරායො මනුස්සන්තරායො අමනුස්සන්තරායො වාළන්තරායො සිරිංසපන්තරායො ජීවිතන්තරායො බ්‍රහ්මචරියන්තරායො [2]. අනුජානාමි භික්ඛවෙ, එවරූපෙසු අන්තරායෙසු සංඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසිතුං. අසති අන්තරායෙ විත්ථාරෙනා" ති.

84. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ අනජ්ඣිට්ඨා ධම්මං භාසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ සඞ්ඝමජ්ඣෙ අනජ්ඣිට්ඨෙන ධම්මො භාසිතබ්බො. යො භාසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා සාමං වා ධම්මං භාසිතුං, පරං වා අජ්ඣෙසිතු" න්ති.

85. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ අසම්මතා විනයං පුච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ අසම්මතෙන විනයො පුච්ඡිතබ්බො. යො පුච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ සම්මතෙන විනයං පුච්ඡිතුං."

86. "එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො: අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං. පරෙන වා පරො සම්මන්නිතබ්බො.

87. "කථඤ්ච අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං?. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො -

"සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො: යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ඉත්ථන්නාමං විනයං පුච්ඡෙය්‍ය' න්ති. එවං අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං:"

1. "සඤ්චරභයං" සි. 2 "බ්‍රහ්මචරියන්තරායොති" ම ඡ සං.

81. එකල්හි භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් පාමොක් උදෙසීම අනුදන්නා ලදැ" යි හැම කල්හි සැකෙවින් පාමොක් උදෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සැකෙවින් පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම් දුකුළා ඇවැත් වේ."

82. එකල්හි **කොසොල් දනව්වෙහි** එක්තරා ආවාසයෙක එ දවස පොහොයෙහි වනවැසි මිනිසුන්ගෙන් බියෙක් වූයේ ය. භික්ෂූහු විස්තර වශයෙන් පාමොක් උදෙසන්නට අපොහොසත් වූහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අන්තරායයක් ඇති කල්හි සැකෙවින් පාමොක් උදෙසන්නට අනුදනිමි."

83. එකල්හි සවග භික්ෂූහු අන්තරායයක් නැති කල්හි ද සැකෙවින් පාමොක් උදෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අන්තරායයක් නැති කල්හි සැකෙවින් පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, අන්තරායයක් ඇති කල්හි සැකෙවින් පාමොක් උදෙසන්නට අනුදනිමි. එහි මේ අන්තරායයෝ ය – රජුගෙන් වන අන්තරාය, සොරුන්ගෙන් වන අන්තරාය, ගින්නෙන් වන අන්තරාය, ජලයෙන් වන අන්තරාය, මිනිසුන්ගෙන් වන අන්තරාය, අමනුෂ්‍යයන්ගෙන් වන අන්තරාය, චණ්ඩමෘගයන්ගෙන් වන අන්තරාය, සර්පයන්ගෙන් වන අන්තරාය, ජීවිතයට වන අන්තරාය, බ්‍රහ්ම චර්‍ය්‍යායට වන අන්තරායය යි. මහණෙනි, මෙබඳු අන්තරායයක් ඇති කල්හි සැකෙවින් පාමොක් උදෙසන්නට ද, අන්තරායයක් නැති කල්හි විස්තර වශයෙන් උදෙසන්නට ද අනුදනිමි" යි.

84. එකල්හි සවග භික්ෂූහු ආරාධනා නො කරණ ලද්දාහු සඟ මැද දහම් දෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ආරාධනා නො කරණ ලද්දහු විසින් සඟ මැද දහම් නො දෙසිය යුතු ය. යමෙක් දෙසන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් තමන් හෝ දහම් දෙසන්නට නැතහොත් අනුන්ට හෝ ආරාධනා කරන්නට අනුදනිමි" යි.

85. එකල්හි සවග භික්ෂූහු සඟ මැද සම්මත නො කරණ ලද්දාහු විනය විචාරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සම්මත නො කරණ ලද්දහු විසින් සඟ මැද විනය නො විචාළ යුතු ය. යමෙක් විචාරන්නේ නම් දුකුළා ඇවැත් වේ. මහණෙනි, සම්මත කරණ ලද්දහු විසින් සඟ මැද විනය විචාරන්නට අනුදනිමි" යි.

86. "මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය. තමන් විසින් හෝ තෙමේ සම්මත කළ යුතු ය. අනිකකු විසින් අනෙකෙක් සම්මත කළ යුතු" ය.

87. "තමන් විසින් තමා කෙසේ සම්මත කළ යුතු ද? ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන් විය යුතු" ය.

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මම මේ නම් ඇත්තහු විනය විචාරන්නෙමි' යි මෙසේ තමන් විසින් හෝ තමා සම්මත කළ යුතු" ය.

88. කථඤ්ච පරෙන වා පරො සම්මන්නිතබ්බො ? ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, ඉත්ථන්නාමො ඉත්ථන්නාමං විනයං පුච්ඡෙය්‍යාති එවං පරෙන වා පරො [1] සම්මන්නිතබ්බො" ති.

89. තෙන ඛො පන සමයෙන පෙසලා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ සම්මතා විනයං පුච්ඡන්ති. ඡබ්බග්ගියා භික්ඛූ ලභන්ති ආඝාතං. ලභන්ති අප්පච්චයං. වධෙන තජ්ජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ සම්මතෙනපි පරිසං ඔලොකෙත්වා පුග්ගලං තුලයිත්වා විනයං පුච්ඡිතු" න්ති.

90. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ අසම්මතා විනයං විස්සජ්ජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ අසම්මතෙන විනයො විස්සජ්ජෙතබ්බො. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ සම්මතෙන විනයං විස්සජ්ජෙතුං."

91. "එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො [2] – අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං. පරෙන වා පරො සම්මන්නිතබ්බො.

92. "කථඤ්ච අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං ? ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

'සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ඉත්ථන්නාමෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යන්ති.' එවං අත්තනා වා අත්තානං සම්මන්නිතබ්බං."

93. "කථඤ්ච පරෙන වා පරො සම්මන්නිතබ්බො ? ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං ඉත්ථන්නාමො ඉත්ථන්නාමෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යාති' එවං පරෙන වා පරො සම්මන්නිතබ්බො" ති.

94. තෙන ඛො පන සමයෙන පෙසලා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ සම්මතා විනයං විස්සජ්ජෙන්ති. ඡබ්බග්ගියා භික්ඛූ ලභන්ති ආඝාතං. ලභන්ති අප්පච්චයං. වධෙන තජ්ජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ සඞ්ඝමජ්ඣෙ සම්මතෙනපි පරිසං ඔලොකෙත්වා පුග්ගලං තුලයිත්වා විනයං විස්සජ්ජෙතු" න්ති.

95. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අනොකාසකතං භික්ඛුං ආපත්තියා චොදෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අනොකාසකතො භික්ඛු ආපත්තියා චොදෙතබ්බො. යො චොදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, ඔකාසං කාරාපෙත්වා ආපත්තියා චොදෙතුං – කරොතු මෙ ආයස්මා [3] ඔකාසං අහං තං වත්තුකාමො" ති.

---

1. "පරෙන පරො" අ වි. ජ පු. තො වි. ම නු ප.
2 "සම්මන්නිතබ්බඃ" ම ජ සං. 3 "කරොතු ආයස්මා" ම ජ සං. තො වි.

88. "අනෙකෙකු විසින් අනෙකෙක් කෙසේ සම්මත කළ යුතු ද? ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය:

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මෙ නම් ඇත්තේ මෙ නම් ඇත්තහු විනය විචාරන්නේ ය යි මෙසේ අනෙකෙකු විසින් අනෙකෙක් සම්මත කළ යුතු ය."

89. එකල්හි පෙශල භික්ෂූහු සම්මත කරණ ලද්දෑහු සඟ මැද විනය විචාරත්. සවග භික්ෂූහු ක්‍රොධ කෙරෙත්. නො සතුටු වෙත්. වධයෙන් තර්ජනය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සම්මතය ලද්දහු විසිනු දු පිරිස බලා පුද්ගලයාගේ පමණ සලකා සඟ මැද විනය විචාරන්නට අනුදනිමි" යි.

90. එකල්හි සවග භික්ෂූහු සම්මත නො කරණ ලද්දෑහු සඟ මැද විනය විසඳත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සම්මත නො කරණ ලද්දහු විසින් සඟ මැද විනය නො විසඳිය යුතු ය. යමෙක් විසඳන්නේ නම් දුකුළාඇවැත් වේ. මහණෙනි, සම්මතය ලද්දහු විසින් සඟ මැද විනය විසඳන්නට අනුදනිමි" යි

91. "මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය. තමන් විසින් තමා සම්මත කළ යුතු ය. අනෙකකු විසින් අනෙකෙක් සම්මත කළ යුතු ය.

92. "තමන් විසින් තමා කෙසේ සම්මත කළ යුතු ද ? ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය:

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මම මෙ නම් ඇත්තහු විසින් විනය විචාරණ ලද්දෙමි විසඳන්නෙමි යි මෙසේ තමන් විසින් තමා සම්මත කළ යුතු ය.

93. "අනෙකෙකු විසින් අනෙකෙක් කෙසේ සම්මත කළ යුතු ද ? ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂූනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය:

"ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මෙ නම් ඇත්තේ මෙ නම් ඇත්තහු විසින් විනය විචාරණ ලද්දේ විසඳන්නේ ය යි මෙසේ අනෙකෙකු විසින් අනෙකෙක් සම්මත කළ යුතු ය."

94. එකල්හි පෙශල භික්ෂූහු සම්මත කරණ ලද්දෑහු සඟ මැද විනය විසඳත්. සවග භික්ෂූහු ක්‍රොධ කෙරෙත්. නො සතුටු වෙත්. වධයෙන් තර්ජනය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සම්මතය ලද්දහු විසින් ද සඟ මැද පිරිස බලා පුද්ගලයා ගැණ සලකා විනය විසඳන්නට අනුදනිමි"යි.

95. එකල්හි සවග භික්ෂූහු අවකාශ නො කළ භික්ෂුහට ඇවැතින් චොදනා කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අවකාශ නො කළ භික්ෂුහට ඇවැතින් චොදනා නො කළ යුතු ය. යමෙක් චොදනා කරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, 'ආයුෂ්මත් තෙමේ මට අවකාශ කෙරේවා. මම ඔබට කියනු කැමැත්තෙමි' යි අවකාශ කරවා ඇවැතින් චොදනා කරන්නට අනුදනිමි"යි.

96. තෙන ඛො පන සමයෙන පෙසලා භික්ඛූ. ඡබ්බග්ගියෙ භික්ඛූ ඔකාසං කාරාපෙත්වා ආපත්තියා චොදෙන්ති. ඡබ්බග්ගියා භික්ඛූ ලභන්ති ආඝාතං ලභන්ති අප්පච්චයං. වධෙන තජ්ජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, කතෙපි ඔකාසෙ පුග්ගලං තුලයිත්වා ආපත්තියා චොදෙතු" න්ති.

97. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "පුරම්හාකං පෙසලා භික්ඛූ ඔකාසං කාරාපෙන්තී" ති පටිගච්චෙව සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ ඔකාසං කාරාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ ඔකාසො කාරාපෙතබ්බො. යො කාරාපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, පුග්ගලං තුලයිත්වා ඔකාසං කාරාපෙතු"න්ති. [1]

98. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ අධම්මකම්මං කරොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අධම්මකම්මං [2] කාතබ්බං. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති. කරොන්තියෙව අධම්මකම්මං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අධම්මකම්මෙ කයිරමානෙ පටික්කොසිතු" න්ති.

99· තෙන ඛො පන සමයෙන පෙසලා භික්ඛූ ඡබ්බග්ගියෙහි භික්ඛූහි අධම්මකම්මෙ කයිරමානෙ පටික්කොසන්ති. ඡබ්බග්ගියා භික්ඛූ ලභන්ති ආඝාතං. ලභන්ති අප්පච්චයං. වධෙන තජ්ජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, දිට්ඨිම්පි ආවිකාතු" න්ති. තෙසංයෙව සන්තිකෙ දිට්ඨිං ආවිකරොන්ති. ඡබ්බග්ගියා භික්ඛූ ලභන්ති ආඝාතං. ලභන්ති අප්පච්චයං. වධෙන තජ්ජෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, චතූහි පඤ්චහි පටික්කොසිතුං. ද්වීහි තීහි දිට්ඨිං ආවිකාතුං. එකෙන අධිට්ඨාතුං - න මෙතං ඛමතී" ති.

100. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ පාතිමොක්ඛං උද්දිසමානා [3] සඤ්චිච්ච න සාවෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, පාතිමොක්ඛුද්දෙසකෙන සඤ්චිච්ච න සාවෙතබ්බං. යො න සාවෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

101. තෙන ඛො පන සමයෙන ආයස්මා **උදායී** සඞ්ඝස්ස පාතිමොක්ඛුද්දෙසකො හොති කාකස්සරකො. අථ ඛො ආයස්මතො උදායිස්ස එතදහොසි: "භගවතා පඤ්ඤත්තං පාතිමොක්ඛුද්දෙසකෙන සාවෙතබ්බ"න්ති. අහඤ්චම්හි කාකස්සරකො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පාතිමොක්ඛුද්දෙසකෙන වායමිතුං - කථං සාවෙය්‍ය න්ති. වායමන්තස්ස අනාපත්තී" ති.

1. "ඔකාසං කාතුං" 2 "න භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ අධම්මකම්මං" P T S.
3. "උද්දිසස්සමානා" ම ඡ සං. P T S.

96. එකල්හි පෙශල භික්ෂූහු අවසර ලබා සවග භික්ෂූන්ට ඇවැතින් චොදනා කෙරෙත්. සවග භික්ෂූහු ක්‍රොධ කෙරෙත්. නො සතුටු වෙත්. වධයෙන් තර්ජනය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අවසර දුන් කල්හි ද පුද්ගලයා ගැණ සලකා චොදනා කරන්නට අනුදනිමි" යි.

97. එකල්හි සවග භික්ෂූහු "නො බෝ කලකින් අපට (චොදනා කරණු පිණිස) පෙශල භික්ෂූහු අවකාශ කරවත්" යි පළමු කොට ම ඇවැත් රහිත වූ පිරිසිදු භික්ෂූන්ට (චොදනා) වස්තුවක් නැති කල්හි නිකරුණෙහි අවකාශ කරවත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඇවැත් රහිත පිරිසිදු භික්ෂූන්ට වස්තුවක් නැති කල්හි නිකරුණෙහි (චොදනා කිරීමට) අවකාශ නො කරවිය යුතු ය. යමෙක් අවකාශ කරවන්නේ නම් දුකුළාඇවැත් වේ. මහණෙනි, පුද්ගලයා සලකා අවකාශ කරන්නට අනුදනිමි"යි.

98. එකල්හි සවග භික්ෂූහු සඟමැද අධර්මකර්ම කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අධර්මකර්ම නො කළ යුතු ය. යමෙක් කරන්නේ නම්, දුකුළාඇවැත් වේ." අධර්මකර්ම කෙරෙත් ම ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අධර්මකර්ම කරණු ලබන කල්හි වළකාලන්නට අනුදනිමි" යි

99. එකල්හි පෙශල භික්ෂූහු සවග භික්ෂූන් අධර්මකර්ම කරණු ලබන කල්හි වළකාලත්. සවග භික්ෂූහු ක්‍රොධ කෙරෙත්. නො සතුටු වෙත්. වධයෙන් තර්ජනය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දෘෂ්ටිය ද ප්‍රකාශ කරන්නට අනුදනිමි." ඔවුන් වෙත ම දෘෂ්ටිය ප්‍රකාශ කෙරෙත්. සවග භික්ෂූහු ක්‍රොධ කෙරෙත්. නොසතුටු වෙත්. වධයෙන් තර්ජනය කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, 'ඒ අධර්මකර්මය මට රුචි නො වේ' යි සිවු දෙනකුන් විසින් පස් දෙනකුන් විසින් වළකාලන්නට ද, දෙදෙනකුන් විසින් තුන් දෙනකුන් විසින් දෘෂ්ටිය ප්‍රකාශ කරන්නට ද, එකකු විසින් 'මෙය මට රුචි නො වේ ය' යි ඉටන්ට ද අනුදනිමි"යි.

100. එකල්හි සවග භික්ෂූහු සඟ මැද පාමොක් උදෙසන්නාහු දැන දැන නො අස්වත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පාමොක් උදෙසන්නහු විසින් දැන දැන නො ඇස්විය යුතු නො වේ. යමෙක් නො අස්වන්නේ නම්, දුකුළාඇවැත් වේ."

101. එකල්හි ආයුෂ්මත් උදායිස්ථවිර තෙමේ සඞ්ඝයාගේ පාතිමොක්ඛුද්දෙසක වූයේ කවුඩුහඬ ඇත්තේ වේ. ඉක්බිති ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'පාමොක් උදෙසන්නහු විසින් ඇස්විය යුතු ය'යි පණවන ලද්දේ ය. මම ද කවුඩු හඬ ඇත්තේ වෙමි. මා විසින් කෙසේ පිළිපැදිය යුතු දැ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පාතිමොක්ඛුද්දෙසකයා විසින් 'කෙසේ අස්වන්නෙම් දැ'යි උත්සාහ කරන්නට අනුදනිමි. උත්සාහ කරන්නාහට ඇවැත් නො වේ."

102. තෙන ඛො පන සමයෙන **දෙවදත්තො** සගහට්ඨාය පරිසාය පාතිමොක්ඛං උද්දිසති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සගහට්ඨාය පරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

103. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඞ්ඝමජ්ඣෙ අනජ්ඣිට්ඨා පාතිමොක්ඛං උද්දිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සඞ්ඝමජ්ඣෙ අනජ්ඣිට්ඨෙන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, 'ථෙරාධිකං[1] පාතිමොක්ඛ' න්ති."

**අසීතිභාණවාරං නිට්ඨිතං.**

---

1 "ථෙරාධෙය්‍යං" අට්ඨ නො වි.

102. එකල්හි **දෙවදත්ත** තෙමේ ගිහියන් සහිත පිරිසෙහි පාමොක් උදෙසයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගිහියන් සහිත පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ."

103. එකල්හි සවග භික්‍ෂුහු සඟ මැද ආරාධනා නො කරණ ලද්දාහු පාමොක් උදෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ආරාධනා නො කරණ ලද්දහු විසින් සඟ මැද පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, පාමොක් උදෙසීම 'සඞ්ඝස්ථවිරයන් අයත් ය' යි අනුදනිමි."

**අන්‍යතීර්ථකභාණවාරය නිමි.**

---

1. අථ ඛො භගවා **රාජගහෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **චොදනාවත්ථු**, තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන චොදනාවත්ථු, තදවසරි. තත්‍ර සුදං භගවා චොදනාවත්ථුස්මිං විහරති. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ සම්බහුලා භික්ඛූ විහරන්ති. තත්‍ථ ථෙරො භික්ඛු බාලො හොති අව්‍යත්තො. සො න ජානාති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා.

2. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: “භගවතා පඤ්ඤත්තං ‘ථෙරාධිකං පාතිමොක්ඛ’ න්ති. අයඤ්ච අම්හාකං ථෙරො බාලො අව්‍යත්තො. න ජානාති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ?” න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, යො තත්‍ථ භික්ඛු ව්‍යත්තො පටිබලො, තස්සාධෙය්‍යං පාතිමොක්ඛ” න්ති.

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා භික්ඛූ විහරන්ති බාලා අව්‍යත්තා. තෙ න ජානන්ති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා. තෙ ථෙරං අජ්ඣෙසිංසු: “උද්දිසතු භන්තෙ, ථෙරො පාතිමොක්ඛ” න්ති. සො එවමාහ. “න මෙ ආවුසො වත්තතී” ති දුතියං ථෙරං අජ්ඣෙසිංසු: “උද්දිසතු භන්තෙ, ථෙරො පාතිමොක්ඛ” න්ති. සොපි එවමාහ: “න මෙ ආවුසො වත්තතී” ති තතියං ථෙරං අජ්ඣෙසිංසු: උද්දිසතු භන්තෙ ථෙරො පාතිමොක්ඛ” න්ති. සොපි එවමාහ: “න මෙ ආවුසො වත්තතී” ති. එතෙනව උපායෙන යාව සඞ්ඝනවකං අජ්ඣෙසිංසු: “උද්දිසතු ආයස්මා පාතිමොක්ඛ” න්ති. සොපි එවමාහ: “න මෙ භන්තෙ වත්තතී” ති.

4. භගවතො එතමත්ථං ආරොචෙසුං “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා භික්ඛූ විහරන්ති බාලා අබ්‍යත්තා. තෙ න ජානනත් උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාති-මොක්ඛුද්දෙසං වා. තෙ ථෙරං අජ්ඣෙසන්ති: ‘උද්දිසතු භන්තෙ, ථෙරො පාතිමොක්ඛ’ න්ති. සො එවං වදෙති. ‘න මෙ ආවුසො වත්තතී’ ති. දුතියම්පි [1] ථෙරං අජ්ඣෙසන්ති: “උද්දිසතු භන්තෙ, ථෙරො පාතිමොක්ඛ’ න්ති. සොපි එවං වදෙති: ‘න මෙ ආවුසො වත්තතී’ ති. තතියම්පි [2] ථෙරං අජ්ඣෙසන්ති: ‘උද්දිසතු භන්තෙ, ථෙරො පාතිමොක්ඛ’ න්ති. සොපි එවං වදෙති: ‘න මෙ ආවුසො වත්තතී’ ති. එතෙනෙව උපායෙන යාව සඞ්ඝනවකං අජ්ඣෙසන්ති: ‘උද්දිසතු ආයස්මා පාතිමොක්ඛ’ න්ති. සොපි එවං වදෙති: ‘න මෙ භන්තෙ, වත්තතී’ ති.

1. “දුතියං” මජ සං. P T S.  2. “තතියං” මජ සං. P T S.

Free Distribution www.aathaapi.org

1. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර කැමැති තාක් වැඩ වාසය කොට **චොදනාවත්ථු** නගරය බලා වැඩි සේක. පිළිවෙළින් චාරිකා කරණ සේක් චොදනාවත්ථු නගරයට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ ඒ චොදනාවත්ථුනගරයෙහි වැඩ වාසය කරත්. එකල්හි එහි එක්තරා ආවාසයෙක බොහෝ භික්ෂූහු වාසය කරති. එහි වැසි ස්ථවිර භික්ෂු තෙමේ අඥ ය. අව්‍යක්ත ය. හෙ තෙමේ උපොසථය හෝ උපොසථකර්මය හෝ පාතිමොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ නො දනී යි.

2. එහි වැසි අනික් භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'පාතිමොක්ඛය සඞ්ඝස්ථවිරයන් අයත්' යි පණවන ලද්දේ ය. අපගේ මේ ස්ථවිර තෙමේත් අඥ ය. අව්‍යක්ත ය. උපොසථය හෝ උපොසථ කර්මය හෝ පාතිමොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ නො දනී යි. මෙහි ලා අප විසින් කෙසේ පිළිපැදිය යුතු දැ" ? යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, එහි ව්‍යක්ත වූ ප්‍රතිබල මහණෙක් වෙසේ නම්, පාතිමොක්ඛය ඔහු අයත් ය යි අනුදනිමි" යි.

3. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු වාසය කෙරෙත්. ඔහු උපොසථය හෝ උපොසථ කම්මය හෝ පාතිමොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ නො දනිත්. ඔහු, "ස්වාමීනි, ස්ථවිර තෙමේ පාතිමොක්ඛය උදෙසාවා" යි තෙරුන්ට ආරාධනා කළහ. ස්ථවිර තෙමේ "ඇවැත්නි, මට ප්‍රගුණ නැතැ" යි කී ය. දෙවන තෙරුන්ට ද "ස්වාමීනි, ස්ථවිර තෙමේ පාතිමොක්ඛය උදෙසාවා" යි ආරාධනා කළහ. ඒ ස්ථවිර තෙමේ ද "ඇවැත්නි, මට ප්‍රගුණ නැතැ" යි කී ය. "ස්ථවිර තෙමේ පාතිමොක්ඛය උදෙසාවා" යි තෙවන තෙරුන්ට ද ආරාධනා කළහ. ඒ ස්ථවිර තෙමේත් "ඇවැත්නි, මට ප්‍රගුණ නැතැ" යි කී ය. මේ ක්‍රමයෙන් සඞ්ඝනවකයා තෙක් "ආයුෂමත් තෙමේ පාතිමොක්ඛය උදෙසාවා" යි ආරාධනා කළහ. හෙතෙමේ ද "ස්වාමීනි, මට ප්‍රගුණ නැතැ" යි කී ය.

4. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු වාසය කෙරෙත්. ඔහු උපොසථය හෝ උපොසථකර්මය හෝ පාතිමොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ නො දනිත්. ඔහු 'ස්වාමීනි, පාතිමොක්ඛය උදෙසාවා' යි තෙරුන්ට ආරාධනා කෙරෙත්. ඒ ස්ථවිර තෙමේ 'ඇවැත්නි, මට ප්‍රගුණ නැතැ' යි කියයි. 'ස්වාමීනි, ස්ථවිර තෙමේ පාතිමොක්ඛය උදෙසාවා' යි දෙවන තෙරුන්ට ද ආරාධනා කෙරෙත්. හෙතෙමේ ද 'ඇවැත්නි, මට ප්‍රගුණ නැතැ' යි කියයි. තෙවන තෙරුන්ට ද 'ස්වාමීනි, ස්ථවිර තෙමේ පාතිමොක්ඛය උදෙසාවා' යි ආරාධනා කෙරෙත්. හෙ තෙමේත් 'ඇවැත්නි, මට ප්‍රගුණ නැතැ' යි කියයි. මේ ක්‍රමයෙන් සඞ්ඝනවකයා තෙක් 'ආයුෂමත් තෙමේ පාතිමොක්ඛය උදෙසාවා' යි ආරාධනා කෙරෙත්. හෙ තෙමේත් 'ස්වාමීනි, මට ප්‍රගුණ නැතැ' යි කියයි.

‘‘තෙහි භික්ඛවෙ, භික්ඛූහි එකො භික්ඛු සාමන්තා ආවාසා සජ්ජුකං පාහෙතබ්බො: ‘ගච්ඡාවුසො සඞ්ඛිත්තෙන වා විත්ථාරෙන වා පාතිමොක්ඛං පරියාපුණිත්වා [1] ආගච්ඡා’’ ති.

5 අථ ඛො භික්ඛූනං එතදහොසි: ‘‘කෙන නු ඛො පාහෙතබ්බො ? ’’ ති. භගවතො එතමත්ථං ආරොචෙසුං ‘‘අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා භික්ඛූනං ආණාපෙතු’’ න්ති. ථෙරෙන ආණත්තා නවා භික්ඛූ න ගච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘න භික්ඛවෙ, ථෙරෙන ආණත්තෙන අගිලානෙන න ගන්තබ්බං. යො න ගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා’’ ති.

6. අථ ඛො භගවා **චොදනාවත්ථුස්මිං** යථාභිරන්තං විහරිත්වා පුනදෙව **රාජගහං** පච්චාගඤ්ඡි. තෙන ඛො පන සමයෙන මනුස්සා භික්ඛූ පිණ්ඩාය චරන්තෙ පුච්ඡන්ති: ‘‘කතමී භන්තෙ පක්ඛස්සා ?’’ ති. භික්ඛූ එවමාහංසු: ‘‘න ඛො මයං ආවුසො ජානාමා’’ ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ‘‘පක්ඛගණනමත්තම්පි ‘මෙ සමණා සක්‍යපුත්තියා න ජානන්ති. කිම්පනිමෙ අඤ්ඤං කිඤ්චි කල්‍යාණං ජානිස්සන්තී’’ ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, පක්ඛගණනං උග්ගහෙතු’’ න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: ‘‘කෙන නු ඛො පක්ඛගණනා උග්ගහෙතබ්බා’’ ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, සබ්බෙහෙව පක්ඛගණනං උග්ගහෙතු’’ න්ති.

7. තෙන ඛො පන සමයෙන මනුස්සා භික්ඛූ පිණ්ඩාය චරන්තෙ පුච්ඡන්ති: ‘‘කීවතිකා භන්තෙ භික්ඛූ’’ ති. භික්ඛූ එවමාහංසු ‘‘න ඛො මයං ආවුසො ජානාමා’’ ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ‘‘අඤ්ඤමඤ්ඤම්පි ‘මෙ සමණා සක්‍යපුත්තියා න ජානන්ති. කිම්පනිමෙ අඤ්ඤං කිඤ්චි කල්‍යාණං ජානිස්සන්තී’’ ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, භික්ඛූ ගණෙතු’’ න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: ‘‘කදා නු ඛො භික්ඛූ ගණෙතබ්බා’’ ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, තදහුපොසථෙ නාමග්ගෙන [2] වා ගණෙතුං සලාකං වා ගාහෙතු’’ න්ති.

8. තෙන ඛො පන සමයෙන භික්ඛූ අජානන්තා අජ්ජුපොසථොති දූරං ගාමං [3] පිණ්ඩාය චරන්ති. තෙ උද්දිස්සමානෙපි පාතිමොක්ඛෙ ආගච්ඡන්ති. උද්දිට්ඨමත්තෙපි ආගච්ඡන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, ආරොචෙතුං අජ්ජුපොසථො’’ ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: ‘‘කෙන නු ඛො ආරොචෙතබ්බො’’ ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා කාලවතො ආරොචෙතු’’ න්ති.

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ථෙරො කාලවතො නස්සරති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, භත්තකාලෙපි අරොචෙතු’’ න්ති. භත්තකාලෙපි න සරති. [4] භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘‘අනුජානාමි භික්ඛවෙ, යං කාලං සරති, තං කාලං ආරොචෙතු’’ න්ති.

1 ‘‘පරියාපුණිත්වාන’’ ම ජ සං. 2. ‘‘නාම මග්ගෙන’’ සි. ‘‘ගණමග්ගෙන’’ PTS
3. ‘‘දූරගාමං’ තො වි. ජ පු. අ වි. 4. ‘‘නස්සරි’ PTS. තො වි. අ වි ජ පු.

"මහණෙනි, ඒ භික්ෂූන් විසින් 'ඇවැත්නි, සැකෙවින් හෝ විස්තර වශයෙන් හෝ පාතිමොක්ඛය ප්‍රගුණ කොට එව' යි එක් මහණෙක් එදා ම එනු පිණිස සමීප ආවාසයකට යැවිය යුතු" යි.

5. එකල්හි භික්ෂූන්ට "කවරකු විසින් (මහණෙක්) යැවිය යුතු දැ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ස්ථවිර-භික්ෂූහු විසින් නවක මහණකුට අණ කරන්ට අනුදනිමි" යි. තෙරුන් විසින් අණ කරණ ලද නවක භික්ෂූහු නො යත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, තෙරුන් විසින් අණ කරණ ලද නො ගිලන් වූවහු නො යා යුතු නො වේ. යමෙක් නො යන්නේ නම් දුකුලාඇවැත් වේ."

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **චොදනාවත්ථු** නගරයෙහි කැමැති තාක් වාසය කොට නැවත **රජගහ**නුවරට පෙරළා වැඩිසේක. එකල්හි මිනිස්සු පිඬු සිඟා යන භික්ෂූන්ගෙන් "ස්වාමීනි, අද පක්ෂය පිළිබඳ කවර දින දැ?" යි විචාරත්. එවිට භික්ෂූහු "ඇවැත්නි, අපි නො දනිමු" යි කීහ. මිනිස්සු "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ පක්ෂය ගිණීම් පමණකුත් නො දන්නෝ ය. කිම? මොහු අන් කිසි යහපතක් දනිත් දැ?" යි අවමන් කෙරෙත්. නින්‍දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පක්ෂ ගිණීම ඉගෙණ ගන්නට අනුදනිමි" යි. එකල්හි "භික්ෂූන්ට කවරකු විසින් පක්ෂ ගිණීම උගත යුත්තේ දැ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සියල්ලන් විසින් ම පක්ෂ ගිණීම ඉගෙණ ගන්නට අනුදනිමි" යි.

7. එකල්හි මිනිස්සු පිඬු සිඟා යන භික්ෂූන්ගෙන් "ස්වාමීනි, වෙහෙර වැසි භික්ෂූහු කොපමණ දැ?" යි විචාරත්. (එවිට) භික්ෂූහු "ඇවැත්නි, අපි නො දනිමු යි" කියත්. මිනිස්සු ඒ අසා "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ උනුන් ගැණ වත් නො දනිත්. කිම? මොහු අන් කිසි යහපතක් දනිත් දැ?" යි අවමන් කෙරෙත්. ගරහත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, භික්ෂූන් ගණින්නට අනුදනිමි" යි. එකල්හි භික්ෂූන්ට "කවදා නම් භික්ෂූන් ගිණිය යුතු දැ?" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එදවස පොහොයෙහි නම් වශයෙන් ගණින්නට හෝ කුසපත් ගැන්වීමෙන් ගණින්නට හෝ අනුදනිමි" යි.

8. එකල්හි භික්ෂූහු "අද පොහොය" යි නො දන්නෝ දුර (ඈත) ගමට පිඬු සිඟා යත්. ඔහු පාමොක් උදෙසනු ලබන කල්හි ද එත්. උදෙසූ ඇසිල්ලෙහි ද එත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, 'අද පොහොය' යි දන්වන්නට අනුදනිමි" යි. "කවරෙකු විසින් දැන්විය යුතු දැ?" යි භික්ෂූන්ට සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් කල් ඇති ව තිබිය දී දන්වන්නට අනුදනිමි" යි.

9. එකල්හි එක්තරා ස්ථවිර නමක් කල් ඇති ව තිබිය දී එය සිහි නො කරයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, බත් කාලයෙහි දන්වන්නට අනුදනිමි"යි. බත් කාලයෙහි ද දන්වන්නට සිහි නො කරයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යම් කාලයක සිහි කෙරේ ද, එකල්හි දන්වන්නට අනුදනිමි" යි

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ උපොසථාගාරං උක්ලාපං හොති. ආගන්තුකා භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම භික්ඛූ උපොසථාගාරං න සම්මජ්ජිස්සන්තී'' ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ, උපොසථාගාරං සම්මජ්ජිතු'' න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: ''කෙන නු ඛො උපොසථාගාරං සම්මජ්ජිතබ්බං'' න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා නවං භික්ඛුං ආණාපෙතු'' න්ති. ථෙරෙන ආණත්තා නවා භික්ඛූ න සම්මජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''න භික්ඛවෙ, ථෙරෙන ආණත්තෙන අගිලානෙන න සම්මජ්ජිතබ්බං. යො න සම්මජ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා'' ති.

11. තෙන ඛො පන සමයෙන උපොසථාගාරෙ ආසනං අපඤ්ඤත්තං හොති. භික්ඛූ ඡමායං නිසීදන්ති. ගත්තානිපි චීවරානිපි පංසුකිතානි හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ උපොසථාගාරෙ ආසනං පඤ්ඤපෙතු'' න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: ''කෙන නු ඛො උපොසථාගාරෙ ආසනං පඤ්ඤපෙතබ්බ?'' න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා නවං භික්ඛුං ආණාපෙතු'' න්ති. ථෙරෙන ආණත්තා නවා භික්ඛූ න පඤ්ඤපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''න භික්ඛවෙ ථෙරෙන ආණත්තෙන අගිලානෙන න පඤ්ඤපෙතබ්බං. යො න පඤ්ඤපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා'' ති.

12. තෙන ඛො පන සමයෙන උපොසථාගාරෙ පදීපො න හොති. භික්ඛූ අන්ධකාරෙ කායම්පි චීවරම්පි අක්කමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ, උපොසථාගාරෙ පදීපං කාතු'' න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: ''කෙන නු ඛො උපොසථාගාරෙ පදීපො කාතබ්බො?'' ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා නවං භික්ඛුං ආණාපෙතු'' න්ති. ථෙරෙන ආණත්තා නවා භික්ඛූ න පදීපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''න භික්ඛවෙ, ථෙරෙන ආණත්තෙන අගිලානෙන න පදීපෙතබ්බො, යො න පදීපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා'' ති.

13. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ ආවාසිකා භික්ඛූ නෙව පානීයං උපට්ඨාපෙන්ති. න පරිභොජනීයං උපට්ඨාපෙන්ති. ආගන්තුකා භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ආවාසිකා භික්ඛූ නෙව පානීයං උපට්ඨාපෙස්සන්ති? න පරිභොජනීයං උපට්ඨාපෙස්සන්තී?'' ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ''අනුජානාමි භික්ඛවෙ, පානීයං පරිභොජනීයං උපට්ඨාපෙතු'' න්ති අථ ඛො භික්ඛූනං එතදහොසි: ''කෙන නු ඛො පානීයං පරිභොජනීයං උපට්ඨාපෙතබ්බ?'' න්ති.

10. එකල්හි එක්තරා ආවාසයෙක උපොසථාගාරය කුණුකසළින් යුක්ත ව පවතී. ආගන්තුක භික්ෂූහු "කෙසේ නම් ආවාසයෙහි වසන භික්ෂූහු පොහොය ගෙය නො හමදින්නාහු දැ" යි පරිභව කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, උපොසථාගාරය හමදින්නට අනුදනිමි" යි. එකල්හි "කා විසින් උපොසථාගාරය හැමදිය යුතු දැ" ? යි භික්ෂූන්ට සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් නවක භික්ෂූහුනට අණ කරන්නට අනුද නිමි." ස්ථවිර භික්ෂූහු විසින් අණ කරණ ලද නවකභික්ෂූහු (උපොසථාගාරය) නො හමදිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් අණ කරණ ලද නො ගිලන් මහණහු විසින් (උපොසථාගාරය) නො හැමදිය යුතු නො වේ. යමෙක් නො හමදින්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

11. එකල්හි උපොසථාගාරයෙහි අසුන් නො පණවන ලද්දේ වේ. භික්ෂූහු බිම හිඳිත්. සිරුරුත් සිවුරුත් පසින් තැවරුණෝ වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, උපොසථාගාරයෙහි අසුන් පණවන්නට අනුද නිමි. එකල්හි "කා විසින් උපොසථාගාරයෙහි අසුන් පැණවිය යුතු දැ ?" යි භික්ෂූන්ට සිත් වි ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් නවක භික්ෂූහුනට අණ කරන්නට අනුදනිමි" යි. තෙරුන් විසින් අණ කරණ ලද නවක භික්ෂූහු (අසුන්) නො පණවත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, තෙරුන් විසින් අණ කරණ ලද නො ගිලන්හු විසින් (අසුන්) නො පැණවිය යුතු නො වේ. යමෙක් නො පණවන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

12. එකල්හි උපොසථාගාරයෙහි පහන් දැල්වීමෙක් නො වේ. භික්ෂූහු අඳුරෙහි (උනුන්ගේ) සිරුරු ද සිවුරු ද පාගත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, උපොසථාගාරයෙහි පහන් දල්වන්නට අනුදනිමි." එවිට "කා විසින් උපොසථාගාරයෙහි පහන් දැල්විය යුතු දැ" යි භික්ෂූන්ට සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, තෙරුන් විසින් එය නවක භික්ෂූහුහට අණ කරන්ට අනුදනිමි." තෙරුන් විසින් අණවන ලද නවක භික්ෂූහු පහන් නො දල්වත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, තෙරුන් විසින් අණ කරණ ලද නො ගිලන්හු විසින් පහන් නො දැල්විය යුතු නො වේ. යමෙක් නො දල්වන්නේ නම්, දුකුලාඇවැත් වේ."

13. එකල්හි එක්තරා ආවාසයෙක ආවාසයෙහි වසන භික්ෂූහු පැන් නො තබත්. පරිභොගයට ගන්නා දිය නො තබත්. ආගන්තුක භික්ෂූහු "කෙසේ නම් ආවාසික භික්ෂූහු පැන් නො තබන්නාහු ද ? පරිභොගයට ගන්නා දිය නො තබන්නාහු දැ ?" යි අවමන් කෙරෙති. ගරහති. දෙස් කියති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පැන් ද පරිභොගයට ගන්නා දිය ද තබන්නට අනුදනිමි" යි. "එකල්හි භික්ෂූන්ට කවරෙකු විසින් පැන්, පරිභොගයට ගන්නා දිය තැබිය යුතු දැ ?" යි සිත් විය.

භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ථෙරෙන භික්ඛුනා නවං භික්ඛුං ආණාපෙතු"න්ති. ථෙරෙන ආණත්තා නවා භික්ඛූ න උපට්ඨාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, ථෙරෙන ආණත්තෙන අගිලානෙන න උපට්ඨාපෙතබ්බං. යො න උපට්ඨාපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

14. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ බාලා අබ්‍යත්තා දිසංගමිකා ආචරියුපජ්ඣායෙ න ආපුච්ඡිංසු[1]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ, සම්බහුලා භික්ඛූ බාලා අබ්‍යත්තා දිසංගමිකා ආචරියුපජ්ඣායෙ න ආපුච්ඡන්ති[2], තෙ භික්ඛවෙ, ආචරියුපජ්ඣායෙහි පුච්ඡිතබ්බා - කහං ගමිස්සථ? කෙන සද්ධිං ගමිස්සථා?" ති.

15. "තෙ චෙ භික්ඛවෙ, බාලා අබ්‍යත්තා අඤ්ඤෙ බාලෙ අබ්‍යත්තෙ අපදිසෙය්‍යුං, න භික්ඛවෙ, ආචරියුපජ්ඣායෙහි අනුජානිතබ්බා. අනුජානෙය්‍යුං චෙ, ආපත්ති දුක්කටස්ස. තෙ ච[3] භික්ඛවෙ, බාලා අබ්‍යත්තා අනනුඤ්ඤාතා ආචරියුපජ්ඣායෙහි ගච්ඡෙය්‍යුං චෙව ආපත්ති දුක්කටස්ස."

16. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ සම්බහුලා භික්ඛූ විහරන්ති බාලා අබ්‍යත්තා. තෙ න ජානන්ති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා. තත්ථ අඤ්ඤො භික්ඛු ආගච්ඡති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. තෙහි භික්ඛවෙ, භික්ඛූහි සො භික්ඛු සඞ්ගහෙතබ්බො අනුග්ගහෙතබ්බො උපලාපෙතබ්බො උපට්ඨාපෙතබ්බො චුණ්ණෙන මත්තිකාය දන්තකට්ඨෙන මුඛොදකෙන. නො චෙ සඞ්ගණ්හෙය්‍යුං අනුග්ගණ්හෙය්‍යුං උපලාපෙය්‍යුං උපට්ඨාපෙය්‍යුං චුණ්ණෙන මත්තිකාය දන්තකට්ඨෙන මුඛොදකෙන, ආපත්ති දුක්කටස්ස."

17. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා භික්ඛූ විහරන්ති බාලා අබ්‍යත්තා. තෙ න ජානන්ති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා, තෙහි භික්ඛවෙ, භික්ඛූහි එකො භික්ඛු සාමන්තා ආවාසා සජ්ජුකං පාහෙතබ්බො: 'ගච්ඡාවුසො සංඛිත්තෙන වා විත්ථාරෙන වා පාතිමොක්ඛං පරියාපුණිත්වා ආගච්ඡා' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙහි භික්ඛවෙ, භික්ඛූහි සබ්බෙහෙව යත්ථ ජානන්ති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා, සො ආවාසො ගන්තබ්බො. නො චෙ ගච්ඡෙය්‍යුං, ආපත්ති දුක්කටස්ස."

1 "ආපුච්ඡිංසු" ම ඡ සං. - එත්ථ මරම්මක්ඛරපොත්ථකෙ නකාරො න දිස්සතෙ
2. "ආපුච්ඡන්ති' ම ඡ සං. 3 තෙ චෙ. ම ඡ සං.

Free Distribution www.aathaapi.org

භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් නවක භික්ෂූහුහට අණ කරන්නට අනුදනිමි." තෙරුන් විසින් අණ කරණ ලද නවක භික්ෂූහු (පැන් හා දිය ද) නො තබත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, තෙරුන් විසින් අණ කරණ ලද නො ගිලන්හු විසින් පැන් හා පරිභොගයට ගත්නා දිය නො තැබිය යුතු නො වේ. යමෙක් නො තබන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

14. එකල්හි අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු පිරිසර දනවු බලා යන්නාහු ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් නො විචාළාහු ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු පිරිසර බලා යන්නාහු ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් නො විචාරති. මහණෙනි, ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් විසින් 'කො තැන්හි යන්නාහු ද? කවරකු සමග යන්නාහු ද?' යි ඒ අන්තෙවාසික සද්ධිවිහාරිකයෝ විචාළ යුත්තාහු ය."

15. "මහණෙනි, ඉදින් අඥ වූ අව්‍යක්ත වූ ඔහු (එසේ ම) අඥ වූ අව්‍යක්ත වූ අන් මහණුන් දක්වන්නාහු නම්, මහණෙනි, ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් විසින් ඔහු නො අනුදැනිය යුතු ය. ඉදින් අනුදන්නාහු නම්, දුකුලා ඇවැත් වේ. මහණෙනි, ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් විසින් නො අනුදන්නා ලද අඥ වූ අව්‍යක්ත වූ ඔහු යන්නාහු නම්, දුකුලාඇවැත් වේ."

16. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු වාසය කරත්. ඔහු උපොසථය හෝ උපොසථකර්මය හෝ පාතිමොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ නො දනිත්. එ තැනට බොහෝ ඇසූ පිරූ තැන් ඇති දත්ආගම ඇති ධර්මධර වූ විනයධර වූ උභයමාතෘකාධර වූ නුවණැත්තා වූ ව්‍යක්ත වූ විදසුන්නුවණැති පව් කිරීමෙහි ලජ්ජා ඇති කුකුස් ඇති ශික්ෂාකාමී වූ අන් භික්ෂුනමක් එයි. මහණෙනි, ඒ ආවාසික භික්ෂූන් විසින් ඒ භික්ෂුතෙමේ (ඇඟ ගානා) සුණුයෙන් මැටියෙන් දැහැටියෙන් මුව දෝනාදියෙන් සංග්‍රහ කළ යුතු ය. අනුග්‍රහ කළ යුතු ය. ප්‍රිය වචනයෙන් කතා කළ යුතු ය. උපස්ථාන කළ යුතු ය. ඉදින් සුණුයෙන් මැටියෙන් දැහැටියෙන් මුවදෝනා දියෙන් සංග්‍රහ නො කරන්-නාහු නම්, අනුග්‍රහ නො කරන්නාහු නම්, ප්‍රිය වචනයෙන් නො කතා කරන්නාහු නම්, උපස්ථාන නො කරන්නාහු නම්, දුකුලාඇවැත් වේ."

17. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු වාසය කරත්. ඔහු උපොසථය හෝ උපොසථකර්මය හෝ පාතිමොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ නො දනිත්. මහණෙනි, ඒ ආවාසික භික්ෂූන් විසින් 'ඇවැත්නි, යව. සැකෙවින් හෝ විස්තර වශයෙන් හෝ පාතිමොක්ඛය ප්‍රගුණ කොට එව' යි එක් භික්ෂු නමක් සමීප විහාරයකට එදවස ම එතු පිණිස යැවිය යුතු ය. මෙය මෙසේ ලබන්නාහු නම්, එය යහපත් ය. නො ලබන්නාහු නම්, මහණෙනි, ඒ සියලු භික්ෂූන් විසින් උපොසථය හෝ උපොසථකම්මය හෝ පාති-මොක්ඛය හෝ පාතිමොක්ඛුද්දෙසය හෝ යම් තැනක වැසි භික්ෂූහු දනිත් ද, ඒ ආවාසයට යා යුතු ය. නො යන්නාහු නම්, දුකුලාඇවැත් වේ."

18. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ සම්බහුලා භික්ඛූ වස්සං වසන්ති බාලා අබ්‍යත්තා. තෙ න ජානන්ති උපොසථං වා උපොසථකම්මං වා පාතිමොක්ඛං වා පාතිමොක්ඛුද්දෙසං වා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි එකො භික්ඛු සාමන්තා ආවාසා සජ්ජුකං පාහෙතබ්බො: ‘ගච්ඡාවුසො සඞ්ඛිත්තෙන වා විත්ථාරෙන වා පාතිමොක්ඛං පරියාපුණිත්වා ආගච්ඡා’ ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, එකො භික්ඛු සත්තාහකාලිකං පාහෙතබ්බො: ‘ගච්ඡාවුසො සංඛිත්තෙන වා විත්ථාරෙන වා පාතිමොක්ඛං පරියාපුණිත්වා ආගච්ඡා’ ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, න භික්ඛවෙ, තෙහි භික්ඛූහි තස්මිං ආවාසෙ වස්සං වසිතබ්බං. වසෙය්‍යුං චෙ, ආපත්ති දුක්කටස්සා” ති.

19. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. “සන්නිපතථ භික්ඛවෙ, සඞ්ඝො උපොසථං කරිස්සතී” ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: “අත්ථි භන්තෙ, භික්ඛු ගිලානො. සො අනාගතො” ති “අනුජානාමි භික්ඛවෙ, ගිලානෙන භික්ඛුනා පාරිසුද්ධිං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: පාරිසුද්ධිං දම්මි. පාරිසුද්ධිං මෙ හර. පාරිසුද්ධිං මෙ ආරොචෙහී’ ති. කායෙන විඤ්ඤාපෙති, වාචාය විඤ්ඤාපෙති, කායෙන වාචාය විඤ්ඤාපෙති, දින්නා හොති පාරිසුද්ධි. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති, න දින්නා හොති පාරිසුද්ධි: එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, සො භික්ඛවෙ, ගිලානො භික්ඛු මඤ්චෙන වා පීඨෙන වා සඞ්ඝමජ්ඣෙ ආනෙත්වා උපොසථො කාතබ්බො. සචෙ භික්ඛවෙ, ගිලානුපට්ඨාකානං භික්ඛූනං එවං හොති: ‘සචෙ ඛො මයං ගිලානං ඨානා චාවෙස්සාම, ආබාධො වා අභිවඩ්ඪිස්සති. කාලකිරියා වා භවිස්සතී’ ති, න භික්ඛවෙ, ගිලානො ඨානා චාවෙතබ්බො. සඞ්ඝෙන තත්ථ ගන්ත්වා උපොසථො කාතබ්බො. නත්වෙව වග්ගෙන සඞ්ඝෙන උපොසථො කාතබ්බො. කරෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්ස”.

20. “පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා තත්ථෙව පක්කමති, අඤ්ඤස්ස දාතබ්බා පාරිසුද්ධි. පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා තත්ථෙව විබ්භමති, කාලං කරොති, සාමණෙරො පටිජානාති, සික්ඛං පච්චක්ඛාතකො පටිජානාති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති, උම්මත්තකො පටිජානාති, ඛිත්තචිත්තො පටිජානාති, වෙදනට්ටො පටිජානාති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො පටිජානාති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො පටිජානාති, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො පටිජානාති, පණ්ඩකො පටිජානාති, ථෙය්‍යසංවාසකො පටිජානාති, තිත්ථියපක්කන්තකො පටිජානාති, තිරච්ඡානගතො පටිජානාති, මාතුඝාතකො පටිජානාති, පිතුඝාතකො පටිජානාති, අරහන්තඝාතකො පටිජානාති, භික්ඛුණිදූසකො පටිජානාති, සඞ්ඝභෙදකො පටිජානාති, ලොහිතුප්පාදකො පටිජානාති, උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, අඤ්ඤස්ස දාතබ්බා පාරිසුද්ධි”.

18. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක අඥ වූ අව්‍යක්ත වූ බොහෝ භික්ෂූහු වස් වෙසෙත්. ඔහු උපොසථය හෝ උපොසථකර්මය හෝ පාති-මොක්ඛය හෝ පාතිමොක්ඛුද්දේසය හෝ නො දනිත්. මහණෙනි, එහි වැසි භික්ෂූන් විසින් 'ඇවැත්නි, යව, සැකෙවින් හෝ විස්තර වශයෙන් හෝ පාතිමොක්ඛය පුහුණු කොට එව' යි සමීපවිහාරයකට භික්ෂු නමක් එ දවසම එනු පිණිස යැවිය යුතු ය. මෙය මෙසේ ලබන්නෝ නම්, එය යහපත් ය. ඉදින් නො ලබන්නෝ නම්, ඇවැත්නි, යව, සැකෙවින් හෝ විස්තර වශයෙන් හෝ පාතිමොක්ඛය පුහුණු කොට එව' යි එක් භික්ෂුනමක් සත් දවසකට කල් නියම කොට යැවිය යුතු ය. එය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, මහණෙනි, ඒ භික්ෂූන් ඒ ආවාසයෙහි වස් නො විසිය යුතු ය. ඉදින් වසන්නෝ නම්, දුකුලාඇවැත් වේ."

19. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, රැස් වවු. සඞ්ඝතෙමේ පොහොය කරන්නේ ය" යි භික්ෂූන් ඇමතූ සේක. මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් "ස්වාමීනි, එක් ගිලන් මහණෙක් ඇත්තේ ය. හෙතෙමේ නො ආයේ" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළේ ය. "මහණෙනි ගිලන් භික්ෂූහු විසින් පාරිශුද්ධිය දෙන්නට අනුදනිමි. මහණෙනි, ඒ මෙසේ දිය යුතු ය. ඒ ගිලන් මහණහු විසින් එක් මහණකු වෙතට ගොස් උතුරුසඟසිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'පාරිශුද්ධිය දෙමි. මාගේ පාරිශුද්ධිය ගෙණ යව. මාගේ පාරිශුද්ධිය සඞ්ඝයාට දන්වාලව' යි මෙසේ කිය යුතු වන්නේ ය. මෙය කයින් හඟවා ද, වචනයෙන් හඟවා ද, කය වචන දෙකින් හඟවා ද, (එකල) පාරිශුද්ධිය දෙන ලද්දී වේ. කයින් නො හඟවා ද, වචනයෙන් නො හඟවා ද, කයින් හා වචනයෙන් නො හඟවා ද, පාරිශුද්ධිය නො දෙන ලද්දී වේ. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, මහණෙනි, ඒ ගිලන් මහණහු ඇඳකින් හෝ පුටුවකින් හෝ සඞ්ඝයා මධ්‍යයට ගෙණවුත් පොහොය කළ යුතු ය. මහණෙනි, ඉදින් ගිලානොපස්ථායක භික්ෂූන්ට 'ඉදින් අපි ගිලනහු හුන් තැනින් ඉවත් කරන්නෙමු නම්, ආබාධය හෝ වැඩෙන්නේ ය. කලුරිය කිරීම හෝ වන්නේ ය' යි අදහස් වේ ද, මහණෙනි, ගිලන් තෙමේ හුන් තැනින් නො ඉවත් කළ යුතු ය. සඞ්ඝයා එ තැනට ගොස් පොහොය කළ යුතු ය. වර්ගී වූ සඞ්ඝයා විසින් පොහොය නො කළ යුතු ම ය. කරන්නේ නම් දුකුලාඇවැත් වේ" යි.

20. "මහණෙනි, ඉදින් පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ පාරි-ශුද්ධිය දුන් කල්හි (සඟ මැදට නො පැමිණ) එහි දී ම කොතැන්හි හෝ යේ ද, (එකල) පාරිශුද්ධිය අනෙකෙකුට දිය යුතු ය. මහණෙනි, පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ ඉදින් පාරිශුද්ධිය දුන් කල්හි එහි දී ම සිවුරු හරී ද, කලුරිය කෙරේ ද, 'මම හෙරණෙක්මි' යි පිළිණ කෙරේ ද, 'ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානය කෙළෙමි' යි පිළිණ කෙරේ ද, 'අන්තිම වස්තුවට පැමිණියෙමි' යි පිළිණ කෙරේ ද 'උමතු වූවෙක්මි' යි පිළිණ කෙරේ ද, 'වික්ෂිප්ත සිත් ඇත්තෙමි' යි පිළිණ කෙරේ ද, 'වෙදනාවෙන් පෙළෙන්නෙමි' යි පිළිණ කෙරේ ද, 'ඇවැත් නො දැක්මෙහි උත්ක්ෂෙපණීය කර්මයෙන් බැහැර කරණ ලද්දෙමි' යි පිළිණ කෙරේ ද 'ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්ෂෙපණීය කර්මයෙන් බැහැර කරණ ලද්දෙමි' යි පිළිණ කෙරේ ද, 'ලාමක දෘෂ්ටිය අත් නො හැරීමෙහි උත්ක්ෂෙපණීයකර්මයෙන් බැහැර කරණ ලද්දෙමි' යි පිළිණ කෙරේ ද, 'පණ්ඩකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'ථෙය්‍යසංවාසකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'තිත්ථියපක්කන්තකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'තිරිසන් ගියෙක්මි' යි පිළිණ කෙරේ ද, 'මාතෘඝාතකයෙක්මි' යි පිළිණ කෙරේද, 'පිතෘඝාතකයෙක්මි' යි පිළිණ කෙරේද, 'අරහන්තඝාතකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'භික්ඛුණී දූසක-යෙක්මි' යි පිළිණ කෙරේ ද, 'සඞ්ඝභෙදකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'ලොහිතුප්පාදකයෙක්මි' යි පිළිණකෙරේ ද, 'උභතොබ්‍යඤ්ජනකයෙක්මි' යි පිළිණ කෙරේ ද, එකල අනෙකෙකුට පාරිශුද්ධිය දිය යුතු ය."



Free Distribution www.aathaapi.org

21. "පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා අන්තරා මග්ගෙ පක්කමති, අනාහටා හොති පාරිසුද්ධි. පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා අන්තරාමග්ගෙ විබ්භමති, කාලං කරොති, -පෙ- උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, අනාහටා හොති පාරිසුද්ධි."

22. "පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා සඞ්ඝප්පත්තො පක්කමති, ආහටා හොති පාරිසුද්ධි. පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා සඞ්ඝප්පත්තො විබ්භමති, කාලං කරොති, -පෙ- උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, ආහටා හොති පාරිසුද්ධි."

23. "පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා සඞ්ඝප්පත්තො සුත්තො න ආරොචෙති, පමත්තො න ආරොචෙති, සමාපන්නො න ආරොචෙති, ආහටා හොති පාරිසුද්ධි පාරිසුද්ධිහාරකස්ස අනාපත්ති."

24. "පාරිසුද්ධිහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පාරිසුද්ධියා සඞ්ඝප්පත්තො සඤ්චිච්ච න ආරොචෙති. ආහටා හොති පාරිසුද්ධි. පාරිසුද්ධිහාරකස්ස ආපත්ති දුක්කටස්සා" ති.

25. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "සන්නිපතථ භික්ඛවෙ, සඞ්ඝො කම්මං කරිස්සතී" ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතද වොච: "අත්ථි භන්තෙ භික්ඛු ගිලානො, සො අනාගතො" ති. "අනුජානාමි භික්ඛවෙ, ගිලානෙන භික්ඛුනා ඡන්දං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බො: තෙන ගිලානෙන භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරොචෙහී' ති. කායෙන විඤ්ඤාපෙති, වාචාය විඤ්ඤාපෙති, කායෙන වාචාය විඤ්ඤාපෙති, දින්නො හොති ඡන්දො. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති, න දින්නො හොති ඡන්දො. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, සො භික්ඛවෙ, ගිලානො භික්ඛු මඤ්චෙන වා පීඨෙන වා සඞ්ඝමජ්ඣෙ ආනෙත්වා කම්මං කාතබ්බං. සචෙ භික්ඛවෙ, ගිලානුපට්ඨාකානං භික්ඛූනං එවං හොති: 'සචෙ ඛො මයං ගිලානං ඨානා චාවෙස්සාම, ආබාධො වා අභිවඩ්ඪිස්සති. කාලකිරියා වා භවිස්සතී' ති. න භික්ඛවෙ, ගිලානො ඨානා චාවෙතබ්බො. සඞ්ඝෙන තත්ථ ගන්ත්වා කම්මං කාතබ්බං. නත්වෙව වග්ගෙන සඞ්ඝෙන කම්මං කාතබ්බං. කරෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්ස."

21. "මහණෙනි, ඉදින් පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ පාරිශුද්ධිය දුන් කල්හි අතරමග දී බැහැර යේ ද, පාරිශුද්ධිය නො ගෙණෙන ලද්දී වේ. මහණෙනි, ඉදින් පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ පාරිශුද්ධිය දුන් කල්හි අතරමග දී සිවුරු හරී ද, කලුරිය කෙරේ ද, -පෙ- 'උභතොබ්‍යඤ්ජනකයෙමි' යි පිළිණ කෙරේ ද, පාරිශුද්ධිය නො ගෙණෙන ලද්දී වේ."

22. "මහණෙනි, ඉදින් පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ පාරිශුද්ධිය දුන් කල්හි සඞ්ඝයා වෙතට පැමිණියේ බැහැර යේ ද, පාරිශුද්ධිය ගෙණෙන ලද්දී වේ. මහණෙනි, ඉදින් පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ පාරිශුද්ධිය දුන් කල්හි සඞ්ඝයා වෙතට පැමිණියේ සිවුරු හරී ද, කලුරිය කෙරේ ද, -පෙ- 'උභතොබ්‍යඤ්ජනකයෙමි' යි පිළිණ කෙරේ ද, පාරිශුද්ධිය ගෙණෙන ලද්දී වේ."

23. "මහණෙනි, ඉදින් පාරිශුද්ධිය ගෙණ එන මහණ තෙමේ පාරිශුද්ධිය දුන් කල්හි සඞ්ඝයා වෙතට පැමිණියේ නිදි ගත්තේ නො සැළකෙරේ ද, ප්‍රමත්ත වූයේ නො සැළකෙරේ ද, සමාධියට සමවන්නේ නො සැළ කෙරේ ද, පාරිශුද්ධිය ගෙණෙන ලද්දී වේ. පාරිශුද්ධිය ගෙණ ආවහුට ඇවැත් නො වේ."

24. "මහණෙනි, ඉදින් පාරිශුද්ධිහාරක තෙමේ පාරිශුද්ධිය දුන් කල්හි සඞ්ඝයා වෙතට පැමිණියේ දැන දැන නො සැළකෙරේ ද, පාරිශුද්ධිය ගෙණෙන ලද්දී වේ. පාරිශුද්ධිහාරකයානට දුකුලාඇවැත් වේ."

25. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, සඞ්ඝ තෙමේ කම් කරන්නේ ය, රැස් වවු" යි භික්ෂූන් ඇමතූ සේක. මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් තෙමේ "ස්වාමීනි, ගිලන් මහණෙක් ඇත්තේ ය, ඒ මහණ නො ආයේ" යි භාග්‍යවතුන් වහන්සේට සැළකළේ ය. "මහණෙනි, ගිලන් මහණහු විසින් ඡන්දය දෙන්නට අනුදනිමි. මහණෙනි, එය මේසේ දිය යුතු ය: ඒ ගිලන් මහණහු එක් මහණෙකු වෙතට පැමිණ උතුරු සඟ සිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඡන්දය දෙමි. මාගේ ඡන්දය ගෙණ යව, මාගේ ඡන්දය සැළකරව' යි මෙසේ කිය යුතු වන්නේ ය. මෙය කයින් හඟවා ද, වචනයෙන් හඟවා ද, කයින් හා වචනයෙන් හඟවා ද, ඡන්දය දෙන ලද්දේ වේ. කයින් නො හඟවා ද, වචනයෙන් නො හඟවා ද, කයින් හා වචනයෙන් නො හඟවා ද, ඡන්දය නො දෙන ලද්දේ වේ. මෙය මෙසේ ලබාන්නහු නම්, එය යහපත් ය. ඉදින් නො ලබාන්නහු නම්, මහණෙනි, ඒ ගිලන් මහණ ඇඳකින් හෝ පුටුවකින් හෝ සඟමැදට පමුණුවා කම්ය කළ යුතු ය. මහණෙනි, යම් ලෙසකින් ගලානොපස්ථායක භික්ෂූන්ට 'ඉදින් අපි ගිලනහු හුන් තැනින් ඉවත් කරන්නෙමු නම්, ආබාධය හෝ වැඩෙන්නේ ය, කලුරිය කිරීම හෝ වන්නේ ය' යි සිත් වේ නම්, මහණෙනි, ගිලන් මහණ තෙමේ හුන් තැනින් ඉවත් නො කළ යුතු ය. සඞ්ඝයා එ තැනට ගොස් කම්ය කළ යුතු ය. වර්ගී වූ සඞ්ඝයා විසින් කම් නො කට යුතු ම ය. කරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

26. "ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ තත්ථෙව පක්කමති, අඤ්ඤස්ස දාතබ්බො ඡන්දො. ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ තත්ථෙව විබ්භමති, කාලං කරොති, සාමණෙරො පටිජානාති, සික්ඛං පච්චක්ඛාතකො පටිජානාති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති, උම්මත්තකො පටිජානාති, ඛිත්තචිත්තො පටිජානාති, වෙදනාට්ටො පටිජානාති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො පටිජානාති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො පටිජානාති, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො පටිජානාති, පණ්ඩකො පටිජානාති, ථෙය්‍යසංවාසකො පටිජානාති, තිත්ථියපක්කන්තකො පටිජානාති, තිරච්ඡානගතො පටිජානාති, මාතුඝාතකො පටිජානාති, පිතුඝාතකො පටිජානාති, අරහන්තඝාතකො පටිජානාති, භික්ඛුනිදූසකො පටිජානාති, සඞ්ඝභෙදකො පටිජානාති, ලොහිතුප්පාදකො පටිජානාති, උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, අඤ්ඤස්ස දාතබ්බො ඡන්දො."

27. "ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ අන්තරාමග්ගෙ පක්කමති, අනාහටො හොති ඡන්දො. ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ අන්තරාමග්ගෙ විබ්භමති, කාලං කරොති, -පෙ- උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, අනාහටො හොති ඡන්දො."

28. "ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ සඞ්ඝප්පත්තො පක්කමති, ආහටො හොති ඡන්දො. ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ සඞ්ඝප්පත්තො විබ්භමති, කාලං කරොති, -පෙ- උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, ආහටො හොති ඡන්දො."

29. "ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ සඞ්ඝප්පත්තො සුත්තො න ආරොචෙති, පමත්තො න ආරොචෙති, සමාපන්නො න ආරොචෙති, ආහටො හොති ඡන්දො. ඡන්දහාරකස්ස අනාපත්ති."

30. "ඡන්දහාරකො චෙ භික්ඛවෙ, දින්නෙ ඡන්දෙ සඞ්ඝප්පත්තො සඤ්චිච්ච න ආරොචෙති, ආහටො හොති ඡන්දො. ඡන්දහාරකස්ස ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, තදහුපොසථෙ පාරිසුද්ධිං දෙන්තෙන ඡන්දම්පි දාතුං, සන්ති සඞ්ඝස්ස කරණීය" න්ති.

26. "මහණෙනි, ඉදින් ඡන්දය ගෙණ එන මහණ තෙමේ ඡන්දය දුන් කල්හි එ තැන දී ම බැහැර යේ ද, (එකල) අනෙකෙකුට ඡන්දය දිය යුතු ය. මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි එහි දී ම සිවුරු හරී ද, කලුරිය කෙරේ ද, 'ශෛරණෙක්මි' යි පිළිණ කෙරේ ද, 'ශික්ෂා-ප්‍රත්‍යඛ්‍යානය කෙළෙමි' යි පිළිණ කෙරේ ද, 'අන්තිමවසතුවට පැමිණියෙක්මි' යි පිළිණ කෙරේ ද, 'උමතු වූවෙක්මි' යි පිළිණ කෙරේ ද, 'වික්ෂිප්ත සිත් ඇත්තෙක්මි' යි පිළිණ කෙරේ ද, 'වේදනාවෙන් පීඩිතයෙමි' යි පිළිණ කෙරේ ද, 'ඇවැත් නො දක්මෙහි උත්ක්ෂෙපණීයකර්මයෙන් බැහැර කරණ ලද්දෙමි' යි පිළිණ කෙරේ ද, 'ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්ෂෙපණීය කර්මයෙන් බැහැර කරණ ලද්දෙමි' යි පිළිණ කෙරේ ද, 'ලාමක දෘෂ්ටිය අත් නො හැරීමෙහි උත්ක්ෂෙපණීයකර්මයෙන් බැහැර කරණ ලද්දෙමි' යි පිළිණ කෙරේ ද, 'පණ්ඩකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'ථෙය්‍යසංවාසකයෙක්මි' යි පිළිණ කෙරේ ද 'තිත්ථියපක්කන්තකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'තිරිසන් ගතයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'මාතෘඝාතකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'පිතෘඝාතකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'අරහන්තඝාතකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'භික්ඛුණීදූසකයෙක්මි' යි පිළිණ කෙරේ ද, 'සඞ්ඝභෙදක-යෙක්මි' යි පිළිණ කෙරේ ද, ලොහිතුප්පාදකයෙක්මි' යි පිළිණ කෙරේ ද 'උභතොබ්‍යඤ්ජනකයෙක්මි' යි පිළිණ කෙරේ ද, (එකල) අනෙකෙකුට ඡන්දය දිය යුතු ය."

27. "මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි අතරමග දී බැහැර යේ ද, ඡන්දය නො ගෙණෙන ලද්දේ වේ. මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි අතරමග දී සිවුරු හරී ද, කලුරිය කෙරේ ද, -පෙ- 'උභතොබ්‍යඤ්ජනකයෙක්මි' යි පිළිණ කෙරේ ද, ඡන්දය නො ගෙණෙන ලද්දේ වේ."

28. "මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි සඟ මැදට පැමිණියේ බැහැර යේ ද, ඡන්දය ගෙණෙන ලද්දේ වේ. මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි සඟ මැදට පැමිණියේ සිවුරු හරී ද, කලුරිය කෙරේ ද -පෙ- 'උභතොබ්‍යඤ්ජනක වෙමි' යි පිළිණ කෙරේ ද ඡන්දය ගෙණෙන ලද්දේ වේ."

29. "මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි සඟ මැදට පැමිණියේ නිදි ගත්තේ නො සැලකෙරේ ද, ප්‍රමත්ත වූයේ නො සැලකෙරේ ද, සමාධියට සමවත්තේ නො සැලකෙරේ ද, ඡන්දය ගෙණෙන ලද්දේ වේ. ඡන්දහාරකයාහට ඇවැත් නො වේ."

30. "මහණෙනි, ඉදින් ඡන්දහාරක තෙමේ ඡන්දය දුන් කල්හි සඟ මැදට පැමිණියේ දැන දැන නො සැලකෙරේ ද, ඡන්දය ගෙණෙන ලද්දේ වේ. ඡන්දහාරකයාහට දුකුලාඇවැත් වේ. මහණෙනි, එදවස පොහොයෙහි පාරිශුද්ධිය දෙන්නහු විසින් 'සඞ්ඝයාට කට යුතු ඇත්තේ ය' යි ඡන්දය ද දෙන්නට අනුදනිමි."

31. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරං භික්ඛුං තදහුපොසථෙ ඤාතකා ගණ්හිංසු. භගවතො එතමත්ථං ආරොචෙසුං: "ඉධ පන භික්ඛවෙ, භික්ඛුං තදහුපොසථෙ ඤාතකා ගණ්හන්ති, තෙ ඤාතකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං මුඤ්චථ, යාවායං භික්ඛු උපොසථං කරොතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ ඤාතකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො මුහුත්තං එකමන්තං හොථ, යාවායං භික්ඛු පාරිසුද්ධිං දෙතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ ඤාතකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං නිස්සීමං නෙථ, යාව සඞ්ඝො උපොසථං කරොතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, නත්වෙව වග්ගෙන සඞ්ඝෙන උපොසථො කාතබ්බො. කරෙය්‍ය චෙ, [1] ආපත්ති දුක්කටස්ස.

32 "ඉධ පන භික්ඛවෙ, භික්ඛුං තදහුපොසථෙ රාජානො ගණ්හන්ති, -පෙ- චොරා ගණ්හන්ති -පෙ- ධුත්තා ගණ්හන්ති -පෙ- භික්ඛුපච්චත්ථිකා ගණ්හන්ති. තෙ භික්ඛුපච්චත්ථිකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං මුඤ්චථ, යාවායං භික්ඛු උපොසථං කරොතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ භික්ඛුපච්චත්ථිකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො මුහුත්තං එකමන්තං හොථ, යාවායං භික්ඛු පාරිසුද්ධිං දෙතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ භික්ඛුපච්චත්ථිකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං නිස්සීමං නෙථ, යාව සඞ්ඝො උපොසථං කරොතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, නත්වෙව වග්ගෙන සඞ්ඝෙන උපොසථො කාතබ්බො. කරෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්සා" ති.

33. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "සන්නිපතථ භික්ඛවෙ. අත්ථි සඞ්ඝස්ස කරණීය" න්ති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "අත්ථි භන්තෙ, **ගග්ගො** නාම භික්ඛු උම්මත්තකො, සො අනාගතො" ති.

34. "ද්වෙ 'මෙ භික්ඛවෙ, උම්මත්තකා: අත්ථි භික්ඛු [2] උම්මත්තකො සරතිපි උපොසථං, නපි සරති, සරතිපි සඞ්ඝකම්මං, නපි සරති. අත්ථි නෙව සරති. ආගච්ඡතිපි උපොසථං, නපි ආගච්ඡති, ආගච්ඡතිපි සඞ්ඝකම්මං, නපි ආගච්ඡති. අත්ථි නෙව ආගච්ඡති."

1. "කරෙය්‍යචෙව" ම නු ප. නො වි. 2. "අත්ථි භික්ඛවෙ භික්ඛු" ම ඡ සං.

31. එකල්හි නැයෝ එදවස පොහොයෙහි එක්තරා මහණෙකු අල්ලා ගත්හ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි නැයෝ එදවස පොහොයෙහි මහණෙකු අල්ලා ගණිත්. භික්ෂූන් විසින් ඒ නෑයන්ට 'ආයුෂ්මත්නි, තෙපි මේ මහණ තෙමේ යම් තාක් පොහොය කෙරේ ද, ඒ තාක් මේ මහණහු මොහොතකට මුදවූ' දෑ යි කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, භික්ෂූන් විසින් 'ආයුෂ්මත්නි, තෙපි මේ මහණ තෙමේ යම් තාක් පාරිශුද්ධිය දේ ද, ඒ තාක් මොහොතක් පසෙකට වවු' දෑ යි ඒ නෑයන්ට කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, භික්ෂූන් විසින් 'ආයුෂ්මත්නි, තෙපි සඞ්ඝ තෙමේ යම් තාක් පොහොය කෙරේ ද, ඒ තාක් මේ මහණහු මොහොතකට සීමාවෙන් බැහැරට ගෙණ යවු' දෑයි ඒ නෑයන්ට කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, වගී වූ සඞ්ඝයා විසින් පොහොය නො කට යුතු ම ය. කරන්නේ නම්, දුකුලාඇවැත් වේ."

32. "මහණෙනි, මෙහි එදවස පොහොයෙහි රජහු මහණෙකු අල්ලා ගණිත් - සොරු අල්ලා ගණිත් - ධූර්තයෝ අල්ලා ගණිත් - පසමිතුරු මහණෝ අල්ලා ගණිත්. භික්ෂූන් විසින් 'ආයුෂ්මත්නි, තෙපි මේ මහණ තෙමේ යම් තාක් පොහොය කෙරේ ද, ඒ තාක් මේ මහණහු මොහොතකට මුදවුදෑ' යි ඒ පසමිතුරු මහණුන්ට කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, භික්ෂූන් විසින් 'ආයුෂ්මත්නි, තමුන්නාන්සේලා, මේ මහණ තෙමේ යම් තාක් පාරිශුද්ධිය දේ ද, ඒ තාක් මොහොතකට පසෙකට වවු' දෑ යි ඒ පසමිතුරු මහණුන්ට කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, භික්ෂූන් විසින් 'ආයුෂ්මත්නි, සඞ්ඝ තෙමේ යම් තාක් පොහොය කෙරේ ද, ඒ තාක් මේ මහණහු මොහොතකට සීමාවෙන් බැහැරට ගෙණ යවු' දෑ යි පසමිතුරු මහණුන්ට කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, සඞ්ඝයා වගී ව පොහොය නො කට යුතු ම ය. කරන්නේ නම්, දුකුලාඇවැත් වේ."

33. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, රැස් වවු. සඞ්ඝයාට කට යුතු ඇතැ"යි භික්ෂූන් ඇමතූ සේක. මෙසේ වදළ කල්හි (එහි සිටි) එක්තරා මහණෙක් "ස්වාමීනි, **ගග්ග** නම් භික්ෂු තෙමේ උම්තු වූයේ වේ, හෙ තෙමේ මෙහි නො ආයේ" යි භාග්‍යවතුන් වහන්සේට සැලකළේ ය.

34. "මහණෙනි, උමතු වූවෝ මොහු දෙදෙනෙක් වෙති: උපොසථය සිහි කරන්නාවූ ද, සිහි නො කරන්නා වූ ද, සඞ්ඝකර්මය සිහි කරන්නා වූ ද, සිහි නො කරන්නා වූ ද, උමතු මහණෙක් ඇත. (එකතින්) සිහි නොම කරන්නෙක් ද ඇත. උපොසථයට එන්නාවූ ද, නො එන්නා වූ ද, සඞ්ඝකර්මයට එන්නා වූ ද, නො එන්නා වූ ද, උමතු මහණෙක් ඇත. (එකතින්) නොම එන්නෙක් ද ඇත."

35. "තත්‍ර භික්ඛවෙ, ස්වායං උම්මත්තකො සරතිපි, උපොසථං න පි සරති, සරතිපි සඞ්ඝකම්මං, නපි සරති. ආගච්ඡතිපි උපොසථං, නපි ආගච්ඡති, ආගච්ඡති පි සඞ්ඝකම්මං, න පි ආගච්ඡති. අනුජානාමි භික්ඛවෙ, එවරූපස්ස උම්මත්තකස්ස උම්මත්තකසම්මුතිං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

36. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. **ගග්ගො** භික්ඛු උම්මත්තකො සරතිපි උපොසථං නපි සරති, සරතිපි සඞ්ඝකම්මං නපි සරති, ආගච්ඡතිපි උපොසථං නපි ආගච්ඡති, ආගච්ඡතිපි සඞ්ඝකම්මං නපි ආගච්ඡති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ගග්ගස්ස භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තකසම්මුතිං දදෙය්‍ය, සරෙය්‍ය වා ගග්ගො භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං, න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං, න වා ආගච්ඡෙය්‍ය. සඞ්ඝො සහ වා ගග්ගෙන විනා වා ගග්ගෙන උපොසථං කරෙය්‍ය. සඞ්ඝකම්මං කරෙය්‍ය. එසා ඤත්ති."

37. "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. ගග්ගො භික්ඛු උම්මත්තකො සරතිපි උපොසථං, නපි සරති, සරතිපි සඞ්ඝකම්මං නපි සරති, ආගච්ඡතිපි උපොසථං නපි ආගච්ඡති, ආගච්ඡතිපි සඞ්ඝකම්මං නපි ආගච්ඡති. සඞ්ඝො ගග්ගස්ස භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තකසම්මුතිං දෙති, සරෙය්‍ය වා ගග්ගො භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය. සංඝො සහ වා ගග්ගෙන විනා වා ගග්ගෙන උපොසථං කරිස්සති. සඞ්ඝකම්මං කරිස්සති. යස්සා- යස්මතො ඛමති ගග්ගස්ස භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තකසම්මුතියා දානං, සරෙය්‍ය වා ගග්ගො භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය. සඞ්ඝො සහ වා ගග්ගෙන විනා වා ගග්ගෙන උපොසථං කරිස්සති. සඞ්ඝකම්මං කරිස්සති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය."

38. "දින්නා සඞ්ඝෙන ගග්ගස්ස භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තකසම්මුති, සරෙය්‍ය වා ගග්ගො භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය. ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය. සඞ්ඝො සහ වා ගග්ගෙන විනා වා ගග්ගෙන උපොසථං කරිස්සති. සඞ්ඝකම්මං කරිස්සති. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

35. "මහණෙනි, ඔවුන් දෙදෙනා අතුරෙහි යම් ඒ උන්මත්තකයෙක් උපොසථය සිහි කෙරේ ද, සිහි නො කෙරේ ද, සඞ්ඝකර්මය සිහි කෙරේ ද, සිහි නො කෙරේ ද, උපොසථයට ඒ ද, නො ඒ ද, සඞ්ඝකර්මයට ඒ ද, නො ඒ ද, මහණෙනි, මෙබඳු වූ උන්මත්තකයාහට උම්මත්තකසම්මුතිය දෙන්ට අනුදනිමි. මහණෙනි, මෙසේ ඒ දිය යුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් (පළමු කොට) සඞ්ඝයාට දැන්විය යුතු ය:

36. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. **ගර්ග** භික්ෂු තෙමේ උන්මත්තක වේ. උපොසථය සිහි කරන්නේ ද, සිහි නො කරන්නේ ද වේ. සඞ්ඝකර්මය සිහි කරන්නේ ද, සිහි නො කරන්නේ ද වේ. උපොසථයට එන්නේ ද, නො එන්නේ ද වේ. සඞ්ඝකර්මයට එන්නේ ද, නො එන්නේ ද වේ. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ උමතු වූ ගර්ගභික්ෂුනමට 'ගර්ගභික්ෂු තෙමේ උපොසථය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ සඞ්ඝකර්මය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ උපොසථයට එන්නේ හෝ නො එන්නේ හෝ සඞ්ඝකර්මයට එන්නේ හෝ නො එන්නේ හෝ වේවා' යි උම්මත්තක-සම්මුතිය දෙන්නේ ය. සඞ්ඝ තෙමේ ගර්ගභික්ෂුනම සමග හෝ ගර්ගභික්ෂුනම හැර හෝ පොහොය කරන්නේ ය. සඞ්ඝකර්ම කරන්නේ ය. මේ දැන්වීම ය."

37. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ගර්ගභික්ෂු තෙමේ උන්මත්තක වේ. උපොසථය සිහි කරන්නේ ද සිහි නො කරන්නේ ද, සඞ්ඝකර්මය සිහි කරන්නේ ද, සිහි නො කරන්නේ ද, උපොසථයට එන්නේ ද, නො එන්නේ ද, සඞ්ඝකර්මයට එන්නේ ද, නො එන්නේ ද වේ. සඞ්ඝ තෙමේ උමතු වූ ගර්ගභික්ෂුනමට 'ගර්ගභික්ෂු තෙමේ උපොසථය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ සඞ්ඝකර්මය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ උපොසථයට එන්නේ හෝ නො එන්නේ හෝ සඞ්ඝකර්මයට එන්නේ හෝ නො එන්නේ හෝ වේවා' යි උම්මත්තකසම්මුතිය දෙයි. සඞ්ඝ තෙමේ ගර්ගභික්ෂුනම සමග හෝ ගර්ගභික්ෂුනම හැර හෝ පොහොය කරන්නේ ය. සඞ්ඝකර්ම කරන්නේ ය. යම් ආයුෂමතෙකුහට උමතු වූ ගර්ගභික්ෂුනමට – උපොසථය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ සඞ්ඝකර්මය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ උපොසථයට එන්නේ හෝ නො එන්නේ හෝ සඞ්ඝකර්මයට එන්නේ හෝ නො එන්නේ හෝ වේවා' යි සඞ්ඝතෙමේ ගර්ගභික්ෂු-නම සමග හෝ ගර්ගභික්ෂුනම හැර හෝ පොහොය කරන්නේ ය. සඞ්ඝකර්ම කරන්නේ ය' යි උම්මත්තකසම්මුතිය දීම රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමෙකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා."

38. "සඞ්ඝයා විසින් උමතු වූ ගර්ගභික්ෂුනමට 'උපොසථය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ සඞ්ඝකර්මය සිහි කරන්නේ හෝ සිහි නො කරන්නේ හෝ උපොසථයට එන්නේ හෝ නො එන්නේ හෝ සඞ්ඝකර්මයට එන්නේ හෝ නො එන්නේ හෝ වේවා' යි සඞ්ඝ තෙමේ ගර්ගභික්ෂුනම සමග හෝ ගර්ගභික්ෂුනම හැර හෝ පොහොය කරන්නේ ය, සඞ්ඝකර්ම කරන්නේ ය' යි උම්මත්තකසම්මුතිය දෙන ලද්දී ය. සඞ්ඝයාට ඒ රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මේය මෙසේ දරමි"

39. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ චත්තාරො භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'උපොසථො කාතබ්බො' ති. මයඤ්චම්හ චත්තාරො ජනා, කථන්නු ඛො අම්හෙහි උපොසථො කාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ, චතුන්නං පාතිමොක්ඛං උද්දිසිතු" න්ති.

40. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ තයො භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං චතුන්නං පාතිමොක්ඛං උද්දිසිතුං. මයඤ්චම්හ තයො ජනා. කථන්නු ඛො අම්හෙහි උපොසථො කාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ, තිණ්ණං පාරිසුද්ධිඋපොසථං කාතුං. එවඤ්ච පන භික්ඛවෙ, කාතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛූ ඤාපෙතබ්බා:-

41. 'සුණන්තු මෙ ආයස්මන්තා,[1] අජ්ජුපොසථො (පණ්ණරසො). යදායස්මන්තානං පත්තකල්ලං, මයං (අඤ්ඤමඤ්ඤං) පාරිසුද්ධිඋපොසථං කරෙය්‍යාමා' ති. ථෙරෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා තෙ භික්ඛූ එවමස්සු වචනීයා: 'පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධො ති මං ධාරෙථ. පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධො ති මං ධාරෙථ. පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධො ති මං ධාරෙථා' ති.

42. "නවකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා, උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා තෙ භික්ඛූ එවමස්සු වචනීයා: 'පරිසුද්ධො අහං භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථ. පරිසුද්ධො අහං භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථ. පරිසුද්ධො අහං භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථා' ති.

43. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ ද්වෙ භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං චතුන්නං පාතිමොක්ඛං උද්දිසිතුං. තිණ්ණන්නං පාරිසුද්ධි උපොසථං කාතුං. මයඤ්චම්හ ද්වෙ ජනා. කථන්නු ඛො අම්හෙහි උපොසථො කාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ද්වින්නං පාරිසුද්ධි උපොසථං කාතුං. එවඤ්ච පන භික්ඛවෙ, කාතබ්බො:- ථෙරෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා නවො භික්ඛු එවමස්ස වචනීයො: 'පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධොති මං ධාරෙහි. පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධොති මං ධාරෙහි. පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධොති මං ධාරෙහී" ති.

44. "නවකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා ථෙරො භික්ඛු එවමස්ස වචනීයො: 'පරිසුද්ධො අහම්භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථ. පරිසුද්ධො අහම්භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථ. පරිසුද්ධො අහං භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථා" ති.

1. "ආයස්මන්තො" PTS.

39. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් භික්ෂූහු වාසය කෙරෙත්. ඉක්බිති ඒ භික්ෂූන්ට ''භාග්‍යවතුන් වහන්සේ විසින් 'උපොසථය කළ යුතු ය' යි පණවන ලද්දේ ය. අපි ද සිවුනමක් වෙමු. (එහෙයින්) අප විසින් කෙසේ නම් උපොසථය කට යුතු දැ'' යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. ''මහණෙනි, සිවු දෙනාට පාමොක් උදෙසන්නට අනුදනිමි'' යි.

40. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි තෙනමක් භික්ෂූහු වෙසෙති. ඉක්බිති ඒ භික්ෂූන්ට ''භාග්‍යවතුන් වහන්සේ විසින් සිවුදෙනාට පාමොක් උදෙසීම අනුදන්නා ලද්දේ ය. අපි ද තිදෙනෙක් වම්හ. කෙසේ නම් අප විසින් උපොසථය කළ යුතු දැ'' යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. ''මහණෙනි, තිදෙනාට පාරිසුද්ධි උපොසථය කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ ඒ කළ යුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් ඒ භික්ෂූන්ට දැන්විය යුතු යː-

41. 'ආයුෂමත්හු මාගේ වචනය අසත්වා. අද පොහොය පසළොස්වක වේ. ඉදින් ආයුෂමතුන්ට පැමිණි කල් ඇත්තේ නම්, අපි එක්එක්කෙනා පාරිසුද්ධි උපොසථය කරන්නෙමු' යි. ඉන් පසු ස්ථවිර භික්ෂුනම විසින් උතුරුසඟසිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම පිරිසිදු වෙමි. එහෙයින් මා පිරිසිදු ය යි දරවූ. ඇවැත්නි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරවූ. ඇවැත්නි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරවූ' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය.

42. ''නවක භික්ෂුනම විසින් උතුරුසඟ සිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරණු මැනවි. ස්වාමීනි, මම පිරිසිදු වෙමි, මා පිරිසිදු ය යි දරණු මැනවි. ස්වාමීනි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරණු මැනැවැ' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය.''

43. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි දෙ නමක් භික්ෂූහු වාසය කරත්. ඉක්බිති ඒ භික්ෂූන්ට ''භාග්‍යවතුන් වහන්සේ විසින් සිවු දෙනාට පාමොක් උදෙසන්නටත් තිදෙනාට පාරිසුද්ධි උපොසථය කරන්නටත් අනුදන්නා ලද්දේ ය. අපි දෙදෙනෙක් වම්හ. අප විසින් කෙසේ නම් උපොසථය කළ යුතු දැ'' යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. ''මහණෙනි, දෙදෙනාට පාරිසුද්ධිඋපොසථය කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ මෙසේ කළ යුතු යː ස්ථවිරභික්ෂුනම විසින් උතුරුසඟසිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරන්න. ඇවැත්නි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරන්න. ඇවැත්නි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරන්නැ' යි නවක භික්ෂුනමට කිය යුතු ය.

44. නවක භික්ෂුනම විසින් උතුරුසඟසිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරණු මැනවි. ස්වාමීනි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරණු මැනවි. ස්වාමීනි, මම පිරිසිදු වෙමි. මා පිරිසිදු ය යි දරණු මැනවැ' යි ස්ථවිර භික්ෂුනමට කිය යුතු ය.''

45. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ එකො භික්ඛු විහරති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං චතුන්නං පාතිමොක්ඛං උද්දිසිතුං. තිණ්ණං පාරිසුද්ධි උපොසථං කාතුං. ද්වින්නං පාරිසුද්ධි උපොසථං කාතුං. අහඤ්චම්හි එකකො. කථං නු ඛො මයා උපොසථො කාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

46. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ එකො භික්ඛු විහරති, තෙන භික්ඛවෙ, භික්ඛුනා යත්ථ භික්ඛූ පටික්කමන්ති උපට්ඨානසාලාය වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා සො දෙසො[1] සම්මජ්ජිත්වා පානීයං පරිභොජනීයං උපට්ඨපෙත්වා ආසනං පඤ්ඤපෙත්වා පදීපං කත්වා නිසීදිතබ්බං. සචෙ අඤ්ඤෙ භික්ඛූ ආගච්ඡන්ති, තෙහි සද්ධිං උපොසථො කාතබ්බො නො චෙ ආගච්ඡන්ති, අජ්ජ මෙ උපොසථො ති අධිට්ඨාතබ්බො. නො චෙ අධිට්ඨහෙය්‍ය, ආපත්ති දුක්කටස්ස."

47. තත්‍ර භික්ඛවෙ, යත්ථ චත්තාරො භික්ඛූ විහරන්ති, න එකස්ස පාරිසුද්ධිං ආහරිත්වා තීහි පාතිමොක්ඛං උද්දිසිතබ්බං, උද්දිසෙය්‍යුං චෙ ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ, යත්ථ තයො භික්ඛූ විහරන්ති, න එකස්ස පාරිසුද්ධිං ආහරිත්වා ද්වීහි පාරිසුද්ධි උපොසථො කාතබ්බො. කරෙය්‍යුං චෙ, ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ, යත්ථ ද්වෙ භික්ඛූ විහරන්ති, න එකස්ස පාරිසුද්ධිං ආහරිත්වා එකෙන අධිට්ඨාතබ්බො අධිට්ඨහෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්සා" ති.

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තදහුපොසථෙ ආපත්තිං ආපන්නො හොති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න සාපත්තිකෙන උපොසථො කාතබ්බො' ති. අහඤ්චම්හි ආපත්තිං ආපන්නො. කථං නු ඛො මයා පටිපජ්ජිතබ්බ?"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

49. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහුපොසථෙ ආපත්තිං ආපන්නො හොති. තෙන භික්ඛවෙ, භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'අහං ආවුසො, ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො. තං පටිදෙසෙමී' ති. තෙන වත්තබ්බො, 'පස්සසී' ති. 'ආම පස්සාමී' ති. 'ආයතිං සංවරෙය්‍යාසී'"ති

50. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහුපොසථෙ ආපත්තියා වෙමතිකො හොති. තෙන භික්ඛවෙ, භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'අහං ආවුසො, ඉත්ථන්නාමාය ආපත්තියා වෙමතිකො, යදා නිබ්බෙමතිකො භවිස්සාමි, තදා තං ආපත්තිං පටිකරිස්සාමී' ති. වත්වා උපොසථො කාතබ්බො. පාතිමොක්ඛං සොතබ්බං. නත්වෙව තප්පච්චයා උපොසථස්ස අන්තරායො කාතබ්බො" ති.

---

1. "සෙ දෙසෙ"?

Free Distribution www.aathaapi.org

45. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි එක් භික්ෂු නමක් වෙසෙයි. ඉක්බිති ඒ භික්ෂුනමට "භාග්‍යවතුන් වහන්සේ විසින් සිවු දෙනාට පාමොක් උදෙසන්නට, තිදෙනාට පාරිසුද්ධි උපොසථය කරන්නට, දෙදෙනාට පාරිසුද්ධි උපොසථය කරන්නට, අනුදන්නා ලද්දේ ය. මම එකලා වෙමි. මා විසින් කෙසේ නම් උපොසථය කළ යුතු දැ" යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

46. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි එක් භික්ෂුනමක් වෙසෙයි. මහණෙනි, ඒ භික්ෂුනම විසින් යම් උපස්ථානශාලාවෙක හෝ මණ්ඩපයෙක්හි හෝ රුක්මුලෙක්හි හෝ භික්ෂූහු රැස් වෙත් ද ඒ පෙදෙස හැමද පැන් හා පරිභොගයට ගන්නා දිය එළවා අසුන් පණවා පහන් දල්වා හිඳිය යුතු ය. ඉදින් අන් මහණහු එහි එත් ද, ඔවුන් සමග පොහොය කළ යුතු ය. ඉදින් නො එත් නම් 'අද මාගේ පොහොය' යි ඉටිය යුතු ය. ඉදින් නො ඉටන්නේ නම්, ඔහුට දුකුලාඇවැත් වේ."

47. "මහණෙනි, එහි යම් තැනෙක්හි සිවුනමක් භික්ෂූහු වෙසෙත් ද, එක් නමකගේ පාරිසුද්ධිය ගෙණවුත් තෙනමක් විසින් පාමොක් නො උදෙසිය යුතු ය. ඉදින් උදෙසන්නාහු නම්, ඔවුනට දුකුලාඇවැත් වේ. මහණෙනි, එහි යම් තැනෙක්හි තෙනමක් භික්ෂූහු වෙසෙත් ද, එක්නමකගේ පාරිසුද්ධිය ගෙණවුත් දෙනමක් විසින් පාරිසුද්ධි උපොසථය නො කළ යුතු ය. ඉදින් කරන්නාහු නම්, ඔවුනට දුකුලා ඇවැත් වේ. මහණෙනි, එහි යම් තැනෙක්හි දෙ නමක් භික්ෂූහු වෙසෙත් ද, එක් නමකගේ පාරිසුද්ධිය ගෙණවුත් එක් නමක් විසින් නො ඉටිය යුතු ය. ඉටන්නේ නම් දුකුලාඇවැත් වේ."

48. එකල්හි එක්තරා මහණෙක් එදවස පොහොයෙහි ඇවැතකට පැමිණියේ වේ. එවිට ඒ මහණහුට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඇවැත් සහිත මහණහු විසින් පොහොය නො කට යුතු ය' යි පණවන ලද්දේ ය. මම ද ඇවැතකට පැමිණියෙම් වෙමි. මා විසින් කෙසේ නම් පිළිපැදිය යුතු දැ" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

49. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එදවස පොහොයෙහි ඇවැතකට පැමිණියේ වේ. මහණෙනි, ඒ භික්ෂුනම විසින් එක් මහණකු වෙතට පැමිණ උතුරුසඟසිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම මෙනම් ඇවැතට පැමිණියේ වෙමි. එය දෙසමි' යි මෙසේ කිය යුතු ය. ඒ ඇවැත පිළිගන්නා මහණහු විසින් 'ඒ ඇවැත දක්නෙහි දැ' යි කිය යුතු ය. ඇවැත දෙසන මහණහු විසින් 'එසේ ය දකිමි' යි කිය යුතු ය. ඇවැත පිළිගන්නා මහණහු විසින් 'ඉදිරියෙහි සංවර වෙව' යි කිය යුතු ය."

50. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එ දවස පොහොයෙහි ඇවැතෙහි විමති ඇත්තේ වේ. මහණෙනි, ඒ මහණහු විසින් එක් මහණකු වෙත ගොස් උතුරුසඟසිවුර එකස් කොට පොරොවා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම මෙනම් ඇවැතෙහි විමති ඇත්තේ වෙමි. යම් කලෙක විමති නැත්තෙම් වන්නෙම් ද, එකල්හි ඒ ඇවැතට පිළියම් කරන්නෙමි' යි කිය යුතු වන්නේ ය. කියා පොහොය කළ යුතු ය. පාමොක් ඇසිය යුතු ය. ඒ හේතුවෙන් උපොසථයට අන්තරාය නො කළ යුතු ම ය".

51. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සභාගං ආපත්තිං දෙසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සභාගා ආපත්ති දෙසෙතබ්බා. යො දෙසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

52. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සභාගං ආපත්තිං පටිග්ගණ්හන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සභාගා ආපත්ති පටිග්ගහෙතබ්බා. යො පටිග්ගණ්හෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

53. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ ආපත්තිං සරති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න සාපත්තිකෙන උපොසථො කාතබ්බො' ති. අහඤ්චම්හි ආපත්තිං ආපන්නො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

54. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ ආපත්තිං සරති. තෙන භික්ඛවෙ, භික්ඛුනා සාමන්තො භික්ඛු එවමස්ස වචනීයො: 'අහං ආවුසො, ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො. ඉතො වුට්ඨහිත්වා තං ආපත්තිං පටිකරිස්සාමී' ති. වත්වා උපොසථො කාතබ්බො. පාතිමොක්ඛං සොතබ්බං. නත්වෙව තප්පච්චයා උපොසථස්ස අන්තරායො කාතබ්බො."

55. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ ආපත්තියා වෙමතිකො හොති. තෙන භික්ඛවෙ, භික්ඛුනා සාමන්තො භික්ඛු එවමස්ස වචනීයො: 'අහං ආවුසො ඉත්ථන්නාමාය ආපත්තියා වෙමතිකො. යදා නිබ්බෙමතිකො භවිස්සාමි, තදා තං ආපත්තිං පටිකරිස්සාමී' ති. වත්වා උපොසථො කාතබ්බො, පාතිමොක්ඛං සොතබ්බං. නත්වෙව තප්පච්චයා උපොසථස්ස අන්තරායො කාතබ්බො" ති.

56. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න සභාගා ආපත්ති දෙසෙතබ්බා. න සභාගා ආපත්ති පටිග්ගහෙතබ්බා' ති. අයඤ්ච සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො, කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ" න්ති භගවතො එතමත්ථං ආරොචෙසුං.

57. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. තෙහි භික්ඛවෙ, භික්ඛූහි එකො භික්ඛු සාමන්තා ආවාසා සජ්ජුකං පාහෙතබ්බො: 'ගච්ඡාවුසො, තං ආපත්තිං පටිකරිත්වා ආගච්ඡ. මයං තෙ සන්තිකෙ ආපත්තිං පටිකරිස්සාමා' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

51. එකල්හි සවග මහණෝ සමාන ඇවැත් දෙසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සමාන ඇවැත් නො දෙසිය යුතු ය. යමෙක් දෙසන්නේ නම්, දුකුළාඇවැත් වේ."

52. එකල්හි සවග මහණෝ සමාන ඇවැත් පිළිගණිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සමාන ඇවැත් නො පිළිගත යුතු ය. යමෙක් පිළිගන්නේ නම්, දුකුළාඇවැත් වේ."

53. එකල්හි එක්තරා මහණෙක් තෙමේ පාමොක් උදෙසනු ලබන කල්හි ඇවැත සිහි කෙරෙයි. ඉක්බිති ඒ භික්‍ෂුතමට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඇවැත් ඇත්තහු විසින් පොහොය නො කළ යුතු ය' යි පණවන ලද්දේ ය. මම ද ඇවැතකට පැමිණියෙම් වෙමි. මා විසින් කෙසේ නම් පිළිපැදිය යුතු ද" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

54. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ පාමොක් උදෙසනු ලබන කල්හි ඇවැත සිහි කරයි. මහණෙනි, ඒ මහණහු විසින් ළඟ සිටි මහණහුට 'ඇවැත්නි, මම මෙනම් ඇවැතට පැමිණියෙම් වෙමි, මෙතැනින් නැගිට ඒ ඇවැතට පිළියම් කරන්නෙමි" යි මෙසේ කිය යුතු වන්නේ ය. එසේ කියා පොහොය කළ යුතු ය. පාමොක් ඇසිය යුතු ය. ඒ හේතු වෙන් උපොසථයට අන්තරායයක් නො කළ යුතු ම ය."

55. "මහණෙනි, මෙහි පාමොක් දෙසනු ලබන කල්හි මහණ තෙමේ ඇවැතෙහි විමති ඇත්තේ වේ. මහණෙනි, ඒ භික්‍ෂුනම විසින් ළඟ සිටි මහණහුට 'ඇවැත්නි, මම මෙනම් ඇවැතෙහි විමති ඇත්තෙම් වෙමි. යම් කලෙක්හි විමති නැත්තෙම් වන්නෙම් ද, එකල්හි ඒ ඇවැතට පිළියම් කරන්නෙමි' යි මෙසේ කිය යුතු වන්නේ ය. කියා පොහොය කළ යුතු ය. පාමොක් ඇසිය යුතු ය. ඒ හේතුවෙන් උපොසථයට අනතරායයක් නො කළ යුතු ම ය."

56. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතකට පැමිණියේ වේ. ඉක්බිති ඒ භික්‍ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'සමාන ඇවැත නො දෙසිය යුතු ය. සමාන ඇවැත නො පිළිගත යුතු ය' යි පණවන ලද්දේ ය. මේ සියලු සඞ්ඝ තෙමේ ද සමාන ඇවැතකට පැමිණියේ වේ. අප විසින් කෙසේ නම් පිළිපැදිය යුතු ද" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ.

57. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතකට පැමිණියේ වේ. මහණෙනි, ඒ මහණුන් විසින් සමීපවිහාරයකට එක් මහණෙක් තෙමේ එ දවස එනු පිණිස 'ඇවැත්නි, යව. ඒ ඇවැතට පිළියම් කොට එව. අපි ඔබගේ හමු-වෙහි ඇවැතට පිළියම් කරන්නෙමු' යි යැවිය යුතු ය. මෙය මෙසේ ලබන් නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, ව්‍යක්ත වූ ප්‍රතිබල භික්‍ෂුනමක් විසින් සඞ්ඝයාට දත් විය යුතු යඃ-

58. “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො. යදා අඤ්ඤං භික්ඛුං සුද්ධං අනාපත්තිකං පස්සිස්සති, තදා තස්ස සන්තිකෙ තං ආපත්තිං පටිකරිස්සතී” ති වත්වා උපොසථො කාතබ්බො. පාතිමොක්ඛං උද්දිසිතබ්බං. නත්වෙව තප්පච්චයා උපොසථස්ස අන්තරායො කාතබ්බො.

59. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සබ්බො සඞ්ඝො සභාගාය ආපත්තියා වෙමතිකො හොති. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං සබ්බො සඞ්ඝො සභාගාය ආපත්තියා වෙමතිකො. යදා නිබ්බෙමතිකො භවිස්සති, තදා තං ආපත්තිං පටිකරිස්සතී” ති, වත්වා උපොසථො කාතබ්බො පාතිමොක්ඛං උද්දිසිතබ්බං. නත්වෙව තප්පච්චයා උපොසථස්ස අන්තරායො කාතබ්බො.”

60. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සූපගතො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. තෙහි භික්ඛවෙ, භික්ඛූහි එකො භික්ඛු සාමන්තා ආවාසා සජ්ජුකං පාහෙතබ්බො: ‘ගච්ඡාවුසො, තං ආපත්තිං පටිකරිත්වා ආගච්ඡ. මයං තෙ සන්තිකෙ තං ආපත්තිං පටිකරිස්සාමා’ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, එකො භික්ඛු සත්තාහකාලිකං පාහෙතබ්බො: ‘ගච්ඡාවුසො. තං ආපත්තිං පටිකරිත්වා ආගච්ඡ. මයං තෙ සන්තිකෙ තං ආපත්තිං පටිකරිස්සාමා” ති.

61. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. සො න ජානාති තස්සා ආපත්තියා නාමං, න ගොත්තං.[1] තත්ථඤ්ඤො භික්ඛු ආගච්ඡති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. තමෙනං අඤ්ඤතරො භික්ඛු, යෙන සො භික්ඛු, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච:

62. ‘යො නු ඛො ආවුසො, එවඤ්චෙවඤ්ච කරොති, කින්නාම සො ආපත්තිං ආපජ්ජතී” ති. සො එවමාහ: ‘යො ඛො ආවුසො එවඤ්චෙවඤ්ච කරොති, ඉමන්නාමං සො ආපත්තිං ආපජ්ජති. ඉමන්නාමං ත්වං ආවුසො, ආපත්තිං ආපන්නො. පටිකරොහි තං ආපත්ති’ න්ති. සො එවමාහ: ‘න ඛො අහං ආවුසො, එකොව ඉමං ආපත්තිං ආපන්නො, අයං සබ්බො සඞ්ඝො ඉමං ආපත්තිං ආපන්නො’ති. සො එවමාහ: ‘කින්තෙ ආවුසො, කරිස්සති පරො ආපන්නො වා අනාපන්නො වා. ඉඞ්ඝ ත්වං ආවුසො, සකාය ආපත්තියා වුට්ඨහා’ති[2]

1 “නාමගොත්තං” ම ඡ සං, නාමංගොත්තං” P T S.

2 “වුට්ඨාති” ම ඡ සං. “වුට්ඨාති” අ වි.

58 "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. 'මේ සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතකට පැමිණියේ වේ. යම් කලෙක ඇවැත් නැති පිරිසිදු අන් මහණකු දක්නේ ද, එකල්හි ඔහු වෙත ඒ ඇවැතට පිළියම් කරන්නේ ය' යි කියා පොහොය කළ යුතු ය. පාමොක් උදෙසිය යුතු ය. ඒ හේතුවෙන් උපොසථයට අන්තරායයක් නො කළ යුතු ම ය.

59. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එ දවස පොහොයෙහි සියලු සඞ්ඝ තෙමේ සමාන වූ ඇවැතෙහි විමති ඇත්තේ වේ. (එහෙයින්) ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝයාට දැන් විය යුතු ය: 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතෙහි විමති ඇත්තේ වේ. යම් කලෙක්හි විමති නැත්තේ වන්නේ නම්, එකල්හි ඒ ඇවැතට පිළියම් කරන්නේ ය' යි උපොසථය කළ යුතුය. පාමොක් උදෙසිය යුතු ය. ඒ හේතුවෙන් උපොසථයට අන්තරායයක් නො කළ යුතු ම ය."

60. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක වස් එළඹියා වූ සඞ්ඝ තෙමේ සමාන ඇවැතකට පැමිණියේ වේ. මහණෙනි, ඒ භික්ෂූන් විසින් සමීප විහාරයකට එක් භික්ෂුනමක් 'ඇවැත්නි, යව. ඒ ඇවතට පිළියම් කොට එව. අපි ඔබගේ සමීපයෙහි ඒ ඇවතට පිළියම් කරන්නෙමු'යි එදවස එනු පිණිස යැවිය යුතු ය. මේ මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නහු නම්, එක් භික්ෂුනමක් 'ඇවැත්නි, යව. ඒ ඇවැතට පිළියම් කොට එව. අපි ඔබගේ සමීපයෙහි ඒ ඇවැතට පිළියම් කරන්නෙමු' යි සත් දවසකට කල් දී යැවිය යුතු ය."

61. එකල්හි එක්තරා ආවාසයෙක සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතකට පැමිණියේ වේ. හෙතෙමේ ඒ ඇවැතෙහි නම නො දනී යි. ගොත්‍රය නො දනී යි. එහි බොහෝ ඇසූ පිරූ තැන් ඇති අවබොධ කළ ආගම ඇති ධම්ධර වූ විනයධර වූ උභයමාතෘකාධර වූ නුවණැත්තා වූ ව්‍යක්ත වූ විදසුන් නුවණැත්තා වූ පව් කිරීමෙහි ලජ්ජා ඇත්තා වූ කුකුස් ඇත්තා වූ ශික්ෂාකාමී වූ අන් මහණෙක් එ යි. (ඔහු ආ පසු) එක්තරා මහණෙක් තෙමේ ඒ මහණහු වෙතට ගියේ ය. ගොස් ඒ මහණහුට මෙය කීයේ ය.

62. "ඇවැත්නි, යම් මහණෙක් මෙසේත් මෙසේත් කෙරේ ද, ඒ මහණ තෙමේ කිනම් ඇවතකට පැමිණේ ද'? ඒ මහණ තෙමේ "ඇවැත්නි, යමෙක් මෙසේත් මෙසේත් කෙරේ නම්, හෙතෙමේ මෙනම් ඇවතකට පැමිණේ. ඇවැත්නි, තෙපි මෙනම් ඇවතකට පැමිණියෝ වහු ය. ඒ ඇවැතට පිළියම් කරවු"යි හෙතෙමේ මෙසේ කීයේ ය. (එවිට) ඒ ඇවතට පැමිණි මහණ තෙමේ 'ඇවැත්නි, මම එකලාව ම මේ ඇවතට නො පැමිණියෙමි. මේ සියලු සඞ්ඝ තෙමේ මේ ඇවැතට පැමිණියේ ය'යි කීයේ ය. ඉක්බිති අළුතෙන් පැමිණි මහණ තෙමේ 'ඇවැත්නි, අනෙකෙක් පැමිණියේ හෝ නො පැමිණියේ හෝ ඔබට කිම? ඇවැත්නි, ඒ නිසා තෙපි සිය ඇවැතින් නැඟී සිටිවු' යි මෙසේ කීයේ ය.

70. අථ බො සො භික්ඛු තස්ස භික්ඛුනො වචනෙන තං ආපත්තිං පටිකරිත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "යො කිර ආවුසො, එවමෙවං කරොති; ඉමං නාම සො ආපත්තිං ආපජ්ජති. ඉමං නාම තුම්හෙ ආවුසො ආපත්තිං ආපන්නා, පටිකරොථ තං ආපත්ති"න්ති. අථ බො තෙ භික්ඛූ න ඉච්ඡිංසු තස්ස භික්ඛුනො වචනෙන තං ආපත්තිං පටිකාතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං.

"ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. සො න ජානාති තස්සා ආපත්තියා නාමං න ගොත්තං. තත්ථඤ්ඤො[1] භික්ඛු ආගච්ඡති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. තමෙනං අඤ්ඤතරො භික්ඛු යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එවං වදෙති: 'යො නු බො ආවුසො, එවමෙවං කරොති, කිං නාම සො ආපත්තිං ආපජ්ජතී'ති. සො එවං වදෙති: 'යො බො ආවුසො, එවමෙවං කරොති, ඉමං නාම සො ආපත්තිං ආපජ්ජති. ඉමං නාම ත්වං ආවුසො, ආපත්තිං ආපන්නො පටිකරොහි තං ආපත්ති'න්ති. සො එවං වදෙති: 'න බො අහං ආවුසො, එකොව ඉමං ආපත්තිං ආපන්නො. අයං සබ්බො සඞ්ඝො ඉමං ආපත්තිං ආපන්නො'ති. සො එවං වදෙති: 'කිං තෙ ආවුසො, කරිස්සති පරො ආපන්නො වා අනාපන්නො වා? ඉඞ්ඝ ත්වං ආවුසො, සකාය ආපත්තියා වුට්ඨහා' ති. සො චෙ භික්ඛවෙ, භික්ඛු තස්ස භික්ඛුනො වචනෙන තං ආපත්තිං පටිකරිත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එවං වදෙති: 'යො කිර ආවුසො, එවමෙවං කරොති, ඉමං නාම සො ආපත්තිං ආපජ්ජති. ඉමං නාම තුම්හෙ ආවුසො, ආපත්තිං ආපන්නා. පටිකරොථ තං ආපත්ති'න්ති. තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ තස්ස භික්ඛුනො වචනෙන තං ආපත්තිං පටිකරෙය්‍යුං, ඉච්චෙතං කුසලං. නො චෙ පටිකරෙය්‍යුං, න තෙ භික්ඛවෙ, භික්ඛූ තෙන භික්ඛුනා අකාමා වචනීයා" ති.

**චොදනාවත්ථුභාණවාරං නිට්ඨිතං.**

---

1. "තත්ථ අඤ්ඤො" ම ඡ සං.

70. එකල්හි ඒ මහණ තෙමේ ඒ මහණහුගේ වචනයෙන් ඒ ඇවැතට පිළියම් කොට ඒ මහණුන් හුන් තැනට ගියේ ය. ගොස් "ඇවැත්නි, යමෙක් තෙමේ මෙසේත් මෙසේත් කෙරේ ද, හෙතෙමේ මෙනම් ඇවැතකට පැමිණේ. ඇවැත්නි, තෙපි මෙනම් ඇවැතකට පැමිණියහු .ඒ ඇවැතට පිළියම් කරවු"යි ඒ භික්ෂූන්ට මෙය කීයේ ය. ඉක්බිති ඒ මහණහු ඒ මහණහුගේ වචනයෙන් ඒ ඇවැතට පිළියම් කරන්නට නො කැමැති වූහ. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළහ.

"මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක සියලු සඞ්ඝ තෙමේ සභාගාපත්තියකට පැමිණියේ වේ. ඒ සඞ්ඝ තෙමේ ඒ ආපත්තියෙහි නම නො දනී යි. ගොත්‍රය නො දනී යි. එහි බොහෝ ඇසූ පිරූ තැන් ඇති පුහුණු කළ නිකාය ඇති ධර්මය දරන්නා වූ විනය දරන්නා වූ උභයමාතෘකා දරන්නා වූ නුවණැත්තා වූ ව්‍යක්ත වූ විදර්ශනාප්‍රඥාවෙන් ප්‍රාඥ වූ පව් කිරීමෙහි ලජ්ජා ඇත්තා වූ කුකුස් ඇත්තා වූ ශික්ෂාකාමී වූ අන් මහණෙක් තෙමේ එයි. එක්තරා මහණෙක් ඒ පැමිණි මහණහු වෙතට එළඹියේ ය. එළඹ ඒ මහණහුට මෙසේ කියයි: 'ඇවැත්නි, යම් මහණෙක් තෙමේ මෙසේත් මෙසේත් කෙරේ ද, ඒ මහණ තෙමේ කිනම් ඇවැතකට පැමිණේ ද?' යි. හෙතෙමේ 'ඇවැත්නි, යම් මහණෙක් මෙසේත් මෙසේත් කෙරේ නම්, හෙතෙමේ මෙනම් ඇවැතකට පැමිණේ. ඇවැත්නි, තෙපි මෙනම් ඇවැතට පැමිණියහු ය. එයට පිළියම් කරවු' යි මෙසේ කිය යි. හෙතෙමේ 'ඇවැත්නි, මම තනි වූයේ ම මේ ඇවැතට නො පැමිණියෙමි. මේ සියලු සඞ්ඝ තෙමේ මේ ඇවැතට පැමිණියේ ය' යි මෙසේ කියයි. හෙතෙමේ 'ඇවැත්නි, අනිකෙක් පැමිණියේ හෝ නො පැමිණියේ හෝ ඔබට කිම? ඇවැත්නි, එබැවින් තෙපි සිය ඇවතින් නැඟී සිටිවු' යි මෙසේ කිය යි. මහණෙනි, ඉදින් ඒ මහණ තෙමේ ඒ මහණහුගේ වචනයෙන් ඒ ඇවැතට පිළියම් කොට ඒ මහණුන් වෙතට ගියේ ය. ගොස් 'ඇවැත්නි, යම් මහණෙක් තෙමේ මෙසේත් මෙසේත් කෙරේ ද, ඒ මහණතෙමේ මෙනම් ඇවැතකට පැමිණේ. ඇවැත්නි, තෙපි මෙනම් ඇවැතට පැමිණියහු ය. ඒ ඇවැතට පිළියම් කරවු' යි ඒ භික්ෂූන්ට මෙසේ කිය යි. මහණෙනි, ඉදින් ඒ මහණහු ඒ මහණහුගේ වචනයෙන් ඒ ඇවැතට පිළියම් කරන්නාහු නම්, එය යහපත් ය. ඉදින් පිළියම් නො කරන්නාහු නම්, මහණෙනි, ඒ මහණහු තුමූ ඒ මහණහු විසින් නො කැමැත්තෙන් නො කිය යුත්තාහ."

**චොදනාවස්තුභාණවාරය කියා නිමවනලදී.**

---

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතිංසු චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානිංසු "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා"ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං අකංසු. පාතිමොක්ඛං උද්දිසිංසු. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡිංසු බහුතරා. භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා'ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං අනාපත්ති." 1.

3. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා'ති. 'තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං අනාපත්ති." 2.

4. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. "තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං. අනාපත්ති." 3.

5. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. "තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං අනාපත්ති." 4.

1. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වූහ. "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ"යි ඔහු නො දත්හ. ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇත්තෝ විනය යන කල්පනා ඇත්තෝ වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇත්තෝ පොහොය කළාහු ය. පාමොක් උදෙසූහ. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය ආවාසික-භික්ෂූහු ආහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

2. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. "ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇත්තෝ විනය යන කල්පනා ඇත්තෝ වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එති. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත්නො වේ." 1.

3. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. "ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇත්තෝ විනය යන කල්පනා ඇත්තෝ වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත සමසම වූ ආවාසික භික්ෂූහු එති. උදෙසනලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 2.

4. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. "ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇත්තෝ විනය යන කල්පනා ඇත්තෝ වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ඉතා අඩු වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එති. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 3.

5. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. "ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇත්තෝ විනය යන කල්පනා ඇත්තෝ වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එති. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 4.

6. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති." 5.

7. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති." 6.

8. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං අනාපත්ති." 7.

9. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති." 8.

10. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති. 9.

Free Distribution www.aathaapi.org

6. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසික භික්ෂූහු රැස් වෙති. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇත්තෝ විනය යන කල්පනා ඇත්තෝ වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇත්තෝ පොහොය කෙරෙත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි නැවත සමසම වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එති. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඒ භික්ෂූන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 5.

7. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙති. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇති ව විනය යන කල්පනා ඇති ව වර්ගී වූවෝ සමගි ය යන කල්පනා ඇති ව පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි නැවැත අන්‍ය වූ ඉතා ටික දෙනෙක් වූ ආවාසිකභික්ෂූහු එති. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 6.

8. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙති. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇති ව විනය යන කල්පනා ඇතිව වර්ගී වූවෝ සමගි ය යන කල්පනා ඇති ව පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස නො නැගී සිටි කල්හි නැවැත අන්‍ය වූ ඉතා බොහෝ වූ ආවාසික භික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 7.

9. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙති. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇති ව විනය යන කල්පනා ඇති ව වර්ගී වූවෝ සමගි ය යන කල්පනා ඇති ව පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස නො නැගී සිටි කල්හි නැවැත අන්‍ය වූ සමසම වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 8.

10. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. ඒ භික්ෂූහු ධර්මය යන කල්පනා ඇති ව විනය යන කල්පනා ඇති ව වර්ගී වූවාහු සමගිය යන කල්පනා ඇති ව පොහොය කෙරෙත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස නො නැගී සිටි කල්හි නැවැත අන්‍ය වූ ඉතා අඩු වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 9.

11. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා'ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං අනාපත්ති." 10.

12. "ඉධ පන භික්ඛවෙ අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති." 11.

13. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති. චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි අරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති." 12.

14. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති. 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං අනාපත්ති." 13

11. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ, සමගි ය යන කල්පනා ඇති ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි ඇතැම් පිරිසක් නැගී සිටි කල්හි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 10.

12. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ එයට වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ, සමගි ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවැත සමසම වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එති. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිශුද්ධිය සැළකළ යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ" 11.

13. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ, සමගි ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවැත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිශුද්ධිය සැළකළ යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 12.

14. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ, සමගි ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 13.

15. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති.” 14.

16. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං අනාපත්ති.” 15.

අනාපත්තිපන්නරසකං නිට්ඨිතං.

---

Free Distribution www.aathaapi.org

15. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු නො දනිත්. "ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ, සමග්‍රි ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිශුද්ධිය සැලකල යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 14.

16 "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ, සමග්‍රි ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිශුද්ධිය සැලකල යුතු ය. උදෙසූවන්ට ඇවැත් නො වේ." 15.

අනාපත්තිපණ්ණරසකය නිමි.

---

1. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 1.

2. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති, 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 2.

3. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 3.

4. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා'ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ -පෙ- අවුට්ඨිතාය පරිසාය -පෙ- එකච්චාය වුට්ඨිතාය පරිසාය -පෙ- සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා -පෙ- සමසමා -පෙ- ථොකතරා. උද්දිට්ඨං. සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 4-15.

**වග්ගාවග්ගසඤ්ඤී පණ්ණරසකං නිට්ඨිතං.**

---

1. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ග වූ වර්ග ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට දුකුලාඇවැත් වේ." 1.

2. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. "නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ" යි ඒ භික්ෂූහු දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ග වූ, වර්ග ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට දුකුලාඇවැත් වේ." 2.

3. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ග වූ, වර්ග ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එති. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට දුකුලාඇවැත් වේ." 3.

4. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ග වූ, වර්ග ය යන කල්පනා ඇති, ඒ භික්ෂූහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි -පෙ- පිරිස නො නැඟී සිටි කල්හි -පෙ- පිරිස කොටසක් නැඟී සිටි කල්හි -පෙ- සියලු පිරිස නැඟී සිටි කල්හි නැවැත ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට දුකුලා-ඇවැත් වේ." 4-15.

**වග්ගාවග්ගසඤ්ඤීපණ්ණරසකය නිමි.**

---

1. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ති. තෙ ‘කප්පති නු බො අම්හාකං උපොසථො කාතුං? න නු බො කප්පතී’ ? ති වෙමතිකා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස.” 1.

2. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. ‘තෙ ජානන්ති අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ති. තෙ ‘කප්පති නු බො අම්හාකං උපොසථො කාතුං? න නු බො කප්පතී?’ ති වෙමතිකා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස.” 2.

3. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ති. තෙ “කප්පති නු බො අම්හාකං උපොසථො කාතුං? න නු බො කප්පතී’? ති වෙමතිකා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස.” 3.

4. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ති. තෙ ‘කප්පති නු බො අම්හාකං උපොසථො කාතුං? න නු බො කප්පතී?’ ති. වෙමතිකා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ -පෙ- අවුට්ඨිතාය පරිසාය -පෙ- එකච්චාය වුට්ඨිතාය පරිසාය -පෙ- සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා -පෙ- සමසමා -පෙ- ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස.” 4-15.

**වෙමතිකපණ්ණරසකං නිට්ඨිතං.**

1. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවුනමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ද? නො කැප දැ?' යි විමති ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට දුකුලාඇවැත් වේ." 1.

2. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ද? නො කැප දැ?' යි විමති ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත සම සම් වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය උදෙසූවන්ට දුකුලාඇවැත් වේ." 2.

3. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ද? නො කැප දැ?' යි විමති ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි ඉතා පිඩ ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට දුකුලාඇවැත් වේ." 3.

4. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ද? නො කැප දැ?' යි විමති ඇත්තෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි -පෙ- පිරිස නො නැගී සිටි කල්හි -පෙ- පිරිස කොටසක් නැගී සිටි කල්හි -පෙ- සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත ඉතා බොහෝ ගණනක් -පෙ- සම සම ගණනක් -පෙ- ඉතා පිඩ ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකළ යුතු ය. උදෙසූවන්ට දුකුලා ඇවැත් වේ." 4-15.

**වෙමතිකපණ්ණරසකය නිමි.**

---

1. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'කප්පතෙව අම්හාකං උපොසථො කාතුං. නාම්හාකං න කප්පතී' ති කුක්කුච්චපකතා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 1.

2. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'කප්පතෙව අම්හාකං උපොසථො කාතුං නාම්හාකං න කප්පතී' ති කුක්කුච්චපකතා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 2.

3. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'කප්පතෙව අම්හාකං උපොසථො කාතුං. නාම්හාකං න කප්පතී' ති කුක්කුච්චපකතා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 3.

4. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'කප්පතෙව අම්හාකං උපොසථො කාතුං. නාම්හාකං න කප්පතී' ති කුක්කුච්චපකතා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ -පෙ- අවුට්ඨිතාය පරිසාය -පෙ- එකච්චාය වුට්ඨිතාය පරිසාය -පෙ- සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස." 4-15.

**කුක්කුච්චපකතපණ්ණරසකං නිට්ඨිතං**

---

1. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ම ය. අපට පොහොය කිරීම නො කැප නො වේ' යි කුකුසින් මඩනා ලද්දෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ඉතා බොහෝ ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට දුකුළාඇවැත් වේ. 1.

2. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. "නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ම ය. අපට පොහොය කිරීම නො කැප නො වේ' යි කුකුසින් මඩනා ලද්දෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවත සම සම ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට දුකුළාඇවැත් වේ." 2.

3. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ම ය. අපට පොහොය කිරීම නො කැප නො වේ' යි කුකුසින් මඩනා ලද්දෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත ටික ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට දුකුළා-ඇවැත් වේ." 3.

4. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'අපට පොහොය කිරීම කැප ම ය. අපට පොහොය කිරීම නො කැප නො වේ' යි කුකුසින් මඩනා ලද්දෝ පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි -පෙ- පිරිස නො නැගී සිටි කල්හි -පෙ- පිරිස කොටසක් නැගී සිටි කල්හි -පෙ- සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත ඉතා බොහෝ ගණනක් -පෙ- සම සම ගණනක් -පෙ- ඉතා ටික ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැලකළ යුතු ය. උදෙසූවන්ට දුකුළාඇවැත් වේ." 4-15.

**කුක්කුච්චපකතපණ්ණරසකය නිමි.**

---

1. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

2. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

3. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිස්සමානෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. අවසෙසං සොතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

4. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස"

5. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

1. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ථුල්ලච්චය ඇවැත් (මහවරද) වේ."

2. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවැත සමසම ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූ වන්ට ථුල්ලච්චය ඇවැත් වේ."

3. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කෙරෙත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසනු ලබන කල්හි නැවත ඉතා ටික ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. සෙස්ස ඇසිය යුතු ය. උදෙසූවන්ට ථුල්ලච්චය ඇවැත් වේ."

4 "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි නැවත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවැත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ථුල්ලච්චය ඇවැත් වේ.

5. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි නැවැත සම සම ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිශුද්ධිය සැලකළ යුතු ය. උදෙසූවන්ට ථුල්ලච්චය ඇවැත් වේ."

6. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

7. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො'ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

8. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

9 "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා'ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො'ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

6. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි නැවැත ඉතා ටික ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ථුලසි ඇවැත් වේ."

7. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත් වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස නො නැගී සිටි කල්හි නැවැත ඉතා වැඩි ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ථුලසි ඇවැත් වේ."

8. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස නො නැගී සිටි කල්හි නැවැත සමසම ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය.. උදෙසූවන්ට ථුලසි ඇවැත් වේ."

9. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස නො නැගී සිටි කල්හි නැවැත ඉතා ටික ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ථුලසි ඇවැත් වේ."

10. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

11. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

12. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

13. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති 'අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා' ති. තෙ 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස."

10. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කෙරෙත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවැත වැඩි ගණනක් අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ථුල්ලසි ඇවැත් වේ."

11. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවැත සමසම ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ථුල්ලසි-ඇවැත් වේ."

12. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කෙරෙත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවැත ඉතා ටික ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැළකල යුතු ය. උදෙසූවන්ට ථුල්ලසි ඇවැත් වේ."

13. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පාමොක් උදෙසිය යුතු ය. උදෙසූවන්ට ථුල්ලසි ඇවැත් වේ."

14. ‘‘ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ ති. තෙ ‘නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො’ ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස’’

15. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ ජානන්ති, ‘අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා’ ති. තෙ ‘නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො’ ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි උද්දිට්ඨමත්තෙ පාතිමොක්ඛෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. උද්දිට්ඨං සුඋද්දිට්ඨං. තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා. උද්දෙසකානං ආපත්ති ථුල්ලච්චයස්ස.’’

**භෙදපුරෙක්ඛාරපණ්ණරසකං නිට්ඨිතං.**

**පඤ්චවීසතිතිකා නිට්ඨිතා.**

---

14. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ වූ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත සමසම ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැලකල යුතු ය. උදෙසූවන්ට ථුලසි ඇවැත් වේ."

15. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. 'නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ' යි ඒ භික්ෂූහු දනිත්. ඒ භික්ෂූහු 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. පාමොක් උදෙසත්. ඔවුන් පාමොක් උදෙසූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවැත ඉතා ටික ගණනක් අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. උදෙසන ලද්ද මනා කොට උදෙසන ලද්දේ වේ. ඔවුන්ගේ සමීපයෙහි පාරිසුද්ධිය සැලකල යුතු ය. උදෙසූවන්ට ථුලසි ඇවැත් වේ."

**භෙදපුරෙක්ඛාරපණ්ණරසකය නිමි.**

**පඤ්චවීසතිතිකය* නිමි.**

---

* උපග්‍රන්ථය බලනු.

1. "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහුපොසථෙ සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති චත්තාරො වා අතිරෙකා වා. තෙ න ජානන්ති 'අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තො සීමං ඔක්කමන්තී' ති. -පෙ- තෙ න ජානන්ති 'අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තො සීමං ඔක්කන්තා' ති. -පෙ- තෙ න පස්සන්ති 'අඤ්ඤෙ ආවාසිකෙ භික්ඛූ අන්තො සීමං ඔක්කමන්තෙ' -පෙ- තෙ න පස්සන්ති 'අඤ්ඤෙ ආවාසිකෙ භික්ඛූ අන්තො සීමං ඔක්කන්තෙ' -පෙ- තෙ න සුණන්ති 'අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තො සීමං ඔක්කමන්තී ති. -පෙ- තෙ න සුණන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තො සීමං ඔක්කන්තා' ති. ආවාසිකෙන ආවාසිකා එකසතපඤ්චසත්තතිතිකා [1] නයතො. ආවාසිකෙන ආගන්තුකා ආගන්තුකෙන ආවාසිකා ආගන්තුකෙන ආගන්තුකා පෙය්‍යාලමුඛෙන සත්තතිකසතානි හොන්ති".

2. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං චාතුද්දසො හොති. ආගන්තුකානං, පණ්ණරසො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං අනුවත්තිතබ්බං".

3. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං පණ්ණරසො හොති. ආගන්තුකානං චාතුද්දසො සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං අනුවත්තිතබ්බං"

4. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං පාටිපදො හොති. ආගන්තුකානං පණ්ණරසො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං න අකාමා දාතබ්බා සාමග්ගී. ආගන්තුකෙහි නිස්සීමං ගන්ත්වා උපොසථො කාතබ්බො. සචෙ සමසමා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං න අකාමා දාතබ්බා සාමග්ගී. ආගන්තුකෙහි නිස්සීමං ගන්ත්වා උපොසථො කාතබ්බො. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං සාමග්ගී වා දාතබ්බා. නිස්සීමං වා ගන්තබ්බං."

5. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං පණ්ණරසො හොති. ආගන්තුකානං පාටිපදො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී වා දාතබ්බා. නිස්සීමං වා ගන්තබ්බං. සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී වා දාතබ්බා. නිස්සීමං වා ගන්තබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං න අකාමා දාතබ්බා සාමග්ගී. ආවාසිකෙහි නිස්සීමං ගන්ත්වා උපොසථො කාතබ්බො"

1. "පඤ්චසත්තතිතිකනයතො" ජ ම සං. P T S.

1. ''මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පොහොයෙහි සිවු නමක් හෝ **වැඩිගණනක් හෝ** බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු 'අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇතුල් සීමාවට පැමිණෙත්' යි නො දනිත්. -පෙ- ඒ භික්ෂූහු 'අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇතුල් සීමාවට පැමිණියාහු' යි නො දනිත්. -පෙ- ඒ භික්ෂූහු ඇතුල් සීමාවට පැමිණෙන්නා වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූන් නො දකිත්. -පෙ- ඒ භික්ෂූහු 'අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇතුල් සීමාවට පැමිණෙත්' යි නො අසත්. -පෙ- ඒ භික්ෂූහු 'අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇතුල් සීමාවට පැමිණියාහු' යි නො අසත්. ආවාසිකයන් හා ආවාසිකයෝ, ක්‍රම විසින් තික එක්සිය පන් සැත්තෑවකි.* ආවාසිකයන් හා ආගන්තුකයෝ, ආගන්තුකයන් හා ආවාසිකයෝ, ආගන්තුකයන් හා ආගන්තුකයෝ, පෙය්‍යාලමුඛයෙන් තික සත්සියයෙක් වේ''*

2. ''මහණෙනි, මෙහි ආවාසික භික්ෂූන්ට තුදුස්වක වේ. ආගන්තුක භික්ෂූන්ට පසළොස්වක වේ. ඉදින් ආවාසිකයෝ වැඩි වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. ඉදින් සමසම වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. ඉදින් ආගන්තුකයෝ වැඩි වෙත් නම්, ආවාසිකයන් ආගන්තුකයන්ට අනුව පැවතිය යුතු ය''

3. ''මහණෙනි, මෙහි ආවාසික භික්ෂූන්ට පසළොස්වක වේ. ආගන්තුක භික්ෂූන්ට තුදුස්වක වේ. ඉදින් ආවාසිකයෝ වැඩි වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. ඉදින් සමසම වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. ඉදින් ආගන්තුකයෝ වැඩි වෙත් නම්, ආවාසිකයන් ආගන්තුකයන්ට අනුව පැවතිය යුතු ය''.

4. ''මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූන්ට පැළවිය වේ. ආගන්තුකයන්ට පසළොස්වක වේ. ඉදින් ආවාසිකයෝ වැඩි වෙත් නම්, ආවාසිකයන් විසින් ආගන්තුකයන්ට නො කැමැත්තෙන් සාමග්‍රිය නො දිය යුතු ය. ආගන්තුකයන් විසින් සීමාවෙන් බැහැරට ගොස් පොහොය කළ යුතු ය. ඉදින් සමසම වෙත් නම්, ආවාසිකයන් විසින් ආගන්තුකයන්ට නො කැමැත්තෙන් සාමග්‍රිය නො දිය යුතු ය. ආගන්තුකයන් විසින් සීමාවෙන් බැහැරට ගොස් පොහොය කළ යුතු ය. ඉදින් ආගන්තුකයෝ වැඩි වෙත් නම්, ආවාසිකයන් විසින් ආගන්තුකයන්ට සාමග්‍රිය හෝ දිය යුතු ය සීමාවෙන් බැහැරට හෝ යා යුතු ය.''

5. ''මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූන්ට පසළොස්වක වේ. ආගන්තුකයන්ට පැළවිය වේ. ඉදින් ආවාසිකයෝ වැඩි වෙත් නම්, ආගන්තුකයන් විසින් ආවාසිකයන්ට සාමග්‍රිය හෝ දිය යුතු ය. සීමාවෙන් බැහැරට හෝ යා යුතු ය. ඉදින් සමසම වෙත් නම්, ආගන්තුකයන් විසින් ආවාසිකයන්ට සාමග්‍රිය හෝ දිය යුතු ය. සීමාවෙන් බැහැරට හෝ යා යුතු ය. ඉදින් ආගන්තුකයෝ වැඩි වෙත් නම්, ආගන්තුකයන් විසින් ආවාසිකයන්ට නො කැමැත්තෙන් සාමග්‍රිය නො දිය යුතු ය. ආවාසිකයන් විසින් සීමාවෙන් බැහැරට ගොස් පොහොය කළ යුතු ය.''

* උපග්‍රන්ථය බලනු.

6. "ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ පස්සන්ති ආවාසිකානං භික්ඛූනං ආවාසිකාකාරං ආවාසිකලිඞ්ගං ආවාසිකනිමිත්තං ආවාසිකුද්දෙසං සුපඤ්ඤත්තං මඤ්චපීඨං භිසිබිබ්බොහනං පානීයං පරිභොජනීයං සූපට්ඨිතං පරිවෙණං සුසම්මට්ඨං. පස්සිත්වා වෙමතිකා හොන්ති 'අත්ථි නු ඛො ආවාසිකා භික්ඛූ නත්ථි නු ඛො' ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා උපොසථං කරොන්ති අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස."

7. "ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ සුණන්ති ආවාසිකානං භික්ඛූනං ආවාසිකාකාරං ආවාසිකලිඞ්ගං ආවාසිකනිමිත්තං ආවාසිකුද්දෙසං චඞ්කමන්තානං පදසද්දං සජ්ඣායසද්දං උක්කාසිතසද්දං ඛිපිතසද්දං. සුත්වා වෙමතිකා හොන්ති 'අත්ථි නු ඛො ආවාසිකා භික්ඛූ නත්ථි නු ඛො?'ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති. භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස."

8. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ පස්සන්ති ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකාකාරං ආගන්තුකලිඞ්ගං ආගන්තුකනිමිත්තං ආගන්තුකුද්දෙසං අඤ්ඤාතකං පත්තං අඤ්ඤාතකං චීවරං අඤ්ඤාතකං නිසීදනං පාදානං ධොතං උදකනිස්සෙකං. පස්සිත්වා වෙමතිකා හොන්ති 'අත්ථි නු ඛො ආගන්තුකා භික්ඛූ නත්ථි නු ඛො''? ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස."

6. ''මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු ආවාසිකභික්ෂූන්ගේ ආවාසිකයන් වතින් සම්පූර්ණ ද අසම්පූර්ණ ද යනු හඳුන්වන ලකුණු (ආචාරසණ්ඨානය) ද, නො පෙණෙන ආවාසිකයන් හඳුන්වන ලකුණු ද, ආවාසිකයන් ඇතැ යි හඳුන්වන ලකුණු ද, ආවාසිකයන් හඳුන්වන පිරිකර දැකීම ද, මනා කොට පැණවූ ඇඳ පුටු ද, බිසි හා කන්වැසින් ද මනා කොට එළ වූ පැන් හා පරිභොග කට යුතු දිය ද, මනා කොට හැමදි පිරිවෙණ ද දකිත්. දැක 'ආවාසිකභික්ෂූහු ඇත් ද නැද්ද' යි විමති ඇත්තෝ වෙත්. විමති ඇත්තා වූ ඒ ආගන්තුකභික්ෂූහු (ආවාසිකභික්ෂූන්) නො සොයත්. නො සොයා පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. ථුලසි ඇවැත් වේ''

7. ''මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු ආවාසිකභික්ෂූන්ගේ ආචාරසණ්ඨානය ආවාසිකයන්, හඳුන්වන ලකුණු, ආවාසිකයන් ඇතැ යි හඳුන්වන ලකුණු, ආවාසිකයන් හඳුන්වන පිරිකර දැකීම, සක්මන් කරන්නවුන්ගේ පාහඬ, හැදෑරීමේ ගඬ, කැරීම්හඬ, කිවිසිලිහඬ, අසත්. අසා 'ආවාසික භික්ෂූහු ඇත් ද? නැත් දැ'? යි විමති ඇත්තෝ වෙත්. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු නො සොයත්. නො සොයා පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. ථුලසි ඇවැත් වේ''

8. ''මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූහු ආගන්තුකභික්ෂූන්ගේ ආගන්තුක ආකාරය, ආගන්තුක ලක්ෂණය, ආගන්තුක නිමිත්ත, ආගන්තුක උදෙදසය, නො හඳුනන පාත්‍රය, නො හඳුනන සිවුර, නො හඳුනන නිසීදනය, පා සේදූ තැන්, වැගුරුණු දිය, දකිත්. දැක 'ආගන්තුක භික්ෂූහු ඇත් ද? නැත් දැ?' යි විමති ඇත්තෝ වෙත්. විමති ඇත්තා වූ ඒ ආවාසික භික්ෂූහු (ආගන්තුක භික්ෂූන්) නො සොයත්. නො සොයා පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. ථුලසි ඇවැත් වේ''

9. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ සුණන්ති ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකාකාරං ආගන්තුකලිඞ්ගං ආගන්තුකනිමිත්තං ආගන්තුකුද්දෙසං ආගච්ඡන්තානං පදසද්දං උපාහනපප්ඵොටනසද්දං උක්කාසිතසද්දං ඛිපිතසද්දං. සුත්වා වෙමතිකා හොන්ති 'අත්ථි නු ඛො ආගන්තුකා භික්ඛූ නත්ථි නු ඛො'? ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති ආපත්ති දුක්කටස්ස. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා 'නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො' ති භෙදපුරෙක්ඛාරා උපොසථං කරොන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස."

10. "ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ පස්සන්ති ආවාසිකෙ භික්ඛූ නානාසංවාසකෙ. තෙ සමානසංවාසකදිට්ඨිං පටිලභන්ති. සමානසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා එකතො උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. අනාපත්ති.

11. "ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ පස්සන්ති ආවාසිකෙ භික්ඛූ සමානසංවාසකෙ. තෙ නානාසංවාසකදිට්ඨිං පටිලභන්ති. නානාසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති"

12. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ පස්සන්ති ආගන්තුකෙ භික්ඛූ නානාසංවාසකෙ. තෙ සමානසංවාසකදිට්ඨිං පටිලභන්ති. සමානසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා එකතො උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. අනාපත්ති."

13. "ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ පස්සන්ති ආගන්තුකෙ භික්ඛූ සමානසංවාසකෙ. තෙ නානාසංවාසකදිට්ඨිං පටිලභන්ති. නානාසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා පාටෙක්කං උපොසථං කරොන්ති. ආපත්ති දුක්කටස්ස. තෙ පුච්ඡන්ති පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා එකතො උපොසථං කරොන්ති. අනාපත්ති.

9. "මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූහු ආගන්තුකභික්ෂූන්ගේ ආගන්තුකආකාරය, ආගන්තුකලක්ෂණය, ආගන්තුකනිමිත්ත, ආගන්තුක-උද්දේසය, එන්නවුන්ගේ පාහඬ, වහන් ගසා දැමීමේ හඬ, කැරීම් හඬ, කිවිසිලි හඬ අසත්. අසා 'ආගන්තුකභික්ෂූහු ඇත් ද?, නැත් ද?' යි විමතී ඇත්තාහු වෙත්." විමති ඇත්තා වූ ඒ භික්ෂූහු (ආගන්තුක භික්ෂූන්) නො සොයත්. නො සොයා පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක 'මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් ද' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පොහොය කරත්. ථුලසි ඇවැත් වේ"

10. "මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු දෘෂ්ටිවශයෙන් නානා-සංවාසක වූ ආවාසික භික්ෂූන් දකිත්. ඒ ආගන්තුක භික්ෂූහු සමානසංවාසක-දෘෂ්ටිය ලබත්. සමානසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා (නානාසංවාසකභාවය) බැහැර නො කෙරෙත්. ඒ දෘෂ්ටිය බැහැර නො කොට එකතු ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර නො කෙරෙත්. බැහැර නො කොට වෙන් වෙන් ව පොහොය කරත්. ඇවැත් නො වේ"

11. "මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු සමානසංවාසක වූ ආවාසිකභික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු නානාසංවාසකදෘෂ්ටිය ලබත්. නානාසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර කෙරෙත්. බැහැර කොට වෙන් වෙන් ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර කරත්. බැහැර කොට එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ"

12. "මහණෙනි, මෙහි ආවාසික භික්ෂූහු නානාසංවාසක වූ ආගන්තුකභික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු සමානසංවාසකදෘෂ්ටිය ලබත්. සමානසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පොහොය කරත්. ඇවැත් නො වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර නො කෙරෙත්. බැහැර නො කොට එකතු ව පොහොය කරත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර නො කෙරෙත්. බැහැර නො කොට වෙන් වෙන් ව පොහොය කෙරෙත්. ඇවැත් නො වේ"

13. "මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූහු සමානසංවාසක වූ ආගන්තුක-භික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු නානාසංවාසකදෘෂ්ටිය ලබත්. නානාසංවාසක-දෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පොහොය කෙරෙත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර කෙරෙත්. බැහැර කොට වෙන් වෙන් ව පොහොය කෙරෙත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර කෙරෙත්. බැහැර කොට එකතු ව පොහොය කෙරෙත්. ඇවැත් නො වේ"

14 න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

15. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා අභික්ඛුකො අනාවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

16. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා අභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

17. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

18. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා අභික්ඛුකො අනාවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

19. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා අභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා

20. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

21. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා අභික්ඛුකො අනාවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

22. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා අභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

23 න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා සභික්ඛුකො ආවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

24. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා සභික්ඛුකො අනාවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

25. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

26. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො ආවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

14. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයා හැර අන්තරායයක් නැති ව නො යා යුතු ය.

15. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් රහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

16. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට හෝ අනාවාසයට සඞ්ඝයාගෙන් තොරව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

17. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

18. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් රහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

19. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට හෝ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

20. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

21. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් රහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

22. මහණෙනි, එදවස පොහොයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් රහිත වූ ආවාසයට හෝ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

23. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

24. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

25. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

26 මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය

27. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො අනාවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

28. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

29. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො ආවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

30. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අවාසා වා අනාවාසා වා සභික්ඛුකො අනාවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

31. න භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

32. ගන්තබ්බො භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා සභික්ඛුකො ආවාසො යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා, යං ජඤ්ඤා, සක්කොමි අජ්ජෙව ගන්තුන්ති.

33. ගන්තබ්බො භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා සභික්ඛුකො අනාවාසො -පෙ- සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා, යං ජඤ්ඤා, සක්කොමි අජ්ජෙව ගන්තුන්ති.

34. ගන්තබ්බො භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො ආවාසො -පෙ- සභික්ඛුකො අනාවාසො -පෙ- සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා, යං ජඤ්ඤා, සක්කොමි අජ්ජෙව ගන්තුන්ති.

35. ගන්තබ්බො භික්ඛවෙ, තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො ආවාසො -පෙ- සභික්ඛුකො අනාවාසො -පෙ- සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා, යං ජඤ්ඤා, සක්කොමි අජ්ජෙව ගන්තුන්ති.

27. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් සහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

28. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

29. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

30. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

31. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද, (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට සඞ්ඝයාගෙන් තොර ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

32. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක සමාන සංවාසක භික්ෂූහු වසන්නාහු ද, යම් තැනකට 'අද ම යන්නට හැක්කෙමි' යි, දන්නේ ද, භික්ෂූන් සහිත වූ ආවාසයෙන් එබඳු භික්ෂූන් සහිත වූ ආවාසයට යා යුතු ය.

33. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක සමානසංවාසක භික්ෂූහු වසන්නාහු ද, යම් තැනකට 'අද ම යන්නට හැක්කෙමි' යි දන්නේ ද, භික්ෂූන් සහිත වූ ආවාසයෙන් (එබඳු)භික්ෂූන් සහිත වූ අනාවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ යා යුතු ය.

34. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක සමානසංවාසක භික්ෂූහු වසන්නාහු ද, යම් තැනකට 'අද ම යන්නට හැක්කෙමි' යි දන්නේ ද, භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් (එබඳු) භික්ෂූන් සහිත වූ ආවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ අනාවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ යා යුතු ය.

35. මහණෙනි, එදවස පොහොයෙහි යම් තැනෙක සමානසංවාසක භික්ෂූහු වසන්නාහු ද, යම් තැනකට 'අද ම යන්නට හැක්කෙමි' යි දන්නේ ද, භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ (එබඳු) භික්ෂූන් සහිත වූ ආවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ අනාවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ යා යුතු ය.

36. න භික්ඛවෙ, භික්ඛුණියා නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

37. න සික්ඛමානාය -පෙ- න සාමණෙරස්ස -පෙ- න සාමණෙරියා -පෙ- න සික්ඛං [1] පච්චක්ඛාතකස්ස -පෙ- න අන්තිමවත්ථුං අජ්ඣාපන්නකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

38. න ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, යථා ධම්මො, කාරෙතබ්බො.

39. න ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකස්ස නිසින්නපරිසාය -පෙ- න පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, යථා ධම්මො, කාරෙතබ්බො.

40. න පණ්ඩකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

41. න ථෙය්‍යසංවාසකස්ස පෙ- න තිත්ථියපක්කන්තකස්ස -පෙ- න තිරච්ඡානගතස්ස -පෙ- න මාතුඝාතකස්ස -පෙ- න පිතුඝාතකස්ස -පෙ- න අරහන්තඝාතකස්ස -පෙ- න භික්ඛුණිදූසකස්ස -පෙ- න සංඝභෙදකස්ස -පෙ- න ලොහිතුප්පාදකස්ස -පෙ- න උභතොබ්‍යඤ්ජනකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

42. න භික්ඛවෙ, පාරිවාසිකපාරිසුද්ධිදානෙන උපොසථො කාතබ්බො අඤ්ඤත්‍ර අවුට්ඨිතාය පරිසාය.

43. න ච භික්ඛවෙ, අනුපොසථෙ උපොසථො කාතබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝසාමග්ගියාති.

**උපොසථක්ඛන්ධකො දුතියො.** [2]

**තතියකභාණවාරං.**

---

1. "සික්ඛා" ම ඡ සං. 2. "උපොසථක්ඛන්ධකං නිට්ඨිතං." සී මු.

36. මහණෙනි, මෙහෙණක හුන් පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ.

37. භික්මෙන්නියක -පෙ- නො උදෙසිය යුතු ය. හෙරණකු -පෙ- නො උදෙසිය යුතු ය. හෙරණියක -පෙ- නො උදෙසිය යුතු ය. ශික්‍ෂා අත්හළ එකකු -පෙ- නො උදෙසිය යුතු ය. අන්තිම්වස්තුවට පැමිණියකු හුන් පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ.

38. ඇවැත් නො දැක්මෙහි බැහැර වූ එකකු හුන් පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, ධර්‍මය (විනයනීති) යම්සේ ද, එසේ කරවිය යුතු ය.

39. ඇවැතට පිළියම් නො කිරීමෙහි බැහැර වූ එකකු හුන් පිරිසෙහි -පෙ- ලාමක මිසදිටු අත් නො හැරීමෙහි බැහැර වූවකු හුන් පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, ධර්‍මය (විනය නීති) පරිදි කරවිය යුතු ය.

40. පණ්ඩකයකු හුන් පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ.

41. පැවිද්ද සොරකම් කළහු -පෙ- තීර්‍ථකයන් කරා ගියකු -පෙ- තිරිසන් ගියකු -පෙ- මවු මැරූවකු -පෙ- පියා මැරූවකු -පෙ- රහතුන් මැරූවකු -පෙ- මෙහෙණන් දූෂණය කළහු -පෙ- සඞ්ඝභෙදකයකු -පෙ- ලොහිතුප්පාදකයකු -පෙ- උභතොබ්‍යඤ්ජනකයකු හුන් පිරිසෙහි පාමොක් නො උදෙසිය යුතු ය. යමෙක් උදෙසන්නේ නම්, දුකුලාඇවැත් වේ.

42. මහණෙනි, පිරිස නො නැගිටියොත් පාරිවාසිකපාරිසුද්ධිය දීමෙන් පොහොය නො කට යුතු ය.

43. මහණෙනි, සඞ්ඝසාමග්‍රිය හැර අනුපොසථයෙහි (චාතුද්දසී - පණ්ණරසී නො වන දිනෙක) පොහොය නො කට යුතු ය.

**දෙවන උපොසථක්ඛන්ධකය නිමි.**

**තෙවන බණවර ය.**

## ඉමම්හි ඛන්ධකෙ වත්ථූ ඡ අසීති:

තස්ස උද්දානං:-

1. තිත්ථියා බිම්බිසාරො ච සන්නිපතිතුං තුණ්හිකා,
ධම්මං රහො[1] පාතිමොක්ඛං දෙවසිකං තදා සකිං.

2. යථාපරිසා සාමග්ගං[2] සාමග්ගී මද්දකුච්ඡි ච,
සීමා මහතී නදියා අනු ද්වෙ ඛුද්දකානි ච.

3. නවා රාජගහෙ චෙව සීමා අවිප්පවාසනා,
සම්මන්නෙ පඨමං සීමං පච්ඡා සීමං සමූහනෙ

4. අසම්මතා ගාමසීමා නදියා සමුද්දෙ සරෙ,
උදකුක්ඛෙපො සම්භින්දන්ති තථෙවජ්ඣොත්ථරන්ති ච.

5. කති කම්මානි උද්දෙසො සවරා අසතීපි ච,
ධම්මං විනයං තජ්ජෙන්ති පුන විනයතජ්ජනා

6. චොදනා කතෙ ඔකාසෙ අධම්මපටික්කොසනා,
චතු පඤ්ච පරා ආවී සඤ්චිච්ච චෙපි වායමෙ

7. සඞ්ඝට්ටා අනජ්ඣිට්ඨා චොදනම්හි න ජානති[3],
සම්බහුලා න ජානන්ති සජ්ජුකං න ච ගච්ඡරෙ.

8. කතමී කීවතිකා දූරෙ ආරොචෙතුඤ්ච නස්සරි,
උක්ලාපං[4] ආසනං දීපො[5] දිසා අඤ්ඤො[6] බහුස්සුතො

9. සජ්ජුකං වස්සුපොසථො[7] සුද්ධිකම්මඤ්ච ඤාතකා,
ගග්ගො චතූ තයො ද්වෙකො ආපත්ති සභාගා සරි.

---

1. "ධම්මරහො" අ වි. ම නු ප.
2. යථාපරිසා සමග්ගං" ම ඡ සං. "යථාපරිසාය සමග්ගං" P T S. "යථාපරිසාය සාමග්ගා" ම නු ප. තො වි.
3. "ජායති" අ වි ඡ වි.
4. "උක්ලාපො" තො වි. ම නු ප.
5. "පදීපො" P T S.
6. "අඤ්ඤෙ" තො වි. ම නු ප.
7. "සජ්ජුවස්සුපොසථො" අ වි. ඡ පු. ම නු ප. "සජ්ජුවස්සුපොසථෙ" තො වි.

**මේ ඛන්ධකයෙහි වස්තු අසූ සයෙකි.**

එහි උද්දානය (වස්තු නාමාවලිය) මෙසේ යː-

1. තීර්ථකයන් **බිම්සර** රජ රැස් වීමට අනුදැනීම, නිහඬ ව හිඳීම, දහම් දෙසීමට අනුදැනීම, රහසිගත ව සිටීමේ දී උපන් පරිවිතර්කය, පාමොක් උදෙසීමට අනුදැනීම, දින පතා පාමොක් උදෙසීම තහනම් කිරීම, පක්ෂය කට වරක් පාමොක් උදෙසීමට නියම කිරීම.

2. පිරිස අනු ව පාමොක් උදෙසීම තහනම් කිරීම, සමග ව පාමොක් උදෙසීම, සමගි වන ආකාරය, මද්දකුච්ඡිය, සීමාසම්මතය, මහා සීමා සම්මතය තහනම් කිරීම, නදීපාරසීමා සම්මතය තහනම් කිරීම, එය අනුදැනීම, පිරිවෙණක් පාසා පාමොක් උදෙසීම තහනම් කිරීම, එක් සීමාවෙක උපොසථාගාර දෙකක් සම්මත නො කිරීම, කුඩා උපොසථාගාර මහත් කර ගැණීම.

3. නවකය, රජගහනුවර අවිප්පවාස සම්මුතිය අනුදැනීම, සීමා සම්මුතිය කරණ කල පළමු ව සමානසංවාස සීමාසම්මුතිය කොට පසු ව අවිප්පවාස සීමා සම්මුතිය කිරීම, සමූහනනය කරණ කල පළමු ව අවිප්පවාස-සීමාව උදුරා පසු ව සමානසංවාසසීමාව උද්ධරණය.

4. අසම්මත වූ ගාමසීමාව, නදියෙහි සමුද්‍රයෙහි ජාතස්සරයෙහි උදකොත්ක්ෂෙපසීමාව, සීමාවෙන් සීමාවක් මිශ්‍ර කොට සීමා සම්මුති තහනම, සීමාවෙන් සීමාව යටපත් කිරීම.

5. කෙතෙක් කම්, පාතිමොක්ඛුද්දෙසය, වැදිබිය, සැකෙවින් පාමොක් නො උදෙසීම, බණ දෙසීම, විනය පිළිවිසීම, තර්ජනය.

6. අවකාශ කළ කල්හි චෝදනා කිරීම, අධර්මකර්ම විරෝධය, දෘෂ්ටිය ප්‍රකාශ කිරීම, එකලා මහණහුගේ අධිෂ්ඨානය, දැන දැන පාමොක් නො ඇස්වීම, ව්‍යායාමය.

7. ගිහියන් සිටි පිරිසෙහි පාමොක් නොඋදෙසීම, ඇරයුම් නැති ව පාමොක් උදෙසීම, **චෝදනාවස්තුයෙහි** විසූ තෙරනමක් උපොසථාදිය නො දැනීම, බොහෝ භික්ෂූන් උපොසථාදිය නොදැනීම, එකෙණෙහි එක් භික්ෂු-නමකට අණ කිරීම, නවකයන් නොයෑම.

8. කිනම් දිනයක් දැ යි පිළිවිසීම, ගණන විචාරීම, දුර යන කල්හි සැළකිරීම අමතක වීම, පොහෝගෙය කසළ සහිත වීම, අසුන් නො පැණවීම, පහන් නො දැල්වීම, දිශා යන කල ඇදුරන් නො පිළිවිසීම, අන්‍ය බහුශ්‍රැත භික්ෂුනමකගේ පැමිණීම.

9. සමීප ආවාසයකට එක් නමක් යැවීම, වස් විසූ පැවිද්දන් පොහොය කිරීම, පාරිශුද්ධිය ගෙණ පොහොය කිරීම, ඡන්දය ගෙණ කර්ම කිරීම, නෑයන් භික්ෂුහු අල්ලා ගත් කල කර්ම කිරීම, **ගර්ග** භික්ෂුනම, සිවුනමට පාමොක් උදෙසීම, තුන් නම ඥප්තිය තබා පාරිසුද්ධිඋපොසථය කිරීම, දෙනම පිළිබඳ පාරිසුද්ධිඋපොසථය, එක් නම පිළිබඳ අධිට්ඨානඋපොසථය, ආපත්තියට පැමිණීම, සභාගාපත්තින් දෙසීම හා පිළිගැණීම, ඇවැත් සිහි කිරීම.

10. සබ්බා සඞ්ඝා වෙමතිකො න ජානන්ති [1] බහුස්සුතො,
බහූ සමසමා ථොකා පරිසා අවුට්ඨිතාය ච [2]

11. එකච්චා වුට්ඨිතා සබ්බා ජානන්ති ච වෙමතිකා,
කප්පතෙවාති කුක්කුච්චා ජානං පස්සං සුණන්ති ච.

12. ආවාසිකෙන ආගන්තු චාතුපණ්ණරසො පුන,
පාටිපදෙ පණ්ණරසො ලිඞ්ගසංවාසකා [3] උභො.

13. පාරිවාසානුපොසථො [4] අඤ්ඤත්‍ර සඞ්ඝසාමග්ගියා,
එතෙ විභත්තා උද්දානා වත්ථු විභූතකාරණාති.

---

1. "න ජානාති" ජ වි. තො වි. ම නු ප.
2. "පරිසායාවුට්ඨිතාය ච" අ වි.
,, පරිසාය අවුට්ඨිතාච P T S ජ වි. ම නු ප.
,, "පරිසාය අවුට්ඨිතා" තො වි.
3. "ලිඞ්ගංසංවාසකා" අ වි. ජ වි. තො වි. ම නු ප.
4. "පාරිවසානුපොසථො" අ වි ජ වි. තො වි. ම නු ප.

10. සියලු සඞ්ඝයාගේ සහාය ඇවැතෙහි විමතිය, නො දැනීම, බහුශ්‍රැත භික්ෂුනමකගේ වචනය පරිදි ඇවැතට පිළියම් කිරීම, බොහෝ භික්ෂූන්ගේ පැමිණීම, ගණනින් සමාන භික්ෂු පිරිසක් පැමිණීම, ටික පිරිසක් පැමිණීම, පිරිස නො නැගිටි කල්හි පැමිණීම.

11. කොටසක් නැගී සිටි කල පැමිණීම, සියලු පිරිස නැගී සිටි කල පැමිණීම, වර්ගීය යි දන පොහොය කිරීම, වෙමතික ව පොහොය කිරීම, කැප ද නො කැප දැ යි කුකුස් කිරීම, තවත් භික්ෂූන් ඇතැ යි දන කිරීම, දැක කිරීම, අසා කිරීම.

12. ආවාසිකයන් හා ආගන්තුකයෝ, ආවාසිකයන්ට චාතුද්දසිය, ආගන්තුකයන්ට පණ්ණරසිය, ආවාසිකයන්ට පණ්ණරසිය, ආගන්තුකයන්ට චාතුද්දසිය, ආවාසිකයන්ට පණ්ණරසිය, ආගන්තුකයන්ට පැළවිය, ආවාසිකයන්ට පැළවිය, ආගන්තුකයන්ට පණ්ණරසිය, ආවාසිකලිඞ්ගාදිය, නානාසංවාසක, සමානසංවාසක යන උභයසංවාසකයෝ.

13. පාරිවාසිකපාරිසුද්ධිඋපොසථය, සඞ්ඝසාමග්ගිය හැර නො පොහෝ දිනයෙහි පොහොය නො කිරීම - යන වස්තු ප්‍රකාශ කිරීමට කරුණු වූ මේ උද්දානයෝ බෙදනු ලදහ

---

# වස්සූපනායිකක්ඛන්ධකං.

---

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ** කලන්දකනිවාපෙ.

2. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං වස්සාවාසො අප්පඤ්ඤත්තො හොති.

3. තෙධ [1] භික්ඛූ හෙමන්තම්පි ගිම්හම්පි වස්සම්පි චාරිකං චරන්ති.

4. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා හෙමන්තම්පි ගිම්හම්පි වස්සම්පි චාරිකං චරිස්සන්ති, හරිතානි තිණානි සම්මද්දන්තා, එකින්ද්‍රියං ජීවං විහෙඨෙන්තා, බහූ ඛුද්දකෙ පාණෙ සඞ්ඝාතං ආපාදෙන්තා? ඉමෙ හි නාම අඤ්ඤතිත්ථියා දුරක්ඛාතධම්මා වස්සාවාසං අල්ලීයිස්සන්ති. සඞ්කාසයිස්සන්ති. [2] ඉමෙ හි නාම සකුන්තකා රුක්ඛග්ගෙසු කුලාවකානි කරිත්වා වස්සාවාසං අල්ලීයිස්සන්ති. සඞ්කාසයිස්සන්ති. ඉමෙ හි පන සමණා සක්‍යපුත්තියා හෙමන්තම්පි ගිම්හම්පි වස්සම්පි චාරිකං චරන්ති, හරිතානි තිණානි සම්මද්දන්තා, එකින්ද්‍රියං ජීවං විහෙඨෙන්තා, බහූ ඛුද්දකෙ පාණෙ සඞ්ඝාතං ආපාදෙන්තා" ති.

5. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

6. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

7. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, වස්සං උපගන්තු" න්ති.

8. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කදා නු ඛො වස්සං උපගන්තබ්බ"න්ති.

9. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ, වස්සානෙ වස්සං උපගන්තු" න්ති.

10. අථ ඛො භික්ඛූනං එතදහොසි "කති නු ඛො [3] වස්සූපනායිකා" ති.

11. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ද්වෙමා භික්ඛවෙ, වස්සූපනායිකා: පුරිමිකා. පච්ඡිමිකා ච. [4] අපරජ්ජුගතාය ආසාළ්හියා පුරිමිකා උපගන්තබ්බා. මාසගතාය ආසාළ්හියා පච්ඡිමිකා උපගන්තබ්බා. ඉමා ඛො භික්ඛවෙ, ද්වෙ වස්සූපනායිකා" ති.

12. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ වස්සං උපගන්ත්වා අන්තරාවස්සං චාරිකං චරන්ති.

---

1. "තෙ ඉධ" ම ඡ සං. 2. "සඞ්කස'යිස්සන්ති" ම ඡ සං. සඞ්කාපයිස්සන්ති. P T S.
3. "කිතානුඛො" කොසුචි P T S. ඡ වි. තො වි ම නු ප.
4. "පච්ඡිමිකාති" ම ඡ සං. P T S.

# වස්සූපනායිකක්ඛන්ධකය.

1. එකල්හි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ **රජගහනුවර** ලෙහෙනුන්ට බොජුන් දුන් බිම වූ **වේළුවනාරාමයෙහි** වැඩ වාසය කරණ සේක.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට වස් විසීම නො පණවන ලද්දේ වේ.

3. එකල්හි ඒ භික්ෂූහු හෙමන්තයෙහි ද ගිම්හානයෙහි ද වස්සානයෙහි ද සැරිසරත්.

4. මිනිස්සු "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ හෙමන්තයෙහි ද ගිම්හානයෙහි ද වස්සානයෙහි ද නිල් තණ මඩිමින් (පාගමින්) එකින්ද්‍රිය ජීව පෙළමින් බොහෝ කුඩා සතුන් විනාශයට පමුණුවමින් චාරිකා කරත්-ද? මේ අන්‍යතීර්ථකපරිව්‍රාජකයෝ වැරැදි සේ කියූ දහම් ඇත්තාහු ද වස් විසීමෙහි ඇලෙත් උත්සාහ රහිත ව නිතර එක තැන වසන්නාහු ය. මේ කුරුල්ලෝ ද ගස් මුදුන්හි කූඩු සාදා, ගෙණ වැසිකාලයෙහි (ඒ කූඩුවල) ඇලී වසන්නෝ ය. (ගොදුරු සෙවීමෙහි) උත්සාහ නැති ව නිතර එක තැන වසන්නෝ ය. මේ ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ හෙමන්තයෙහි ද ගිම්හානයෙහි ද වස්සානයෙහි ද නිල් තණ මඩිමින් එකින්ද්‍රියජීව පෙළමින් බොහෝ කුඩා සතුන් විනාශයට පමුණුවමින් චාරිකා කරත්" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

5. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දොස් කියන ඒ මිනිසුන්ගේ බස් ඇසූහ.

6. එවිට භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

7. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, මම වස් එළඹෙන්නට අනුදනිමි" යි භික්ෂූන් ඇමතූසේක.

8. එකල්හි භික්ෂූන්ට "කවදා වස් එළඹිය යුතු දැ?" යි සිත් වි ය.

9. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වස්සාන ඍතුවෙහි වස් එළඹෙන්නට අනුදනිමි" යි.

10. එකල්හි "වස් එළඹීම් කෙතෙක් දැ?" යි භික්ෂූන්ට සිත් වි ය.

11. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පෙරවස් එළඹීම පසුවස් එළඹීම යැ යි මේ වස් එළඹීම් දෙකෙකි. ඇසළ පුණු පොහොය අනික් දිනට ගිය කල්හි ඇසළ පුණු පොහෝදිනයෙන් පසුදිනයෙහි - අවපෑලවියෙහි - පෙරවස් එළඹිය යුතු ය, ඇසළ පුණුපොහොයෙන් මසක් ඉක්ම ගිය කල්හි පසුවස් එළඹිය යුතු ය. මහණෙනි, මේ වස් එළඹීම් දෙක" යි.

12. එකල්හි සවග මහණෝ වස් එළඹ වස් තුළ චාරිකාව කරත්.

13. මනුස්සා තථෙව උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා හෙමන්තම්පි ගිම්හම්පි වස්සම්පි චාරිකං චරිස්සන්ති, හරිතානි තිණානි සම්මද්දන්තා, එකින්ද්‍රියං ජීවං විහෙඨෙන්තා, බහූ ඛුද්දකෙ පාණෙ සඞ්ඝාතං ආපාදෙන්තා? ඉමෙ හි නාම අඤ්ඤතිත්ථියා දුරක්ඛාතධම්මා වස්සාවාසං අල්ලීයිස්සන්ති, සඞ්කාසයිස්සන්ති. ඉමෙ හි නාම සකුන්තකා රුක්ඛග්ගෙසු කුලාවකානි කරිත්වා වස්සාවාසං අල්ලීයිස්සන්ති, සඞ්කාසයිස්සන්ති. ඉමෙ පන සමණා සක්‍යපුත්තියා හෙමන්තම්පි ගිම්හම්පි වස්සම්පි චාරිකං චරන්ති හරිතානි තිණානි සම්මද්දන්තා, එකින්ද්‍රියං ජීවං විහෙඨෙන්තා, බහූ ඛුද්දකෙ පාණෙ සංඝාතං ආපාදෙන්තා" ති.

14. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ වස්සං උපගන්ත්වා අන්තරාවස්සං චාරිකං චරිස්සන්ති?" ති.

15. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං අරොචෙසුං

16. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, වස්සං උපගන්ත්වා පුරිමං වා තෙමාසං පච්ඡිමං වා තෙමාසං අවසිත්වා චාරිකා පක්කමිතබ්බා. යො පක්කමෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

17. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ න ඉච්ඡන්ති වස්සං උපගන්තුං.

18. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, වස්සං න උපගන්තබ්බං, යො න උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

19 තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තදහු වස්සූපනායිකාය වස්සං අනුපගන්තුකාමා සඤ්චිච්ච ආවාසං අතික්කමන්ති.

20. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, තදහු වස්සූපනායිකාය වස්සං අනුපගන්තුකාමෙන සඤ්චිච්ච ආවාසො අතික්කමිතබ්බො. යො අතික්කමෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

21. තෙන ඛො පන සමයෙන රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** වස්සං උක්කඩ්ඪිතුකාමො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: "යදි පනය්‍යා ආගමෙ ජුණ්හෙ වස්සං උපගච්ඡෙය්‍යු" න්ති.

22. භගවතො එතමත්ථං අරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, රාජූනං අනුවත්තිතු" න්ති.

23. අථ ඛො භගවා **රාජගහෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **සාවත්ථි**, තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි, තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

Free Distribution www.aathaapi.org

13. මිනිස්සු පෙර මෙන් "ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ හෙමන්තයෙහි ද ගිම්හානයෙහි ද වස්සානයෙහි ද නිල් තණ මඩිමින් එකින්ද්‍රියජීව පෙළමින් බොහෝ කුඩා සතුන් විනාශයට පමුණුවමින් කෙසේ නම් චාරිකාවෙහි හැසිරෙත් ද ? මේ අන්‍යතීර්ථකයෝ වැරදි සේ කියූ ධර්ම ඇත්තාහු වස් විසීමෙහි ඇලෙන්නාහු ය. උත්සාහ රහිත ව නිතර එක තැන වසන්නාහු ය. මේ කුරුල්ලෝ ගස් මුදුන්හි කුඩු සාදා ගෙණ වැසිකාලයෙහි (කුඩුවල) ඇලී වසන්නාහු ය. (ගොදුරු සෙවීමෙහි) උත්සාහ නැති ව නිතර එක තැන වසන්නාහු ය. මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ හෙමන්තයෙහි ද ගිම්හානයෙහි ද වස්සානයෙහි ද නිල් තණ මඩිමින් එකින්ද්‍රියජීව පෙළමින් බොහෝ කුඩා සතුන් විනාශයට පමුණුවමින් චාරිකාව කෙරෙත්" යි අවමන් කෙරෙත්, නින්‍දා කෙරෙත්, දොස් කියත්.

14. භික්ෂූහු අවමන් කරණ, අගුණ පතුරුවන, දොස් කියන ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් ඒ අාශාරහිත භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු "ෂඩ්වර්ගික මහණෝ කෙසේ නම් වස් එළඹ වස තුළ චාරිකාව කරත් දැයි ද?" යි අවමන් කෙරෙත්. නින්‍දා කෙරෙත්. දොස් කියත්.

15. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ වග සැළකළහ.

16. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, වස් එළඹ පළමු තෙමස හෝ පසු තෙමස හෝ නො වැස චාරිකා නො කට යුතු ය. යමෙක් චාරිකා කරන්නේ නම්, දුකුළා ඇවැත් වේ යැ" යි භික්ෂූන් අමතා වදාළසේක.

17. එකල්හි ෂඩ්වර්ගික මහණෝ වස් එළඹෙන්නට නො කැමැති වෙති.

18. භාග්‍යවතුන් වහන්සේට මේ වග සැළකළහ. "මහණෙනි, වස් නො එළඹිය යුතු නො වේ. යමෙක් වස් නො එළඹෙන්නේ නම්, දුකුළා ඇවැත් වේ"

19. එකල්හි ෂඩ්වර්ගික මහණෝ එදවස වස් එළඹෙන දිනයෙහි වස් නො එළඹෙනු කැමැත්තෝ දැන දැන ආවාසය ඉක්මවා යෙත්.

20. භාග්‍යවතුන් වහන්සේට මේ වග සැළකළහ. "මහණෙනි, එදවස වස් එළඹෙන දිනයෙහි වස් නො එළඹෙනු කැමැත්තහු විසින් දැන දැන ආවාසය නො ඉක්මවිය යුතු ය. යමෙක් ඉක්මවන්නේ නම්, දුකුළා-ඇවැත් වේ"

21. එකල්හි මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ වස් මුලට අදිනු කැමැත්තේ "ආර්‍ය්‍යයෝ ලබන පුර පසළොස්වක් තිථියෙහි වස් එළඹෙන්නාහු නම් යෙහෙකැ" යි භික්ෂූන් වෙතට දූතයකු යැවී ය.

22. භාග්‍යවතුන් වහන්සේට මේ වග සැළකළහ. "මහණෙනි, රජුන්ට එකඟ ව පවතින්නට අනුදනිමි" යි. වදාළසේක.

23. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කැමැති තාක් වාසය කොට සැවැත්නුවර සැරි සරා වැඩි සේක. පිළිවෙළින් සැරි සරණ සේක් සැවැත් නුවරට පැමිණියාහ. භාග්‍යවතුන් වහන්සේ එහි සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරණ සේක.

24. තෙන ඛො පන සමයෙන **කොසලෙසු** ජනපදෙසු **උදෙනෙන** උපාසකෙන සඞ්ඝං උද්දිස්ස විහාරො කාරාපිතො හොති.

25. සො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: “ආගච්ඡන්තු භදන්තා, ඉච්ඡාමි දානං ච දාතුං, ධම්මං ච සොතුං, භික්ඛූ ච පස්සිතු” න්ති.

26. භික්ඛූ එවමාහංසු: “භගවතා ආවුසො, පඤ්ඤත්තං න වස්සං උපගන්ත්වා පුරිමං වා තෙමාසං පච්ඡිමං වා තෙමාසං අවසිත්වා චාරිකා පක්කමිතබ්බාති. ආගමෙතු උදෙනො උපාසකො යාව භික්ඛූ වස්සං වසන්ති. වස්සං වුත්ථා ආගමිස්සන්ති. සචෙ පනස්ස අච්චායිකං කරණීයං, තත්ථෙව ආවාසිකානං භික්ඛූනං සන්තිකෙ විහාරං පතිට්ඨාපෙතූ” ති.

27. උදෙනො උපාසකො උජ්ඣායති, ඛීයති, විපාචෙති: “කථං හි නාම භදන්තා මයා පහිතෙ න ආගමිස්සන්ති.[1] අහං හි දායකො කාරකො සංඝුපට්ඨාකො” ති.

28. අස්සොසුං ඛො භික්ඛූ උදෙනස්ස උපාසකස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස.

29. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “අනුජානාමි භික්ඛවෙ, සත්තන්නං සත්තාහකරණීයෙන පහිතෙ ගන්තුං, න ත්වෙව අප්පහිතෙ – භික්ඛුස්ස භික්ඛුණියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා උපාසකස්ස උපාසිකාය. අනුජානාමි භික්ඛවෙ, ඉමෙසං සත්තන්නං සත්තාහකරණීයෙන පහිතෙ ගන්තුං. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

30. “ඉධ පන භික්ඛවෙ උපාසකෙන සඞ්ඝං උද්දිස්ස විහාරො කාරාපිතො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය ‘ආගච්ඡන්තු භදන්තා, ඉච්ඡාමි දානං ච දාතුං, ධම්මං ච සොතුං, භික්ඛූ ච පස්සිතු” න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ, සත්තාහං සන්නිවත්තො කාතබ්බො”

1. “ආගච්ඡිස්සන්ති” ම ඡ සං. P T S.

24. එකල්හි **කොසොල්** දනව්වෙහි **උදෙන** නම් උපාසකයා විසින් සඞ්ඝයා උදෙසා විහාරයෙක් කරවන ලද්දේ වේ.

25. හෙ තෙමේ “පින්වතුන් වහන්සේ වඩින සේක්වා, මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි” යි භික්ෂූන් වෙතට දූතයකු යැවී ය.

26. භික්ෂූහු, “ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් වස් එළඹ පළමු තෙමස හෝ පසු තෙමස හෝ නො වැස චාරිකා නො කට යුතු ය යි පණවන ලද්දේ ය, (එහෙයින්) උදෙන උපාසක තෙමේ යම් තාක් භික්ෂූහු වස් වෙසෙත් ද, ඒ තාක් බලාපොරොත්තු වේවා. වස් පැවරූවෝ (වස් වැස පවරා නිමවූවෝ) එන්නාහ. යම් ලෙසකින් ඉක්මනින් කළ යුතු කටයුත්තෙක් වන්නේ නම්, එහි ම ආවාසික භික්ෂූන්ගේ වෙත විහාරය පිහිටුවාවා” යි කීහ.

27. උදෙන උපාසක තෙමේ “පින්වතුන් වහන්සේ මා පණිවිඩ එවූ කල්හි කෙසේ නම් **නො එත් ද?** මම දායකයෙක් වෙමි. කටයුතු කරන්නෙක් වෙමි. සඞ්ඝොපස්ථායකයෙක් වෙමි” යි අවමන් කරයි. නින්දා කරයි. දොස් කියයි.

28. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දොස් කියන උදෙන උපාසකයාගේ කතාව ඇසූහ.

29. එකල්හි භික්ෂූහු මේ වග භාග්‍යවතුන් වහන්සේට සැළකළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට “මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත් දෙනකුන් වෙතට සත්තාහකරණීයයෙන් යන්නටත් පණිවිඩ නො එවූ කල්හි නො යන්නටත් අනුදනිමි. මහණෙනි, මහණ මෙහෙණ භික්මෙන්නිය හෙරණ හෙරණි උපාසක උපාසිකා යන මේ සත් දෙනා වෙතට පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යන්නටත් පණිවිඩ නො එවූ කල්හි නො යන්නටත් අනුදනිමි. සතියෙන් ආ පසු ඊම කට යුතු ය”

30. “මහණෙනි, මෙහි උපාසකයකු විසින් සඞ්ඝයා උදෙසා විහාරයෙක් කරවන ලද්දේ වේ. හෙ තෙමේ ඉදින් ‘පින්වතුන් වහන්සේලා වඩින සේක්වා, මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි’ යි භික්ෂූන් වෙතට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය, සතියෙන් ආපසු ඊම කළ යුතු ය.”

31. "ඉධ පන භික්ඛවෙ, උපාසකෙන සඞ්ඝං උද්දිස්ස අඩ්ඪයොගො කාරාපිතො හොති -පෙ- පාසාදො කාරාපිතො හොති -පෙ- හම්මියං කාරාපිතං හොති -පෙ- ගුහා කාරාපිතා හොති -පෙ- පරිවෙණං කාරාපිතං හොති -පෙ- කොට්ඨකො කාරාපිතො හොති -පෙ- උපට්ඨානසාලා කාරාපිතා හොති -පෙ- අග්ගිසාලා කාරාපිතා හොති -පෙ- කප්පියකුටි කාරාපිතා හොති -පෙ- වච්චකුටි කාරාපිතා හොති -පෙ- චඞ්කමො කාරාපිතො හොති -පෙ- චඞ්කමනසාලා කාරාපිතා හොති -පෙ- උදපානො කාරාපිතො හොති -පෙ- උදපානසාලා කාරාපිතා හොති -පෙ- ජන්තාඝරං කාරාපිතං හොති -පෙ- ජන්තාඝරසාලා කාරාපිතා හොති -පෙ- පොක්ඛරණී කාරාපිතා හොති -පෙ- මණ්ඩපො කාරාපිතො හොති. -පෙ- ආරාමො කාරාපිතො හොති -පෙ- ආරාමවත්ථු කාරාපිතං හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය, 'ආගච්ඡන්තු භදන්තා, ඉච්ඡාමි දානං ච දාතුං ධම්මං ච සොතුං භික්ඛූ ච පස්සිතු' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.

32. "ඉධ පන භික්ඛවෙ, උපාසකෙන සම්බහුලෙ භික්ඛූ උද්දිස්ස -පෙ- එකං භික්ඛුං උද්දිස්ස විහාරො කාරාපිතො හොති. අඩ්ඪයොගො කාරාපිතො හොති. පාසාදො කාරාපිතො හොති. හම්මියං කාරාපිතං හොති. ගුහා කාරාපිතා හොති. පරිවෙණං කාරාපිතං හොති. කොට්ඨකො කාරාපිතො හොති. උපට්ඨානසාලා කාරාපිතා හොති. අග්ගිසාලා කාරාපිතා හොති. කප්පියකුටි කාරාපිතා හොති. වච්චකුටි කාරාපිතා හොති. චඞ්කමො කාරාපිතො හොති. චඞ්කමනසාලා කාරාපිතා හොති. උදපානො කාරාපිතො හොති. උදපානසාලා කාරාපිතා හොති. ජන්තාඝරං කාරාපිතං හොති. ජන්තාඝරසාලා කාරාපිතා හොති. පොක්ඛරණී කාරාපිතා හොති. මණ්ඩපො කාරාපිතො හොති. ආරාමො කාරාපිතො හොති. ආරාමවත්ථු කාරපිතං හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය 'ආගච්ඡන්තු භදන්තා, ඉච්ඡාමි දානං ච දාතුං ධම්මඤ්ච සොතුං භික්ඛූ ච පස්සිතු' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

33. "ඉධ පන භික්ඛවෙ, උපාසකෙන භික්ඛුණීසඞ්ඝං උද්දිස්ස -පෙ- සම්බහුලා භික්ඛුණියො උද්දිස්ස -පෙ- එකං භික්ඛුණිං උද්දිස්ස -පෙ- සම්බහුලා සික්ඛමානායො උද්දිස්ස -පෙ- එකං සික්ඛමානං උද්දිස්ස -පෙ සම්බහුලෙ සාමණෙරෙ උද්දිස්ස -පෙ- එකං සාමණෙරං උද්දිස්ස -පෙ- සම්බහුලා සාමණෙරියො උද්දිස්ස -පෙ- එකං සාමණෙරිං උද්දිස්ස -පෙ- විහාරො කාරාපිතො හොති. අඩ්ඪයොගො කාරාපිතො හොති. පාසාදො කාරාපිතො හොති. හම්මියං කාරාපිතං හොති. ගුහා කාරාපිතා හොති. පරිවෙණං කාරාපිතං හොති. කොට්ඨකො කාරාපිතො හොති. උපට්ඨානසාලා කාරාපිතා හොති. අග්ගිසාලා කාරාපිතා හොති. කප්පියකුටි කාරාපිතා හොති. චඞ්කමො කාරාපිතො හොති, චඞ්කමනසාලා කාරාපිතා හොති. උදපානො කාරාපිතො හොති. උදපානසාලා කාරාපිතා හොති. පොක්ඛරණී කාරාපිතා හොති. මණ්ඩපො කාරාපිතො හොති. ආරාමො කාරාපිතො හොති. ආරාමවත්ථු කාරාපිතං හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'ආගච්ඡන්තු භදන්තා. ඉච්ඡාමි දානං ච දාතුං ධම්මං ච සොතුං භික්ඛූ ච පස්සිතු' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ: සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

31. "මහණෙනි, මෙහි උපාසකයකු විසින් සඞ්ඝයා උදෙසා ගුරුළු පියාපත් වැනි සෙවෙනි ඇති ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- සිවුරුස් ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- ගුහාවක් කරවන ලද්දේ වේ. -පෙ- පිරිවෙණක් කරවන ලද්දේ වේ. -පෙ- කොටු ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- උපස්ථාන ශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- අග්නි ශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- කැප කිළියක් කරවන ලද්දේ වේ. -පෙ- වැසි කිළියක් කරවන ලද්දේ වේ. -පෙ- සක්මනක් කරවන ලද්දේ වේ. -පෙ- චඞ්ක්‍රමණශාලාවක් කරවන ලද්දේ වේ. -පෙ- ලිඳක් කරවන ලද්දේ වේ. -පෙ- ළිඳ් හලක් කරවන ලද්දේ වේ. -පෙ- ජන්තාඝරයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ජන්තාඝර ශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- පොකුණක් කරවන ලද්දේ වේ. -පෙ- මණ්ඩපයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ආරාමයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ආරාම වත්තක් කරවන ලද්දේ වේ. හෙ තෙමේ 'පින්වතුන් වහන්සේලා වඩිත සේක්වා. මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි' යි භික්ෂූන් වෙත දූතයකු එවන්නේ නම් මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියකින් ආපසු ඊම කළ යුතු ය."

32. "මහණෙනි, මෙහි උපාසකයකු විසින් බොහෝ භික්ෂූන් උදෙසා -පෙ-එක් භික්ෂුවක් උදෙසා විහාරයෙක් කරවන ලද්දේ වේ. අඩසෙවෙනි ඇති ගෙයක් කරවන ලද්දේ වේ. සිවුරුස් ගෙයක් කරවන ලද්දේ වේ. සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. ගුහාවක් කරවන ලද්දේ වේ. පිරිවෙණක් කරවන ලද්දේ වේ. කොටුගෙයක් කරවන ලද්දේ වේ. උපස්ථානශාලාවක් කරවන ලද්දී වේ. අග්නිශාලාවක් කරවන ලද්දී වේ. කැප කිළියක් කරවන ලද්දේ වේ. වැසිකිළියක් කරවන ලද්දේ වේ. සක්මනක් කරවන ලද්දේ වේ. චඞ්ක්‍රමණශාලාවක් කරවන ලද්දේ වේ. ළිඳ් හලක් කරවන ලද්දේ වේ. ජන්තාඝරයෙක් කරවන ලද්දේ වේ. ජන්තාඝර ශාලාවක් කරවන ලද්දී වේ. පොකුණක් කරවන ලද්දේ වේ. මණ්ඩපයෙක් කරවන ලද්දේ වේ. ආරාමයෙක් කරවන ලද්දේ වේ. ආරාම වත්තක් කරවන ලද්දේ වේ. හෙ තෙමේ 'පින්වතුන් වහන්සේලා වඩිත සේක්වා. මම දන් දෙන්නට බණ අසන්නට භික්ෂූන් දකින්නට කැමැත්තෙමි' යි භික්ෂූන් වෙතට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් ආ පසු ඊම කළ යුතු ය."

33. "මහණෙනි, මෙහි උපාසකයකු විසින් මෙහෙණි සඟ උදෙසා -පෙ- බොහෝ මෙහෙණින් උදෙසා -පෙ- එක් මෙහෙණක උදෙසා -පෙ- බොහෝ භික්මෙන්නියන් උදෙසා -පෙ- එක් භික්මෙන්නියක උදෙසා -පෙ- බොහෝ හෙරණුන් උදෙසා -පෙ- එක් හෙරණකු උදෙසා -පෙ- බොහෝ සාමණෙරීන් උදෙසා -පෙ- එක් සාමණෙරියක උදෙසා විහාරයෙක් කරවන ලද්දේ වේ. අඩ සෙවෙනි ඇති ගෙයක් කරවන ලද්දේ වේ. සිවුරුස් ගෙයක් කරවන ලද්දේ වේ. සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. ගුහාවක් කරවන ලද්දේ වේ. පිරිවෙණක් කරවන ලද්දේ වේ. කොටුගෙයක් කරවන ලද්දේ වේ. උපස්ථානශාලාවක් කරවන ලද්දේ වේ අග්නිශාලාවක් කරවන ලද්දී වේ. කැප කිළියක් කරවන ලද්දේ වේ. සක්මනක් කරවන ලද්දී වේ. චඞ්ක්‍රමණ ශාලාවක් කරවන ලද්දී වේ. ලිඳක් කරවන ලද්දේ වේ. ළිඳ් හලක් කරවන ලද්දේ වේ. පොකුණක් කරවන ලද්දේ වේ. මණ්ඩපයෙක් කරවන ලද්දී වේ. ආරාමයෙක් කරවන ලද්දේ වේ. ආරාම වත්තක් කරවන ලද්දේ වේ. හෙ තෙමේ 'පින්වතුන් වහන්සේලා වඩිත සේක්වා මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි' යි භික්ෂූන් වෙතට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් ආපසු ඊම කළ යුතු ය.

34. "ඉධ පන භික්ඛවෙ, උපාසකෙන අත්තනො අත්ථාය නිවෙසනං කාරාපිතං හොති. -පෙ- සයනිඝරං කාරාපිතං හොති. -පෙ- උද්දොසිතො[1] කාරාපිතො හොති. -පෙ- අට්ටො කාරාපිතො හොති. -පෙ- මාළො කාරාපිතො හොති. -පෙ- ආපණො කාරාපිතො හොති. -පෙ- ආපණසාලා කාරාපිතා හොති. -පෙ- පාසාදො කාරාපිතො හොති. -පෙ- හම්මියං කාරාපිතං හොති. -පෙ- ගුහා කාරාපිතා හොති. -පෙ- පරිවෙණං කාරාපිතං හොති. -පෙ- කොට්ඨකො කාරාපිතො හොති. -පෙ- උපට්ඨානසාලා කාරාපිතා හොති. -පෙ- අග්ගිසාලා කාරාපිතා හොති. -පෙ- රසවතී කාරාපිතා හොති. -පෙ- වච්චකුටී කාරාපිතා හොති. -පෙ- චඞ්කමො කාරාපිතො හොති. -පෙ- චඞ්කමනසාලා කාරාපිතා හොති. -පෙ- උදපානො කාරාපිතො හොති. -පෙ- උදපානසාලා කාරාපිතා හොති -පෙ- ජන්තාඝරං කාරාපිතං හොති. -පෙ- ජන්තාඝරසාලා කාරාපිතා හොති. -පෙ- පොක්ඛරණී කාරාපිතා හොති. -පෙ- මණ්ඩපො කාරාපිතො හොති. -පෙ- ආරාමො කාරාපිතො හොති. -පෙ- ආරාමවත්ථු කාරාපිතං හොති. -පෙ- පුත්තස්ස වා වාරෙය්‍යං හොති. -පෙ- ධීතුයා වා වාරෙය්‍යං හොති. -පෙ- ගිලානො වා හොති. -පෙ- අභිඤ්ඤාතං වා සුත්තන්තං භණති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'ආගච්ඡන්තු භදන්තා. ඉමං සුත්තන්තං පරියාපුණිස්සන්ති, පුරායං සුත්තන්තො පලුජ්ජතී' ති. අඤ්ඤතරං වා පනස්ස කිච්චං හොති කරණීයං වා, සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'ආගච්ඡන්තු භදන්තා. ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතු' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

35. "ඉධ පන භික්ඛවෙ, උපාසිකාය සඞ්ඝං උද්දිස්ස විහාරො කාරාපිතො හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'ආගච්ඡන්තු අය්‍යා, ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතු' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

36. "ඉධ පන භික්ඛවෙ, උපාසිකාය සඞ්ඝං උද්දිස්ස අඩ්ඪයොගො කාරාපිතො හොති. පාසාදො කාරාපිතො හොති. හම්මියං කාරාපිතං හොති. ගුහා කාරාපිතා හොති. පරිවෙණං කාරාපිතං හොති. කොට්ඨකො කාරාපිතො හොති. උපට්ඨානසාලා කාරාපිතා හොති. අග්ගිසාලා කාරාපිතා හොති. කප්පියකුටී කාරාපිතා හොති. වච්චකුටී කාරාපිතා හොති. චඞ්කමො කාරාපිතො හොති. චඞ්කමනසාලා කාරාපිතා හොති. උදපානො කාරාපිතො හොති. උදපානසාලා කාරාපිතා හොති. ජන්තාඝරං කාරාපිතං හොති. ජන්තාඝරසාලා කාරාපිතා හොති. පොක්ඛරණී කාරාපිතා හොති. මණ්ඩපො කාරාපිතො හොති. ආරාමො කාරාපිතො හොති. ආරාමවත්ථු කාරාපිතං හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතු" න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

1. "උදොසිතො" ම ඡ සං.

34. "මහණෙනි, මෙහි උපාසකයකු විසින් තමන් පිණිස ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- තිදන ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- බඩු තබන ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- මුරගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- එක කැණිමඬලෙන් යුත් ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- සල්පිලක් කරවන ලද්දේ වේ. -පෙ- සල්පිල්හලක් කරවන ලද්දේ වේ. -පෙ- සිවුරුස්ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- ගුහාවක් කරවන ලද්දී වේ. -පෙ- පිරිවෙණක් කරවන ලද්දේ වේ. -පෙ- කොටු ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- උපස්ථානශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- අගනිශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- මුළුතැන්ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- වැසිකිළියක් කරවන ලද්දී වේ. -පෙ- සක්මණක් කරවන ලද්දේ වේ. -පෙ- චඞ්ක්‍රමණ ශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- ළිඳක් කරවන ලද්දේ වේ. -පෙ- ළින්හලක් කරවන ලද්දේ වේ. -පෙ- ජන්තාඝරයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ජන්තාඝර සාලාවක් කරවන ලද්දී වේ. -පෙ- පොකුණක් කරවන ලද්දේ වේ. -පෙ- මණ්ඩපයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ආරාමයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ආරාම වත්තක් කරවන ලද්දේ වේ. -පෙ- පුතකුගේ ආවාහ මඟුලෙක් හෝ වේ. -පෙ- දුවකගේ විවාහ මඟුලෙක් හෝ වේ. -පෙ- ගිලන් වූයේ හෝ වේ. -පෙ- ප්‍රසිද්ධ වූ සූත්‍රධර්මයක් හෝ කියයි. හෙ තෙමේ 'පින්වතුන් වහන්සේලා වඩින සේක්වා. මේ සූත්‍ර ධර්මය යම් තාක් නො නැසේ ද, ඊට පෙර මේ සූත්‍රධර්මය පුහුණු කරන්නාහු' යි භික්ෂූන් වෙතට දූතයකු එවන්නේ ද, ඔහුගේ අත් කිසක් හෝ කටයුත්තක් හෝ වේ ද, (එකල) හෙ තෙමේ 'පින්වතුන් වහන්සේලා වඩින සේක්වා, මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි' යි භික්ෂූන් වෙතට දූතයකු එවන්නේ නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් ආ පසු ඊම කළ යුතු ය."

35. "මහණෙනි, මෙහි උපාසිකාවක විසින් සඞ්ඝයා උදෙසා විහාරයක් කරවන ලද්දේ වේ. ඕ තොමෝ ඉදින් 'ආයසීයන් වහන්සේලා වඩින සේක්වා. මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි' යි භික්ෂූන් වෙතට, දූතයකු එවන්නී නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් ආ පසු ඊම කළ යුතු ය."

36. "මහණෙනි, මෙහි උපාසිකාවක විසින් සඞ්ඝයා උදෙසා අඩ සෙවෙනි ඇති ගෙයක් කරවන ලද්දේ වේ. සිවුරුස්ගෙයක් කරවන ලද්දේ වේ. සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. ගුහාවක් කරවන ලද්දේ වේ. පිරිවෙණක් කරවන ලද්දේ වේ. කොටුගෙයක් කරවන ලද්දේ වේ. උපස්ථාන ශාලාවක් කරවන ලද්දී වේ. අගනිශාලාවක් කරවන ලද්දී වේ. කැපකිළියක් කරවන ලද්දී වේ. වැසිකිළියක් කරවන ලද්දී වේ. සක්මනක් කරවන ලද්දේ වේ. චඞ්ක්‍රමණශාලාවක් කරවන ලද්දී වේ. ළිඳක් කරවන ලද්දේ වේ. ළින්හලක් කරවන ලද්දේ වේ. ජන්තාඝරයෙක් කරවන ලද්දේ වේ. ජන්තාඝර ශාලාවක් කරවන ලද්දී වේ. පොකුණක් කරවන ලද්දේ වේ. මණ්ඩපයෙක් කරවන ලද්දේ වේ. ආරාමයෙක් කරවන ලද්දේ වේ. ආරාමවත්තක් කරවන ලද්දේ වේ. ඕ තොමෝ 'ආයසීයන් වහන්සේලා වඩිනසේක්වා. මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි' යි භික්ෂූන් වෙතට දූතයකු එවන්නී නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීය-යෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් ආ පසු ඊම කළ යුතු ය.

37. “ඉධ පන භික්ඛවෙ, උපාසිකාය සම්බහුලෙ භික්ඛූ උද්දිස්ස -පෙ- එකං භික්ඛුං උද්දිස්ස -පෙ- භික්ඛුණිසඞ්ඝං උද්දිස්ස -පෙ- සම්බහුලා භික්ඛුණියො උද්දිස්ස -පෙ- එකං භික්ඛුණිං උද්දිස්ස -පෙ- සම්බහුලා සික්ඛමානායො උද්දිස්ස -පෙ- එකං සික්ඛමානං උද්දිස්ස -පෙ- සම්බහුලෙ සාමණෙරෙ උද්දිස්ස -පෙ- එකං සාමණෙරං උද්දිස්ස -පෙ- සම්බහුලා සාමණෙරියො උද්දිස්ස පෙ-- එකං සාමණෙරිං උද්දිස්ස -පෙ- අත්තනො අත්ථාය නිවෙසනං කාරාපිතං හොති. සයනීඝරං කාරාපිතං හොති. උදොසිතො කාරාපිතො හොති. අට්ටො කාරාපිතො හොති. මාළො කාරාපිතො හොති. ආපණො කාරාපිතො හොති. ආපණසාලා කාරාපිතා හොති. පාසාදො කාරාපිතො හොති. හම්මියං කාරාපිතං හොති. ගුහා කාරාපිතා හොති. පරිවෙණං කාරාපිතං හොති. කොට්ඨකො කාරාපිතො හොති. උපට්ඨානසාලා කාරාපිතා හොති. අග්ගිසාලා කාරාපිතා හොති. රසවතී කාරාපිතා හොති. වච්චකුටී කාරාපිතා හොති. චඞ්කමො කාරාපිතො හොති. චඞ්කමනසාලා කාරාපිතා හොති. උදපානො කාරාපිතො හොති. උදපානසාලා කාරාපිතා හොති. ජන්තාඝරං කාරාපිතං හොති. ජන්තාඝරසාලා කාරාපිතා හොති. පොක්ඛරණී කාරාපිතා හොති. මණ්ඩපො කාරාපිතො හොති. ආරාමො කාරාපිතො හොති. ආරාමවත්ථු කාරාපිතං හොති. පුත්තස්ස වා වාරෙය්‍යං හොති. ධීතුයා වා වාරෙය්‍යං හොති. ගිලානා වා හොති. අභිඤ්ඤාතං වා සුත්තන්තං භණති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘ආගච්ඡන්තු අය්‍යා. ඉමං සුත්තන්තං පරියාපුණිස්සන්ති, පුරායං සුත්තන්තො පලුජ්ජතී’ ති. අඤ්ඤතරං වා පනස්සා කිච්චං හොති කරණීයං වා. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘ආගච්ඡන්තු අය්‍යා, ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතු’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

38. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා සඞ්ඝං උද්දිස්ස -පෙ- භික්ඛුණියා සඞ්ඝං උද්දිස්ස -පෙ- සික්ඛමානාය සඞ්ඝං උද්දිස්ස -පෙ- සාමණෙරෙන සඞ්ඝං උද්දිස්ස -පෙ- සාමණෙරියා සඞ්ඝං උද්දිස්ස -පෙ- සම්බහුලෙ භික්ඛූ උද්දිස්ස -පෙ- එකං භික්ඛුං උද්දිස්ස -පෙ- භික්ඛුණිසඞ්ඝං උද්දිස්ස -පෙ- සම්බහුලා භික්ඛුණියො උද්දිස්ස -පෙ- එකං භික්ඛුණිං උද්දිස්ස -පෙ- සම්බහුලා සික්ඛමානායො උද්දිස්ස -පෙ- එකං සික්ඛමානං උද්දිස්ස -පෙ- සම්බහුලෙ සාමණෙරෙ උද්දිස්ස -පෙ- එකං සාමණෙරං උද්දිස්ස -පෙ- සම්බහුලා සාමණෙරියො උද්දිස්ස -පෙ- එකං සාමණෙරිං උද්දිස්ස -පෙ- අත්තනො අත්ථාය විහාරො කාරාපිතො හොති. අඩ්ඪයොගො කාරාපිතො හොති. පාසාදො කාරාපිතො හොති. හම්මියං කාරාපිතං හොති. ගුහා කාරාපිතා හොති. පරිවෙණං කාරාපිතං හොති. කොට්ඨකො කාරාපිතො හොති. උපට්ඨානසාලා කාරාපිතා හොති. අග්ගිසාලා කාරාපිතා හොති. කප්පියකුටී කාරාපිතා හොති. චඞ්කමො කාරාපිතො හොති. චඞ්කමනසාලා කාරාපිතා හොති. උදපානො කාරාපිතො හොති. උදපානසාලා කාරාපිතා හොති. පොක්ඛරණී කාරාපිතා හොති. මණ්ඩපො කාරාපිතො හොති. ආරාමො කාරාපිතො හොති. ආරාමවත්ථු කාරාපිතං හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘ආගච්ඡන්තු අය්‍යා ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතු’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ සත්තාහං සන්නිවත්තො කාතබ්බො” ති.

37. "මහණෙනි, මෙහි උපාසිකාවක විසින් බොහෝ භික්ෂූන් උදෙසා -පෙ- එක් භික්ෂුනමක් උදෙසා -පෙ- මෙහෙණසඟ උදෙසා -පෙ- බොහෝ මෙහෙණින් උදෙසා -පෙ- එක් මෙහෙණක උදෙසා -පෙ- බොහෝ භික්මෙන්නියන් උදෙසා -පෙ- එක් භික්මෙන්නියක උදෙසා -පෙ- බොහෝ හෙරණුන් උදෙසා -පෙ- එක් හෙරණකු උදෙසා -පෙ- බොහෝ සාමණෙරීන් උදෙසා -පෙ- එක් සාමණෙරියක උදෙසා -පෙ- තමන් පිණිස ගෙයක් කරවන ලද්දේ වේ. නිදන ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- බඩු තබන ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- මුරගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- එක් කැණිමඬලින් යුත් ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- කඩ පිලක් කරවන ලද්දේ වේ. කඩපිල්හලක් කරවන ලද්දේ වේ. -පෙ- සිවුරුස්ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- ගුහාවක් කරවන ලද්දී වේ. පිරිවෙණක් කරවන ලද්දේ වේ. -පෙ- කොටුගෙයක් කරවන ලද්දේ වේ. උපස්ථානශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- අග්නිශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- මුළුතැන්ගෙයක් කරවන ලද්දේ වේ. -පෙ- වැසිකිළියක් කරවන ලද්දී වේ. -පෙ- සක්මනක් කරවන ලද්දේ වේ. -පෙ- චඞ්ක්‍රමණශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- ලිඳක් කරවන ලද්දේ වේ. -පෙ- ලින්හලක් කරවන ලද්දේ වේ. -පෙ- ජන්තාඝරයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ජන්තාඝර ශාලාවක් කරවන ලද්දී වේ. -පෙ- පොකුණක් කරවන ලද්දේ වේ. -පෙ- මණ්ඩපයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ආරාමයෙක් කරවන ලද්දේ වේ. -පෙ- ආරාම වත්තක් කරවන ලද්දේ වේ. -පෙ- පුතකුගේ ආවාහ මඟුලෙක් වේ. -පෙ- දුවකගේ විවාහ මඟුලෙක් හෝ වේ. -පෙ- ගිලන් වූවා හෝ වේ. -පෙ- ප්‍රසිද්ධ වූ සූත්‍ර ධර්මයක් හෝ කියයි. -පෙ- ඕ තොමෝ 'ආයුෂ්මතුන් වහන්සේලා වඩිනසේක්වා. මේ සූත්‍ර ධර්මය යම් තාක් පලුදු වේ ද, ඊට පෙර මේ සූත්‍ර ධර්මය පුහුණු කරන්නාහු' යි භික්ෂූන් වෙතට දූතයකු එවන්නී ද, ඈ පිළිබඳ කළයුතු එක්තරා කටයුත්තෙක් හෝ වේ ද, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් නැවත ඊම කළ යුතු ය."

38. "මහණෙනි, මෙහි මහණකු විසින් සඞ්ඝයා උදෙසා -පෙ- මෙහෙණක විසින් සඞ්ඝයා උදෙසා -පෙ- භික්මෙන්නියක විසින් සඞ්ඝයා උදෙසා -පෙ- හෙරණකු විසින් සඞ්ඝයා උදෙසා -පෙ- හෙරණියක විසින් සඞ්ඝයා උදෙසා -පෙ- බොහෝ භික්ෂූන් උදෙසා -පෙ- එක් මහණකු උදෙසා -පෙ- මෙහෙණ සඟ උදෙසා -පෙ- බොහෝ මෙහෙණින් උදෙසා -පෙ- එක් මෙහෙණක උදෙසා -පෙ- බොහෝ භික්මෙන්නියන් උදෙසා -පෙ- එක් භික්මෙන්නියක උදෙසා -පෙ- බොහෝ හෙරණුන් උදෙසා -පෙ- එක් හෙරණකු උදෙසා -පෙ- බොහෝ සාමණෙරීන් උදෙසා -පෙ- එක් සාමණෙරියක උදෙසා -පෙ- තමන් පිණිස විහාරයෙක් කරවන ලද්දේ වේ. අඩසෙවෙනි ඇති ගෙයක් කරවන ලද්දේ වේ. සිවුරුස්ගෙයක් කරවන ලද්දේ වේ. සඳලු සහිත ගෙයක් කරවන ලද්දේ වේ. ගුහාවක් කරවන ලද්දේ වේ. පිරිවෙණක් කරවන ලද්දේ වේ. කොටුගෙයක් කරවන ලද්දේ වේ. උපස්ථානශාලාවක් කරවන ලද්දී වේ. අග්නිශාලාවක් කරවන ලද්දී වේ. කැප කිළියක් කරවන ලද්දී වේ. සක්මනෙක් කරවන ලද්දේ වේ. චඞ්ක්‍රමණ ශාලාවක් කරවන ලද්දී වේ. ලිඳක් කරවන ලද්දේ වේ. ලින්හලක් කරවන ලද්දේ වේ. පොකුණක් කරවන ලද්දේ වේ. මණ්ඩපයක් කරවන ලද්දේ වේ. ආරාමයක් කරවන ලද්දේ වේ. ආරාමවත්තක් කරවන ලද්දේ වේ. ඕ තොමෝ 'ආයුෂ්මතුන් වහන්සේලා වඩින සේක්වා. මම දන් දෙන්නට ද බණ අසන්නට ද භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු එවන්නී නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් නැවත ඊම කළ යුතු ය."

39. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. සො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: “අහං හි [1] ගිලානො. ආගච්ඡන්තු භික්ඛූ ඉච්ඡාමි භික්ඛූනං ආගත” න්ති.

40. භගවතො එතමත්ථං ආරොචෙසුං:- “අනුජානාමි භික්ඛවෙ, පඤ්චන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙපි ගන්තුං පගෙව පහිතෙ- භික්ඛුස්ස භික්ඛුණියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා[2]. අනුජානාමි භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙපි ගන්තුං, පගෙව පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

41. “ඉධ පන භික්ඛවෙ, භික්ඛු ගිලානො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අහං හි ගිලානො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත’ න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘ගිලානභත්තං වා පරියෙසිස්සාමි, ගිලානුපට්ඨාකභත්තං වා පරියෙසිස්සාමි, ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි, පුච්ඡිස්සාමි වා, උපට්ඨිස්සාමි වා ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

42. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස අනභිරති උප්පන්නා හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අනභිරති මෙ උප්පන්නා. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත’ න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘අනභිරතිං වූපකාසෙස්සාමි වා, වූපකාසාපෙස්සාමි වා, ධම්මකථං වාස්ස කරිස්සාමී ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

43. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස කුක්කුච්චං උප්පන්නං හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘කුක්කුච්චං මෙ උප්පන්නං. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත’ න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘කුක්කුච්චං විනොදෙස්සාමි වා, විනොදාපෙස්සාමි වා, ධම්මකථං වාස්ස කරිස්සාමී’ ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

44. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස දිට්ඨිගතං උප්පන්නං හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: “දිට්ඨිගතං මෙ උප්පන්නං. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත’ න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘දිට්ඨිගතං විවෙචෙස්සාමි වා, විවෙචාපෙස්සාමි වා, ධම්මකථං වාස්ස කරිස්සාමී’ ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

1. “අහං” ම ඡ සං. අ වි. ජ වි. තො ඊ. ම නු ප.
2. “සාමණෙරාය” සී මු.

39. එකල්හි වනාහි එක්තරා මහණෙක් තෙමේ ගිලන් වූයේ වේ. හෙතෙමේ ''මම ගිලන් වෙමි. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි'' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යැවූයේ ය.

40. භාග්‍යවතුන් වහන්සේට මේ වග සැලකළහ. ''මහණෙනි, මහණෙක මෙහෙණක හික්මෙන්නියක හෙරණෙක හෙරණියක යන පස් දෙනාගේ සමීපයට පණිවිඩ නො එවූ කල්හි ද සත්තාහකරණීයයෙන් යන්ට අනුදනිමි. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? මහණෙනි, මේ පස්දෙනාගේ සමීපයට පණිවිඩ නො එවූ කල්හි ද සත්තාහකරණීයයෙන් යන්ට අනුදනිමි. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් ආ පසු ඊම කළ යුතු ය.''

41. ''මහණෙනි, මෙහි මහණෙක් තෙමේ ගිලන් වූයේ වේ. හෙ තෙමේ 'මම ගිලන් වෙමි. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ගිලන්බත් හෝ සොයන්නෙමි. ග්ලානොපස්ථායකයන් සඳහා බත් හෝ සොයන්නෙමි. ගිලන් බෙහෙත් හෝ සොයන්නෙමි. සුවදුක් හෝ විචාරන්නෙමි. උවැටන් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් ආ පසු ඊම කළ යුතු ය.''

42. ''මහණෙනි, මෙහි මහණෙකුහට සසුන්හි කලකිරීමෙක් උපන්නේ වේ. හෙ තෙමේ 'මට කලකිරීමෙක් උපන්නේ ය. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'කලකිරීම බැහැර කරන්නෙමි හෝ බැහැර කරවන්නෙමි. ඔහුට ධර්ම කථාවක් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවතිය යුතු ය.''

43. ''මහණෙනි, මෙහි මහණෙකුහට කුකුසෙක් උපන්නේ වේ. හෙ තෙමේ 'මට කුකුසෙක් උපන්නේ ය. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'කුකුස දුරු කරන්නෙමි යි හෝ, දුරු කරවාලන්නෙමි යි හෝ, මොහුට ධර්මකථාවක් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවතිය යුතු ය.''

44. ''මහණෙනි, මෙහි මහණෙකුහට මිසදිටුවක් උපන්නේ වේ. හෙ තෙමේ 'මට මිසදිටුවක් උපන්නේ ය. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'මිසදිටුව බැහැර කරන්නෙමි යි හෝ, බැහැර කරවන්නෙමි යි හෝ, මොහුට ධර්ම කථාවක් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවතිය යුතු ය.''

45. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසාරහො. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගරුධම්මං අජ්ඣාපන්නො පරිවාසාරහො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'පරිවාසදානං උස්සුක්කං කරිස්සාමි වා, අනුස්සාවෙස්සාමි වා, ගණපූරකො වා භවිස්සාමී'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

46. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු මූලාය පටිකස්සනාරහො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි මූලාය පටිකස්සනාරහො ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'මූලාය පටිකස්සනං උස්සුක්කං කරිස්සාමි වා, අනුස්සාවෙස්සාමි වා, ගණපූරකො වා භවිස්සාමී'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

47. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු මානත්තාරහො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි මානත්තාරහො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'මානත්තදානං උස්සුක්කං කරිස්සාමි වා, අනුස්සාවෙස්සාමි වා, ගණපූරකො වා භවිස්සාමී'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

48. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු අබ්භානාරහො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි අබ්භානාරහො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'අබ්භානං උස්සුක්කං කරිස්සාමි වා, අනුස්සාවෙස්සාමි වා, ගණපූරකො වා භවිස්සාමී'' ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

49. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස සඞ්ඝො කම්මං කත්තුකාමො හොති. තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: "සඞ්ඝො මෙ කම්මං කත්තුකාමො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'කින්ති නු බො සඞ්ඝො කම්මං න කරෙය්‍ය. ලහුකාය වා පරිණාමෙය්‍යා'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

45. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ ගරු ඇවැතට පැමිණියේ පිරිවෙසට සුදුසු වූයේ වේ. හෙ තෙමේ 'මම ගරු ඇවැතට පැමිණියේ පිරිවෙසට සුදුසු වූයේ වෙමි. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'පිරිවෙස් දීම ඉක්මන් කරන්නෙමි යි හෝ (කර්මවාක්‍ය) අස්වන්නෙමි යි හෝ, ගණපූරකයෙක් හෝ වන්නෙමි" යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

46. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ 'මූලායපටිකස්සන' නම් විනයකර්මයට සුදුසු වූයේ වේ. හෙතෙමේ 'මම 'මූලායපටිකස්සන' විනයකර්මයට සුදුසු වූයේ වෙමි. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'මූලායපටිකස්සනකර්මය' ඉක්මන් කරන්නෙමි යි හෝ, (කර්මවාක්‍ය) අස්වන්නෙමි යි හෝ, ගණපූරකයෙක් හෝ වන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතුය."

47. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මානතට සුදුසු වේ. හෙ තෙමේ 'මම මානතට සුදුසු වූයේ වෙමි. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද මානත දීම ඉක්මන් කරන්නෙමි යි හෝ, (කර්මවාක්‍ය) අස්වන්නෙමි යි හෝ, ගණපූරකයෙක් හෝ වන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

48. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ අබ්භානයට සුදුසු වූයේ වේ. හෙ තෙමේ 'මම අබ්භානයට සුදුසු වූයේ වෙමි. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'අබ්භානය දීම ඉක්මන් කරන්නෙමි යි හෝ, (කර්මවාක්‍ය) අස්වන්නෙමි යි හෝ ගණපූරකයෙක් හෝ වන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවතිය යුතු ය."

49. "මහණෙනි, මෙහි මහණෙකුහට සඞ්ඝ තෙමේ තජ්ජනීයකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනීයකර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපණීයකර්මය හෝ කරණු කැමැත්තේ වේ. හෙ තෙමේ 'සඞ්ඝ තෙමේ මට කර්මයක් කරණු කැමැත්තේ වේ. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි" යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'සඞ්ඝ තෙමේ කෙසේ නම් කර්ම නො ම කරන්නේ ද? කර්මය සැහැල්ලු බවට හෝ පෙරළන්නේ ද' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවතිය යුතු ය."

50. “කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘සඞ්ඝො මෙ කම්මං අකාසි. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘**කින්ති** නු ඛො සම්මා වත්තෙය්‍ය? ලොමං පාතෙය්‍ය? නෙත්ථාරං වත්තෙය්‍ය? සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා’ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

51. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුණී ගිලානා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අහං හි ගිලානා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘ගිලානභත්තං වා පරියෙසිස්සාමි, ගිලානුපට්ඨාකභත්තං වා පරියෙසිස්සාමි, ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි, **පුච්ඡිස්සාමි** වා, උපට්ඨහිස්සාමි වා’ ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

52. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුණියා අනභිරති උප්පන්නා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අනභිරති මෙ උප්පන්නා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘අනභිරතිං වූපකාසෙස්සාමි වාවූපකාසාපෙස්සාමි වා, ධම්මකථං වාස්සා කරිස්සාමී’ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

53. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුණියා කුක්කුච්චං උප්පන්නං හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘කුක්කුච්චං මෙ උප්පන්නං. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘කුක්කුච්චං විනොදෙස්සාමි වා, විනොදාපෙස්සාමි වා, ධම්මකථං වාස්සා කරිස්සාමී’ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

54. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුණියා දිට්ඨිගතං උප්පන්නං හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘දිට්ඨිගතං මෙ උප්පන්නං. ආගච්ඡන්තු අය්‍යා, ඉච්ඡාමි අය්‍යානං ආගත’න්ති ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘දිට්ඨිගතං විවෙචෙස්සාමි වා, විවෙචාපෙස්සාමි වා, ධම්මකථං වාස්සා කරිස්සාමී’ ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

55. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුණී ගරුධම්මං අජ්ඣාපන්නා හොති මානත්තාරහා. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අහං හි ගරුධම්මං අජ්ඣාපන්නා මානත්තාරහා. ආගච්ඡන්තු අය්‍යා, ඉච්ඡාමි අය්‍යානං ආගත”න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘මානත්තදානෙ උස්සුක්කං කරිස්සාමී’ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

50. "මොහුට සඞ්ඝයා විසින් තජ්ජනීයකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනීයකර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපනීයකර්මය හෝ කරණ ලද්දේ වේ. හෙ තෙමේ "සඞ්ඝ තෙමේ මට කර්මයක් කෙළේ ය. භික්ෂූහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි" යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'කෙසේ නම් මනා කොට පවතින්නේ ද? මහණුන්ට අනුලොම් ව පවතින්නේ ද? කර්මයෙන් නිදහස් වන සේ පවතින්නේ ද? සඞ්ඝ තෙමේ ඒ කර්මය සංසිඳුවන්නේ දැ' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේද ? සතියෙන් නැවැතිය යුතු ය."

51. "මහණෙනි, මෙහි මෙහෙණක් ගිලන් වූවා වේ. ඕ තොමෝ 'මම ගිලන් වූවා වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ගිලන්බත් හෝ සොයන්නෙමි. ගිලානොපස්ථායකයන් සඳහා හෝ, බත් සොයන්නෙමි. ගිලන් බෙහෙත් හෝ සොයන්නෙමි. (සුවදුක්) විචාරන්නෙමි යි හෝ, උවැටන් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතුය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

52. "මහණෙනි, මෙහි මෙහෙණකට කළකිරීමක් වේ. ඕ තොමෝ 'මට කළකිරීමක් උපන. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'කළකිරීම සංසිඳුවන්නෙමි යි හෝ, සංසිඳුවා ලන්නෙමි යි හෝ, මැට ධර්ම කථාවක් හෝ කරන්නෙමි යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනුම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

53. "මහණෙනි, මෙහි මෙහෙණකට කුකුසෙක් උපන්නේ වේ. ඕ තොමෝ 'මට කුකුසෙක් උපන්නේ ය. පින්වතුන් වහන්සේලා එත්වා. පින්-වතුන් වහන්සේලාගේ ඊම කැමත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'කුකුස දුරු කරන්නෙමි' යි හෝ, දුරු කරවන්නෙමි යි හෝ, මැට ධර්මකථාවක් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

54. "මහණෙනි, මෙහි මෙහෙණකට මිසදිටුවක් උපන්නේ වේ. ඕ තොමෝ 'මට මිසදිටුවක් උපන්නේ ය. පින්වතුන් වහන්සේලා එත්වා. පින්-වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද මිසදිටුව බැහැර කරන්නෙමි යි හෝ, බැහැර කරවන්නෙමි යි හෝ, මැට ධර්මකථාවක් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනුම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

55. "මහණෙනි, මෙහි මෙහෙණක් ගරු ඇවැතට පැමිණියා මානතට සුදුසු වූවා වේ. ඕ තොමෝ 'මම ගරු ඇවතට පැමිණියා මානතට සුදුසු වූවා වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද මානත දීම ඉක්මන් කරන්නෙමි යි සත්තාහ-කරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

56. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුණී මූලාය පටිකස්සනාරහා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි මූලාය පටිකස්සනාරහා ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'මූලාය පටිකස්සනං උස්සුක්කං කරිස්සාමී'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

57. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුණී අබ්භානාරහා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි අබ්භානාරහා' ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත''න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහ-කරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'අබ්භානං උස්සුක්කං කරිස්සාමී' ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

58. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුණියා සඞ්ඝො කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා . සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'සඞ්ඝො මෙ කම්මං කත්තු-කාමො. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'කින්ති නු ඛො සඞ්ඝො කම්මං න කරෙය්‍ය? ලහුකාය වා පරිණාමෙය්‍යා'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

59. "කතං වා පනස්සා හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'සඞ්ඝො මෙ කම්මං අකාසි. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත''න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි. පගෙව පහිතෙ: ''කින්ති නු ඛො සම්මා වත්තෙය්‍ය? ලොමං පාතෙය්‍ය? නෙත්ථාරං වත්තෙය්‍ය? සඞ්ඝො තං කම්මං පටිප්පස්සම්භෙය්‍යා'ති සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

60. "ඉධ පන භික්ඛවෙ, සික්ඛමානා ගිලානා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'ගිලානභත්තං වා පරියෙසිස්සාමි, ගිලානුපට්ඨාක භත්තං වා පරියෙසිස්සාමි, ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි, පුච්ඡිස්සාමි වා, උපට්ඨිස්සාමි වා'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

56. "මහණෙනි, මෙහි මෙහෙණක් මූලායපටිකස්සනකර්මයට සුදුසු වූවා වේ. ඕ තොමෝ 'මම මූලායපටිකස්සනකර්මයට සුදුසු වූවා වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද **මූලායපටිකස්සනකර්මය** ඉක්මන් කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

57. "මහණෙනි, මෙහි මෙහෙණක් අබ්භානයට සුදුසු වූවා වේ. ඕ තොමෝ 'මම අබ්භානයට සුදුසු වූවා වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවුඩ නො එවූ කල්හි ද 'අබ්භානය ඉක්මන් කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය.

58. "මහණෙනි, මෙහි මෙහෙණකට සඞ්ඝ තෙමේ තජ්ජනීයකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනීයකර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපනීයකර්මය හෝ කරණු කැමැත්තේ වේ. ඕ තොමෝ 'සඞ්ඝතෙමේ මට කර්මයක් කරණු කැමැත්තේ ය. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'සඞ්ඝ තෙමේ කෙසේ නම් කර්ම නො කරන්නේ ද කර්මය සැහැල්ලු කිරීම පිණිස හෝ පෙරළන්නේ දැයි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

59. "මැට සඞ්ඝයා විසින් තජ්ජනීයකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනීයකර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපනීයකර්මය හෝ කරණ ලද්දේ වේ. ඕ තොමෝ 'සඞ්ඝ තෙමේ මට කර්මයක් කෙළේ ය. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්-තෙමි"යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'කෙසේ නම් මනා කොට පවත්නේ ද? මහණුන්ට අනුලොම් ව පවත්නේ ද? කර්මයෙන් නිදහස් වන සේ පවත්නේ ද? සඞ්ඝ තෙමේ ඒ කර්මය සංසිඳුවන්නේ දැ' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

60. "මහණෙනි, මෙහි භික්මෙන්නියක් තොමෝ ගිලන් වූවා වෙයි. ඕ තොමෝ 'මම ගිලන් වූවා වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ගිලන් බත් හෝ සොයන්නෙමි. ගිලානොපස්ථායකයා සඳහා හෝ බත් සොයන්නෙමි. ගිලන්බෙහෙත් හෝ සොයන්නෙමි. සුවදුක් හෝ විචාරන්නෙමි' උවැටන් හෝ කරන්නෙ'මි යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

61. "ඉධ පන භික්ඛවෙ, සික්ඛමානාය අනභිරති උප්පන්නා හොති. -පෙ- සික්ඛමානාය කුක්කුච්චං උප්පන්නං හොති. -පෙ- සික්ඛමානාය දිට්ඨිගතං උප්පන්නං හොති. -පෙ- සික්ඛමානාය සික්ඛා කුපිතා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: "සික්ඛා මෙ කුපිතා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහ-කරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'සික්ඛාසමාදානං උස්සුක්කං කරිස්සාමී'ති සත්තාහං-සන්නිවත්තො කාතබ්බො."

62. "ඉධ පන භික්ඛවෙ, සික්ඛමානා උපසම්පජ්ජිතුකාමා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි උපසම්පජ්ජිතුකාමා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'උපසම්පදං උස්සුක්කං කරිස්සාමි වා. අනුසාවෙස්සාමි වා, ගණපූරකො වා භවිස්සාමී"ති. සත්තාහං. සන්නිවත්තො කාතබ්බො."

63. "ඉධ පන භික්ඛවෙ, සාමණෙරො ගිලානො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'ගිලානභත්තං වා පරියෙසිස්සාමි, ගිලානුපට්ඨාකභත්තං වා පරියෙසිස්සාමි, ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි, පුච්ඡිස්සාමි වා, උපට්ඨහිස්සාමි වා'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

64. "ඉධ පන භික්ඛවෙ, සාමණෙරස්ස අනභිරති උප්පන්නා හොති. -පෙ- සාමණෙරස්ස කුක්කුච්චං උප්පන්නං හොති. -පෙ- සාමණෙරස්ස දිට්ඨිගතං උප්පන්නං හොති. -පෙ- සාමණෙරො වස්සං පුච්ඡිතුකාමො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි වස්සං පුච්ඡිතු-කාමො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'පුච්ඡිස්සාමි වා. ආචික්ඛිස්සාමි වා'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

65. "ඉධ පන භික්ඛවෙ, සාමණෙරො උපසම්පජ්ජිතුකාමො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි උපසම්පජ්ජිතු-කාමො. ආගච්ඡන්තු භික්ඛූ. ඉච්ඡාමි භික්ඛූනං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'උපසම්පදං උස්සුක්කං කරිස්සාමි වා, අනුසාවෙස්සාමි වා, ගණපූරකො වා භවිස්සාමී'ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

66. "ඉධ පන භික්ඛවෙ, සාමණෙරී[1] ගිලානා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහ-කරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: 'ගිලානභත්තං වා පරියෙසිස්සාමි, ගිලානුපට්ඨාකභත්තං වා පරියෙසිස්සාමි, ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි, පුච්ඡිස්සාමි වා, උපට්ඨහිස්සාමි වා"ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

1 "සාමණෙරා" සී මු.

61. "මහණෙනි, මෙහි භික්මෙන්නියකට කළකිරීමක් වේ.. -පෙ- භික්මෙන්නියකට කුකුසෙක් උපන්නේ වේ. -පෙ- භික්මෙන්නියකට මිසදිටුවක් උපන්නේ වේ. -පෙ- භික්මෙන්නියකගේ ශික්ෂා තොමෝ කිපියා වේ. ඕ තොමෝ 'මාගේ ශික්ෂා තොමෝ කිපියා ය. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ශික්ෂාසමාදානය ඉක්මන් කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

62. "මහණෙනි, මෙහි භික්මෙන්නියක් තොමෝ 'මම උපසපන් වනු කැමැත්තී වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'උපසම්පදාව ඉක්මන් කරන්නෙමි යි හෝ, (කම්වදන්) අස්වන්නෙමි යි හෝ, ගණපූරකයෙක් හෝ වන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

63. "මහණෙනි, මෙහි සාමණෙරයෙක් තෙමේ ගිලන් වූයේ වේ. හෙ තෙමේ 'මම ගිලන් වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ගිලන්බත් හෝ සොයන්නෙමි. ගලානොපස්ථායකයන් සඳහා හෝ බත් සොයන්නෙමි. ගිලන් බෙහෙත් හෝ සොයන්නෙමි. (සුවදුක්) විචාරන්නෙමි යි හෝ, උවැටන් හෝ කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

64. "මහණෙනි, මෙහි හෙරණකුට කළකිරීමක් වේ. -පෙ- හෙරණකුහට කුකුසෙක් වේ. -පෙ- හෙරණකුහට මිසදිටුවක් වේ. -පෙ- හෙරණෙක් තෙමේ වස් විචාරණු කැමැත්තේ වේ. හෙ තෙමේ 'මම වස් විචාරණු කැමැත්තේ වෙමි. භික්ෂුහු එත්වා. භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි'යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'විචාරන්නෙමි යි හෝ කියන්නෙමි'යි හෝ සත්තාහකරණීයයෙන් යායුතුය. පණිවිඩ එවූ කල්හි කියනුම කවරේ ද? සතියෙන් නැවැතිය යුතුය."

65. "මහණෙනි, මෙහි හෙරණෙක් තෙමේ උපසපන් වනු කැමැත්තේ වේ. හෙ තෙමේ 'මම උපසපන් වනු කැමැත්තේ වෙමි. භික්ෂුහු එත්වා භික්ෂූන්ගේ ඊම කැමැත්තෙමි'යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'උපසම්පදාව ඉක්මන් කරන්නෙමි යි හෝ, (කම්වදන්) අස්වන්නෙමි යි හෝ, ගණපූරකයෙක් හෝ වන්නෙමි"යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය.

66. මහණෙනි, මෙහි හෙරණක් තොමෝ ගිලන් වූවා වේ. ඕ තොමෝ 'මම ගිලන් වූවා වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ගිලන්බත් හෝ සොයන්නෙමි. ගලානොපස්ථායකයන් සඳහා හෝ බත් සොයන්නෙමි. ගිලන්බෙහෙත් හෝ සොයන්නෙමි. (සුවදුක්) විචාරන්නෙමි යි හෝ, උවැටැන් හෝ කරන්නෙමි'යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතුය.

67. “ඉධ පන භික්ඛවෙ, සාමණෙරියා අනභිරති උප්පන්නා හොති. -පෙ- සාමණෙරියා කුක්කුච්චං උප්පන්නං හොති. -පෙ- සාමණෙරියා දිට්ඨිගතං උප්පන්නං හොති. -පෙ- සාමණෙරී වස්සං පුච්ඡිතුකාමා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අහං හි වස්සං පුච්ඡිතුකාමා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘පුච්ඡිස්සාමි වා, ආචික්ඛිස්සාමි වා’ ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

68. “ඉධ පන භික්ඛවෙ, සාමණෙරී සික්ඛං සමාදියිතුකාමා හොති. සා චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අහං හි සික්ඛං සමාදියිතුකාමා. ආගච්ඡන්තු අය්‍යා. ඉච්ඡාමි අය්‍යානං ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘සික්ඛා සමාදානං උස්සුක්කං කරිස්සාමී’ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො”ති.

69. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මාතා ගිලානා හොති. සා පුත්තස්ස සන්තිකෙ දූතං පාහෙසි: “අහං හි ගිලානා. ආගච්ඡතු මෙ පුත්තො. ඉච්ඡාමි පුත්තස්ස ආගත”න්ති.

70. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: “භගවතා පඤ්ඤත්තං සත්තන්නං සත්තාහකරණීයෙන පහිතෙ ගන්තුං; න ත්වෙව අප්පහිතෙ. පඤ්චන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙපි ගන්තුං. පගෙව පහිතෙ.[1] අයං ච මෙ මාතා ගිලානා. සා ච අනුපාසිකා. කථං නු ඛො මයා පටිපජ්ජිතබ්බ”න්ති.

71. භගවතො එතමත්ථං ආරොචෙසුං:– “අනුජානාමි භික්ඛවෙ, සත්තන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙපි ගන්තුං. පගෙව පහිතෙ. භික්ඛුස්ස භික්ඛුණියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා මාතුයා ච පිතුස්ස ච. අනුජානාමි භික්ඛවෙ, ඉමෙසං සත්තන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙපි ගන්තුං, පගෙව පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො”

72. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස මාතා ගිලානා හොති. සා චෙ පුත්තස්ස සන්තිකෙ දූතං පහිණෙය්‍ය: ‘අහං හි ගිලානා. ආගච්ඡතු මෙ පුත්තො. ඉච්ඡාමි පුත්තස්ස ආගත’න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: ‘ගිලානභත්තං වා පරියෙසිස්සාමි, ගිලානුපට්ඨාකභත්තං වා පරියෙසිස්සාමි, ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි, පුච්ඡිස්සාමි වා, උපට්ඨහිස්සාමි වා’ති. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.”

1 “පහිතෙති” ම ඡ සං

Free Distribution www.aathaapi.org

67. "මහණෙනි, මෙහි සාමණේරියකට කළකිරීමක් වේ. -පෙ- සාමණේරියකට කුකුසක් වේ. සාමණේරියකට මිසදිටුවක් වේ. -පෙ- සාමණේරියක් තොමෝ වස් පිවාරණු කැමැත්තී වේ. ඕ තොමෝ 'මම වස් පිවාරණු කැමැත්තී වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි'යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'විචාරන්නෙමි යි හෝ, කියන්නෙමි'යි හෝ සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

68. "මහණෙනි, මෙහි සාමණේරියක් තොමෝ ශික්ෂාසමාදානය කැමැත්තී වේ. ඕ තොමෝ "මම ශික්ෂා සමාදන් වනු කැමැත්තී වෙමි. පින්වතුන් වහන්සේලා එත්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ශික්ෂාසමාදානය ඉක්මන් කරන්නෙමි' යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කවරේ ද? සතියෙන් නැවැතිය යුතු ය."

69. එකල්හි එක්තරා මහණකුගේ මවු තොමෝ ගිලන් වූවා වේ. ඕ තොමෝ "මම ගිලන් වූවා වෙමි. මාගේ පුත්‍රතෙමේ ඒවා. පුත්‍රයාගේ ඊම කැමැත්තෙමි" යි පුත්‍රයාගේ සමීපයට දූතයකු යැවූ ය.

70. එකල්හි ඒ භික්ෂූහුනට "භාග්‍යවතුන් වහන්සේ විසින් පණිවිඩ එවූ කල්හි සත් දෙනකුන්ගේ සමීපයට සත්තාහකරණීයයෙන් යන්ටත් පණිවිඩ නො එවූ කල්හි ද පස් දෙනකුන්ගේ සමීපයට යන්ටත් පණවන ලද්දේය. පණිවිඩ එවූ කල්හි කියනු ම කිම? මාගේ මේ මවු තොමෝ ගිලන් වූවා ය. ඕ තොමෝත් උපාසිකාවක් නො වූවා ය. මා විසින් කෙසේ පිළිපැදිය යුතු දැ" යි මෙබඳු සිතෙක් උපන.

71. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද සත් දෙනකුන්ගේ සමීපයට සත්තාහකරණීයයෙන් යන්ට අනුදනිමි. පණිවිඩ එවූ කල්හි කියනු ම කිම? මහණ මෙහෙණ භික්මෙන්නිය සාමණේරය සාමණේරිය මවු පියා යන මේ සත් දෙනාගේ සමීපයට පණිවිඩ නො එවූ කල්හි ද සත්තාහකරණීයයෙන් යන්ට අනුදනිමි. පණිවිඩ එවූ කල්හි කියනු ම කිම? සතියෙන් නැවැතිය යුතු ය."

72 "මහණෙනි, මෙහි මහණකුගේ මවු ගිලන් වූවා වේ. ඕ තොමෝ 'මම ගිලන් වූවා වෙමි. මාගේ පුත්‍ර තෙමේ ඒවා. පුත්‍රයාගේ ඊම කැමැත්තෙමි' යි පුත්‍රයාගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද ගිලන් බත් හෝ සොයන්නෙමි. ගිලානොපසථායකයන් සඳහා හෝ බත් සොයන්නෙමි. ගිලන් බෙහෙත් හෝ සොයන්නෙමි. විචාරන්නෙමි යි හෝ උවැටන් කරන්නෙමි' යි හෝ සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු ම කිම? සතියෙන් නැවැතිය යුතු ය."



Free Distribution www.aathaapi.org

73. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස පිතා ගිලානො හොති. සො චෙ පුත්තස්ස සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානො. ආගච්ඡතු මෙ පුත්තො. ඉච්ඡාමි පුත්තස්ස ආගත'න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන අප්පහිතෙපි පගෙව පහිතෙ: "ගිලානභත්තං වා පරියෙසිස්සාමි. ගිලානුපට්ඨාකභත්තං වා පරියෙසිස්සාමි. ගිලානභෙසජ්ජං වා පරියෙසිස්සාමි. පුච්ඡිස්සාමි වා. උපට්ඨහිස්සාමි වා'ති, සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

74. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස භාතා ගිලානො හොති. සො චෙ භාතුනො සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානො. ආගච්ඡතු මෙ භාතා. ඉච්ඡාමි භාතුනො ආගත' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො."

75. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස භගිනී ගිලානා හොති. සා චෙ භාතුනො සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානා. ආගච්ඡතු මෙ භාතා ඉච්ඡාමි භාතුනො ආගත' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො".

76. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුස්ස ඤාතකො ගිලානො හොති. සො චෙ භික්ඛුස්ස සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානො. ආගච්ඡතු භදන්තො. ඉච්ඡාමි භදන්තස්ස ආගත' න්ති. ගන්තබ්බං භික්ඛවෙ. සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො

77. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුගතිකො[1] ගිලානො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: 'අහං හි ගිලානො. ආගච්ඡන්තු භදන්තා.[2] ඉච්ඡාමි භදන්තානං ආගත' න්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ න ත්වෙව අප්පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො"ති.[3]

78. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස මහාවිහාරො[4] උද්‍රීයති. අඤ්ඤතරෙන උපාසකෙන අරඤ්ඤෙ භණ්ඩං ඡෙදාපිතං හොති. සො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි. "සචෙ භදන්තා තං භණ්ඩං ආවහාපෙය්‍යුං[5], දජ්ජාහං භදන්තානං තං භණ්ඩ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සඞ්ඝකරණීයෙන ගන්තුං. සත්තාහං සන්නිවත්තො කාතබ්බො"ති.

**වස්සාවාසභාණවාරං නිට්ඨිතං.**

---

1. "භික්ඛුගතිකො" ම ජ සං P T S. ජ. වි.
,, "භික්ඛුගතිකො" අ ට්ඨ.
2. "ආගච්ඡන්තු භික්ඛූ" P T S.
3. "කාතබ්බා" ම ජ සං. අ වි. ජ වි. ථා වි. ම නු ප
4. "විහාරො" ම ජ සං. P T S. ජ. වි. අ වි.
5. "අවහාපෙය්‍යුං" "අවහරෙය්‍යුං" ම ජ සං. P T S

73. "මහණෙනි, මෙහි මහණකුගේ පියා ගිලන් වූයේ වේ. හෙතෙමේ 'මම ගිලන් වූයේ වෙමි. මාගේ පුත්‍ර තෙමේ ඒවා. පුත්‍රයාගේ ඊම කැමැත්තෙමි, යි පුත්‍රයාගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ නො එවූ කල්හි ද 'ගිලන් බත් හෝ සොයන්නෙමි. ගලානොපස්ථායකයන් සඳහා බත් හෝ සොයන්නෙමි. ගිලන් බෙහෙත් හෝ සොයන්නෙමි. විචාරන්නෙමි යි හෝ උවැටන් හෝ කරන්නෙමි යි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ එවූ කල්හි කියනු කිම? සතියෙන් නැවතිය යුතු ය."

74 "මහණෙනි, මෙහි මහණකුගේ බෑයෙක් ගිලන් වූයේ වේ. හෙතෙමේ 'මම ගිලන් වූයේ වෙමි මාගේ භ්‍රාතෘ තෙමේ ඒවා. බෑයාගේ ඊම කැමැත්තෙමි' යි බෑයාගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් නැවතිය යුතු ය."

75 "මහණෙනි, මෙහි මහණකුගේ බුහුනක් ගිලන් වූවා වේ. ඕ තොමෝ 'මම ගිලන් වූවා වෙමි. මාගේ භ්‍රාතෘ තෙමේ ඒවා. භ්‍රාතෘගේ ඊම කැමැත්තෙමි'යි බෑයාගේ සමීපයට දූතයකු යවන්නී නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් නැවතිය යුතු ය."

76 "මහණෙනි, මෙහි මහණකුගේ නෑයෙක් ගිලන් වූයේ වේ. හෙ තෙමේ 'මම ගිලන් වූයේ වෙමි. පින්වතුන් වහන්සේ වඩිනා සේක්වා. පින්වතුන් වහන්සේගේ ඊම කැමැත්තෙමි'යි මහණකුගේ සමීපයට දූතයකු යවන්නේ නම්, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් නැවතිය යුතු ය."

77. "මහණෙනි, මෙහි භික්ෂූන්ගේ මෙහෙකරුවෙක් ගිලන් වූයේ වේ. හෙතෙමේ 'මම ගිලන් වූයේ වෙමි. පින්වතුන් වහන්සේලා වඩිනා සේක්වා. පින්වතුන් වහන්සේලාගේ ඊම කැමැත්තෙමි' යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යවන්නේ නම්, මහණෙනි, පණිවිඩ එවූ කල්හි සත්තාහකරණීයයෙන් යා යුතු ය. පණිවිඩ නො එවූ කල්හි නො යා යුතු ම ය. සතියෙන් නැවතිය යුතු ය."

78. එකල්හි සඞ්ඝයාගේ මහාවිහාරයක් නැසී යයි. එක්තරා උපාසකයකු විසින් වනයෙහි දැවබඩු සිඳවන ලද්දේ වේ. හෙ තෙමේ "පින්වතුන් වහන්සේලා ඒ බඩු අදවා (ගෙන්වා) ගන්නාහු නම්, මම ඒ බඩු පින්වතුන් වහන්සේලාට දෙමි" යි භික්ෂූන්ගේ සමීපයට දූතයකු යැවී ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සඞ්ඝයා පිළිබඳ කටයුතු නිසා යන්ට අනුදනිමි. සතියෙන් නැවතිය යුතු ය "

**වස්සාවාසභාණවාරය නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සූපගතා භික්ඛූ වාළෙහි උබ්බාළ්හා හොන්ති. ගණ්හිංසුපි. පරිපාතිංසුපි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ වාළෙහි උබ්බාළ්හා හොන්ති. ගණ්හන්තිපි. පරිපාතෙන්තිපි. 'එසෙව අන්තරායො'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

2. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ සිරිංසපෙහි උබ්බාළ්හා හොන්ති. ඩංසන්තිපි. පරිපාතෙන්තිපි. 'එසෙව[1] අන්තරායො'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

3. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ චොරෙහි උබ්බාළ්හා හොන්ති, විලුම්පන්තිපි. ආකොටෙන්තිපි. 'එසෙව අන්තරායො'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

4. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ පිසාචෙහි උබ්බාළ්හා හොන්ති. ආවිසන්තිපි. ඔජම්පි හරන්ති[2]. 'එසෙව අන්තරායො'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

5. ',ඉධ පන භික්ඛවෙ, වස්සූපගතානං භික්ඛූනං ගාමො අග්ගිනා දඩ්ඪො හොති. භික්ඛූ පිණ්ඩකෙන කිලමන්ති. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස.

6. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතානං භික්ඛූනං සෙනාසනං අග්ගිනා දඩ්ඪං හොති. භික්ඛූ සෙනාසනෙන කිලමන්ති. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

7. "ඉධ පන භික්ඛවෙ වස්සූපගතානං භික්ඛූනං ගාමො උදකෙන වූළ්හො හොති. භික්ඛූ පිණ්ඩකෙන කිලමන්ති. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

8. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතානං භික්ඛූනං සෙනාසනං උදකෙන වූළ්හං හොති. භික්ඛූ සෙනාසනෙන කිලමන්ති. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති. වස්සච්ඡෙදස්සා" ති.

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සූපගතානං භික්ඛූනං ගාමො චොරෙහි වුට්ඨාපිතො[3] හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යෙන ගාමො, තෙන ගන්තු" න්ති. ගාමො ද්වෙධා භිජ්ජිත්ථ[4]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යෙන බහුතරා, තෙන ගන්තු" න්ති. බහුතරා අස්සද්ධා හොන්ති අප්පසන්නා. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යෙන සද්ධා පසන්නා, තෙන ගන්තු" න්ති.

1. "එසො" ම නු ප. 2. "හනන්ති" "හරන්තිපි" ම ජ සං. සි.
3. "වුට්ඨාසි" ම ජ සං. P T S. ම නු ප. තො වි.
4. "භිජ්ජිත්ථ" ම ජ සං. P T S. තො වි. අ වි. ම නු ප. ජ වි.

1. එකල්හි කොසොල් දනව්වෙහි එක්තරා ආවාසයෙක වස් එළැඹි භික්ෂූහු චණ්ඩවනමෘගයන් විසින් පෙළන ලද්දාහු වෙති. අල්වා ද ගත්හ. මරා ද හෙළූහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු චණ්ඩවනමෘගයන් විසින් පෙළන ලද්දාහු වෙත්. අල්වා ද ගණිත්. මරා ද හෙළත්. 'මේ ම අන්තරාය ය'යි බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

2. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු සර්පයන් විසින් පෙළන ලද්දාහු වෙත්. ඩැසීම ද කෙරෙත්. මරා ද හෙළත්. 'මේ ම අන්තරාය ය' යි බැහර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

3 "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු සොරුන් විසින් පෙළන ලද්දාහු වෙත්. අල්ලා ගණිත්. ආයුධ වලින් පහර ද දෙත් 'මේ ම අන්තරාය ය'යි බැහර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

4. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු පිශාචයන් විසින් පෙළන ලද් දාහු වෙත්. ආවිෂ්ට ද වෙත්. ශරීරඔජාව ද ගණිත්. 'මේ ම අන්තරාය ය'යි බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

5. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූන්ගේ ගම ගින්නෙන් දැවුනේ වේ. භික්ෂූහු ආහාරයෙන් කලානත වෙති. 'මේ ම අන්තරාය ය'යි බැහර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

6. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූන්ගේ සෙනසුන් ගින්නෙන් දැවුනේ වේ. භික්ෂූහු සෙනසුනෙන් කලානත වෙත්. 'මේ ම අන්තරාය' යයි බැහර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

7. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූන්ගේ ගම ජලයෙන් යට වි ය. භික්ෂූහු ආහාරයෙන් කලානත වෙත්. "මේ ම අන්තරාය" යි බැහර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

8. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූන්ගේ සෙනසුන ජලයෙන් යට වි ය. භික්ෂූහු සෙනසුනෙන් කලානත වෙත්. 'මේ ම අන්තරාය ය'යි බැහර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

9. එකල්හි එක්තරා ආවාසයෙක වස් එළැඹි භික්ෂූන්ගේ ගම සොරුන් විසින් නගා හරිණ ලද්දේ ය. භාග්‍යවතුන්වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, ගම පිහිටි තැනට යන්ට අනුදනිමි". ගම දෙකට බිඳුනේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඉතා බොහෝ ගණනක් ගම් වැස්සන් ඇති තැනට යන්නට අනුදනිමි" ඉතා බොහෝ දෙනෙක් ශ්‍රද්ධා නැත්තෝ නො පහන් වූවෝ වෙති. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සැදැහැති පහන් මිනිසුන් ඇති තැනට යන්නට අනුදනිමි".

10, තෙන ඛො පන සමයෙන **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සූපගතා භික්ඛූ න ලභිංසු ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. භගවතො එතමත්ථං ආරොචෙසුං. ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ න ලභන්ති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස.

11. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ ලභන්ති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. න ලභන්ති සප්පායානි භොජනානි. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

12. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ ලභන්ති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. ලභන්ති සප්පායානි භොජනානි. න ලභන්ති සප්පායානි භෙසජ්ජානි. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

13. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතා භික්ඛූ ලභන්ති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. ලභන්ති සප්පායානි භොජනානි. ලභන්ති සප්පායානි. භෙසජ්ජානි න ලභන්ති පතිරූපං උපට්ඨාකං. 'එසෙව අන්තරායො' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

14. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතං භික්ඛුං ඉත්ථි නිමන්තෙති: 'එහි භන්තෙ, හිරඤ්ඤං වා තෙ දෙමි. සුවණ්ණං වා තෙ දෙමි. ඛෙත්තං වා තෙ දෙමි. වත්ථුං වා තෙ දෙමි. ගාවුං වා තෙ දෙමි. ගාවිං වා තෙ දෙමි. දාසං වා තෙ දෙමි. දාසිං වා තෙ දෙමි. ධීතරං වා තෙ දෙමි භරියත්ථාය. අහං වා තෙ භරියා හොමි. අඤ්ඤං වා තෙ භරියං ආනෙමී" ති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: 'ලහුපරිවත්තං ඛො චිත්තං වුත්තං භගවතා. සියාපි මෙ බ්‍රහ්මචරියස්ස අන්තරායො'' ති. පක්කමිතබ්බං අනාපත්ති වස්සච්ඡෙදස්ස.

15. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතං භික්ඛුං වෙසී නිමන්තෙති. -පෙ- ථුල්ලකුමාරී නිමන්තෙති. -පෙ- පණ්ඩකො නිමන්තෙති. -පෙ- ඤාතකා නිමන්තෙන්ති. -පෙ- රාජානො නිමන්තෙන්ති. -පෙ- චොරා නිමන්තෙන්ති. -පෙ- ධුත්තා නිමන්තෙන්ති. 'එහි භන්තෙ, හිරඤ්ඤං වා තෙ දෙම. සුවණ්ණං වා තෙ දෙම. ඛෙත්තං වා තෙ දෙම. වත්ථුං වා තෙ දෙම. ගාවුං වා තෙ දෙම. ගාවිං වා තෙ දෙම. දාසං වා තෙ දෙම. දාසිං වා තෙ දෙම. ධීතරං වා තෙ දෙම භරියත්ථාය. අඤ්ඤං වා තෙ භරියං ආනෙමා' ති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: 'ලහුපරිවත්තං ඛො චිත්තං වුත්තං භගවතා. සියාපි මෙ බ්‍රහ්මචරියස්ස අන්තරායො' ති. පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

10. එකල්හි කොසොල්දනව්වෙහි එක්තරා ආවාසයෙක වස් එළැඹි භික්ෂූහු රළු වූ හෝ මිහිරි වූ හෝ බොජුන් සෑහෙන පමණ නො ලැබූහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු රළු වූ හෝ මිහිරි වූ හෝ බොජුන් සෑහෙන පමණ නො ලබත්. 'මේ ම අනතරාය ය'යි බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

11. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු රළු වූ හෝ මිහිරි වූ හෝ බොජුන් සෑහෙන පමණ ලබත්. හිත වූ බොජුන් නො ලබත්. 'මේ ම අනතරාය ය'යි බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

12. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු රළු වූ හෝ මිහිරි වූ හෝ බොජුන් සෑහෙන පමණ ලබත්. හිත වූ බොජුන් ලබත්. හිත වූ බෙහෙත් නො ලබත්. 'මේ ම අනතරාය ය'යි බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

13. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂූහු රළු වූ හෝ මිහිරි වූ හෝ බොජුන් සෑහෙන පමණ ලබත්. හිත වූ බොජුන් ලබත්. හිත වූ බෙහෙත් ලබත්. සුදුසු වූ උපස්ථායකයකු නො ලබත්. 'මේ ම අනතරාය' යයි බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

14. "මහණෙනි, මෙහි ස්ත්‍රියක් 'ස්වාමීනි, එනු මැනව. නුඹ වහන්සේට අමුරන් හෝ දෙමි. නුඹ වහන්සේට රන් හෝ දෙමි. නුඹ වහන්සේට කෙතක් හෝ දෙමි. නුඹ වහන්සේට වත්තක් හෝ දෙමි. නුඹ වහන්සේට ගවයකු හෝ දෙමි. නුඹ වහන්සේට දැසියක හෝ දෙමි. නුඹ වහන්සේට දාසයකු හෝ දෙමි. නුඹ වහන්සේට දැසියකු හෝ දෙමි. නුඹ වහන්සේට භාර්‍යාව පිණිස දුව හෝ දෙමු. මම හෝ නුඹවහන්සේගේ භාර්‍යා වෙමි. නුඹ වහන්සේට අන් බිරියක හෝ ගෙණෙමි' යි වස් එළැඹි භික්ෂුනමකට නිමන්ත්‍රණය කෙරෙ යි. එහි දී ඒ භික්ෂුහුහට 'සිත යුහු ව පෙරළේ ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ම ය. මාගේ බ්‍රහ්මචර්‍යයට අනතරායයෙක් වන්නේ ය' යි මෙසේ අදහස් වේ නම්, බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

15. "මහණෙනි, මෙහි වස් එළැඹි භික්ෂුනමකට වෙසඟනක් නිමන්ත්‍රණය කරයි. –පෙ– විවාහයට නො පැමිණ වයසට පත් ස්ත්‍රියක් නිමන්ත්‍රණය කරයි, –පෙ– පණ්ඩකයෙක් නිමන්ත්‍රණය කරයි. –පෙ– නෑයෝ නිමන්ත්‍රණය කරත්. –පෙ– රජහු නිමන්ත්‍රණය කරත්. –පෙ– සොරු නිමන්ත්‍රණය කරත්. –පෙ– ධූර්තයෝ හෝ 'ස්වාමීනි, එනු මැනව. නුඹ වහන්සේට අමුරන් හෝ දෙමු. නුඹ වහන්සේට රන් හෝ දෙමු. නුඹවහන්සේට කෙතක් හෝ දෙමු. නුඹ වහන්සේට වත්තක් හෝ දෙමු. නුඹවහන්සේට ගවයකු හෝ දෙමු. නුඹවහන්සේට දෙනකු හෝ දෙමු. නුඹවහන්සේට දාසයකු හෝ දෙමු. නුඹ වහන්සේට දැසියක හෝ දෙමු. භාර්‍යාව පිණිස නුඹ වහන්සේට දුව හෝ දෙමු. නුඹ වහන්සේට අන් බිරියක හෝ ගෙණෙමු' යි. නිමන්ත්‍රණය කරත්. එහි දී ඒ භික්ෂුහුහට 'සිත යුහු ව පෙරළේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මාගේ බ්‍රහ්මචර්‍යයට අනතරායයෙක් වන්නේ ය' යි මෙසේ අදහස් වේ නම් බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

16. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු අස්සාමිකං නිධිං පස්සති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: ‘ලහුපරිවත්තං ඛො චිත්තං වුත්තං භගවතා. සියාපි මෙ බ්‍රහ්මචරියස්ස අන්තරායො’ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

17. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු පස්සති සම්බහුලෙ භික්ඛූ සඞ්ඝභෙදාය පරක්කමන්තෙ. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති ‘ගරුකො ඛො සඞ්ඝභෙදො වුත්තො භගවතා. මා මයි සම්මුඛීභූතෙ සඞ්ඝො භිජ්ජී’ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

18. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති ‘අමුකස්මිං කිර ආවාසෙ සම්බහුලා භික්ඛූ සඞ්ඝභෙදාය පරක්කමන්තී’ති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: ‘ගරුකො ඛො සඞ්ඝභෙදො වුත්තො භගවතා. මා මයි සම්මුඛීභූතෙ සඞ්ඝො භිජ්ජී’ ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

19. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති ‘අමුකස්මිං කිර ආවාසෙ සම්බහුලා භික්ඛූ සඞ්ඝභෙදාය පරක්කමන්තී’ ති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: ‘තෙ ඛො මෙ භික්ඛූ මිත්තා. ත්‍යාහං වක්ඛාමි. – ගරුකො ඛො ආවුසො, සඞ්ඝභෙදො වුත්තො භගවතා. මා ආයස්මන්තානං සඞ්ඝභෙදො රුච්චිත්ථාති. කරිස්සන්ති මෙ වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තී’ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

20. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති ‘අමුකස්මිං කිර ආවාසෙ සම්බහුලා භික්ඛූ සඞ්ඝභෙදාය පරක්කමන්තී’ ති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: ‘තෙ ඛො මෙ භික්ඛූ න මිත්තා. අපි ච යෙ තෙසං මිත්තා, තෙ මෙ මිත්තා. ත්‍යාහං වක්ඛාමි. තෙ වුත්තා තෙ වක්ඛන්ති – ගරුකො ඛො ආවුසො සඞ්ඝභෙදො වුත්තො භගවතා, මා ආයස්මන්තානං සඞ්ඝභෙදො රුච්චිත්ථාති. කරිස්සන්ති මෙ [1] වචනං, සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තීති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

21. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති ‘අමුකස්මිං කිර ආවාසෙ සම්බහුලෙහි භික්ඛූහි සඞ්ඝො භින්නො’ ති. තත්‍ර චෙ භික්ඛුනො එවං හොති: ‘තෙ ඛො මෙ භික්ඛූ මිත්තා, ත්‍යාහං වක්ඛාමි – ගරුකො ඛො ආවුසො සංඝභෙදො වුත්තො භගවතා. මා ආයස්මන්තානං සංඝභෙදො රුච්චිත්ථා ති. කරිස්සන්ති මෙ වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තීති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

1. "තෙසං" ම ඡ සං. අ වි. ජ පු

Free Distribution www.aathaapi.org

16. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් තෙමේ හිමියන් නැති නිධානයක් දකී යි. එහි දී ඒ මහණහුට 'සිත වනා පෙරළේ ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මාගේ බ්‍රහ්මචර්‍ය්‍යයට අනතුරායයෙක් වන්නේ යි මෙසේ අදහස් වේ නම්, බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

17. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් තෙමේ සඞ්ඝභෙදයට උත්සාහය කරන්නා වූ බොහෝ භික්ෂූන් දකී. එහි දී ඒ මහණහුට 'සඞ්ඝභෙදය තෙමේ බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මා හමු ව සිටිය දී සඞ්ඝ තෙමේ නො බිදේවා' යි මෙසේ අදහස් වේ නම්, බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

18. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ භික්ෂූහු සඞ්ඝභෙදයට උත්සාහ කෙරෙත් ල' යි අසයි. එහි දී ඒ මහණහුට 'සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. මා හමු ව සිටිය දී සඞ්ඝතෙමේ නො බිදේවා' යි මෙසේ අදහස් වේ නම්, බැහැර යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

19. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ භික්ෂූහු සඞ්ඝභෙදයට උත්සාහ කෙරෙත් ල' යි අසයි. එහි දී ඒ මහණහුට 'භික්ෂූහු මාගේ මිත්‍රයෝ ය. මම ඔවුන්ට 'ඇවැත්නි, සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. ආයුෂ්මතුන් හට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නෙමි. ඔහු මාගේ වචනය කරන්නෝ ය. අසන්නෝ ය. කන් යොමු කරන්නෝ ය' යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

20. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ භික්ෂූහු සඞ්ඝභෙදයට උත්සාහය කෙරෙත් ල' යි අසයි. මහණෙනි, එහි දී මහණහුට 'ඒ භික්ෂූහු මාගේ මිත්‍රයෝ නො වෙති. එහෙත් යම් කෙනෙක් ඔවුන්ගේ මිත්‍රයෝ වෙත් ද, ඔහු මාගේ මිත්‍රයෝ ය. මම ඔවුන්ට කියන්නෙමි. (මා විසින්) කියන ලද ඔහු ඔවුන්ට 'ඇවැත්නි, සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. ආයුෂ්මතුන්හට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නාහු ය. මාගේ වචනය කරන්නෝ ය. අසන්නෝ ය. කන් යොමු කරන්නෝ ය' යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

21. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ භික්ෂූන් විසින් සඞ්ඝ තෙමේ බිඳින ලද්දේ ල' යි අසයි. එහි දී මහණහුට "ඒ භික්ෂූහු මාගේ මිත්‍රයෝ ය. මම ඔවුන්ට 'ඇවැත්නි, සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදේද්දේ ය ආයුෂ්මතුන්හට සඞ්ඝභෙදය රුචි නො වේවා යි කියන්නෙමි. ඔහු මාගේ වචනය කරන්නෝ ය. අසන්නෝ ය. කන් යොමු කරන්නෝ ය' යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

22 "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති: 'අසුකස්මිං කිර ආවාසෙ සම්බහුලෙහි භික්ඛූහි සඞ්ඝෝ භින්නො" ති. තත්‍ර ච භික්ඛුනො එවං හොති: 'තෙ ඛො මෙ භික්ඛූ න මිත්තා. අපි ච යෙ තෙසං මිත්තා, තෙ මෙ මිත්තා. ත්‍යාහං වක්ඛාමි. තෙ වුත්තා තෙ වක්ඛන්ති - ගරුකො ඛො ආවුසො, සඞ්ඝභෙදො වුත්තො භගවතා. මා ආයස්මන්තානං සඞ්ඝභෙදො රුච්චිත්ථා' ති. කරිස්සන්ති මෙ[1] වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තී'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

23. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති: 'අසුකස්මිං[2] කිර ආවාසෙ සම්බහුලා භික්ඛුණියො සඞ්ඝභෙදාය පරක්කමන්තී' ති. තත්‍ර ච භික්ඛුනො එවං හොති: 'තා ඛො මෙ භික්ඛුණියො මිත්තා. තාහං වක්ඛාමි - ගරුකො ඛො භගිනියො සඞ්ඝභෙදො වුත්තො භගවතා. මා භගිනීනං සඞ්ඝභෙදො රුච්චිත්ථා' ති කරිස්සන්ති මෙ වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තී' ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

24. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති: 'අසුකස්මිං කිර ආවාසෙ සම්බහුලා භික්ඛුණියො සඞ්ඝභෙදාය පරක්කමන්තී' ති. තත්‍ර ච භික්ඛුනො එවං හොති: 'තා ඛො මෙ භික්ඛුණියො න මිත්තා. අපි ච යා තාසං මිත්තා, තා මෙ මිත්තා. තාහං වක්ඛාමි. තා වුත්තා තා වක්ඛන්ති - ගරුකො ඛො භගිනියො සංඝභෙදො වුත්තො භගවතා. මා භගිනීනං සංඝභෙදො රුච්චිත්ථා'ති. කරිස්සන්ති මෙ වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තී'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

25. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති: 'අසුකස්මිං කිර ආවාසෙ සම්බහුලාහි භික්ඛුණීහි සඞ්ඝෝ භින්නො' ති. තත්‍ර ච භික්ඛුනො එවං හොති 'තා ඛො මෙ භික්ඛුනියො මිත්තා. තාහං වක්ඛාමි - ගරුකො ඛො භගිනියො සංඝභෙදො වුත්තො භගවතා. මා භගිනීනං සංඝභෙදො රුච්චිත්ථා'ති. කරිස්සන්ති මෙ වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තී'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්ස."

26. "ඉධ පන භික්ඛවෙ, වස්සූපගතො භික්ඛු සුණාති: 'අසුකස්මිං කිර ආවාසෙ සම්බහුලාහි භික්ඛුණීහි සඞ්ඝෝ භින්නො' ති. තත්‍ර ච භික්ඛුනො එවං හොති 'තා ඛො මෙ භික්ඛුණියො න මිත්තා. අපි ච යා තාසං මිත්තා, තා මෙ මිත්තා. තාහං වක්ඛාමි. තා වුත්තා තා වක්ඛන්ති - ගරුකො ඛො භගිනියො සඞ්ඝභෙදො වුත්තො භගවතා. මා භගිනීනං සඞ්ඝභෙදො රුච්චිත්ථා'ති. කරිස්සන්ති මෙ වචනං. සුස්සූසිස්සන්ති. සොතං ඔදහිස්සන්තී'ති පක්කමිතබ්බං. අනාපත්ති වස්සච්ඡෙදස්සා" ති.

1. "තෙසං" ම ඡ සං. අ වි. ඡ පු. 2. "අමුකස්මිං" ම ඡ සං. P T S.

22. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ භික්ෂූන් විසින් සඞ්ඝ තෙමේ බිඳින ලද්දේ ල' යි අසයි. එහි දී ඒ මහණහුට 'ඒ භික්ෂූහු මාගේ මිත්‍රයෝ නො වෙති. එහෙත් යම් කෙනෙක් ඔවුන්ගේ මිත්‍රයෝ වෙත් ද, ඔහු මාගේ මිත්‍රයෝ ය. මම ඔවුන්ට කියන්නෙමි. මා විසින් කියන ලද ඔහු ඔවුන්ට 'ඇවැත්නි, සඞ්ඝභේදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. ආයුෂ්මතුන්හට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නාහු ය. මාගේ වචනය කරන්නාහු ය. අසන්නාහු ය. කන් යොමු කරන්නාහු' යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

23. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ මෙහෙණෝ සඞ්ඝභෙදයට උත්සාහ කරත් ල' යි අසයි. එහි දී මහණහුට 'ඒ මෙහෙණෝ මාගේ මිතුරෝ ය. ඔවුන්ට මම 'නැගනියෙනි, සඞ්ඝභෙදය බරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. නැගනියන්ට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නෙමි. මාගේ වචනය කරන්නාහු ය. අසන්නාහු ය. කන් යොමු කරන්නාහු ය" යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

24. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ මෙහෙණෝ සඞ්ඝභෙදයට උත්සාහ කරත් ල' යි අසයි. එහි දී ඒ මහණහුට 'ඒ මෙහෙණෝ මාගේ මිතුරෝ නො වෙත්. එහෙත් යම් කෙනෙක් ඔවුන්ගේ මිතුරෝ වෙත් ද, ඔහු මාගේ යෙහෙළියෝ වෙත්. මම ඔවුන්ට කියන්නෙමි. (මා විසින්) කියන ලද ඔහු, ඔවුන්ට – නැගනියෙනි, සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. නැගනියන්ට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නාහු ය. මාගේ වචනය කරන්නාහු ය. අසන්නාහු ය. කන් යොමු කරන්නාහු' ය යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

25. "මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ මෙහෙණන් විසින් සඞ්ඝ තෙමේ බිඳින ලද්දේ' යි අසයි. එහි දී ඒ මහණහුට ඒ මෙහෙණෝ මාගේ යෙහෙළියෝ ය. මම ඔවුන්ට 'නැගනියෙනි, සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. නැගනියන්ට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නෙමි. මාගේ වචනය කරන්නාහු ය. අසන්නාහු ය. කන් යොමු කරන්නාහු ය' යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

26. මහණෙනි, මෙහි වස් එළැඹි මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ මෙහෙණන් විසින් සඞ්ඝ තෙමේ බිඳින ලද්දේ' යි අසයි. එහි දී මහණහුට 'ඒ මෙහෙණෝ මාගේ යෙහෙළියෝ නො වෙත්. එහෙත් යම් මෙහෙණෝ ඔවුන්ගේ මිතුරෝ වෙත් ද, ඔවුන් මාගේ මිතුරෝ ය. මම ඔවුන්ට කියන්නෙමි. (මා විසින්) කියන ලද ඔහු, ඔවුන්ට – නැගනියෙනි, සඞ්ඝභෙදය බැරෑරුම් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය. නැගනියන්ට සඞ්ඝභෙදය රුචි නො වේවා' යි කියන්නාහු ය. මාගේ වචනය කරන්නාහු ය. අසන්නාහු ය. කන් යොමු කරන්නාහු ය' යි මෙසේ අදහස් වේ නම්, යා යුතු ය. වස සිඳීමෙන් ඇවැත් නො වේ."

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වජෙ වස්සං උපගන්තුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, වජෙ වස්සං උපගන්තු"න්ති. වජො වුට්ඨාසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යෙන වජො, තෙන ගන්තු"න්ති.

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු උපකට්ඨාය වස්සූපනායිකාය සත්ථෙන ගන්තුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සත්ථෙ වස්සං උපගන්තු"න්ති.

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු උපකට්ඨාය වස්සූපනායිකාය නාවාය ගන්තුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, නාවාය වස්සං උපගන්තු" න්ති.

30. තෙන ඛො පන සමයෙන භික්ඛු රුක්ඛසුසිරෙ වස්සං උපගච්ඡන්ති. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති. විපාචෙන්ති: "සෙය්‍යථාපි පිසාචිල්ලිකා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, රුක්ඛසුසිරෙ වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

31. තෙන ඛො පන සමයෙන භික්ඛු රුක්ඛවිටභියා වස්සං උපගච්ඡන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති විපාචෙන්ති: "සෙය්‍යථාපි මිගලුද්දකා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, රුක්ඛවිටභියා වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

32. තෙන ඛො පන සමයෙන භික්ඛු අජ්ඣොකාසෙ වස්සං උපගච්ඡන්ති. දෙවෙ වස්සන්තෙ රුක්ඛමූලම්පි නිම්බකොසම්පි උපධාවන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අජ්ඣොකාසෙ වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

33. තෙන ඛො පන සමයෙන භික්ඛු අසෙනාසනිකා වස්සං උපගච්ඡන්ති. සීතෙනපි උණ්හෙනපි කිලමන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

34. තෙන ඛො පන සමයෙන භික්ඛු ඡවකුටිකාය වස්සං උපගච්ඡන්ති. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති. විපාචෙන්ති: "සෙය්‍යථාපි ඡවඩාහකා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, ඡවකුටිකාය වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

35. තෙන ඛො පන සමයෙන භික්ඛු ඡත්තෙ වස්සං උපගච්ඡන්ති. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති. විපාචෙන්ති: "සෙය්‍යථාපි ගොපාලකා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං "න භික්ඛවෙ, ඡත්තෙ වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

27. එකල්හි එක්තරා මහණෙක් ගාලෙහි වස් එළැඹෙනු කැමැත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගාලෙහි වස් එළැඹෙන්නට අනුදනිමි". යි. ගාල අන් තැනකටගියේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගාල ගොස් සිටි තැනට යන්නට අනුදනිමි".

28. එකල්හි එක්තරා මහණෙක් වස් එළැඹීම ලං ව සිටි කල්හි ගැල් පදවන්නන් හා යනු කැමැත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගැලේ වස් එළැඹෙන්නට අනුදනිමි".

29. එකල්හි එක්තරා මහණෙක් වස් එළැඹීම ලං ව සිටි කල්හි නැවක යනු කැමැත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නැවෙහි වස් එළැඹෙන්නට අනුදනිමි" යි.

30. එකල්හි භික්ෂූහු ගස් සිදුරෙක වස් එළැඹෙත්. මිනිස්සු (මොවුන්) "පිශාච පැටවුන් සේ ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගස් සිදුරෙහි වස් නො එළැඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුලා ඇවැත් වේ."

31. එකල්හි භික්ෂූහු රුක් වෙළෙප්හි වස් එළැඹෙත්. මිනිස්සු (මොවුන්) "මුව වැද්දන් සේ ය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි රුක් වෙළෙප්හි වස් නො එළැඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුලාඇවැත් වේ"

32. එකල්හි භික්ෂූහු එළිමහනෙහි වස් එළැඹෙත්. වැසි වස්නා කල රුක් මුලට ද (ගෙවල්හි) අගුසෙවනට ද දුවත්. භාග්‍යවතුන් වහන්සේටමෙය සැලකළහ. "මහණෙනි, එළිමහනෙහි වස් නො එළැඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුලාඇවැත් වේ".

33. එකල්හි භික්ෂූහු සෙනසුන් නැත්තාහු වස් එළැඹෙත්. සීතයෙන් ද උෂ්ණයෙන් ද කලානත වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සෙනසුන් නැත්තහු විසින් වස් නො එළඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුලාඇවැත් වේ."

34. එකල්හි භික්ෂූහු සොහොන්කිළියෙහි වස් එළැඹෙත්. මිනිස්සු (මොවුන්) "මිනී දවන්නන් සේ ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සොහොන් කිළියෙහි වස් නො එළැඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුලාඇවැත් වේ."

35. එකල්හි භික්ෂූහු ඡත්‍රය යට වස් එළැඹෙත්. මිනිස්සු (මොවුන්) "ගොපලුන් සේ ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඡත්‍රය යට වස් නො එළැඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුලාඇවැත් වේ."

36. තෙන ඛො පන සමයෙන භික්ඛූ චාරියා වස්සං උපගච්ඡන්ති. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති. විපාචෙන්ති: "සෙය්‍යථාපි තිත්ථියා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, චාරියා වස්සං උපගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

37. තෙන ඛො පන සමයෙන **සාවත්ථියා** සංඝෙන කතිකා[1] කතා හොති: "අන්තරාවස්සං න පබ්බාජෙතබ්බ"න්ති. **විසාඛාය** මිගාරමාතුය නත්තා භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචි. භික්ඛූ එවමාහංසු: "සඞ්ඝෙන ඛො ආවුසො කතිකා කතා – 'අන්තරාවස්සං න පබ්බාජෙතබ්බ' න්ති. ආගමෙහි ආවුසො, යාව භික්ඛූ වස්සං වසන්ති. වස්සං වුත්ථා පබ්බාජෙස්සන්තී" ති.

38. අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා **විසාඛාය** මිගාරමාතුයා නත්තාරං එතදවොචුං: "එහිදානි ආවුසො පබ්බජාහී" ති. සො එවමාහ: "සචාහං භන්තෙ පබ්බජිතො අස්සං, අභිරමෙය්‍යං චාහං.[2] න'දානාහං භන්තෙ, පබ්බජිස්සාමි" ති. විසාඛා මිගාරමාතා උජ්ඣායති. ඛීයති. විපාචෙති: "කථං හි නාම අය්‍යා එවරූපං කතිකං කරිස්සන්ති: 'අන්තරාවස්සං න පබ්බාජෙතබ්බ' න්ති. කං කාලං ධම්මො න චරිතබ්බො" ති.

39. අස්සොසුං ඛො භික්ඛූ විසාඛාය මිගාරමාතුයා උජ්ඣායන්තියා ඛියන්තියා විපාචෙන්තියා. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, එවරූපා කතිකා කාතබ්බා: 'අන්තරා වස්සං න පබ්බාජෙතබ්බ' න්ති. යො කරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

40. තෙන ඛො පන සමයෙන ආයස්මතා **උපනන්දෙන** සක්‍යපුත්තෙන රඤ්ඤො **පසෙනදිස්ස** කොසලස්ස වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය.

41. සො තං ආවාස ගච්ඡන්තො අද්දස, අන්තරාමග්ගෙ ද්වෙ ආවාසෙ බහුචීවරකෙ. තස්ස එතදහොසි: "යන්නූනාහං ඉමෙසු ද්විසු ආවාසෙසු වස්සං වසෙය්‍යං, එවං මෙ බහුං චීවරං[3] උප්පජ්ජිස්සතී" ති.

42. සො තෙසු ද්විසු ආවාසෙසු වස්සං වසි. රාජා පසෙනදි කොසලො උජ්ඣායති. ඛීයති. විපාචෙති: "කථං හි නාම අය්‍යො උපනන්දො සක්‍යපුත්තො අම්හාකං වස්සාවාසං පටිස්සුණිත්වා විසංවාදෙස්සති? නනු භගවතා අනෙක පරියායෙන මුසාවාදො ගරහිතො? මුසාවාදා වෙරමණී පසත්ථා?" ති.

1 "එවරූපා කතිකා" ම ඡ සං. 2. "අභිරමෙය්‍යාමහං" ම ඡ සං. P T S.
3. "බහුචීවරං" P T S. අ වි. ජ පු. ථා වි.

36. එකල්හි භික්ෂූහු සැළියෙහි වස් එළැඹෙත්. මිනිස්සු (මොවුන්) "තීර්ථකයන් සේ ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සැළියෙහි වස් නො එළැඹිය යුතු ය. යමෙක් එළැඹෙන්නේ නම්, දුකුළාඇවැත් වේ"

37. එකල්හි සැවැත් නුවර දී සඞ්ඝයා විසින් "වස ඇතුළත පැවිදි නො කළ යුතු ය" යි කතිකාවක් කරණ ලද්දී ය. මිගාරමාතු වූ **විශාඛාවගේ** මුනුබුරෙක් භික්ෂූන් කරා එළඹ පැවිද්ද ඉල්ලී ය. භික්ෂූහු "ඇවැත්නි, 'වස ඇතුළත පැවිදි නො කළ යුතු ය' යි සඞ්ඝයා විසින් කතිකාවක් කරණ ලද්දී ය. ඇවැත්නි, භික්ෂූහු යම් තාක් වස් වැස නිමවත් ද ඒ තාක් බලා-පොරොත්තු වෙව. වස් වැස නිම කළාහු පැවිදි කරන්නාහු" යි මෙසේ කීහ.

38. ඉක්බිති ඒ භික්ෂූහු වස් වැස නිම කළාහු මිගාර මාතු වූ විශාඛාවගේ මුණුබුරාට "ඇවැත්නි, දැන් එව. පැවිදි වෙව" යි කීහ. හෙ තෙමේ "ස්වාමීනි, මම පැවිදි වූයේ වීම් නම්, මම (සසුනෙහි) සිත් අලවා වසන්නෙමි. 'ස්වාමීනි, මීම දැන් පැවිදි නො වන්නෙමි' යි මෙසේ කීයේ ය. මිගාරමාතෘ වූ විශාඛා තොමෝ 'පින්වතුන් වහන්සේලා කෙසේ නම් වස ඇතුළත දී පැවිදි නො කට යුතු ය' යි මෙබඳු කතිකාවක් කරත් ද ? කිනම් කලෙක ධර්මය තෙමේ නො හැසිරිය යුතු දැ?' යි අවමන් කරයි. නින්දා කරයි. දෙස් කියයි.

39. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දෙස් කියන මිගාරමාතෘ වූ විශාඛාවගේ ඒ කතාව ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, 'වස ඇතුළත දී පැවිදි නො කට යුතු ය' යි මෙබඳු කතිකා නො කට යුතු ය. යමෙක් කරන්නේ නම්, දුකුළාඇවැත් වේ

40. එකල්හි ශාක්‍යපුත්‍ර වූ ආයුෂ්මත් **උපනන්ද** තෙරුන් විසින් **පසේනදි කොසොල්** රජුගේ පෙරවස් විසීමට ආරාධනාවක් ගිවිස ගන්නා ලද්දේ ය.

41. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ අතර මග දී බොහෝ සිවුරු ඇති ආවාස දෙකක් දුටුයේ ය. ඔහුට "මම මේ ආවාස දෙක්හි වස් වසන්නෙම් නම් යහපත් ය. එසේ ඇති කල්හි මට බොහෝ සිවුරු ලැබෙන්නේ ය" යි මෙබඳු සිතෙක් වි ය.

42. හෙ තෙමේ ඒ ආවාස දෙක්හි වස් විසී ය. පසේනදි කොසොල් රජ තෙමේ "කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ආයෑී උපනන්ද ස්ථවිර තෙමේ අපගේ වස් ආරාධනාව ගිවිස (පිළිගෙණ) වෙනස් කෙරේ ද? භාග්‍යවතුන් වහන්සේ විසින් මුසාවාදය නොයෙක් අයුරින් ගරහන ලද්දේ නො වේ ද? මුසාවාදයෙන් වැළැක්ම පසසන ලද්දේ නො වේ දැ?' යි අවමන් කරයි. නින්දා කරයි. දෙස් කියයි.

43. අස්සොසුං ඛො භික්ඛූ රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස වස්සාවාසං පටිස්සුණිත්වා විසංවාදෙස්සති? නනු භගවතා අනෙකපරියායෙන මුසාවාදෙ ගරහිතො? මුසාවාදා වෙරමණී පසත්ථා"? ති.

44. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසංඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං පටිපුච්ඡි: "සච්චං කිර ත්වං උපනන්ද, රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස වස්සාවාසං පටිස්සුණිත්වා විසංවාදෙසී?" ති. "සච්චං භගවා[1]". විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස, රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස වස්සාවාසං පටිස්සුණිත්වා විසංවාදෙස්සති නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන මුසාවාදෙ ගරහිතො? මුසාවාදා වෙරමණී පසත්ථා? නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය - පෙ - විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

45. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො පස්සති අන්තරාමග්ගෙ ද්වෙ ආවාසෙ බහුචීවරකෙ. තස්ස එවං හොති: 'යන්නූනාහං ඉමෙසු ද්වීසු ආවාසෙසු වස්සං වසෙය්‍යං. එවං මෙ බහුං චීවරං උප්පජ්ජිස්සතී'ති. සො තෙසු ද්වීසු ආවාසෙසු වස්සං වසති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

46. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති. පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ[2] විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව අකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

47. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව සකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

66. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා අකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස"

1 "භගවාති" ම ඡ සං. 2. "පාටිපදෙන" P T S.

Free Distribution www.aathaapi.org

43. භික්ෂූහු අවමන් කරණ නින්ද, කරණ දෙස් කියන පසේනදි කොසොල් රජුගේ ඒ කතාව ඇසූහ. ඔවුන් අතුරෙහි යම් ඒ ආශාරහිත භික්ෂූහු වෙත් ද, ඔහු "කෙසේ නම් ශාක්‍යපුත්‍ර වූ ආයුෂමත් උපනන්ද තෙමේ පසේනදි කොසොල් රජුගේ වස් විසීමට ආරාදනාව පිළිගෙණ වෙනස් කෙරේ ද ? භාග්‍යවතුන් වහන්සේ විසින් මුසාවාදය නොයෙක් අයුරින් ගරහන ලද්දේ නො වේ ද? මුසාවාදයෙන් වැළැක්ම පසසන ලද්දේ නො වේ ද?" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්.

44. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි ලා භික්ෂුසඞ්ඝයා රැස් කරවා ශාක්‍යපුත්‍ර වූ ආයුෂමත් උපනන්ද තෙරුන් පිළිවිසිසේක. "උපනන්දය, පසේනදි කොසොල් රජුගේ වස් විසීමට ආරාදනාව පිළිගෙණ වෙනස් කෙළෙහි සැබෑ ද?" "භාග්‍යවතුන් වහන්ස, සැබව". භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "හිස්පුරුෂය, තෝ කෙසේ නම් පසේනදි කොසොල් රජුගේ වස් ආරාදනාව පිළි ගෙණ වෙනස් කෙළෙහි ද? හිස්පුරුෂය, මා විසින් මුසාවාදය නොයෙක් අයුරින් ගරහන ලද්දේ නො වේ ද? මුසාවාදයෙන් වැළැක්ම පසසන ලද්දේ නො වේ ද? හිස්පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ -පෙ- නොවේ" යි ගැරහූසේක. ගරහා දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූසේක:

45. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස්ආරාදනා-වක් පිළිගන්නා ලද්දේ ය. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ අතර මග දී බොහෝ සිවුරු ඇති ආවාස දෙකක් දකියි. ඔහුට 'මම මේ ආවාස දෙකෙහි වස් වසන්නෙම් නම් යෙහෙක. එසේ ඇති කල්හි මට බොහෝ සිවුරු ලැබෙන්නේ ය' යි මෙබඳු සිතෙක් උපන. හෙතෙමේ ඒ ආවාස දෙකෙහි වස් විසී.ය. මහණෙනි, ඒ මහණහුට පෙරවස ද නො පෙණේ. ගිවිසීමෙහි ද දුකුළාඇවැත් වේ."

46. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් ආරාදනාවක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පරිභොග කටයුතු දිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු නැත්තේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුට පෙරවස ද නො පෙණේ. ගිවිසීමෙහි ද දුකුළාඇවැත් වේ."

47. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් ආරාදනාවක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණේ. සෙනසුන් පණවයි. පැන් හා පරිභොග කටයුතු දිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුට පෙරවස ද නො පෙණේ. ගිවිසීමෙහි ද දුකුළාඇවැත් වේ."

48. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් ආරාදනාවක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණේ. සෙනසුන් පණවයි. පැන් හා පරිභොග කටයුතු දිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු රහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුට පෙරවස ද නො පෙණේ. ගිවිසීමෙහි ද දුකුළාඇවැත් වේ."


Free Distribution www.aathaapi.org

49. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො දිවසෙව සකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

50. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා සත්තාහ-කරණීයෙන පක්කමති. සො තං සත්තාහං බහිද්ධා වීතිනාමෙති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

51. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති. සො තං සත්තාහං අන්තො සන්නිවත්තං කරොති. තස්ස භික්ඛවෙ භික්ඛුනො පුරිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති."

52. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො සත්තාහං අනාගතාය පවාරණාය සකරණීයො පක්කමති. ආගච්ඡෙය්‍ය වා සො භික්ඛවෙ, භික්ඛු තං ආවාසං, න වා ආගච්ඡෙය්‍ය, තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති."

53. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගන්ත්වා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව අකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

54. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය සො තං ආවාසං ගන්ත්වා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව සකරණීයො පක්කමති - පෙ - සො ද්වීහතීහං වසිත්වා අකරණීයො පක්කමති - පෙ - සො ද්වීහතීහං වසිත්වා සකරණීයො පක්කමති - පෙ - සො ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති. සො තං සත්තාහං බහිද්ධා වීතිනාමෙති තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස. - පෙ - සො ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති. සො තං සත්තාහං අන්තො සන්නිවත්තං කරොති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පුරිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති."

49. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් විසීමෙක් (=වස් විසුමට ආරාධනාවක්) පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැළවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පරිභොග කටයුතු දිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුට පෙරවස ද නො පෙණේ. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

50. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙර වස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැළවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්‍තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය පිටත ඉක්මවයි. මහණෙනි, ඒ මහණහුට පෙර වස ද නො පෙණේ. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

51. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැළවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්‍තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය ඇතුළත නැවතීම (=පෙරළා ඊම) කෙරෙයි. මහණෙනි, ඒ මහණහුගේ පෙර වස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

52. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙතෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැළවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ පවාරණ දිනය නො පැමිණි සතියක් ඇති කල්හි (=පවාරණ දිනයට සතියක් තිබිය දී) කටයුතු සහිතව බැහැර යයි. මහණෙනි, ඒ මහණ තෙමේ ඒ ආවාසයට පැමිණෙන්නේ හෝ නො පැමිණෙන්නේ හෝ වේවා මහණෙනි, ඒ මහණහුගේ පෙරවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

53. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට ගොස් පොහොය කරයි. පැළවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු නැත්තේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුගේ පෙරවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

54. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙර වස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට ගොස් පොහොය කරයි. පැළවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු සහිත වූයේ බැහැර යයි. -පෙ- හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු රහිත වූයේ බැහැර යයි -පෙ- හෙ තෙමේ දෙතුන්දිනක් වැස කටයුතු සහිත වූයේ බැහැර යයි. -පෙ- හෙතෙමේ දෙතුන් දිනක් වැස සත්‍තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය පිටත දී ඉක්මවයි. මහණෙනි, ඒ මහණහුගේ පෙරවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ -පෙ- හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්‍තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය ඇතුළත නැවතීම (=පෙරළා ඊම) කරයි. මහණෙනි, ඒ මහණහුගේ පෙරවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

55. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පුරිමිකාය. සො තං ආවාසං ගන්ත්වා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො සත්තාහං අනාගතාය පවාරණාය සකරණීයො පක්කමති. ආගච්ඡෙය්‍ය වා සො භික්ඛවෙ, භික්ඛු තං ආවාසං, න වා ආගච්ඡෙය්‍ය, තස්ස භික්ඛවෙ භික්ඛුනො පුරිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති."

56. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව අකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

57. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව සකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

58. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා අකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

59. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා සකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස."

60. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති, සො තං සත්තාහං බහිද්ධා වීතිනාමෙති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස"

55. "මහණෙනි, මෙහි මහණකු විසින් පෙරවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට ගොස් පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝ- දිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ පවාරණ දිනය නො පැමිණි සතියක් ඇති කල්හි කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණ තෙමේ ඒ ආවාසයට එන්නේ හෝ නො එන්නේ හෝ (වේවා) මහණෙනි, ඒ මහණහුගේ පෙරවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

56. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු රහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුගේ පසු වස ද නො පෙණෙයි ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

57. "මහණෙනි, මෙහි මහණකු විසින් පසු වස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

58. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු රහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

59. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුලාඇවැත් වේ."

60. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පැලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්තාහකරණීයයෙන් බැහැර යයි හෙ තෙමේ ඒ සතිය පිටත දී ඉක්මවයි මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුලා ඇවැත් වේ."

61. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති **පච්ඡිමිකාය.** සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං. උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති. සො තං සත්තාහං අන්තො සන්නිවත්තං කරොති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති.”

62. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගච්ඡන්තො බහිද්ධා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො සත්තාහං අනාගතාය කොමුදියා චාතුමාසිනියා සකරණීයො පක්කමති. ආගච්ඡෙය්‍ය වා සො භික්ඛවෙ, භික්ඛු තං ආවාසං, න වා ආගච්ඡෙය්‍ය, තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති.”

63. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගන්ත්වා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. **සෙනාසනං** පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව අකරණීයො පක්කමති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස.”

64. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගන්ත්වා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො තදහෙව සකරණීයො පක්කමති. – පෙ – සො ද්වීහතීහං වසිත්වා අකරණීයො පක්කමති – පෙ – සො ද්වීහතීහං වසිත්වා සකරණීයො පක්කමති –පෙ– ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති. සො තං සත්තාහං බහිද්ධා වීතිනාමෙති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච න පඤ්ඤායති. පටිස්සවෙ ච ආපත්ති දුක්කටස්ස. -පෙ- සො ද්වීහතීහං වසිත්වා සත්තාහකරණීයෙන පක්කමති. සො තං සත්තාහං අන්තො සන්නිවත්තං කරොති. තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති.”

65. “ඉධ පන භික්ඛවෙ, භික්ඛුනා වස්සාවාසො පටිස්සුතො හොති පච්ඡිමිකාය. සො තං ආවාසං ගන්ත්වා උපොසථං කරොති. පාටිපදෙ විහාරං උපෙති. සෙනාසනං පඤ්ඤපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. පරිවෙණං සම්මජ්ජති. සො සත්තාහං අනාගතාය කොමුදියා චාතුමාසිනියා සකරණීයො පක්කමති. ආගච්ඡෙය්‍ය වා සො භික්ඛවෙ, භික්ඛු තං ආවාසං, න වා ආගච්ඡෙය්‍ය, තස්ස භික්ඛවෙ, භික්ඛුනො පච්ඡිමිකා ච පඤ්ඤායති. පටිස්සවෙ ච අනාපත්ති.”

**වස්සූපනායිකක්ඛන්ධකො නිට්ඨිතො තතියො[1].**

---

1. “ඛන්ධකං නිට්ඨිතං තතියං” අ වි. තො වි. ජ වි. ම නු ප. සි මු.

61. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් (= වස් විසුමට ආරාදනාවක්) පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පෑලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය ඇතුළත නැවතීම (= පෙරළා ඊම) කරයි. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

62. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට යන්නේ පිටත දී පොහොය කරයි. පෑලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ වෂ්ා මාස සතර අවසන්හි යෙදෙන කුමුදුමල් පිපුම් හෝ සඳරැස් ඇති ඉල් මස පුර පසළොස්වකට සතියක් තිබිය දී කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණ තෙමේ ඒ ආවාසයට එන්නේ හෝ නො එන්නේ හෝ වේවා. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

63. "මහණෙනි, මෙහි මහණකු විසින් පසු වස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට ගොස් පොහොය කරයි. පෑලවියෙහි වෙහෙරට පැමිණෙයි සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝ දිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු රහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුළාඇවැත් වේ."

64. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට ගොස් පොහොය කරයි. පෑලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ එදවස ම කටයුතු සහිත වූයේ බැහැර යයි -පෙ- හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු රහිත වූයේ බැහැර යයි. -පෙ- හෙ තෙමේ දෙතුන් දිනක් වැස කටයුතු සහිත වූයේ බැහැර යයි -පෙ- හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය පිටත දී ඉක්මවයි. මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද නො පෙණෙයි. ගිවිසීමෙහි ද දුකුළාඇවැත් වේ -පෙ- හෙ තෙමේ දෙතුන් දිනක් වැස සත්තාහකරණීයයෙන් බැහැර යයි. හෙ තෙමේ ඒ සතිය ඇතුළත නැවතීම (= පෙරළා ඊම) කරයි. මහණෙනි, ඒ මහණහුට පසුවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

65. "මහණෙනි, මෙහි මහණකු විසින් පසුවස පිණිස වස් විසීමෙක් පිළිගන්නා ලද්දේ වේ. හෙ තෙමේ ඒ ආවාසයට ගොස් පොහොය කරයි. පෑලවියෙහි වෙහෙරට පැමිණෙයි. සෙනසුන් පණවයි. පැන් හා පිරිබෝදිය එළවා තබයි. පිරිවෙණ හමදියි. හෙ තෙමේ චාතුමාසිනී කොමුදී නම් ඉල් පුර පසළොස්වකට සතියක් තිබිය දී කටයුතු සහිත වූයේ බැහැර යයි. මහණෙනි, ඒ මහණ තෙමේ ඒ ආවාසයට එන්නේ හෝ නො එන්නේ හෝ (වේවා ) මහණෙනි, ඒ මහණහුගේ පසුවස ද පෙණෙයි. ගිවිසීමෙහි ද ඇවැත් නො වේ."

**තෙවෙනි වස්සූපනායිකක්ඛන්ධකය නිමි.**

තස්ස උද්දානං:-

1. උපගන්තුං[1] කදා චෙව කති අන්තරා[2] වස්ස ච,
න ඉච්ඡන්ති ච සඤ්චිච්ච උක්කණ්ඨිතුං උපාසකො.

2. ගිලානො මාතා පිතා ච[3] භාතා ච අථ ඤාතකො,
භික්ඛුගතිකො විහාරො වාළා චාපි සිරිංසපා.

3. චොරා චෙව පිසාචා ච දඩ්ඪා තදුභයෙන ච,
වූළ්හොදකෙන වුට්ඨාසි බහුතරා ච දායකා.

4. ලූඛප්පණීතසප්පායභෙසජ්ජුපට්ඨාකෙන ච
ඉත්ථී වෙසී කුමාරී ච පණ්ඩකො ඤාතකෙන ච.

5. රාජා චොරා[4] ධුත්තා නිධි[5] භෙද අට්ඨවිධෙන ච[6],
වජො සත්ථො ච[7] නාවා ච සුසිරෙ විටභාය ච[8].

6. අජ්ඣොකාසෙ[9] වස්සාවාසො අසෙනාසනිකෙන ච,
ඡවකුටිකා ඡත්තෙ ච චාටියා ච උපෙන්ති තෙ.

7. කතිකා පටිස්සුණිත්වා බහිද්ධා ච උපොසථා[10],
පුරිමිකා පච්ඡිමිකා යථා ඤායෙන යොජයෙ.

8. අකරණීයො[11] පක්කමති සකරණීයො[12] තථෙව ච,
ද්වීහතීහං [13]වසිත්වාන සත්තාහකරණෙන ච[14].

9. සත්තාහනාගතා චෙව ආගච්ඡෙය්‍ය න එය්‍ය වා,
වත්ථුද්දානෙ අන්තරිකා තන්තිමග්ගං නිසාමයෙති

**ඉමම්හි ඛන්ධකෙ වත්ථූ[15] දෙව පණ්ණාස[16].**

---

1. "උපගන්තු" අ වි. ජ වි. ම නු ප. තො වි. 2. "අන්තරා" ම ඡ සං. P T S.
3. "මාතා ච පීතා" ම ඡ සං. P T S. 4 "රාජචොරා" ම නු ප. තො වි.
5. "ධුත්තා ච නිධි" තො වි. ම නු ප. 6. "භෙද අට්ඨවිධෙන ච" ම ඡ සං.
7. "වජසත්ථා" ම ඡ සං
" "වජාසත්ථා ච" P T S. තො වි. ම නු ප.
8. "විටභියා" ම ඡ සං.
9. "අජ්ඣොකාසෙ ච" මනුප. තො වි. 10. "උපොසථො" අ වි. ජ වි
11. "අකරණී" ම ඡ සං. 12. "සකරණී" ම ඡ සං.
13. "ද්වීහතීහා ච පුන ච" ම ඡ සං. ම නු ප. තො වි.
" "ද්වීහාතීහා ච දුන" P T S.
14. "සත්තාහකරණීයෙන ච" ම ඡ සං. P T S. 15 "වත්ථූනි" ම ඡ සං
16. "පණ්ණාසා" අ වි. ජ වි.

එහි උද්දානය (වස්තු නාමමාලාව) මෙසේ ය:-

1. වස් එළඹෙන්නට අනුදැනීම, කවර ඍතුවක ද යි පිළිවිසීම, කෙතෙක් ද යි පිළිවිසීම, වස් වැස චාරිකාවෙහි හැසිරීම, වස් විසීමට නො කැමැති වීම, දැන දැන ආරාමය ඉක්මවීම, වස්සුක්කඩ්ඪනය, **උදෙන** උපාසක.

2. ගිලන් වීම, මවු ගිලන් වීම, පියා ගිලන් වීම, සොහොයුරකු ගිලන් වීම, නෑයකු ගිලන් වීම, මෙහෙකරු ගිලන් වීම, විහාරය, චණ්ඩ වල් සිවුපාවුන්ගේ අන්තරාය, සර්පයන්ගේ අන්තරාය,

3. සොරුන්ගේ අන්තරාය, පිශාචයන්ගේ අන්තරාය, ගම ගින්නෙන් දැවීම, සෙනසුන ගින්නෙන් දැවීම, ගම හා සෙනසුන දියෙන් යට වීම හෝ අන්තරායට පත් වීම, ගම හැර යෑම, වැඩි ගම්වැස්සන් වෙතට යෑම, දෙන්නන් කරා යෑම.

4. රළු හෝ මිහිරි ආහාර නො ලැබීම, හිත බොජුන් නො ලැබීම, හිත බෙහෙත් නො ලැබීම, උපස්ථායකයකු නො ලැබීම, ස්ත්‍රිය, වෙසඟන, තරුණි කුමරිය, පණ්ඩක, නෑ යන මොවුන්ගෙන් වන අන්තරාය.

5. රජ, සොර, ධූර්ත යන මොවුන්ගෙන් වන අන්තරාය, නිධානය, සඞ්ඝභෙදය, ගාල, ගැල, නැව, රුක්සිදුර, රුක්වෙළෙප.

6. එළිමහනෙහි වස් විසීම, සෙනසුන් නැත්තහු වස් විසීම, සොහොන් කිළියෙහි, ඡත්‍රයෙහි, සැළියෙහි ඒ භික්ෂූහු වස් එළඹෙත් යන්න ද

7. කතිකාව, වස් ගිවිස බැහැර වස් විසීම, යන මොහු වෙත්. අන් තැනක පොහොය කොට වස් වසන තැනට පැමිණීම, පෙරවස පසුවස වශයෙන් සුදුසු පරිදි යොදන්නේ ය.

8. සත්තාහකරණීයයෙන් නිකරුණේ බැහැර යයි. එසේ ම කරුණු සහිත ව බැහැර යයි. දෙතුන් දිනක් වැස සත්තාහකරණීයයෙන් බැහැර යයි.

9. පවාරණයට සත්දිනක් තිබිය දී ගොස් පෙරළා පැමිණෙන්නේ හෝ නො පැමිණෙන්නේ හෝ වසට අන්තරාය නැති බව - යන මොහු උද්දානයෙහි ඇතුළත් වස්තූහු වෙත්. පෙළමග නුවණින් පරීක්ෂා කරන්නේ ය.

**මේ ඛන්ධකයෙහි වස්තූහු දෙපණසෙකි.**

# පවාරණක්ඛන්ධකං.

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡිංසු.

2. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "කෙන නු ඛො මයං උපායෙන සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසෙය්‍යාම? න ච පිණ්ඩකෙන කිලමෙය්‍යාමා?"ති.

3. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "සචෙ ඛො මයං අඤ්ඤමඤ්ඤං නෙව ආලපෙය්‍යාම, න සල්ලපෙය්‍යාම, යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමෙය්‍ය සො ආසනං පඤ්ඤපෙය්‍ය පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපෙය්‍ය, අවක්කාරපාතිං ධොවිත්වා උපට්ඨාපෙය්‍ය, පානීයං පරිභොජනීයං උපට්ඨාපෙය්‍ය. යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමෙය්‍ය, සචස්ස භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛෙය්‍ය, භුඤ්ජෙය්‍ය, නො චෙ ආකඞ්ඛෙය්‍ය අප්පහරිතෙ වා ඡඩ්ඩෙය්‍ය, අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙය්‍ය, සො ආසනං උද්ධරෙය්‍ය, පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙය්‍ය, අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙය්‍ය, පානීයං පරිභොජනීයං පටිසාමෙය්‍ය, භත්තග්ගං සම්මජ්ජෙය්‍ය, යො පස්සෙය්‍ය පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං සො උපට්ඨාපෙය්‍ය, සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙය්‍ය, නත්වෙව තප්පච්චයා වාචං භින්දෙය්‍ය. එවං ඛො මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසෙය්‍යාම. න ච පිණ්ඩකෙන කිලමෙය්‍යාමා" ති.

4. අථ ඛො තෙ භික්ඛූ අඤ්ඤමඤ්ඤං නෙව ආලපිංසු. න සල්ලපිංසු. යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමති, සො ආසනං පඤ්ඤපෙති. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපති. අවක්කාරපාතිං ධොවිත්වා උපට්ඨාපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති, භුඤ්ජති. නො චෙ ආකඞ්ඛති, අප්පහරිතෙ වා ඡඩ්ඩෙති. අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙති. සො ආසනං උද්ධරති. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙති. අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙති. පානීයං පරිභොජනීයං පටිසාමෙති. භත්තග්ගං සම්මජ්ජති. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං, සො උපට්ඨාපෙති. සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙති. න ත්වෙව තප්පච්චයා වාචං භින්දති.

Free Distribution www.aathaapi.org

# පවාරණක්ඛන්ධකය.

1. එකල්හි භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** උයන්හි **අනේපිඬුසිටුහුගේ** ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි දුටුමිතුරු වූ **දැකිමිතුරු** වූ බොහෝ භික්ෂූහු **කොසොල්** දනව්වෙහි එක්තරා ආවාසයෙක වස් එළඹියහ.

2. එකල්හි ඒ භික්ෂූන්ට "අපි කිනම් උපායයකින් සමගි ව සතුටු වෙමින් විවාද නො කරමින් පහසුවෙන් වස් වසන්නෙමු ද? ආහාර ලැබීමෙන් ක්ලාන්ත නො වන්නෙමු ද?" යි මෙබඳු සිතෙක් උපන.

3. නැවැත ඒ භික්ෂූන්ට "ඉදින් අපි උනුන් කතා නො කරන්නෙමු නම්, වදන් පිළිවදන් වසයෙන් කතා නො කරන්නෙමු නම්, යමෙක් පළමු කොට ගමෙහි පිඬු පිණිස හැසිර පෙරළා එන්නේ ද, හෙ තෙමේ අසුන් පණවන්නේ නම්, පා ධෝනා දිය පාපුටුව නො සේදූ පා තබන පුවරුව එළවා තබන්නේ නම්, ඉඳුල් ලන බඳුන සෝදා එළවන්නේ නම්, පැන් පිරිබෝදිය එළවන්නේ නම්, යමෙක් පසු ව ගමෙහි පිඬු පිණිස හැසිර පෙරළා පැමිණෙන්නේ ද, වළඳා ඉතිරි වූ ආහාරයෙක් වන්නේ ද, (එය) කැමැත්තේත් වන්නේ ද, එය වළඳන්නේ නම්, නො කැමැත්තේ නම්, නිල් තණ නැති තැනෙක දමන්නේ නම්, සතුන් නැති දියෙහි හෝ පා කොට හරින්නේ නම්, අසුන් ඔසොවා තබන්නේ නම්, පා ධෝනා දිය පාපුටුව පා තබන පුවරුව තැන් පත් කරන්නේ නම්, ඉඳුල් ලන බඳුන සෝදා තැන් පත් කරන්නේ නම්, පැන් (කළය) පිරිබෝදිය (සැළ) තැන් පත් කරන්නේ නම්, බොජුන්හල හමදින්නේ නම්, යමෙක් සිස් වූ පැන්කළය හෝ පිරිබෝදියසැළ හෝ වැසිකිළිදියකළය හෝ දක්නේ ද, හෙ තෙමේ එළවා තබන්නේ නම්, ඉදින් ඔහුට (එය) ඔසොවනු නො හැකි වේ නම්, අත වැනීමෙන් දෙවැන්නකු අමතා අත්විලඟින් (දෙදෙනකු බැඳගත් අත් වලින්) එළවා තබන්නේ නම්, ඒ හෙතුවෙන් කතා නො කරන්නේ නම්, අපි මෙසේ සමගි ව **සතුටුවෙමින්** විවාද නො කරමින් පහසුවෙන් වස් වසන්නෙමු. ආහාරයෙන් ක්ලාන්ත නො වන්නෙමු" යි මෙබඳු සිතෙක් විය.

4. ඉක්බිති ඒ භික්ෂූහු උනුන් නො ම කතා කළහ. වදන් පිළිවදන් වශයෙන් නො ම කතා කළහ. යමෙක් පළමු ව ගමෙහි පිඬු පිණිස හැසිර හැරී ඒ ද, හෙ තෙමේ අසුන් පණවයි. පා ධෝනා දිය පාපුටුව පාපුවරුව එළවා තබයි. ඉඳුල් ලන බඳුන සෝදා එළවයි. පැන් පිරිබෝදිය එළවයි. යමෙක් පසු ව ගමෙහි පිඬු පිණිස හැසිර පෙරළා ඒ ද, වළඳා ඉතිරි වූ ආහාරයෙක් වන්නේ ද කැමැත්තේ නම්, එය වළඳයි. නො කැමැත්තේ නම්, නිල් තණ නැති තැනෙක හෝ දමයි. සතුන් නැති දියෙහි හෝ පා කොට හරියි. හෙ තෙමේ අසුන් ඔසොවා තබයි. පා ධෝනා දිය පාපුටුව පාපුවරුව තැන්පත් කරයි. ඉඳුල් ලන බඳුන සෝදා තැන්පත් කරයි. පැන් (කළය) පිරිබෝදිය (සැළ) තැන් පත් කරයි. බොජුන්හල හමදියි. යමෙක් සිස් වූ පැන්කළය හෝ පිරිබෝදියකළය හෝ වැසිකිළිදියකළය හෝ දක්නේ ද, හෙ තෙමේ එය එළවයි. ඉදින් ඔහුට (එය) නො හැක්කේ නම් හස්තසංඥවෙන් දෙවැන්නකු අමතා අත්විලඟින් එළවයි. ඒ හෙතුවෙන් කතා නො කරන්නේම ය.

5. ආචිණ්ණං ඛො පනෙතං වස්සං වුත්ථානං භික්ඛූනං භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා තෙමාසච්චයෙන සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන **සාවත්ථි,** තෙන පක්කමිංසු. අනුපුබ්බෙන යෙන සාවත්ථි, **ජෙතවනං, අනාථපිණ්ඩිකස්ස** ආරාමො, යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

6. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං. අථ ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "කච්චි භික්ඛවෙ, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ? න ච පිණ්ඩකෙන කිලමිත්ථා?" ති.

7. "ඛමනීයං භගවා, යාපනීයං භගවා. සමග්ගා ච මයං භන්තෙ, සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිම්හ. න ච පිණ්ඩකෙන කිලමිම්හා" ති.

8. ජානන්තාපි තථාගතා පුච්ඡන්ති. ජානන්තාපි න පුච්ඡන්ති. කාලං විදිත්වා පුච්ඡන්ති. කාලං විදිත්වා න පුච්ඡන්ති. අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති නො අනත්ථසංහිතං. අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං.

9. ද්වීහාකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛූ පටිපුච්ඡන්ති, "ධම්මං වා දෙසෙස්සාම. සාවකානං වා සික්ඛාපදං පඤ්ඤපෙස්සාමා" ති.

10. අථ ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "යථා කථම්පන තුම්හෙ භික්ඛවෙ, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ? න ච පිණ්ඩකෙන කිලමිත්ථා?" ති.

11. "ඉධ මයං භන්තෙ, සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡිම්හා. තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: "කෙන නු ඛො මයං උපායෙන සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසෙය්‍යාම? න ච පිණ්ඩකෙන කිලමෙය්‍යාමා?" ති.

5. භාග්‍යවතුන් වහන්සේ දැකීමට එළැඹීම ය යන මෙය වස් වැස නිම කළ භික්ෂූන්ගේ පුරුද්දෙක් ම වේ. එකල්හි වස් වැස නිම කළ ඒ භික්ෂූහු තෙමස ඇවෑමෙන් සෙනසුන් තැන්පත් කොට පාසිවුරු ගෙණ සැවැත්නුවරට ගියහ. පිළිවෙළින් ගොස් සැවැත් නුවර ජේතවනයෙහි වූ **අනාථපිණ්ඩික** සිටුගේ ආරාමයට එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ.

6. ආගන්තුක භික්ෂූන් හා පිළිසඳරකතා කිරීම යන මෙය භාග්‍යවත් වූ බුදුවරුන්ගේ පුරුද්දෙක් ම ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කිම? (සැපපහසුකම්) ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම සමගි වූවෝ සතුටු වෙමින් විවාද නො කරමින් පහසුවෙන් වස් විසූවහු ද? ආහාරයෙන් පීඩා නො ලැබූහු ද?"යි යන මෙය ඒ භික්ෂූන්ගෙන් අසා වදාළසේක.

7. "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. ස්වාමීනි, අපි සමගි ව සතුටු සිත් ඇති ව විවාද නො කරමින් පහසුවෙන් වස් විසූමු. ආහාරයෙන් ද ක්ලාන්ත නො වීමු"යි (භික්ෂූහු සැළකළහ).

8. තථාගතවරු දන්නෝ ද විචාරත්. දන්නෝ ද නො විචාරත්. කාලය දැන විචාරත්. කාලය දැන නො විචාරත්. තථාගතවරු අර්ථයෙන් යුක්ත වූවක් විචාරත්. අනර්ථයෙන් යුක්ත වූවක් නො විචාරත්. අනර්ථයෙන් යුක්ත වචනයෙහි තථාගතයන් වහන්සේලාගේ මාර්ගඝාතයෙන් ම සේතු නැසීම වේ.

9. භාග්‍යවත් බුදුවරයෝ "ධර්මය හෝ දෙසන්නෙමු. ශ්‍රාවකයන්ට ශික්ෂාපද හෝ පණවන්නෙමු" යි දෙ අයුරකින් භික්ෂූන් විචාරත්.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, තෙපි කෙසේ නම් සමගි ව සතුටු සිත් ඇති ව විවාද නො කරමින් පහසුවෙන් වස් විසූවහු ද? ආහාරයෙන් ක්ලාන්ත නො වූහු ද?" යි යන මෙය ඒ භික්ෂූන්ගෙන් විචාළසේක.

11. "ස්වාමීනි, අපි මෙහි මිතුරු වූ දැඩිමිතුරු වූ බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි එක්තරා ආවාසයෙක වස් එළැඹියෙමු. "ස්වාමීනි, ඒ අපට 'අපි කිනම් උපායයකින් සමගි ව සතුටු සිත් ඇති ව විවාද නො කරමින් පහසුවෙන් වස් වසන්නෙමු ද? ආහාරයෙන් ද ක්ලාන්ත නො වෙමු ද?'යි මේ සිතෙක් උපන.

12. "තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: 'සචෙ ඛො මයං අඤ්ඤමඤ්ඤං නෙව ආලපෙය්‍යාම, න සල්ලපෙය්‍යාම, යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමෙය්‍ය, සො ආසනං පඤ්ඤපෙය්‍ය, පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපෙය්‍ය, අවක්කාරපාතිං ධොවිත්වා උපට්ඨාපෙය්‍ය, පානීයං පරිභොජනීයං උපට්ඨාපෙය්‍ය, යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමෙය්‍ය, සචස්ස භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛෙය්‍ය, භුඤ්ජෙය්‍ය, නො චෙ ආකඞ්ඛෙය්‍ය, අප්පහරිතෙ වා ඡඩ්ඩෙය්‍ය, අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙය්‍ය, සො ආසනං උද්ධරෙය්‍ය, පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙය්‍ය, අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙය්‍ය, පානීයං පරිභොජනීයං පටිසාමෙය්‍ය, භත්තග්ගං සම්මජ්ජෙය්‍ය, යො පස්සෙය්‍ය, පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං, සො උපට්ඨාපෙය්‍ය, සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙය්‍ය, න ත්වෙව තප්පච්චයා වාචං භින්දෙය්‍ය, එවං ඛො මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසෙය්‍යාම. න ච පිණ්ඩකෙන කිලමෙය්‍යාමා'ති.

13. "අථ ඛො මයං භන්තෙ, අඤ්ඤමඤ්ඤං නෙව ආලපිම්හා. න සල්ලපිම්හා. යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමති, සො ආසනං පඤ්ඤපෙති. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපති. අවක්කාරපාතිං ධොවිත්වා උපට්ඨාපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති, භුඤ්ජති. නො චෙ ආකඞ්ඛති, අප්පහරිතෙ වා ඡඩ්ඩෙති. අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙති. සො ආසනං උද්ධරති. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙති. අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙති. පානීයං පරිභොජනීයං පටිසාමෙති. භත්තග්ගං සම්මජ්ජති. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං සො උපට්ඨාපෙති. සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙති. න ත්වෙව තප්පච්චයා වාචං භින්දති. එවං ඛො මයං භන්තෙ, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිම්හා. න ච පිණ්ඩකෙන කිලමිම්හා" ති.

14. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "අඵාසුකඤ්ඤෙව[1] කිර'මෙ[2] භික්ඛවෙ, මොඝපුරිසා වුත්ථා[3] සමානා ඵාසුකම්හ[4] වුත්ථා'ති පටිජානන්ති. පසුසංවාසඤ්ඤෙව කිර'මෙ භික්ඛවෙ, මොඝපුරිසා වුත්ථා සමානා ඵාසුකම්හ වුත්ථා'ති පටිජානන්ති. එළකසංවාසඤ්ඤෙව කිර 'මෙ භික්ඛවෙ, මොඝපුරිසා වුත්ථා සමානා ඵාසුකම්හ වුත්ථා'ති පටිජානන්ති. සපත්තසංවාසඤ්ඤෙව කිර 'මෙ භික්ඛවෙ, මොඝපුරිසා වුත්ථා සමානා ඵාසුකම්හ වුත්ථා'ති පටිජානන්ති. කථං හි නාම'මෙ[5] භික්ඛවෙ, මොඝපුරිසා මූගබ්බතං තිත්ථියසමාදානං සමාදියිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, මූගබ්බතං තිත්ථියසමාදානං සමාදියිතබ්බං. යො සමාදියෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං තීහි ඨානෙහි පවාරෙතුං දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. සා වො භවිස්සති අඤ්ඤමඤ්ඤානුලොමතා ආපත්තිවුට්ඨානතා විනයපුරෙක්ඛාරතා. එවඤ්ච පන භික්ඛවෙ, පවාරෙතබ්බං: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො-

1. "අඵාසුඤ්ඤෙව" ම ඡ සං. PTS. 2 "කිරිමෙ" ජ වි. 3. "වුට්ඨා" ම ඡ සං.
4. "ඵාසුම්හා" ම ඡ සං. PTS. 5. "කථං හි නාම භික්ඛවෙ" ම ඡ සං.
5. "කථං හි නාම මෙ භික්ඛවෙ" අ වි. ම නු ප.

12. “ස්වාමීනි, ඒ අපට ‘අපි කතා නො කරන්නෙමු නම්, වදන් පිළිවදන් වසයෙන් කතා නො කරන්නෙමු නම්, යමෙක් ගමෙහි පිඬු පිණිස හැසිර පළමුකොට පෙරළා එන්නේ ද හෙ තෙමේ අසුන් පණවන්නේ නම්, පා දෝනා දිය පාපුටුව නො සේදූ පා තබන පුවරුව එළවන්නේ නම්, ඉඳුල් ලන බඳුන සෝදා එළවන්නේ නම්, පැන් පිරිබෝදිය එළවන්නේ නම්, යමෙක් ගමෙහි පිඬු පිණිස හැසිර පසු ව පෙරළා එන්නේ ද, වළඳා ඉතිරි වූ ආහාරයෙක් වන්නේ ද, කැමැත්තේ ත් වන්නේ ද, එය වළඳන්නේ නම්, නො කැමැත්තේ නම්, තිල් තණ නැති තැනෙක දමන්නේ නම්, සතුන් නැති දියෙහි හෝ පා කොට හරින්නේ නම්, හෙ තෙමේ අසුන් ඔසොවා තබන්නේ නම්, පා දෝනා දිය පාපුටුව නො සේදූ පා තබන පුවරුව තැන්පත් කරන්නේ නම්, ඉඳුල් ලන බඳුන සෝදා තැන් පත් කරන්නේ නම් පැන් (කළය) පිරිබෝදිය (සැළ) තැන් පත් කරන්නේ නම්, බොජුන්හල හමදින්නේ නම්, යමෙක් සිස් වූ පැන්කළය හෝ පිරිබෝදියකළය හෝ වැසිකිළිදියකළය හෝ දක්නේ ද, හෙ තෙමේ එය එළවන්නේ නම්, ඔහුට නො හැක්කේ නම්, හස්තසංඥාවෙන් දෙවැන්නකු අමතා අත්විලඟුවෙන් එළවන්නේ නම්, ඒ හෙතුවෙන් කතා නො කරන්නේ නම්, මෙසේ අපි සමගි ව සතුටු සිත් ඇති ව විවාද නො කරමින් පහසුවෙන් වස් වසන්නෙමු. ආහාරයෙන් කලානත නො වන්නෙමු’ යි මේ සිත් උපන.”

13. “ඉක්බිති ස්වාමීනි, අපි උනුන් කතා නො කෙළෙමු. වදන් පිළිවදන් වසයෙන් කතා නො කෙළෙමු. යමෙක් ගමෙහි පිඬු පිණිස හැසිර පළමු කොට පෙරළා ඒ ද, හෙ තෙමේ අසුන් පණවයි. පා දෝනා දිය පාපුටුව පා පුවරුව එළවයි. ඉඳුල් ලන බඳුන සෝදා එළවයි. පැන් පිරිබෝදිය එළවයි. යමෙක් ගමෙහි පිඬු පිණිස හැසිර පසු ව පෙරළා ඒ නම්, වළඳා ඉතිරි වූ ආහාරයෙක් වේ ද, කැමැත්තේ නම්, එය වළඳයි නො කැමැත්තේ නම්, තිල් තණ නැති තැනෙක හෝ දමයි. සතුන් නැති දියෙහි හෝ පා කොට හරියි. හෙ තෙමේ අසුන් ඔසොවා තබයි. පා දෝනා දිය පාපුටුව පාපුවරුව තැන් පත් කරයි. ඉඳුල් ලන බඳුන සෝදා තැන් පත් කරයි. පැන් (කළය) පරිභොග කට යුතු දිය (සැළ) තැන්පත් කරයි. බොජුන්හල හමදියි. යමෙක් සිස් වූ පැන්කළය හෝ පිරිබෝදියකළය හෝ වැසිකිළිදියකළය දක්නේ ද හෙ තෙමේ (එය) එළවයි. ඔහුට නො හැක්කේ නම්, හස්තසංඥාවෙන් දෙවැන්නකු අමතා අත්විලඟුවෙන් එළවයි. ඒ හේතුවෙන් කතා නො කරන්නේ ය. ස්වාමීනි, මෙසේ අපි සමගි ව සතුටු සිත් ඇති ව විවාද නො කරමින් පහසුවෙන් වස් විසීමු. ආහාරයෙන් ද කලානත නො වීමු” යි (සැළකළහ).

14. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. “මහණෙනි, මේ සිස් පුරුෂයෝ නො පහසුවෙන් ම විසුවෝ ‘පහසුවෙන් විසූම්හ’ යි ප්‍රතිඥා කෙරෙත්. මහණෙනි, මේ හිස්පුරුෂයෝ සිවුපාවුන්ගේ එක් ව විසීම වැන්නක් ම කළෝ ‘පහසුවෙන් ම විසූම්හ’යි ප්‍රතිඥා කෙරෙත්. මහණෙනි, මේ හිස්පුරුෂයෝ එළුවන්ගේ එක් ව විසීම වැන්නක් ම කළාහු ‘පහසුවෙන් ම විසූම්හ’ යි ප්‍රතිඥා කෙරෙත්. මහණෙනි, මේ හිස් පුරුෂයෝ සතුරන්ගේ එක් ව විසීම වැන්නක් ම කළෝ ‘පහසුවෙන් ම විසුම්හ’ යි ප්‍රතිඥා කෙරෙත්. මහණෙනි, කෙසේ නම් මේ හිස්පුරුෂයෝ ගොළුවතක් වූ තීර්ථකයන්ගේ සමාදානයක් සමාදන් ව ගත්තාහු ද? මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස -පෙ- නො වේයැ” යි ගරහා දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක. “මහණෙනි, ගොළුවතක් වූ තීර්ථකසමාදානය නො සමාදන් විය යුතු ය. යමෙක් සමාදන් වන්නේ නම්, දුකුලාඇවැත් වේ”යි වදාළ සේක. “මහණෙනි, වස් වැස නිම කළ භික්ෂූන්ට දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ සැකයෙන් හෝ යන කරුණු තුණින් පවරන්නට හෙවත් දුටු හෝ ඇසූ හෝ සැක කළ හෝ තමාගේ දෙෂයන් කියන්නට භික්ෂූන් කැමති කරවා ගැණීමට අනුදනිමි. ඒ පැවරීම තොපට උනුන්ගේ අනුලෝම්බව ද ඇවතින් නැගී සිටීම ද විනය පෙරටු කොට ගත් බව ද වන්නේ ය. මහණෙනි, මෙසේ පැවරිය යුතුය. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යː-

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අජ්ජ පවාරණා යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා" ති.

15. ථෙරෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො "සඞ්ඝං ආවුසො පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. තතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී" ති.

16. නවකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "සඞ්ඝං භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි භන්තෙ, සඞ්ඝං –පෙ– තතියම්පි භන්තෙ, සඞ්ඝං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී" ති.

17. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙසු අච්ඡන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙසු අච්ඡිස්සන්තී" ති.

18. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙසු අච්ඡන්තී ?" ති. "සච්චං භගවා".

විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙසු අච්ඡිස්සන්ති ?

19. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙසු අච්ඡිතබ්බං, යො අච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, සබ්බෙහෙව උක්කුටිකං නිසින්නෙහි පවාරෙතු" න්ති.

"සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. අද පවාරණය යි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ පවරන්නේ ය" යි.

15. ස්ථවිර භික්ෂුනම විසින් උතුරුසඟ සිවුර එකස් කොට උත්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ "ඇවැත්නි, සඞ්ඝයාට (මාගේ) දුටු ඇවැතින් හෝ ඇසූ ඇවැතින් හෝ සැක කළ ඇවැතින් හෝ කියන්නට පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දෙස් දක්නෙම් පිළියම් කරන්නෙමි" යි මෙසේ සඞ්ඝ තෙමේ කිය යුතු වන්නේ ය. "ඇවැත්නි, දෙවනු ද සඞ්ඝයාහට (මාගේ) දුටු ඇවැතින් හෝ ඇසූ ඇවැතින් හෝ සැක කළ ඇවැතින් හෝ (කියන්නට) පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දෙස් දක්නෙම් පිළියම් කරන්නෙමි. ඇවැත්නි, තෙවනු ද සඞ්ඝයාහට (මාගේ) දුටු ඇවැතින් හෝ ඇසූ ඇවැතින් හෝ සැක කළ ඇවැතින් හෝ (කියන්නට) පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දෙස් දක්නෙම් පිළියම් කරන්නෙමි" යි.

16. නවක භික්ෂුනම විසින් උතුරුසඟ සිවුර එකස් කොට උත්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ "ස්වාමීනි, සඞ්ඝයාහට (මාගේ) දුටු ඇවැතින් හෝ ඇසූ ඇවැතින් හෝ සැක කළ ඇවැතින් හෝ කියන්නට පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දෙස් දක්නෙම් පිළියම් කරන්නෙමි. ස්වාමීනි, දෙවනු ද සඞ්ඝයාහට –පෙ– ස්වාමීනි, තෙවනු ද සඞ්ඝයාහට (මාගේ) දුටු ඇවැතින් හෝ ඇසූ ඇවැතින් හෝ සැක කළ ඇවැතින් හෝ කියන්නට පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දෙස් දක්නෙම් පිළියම් කරන්නෙමි" යි.

17. එකල්හි ෂඩ්වර්ග මහණෝ උත්කුටුකයෙන් හුන් ස්ථවිර භික්ෂූන් පවරණ කල්හි අසුන්හි හිඳිත්. යම් ඒ භික්ෂූහු ආශා රහිත වෙත් ද, ඒ භික්ෂූහු "ෂඩ්වර්ග මහණෝ කෙසේ නම් උත්කුටුකයෙන් හුන් ස්ථවිර භික්ෂූන් පවරණ කල්හි අසුන්වල හිඳිත් ද ? " යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්.

18. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ෂඩ්වර්ග මහණෝ උත්කුටුකයෙන් හුන් ස්ථවිර භික්ෂූන් පවරණ කල්හි අසුන්වල හිඳිත් ල යනු සැබෑ ද ?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය."

භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ උත්කුටුකයෙන් හුන් ස්ථවිර භික්ෂූන් පවරණ කල්හි අසුන්වල හිඳිත් ද ? " යි ගැරහූ සේක.

19. "මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස –පෙ– නො වේ" යි ගරහා දැහැමි කතා කොට "මහණෙනි, උත්කුටුකයෙන් හුන් ස්ථවිර භික්ෂූන් පවාරණය කරණ කල්හි අසුන්වල නො හිඳිය යුතු ය. යමෙක් හිඳින්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, උත්කුටුකයෙන් හුන් සියලු දෙනා විසින් ම පවරන්නට අනුදනිමි" යි භික්ෂූන් ඇමතූ සේක.

20. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ථෙරො ජරාදුබ්බලො යාව සබ්බෙ පවාරෙන්තීති[1] උක්කුටිකං නිසින්නො ආගමයමානො මුච්ඡිතො පපති.

21. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තදනන්තරා උක්කුටිකං නිසීදිතුං යාව පවාරෙති. පවාරෙත්වා ආසනෙ නිසීදිතු"න්ති.

22. අථ ඛො භික්ඛූනං[2] එතදහොසි: "කති නු ඛො පවාරණා?"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ද්වෙ'මා භික්ඛවෙ, පවාරණා: චාතුද්දසිකා[3] පණ්ණරසිකා ච. ඉමා ඛො භික්ඛවෙ, ද්වෙ පවාරණා"ති.

23. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කති නු ඛො පවාරණකම්මානී?"ති[4]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "චත්තාරිමානි භික්ඛවෙ, පවාරණකම්මානි: අධම්මෙන වග්ගං පවාරණකම්මං. අධම්මෙන සමග්ගං පවාරණකම්මං. ධම්මෙන වග්ගං පවාරණකම්මං. ධම්මෙන සමග්ගං පවාරණකම්මං."

24. "තත්‍ර භික්ඛවෙ, යමිදං අධම්මෙන වග්ගං පවාරණකම්මං, න භික්ඛවෙ, එවරූපං පවාරණකම්මං කාතබ්බං. න ච මයා එවරූපං පවාරණකම්මං අනුඤ්ඤාතං."

25. "තත්‍ර භික්ඛවෙ, යමිදං අධම්මෙන සමග්ගං පවාරණකම්මං, න භික්ඛවෙ, එවරූපං පවාරණකම්මං කාතබ්බං. න ච මයා එවරූපං පවාරණකම්මං අනුඤ්ඤාතං."

26. "තත්‍ර භික්ඛවෙ, යමිදං ධම්මෙන වග්ගං පවාරණකම්මං, න භික්ඛවෙ, එවරූපං පවාරණකම්මං කාතබ්බං. න ච මයා එවරූපං පවාරණකම්මං අනුඤ්ඤාතං."

27. "තත්‍ර භික්ඛවෙ, යමිදං ධම්මෙන සමග්ගං පවාරණකම්මං, එවරූපං භික්ඛවෙ, පවාරණකම්මං කාතබ්බං. එවරූපඤ්ච මයා පවාරණකම්මං අනුඤ්ඤාතං."

28. "තස්මාතිහ භික්ඛවෙ, එවරූපං පවාරණකම්මං කරිස්සාම, යදිදං ධම්මෙන සමග්ගන්ති එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති."

29. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "සන්නිපතථ භික්ඛවෙ, සඞ්ඝො පවාරෙස්සතී"ති.

30. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: "අත්ථි භන්තෙ, භික්ඛු ගිලානො. සො අනාගතො"ති. "අනුජානාමි භික්ඛවෙ, ගිලානෙන භික්ඛුනා පවාරණං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'පවාරණං දම්මි. පවාරණං මෙ හර. පවාරණං මෙ ආරොචෙහි[5] මමත්ථාය පවාරෙහී'ති.

1. "පවාරෙන්ති". සි අ වි. 2. "තෙසං භික්ඛූනං" අ වි. ජ වි. තො වි.
3. "චාතුද්දසිකා ච" ම ජ සං. ජ වි. මු නු ප. 4. "පවාරණකම්මානි" සි
5. "පවාරණං මෙ ආරොචෙහි" අයං පාඨො - සී. මු. පොත්ථකෙ න දිස්සති.

20. එකල්හි ජරායෙන් දුර්වල වූ එක්තරා තෙර නමක් සියල්ලෝ යම් තාක් කල් පවරත් ද, ඒ තාක් කල් බලාපොරොත්තු වෙමින් උත්කුටුකයෙන් හුන්නේ මුසපත් ව වැටුනේ ය.

21. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යම් තාක් කල් (තෙමේ) පවරා ද, ඒ අතර උත්කුටුකයෙන් හිඳින්නට, පවාරණය කොට අසුනෙහි හිඳින්නට අනුදනිමි".

22. ඉක්බිති භික්ෂූන්ට "පවාරණයෝ කෙතෙක් දැ?" යි මේ අදහස වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, චාතුද්දසික ය, පණ්ණරසික යැ' යි මේ පවාරණ දෙකෙකි. මහණෙනි, මේ පවාරණ දෙක ය".

23. එකල්හි භික්ෂූන්ට "පවාරණකර්මයෝ කෙතෙක් දැ?" යි යන මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අධර්මයෙන් ව්‍යග්‍ර වූ පවාරණකර්මය, අධර්මයෙන් සමග්‍ර වූ පවාරණකර්මය, ධර්මයෙන් ව්‍යග්‍ර වූ පවාරණ කර්මය, ධර්මයෙන් සමග්‍ර වූ පවාරණකර්මයැ යි මේ පවාරණකර්ම සතරෙකි."

24. "මහණෙනි, ඔවුන් අතුරෙහි යම් මේ අධර්මයෙන් ව්‍යග්‍ර වූ පවාරණකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ පවාරණකර්මය නො කට යුතු ය. මා විසින් එබඳු වූ පවාරණකර්මයෙක් නො ද අනුදන්නා ලද්දේ ය."

25. "මහණෙනි, ඔවුන් අතුරෙහි යම් ඒ අධර්මයෙන් සමග්‍ර වූ පවාරණකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ පවාරණකර්මය නො කට යුතු ය. එබඳු වූ පවාරණකර්මයෙක් මා විසින් නො ද අනුදන්නා ලද්දේ ය."

26. "මහණෙනි, ඔවුන් අතුරෙහි යම් ඒ ධර්මයෙන් ව්‍යග්‍ර වූ පවාරණ-කර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ පවාරණකර්මය නො කට යුතු ය. මා විසින් එබඳු පවාරණකර්මයෙක් නො ද අනුදන්නා ලද්දේ ය."

27. "මහණෙනි, ඔවුන් අතුරෙහි යම් ඒ ධර්මයෙන් සමග්‍ර වූ පවාරණකර්මයෙක් වේ ද, මහණෙනි, එබඳු වූ පවාරණකර්මය කටයුතු ය. මා විසින් පණවන ලද්දේ ද එබඳු වූ පවාරණකර්මයෙකි."

28. "මහණෙනි, එහෙයින් මෙහි ධර්මයෙන් සමගි වූ යම් පවාරණකර්මයෙක් වේ ද, එබඳු වූ පවාරණකර්මය කරන්නෙමු යි, මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු ම ය."

29. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, සඞ්ඝ තෙමේ පවරන්නේ ය. (එහෙයින්) රැස් වවු" යි භික්ෂූන් ඇමතූ සේක.

30. මෙසේ වදාළ කල්හි එක්තරා මහණෙක් තෙමේ "ස්වාමීනි, ගිලන් මහණෙක් ඇත්තේ ය. හෙ තෙමේ නො ආයේ ය" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය. "මහණෙනි, ගිලන් මහණහු විසින් පවාරණය දෙන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ දිය යුතු ය: ඒ ගිලන් මහණහු විසින් එක් මහණකු වෙත ගොස් උතුරුසඟසිවුර එකස් කොට උත්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'පවාරණය දෙමි. මාගේ පවාරණය ගෙණ යව. මාගේ පවාරණය සැලකරව. මා පිණිස පවරව' යි මෙසේ කිය යුතු වන්නේ ය.

කායෙන විඤ්ඤාපෙති, වාචාය විඤ්ඤාපෙති, කායෙන වාචාය විඤ්ඤාපෙති, දින්නා හොති පවාරණා. න කායෙන විඤ්ඤාපෙති, න වාචාය විඤ්ඤාපෙති, න කායෙන වාචාය විඤ්ඤාපෙති; න දින්නා හොති පවාරණා. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, සො භික්ඛවෙ, ගිලානො භික්ඛු මඤ්චෙන වා පීඨෙන වා සඞ්ඝමජ්ඣෙ ආනෙත්වා පවාරෙතබ්බං. සචෙ භික්ඛවෙ, ගිලානුපට්ඨාකානං භික්ඛූනං එවං හොති[1]: 'සචෙ ඛො මයං ගිලානං ඨානා චාවෙස්සාම, ආබාධො වා අභිවඩ්ඪිස්සති, කාලකිරියා වා භවිස්සතී' ති. න භික්ඛවෙ, ගිලානො[2] ඨානා චාවෙතබ්බො. සඞ්ඝෙන තත්ථ ගන්ත්වා පවාරෙතබ්බං. න ත්වෙව වග්ගෙන සඞ්ඝෙන පවාරෙතබ්බං. පවාරෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්ස."

31. "පවාරණාහාරකො[3] චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය තත්ථෙව පක්කමති, අඤ්ඤස්ස දාතබ්බා පවාරණා. පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය තත්ථෙව විබ්භමති -පෙ- කාලං කරොති -පෙ- 'සාමණෙරො' පටිජානාති -පෙ- 'සික්ඛං පච්චක්ඛාතකො' පටිජානාති -පෙ- 'අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො' පටිජානාති -පෙ- 'උම්මත්තකො' පටිජානාති -පෙ- 'ඛිත්තචිත්තො' පටිජානාති -පෙ- 'වෙදනාට්ටො' පටිජානාති -පෙ- 'ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'පණ්ඩකො' පටිජානාති -පෙ- 'ථෙය්‍යසංවාසකො' පටිජානාති -පෙ- 'තිත්ථියපක්කන්තකො' පටිජානාති -පෙ- 'තිරච්ඡානගතො' පටිජානාති -පෙ- 'මාතුඝාතකො' පටිජානාති -පෙ- 'පිතුඝාතකො' පටිජානාති -පෙ- 'අරහන්තඝාතකො' පටිජානාති -පෙ- 'භික්ඛුනිදූසකො' පටිජානාති -පෙ- 'සඞ්ඝභෙදකො' පටිජානාති -පෙ- 'ලොහිතුප්පාදකො' පටිජානාති -පෙ- 'උභතොබ්‍යඤ්ජනකො' පටිජානාති, අඤ්ඤස්ස දාතබ්බා පවාරණා."

32. "පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය අන්තරාමග්ගෙ පක්කමති, අනාහටා හොති පවාරණා. පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය අන්තරාමග්ගෙ විබ්භමති -පෙ- කාලං කරොති -පෙ- 'සාමණෙරො' පටිජානාති -පෙ- 'සික්ඛං පච්චක්ඛාතකො' පටිජානාති -පෙ- 'අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො' පටිජානාති -පෙ- 'උම්මත්තකො' පටිජානාති -පෙ- 'ඛිත්තචිත්තො' පටිජානාති -පෙ- 'වෙදනාට්ටො' පටිජානාති -පෙ- 'ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'පණ්ඩකො' පටිජානාති -පෙ- 'ථෙය්‍යසංවාසකො' පටිජානාති -පෙ- 'තිත්ථියපක්කන්තකො' පටිජානාති -පෙ- 'තිරච්ඡානගතො' පටිජානාති -පෙ- 'මාතුඝාතකො' පටිජානාති -පෙ- 'පිතුඝාතකො' පටිජානාති -පෙ- 'අරහන්තඝාතකො' පටිජානාති -පෙ- 'භික්ඛුනිදූසකො' පටිජානාති -පෙ- 'සඞ්ඝභෙදකො' පටිජානාති -පෙ- 'ලොහිතුප්පාදකො' පටිජානාති -පෙ- 'උභතොබ්‍යඤ්ජනකො' පටිජානාති, අනාහටා හොති පවාරණා."

1. "එතදහොසි" ම ඡ සං. 2. "ගිලානො භික්ඛු" ම ඡ සං.
3. "පවාරණහාරකො" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

එය කයින් හඟවා ද, වචනයෙන් හඟවා ද, කයින් හා වචනයෙන් හඟවා ද, පවාරණය දෙන ලද්දේ වේ. කයින් නො හඟවා ද, වචනයෙන් නො හඟවා ද, කයින් හා වචනයෙන් නො හඟවා ද, පවාරණය දෙන ලද්දේ නො වේ. මේ මෙසේ ලැබෙන්නේ නම්, ඒ යහපත් ය. නො ලැබෙන්නේ නම්, මහණෙනි, ඒ ගිලන් මහණහු ඇඳකින් හෝ පුටුවකින් හෝ සඟමැදට ගෙණවුත් පැවරිය යුතු ය. මහණෙනි, ගිලානොපස්ථායක භික්ෂූන්ට 'අපි ගිලනහු හුන් තැනින් ඉවත් කරන්නෙමු නම්, ආබාධය හෝ වැඩෙන්නේ ය. කලුරිය කිරීම හෝ වන්නේ ය' යි මෙසේ අදහස් වේ නම්, මහණෙනි, ගිලන් තෙමේ හුන් තැනින් ඉවත් නො කට යුතු ය. සඞ්ඝයා එහි ගොස් පැවරිය යුතු ය. ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් නො පැවරිය යුතු ම ය. පවරන්නේ නම් දුකුලාඇවැත් වේ."

31. "මහණෙනි, ඉදින් පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි බැහැර යේ ද, (එවිට) අනෙකෙකුට පවාරණය දිය යුතු ය. මහණෙනි, ඉදින් පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි එහි දී ම සිවුරු හරී ද -පෙ- කලුරිය කෙරේ ද -පෙ- 'සෙරණෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ශික්ෂාව බැහැර කළ එකෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'අන්තිමවස්තුවට පැමිණියෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'උන්මත්තකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'වික්ෂිප්ත වූ සිත් ඇත්තෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'වේදනාවෙන් පෙළෙන්නෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ඇවැත් නො දැක්මෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ඇවැතට පිළියම් නො කිරීමෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ලාමක දෘෂ්ටිය නො හැරීමෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'පණ්ඩකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'පැවිද්ද සොරකම් කළ එකෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'තීර්ථිකයන් කරා ගියෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද, -පෙ- 'තිරිසන් ගියෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'මාතෘඝාතකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'පිතෘඝාතකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'අරහන්තඝාතකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'භික්ෂුණීදූෂකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'සඞ්ඝභෙදකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ලොහිතුප්පාදකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'උභතොව්‍යඤ්ජනකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද (එකල) අනෙකෙකුට පවාරණය දිය යුතු ය."

32. "මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි අතරමග දී බැහැර යේ ද, පවාරණය නො ගෙණෙන ලද්දේ වේ. මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි අතරමග දී සිවුරු හරී ද -පෙ- කලුරිය කෙරේ ද -පෙ- 'සෙරණෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ශික්ෂාව බැහැර කළ එකෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'අන්තිමවස්තුවට පැමිණියෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'උන්මත්තකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'වික්ෂිප්ත වූ සිත් ඇත්තෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'වේදනාවෙන් පෙළෙන්නෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ඇවැත් නොදැක්මෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ඇවැතට පිළියම් නො කිරීමෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ලාමක දෘෂ්ටිය අත් නොහැරීමෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'පණ්ඩකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'පැවිද්ද සොරකම් කළ එකෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'තීර්ථිකයන් කරා ගියෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'තිරිසන් ගියෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'මාතෘඝාතකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'පිතෘඝාතකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'අරහන්තඝාතකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'භික්ෂුණීදූෂකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'සඞ්ඝභෙදකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'ලොහිතුප්පාදකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද -පෙ- 'උභතොව්‍යඤ්ජනකයෙක්මි' යි ප්‍රතිඥ කෙරේ ද පවාරණය ගෙණෙන ලද්දේ නො වේ."

33. "පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය සඞ්ඝප්පත්තො පක්කමති, ආහටා හොති පවාරණා. පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය සඞ්ඝප්පත්තො විබ්භමති -පෙ- කාලං කරොති -පෙ- 'සාමණෙරො' පටිජානාති -පෙ- 'සික්ඛං පච්චක්ඛාතකො' පටිජානාති -පෙ- 'අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො' පටිජානාති -පෙ- 'උම්මත්තකො' පටිජානාති -පෙ- 'ඛිත්තචිත්තො' පටිජානාති -පෙ- 'වෙදනාට්ටො' පටිජානාති -පෙ- 'ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො' පටිජානාති -පෙ- 'පණ්ඩකො' පටිජානාති -පෙ- 'ථෙය්‍යසංවාසකො' පටිජානාති -පෙ- 'තිත්ථියපක්කන්තකො' පටිජානාති -පෙ- 'තිරච්ඡානගතො' පටිජානාති -පෙ- 'මාතුඝාතකො' පටිජානාති -පෙ- 'පිතුඝාතකො' පටිජානාති -පෙ- 'අරහන්තඝාතකො' පටිජානාති -පෙ- 'භික්ඛුනිදූසකො' පටිජානාති -පෙ- 'සඞ්ඝභෙදකො' පටිජානාති -පෙ- 'ලොහිතුප්පාදකො' පටිජානාති -පෙ- 'උභතොබ්‍යඤ්ජනකො' පටිජානාති ආහටා හොති පවාරණා."

34. "පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය සඞ්ඝප්පත්තො සුත්තො නාරොචෙති, ආහටා හොති පවාරණා. පවාරණාහාරකස්ස අනාපත්ති.[1] පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය සඞ්ඝප්පත්තො පමත්තො[2] නාරොචෙති -පෙ- සමාපන්නො නාරොචෙති, ආහටා හොති පවාරණා. පවාරණාහාරකස්ස අනාපත්ති."

35. "පවාරණාහාරකො චෙ භික්ඛවෙ, දින්නාය පවාරණාය සඞ්ඝප්පත්තො සඤ්චිච්ච නාරොචෙති, ආහටා හොති පවාරණා. පවාරණාහාරකස්ස ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, තදහු පවාරණාය පවාරණං දෙන්තෙන ඡන්දම්පි දාතුං - සන්ති සඞ්ඝස්ස කරණීය"න්ති.

36. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරං භික්ඛුං තදහු පවාරණාය ඤාතකා ගණ්හිංසු. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ, භික්ඛුං තදහු පවාරණාය ඤාතකා ගණ්හන්ති. තෙ ඤාතකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං මුඤ්චථ,[3] යාවායං භික්ඛු පවාරෙතී'ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ ඤාතකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො මුහුත්තං එකමන්තං හොථ. යාවායං භික්ඛු පවාරණං දෙතී'ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ ඤාතකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං නිස්සීමං නෙථ, යාව සඞ්ඝො පවාරෙතී'ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, න ත්වෙව වග්ගෙන සඞ්ඝෙන පවාරෙතබ්බං. පවාරෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්ස."

1. "පවාරණාහාරකස්ස අනාපත්ති"ති. කෙසුචි පොත්ථකෙසු න දිස්සතෙ.
2. "සුත්තො" ම ඡ සං. තො වි. ජ වි. ම නු ප. තො වි.
3. "මුඤ්චථ" තො වි. තො වි ම නු ප. අ වි.

Free Distribution www.aathaapi.org

33. "මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි සඞ්ඝයා වෙත පැමිණියේ බැහැර යේ ද, පවාරණය ගෙණෙන ලද්දේ වේ. මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි සඟ මැදට පැමිණියේ සිවුරු හරියි ද -පෙ- කලුරිය කරයි ද -පෙ- 'හෙරණෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'ශික්‍ෂාව බැහැර කළ එකෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'අන්තිමවස්තුවට පැමිණියෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'උන්මත්තකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'වික්‍ෂිප්ත වූ සිත් ඇත්තෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'වේදනාවෙන් පෙළෙන්නෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'ඇවැත් නො දැක්මෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'ඇවැතට පිළියම් නො කිරීමෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'ලාමක දෘෂ්ටිය අත් නොහැරීමෙහි බැහැර කරණ ලද්දෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'පණ්ඩකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'පැවිද්ද සොරකම් කළ එකෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'තීර්ථකයන් වෙත ගියෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'තිරිසන් ගියෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'මාතෘඝාතකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'පිතෘඝාතකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'අරහන්තඝාතකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'භික්‍ෂුණීදූෂකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'සඞ්ඝභෙදකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'ලොහිතුප්පාදකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද -පෙ- 'උභතොබ්‍යඤ්ජනකයෙක්මි' යි ප්‍රතිඥා කෙරේ ද, පවාරණය ගෙණෙන ලද්දේ වේ."

34. "මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි සඟ මැදට පැමිණියේ නිදි ගත්තේ නො සැළකෙරේ ද, පවාරණය ගෙණෙන ලද්දේ වේ. පවාරණය ගෙණෙන මහණහුට ඇවැත් නො වේ. මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි සඞ්ඝයා වෙත පැමිණියේ ප්‍රමත්ත ව නො සැළකෙරේ ද - සමාපත්තියට සමවැදුනේ නො සැළකෙරේ ද, පවාරණය ගෙණෙන ලද්දේ වේ. පවාරණය ගෙණෙන මහණහුට ඇවැත් නො වේ."

35. "මහණෙනි, පවාරණය ගෙණෙන මහණ තෙමේ පවාරණය දුන් කල්හි සඞ්ඝයා වෙත පැමිණියේ දැන දැන නො සැළකෙරේ ද, පවාරණය ගෙණෙන ලද්දේ වේ. පවාරණය ගෙණෙන මහණහුට දුකුළාඇවැත් වේ. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි පවාරණය දෙන්නහු විසින් 'සඞ්ඝයා පිළිබඳ කටයුතු ඇතැ' යි ඡන්දය ද දෙන්නට අනුදනිමි"යි.

36. එකල්හි එක්තරා මහණකු එදවස පවාරණදිනයෙහි නෑයෝ අල්ලා ගත්හ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, මෙහි මහණකු එදවස පවාරණදිනයෙහි නෑයෝ අල්ලා ගණිත්. එබැවින් භික්‍ෂූන් විසින් ඒ නෑයෝ 'ආයුෂ්මත්නි, තෙපි මේ මහණ තෙමේ යම් තාක් කල් පවාරණය කෙරේ ද, (ඒතාක්) කල් මේ මහණහු මොහොතකට මුදවූ' යි මෙසේ කිය යුතු වන්නාහු ය. මේ මෙසේ ලැබෙන්නේ නම්, ඒ යහපත් ය. නො ලැබෙන්නේ නම්, ඒ නෑයෝ භික්‍ෂූන් විසින් 'ආයුෂ්මත්නි, එසේ නම් තෙපි මේ මහණ තෙමේ යම් තාක් කල් පවාරණය දේ ද, (ඒතාක්) මොහොතකට පසකට වවූ' යි මෙසේ කිය යුතු වන්නාහු ය. මේ මෙසේ ලැබෙන්නේ නම්, ඒ යහපත් ය. ඉදින් නො ලැබෙන්නේ නම්, ඒ නෑයෝ භික්‍ෂූන් විසින් 'ආයුෂ්මත්නි, එසේ නම් තෙපි යම් තාක් කල් සඞ්ඝ තෙමේ පවාරණය කෙරේ ද (එතාක්) කල් මේ මහණ මොහොතකට සීමාවෙන් බැහැරට ගෙණ යවූ' යි මෙසේ කිය යුතු වන්නාහු ය. මේ මෙසේ ලබන්නේ නම් ඒ යහපත් ය. නො ලබන්නේ නම් ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් නො පැවරිය යුතු ම ය. පවරන්නේ නම් දුකුළාඇවැත වේ."

37. "ඉධ පන භික්ඛවෙ, භික්ඛූනං තදහු පවාරණාය රාජානො ගණ්හන්ති -පෙ- චොරා ගණ්හන්ති -පෙ- ධුත්තා ගණ්හන්ති -පෙ- භික්ඛුපච්චත්ථිකා ගණ්හන්ති. තෙ භික්ඛුපච්චත්ථිකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං මුඤ්චථ, යාවායං භික්ඛු පවාරෙතී'ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ භික්ඛු පච්චත්ථිකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො මුහුත්තං එකමන්තං හොථ, යාවායං භික්ඛු පවාරණං දෙතී'ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, තෙ භික්ඛුපච්චත්ථිකා භික්ඛූහි එවමස්සු වචනීයා: 'ඉඞ්ඝ තුම්හෙ ආයස්මන්තො ඉමං භික්ඛුං මුහුත්තං නිස්සීමං නෙථ, යාව සඞ්ඝො පවාරෙතී' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, න ත්වෙව වග්ගෙන සඞ්ඝෙන පවාරෙතබ්බං. පවාරෙය්‍ය චෙ, ආපත්ති දුක්කටස්සා"ති.

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය පඤ්ච භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං සඞ්ඝෙන පවාරෙතබ්බන්ති. මයඤ්චම්හ පඤ්ච ජනා කථන්නු ඛො අම්හෙහි පවාරෙතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පඤ්චන්නං සඞ්ඝෙ පවාරෙතු" න්ති.

39. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය චත්තාරො භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං පඤ්චන්නං සඞ්ඝෙ පවාරෙතුං.[1] මයඤ්චම්හ චත්තාරො ජනා. කථන්නු ඛො අම්හෙහි පවාරෙතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, චතුන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. එවඤ්ච පන භික්ඛවෙ, පවාරෙතබ්බං. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛූ ඤාපෙතබ්බා:-

40. "සුණන්තු මෙ ආයස්මන්තො. අජ්ජ පවාරණා. යදායස්මන්තානං පත්තකල්ලං, මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමා'ති. ථෙරෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා තෙ භික්ඛූ එවමස්සු වචනීයා: "අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි -පෙ- තතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී'ති."

41. "නවකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා තෙ භික්ඛූ එවමස්සු වචනීයා: අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි -පෙ- තතියම්පි අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී'ති."

1. "පවාරෙතුන්ති" ම ඡ සං.

37. "මහණෙනි, මෙහි මහණකු එදවස පවාරණාදිනයෙහි රජහු අල්ලා ගණිත් -පෙ- සොරු අල්ලා ගණිත් -පෙ- ධූර්තයෝ අල්ලා ගණිත් -පෙ- පසමිතුරු වූ භික්ෂූහු[1] අල්ලා ගණිත්. භික්ෂූන් විසින් ඒ පසමිතුරු වූ භික්ෂූහු 'ආයුෂ්මත්නි, එසේ නම් තෙපි මේ මහණ තෙමේ යම් තාක් කල් පවාරණය කෙරේ ද, (ඒ තාක් කල්) මේ මහණහු මොහොතකට මුදවූ' යි මෙසේ කිය යුතු වන්නාහු ය. මේ මෙසේ ලබන්නේ නම්, ඒ යහපත් ය. නො ලබන්නේ නම්, භික්ෂූන් විසින් ඒ පසමිතුරු වූ භික්ෂූහු 'ආයුෂ්මත්නි, එසේ නම් තෙපි මේ මහණ තෙමේ යම් තාක් කල් පවාරණය දේ ද, (ඒ තාක් කල්) මොහොතක් පසකට වවු'යි මෙසේ කිය යුතු වන්නාහු ය. මේ මෙසේ ලබන්නේ නම්, ඒ යහපත් ය. නො ලබන්නේ නම්, භික්ෂූන් විසින් ඒ පසමිතුරු වූ භික්ෂූහු 'ආයුෂ්මත්නි, එසේ නම් තෙපි යම් තාක් කල් සඞ්ඝ තෙමේ පවාරණය කෙරේ ද, (ඒ තාක් කල්) මේ මහණහු මොහොතකට සීමාවෙන් බැහැරට ගෙණ යවූ' යි මෙසේ කිය යුතු වන්නාහු ය. මේ මෙසේ ලබන්නේ නම්, ඒ යහපත් ය. නො ලබන්නේ නම්, ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් නො පැවරිය යුතු ම ය. පවරන්නේ නම් දුකුලාඇවැත් වේ."

38. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් භික්ෂූහු වාසය කෙරෙත්. එවිට ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් සඞ්ඝයා විසින් පැවරිය යුතු ය යි පණවන ලද්දේ ය. අපි පස් දෙනෙක් වෙමු. අප විසින් කෙසේ පැවරිය යුතු දැ" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පස් දෙනාට සඞ්ඝයා වෙත පවරන්නට අනුදනිමි" යි.

39. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි සිවු නමක් භික්ෂූහු වාසය කරත්. එවිට ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් පස් දෙනකුන්ට සඞ්ඝයා වෙත පැවරීම අනුදන්නා ලද්දේ ය. අපි සිවු දෙනෙක් වෙමු. අප විසින් කෙසේ පැවරිය යුතු දැ" යි මේ සිත උපන. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සිවු දෙනාට උනුන් පවරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ පැවරිය යුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් ඒ භික්ෂූහු දැන්විය යුත්තාහු ය:

40. "ආයුෂ්මත්හු මාගේ වචනය අසත්වා. අද පවාරණ දිනය යි. ඉදින් ආයුෂ්මතුන්හට පැමිණි කල් ඇත්තේ නම්, අපි උනුන් පවරන්නෙමු. ස්ථවිර භික්ෂු නම විසින් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම (මාගේ) දුටු ඇවැතින් හෝ ඇසූ ඇවැතින් හෝ සැක කළ ඇවැතින් හෝ (කියන්නට) ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දක්නේ පිළියම් කරන්නෙමි' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය. දෙවනු ද ඇවැත්නි, මම ආයුෂ්මතුන් පවරමි. -පෙ- තෙවනු ද 'ඇවැත්නි, මම දුටුවකින් හෝ ඇසූවකින් හෝ සැකයෙකින් හෝ (කියන්නට) ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු මට අනුකම්පා කොට කියත්වා. දක්නේ පිළියම් කරන්නෙමි' යි (ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය.)"

41. "නවක භික්ෂු නම විසින් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මම (මාගේ) දුටුවකින් හෝ ඇසූවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දක්නේ පිළියම් කරන්නෙමි' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය. දෙවනු ද 'ස්වාමීනි, මම ආයුෂ්මතුන් පවරමි -පෙ- තෙවනු ද 'ස්වාමීනි, මම දුටුවකින් හෝ ඇසූවකින් හෝ සැකයකින් හෝ (කියන්නට) ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු මට අනුකම්පා කොට කියත්වා. දක්නේ පිළියම් කරන්නෙමි' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය."

1. "භික්ඛූ යෙව පච්චත්ථිකා = භික්ඛුපච්චත්ථිකා" - ටීකා

42. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය තයො භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං පඤ්චන්නං සඞ්ඝෙ පවාරෙතුං. චතුන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. මයඤ්චම්හ තයො ජනා. කථන්නු ඛො අම්හෙහි පවාරෙතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තිණ්ණන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. එවඤ්ච පන භික්ඛවෙ, පවාරෙතබ්බං. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛූ ඤාපෙතබ්බා:"

43. "සුණන්තු මෙ ආයස්මන්තා. අජ්ජ පවාරණා. යදායස්මන්තානං පත්තකල්ලං, මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමාති. ථෙරෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා තෙ භික්ඛූ එවමස්සු වචනීයා: 'අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි. -පෙ- තතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී' ති."

44. "නවකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා තෙ භික්ඛූ එවමස්සු වචනීයා: 'අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී' ති. දුතියම්පි අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි. -පෙ- තතියම්පි අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී'ති."

45. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය ද්වෙ භික්ඛූ විහරන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං පඤ්චන්නං සඞ්ඝෙ පවාරෙතුං. චතුන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. තිණ්ණන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. මයඤ්චම්හ ද්වෙ ජනා. කථන්නු ඛො අම්හෙහි පවාරෙතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ද්වින්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. එවඤ්ච පන භික්ඛවෙ, පවාරෙතබ්බං: ථෙරෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා නවො භික්ඛු එවමස්ස වචනීයො: "අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි. තතියම්පි අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී' ති."

42. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි තෙනමක් භික්ෂූහු වාසය කරත්. එකල ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් පස්දෙනාට සඞ්ඝයා වෙත පවරන්නට ද සිව් දෙනාට උනුන් පවරන්නට ද අනුදන්නා ලද්දේ ය. අපි තිදෙනෙක් වෙමු. අප විසින් කෙසේ පැවරිය යුතු ද" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, තිදෙනාට උනුන් පවරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ පැවරිය යුතු ය. පළමු කොට ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් ඒ භික්ෂූහු දැන්විය යුතු වෙත්."

43. "ආයුෂ්මත්හු මාගේ වචනය අසත්වා. අද පවාරණ දිනය යි. ඉදින් ආයුෂ්මතුන්ට පැමිණි කල් ඇත්තේ නම්, අපි උනුන් පවරන්නෙමු. ස්ථවිර භික්ෂුනම විසින් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ (කියන්නට) ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය. දෙවනු ද 'ඇවැත්නි, මම ආයුෂ්මතුන් පවරමි' -පෙ- තෙවනු ද 'මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි (ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය.)

44. "නවකභික්ෂුනම විසින් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මම (මාගේ) දුටු වරදකින් හෝ ඇසූ වරදකින් හෝ සැක කළ වරදකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දක්නේ පිළියම් කරන්නෙමි' යි ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය. දෙවනු ද ස්වාමීනි, මම ආයුෂ්මතුන් පවරමි -පෙ- තෙවනු ද මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත්හු අනුකම්පා කොට මට කියත්වා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි (ඒ භික්ෂූහු මෙසේ කිය යුතු වන්නාහු ය.)"

45. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි දෙනමක් භික්ෂූහු වාසය කෙරෙත්. එකල ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් පස්දෙනාට සඞ්ඝයා වෙත පවරන්නට ද සිව් දෙනාට උනුන් පවරන්නට ද තිදෙනාට උනුන් පවරන්නට ද අනුදන්නා ලද්දේ ය. අපි දෙදෙනෙක් වෙමු. අප විසින් කෙසේ පැවරිය යුතු ද" යි මේ සිත් උපන. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, දෙදෙනාට උනුන් පවරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ පැවරිය යුතු ය. ස්ථවිර-භික්ෂුනම විසින් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත් තෙමේ අනුකම්පා කොට මට කියාවා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි නවක භික්ෂු තෙමේ මෙසේ කිය යුතු වන්නේ ය. දෙවනු ද 'ඇවැත්නි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත් තෙමේ අනුකම්පා කොට මට කියාවා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි (නවක භික්ෂු තෙමේ කිය යුතු වන්නේ ය.) 'තෙවනු ද 'ඇවැත්නි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත් තෙමේ අනුකම්පා කොට මට කියාවා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි (නවක භික්ෂු තෙමේ කිය යුතු වන්නේ ය.)"

46. නවකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා ථෙරො භික්ඛු එවමස්ස වචනීයො: 'අහං භන්තෙ ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි අහං භන්තෙ ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමි. තතියම්පි අහං භන්තෙ ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය. පස්සන්තො පටිකරිස්සාමී' ති."

47. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය එකො භික්ඛු විහරති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා අනුඤ්ඤාතං පඤ්චන්නං සඞ්ඝෙ පවාරෙතුං. චතුන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. තිණ්ණන්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. ද්වින්නං අඤ්ඤමඤ්ඤං පවාරෙතුං. අහඤ්චම්හි එකකො. කථන්නු ඛො මයා පවාරෙතබ්බන්ති." භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය එකො භික්ඛු විහරති. තෙන භික්ඛවෙ, භික්ඛුනා යත්ථ භික්ඛූ පටික්කමන්ති උපට්ඨානසාලාය වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා, සො දෙසො[1] සම්මජ්ජිත්වා පානීයං පරිභොජනීයං උපට්ඨාපෙත්වා ආසනං පඤ්ඤපෙත්වා පදීපං කත්වා නිසීදිතබ්බං. සචෙ අඤ්ඤෙ භික්ඛූ ආගච්ඡන්ති, තෙහි සද්ධිං පවාරෙතබ්බං. නො චෙ ආගච්ඡන්ති 'අජ්ජ මෙ පවාරණා'ති, අධිට්ඨාතබ්බං. නො චෙ අධිට්ඨෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ, යත්ථ පඤ්ච භික්ඛූ විහරන්ති, න එකස්ස පවාරණං ආහරිත්වා චතූහි සඞ්ඝෙ පවාරෙතබ්බං. පවාරෙය්‍යුං චෙ ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ, යත්ථ චත්තාරො භික්ඛූ විහරන්ති, න එකස්ස පවාරණං ආහරිත්වා තීහි අඤ්ඤමඤ්ඤං පවාරෙතබ්බං. පවාරෙය්‍යුං චෙ, ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ, යත්ථ තයො භික්ඛූ විහරන්ති, න එකස්ස පවාරණං ආහරිත්වා ද්වීහි අඤ්ඤමඤ්ඤං පවාරෙතබ්බං. පවාරෙය්‍යුං චෙ ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ, යත්ථ ද්වෙ භික්ඛූ විහරන්ති, න එකස්ස පවාරණං ආහරිත්වා එකෙන අධිට්ඨාතබ්බං. අධිට්ඨෙය්‍ය චෙ[2], ආපත්ති දුක්කටස්සා"ති.

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තදහු පවාරණාය ආපත්තිං ආපන්නො හොති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'න සාපත්තිකෙන පවාරෙතබ්බ' න්ති. අහඤ්චම්හි ආපත්තිං ආපන්නො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ ?" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය ආපත්තිං ආපන්නො හොති. තෙන භික්ඛවෙ, භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'අහං ආවුසො ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො. තං පටිදෙසෙමී' ති. තෙන වත්තබ්බො 'පස්සසී'ති. 'ආම පස්සාමී' ති. 'ආයතිං සංවරෙය්‍යාසී'ති.

1. සෙඬ්දෙසෙ ?
"සො දෙසො සම්මජ්ජිත්වා'ති = තං දෙසං සම්මජ්ජිත්වා - උපයොගත්ථෙ පච්චත්තං" අට්ඨකථා.
2. "අධිට්ඨෙය්‍ය" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

46. "නවක භික්ෂු නම විසින් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත් තෙමේ අනුකම්පා කොට මට කියාවා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි ස්ථවිර භික්ෂු තෙමේ මෙසේ කිය යුතු වන්නේ ය. 'දෙවනු ද ස්වාමීනි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි ආයුෂ්මත් තෙමේ අනුකම්පා කොට මට කියාවා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි ස්ථවිර භික්ෂු තෙමේ මෙසේ කිය යුතු වන්නේ ය. 'තෙවනු ද ස්වාමීනි, මම දුටුවකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ කියන්නට ආයුෂ්මතුන් පවරමි. ආයුෂ්මත් තෙමේ අනුකම්පා කොට මට කියාවා. දක්නෙම් පිළියම් කරන්නෙමි' යි ස්ථවිර භික්ෂුතෙමේ මෙසේ කිය යුතු වන්නේ ය."

47. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි එක් භික්ෂු නමක් වෙසෙයි. එකල ඒ භික්ෂු නමට "භාග්‍යවතුන් වහන්සේ විසින් පස්දෙනාට සඞ්ඝයා වෙත පවරන්නට ද සිවු දෙනාට උනුන් පවරන්නට ද තිදෙනාට උනුන් පවරන්නට ද දෙදෙනාට උනුන් පවරන්නට ද අනුදන්නා ලද්දේ ය. මම ද එකලා වෙමි. මා විසින් කෙසේ පැවරිය යුතු ද ?" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි එක් භික්ෂු නමක් වෙසෙයි. මහණෙනි, ඒ භික්ෂු නම විසින් භික්ෂූහු උපස්ථාන-ශාලාවක හෝ මණ්ඩපයෙක හෝ රුක්මුලෙක හෝ යම් තැනෙක රැස් වෙත් ද, ඒ පෙදෙස හැමද පැන් පිරිබෝදිය එළවා තබා අසුන් පණවා පහන් දල්වා හිඳිය යුතු ය. අන්‍ය වූ භික්ෂූහු එත් නම්, ඔවුන් සමග පැවරිය යුතු ය. නො එත් නම්, 'අද මාගේ පවාරණ දිනය' යි ඉටිය යුතු ය. නො ඉටන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, එහි යම් තැනෙක පස් නමක් භික්ෂූහු වෙසෙත් ද, එකකුගේ පවාරණය ගෙණවුත් සිවු දෙනකුන් විසින් සඞ්ඝයා වෙත නො පැවරිය යුතු ය. පවරන්නාහු නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, එහි යම් තැනෙක සිවු නමක් භික්ෂූහු වෙසෙත් ද, එකකුගේ පවාරණය ගෙණවුත් තිදෙනකුන් විසින් උනුන් නො පැවරිය යුතු ය. පවරන්නාහු නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, එහි යම් තැනෙක තෙනමක් භික්ෂූහු වෙසෙත් ද, එකකුගේ පවාරණය ගෙණවුත් දෙදෙනකුන් විසින් උනුන් නො පැවරිය යුතු ය. පවරන්නාහු නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, එහි යම් තැනෙක දෙනමක් භික්ෂූහු වෙසෙත් ද, එකකුගේ පවාරණය ගෙණවුත් එකකු විසින් නො ඉටිය යුතු ය. ඉටන්නේ නම් දුකුලාඇවැත් වේ."

48. එකල්හි එක්තරා භික්ෂුනමක් එදවස පවාරණදිනයෙහි ඇවැතකට පැමිණියේ වේ. (එවිට) ඒ භික්ෂුනමට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඇවැත් සහිත වූවහු විසින් නො පැවරිය යුතු ය' යි පණවන ලද්දේ ය. මම ද ඇවැතකට පැමිණියෙම් වෙමි. මා විසින් කෙසේ පිළිපැදිය යුතු ද ?" යි මේ සිත උපන. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එදවස පවාරණදිනයෙහි ඇවැතකට පැමිණියේ වේ. මහණෙනි, ඒ මහණහු විසින් එක් මහණකු වෙත ගොස් උතුරුසඟසිවුර එකස් කොට උක්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම මෙ නම් ඇවැතට පැමිණියෙමි. ඒ ඇවැත දෙසමි'යි මෙසේ කිය යුතු වන්නේ ය. ඒ ඇවැත පිළිගන්නහු විසින් 'ඇවැත දක්නෙහි ද' යි කිය යුතු ය. (දෙසන්නහු විසින්) 'එසේ ය, දකිමි' යි (කිය යුතු ය). 'මත්තෙහි සංවරයෙන් යුත්වෙව' යි කිය යුතු ය.

49. “ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය ආපත්තියා වෙමතිකො හොති. තෙන භික්ඛවෙ, භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: ‘අහං ආවුසො ඉත්ථන්නාමාය ආපත්තියා වෙමතිකො. යදා නිබ්බෙමතිකො භවිස්සාමි,[1] තදා තං ආපත්තිං පටිකරිස්සාමී’ති. වත්වා පවාරෙතබ්බං. න ත්වෙව තප්පච්චයා පවාරණාය අන්තරායො කාතබ්බො’ ති.

50. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පවාරයමානො ආපත්තිං සරති.[2] අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: “භගවතා පඤ්ඤත්තං, න සාපත්තිකෙන පවාරෙතබ්බ’න්ති. අහඤ්චම්හි ආපත්තිං ආපන්නො. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ ?” න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “ඉධ පන භික්ඛවෙ, භික්ඛු පවාරයමානො ආපත්තිං සරති. තෙන භික්ඛවෙ, භික්ඛුනා සාමන්තා භික්ඛු එවමස්ස වචනීයො: ‘අහං ආවුසො ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො. ඉතො වුට්ඨහිත්වා තං ආපත්තිං පටිකරිස්සාමී’ ති. වත්වා පවාරෙතබ්බං. න ත්වෙව තප්පච්චයා පවාරණාය අන්තරායො කාතබ්බො” “ඉධ පන භික්ඛවෙ, භික්ඛු පවාරයමානො ආපත්තියා වෙමතිකො හොති. තෙන භික්ඛවෙ, භික්ඛුනා සාමන්තා භික්ඛු එවමස්ස වචනීයො: ‘අහං ආවුසො ඉත්ථන්නාමාය ආපත්තියා වෙමතිකො. යදා නිබ්බෙමතීකො භවිස්සාමි. තදා තං ආපත්තිං පටිකරිස්සාමී’ති වත්වා පවාරෙතබ්බං. න ත්වෙව තප්පච්චයා පවාරණාය අන්තරායො කාතබ්බො” ති.

51. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: “භගවතා පඤ්ඤත්තං ‘න සභාගා ආපත්ති දෙසෙතබ්බා. න සභාගා ආපත්ති පටිග්ගහෙතබ්බා’ති. අයඤ්ච සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ” න්ති.

52. භගවතො එතමත්ථං ආරොචෙසුං. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො හොති. තෙහි භික්ඛවෙ, භික්ඛූහි එකො භික්ඛු සාමන්තා ආවාසා සජ්ජුකං පාහෙතබ්බො ‘ගච්ඡාවුසො, තං ආපත්තිං පටිකරිත්වා ආගච්ඡ මයං තෙ සන්තිකෙ තං ආපත්තිං පටිකරිස්සාමා’ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

53. “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: ‘අයං සබ්බො සඞ්ඝො සභාගං ආපත්තිං ආපන්නො. යදා අඤ්ඤං භික්ඛුං සුද්ධං අනාපත්තිකං පස්සිස්සති, තදා තස්ස සන්තිකෙ තං ආපත්තිං පටිකරිස්සතී’ ති වත්වා පවාරෙතබ්බං. න ත්වෙව තප්පච්චයා පවාරණාය අන්තරායො කාතබ්බො.”

1. “භවිස්සාමීති” අ වි තො වි මනු ප.
2. “සරි” අ වි. ජ වි. ම නු ප. තො වි.

49. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එදවස පවාරණ දිනයෙහි ඇවැතෙහි විමති ඇත්තේ වේ. මහණෙනි, ඒ මහණහු විසින් එක් මහණකු වෙත එළඹ උතුරුසඟසිවුර එකස් කොට උත්කුටුකයෙන් හිඳ ඇඳිලි බැඳ 'ඇවැත්නි, මම මෙ නම් ඇවැතෙහි විමති ඇත්තෙම් වෙමි. යම් කලෙක විමති රහිත වන්නෙම් ද, එකල්හි ඒ ඇවැතට පිළියම් කරන්නෙමි'යි මෙසේ කිය යුතු වන්නේ ය. කියා පැවරිය යුතු ය. ඒ හේතුවෙන් පවාරණයට අන්තරායයක් නො කටයුතු ම ය.

50. එකල්හි එක්තරා මහණෙක් තෙමේ පවරන්නේ ඇවැත සිහිපත් කරයි. එවිට ඒ මහණහුට "භාග්‍යවතුන් වහන්සේ විසින් ඇවැත් සහිත මහණහු විසින් නො පැවරිය යුතු ය යි පණවන ලද්දේ ය. මම ද ඇවතකට පැමිණියෙම් වෙමි. මා විසින් කෙසේ පිළිපැදිය යුතු දැ" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ පවරන්නේ ඇවැත සිහිපත් කරයි. මහණෙනි, ඒ මහණහු විසින් ළඟ සිටි මහණ තෙමේ 'ඇවැත්නි, මම මෙ නම් ඇවැතට පැමිණියෙමි. මෙතැනින් නැගිට ඒ ඇවැතට පිළියම් කරන්නෙමි' යි කිය යුතු වන්නේ ය. කියා පැවරිය යුතු ය. ඒ හෙතුවෙන් පවාරණයට අන්තරායයෙක් නො කට යුතු ම ය. මහණෙනි, මෙහි මහණෙක් තෙමේ පවරන්නේ ඇවැතෙහි විමති ඇත්තේ වේ. මහණෙනි, ඒ මහණහු විසින් ළඟ සිටි මහණ තෙමේ 'ඇවැත්නි, මම මෙ නම් ඇවැතෙහි විමති ඇත්තෙම් වෙමි. යම් කලෙක විමති රහිත වන්නෙම් ද, එකල්හි ඒ ඇවැතට පිළියම් කරන්නෙමි' යි මෙසේ කිය යුතු වන්නේ ය. කියා පැවරිය යුතු ය. ඒ හෙතුවෙන් පවාරණයට අන්තරායයක් නො කටයුතු ම ය."

51. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවතකට පැමිණියේ වේ. එවිට ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'සමාන ඇවැත් නො දෙසිය යුතු ය. සමාන ඇවැත් නො පිළිගත යුතු ය' යි පණවන ලද්දේ ය. මේ සියලු සඞ්ඝ තෙමේ ද සමාන ඇවැතට පැමිණියේ වේ. අප විසින් කෙසේ පිළිපැදිය යුතු දැ" යි මෙ සිත් වි ය.

52. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවතකට පැමිණියේ වේ. මහණෙනි, ඒ භික්ෂූන් විසින් එක් මහණෙක් තෙමේ 'ඇවැත්නි, යව. සමීප ආවාසයකින් ඒ ඇවැතට පිළියම් කොට එව. අපි ඔබගේ සමීපයෙහි ඒ ඇවැතට පිළියම් කරන්නෙමු' යි එදවස ම එනු . පිණිස යැවිය යුතු ය. මේ මෙසේ ලබන්නේ නම්, ඒ යහපත් ය. ඉදින් නො ලබන්නේ නම්, ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් සඞ්ඝ තෙමේ දැන් විය යුතු ය:

53. "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතකට පැමිණියේ වේ. යම් කලෙක ඇවැත් නැති පිරිසිදු වූ අන් මහණකු දකින්නේ ද, එකල්හි ඒ මහණහුගේ සමීපයෙහි ඒ ඇවැතට පිළියම් කරන්නේ ය' යි කියා පැවරිය යුතු ය. ඒ හේතුවෙන් පවාරණයට අන්තරායයක් නො කට යුතු ම ය.

54. "ඉධ පන භික්ඛවෙ අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සබ්බො සඞ්ඝො සභාගාය ආපත්තියා වෙමතිකො හොති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං සබ්බො සඞ්ඝො සභාගාය ආපත්තියා වෙමතිකො. යදා නිබ්බෙමතිකො භවිස්සති, තදා තං ආපත්තිං පටිකරිස්සතී'ති. වත්වා පවාරෙතබ්බං. න ත්වෙව තප්පච්චයා පවාරණාය අන්තරායො කාතබ්බො"ති.

## පඨමක භාණවාරං නිට්ඨිතං[1]

---

1. "පඨම භාණවාරො නිට්ඨිතො" ම ඡ සං. "පඨම භාණවාරං නිට්ඨිතං" P T S.

Free Distribution www.aathaapi.org

54. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතෙහි විමති ඇත්තේ වේ. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය: 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ සියලු සඞ්ඝ තෙමේ සමාන ඇවැතෙහි විමති ඇත්තේ වේ. යම් කලෙක විමති නැත්තේ වන්නේ ද, එකල්හි ඒ ඇවැතට පිළියම් කරන්නේ ය' යි කියා පැවරිය යුතු ය. ඒ හේතුවෙන් පවාරණයට අන්තරායයක් නො කළ යුතු ය."

**පළමු බණවර නිමි.**



Free Distribution www.aathaapi.org

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතිංසු පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානිංසු "අත්ථඤ්ඤෙ අවාසිකා භික්ඛූ අනාගතා"ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙසුං. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡිංසු බහුතරා. භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා"ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිය-මානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 1.

3. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 2.

4. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 3.

5. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිත-මත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 4.

6. ඉධ පන පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්ම-සඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 5.

1. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වූහ. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ"යි නො දත්හ. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ ඔහු සමගි ය යන කල්පනා ඇතිව පැවරූහ. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසික භික්ෂූහු පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

2. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, වර්ගී වූ ඔහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 1.

3. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 2.

4 මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කලපනා ඇති, විනය යන කලපනා ඇති, ඔහු වර්ගී වූවාහු සමගි ය යන කලපනා ඇතිව පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 3.

5. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කලපනා ඇති, ඔහු වර්ගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 4.

6. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණාදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කලපනා ඇති, විනය යන කලපනා ඇති, ඔහු වර්ගී වූවාහු සමගි ය යන කලපනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. ඔවුන්ගේ සමීපයෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 5.

7. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පාවරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං පවාරිතානං අනාපත්ති. 6.

8. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 7.

9. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 8.

10. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 9.

11. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 10.

12. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 11.

7. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. ඔවුන්ගේ සමීපයෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 6.

8. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස නො නැගී හුන් කල්හි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 7.

9. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස නො නැගී හුන් කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසික-භික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. ඔවුන් හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 8.

10. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස නො නැගී හුන් කල්හි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසික-භික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 9.

11. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස කොටසක් නැගී සිටි කල්හි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 10.

12. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වගී වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස සමහරක් නැගී සිටි කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවෝ මනා කොට පැවරූවෝ වෙති. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 11.

13. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිත-මත්තෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුපවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 12.

14. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 13.

15. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුපවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 14.

16. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුපවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං අනාපත්ති. 15.

**අනාපත්තිපණ්ණරසකං නිට්ඨිතං.**

---

13. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ'' යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වර්ග වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස සමහරක් නැඟී සිටි කල්හි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 12.

14. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ''යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වර්ග වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි සියලු පිරිස නැඟී සිටි කල්හි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසික-භික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 13.

15. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ'' යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වර්ග වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි සියලු පිරිස නැඟී සිටි කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙති. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 14.

16. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ'' යි නො දනිත්. ධර්මය යන කල්පනා ඇති, විනය යන කල්පනා ඇති, ඔහු වර්ග වූවාහු සමගි ය යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි සියලු පිරිස නැඟී සිටි පසු ඉතා ටික වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. පවරණ ලද්දේ මනා කොට පවරණ ලද්දාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට ඇවැත් නො වේ. 15.

**නො ඇවැත් පසළොස් වර නිමි.**

1. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා"ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 1.

2. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා"ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 2.

3. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 3.

4. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා වග්ගසඤ්ඤිනො පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. -පෙ- අවුට්ඨිතාය පරිසාය -පෙ- බහුතරා. -පෙ- සමසමා. -පෙ- **ථොකතරා** එකච්චාය වුට්ඨිතාය පරිසාය -පෙ- බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. -පෙ- සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 4-15

**වග්ගාවග්ගසඤ්ඤිපණ්ණරසකං නිට්ඨිතං.**

1. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ'' යි දනිත්. ඔහු ධර්මය යන කල්පනා ඇත්තාහු, විනය යන කල්පනා ඇත්තාහු, වර්ගී වූවෝ වර්ගී වූයෙමු යි යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පවරණ කල්හි ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුලාඇවැත් වේ. 1.

2. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ'' යි දනිත්. ඔහු ධර්මය යන කල්පනා ඇත්තාහු, විනය යන කල්පනා ඇත්තාහු, වර්ගී වූවෝ වර්ගී වූයෙමු යි යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුලාඇවැත් වේ. 2.

3. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ'' යි දනිත්. ඔහු ධර්මය යන කල්පනා ඇත්තාහු, විනය යන කල්පනා ඇත්තාහු, වර්ගී වූවෝ වර්ගී වූයෙමු යි යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත් පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුලාඇවැත් වේ. 3.

4. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු ''නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ'' යි දනිත්. ඔහු ධර්මය යන කල්පනා ඇත්තාහු, විනය යන කල්පනා ඇත්තාහු, වර්ගී වූවෝ වර්ගී වූයෙමු යි යන කල්පනා ඇතිව පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- පිරිස නො නැගී හුන් කල්හි ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- පිරිස සමහරක් නැගී සිටි කල්හි ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- සියලු පිරිස නැගී සිටි කල්හි නැවත ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුලා-ඇවැත් වේ. 4–15.

**වර්ගී වූ වර්ගී සංඥා ඇති පසළොස් වර නිමි.**

---

1. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති. පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පති නු ඛො අම්හාකං පවාරෙතුං? න නු ඛො කප්පතී" ති වෙමතිකා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 1.

2. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පති නු ඛො අම්හාකං පවාරෙතුං? න නු ඛො කප්පතී" ති වෙමතිකා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ අවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 2.

3. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පති නු ඛො අම්හාකං පවාරෙතුං? න නු ඛො කප්පතී" ති වෙමතිකා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 3.

4. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්‍ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පති නු ඛො අම්හාකං පවාරෙතුං? න නු ඛො කප්පතී" ති. වෙමතිකා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ -පෙ- බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. -පෙ- අවුට්ඨිතාය පරිසාය -පෙ- බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. -පෙ- එකච්චාය වුට්ඨිතාය පරිසාය -පෙ- බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. -පෙ- සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. -පෙ- සමසමා. -පෙ- ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 4-15.

**වෙමතිකපණ්ණරසකං නිට්ඨිතං.**

Free Distribution www.aathaapi.org

1. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප ද ? නො කැප දැ" යි විමති ඇත්තෝ පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා බොහෝ වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුළාඇවැත් වේ. 1.

2. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප ද ? නො කැප දැ" යි විමති ඇත්තෝ පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසික භික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුළා ඇවැත් වේ. 2.

3. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප ද ? නො කැප දැ" යි විමති ඇත්තෝ පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුළාඇවැත් වේ. 3.

4. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසික භික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප ද ? නො කැප දැ" යි විමති ඇත්තෝ පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- පිරිස නො නැඟී හුන් කල්හි නැවත ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- පිරිස සමහරක් නැඟී සිටි කල්හි නැවත ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- සියලු පිරිස නැඟී සිටි කල්හි නැවත ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට දුකුළාඇවැත් වේ. 4-15.

**විමති ඇති පසළොස්වර නිමි.**

---

1. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පතෙව අම්හාකං පවාරෙතුං. නාම්හාකං න කප්පතී"ති කුක්කුච්චපකතා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 1.

2. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පතෙව අම්හාකං පවාරෙතුං. නාම්හාකං න කප්පතී"ති කුක්කුච්චපකතා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 2.

3. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පතෙව අම්හාකං පවාරෙතුං. නාම්හාකං න කප්පතී"ති කුක්කුච්චපකතා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි[1] පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස. 3.

4. ඉධ පන භික්ඛවෙ අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "කප්පතෙව අම්හාකං පවාරෙතුං. නාම්හාකං න කප්පතී" ති කුක්කුච්චපකතා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ –පෙ– බහුතරා. –පෙ– සමසමා. –පෙ– ථොකතරා. –පෙ– අවුට්ඨිතාය පරිසාය –පෙ– බහුතරා. –පෙ– සමසමා. –පෙ– ථොකතරා. –පෙ– එකච්චාය වුට්ඨිතාය පරිසාය –පෙ– බහුතරා. –පෙ– සමසමා. –පෙ– ථොකතරා –පෙ– සබ්බාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. –පෙ– සමසමා. –පෙ– ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති දුක්කටස්ස.

**කුක්කුච්චපකතපන්නරසකං නිට්ඨිතං.**

---

1 "අවසෙසෙහි තෙසං සන්තිකෙ" ඉත්‍යපි

1. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්‍ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්‍ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප වේ ම ය. අපට පැවරීම නො කැප නො වේ" යි කුකුසින් මඩනා ලද්දෝ පවරත්. ඔවුන් පවරණ කල්හි ඉතා බොහෝ වූ අන්‍ය වූ ආවාසිකභික්‍ෂූහු එත්. මහණෙනි, ඒ භික්‍ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරුවන්ට දුකුළාඇවැත් වේ. 1.

2. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්‍ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්‍ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප වේ ම ය. අපට පැවරීම නො කැප නො වේ" යි කුකුසින් මඩනා ලද්දෝ පවරත්. ඔවුන් පවරණ කල්හි සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්‍ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙති. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරුවන්ට දුකුළාඇවැත් වේ. 2.

3. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්‍ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්‍ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප වේ ම ය. අපට පැවරීම නො කැප නො වේ" යි කුකුසින් මඩනා ලද්දෝ පවරත්. ඔවුන් පවරණ කල්හි ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්‍ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පැවරුවාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරුවන්ට දුකුළාඇවැත් වේ. 3.

4. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්‍ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්‍ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "අපට පැවරීම කැප වේ ම ය. අපට පැවරීම නො කැප නො වේ" යි කුකුසින් මඩනා ලද්දෝ පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටිකවූ -පෙ- පිරිස නො නැගී හුන් කල්හි ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- පිරිස සමහරක් නැගී සිටි කල්හි ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ -පෙ- සියලු පිරිස නැගී සිටි කල්හි ඉතා බොහෝ වූ -පෙ- සමසම වූ -පෙ- ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්‍ෂූහු එත්. පැවරුවාහු මනා කොට පැවරුවාහු වෙති. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරුවන්ට දුකුළා-ඇවැත් වේ. 4-15.

**කුකුසින් මැඩුම් පසළොස් වර නිමි.**

1. ඉධ පන භික්ඛවෙ අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 1.

2. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 2.

3. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරියමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති තොකතරා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 3.

4. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 4.

5. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 5

1. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් ද" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට ථුල්ලච්චයාපත්ති වේ. 1.

2. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් ද" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවෝ මනා කොට පැවරූවෝ වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට ථුල්ලච්චයාපත්ති වේ. 2.

3. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩි ගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් ද" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පවරණ කල්හි නැවත ඉතා ටික වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවෝ මනා කොට පැවරූවාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට ථුල්ලච්චයාපත්ති වේ. 3.

4. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් හෝ වැඩිගණනක් හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් ද" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත ඉතා බොහෝ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරියයුතු ය. පැවරූවන්ට ථුල්ලච්චයාපත්ති වේ. 4.

5. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් ද" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත සමසම වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූහු එත්. පැවරූවාහු මනා කොට පැවරූවාහු වෙති. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට ථුල්ලච්චයාපත්ති වේ. 5.

6. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති “අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා” ති. තෙ “නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො” ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 6.

7. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති “අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා” ති. තෙ “නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො” ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 7.

8. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති “අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා” ති. තෙ “නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො” ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 8.

9. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති “අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා” ති. තෙ “නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො” ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ අවුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 9.

10. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති “අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා” ති. තෙ “නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො” ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 10.

6. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි නැවත ටික දෙනෙක් වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 6.

7. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස නො නැගී හුන් කල්හි නැවත ඉතා බොහෝ වූ අන්‍ය ආවාසික භික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 7.

8. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස නො නැගී හුන් කල්හි නැවත සමසම වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 8.

9. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණදිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස නො නැගී හුන් කල්හි නැවත ටික වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 9.

10. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ"යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස සමහරක් නැගී සිටි කල්හි නැවත ඉතා බොහෝ වූ අන්‍ය ආවාසික භික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 10.

11. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "ධම්මො විනයො" ති... තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 11.

12. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ එකච්චාය වුට්ඨිතාය පරිසාය අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 12.

13. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති බහුතරා. තෙහි භික්ඛවෙ, භික්ඛූහි පුන පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 13.

14. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති සමසමා. පවාරිතා සුප්පවාරිතා. අවසෙසෙහි පවාරෙතබ්බං.[1] පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 14.

15. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ ජානන්ති "අත්ථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතා" ති. තෙ "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො" ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. තෙහි පවාරිතමත්තෙ සබ්බාය වුට්ඨිතාය පරිසාය අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ ආගච්ඡන්ති ථොකතරා. පවාරිතා සුප්පවාරිතා. තෙසං සන්තිකෙ පවාරෙතබ්බං. පවාරිතානං ආපත්ති ථුල්ලච්චයස්ස. 15.

**භෙදපුරෙක්ඛාරපණ්ණරසකං නිට්ඨිතං.**

**පඤ්චවීසතිතිකා නිට්ඨිතා.**

---

1. "තෙසං සන්තිකෙ පවාරෙතබ්බං" ම ජ සං.

11. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස සමහරක් නැගී සිටි කල්හි නැවත සමසම වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 11.

12. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙති. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි පිරිස සමහරක් නැගී සිටි කල්හි නැවත ටික වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 12.

13. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ' යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවත ඉතා බොහෝ වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. මහණෙනි, ඒ භික්ෂූන් විසින් නැවත පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 13.

14. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇත්තාහ"යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවත සමසම වූ ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. සෙස්සන් විසින් පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 14.

15. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඔහු "නො පැමිණි අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇත්තාහ" යි දනිත්. ඔහු "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ"යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. ඔවුන් පැවරූ ඇසිල්ලෙහි සියලු පිරිස නැගී සිටි කල්හි නැවත ටික වූ අන්‍ය ආවාසිකභික්ෂූහු එත්. පවාරණය කළාහු මනා කොට පවාරණය කළාහු වෙත්. ඔවුන්ගේ හමුවෙහි පැවරිය යුතු ය. පැවරූවන්ට තුලසිඇවැත් වේ. 15.

**බිඳීම පෙරටුකොට ඇති පසළොස්වර නිමි.**

**පඤ්චිසතිකයෝ නිමවන ලදහ.**

---

1. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සම්බහුලා ආවාසිකා භික්ඛූ සන්නිපතන්ති පඤ්ච වා අතිරෙකා වා. තෙ න ජානන්ති "අඤ්ඤෙ[1] ආවාසිකා භික්ඛූ අන්තො සීමං ඔක්කමන්තී"ති. -පෙ- තෙ න ජානන්ති "අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කන්තා"ති. -පෙ- තෙ න පස්සන්ති "අඤ්ඤෙ ආවාසිකෙ භික්ඛූ අන්තොසීමං ඔක්කමන්තෙ" -පෙ- තෙ න පස්සන්ති "අඤ්ඤෙ ආවාසිකෙ භික්ඛූ අන්තොසීමං ඔක්කන්තෙ" -පෙ- තෙ න සුණන්ති "අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කමන්තී"ති -පෙ- තෙ න සුණන්ති "අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කන්තා"ති. ආවාසිකෙන ආවාසිකා එක-සතපඤ්චසත්තතිතිකා නයතො.[2] ආවාසිකෙන ආගන්තුකා, ආගන්තුකෙන ආවාසිකා, ආගන්තුකෙන ආගන්තුකා - පෙය්‍යාලමුඛෙන සත්තතිකසතානි හොන්ති.

2. ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං චාතුද්දසො හොති. ආගන්තුකානං පණ්ණරසො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං අනුවත්තිතබ්බං.

3. ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං පණ්ණරසො හොති. ආගන්තුකානං චාතුද්දසො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං අනුවත්තිතබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං අනුවත්තිතබ්බං.

4. ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං පාටිපදො හොති. ආගන්තුකානං පණ්ණරසො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං න අකාමා දාතබ්බා සාමග්ගී. ආගන්තුකෙහි නිස්සීමං ගන්ත්වා පවාරෙතබ්බං. සචෙ සමසමා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං න අකාමා දාතබ්බා සාමග්ගී. ආගන්තුකෙහි නිස්සීමං ගන්ත්වා පවාරෙතබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආවාසිකෙහි ආගන්තුකානං සාමග්ගී වා දාතබ්බා, නිස්සීමං වා ගන්තබ්බං.

5. ඉධ පන භික්ඛවෙ, ආවාසිකානං භික්ඛූනං පණ්ණරසො හොති. ආගන්තුකානං පාටිපදො. සචෙ ආවාසිකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී වා දාතබ්බා, නිස්සීමං වා ගන්තබ්බං. සචෙ සමසමා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං සාමග්ගී වා දාතබ්බා, නිස්සීමං වා ගන්තබ්බං. සචෙ ආගන්තුකා බහුතරා හොන්ති ආගන්තුකෙහි ආවාසිකානං න අකාමා දාතබ්බා සාමග්ගී. ආවාසිකෙහි නිස්සීමං ගන්ත්වා පවාරෙතබ්බං.

1. "අථඤ්ඤෙ" තො ච
,, "අත්ථඤ්ඤෙ"ති බහුසු සීහලක්ඛරපොත්ථකෙසු දිස්සතෙ
2. "එකසතපඤ්චසත්තතිකනයතො" ම ඡ සං.

1. මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි පස් නමක් වූ හෝ වැඩි වූ හෝ බොහෝ ආවාසිකභික්ෂූහු රැස් වෙත්. ඒ භික්ෂූහු ''අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇතුල් සීමාවට පැමිණෙත්''යි නො දනිත්. -පෙ- ඒ භික්ෂූහු ''අන්‍ය වූ ආවාසිකභික්ෂූහු ඇතුල් සීමාවට පැමිණියාහු'' යි නො දනිත්. -පෙ- ඒ භික්ෂූහු ඇතුල් සීමාවට පැමිණෙන්නාවූ අන්‍ය වූ ආවාසිකභික්ෂූන් නො දකිත් -පෙ- ඒ භික්ෂූහු ඇතුල් සීමාවට පැමිණියා වූ අන්‍ය වූ ආවාසිකභික්ෂූන් නො දකිත්. -පෙ- ඒ භික්ෂූහු ''අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇතුල් සීමාවට පැමිණෙත්''යි නො අසත්. -පෙ- ඒ භික්ෂූහු ''අන්‍ය වූ ආවාසික භික්ෂූහු ඇතුල් සීමාවට පැමිණියාහු''යි නො අසත්. ආවාසිකයන් හා ආවාසිකයෝ - ක්‍රම විසින් තික එක්සිය පන්සැත්තෑවකි.* ආවාසිකයන් හා ආගන්තුකයෝ, ආගන්තුකයන් හා ආවාසිකයෝ, ආගන්තුකයන් හා ආගන්තුකයෝ - පෙය්‍යාලමුඛයෙන් තික සත්සියයෙක් වේ.*

2. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූන්ට තුදුස්වක වේ. ආගන්තුක භික්ෂූන්ට පසළොස්වක වේ. ආවාසිකයෝ ඉතා බොහෝ වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. සමසම වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. ආගන්තුකයෝ බොහෝ වෙත් නම්, ආවාසිකයන් ආගන්තුකයන්ට අනුව පැවතිය යුතු ය.

3. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූන්ට පසළොස්වක වේ. ආගන්තුක භික්ෂූන්ට තුදුස්වක වේ. ආවාසිකයෝ බොහෝ වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. සමසම වෙත් නම්, ආගන්තුකයන් ආවාසිකයන්ට අනුව පැවතිය යුතු ය. ආගන්තුකයෝ බොහෝ වෙත් නම්, ආවාසිකයන් ආගන්තුකයන්ට අනුව පැවතිය යුතු ය.

4. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූන්ට පැළවිය වේ. ආගන්තුකයන්ට පසළොස්වක වේ. ආවාසිකයෝ බොහෝ වෙත් නම්, ආවාසිකයන් විසින් ආගන්තුකයන්ට නො කැමැත්තෙන් සමගිය නො දිය යුතු ය. ආගන්තුකයන් විසින් සීමාවෙන් බැහැරට ගොස් පැවරිය යුතු ය. සමසම වෙත් නම්, ආවාසිකයන් විසින් ආගන්තුකයන්ට නො කැමැත්තෙන් සමගිය නො දිය යුතු ය. ආගන්තුකයන් විසින් සීමාවෙන් බැහැරට ගොස් පැවරිය යුතු ය. ආගන්තුකයෝ බොහෝ වෙත් නම්, ආවාසිකයන් විසින් ආගන්තුකයන්ට සාමග්‍රිය හෝ දිය යුතු ය. සීමාවෙන් බැහැරට හෝ යා යුතු ය.

5. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූන්ට පසළොස්වක වේ. ආගන්තුකයන්ට පැළවිය වේ. ආවාසිකයෝ බොහෝ වෙත් නම්, ආගන්තුකයන් විසින් ආවාසිකයන්ට සාමග්‍රිය හෝ දිය යුතු ය. සීමාවෙන් බැහැරට හෝ යා යුතු ය. සමසම වෙත් නම්, ආගන්තුකයන් විසින් ආවාසිකයන්ට සාමග්‍රිය හෝ දිය යුතු ය. සීමාවෙන් බැහැරට හෝ යා යුතු ය. ආගන්තුකයෝ බොහෝ වෙත් නම්, ආගන්තුකයන් විසින් ආවාසිකයන්ට නො කැමැත්තෙන් සාමග්‍රිය නො දිය යුතු ය. ආවාසිකයන් විසින් සීමාවෙන් බැහැරට ගොස් පැවරිය යුතු ය.

* උපග්‍රන්ථය බලනු.

6. ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ පස්සන්ති ආවාසිකානං භික්ඛූනං ආවාසිකාකාරං ආවාසිකලිඞ්ගං ආවාසිකනිමිත්තං ආවාසිකුද්දෙසං සුපඤ්ඤත්තං මඤ්චපීඨං භිසිබිබ්බොහනං පානීයං පරිභොජනීයං සූපට්ඨිතං පරිවෙණං සුසම්මට්ඨං. පස්සිත්වා වෙමතිකා හොන්ති "අත්ථි නු ඛො ආවාසිකා භික්ඛූ නත්ථි නු ඛො"ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො"ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස.

7. ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ සුණන්ති ආවාසිකානං භික්ඛූනං ආවාසිකාකාරං ආවාසිකලිඞ්ගං ආවාසිකනිමිත්තං ආවාසිකුද්දෙසං චඞ්කමන්තානං පදසද්දං සජ්ඣායසද්දං උක්කාසිතසද්දං ඛිපිතසද්දං. සුත්වා වෙමතිකා හොන්ති. "අත්ථි නු ඛො ආවාසිකා භික්ඛූ නත්ථි නු ඛො"ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො පවාරෙන්ති. -පෙ- අනාපත්ති. තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා "නස්සන්තෙතෙ විනස්සන්තෙතෙ, කො තෙහි අත්ථො"ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති ආපත්ති ථුල්ලච්චයස්ස.

8. ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ පස්සන්ති ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකාකාරං ආගන්තුකලිඞ්ගං ආගන්තුකනිමිත්තං ආගන්තුකුද්දෙසං අඤ්ඤාතකං පත්තං අඤ්ඤාතකං චීවරං අඤ්ඤාතකං නිසීදනං පාදානං ධොතං උදකනිස්සෙකං.[1] පස්සිත්වා වෙමතිකා හොන්ති "අත්ථි නු ඛො ආගන්තුකා භික්ඛූ නත්ථි නු ඛො" ති. තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා පවාරෙන්ති. ආනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො පවාරෙන්ති අනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො"ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස.

9. ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ සුණන්ති ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකාකාරං ආගන්තුකලිඞ්ගං ආගන්තුකනිමිත්තං ආගන්තුකුද්දෙසං ආගච්ඡන්තානං පදසද්දං උපාහනාපප්ඵොටනසද්දං[2] උක්කාසිතසද්දං ඛිපිතසද්දං. සුත්වා වෙමතිකා හොන්ති. "අත්ථි නු ඛො ආගන්තුකා භික්ඛූ නත්ථි නු ඛො" ති.

1. "උදකනිසෙකං" ඉතිපි - අට්ඨකථා.
2. "උපාහනපප්ඵොටනසද්දං" ම ඡ සං. අ වි. තො වි.

6. මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු ආවාසිකභික්ෂූන්ගේ ආවාසිකයන් පිළිබඳ ආචාරසණ්ඨානය ආවාසිකයන් ඇතැ යි හඳුන් වන ලකුණු, ආවාසිකයන් ඇතැයි හඳුන්වන නිමිති, ආවාසිකයන් හඳුන්වන පිරිකර, මනා කොට පැණ වූ ඇඳ පුටු ගුදිරි හා කොට්ට, මනා කොට එළ වූ පැන් හා පිරිබෝදිය, මනා කොට හැමදි පිරිවෙණ දකිත්. දැක "ආවාසික භික්ෂූහු ඇත් ද නැද්ද" යි විමති ඇත්තෝ වෙත්. විමති ඇත්තා වූ ඒ ආගන්තුකභික්ෂූහු නො සොයත්. නො සොයා පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. තුලසිඇවැත් වේ.

7. මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු ආවාසිකභික්ෂූන්ගේ ආචාරසණ්ඨානය, ආවාසිකයන් හඳුන් වන ලකුණු, ආවාසිකයන් ඇති බැව්හි ලකුණු, ආවාසිකයන් හඳුන්වන පිරිකර, සක්මන් කරන්නවුන්ගේ පාහඬ, හැදෑරීමේ හඬ, කෑරීම් හඬ, කිවිසිලි හඬ අසත්. අසා "ආවාසිකභික්ෂූහු ඇද් ද නැද්දැ" යි විමති ඇත්තෝ වෙත්. විමති ඇත්තා වූ ඒ භික්ෂූහු නො සොයත්. නො සොයා පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පවරත්. ඇවැත් නො වේ. -පෙ-විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. තුලසිඇවැත් වේ.

8. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූහු ආගන්තුකභික්ෂූන්ගේ ආගන්තුකාකාරය, ආගන්තුකලක්ෂණය, ආගන්තුකනිමිත්ත, ආගන්තුකඋද්දෙසය, නො හඳුනන පාත්‍රය, නො හඳුනන සිවුර, නො හඳුනන නිසීදනය, පා සේදූ තැන්, වැගුරුණු දිය දකිත්. දැක "ආගන්තුක භික්ෂූහු ඇද් ද නැද්දැ" යි විමති ඇත්තෝ වෙත්. විමති ඇත්තා වූ ඒ ආවාසිකභික්ෂූහු නො සොයත්. නො සොයා පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ" යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. තුලසිඇවැත් වේ.

9. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූහු ආගන්තුකභික්ෂූන්ගේ ආගන්තුකාකාරය, ආගන්තුකලිඞ්ගය, ආගන්තුකනිමිත්ත, ආගන්තුකඋද්දෙසය, එන්නන්ගේ පා හඬ, වහන් පෙළීමේ හඬ, කෑරීම් හඬ, කිවිසිලි හඬ, අසත්. අසා "ආගන්තුක භික්ෂූහු ඇද්ද නැද්දැ" යි විමති ඇත්තෝ වෙත්.

තෙ වෙමතිකා න විචිනන්ති. අවිචිනිත්වා පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා න පස්සන්ති. අපස්සිත්වා පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා එකතො පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා පාටෙක්කං පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ වෙමතිකා විචිනන්ති. විචිනිත්වා පස්සන්ති. පස්සිත්වා "නස්සන්තෙතෙ. විනස්සන්තෙතෙ. කො තෙහි අත්ථො"ති භෙදපුරෙක්ඛාරා පවාරෙන්ති. ආපත්ති ථුල්ලච්චයස්ස.

10. ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ පස්සන්ති ආවාසිකෙ භික්ඛූ නානාසංවාසකෙ. තෙ සමානසංවාසකදිට්ඨිං පටිලභන්ති. සමානසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා එකතො පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා පාටෙක්කං පවාරෙන්ති. අනාපත්ති.

11. ඉධ පන භික්ඛවෙ, ආගන්තුකා භික්ඛූ පස්සන්ති ආවාසිකෙ භික්ඛූ සමානසංවාසකෙ. තෙ නානාසංවාසකදිට්ඨිං පටිලභන්ති. නානාසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස -පෙ- තෙ පුච්ඡන්ති පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා පාටෙක්කං පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා එකතො පවාරෙන්ති. අනාපත්ති.

12. ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ පස්සන්ති ආගන්තුකෙ භික්ඛූ නානාසංවාසකෙ. තෙ සමානසංවාසකදිට්ඨිං පටිලභන්ති. සමානසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො පවාරෙන්ති. අනාපත්ති. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා එකතො පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා නාභිවිතරන්ති. අනභිවිතරිත්වා පාටෙක්කං පවාරෙන්ති. අනාපත්ති.

13. ඉධ පන භික්ඛවෙ, ආවාසිකා භික්ඛූ පස්සන්ති ආගන්තුකෙ භික්ඛූ සමානසංවාසකෙ. තෙ නානාසංවාසකදිට්ඨිං පටිලභන්ති. නානාසංවාසකදිට්ඨිං පටිලභිත්වා න පුච්ඡන්ති. අපුච්ඡිත්වා එකතො පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා පාටෙක්කං පවාරෙන්ති. ආපත්ති දුක්කටස්ස. -පෙ- තෙ පුච්ඡන්ති. පුච්ඡිත්වා අභිවිතරන්ති. අභිවිතරිත්වා එකතො පවාරෙන්ති. අනාපත්ති.

14. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

15. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා අභික්ඛුකො අනාවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

16. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා අභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

Free Distribution www.aathaapi.org

විමති ඇත්තා වූ ඒ භික්ෂූහු නො සොයත්. නො සොයා පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා නො දකිත්. නො දැක පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක එකතු ව පවරත්. ඇවැත් නො වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක වෙන් වෙන් ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- විමති ඇත්තා වූ ඒ භික්ෂූහු සොයත්. සොයා දකිත්. දැක "මේ මහණහු නැසෙත්වා. මේ මහණහු වැනසෙත්වා. ඔවුන්ගෙන් කිනම් වැඩෙක් දැ"යි බිඳීමේ අදහස පෙරටු කොට ඇත්තාහු පවරත්. තුලසිඇවැත් වේ.

10. මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු නානාසංවාසක වූ ආවාසිකභික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු සමානසංවාසකදෘෂ්ටිය ලබත්. සමානසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පවරත්. ඇවැත් නො වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (නානාසංවාසකදිට්ඨිය) බැහැර නො කෙරෙත්. බැහැර නො කොට එකතු ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (ඒ දෘෂ්ටිය) බැහැර නො කෙරෙත්. බැහැර නො කොට වෙන් වෙන් ව පවරත්. ඇවැත් නො වේ.

11. මහණෙනි, මෙහි ආගන්තුකභික්ෂූහු සමානසංවාසක වූ ආවාසික භික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු නානාසංවාසකදෘෂ්ටිය ලබත්. නානාසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (ඒ දෘෂ්ටිය) බැහැර කරත්. බැහැර කොට වෙන් වෙන් ව පවරත්. දුකුලාඇවැත් වේ. ඒ භික්ෂූහු විචාරත්. විචාරා බැහැර කෙරෙත්. බැහැර කොට එකතු ව පවරත්. ඇවැත් නො වේ.

12. මහණෙනි, මෙහි ආවාසිකභික්ෂූහු නානාසංවාසක වූ ආගන්තුක භික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු සමානසංවාසකදෘෂ්ටිය ලබත්. සමානසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පවරත්. ඇවැත් නො වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (ඒ දෘෂ්ටිය) බැහැර නො කෙරෙත්. බැහැර නො කොට එකතු ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (ඒ දෘෂ්ටිය) බැහැර නො කෙරෙත් බැහැර නො කොට වෙන් වෙන් ව පවරත්. ඇවැත් නො වේ.

13. මහණෙනි, මෙහි ආවාසික භික්ෂූහු සමානසංවාසක වූ ආගන්තුක භික්ෂූන් දකිත්. ඒ භික්ෂූහු නානාසංවාසකදෘෂ්ටිය ලබත්. නානාසංවාසකදෘෂ්ටිය ලබා නො විචාරත්. නො විචාරා එකතු ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (ඒ දෘෂ්ටිය) බැහැර කෙරෙත්. බැහැර කොට වෙන් වෙන් ව පවරත්. දුකුලාඇවැත් වේ. -පෙ- ඒ භික්ෂූහු විචාරත්. විචාරා (ඒ දෘෂ්ටිය) බැහැර කෙරෙත්. බැහැර කොට එකතු ව පවරත්. ඇවැත් නො වේ.

14. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

15. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

16. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

17. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

18. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා අභික්ඛුකො අනාවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

19. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා අභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

20. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා අභික්ඛුකො ආවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

21. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා අභික්ඛුකො අනාවාසො ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

22. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා අභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

23. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා සභික්ඛුකො ආවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

24. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා සභික්ඛුකො අනාවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

25. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා

26. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො ආවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

27. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො අනාවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

28. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

Free Distribution www.aathaapi.org

17. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

18. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් රහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

19. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් රහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

20. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් රහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

21. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් රහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

22. මහණෙනි, එදවස පවාරණදිනයෙහි භික්ෂූන් සහිත වූ ආවාසසෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් රහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

23. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසත්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

24. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසත්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

25. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක නානාසංවාසකභික්ෂූහු වසත්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

26. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසත්නාහු ද එබඳු වූ භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

27. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසත්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් සහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

28. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසත්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ අනාවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාස්යට හෝ සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

29. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො ආවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

30. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො අනාවාසො ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

31. න භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා ගන්තබ්බො යත්ථස්සු භික්ඛූ නානාසංවාසකා අඤ්ඤත්‍ර සඞ්ඝෙන අඤ්ඤත්‍ර අන්තරායා.

32. ගන්තබ්බො භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා සභික්ඛුකො ආවාසො යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා යං ජඤ්ඤා "සක්කොමි අජ්ජෙව ගන්තු"න්ති.

33. ගන්තබ්බො භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා සභික්ඛුකො අනාවාසො -පෙ- සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා යං ජඤ්ඤා "සක්කොමි අජ්ජෙව ගන්තු"න්ති.

34. ගන්තබ්බො භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා අනාවාසා සභික්ඛුකො ආවාසො -පෙ- සභික්ඛුකො අනාවාසො -පෙ- සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා යං ජඤ්ඤා "සක්කොමි අජ්ජෙව ගන්තු"න්ති.

35. ගන්තබ්බො භික්ඛවෙ, තදහු පවාරණාය සභික්ඛුකා ආවාසා වා අනාවාසා වා සභික්ඛුකො ආවාසො -පෙ- සභික්ඛුකො අනාවාසො -පෙ- සභික්ඛුකො ආවාසො වා අනාවාසො වා යත්ථස්සු භික්ඛූ සමානසංවාසකා යං ජඤ්ඤා "සක්කොමි අජ්ජෙව ගන්තු"න්ති.

36. න භික්ඛවෙ, භික්ඛුනියා නිසින්නපරිසාය පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

37. න සික්ඛමානාය -පෙ- න සාමණෙරස්ස -පෙ- න සාමණෙරාය -පෙ- න සික්ඛං පච්චක්ඛාතකස්ස -පෙ- න අන්තිමවත්ථුං අජ්ඣාපන්නකස්ස නිසින්නපරිසාය පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

38. න ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකස්ස නිසින්නපරිසාය පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො.

39. න ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකස්ස -පෙ- න පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකස්ස නිසින්නපරිසාය පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො.

40. න පණ්ඩකස්ස නිසින්නපරිසාය පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

29. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ ආවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

30. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක නානාසංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ අනාවාසයට සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

31. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක නානාසංවාසක භික්ෂූහු වසන්නාහු ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ සඞ්ඝයාගෙන් වෙන් ව අන්තරායයක් නැති ව නො යා යුතු ය.

32. මහණෙනි, එදවස පවාරණදිනයෙහි යම් තැනෙක සමාන සංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද යම් තැනක් "අද ම යන්නට හැක්කෙමි"යි දන්නේ ද එබඳු වූ භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ ආවාසයට යා යුතු ය.

33. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි යම් තැනෙක සමාන සංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද යම් තැනක් "අද ම යන්නට හැක්කෙමි" යි දන්නේ ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් භික්ෂූන් සහිත වූ අනාවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ යා යුතු ය.

34. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි යම් තැනෙක සමාන සංවාසක වූ භික්ෂූහු වසන්නාහු ද, යම් තැනක් "අද ම යන්නට හැක්කෙමි"යි දන්නේ ද එබඳු වූ භික්ෂූන් සහිත වූ ආවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ අනාවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ යා යුතු ය.

35. මහණෙනි, එදවස පවාරණ දිනයෙහි යම් තැනෙක සමාන සංවාසක භික්ෂූහු වසන්නාහු ද, යම් තැනක් "අද ම යන්නට හැක්කෙමි"යි දන්නේ ද (එබඳු වූ) භික්ෂූන් සහිත වූ ආවාසයෙන් හෝ අනාවාසයෙන් හෝ භික්ෂූන් සහිත වූ ආවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ අනාවාසයට -පෙ- භික්ෂූන් සහිත වූ ආවාසයට හෝ අනාවාසයට හෝ යා යුතු ය.

36. මහණෙනි, මෙහෙණක හුන් පිරිසෙහි නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම් දුකුලාඇවැත් වේ.

37. ශික්මෙන්නියක -පෙ- නො පැවරිය යුතු ය. සෙරණකු -පෙ- නො පැවරිය යුතු ය. සෙරණියක -පෙ- නො පැවරිය යුතු ය. ශික්ෂාව බැහැරලූවකු -පෙ- නොපැවරිය යුතු ය. අන්තිම වස්තුවට පැමිණියකු හුන් පිරිසෙහි නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම් දුකුලාඇවැත් වේ.

38. ඇවැත් නො දක්මෙහි බැහැර ලූවකු හුන් පිරිසෙහි නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම් ධර්මය (විනය නීති) පරිදි කරවිය යුතු ය.

39. ඇවැතට පිළියම් නො කිරීමෙහි බැහැර ලූවකු පෙ- ලාමක මිසදිටු අත් නො හැරීමෙහි බැහැර ලූවකු හුන් පිරිසෙහි නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම් ධර්මය පරිදි කරවිය යුතු ය.

40. පණ්ඩකයකු හුන් පිරිසෙහි නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම් දුකුලා ඇවැත් වේ.

41. න ථෙය්‍යසංවාසකස්ස -පෙ- න තිත්ථියපක්කන්තකස්ස -පෙ- න තිරච්ඡානගතස්ස -පෙ- න මාතුඝාතකස්ස -පෙ- න පිතුඝාතකස්ස -පෙ- න අරහන්තඝාතකස්ස -පෙ- න භික්ඛුණිදූසකස්ස -පෙ- න සඞ්ඝභෙදකස්ස -පෙ- න ලොහිතුප්පාදකස්ස -පෙ- න උභතොබ්‍යඤ්ජනකස්ස නිසින්නපරිසාය පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස

42. න භික්ඛවෙ, පාරිවාසිකපවාරණාදානෙන පවාරෙතබ්බං අඤ්ඤත්‍ර අවුට්ඨිතාය පරිසාය.

43. න ච භික්ඛවෙ, අප්පවාරණාය පවාරෙතබ්බං අඤ්ඤත්‍ර සඞ්ඝසාමග්ගියා’ ති.

## දුතියභාණවාරං නිට්ඨිතං[1].

---

1. “දුතියභාණවාරො නිට්ඨිතො” ම ඡ සං.

Free Distribution www.aathaapi.org

41. පැවිද්ද සොරකම් කළ එකකු -පෙ- නො පැවරිය යුතු ය. තීර්ථකයන් කරා ගියකු -පෙ- නො පැවරිය යුතු ය. තිරිසන් ගියකු -පෙ- නො පැවරිය යුතු ය. මාතෘඝාතකයකු -පෙ- නො පැවරිය යුතු ය. පිතෘඝාතකයකු -පෙ- නො පැවරිය යුතු ය. අරහන්තඝාතකයකු -පෙ- නො පැවරිය යුතු ය. භික්ඛුණීදූසකයකු -පෙ- නො පැවරිය යුතු ය. සඞ්ඝභෙදකයකු -පෙ- නො පැවරිය යුතු ය. ලොහිතුප්පාදකයකු -පෙ- නො පැවරිය යුතු ය. උභතොබ්‍යඤ්ජනකයකු හුන් පිරිසෙහි නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම් දුකුළාඇවැත් වේ.

42. මහණෙනි, පිරිස නො නැගී හුන් කල්හි හැර පාරිවාසික පවාරණය දීමෙන් නො පැවරිය යුතු ය.

43. මහණෙනි, සඞ්ඝසාමග්‍රියෙහි හැර පවාරණය නො කට යුතු දිනයෙහි නො පැවරිය යුතු ය.

**දෙවන බණවර නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය සවරභයං අහොසි. භික්ඛූ නාසක්ඛිංසු තෙවාචිකං පවාරෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ ද්වෙවාචිකං පවාරෙතු"න්ති. බාළ්හතරං සවරභයං අහොසි. භික්ඛූ නාසක්ඛිංසු ද්වෙවාචිකං පවාරෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ, එකවාචිකං පවාරෙතු"න්ති. බාළ්හතරං සවරභයං අහොසි. භික්ඛූ නාසක්ඛිංසු එකවාචිකං පවාරෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ, සමානවස්සිකං පවාරෙතු"න්ති.

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය මනුස්සෙහි දානං දෙන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "මනුස්සෙහි දානං දෙන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති. අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං රත්ති විභායිස්සති. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය මනුස්සෙහි දානං දෙන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා හොති. තත්‍ර චෙ භික්ඛූනං[1] එවං හොති 'මනුස්සෙහි දානං දෙන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති. අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං රත්ති විභායිස්සතී' ති, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. මනුස්සෙහි දානං දෙන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති. අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං රත්ති විභායිස්සති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ද්වෙවාචිකං -පෙ- එකවාචිකං -පෙ- සමානවස්සිකං පවාරෙය්‍යා" ති.

3. ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය භික්ඛූහි ධම්මං භණන්තෙහි -පෙ- සුත්තන්තිකෙහි සුත්තන්තං සඞ්ගායන්තෙහි -පෙ- විනයධරෙහි විනයං විනිච්ඡිනන්තෙහි[2] -පෙ- ධම්මකථිකෙහි ධම්මං සාකච්ඡන්තෙහි -පෙ- භික්ඛූහි කලහං කරොන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා හොති. තත්‍ර චෙ භික්ඛූනං එවං හොති -පෙ- "භික්ඛූහි කලහං කරොන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා, සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං රත්ති විභායිස්සතී" ති, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. භික්ඛූහි කලහං කරොන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං රත්ති විභායිස්සති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ද්වෙවාචිකං -පෙ- එකවාචිකං -පෙ- සමානවස්සිකං පවාරෙය්‍යා" ති.

1. "භික්ඛවෙ භික්ඛූනං" ම ඡ සං. 2. "විනිච්ඡන්තෙහි' තො වි. ම නු ප. ජ වි.

Free Distribution www.aathaapi.org

1. එකල්හි **කොසොල්** දනව්වෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණයෙහි වැද්දන්ගෙන් බියක් වූයේ ය. භික්ෂූහු තෙවරක් කීමෙන් පවරන්නට නො හැකි වූහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දෙවරක් කීමෙන් පවරන්නට අනුදනිමි" යි. දැඩි වැදි බියක් වූයේ ය. භික්ෂූහු දෙවරක් කීමෙන් පවරන්නට නො හැකි වූහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එක්වරක් කීමෙන් පවරන්නට අනුදනිමි" යි. ඉතා දැඩි වැදිබියක් වූයේ ය. භික්ෂූහු එක්වරක් කීමෙන් ද පවරන්නට නො හැකි වූහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සමාන වස් ඇත්තන් එකතු ව (කීමෙන්) පවරන්නට අනුදනිමි" යි.

2. එකල්හි එක්තරා ආවාසයෙක එදවස පවාරණයෙහි දන් දෙන්නා වූ මිනිසුන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. එකල්හි ඒ භික්ෂූන්ට "දන් දෙන්නා වූ මිනිසුන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. ඉදින් සඞ්ඝ තෙමේ තෙවරක් කියා පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. එසේ කල්හි මේ රාත්‍රිය පහන් වන්නේ ය. අප විසින් කෙසේ පිළිපැදිය යුතු දැ"යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි දන් දෙන්නා වූ මිනිසුන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. එහි දී භික්ෂූන්ට 'දන් දෙන්නා වූ මිනිසුන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. සඞ්ඝ තෙමේ තෙවරක් කීමෙන් පවරන්නේ නම් සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. එසේ කල්හි මේ රාත්‍රිය පහන් වන්නේ ය'යි මෙසේ අදහස් වේ නම්, ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. දන් දෙන්නා වූ මිනිසුන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. ඉදින් සඞ්ඝ තෙමේ තුන් වරක් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. දැන් මේ රාත්‍රිය පහන් වන්නේ ය. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ දෙවරක් කීමෙන් -පෙ- එක්වරක් කීමෙන් -පෙ- සමාන වස් ඇත්තන් එකතු ව කීමෙන් පවරන්නේ ය."

3. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණයෙහි දහම් දෙසන්නා වූ භික්ෂූන් විසින් -පෙ- සූත්‍රාන්ත සඞ්ගායනා කරන්නා වූ සූත්‍රාන්තිකයන් විසින් -පෙ- විනය විසඳන්නා වූ විනයධරයන් විසින් -පෙ- ධර්ම සාකච්ඡා කරන්නා වූ ධර්මකථිකයන් විසින් -පෙ- කලහ කරන්නා වූ භික්ෂූන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. එහි දී භික්ෂූන්ට 'කලහ කරන්නා වූ භික්ෂූන් විසින් රාත්‍රිය ගෙවන ලදී. සඞ්ඝ තෙමේ තෙවරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. මේ රාත්‍රිය ද පහන් වන්නේ ය'යි මෙසේ අදහස් වේ නම්. ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් සඞ්ඝ තෙමේ දැන් විය යුතු ය. 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: කලහ කරන්නා වූ භික්ෂූන් විසින් බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදී. ඉදින් සඞ්ඝ තෙමේ තෙවරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. දැන් මේ රාත්‍රිය පහන් වන්නේ ය. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ දෙවරක් කීමෙන් -පෙ- එක් වරක් කීමෙන් -පෙ- සමාන වස් ඇත්තන් එකතු ව කීමෙන් පවරන්නේ ය" යි.

4. තෙන ඛො පන සමයෙන **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය මහාභික්ඛුසඞ්ඝො සන්නිපතිතො හොති. පරිත්තඤ්ච අනොවස්සිකං[1] හොති. මහා ච මෙඝො[2] උග්ගතො හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: “අයං ඛො මහාභික්ඛුසඞ්ඝො සන්නිපතිතො. පරිත්තඤ්ච අනොවස්සිකං. මහා ච මෙඝො උග්ගතො. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං මෙඝො පවස්සිස්සති[3]. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ” න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “ඉධ පන භික්ඛවෙ, අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය මහාභික්ඛුසඞ්ඝො සන්නිපතිතො හොති. පරිත්තඤ්ච අනොවස්සිකං හොති මහා ච මෙඝො උග්ගතො හොති. තත්‍ර චෙ භික්ඛූනං එවං හොති: ‘අයං ඛො මහාභික්ඛුසඞ්ඝො සන්නිපතිතො. පරිත්තඤ්ච අනොවස්සිකං. මහා ච මෙඝො උග්ගතො. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං මෙඝො පවස්සිස්සතී' ති. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං මහාභික්ඛුසඞ්ඝො සන්නිපතිතො. පරිත්තඤ්ච අනොවස්සිකං. මහා ච මෙඝො උග්ගතො. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං මෙඝො පවස්සිස්සති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ද්වෙවාචිකං -පෙ- එකවාචිකං -පෙ- සමානවස්සිකං පවාරෙය්‍යා” ති.

5. “ඉධ පන භික්ඛවෙ අඤ්ඤතරස්මිං ආවාසෙ තදහු පවාරණාය රාජන්තරායො හොති -පෙ- චොරන්තරායො හොති -පෙ- අග්‍යන්තරායො හොති -පෙ- උදකන්තරායො හොති -පෙ- මනුස්සන්තරායො හොති -පෙ- අමනුස්සන්තරායො හොති -පෙ- වාළන්තරායො හොති -පෙ- සිරිංසපන්තරායො හොති -පෙ- ජීවිතන්තරායො හොති -පෙ- බ්‍රහ්මචරියන්තරායො හොති තත්‍ර චෙ භික්ඛූනං එවං හොති: ‘අයං ඛො බ්‍රහ්මචරියන්තරායො. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං බ්‍රහ්මචරියන්තරායො භවිස්සතී' ති. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං බ්‍රහ්මචරියන්තරායො. සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති. අථායං බ්‍රහ්මචරියන්තරායො භවිස්සති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ද්වෙවාචිකං -පෙ- එකවාචිකං -පෙ- සමානවස්සිකං පවාරෙය්‍යා” ති.

6. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සාපත්තිකා පවාරෙන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං: “න භික්ඛවෙ, සාපත්තිකෙන පවාරෙතබ්බං. යො පවාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, යො සාපත්තිකො පවාරෙති, තස්ස ඔකාසං කාරාපෙත්වා ආපත්තියා චොදෙතු” න්ති.

1. “අනොවස්සකං” අ වි. ජ වි. පො වි. 2. “මහාමෙඝො” ජ වි.
3. “වස්සිස්සති” පො වි. ම නු ප.

4. එකල්හි කොසොල්දනව්වෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි මහාභික්ෂුසඞ්ඝ තෙමේ රැස් වූයේ වේ. නො තෙමෙන තැන් ඉතා ටික වේ. මහත් මෙඝයෙක් ද නැංගේ වේ. එකල්හි ඒ භික්ෂූන්ට "මේ මහාභික්ෂුසඞ්ඝ තෙමේ රැස් වූයේ වේ. නො තෙමෙන තැන් ද ටික ය. මහාමෙඝයෙක් ද නැංගේ වේ. ඉදින් සඞ්ඝ තෙමේ තුන් වරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. මේ මෙඝය ද වසින්නේ ය. අප විසින් කෙසේ පිළිපැදිය යුතු දැ"යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි මහාභික්ෂුසඞ්ඝ තෙමේ රැස් වූයේ වේ. නො තෙමෙන තැන් ද ටික වේ. මහත් වූ මෙඝයෙක් ද නැංගේ වේ. එහි දී භික්ෂූන්ට 'මේ මහාභික්ෂුසඞ්ඝ තෙමේ රැස් වූයේ වේ. නො තෙමෙන තැන් ද ටික ය. මහත් වූ මෙඝයෙක් ද නැංගේ ය. සඞ්ඝ තෙමේ තුන්වරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. ඒ මෙඝය ද වසින්නේ ය'යි මෙසේ අදහස් වේ නම්, ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන් විය යුතු ය: 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ මහාභික්ෂු සඞ්ඝ තෙමේ රැස් වූයේ ය. නො තෙමෙන තැන් ද ටික ය. මහත් වූ මෙඝයෙක් ද නැංගේ ය. ඉදින් සඞ්ඝ තෙමේ තෙවරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. මේ මෙඝය ද වසින්නේ ය. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ දෙවරක් කීමෙන් -පෙ- එක්වරක් කීමෙන් -පෙ- සමාන වස් ඇත්තන් එකතු ව කීමෙන් පවරන්නේ ය'' යි.

5. "මහණෙනි, මෙහි එක්තරා ආවාසයෙක එදවස පවාරණ දිනයෙහි රජුගෙන් අන්තරායයෙක් වේ. -පෙ- සොරුන්ගෙන් අන්තරායයෙක් වේ. -පෙ- ගින්නෙන් අන්තරායයෙක් වේ. -පෙ- ජලයෙන් අන්තරායයෙක් වේ. -පෙ- මිනිසුන්ගෙන් අන්තරායයෙක් වේ. -පෙ- අමනුෂ්‍යයන්ගෙන් අන්තරායයෙක් වේ. -පෙ- චණ්ඩමෘගයන්ගෙන් අන්තරායයෙක් වේ. -පෙ- සර්පයන්ගෙන් අන්තරායයෙක් වේ. -පෙ- ජීවිතයට අන්තරායයෙක් වේ. -පෙ- බ්‍රහ්මචර්‍ය්‍යයට අන්තරායයෙක් වේ. -පෙ- එහි දී භික්ෂූන්ට 'මේ බ්‍රහ්මචර්‍ය්‍යාන්තරායයෙකි. සඞ්ඝ තෙමේ තෙවරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. මේ බ්‍රහ්මචර්‍ය්‍යයට අන්තරායය ද වන්නේ ය' යි මෙසේ අදහස් වේ නම්, ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන් විය යුතු ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ බ්‍රහ්මචර්‍ය්‍යයට අන්තරායයෙකි. ඉදින් සඞ්ඝ තෙමේ තෙවරක් කීමෙන් පවරන්නේ නම්, සඞ්ඝ තෙමේ නො පැවරූයේ ම වන්නේ ය. මේ බ්‍රහ්මචර්‍ය්‍යාන්තරායය ද වන්නේ ය. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ දෙවරක් කීමෙන් -පෙ- එක් වරක් කීමෙන් -පෙ- සමාන වස් ඇත්තන් එකතු ව කීමෙන් පවරන්නේ ය'' යි.

6. එකල්හි සවග මහණෝ ඇවැත් සහිත වූවෝ පවරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඇවැත් සහිත වූවහු විසින් නො පැවරිය යුතු ය. යමෙක් පවරන්නේ නම්, දුකුළා ඇවැත් වේ. මහණෙනි, ඇවැත් සහිත වූ යමෙක් පවරා නම්, ඔහුට අවකාශ කරවා (නැමැත්ත ගෙණ) ඇවැතින් චෝදනා කරන්නට අනුදනිමි'' යි.

7. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඔකාසං කාරාපියමානා න ඉච්ඡන්ති ඔකාසං කාතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ඔකාසං අකරොන්තස්ස පවාරණං ඨපෙතුං. එවඤ්ච පන භික්ඛවෙ, ඨපෙතබ්බා: තදහු පවාරණාය චාතුද්දසෙ වා පණ්ණරසෙ වා තස්මිං පුග්ගලෙ සම්මුඛීභූතෙ සඞ්ඝමජ්ඣෙ උදාහරිතබ්බං: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො පුග්ගලො සාපත්තිකො. තස්ස පවාරණං ඨපෙමි. න තස්මිං සම්මුඛීභූතෙ පවාරෙතබ්බ'න්ති. ඨපිතා හොති පවාරණා."

8. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "පුරම්හාකං පෙසලා භික්ඛූ පවාරණං ඨපෙන්තී"ති පටිගච්චෙව සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ පවාරණං ඨපෙන්ති. පවාරිතානම්පි පවාරණං ඨපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සුද්ධානං භික්ඛූනං අනාපත්තිකානං අවත්ථුස්මිං අකාරණෙ පවාරණා ඨපෙතබ්බා. යො ඨපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, පවාරිතානම්පි පවාරණා ඨපෙතබ්බා. යො ඨපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස."

9. "එවං ඛො භික්ඛවෙ, ඨපිතා හොති පවාරණා. එවං අට්ඨපිතා. කථං ච භික්ඛවෙ, අට්ඨපිතා හොති පවාරණා? තෙවාචිකාය චෙ භික්ඛවෙ, පවාරණාය භාසිතාය ලපිතාය පරියොසිතාය පවාරණං ඨපෙති, අට්ඨපිතා හොති පවාරණා. ද්වෙවාචිකාය චෙ භික්ඛවෙ, -පෙ- එකවාචිකාය චෙ භික්ඛවෙ, -පෙ- සමානවස්සිකාය චෙ භික්ඛවෙ, පවාරණාය භාසිතාය ලපිතාය පරියොසිතාය පවාරණං ඨපෙති, අට්ඨපිතා හොති පවාරණා. එවං ඛො භික්ඛවෙ අට්ඨපිතා හොති පවාරණා."

10. "කථඤ්ච භික්ඛවෙ, ඨපිතා හොති පවාරණා? තෙවාචිකාය චෙ භික්ඛවෙ පවාරණාය භාසිතාය ලපිතාය අපරියොසිතාය පවාරණං ඨපෙති, ඨපිතා හොති පවාරණා. ද්වෙවාචිකාය චෙ භික්ඛවෙ, -පෙ- එකවාචිකාය චෙ භික්ඛවෙ, -පෙ- සමානවස්සිකාය චෙ භික්ඛවෙ, පවාරණාය භාසිතාය ලපිතාය අපරියොසිතාය පවාරණං ඨපෙති, ඨපිතා හොති පවාරණා. එවං ඛො භික්ඛවෙ, ඨපිතා හොති පවාරණා."

11. "ඉධ පන භික්ඛවෙ, තදහු පවාරණාය භික්ඛු භික්ඛුස්ස පවාරණං ඨපෙති. තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානන්ති 'අයං ඛො ආයස්මා අපරිසුද්ධකායසමාචාරො අපරිසුද්ධවචීසමාචාරො අපරිසුද්ධආජීවො, බාලො අව්‍යත්තො, න පටිබලො අනුයුඤ්ජීයමානො අනුයොගං දාතු'න්ති. 'අලං භික්ඛු, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද'න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං."

12. "ඉධ පන භික්ඛවෙ, තදහු පවාරණාය භික්ඛු භික්ඛුස්ස පවාරණං ඨපෙති. තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානන්ති 'අයං ඛො ආයස්මා පරිසුද්ධකායසමාචාරො අපරිසුද්ධවචීසමාචාරො අපරිසුද්ධාජීවො බාලො අබ්‍යත්තො, න පටිබලො අනුයුඤ්ජීයමානො අනුයොගං දාතු'න්ති. 'අලං භික්ඛු, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද'න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං."

Free Distribution www.aathaapi.org

7. එකල්හි සවග මහණෝ අවකාශ කරවනු ලබන්නෝ අවකාශ කරන්නට (ඉඩ දෙන්නට) නො කැමැති වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "මහණෙනි, අවකාශ නො කරන්නහුගේ පවාරණය නවතාලන්ට අනුදනිමි. මහණෙනි, මෙසේ නැවැත්විය යුතු ය. එදවස පවාරණයෙහි තුදුස්වක්හි හෝ පසළොස්වක්හි හෝ ඒ පුද්ගලයා හමු වූ කල්හි සඟමැද ප්‍රකාශකළ යුතු ය: 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා: මෙ නම් ඇති පුද්ගල තෙමේ ඇවැත් සහිත වේ. ඔහුගේ පවාරණය නවත්වමි. ඔහු හමු වූ කල්හි නො පැවරිය යුතු ය' යි (මෙසේ) පවාරණය නවත්වන ලද්දේ වේ."

8. එකල්හි සවග මහණෝ "පෙශලභික්‍ෂූහු අපට පෙර අපගේ පවාරණය නවත්වති" යි වස්තුවක් නැති ව නිකරුණෙහි පළමු කොට ම ඇවැත් රහිත වූ පිරිසිදු වූ භික්‍ෂූන්ගේ පවාරණය නවත්වති. පවාරණය කළ භික්‍ෂූන්ගේ ද පවාරණය නවත්වත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වස්තුවක් නැති කල්හි නිකරුණෙහි ඇවැත් රහිත වූ පිරිසිදු භික්‍ෂූන්ගේ පවාරණය නො නැවැත්විය යුතු ය. යමෙක් නවත්-වන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, පවාරණය කළ භික්‍ෂූන්ගේ ද පවාරණය නො නැවැත්විය යුතු ය. යමෙක් නවත්වන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

9. "මහණෙනි, පවාරණය මෙසේ නවත්වන ලද්දේ වේ. මෙසේ නො නවත්වන ලද්දේ වේ. මහණෙනි, පවාරණය කෙසේ නො නවත්වන ලද්දේ වේ ද? මහණෙනි, තෙවාචික පවාරණය කියූ කල්හි පැවසූ කල්හි අවසන් කළ කල්හි පවාරණය නවතා ද, (එකල්හි) පවාරණය නො නවත්වන ලද්දේ වේ. මහණෙනි, දෙවාචික පවාරණය -පෙ- මහණෙනි, එකවාචික පවාරණය -පෙ- මහණෙනි, සමානවස්සික පවාරණය කියූ කල්හි පැවසූ කල්හි අවසන් කළ කල්හි පවාරණය නවතා ද, එකල්හි පවාරණය නො නවත්වන ලද්දේ වේ. මහණෙනි, මෙසේ පවාරණය නො නවත්වන ලද්දේ වේ."

10. "මහණෙනි, පවාරණය කෙසේ නවත්වන ලද්දේ වේ ද? මහණෙනි, තෙවාචික පවාරණය කියූ කල්හි පැවසූ කල්හි අවසන් නො කළ කල්හි පවාරණය නවතා ද, පවාරණය නවත්වන ලද්දේ වේ. මහණෙනි, දෙවාචික පවාරණය -පෙ- මහණෙනි, එකවාචික පවාරණය -පෙ- මහණෙනි, සමාන වස්සිකපවාරණය කියූ කල්හි පැවසූ කල්හි අවසන් නො කළ කල්හි පවාරණය නවතා ද, පවාරණය නවත්වන ලද්දේ වේ. මහණෙනි, මෙසේ පවාරණය නවත්වන ලද්දේ වේ."

11. "මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි මහණෙක් තෙමේ මහණකුගේ පවාරණය නවතයි. 'මේ ආයුෂ්මත් තෙමේ කය පිළිබඳ අපිරිසිදු හැසිරීම් ඇත්තේ ය. වචනය පිළිබඳ අපිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. අපිරිසිදු වූ දිවිපැවැතුම් ඇත්තේ ය. අඥ ය. අව්‍යක්ත ය. කරුණු විචාරණු ලබන්නේ කරුණු ඉදිරිපත් කරන්නට දක්‍ෂ නො වේ ය' යි අන්‍ය වූ භික්‍ෂූහු ඒ මහණහු දනිත්. 'මහණ, කම් නැත, ඩබර නො කරව. කලහ නො කරව. විරුද්ධ ගැණීම් නො ගණුව. විරුද්ධවාද නො කරව' යි (මෙසේ ඔහුගේ කීම) මැඩ සඞ්ඝයා විසින් පැවරිය යුතු ය."

12. "මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි මහණෙක් තෙමේ මහණකුගේ පවාරණය නවතයි. 'මේ ආයුෂ්මත් තෙමේ කය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. වචනය පිළිබඳ අපිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. අපිරිසිදු වූ දිවිපැවැතුම් ඇත්තේ ය. අඥ ය. අව්‍යක්ත ය. කරුණු විචාරණු ලබන්නේ කරුණු කීමට දක්‍ෂ නො වේ' යි අන්‍ය වූ භික්‍ෂූහු ඒ මහණහු දනිත්. 'මහණ, කම් නැත. ඩබර නො කරව, කලහ නො කරව, විරුද්ධ ගැණීම් නො ගණුව. විරුද්ධවාද නො කරව' යි (මෙසේ ඔහුගේ කීම) මැඩ සඞ්ඝයා විසින් පැවරිය යුතු ය."

13. "ඉධ පන භික්ඛවෙ, තදහු පවාරණාය භික්ඛු භික්ඛුස්ස පවාරණං ඨපෙති. තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානන්ති 'අයං බො ආයස්මා පරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො අපරිසුද්ධාජීවො, බාලො අබ්‍යත්තො, න පටිබලො අනුයුඤ්ජීයමානො අනුයොගං දාතු'න්ති. 'අලං භික්ඛු, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද'න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං."

14. "ඉධ පන භික්ඛවෙ, තදහු පවාරණාය භික්ඛු භික්ඛුස්ස පවාරණං ඨපෙති. තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානන්ති: 'අයං බො ආයස්මා පරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො පරිසුද්ධාජීවො, බාලො අබ්‍යත්තො, න පටිබලො අනුයුඤ්ජීයමානො අනුයොගං දාතු'න්ති. 'අලං භික්ඛු, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද'න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං."

15. "ඉධ පන භික්ඛවෙ, තදහු පවාරණාය භික්ඛු භික්ඛුස්ස පවාරණං ඨපෙති. තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානන්ති: 'අයං බො ආයස්මා පරිසුද්ධකායසමාචාරො පරිසුද්ධවචීසමාචාරො පරිසුද්ධාජීවො, පණ්ඩිතො ව්‍යත්තො පටිබලො අනුයුඤ්ජීයමානො අනුයොගං දාතු'න්ති. සො එවමස්ස වචනීයො: 'යං බො ත්වං ආවුසො, ඉමස්ස භික්ඛුනො පවාරණං ඨපෙසි, කිම්හි නං ඨපෙසි? සීලවිපත්තියා[1] ඨපෙසි? ආචාරවිපත්තියා ඨපෙසි? දිට්ඨිවිපත්තියා ඨපෙසී'ති?"

16. "සො චෙ එවං වදෙය්‍ය: 'සීලවිපත්තියා වා ඨපෙමි. ආචාරවිපත්තියා වා ඨපෙමි. දිට්ඨිවිපත්තියා වා ඨපෙමී'ති. සො එවමස්ස වචනීයො: 'ජානාති[2] පනායස්මා සීලවිපත්තිං? ජානාති ආචාරවිපත්තිං? ජානාති දිට්ඨිවිපත්ති'න්ති? සො චෙ එවං වදෙය්‍ය: 'ජානාමි බො අහං ආවුසො සීලවිපත්තිං. ජානාමි ආචාරවිපත්තිං. ජානාමි දිට්ඨිවිපත්ති'න්ති. සො එවමස්ස වචනීයො: 'කතමා පනාවුසො සීලවිපත්ති? කතමා ආචාරවිපත්ති? කතමා දිට්ඨිවිපත්තී'ති?"

17. "සො චෙ එවං වදෙය්‍ය:– 'චත්තාරි පාරාජිකානි තෙරස සඞ්ඝාදිසෙසා අයං සීලවිපත්ති. ථුල්ලච්චයං පාචිත්තියං පාටිදෙසනීයං දුක්කටං දුබ්භාසිතං අයං ආචාරවිපත්ති. මිච්ඡාදිට්ඨි අන්තග්ගාහිකාදිට්ඨි අයං දිට්ඨිවිපත්තී' ති. සො එවමස්ස වචනීයො: 'යං බො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො පවාරණං ඨපෙසි, දිට්ඨෙන ඨපෙසි? සුතෙන ඨපෙසි? පරිසඞ්කාය ඨපෙසී'ති. ?"

1. "සීලවිපත්තියා වා' ම. ඡ. සං. 2. "ජානාසි" ම ඡ සං.

13. "මහණෙනි, එදවස පවාරණයෙහි මහණෙක් තෙමේ මහණකුගේ පවාරණය නවතයි. 'මේ ආයුෂ්මත්තෙමේ කය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. වචනය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. අපිරිසිදු වූ දිවිපැවැතුම් ඇත්තේ ය. අඥ ය. අව්‍යක්ත ය. කරුණු විචාරණු ලබන්නේ කරුණු කීමට දක්ෂ නො වේ' යි අන්‍ය වූ භික්ෂූහු ඒ මහණහු දනිත්. 'මහණ, ඩබර නො කරව. කලහ නො කරව. විරුද්ධ ගැණිම් නො ගණුව. විරුද්ධවාද නො කරව' යි මෙසේ (ඔහුගේ කීම) මැඩ සඞ්ඝයා විසින් පැවරිය යුතු ය."

14. "මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි මහණෙක් තෙමේ මහණකුගේ පවාරණය නවතයි. 'මේ ආයුෂ්මත් තෙමේ කය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. වචනය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. පිරිසිදු වූ දිවිපැවැතුම් ඇත්තේ ය. අඥ ය. අව්‍යක්ත ය. කරුණු විචාරණු ලබන්නේ කරුණු කීමට දක්ෂ නො වේ' යි අන්‍ය වූ භික්ෂූහු ඒ මහණහු දනිත්. 'මහණ ඩබර නො කරව. කලහ නො කරව. විරුද්ධ ගැණිම් නො ගණුව. විරුද්ධ වාද නො කරව' යි මෙසේ (ඔහුගේ කීම) මැඩ සඞ්ඝයා විසින් පැවරිය යුතු ය."

15. "මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි මහණෙක් තෙමේ මහණකුගේ පවාරණය නවතයි. 'මේ ආයුෂ්මත් තෙමේ කය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. වචනය පිළිබඳ පිරිසිදු වූ හැසිරීම් ඇත්තේ ය. පිරිසිදු වූ දිවිපැවැතුම් ඇත්තේ ය. පණ්ඩිත ය. ව්‍යක්ත ය. කරුණු විචාරණු ලබන්නේ කරුණු කීමට දක්ෂ වේ' යි අන්‍ය වූ භික්ෂූහු ඒ මහණහු දනිත්. 'ඇවැත්නි, යම් හෙයකින් තෝ මේ මහණහුගේ පවාරණය නවත්වන්නෙහි කිනම් හෙතුවකින් එය නවත්වන්නෙහි ද ? සීලවිපත්තිය හෙතු කොට නවත්වන්නෙහි ද ? ආචාරවිපත්තිය හෙතු කොට නවත්වන්නෙහි ද ? දෘෂ්ටිවිපත්තිය හෙතු කොට නවත්වන්නෙහි ද ?'යි ඒ මහණ තෙමේ මෙසේ විචාළ යුතු වන්නේ ය."

16. "සීලවිපත්තිය හෙතු කොට හෝ නවතමි. ආචාරවිපත්තිය හෙතු කොට හෝ නවතමි. දෘෂ්ටිවිපත්තිය හෙතු කොට හෝ නවතමි' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්, 'ආයුෂ්මත් තෙමේ සීලවිපත්තිය දනී ද ? ආචාරවිපත්තිය දනී ද ? දෘෂ්ටි විපත්තිය දනී ද ?'යි ඒ මහණ තෙමේ මෙසේ විචාළ යුතු වන්නේ ය. 'ඇවැත්නි, මම සීලවිපත්තිය දනිමි. ආචාරවිපත්තිය දනිමි. දෘෂ්ටිවිපත්තිය දනිමි' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්, 'ඇවැත්නි, සීලවිපත්තිය කවරී ද ? ආචාරවිපත්තිය කවරී ද? දෘෂ්ටිවිපත්තිය කවරී ද ?' යි ඒ මහණ තෙමේ මෙසේ විචාළ යුතු වන්නේ ය."

17. "සතර පරිජි, තෙරස සඞ්ඝාදිසෙස යන මේ සීලවිපත්ති නම්. ථුල්ලච්චය පාචිත්තිය පාටිදෙසනීය දුක්කට දුබ්භාසිත යන මේ ආචාරවිපත්ති නම්. මිච්ඡාදිට්ඨි අන්තගාහකදිට්ඨි යන මේ දෘෂ්ටිවිපත්ති නම්' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්, 'ඇවැත්නි, යම් හෙයකින් තෝ මේ මහණහුගේ පවාරණය නවත්වන්නෙහි දක්නා ලද්දකින් නවත්වන්නෙහි ද ? අසන ලද්දකින් නවත්වන්නෙහි ද ? සැකයකින් නවත්වන්නෙහිද ?' යි ඒ මහණ තෙමේ මෙසේ ඇසිය යුතු වන්නේ ය."

18. "සො චෙ එවං වදෙය්‍ය: 'දිට්ඨෙන වා ඨපෙමි. සුතෙන වා ඨපෙමි. පරිසඞ්කාය වා ඨපෙමී' ති. සො එවමස්ස වචනීයො: 'යං ඛො ත්වං ආවුසො, ඉමස්ස භික්ඛුනො දිට්ඨෙන පවාරණං ඨපෙසි, කින්තෙ දිට්ඨං? කින්ති තෙ දිට්ඨං? කදා තෙ දිට්ඨං? කත්ථ තෙ දිට්ඨං? පාරාජිකං අජ්ඣාපන්නො දිට්ඨො? සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නො දිට්ඨො? ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නො දිට්ඨො? කත්ථ ච ත්වං අහොසි? කත්ථ චායං භික්ඛු අහොසි? කිඤ්ච ත්වං කරොසි? කිඤ්චායං භික්ඛු'කරොතී?'ති."

19. "සො චෙ එවං වදෙය්‍ය: 'න ඛො අහං ආවුසො, ඉමස්ස භික්ඛුනො දිට්ඨෙන පවාරණං ඨපෙමි. අපි ච සුතෙන පවාරණං ඨපෙමී' ති. සො එවමස්ස වචනීයො: 'යං ඛො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො සුතෙන පවාරණං ඨපෙසි, කින්තෙ සුතං? කින්ති තෙ සුතං? කදා තෙ සුතං? කත්ථ තෙ සුතං? පාරාජිකං අජ්ඣාපන්නොති සුතං? සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති සුතං? ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නොති සුතං? භික්ඛුස්ස සුතං? භික්ඛුණියා සුතං? සික්ඛමානාය සුතං? සාමණෙරස්ස සුතං? සාමණෙරියා සුතං? උපාසකස්ස සුතං? උපාසිකාය සුතං? රාජූනං සුතං? රාජමහාමත්තානං සුතං? තිත්ථියානං සුතං? තිත්ථියසාවකානං සුත?'න්ති."

20. "සො චෙ එවං වදෙය්‍ය: 'න ඛො අහං ආවුසො ඉමස්ස භික්ඛුනො සුතෙන පවාරණං ඨපෙමි. අපි ච පරිසඞ්කාය පවාරණං ඨපෙමී' ති. සො එවමස්ස වචනීයො: 'යං ඛො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො පරිසඞ්කාය පවාරණං ඨපෙසි, කිං පරිසඞ්කසි? කින්ති පරිසඞ්කසි? කදා පරිසඞ්කසි? කත්ථ පරිසඞ්කසි? පාරාජිකං අජ්ඣාපන්නොති පරිසඞ්කසි?. සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති පරිසඞ්කසි? ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නොති පරිසඞ්කසි? භික්ඛුස්ස සුත්වා පරිසඞ්කසි? භික්ඛුණියා සුත්වා පරිසඞ්කසි? සාමණෙරස්ස සුත්වා පරිසඞ්කසි? සාමණෙරියා සුත්වා පරිසඞ්කසි? උපාසකස්ස සුත්වා පරිසඞ්කසි? උපාසිකාය සුත්වා පරිසඞ්කසි? රාජූනං සුත්වා පරිසඞ්කසි? රාජමහාමත්තානං සුත්වා පරිසඞ්කසි? තිත්ථියානං සුත්වා පරිසඞ්කසි? තිත්ථියසාවකානං සුත්වා පරිසඞ්කසී' ?ති."

21. "සො චෙ එවං වදෙය්‍ය: 'න ඛො අහං ආවුසො ඉමස්ස භික්ඛුනො පරිසඞ්කාය පවාරණං ඨපෙමි. අපි ච අහං[1] න ජානාමි - කෙන අහං ඉමස්ස භික්ඛුනො පවාරණං ඨපෙමී' ති. සො චෙ භික්ඛවෙ, චොදකො භික්ඛු අනුයොගෙන විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං චිත්තං. න ආරාධෙති. 'අනනුවාදො චුදිතො භික්ඛූ'ති අලං වචනාය. සො චෙ භික්ඛවෙ, චොදකො භික්ඛු අනුයොගෙන විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං චිත්තං ආරාධෙති, 'සානුවාදො චුදිතො භික්ඛූ'ති අලං වචනාය."

1. "අපිච අහමපි" ම ඡ සං.

18. "දුටුවකින් හෝ නවත්වමි. ඇසුවකින් හෝ නවත්වමි. සැකයකින් හෝ නවත්වමි' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්, 'ඇවැත්නි, යම් හෙයකින් තෝ මේ මහණහුගේ පවාරණය දුටුවකින් නවත්වන්නෙහි නම්, තා විසින් කුමක් දක්නා ලද්දේ ද ? තා විසින් කිනම් ලෙසකින් දක්නා ලද්දේ ද ? තා විසින් කවර කලෙක දක්නා ලද්දේ ද ? තා විසින් කොතැනක දී දක්නා ලද්දේ ද ? පාරාජිකාවට පැමිණෙනුයේ දක්නා ලද්දේ ද ? සඞ්ඝාදිසෙසයට පැමිණෙනුයේ දක්නා ලද්දේ ද ? ථුල්ලච්චයයට -පෙ- පාචිත්තියට -පෙ- පාටිදෙසනීයයට -පෙ- දුක්කටයට -පෙ- දුබ්භාසිතයට පැමිණෙනුයේ දක්නා ලද්දේ ද ? තෝ කොතැනක වූයෙහි ද ? මේ මහණ කොතැනක වූයේ ද ? තෝ කුමක් කෙරෙහි ද ? මේ මහණ කුමක් කෙරේ ද ?'යි ඒ මහණ තෙමේ මෙසේ කිය යුතු වන්නේ ය."

19. "ඇවැත්නි, මම මේ මහණහුගේ පවාරණය දුටුවකින් නො නවතමි. එහෙත් ඇසුවකින් පවාරණය නවතමි' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්. 'ඇවැත්නි, යම් හෙයකින් තෝ මේ මහණහුගේ පවාරණය ඇසුවකින් නවතන්නෙහි නම්, තා විසින් කුමක් අසන ලද්දේ ද ? තා විසින් කිනම් ලෙසකින් අසන ලද්දේ ද ? තා විසින් කවර කලෙක අසන ලද්දේ ද ? තා විසින් කොතැනක දී අසන ලද්දේ ද ? පාරාජිකාවට පැමිණියේ යි අසන ලද්දේ ද ? සඞ්ඝාදිසෙසයට පැමිණියේ යි අසන ලද්දේ ද ? ථුල්ලච්චයයට -පෙ- පාචිත්තියට -පෙ- පාටිදෙසනීයයට -පෙ- දුක්කටයට -පෙ- දුබ්භාසිතයට පැමිණියේ යි අසන ලද්දේ ද ? මහණකුගෙන් අසන ලද්දේ ද ? මෙහෙණකගෙන් අසන ලද්දේ ද ? භික්මෙන්නියකගෙන් අසන ලද්දේ ද ? හෙරණකුගෙන් අසන ලද්දේ ද ? හෙරණියකගෙන් අසන ලද්දේ ද ? උපාසකයකුගෙන් අසන ලද්දේ ද? උපාසිකාවකගෙන් අසන ලද්දේ ද ? රජුන්ගෙන් අසන ලද්දේ ද ? රජමහඇමතියන්ගෙන් අසන ලද්දේ ද ? තීර්ථකයන්ගෙන් අසන ලද්දේ ද ? තීර්ථකශ්‍රාවකයන්ගෙන් අසන ලද්දේ ද?' යි ඒ මහණ තෙමේ මෙසේ ඇසිය යුතු වන්නේ ය."

20. "ඇවැත්නි, මම මේ මහණහුගේ පවාරණය ඇසුවකින් නො නවතමි. එහෙත් සැකයකින් පවාරණය නවතමි' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්, "ඇවැත්නි, යම් හෙයකින් තෝ මේ මහණහුගේ පවාරණය සැකයකින් නවතන්නෙහි නම්, කුමක් සැක කරන්නෙහි ද ? කිනම් ලෙසකින් සැක කරන්නෙහි ද ? කවර කලෙක සැක කරන්නෙහි ද ? කොතැනෙක දී සැක කරන්නෙහි ද? පාරාජිකාවට පැමිණියේ යි සැක කරන්නෙහි ද ? සඞ්ඝාදිසෙසයට පැමිණියේ යි සැක කරන්නෙහි ද ? ථුල්ලච්චයයට -පෙ- පාචිත්තියට -පෙ- පාටිදෙසනීයයට -පෙ- දුක්කටයට -පෙ- දුබ්භාසිතයට පැමිණියේ යි සැක කරන්නෙහි ද ? මහණකුගෙන් අසා සැක කරන්නෙහි ද ? මෙහෙණකගෙන් අසා සැක කරන්නෙහි ද ? භික්මෙන්නියකගෙන් අසා සැක කරන්නෙහි ද ? හෙරණකුගෙන් අසා සැක කරන්නෙහි ද ? හෙරණකගෙන් අසා සැක කරන්නෙහි ද ? උපාසකයකුගෙන් අසා සැක කරන්නෙහි ද ? උපාසිකාවකගෙන් අසා සැක කරන්නෙහි ද ? රජුන්ගෙන් අසා සැක කරන්නෙහි ද ? රජමහඇමැතියන්ගෙන් අසා සැක කරන්නෙහි ද ? තීර්ථකයන්ගෙන් අසා සැක කරන්නෙහි ද ? තීර්ථකශ්‍රාවකයන්ගෙන් අසා සැක කරන්නෙහි ද ?' යි ඒ මහණ තෙමේ මෙසේ ඇසිය යුතු වන්නේ ය."

21 "ඇවැත්නි, මම මේ මහණහුගේ පවාරණය සැකයකින් නො නවත්වමි. එහෙත් මම මේ මහණහුගේ පවාරණය කුමකින් නවත්වම් ද ? යි මම නො දනිමි' යි ඒ මහණ තෙමේ මෙසේ කියන්නේ නම්, මහණෙනි, ඒ චොදක භික්ෂු තෙමේ ප්‍රශ්න කිරීමෙන් නුවණැති සබ්රම්සරුන්ගේ සිත සතුටු නො කෙරේ ද 'චුදිත භික්ෂු තෙමේ චොදනා රහිතයෙකැ' යි කීමට සුදුසු වේ. මහණෙනි, ඒ චොදක භික්ෂු තෙමේ ප්‍රශ්න කිරීමෙන් නුවණැති සබ්රම්සරුන්ගේ සිත සතුටු කෙරේ ද, 'චුදිතභික්ෂු තෙමේ චොදනා-සහිතයෙකැ'යි කීමට සුදුසු වේ.

22. "සො චෙ භික්ඛවෙ, චොදකො භික්ඛු අමූලකෙන පාරාජිකෙන අනුද්ධංසිතං පටිජානාති, සඞ්ඝාදිසෙසං ආරොපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං. සො චෙ භික්ඛවෙ, චොදකො භික්ඛු අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසිතං පටිජානාති, යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං. සො චෙ භික්ඛවෙ, චොදකො භික්ඛු අමූලකෙන ථුල්ලච්චයෙන -පෙ- පාචිත්තියෙන -පෙ- පාටිදෙසනීයෙන -පෙ- දුක්කටෙන -පෙ- දුබ්භාසිතෙන අනුද්ධංසිතං පටිජානාති, යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං."

23. "සො චෙ භික්ඛවෙ, චුදිතො භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නොති පටිජානාති, නාසෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං. සො චෙ භික්ඛවෙ චුදිතො භික්ඛු සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති පටිජානාති, සඞ්ඝාදිසෙසං ආරොපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං. සො චෙ භික්ඛවෙ, චුදිතො භික්ඛු ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නොති පටිජානාති, යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බං."

24. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය ථුල්ලච්චයං අජ්ඣාපන්නො හොති. එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ සඞ්ඝාදිසෙසදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ, භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො පවාරෙය්‍යා'ති. ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය ථුල්ලච්චයං අජ්ඣාපන්නො හොති. එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. -පෙ- එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාටිදෙසනීය දිට්ඨිනො හොන්ති. -පෙ- එකච්චෙ භික්ඛූ ථුල්ලච්චය දිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. -පෙ- එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ දුබ්භාසිත-දිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ, භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං ඛො සො ආවුසො, භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා'ති."

22. "මහණෙනි, ඒ චෝදකභික්ෂු තෙමේ අමූලික වූ පාරාජිකාපත්තිය කින් චෝදනා කිරීම ප්‍රතිඥා කෙරේ ද, (ඒ චෝදකයාට) සඞ්ඝාදිසෙසාපත්තිය ආරෝපණය කොට සඞ්ඝයා විසින් පැවරිය යුතු ය. මහණෙනි, ඒ චෝදකභික්ෂු තෙමේ අමූලික වූ සඞ්ඝාදිසෙසාපත්තියකින් චෝදනා කිරීම ප්‍රතිඥා කෙරේ ද, (ඔහුට) ඇවැත් පරිදි කරවා සඞ්ඝයා විසින් පැවරිය යුතු ය.' මහණෙනි, චෝදකභික්ෂු තෙමේ අමූලික වූ ථුල්ලච්චයාපත්තියකින් -පෙ- පාචිත්තියාපත්තියකින් -පෙ- පාටිදෙසනීයාපත්තියකින් දුක්කටාපත්තියකින් -පෙ- දුබ්භාසිතාපත්තියකින් චෝදනා කිරීම ප්‍රතිඥා කෙරේ ද, ධර්මය පරිදි කරවා සඞ්ඝයා විසින් පැවරිය යුතු ය."

23. "මහණෙනි, චුදිත භික්ෂු තෙමේ 'පාරාජිකාපත්තියට පැමිණියෙමි' යි ප්‍රතිඥා කෙරේ ද, ලිඞ්ගනාසනය කොට (=සිවුරු හරවා) සඞ්ඝයා විසින් පැවරිය යුතු ය. මහණෙනි, චුදිතභික්ෂු තෙමේ 'සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණියෙමි' යි ප්‍රතිඥා කෙරේ ද, (ඔහුට) සඞ්ඝාදිසෙසාපත්තිය ආරෝපණය කොට සඞ්ඝයා විසින් පැවරිය යුතු ය. මහණෙනි, චුදිතභික්ෂු තෙමේ 'ථුල්ලච්චයාපත්තියකට -පෙ- පාචිත්තියාපත්තියකට -පෙ- පාටිදෙසනීයාපත්තියකට -පෙ- දුක්කටාපත්තියකට -පෙ- දුබ්භාසිතාපත්තියකට පැමිණියෙමි' යි ප්‍රතිඥා කෙරේ ද, (ඔහුට) ධර්මය පරිදි කරවා සඞ්ඝයා විසින් පැවරිය යුතු ය."

24. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එදවස පවාරණයෙහි ථුල්ලච්චයාපත්තියකට පැමිණියේ වේ. ඇතැම් මහණෝ ථුල්ලච්චයාපත්තිය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් මහණෝ සඞ්ඝාදිසෙසාපත්තිය යන ලබ්ධි ඇත්තෝ වෙත්. මහණෙනි, යම් ඒ මහණෝ ථුල්ලච්චයාපත්තිය යන ලබ්ධිය ඇත්තෝ වෙත් ද, මහණෙනි, ඒ මහණුන් විසින් ඒ මහණ තෙමේ පසෙකට ඉවත් කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙතට එළඹ මෙසේ කිය යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ මහණ තෙමේ යම් ඇවැතකට පැමිණියේ ද, ඔහු විසින් ඒ ඇවැත විනය පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේය' යි. මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි මහණෙක් තෙමේ ථුල්ලච්චයාපත්තියකට පැමිණියේ වේ. ඇතැම් මහණෝ ථුල්ලච්චය ය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. ඇතැම් මහණෝ පාචිත්තිය ය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. -පෙ- ඇතැම් මහණෝ ථුල්ලච්චය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. ඇතැම් මහණෝ පාටිදෙසනීය ය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. -පෙ- ඇතැම් මහණෝ ථුල්ලච්චය ය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. ඇතැම් මහණෝ දුක්කටය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. -පෙ- ඇතැම් මහණෝ ථුල්ලච්චය ය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. ඇතැම් මහණෝ දුබ්භාසිතය යන ලබ්ධිය ඇත්තෝ වෙත්. මහණෙනි, යම් ඒ මහණෝ ථුල්ලච්චය ය යන ලබ්ධිය ඇත්තෝ වෙත් ද මහණෙනි, ඒ මහණුන් විසින් ඒ මහණ තෙමේ පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කිය යුතු වන්නේ ය. "ඇවැත්නි, ඒ මහණ තෙමේ යම් ඇවැතකට පැමිණියේ ද, ඔහු විසින් ඒ ඇවැත විනය පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේය' යි."

25. “ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය පාචිත්තියං අජ්ඣාපන්නො හොති. [එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ සඞ්ඝාදිසෙසදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ පාචිත්තියදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා’ති. ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො හොන්ති. -පෙ- ඉධ පන භික්ඛවෙ, -පෙ- එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. -පෙ- ඉධ පන භික්ඛවෙ, -පෙ- එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ, භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා’ති.

26. “[ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය] පාටිදෙසනීයං අජ්ඣාපන්නො හොති. [එකච්චෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ සඞ්ඝාදිසෙසදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා’ති. ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති. -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ පාටිදෙසනීය දිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ, භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: ‘යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා’ති.]”

---

25 - 28 - ඉධ පන පාචිත්තියතො යාව දුබ්භාසිතාපත්තියා ආගතා පාළි වත්තමාන පොත්ථකෙසු “ඉධ පන භික්ඛවෙ භික්ඛු තදහු පවාරණාය පාචිත්තියං අජ්ඣාපන්නො හොති - පාටිදෙසනීයං අජ්ඣාපන්නො හොති” ඉච්චාදිනා පෙය්‍යාලමුඛෙන අතිසඞ්ඛිත්තත්තා අවිසදා. තස්මාමෙත්ථ සුඛග්ගහණත්ථාය ආපත්තිවාරවසෙන “[ - ]” ඉමෙහි අන්තරිතපදානි පාළිනයං නිස්සාය පෙය්‍යාලමුඛෙන උද්ධරිතානි.

25. "මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි භික්ෂු නමක් පචිති ඇවැතකට පැමිණියේ වේ. *[ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු සඞ්ඝාදිසෙස ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු ද, ඒ භික්ෂූන් විසින් ඒ භික්ෂු තෙමේ පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කියයුතු වන්නේ ය. 'ඇවැත්නි, ඒ භික්ෂුතෙමේ යම් ඇවැතකට පැමිණියේ ද ඒ ඇවැත විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි. මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු තුලසි ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තාහු වෙත් -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු දුබ්භාසිතය යන ලබ්ධි ඇත්තාහු වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු පචිතිය යන ලබ්ධි ඇත්තෝ ද, ඔවුන් විසින් ඒ භික්ෂුතෙම පසෙකට ඉවත් කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, ඒ භික්ෂු තෙමේ යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවැතට විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝතෙමේ පවරන්නේ ය' යි.]

26. "[මහණෙනි, මෙහි එ දවස පවාරණයෙහි භික්ෂු නමක්] පාටිදෙසනීය ඇවැතකට පැමිණියේ වේ. *[ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු සඞ්ඝාදිසෙස ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තාහු ද, මහණෙනි, ඔවුන් විසින් ඒ භික්ෂුතෙමේ පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කියයුතු වන්නේය. "ඇවැත්නි, ඒ භික්ෂු තෙමේ යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවැත විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි. මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු තුලසි ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. -පෙ- මහණෙනි මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තෝ ද, මහණෙනි, ඔවුන් විසින් ඒ භික්ෂු තෙමේ පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කියයුතු වන්නේ ය. 'ඇවැත්නි, ඒ භික්ෂු තෙමේ යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවැතට විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි.]

---

* උපග්‍රන්ථය බලනු.

27. ["ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය] දුක්කටං අජ්ඣාපන්නො හොති. එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ සඞ්ඝාදිසෙසදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා'ති. ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාටිදෙසනීයදිට්ඨිනො හොන්ති. -පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ- එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ දුබ්භාසිත-දිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා'ති."]

28. ["ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය] දුබ්භාසිතං අජ්ඣාපන්නො හොති. එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ සඞ්ඝාදිසෙසදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො, තෙහි සො භික්ඛවෙ, භික්ඛු එකමන්තං අපනෙත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා'ති. ඉධ පන භික්ඛවෙ භික්ඛු තදහු පවාරණාය දුබ්භාසිතං අජ්ඣාපන්නො හොති. එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ ථුල්ලච්චයදිට්ඨිනො හොන්ති. [-පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ-] එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාචිත්තියදිට්ඨිනො හොන්ති. [-පෙ- ඉධ පන භික්ඛවෙ, -පෙ-] එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති. එකච්චෙ භික්ඛූ පාටිදෙසනීය දිට්ඨිනො හොන්ති. [-පෙ- ඉධ පන භික්ඛවෙ -පෙ-] එකච්චෙ භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො හොන්ති එකච්චෙ භික්ඛූ දුක්කටදිට්ඨිනො හොන්ති. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ දුබ්භාසිතදිට්ඨිනො තෙහි සො භික්ඛවෙ, භික්ඛු එකමන්තං අපනෙත්වා යථා ධම්මං කාරාපෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'යං ඛො සො ආවුසො භික්ඛු ආපත්තිං ආපන්නො, සාස්ස යථාධම්මං පටිකතා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍යා'ති."

29. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං වත්ථු පඤ්ඤායති, න පුග්ගලො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, වත්ථුං ඨපෙත්වා සඞ්ඝො පවාරෙය්‍යා'ති. සො එවමස්ස වචනීයො: 'භගවතා ඛො ආවුසො විසුද්ධානං පවාරණා පඤ්ඤත්තා. සචෙ වත්ථු පඤ්ඤායති, න පුග්ගලො, ඉදානෙව නං වදෙහී' ති."

27. ["මහණෙනි, මෙහි භික්ෂු නමක් එදවස පවාරණයෙහි] දුක්කටා-පත්තියකට පැමිණියේ වේ. ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු සඞ්ඝාදිසෙසය යන ලබ්ධි ඇත්තාහු වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තාහු ද, ඔවුන් විසින් ඒ භික්ෂු තෙමේ පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කිය යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ භික්ෂුතෙමේ යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවත විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු දුක්කටය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් භික්ෂූහු තුලසි ය යන ලබ්ධි ඇත්තෝ වෙත් -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තෝ වෙත් -පෙ- මහණෙනි මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. -පෙ- මහණෙනි, මෙහි -පෙ- ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු දුක්කට ලබ්ධි ඇත්තෝ ද, මහණෙනි, ඔවුන් විසින් ඒ භික්ෂුතෙම පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කිය යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ භික්ෂුතෙම යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවැතට විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි."

28. ["මහණෙනි, මෙහි එදවස පවාරණයෙහි භික්ෂුනමක්] දුබ්භාසිතා-පත්තියකට පැමිණියේ වේ. ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තාහු වෙත්. ඇතැම් භික්ෂූහු සඞ්ඝාදිසෙස ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. මහණෙනි, යම් ඒ භික්ෂූහු දුක්කටය යන ලබ්ධි ඇත්තෝ ද, මහණෙනි, ඔවුන් විසින් ඒ භික්ෂු තෙම එක්පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කිය යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ භික්ෂුතෙම යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවැතට විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝතෙමේ පවරන්නේ ය' යි [මහණෙනි, මෙහි -පෙ-] ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් භික්ෂූහු තුලසි ය යන ලබ්ධි ඇත්තෝ වෙති. [-පෙ- මහණෙනි, මෙහි -පෙ-] ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තෝ වෙති. ඇතැම් භික්ෂූහු පචිති ය යන ලබ්ධි ඇත්තෝ වෙති. [-පෙ- මහණෙනි, මෙහි -පෙ-] ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තෝ වෙත්. ඇතැම් භික්ෂූහු පාටිදෙසනීය ය යන ලබ්ධි ඇත්තෝ වෙත් [-පෙ- මහණෙනි, මෙහි -පෙ-] ඇතැම් භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තෝ වෙති. ඇතැම් භික්ෂූහු දුක්කට ය යන ලබ්ධි ඇත්තෝ වෙති. මහණෙනි, යම් ඒ භික්ෂූහු දුබ්භාසිත ය යන ලබ්ධි ඇත්තෝ ද, මහණෙනි, ඔවුන් විසින් ඒ භික්ෂුතෙම පසෙකට බැහැර කොට ඇවැත් පරිදි කරවා සඞ්ඝයා වෙත එළඹ මෙසේ කිය යුතු වන්නේ ය: 'ඇවැත්නි, ඒ භික්ෂුතෙම යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ඇවැතට විනය වූ පරිදි පිළියම් කරණ ලදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි."

29. "මහණෙනි, මෙහි මහණෙක්-තෙමේ එදවස පවාරණයෙහි සඟ මැද 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ වස්තුව පෙණේ. පුද්ගල තෙමේ නො පෙණේ. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, වස්තුව තබා සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි කියන්නේ ය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිසිදු මහණුන්ට පවාරණය පණවන ලද්දේ ය. වස්තුව පෙණේ නම්, පුද්ගල තෙමේ නො පෙණේ නම්, දැන් ම එය කියව' යි ඒ මහණ තෙමේ මෙසේ කිය යුතු වන්නේ ය:

30. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං පුග්ගලො පඤ්ඤායති, න වත්ථු. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, පුග්ගලං ඨපෙත්වා සඞ්ඝො පවාරෙය්‍යා' ති. සො එවමස්ස වචනීයො: 'භගවතා ආවුසො විසුද්ධානඤ්ච[1] සමග්ගානඤ්ච පවාරණා පඤ්ඤත්තා. සචෙ පුග්ගලො පඤ්ඤායති, න වත්ථු, ඉදානෙව නං වදෙහී'ති."

31. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු තදහු පවාරණාය සඞ්ඝමජ්ඣෙ උදාහරෙය්‍ය: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං වත්ථු ච පුග්ගලො ච පඤ්ඤායති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, වත්ථුඤ්ච පුග්ගලඤ්ච ඨපෙත්වා සඞ්ඝො පවාරෙය්‍යා' ති. සො' එවමස්ස වචනීයො: 'භගවතා ඛො ආවුසො විසුද්ධානඤ්ච සමග්ගානඤ්ච පවාරණා පඤ්ඤත්තා. සචෙ වත්ථු ච පුග්ගලො ච පඤ්ඤායති, ඉදානෙව නං වදෙහී' ති. පුබ්බෙ වෙ භික්ඛවෙ, පවාරණාය වත්ථු පඤ්ඤායති, පච්ඡා පුග්ගලො, කල්ලං වචනාය. පුබ්බෙ වෙ භික්ඛවෙ, පවාරණාය පුග්ගලො පඤ්ඤායති, පච්ඡා වත්ථු, කල්ලං වචනාය. පුබ්බෙ වෙ භික්ඛවෙ, පවාරණාය වත්ථු ච පුග්ගලො ච පඤ්ඤායති, තඤ්ච කතාය පවාරණාය උක්කොටෙති. උක්කොටනකං පාචිත්තිය' න්ති."

32. තෙන ඛො පන සමයෙන සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡිංසු. තෙසං සාමන්තා අඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා වස්සං උපගච්ඡිංසු: "මයං තෙසං භික්ඛූනං වස්සං වුත්ථානං පවාරණාය පවාරණං ඨපෙස්සාමා" ති. අස්සොසුං ඛො තෙ භික්ඛූ "අම්හාකං කිර සාමන්තා අඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා වස්සං උපගතා 'මයං තෙසං භික්ඛූනං වස්සං වුත්ථානං පවාරණාය පවාරණං ඨපෙස්සාමා'ති. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

33. "ඉධ පන භික්ඛවෙ, සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡන්ති. තෙසං සාමන්තා අඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා වස්සං උපගච්ඡන්ති: 'මයං තෙසං භික්ඛූනං වස්සං වුත්ථානං පවාරණාය පවාරණං ඨපෙස්සාමා' ති. අනුජානාමි භික්ඛවෙ, තෙහි භික්ඛූහි ද්වෙ තයො උපොසථෙ චාතුද්දසිකෙ කාතුං 'කථං මයං තෙහි භික්ඛූහි පඨමතරං පවාරෙය්‍යාමා' ති."

34. "තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා තං ආවාසං ආගච්ඡන්ති, තෙහි භික්ඛවෙ, ආවාසිකෙහි භික්ඛූහි ලහුං ලහුං සන්නිපතිත්වා පවාරෙතබ්බං. පවාරෙත්වා වත්තබ්බා: 'පවාරිතා ඛො මයං ආවුසො. යථායස්මන්තා මඤ්ඤන්ති, තථා කරොන්තූ' ති."

1. "විසුද්ධානං" ඉති මරම්මක්ඛරපොත්ථකෙ න දිස්සතෙ.

30. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එදවස පවාරණයෙහි සඟ මැද 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ පුද්ගලතෙමේ පෙණේ. වස්තුව නො පෙණේ. සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, පුද්ගලයා තබා සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි කියන්නේ ය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිසිදු වූ ද සමගි වූ ද මහණුන්ට පවාරණය පණවන ලද්දේ ය. පුද්ගල තෙමේ පෙණේ නම්, වස්තුව නො පෙණේ නම්, දැන් ම ඔහු කියව' යි ඒ මහණ තෙමේ මෙසේ කිය යුතු වන්නේ ය."

31. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එදවස පවාරණයෙහි සඟ මැද 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ වස්තුව ද පුද්ගල තෙමේ ද පෙණේ. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් වේ නම්, වස්තුව ද පුද්ගලයා ද තබා සඞ්ඝ තෙමේ පවරන්නේ ය' යි කියන්නේ ය. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිසිදු වූ ද සමගි වූ ද මහණුන්ට පවාරණය පණවන ලද්දේ ය. වස්තුව ද පුද්ගලයා ද පෙණේ නම්, දැන් ම එය කියව' යි ඒ මහණ තෙමේ මෙසේ කිය යුතු වන්නේ ස. මහණෙනි, පැවරීමට පෙර වස්තුව පෙණේ ද, පසු ව පුද්ගලයා පෙණේ ද, කීමට (චොදනා කිරීමට) සුදුසු වේ. මහණෙනි, පැවරීමට පෙර පුද්ගලයා පෙණේ ද, පසු ව වස්තුව පෙණේ ද, කීමට (චොදනා කිරීමට) සුදුසු වේ. මහණෙනි, පැවරීමට පෙර වස්තුවත් පුද්ගලයාත් පෙණේ ද, පැවරීම කළ කල්හි එය උගුළුවා ද (=නැවත විනිශ්චය කිරීමට ඉල්ලා ද, එකල්හි) උක්කොටනක (=විනයානුකූල ව සමථයට පැමිණ වූ අධිකරණයක් නැවත විනිශ්චය කිරීමට සැලැස්වීම් හෙතුවෙන් වන) පාචිත්තිය වේ යි."

32. එකල්හි දුටුමිතුරු වූ දැකිමිතුරු වූ බොහෝ භික්ෂූහු **කොසොල්** දනව්වෙහි එක්තරා ආවාසයෙක වස් එළඹියහ. ඒ භික්ෂූන්ට සමීප තැනෙක ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ අන්‍ය වූ භික්ෂූහු "අපි වස් වැස නිම කළ ඒ භික්ෂූන්ගේ පවාරණයෙහි දී පවාරණය නවතන්නෙමු" යි වස් එළඹියහ. ඒ භික්ෂූහු "ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ අන්‍ය වූ භික්ෂූහු 'අපි වස් වැස නිම කළ ඒ භික්ෂූන්ගේ පවාරණයෙහි දී පවාරණය නවතන්නෙමු' යි අපට සමීප තැනෙක වස් එළඹියාහු" යි ඇසූහ. "අප විසින් (මෙහි දී) කෙසේ පිළිපැදිය යුතු ද?" භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

33. "මහණෙනි, මෙහි දුටුමිතුරු වූ දැකිමිතුරු වූ බොහෝ භික්ෂූහු එක්තරා ආවාසයෙක වස් එළඹෙත්. ඔවුන්ට සමීප තැනෙක ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ අන්‍ය වූ භික්ෂූහු 'අපි වස් වැස නිම කළ ඒ භික්ෂූන්ගේ පවාරණයෙහි දී පවාරණය නවතන්නෙමු' යි වස් එළඹෙත්. මහණෙනි, 'අපි ඒ භික්ෂූන්ට වඩා පළමු කොට කෙසේ පවරන්නෙමු දැ' යි ඒ (මිතුරු වූ) භික්ෂූන් විසින් පොහොය දෙක තුනක් චාතුද්දසික කිරීමට අනුදනිමි" යි.

34. "මහණෙනි, ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ ඒ භික්ෂූහු ඒ ආවාසයට එත් ද මහණෙනි, ආවාසික වූ ඒ භික්ෂූන් විසින් ඉක්මනින් ම රැස් වී පැවරිය යුතු ය. පවරා 'ඇවැත්නි, අපි පැවරුවෝ වෙමු. ආයුෂ්මත්හු යම් සේ හඟිත් ද, එසේ කෙරෙත්වා' යි කිය යුතු ය."

35. "තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා අසංවිහිතා තං ආවාසං ආගච්ඡන්ති, තෙහි භික්ඛවෙ, ආවාසිකෙහි භික්ඛූහි ආසනං පඤ්ඤපෙතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. පානීයෙන පුච්ඡිතබ්බා[1]. තෙ සංවික්ඛිත්වා[2] නිස්සීමං ගන්ත්වා පවාරෙතබ්බං. පවාරෙත්වා වත්තබ්බා: 'පවාරිතා ඛො මයං ආවුසො, යථායස්මන්තා මඤ්ඤන්ති, තථා කරොන්තූ' ති. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, ආවාසිකෙන[3] භික්ඛවෙ, භික්ඛුනා ව්‍යත්තෙන පටිබලෙන ආවාසිකා භික්ඛූ ඤාපෙතබ්බා: 'සුණන්තු මෙ ආයස්මන්තා ආවාසිකා, යදායස්මන්තානං පත්තකල්ලං, ඉදානි උපොසථං කරෙය්‍යාම. පාතිමොක්ඛං උද්දිසෙය්‍යාම. ආගමෙ කාලෙ පවාරෙය්‍යාමා' ති.

36. "තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා තෙ භික්ඛූ එවං වදෙය්‍යුං: 'සාධාවුසො, ඉදානෙව නො පවාරෙථා' ති. තෙ එවමස්සු වචනීයා: 'අනිස්සරා ඛො තුම්හෙ ආවුසො අම්හාකං පවාරණාය. න තාව මයං පවාරෙය්‍යාමා' ති.

37. "තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාද කාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා තං කාලං අනුවසෙය්‍යුං, ආවාසිකෙන භික්ඛවෙ, භික්ඛුනා[3] ව්‍යත්තෙන පටිබලෙන ආවාසිකා භික්ඛූ ඤාපෙතබ්බා: 'සුණන්තු මෙ ආයස්මන්තා ආවාසිකා, යදායස්මන්තානං පත්තකල්ලං, ඉදානි උපොසථං කරෙය්‍යාම. පාතිමොක්ඛං උද්දිසෙය්‍යාම. ආගමෙ ජුණ්හෙ පවාරෙය්‍යාමා' ති.

38. "තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාද කාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා තෙ භික්ඛූ එවං වදෙය්‍යුං: 'සාධාවුසො, ඉදානෙව නො පවාරෙථා' ති.[4] තෙ එවමස්සු වචනීයා: 'අනිස්සරා ඛො තුම්හෙ ආවුසො අම්හාකං පවාරණාය. න තාව පවාරෙය්‍යාමා' ති.

39. "තෙ චෙ භික්ඛවෙ, භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාද කාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා තම්පි ජුණ්හං අනුවසෙය්‍යුං, තෙහි භික්ඛවෙ, භික්ඛූහි සබ්බෙහෙව ආගමෙ ජුණ්හෙ කොමුදියා චාතුමාසිනියා අකාමා පවාරෙතබ්බං.

40. "තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි පවාරියමානෙ ගිලානො අගිලානස්ස පවාරණං ඨපෙති. සො එවමස්ස වචනීයො: 'ආයස්මා ඛො ගිලානො; ගිලානො ච අනනුයොගක්ඛමො වුත්තො භගවතා. ආගමෙහි ආවුසො යාව අරොගො හොසි. අරොගො ආකඞ්ඛමානො චොදෙස්සසී' ති. එවං චෙ වුච්චමානො චොදෙති, අනාදරියෙ පාචිත්තියං.

---

1. "පරිපුච්ඡිතබ්බා" ම ඡ සං.
2 "වික්ඛිපාපෙත්වා" ති එකච්චෙ, ආවික්ඛිත්වා "ති අපරෙ.
3. "ආවාසිකෙන භික්ඛුනා" ම ඡ සං. නො දි. ම් නු ප.
4. "පවාරෙය්‍යාථාති" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

35. "මහණෙනි, ඩබර කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ ඒ භික්ෂූහු සංවිදහන රහිත ව (එන බව නො අඟවා) ඒ ආවාසයට එත් නම්, මහණෙනි, ඒ ආවාසික භික්ෂූන් විසින් අලුත් පැණවිය යුතු ය. පා ධෝනා දිය පාපුටුව පාපුවරුව එළවිය යුතු ය. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගත යුතු ය. පැනින් පිළිවිසිය යුත්තාහ. ඒ ඩබරකරුමහණුන් මුළා කොට ('තෙපි කලානත වූවහු ය. මොහොතක් විඩා සංසිඳුවා ගණිවු' යි) සීමාවෙන් බැහැරට ගොස් පැවරිය යුතු ය. පවරා 'ඇවැත්නි, අපි පැවරුවෝ වෙමු. ආයුෂ්මත්හු යම් සේ හඟිත් නම්, එසේ කෙරෙත්වා' යි කිය යුතු ය. මෙය මෙසේ ලබන්නහු නම්, ඒ යහපත් ය. නො ලබන්නහු නම්, මහණෙනි, ආවාසික වූ ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් ඒ ආවාසිකභික්ෂූහු දත්විය යුතු ය. 'ආයුෂ්මත් වූ ආවාසික භික්ෂූහු මාගේ වචනය අසත් වා. ආයුෂ්මතුන්ට පැමිණි කල් ඇත්තේ නම්, දැන් පොහොය කරන්නෙමු. පාමොක් උදෙසන්නෙමු. ලබන කළුවර පොහොය දිනයෙහි පවරන්නෙමු' යි.

36. "මහණෙනි, ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ ඒ භික්ෂූහු 'ඇවැත්නි, මැනවි. දැන් ම අපට පවරවු' යි ඒ ආවාසික භික්ෂූන්ට මෙසේ කියන්නාහු ද, ඒ ඩබරකරුමහණහු 'ඇවැත්නි, තෙපි අපගේ පවාරණයෙහි අධිපතීහු නො වහු. අපි ඒ තාක් කල් (ලබන පොහොය තෙක්) නො පවරන්නෙමු'යි මෙසේ කිය යුතු වන්නාහු ය.

37. "මහණෙනි, ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ ඒ භික්ෂූහු ඒ කළුවර පොහොය (මහාපවාරණදිනය පටන් තුදුස්වක) තෙක් එක් ව වසන්නාහු නම්, මහණෙනි, ආවාසික වූ ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් ආවාසික භික්ෂූහු දත්විය යුතු ය: 'ආයුෂ්මත් වූ ආවාසික භික්ෂූහු මාගේ වචනය අසත්වා. ආයුෂ්මතුන්ට පැමිණි කල් ඇත්තේ නම්, දැන් පොහොය කරන්නෙමු. පාමොක් උදෙසන්නෙමු. ලබන ජුණ්හයෙහි (පුරපසළොස්වක්හි) පවරන්නෙමු' යි.

38. "මහණෙනි, ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ ඒ භික්ෂූහු ඒ ආවාසික භික්ෂූන්ට 'ඇවැත්නි, මැනවි. දැන් ම අපට පවරවු' යි මෙසේ කියන්නාහු නම්, ඒ භික්ෂූහු 'ඇවැත්නි, තෙපි අපගේ පවාරණයෙහි ඊශ්වර නො වහු. අපි ඒ තාක් කල් නො පවරන්නෙමු' යි මෙසේ කිය යුතු වන්නාහු ය.

39. "මහණෙනි, ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපද වන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත නඩු කියන්නා වූ ඒ භික්ෂූහු ඒ පවාරණසිදිනයෙහි ද එක් ව වසන්නාහු නම්, මහණෙනි, ඒ සියලු භික්ෂූන් විසින් ම ඉදිරියෙහි එන සිවුමස්පිරීම් ඇති කොමුදී නම් ඉල් පුරපසළොස්වක්හි* නො කැමැත්තෙන් (අවශ්‍යයෙන්) පැවරිය යුතු ය.

40. "මහණෙනි, ඒ භික්ෂූන් විසින් පවාරණය කරණු ලබන කල්හි ගිලන් මහණෙක් නොගිලන් මහණකුගේ පැවරීම නවත්වා ද, ඒ මහණ තෙමේ 'ආයුෂ්මත් තෙමේ ගිලන් ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ගිලන් තෙමේ ද කරුණු විචාරීමට නුසුදුස්සෙකැ' යි වදාරණ ලද්දේ ය. ඇවැත්නි, යම් තාක් කල් රෝග නැත්තෙක් වෙහි ද, (ඒ තාක් කල්) බලාපොරොත්තු වෙව, රෝග නැත්තෙහි කැමැත්තෙහි චෝදනා කරන්නෙහි" යි කිය යුතු වන්නේ ය. මෙසේ කියනු ලබන්නේ චෝදනා කෙරේ නම්, අනාදරයෙහි පචිති වේ.

---

* උපග්‍රන්ථය බලනු.

41. "තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි පවාරියමානෙ අගිලානො ගිලානස්ස පවාරණං ඨපෙති, සො එවමස්ස වචනීයො: 'අයං ඛො ආවුසො භික්ඛු ගිලානො. ගිලානො ච අනනුයොගක්ඛමො වුත්තො භගවතා. ආගමෙහි ආවුසො යාවායං භික්ඛු අරොගො හොති. අරොගං ආකඞ්ඛමානො චොදෙස්සසී' ති. එවඤ්චෙ වුච්චමානො චොදෙති, අනාදරියෙ පාචිත්තියං.

42. "තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි පවාරියමානෙ ගිලානො ගිලානස්ස පවාරණං ඨපෙති, සො එවමස්ස වචනීයො: 'ආයස්මන්තා ඛො ගිලානා. ගිලානො ච අනනුයොගක්ඛමො වුත්තො භගවතා. ආගමෙහි ආවුසො යාව අරොගා හොථ. අරොගො අරොගං ආකඞ්ඛමානො චොදෙස්සසී' ති. එවං චෙ වුච්චමානො චොදෙති, අනාදරියෙ පාචිත්තියං.

43. "තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි පවාරියමානෙ අගිලානො අගිලානස්ස පවාරණං ඨපෙති, උභො සඞ්ඝෙන සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා[1] යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බ" න්ති.

44. තෙන ඛො පන සමයෙන සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡිංසු. තෙසං සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං විහරතං අඤ්ඤතරො ඵාසු-විහාරො අධිගතො හොති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "අම්හාකං ඛො සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං විහරතං අඤ්ඤතරො ඵාසුවිහාරො අධිගතො. සචෙ මයං ඉදානි පවාරෙස්සාම, සියාපි භික්ඛූ පවාරෙත්වා චාරිකං පක්කමෙය්‍යුං. එවං මයං ඉමම්හා ඵාසුවිහාරා පරිබාහිරා භවිස්සාම. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

45. "ඉධ පන භික්ඛවෙ, සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡන්ති, තෙසං සමග්ගානං සම්මොද-මානානං අවිවදමානානං විහරතං අඤ්ඤතරො ඵාසුවිහාරො අධිගතො හොති. තත්‍ර චෙ භික්ඛූනං එවං හොති: 'අම්හාකං ඛො සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං විහරතං අඤ්ඤතරො ඵාසුවිහාරො අධිගතො. සචෙ මයං ඉදානි පවාරෙස්සාම, සියාපි භික්ඛූ පවාරෙත්වා චාරිකං පක්කමෙය්‍යුං, එවං මයං ඉමම්හා ඵාසුවිහාරා පරිබාහිරා භවිස්සාමා' ති.

1 "සමනුභාසිත්වා" ඉති එකච්චෙසු සීහලක්ඛරපොත්ථකෙසු ච මරම්මක්ඛර පොත්ථකෙ ච න දිස්සතෙ.

Free Distribution www.aathaapi.org

41. "මහණෙනි, ඒ භික්‍ෂූන් විසින් පවාරණය කරණු ලබන කල්හි නො ගිලන් මහණෙක් ගිලන් මහණකුගේ පවාරණය තබා ද, ඒ මහණ තෙමේ 'ඇවැත්නි, මේ මහණතෙමේ ගිලන් ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ගිලන් තෙමේ ද කරුණු නො විචාළ යුත්තෙකැයි වදාරණ ලද්දේ ය. ඇවැත්නි, මේ මහණ යම් තාක් කල් රොග නැත්තේ වේ ද, ඒ තාක් කල් බලාපොරොත්තු වෙව, රොග නැත්තහුට කැමැති වන්නෙහි චොදනා කරන්නෙහි' යි කිය යුතු වන්නේ ය. මෙසේ කියනු ලබන්නේ චොදනා කෙරේ නම්, අනාදරයෙහි පචිති වේ.

42. "මහණෙනි, ඒ භික්‍ෂූන් විසින් පවාරණය කරණු ලබන කල්හි ගිලන් මහණෙක් තෙමේ ගිලන් මහණකුගේ පවාරණය තබා ද, ඒ මහණ තෙමේ 'ආයුෂ්මත්හු ගිලන්හු වෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් ගිලන් තෙමේ ද කරුණු විචාරීමට නුසුදුස්සෙකැ' යි වදාරණ ලද්දේ ය. ඇවැත්නි, යම් තාක් කලකින් රොග නැත්තෝ වහු ද, ඒ තාක් බලාපොරොත්තු වෙවු. රොග නැත්තේ රොග නැත්තහුට කැමැති වන්නෙහි චොදනා කරන්නෙහි' යි මෙසේ කිය යුතු වන්නේ ය. මෙසේ කියනු ලබන්නේ චොදනා කෙරේ නම්, අනාදරයෙහි පචිති වේ.

43. "මහණෙනි, ඒ භික්‍ෂූන් විසින් පවාරණය කරණු ලබන කල්හි නො ගිලන් මහණෙක් තෙමේ නො ගිලන් මහණකුගේ පවාරණය තබා ද ඒ දෙදෙනා සඞ්ඝයා විසින් අනුයොගවතෙහි යොදා කරුණු විචාරා, කරුණු පිළිගන්වා, කරුණු කියා, ඇවැත් පරිදි කරවා සඞ්ඝයා විසින් පැවරිය යුතු ය"යි.

44. එකල්හි දුටුමිතුරු වූ දැකිමිතුරු වූ බොහෝ භික්‍ෂූහු **කොසොල්** දනව්වෙහි එක්තරා ආවාසයෙක වස් එළැඹියහ. සමගි ව සතුටු ව විවාද නො කරමින් වසන්නා වූ ඒ භික්‍ෂූන් විසින් එක්තරා පහසු විහරණයක් (තරුණසමථය හෝ තරුණ විදර්ශනාව) ලබන ලද්දේ වේ. එකල්හි ඒ භික්‍ෂූන්ට 'සමගි ව සතුටු ව විවාද නො කරමින් වසන්නා වූ අප විසින් එක්තරා පහසුවිහරණයක් අවබොධ කරණ ලද්දේ ය. අපි දැන් පවරන්නෙමු නම්, භික්‍ෂූහු පවාරණය කොට චාරිකාවට යන්නාහු ම ය. එසේ ඇති කල්හි අපි මේ පහසුවිහරණයෙන් (සමථ-විපස්සනාවෙන්) බැහැර වන්නෙමු. අප විසින් කෙසේ පිළිපැදිය යුතු දැ' යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ.

45. "මහණෙනි, මෙහි දුටුමිතුරු වූ දැකිමිතුරු වූ බොහෝ භික්‍ෂූහු එක්තරා ආවාසයෙක වස් එළැඹෙත්. සමගි ව සතුටු ව විවාද නො කරමින් වසන්නා වූ ඒ භික්‍ෂූන් විසින් එක්තරා පහසු විහරණයෙක් ලබන ලද්දේ වේ. එහි දී ඒ භික්‍ෂූන්ට 'සමගි ව සතුටු ව විවාද නො කරමින් වසන්නා වූ අප විසින් එක්තරා පහසු විහරණයෙක් ලබන ලද්දේ ය. අපි දැන් පවරන්නෙමු නම්, භික්‍ෂූහු පවාරණය කොට චාරිකාවට යන්නාහු ම ය. එසේ ඇති කල්හි අපි මේ පහසු විහරණයෙන් බැහැර වන්නෙමු' යි මෙසේ අදහස් වේ නම්, -

46. “අනුජානාමි භික්ඛවෙ, තෙහි භික්ඛූහි පවාරණාසඞ්ගහං කාතුං. එවඤ්ච පන භික්ඛවෙ, කාතබ්බො: සබ්බෙහෙව එකජ්ඣං සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

47. “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අම්හාකං සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං විහරතං අඤ්ඤතරො ඵාසුවිහාරො අධිගතො. සචෙ මයං ඉදානි පවාරෙස්සාම, සියාපි භික්ඛූ පවාරෙත්වා චාරිකං පක්කමෙය්‍යුං. එවං මයං ඉමම්හා ඵාසුවිහාරා පරිබාහිරා භවිස්සාම. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො පවාරණාසඞ්ගහං කරෙය්‍ය. ඉදානි උපොසථං කරෙය්‍ය. පාතිමොක්ඛං උද්දිසෙය්‍ය. ආගමෙ[1] කොමුදියා චාතුමාසිනියා පවාරෙය්‍ය. එසා ඤත්ති.”

48. “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං විහරතං අඤ්ඤතරො ඵාසුවිහාරො අධිගතො. සචෙ මයං ඉදානි පවාරෙස්සාම, සියාපි භික්ඛූ පවාරෙත්වා චාරිකං පක්කමෙය්‍යුං. එවං මයං ඉමම්හා ඵාසුවිහාරා පරිබාහිරා භවිස්සාම. සඞ්ඝො පවාරණාසඞ්ගහං කරොති, ඉදානි උපොසථං කරිස්සති, පාතිමොක්ඛං උද්දිසිස්සති. ආගමෙ කොමුදියා චාතුමාසිනියා පවාරෙස්සති. යස්සායස්මතො ඛමති පවාරණාසඞ්ගහස්ස කරණං. ඉදානි උපොසථං කරිස්සති, පාතිමොක්ඛං උද්දිසිස්සති. ආගමෙ කොමුදියා චාතුමාසිනියා පවාරෙස්සති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.”

49. “කතො සඞ්ඝෙන පවාරණාසඞ්ගහො. ඉදානි උපොසථං කරිස්සති, පාතිමොක්ඛං උද්දිසිස්සති. ආගමෙ කොමුදියා චාතුමාසිනියා පවාරෙස්සති. ‘ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී’’ ති.

50. “තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි කතෙ පවාරණාසඞ්ගහෙ අඤ්ඤතරො භික්ඛු එවං වදෙය්‍ය: ‘ඉච්ඡාමහං ආවුසො ජනපදචාරිකං පක්කමිතුං, අත්ථි මෙ ජනපදෙ කරණීය’ න්ති. සො එවමස්ස වචනීයො: ‘සාධාවුසො, පවාරෙත්වා ගච්ඡාහී’ ති.

51. “සො චෙ භික්ඛවෙ, භික්ඛු පවාරයමානො අඤ්ඤතරස්ස භික්ඛුනො පවාරණං ඨපෙති. සො එවමස්ස වචනීයො: ‘අනිස්සරො ඛො මෙ ත්වං ආවුසො පවාරණාය. න තාවාහං පවාරෙස්සාමී’ ති. තස්ස චෙ භික්ඛවෙ, භික්ඛුනො පවාරයමානස්ස අඤ්ඤතරො භික්ඛු පවාරණං ඨපෙති.[2] උභො සඞ්ඝෙන සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා යථාධම්මං කාරාපෙතබ්බා.

1. “ආගමෙ ජුණ්හෙ” ම. ජ. සං.
2. “ඨපෙති තස්ස භික්ඛුනො” ම ජ සං. තො වි. P T S. ජ වි. තො මි.

46. "මහණෙනි, ඒ භික්ෂූන් විසින් පවාරණය කල් තැබීම කරන්නට අනුදනිමි. මහණෙනි, ඒ මෙසේ කළ යුතු ය: සියල්ලන් ම එක් තැනෙක රැස් විය යුතු ය. රැස් ව ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂු නමක් විසින් සඞ්ඝයාට දැන්විය යුතු ය:

47. 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සමගි ව සතුටු ව විවාද නො කරමින් වසන්නා වූ අප විසින් එක්තරා පහසු විහරණයෙක් ලබන ලද්දේ ය. අපි දැන් පවරන්නෙමු නම්, භික්ෂූහු පවාරණය කොට චාරිකාවට යන්නාහු ම ය. මෙසේ ඇති කල්හි අපි මේ පහසුවිහරණයෙන් බැහැර වන්නෙමු. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ පවාරණාසඞ්ගහය (පවාරණය කල් තැබීම) කරන්නේ ය. දැන් පොහොය කරන්නේ ය. පාමොක් උදෙසන්නේ ය. ඉදිරියෙහි එන සිවුමස් පිරෙණ කොමුදී නම් පසළොස්වක්හි පවාරණය කරන්නේ ය. මේ දැන්වීම ය.

48. 'ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සමගි ව සතුටු ව විවාද නො කරමින් වසන්නා වූ අප විසින් එක්තරා පහසු විහරණයෙක් ලබන ලද්දේ ය. අපි දැන් පවරන්නෙමු නම්, භික්ෂූහු පවරා චාරිකාවට යන්නාහු ම ය. මෙසේ ඇති කල්හි අපි මේ පහසු විහරණයෙන් බැහැර වන්නෙමු. (එබැවින්) සඞ්ඝ තෙමේ පවාරණාසංග්‍රහය කරන්නේ ය. දැන් පොහොය කරන්නේ ය. පාමොක් උදෙසන්නේ ය. ඉදිරියෙහි එන චාතුමාසිනී කොමුදී නම් ඉල්පුරපසළොස්වක්හි පවරන්නේය. යම් ආයුෂමතකුහට 'දැන් පොහොය කරන්නේය, පාමොක් උදෙසන්නේ ය, ඉදිරියෙහි එන චාතුමාසිනී කොමුදී නම් පසළොස්වක්හි පවාරණය කරන්නේ ය'යි (මෙසේ) පවාරණා-සංග්‍රහය කිරීම රුචි වේ නම්, ඒ ආයුෂමත් තෙමේ නිශශබ්ද වේවා. යමකුට රුචි නො වේ නම්, හෙතෙමේ කියන්නේ ය.

49. 'සඞ්ඝයා විසින් පවාරණාසඞ්ග්‍රහය කරණ ලද්දේ ය. දැන් පොහොය කරන්නේ ය. පාමොක් උදෙසන්නේ ය. ඉදිරියෙහි එන චාතුමාසිනී කොමුදී නම් පසළොස්වක්හි පවාරණය කරන්නේ ය. එය සඞ්ඝයාට රුචි වේ. එහෙයින් නිශ්ශබ්ද වේ. මෙය මෙසේ දරමි" යි.

50. "මහණෙනි, ඒ භික්ෂූන් පවාරණාසඞ්ග්‍රහය කළ කල්හි එක්තරා මහණෙක් තෙමේ 'ඇවැත්නි, මම ජනපදචාරිකාවට යන්නට කැමැත්තෙමි. මට ජනපදයෙහි කටයුත්තෙක් ඇත්තේ ය' යි මෙසේ කියන්නේ නම්, ඒ මහණ තෙමේ 'ඇවැත්නි, මැනවි. පවාරණය කොට යව' යි මෙසේ කිය යුතු වන්නේ ය.

51. "මහණෙනි, ඒ මහණ තෙමේ පවරණුයේ එක්තරා මහණකුගේ පවාරණය තබා ද, ඒ මහණ තෙමේ 'ඇවැත්නි, තෝ මාගේ පවාරණයෙහි ඊශ්වර නො වෙහි. මම ඒ තාක් කල් නො පවරන්නෙමි' යි මෙසේ කිය යුතු වන්නේ ය. මහණෙනි, එක්තරා මහණෙක් තෙමේ පවරන්නා වූ ඒ මහණහුගේ පවාරණය තබා ද, දෙදෙනා සඞ්ඝයා විසින් කරුණෙහි යොදා කරුණ පිළිගන්වා කරුණ විස්තර කොට ඇවැත් පිරිදි කරවිය යුත්තාහ.

52. "සො චෙ භික්ඛවෙ, භික්ඛු ජනපදෙ තං කරණීයං තීරෙත්වා පුනදෙව අන්තොකොමුදියා චාතුමාසිනියා තං ආවාසං ආගච්ඡති, තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි පවාරියමානෙ අඤ්ඤතරො භික්ඛු තස්ස භික්ඛුනො පවාරණං ඨපෙති, සො එවමස්ස වචනීයො: 'අනිස්සරො ඛො මෙ ත්වං ආවුසො පවාරණාය, පවාරිතො අහ' න්ති. තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි පවාරියමානෙ සො භික්ඛු අඤ්ඤතරස්ස භික්ඛුනො පවාරණං ඨපෙති, උභො සඞ්ඝෙන සමනුයුඤ්ජිත්වා සමනුගාහිත්වා සමනුභාසිත්වා යථාධම්මං කාරාපෙත්වා සඞ්ඝෙන පවාරෙතබ්බ" න්ති.

**පවාරණක්ඛන්ධකො නිට්ඨිතො චතුත්ථො.**

---

තස්ස උද්දානං:-

1. වස්සං වුත්ථා කොසලෙසු ආගමම්[1] සත්ථුදස්සනං[2],
අඵාසු[3] පසුසංවාසං අඤ්ඤමඤ්ඤානුලොමතා.

2. පවාරෙන්තාසනෙ[4] ද්වෙ ච කම්මං[5] ගිලානඤාතකා,
රාජා චොරා ච ධුත්තා ච භික්ඛුපච්චත්ථිකා තථා.

3. පඤ්ච චතු තයො ද්වෙකො ආපන්නො වෙමතී සරී,
සබ්බො සඞ්ඝො වෙමතිකො බහු සමා ච[6] ථොකිකා.

4. ආවාසිකා චාතුද්දසො[7] ලිඞ්ගසංවාසකා උභො,
ගන්තබ්බං න නිසින්නාය[8] ඡන්දදානෙ පවාරණා[9].

5. සවරෙහි ඛෙපිතා මෙඝො අන්තරා ච පවාරණා,
න කරොන්ති[10] පුරමහාකං[11] අට්ඨපිතා ච භික්ඛුනො.

6. කිමහි වාති[12] කතමඤ්ච දිට්ඨෙන සුතසංකයා[13],
චොදකො චුදිතකො ච ථුල්ලච්චය[14]වත්ථු භණ්ඩනං[15],
පවාරණා[16]සඞ්ගහො ච අනිස්සරො පවාරයෙති[17].

**ඉමම්හි ඛන්ධකෙ වත්ථූ ඡචත්තාරීසා.**

---

1. "අගමුං" ම ජ සං. 2. "සත්ථුං දස්සනං" අ වි. 3. "අඵාසුං" ම ජ සං
4. "පවාරෙන්තා පණ්ණාමඤ්ච" ම ජ සං.
,, "පණ්ණාමෙ ච" P T S.
5. "කම්ම" තො වි. ම නු ප. 6. "බහුසමාන" අ වි. තො වි. ජ වි.
7. "චාතුද්දස" ම ජ සං. "චාතුද්දසා" P T S. තො වි.
8 "නිසින්නාය" තො වි. ම නු ප. 9. "ඡන්දදාන පවාරණා" ඉතිපි
10. "න ඉච්ඡන්ති" ම ජ සං. 11. "පුනමහාකං" ම නු ප. තො වි.
12. "කිමසිවාති" ම ජ සං. 13. "සුතසංකාය" ම ජ සං.
14. "ථුල්ලච්චයං" අ වි. ම ජ සං ජ වි. 15. "ථුල්ලච්චයංච භණ්ඩනං" නු ප. තො වි.
16. "පවාරණස්ස" ම නු ප. තො වි. 17. "පවාරෙති" ම නු ප. තො වි
"පවාරණා" ජ වි.

52. "මහණෙනි, ඒ මහණ තෙමේ ජනපදයෙහි ඒ කටයුතු අවසන් කොට නැවත සිවුමස් පිරෙණ කොමුදී නම් පසළොස්වක ඇතුළත ඒ ආවාසයට පැමිණේ ද, මහණෙනි, ඒ භික්ෂූන් විසින් පවාරණය කරණු ලබන කල්හි එක්තරා මහණෙක් තෙමේ ඒ මහණහුගේ පවාරණය තබා ද, ඒ මහණ තෙමේ 'ඇවැත්නි, තෝ මාගේ පවාරණයෙහි ඊශ්වර නො වෙහි. මම පැවරූයේ වෙමි යි මෙසේ කිය යුතු වන්නේ ය. මහණෙනි, ඒ භික්ෂූන් විසින් පවාරණය කරණු ලබන කල්හි ඒ මහණ තෙමේ එක්තරා මහණකුගේ පවාරණය තබා ද, දෙදෙනා සඞ්ඝයා විසින් කරුණෙහි යොදා, කරුණු පිළිගන්වා, සමනුභාෂණය කොට, ඇවැත් පරිදි කරවා සඞ්ඝයා විසින් පැවරිය යුතු ය.

**සිවුවන පවාරණක්ඛන්ධකය නිමි.**

---

මේ ඛන්ධකයෙහි උද්දානය (වස්තුනාමාවලිය) මෙසේය:-

1. කොසොල්දනව්වෙහි වස් වැස නිම කළ භික්ෂූහු ශාස්තෘදර්ශනයට පැමිණියහ. අපහසු වූ පශුසංවාසය, උනුන්ට අනුලොම් වූ පවාරණය,

2. උත්කුටුකයෙන් හිඳ පැවරීම, පැවරූ පසු අසුනෙහි හිඳීම, පවාරණ දෙක, කම් (සතර), ගිලන්හුගේ පැවරීම, නෑයෝ මහණකු ගණිති. එසේ රජහු සොරහු ධූර්තයෝ පසමිතුරු භික්ෂූහු (මහණුන්) ගණිත්.

3. පස් දෙනාගේ පැවරීම, සිවුදෙනාගේ පැවරීම, තිදෙනාගේ පැවරීම, දෙදෙනාගේ පැවරීම, එකකුගේ පැවරීම, ඇවැතට පැමිණීම, ඇවැතෙහි විමතිය, ඇවැත සිහිපත් කිරීම, සියලු සඞ්ඝ තෙමේ ඇවැතෙහි විමති ඇත්තේ ය. බොහෝ පිරිස, සමපිරිස, ටිකපිරිස,

4. ආවාසිකයෝ [ආගන්තුකයෝ] තුදුස්වක, පසළොස්වක, ආවාසික ලක්ෂණ, උභයසංවාසකයෝ, යා යුතු ය. නො යා යුතු ය. මෙහෙණින් ඈ හුන් පිරිසෙහි නො පැවරීම, පාරිවාසික පවාරණාදානයෙන් නො පැවරීම, නො පැවරිය යුතු දිනයෙහි නො පැවරීම,

5. වැදිබියෙන් නො පැවරීම, රාත්‍රිය ගෙවන ලදී. වැස්ස, අන්තරාය, සාපත්තිකව පැවරීම, චොදනාවට ඉඩ නො දීම. පෙර අපගේ පවාරණය නැවැත්වූහ යි අනාපත්තිකයන්ගේ පවාරණය නැවැත්වීම, නැවැත්වීම (වන පරිදි හා) නො වන පරිදි, භික්ෂූහුගේ (පවාරණය තැබීම),

6. කිනම් හෙතුවකින් දැ යි පිළිවිසීම, කිනම් දැ යි පිළිවිසීම, දුටු වකින් හෝ ඇසුවකින් හෝ සැකයකින් හෝ පැවරීම, චොදක තෙමේ ය, චුදිතක තෙමේ ය, ථුල්ලච්චය, වස්තු, භණ්ඩනකාරක යන මොහු ය. පවාරණාසඞ්ග්‍රහය ද පවාරණයෙහි නො ඉසුරුබව ද වේ.

**මේ ඛන්ධකයෙහි වස්තු සතළිස් සයෙකි.**

---

# චම්මක්ඛන්ධකං

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** අසීතියා ගාමසහස්සෙසු ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙති[1]. තෙන ඛො පන සමයෙන **චම්පායං සොණො** නාම කොළිවීසො සෙට්ඨිපුත්තො සුඛුමාලො හොති. තස්ස පාදතලෙසු ලොමානි ජාතානි හොන්ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො තානි අසීතිගාමිකසහස්සානි සන්නිපාතාපෙත්වා කෙනචිදෙව කරණීයෙන සොණස්ස කොළිවීසස්ස සන්තිකෙ දූතං පාහෙසි: "ආගච්ඡතු සොණො. ඉච්ඡාමි සොණස්ස ආගත"න්ති.

2. අථ ඛො සොණස්ස කොළිවීසස්ස මාතාපිතරො සොණං කොළිවීසං එතදවොචුං: "රාජා තෙ තාත. සොණ, පාදෙ දක්ඛිතුකාමො. මා ඛො ත්වං තාත, සොණ, යෙන රාජා තෙන පාදෙ අභිප්පසාරෙය්‍යාසි. රඤ්ඤො පුරතො පල්ලඞ්කෙන නිසීද. නිසින්නස්ස තෙ රාජා පාදෙ දක්ඛිස්සතී" ති.

3. අථ ඛො සොණං කොළිවීසං සිවිකාය ආනෙසුං. අථ ඛො සොණො කොළිවීසො යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං මාගධං සෙනියං. බිම්බිසාරං අභිවාදෙත්වා රඤ්ඤො පුරතො පල්ලඞ්කෙන නිසීදි. අද්දසා ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො සොණස්ස කොළිවීසස්ස පාදතලෙසු ලොමානි ජාතානි.

4. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො තානි අසීති ගාමිකසහස්සානි දිට්ඨධම්මිකෙ අත්ථෙ අනුසාසිත්වා උය්‍යොජෙසි "තුම්හෙ ඛ්වත්ථ භණෙ, මයා දිට්ඨධම්මිකෙ අත්ථෙ අනුසිට්ඨා[2]. ගච්ඡථ තං භගවන්තං පයිරුපාසථ. සො නො භගවා සම්පරායිකෙ අත්ථෙ අනුසාසිස්සතී" ති. අථ ඛො තානි අසීතිගාමිකසහස්සානි යෙන ගිජ්ඣකූටො පබ්බතො තෙනුපසඞ්කමිංසු.

5. තෙන ඛො පන සමයෙන ආයස්මා **සාගතො** භගවතො උපට්ඨාකො හොති. අථ ඛො තානි අසීතිගාමිකසහස්සානි යෙනායස්මා සාගතො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාගතං එතදවොචුං: "ඉමානි භන්තෙ, අසීතිගාමිකසහස්සානි ඉධූපසඞ්කන්තානි භගවන්තං දස්සනාය. සාධු මයං භන්තෙ, ලභෙය්‍යාම භගවන්තං දස්සනායා" ති. තෙන හි තුම්හෙ ආයස්මන්තො මුහුත්තං ඉධෙව තාව හොථ, යාවාහං භගවන්තං පටිවෙදෙමී"ති.

6. අථ ඛො ආයස්මා සාගතො තෙසං අසීතියා ගාමිකසහස්සානං පුරතො පෙක්ඛමානානං පාටිකාය නිමුජ්ජිත්වා භගවතො පුරතො උම්මුජ්ජිත්වා භගවන්තං එතදවොච: "ඉමානි භන්තෙ, අසීති ගාමිකසහස්සානි ඉධූපසඞ්කන්තානි භගවන්තං දස්සනාය. යස්සදානි භන්තෙ, භගවා කාලං මඤ්ඤතී" ති.

1. "කරොති" තො වි. අ වි. ම නු ප.
2 "අනුසාසිතා" ම ඡ සං.

# පස්වන චම්මක්ඛන්ධකය

1. එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **රජගහ** නුවර සමීපයෙහි වූ **ගිජ්ඣකූළපව්වෙහි** වැඩ වසන සේක. එකල්හි මගධේශ්වර වූ සෙනිය **බිම්බිසාර** රජ තෙමේ ගම් අසූදහසෙක ඓශ්වර්‍ය්‍යයෙන් හා අධිපති භාවයෙන් යුත් රාජ්‍යය කරවයි. එකල්හි **චම්පා** නුවර කොළිවීස ගොත්‍රයෙහි උපන් **සොණ** නම් සිටුපුත්‍ර තෙමේ සිවුමැලි වූයේ වේ. ඔහුගේ යටිපතුල්හි (අඳුන්වන්) ලොම් හට ගත්තේ වේ. එකල්හි මගධේශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ කිසියම් කටයුත්තක් සඳහා (මෙන්) ඒ අසූ දහසක් ගම් ප්‍රධානයන් රැස් කරවා කොළිවීසගොත්‍රයෙහි උපන් සොණ සිටු පුතු වෙතට "සොණ තෙමේ පැමිණේවා. සොණගේ ඊම කැමැත්තෙමි" යි දූතයකු යැවී ය.

2. එවිට කොළිවීස සොණගේ මවු පියෝ "පුත් සොණ, රජ තෙමේ ඔබගේ පාදයන් දකිනු කැමැත්තේ ය. පුත් සොණ, තෝ රජු දිසාවට පාදයන් දිගු නො කරව. රජුගේ ඉදිරියෙහි අහරම්ණිය ගොතා හිඳුව. රජ තෙමේ එසේ හුන් තාගේ පාදයන් දකින්නේ ය" යි කොළිවීස සොණට කීහ.

3. ඉක්බිති කොළිවීස සොණ සිවිගෙයකින් (දෝලාවකින්) ගෙණාවාහු ය. කොළිවීස සොණ තෙමේ මගධේශ්වර වූ සෙනිය බිම්බිසාර රජු වෙතට ගියේ ය. ගොස් මගධේශ්වර වූ සෙනිය බිම්බිසාර රජු සකසා වැඳ රජ ඉදිරියෙහි අහරම්ණිය ගොතා හුන්නේ ය. මගධේශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ කොළිවීස සොණගේ යටිපතුල්හි හටගත් ලොම් දුටුයේ ය.

4. ඉක්බිති මගධේශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ ඒ අසූ දහසක් ගම් ප්‍රධානයන් මේ ජීවිතයට හිත වූ කරුණෙහි අනුශාසනා කොට "කොලෙනි, මා විසින් තෙපි මේ ජීවිතයට හිත වූ කරුණෙහි අනුශාසනා කරණ ලද්දෝ වහු ය. යවු. ඒ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙවු. අපගේ ඒ භාග්‍යවතුන් වහන්සේ පරලොවට හිත වූ කරුණෙහි අනුශාසනා කරන්නාහු ය" යි පිටත් කෙළේ ය. එවිට ඒ අසූදහසක් ගම් ප්‍රධානයෝ ගිජ්ඣකූළපව්වට ගියහ.

5. ඒ කාලයෙහි ආයුෂමත් **සාගත** ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වෙත්. එහෙයින් ඒ අසූදහසක් ගම් ප්‍රධානයෝ ආයුෂමත් සාගත තෙරුන් වෙතට ගියහ. ගොස් ආයුෂමත් සාගත තෙරුන්ට "ස්වාමීනි, මේ අසූදහසක් ගම් ප්‍රධානයෝ භාග්‍යවතුන් වහන්සේ දක්නට මෙහි පැමිණියාහු ය. ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ දක්නට ලබන්නෙමු නම් මැනවැ" යි මෙය සැලකළහ. "එසේ නම් ආයුෂමත්නි, තෙපි මම යම්තාක් කලෙකින් භාග්‍යවතුන් වහන්සේට එය දන්වන්නෙම් ද, ඒ තාක් කල් මොහොතක් මෙහි ම සිටිවු."

6. ඉක්බිති සාගත ස්ථවිරයන් වහන්සේ ඒ අසූදහසක් ගම් ප්‍රධානයන් ඉදිරියෙහි බලා සිටිය දී සඳකඩපහණෙහි ගිලී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මතු වී භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මේ අසූදහසක් ගම් ප්‍රධානයෝ භාග්‍යවතුන් වහන්සේ දක්නට මෙහි පැමිණියාහු ය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ එයට කල් දන්නා සේක්වා" යි මෙය සැලකළහ.

7. “තෙන හි ත්වං සාගත, විහාරපච්ඡායායං ආසනං පඤ්ඤපෙහී”ති. “එවං භන්තෙ”ති ඛො ආයස්මා සාගතො භගවතො පටිස්සුණිත්වා පීඨං ගහෙත්වා භගවතො පුරතො නිමුජ්ජිත්වා තෙසං අසීතියා ගාමිකසහස්සානං පුරතො පෙක්ඛමානානං පාටිකාය උම්මුජ්ජිත්වා විහාරපච්ඡායායං ආසනං පඤ්ඤපෙසි.[1]

8. අථ ඛො භගවා විහාරා නික්ඛමිත්වා විහාරපච්ඡායායං පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො තානි අසීතිගාමිකසහස්සානි යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

9. අථ ඛො තානි අසීතිගාමිකසහස්සානි ආයස්මන්තංයෙව සාගතං සමන්නාහරන්ති. නො තථා භගවන්තං. අථ ඛො භගවා තෙසං අසීතියා ගාමිකසහස්සානං චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය ආයස්මන්තං සාගතං ආමන්තෙසි: “තෙන හි ත්වං සාගත, භිය්‍යොසොමත්තාය උත්තරිමනුස්සධම්මං[2] ඉද්ධිපාටිහාරියං දස්සෙහී” ති. “එවං භන්තෙ” ති ඛො ආයස්මා සාගතො භගවතො පටිස්සුණිත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමතිපි, තිට්ඨතිපි, නිසීදතිපි, සෙය්‍යම්පි කප්පෙති, ධූපායතිපි[3], පජ්ජලතිපි, අන්තරධායතිපි.

10. අථ ඛො ආයස්මා සාගතො ආකාසෙ අන්තලික්ඛෙ අනෙකවිහිතං උත්තරිමනුස්සධම්මං ඉද්ධිපාටිහාරියං දස්සෙත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: “සත්ථා මෙ භන්තෙ, භගවා. සාවකො'හමස්මි. සත්ථා මෙ භන්තෙ, භගවා. සාවකො'හමස්මී” ති.

11. අථ ඛො තානි අසීතිගාමිකසහස්සානි “අච්ඡරියං වත භො! අබ්භුතං වත භො! සාවකො හි නාම එවං මහිද්ධිකො භවිස්සති. එවං මහානුභාවො. අහො නූන සත්ථා” ති භගවන්තංයෙව සමන්නාහරන්ති. නො තථා ආයස්මන්තං සාගතං.

12. අථ ඛො භගවා තෙසං අසීතියා ගාමිකසහස්සානං චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං – දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි.

13. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා – තං පකාසෙසි, දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං අසීතියා ගාමිකසහස්සානං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: “යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම” න්ති.

1. “පඤ්ඤපෙති” ම ඡ සං. 2. උත්තරිමනුස්සධම්මා” සී. මු.
3. “ධූමායතිපි” ම ඡ සං “පධූපායතිපි” සී.

7. "සාගත, එසේ නම් වෙහෙර පිටිපස සෙවණෙහි අසුන් පණවන්නැ" යි වදාළ සේක. "ස්වාමීනි, එසේ ය" යි ආයුෂ්මත් සාගත ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පුටුවක් ගෙණ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි ගිලී ඒ අසූදහසක් ගම් ප්‍රධානයන් ඉදිරියෙහි බලා සිටිය දී සඳකඩ පහණෙන් මතු වී වෙහෙර පිටිපස සෙවණෙහි අසුනක් පැණවූහ.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විහාරයෙන් නික්ම වෙහෙර පිටිපස සෙවණෙහි පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. ඉන් පසු ඒ අසූ දහසක් ගම් ප්‍රධානයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ.

9. එකල්හි ඒ අසූදහසක් ගම් ප්‍රධානයෝ ආයුෂ්මත් සාගත තෙරුන් ගැණ ම සලකත්. භාග්‍යවතුන් වහන්සේ ගැණ එසේ නො සලකත්. භාග්‍යවතුන් වහන්සේ ඒ අසූදහසක් ගම් ප්‍රධානයන්ගේ සිතේ අදහස තම සිතින් දැන ආයුෂ්මත් සාගත තෙරුන් ඇමතූ සේක: "සාගත, එසේ නම් තෝ බොහෝවක් උතුරු මිනිස් දම් පෙළහර දක්වවූ" යි. "ස්වාමීනි, එසේ ය" යි ආයුෂ්මත් සාගත තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී අහසට නැඟී අහසෙහි සක්මන් ද කෙරෙයි. සිටීම ද කෙරෙයි. සයනය ද කෙරෙයි. දුමන්නේ ද වෙයි. දිලිසෙන්නේ ද වෙයි. අතුරුදහන් ද වෙයි.

10. ඉන් පසු ආයුෂ්මත් සාගත තෙමේ අහස් කුසෙහි උතුරු මිනිස් දම්පෙළහර දක්වා භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වන සේක. මම ශ්‍රාවක වෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වන සේක. මම ශ්‍රාවක වෙමි" යි මෙය සැළකෙළේ ය.

11. ඉක්බිති ඒ අසූදහසක් ගම් ප්‍රධානයෝ "පින්වත්නි, ආශ්චර්‍ය්‍යයෙකි! පින්වත්නි, පෙර නො වූවෙකි! ඒ එසේ ම ය. ශ්‍රාවක තෙමේ මෙසේ මහත් සෘද්ධි ඇත්තේ මෙසේ මහත් අනුභාව ඇත්තේ වන්නේ නම්, ශාස්තෘ තෙමේ-අහෝ පුදුමැ!" යි භාග්‍යවතුන් වහන්සේ ම සලකත්. ආයුෂ්මත් සාගත තෙරුන් ගැණ එසේ නො සලකත්.

12. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ අසූ දහසක් ගම් ප්‍රධානයන්ගේ සිතේ අදහස තම සිතින් දැන අනුපිළිවෙලකතාව වදාළ සේක. එනම්-දානකථාව, ශීලකථාව, ස්වර්‍ගකථාව, කාමයන් දුක්බව, ලාමකබව, කෙලෙසීම, පැවිද්දෙහි අනුසස් වදාළ සේක.

13. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සුදුසු වූ සිත් ඇත්තන් මොළොක් වූ සිත් ඇත්තන් නො වැසුනු සිත් ඇත්තන් නො හැකුළුනු සිත් ඇත්තන් පහන් සිත් ඇත්තන් ද කොට දත් සේක් ද, එකල්හි බුදුවරයන්ගේ තමන් ම පියොවින් උසස් බවට පැමිණියා වූ යම් ධර්‍මදෙශනාවක් වේ ද, ඒ දුඃඛ සත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්‍ගසත්‍යය යන චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. පහ වූ කිළුටු ඇති පිරිසිදු වස්ත්‍රයක් මනා කොට සායම් අල්ලා ගන්නේ යම් සේ ද, එසේ ම ඒ අසූදහසක් ගම් ප්‍රධානයන්ට ඒ ආසනයෙහි දී ම "යමක් හට ගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදී රජස් ඇති පහ වූ කෙලෙස් මල ඇති සොතාපත්තිමග්ගඥාණය පහළ වූයේ ය.

14. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථංකථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: “අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය ‘චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී’ ති, එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙ”ති.

15. අථ ඛො සොණස්ස කොළිවීසස්ස එතදහොසි: “යථා යථා ඛො අහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය” න්ති.

16. අථ ඛො තානි අසීති ගාමිකසහස්සානි භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු. අථ ඛො සොණො කොළිවීසො අචිරපක්කන්තෙසු තෙසු අසීතියා ගාමිකසහස්සෙසු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණො කොළිවීසො භගවන්තං එතදවොච: “යථා යථාහං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං භන්තෙ, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. පබ්බාජෙතු මං භන්තෙ, භගවා” ති. අලත්ථ ඛො සොණො කොළිවීසො භගවතො සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං.

17. අචිරූපසම්පන්නො ච පනායස්මා සොණො සීතවනෙ විහරති. තස්ස අච්චාරද්ධවිරියස්ස චඞ්කමතො පාදා භිජ්ජිංසු. චඞ්කමො ලොහිතෙන ඵුට්ඨො හොති සෙය්‍යථාපි ගවාඝාතනං.

18. අථ ඛො ආයස්මතො සොණස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: “යෙ ඛො කෙචි භගවතො සාවකා ආරද්ධවිරියා විහරන්ති, අහං තෙසං අඤ්ඤතරො. අථ ච පන මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. සංවිජ්ජන්ති ඛො පන මෙ කුලෙ භොගා. සක්කා භොගෙ ච භුඤ්ජිතුං. පුඤ්ඤානි ච කාතුං. යන්නූනාහං හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජෙය්‍යං. පුඤ්ඤානි ච කරෙය්‍ය” න්ති.

19. අථ ඛො භගවා ආයස්මතො සොණස්ස චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ගිජ්ඣකූටෙ පබ්බතෙ අන්තරහිතො සීතවනෙ පාතුරහොසි.

14. දුටු දහම් ඇති පැමිණි දහම් ඇති අවබොධ කළ දහම් ඇති නුවණින් බැස ගත් දහම් ඇති තරණය කළ විචිකිච්ඡා ඇති පහ වූ 'කෙසේ කෙසේ ද' යි පැවති සැක ඇති විශාරදභාවයට පැමිණි බුදු-සසුන්හි අනුන්ගේ උපකාර නො වුව මනා වූ ඔහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ: "ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ විවෘත කරන්නේ ද, මං මුළා වූවහුට මාර්ගය යම් සේ කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නාහු ය' යි ගනඳුරෙහි තෙල් පහනක් යම් සේ දරන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය තෙමේ ප්‍රකාශ කරණ ලද්දේ ය. ස්වාමීනි, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ ද නවලොකොත්තර ධර්මය ද අෂ්ටාර්‍ය්‍ය පුද්ගල භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමු. භාග්‍යවතුන් වහන්සේ අද පටන් අප දිවි තෙක් සරණ ගියා වූ උපාසකයන් කොට දරණසේක්වා" යි.

15. එකල්හි කොළිවිසසොණයන්ට "මම භාග්‍යවතුන් වහන්සේ විසින් යම් යම් පරිද්දෙකින් දෙසන ලද ධර්මය දනිම් ද, ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පරිපූර්ණ වූ හැම ලෙසින් පිරිසිදු වූ සඞ්ඛලිඛිත වූ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරීම පහසු නො වේ. මම කෙස් රැවුල් බහා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්නෙම් නම් යෙහෙකැ"යි මේ සිත් වි ය.

16. ඉන් පසු ඒ අසූදහසක් ගම් වැස්සෝ භාග්‍යවතුන් වහන්සේගේ භාසිතය ඉතා සතුටින් පිළිගෙණ අනුමෝදන් වී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියහ. ඉක්බිති කොළිවිස සොණ තෙමේ ඒ අසූ දහසක් ගම් ප්‍රධානයන් ගිය නොබෝ වේලාවක දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් කොළිවිස සොණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් යම් යම් පරිද්දෙකින් දෙශනා කරණ ලද ධර්මය දනිම් ද එකාන්තයෙන් පරිපූර්ණ වූ හැම ලෙසින් පිරිසිදු වූ සඞ්ඛලිඛිත වූ මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරීම ගිහිගෙයි වසන්නහුට පහසු නො වේ. ස්වාමීනි, මම කෙස් රැවුල් බහා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නට කැමැත්තෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරණසේක්වා" යි සැළකෙළේ ය. කොළිවිස සොණතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලැබුයේ ය. උපසම්පදාව ලැබුයේ ය.

17. උපසපන් වීමෙන් නොබෝ කල් ඇති ආයුෂ්මත් සොණ තෙමේ **සීතවනයෙහි** වෙසෙයි. බලවත් වීර්‍ය්‍යය ඇති ව සක්මන් කරන්නා වූ ඒ සොණ තෙරුන්ගේ පතුල් පැළුනේ ය. සක්මන ගවයන් මරණ තැනක් සේ ලෙයින් තැවරුණේ ය.

18. ඉක්බිති රහොගත වූ විවේකයට පැමිණ හුන්නා වූ ආයුෂ්මත් සොණ තෙරුන්ට "භාග්‍යවතුන් වහන්සේගේ යම් කිසි ශ්‍රාවක කෙනෙක් පටන් ගත් වීර්‍ය්‍යය ඇත්තෝ ව වෙසෙත් ද, මම උන්වහන්සේලා අතුරෙහි එක්තරා එකෙක් වෙමි. එහෙත් මාගේ සිත උපාදාන රහිත ව (තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් අල්ලා නො ගෙණ) කාමාදිආශ්‍රවයන්ගෙන් නො මිදේ. මාගේ ගෙයි භොගයෝ ඇත්තාහු ම ය. සම්පත් අනුභව කරන්නටත් පින් කරන්නටත් හැකි ය. මම ගිහි බවට පෙරළී සම්පත් අනුභව කරන්නෙම් නම්, පිණුත් කරන්නෙම් නම්, යෙහෙකැ" යි මෙසේ අදහසක් උපන්නේ ය.

19. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ තෙරුන්ගේ සිතේ අදහස තම සිතින් දැන බලවත් පුරුෂයෙක් හැකිළූ අතක් යම් සේ දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් යම්සේ හකුළන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ගිජුකුළුපව්වෙහි අතුරු දහන් ව සේක් සීතවනයෙහි පහළ වූ සේක.

20. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො යෙනායස්මතො සොණස්ස චඞ්කමො තෙනුපසඞ්කමි. අද්දසා ඛො භගවා ආයස්මතො සොණස්ස චඞ්කමං ලොහිතෙන ඵුට්ඨං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: “කස්ස න්වායං භික්ඛවෙ, චඞ්කමො ලොහිතෙන ඵුට්ඨො සෙය්‍යථාපි ගවාඝාතන” න්ති. “ආයස්මතො භන්තෙ, සොණස්ස අච්චාරද්ධවිරියස්ස චඞ්කමතො පාදා භිජ්ජිංසු. තස්සායං චඞ්කමො ලොහිතෙන ඵුට්ඨො සෙය්‍යථාපි ගවාඝාතන” න්ති.

21. අථ ඛො භගවා යෙනායස්මතො සොණස්ස විහාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ආයස්මාපි ඛො සොණො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සොණං භගවා එතදවොච: “නනු තෙ සොණ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ‘යෙ ඛො කෙචි භගවතො සාවකා අච්චාරද්ධවිරියා විහරන්ති, අහං තෙසං අඤ්ඤතරො. අථ ච පන මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති. සංවිජ්ජන්ති ඛො පන මෙ කුලෙ භොගා. සක්කා භොගෙ ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතුං. යන්නූනාහං හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජෙය්‍යං. පුඤ්ඤානි ච කරෙය්‍ය” න්ති. “එවං භන්තෙ” ති.

22. “තං කිම්මඤ්ඤසි සොණ, කුසලො ත්වං පුබ්බෙ අගාරිකභූතො වීණාය තන්තිස්සරෙ?” ති. “එවං භන්තෙ” ති. “තං කිම්මඤ්ඤසි සොණ, යදා තෙ වීණාය තන්තියො අච්චායතා හොන්ති, අපි නු තෙ වීණා තස්මිං සමයෙ සරවතී වා හොති කම්මඤ්ඤා වා ?” ති. “නො හෙතං භන්තෙ” ති. “තං කිම්මඤ්ඤසි සොණ, යදා තෙ වීණාය තන්තියො අතිසිථිලා හොන්ති, අපි නු තෙ වීණා තස්මිං සමයෙ සරවතී වා හොති කම්මඤ්ඤා වා ?” ති. “නො හෙතං භන්තෙ” ති. “තං කිම්මඤ්ඤසි සොණ, යදා තෙ වීණාය තන්තියො නෙව අච්චායතා හොන්ති නාතිසිථිලා, සමෙ ගුණෙ පතිට්ඨිතා, අපි නු තෙ වීණා තස්මිං සමයෙ සරවතී වා හොති කම්මඤ්ඤා වා ?” ති. “එවං භන්තෙ” ති.

23. “එවමෙව ඛො සොණ, අච්චාරද්ධවිරියං උද්ධච්චාය සංවත්තති. අතිලීනවිරියං කොසජ්ජාය සංවත්තති. තස්මාතිහ ත්වං සොණ, විරියසමතං[1] අධිට්ඨහ. ඉන්ද්‍රියානඤ්ච සමතං[2] පටිවිජ්ඣ. තත්ථ ච නිමිත්තං ගණ්හාහී” ති. “එවං භන්තෙ” ති ඛො ආයස්මා සොණො භගවතො පච්චස්සොසි.

24. අථ ඛො භගවා ආයස්මන්තං සොණං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව සීතවනෙ ආයස්මතො සොණස්ස පමුඛෙ අන්තරහිතො ගිජ්ඣකූටෙ පබ්බතෙ පාතුරහොසි.

---

1. “විරියසමථං” ජ වි. 2. “ඉන්ද්‍රියානඤ්ච සමථං” ජ වි

20. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග සෙනාසන චාරිකාවෙහි වඩනා සේක් ආයුෂ්මත් සොණ තෙරුන්ගේ සක්මන වෙතට එළඹි සේක. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ තෙරුන්ගේ ලෙයින් වැකුනු සක්මන දුටු සේක. දැක භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, ගවයන් මරණ තැනක් සේ ලෙයින් වැකී ඇති මේ සක්මන කවරකුගේ ද?" "ස්වාමීනි, දැඩි සේ පටන් ගත් වීර්‍ය්‍යය ඇති ව සක්මන් කරන්නා වූ සොණ තෙරුන්ගේ පතුල් පැළුනේ ය. උන් වහන්සේගේ මේ සක්මන ගවයන් මරණ තැනක් සේ ලෙයින් වැකුනේ ය."

21. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ තෙරුන්ගේ වෙහෙරට වැඩි සේක. වැඩ පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් සොණ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "සොණ, රහොගත වූ විවෙකයට පැමිණ හුන් තට 'භාග්‍යවතුන් වහන්සේගේ යම් කිසි ශ්‍රාවක කෙනෙක් පටන් ගත් වීර්‍ය්‍යය ඇත්තෝ ව වෙසෙත් ද, මම උන්වහන්සේලා අතුරෙහි එක්තරා එකෙක් වෙමි. එහෙත් මාගේ සිත තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් අල්ලා නො ගෙණ කාමාදිආශ්‍රවයන්ගෙන් නො මිදෙයි. මාගේ ගෙයි භොගයෝ ඇත්තාහු ම ය. සම්පත් අනුභව කරන්නටත් පින් කරන්නටත් හැක්කේ ය. මම ගිහිබවට පෙරළී සම්පත් අනුභව කරන්නෙම් නම්, පිණුත් කරන්නෙම් නම්, යෙහෙකැ' යි මේ සිත පහළ වූයේ නො වේ ද?". "ස්වාමීනි, එසේ ය."

22. "සොණ, ඒ කිමැ යි සිතන්නෙහි ද? තෝ පෙර ගිහි වූයේ වීණා වාදනයෙහි දක්‍ෂ වූයෙහි ද?". "ස්වාමීනි, එසේ ය". "සොණ, ඒ කිමැ යි සිතන්නෙහි ද? යම් කලෙක තාගේ වීණාවෙහි තත් තදින් අදනා ලද්දේ ඉතා තද වූයේ වේ ද, කිම, එකල්හි තාගේ වීණාව මිහිරි හඬ ඇත්තී හෝ කම්යට යොග්‍ය වූවා හෝ වේ ද?" "ස්වාමීනි, මේ නො වේ ම ය." "සොණ, ඒ කිමැ යි සිතන්නෙහි ද? යම් කලෙක තාගේ වීණාවෙහි තත් ඉතා ලිහිල් වූයේ වේ ද, කිම, එකල්හි තාගේ වීණාව මිහිරි හඬ ඇත්තී හෝ කම්යට යොග්‍ය වූවා හෝ වේ ද?" "ස්වාමීනි, මේ නො වේ ම ය." "සොණ, ඒ කිමැ යි සිතන්නෙහි ද? යම් කලෙක තාගේ වීණාවෙහි තත් ඉතා තද නො වූයේ ඉතා ලිහිල් නො වූයේ සමගුණයෙහි පිහිටියේ වේ ද, කිම, එකල්හි තාගේ වීණාව මිහිරි හඬ ඇත්තී හෝ කම්යට යොග්‍ය වූවා හෝ වේ ද?" "ස්වාමීනි, එසේ වන්නී ය."

23. "සොණ, එපරිද්දෙන් ම දැඩි ව ගත් වීර්‍ය්‍යය උඩඟුබව පිණිස පවතී. ඉතා සැහවුනු (හැකුළුනු) වීර්‍ය්‍යය කුසීතබව පිණිස පවතී. සොණ, එහෙයින් තෝ වීර්‍ය්‍යයාගේ සමබව ඉටා ගණුව. ඉඳුරන්ගේ සමබව දැන ගණුව. එහි නිමිති ද ගණුව." "ස්වාමීනි, එසේ ය" යි ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේ ය.

24. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ තෙරුන්ට මේ අවවාදයෙන් අවවාද දී බලවත් පුරුෂයෙක් හැකිළූ අතක් යම් සේ දිගු කරන්නේ ද, දිගු කළ අතක් යම් සේ හකුළන්නේ ද, එපරිද්දෙන් සීත වනයෙහි ආයුෂ්මත් සොණ තෙරුන්ගේ ඉදිරියෙහි අතුරුදහන් වූ සේක් **ගිජ්ඣකූළ**පව්වෙහි පහළ වූ සේක.



Free Distribution www.aathaapi.org

25. අථ ඛො ආයස්මා සොණො අපරෙන සමයෙන විරියසමතං අධිට්ඨාසි. ඉන්ද්‍රියානඤ්ච සමතං පටිවිජ්ඣි. තත්ථ ච නිමිත්තං අග්ගහෙසි. අථ ඛො ආයස්මා සොණො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. "ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායා" ති අබ්භඤ්ඤාසි.[1] අඤ්ඤතරො ච පනායස්මා සොණො අරහතං අහොසි.

26. අථ ඛො ආයස්මතො සොණස්ස අරහත්තං පත්තස්ස එතදහොසි: "යන්නූනාහං භගවතො සන්තිකෙ අඤ්ඤං බ්‍යාකරෙය්‍යං" න්ති. අථ ඛො ආයස්මා සොණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සොණො භගවන්තං එතදවොච.

27. "යො සො භන්තෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සො ඡ ඨානානි අධිමුත්තො හොති: නෙක්ඛම්මාධිමුත්තො හොති. පවිවෙකාධිමුත්තො හොති. අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. උපාදානක්ඛයාධිමුත්තො හොති. තණ්හක්ඛයාධිමුත්තො හොති. අසම්මොහාධිමුත්තො හොති.

28. "සියා ඛො පන භන්තෙ ඉධෙකච්චස්ස ආයස්මතො එවමස්ස: 'කෙවලං සද්ධාමත්තකං නූන අයමායස්මා නිස්සාය නෙක්ඛම්මාධිමුත්තො' ති. න ඛො පනෙතං භන්තෙ, එවං දට්ඨබ්බං. ඛීණාසවො භන්තෙ, භික්ඛු වුසිතවා කතකරණීයො කරණීයමත්තනො[2] අසමනුපස්සන්තො කතස්ස වා පතිචයං, ඛයා රාගස්ස වීතරාගත්තා නෙක්ඛම්මාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා නෙක්ඛම්මාධිමුත්තො හොති. ඛයා මොහස්ස වීතමොහත්තා නෙක්ඛම්මාධිමුත්තො හොති.

29. "සියා ඛො පන භන්තෙ, ඉධෙකච්චස්ස ආයස්මතො එවමස්ස: 'ලාභසක්කාරසිලොකං නූන අයමායස්මා නිකාමයමානො පවිවෙකාධිමුත්තො' ති. න ඛො පනෙතං භන්තෙ, එවං දට්ඨබ්බං. ඛීණාසවො භන්තෙ, භික්ඛු වුසිතවා කතකරණීයො කරණීයමත්තනො අසමනුපස්සන්තො කතස්ස වා පතිචයං, ඛයා රාගස්ස වීතරාගත්තා පවිවෙකාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා පවිවෙකාධිමුත්තො හොති. ඛයා මොහස්ස වීතමොහත්තා පවිවෙකාධිමුත්තො හොති.

1. "අභිඤ්ඤාසි" ම ඡ සං.
2. "කරණීයමත්තනා" සී මු. ම ඡ සං. "කරණීයං අත්තනො" අංගුත්තරපාළි.

25. ඉක්බිති ආයුෂ්මත් සොණ සළුවිර තෙමේ පසු කාලයෙහි වීය්‍ය්‍යීයාගේ සමබව ඉටී ය. ඉඳුරන්ගේ සමබව දත්තේ ය. එහි නිමිති ද ගත්තේ ය. ඉක්බිති ආයුෂ්මත් සොණ සළුවිර තෙමේ එකලා වූයේ වෙන් වූයේ නිරතුරු සිහි ඇත්තේ කෙලෙස් තවන වීය්‍යීය ඇත්තේ භාවනාවට යැවූ සිත් ඇති ව වාසය කරණුයේ යමක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට ම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත් ද, නිරුත්තර වූ මාගීබ්‍රහ්මචය්‍යීය කෙළවර කොට ඇති ඒ රහත්බව නොබෝ දිනකින් ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට (ඊට) පැමිණ විසී ය. "ජාතිය ක්‍ෂය විය. බඹසර වැස නිමවන ලදී. සිවු මගින් කළ යුතු කටයුතු කරණ ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ" යි දත්තේ ය. ආයුෂ්මත් සොණ සළුවිර තෙමේ රහතුන් අතුරෙහි එක්තරා නමක් වී ය.

26. ඉක්බිති රහත්බවට පැමිණි ආයුෂ්මත් සොණ තෙරුන්ට "මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි අහීත්ඵලය ප්‍රකාශ කරන්නෙම් නම්, යෙහෙකැ" යි මේ සිත් වි ය. එකල ආයුෂ්මත් සොණ සළුවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ආයුෂ්මත් සොණ සළුවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය:

27. "ස්වාමීනි, යම් ඒ මහණෙක් තෙමේ රහත් වූයේ ගෙවා දැමූ කාමාදි ආශ්‍රව ඇත්තේ වැස නිම කළ බඹසර ඇත්තේ සිවුමගින් කොට නිම කළ කටයුතු ඇත්තේ බහා තැබූ බර ඇත්තේ පැමිණි රහත්බව ඇත්තේ ගෙවූ බවබැඳුම් ඇත්තේ මනා කොට සිවුමගනුවණින් දැන මිදුනේ වේ ද, ඒ මහණ තෙමේ කරුණු සයක් ප්‍රත්‍යක්‍ෂ කළේ වේ: නෛෂ්ක්‍රම්‍යය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. ප්‍රවිවේකය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. අහීත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. උපාදානක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. තෘෂ්ණාක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. අසම්මෝහය (නිර්වාණය)* ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය.

28. "ස්වාමීනි, මෙහි ඇතැම් ආයුෂ්මතකුහට 'මේ ආයුෂ්මත් තෙමේ හුදෙක් (ප්‍රතිවෙධප්‍රඥාරහිත) ශ්‍රද්ධාමාත්‍රයක් නිසා නෛෂ්ක්‍රම්‍යය ප්‍රත්‍යක්‍ෂ කෙළේ දෝ' යි කිසි විටෙක මෙසේ අදහස් වන්නේ ය. ස්වාමීනි, මේ ප්‍රකාශය මෙසේ නො දත යුතු ය. ස්වාමීනි, ගෙවා දැමූ කාමාදිආශ්‍රව ඇති වැස නිම කළ බඹසර ඇති සිවුමගින් කොට නිම කළ කටයුතු ඇති මහණ තෙමේ තමා විසින් සිවුමගින් කළයුතු තවත් කටයුතු ඇතැයි හෝ කළ (භාවනා) කර්‍මයාගේ නැවත (කිරීමෙන්) වැඩීමක් හෝ නො දක්නේ, රාගය ක්‍ෂය වීමෙන් පහ වූ රාගය ඇති බැවින් නෛෂ්ක්‍රම්‍යය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. ද්වේෂය ක්‍ෂය වීමෙන් පහ වූ ද්වේෂය ඇති බැවින් නෛෂ්ක්‍රම්‍යය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. මෝහය ක්‍ෂය වීමෙන් පහ වූ මෝහය ඇති බැවින් නෛෂ්ක්‍රම්‍යය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය.

29. "ස්වාමීනි, මෙහි කිසි ආයුෂ්මතකුහට 'මේ ආයුෂ්මත් තෙමේ ලාභසත්කාර කීර්තිය කැමැති වෙමින් ප්‍රවිවේකය ප්‍රත්‍යක්‍ෂ කෙළේ දෝ' යි කිසි විටෙක මෙසේ අදහස් වන්නේ ය. ස්වාමීනි, මේ මෙසේ නො දත යුතු ය. ස්වාමීනි, ගෙවා දැමූ කාමාදිආශ්‍රව ඇති වැස නිම කළ බඹසර ඇති සිවු මගින් කොට නිම කළ කටයුතු ඇති මහණ තෙමේ තමා විසින් කළ යුතු කටයුතු ඇතැයි හෝ කළ කර්‍මයාගේ නැවත වැඩීමක් හෝ නො දක්නේ, රාගය ක්‍ෂය වීමෙන් පහ වූ රාගය ඇති බැවින් ප්‍රවිවේකය ප්‍රත්‍යක්‍ෂ කෙළේ වේ. ද්වේෂය ක්‍ෂය වීමෙන් පහ වූ ද්වේෂය ඇති බැවින් ප්‍රවිවේකය ප්‍රත්‍යක්‍ෂ කෙළේ වේ. මෝහය ක්‍ෂය වීමෙන් පහ වූ මෝහය ඇති බැවින් ප්‍රවිවේකය ප්‍රත්‍යක්‍ෂ කෙළේ වේ.

* උපග්‍රන්ථය බලනු.

30. ''සියා ඛො පන භන්තෙ, ඉධෙකච්චස්ස ආයස්මතො එවමස්ස 'සීලබ්බතපරාමාසං නූන අයමායස්මා සාරතො පච්චාගච්ඡන්තො අබ්‍යාපජ්ඣාධිමුත්තො''ති. න ඛො පනෙතං එවං දට්ඨබ්බං. ඛීණාසවො භන්තෙ, භික්ඛු වුසිතවා කතකරණීයො කරණීයමත්තනො අසමනුපස්සන්තො කතස්ස වා පතිචයං, ඛයා රාගස්ස වීතරාගත්තා අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. ඛයා මොහස්ස වීතමොහත්තා අබ්‍යාපජ්ඣාධිමුත්තො හොති. -පෙ- ඛයා රාගස්ස වීතරාගත්තා උපාදානක්ඛයාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා උපාදානක්ඛයාධිමුත්තො හොති. ඛයා මොහස්ස වීතමොහත්තා උපාදානක්ඛයාධිමුත්තො හොති. -පෙ- ඛයා රාගස්ස වීතරාගත්තා තණ්හක්ඛයාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා තණ්හක්ඛයාධිමුත්තො හොති. ඛයා මොහස්ස වීතමොහත්තා තණ්හක්ඛයාධිමුත්තො හොති. -පෙ- ඛයා රාගස්ස වීතරාගත්තා අසම්මොහාධිමුත්තො හොති. ඛයා දොසස්ස වීතදොසත්තා අසම්මොහාධිමුත්තො හොති. ඛයා මොහස්ස වීතමොහත්තා අසම්මොහාධිමුත්තො හොති.

31. ''එවං සම්මා විමුත්තචිත්තස්ස භන්තෙ, භික්ඛුනො භුසා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සති. භුසා චෙපි සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සති.

32. ''සෙය්‍යථාපි භන්තෙ, සෙලො පබ්බතො අච්ඡිද්දො අසුසිරො එකග්ඝනො, පුරත්ථිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි, නෙව නං සඞ්කම්පෙය්‍ය. න සම්පකම්පෙය්‍ය. න සම්පවෙධෙය්‍ය. පච්ඡිමාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි -පෙ- උත්තරාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි -පෙ- දක්ඛිණාය චෙපි දිසාය ආගච්ඡෙය්‍ය භුසා වාතවුට්ඨි, නෙව නං සඞ්කම්පෙය්‍ය. න සම්පකම්පෙය්‍ය. න සම්පවෙධෙය්‍ය. එවමෙව ඛො භන්තෙ, එවං සම්මා විමුත්තචිත්තස්ස භික්ඛුනො භුසා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සති. භුසා චෙපි සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං. වයඤ්චස්සානුපස්සතී'' ති.

30. ''ස්වාමීනි, මෙහි කිසි ආයුෂ්මතකුහට 'මේ ආයුෂ්මත් තෙමේ ඒකාන්තයෙන් සීලබ්බතපරාමාසය සාරවශයෙන් ගණිමින් රහත්බව ප්‍රත්‍යක්‍ෂ කෙළේ දෝ' යි කිසි විටෙක මෙසේ අදහස් වන්නේ ය. ස්වාමීනි, මේ මෙසේ නො දත යුතු ය. ස්වාමීනි, ගෙවා දැමූ කාමාදි ආශ්‍රව ඇති වැස නිම කළ බඹසර ඇති සිවුමගින් කොට නිම කළ කටයුතු ඇති මහණ තෙමේ තමන් විසින් කටයුතු ඇතැයි හෝ කළ කම්යාගේ නැවත වැඩීමක් හෝ නො දක්නේ, රාගය ක්‍ෂය වීමෙන් පහ වූ රාගය ඇති බැවින් රහත්බව ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. ද්වේෂය ක්‍ෂය වීමෙන් පහ වූ ද්වේෂය ඇති බැවින් රහත්බව ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. මෝහය ක්‍ෂය වීමෙන් පහ වූ මෝහය ඇති බැවින් රහත් වූයේ ය. -පෙ- රාගය ක්‍ෂය වීමෙන් පහ වූ රාගය ඇති බැවින් උපාදනක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. ද්වේෂය ක්‍ෂය වීමෙන් පහ වූ ද්වේෂය ඇති බැවින් උපාදනක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. මෝහය ක්‍ෂය වීමෙන් පහ වූ මෝහය ඇති බැවින් උපාදනක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. -පෙ- රාගය ක්‍ෂය වීමෙන් පහ වූ රාගය ඇති බැවින් තෘෂ්ණාක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. ද්වේෂය ක්‍ෂය වීමෙන් පහ වූ ද්වේෂය ඇති බැවින් තෘෂ්ණාක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. මෝහය ක්‍ෂය වීමෙන් පහ වූ මෝහය ඇති බැවින් තෘෂ්ණාක්‍ෂයය ප්‍රත්‍යක්‍ෂ කෙළේය. -පෙ- රාගය ක්‍ෂය වීමෙන් පහ වූ රාගය ඇති බැවින් අසම්මෝහය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. ද්වේෂය ක්‍ෂය වීමෙන් පහ වූ ද්වේෂය ඇති බැවින් අසම්මෝහය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය. මෝහය ක්‍ෂය වීමෙන් පහ වූ මෝහය ඇති බැවින් අසම්මෝහය ප්‍රත්‍යක්‍ෂ කෙළේ ය.

31. ''ස්වාමීනි, මෙසේ මනා කොට මිදුනු සිත් ඇති රහත් මහණහුගේ ඇස්හමුවට ඉදිත් චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතු වූ බලවත් (දිව්‍යමය වූ හෝ) රූපයෝ පැමිණෙත් ද, ඒ රහත්හුගේ සිත නො ම අල්ලා ගණිත් (නො මඩිත්.) ඒ රහත්හුගේ සිත අරමුණ හා අමිශ්‍රිත වූයේ ම පිහිටියේ නො සැලෙන බවට පැමිණියේ වේ. ඒ අරමුණේ විනාශය ද දකී යි. සොතවිඤ්ඤාණයෙන් දතයුතු බලවත් ශබ්දයෝ -පෙ- ඝාණවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ගන්ධයෝ -පෙ- ජිව්හාවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් රසයෝ -පෙ- කායවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ඵොට්ඨබ්බයෝ -පෙ- මනොවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ධර්මයෝ සිත් හමුවට පැමිණෙත් ද, ඒ රහත්හුගේ සිත මැඩ නො ගණිත්. ඒ රහත්හුගේ සිත අමිශ්‍රිත වූයේ ම පිහිටියේ නිසල බවට පැමිණියේ වේ. ඒ ධම්මාරම්මණයාගේ විනාශය ද දකී යි.

32. ''ස්වාමීනි, කුඩා සිදුරු රහිත වූ මහසිදුරු රහිත වූ ඒකඝන වූ ගල්පව්වෙක් (වේ ද), බලවත් වාතමෙඝයෙක් පෙරදිගින් එන්නේ, ඒ පර්වතය යම් සේ සොලවාලිය නො හැක්කේ ද, හාත්පසින් සොලවාලිය නො හැක්කේ ද, වෙව්ලුවා හෙළිය නො හැක්කේ ද, බලවත් වාතමෙඝයෙක් පැසුළුදිගින් එන්නේ ද -පෙ- බලවත් වාතමෙඝයෙක් උතුරුදිගින් එන්නේ ද, -පෙ- බලවත් වාතමෙඝයෙක් දකුණුදිගින් එන්නේ ද, ඒ පර්වතය යම් සේ සොලවාලිය නො හැක්කේ ද, කොයි අතිනුත් සොලවාලිය නො හැක්කේ ද, වෙව්ලුවා හෙළිය නො හැක්කේ ද, ස්වාමීනි, එපරිද්දෙන් මනා කොට මිදුනු සිත් ඇති ඒ රහත්හුගේ ඇස් හමුවට චක්ඛුවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් රූපයෝ පැමිණෙත් ද, ඒ රහත්හුගේ සිත නො ම අල්ලා ගණිත්. ඒ රහත්හුගේ සිත මිශ්‍රිත නො වූයේ ම පිහිටියේ නො සැලෙනබවට පැමිණියේ වේ. රූපාරම්මණයාගේ විනාශය ද දකියි. සොතවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ශබ්දයෝ -පෙ- ඝාණවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ගන්ධයෝ -පෙ- ජිව්හාවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් රසයෝ -පෙ- කායවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ඵොට්ඨබ්බයෝ -පෙ- මනොවිඤ්ඤාණයෙන් දත යුතු වූ බලවත් ධර්මයෝ සිත් හමුවට පැමිණෙත් ද, ඒ රහත්හුගේ සිත නො ම අල්ලා ගණිත්. ඒ රහත්හුගේ සිත මිශ්‍රිත නො වූයේ ම පිහිටියේ නොසැලෙනබවට පැමිණයේ වේ. ධම්මාරම්මණයාගේ විනාශය ද දකී යි.

33\. “නෙක්ඛම්මං අධිමුත්තස්ස පවිවෙකඤ්ච චෙතසො,
අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස උපාදානක්ඛයස්ස ච;
තණ්හක්ඛයාධිමුත්තස්ස අසම්මොහඤ්ච චෙතසො,
දිස්වා ආයතනුප්පාදං සම්මා චිත්තං විමුච්චති.

34\. තස්ස සම්මා විමුත්තස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
කතස්ස පතිචයො නත්ථි කරණීයං න විජ්ජති.

35\. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං රූපා රසා සද්දා ගන්ධා ඵස්සා ච කෙවලා;
ඉට්ඨා ධම්මා අනිට්ඨා ච නප්පවෙධෙන්ති තාදිනො,
ඨිතං චිත්තං විප්පමුත්තං වයඤ්චස්සානුපස්සතී” ති.

36\. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: “එවං ඛො භික්ඛවෙ, කුලපුත්තා අඤ්ඤං ව්‍යාකරොන්ති. අත්ථො ච වුත්තො. අත්තා ච අනුපනීතො. අථ ච පනිධෙකච්චෙ මොඝපුරිසා හසමානකා[1] මඤ්ඤෙ අඤ්ඤං ව්‍යාකරොන්ති. තෙ පච්ඡා විඝාතං ආපජ්ජන්තී” ති.

37\. අථ ඛො භගවා ආයස්මන්තං සොණං ආමන්තෙසි: “ත්වං ඛො'සි සොණ, සුකුමාලො. අනුජානාමි තෙ සොණ, එකපලාසිකං උපාහන” න්ති. “අහං ඛො භන්තෙ, අසීතිසකටවාහෙ හිරඤ්ඤං ඔහාය අගාරස්මා අනගාරියං පබ්බජිතො සත්තහත්ථිකඤ්ච අනීකං. අථාහං භන්තෙ, එකපලාසිකං චෙ උපාහනං පරිහරිස්සාමි[2], තස්ස මෙ භවිස්සන්ති වත්තාරො: 'සොණො කොළිවීසො අසීතිසකටවාහෙ හිරඤ්ඤං ඔහාය ආගරස්මා අනගාරියං පබ්බජිතො සත්තහත්ථිකඤ්ච අනීකං. සො දානායං එකපලාසිකාසු උපාහනාසු සත්තො' ති. සචෙ භගවා භික්ඛුසඞ්ඝස්ස අනුජානිස්සති, අහම්පි පරිභුඤ්ජිස්සාමි. නො චෙ භගවා භික්ඛුසඞ්ඝස්ස අනුජානිස්සති, අහම්පි න පරිභුඤ්ජිස්සාමී” ති.

38\. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “අනුජානාමි භික්ඛවෙ, එකපලාසිකං උපාහනං. න භික්ඛවෙ, දිගුණා උපාහනා ධාරෙතබ්බා. න තිගුණා උපාහනා ධාරෙතබ්බා. න ගණඞ්ගණූපාහනා[3] ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා” ති.

39\. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සබ්බනීලිකා[4] උපාහනායො ධාරෙන්ති. -පෙ- සබ්බපීතිකා[5] උපාහනායො ධාරෙන්ති. සබ්බලොහිතිකා[6] උපාහනායො ධාරෙන්ති. සබ්බමඤ්ජෙට්ඨිකා[7] උපාහනායො ධාරෙන්ති. සබ්බකණ්හා[8] උපාහනායො ධාරෙන්ති. සබ්බමහාරඞ්ගරත්තා උපාහනායො ධාරෙන්ති. සබ්බමහානාමරත්තා උපාහනායො ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: “සෙය්‍යථාපි ගිහී කාමභොගිනො” ති.

---

1\. “හසමානකං” ම. ඡ. සං. PTS මනුප. තො වි. “හසමානා” අට්ඨකථා.
2\. “අථාහං භන්තෙ එකපලාසිකං චෙ උපාහනං පරිහරිස්සාමී” ති සීහලක්ඛර-පොත්ථකෙසු න දිස්සතෙ. මරම්මරක්ඛර පොත්ථකෙ “උපාහනං” න දිස්සතෙ.
3 “ගුණංගුණූපාහනා” ම ඡ සං.
4\. “සබ්බනීලිකායො” අ වි. ම නු පා. තො වි. ඡ වි.
5\. “සබ්බපීතිකායො” ම නු ප. අ වි. තො වි. ඡ වි.
6 “සබ්බලොහිතිකායො” ම නු ප. අ වි. තොවි. ඡ වි.
7\. “මඤ්ජෙට්ඨිකායො” ම නු ප. අ වි. තො වි. ඡ වි.
,, “මඤ්ජිට්ඨිකා” ම ඡ සං. ම නු ප. අට්ඨකථා.
8\. “සබ්බකණ්හායො” ම නු ප. අ වි. තො වි. ඡ වි.

33. "නෙක්ඛම්මය, සිත්හි ප්‍රවිවේකය, අබ්‍යාපජ්ඣය, උපාදානක්ඛයය, තණ්හක්ඛයය, සිත්හි අසම්මොහය (යන නම් ඇති රහත්බව) අවබොධ කොට සිටියා වූ රහත්හුගේ සිත ආයතනයන්ගේ ඉපදීම (විපස්සනා වසයෙන්) දැක මනා කොට (ඵලසමාපත්ති වසයෙන්) මිදේ. (නිවන්අරමුණෙහි පිහිටයි යු සේයි.)

34. ඵලසමාපත්තිවසයෙන් මනා කොට මිදුනු සන්හුන් සිත් ඇති ඒ රහත් මහණහුට කළ කර්‍මයාගේ නැවැත වැඩීමෙක් නැත්තේ ය. සිවුමගින් (තවත්) කටයුත්තෙක් විද්‍යමාන නො වේ.

35. එකඝන වූ ගල්පව්වෙක් සිවුදිගින් හමන හුළඟින් යම් සේ නො සැලේ ද, එපරිද්දෙන් සියලු රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන ආරම්මණයෝ ද, ඉෂ්ට වූ හෝ අනිෂ්ට වූ ධම්මාරම්මණයෝ ද රහතුන් වහන්සේගේ සිත කම්පිත නො කෙරෙත් ඒ රහත්හුගේ ස්ථිර වූ මැනවින් කෙලෙසුන්ගෙන් මිදුනු සිත විනාශය ද දකී යි.*"

36. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මෙසේ කුලපුත්‍රයෝ රහත්බව ප්‍රකාශ කෙරෙත්. අර්‍ථය ද කියන ලද්දේ ය. (මම රහත්මි යි මෙසේ ව්‍යඤ්ජනවශයෙන්) තෙමේ ද නො එළවන ලද්දේ ය. එහෙත් මෙහි ඇතැම් හිස් පුරුෂයෝ සිනහසෙන්නවුන් මෙන් රහත්බව ප්‍රකාශ කෙරෙත්. ඔහු පසු ව දුකට පැමිණෙත්" යි භික්ෂූන් ඇමතූ සේක.

37. නැවැත භාග්‍යවතුන් වහන්සේ "සොණ, තෝ සියුමැලි ය. සොණ, තට එක් පටලයක් (පටක්) ඇති වහනක් අනුදනිමි" යි ආයුෂමත් සොණ තෙරුන් ඇමතූ සේක. "ස්වාමීනි, මම අසූගැල්බරක් මසුරන් ද (එක් අණීක-යක් වූ ඇතකු හා ඇතීනියන් සදෙනකුන් ඇති) ඇත් අණීක සතක් ද හැර දමා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වීමි. දැන් මම එක්පටවහනක් දරන් නෙම් නම්, ඒ මට 'කොළිවීස සොණ තෙමේ අසූගැල්බරක් මසුරන් ද ඇත් අණීක සතක් ද හැර දමා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ ය. ඒ මේ සොණ තෙමේ දැන් එක් පටක් ඇති වහන්හි ඇලුනේ ය' යි කියන්නෝ වෙත්. භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයාහට අනුදන්නා සේක් නම්, මමත් පරිභොග කරන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයාහට නො අනුදන්නා සේක් නම්, මමත් පරිභොග නො කරන්නෙමි" යි.

38. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, එක්පටක් ඇති වහනක් අනුදනිමි. මහණෙනි, දෙපටක් ඇති වහන් නො දැරිය යුතු ය. තෙපටක් ඇති වහන් නො දැරිය යුතු ය. තුන් පටට වැඩි පට ඇති වහන් ද නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි භික්ෂූන් ඇමතූ සේක.

39. එකල්හි සවග මහණෝ සව් (සියල්ල) නිල් (පැහැයෙන් යුත්) වහන් දරත්. -පෙ- සව්රන්වන් වහන් දරත්. සව්රත් වහන් දරත්. සව්මඳට-වන් වහන් දරත්. සව්කළු වහන් දරත්. සව්පතඟිවන් (රත්වැයන් පිටිපැහැ යුත්) වහන් දරත්. මුසු වූ (හෝ රත්පියුම්මල්පෙති) පැහැ යුත් වහන් දරත්. මිනිස්සු (මොහු) "කාමභොගී වූ ගිහින් සේ" යි අවමන් කෙරෙත්. නින්‍දා කෙරෙත්. දෙස් කියත්.

*උපග්‍රන්ථය බලනු.

40. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ, සබ්බනීලිකා උපාහනා ධාරෙතබ්බා. -පෙ- න සබ්බපීතිකා උපාහනා ධාරෙතබ්බා. න සබ්බලොහිතිකා උපාහනා ධාරෙතබ්බා. න සබ්බමඤ්ජෙට්ඨිකා උපාහනා ධාරෙතබ්බා. න සබ්බකණ්හා උපාහනා ධාරෙතබ්බා. න සබ්බමහාරඞ්ගරත්තා උපාහනා ධාරෙතබ්බා. න සබ්බමහානාමරත්තා උපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

41. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නීලකවට්ටිකා[1] උපාහනායො ධාරෙන්ති -පෙ- පීතකවට්ටිකා උපාහනායො ධාරෙන්ති. ලොහිතකවට්ටිකා උපාහනායො ධාරෙන්ති. මඤ්ජෙට්ඨිකවට්ටිකා උපාහනායො ධාරෙන්ති. කණ්හවට්ටිකා උපාහනායො ධාරෙන්ති. මහාරඞ්ගරත්තවට්ටිකා උපාහනායො ධාරෙන්ති. මහානාමරත්තවට්ටිකා උපාහනායො ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො" ති.

42. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ, නීලකවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. -පෙ- න පීතකවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න ලොහිතකවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න මඤ්ජෙට්ඨිකවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න කණ්හවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න මහාරඞ්ගරත්තවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න මහානාමරත්තවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

43. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඛල්ලිකබද්ධා[2] උපාහනායො ධාරෙන්ති. -පෙ- පුටබද්ධා උපාහනායො ධාරෙන්ති. පාළිගුණ්ඨිමා උපාහනායො ධාරෙන්ති. තූලපුණ්ණිකා[3] උපාහනායො ධාරෙන්ති. තිත්තිරපත්තිකා උපාහනායො ධාරෙන්ති. මෙණ්ඩවිසාණවට්ටිකා[4] උපාහනායො ධාරෙන්ති. අජවිසාණවට්ටිකා[5] උපාහනායො ධාරෙන්ති. විච්ඡිකාළිකා උපාහනායො ධාරෙන්ති. මොරපිඤ්ඡපරිසිබ්බිතා[6] උපාහනායො ධාරෙන්ති. චිත්‍රා උපාහනායො ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො" ති.

44. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ, ඛල්ලිකබද්ධා උපාහනා ධාරෙතබ්බා. -පෙ- න පුටබද්ධා උපාහනා ධාරෙතබ්බා. න පාළිගුණ්ඨිමා උපාහනා ධාරෙතබ්බා. න තූලපුණ්ණිකා උපාහනා ධාරෙතබ්බා. න තිත්තිරපත්තිකා උපාහනා ධාරෙතබ්බා. න මෙණ්ඩවිසාණවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න අජවිසාණවට්ටිකා උපාහනා ධාරෙතබ්බා. න විච්ඡිකාළිකා උපාහනා ධාරෙතබ්බා න මොරපිඤ්ඡපරිසිබ්බිතා උපාහනා ධාරෙතබ්බා. න චිත්‍රා උපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

1. "නීලකවද්ධිකා" ම ඡ සං. එත්ථ පීතකාදීසු ච සබ්බත්ථ වද්ධිකා'ති දිස්සතෙ.
2. "ඛල්ලකබද්ධා" ම ඡ සං P T S. ම නු ප. ජව්. තො වි.
3. "තූලපණ්ණිකා" තො වි. 4 - 5. "බද්ධිකා" සී. මු. "බන්ධිකා" P T S.
5. "අජවිසාණවද්ධිකා" අට්ඨකථා. 6. "මොරපිච්ඡපරිසිබ්බිතා" ම ඡ සං.

40. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සව්නිල් වහන් නො දැරිය යුතු ය. -පෙ- සව්රත්වන් වහන් නො දැරිය යුතු ය. සව්රතු වහන් නො දැරිය යුතු ය. සව්මඳටවන් වහන් නො දැරිය යුතු ය. සව්කළු වහන් නො දැරිය යුතු ය. සව්පතඟිපැහැති වහන් නො දැරිය යුතු ය. මිශ්‍ර වූ පැහැති වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

41. එකල්හි සවගමහණෝ නිල් වැටි = වර (වරපට) ඇති වහන් දරත්. -පෙ- රත්වන් වර ඇති වහන් දරත්. රතුවර ඇති වහන් දරත්. මඳටවන් වර ඇති වහන් දරත්. කළුවන් වර ඇති වහන් දරත්. පතඟිවන් වර ඇති වහන් දරත්. මුසු වූ පැහැ යුත් වර ඇති වහන් දරත්. මිනිස්සු "(මොහු) කාමභොගී වූ ගිහින් සේ" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දොස් කියත්.

42. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නිල් වන් වර ඇති වහන් නො දැරිය යුතු ය. -පෙ- රත්වන් වර ඇති වහන් නො දැරිය යුතු ය. රතුවර ඇති වහන් නො දැරිය යුතු ය. මඳටවන් වර ඇති වහන් නො දැරිය යුතු ය. කළුවන් වර ඇති වහන් නො දැරිය යුතු ය. පතඟිවන් වර ඇති වහන් නො දැරිය යුතු ය. මුසු වූ පැහැ යුත් වර ඇති වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

43. එකල්හි සවගමහණෝ විළුම් වසාලන වර ඇති වහන් දරත්. -පෙ- කෙණ්ඩය වසාලන සේ මැසූ වහන් දරත්. පිටිපාවසාලන වහන් දරත්. පුලුන් පුරවා මැසූ වහන් දරත්. තිත්වටුපියාපතින් පිරියම් කළ වහන් දරත්. මැඩෙළු අං වැනි සටහන් ඇති වර (දෙපැත්තෙහි = පය දෙඇඟිලි අවුළුවන තැන) යොදා කළ වහන් දරත්. තිරෙළුඅං වැනි සටහන් ඇති වර යොදා කළ වහන් දරත්. ගෝනුසුනඟුටු ආකාරයෙන් වර යොදා කළ වහන් දරත්. මොනරපිල්වලින් මසා කළ වහන් දරත්. විසිතුරු (වර ඇති) වහන් දරත්. මිනිස්සු "(මොහු) කාමභොගී වූ ගිහින් සේ"යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

44. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, විළුම් වසාලන වර ඇති වහන් නො දැරිය යුතු ය. -පෙ- කෙණ්ඩය දක්වා වසාලන වහන් නො දැරිය යුතු ය. පිටිපා වසාලන වහන් නො දැරිය යුතු ය. පුලුන් පුරවා මැසූ වහන් නො දැරිය යුතු ය. තිත්වටුපියාපතින් පිරියම් කළ වහන් නො දැරිය යුතු ය. එළුඅං වැනි සටහන් ඇති වර යොදා කළ වහන් නො දැරිය යුතු ය. තිරෙළුඅං වැනි සටහන් ඇති වර යොදා කළ වහන් නො දැරිය යුතු ය. ගෝනුසුනඟුටු ආකාරයෙන් වර යොදා කළ වහන් නො දැරිය යුතු ය. මොනරපිල්වලින් මසා කළ වහන් නො දැරිය යුතු ය. විසිතුරු වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

45. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සීහචම්මපරික්ඛටා උපාහනායො ධාරෙන්ති. -පෙ- ව්‍යග්ඝචම්මපරික්ඛටා උපාහනායො ධාරෙන්ති. දීපිචම්මපරික්ඛටා උපාහනායො ධාරෙන්ති. අජිනචම්මපරික්ඛටා උපාහනායො ධාරෙන්ති. උද්දචම්මපරික්ඛටා උපාහනායො ධාරෙන්ති. මජ්ජාරචම්ම-පරික්ඛටා උපාහනායො ධාරෙන්ති. කාළකචම්මපරික්ඛටා උපාහනායො ධාරෙන්ති. උලූකචම්මපරික්ඛටා[1] උපාහනායො ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො" ති.

46. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ, සීහචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. -පෙ- න ව්‍යග්ඝචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. න දීපිචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. න අජිනචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. න උද්දචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. න මජ්ජාරචම්ම-පරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. න කාළකචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. න උලූකචම්මපරික්ඛටා උපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

47. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය **රාජගහං** පිණ්ඩාය පාවිසි අඤ්ඤතරෙන භික්ඛුනා පච්ඡාසමණෙන. අථ ඛො සො භික්ඛු ඛඤ්ජමානො භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි.

48. අද්දසා ඛො අඤ්ඤතරො උපාසකො ගණඞ්ගණූපාහනං[2] ආරොහිත්වා භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන උපාහනා ඔරොහිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එතදවොච: "කිස්ස භන්තෙ අය්‍යො ඛඤ්ජතී" ති. "පාදා මෙ ආවුසො ඵලිතා" ති.[3] "හන්ද භන්තෙ, උපාහනායො" ති. "අලං ආවුසො, පටික්ඛිත්තා භගවතා ගණඞ්ගණූපාහනා" ති. "ගණ්හාහෙතා භික්ඛු උපාහනායො" ති.

49. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, ඔමුක්කං ගණඞ්ගණූපාහනං. න භික්ඛවෙ, නවා ගණඞ්ගණූපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

50. තෙන ඛො පන සමයෙන භගවා අජ්ඣොකාසෙ අනුපාහනො චඞ්කමති. "සත්ථා අනුපාහනො චඞ්කමතී" ති ථෙරාපි භික්ඛූ අනුපාහනා චඞ්කමන්ති.

51. ඡබ්බග්ගියා භික්ඛූ සත්ථරි අනුපාහනෙ චඞ්කමමානෙ ථෙරෙසුපි භික්ඛූසු අනුපාහනෙසු චඞ්කමමානෙසු සඋපාහනා චඞ්කමන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ සත්ථරි අනුපාහනෙ චඞ්කමමානෙ ථෙරෙසුපි භික්ඛූසු අනුපාහනෙසු චඞ්කමමානෙසු සඋපාහනා චඞ්කමිස්සන්තී" ති

52. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ සත්ථරි අනුපාහනෙ චඞ්කමමානෙ ථෙරෙසුපි භික්ඛූසු අනුපාහනෙසු චඞ්කමමානෙසු සඋපාහනා චඞ්කමන්තී ?" ති. "සච්චං භගවා."

1. "ලූවකචම්ම පරික්ඛටා" ම ඡ සං. 2. "ගණඞ්ගණූපාහනා" ම නු ප. අ වි. ඡ වි. තො වි.
2. "ගුණඞ්ගුණූපාහනා" ම ඡ සං. 3. "ඵාලිතා ති" සී මු.

45. එකල්හි ඡබ්බග්ගියභික්ෂූහු සිහසම් වටේ යොදා කළ වහන් දරත්. -පෙ- ව්‍යග්‍රසම් වටේ යොදා කළ වහන් දරත්. දිවිසම් වටේ යොදා කළ වහන් දරත්. අඳුන්දිවිසම් වටේ යොදා කළ වහන් දරත්. දියබළලුසම් වටේ යොදා කළ වහන් දරත්. බළල්සම් වටේ යොදා කළ වහන් දරත්. ලේනසම් වටේ යොදා කළ වහන් දරත්. මහමුහුණු (බකමූණු) සම් වටේ යොදා කළ වහන් දරත්. මිනිස්සු "(මොහු) කාමභෝගී වූ ගිහින් සේ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

46. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සිහසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතු ය. -පෙ- ව්‍යග්‍රසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතු ය. දිවිසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතු ය. අඳුන්දිවිසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතුය. දියබළලුසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතු ය. බළල්සම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතු ය. ලේනසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතුය. මහමුහුණුසම් වටේ යොදා කළ වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

47. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ කැටු ව යන එක්තරා මහණකු සමග **රජගහනුවරට** පිඬු පිණිස වැඩි සේක. ඒ මහණ තෙමේ කොර ගසමින් භාග්‍යවතුන් වහන්සේ පසු පස ලුහුබැඳ ගියේ ය.

48. එකල්හි එක්තරා උපාසකයෙක් සිවුපටක් ඇති වහන් ලා එන්නේ වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටුයේ ය. දැක වහන් මුදා භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඒ මහණහු වෙතට ගියේ ය. ගොස් ඒ මහණහු සකසා වැඳ මෙය කීයේ ය: "ස්වාමීනි, ආර්‍ය්‍ය තෙමේ කුමක් නිසා කොර ගසයි දැ?" යි. "ඇවැත්නි, මාගේ පතුල් පැළුනේ ය." "ස්වාමීනි, එසේ නම් මෙන්න වහන්." "ඇවැත්නි, වුව මනා නැත. භාග්‍යවතුන් වහන්සේ විසින් සිවුපට වහන් ප්‍රතික්ෂෙප කරණ ලදී." "මහණ, මේ වහන් ගණුව."

49. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, පරිභොගයෙන් මුදා ඉවත් කළ පටගණන් ඇති වහන් අනුදනිමි. මහණෙනි, පටගණන් ඇති අළුත් වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

50. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එළිමහන්හි වහන් රහිත ව සක්මන් කරණ සේක. "ශාස්තෘන් වහන්සේ වහන් රහිත ව සක්මන් කරණ සේකැ" යි ස්ථවිර භික්ෂූහු ද වහන් රහිත ව සක්මන් කෙරෙති.

51. ශාස්තෘන් වහන්සේ වහන් රහිත ව සක්මන් කරණ කල්හි ස්ථවිර භික්ෂූන් වහන් රහිත ව සක්මන් කරණ කල්හි ඡබ්බග්ගියභික්ෂූහු වහන් සහිත ව සක්මන් කෙරෙත්. ආශා රහිත වූ යම් ඒ භික්ෂූහු වෙත් ද ඔහු "ශාස්තෘන් වහන්සේ වහන් රහිත ව සක්මන් කරණ කල්හි ස්ථවිර භික්ෂූන් වහන් රහිත ව සක්මන් කරණ කල්හි කෙසේ නම් ඡබ්බග මහණෝ වහන් සහිත ව සක්මන් කරත් දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

52. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ශාස්තෘන් වහන්සේ වහන් රහිත ව සක්මන් කරණ කල්හි ස්ථවිර භික්ෂූන් වහන් රහිත ව සක්මන් කරණ කල්හි ඡබ්බග මහණෝ වහන් සහිත ව සක්මන් කෙරෙත් ලු. එ සැබෑ ද?" "භාග්‍ය වතුන් වහන්ස, සැබෑ ය."

53. විගරහි බුද්ධො භගවා "කථං හි නාම තෙ භික්ඛවෙ, මොඝපුරිසා සත්ථරි අනුපාහනෙ චඞ්කමමානෙ ථෙරෙසුපි භික්ඛූසු අනුපාහනෙසු චඞ්කමමානෙසු සඋපාහනා චඞ්කමිස්සන්ති? ඉමෙහි නාම භික්ඛවෙ, ගිහී කාමභොගිනො ඔදාතවසනා[1] අභිජීවනිකස්ස සිප්පස්ස කාරණා ආචරියෙසු සගාරවා සප්පතිස්සා[2] සභාගවුත්තිකා විහරිස්සන්ති. ඉධ ඛො තං භික්ඛවෙ, සොභෙථ, යං තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා ආචරියෙසු ආචරියමත්තෙසු උපජ්ඣායෙසු උපජ්ඣායමත්තෙසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරෙය්‍යාථ?

54. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, ආචරියෙසු ආචරියමත්තෙසු උපජ්ඣායෙසු උපජ්ඣායමත්තෙසු අනුපාහනෙසු චඞ්කමමානෙසු සඋපාහනෙන චඞ්කමිතබ්බං. යො චඞ්කමෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න භික්ඛවෙ[3], අජ්ඣාරාමෙ උපාහනා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

55. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පාදඛීලාබාධො හොති. භික්ඛූ තං භික්ඛුං[4] පරිග්ගහෙත්වා උච්චාරම්පි පස්සාවම්පි නික්ඛාමෙන්ති. අද්දසා ඛො භගවා සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තෙ භික්ඛූ තං භික්ඛුං පරිග්ගහෙත්වා උච්චාරම්පි පස්සාවම්පි නික්ඛාමෙන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කිං ඉමස්ස භික්ඛවෙ, භික්ඛුනො ආබාධො" ති. "ඉමස්ස භන්තෙ ආයස්මතො පාදඛීලාබාධො. ඉමං මයං පරිග්ගහෙත්වා උච්චාරම්පි පස්සාවම්පි නික්ඛාමෙමා'ති.

56. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, යස්ස පාදා වා දුක්ඛා, පාදා වා ඵලිතා, පාදඛීලො වා ආබාධො[5], උපාහනං ධාරෙතු" න්ති.

57. තෙන ඛො පන සමයෙන භික්ඛූ අධොතෙහි පාදෙහි මඤ්චම්පි පීඨම්පි අභිරුහන්ති. චීවරම්පි සෙනාසනම්පි දුස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, 'ඉදානි මඤ්චං වා පීඨං වා අභිරුහිස්සාමී'ති උපාහනං ධාරෙතු" න්ති.

58. තෙන ඛො පන සමයෙන භික්ඛූ රත්තියා උපොසථග්ගම්පි සන්නිසජ්ජම්පි ගච්ඡන්තා අන්ධකාරෙ ඛාණුම්පි කණ්ටකම්පි අක්කමන්ති. පාදා දුක්ඛා හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අජ්ඣාරාමෙ උපාහනං ධාරෙතුං උක්කං පදීපං කත්තරදණ්ඩ"න්ති.

1. "ගිහී ඔදාතවත්ථවසනා" ම ඡ සං 2. "සප්පතිස්සවා" සී මු.
3. "න ච භික්ඛවෙ" ම ඡ සං. P T S. 4. "තං භික්ඛූ" ම ඡ සං
5. "පාදඛීලාබාධො වා" සී

53. "මහණෙනි, ඒ හිස් පුරුෂයෝ ශාස්තෲන් වහන්සේ වහන් රහිත ව සක්මන් කරණ කල්හි සථවිරභික්ෂූන් වහන් රහිත ව සක්මන් කරණ කල්හි කෙසේ නම් වහන් සහිත ව සක්මන් කරත් දැ" යි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ (ඔවුන්ට) ගැරහූ සේක. "මහණෙනි, සුදුපිළි අඳින්නා වූ කාමභොගී වූ මේ ගිහියෝ දිවි පැවැත්වීමට සුදුසු වූ ශිල්ප හෙතුවෙන් ඇදුරන් කෙරෙහි ගෞරව සහිත ව ආදරසහිත ව සමාන පැවැතුම් ඇති ව වාසය කරන්නාහු ය. මහණෙනි, ඉදින් තෙපි මෙසේ මනා කොට දෙසූ ශාසනයෙහි පැවිදි ව ඇදුරන් කෙරෙහි ඇදුරන් පමණ වූවන් කෙරෙහි උපාධ්‍යායයන් කෙරෙහි උපාධ්‍යායයන් පමණ වූවන් කෙරෙහි ගෞරව රහිත ව ආදර රහිත ව නො සමපැවැතුම් ඇති ව වසන්නහු නම්, මෙහි තෙපි හොබනහු ද?

54. "මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ -පෙ-" යි ගරහා දැහැමි කතා කොට "මහණෙනි, ඇදුරන් පමණ වූවන් උපාධ්‍යායයන් පමණ වූවන් වහන් රහිත ව සක්මන් කරණ කල්හි වහන් සහිත ව සක්මන් නො කළ යුතු ය. යමෙක් (එසේ) සක්මන් කරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ආරාමය තුළ වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළා-ඇවැත් වේ" යි භික්ෂූන් ඇමතූ සේක.

55. එකල්හි එක්තරා මහණකුට පාදයෙහි මස්දළු ලියලන ආබාධයෙක් වේ. භික්ෂූහු ඒ මහණහු වට කොට (ඔසොවා) ගෙණ මල ද මුත්‍ර ද පහ කරවත්. සෙනාසනචාරිකාවෙහි වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහු ඔසොවා ගෙණ මල ද මුත්‍ර ද පහ කරවන්නා වූ ඒ භික්ෂූන් දුටු සේක. දැක ඒ භික්ෂූන් වෙතට වැඩි සේක. වැඩ "මහණෙනි, මේ මහණහුගේ ආබාධය කිනම් දැ" යි ඒ භික්ෂූන් අතින් අසා වදාළ සේක. "සවාමීනි, මේ මහණහුට පාදයෙහි මස්දළු හට ගැණිම් ආබාධයෙක් වේ. අපි මොහු ඔසොවා ගෙණ මල ද මුත්‍ර ද පහ කරවමු" යි.

56 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, යම් මහණකුගේ පාදයෝ දුක් ඇත්තාහු හෝ වෙත් ද, පතුල් පැළෙනේ හෝ වේ ද, පාදයෙහි මස්දළු හට ගැණිම් ආබාධයෙක් හෝ වේ ද, එකල්හි වහන් දරන්නට අනුදනිමි" යි භික්ෂූන් ඇමතූ සේක.

57. එකල්හි භික්ෂූහු නො සේදූ පාවලින් යුක්ත ව ඇඳට ද පුටුවට ද නගිත්. සිවුර ද සෙනසුන ද කිලිටි වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, 'දැන් ඇඳට හෝ පුටුවට නගින්නෙමි' යි වහන් දරන්නට අනුදනිමි" යි.

58. එකල්හි භික්ෂූහු රාත්‍රියෙහි පොහෝගෙට ද රැස් ව හිඳිනා තැනට ද යන්නෝ අන්ධකාරයෙහි උල් ද කටු ද පාගති. පාදයෝ වෙදනා සහිත වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ආරාමය තුළ වහන්, ගිනි හුළක්, පහනක්, සැරයටියක් දරන්නට අනුදනිමි" යි.

60. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය කට්ඨපාදුකායො අභිරුහිත්වා අජ්ඣොකාසෙ චඞ්කමන්ති උච්චාසද්දා මහාසද්දා ඛටඛටසද්දා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තා- සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා, කීටකම්පි අක්කමිත්වා මාරෙන්ති, භික්ඛූපි සමාධිම්හා චාවෙන්ති.

61. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය කට්ඨපාදුකායො අභිරුහිත්වා අජ්ඣොකාසෙ චඞ්කමිස්සන්ති උච්චාසද්දා මහාසද්දා ඛටඛටසද්දා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තා - සෙය්‍යථීදං: රාජකථං චොරකථං -පෙ- ඉති භවාභවකථං. ඉති වා, කීටකම්පි අක්කමිත්වා මාරෙස්සන්ති. භික්ඛූපි සමාධිම්හා චාවෙස්සන්ති" ති.

62. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය කට්ඨපාදුකායො අභිරුහිත්වා අජ්ඣොකාසෙ චඞ්කමන්ති උච්චාසද්දා මහාසද්දා ඛටඛටසද්දා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තා - සෙය්‍යථීදං: රාජකථං චොරකථං -පෙ- ඉති භවාභවකථං ඉති වා? කීටකම්පි අක්කමිත්වා මාරෙන්ති, භික්ඛූපි සමාධිම්හා චාවෙන්තී?" ති. "සච්චං භගවා".

63. විගරහි බුද්ධො භගවා -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, කට්ඨපාදුකායො ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

64. අථ ඛො භගවා **රාජගහෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **බාරාණසී** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී තදවසරි. තත්‍රසුදං භගවා බාරාණසියං විහරති **ඉසිපතනෙ මිගදායෙ**.

65. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා කට්ඨපාදුකා පටික්ඛිත්තා" ති තාලතරුණෙ ඡෙදාපෙත්වා තාලපත්තපාදුකායො ධාරෙන්ති. තානි තාලතරුණානි ඡින්නානි මිලායන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා තාලතරුණෙ ඡෙදාපෙත්වා තාලපත්තපාදුකායො ධාරෙස්සන්ති? තානි තාලතරුණානි ඡින්නානි මිලායන්ති. එකින්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙන්තී" ති.

66. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ තාලතරුණෙ ඡෙදාපෙත්වා තාලපත්තපාදුකායො ධාරෙන්ති. තානි තාලතරුණානි ඡින්නානි මිලායන්තී"? ති. "සච්චං භගවා."

60. එකල්හි ඡබ්බග්ගියභික්ෂූහු රෑ අලුයම් කාලයෙහි නැගිට දූවවහන් පය ලා ගෙණ උස්හඬ ඇති ව මහහඬ ඇති ව බට බට යන හඬ නගන්නෝ නන් වැදෑරුම් තිරිසන් කතා කරමින් එළිමහනෙහි සක්මන් කෙරෙත්. – එනම්: රාජකථා චෞරකථා මහාමාත්‍යකථා සේනාකථා භයකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා සයනකථා මාලාකථා ගන්ධකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා ශූරකථා වීථිකථා කුම්භස්ථානකථා (පැන්තොට හා පැන් ගෙණෙන දැසීන් පිළිබඳ කථා) පූර්වප්‍රේතකථා නානාත්වකථා ලෝකාඛ්‍යාන-කථා සමුද්‍රකථා වැඩීම හා නො වැඩීම පිළිබඳ කථා යන මොහු ය. පණුවන් ද පාගා මරත්. භික්ෂූන් ද සමාධියෙන් තොර කෙරෙත්.

61. අල්පේච්ඡ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු “ඡබ්බග්ගියභික්ෂූහු කෙසේ නම් රෑ අලුයම් කාලයෙහි නැගිට දූව වහන් පය ලා ගෙණ උස්-හඬ ඇති ව මහහඬ ඇති ව බට බට යන හඬ නගන්නෝ නන් වැදෑරුම් තිරිසන් කතා – එනම්: රාජකථා චෞරකථා –පෙ– වැඩීම හා නො වැඩීම පිළිබඳ කතා යන තිරිසන් කතා කරමින් එළිමහනෙහි සක්මන් කරත් ද, පණුවන් ද පාගා මරත් ද, භික්ෂූන් ද සමාධියෙන් තොර කරත් දැ”යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්.

62. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. “මහණෙනි, ඡබ්බග්ගියභික්ෂූහු රෑ අලුයම නැගිට දූවවහන් පය ලා ගෙණ උස්හඬ ඇති ව මහත්හඬ ඇති ව බට බට යන හඬ නගන්නෝ නන් වැදෑරුම් තිරිසන් කතා – රාජකථා චෞරකථා –පෙ– වැඩීම හා නොවැඩීම පිළිබඳ කතා යන මේ තිරිසන් කතා කියමින් එළිමහනෙහි සක්මන් කරත් යනු සැබෑ ද? පණුවන් ද පාගා මරත්. භික්ෂූන් ද සමාධියෙන් තොර කෙරෙත් දැ?”යි. “භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය”.

63. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගර්හා කළසේක –පෙ– ගරහා දැහැමි කතා කොට “මහණෙනි, දූවවහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ” යි භික්ෂූන් ඇමතූ සේක.

64. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් **රජගහ** නුවර වැඩ වාසය කොට **බරණැස** බලා චාරිකා කළ සේක. පිළිවෙළින් චාරිකා කරණ සේක් බරණැස් නුවරට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි බරණැස **මිගදාය** නම් වූ **ඉසිපතනයෙහි** වසන සේක.

65. එකල්හි ඡබ්බග්ගියභික්ෂූහු “භාග්‍යවතුන් වහන්සේ විසින් දූව වහන් තහනම් කරණ ලද” යි තරුණ තල්ගස් සිඳුවා තල්පතින් කළ පාදුකා = වහන් දරත්. ගොබ සිඳින ලද ඒ තරුණ තල්ගස් මැලවේ. මිනිස්සු “ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කෙසේ නම් තරුණ තල්ගස් සිඳුවා තල්පතින් කළ වහන් දරත් ද? කපා දැමූ ඒ තරුණ තල්ගස් මැලවේ. ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ ඒකින්ද්‍රියජීව පෙළත්” යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්.

66. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දෙස් කියන ඒ මිනිසුන්ගේ කතාව ඇසූහ. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. “මහණෙනි, ඡබ්බග්ගියභික්ෂූහු තරුණ තල්ගස් කපවා තල්පතින් කළ වහන් දරත් ල. කපා දැමූ ඒ තරුණ තල්ගස් මැලවේ ල. ඒ සැබෑ දැ?” යි. “භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය.”

67. විගරහි බුද්ධො භගවා "කථං හි නාම තෙ භික්ඛවෙ, මොඝපුරිසා තාලතරුණෙ ඡේදාපෙත්වා තාලපත්තපාදුකායො ධාරෙස්සන්ති. ? තානි තාලතරුණානි ඡින්නානි මිලායන්ති. ජීවසඤ්ඤිනො හි භික්ඛවෙ, මනුස්සා රුක්ඛස්මිං. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: 'න භික්ඛවෙ, තාලපත්තපාදුකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

68. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා තාලපත්තපාදුකා පටික්ඛිත්තා" ති වෙළුතරුණෙ ඡේදාපෙත්වා වෙළුපත්තපාදුකායො ධාරෙන්ති. තානි වෙළුතරුණානි ඡින්නානි මිලායන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා වෙළුතරුණෙ ඡේදාපෙත්වා වෙළුපත්තපාදුකායො ධාරෙස්සන්ති ? තානි වෙළුතරුණානි ඡින්නානි මිලායන්ති. එකින්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙන්තී" ති.

69. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "න භික්ඛවෙ, වෙළුපත්තපාදුකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

70. අථ ඛො භගවා **බාරාණසියං** යථාභිරන්තං විහරිත්වා යෙන **භද්දියං** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන භද්දියං තදවසරි. තත්‍රසුදං භගවා **භද්දියෙ** විහරති **ජාතියාවනෙ**.

71. තෙන ඛො පන සමයෙන **භද්දියා** භික්ඛූ අනෙකවිහිතං පාදුකමණ්ඩනානුයොගමනුයුත්තා විහරන්ති. තිණපාදුකං කරොන්තිපි. කාරාපෙන්තිපි. මුඤ්ජපාදුකං කරොන්තිපි. කාරාපෙන්තිපි. බබ්බජපාදුකං කරොන්තිපි. කාරාපෙන්තිපි. හින්තාලපාදුකං කරොන්තිපි. කාරාපෙන්තිපි. කමලපාදුකං කරොන්තිපි. කාරාපෙන්තිපි. කම්බලපාදුකං කරොන්තිපි. කාරාපෙන්තිපි. රිඤ්චන්ති උද්දෙසං පරිපුච්ඡං අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤං.

72. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම භද්දියා භික්ඛූ අනෙකවිහිතං පාදුකමණ්ඩනානුයොගමනුයුත්තා විහරිස්සන්ති ? තිණපාදුකං කරිස්සන්තිපි ? කාරාපෙස්සන්තිපි ? මුඤ්ජපාදුකං කරිස්සන්තිපි ? කාරාපෙස්සන්තිපි ? බබ්බජපාදුකං කරිස්සන්තිපි ? කාරාපෙස්සන්තිපි ? හින්තාලපාදුකං කරිස්සන්තිපි ? කාරාපෙස්සන්තිපි ? කමලපාදුකං කරිස්සන්තිපි ? කාරාපෙස්සන්තිපි ? කම්බලපාදුකං කරිස්සන්තිපි ? කාරාපෙස්සන්තිපි ? රිඤ්චිස්සන්ති උද්දෙසං පරිපුච්ඡං අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤ"න්ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

73. "සච්චං කිර භික්ඛවෙ, භද්දියා භික්ඛූ අනෙකවිහිතං පාදුකමණ්ඩනානුයොගමනුයුත්තා විහරන්ති ? තිණපාදුකං කරොන්තිපි ? කාරාපෙන්තිපි ? මුඤ්ජපාදුකං කරොන්තිපි ? කාරාපෙන්තිපි ? බබ්බජපාදුකං කරොන්තිපි ? කාරාපෙන්තිපි ? හින්තාලපාදුකං කරොන්තිපි ? කාරාපෙන්තිපි ? කමලපාදුකං කරොන්තිපි ? කාරාපෙන්තිපි ? කම්බලපාදුකං කරොන්තිපි ? කාරාපෙන්තිපි ? රිඤ්චන්ති උද්දෙසං පරිපුච්ඡං අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤං ?" න්ති. "සච්චං භගවා."

Free Distribution www.aathaapi.org

67. භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ගැරහූ සේක. "මහණෙනි, ඒ හිස් පුරුෂයෝ කෙසේ නම් තරුණ තල්ගස් කපවා තල්පතින් කළ වහන් දරත් ද ? ගොබ කපා දැමූ ඒ තරුණ තල්ගස් මැලවේ. මහණෙනි, මිනිස්සු ගස්වල පණ ඇත්තාහු ය යන කල්පනා ඇත්තෝ වෙත්. "මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ. -පෙ-" ගරහා දැහැමි කතා කොට "මහණෙනි, තල්පතින් කළ වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි භික්ෂූන් ඇමතූ සේක.

68. එකල්හි සවගමහණෝ "භාග්‍යවතුන් වහන්සේ විසින් තල්පතින් කළ වහන් තහනම් කරණ ලද" යි තරුණ උණගස් කපවා උණපතින් කළ වහන් දරත්. කපා දැමූ ඒ ලපටි උණගස් මැලවේ. මිනිස්සු "ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කෙසේ නම් ලපටි උණගස් කපවා උණපතින් කළ වහන් දරත් ද ? කපා දැමූ ඒ ලපටි උණගස් මැලවේ. ශාක්‍ය පුත්‍රීය වූ ශ්‍රමණයෝ එකින්ද්‍රියජීව පෙළත්" යි අවමන් කෙරෙත්. නින්‍දා කෙරෙත්. දොස් කියත්.

69. භික්ෂූහු අවමන් කරණ නින්‍දා කරණ දොස් කියන ඒ මිනිසුන්ගේ කතාව ඇසූහ. එකල්හි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. -පෙ- "මහණෙනි, උණපතින් කළ වහන් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

70. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් බරණැස් නුවර වාසය කොට **භද්දියනගරය** බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකාවෙහි වඩිනා සේක් භද්දියනගරයට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ එහි භද්දිය නගර සමීපයෙහි වූ **ජාතියවන** වෙහෙරෙහි වසන සේක.

71. එකල්හි භද්දියනගර වැසි භික්ෂූහු නොයෙක් ලෙසින් වහන් සැරසීමෙහි එක්වත් යෙදී වසත්. තණවහන් ද කෙරෙත්. කරවත්. මුදුතණවහන් ද කෙරෙත්. කරවත්. බබුස්තණවහන් ද කෙරෙත්. කරවත්. කිතුල් (ඉඳි)කොළවහන් ද කෙරෙත්. කරවත්. කමලතණ (සැවැන්න) වහන් ද කෙරෙත්. කරවත්. පලස් (උණුලොම්) වහන් ද කෙරෙත්. කරවත්. උදෙසීම් ද පිළිවිසීම ද අධිශීලය ද අධිචිත්තය ද අධිප්‍රඥාව ද සිස් කෙරෙත්.

72. ආශා රහිත වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු "භද්දිය නගර වැසි භික්ෂූහු කෙසේ නම් නොයෙක් ලෙසින් වහන් සැරසීමෙහි එක්වත් යෙදී වසත් ද ? "තණවහන් කරත් ද ? කරවත් ද ? මුදුතණ-වහන් කරත් ද ? කරවත් ද ? බබුස්තණ වහන් කරත් ද ? කරවත් ද ? කිතුල්කොළවහන් කරත් ද ? කරවත් ද ? කමලතණවහන් කරත් ද ? කරවත් ද ? පලස්වහන් කරත් ද ? කරවත් ද ? උදෙසීම පිළිවිසීම අධිශීලය අධිචිත්තය අධිප්‍රඥාව සිස් කරත් ද ?" යි අවමන් කෙරෙත්. නින්‍දා කෙරෙත්. දොස් කියත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

73. "මහණෙනි, භද්දිය නගර වැසි භික්ෂූහු නොයෙක් ලෙසින් වහන් සැරසීමෙහි යෙදී වසත් ල. ඒ සැබෑ ද? තණවහන් කෙරෙත් ද ? කරවත් ද ? මුදුතණවහන් කෙරෙත් ද ? කරවත් ද ? බබුස්තණවහන් කෙරෙත් ද ? කරවත් ද ? කිතුල්කොළවහන් කෙරෙත් ද ? කරවත් ද ? කමලතණවහන් කෙරෙත් ද ? කරවත් ද ? පලස්වහන් කෙරෙත් ද ? කරවත් ද ? උදෙසීම පිළිවිසීම අධිශීලය අධිචිත්තය අධිප්‍රඥාව සිස් කෙරෙත් ද ?". "භාග්‍යවතුන් වහන්ස, සැබෑය."

74. විගරහි බුද්ධො භගවා: “කථං හි නාම තෙ භික්ඛවෙ, මොඝපුරිසා අනෙකවිහිතං පාදුකමණ්ඩනානුයොගමනුයුත්තා විහරිස්සන්ති – තිණපාදුකං කරිස්සන්තිපි? කාරාපෙස්සන්තිපි? මුඤ්ජපාදුකං කරිස්සන්තිපි? කාරාපෙස්සන්තිපි. ? බබ්බජපාදුකං[1] කරිස්සන්තිපි? කාරාපෙස්සන්තිපි? හින්තාලපාදුකං කරිස්සන්තිපි? කාරාපෙස්සන්තිපි? කමලපාදුකං කරිස්සන්තිපි? කාරාපෙස්සන්තිපි? කම්බලපාදුකං කරිස්සන්තිපි? කාරාපෙස්සන්තිපි? රිඤ්චිස්සන්ති උද්දෙසං පරිපුච්ඡං අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤං.

75. “නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: න භික්ඛවෙ, තිණපාදුකා ධාරෙතබ්බා. න මුඤ්ජපාදුකා ධාරෙතබ්බා. න බබ්බජපාදුකා ධාරෙතබ්බා. න හින්තාලපාදුකා ධාරෙතබ්බා. න කමලපාදුකා ධාරෙතබ්බා. න කම්බලපාදුකා ධාරෙතබ්බා. න සොවණ්ණමයා පාදුකා ධාරෙතබ්බා. න රූපිමයා[2] පාදුකා ධාරෙතබ්බා. න මණිමයා පාදුකා ධාරෙතබ්බා. න වෙළුරියමයා පාදුකා ධාරෙතබ්බා. න ඵලිකමයා පාදුකා ධාරෙතබ්බා. න කංසමයා පාදුකා ධාරෙතබ්බා. න කාචමයා පාදුකා ධාරෙතබ්බා. න තිපුමයා පාදුකා ධාරෙතබ්බා. න සීසමයා පාදුකා ධාරෙතබ්බා. න තම්බලොහමයා පාදුකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, කාචි සඞ්කමනීයා පාදුකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, තිස්සො පාදුකායො[3] ධුවට්ඨානීයා අසඞ්කමනීයායො: වච්චපාදුකං පස්සාවපාදුකං ආචමනපාදුක”න්ති.

76. අථ ඛො භගවා භද්දියෙ යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

77. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අචිරවතියා නදියා ගාවීනං තරන්තීනං විසාණෙසුපි ගණ්හන්ති. කණ්ණෙසුපි ගණ්හන්ති. ගීවායපි ගණ්හන්ති. ඡෙප්පායපි[4] ගණ්හන්ති. පිට්ඨිම්පි අභිරූහන්ති. රත්තචිත්තාපි අඞ්ගජාතං ඡුපන්ති. වච්ඡතරිම්පි ඔගාහෙත්වා මාරෙන්ති.

78. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: “කථං හි නාම සමණා සක්‍යපුත්තියා ගාවීනං තරන්තීනං විසාණෙසුපි ගහෙස්සන්ති? කණ්ණෙසුපි ගහෙස්සන්ති? ගීවායපි ගහෙස්සන්ති? ඡෙප්පායපි ගහෙස්සන්ති? පිට්ඨිම්පි අභිරූහිස්සන්ති? රත්තචිත්තාපි අඞ්ගජාතං ඡුපිස්සන්ති? වච්ඡතරිම්පි ඔගාහෙත්වා මාරෙස්සන්ති? සෙය්‍යථාපි ගිහී කාමභොගිනො?” ති.

79. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: “සච්චං කිර භික්ඛවෙ, -පෙ- සච්චං භගවා.”

1. “පබ්බජපාදුකා” ම ඡ සං. 2. “රූපියමයා” ම ඡ සං. 3 “පාදුකා” ම ඡ සං.
4 “ඡෙප්පාපි” ම ඡ සං “ඡෙප්පායම්පි” P T S අ වි. ජෙතාවි. ජ වි.

74. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "මේ සිස් පුරුෂයෝ කෙසේ නම් නොයෙක් ලෙසින් පාදුකා සැරසීමෙහි යෙදී වසත් ද ? තණ පාදුකා කෙරෙත් ද ? කරවත් ද? මුදුතණ පාදුකා කෙරෙත් ද ? කරවත් ද ? බබුස්තණ පාදුකා කෙරෙත් ද? කරවත් ද ? කිතුල්කොළපාදුකා කෙරෙත් ද? කරවත් ද ? කමලතණ පාදුකා කෙරෙත් ද ? කරවත් ද ? පලස්වහන් කෙරෙත් ද ? කරවත් ද ? උදෙසීම පිළිවිසීම අධිශීලය අධිචිත්තය අධිප්‍රඥාව සිස් කෙරෙත් දැ" යි ගැරහූ සේක.

75. "මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ යි -පෙ- ගරහා දැහැමි කතා කොට 'මහණෙනි, තණපාදුකා නො දැරිය යුතු ය. මුදුතණපාදුකා නො දැරිය යුතු ය. බබුස්තණපාදුකා නො දැරිය යුතු ය. කිතුල්කොළපාදුකා නො දැරිය යුතු ය. කමලතණපාදුකා නො දැරිය යුතු ය. පලස්පාදුකා නො දැරිය යුතු ය. රනින් කළ පාදුකා නො දැරිය යුතු ය. රිදියෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. මිණියෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. වෙරළුමිණියෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. පළිඟුයෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. කස්ලොහයෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. කදුමිණි(වීදුරු)යෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. ඊයමෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. කළුඊයමෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. තඹ ලොහයෙන් කළ පාදුකා නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළා ඇවැත් වේ" යි භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, ගෙණ යා හැකි (පය ලා ඇවිද්ද හැකි) කිසි (යම්) පාදුකා නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ස්ථිර ව (එහි ම) තිබෙන, තැන තැන ගෙණ යා නො හැකි වූ වැසිකිළිපාදුකාව කෙසකිළිපාදුකාව දියකිස සාහන පාදුකාව යන පාදුකා තුණක් අනුදනිමි" යි.

76. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **භද්දිය**නගරයෙහි කැමැති තාක් කල් වාසය කොට **සැවැත්**නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකාවෙහි වඩිනා සේක් සැවැත් නුවරට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ එහි සැවැත්නුවර **ජේතවන**යෙහි වූ **අනේපිඩු** සිටුහුගේ ආරාමයෙහි වසන සේක.

77. එකල්හි **සවග**මහණෝ **අචිරවතී**ගංගාවෙන් එතෙර වන්නා වූ දෙනුන්ගේ අං ද අල්වා ගණිත්. කන් ද අල්වා ගණිත්. බෙල්ල ද අල්වා ගණිත්. නගුට ද අල්වා ගණිත්. පිටට ද නගිත්. රාගයෙන් රත් වූ සිත් ඇත්තාහු රහසඟ ද ස්පර්ශ කෙරෙත්. නාඹු වැසිදෙන ද දියෙහි ගිල්වා මරත්.

78. මිනිස්සු "ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කාමභොගී ගිහින් සේ කෙසේ නම් (ගඟින්) එතෙර වන්නා වූ දෙනුන්ගේ අං අල්වා ගණිත් ද ? කන් අල්ලා ගණිත් ද ? බෙල්ල අල්වා ගණිත් ද ? නගුට අල්වා ගණිත් ද ? පිටට නගිත් ද ? රාගයෙන් රත් වූ සිත් ඇති ව රහසඟ ස්පර්ශ කරත් ද ? නාඹුවැසිදෙනුන් දියෙහි ගිල්වා මරත් දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්.

79. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දෙස් කියන ඒ මිනිසුන්ගේ කතාව ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "මහණෙනි, සැබෑ ද? -පෙ- භාග්‍යවතුන් වහන්ස සැබෑ ය,"

80. විගරහි බුද්ධො භගවා -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, ගාවීනං විසාණෙසු ගහෙතබ්බං. න කණ්ණෙසු ගහෙතබ්බං. න ගීවාය ගහෙතබ්බං. න ඡෙප්පාය ගහෙතබ්බං. න පිට්ඨිං අභිරූහිතබ්බා. යො අභිරූහෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, රත්තචිත්තෙන අඞ්ගජාතං ඡුපිතබ්බං. යො ඡුපෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්ස. න වච්ඡතරී මාරෙතබ්බා. යො මාරෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො" ති.

81. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ යානෙන යායන්ති ඉත්ථියුත්තෙනපි පුරිසන්තරෙන පුරිසයුත්තෙනපි ඉත්ථන්තරෙන. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගඞ්ගාමහියායා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "න භික්ඛවෙ, යානෙන යායිතබ්බං. යො යායෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

82. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තො භගවන්තං දස්සනාය අන්තරාමග්ගෙ ගිලානො හොති. අථ ඛො සො භික්ඛු මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

83. මනුස්සා තං භික්ඛුං පස්සිත්වා[1] එතදවොචුං: "කහං භන්තෙ, අය්‍යො ගමිස්සතී" ති. "සාවත්ථිං ඛො අහං ආවුසො, ගමිස්සාමි භගවන්තං දස්සනායා" ති. "එහි භන්තෙ, ගමිස්සාමා" ති. "නාහං ආවුසො, සක්කොමි. ගිලානොම්හී" ති. "එහි භන්තෙ, යානං අභිරූහා" ති. "අලං ආවුසො, පටික්ඛිත්තං භගවතා යාන" න්ති. කුක්කුච්චායන්තො යානං නාභිරූහි.

84. අථ ඛො සො භික්ඛු සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, ගිලානස්ස යාන"න්ති.

85. අථ ඛො භික්ඛූනං එතදහොසි: "ඉත්ථියුත්තං නු ඛො පුරිසයුත්තං නු ඛො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පුරිසයුත්තං හත්ථවට්ටක" න්ති.

86. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො යානුග්ඝාතෙන බාළ්හතරං අඵාසු අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, සිවිකං පාටඞ්කි" න්ති.

87. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාසයන මහාසයනානි ධාරෙන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලඞ්කං ගොණකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං[2] එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණිං[3] කාදලිමිගපවරපච්චත්ථරණං[4] සඋත්තරච්ඡදං උභතො ලොහිතකූපධානං[5].

1. "දිස්වා" ම ඡ සං.
2. "උද්ධලොමිං" ම ඡ සං. 3. අජිනපවෙණිං." ම ඡ සං.
4. "කදලිමිගපවරපච්චත්ථරණං" ම ඡ සං. 5. "ලොහිතකූපධානානි" ම ඡ සං.

80. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක. -පෙ- ගරහා දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, දෙනුන්ගේ අං නො (අල්වා) ගත යුතු ය. කන් නො (අල්වා) ගත යුතු ය. බෙල්ල නො (අල්වා) ගත යුතු ය. නගුට නො (අල්වා) ගත යුතු ය. පිටට නො නැගිය යුතු ය. යමෙක් නගින්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, රාගයෙන් රත් වූ සිතින් අඞ්ගජාතය නො පහල යුතු ය. යමෙක් පහස්නේ නම් ථුලසිඇවැත් වේ. වැසිනැහැඹිය නො මැරිය යුතු ය. යමෙක් මරන්නේ නම්, ඇවැත් පරිදි කරවිය යුතු" යි.

81. එකල්හි **සවග**මහණෝ දෙනුන් යෙදූ පිරිමිරියැදුරා ඇති පිරිමිසතුන් යෙදූ ගැණුරියැදුරා ඇති යානයෙන් යෙත්. මිනිස්සු "ගඞ්ගා උත්සව ක්‍රීඩා පිණිස (යන්නේ) යම් සේ ද, එ මෙනැ" යි අවමන් කෙරෙත්. නින්දු කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යානයෙන් නො යා යුතු ය. යමෙක් යන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

82. එකල්හි එක්තරා මහණෙක් තෙමේ භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස **කොසොල්**දනව්වෙහි වූ **සැවැත්**නුවරට යන්නේ අතරමග දී ගිලන් වූයේ වේ. ඉක්බිති ඒ මහණ තෙමේ මාර්‍ගයෙන් ඉවත් ව එක්තරා ගසක් මුල හුන්නේ ය.

83. මිනිස්සු ඒ මහණහු දැක "සවාමීන් වහන්සේ කොහි වඩිනා සේක් ද" යි ඇසූහ. "ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස සැවැත්නුවරට යන්නෙමි" යි. "සවාමීනි, (එසේ නම්) වඩින්න, යන්නෙමු" යි. "ඇවැත්නි, මම යා නො හැක්කෙමි. ගිලන්මි" යි. "එන්න, සවාමීනි, යානයට නගින්න" යි. "ඇවැත්නි, වුවමනා නැත. භාග්‍යවතුන් වහන්සේ විසින් යානය තහනම් කරණ ලදී" යි. සැක කරන්නේ යානයට නො නැංගේ ය.

84. ඉක්බිති ඒ මහණ තෙමේ සැවැත්නුවරට ගොස් භික්ෂූන්ට මේ කරුණ සැලකළේ ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, ගිලනහුට යානය අනුදනිමි" යි.

85. එකල්හි භික්ෂූන්ට "ගැණු සතුන් යෙදූ යානය ද ? (නොහොත්) පිරිමි සතුන් යෙදූ යානය ද" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, (ගොන් ආදී) පිරිමිසතුන් යෙදූ අතින් අදිනා යානය අනුදනිමි" යි.

86. එකල්හි එක්තරා මහණකුට යානය ගැස්සීමෙන් ඉතා දැඩි අපහසුවෙක් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සිවිකාව (දෝලාව) හිදෙළුව (පල්ලැක්කිය) අනුදනිමි" යි.

87. එකල්හි සවගමහණෝ උසසුන් මහසුන් දරත්: දික් හහලා පුටුව, පලඟ, මහාකොඳුපලස, විසිතුරු එළලොම් ඇතිරිය, එළලොම් සුදු ඇතිරිය, ඝනපුප්රතුඇතිරිය, පුලුන් බහා කළ තුලිකාව (ගුදිරිය), සිංහව්‍යාඝ්‍රාදී රූපයන්ගෙන් විසිතුරු එළලොම් ඇතිරිය, එක්පසෙක නැගි ලොම් ඇති එළලොම් ඇතිරිය, දෙපස නැගි ලොම් ඇති එළලොම් ඇතිරිය, රන් කම් කළ නූලෙන් වියූ ඇතිරිය, රණින් මුසු තිහිරිහුයින් කළ ඇතිරිය, සොළොස් නළඟනන්ට නැටිය හැකි පමණින් එළලොමින් කළ මහ ඇතිරිය, ඇතු පිට ලන ඇතිරිය, අසු පිට ලන ඇතිරිය, රියෙහි අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් ඇද පමණට කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ උතුම් ඇතිරිය, රතු වියන් සහිත වූ හිස් දෙර පාමුල රතු කන්වැසින් නැබූ අසුන යන මොහු ය.

88. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "න භික්ඛවෙ, උච්චාසයනමහාසයනානි ධාරෙතබ්බානි. සෙය්‍යථීදං: ආසන්දි පල්ලඞ්කො ගොණකො චිත්තකො පටිකා පටලිකා තූලිකා විකතිකා උද්දලොමී එකන්තලොමී කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණී කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතො ලොහිතකූපධානං. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

89. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ "භගවතා උච්චාසයනමහාසයනානි පටික්ඛිත්තානී"ති මහාචම්මානි ධාරෙන්ති: සීහචම්මං බ්‍යග්ඝචම්මං දීපිචම්මං. තානි මඤ්චප්පමාණෙනපි ඡින්නානි හොන්ති. පීඨප්පමාණෙනපි ඡින්නානි හොන්ති. අන්තොපි මඤ්චෙ පඤ්ඤත්තානි හොන්ති. බහිපි මඤ්චෙ පඤ්ඤත්තානි හොන්ති. අන්තොපි පීඨෙ පඤ්ඤත්තානි හොන්ති. බහිපි පීඨෙ පඤ්ඤත්තානි හොන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "න භික්ඛවෙ, මහාචම්මානි ධාරෙතබ්බානි: සීහචම්මං බ්‍යග්ඝචම්මං දීපිචම්මං. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

90. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා මහාචම්මානි පටික්ඛිත්තානී"ති ගොචම්මානි ධාරෙන්ති. තානි මඤ්චප්පමාණෙනපි ඡින්නානි හොන්ති. පීඨප්පමාණෙනපි ඡින්නානි හොන්ති. අන්තොපි මඤ්චෙ පඤ්ඤත්තානි හොන්ති. බහිපි මඤ්චෙ පඤ්ඤත්තානි හොන්ති. අන්තොපි පීඨෙ පඤ්ඤත්තානි හොන්ති. බහිපි පීඨෙ පඤ්ඤත්තානි හොන්ති.

91. අඤ්ඤතරොපි පාපභික්ඛු අඤ්ඤතරස්ස පාපූපාසකස්ස කුලූපගො[1] හොති. අථ ඛො සො පාපභික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන තස්ස පාපූපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සො පාපූපාසකො යෙන සො පාපභික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං පාපභික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

92. තෙන ඛො පන සමයෙන තස්ස පාපූපාසකස්ස වච්ඡකො හොති තරුණකො අභිරූපො දස්සනීයො පාසාදිකො චිත්තො සෙය්‍යථාපි දීපිච්ඡාපො. අථ ඛො සො පාපභික්ඛු තං වච්ඡකං සක්කච්චං උපනිජ්ඣායති. අථ ඛො සො පාපූපාසකො තං පාපභික්ඛුං එතදවොච: "කිස්ස භන්තෙ, අය්‍යො ඉමං වච්ඡකං සක්කච්චං උපනිජ්ඣායතී"ති. "අත්ථො මෙ ආවුසො, ඉමස්ස වච්ඡකස්ස චම්මෙනා"ති. අථ ඛො සො පාපූපාසකො තං වච්ඡකං වධිත්වා චම්මං විධුනිත්වා තස්ස පාපභික්ඛුනො පාදාසි. අථ ඛො සො පාපභික්ඛු තං චම්මං සඞ්ඝාටියා පටිච්ඡාදෙත්වා අගමාසි.

1. "කුලූපකො" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

88. විහාරචාරිකාවෙහි ඇවිදිත භික්ෂූන් දැක "කාමභොගී ගිහින් සේ ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උසසුන් මහසුන් නො දැරිය යුතු ය. එනම් දික්සහළාපුටුව, පලඟ, මහකොඳුපලස, විසිතුරු එළලොම් ඇතිරිය, එළලොම් සුදු ඇතිරිය, ගනපුප් රතු ඇතිරිය, පුළුන් බහා කළ බිසිය, සිංහව්‍යාඝ්‍රාදිරූපයන්ගෙන් විසිතුරු එළලොම් ඇතිරිය, එක්පසෙක නැගි ලොම් ඇති එළලොම් ඇතිරිය, දෙපස නැගි ලොම් ඇති එළලොම් ඇතිරිය, රන්කම් කළ නූලෙන් වියූ ඇතිරිය, රණින් මුසු තිහිරිහුයින් කළ ඇතිරිය, නළඟනන් සොළොසකට නැටිය හැකි පමණින් එළලොමින් කළ ඇතිරිය, ඇතු පිට ලන ඇතිරිය, අසු පිට ලන ඇතිරිය, රියෙහි අතුරණ ඇතිරිය, අඳුන්දිවිසමින් ඇඳ පමණින් කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ උතුම් ඇතිරිය, රතු වියන් සහිත වූ (හිස පය) දෙපස රතුකන්වැයින් තැබූ අසුන යන මොහු ය. යමෙක් (මේ අසුන්) දරන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි.

89. එකල්හි සවගමහණෝ "භාග්‍යවතුන් වහන්සේ විසින් උසසුන් මහසුන් තහනම් කරණ ලදැ" යි සිංහසම් වගසම් දිවිසම් යන මහසම් දරත්. ඒ සම් ඇඳ පමණට ද සිඳින ලද්දේ වේ. පුටු පමණින් ද සිඳින ලද්දේ වේ. ඇඳේ ද පණවන ලද්දේ වේ. ඇඳින් පිටත ද පණවන ලද්දේ වේ. පුටුවේ ද පණවන ලද්දේ වේ. පුටුවෙන් පිටත ද පණවන ලද්දේ වේ. විහාරචාරිකාවෙහි ඇවිදින භික්ෂූ දැක "කාමභොගී ගිහින් සේ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සිංහසම් වගසම් දිවිසම් යන මහසම් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි.

90. එකල්හි සවගමහණෝ "භාග්‍යවතුන් වහන්සේ විසින් මහසම් තහනම් කරණ ලදැ" යි ගෙරිසම් දරත්. ඒ ගෙරිසම් ඇඳ පමණට ද සිඳින ලද්දේ වේ. පුටු පමණට ද සිඳින ලද්දේ වේ. ඇඳේ ද පණවන ලද්දේ වේ. ඇඳෙන් පිටත ද පණවන ලද්දේ වේ. පුටුවේ ද පණවන ලද්දේ වේ. පුටුවෙන් පිටත ද පණවන ලද්දේ වේ.

91 එක්තරා පව්ටු මහණෙක් එක්තරා පාපි උපාසකයකුගේ කුලූපග වේ. එකල්හි ඒ පාපි භික්ෂු තෙමේ පෙරවරුයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙණ ඒ පාපි උපාසකයාගේ ගෙට ගියේ ය. ගොස් පැණවූ අසුනෙහි හුන්නේ ය. ඉක්බිති ඒ පව්ටු උවසු තෙමේ ඒ පව්ටු මහණ වෙතට එළඹියේ ය. එළඹ ඒ පව්ටු මහණ සකසා වැඳ පසෙක හුන්නේ ය.

92. එකල්හි ඒ පාපී උපාසකයාගේ තරුණ වූ මනා රූ ඇති දැකුම්කලු සතුට එළවන දිවිපැටවකු සේ විසිතුරු පැහැ ඇති වස්සෙක් වේ. ඒ පාපී භික්ෂු තෙමේ ඒ වස්සා ගැණ ඉතා ඕනෑකමින් සලකා බලයි. එවිට ඒ පාපී උපාසක තෙමේ ඒ පාපී භික්ෂුහුහට "කවරහෙයින් ස්වාමීනි, ස්වාමීන් වහන්සේ මේ වස්සා ගැණ ඉතා ඕනෑකමින් සිතා බලත් දැ" යි මෙය ඇසී ය. "ඇවැත්නි, මේ වස්සාගේ සමින් මට වැඩෙක් තිබේ." ඉක්බිති ඒ පාපී උපාසක තෙමේ ඒ වස්සා මරා හම උපුටා ඒ පාපී භික්ෂුහුහට දුන්නේ ය. ඉන් පසු ඒ පාපී භික්ෂු තෙමේ ඒ හම සඟල සිවුරෙන් වසා ගෙණ ගියේ ය.

93. අථ බො සා ගාවී වච්ඡගිද්ධිනී තං පාපභික්ඛුං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි. භික්ඛූ එවමාහංසු: "කිස්ස ත්‍යායං ආවුසො, ගාවී පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා" ති.[1] "අහම්පි බො ආවුසො, න ජානාමි කෙන ම්‍යායං ගාවී පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා" ති.

94. තෙන බො පන සමයෙන තස්ස පාපභික්ඛුනො සඞ්ඝාටි ලොහිතෙන මක්ඛිතා හොති. භික්ඛූ එවමාහංසු: "අයං පන තෙ ආවුසො, සඞ්ඝාටි කිං කතා?" ති. අථ බො සො පාපභික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. "කිං පන ත්වං ආවුසො, පාණාතිපාතෙ සමාදපෙසී" ති. "එවමාවුසො" ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු පාණාතිපාතෙ සමාදපෙස්සති. ? නනු භගවතා අනෙකපරියායෙන පාණාතිපාතො ගරහිතො ? පාණාතිපාතා වෙරමණී පසත්ථා" ති. අථ බො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ බො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා තං පාපභික්ඛුං පටිපුච්ඡි. "සච්චං කිර ත්වං භික්ඛු පාණාතිපාතෙ සමාදපෙසී" ති. "සච්චං භගවා".

95. විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස, පාණාතිපාතෙ සමාදපෙස්සසි ? නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන පාණාතිපාතො ගරහිතො ? පාණාතිපාතා වෙරමණී පසත්ථා ? නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය. -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, පාණාතිපාතෙ සමාදපෙතබ්බං. යො සමාදපෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො. න භික්ඛවෙ, ගොචම්මං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, කිඤ්චි චම්මං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

96. තෙන බො පන සමයෙන මනුස්සානං මඤ්චෙපි[2] පීඨෙපි චම්මොනද්ධානි හොන්ති චම්මවිනද්ධානි. භික්ඛූ කුක්කුච්චායන්තා නාභිනිසීදන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගිහිවිකටං[3] අභිනිසීදිතුං. නත්වෙව අභිනිපජ්ජිතු" න්ති.

97. තෙන බො පන සමයෙන විහාරා චම්මවද්ධෙහි ඔගුම්ඵියන්ති.[4] භික්ඛූ කුක්කුච්චායන්තා නාභිනිසීදන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, බන්ධනමත්තං අභිනිසීදිතු" න්ති.

98. තෙන බො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සඋපාහනා ගාමං පවිසන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සඋපාහනෙන ගාමො පවිසිතබ්බො. යො පවිසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති

99. තෙන බො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. න සක්කොති විනා උපාහනෙ න ගාමං පවිසිතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගිලානෙන භික්ඛුනා සඋපාහනෙන ගාමං පවිසිතු" න්ති.

1 "අනුබන්ධීති" ම ජ සං "අනුබන්ධා" සී මු 2. "මඤ්චම්පි" ම ජ සං.
3. "ගිහීවිකතං" ම ජ සං. 4. "ඔගුම්ඵීයන්ති" ම ජ සං

93. ඒ වේලෙහි වස්සා කෙරෙහි ගිජු වූ ඒ දෙන ඒ පවිටු මහණහු පසු පස ලුහුබැඳ ගියා ය. "ඇවැත්නි, කුමක් නිසා මේ දෙන තා පසු පස ලුහුබැඳ ඒ ද" යි භික්ෂූහු මෙසේ ඇසූහ. "ඇවැත්නි, මේ දෙන මා පසු පස කුමක් හෙයින් ලුහුබැඳ එන්නී ද" යි මමත් නො දනිමි.

94. එකල්හි ඒ පාපී භික්ෂූහුගේ සඟළසිවුර ලෙයින් වැකුනේ වේ. "ඇවැත්නි, තාගේ සඟළසිවුර කුමක් කෙළේ ද" යි භික්ෂූහු මෙසේ ඇසූහ. එවිට ඒ පාපී භික්ෂුතෙමේ භික්ෂූන්ට මේ කරුණ ප්‍රකාශ කළේ ය. "කිමෙක් ද ඇවැත්නි, තෝ සතුන් මැරීමෙහි සමාදන් කරවූයෙහි ද?". "ඇවැත්නි, එසේ ය." අල්පෙච්ඡ වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු "කෙසේ නම් මහණෙක් සතුන් මැරීමෙහි සමාදන් කරවා ද? භාග්‍ය වතුන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් සතුන් මැරීම ගරහන ලද්දේ නො වේ ද? සතුන් මැරීමෙන් වැළකීම පසස්නා ලද්දේ නො වේ ද" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා ඒ පවිටුමහණහුගෙන් විචාළ සේක. "මහණ, සැබෑ ද? තෝ සතුන් මැරීමෙහි සමාදන් කරවූයෙහි ද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය."

95. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක. "හිස් පුරුෂය, කෙසේ නම් තෝ සතුන් මැරීමෙහි සමාදන් කරවූයෙහි ද, හිස් පුරුෂය, මා විසින් සතුන් මැරීම නොයෙක් ලෙසින් ගරහන ලද්දේ නො වේ ද? සතුන් මැරීමෙන් වැළකීම පසස්නා ලද්දේ නො වේ ද? හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ. -පෙ- ගරහා දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, සතුන් මැරීමෙහි සමාදන් නො කරවිය යුතු ය. යමෙක් සමාදන් කරවන්නේ ද, ඇවැත් පරිදි කරවිය යුතු ය. මහණෙනි, ගෙරිසම් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, කිසි හමක් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි.

96. එකල්හි මිනිසුන්ගේ ඇඳ ද පුටු ද සම් වද්දන ලද්දේ වෙයි. භික්ෂූහු කුකුස් කරන්නෝ නො හිඳිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ගිහින් සතු ඇඳපුටුවල හිඳින්නටත් එහි නො නිදන්නටත් අනුදනිමි" යි.

97. එකල්හි විහාරයෝ සම්වැටියෙන් වෙළා බඳිනු ලැබෙත්. භික්ෂූහු කුකුස් කරන්නෝ නො හිඳිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, බැඳුම්පමණ නිසා හිඳින්නට අනුදනිමි" යි.

98. එකල්හි සවගමහණෝ වහන් සහිත ව ගමට පිවිසෙත්. මිනිස්සු "කාමභොගී ගිහින් වැනි ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, වහන් සහිත ව ගමට නො පිවිසිය යුතු ය. යමෙක් පිවිසෙන්නේ නම්, දුකුළා ඇවැත් වේ" යි.

99. එකල්හි එක්තරා මහණෙක් තෙමේ ගිලන් වෙයි. වහන් නැති ව ගමට පිවිසෙන්නට අපොහොසත් වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ගිලන්මහණහු විසින් වහනින් යුක්ත ව ගම් වැදීම අනුදනිමි" යි.

100. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකච්චායනො අවන්තීසු** විහරති **කුරරඝරෙ**[1] **පපාතෙ**[2] පබ්බතෙ. තෙන ඛො පන සමයෙන **සොණො** උපාසකො **කුටිකණ්ණො**[3] ආයස්මතො මහාකච්චායනස්ස උපට්ඨාකො හොති.

101. අථ ඛො සොණො උපාසකො කුටිකණ්ණො යෙනායස්මා මහා-කච්චායනො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණො උපාසකො කුටිකණ්ණො ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: "යථා යථාහං භන්තෙ, අය්‍යෙන මහාකච්චායනෙන ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං. එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං භන්තෙ, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. පබ්බාජෙතු මං භන්තෙ අය්‍යො මහාකච්චායනො" ති.[4] "දුක්කරං ඛො සොණ, යාවජීවං එකසෙය්‍යං එකභත්තං බ්‍රහ්මචරියං චරිතුං. ඉඞ්ඝ ත්වං සොණ, තත්ථෙව අගාරිකභූතො බුද්ධානං සාසනං අනුයුඤ්ජ කාලයුත්තං එකසෙය්‍යං එකභත්තං බ්‍රහ්මචරියන්" ති.

102. අථ ඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස යො අහොසි පබ්බජ්ජාභිසඞ්ඛාරො, සො පටිප්පස්සම්භි. දුතියම්පි ඛො සොණො උපාසකො කුටිකණ්ණො -පෙ- තතියම්පි ඛො සොණො උපාසකො කුටිකණ්ණො යෙනායස්මා මහාකච්චායනො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණො උපාසකො කුටිකණ්ණො ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: "යථා යථාහං භන්තෙ අය්‍යෙන මහාකච්චායනෙන ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං භන්තෙ, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. පබ්බාජෙතු මං භන්තෙ, අය්‍යො මහාකච්චායනො" ති. අථ ඛො ආයස්මා මහාකච්චායනො සොණං උපාසකං කුටිකණ්ණං පබ්බාජෙසි.

103. තෙන ඛො පන සමයෙන **අවන්තිදක්ඛිණාපථො** අප්පභික්ඛුකො හොති. අථ ඛො ආයස්මා මහාකච්චායනො තිණ්ණං වස්සානං අච්චයෙන කිච්ඡෙන කසිරෙන තතො තතො දසවග්ගං භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං සොණං උපසම්පාදෙසි.

104. අථ ඛො ආයස්මතො සොණස්ස වස්සං වුත්ථස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "සුතොයෙව ඛො මෙ සො භගවා 'එදිසො ච එදිසො චා' ති. න ච මයා සම්මුඛා දිට්ඨො. ගච්ඡෙය්‍යාහං තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං, සචෙ මං උපජ්ඣායො අනුජානෙය්‍යා" ති.

---

1. "කුරුරඝරෙ" ම ජ සං. 2. "පපතකෙ" ම ජ සං.
3. "කොටිකණ්ණො" අට්ඨකථා.
4. "එවං වුත්තෙ ආයස්මා මහාකච්චායනො සොණං උපාසකං කුටිකණ්ණං එතදවොච" සී.

100. එකල්හි ආයුෂ්මත් **මහාකාත්‍යායන** ස්ථවිර තෙමේ **අවන්ති** ජනපදයෙහි **කුරරඝර** නගරයෙහි **ප්‍රපාතපර්වත**යෙහි වාසය කරයි. එකල්හි **කුටිකණ්ණ** නම් වූ **සෝණ** උපාසක තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන්ගේ උපස්ථායක වේ.

101. දිනක් කුටිකණ්ණ සෝණ උපාසක තෙමේ ආයුෂ්මත් මහා-කාත්‍යායන තෙරුන් වෙත ගියේ ය. ගොස් ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් කුටිකණ්ණ සෝණ උපාසක තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන්ට මෙය සැළකළේ ය: "ස්වාමීනි, ආර්ය වූ මහාකාත්‍යායනයන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය යම් යම් පරිද්දෙකින් මම දනිම් ද, ඒකාන්තයෙන් පරිපූර්ණ වූ හැම ලෙසින් පිරිසිදු වූ සඞ්ඛලිඛිත* වූ මේ බ්‍රහ්මචර්යයෙහි හැසිරීම ගිහිගෙයි වසන්නහුට පහසු නො වේ. ස්වාමීනි, මම කෙස් රැවුල් බහා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නට කැමැත්තෙමි. ස්වාමී වූ මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මා පැවිදි කරණ සේක්වා"යි. "සෝණ, දිවිහිම් කොට එක් සයනයක් ඇති එක් වේලේ බත් ඇති බඹසර විසීම පහසු නො වේ. සෝණ, එබැවින් තෝ ගිහි වූයේ බුදුන්ගේ අනුශාසනය වූ කාලානු-රූප වූ එක් සයනයක් ඇති එක් වේලේ බත් ඇති ඒ බ්‍රහ්මචර්යයෙහිම (අටසිල්හි) යෙදෙව" යි.

102. ඉක්බිති කුටිකණ්ණසෝණ උපාසකයාහට ඇති වූ පැවිදි වීමේ තියුණු අදහස සංසිඳී ගියේ ය. දෙවනු ද කුටිකණ්ණසෝණ උපාසක තෙමේ -පෙ- තෙවනු ද කුටිකණ්ණසෝණ උපාසක තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් වෙත ගියේ ය. ගොස් ආයුෂ්මත් වූ මහාකාත්‍යායන තෙරුන් සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් කුටිකණ්ණ සෝණ උපාසක තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන්ට මෙය සැළ කළේ ය: "ස්වාමීනි, මම ආර්ය වූ මහාකාත්‍යායනයන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය යම් යම් පරිද්දෙකින් දනිම් ද, ඒකාන්තයෙන් පරිපූර්ණ වූ හැම ලෙසින් පිරිසිදු වූ සඞ්ඛලිඛිත වූ මේ බ්‍රහ්මචර්යයෙහි හැසිරීම ගිහිගෙහි වසන්නහුට පහසු නො වේ. ස්වාමීනි, මම කෙස් රැවුල් බහා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නට කැමැත්තෙමි. ස්වාමී වූ මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මා පැවිදි කරණ සේක්වා" යි. ඉක්බිති ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ කුටිකණ්ණසෝණ උපාසකයා පැවිදි කළහ.

103. එකල්හි **අවන්තිදක්ඛිණාපථය** මහණගණයාගෙන් තොර වූයේ වේ. එහෙයින් ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ තෙවසක් ඇවෑමෙන් ඉතා දුකින් ඒ ඒ දිශාවෙන් දශවර්ගික වූ භික්ෂුසඞ්ඝයා රැස් කරවා ආයුෂ්මත් සෝණහෙරණහු උපසපන් කළහ.

104. ඉක්බිති වස් වැස නිම කළ රහොගත වූ විවේකයට පැමිණ හුන් ආයුෂ්මත් සෝණ තෙරුන්ගේ සිත්හි මෙබඳු අදහසෙක් උපන: "මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ 'මෙබඳු ය, මෙබඳු ය' යි අසන ලදසේක් ම ය. (එහෙත්) මා විසින් ඉදිරියෙහි නො ද දක්නා ලදහ. මට උපාධ්‍යායයන් වහන්සේ අනුදන්නා සේක් නම්, මම අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නට යන්නෙමි" යි.

* උපග්‍රන්ථය බලනු.

105. අථ ඛො ආයස්මා සොණො සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකච්චායනො තෙනුපසඞ්කමි. උපසංකමිත්වා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සොණො ආයස්මන්තං මහාකච්චායනං එතදවොච: "ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'සුතොයෙව ඛො මෙ සො භගවා 'ඊදිසො ච ඊදිසො චා' ති. න ච මයා සම්මුඛා දිට්ඨො. ගච්ඡෙය්‍යාහං තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං, සචෙ මං උපජ්ඣායො අනුජානෙය්‍යා' ති. 'ගච්ඡෙය්‍යාහං භන්තෙ, තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං, සචෙ මං උපජ්ඣායො අනුජානාති" ති. "සාධු සාධු සොණ, ගච්ඡ ත්වං සොණ, තං භගවන්තං දස්සනාය අරහන්තං සම්මාසම්බුද්ධං, දක්ඛිස්සසි ත්වං සොණ තං භගවන්තං පාසාදිකං පසාදනීයං[1] සන්තින්ද්‍රියං සන්තමානසං උත්තමදමථ සමථමනුප්පත්තං දන්තං ගුත්තං යතින්ද්‍රියං නාගං.

106. "තෙන හි ත්වං සොණ, මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්ද 'උපජ්ඣායො මෙ භන්තෙ, ආයස්මා මහාකච්චායනො භගවතො පාදෙ සිරසා වන්දතී' ති. එවඤ්ච වදෙහි 'අවන්තිදක්ඛිණාපථො භන්තෙ, අප්පභික්ඛුකො. තිණ්ණං මෙ වස්සානං අච්චයෙන කිච්ඡෙන කසිරෙන තතො තතො දසවග්ගං භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා උපසම්පදං අලත්ථං. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිණාපථෙ අප්පතරෙන ගණෙන උපසම්පදං අනුජානෙය්‍යා" ති.

107. "අවන්තිදක්ඛිණාපථෙ භන්තෙ, කණ්හුත්තරා භූමි ඛරා ගොකණ්ටකහතා. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිණාපථෙ ගණඞ්ගණූ-පාහනං අනුජානෙය්‍ය.

108. "අවන්තිදක්ඛිණාපථෙ භන්තෙ, න්හානගරුකා මනුස්සා උදක-සුද්ධිකා. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිණාපථෙ ධුවන්හානං අනුජානෙය්‍ය.

109. "අවන්තිදක්ඛිණාපථෙ භන්තෙ, චම්මානි අත්ථරණානි එළකචම්මං අජචම්මං මිගචම්මං. සෙය්‍යථාපි භන්තෙ, මජ්ඣිමෙසු ජනපදෙසු එරගු මොරගු මජ්ජාරු ජන්තු[2], එවමෙව ඛො භන්තෙ, අවන්තිදක්ඛිණාපථෙ චම්මානි අත්ථරණානි එළකචම්මං අජචම්මං මිගචම්මං. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිණාපථෙ චම්මානි අත්ථරණානි අනුජානෙය්‍ය එළකචම්මං අජචම්මං මිගචම්මං.

110. "එතරහි භන්තෙ, මනුස්සා නිස්සීමගතානං භික්ඛූනං චීවරං දෙන්ති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙමා' ති. තෙ ආගන්ත්වා ආරොචෙන්ති: 'ඉත්ථන්නාමෙහි තෙ ආවුසො මනුස්සෙහි චීවරං දින්න' න්ති. තෙ කුක්කුච්චායන්තා න සාදියන්ති' මා නො නිස්සග්ගියං අහොසී' ති. අප්පෙව නාම භගවා චීවරෙ පරියායං ආචික්ඛෙය්‍යා" ති.

1. "පාසාදිකං පාසාදනීයං" අ වි ම නු ප. තො වි. ජ වි.
2. "එරකො මෙරකො ජතුරකා මතුරකාඃ" ඉති දිස්සතෙ "දිව්‍යාවදානෙ."

109. ඉක්බිති ආයුෂ්මත් සොණස්ථවිර තෙමේ සවස් කාලයෙහි විවෙකයෙන් නැගී සිටියේ මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ වෙත ගියේ ය. ගොස් ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ සකසා වැද පසෙක හුන්නේ ය. පසෙක හුන් ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ කාත්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙය සැලකෙළේ ය. "ස්වාමීනි, මෙහි රහොගත ව විවෙකයට පැමිණ හුන් මාගේ සිතෙහි මෙබඳු අදහසෙක් උපන: 'මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ 'මෙබඳු ය, මෙබඳු ය' යි අසන ලදසේක් ම ය. (එහෙත්) මා විසින් ඉදිරියෙහි නො ද දක්නා ලදහ. ඉදින් මට උපාධ්‍යායයන් වහන්සේ අනුදන්නෝ නම් අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නට යන්නෙමි යි. ස්වාමීනි, උපාධ්‍යායයන් වහන්සේ ඉදින් මට අනුදනිත් නම්, මම අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නට යන්නෙමි" යි. "සොණ, ඉතා යහපති. සොණ, තෝ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දක්නට යව. සොණ, තෝ පැහැදීම එළවන පැහැදීමට ස්ථාන වූ සන්සුන් ඉඳුරන් ඇති සන්සුන් සිත් ඇති උතුම් කායුපසමයට හා චිත්තුපසමයට පැමිණියා වූ දමුනා වූ රක්නා ලද ඉඳුරන් ඇති හික්මවූ ඉඳුරන් ඇති ශ්‍රෙෂ්ඨ වූ නොහොත් පව් නැති ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නෙහි ය.

110. "සොණ, එසේ නම් තෝ 'ස්වාමීනි, මාගේ උපාධ්‍යාය වූ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිති' යි කියා මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳුව. මෙසේත් සැළකරව: 'ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථය මහණගණයාගෙන් තොර වූයේ ය. තුන් අවුරුද්දක් ඇවෑමෙන් ඉතා දුකින් (අපහසුවෙන්) ඒ ඒ දිශාවන්ගෙන් දශවර්ගිකභික්ෂුසඞ්ඝයා රැස් කරවා ගෙණ (මම) මාගේ උපසම්පදාව ලැබුයෙමි. භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි ඉතා අඩු වූ භික්ෂුගණයාගෙන් යුක්ත උපසම්පදාව අනුදන්නා සේක් නම් යෙහෙක.

111. "ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථයෙහි කළු මැටි වැඩි බිම ගවකුරයෙන් කැඩුනී ය. රළු ය. භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි පට කීපයක් ඇති ඝන වහන් අනුදන්නා සේක් නම්, යෙහෙක.

112. "ස්වාමීනි' අවන්තිදක්ඛිණාපථයෙහි මිනිස්සු නෑම ගරු කොට ගත්තෝ ය. දියෙන් පිරිසිදු බව බලාපොරොත්තු වන්නෝ ය. භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි නිත්‍යස්නානය (නිතර නෑම) අනුදන්නා සේක් නම්, යෙහෙක.

113. "ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම්, තිරෙළුසම්, මුවසම්, යන සම් ඇතිරි වේ. ස්වාමීනි, මධ්‍යජනපදයෙහි එරගු, මොරගු, මජ්ජාරු, ජන්තු යන තෘණයන්ගෙන් කළ කලාල මෙන් – ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම් ඇතිරි වේ. භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම් තිරෙළු සම් මුවසම් යන සම්-ඇතිරි අනුදන්නා සේක් නම්, යෙහෙක".

114. "ස්වාමීනි, දැන් මිනිස්සු සීමාවෙන් බැහැරට ගිය භික්ෂූන්ට 'මේ සිවුර, මෙනම් ඇත්තහුට දෙමු' යි සිවුරු දෙත්. ඔහු අවුත් 'ඇවැත්නි, මෙනම් ඇති මිනිසුන් විසින් තට සිවුරු දෙන ලද' යි කියත්. ඔහු කුකුස් කරන්නෝ 'අපට නිසගිපචිති නො වේවා' යි නො ඉවසත් (නො පිළිණිත්). භාග්‍යවතුන් වහන්සේ සිවුරෙහි ක්‍රමයක් (පිළිගැණීමේ නීතියක්) වදාළ සේක් නම්, යෙහෙකැ" යි.

115. "එවං භන්තෙ" ති ඛො ආයස්මා සොණො ආයස්මතො මහාකච්චායනස්ස පටිස්සුත්වා උට්ඨායාසනා ආයස්මන්තං මහාකච්චායනං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන සාවත්ථි තෙන පක්කාමි.

116. අනුපුබ්බෙන යෙන **සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස** ආරාමො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "ඉමස්ස ආනන්ද, ආගන්තුකස්ස භික්ඛුනො සෙනාසනං පඤ්ඤපෙහී" ති.

117. අථ ඛො ආයස්මා ආනන්දො "යස්ස ඛො මං භගවා ආණාපෙති 'ඉමස්ස ආනන්ද, ආගන්තුකස්ස භික්ඛුනො සෙනාසනං පඤ්ඤපෙහී' ති, ඉච්ඡති භගවා තෙන භික්ඛුනා සද්ධිං එකවිහාරෙ වත්ථුං. ඉච්ඡති භගවා ආයස්මතා සොණෙන සද්ධිං එකවිහාරෙ වත්ථු" න්ති යස්මිං විහාරෙ භගවා විහරති, තස්මිං විහාරෙ ආයස්මතො සොණස්ස සෙනාසනං පඤ්ඤපෙසි.

118. අථ ඛො භගවා බහුදෙව රත්තිං අජ්ඣොකාසෙ වීතිනාමෙත්වා විහාරං පාවිසි. ආයස්මාපි ඛො සොණො බහුදෙව රත්තිං අජ්ඣොකාසෙ වීතිනාමෙත්වා විහාරං පාවිසි.

119. අථ ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය ආයස්මන්තං සොණං අජ්ඣෙසි: "පටිභාතු තං භික්ඛු ධම්මො භාසිතු" න්ති. "එවං භන්තෙ" ති ඛො ආයස්මා සොණො භගවතො පටිස්සුණිත්වා සබ්බානෙව අට්ඨකවග්ගිකානි සරෙන අභාසි.

120. අථ ඛො භගවා ආයස්මතො සොණස්ස සරභඤ්ඤපරියොසානෙ අබ්භනුමොදි: සාධු. සාධු. භික්ඛු, 'සුග්ගහිතානි ඛො තෙ භික්ඛු, අට්ඨක-වග්ගිකානි සුමනසිකතානි සූපධාරිතානි. කල්‍යාණියාසි[1] වාචාය සමන්නා-ගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. කති වස්සොසි ත්වං භික්ඛු ?" ති. "එකවස්සො අහං භගවා" ති. "කිස්ස පන ත්වං භික්ඛු, එවං චිරං අකාසී ?" ති. "චිරදිට්ඨො[2] මෙ භන්තෙ, කාමෙසු ආදීනවො. අපි ච සම්බාධො ඝරාවාසො[3] බහුකිච්චො බහුකරණීයො[4]" ති.

121. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"දිස්වා ආදීනවං ලොකෙ ඤත්වා ධම්මං නිරූපධිං,
අරියො න රමති පාපෙ පාපෙ න රමති සුචී" ති.

1. "කල්‍යාණියාපි" ම ජ සං "කල්‍යාණියාසිපි" P T S.
2. "චිරං දිට්ඨො" ම ජ සං. P T S.
3. "සම්බාධා ඝරාවාසා" ම ජ සං. P T S. තො වි. ම නු ප
4. "බහුකිච්චා බහුකරණීයා" ම ජ සං. P T S. ම නු ප. තො වි.

115. "එසේ ය, ස්වාමීනි" යි ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැගිට ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට සෙනසුන තැන්පත් කොට තබා පාසිවුරු ගෙණ සැවැත් නුවරට ගියේ ය.

116. පිළිවෙළින් (ගොස්) **සැවැත්**නුවර **ජේතවන**යෙහි **අනේපිඬු** සිටුහුගේ ආරාමය යම් තැනෙක ද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද, එහි එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට "ආනන්දය, මේ ආගන්තුක භික්ෂුහුහට සෙනසුනක් පණව" යි ඇමතූ සේක.

117. ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ "ආනන්දය, මේ ආගන්තුකභික්ෂුහුහට සෙනසුනක් පණව' යි භාග්‍යවතුන් වහන්සේ මට යමකු පිළිබඳ ව අණ කරණ සේක් ද, භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහු සමග එක වෙහෙර විසීම කැමැති සේක. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ තෙරුන් සමග එක වෙහෙර විසීම කැමැති සේකැ" යි භාග්‍යවතුන් වහන්සේ යම් වෙහෙරක වසන සේක් නම්, ඒ වෙහෙරෙහි ආයුෂ්මත් සොණ තෙරුන්ට සෙනසුන් පැණවූහ.

118. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් එළිමහනෙහි කල් ගෙවා වෙහෙරට පිවිසි සේක. ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ ද රෑ බොහෝ වේලාවක් එළිමහනෙහි කල් ගෙවා වෙහෙරට පිවිසියේ ය.

119. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රෑ අළුයම නැගී සිට සොණ තෙරුන්ට "මහණ, තට දහම් දෙසීමට වැටහේවා" යි ආරාධනා කළ සේක. "එසේ ය, ස්වාමීනි," යි ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී සියලු ම අෂ්ටකවර්ගීයෙහි සූත්‍රයන්* මිහිරිහඬින් කීයේ ය.

120. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණ තෙරුන්ගේ මිහිරි හඬින් (පෙළ අරුත්) කීම අවසන්හි වෙසෙසින් සතුටු වූ සේක. "මහණ, ඉතා මැනවි. මහණ, තා විසින් අෂ්ටකවර්ගීයෙහි වූ සූත්‍රයෝ මනා සේ උගන්නා ලදහ. මනා සේ මෙනෙහි කරණ ලද්දාහු ය. මනා කොට විමසන ලද්දාහු ය. විශද වූ නිර්දෝෂ වූ අර්ථය වෙසෙසින් හඟවන්නා වූ යහපත් වචනයෙන් යුක්ත වූයෙහි ය. මහණ, තෝ කෙතෙක් වස් ඇත්තේ වෙහි ද ?" "භාග්‍යවතුන් වහන්ස, මම එක්වස් ඇත්තේ වෙමි" "මහණ, තෝ කුමක් නිසා මෙසේ බොහෝ කල් යැවූයෙහි ද?" "ස්වාමීනි, මා විසින් කාමයන් දුක්බව බොහෝ කලින් දක්නා ලද්දේ ය. එහෙත් ගිහිගෙයි විසීම අවකාශ රහිත ය. බොහෝ කෘත්‍යය ඇත්තේ ය. බොහෝ කටයුතු ඇත්තේ ය".

121. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලෙහි මේ උදානය පහළ කළසේක:

"සංස්කාරලොකයෙහි අනිත්‍යාදිදෝෂය දැක උපධි රහිත වූ නිර්වාණධර්මය මගපල නුවණින් දැන ආර්‍ය්‍ය පුද්ගල තෙමේ පවෙහි නො ඇලෙයි. (ඒ එසේ මැයි) මාර්‍ගඵලලාභී විශුද්ධපුද්ගල තෙමේ පව්කම්හි නො ඇලේ" යි.

---

* උපග්‍රන්ථය බලනු.

122. අථ ඛො ආයස්මා සොණො "පටිසම්මොදති ඛො මං භගවා. අයං ඛ්වස්ස කාලො යං මෙ උපජ්ඣායො පරිදස්සී" ති[1] උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙ සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: "උපජ්ඣායො මෙ භන්තෙ, ආයස්මා මහාකච්චායනො භගවතො පාදෙ සිරසා වන්දති. එවඤ්ච වදෙති:

123. "අවන්තිදක්ඛිණාපථො භන්තෙ, අප්පභික්ඛුකො. තිණ්ණං මෙ වස්සානං අච්චයෙන කිච්ඡෙන කසිරෙන තතො තතො දසවග්ගං භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා උපසම්පදං අලත්ථං. අප්පෙව නාම භගවා අවන්ති-දක්ඛිණාපථෙ අප්පතරෙන ගණෙන උපසම්පදං අනුජානෙය්‍ය.

124. "අවන්තිදක්ඛිණාපථෙ භන්තෙ, කණ්හුත්තරා භූමි ඛරා ගොකණ්ටකහතා. අප්පෙවනාම භගවා අවන්ති දක්ඛිණාපථෙ ගණඞ්ගණූ-පාහනං අනුජානෙය්‍ය.

125. "අවන්තිදක්ඛිණාපථෙ භන්තෙ, නහානගරුකා මනුස්සා උදකසුද්ධිකා. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිණාපථෙ ධුවනහානං අනුජානෙය්‍ය.

126. "අවන්තිදක්ඛිණාපථෙ භන්තෙ, චම්මානි අත්ථරණානි: එළකචම්මං අජචම්මං මිගචම්මං. සෙය්‍යථාපි භන්තෙ, මජ්ඣිමෙසු ජනපදෙසු එරගු මොරගු මජ්ජාරු ජන්තු, එවමෙව ඛො භන්තෙ අවන්තිදක්ඛිණාපථෙ චම්මානි අත්ථරණානි එළකචම්මං අජචම්මං මිගචම්මං. අප්පෙව නාම භගවා අවන්තිදක්ඛිණාපථෙ චම්මානි අත්ථරණානි අනුජානෙය්‍ය: එළකචම්මං අජචම්මං මිගචම්මං."

127. "එතරහි භන්තෙ, මනුස්සා නිස්සීමගතානං භික්ඛූනං චීවරං දෙන්ති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙමා' ති. තෙ ආගන්ත්වා ආරොචෙන්ති: 'ඉත්ථන්නාමෙහි තෙ ආවුසො මනුස්සෙහි චීවරං දින්න' න්ති. තෙ කුක්කුච්චා-යන්තා න සාදියන්ති 'මා නො නිස්සග්ගියං අහොසී' ති. අප්පෙව නාම භගවා චීවරෙ පරියායං ආචික්ඛෙය්‍යා" ති.

128. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අවන්තිදක්ඛිණාපථො භික්ඛවෙ, අප්පභික්ඛුකො. අනුජානාමි භික්ඛවෙ, සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු විනයධරපඤ්චමෙන ගණෙන උපසම්පදං.

129. "තත්‍රිමෙ පච්චන්තිමා ජනපදා: පුරත්ථිමාය දිසාය කජඞ්ගලං[2] නාම නිගමො. තස්සාපරෙන[3] මහාසාලා. තතො පරා පච්චන්තිමා ජනපදා. ඔරතො මජ්ඣෙ. පුරත්ථිමදක්ඛිණාය දිසාය සලලවතී[4] නාම නදී. තතො පරා පච්චන්තිමා ජනපදා. ඔරතො මජ්ඣෙ. දක්ඛිණාය දිසාය සෙතකණ්ණිකං නාම නිගමො. තතො පරා පච්චන්තිමා ජනපදා. ඔරතො මජ්ඣෙ. පච්ඡිමාය දිසාය ථූණං නාම බ්‍රාහ්මණගාමො. තතො පරා පච්චන්තිමා ජනපදා. ඔරතො මජ්ඣෙ. උත්තරාය දිසාය උසීරද්ධජො නාම පබ්බතො. තතො පරා පච්චන්තිමා ජනපදා. ඔරතො මජ්ඣෙ. අනුජානාමි භික්ඛවෙ, එවරූපෙසු පච්චන්තිමෙසු ජනපදෙසු විනයධරපඤ්චමෙන ගණෙන උපසම්පදං."

1. පරිදස්සතීති" ම නු ප. තො වි

2 "ඝජඞ්ගලො" අ වි. මනු ප. තො වි. තොවි. ජ වි. "ගජඞ්ගලං" ම ජ සං.

3. "තස්සපරෙන" ම ජ සං. ම නු ප. තො වි තො වි. 4. "සලලවතී" ම ජ සං. අ වි.

122. ඉක්බිති ආයුෂ්මත් සොණ ස්ථවිර තෙමේ ''භාග්‍යවතුන් වහන්සේ මා හා, පිළිසඳර කතා කරණ සේක. මාගේ උපාධ්‍යාය තෙමේ යමක් දන්වී ද, ඊට මේ කාලය වේ ය'' යි හුනස්නෙන් නැගිට උතුරුසඟසිවුර එකස් කොට භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''ස්වාමීනි, මාගේ උපාධ්‍යාය වූ ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳිත්. මෙසේ ද කියත්:

123. ''ස්වාමීනි, **අවන්තිදක්ඛිණාපථය** භික්ෂූන් ස්වල්ප ගණනක් ඇති පෙදෙසෙකි. තුන් අවුරුද්දක් ඇවෑමෙන් ඉතා දුකින් ඒ ඒ දිශාවන්ගෙන් දශවර්ගික භික්ෂුසඞ්ඝයා රැස් කරවා (මම) මාගේ උපසම්පදාව ලැබීමි. භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි ඉතා ස්වල්ප වූ භික්ෂුගණයා-ගෙන් උපසපන් කිරීම අනුදන්නා සේක් නම්, යෙහෙක.

124. ''ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථයෙහි මතුපිට කළුමැටි බහුල බිම රළු ය. ගවකුරවලින් කැඩුනේ ය.* භාග්‍යවතුන් වහන්සේ අවන්ති-දක්ඛිණාපථයෙහි ගණඞ්ගණඋපාහනයන් අනුදන්නා සේක් නම්, යෙහෙක.

125. ''ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථයෙහි මිනිස්සු නෑම ගරු කරන්-නෝ ය. උදකසුද්ධිය (දියෙන් පිරිසිදු බව) බලාපොරොත්තු වන්නෝ ය. භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි නිතර නෑම අනුදන්නා සේක් නම්, යෙහෙක.

126. ''ස්වාමීනි, අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම්ඇතිරි වේ. ස්වාමීනි, මධ්‍යමජනපදයෙහි එරගු මොරගු මජ්ජාරු ජන්තු* යන තෘණයෙන් කළ කලාල මෙන් ස්වාමීනි, අවන්තිදක්ඛිණා-පථයෙහි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම් ඇතිරි වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම් ඇතිරි අනුදන්නා සේක් නම්, යෙහෙක.

127. ''ස්වාමීනි, දැන් මිනිස්සු සීමාවෙන් බැහැර ගිය භික්ෂූන්ට 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමු' යි සිවුරු දෙත්. ඒ භික්ෂූහු අවුත් 'ඇවැත්නි, මෙනම් ඇති මිනිසුන් විසින් තට සිවුරක් දෙන ලදැ' යි කියත්. ඔහු කුකුස් කරන්නෝ 'අපට නිසඟිපචිති නො වේවා' යි* නො ඉවසත්. භාග්‍යවතුන් වහන්සේ සිවුරෙහි (පිළිපදිනා) ක්‍රමයක් වදාරණසේක් නම්, යෙහෙක'' යනුයි.

128. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණෙහි දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, අවන්තිදක්ඛිණා පථය භික්ෂුගණයාගෙන් හිඟ වූයේ ය. මහණෙනි, සියලු ප්‍රත්‍යන්තජනපද-යන්හි විනයධරයා පස් වැනි කොට ඇති භික්ෂුගණයාගෙන් උපසපන් කිරීම අනුදනිමි'' යි.

129. ''මේ එහි ප්‍රත්‍යන්තජනපදයෝ ය:* (මහබෝමැඩට) පෙරදිගින් **කජඞ්ගල** නම් නියම්ගම ය. ඉන් පිටත මහාශාලයෝ ය. ඉන් ඔබ්බෙහි ප්‍රත්‍යන්තජනපදයෝ ය. ඉන් මොබ මධ්‍යදෙශය යි. පූර්වදක්ෂිණ දිශාවෙන් (ගිනිකොණින්) **සලලවතී** නම් ගඞ්ගාව ය. ඉන් ඔබ්බෙහි ප්‍රත්‍යන්ත-ජනපදයෝ ය. ඉන් මොබ මධ්‍යදෙශය යි. දකුණුදිගින් **ශෙවතකර්ණිකා** නම් නියම්ගම ය. ඉන් ඔබ්බෙහි ප්‍රත්‍යන්තජනපදයෝ ය. ඉන් මොබ මධ්‍යදෙශය යි. බස්නාහිරිදිගින් **ථූණ** නම් බමුණුගම ය. ඉන් ඔබ්බෙහි ප්‍රත්‍යන්තජනපදයෝ ය. ඉන් මොබ මධ්‍යදෙශය යි. උතුරුදිගින් **උශීරධ්වජ** නම් පර්වත ය යි. ඉන් ඔබ්බෙහි ප්‍රත්‍යන්තජනපදයෝ ය. ඉන් මොබ මධ්‍ය-දෙශ ය යි. මහණෙනි, මෙබඳු ප්‍රත්‍යන්තජනපදයන්හි විනයධරයා පස් වැනි කොට ඇති භික්ෂුගණයාගෙන් උපසපන් කිරීම අනුදනිමි'' යි.

* උපග්‍රන්ථය බලනු.

130. "අවන්තිදක්ඛිණාපථෙ භික්ඛවෙ, කණ්හුත්තරා භූමි ඛරා ගොකණ්ටකහතා. අනුජානාමි භික්ඛවෙ, සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු ගණඞ්ගණූපාහනං."

131. "අවන්තිදක්ඛිණාපථෙ භික්ඛවෙ, නහානගරුකා මනුස්සා උදකසුද්ධිකා. අනුජානාමි භික්ඛවෙ, සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු ධුවනහානං".

132. "අවන්තිදක්ඛිණාපථෙ භික්ඛවෙ, චම්මානි අත්ථරණානි: එළකචම්මං අජචම්මං මිගචම්මං. සෙය්‍යථාපි භික්ඛවෙ, මජ්ඣිමෙසු ජනපදෙසු එරගු මොරගු මජ්ජාරු ජන්තු, එවමෙව ඛො භික්ඛවෙ, අවන්තිදක්ඛිණාපථෙ චම්මානි අත්ථරණානි: එළකචම්මං අජචම්මං මිගචම්මං. අනුජානාමි භික්ඛවෙ, සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු චම්මානි අත්ථරණානි: එළකචම්මං අජචම්මං මිගචම්මං."

133. "ඉධ පන භික්ඛවෙ, මනුස්සා නිස්සීමගතානං භික්ඛූනං චීවරං දෙන්ති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙමා' ති. අනුජානාමි භික්ඛවෙ, සාදිසිතුං[1]. න තාව තං ගණනූපගං යාව න හත්ථං ගච්ඡතී" ති.

**චම්මක්ඛන්ධකො නිට්ඨිතො පංචමො.**

---

1 "සාදීතුං" ම ඡ සං. ම නු ප තො වි.

130. “මහණෙනි, අවන්තිදක්ඛිණාපථයෙහි මතුපිට කළු මැටි බහුල බිම ගවකුරයෙන් කැඩුනී රළු ය. මහණෙනි, සියලු ප්‍රත්‍යන්තජනපදයන්හි පටගණන් ඇති සන වහන් (දූරිම) අනුදනිමි” යි.

131. “මහණෙනි, අවන්තිදක්ඛිණාපථයෙහි මිනිස්සු නෑම ගරු කොට ගත්තෝ ය. දියෙන් පිරිසිදු වීම කැමැත්තෝ ය. මහණෙනි, සියලු ප්‍රත්‍යන්ත-ජනපදයන්හි නිතර නෑම අනුදනිමි” යි.

132. “මහණෙනි, අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම් ඇතිරි වේ. මහණෙනි, මධ්‍යමජනපදයන්හි එරගු මොරගු මජ්ජාරු ජන්තු යන තෘණයන්ගෙන් කළ කළාල සේ මහණෙනි, අවන්තිදක්ඛිණාපථයෙහි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම් ඇතිරි වේ. මහණෙනි, සියලු ප්‍රත්‍යන්තජනපදයන්හි එළුසම් තිරෙළුසම් මුවසම් යන සම් ඇතිරි අනුදනිමි” යි.

133. “මහණෙනි, මෙහි මිනිස්සු සීමාවෙන් බැහැර ගිය භික්ෂූන්ට ‘මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමු’ යි සිවුරු දෙත්. මහණෙනි, ඉවසන්ට අනුදනිමි. යම් තාක් කල් ඒ අත්පත් නොවේ ද, ඒ තාක් කල් ගණනට නො ගැණේ යි” වදාළ සේක.

**පස්වන චම්මක්ඛන්ධකය නිමි.**

---

## ඉමම්හි ඛන්ධකෙ වත්ථූ තෙසට්ඨි.

තස්ස උද්දානං:-

1. රාජා ච මාගධො **සොණො** අසීතිසහස්සිස්සරො,
**සාගතො** ගිජ්ඣකූටම්හි බහුං දස්සෙසි උත්තරිං[1].

2. පබ්බජ්ජාරද්ධභිජ්ජිංසු වීණං එකපලාසිකං,
නීලා පීතා ලොහිතිකා[2] මඤ්ජෙට්ඨා කණ්හමෙව ච.

3. මහාරඞ්ගා මහානාමා වට්ටිකා ච[3] පටික්ඛිපි,
ඛල්ලිකා[4] පුට පාළි ච තූලතිත්තිරමෙණ්ඩජා.

4. විච්ඡිකා මොරචිත්‍රා ච[5] සීහබ්‍යග්ඝා ච දීපිකා,
අජිනුද්දා මජ්ජාරී ච කාළලූක[6]පරික්ඛටා.

5. ඵලිතූපාහනා[7] ඛීලා ධොතඛාණුඛටංඛටා,
තාලවෙළුතිණඤ්චෙව මුඤ්ජබබ්බජහින්තාලා[8].

6. කමලකම්බලසොවණ්ණා රූපිකා මණි වෙළුරි,
ඵළිකා කංසකාචා ච තිපු සීසඤ්ච තම්බකා.

7. ගාවී යානං ගිලානො ච පුරිසයුත්තං[9] සිවිකා,
සයනානි මහාචම්මා ගොචම්මෙහි ච පාපකො.

8. ගිහීනං චම්මබද්ධෙහි පවිසන්ති ගිලානකා[10],
මහාකච්චායනො සොණො සරෙනට්ඨකවග්ගිකං[11].

9. උපසම්පදං පඤ්චහි ගණඞ්ගණා ධුවසිනායනා[12],
චම්මත්ථරණානුඤ්ඤාසි න තාව ගණනූපගං;
අදාසි' මෙ වරෙ පඤ්ච සොණත්ථෙරස්ස නායකොති.

---

1. "දස්සෙති උත්තරිං" ම ජ සං. අ වි.
2. "නීලපීතලොහිතකා" අ වි. තො වි. ම නු ප. තො වි.
3. "මහාරඞ්ග මහානාමා වද්ධිකා" ම ජ සං. ජ වි.
4. "ඛල්ලකා" ම ජ සං. තො වි.
5. "චිත්‍රාංච" අ වි. තො වි. ම නු ප. ජ වි.
6. "කාළලූව" ම ජ සං.
7. "ඵලිතූපාහනා" ම ජ සං
8. "හින්තාලා" ම ජ සං "හින්තාලී" තො වි. ම නු ප. අ වි. ජ වි
9. "පුරිසායුත්ත" ම ජ සං. ම නු ප. තො වි.
10. "ගිලායනො" ම ජ සං.
11. "සරෙනා අට්ඨකවග්ගිකං" ම ජ සං.
12. "ධුවසිනා" ම ජ සං.

Free Distribution www.aathaapi.org

## මේ ඛන්ධකයෙහි වස්තු තෙසැටෙකි.

එහි උද්දානය (වස්තුනාමාවලිය) මෙසේ ය:

1. මගධාධිපති බිම්බිසාර තෙමේ ය. **සෝණ**සිටු තෙමේ ය. අසූදහසක් ගම්දෙටුහු ය. **සාගත**ස්ථවිර තෙමේ ගිජුකුළුපව්වෙහි බොහෝ උතුරු මිනිස්දම් දක් වී ය.

2. සෝණසිටුගේ පැවිද්ද හා අධිකවීර්‍ය්‍යය නිසා පතුල් පැළීම, වෙණ වැයීම, එක්පට වහන් අනුදැනීම, නිල්වන් වහන්, රන්වන් වහන්, රතුවහන්, මදටියවන් වහන්, කළුවහන්-

3. පතඟිවන් වහන්, මුසුපැහැති වහන්, නිල්වන් ඈ වරපට ඇති වහන් යන මේ වහන් ප්‍රතික්ෂෙප කිරීම, විලුඹ වසා කළ වහන්, කෙණ්ඩා වැසෙන සේ කළ වහන්, පිටිපා වසාලන වහන්, පුලුන් පුරවා කළ වහන්, තිත්වටුපියාපත් පිරියමින් විසිතුරු කොට කළ වහන්, බැටළුඅං සටහන් වර ඇති වහන්, එළුඅං සටහන් වර ඇති වහන්-

4. ගෝනුසුනගුටුසටහන් වර ඇති වහන්, මොනරපිල් වහන්, විසිතුරු වහන්, සිංහසමින් කළ වහන්, ව්‍යාඝ්‍රසමින් කළ වහන්, අඳුන්දිවිසමින් කළ වහන්, දියබලුසමින් කළ වහන්, බළල්සමින් කළ වහන්, ලේනසමින් කළ වහන්, බකමූණුපිහාටුවලින් කළ වහන් ප්‍රතික්ෂෙප කිරීම-

5. පැළුනු පතුල් ඇති මහණකු නිසා වහන් අනුදැනීම, පට කිහිපයකින් යුත්වහන් අනුදැනීම, සව්ගමහණුන් නිසා ආරාමය තුළ වහන් දැරීම තහනම් කිරීම, පාදඛිලාබාධය, සේදූ පාදය, උල් ඇණීම, ඛට ඛට යන ශබ්දයෙන් යුත් පාදුකා දැරීම, තල්කොළ, උණකොළ, තණකොළ පාදුකා, මුදුතණ, බබුස්තණ, කිතුල්කොළ යන මෙයින් කළ පාදුකා ප්‍රතික්ෂෙප කිරීම-

6. කමලතණ, පලස් පාදුකා, රන්, රිදී, මැණික්, වෛරෝඩිමිණි, පළිඟු, කස්ලොහ, කාචමිණි, සුදුරියම්, කළුරියම්, තඹලොහෝ, යන මෙයින් කළ පාදුකා ප්‍රතික්ෂෙ කිරීම-

7. ගඟින් එතරවන දෙනුන්, යානාව, ගිලනා, පිරිමිසතුන් යෙදූ යානාවන්, සිවිකා, හිදෙළු, මහසම්, ගෙරිසම්, පවිටුමහණ යන මොවුන් පිළිබඳ වස්තු-

8. ගිහින් සතු සම්වෙළූ අසුන්, සම්බැඳි වෙහෙර හිඳීම, (වහන් පය ලා ගම්) වැදීම, ගිලන්හු, මහාකාත්‍යායනස්ථවිර තෙමේ, සෝණස්ථවිර තෙමේ, මිහිරිහඬින් අෂ්ටක වග්ගී සූත්‍ර දෙසීම-

9. පංචවර්ගිකභික්ෂූන් විසින් උපසපන් කිරීම, තුන් පටින් වැඩි පට ඇති වහන් දැරීම, නිත්‍යස්නානය, සම්ඇතිරි, අත්පත් වන තෙක් ගණන් නො ගැණෙන සිවුරු ඉවසීම ද අනුදත් සේක. නායක වූ බුදුරජානන් වහන්සේ සෝණ තෙරුන්ට මේ වර පස දුන් සේක.